

# සංවිචාරණීය සමාජයක්

## A Deliberative Society

දේශපාලනය හා ආර්ථිකය ගැන වෙනත් කියැවීමක්

විජයානන්ද ජයවීර

# සංවිචාරණීය සමාජයක්

## A Deliberative Society

### දේශපාලනය හා ආර්ථිකය ගැන වෙනත් කියවීමක්

An excellent addition to the corpus of new political and social knowledge available in Sinhala.
- Professor Jayadeva Uyangoda

**කර්තෘගේ අනෙකුත් කෘති**

- නියත විවරණ - විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනය පිළිබඳ ඉතිහාසයක්
- ඇත්තක අසිරිය *(පරිවර්තන)*
  *-Magic of Reality by Richard Dawkins*
- භෞතික විද්‍යාව පිළිබඳ පාඩම් හතක් *(පරිවර්තන)*
  *- Seven Lessons of Physics by Carlo Rovelli*
- සම්පිණ්ඩන - වැඩියෙන් ම අලෙවි වූ ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ ග්‍රන්ථ එකොළහක සැකෙවින් කියැවීමක්
- අප කාලගුණ කාරකයෝය - *We are the Weather Makers by Tim Flannery* ගෝලීය උණුසුම පිළිබඳ කතන්දරය

# සංවිචාරණීය සමාජයක්

A Deliberative Society

දේශපාලනය හා ආර්ථිකය ගැන වෙනත් කියවීමක්

**විජයානන්ද ජයවීර**

**සංවිචාරණීය සමාජයක්**

*A Deliberative Society*

දේශපාලනය හා ආර්ථිකය ගැන වෙනත් කියවීමක්

© විජයානන්ද ජයවීර

ISBN: 978-955-51142-2-6

ප්‍රථම මුද්‍රණය: 2022 මාර්තු 25

කවර නිර්මාණය:

මො.ල. සෙනෙවිරත්න

පරිගණක පිටු සැකසුම:

**චන්දිමා පීරිස්**

ප්‍රකාශනය:

අගහස් ප්‍රකාශකයෝ
717/2, මාදින්නාගොඩ, රාජගිරිය

මුද්‍රණය:

නියෝ ග්‍රැෆික්ස් (පුද්.) සමාගම
අංක 44, උඩහමුල්ල දුම්රියපොළ පාර
ගංගොඩවිල - නුගේගොඩ

**සංස්කරණ සහාය: සමිත විජයවර්ධන**

අමායා, අවන්යා සහ කීරා ට.

To Amaya, Avanya and Keira

# පූර්විකාව

දේශපාලනය යනු බලය පිළිබඳ කටයුත්තක් බව දේශපාලනය යන වචනයේ වාච්‍යාර්ථයෙන් ම පැහැදිලි වෙයි. ඒ අනුව අත්පත් කර ගෙන ඇති බලය කෙසේ හෝ ආරක්ෂා කර ගැනීම බලයේ සිටින දේශපාලනඥයන්ගේ අරමුණ වී ඇත. අනික් අතට බලය අහිමි දේශපාලනඥයන්ගේ අරමුණ වන්නේ හැකි තාක් ඉක්මනින් බලය අත්පත් කර ගැනීමයි. බලය පවත්වා ගැනීම හා අත්පත් කර ගැනීම යන දෙකෙන් කවරක් අරමුණු කර ගත්තත්, දේශපාලනඥයන්ට නම් බොහෝ විට දේශපාලනය යනු රටක වැසියන් සහ සම්පත් මත රාජ්‍ය බලය යෙදවීමේ අධිකාරය තමන් සතු කර ගැනීමයි. සැබෑ බලය ඇත්තේ කවුරුන් සතු ව ද යන්න මත බලය අත්පත් කර ගැනීම පිළිබඳ ව වෙනත් සංකීර්ණ අර්ථකථන තිබිය හැකි ය. එහෙත් ආණ්ඩු බලය අත්පත් කර ගැනීම පිණිස මැතිවරණයක් මගින් බහුතරයේ කැමැත්ත ලබා ගැනීම යනුවෙන් එය තේරුම් ගැනීම අපේ වර්තමාන සාකච්ඡාව ඇරඹීමට ප්‍රමාණවත් ය.

එදිනෙදා භාවිතයේ දී ද දේශපාලනය යනු බලය අත්පත් කර ගැනීම පිළිබඳ කටයුත්තක් වසයෙන් සැලැකීම පිළිබඳ ව වැඩි මතභේදයක් තිබිය නො හැකි ය. එහෙත් එසේ අත්පත් කර ගන්නා බලය අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද යන ප්‍රශ්නය සාමාන්‍යයෙන් සැලකෙන්නේ ආර්ථික විශේෂඥයන් විසින් ආධිපත්‍ය පතුරවනු ලබන 'ආර්ථික විද්‍යාව' නමැති ක්ෂේත්‍රය තුළ සාකච්ඡා විය යුතු ප්‍රශ්නයක් වසයෙනි. ඡන්ද දායක සාමාන්‍ය ජනයාට අගෝචර වන තරමට ආර්ථික විශේෂඥයන් ආර්ථික විද්‍යාව අනවශ්‍ය ලෙස සංකීර්ණ කර තිබේ. එහෙත් දේශපාලනය හා ආර්ථිකය යනු එක ම කාසියක දෙපැත්තකි. එකක පැවැත්ම අනෙක මත තීරණය වේ.

නිතිපතා උග්‍ර වන සමාජ අසමානතාවට අතිරේක ව අප ජීවත් වන මේ ග්‍රහලෝකය දැන් මුහුණ දී ඇති තත්වය සහ ඒ නිසා සිදු විය හැකි ව්‍යසනය හමුවේ තවදුරටත් බලය අත්පත් කර ගැනීමේ දේශපාලන ක්‍රීඩාවට ඔල්වරසන් දෙමින් කල් මැරීමට අපට නො හැකි ය. ඉන් මිදීමට

අපට හැකි වන්නේ දේශපාලනය හා සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික පර්යාලෝකයෙන් ගැලවී අප මුහුණ දෙන අභියෝග සඳහා මෙතෙක් යොදා ගත් අසාර්ථක එළඹීම් හේතු සාධක මත විචාරශීලී ව විමසා උචිත නව දැක්මක් ගොඩ නගා ගැනීමෙනි. ඒ සඳහා දැනුවත් සංවිචාරණයක් *(deliberation)* හෙවත් විචාරශීලී ව හා සාවධාන ව අදාළ කරුණු කාරණා සාකච්ඡාවට ලක් කිරීමක් අත්‍යවශ්‍ය ය. එයට අවශ්‍ය කරන දැනුම, තාක්ෂණය, සහ විමර්ශනාත්මක අත්දැකීම් අප අතර තිබේ. එහෙත් ඒ දැනුම අර්ථසාධනීය ව භාවිත කළ හැකි පොදු යහපත මුල්කරගත් සංවිචාරණීය සමාජයක් ගොඩ නැගීමේ අභියෝගයට ද අප ඉදුරා ම මුහුණ දිය යුතු ය. මන්ද දශක කිහිපයක සිට දේශපාලනය හා ආර්ථික සංවර්ධනය පිළිබඳ ව අප අතර උත්කර්ෂණයට නංවා ඇති දැක්ම සද්ජන සමාජ වටිනාකම් පිටු දකින හුදු ස්වාර්ථකාමය සහ ස්වාමිත්වකාමය ම සමාජයේ ගාමක බලවේගය ලෙස සලකන මිථ්‍යාදෘෂ්ටියක් වූ බැවිනි. එම මිථ්‍යාදෘෂ්ටියේ විපාක වැඩි වෙන ආදායම් විෂමතා, අසමාන සමාජ අවස්ථා, ජන වාර්ගික ද්වේෂය, විෂමාචාරී ජනමාධ්‍ය, රැවටිලිකාර නායකයන්, ඉච්ඡාභංගවීම්, දූෂිත පරිපාලනය, පොදු දේපළ කොල්ලකෑම, සමාජ අසහනය, පොදු සේවාවල කඩා වැටීම සහ පෘථිවි පරිසර පද්ධතිය මත රේඛීය ආර්ථිකයෙන් පටවා ඇති පරිපීඩනයේ ව්‍යසනකාරී ඵල විපාක තුළින් නිරූපණය වෙයි. එම පටු දැක්ම පිළිබඳ දැනුවත් සංවිචාරණයක් සහ ඊට විකල්පයක් ලෙස සැමට සාධාරණය සහ යුක්තිය අත්පත් කර දීම අරමුණ කරගත් සජ්ජන සමාජයක් බිහි කර ගැනීමට හැකි දැක්මක් ගොඩනැගීම අරමුණ කරගත් තොරතුරු හා උත්තේජනීය අදහස් කිහිපයක් සංවිචාරණයකට ලක් කිරීම මේ කෘතියේ අභිප්‍රායයි.

**විජයානන්ද ජයවීර**
2022 මාර්තු 15

10/5A, නිලම්මහර පාර,
කටුවාවල,
බොරලැස්ගමුව.
*w.jayaweera@gmail.com*

# පටුන


**1. දේශපාලනයට නව දැක්මක් 13-145**

1. යුක්තිය ඉටු කර ගැනීමේ දේශපාලනය 13
2. ප්‍රජාතන්ත්‍රවාදය - පරමාදර්ශය හා විකෘතිය 21
3. නියෝජන ක්‍රමයේ සීමා ඉක්මවීම 39
4. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය 59
5. නියෝජනය වෙනුවට සංවිචාරණය - අයිස්ලන්ත අත්දැකීම 91
6. මොංගෝලියානු අත්දැකීම සහ සංවිචාරණයේ කොන්දේසි 119
7. දේශපාලන සමානාත්මතාව හා පොදු අයිතිය 137

**2. ආර්ථිකයේ නො දැක්ම 147-379**

8. ප්‍රගතිය කෙබඳු විය යුතු ද? 147
9. ධනවාදය බටහිරින් ආවේ ඇයි ? 171
10. ආර්ථික චින්තනයේ සීමා 203
11. වෙළඳපොළ සමාජය 247
12. ආර්ථික මිනිසා - මිථ්‍යාව හා යථාර්ථය 277
13. නිස්සාරක ධනවාදය 315
14. නව ලිබරල්වාදයේ ආගමනය 327
15. නව ලිබරල්වාදයේ දේශපාලන දැක්ම 347
16. නවලිබරල්වාදය සහ ජනරාල් පිනෂේගේ සංස්ථාපිත පෞද්ගලික රාජ්‍යය 367

**3. සංවර්ධනයට විකල්පයක් 381-503**

17. විකල්ප සංවර්ධනයකට ප්‍රවේශයක් 381
18. සංවර්ධන කතිකාවේ නව දිශානතිය 395
19. වර්ධනය යනු සංවර්ධනය ම ද? 405
20. තිරසාර සංවර්ධන අරමුණු දක්වා සංවර්ධන දැක්ම 439

**4. නව ආර්ථික දැක්මක් 505-623**

21. රේඛීය ආර්ථිකය වෙනුවට චක්‍රීය ආර්ථිකයක් 505
22. චක්‍රීය ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ ඩෝනට් මොඩලය 531
23. අරමුණු පාදක මෙහෙවර ආර්ථිකයක් 565
24. මෙහෙවරක් *(mission)* සැලසුම් කිරීම 597

**5. විෂමතා අවම කිරීම 625-724**

25. අසමානතාව ආමන්ත්‍රණය කිරීම 625
26. සැමට මූලික ආදායමක් සහතික කිරීම 655
27. සිව්දින වැඩ සතිය - ජීවිතය විඳ ගැනීම 689
28. සමාජීය හා ආර්ථික ප්‍රතිමාන 705

# 1. දේශපාලනයට නව දැක්මක්

# -1-

## යුක්තිය ඉටු කර ගැනීමේ දේශපාලනය

දරුමල්ලන් ඇති දැඩි කර ගෙන නෑ හිත මිතුරන් ඇසුරු කර ගෙන අවසානය දක්වා ම තුටුපහටු අභිමානවත් ජීවිතයක් ගත කිරීම අප සියලු දෙනාට ම ඇති මූලික අභිලාෂයකි. එය බොහෝ විට අපේ මුඛ්‍ය දේශපාලන පරමාර්ථය ද වේ. එහෙත් 'බලය අත්පත් කර ගැනීමේ දේශපාලනයට' අනුගත වීමෙන් දේශපාලන අන්තේවාසිකයෙකු වීම හැර සැමට එම අභිලාෂය ඉටු කර ගත හැකි ජන සමාජයක් ගොඩ නගා ගැනීමට මෙතෙක් අපට හැකි වී නැත. ඒ බව නිදහස ලැබී ගත වූ වසර 70 තුළ ශ්‍රී ලංකාවේ දේශපාලනය පිළිබඳ ව අප සියලු දෙනා අතර අඩු වැඩි වසයෙන් ඇති කලකිරීම්වලින් සහ රැවටුණු රැවටිලිවලින් පැහැදිලි වේ. තව දුරටත් ඒ වංචාවේ ගොදුරු බවට පත්වීමට අපට නො හැකි ය.

එබැවින් මෙතෙක් කලක් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් 'බලය අත්පත් කර ගැනීම' මුල් කොට අපේ දේශපාලන කතිකාව මෙහෙය වූ දේශපාලන සුසමාදර්ශය *(paradigm)* වෙනුවට අපේ පොදු අභිලාෂ සම්බන්ධයෙන් 'සැමට යුක්තිය ඉටු කර ගැනීම' මුල් කරගත් නව දේශපාලන සුසමාදර්ශයක් ගොඩනගා ගත යුතු ව ඇත.

නව සුසමාදර්ශයක් යනු යථාර්ථය විමසීම සඳහා උපයෝගී කර ගන්නා මුඛ්‍ය අදහස් සමුදායක් මත ගොඩ නැගූ උපකල්පන, නිගමන,

වටිනාකම්, අනන්‍යතා සහ භාවිතවලින් සමන්විත සිතුවිලි පද්ධතියකි. එය දැනට පවතින සුසමාදර්ශයේ මුඛ්‍ය අදහස සමතික්‍රමණය කළ යුතුවා පමණක් නො ව අදාළ ප්‍රස්තුතයට නව තේරුමක් ද ගෙන ආ යුතු ය.

ඉතිං, සුසමාදර්ශීය වෙනසක් යැයි කිව හැකි මට්ටමේ දේශපාලන පරිවර්තනයක් ඇති කරන්නේ කෙසේ ද? සුසමාදර්ශීය වෙනස්වීම් පිළිබඳ අදහස හඳුන්වා දුන් තෝමස් කුන් ඔහුගේ *Structure of Scientific Revolutions* නම් පොතේ සඳහන් කරන අන්දමට සුසමාදර්ශීය පරිවර්තනයක් හිටි හැටියේ සිදු නො වේ. එයට කලක් ගත විය හැකි ය. එහෙත් ඒ සඳහා වැදගත් ම දෙය වන්නේ තමන් මෙතෙක් විශ්වාස කළ දේවල් තවදුරටත් නිවැරදි නො වන බව මිනිසුන්ට ඒත්තු යන සේ පර්යේෂණ හා විශ්ලේෂණ මඟින් මතු කර ගත් සාක්ෂි ඔවුන් ඉදිරියේ ගෙන හැර තැබීමයි. තෝමස් කුන් මේ සම්බන්ධයෙන් උදාහරණයක් ලෙස ගන්නේ සෞරග්‍රහ මණ්ඩලය විස්තර කිරීමේ දී සම්ප්‍රදායික විද්‍යාව හා නූතන විද්‍යාව ඉදිරිපත් කරන නිගමන අතර ඇති වෙනස යි. ක්‍රි.පූ. 384-322 විසූ ඇරිස්ටෝටල්ගේ කාලයේ සිට 14 වැනි සිය වසේ මැද භාගය දක්වා ම මිනිසුන් විශ්වාස කළේ සෞරග්‍රහ මණ්ඩලයේ කේන්ද්‍රීය වස්තුව පෘථිවිය බව යි. ඒ අනුව සූර්යයා සහ සියලු ග්‍රහ වස්තු පොළොව වටා කරකැවෙන වස්තු ය යන්න එකල සම්ප්‍රදායික විද්‍යා චින්තනය බවට පත් වී තිබුණි. එහෙත් පෘථිවිය ඇතුළු ග්‍රහ වස්තු කක්ෂ ගත ව ඇත්තේ පෘථිවිය වටා නො ව සූර්යයා වටා බව නිකොලොස් කොපර්නිකස් 1543 දී සාක්ෂි සහිතව පෙන්වා දුන්නේ ය. එතැන් සිට අද දක්වා ම නූතන විද්‍යාව පදනම් ව ඇත්තේ කොපර්නිකස්ගේ සූර්ය කේන්ද්‍රීය න්‍යාය මඟින් හඳුන්වා දුන් ඒ සුසමාදර්ශීය වෙනස මත යි. සාමාන්‍ය තත්ව යටතේ විටින් විට එක් වෙන කරුණු සහ න්‍යාය මත විද්‍යාත්මක දැනුම ක්‍රමික ව තහවුරු වෙනවා වෙනුවට විප්ලවකාරී විද්‍යාවක් හෙවත් විද්‍යාවේ සුසමාදර්ශීය වෙනසක් බොහෝ විට ඇති වන්නේ කලින් ප්‍රතික්ෂේප කළ හෝ නො සලකා හරින ලද සාධක නව පර්යාලෝකයක් තුළ නැවත අවධානයට ලක් කිරීමෙන් බව තෝමස් කුන් පැවසීය.

යුක්ති සහගත සමාජයක් ගොඩ නැගීමේ ප්‍රයත්න මීට පෙර ද තිබිණි. ඉන් සමාජවාදී යැයි හඳුන්වන ලද ඇතැම් ඒවා සමාජ විෂමතා අවම කිරීම ප්‍රකාශිත අරමුණ කරගත් නමුත් වැඩිකල් නො යා මං මුලාව ගොස් මහජනතාව අතර අපකීර්තියට ලක් විය. එවැනි අසාර්ථක ප්‍රයත්නවල දක්නට ලැබුණු පොදු ලක්ෂණය වූයේ ඒ සියල්ල බලය අත්පත් කර ගැනීම මුඛ්‍ය කරගත් ප්‍රයත්න වීම යි. ඒ නිසා නව දේශපාලන සුසමාදර්ශයක් බිහි කළ හැකි කතිකාවක දී 'බලය අත්පත් කර ගැනීමට' විකල්ප වූ 'යුක්තිය ඉටු කර ගැනීමේ' සමාජයීය දේශපාලන ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන වෙනස් ආකාරයක මුඛ්‍ය අදහස් පද්ධතියක් අප ඉස්මතු කර ගත යුතු ය. එම අදහස් ගැඹුරින් සංවිචාරණයට *(deliberation)* ලක් කිරීමෙන් යුක්තිය අත්පත් කර ගැනීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? දේශපාලන බලය ස්වාමිත්වකාමී අත්පත් කර ගැනීම් මඟින් නො ව සමාජයේ සංවිචාරණීය අභිමතය අනුව නිරන්තර මහජන සහභාගීත්වය පදනම් කොට මෙහෙයවෙන දෙයක් බවට පත් කළ නො හැකි ද? බංකොලොත් ව්‍යාජ නියෝජන ක්‍රමවලින් මුලා නො වී එම අදහස් පාදක කරගත් අරමුණු කරා යෑමට අවශ්‍ය කරන ව්‍යුහාත්මක දේශපාලන හා ආර්ථික වෙනස්කම් කෙබඳු විය යුතු ද? යන්න පිළිබඳ ව නිශ්චිත අදහස් ද ජනනය කර ගත හැකි ය. එහෙත් එම අදහස් පවතිනා දේශපාලන හා ආර්ථික ක්‍රමය නිසා උද්ගත වී ඇති ප්‍රශ්නවලට උචිත පිළිතුරු සැපයීමට හැකි ඒවා ද විය යුතුය.

බලය අත්පත් කර ගැනීමේ දේශපාලනය වෙනුවට යුක්තිය ඉෂ්ට කර ගැනීමේ දේශපාලනය ආදේශ කළ යුතු ය යන අදහස මෑතක දී මුලින් ම ඉදිරිපත් කළේ ඇලන් බදියු විසින් ඔහුගේ '*In Praise of Politics*' නමැති කෘතියෙනි. ප්‍රකට ප්‍රංශ බුද්ධිමතෙකු වන ඇලන් බදියු පවසන අන්දමට බලය ගැන කරදර වීමට වඩා මේ අවස්ථාවේ දී වැදගත් වන්නේ කෙබඳු ජනසමාජයක් බිහි විය යුතු ද යන්න පිළිබඳ ව හොඳ උපාය මාර්ගික දැක්මක් ඇති ජනතාවක්

ඇති කර ගැනීමයි.[1] ප්‍රායෝගික ලෙස බැලූ විට දේශපාලනය යනු තමන් ජීවත් වන ජන සමාජයේ අනාගතය කෙබඳු විය යුතු ද යන්න පිළිබඳ පැහැදිලි දැක්මක් ඇති ජනතාවක් සහ එවැනි සමාජයක් බිහි වීමේ හැකියාව අතර ඇති සම්බන්ධතාව පිළිබඳ ප්‍රකාශනය බව බදියු පවසයි. එකී උපාය මාර්ගික දැක්ම පවතින දේශපාලන සුසමාදර්ශය විස්ථාපනය කිරීමෙන් බිහි කර ගත යුත්තකි. ඒ දැක්ම කල් තියා ගොඩනගා ගැනීමට නො හැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් රටවල මහජන නැගිටීම් අර්ථ විරහිත ලෙස අවසන් වූ අතර තවත් රටවල ජනතාවට පටු ජාතිකවාදී ඉන්ද්‍රජාලිකයන් සරණ යෑමට සිදු විය. මෙය අපට පමණක් සීමා වූ ගැටලුවක් නො වේ. ඒ නිසා නව දේශපාලන සුසමාදර්ශයක් බිහි කිරීම යනු ගෝලීය පර්යාලෝකයකින් විමසිය යුතු කරුණකි.

ශ්‍රී ලංකාව ද ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී යැයි සැලකෙන බොහෝ රටවල දැනට පවතින දේශපාලන සුසමාදර්ශයේ නිශ්චිත මුඛ්‍ය ලක්ෂණ දෙකක් තිබේ. ඉන් එකක් වන්නේ බලය ඉල්ලන කණ්ඩායම් අතරින් ආණ්ඩු බලය අල්ලා ගන්නා කණ්ඩායම කලින් කලට පැවැත්වෙන මැතිවරණ මඟින් තෝරා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය වසයෙන් සැලැකීමයි. අනෙක බලය අල්ලා ගත් පාර්ලිමේන්තු කණ්ඩායමේ වගකීම 'හෝමෝ එකොනොමිකස් *(Homo Economicus)*'[2] හෙවත් "මිනිසා යනු ස්වාර්ථය තකා කටයුතු කරන තාර්කික ආර්ථික සත්වයෙකි, යන ධනවාදී ආර්ථික චින්තනය මත ආර්ථිකය මෙහෙයවීමට ආධාර කිරීම යි.

---

1 Badiou, Alain with Lancelin, Aude, (2019) *In Praise of Politics,* Medford: Polity Press, p.12

2 19 වන සියවසේ ජීවත් වූ ඉංග්‍රීසි ජාතික දාර්ශනිකයෙකු වූ ජෝන් මිල්ටන්ගේ යෙදුමකින් ජනිත වූව කැ'යි සැලකෙන "හෝමෝ එකොනොමිකස්" යන යෙදුමෙන් අදහස් කෙරෙන්නේ මනුෂ්‍යයන් යනු නිරන්තරයෙන් ම සිය ස්වාර්ථකාමී අරමුණු ප්‍රශස්ත ලෙස ඉටු කර ගැනීමට තාර්කිකව වෑයම් කරන සත්ව විශේෂයක් බවයි. මේ ඒකාකෘතික ප්‍රතිරූපය ප්‍රතික්ෂේප විය යුත්තේ ඇයි යන්න 12 වැනි පරිච්ඡේදයේ දී සවිස්තරව සලකා බලමු.

ඒ අනුව බලය අත්පත් කර ගන්නා කණ්ඩායම්වල යුතුකම වසයෙන් සැලකෙන්නේ දේපළවල ස්වාමිත්වකාමි *(possessive)* පුද්ගලික අයිතිය පදනම් කොට ප්‍රාග්ධන සමුච්චයනය හෙවත් ධනය ඒකරාශි වීම පිණිස නිෂ්පාදන මාර්ග හා සම්පත් නිර්බාධක ව උපයෝගී කර ගැනීමට පහසුකම් සපයනු ලැබීමයි. ඒ නිසා ඇති වෙතැ'යි විශ්වාස කරන ආර්ථික වර්ධනයක ප්‍රතිලාභ පහළට ගලා යෑම මගින් සමස්ත සමාජය ද ප්‍රගතිය කරා දක්කනු ඇතැ'යි යන විශ්වාසය ද පවතින දේශපාලන සුසමාදර්ශය තුළ අඩංගු වන මුඛ්‍ය උපකල්පනයකි. ඒ අනුව ආර්ථිකයේ වර්ධන වේගය වැඩි වීම ප්‍රගතියේ දර්ශකයක් ලෙස සැලකේ. නව දේශපාලන සුසමාදර්ශයක් බිහි කිරීමේ හැකියාව විමසා බැලීමේ දී බලය අත්පත් කර ගැනීම මෙන් ම ස්වාර්ථකාමී ආර්ථික එළඹුම යන අංග දෙකේ ම ඵල විපාක හා ඒවායේ දුර්ගුණ පිටු දැකිය හැකි විකල්ප මොනවා දැයි විමසා බැලීම ප්‍රයෝජනවත් ය.

පවතින දේශපාලන සුසමාදර්ශය පිළිබඳ ව අපට තවදුරටත් විශ්වාසයක් නැත්තේ ප්‍රජාතන්ත්‍රවාදය යන නමින් විකෘතියක් තෝරා ගැනීමට සිදුවීමෙන් හෙම්බත් වීම නිසා ම පමණක් නො වේ. ධනවාදී ආර්ථික ක්‍රමය තුළ එම විකෘතියට බෙහෙවින් තුඩු දුන් නවලිබරල්වාදී *(neoliberal)* ආර්ථික එළඹුමේ ඵලයක් ලෙස තීව්‍ර වී ඇති සමාජ විෂමතා, බදු හා මූල්‍ය වංචා, කොටස් වෙළඳපොළ ජාවාරම්, පොදු දේපළ මංකොල්ල කෑම, වාර්ගික ධ්‍රැවීකරණය, සමාජ අසහනය සහ තෘෂ්ණාධික රේඛීය වර්ධනය නිසා පෘථිවි සම්පත් ක්ෂය වීම වැනි අත්දැකීම් ඊට හේතු වෙයි. මේ නවලිබරල්වාදී ආර්ථික එළඹුමේ දේශපාලන දැක්ම නිසා සිදු වූ හානිය අපි ඉදිරි පරිච්ඡේද තුනකින් සවිස්තර ව සාකච්ඡා කරමු. දේශපාලනයේ සුසමාදර්ශීය වෙනස මඟින් ම පිළිබිඹු වන නව ආරක ආර්ථික චින්තනයක් අවශ්‍ය වන්නේ එම හානිය පූරණය කිරීම සඳහා ය.

ඒ හැර තවමත් බරපතළ අවධානයකට ලක් වී ඇති බවක් නොපනෙන ගෝලීය උණුසුම ඉහළ යෑම නිසා ඇතිවීමට නියමිත

තීරණාත්මක අර්බුදය පවතින දේශපාලන සුසමාදර්ශය තුළ ඵලදායක ලෙස ආමන්ත්‍රණය කිරීම ද සැලකිය යුතු අභියෝගයක් වී තිබේ. ගෝලීය උණුසුම වැඩි වීම සහ අක්වෙරළ ගිණුම් උපයෝගී කර දැවැන්ත ලෙස බදු වංචා කිරීම මගින් සමාජීය වගකීම පැහැර හැරීම වැනි ඇතැම් ගැටලු පවතින දේශපාලන සුසමාදර්ශයේ පදනම වන ජාතික රාජ්‍ය නමැති පාලන ඒකකය තුළ පමණක් විසඳිය හැකි ඒවා නො ව ගෝලීය සහයෝගිතාව මත විසඳිය යුතු ඒවා ය. ගෝලීය මට්ටමින් ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට සිදුවීම කිසියම් දුරකට කෝවිඩ්-19 වසංගතය අපට මතක් කර දුන්නේ ය. තවමත් ඇති තරම් මහජන අවධානයට ලක් කර නොමැති ගෝලීය උණුසුම පිළිබඳ ප්‍රශ්නය ඊටත් වඩා ගෝලීය සහයෝගිතාවක් ඉල්ලා සිටින්නකි.

ගෝලීය උණුසුම වැඩි වීම තීරණාත්මක කඩයිම් ලක්ෂ්‍ය ඉක්මවා යෑම නතර කර ගැනීමට ඉදිරි දස වසර තුළ අපට නො හැකි වුව හොත් අප ජීවත් වන කිලෝමීටර් 10ක් පමණ තුනී වූ පෘථිවි වායුගෝලය තුළ සිදු විය හැකි බරපතළ වෙනස්කම් අපේ පැවැත්මට ඉමහත් තර්ජනයක් විය හැකි ය. ඒ නිසා ඇති වෙන අත්‍යන්ත දේශගුණික වෙනස්කම්, බව භෝග විනාශය, ජල හිඟය, බල ශක්ති අර්බුදය, නියඟ, ලැව්ගිනි, සුළි කුණාටු, ගංවතුර, සාගත සහ වසංගත, විතැන් වෙන ජන සන්නිපාත, සාගර ජල මට්ටම ඉහළ යෑම නිසා දූපත්වලට සහ වෙරළාසන්න නගරවලට සිදු වන හානි වැනි අස්ථායීකාරක ඵල විපාක සමාජ වියවුල්වලට පමණක් නො ව ඇතැම් විට ප්‍රචණ්ඩ යුද්ධවලට පවා හේතු විය හැකි ය. මානව ක්‍රියාකාරකම් නිසා වැඩි වෙන කාබන් ඩයොක්සයිඩ් වායුවෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අවශෝෂණය වන්නේ හරිත ශාක පත්‍ර තුළ ප්‍රභාසංස්ලේෂණය නමින් සිදු වන ආහාර නිපදවීමේ ක්‍රියාවලිය මගිනි. ප්‍රභාසංස්ලේෂණයේ දී සිදුවන්නේ කාබන් ඩයොක්සයිඩ්, ජලය සහ ඛනිජ ලවණ සූර්යාලෝකය මගින් ඔක්සිජන් සහ ශක්ති ජනක කාබනික සංයෝග බවට පරිවර්තනය කරනු ලැබීමයි. ඒ හැර සාගරය තුළ හා මහ පොළොවේ කාබනික ද්‍රව්‍ය වසයෙන් තැන්පත්

වීම ද කාබන් ඩයොක්සයිඩ් වායුවේ වායුගෝලීය සංයුතිය පාලනයට උපකාරී වේ.

දැනටමත් නැවත වන වගාව වැනි ඇතැම් සාම්ප්‍රදායික පියවර මඟින් කාබන් ඩයොක්සයිඩ් විමෝචනය පාලනය කිරීමට දරන සීමිත දේශීය ප්‍රයත්න ගැන ලොව පුරා වාර්තා වී තිබේ[3]. ගෝලීය මට්ටමෙන් ගත් විට මෑත කාලයේ දී ශාක ගහණය හෙක්ටෙයාර් මිලියන 2.24 කින් වැඩි වී ඇති බවට 2018 දී මේරිලන්ඩ් විශ්වවිද්‍යාලය කළ සමීක්ෂණයකින් හෙළිදරව් වීම මෙවැනි ප්‍රයත්නවල ප්‍රතිඵල විය හැකි ය. එහෙත් ජාතික මට්ටමින් ගත් විට ප්‍රධාන වනාන්තරවලට *(primary forests)* වෙන් වී ඇති ප්‍රමාණය රක්ෂිත වසයෙන් දිගින් දිගට ම පැවතීම මේ මඟින් සහතික කළ නො හැකි ය. කුඩා ප්‍රමාණයේ නැවත වන වගාවලින් ප්‍රධාන වනාන්තර පද්ධතිවලින් ඉටු වන පාරිසරික මෙහෙය කිසි සේත් ම සපුරා ගත නො හැකි ය[4]. ඒ නිසා වඩාත් ඵලදායී වන්නේ විශාල වසයෙන් කාබන් ඩයොක්සයිඩ් වායුගෝලයට මුසු කරන ඛනිජ ඉන්ධන වෙනුවට නිර්කාබනික විකල්ප බලශක්ති ප්‍රභව යොදා ගැනීම මඟින් කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අඩු කර ගැනීමයි.

එහෙත් ඒ සමඟ ම අපේ තෘෂ්ණාධික පාරිභෝගික සංස්කෘතිය හා ඊට ම ගැළපෙන ලෙස සම්පත් අපතේ යවන නාස්තිකාරී රේඛීය *(linear)* නිෂ්පාදන ක්‍රමය ද නිසා නිපදවෙන දැවැන්ත කාබනික අපද්‍රව්‍ය ප්‍රමාණය පරිසරයට මුදා හැරීම ද අවම කර ගත යුතු ය. නාගරික ප්‍රදේශවල බිහි වෙන අපද්‍රව්‍යවලින් 70% ක් ම කාබනික අපද්‍රව්‍යයි. අසාධිත *(untreated)* කාබනික කසල බැහැර කෙරෙන ගොහොරුවලින් ද කාබන් ඩයොක්සයිඩ්, මීතේන් ඇතුළු හරිතාගාර

3 Sri Lanka submitted a Nationally determined Contribution (NDC) to the UNFCCC in September 2016, which includes a target to increase the national forest cover from 29.7% to 32% by 2030. - Sri Lanka's Forest Reference Level submission to UNFCC, 2017

4 Perera, Anoma (2018) 'Sustainable Management of Tropical Humid Forests of Sri Lanka in the Face of Climate Change' in Sri Lanka Forester, N.D.R. Weerawardane et. al (eds.), Volume 39, Forest Department, Colombo, pp. 14-19

වායු අධික ව නිපදවේ. බල ශක්ති භාවිතය සහ අපද්‍රව්‍ය නිෂ්කාශනය යන දෙකෙන් ම ඇතිවෙන හරිතාගාර වායු ජනනය හා පාරිසරික හානියෙන් මිදීමට නම් දැනට පවතින ගන්න-හදන්න-ඉවත දමන්න යන ක්‍රමයට කටයුතු සිදු වෙන රේඛීය නිෂ්පාදන ක්‍රමය වෙනුවට සම්පත් ප්‍රතිචක්‍රීකරණයට *(recycling)* මුල් තැන දෙන නිෂ්පාදන ක්‍රමයක් ආදේශ කළ යුතු ය. එසේ නොමැති ව හුදෙක් අතරින් පතර කෙරෙන නැවත වන වගාවකින් පමණක් අනාගතයේ ඇතිවීමට නියමිත ව්‍යසනවලට ඵලදායක ලෙස මුහුණ දීමට අපට නො හැකි වනු ඇත.

එනිසා ඉවක් බවක් නැති ව ගෝලීය මධ්‍යම පංතියේ සුඛවිහරණය සඳහා පෘථිවි සම්පත් අපතේ යවන රේඛීය ආර්ථික නිෂ්පාදන විධි ක්‍රමය වෙනුවට, අප ගොඩ නගන නව දේශපාලන සුසමාදර්ශය තුළ ජීවී පරිසරය රටක සමස්ත ආර්ථිකයේ ම කොටසක් ලෙස සලකන ප්‍රතිජනනීය *(regenerative)* චක්‍රීය ආර්ථික නිෂ්පාදන ක්‍රමවේදයක් *(Circular Economy)* හඳුන්වා දීම සඳහා කටයුතු යෙදීම අත්‍යවශ්‍ය වන්නේ ය. රේඛීය ආර්ථිකයක් වෙනුවට චක්‍රීය ආර්ථිකයක් ආදේශ කිරීමේ හැකියාවන් පිළිබඳ ව 21 වැනි පරිච්ඡේදයේ සිට සවිස්තර ව සාකච්ඡා කරමු.

මේ සියලු කටයුතු හුදෙක් ජාතික රාජ්‍ය දේශපාලනය තුළ පමණක් සාක්ෂාත් කර ගත හැකි ඒවා නො වේ. එහෙත් ජාතික රාජ්‍ය ඉක්මවා යන විසඳුම් සෙවීමේ දී ද ඒ සඳහා අප ජාතික මට්ටමෙන් අනුගත විය යුතු සංවිධාන ක්‍රමය හා ආණ්ඩුකරණය *(governance)* කෙබඳු විය යුතු ද යන්න විමසීම වැදගත් ය. ඒ නිසා මේ කතිකාව මෙතෙක් අප අත්දැක ඇති ආණ්ඩුකරණයේ අසාර්ථක ප්‍රජාතන්ත්‍රවාදී වරය විචාරශීලී ව විමසීමෙන් ඇරඹීම ප්‍රයෝජනවත් විය හැකි ය.

# - 2 -

## ප්‍රජාතන්ත්‍රවාදය - පරමාදර්ශය හා විකෘතිය

නූතන අර්ථයෙන් ගත් විට ප්‍රජාතන්ත්‍රවාදයක වැදගත් ම ගුණාංග ලෙස සැලකෙන්නේ මහජනතාවගේ දේශපාලන සමානාත්මතාව, මහජන සහභාගිත්වය සහ ආණ්ඩුකරණයේ වග වීමයි[5]. දේශපාලන සමානාත්මතාව යනුවෙන් හැඳින්වූයේ දේශපාලනය කිරීමේ අයිතිය සමාජයේ හැම සාමාජිකයෙකුට ම එක හා සමානව හිමි වෙන බව යි. මහජන සහභාගීත්වය යන්න මැතිවරණයට පමණක් සීමා වූවක් නොවේ. සෘජු ව හෝ සංවිධිත ව හෝ දේශපාලන කටයුතු වලට සහභාගි වීම, විසම්මුතිය, අදහස් ප්‍රකාශ කිරීම, ආණ්ඩු කිරීම සංනිරීක්ෂණයට දායක වීම, රැස්වීම් පැවැත්වීම, උද්ඝෝෂණ හා වැඩ වර්ජනය කිරීම ආදිය ද මහජන සහභාගීත්වයේ විවිධ ස්වරූපයෝ ය.

කෙසේ වෙතත් ඉංග්‍රීසින් විසින් පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දුන් දා සිට ප්‍රජාතන්ත්‍රවාදය තේරුම් කරන ලද්දේ රාජ්‍යයේ ස්වරූපය පිළිබඳ ආකෘතියක් ලෙස මිස සමාජයක සාමාජිකයන්ට සාමූහික ව ජීවත් වීම සඳහා උපයෝගී වන සහභාගිත්ව දේශපාලන යන්ත්‍රණයක් ලෙස නො වේ. එංගලන්තයේ පළමුවැනි එඩ්වඩ් *(1272-1307)* රජුගේ සමයේ ඉංග්‍රීසි පාර්ලිමේන්තුව පිහිටුවන ලද්දේ මූලික වසයෙන් ම රජුට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස බදු පැණවීමේ දී එම

5 Schmitter, Philippe C (2020), 'Democracies' in Sage *Handbook on Political Science,* Berg-Schlosser Dirk (eds.), London: Sage, p. 730

බදු අය කර දීම පැවරෙන රදළ නායක කාරකාදීන්ගේ ද කැමැත්ත විමසිය යුතු ය යන එකඟත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ය[6]. බදු ආදායමකින් තොර ව රජයක් පවත්වා ගෙන යා නො හැකි ය. ඒ නිසා පාර්ලිමේන්තුව රාජාණ්ඩුවේ අත්‍යවශ්‍ය ධනෝපායන මෙවලමක් විය. කලක දී සාමිවරයන් සහ සාමාන්‍යයන් වසයෙන් වෙන වෙනම රැස්ව ව්‍යවස්ථා හා නීති අනුමත කිරීම කළ ද පාර්ලිමේන්තුවේ මූලික භූමිකාව වූයේ රජුට අවශ්‍යය අරමුදල් සැපයීම යි.

ප්‍රජාතන්ත්‍රවාදයේ බළකොටුව ලෙස බොහෝ විට හඳුන්වන ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත්කරුවන් වඩා සැලකිල්ලක් දැක්වූයේ හොඳ සමූහාණ්ඩු ක්‍රමයක් පිහිටු විය යුත්තේ කෙසේ ද යන්න ගැන මිස ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පිළිබඳ ව නො වන බව හෙලන් ලැන්ඩ්මොර් පෙන්වා දෙයි.[7] ප්‍රජාතන්ත්‍රවාදය කලහකාරයන්ගේ පාලනයකට සම කළ ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ මතය සමඟ බොහෝ ඇමෙරිකානු ව්‍යවස්ථා සම්පාදකයන් එකඟ වූ බව පෙනේ. විශේෂයෙන් ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රමුඛ කෙටුම්පත්කරුවෙකු වූ ජේම්ස් මැඩිසන් ට අවශ්‍ය වූයේ රාජාණ්ඩුවාදී සුළුතරයකට මෙන් ම පීඩාකාරී බහුජන ආධිපත්‍යකට ද නතු නො වෙන නව ආරක සමූහාණ්ඩු ක්‍රමයකි. ඒ සඳහා ඔහු අනුදත් ක්‍රමයට විශේෂ ලක්ෂණ කිහිපයක් ම අයත් විය. ඉන් පළමුවැන්න වූයේ නියෝජන ක්‍රමයක් මඟින් ලිබරල් මතධාරී ඇමරිකන් ඉඩම් හිමි ප්‍රභූවරයන්ගේ අභිමතය නව ආණ්ඩුව තුළ බල ගැන්වීමයි. නියෝජන ක්‍රමය මඟින් බහුතර මහජනතාවගේ 'අවිශිෂ්ට මතවාද' ශුද්ධ පවිත්‍ර කර මැඩපවත්වා ගත හැකි බව මැඩිසන්ගේ අදහස විය. ඒ හැර ෆෙඩරල් ක්‍රමය, ද්වි මණ්ඩල මන්ත්‍රණ සභා, ජනාධිපති සතු නිෂේධ බලය සහ අධිකරණය සතු සන්නිරීක්ෂණ බලය ද බහුතරයේ ආධිපත්‍ය ඉස්මතු වීම වැළැක්වීම

6 Vieira, Mónica Brito and Runciman, David (2008) *Representation,* Cambridge: Polity Press, pp.15-16

7 Landmore, Helen (2020) *Open Democracy: Reinventing Popular Rule for the 21st Century,* Princeton: Princeton University Press, p. 3

පිණිස ඇමෙරිකානු ව්‍යවස්ථා සම්පාදකයින් විසින් යොදා ගනු ලැබූ අනෙකුත් වැදගත් උපාය මාර්ග වෙයි.

මැඩිසන් වඩාත් සැලකිලිමත් වූයේ ඉපැරණි විවෘත ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන්ට වෙනස් ව මහජනතාව සාමූහික ව ආණ්ඩුකරණයේ කොටස්කරුවන් වීම වැළැක්වීම කෙරෙහි ය[8]. ඒ අනුව ඇමෙරිකානු ආණ්ඩුක්‍රමයේ සමාරම්භකයින් ඔවුන්ගේ නව සමූහාණ්ඩුවේ සුවිශේෂ ලක්ෂණය ලෙස හුවා දැක්වූයේ එය මහජන බලය මත රඳා පවතින ආණ්ඩුවක් නො ව තෝරා පත්කර ගත් ප්‍රභූන්ගේ බලය මත ක්‍රියාත්මක වන ආණ්ඩුවක් ලෙස ය. එය ආණ්ඩුකරණය අත්පත් කර ගැනීම සඳහා මහජන කැමැත්ත ලබා ගැනීමක් මිස ආණ්ඩුකරණය සඳහා මහජන සහභාගිත්වය අපේක්ෂා කළ ආණ්ඩුක්‍රමයක් නො වී ය.

එහෙත් නියෝජනය පිළිබඳ ව මහජනයා අනුදත් මතය මැඩිසන් වැනි ආණ්ඩුක්‍රම කෙටුම්පත් කමිටු සාමාජිකයන් තුළ පැවති මතය ම නො වී ය. ඇමෙරිකානු විප්ලවය *(1765-1791)* පිළිබඳ ඉතිහාසඥයෙකු ලෙස සැලකෙන ගෝර්ඩන්. එස්. වුඩ් පෙන්වා දෙන අන්දමට නියෝජිතයන් පත් කිරීම නිසා සිය දේශපාලන ක්‍රියාකාරිත්වය අහෝසි වෙන බවක් පොදු ඇමෙරිකානුවෝ කිසි සේත් ම පිළිනොගත්හ. *The American Revolution: A History* නම් සිය කෘතියේ වුඩ් ඒ බව මෙසේ සඳහන් කරයිඃ

> **"නිදහස ලැබීමෙන් පසු ගත වූ දශකය තුළ ඇමෙරිකානු දේශපාලන සංස්කෘතිය බෙහෙවින් පරිවර්තනය විය. පැහැදිලි ව පෙනෙන පරිදි ඇමෙරිකානුවන් පරමාධිපත්‍යය සහ නීති සම්පාදනයේ අධිකාරය යටත් විජිත රජයේ ආයතනවලින් පොදු ජනතාව වෙත මාරු කර තිබුණි. ඉංග්‍රීසින් මෙන් නො ව සිය නියෝජිතයන් තෝරා පත් කර ගැනීම නිසා තමන්ගේ දේශපාලන පැවැත්ම අහෝසි වන බව පිළිගැනීම ඇමෙරිකානු ජනතාව 1776 සිට ම ප්‍රතික්ෂේප කර තිබුණි. "දොරින් පිට සිටින"** *(out of door)* **අය ලෙස සැලකුණු පොදු ජනතාව ආණ්ඩුවේ සියලු ම නිල ආයතනවලට බැහැරින් ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වූහ. 1780**

8 Vieira, Mónica Brito and Runciman, David (2008) *Representation,* Cambridge: Polity Press, p 38

ගණන්වල දී ඇමෙරිකානු ජනතාව සිය දුක්ගැනවිලි ප්‍රකාශ කිරීමට හා දේශපාලන අරමුණු ඉටු කර ගැනීමට නොයෙකුත් ආකාරයේ කොමිටි, සම්මන්ත්‍රණ සහ නිල නො වන ආයතන සංවිධානය කළහ. ඒ මඟින් ඔවුහු ඇමෙරිකානු විප්ලව සමයේ යොදා ගත් දේශපාලන භාවිතය ඒ ආකාරයෙන් ම පවත්වා ගෙන ගියහ. මිල පාලනය, අධික ලාභ ගැනීම වැළැක්වීම සහ ටෝරිවරුන්ට (යටත්විජිතවාදීන්ට) දඬුවම් කිරීම ආදිය ඉටු කර ගැනීමේ ලා නව ඇමෙරිකානු රජය බොහෝ විට අපොහොසත් විය. එහෙත් සුපරීක්ෂාකාරී ව සිටීමෙන් සහ නොයෙක් ආකාරයේ මහජන ක්‍රියාන්විත දියත් කිරීම මඟින් කඩිනමින් හා කාර්යක්ෂම ව ඒවා ඉටු කර ගැනීමට මහජනතාවට හැකි විය. හැම තැනක දීම "නියම මහජන නියෝජනය" පිළිබඳ තර්කය තවදුරටත් පුළුල් කරමින් ආණ්ඩුවේ ආයතනවලට සෘජු ව උපදෙස් දීමට සහ ඒවා මහජන සන්නිරීක්ෂණයට නතු කිරීමට මහජනතාව කටයුතු කළහ. බ්‍රිතාන්‍යයන් හා ඔවුන්ගේ පාර්ලිමේන්තුව අතර පැවති නියෝජන සම්බන්ධතාව මෙන් නො ව එකල ඇමෙරිකානුවෝ කිසිදු දේශපාලන ආයතනයකට හෝ සියලු දේශපාලන ආයතනවල එකතුවකට හෝ තමන් සතු පූර්ණ හා අවසාන පරමාධිපත්‍ය බලය යටත් නො කළහ."[9]

ගෝර්ඩන් එස් වුඩ්ගේ මේ නිරීක්ෂණය ඉතා වැදගත් ය. දිගු කලක් තිස්සේ ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති නීත්‍යනුකූල වර්ණ භේදවාදය අභියෝගයට ලක් කරමින් 1954-1968 කාලයේ දී වීදි බට ඇමෙරිකානු සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය සහ ඇමෙරිකාව වියට්නාම් යුද්ධයට මැදිහත් වීමට එරෙහිව 1965 දී මහජන සහභාගිත්වය උච්ච වූ යුධ විරෝධී ව්‍යාපාරය වැනි මහජන ක්‍රියාන්විත මේ සම්ප්‍රදායේ ගති ලක්ෂණය. බෙහෙවින් සාර්ථක වූ එම ව්‍යාපාර දෙකම මහජන පරමාධිපත්‍යය නියෝජිතයන්ට පවරා දීමට සූදානම් නැති එහෙත් බලය වෙනුවට යුක්තිය අත්පත් කර ගැනීමට සංවිධානය වූ ඒවා වසයෙන් සැලකිය හැකි ය. බලය අත්පත් කර ගැනීමේ දේශපාලනය වෙනුවට යුක්තිය අත්පත් කිරීමේ දේශපාලනය ආදේශ කිරීමේ දී ඊනියා මහජන නියෝජිතයන්ගේ අත්තනෝමතික අභිමතය වෙනුවට ජන සංවිචාරණය මගින් රාජ්‍ය විචාරණය කළ හැකි අන්දමේ ව්‍යුහාත්මක වෙනස්කම් ආණ්ඩුක්‍රමයට ඇති කළ යුතු ය.

9 Wood, Gordon S. (1900) *The American Revolution: A History.* New York: Modern Library; Reprint edition, p. 154 (KE)

කෙසේ වෙතත් රාජ්‍යයේ ආකෘතියක් ලෙස සැලකූ විට නොයෙක් ආකාරයේ පාර්ලිමේන්තුවලට මහජනයා විසින් තෝරා පත් කරනු ලබන ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රම ලෙස අඟවා සිටීමට හැකි ව තිබේ. එහි දී තර්කනය වන්නේ මැතිවරණයක දී මහජනයා අතරින් බහුතරය විසින් තෝරා ගනු ලබන මහජන නියෝජිතයන් නීති සම්පාදකයන් ලෙසත් රාජ්‍යයේ කළමනාකරණය හොබවන විධායකයන් ලෙසත් කටයුතු කිරීමට මහජනයා විසින් තෝරා පත් කරනු ලබන බවයි.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මේ සුලබ සංකල්පයේ ප්‍රවර්ධකයන්ට අනුව රජය ප්‍රජාතන්ත්‍රවාදී වන්නේ එසේ මැතිවරණයකින් තෝරා පත් කර ගන්නා මහජන නියෝජිතයන් මඟින් රජයට නිරතුරුව ම මහජන මතයට කන්දීමට හැකි වන නිසා ය. අනෙක් අතට තමන් විසින් තෝරා ගනු ලැබූ මහජන නියෝජිතයන් කටයුතු කරන ආකාරය ගැන තමන්ට පැහැදීමක් නැති නම් ඊළඟ මැතිවරණයක දී ඔවුන් වෙනුවට වෙනත් අය පත්කර ගැනීමට මහජනතාවට ඉඩ ලැබෙන බව ද මේ ප්‍රවර්ධකයෝ අපට මතක් කර දෙති. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු හුදෙක් දේශපාලන බලය අත්පත් කර ගන්නා කණ්ඩායම කවුරුන්ද කියා මැතිවරණයෙන් තීරණය කිරීම නම් අපට ඒ කියන වර්ගයේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් අඩුවක් නැත.

එහෙත් අප අත්විඳින ඒ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාජ බවට එක් හේතුවක් වන්නේ ද හුදෙක් මැතිවරණයක දී අපේ ඡන්දය යදින අපේක්ෂකයන් අතරෙන් කිසියම් පිරිසක් නියත වශයෙන් ම නිශ්චිත කලකට තෝරා පත්කර ගත යුතුය කියා එකී ප්‍රජාතන්ත්‍රවාදය ම අපට බලපෑම් කිරීමයි. අනෙක් අතට මෙසේ තෝරා ගැනෙන "මහජන නියෝජිතයන්" බොහෝ විට බලය අත්පත් කර ගැනීමෙන් පසු ප්‍රමුඛත්වය දෙන්නේ අපට දුන් පොරොන්දුවලට නො ව සැබවින්ම දේශපාලනය මෙහෙයවන ධනය සමුච්චයනය කරන පෙළැන්තියේ අවශ්‍යතා පිරිමැසීම සඳහා වීමයි. එසේ අපේ සැබෑ අවශ්‍යතා නියෝජනය කිරීම පැහැදිලිව ම නො සලකා හරින විට

අභිමත පරිදි ඔවුන්ගේ මහජන නියෝජන භූමිකාව අවලංගු කිරීමට පවතින දේශපාලන සුසමාදර්ශයට අනුව අපට ඉඩක් නැත.

ඒ අනුව මැතිවරණ ක්‍රමය මඟින් ව්‍යවස්ථාදායකයට හෙවත් පාර්ලිමේන්තුවකට 'මහජන නියෝජිතයන්" තෝරා ගැනීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මකවෙතැ'යි යන ඇදහිල්ල තව දුරටත් වලංගු නො වන බව අප ඇති තරම් අත් දැක ඇත. මේ ක්‍රමයේ අසාර්ථකත්වය මූලික ව දෙයාකාරයකින් දැකිය හැකි යඃ

1. මැතිවරණ පැවැත්වෙන විකෘති ක්‍රමවේදයේ දූෂිත බව
2. තෝරා ගැනෙන නියෝජිතයන්ගේ දුෂ්චර්යාව

මේ විකෘතියට බලපා ඇති මූලික කරුණු අතර මැතිවරණ ව්‍යාපාර සඳහා ආයෝජනය කරන මුදල් සපයා ගන්නා ආකාරය, සද්භාවී දේශපාලනයකට නොගැළපෙන අපේක්ෂකයන්ට දේශපාලන පක්ෂවල අනුග්‍රහය ලැබීම සහ පක්ෂග්‍රාහී ජනමාධ්‍ය ආවරණය යන සාධක තුන ප්‍රධාන වේ.

මැතිවරණ ව්‍යාපාර සඳහා විශාල මුදලක් අවශ්‍ය වේ. එම අවශ්‍යතාව බොහෝ විට සපුරන්නේ සමුච්චයනය වන නොහොත් ඒකරාශි වන ධනයකට හිමිකම් ඇති ධන හිමියන් මගිනි. ඡන්ද ක්‍රමය සම්බන්ධයෙන් මුදල් බලය බලපාන්නේ කෙසේ ද යන්න මැතිවරණ නීති හා ඒවා ක්‍රියාත්මක කරන ආකාරය අනුව රටින් රටට වෙනස් විය හැකි වුණත් ඡන්දයෙන් පත් වන රජය කෙරෙහි තම බලපෑම පවත්වා ගැනීම පිණිස මුල් පෙළේ ව්‍යාපාරිකයෝ, ජාවාරම්කාරයෝ සහ ධන හිමියෝ කෙසේ හෝ ප්‍රධාන පක්ෂවලට මැතිවරණ අරමුදල් සැපයීමට උත්සුක වෙති. මේ නිසා ධන හිමියන් ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් නැති පක්ෂ සහ අපේක්ෂක කණ්ඩායම් මැතිවරණයට පිවිසෙන්නේ ම අවාසිදායක තත්වයක් යටතේ ය. එහි ප්‍රතිඵලය කුමන ප්‍රධාන පක්ෂයක් බලය අල්ලා ගත්තත් බොහෝ දුරට ඇත්ත බලය හිමි වන්නේ ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා මුදල් ආයෝජනය කළ දෙස් විදෙස් ධන හිමියන්ට වීමයි.

මෙය බොහෝ රටවල ප්‍රජාතන්ත්‍රවාදී යැයි සැලකෙන මැතිවරණ ගොදුරු කර ගනිමින් සිටින බරපතළ ව්‍යසනයකි. සාමාන්‍ය ජනතාව විසින් පවුල් බලය සහ මුදල් බලය ආදී වසයෙන් හැඳින්වීමට පුරුදු ව සිටින මේ බලපෑම එක්තරා ආකාරයකට පවුල නොහොත් කුටුම්බ ක්‍රමයේ මැදිහත් වීමක් ලෙස ද සැලකිය හැකි ය. එහෙත් එසේ පැවසිය හැක්කේ නව පරපුරේ ආර්ථික විද්‍යාඥයෙකු වන තෝමස් පිකෙටි සිය *Capital in the 21st Century* නමැති ප්‍රකට කෘතියෙන් මතු කරන කුටුම්බ දෙවර්ගය පිළිබඳ දෘෂ්ටිකෝණයට අනුව ය. කවුරු කුමක් උපයන්නේ ද පමණක් නො ව කවුරුන් ට කුමක් අයත් දැ'යි විමසීමෙන් දෙවර්ගයක කුටුම්බ හඳුනා ගත හැකි බව පිකෙටි අපට පෙන්වා දෙයි. ඉන් එක් වර්ගයක් නම් ඉඩම්, ගොඩනැගිලි සහ මූල්‍ය වත්කම් වැනි සැලකිය යුතු ප්‍රාග්ධනයක් හිමි කුටුම්බයෝ ය. එමඟින් ඔවුන්ට කිසිදු වෙහෙසකින් තොර ව නිතිපතා බදු කුලිය, ලාභාංශ සහ පොලිය උපයා ගැනීමට හැකි ය. අනෙකුත් වර්ගය නම් හුදෙක් තම ශ්‍රමය අලෙවි කිරීමෙන් වැටුප් පමණක් උපයන කුටුම්බයි. යුරෝපයේ හා උතුරු ඇමෙරිකාවේ බදු වාර්තා විශ්ලේෂණය කරන පිකෙටි කලක් තිස්සේ මෙකී ආදායම් ප්‍රභවවල වර්ධනයේ වෙනස් වන ස්වභාවය අනුව බටහිර ආර්ථික සහ ඒවා අනුකරණය කරන වෙනත් ආර්ථික ඉතා අසාධාරණ සමාජ අසමානතාවක් ජනිත කරන ඒවා බවට පත් වී ඇති බව නිගමනය කරයි[10]. ඊට හේතුව වසයෙන් ඔහු පෙන්වන්නේ එම රටවල සමස්ත නිෂ්පාදන ආර්ථිකයේ වර්ධනයට වඩා ඉඩම්, ගොඩනැගිලි සහ මූල්‍ය සම්පත් ආදී වත්කම් ප්‍රාග්ධනය සඳහා ලැබෙන ප්‍රතිලාභ ශීඝ්‍රයෙන් වැඩි වීමයි. එහි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ ධනවත් කුටුම්බ අතර ධනය වඩ වඩා ඒකරාශි වීම නොහොත් සමුච්චයනය වීම සහ ප්‍රාග්ධන හිමියන් සහ වැටුප් ශ්‍රමිකයන් අතර ආදායම් විෂමතා පරතරය එන්න එන්න ම වැඩිවීම යි. එම ගතිකය ඉන් පසු ධන හිමියන්ගේ සමාගම්වල ලොබි කිරීම්වල හා බලපෑම්වල සිට මැතිවරණ අරමුදල් ලබා දීම

10 Piketty, T. (2014) *Capital in the Twenty-First Century*. Cambridge, MA: Harvard University Press. p.11(KE)

දක්වා ක්‍රමවලින් රටක දේශපාලනය කෙරෙහි ආනුභාවය පතුරවමින් දැනටමත් ධනවත් වී ඇති අයගේ අවශ්‍යතා තව තවත් ප්‍රවර්ධනය කරන බව පිකෙටි පෙන්වා දෙයි. එමඟින් අත්තනෝමතික සහ ඔරොත්තු නො දෙන සමාජ අසමානතා ජනනය කරමින් ධනවාදය ස්වයං ක්‍රියාකාරී ව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයේ පදනම වසයෙන් සැලකෙන කුසලතාවාදී *(meritocratic)* වටිනාකම් විනාශ කරන බව ද පිකෙටි සඳහන් කරයි.

මැතිවරණ සඳහා ලැබෙන පුද්ගලික මුදල් ප්‍රදානවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රැස්වීම්, පෝස්ටර්, ජනමාධ්‍ය දැන්වීම් හා සමාජ මාධ්‍ය මෙහෙවර ආදී ප්‍රචාරක කටයුතුවලටත් මැතිවරණ කටයුතු සඳහා බඳවා ගන්නා සහකරුවන් සඳහාත් වැය වේ. බොහෝ විට මේ සමාජ මාධ්‍ය මෙහෙවරවල අරමුණ තම ප්‍රතිපාක්ෂික අපේක්ෂකයන් හැකි තරම් අපකීර්තියට ලක් කිරීමයි. කෙසේ වෙතත් මේ ප්‍රචාරක ව්‍යාපාර තුළ අදාළ දේශපාලන පක්ෂයට අපේක්ෂකයාගේ ඇති පක්ෂපාතිත්වය ඉස්මතු කිරීම හැර අපේක්ෂකත්වයේ සද්භාවය පිළිබඳ ව ඡන්දදායකයාට ද සහභාගී විය හැකි ප්‍රයෝජනවත් සවිචාරී කතිකාවකට ඉඩක් නො ලැබේ.

එමෙන් ම දේශපාලන පක්ෂවලට බොහෝ මැතිවරණ සඳහා අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කිරීමට සිදු ව ඇත්තේ සද්භාවී දේශපාලනයක් කළ හැකි නැණවත් පුද්ගලයන් නො ව ධන බලය, මැර බලය, කුල බලය, ආගම් හා වර්ගවාදය මැතිවරණ ජය සඳහා යොදා ගත හැකි පුද්ගලයන් ය. බොහෝ විට මේ දේශපාලන පක්ෂවල කිසිදු අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් නැති අතර අපේක්ෂකයන් තෝරා ගන්නේ හුදෙක් පක්ෂ නායකත්වයේ අභිමතය පරිදි ය. ඒ අතර කලාතුරකින් සද්භාවයෙන් දේශපාලනයට පිවිසෙන දැන උගත් අපේක්ෂකයන් ද සිටිය හැකි නමුත් තේරී පත් වූ විට ඔවුන්ට කටයුතු කිරීමට සිදුවන්නේ ද තම හෘදසාක්ෂියට අනුව නො ව පක්ෂයේ නායක කාරකාදීන්ගේ බලපෑම් හා සිතැඟිවලට අනුව ය. මේ යථාර්ථය සහ මැතිවරණ තරඟ ක්‍රමවලින් ඇති කර තිබෙන ප්‍රායෝගික බාධා නිසා බොහෝ විට අවංක හා දක්ෂ තරුණ තරුණියන්, ප්‍රජා ප්‍රසාදය

දිනා ගත් ප්‍රජා නායකයන් සහ සමාජ ක්‍රියාකාරීන්, ඇසූපිරූතැන් ඇති ගුණ යහපත් ස්ත්‍රීන් සහ පුරුෂයන් පාර්ලිමේන්තු මැතිවරණවලට ඉදිරි පත්වීමෙන් වළක්වා තිබේ.

කපටි දේශපාලනඥයෙකුට එරෙහි ව සාපේක්ෂ ව දක්ෂ ගුණ යහපත් අපේක්ෂකයෙකු ඉදිරිපත් වුව ද දෙදෙනා අතර ඇති වෙනස ගැන ඡන්දදායකයන්ට නිසි අවබෝධයක් ලබා ගැනීමට අපහසු වන එක් තීරණාත්මක හේතුවක් වන්නේ මැතිවරණයට ඉදිරිපත් වන අය සම්බන්ධ උසස් මට්ටමේ ස්වාධීන ජනමාධ්‍ය සන්නිරීක්ෂණයක් නොමැති වීම යි. අපක්ෂපාතී වෘත්තීය භාවිතයක් නොමැති ජනමාධ්‍ය රජයන රටක ආණ්ඩු බලය අත්පත් කර ගෙන ඇති හෝ අත්පත් කර ගැනීමට බෙහෙවින් ඉඩ ඇති පක්ෂවලට මාධ්‍ය හිමිකරුවන්ගේ සහාය ඍජු හා වක්‍ර මාර්ගවලින් පහසුවෙන් ම ලබා ගත හැකි ය. බොහෝ මාධ්‍ය හිමියෝ සිය ජනමාධ්‍ය ආයතන පවත්වා ගෙන යන්නේ ම ජයග්‍රහණය කරතියි අපේක්ෂා කරන ආණ්ඩුවෙන් තම ව්‍යාපාර කටයුතුවලට අනුග්‍රහ ලබා ගැනීම පිණිස ය. එනිසා ජනමාධ්‍ය පක්ෂග්‍රාහිත්වය මහා මැතිවරණවල දක්නට ලැබෙන පොදු දුර්ගුණයක් බවට පත් ව ඇත. අන් මාධ්‍ය මෙන් නො ව ඡන්ද දායකයාගේ මතය හැඩ ගැස්වීමේ ලා විශාල බලපෑමක් ඇති කළ හැකි රූපවාහිනී හා ගුවන් විදුලිය වැනි විද්‍යුත් ජනමාධ්‍යයේ ඍජු හෝ වක්‍ර හෝ පක්ෂග්‍රාහීත්වය මැතිවරණ ක්‍රමයක ඇතිවිය හැකි දුෂ්ටතම විකෘතිවලින් එකකි.

විද්‍යුත් ජනමාධ්‍ය විකාශන කටයුතු පවත්වා ගෙන යන්නේ පොදු දේපළක් වන විද්‍යුත් සංඛ්‍යාත යොදා ගැනීමෙනි. ඒ අනුව විද්‍යුත් සංඛ්‍යාත පොදු යහපතට පටහැණි කටයුතු සඳහා යොදා ගත නො හැකි ය. එහෙත් විද්‍යුත් ජනමාධ්‍යයේ භූමිකාව සම්බන්ධයෙන් ඇති වැරදි වැටහීම කොතරම් දැයි කිව හොත් මැතිවරණයක දී වැදගත් දෘෂ්ටිකෝණ සියල්ල දැන ගැනීමට ඡන්ද දායකයාට ඇති අයිතියට වඩා විද්‍යුත් මාධ්‍ය හිමියාගේ ප්‍රකාශන අයිතිය වැදගත් යැයි සැලකූ ඇතැම් ආණ්ඩුක්‍රම උපදේශකයෝ මැතිවරණයක දී විද්‍යුත්

මාධ්‍ය හිමියන්ට තමන් අභිමත පක්ෂයකට සහය දීමට විද්‍යුත් මාධ්‍ය යොදා ගැනීමට ඉඩ සලසන විධිවිධාන 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එක් කිරීමට තැත් කළහ[11]. මුල් පෙළේ විද්‍යුත් මාධ්‍ය තම අභිමත මතය තෝරා ගන්නේ විවිධ මතවාද එකිනෙකා අතර බෙදා ගැනීමට එකඟ වීමෙන් නො ව ඒ අදහස් අතරින් තම ව්‍යාපාරික හා දේශපාලනික අවශ්‍යතාවලට ගැළපෙන මතය කුමක්දැ' යි යන තක්සේරුව මතය. ඒ හේතුව නිසා ම බොහෝ දියුණු මැතිවරණ ක්‍රම ඇති රටවල් ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම, විවාදාත්මක කරුණු පිළිබඳ කාලීන සාකච්ඡා සහ විශේෂයෙන්ම මැතිවරණවල දී විද්‍යුත් මාධ්‍ය අපක්ෂපාතිත්වය තහවුරු කරන නියාමන නීති රීති හඳුන්වා දී තිබේ.

අපක්ෂපාතිත්වය පිළිබඳ මේ අවශ්‍යතාව බ්‍රිතාන්‍ය විද්‍යුත් මාධ්‍ය නියාමන නීතියේ නො තිබෙන්නට 2017 මැතිවරණයේ දී ලේබර් පක්ෂයට එතරම් ආසන ගණනක් දිනා ගැනීමට ඉඩ නො ලැබෙනු ඇතයි කාඩිෆ් සරසවියේ සංනිවේදන මහාචාර්ය ජස්ටින් ලුවිස් වරක් පෙන්වා දුන්නේ ය.[12] මාධ්‍ය හිමියන් අතර අධිරාජයෙක් සේ සැලකෙන රූපට් මර්ඩොක්ට අයත් පුවත්පත් ඇතුළු වැඩියෙන් විකිණෙන සියලු ප්‍රධාන බ්‍රිතාන්‍ය පුවත්පත් එකී මැතිවරණයේ දී පක්ෂපාතිත්වය දැක්වූයේ කොන්සර්වෙටිව් පක්ෂයට යි. එහෙත් සිය පුවත්පත් යොදා ගත් අන්දමින් මර්ඩොක්ට ඔහු සතු විද්‍යුත් මාධ්‍ය ද කොන්සර්වෙටිව් පක්ෂයට වාසි වෙන ලෙස යොදා ගත නො හැකි විය. ඊට හේතු වූයේ බ්‍රිතාන්‍ය නියාමන නීතිය මඟින් පනවා ඇති විධි විධාන නිසා මැතිවරණවල දී විද්‍යුත් මාධ්‍යයේ අපක්ෂපාතිත්වය රැකීමට ඔහු බැඳී සිටි බැවිනි. ඒ අනුව ලේබර් සහ කොන්සර්වෙටිව් යන පක්ෂ දෙකට ම සමාන ව සැලැකීමට මර්ඩොක් සතු විද්‍යුත් මාධ්‍යවලට සිදු විය. ඒ නිසා මැතිවරණයේ දී මහජන මතය සම්පූර්ණයෙන්ම තමන්ට අභිමත අන්දමින් මෙහෙයවීමට ඔහුට නො හැකි විය.

---

11 https://www.colombotelegraph.com/index.php/the-19a-allows-private-broadcasters-to-legally-skew-elections/ - Retrieved on 02 Feb 2021

12 https://theconversation.com/broadcast-impartiality-rule-has-helped-labour-to-achieve-biggest-poll-shift-since-1945-78949 Retrieved on 02 Feb 2021

විද්‍යුත් මාධ්‍ය විකාශන බලපත්‍රලාභීන් අපක්ෂපාතිත්වය උල්ලංඝනය නො කළ යුතු අවස්ථා බ්‍රිතාන්‍ය විද්‍යුත් මාධ්‍ය නියාමන නීතියේ වෙසෙසින් දක්වා තිබේ. ඒ අනුව දේශපාලනික සහ වෘත්තීය අරගල සම්බන්ධ මතභේදාත්මක කරුණු සම්බන්ධයෙන් ද *(matters of political or industrial controversy)*, තත් කාලීන පොදු ප්‍රතිපත්ති පිළිබඳ ව කරුණු සම්බන්ධයෙන් ද *(matters relating to current public policy)* මැතිවරණවල දී ද පැත්තක් නො ගෙන අපක්ෂපාතී ව වාර්තාකරණය ඉටු කිරීමට විද්‍යුත් මාධ්‍ය නීතියෙන් බැඳී සිටී. ඒ නිසා එවැනි කරුණුවල දී තමන්ගේ අභිමතය අසන්නන් හෝ නරඹන්නන් මත පටවනවාට වඩා මතභේදාත්මක කරුණුවල දී සියලු වැදගත් දෘෂ්ටිකෝණ අසන්නන් හෝ නරඹන්නන් වෙත ඉදිරිපත් කිරීමට විද්‍යුත් මාධ්‍යයට සිදුවේ. පුද්ගලික සමාගම්වලට අයත් විද්‍යුත් මාධ්‍යවලට අතිරේක ව පොදු අරමුදල් යොදා ඥානෝද්දීපනය *(enlightenment)* මුල් කොට පවත්වා ගෙන යන ස්වාධීන මහජන සේවා විද්‍යුත් මාධ්‍ය *(Independent Public Service Broadcasting)* ද පවතින්නේ නම් මේ අපක්ෂපාතිත්වය තවදුරටත් තහවුරු වේ.

අපක්ෂපාතිත්වය පිළිබඳ නියාමනයෙන් මූලික වසයෙන් ම ඉටු කෙරෙන්නේ අන් මත වාරණය කොට තම අභිමතයට අනුකූල වන ලෙස මහජන මතය මෙහෙයවීමට විද්‍යුත් මාධ්‍ය හිමිකරු ට ඇති හැකියාව අවම කිරීමයි. මේ අනුව තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට මුවා වී අන් මතධාරීන්ට අවස්ථාවක් නො දී සිටීමට විකාශන බලපත්‍ර හිමියාට ඉඩ නො ලැබේ. මන්ද අපක්ෂපාතිත්වය ආරක්ෂා කළ හැක්කේ මතභේදාත්මක කරුණු ඇතුළත් වැඩසටහන්වල දී බහුවිධ මතවාදවලට ඉඩ සැලසීමෙන් පමණක් වන බැවිනි.

'එක් එක් විද්‍යුත් මාධ්‍යයට තම අභිමත මතය ප්‍රකාශ කිරීමට, ප්‍රමුඛත්වය දීමට ඉඩ දිය යුතු ය, ඒ අනුව මහජන මතයේ ස්වරූපය දැන ගැනීමට අවශ්‍ය අයගේ වගකීම නම් නාලිකා කිහිපයක් ම නැරඹීම යැ'යි කෙනෙකුට තර්ක කළ හැකි ය. අපක්ෂපාතී මහජන සේවා විද්‍යුත් මාධ්‍යයක් නොමැති විට සියලු පෞද්ගලික විද්‍යුත්

මාධ්‍යවලට එක ම පක්ෂයකට සහයෝගය දීමේ අවස්ථාවක් එළඹුනොත් ඉහත තර්කයට කුමක් වේ ද? එවැනි තර්ක විශ්ලේෂණයේ දී කාඩිෆ් විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍යවේදය පිළිබඳ මහාචාර්ය රිචර්ඩ් සැම්බ්රූක් පෙන්වා දෙන සමානුකූලතාව *(Homophily)* නිසා ඇතිවිය හැකි බලපෑම පිළිබඳ කාරණය අවධානයට ලක් කිරීම වටී.[13]

මෙහි දී සමානුකූලතාව යන්නෙන් අදහස් වන්නේ තිබිය හැකි අනෙක් අදහස් නො තකා තමන් දන්නා හෝ තමන්ට එකඟ විය හැකි අදහස්වලට පමණක් එකඟ වීමට මිනිසුන් දක්වන නැඹුරුවයි. තොරතුරු ගහණය අතිශයින් ඉහළ යන තොරතුරු තාක්ෂණික යුගයක මෙය එක්තරා ආකාරයක අවදානමකි. මන්ද ඒ නිසා අන් මත නො තැකීමේ බුද්ධි ශෝධනයකට *(brain-wash*) ඡන්ද දායකයා ගොදුරු වීමට තිබෙන ඉඩ කඩ වැඩි බැවිනි. මෙය තවදුරටත් පැහැදිලි කරනවා නම් ඒ නිසා තර්ක බුද්ධිය විසින් යුක්ති යුක්ත කළ හැකි සමාජ කතිකාවක් ගොඩ නැගෙනු වෙනුවට අපේකම, වර්ගවාදය, කුලය, ආගම, අන්ධ විශ්වාස ආදි දේවල් මත විවිධ කල්ලිවලට ජනසමාජය අවිචාරශිලී ව බෙදී යෑමට සමානුකූලතාව හේතුවක් වන බව මහාචාර්ය සැම්බෲක් පෙන්වා දෙයි.

ඒ නිසා ඒකපාර්ශ්වික, සීමිත මතවාද පතුරවන විද්‍යුත් මාධ්‍ය නාලිකා වෙනුවට වෙනත් කවරදාකටත් වඩා අද අපට අවශ්‍ය වන්නේ අපක්ෂපාතී ලෙස බහුවිධ අදහස් හා මතවාද සංනිවේදනය කරන සහ ඒවා මැනවින් සන්නිරීක්ෂණයට ලක් කරන පොදු යහපත මුල් කරගත් විද්‍යුත් මාධ්‍යයයි. එසේ නොමැතිව තම තොරතුරු ප්‍රභවය තමන්ට කැමති මතය උත්කර්ෂණයට නංවන නාලිකාවකට සීමා කර ගැනීමට ග්‍රාහකයන් පෙලඹීමෙන් සිදු වන්නේ අන් මතවල සබුද්ධිමත් බව තක්සේරු කිරීමට නො හැකි ව ජන සමාජය අනවශ්‍ය ලෙස ආධානග්‍රාහී කොටස්වලට ධ්‍රැවීකරණය වීමයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය මඟින් යුක්තිය අත්පත් කර ගැනීම සඳහා සුසමාදර්ශයක්

---

13 Richard Sambrook, (2012), *Delivering Trust Impartiality and Objectivity in the Digital Age*, Oxford: the Reuters Institute Study of Journalism

නිර්මාණය කිරීමේ දී විද්‍යුත් මාධ්‍යයේ අපක්ෂපාතිත්වය සහ ස්වාධීන මහජන සේවා විද්‍යුත් මාධ්‍යය ජාලයක පැවැත්ම ද අතිශයින් තීරණාත්මක ය.

'දුස්තොරතුරු *(misinformation)* ප්‍රචාරය ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මට බලවත් තර්ජනයකි' යනුවෙන් වර්ධනය වෙමින් පවතින මතය අපට පමණක් සීමා වූවක් නො වේ. හිතාමතා ම ජන මනස විකෘති කිරීම සඳහා හෝ ලාභය සඳහා හෝ දුස්තොරතුරු එනම් සාවද්‍ය සහ නො මඟ යවන තොරතුරු ප්‍රචාරය කිරීම, එන්න එන්න ම වැඩි වෙයි. එය ප්‍රජාතන්ත්‍රවාදයට බලවත් තර්ජනයක් බව යුරෝබැරෝමීටර *(Eurobarometer)* සමීක්ෂණයක දී ප්‍රතිචාර දුන් යුරෝපීයන් අතුරෙන් 85% ක් ම ප්‍රකාශ කළහ. මේ සන්දර්භය තුළ ඵලදායක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා "බහුවිධ මාධ්‍ය තාක්ෂණ වේදිකා මඟින් විශ්වාසදායක අර්ථාන්විත සහ අපක්ෂපාතී මාධ්‍ය අවකාශයක් සැපයිය හැකි බවට සියලු පුරවැසියන්ට වග වෙන අව්‍යාජ ස්වාධීන මහජන සේවා මාධ්‍ය *(public service media)* ක්‍රමයක් මහජන අරමුදලින් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව"[14] නැවත නැවතත් තහවුරු වෙමින් පවතී.

මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ පිරිහීමට හේතු වන ඊ ළඟ වැදගත් කාරණය වන්නේ පාර්ලිමේන්තුවලට හෝ ව්‍යවස්ථාදායක සභාවලට මැතිවරණවලින් තෝරා පත් වන නියෝජිතයන්ගේ දුෂ්චර්යාව යි. ඒ අතරින් බහුල ව දක්නට ලැබෙන දුෂ්ක්‍රියාවක් වන්නේ අල්ලස් හා දූෂණ ය. තෝරා ගත් පුද්ගලයන්ට හා ව්‍යාපාරිකයන්ට වැඩි වාසි සැලසෙන අන්දමින් අයථා ලෙස කටයුතු කිරීම ද දූෂණ අතර ප්‍රමුඛ වේ. එවැනි වාසි අතර බදු සහන ලබා දීම, ඒකාධිකාර ඇති කිරීමට මග සලසා දීම, රාජ්‍ය දේපොළ අයුතු ලෙස අත්පත් කර ගැනීමට ආධාර කිරීම, පිළිගත හැකි සාධාරණීකරණය කිරීමකින් තොර ව නොයෙකුත් වාසිදායක වරප්‍රසාද ලබාගැනීම, අයථා ලෙස මත්පැන් අලෙවි බලපත්‍ර, විකාශන බලපත්‍ර, කැණීම් බලපත්‍ර ආදිය ලබා ගැනීම

14 Rodríguez-Castro, Marta et al (2020) *Public Service Media as a Political Issue,* Journal of Information Policy Vol. 10, PA: Penn State university Press, PA, pp. 439-473,

ලබා දීම හා තුන්වැනි පාර්ශවයකට වැඩි මිලට අලෙවි කිරීම, වාසි දායක කොන්දේසි යටතේ රජයේ කොන්ත්‍රාත්තු පිරි නැමීම, කොමිස් ගැනීම පිණිස තෝරා ගත් ව්‍යාපාරිකයන්ට අයුතු ලාභ ලබා ගැනීමට සැලැස්වීම ආදිය අයත් වේ. මේ අකටයුතු බොහෝමයක් ම ජනමාධ්‍ය මඟින් ඇති සැටියෙන් අනාවරණය වීම වැළැක්වීමට ද මාධ්‍ය පක්ෂග්‍රාහීත්වය යොදා ගැනේ. එවැනි පසුබිමක් යටතේ ස්වාර්ථය මුල්කරගත් දේශපාලන හා ආර්ථික දැක්මක් ඇති දේශපාලනඥයන් වෙතින් සදාචාරීය අධිකාරයක් *(moral authority)* බලාපොරොත්තු විය හැක්කේ කෙසේ ද?.

පාර්ලිමේන්තු මන්ත්‍රණ සභාවල අසමත් බවට තවත් හේතුවක් වන්නේ අදාළ දේශපාලන පක්ෂයේ අනම්‍ය මතවාද නිසා එමඟින් තෝරා පත් වන නියෝජිතයන්ට නිර්මාණශීලී ව නව විසඳුම් ගැන කල්පනා කිරීමට හෝ සමාජ ප්‍රශ්නයක් පිළිබඳ ව විවෘත ව සාකච්ඡා කිරීමට අසීරු වීමයි. පක්ෂයේ දෘෂ්ටිවාදය විසින් බොහෝ විට ඔවුන්ගේ දැක්ම සීමා කරනු ලැබේ. හුදෙක් පක්ෂය විසින් තීරණය කරන ලද විසඳුම්වලට අනුකූලව මිස වෙනත් ආකාරයකට ප්‍රශ්න දෙස නො බැලීමට ඡන්දයෙන් පත් වන විට ම මේ ඊනියා මහජන නියෝජිතයන්ට සිදුවේ. සියලු ම පක්ෂවලට එක් වී විශේෂඥ මත ද සැලකිල්ලට ගෙන කිසියම් ප්‍රශ්නයක් ගැන සුදුසු ම විසඳුම සොයා ගත හැකියැ'යි කෙනෙකුට තර්ක කළ හැකි නමුත් එය එසේ සිදු නො වෙන්නේ ඒ නිසා තරඟකාරී විරුද්ධ පාර්ශවයකට කීර්තියක් අත් වීමේ බිය විසින් එවැනි සාමූහික ප්‍රයත්න ඇතිවීම නිරන්තරයෙන් වළක්වන බැවිනි.

මේ පක්ෂග්‍රාහී එළඹුම නිසා යුක්තිගරුක ප්‍රතිපත්ති සහ සමාජ වටිනාකම් ප්‍රකාශ වන සාකච්ඡා සඳහා දේශපාලනඥයින් විසින් වැය කළ යුතු මානව හා මූල්‍ය සම්පත් ඒ වෙනුවට සිය විරුද්ධවාදීන් අපකීර්තියට ලක් කළ හැකි හා පොදු ජනතාව රැවටිය හැකි කුටෝපායික ක්‍රියා මාර්ගවලට සහ ප්‍රචාරණ කටයුතුවලට යොදා ගැණේ. සැබෑ සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය *(deliberative democracy)*

අගයන සමාජයක නම් ව්‍යවස්ථාදායකයක සාමාජිකයන්ට මෙන් ම රටවැසියන්ට ද දේශපාලන කතිකාව මඟින් මතු වූ නව කරුණු හා තර්ක විතර්ක අනුව තමන්ගේ දැක්ම හා මතවාද අවංක ව යළි සලකා බැලීමට ඉඩ ලැබේ. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය ගැන පස් වැනි පරිච්ඡේදයෙන් වඩා ගැඹුරින් සාකච්ඡා කරන විට අපට මෙය තවදුරටත් විමසා බැලිය හැකිය. දැනුවත් සංවිචාරණීය කතිකාවකින් තොර හුදු පක්ෂ භජනයෙන් මෙහෙය වෙන ව්‍යවස්ථාදායකයක සාමාජිකයන්ට මහජන ප්‍රජාතන්ත්‍රවාදයක සුජාතභාවයක් නියෝජනය කළ නො හැක්කේ ම ය.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් වසර 70ක් තිස්සේ අත්දුටු විකෘතිය සහ ඒ පිළිබඳ ව අපේ ඇති කලකිරීම් බොහෝ විට දේශපාලනඥයන්ගේ අකටයුතුකම්වලට ලඝු කිරීමෙන් පිළිබිඹු වන්නේ ප්‍රායෝගික ක්‍රියාවලියක් වසයෙන් කෙසේ වෙතත් ප්‍රමිතියක් වසයෙන් අප තවමත් පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් කොට සලකන බවයි. එහෙත් අප අත්දකින ආකාරයේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයකට ඒ පරමාදර්ශය අපට අත් කර දිය නො හැකි බව පෙනේ.

අප නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යැයි හඳුන්වන දෙය ඇත්ත වසයෙන් ම දහඅටවැනි සියවසේ ඥානවිභාගය හා තාක්ෂණය විසින් නිපදවන ලද්දක් බව හෙලන් ලැන්ඩ්මෝර් පෙන්වා දෙයි.[15] ඇයට අනුව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ගොඩ නැගූ සංකල්පයකට වඩා ලිබරල් රිපබ්ලිකන්වරුන් විසින් ගොඩ නගන ලද සංකල්පයක් ලෙස සැලකිය යුතු ය. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණ වූයේ පුරවැසියන් සවි බල ගැන්වීමට වඩා කිසියම් පෙළැන්තියක පුද්ගල අයිතීන් තහවුරු කර ගැනීම යි. ඒ අනුව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු බලය භාවිත කිරීම සඳහා මහජන කැමැත්ත ලබා ගැනීමක් මිස මහජනයා මඟින් බලය භාවිත කිරීමට දරන ලද වෑයමක් ලෙස නො සැලැකිය යුතු බව ලැන්ඩ්මෝර් පෙන්වා දෙයි. එවැනි විකෘති ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයකින් තෝරා

15 Landmore, Helen (2020) *Open Democracy: Reinventing Popular Rule for the 21st Century,* Princeton NJ: Princeton University Press p. xiii-xiv

පත් වන ප්‍රභූන් විසින් ගනු ලබන තීන්දු මහජන කැමැත්ත ලෙස සැලකීම විහිළුවකි.

කෙසේ වෙතත් ප්‍රභූවරයන්ගේ සහ ප්‍රභූවරයන් වීමට තැත් කරන අයගේ මැතිවරණ දේශපාලනය පසෙකින් තැබුවොත් පරමාදර්ශී ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේ බලාපොරොත්තු මුළුමනින් ම සුන් කර ගැනීමට තව මත් කල් වැඩි ය. මන්ද මහජන සහභාගිත්වය මුල් කරගත් විවෘත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වැදගත් ආදර්ශ අපට තව මත් සොයා ගත හැකි බැවිනි. විවෘත දේශපාලන කතිකා සඳහා එක්සත් ජනපදයේ පැවැත්වෙන ටවුන් හෝල් රැස්වීම් වැනි බිම් මට්ටමේ කටයුතුවල සිට කලකට පෙර ජාතික මට්ටමෙන් බ්‍රසීලයේ පැවති පොදු ප්‍රතිපත්ති පිළිබඳ ජාතික සමුළු වැනි විවෘත රැස්වීම් දක්වා කටයුතු ඒ සඳහා ඇතැම් උදාහරණයි. සමලිංගික විවාහ හා විසමලිංගික විවාහ එක සමාන කොට සැලැකීම පිළිබඳ පින්ලන්ත වැසියන් දියත් කළ කතිකාව හරහා 2012 දී පින්ලන්ත පාර්ලිමේන්තුව විසින් නව විවාහ නීතියක් සම්මත කරනු ලැබීම තවත් එවැනි උදාහරණයකි. එරට ව්‍යවස්ථාව අනුව රටවැසියන් 50,000ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකඟ වී යෝජනා කරන පනත් කෙටුම්පතක් පින්ලන්ත පාර්ලිමේන්තුව විසින් අනිවාර්යයෙන් ම සාකච්ඡා කරුනු ලැබිය යුතු වේ[16].

එතෙක් අපරාධයක් ව පැවති සමලිංගික සම්බන්ධතා නිරපරාධයක් කිරීම පිණිස අයර්ලන්තය ද ඒ හා සමාන ක්‍රමයක් යොදා ගත්තේ ය. ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස කුසපත් ඇදීමෙන් හෙවත් සීට්ටු ක්‍රමයට අහඹු *(random)* ලෙස තෝරා ගත් රටවැසියන් තුනෙන් දෙකකින් සහ නිල පාර්ලිමේන්තු සාමාජිකයන් තුනෙන් එකකින් සමන්විත මහජන සභාවක් කැඳවනු ලැබී ය. දකුණු කොරියානු විධායකයේ බලශක්ති ප්‍රතිපත්තියට විකල්පයක් ඉදිරිපත් කිරීමට දියත් කළ බලශක්තිය පිළිබඳ ජාතික කතිකාවකට අනුව

16 https://blogs.oii.ox.ac.uk/policy / finnish-decision-to-allow-same-sex-marriage-shows-the-power-of-citizen-initiatives/ - Retrieved 04 Feb 2021

දකුණු කොරියානු රටවැසියන් 2017දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බලශක්ති ප්‍රතිපත්තිය පිළිබඳ නිර්දේශ පාර්ලිමේන්තුවෙන් සම්මත වීම ප්‍රජාතන්ත්‍රවාදය විවෘත කිරීම පිළිබඳ තවත් වැදගත් උදාහරණයකි[17]. 2017 දී මොන්ගෝලියාව සම්මත කරගත් මහජන මතය පිළිබඳ නව නීතියකට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්මත කිරීමට පෙර ඒ සඳහා අහඹු ලෙස තෝරා ගනු ලබන රටවැසියන්ගෙන් සමන්විත තාවකාලික මහජන කතිකා මණ්ඩපවල නිර්දේශ අවශ්‍ය වේ[18]. එය තරමක් දුරට සමාජ විද්‍යා පර්යේෂකයන් විසින් යොදා ගන්නා කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා *(focus group discussion)* ක්‍රමය හා සමාන වේ.

වසර 2019 බෙල්ජියමේ ජර්මන් බස කතා කරන ප්‍රජාවේ පාර්ලිමේන්තුව[19] විසින් නීති සම්පාදනය කිරීමේ දී සහාය වීම පිණිස කුසපත් ඇදීමේ ක්‍රමයට අහඹු ලෙස තෝරා ගන්නා රටවැසියන්ගෙන් සමන්විත පුරවැසි කවුන්සලයක් පිහිටුවීමේ යෝජනාවක් සම්මත කර ගන්නා ලදී. එම වසරේ ම දෙමසක් පුරා ප්‍රංශ වැසියන් මිලියන 1.5කට ආසන්න පිරිසක් සහභාගි වූ දේශගුණ විපර්යාසය පිළිබඳ මහා කතිකාවක් පැවැත්විණි. ඊට අනුපූරකයක් ලෙස ගෝලීය උණුසුම ඉහළ යෑමට සමාජ සාධාරණත්වය මත විසඳුම් නිර්දේශ කිරීම පිණිස අහඹු ක්‍රමයට තෝරා ගත් පුරවැසියන් 150 ස් දෙනෙකුගෙන් සැදුම් ලත් පුරවැසි සම්මේලනයක් *(Citizen Convention on Climate Change)* කැඳවනු ලැබීය. අයිස්ලන්තයට නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීම සඳහා කැඳවන ලද ජාතික සමුලුවල බහුතරය තෝරා ගනු ලැබුවේ

17 https://thediplomat.com/2017/10/south-koreas-nuclear-energy-debate/ - Retrieved 04 Feb 2021

18 https://news.stanford.edu/2017/05/02/collaboration-stanford-leads-mongolian-parliament-passing-law-public-opinion-polling/ - Retrieved 04 Feb 2021

19 බෙල්ජියමේ වෙසෙන ජර්මන් බස කථා කරන ජන කොට්ඨාශය නියෝජනය කරන නියෝජිතයන් 25 දෙනෙකුගෙන් සමන්විත වෙනම පාර්ලිමේන්තුවක් බෙල්ජියමේ පවතී. ජර්මන් බස කථා කරන ජනයාගේ සංස්කෘතික, භාෂාමය හා පුද්ගල අභිවෘද්ධිය කරුණු (අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි) සම්බන්ධ තීන්දු තීරණ ගැනීම මේ පාර්ලිමේන්තුවේ කාර්යයකි.

ද කුසපත් ඇදීමෙනි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දුර්වලකම් අවම කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ එවැනි නවමු අත්හදා බැලීම් ගණනාවක් ලොව පුරා ක්‍රියාත්මක කර තිබේ. මේ පිළිබඳ මීළඟ පරිච්ඡේදවලින් සවිස්තර ව සාකච්ඡා කරමු.

# - 3 -

## නියෝජන ක්‍රමයේ සීමා ඉක්මවීම

බලය අල්ලා ගැනීම සඳහා ඉදිරිපත් වන කණ්ඩායමකට සහයෝගය දැක්වීමේ මැතිවරණ දේශපාලනය වෙනුවට නමට නො ව ක්‍රියාවෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී වන පුද්ගල කාරකත්වයක් සහිත මහජන දේශපාලනයක අවශ්‍යතාව වෙන කවරදාකටත් වඩා අද ඉස්මතු ව තිබේ. එහෙත් එය සාක්ෂාත් කර ගත හැකි වන්නේ පවතින ව්‍යාජ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී රාමුව සැරසීමට වෙනත් නියෝජිත කණ්ඩායමක් තෝරා ගැනීමෙන් නො වේ. බලය අල්ලා ගැනීමේ දේශපාලනය වෙනුවට 'යුක්තිය අත්පත් කර ගැනීමේ ක්‍රියාකාරී මහජන දේශපාලනයක්' සඳහා සුදුසු වැඩපිළිවෙළක් ගොඩනගා ගැනීමෙනි. ඒ වැඩපිළිවෙළ තුළ දේශපාලනය පමණක් නො ව ඒ සමඟ නවලිබරල්වාදී ආර්ථික සුසමාදර්ශයෙන් මිදීම ද සාකච්ඡා කළ යුතු ය. මන්ද ඒ දෙක ම අන්‍යෝන්‍ය වසයෙන් ප්‍රතිපෝෂණය වන ප්‍රත්‍යවර්ත්‍ය ප්‍රතික්‍රියාවල ප්‍රතිඵල වන බැවිනි.

කෙසේ වෙතත් අපට මේ සාකච්ඡාවට පිවිසීමට සිදු වන්නේ ජාතික රාජ්‍ය සන්දර්භයක සිට ය. මන්ද බලය අත්පත් කර ගැනීමේ දේශපාලනය මෙන් ම ආර්ථික සංවර්ධනය පිළිබඳ සංකල්ප ද ඇති වී තිබෙන්නේ ජාතික රාජ්‍යය විශ්ලේෂණ ඒකකය *(unit of analysis)* ලෙස ගෙන ඇති නිසා ය. ජාතික රාජ්‍යයේ 'බලය අත්පත් කර ගැනීම' යන්න දේශපාලනය සම්බන්ධයෙන් වම සහ දකුණ යන දෙකට ම අයත් දේශපාලන දෘෂ්ටිවාදවල මුඛ්‍ය පරමාර්ථය විය. මේ දෙපාර්ශවය

අතරින්, අල්ලා ගත් බලය යොදා ගත යුත්තේ ධනය සමුච්චයනය වීම මත පදනම් වන ධනවාදී ආර්ථික වර්ධනය පුළුල් කිරීම සඳහා ය යන්න පිළිබඳ නිශ්චිත අවබෝධයක් දක්ෂිණාංශයට තිබුණි. එහෙත් රාජ්‍ය බලය අල්ලා ගත් පසු තමන් විසින් සිදු කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳ විශිෂ්ට අවබෝධයක් වාමාංශිකයන්ට නො තිබුණු බව සමාජවාදය පිළිබඳ ඔවුන් කළ ප්‍රකට අත්හදා බැලීම් අසාර්ථක වීමෙන් පැහැදිලි වේ. බැරි වෙලාවත් ආණ්ඩු බලය ලැබුණොත් කරන්නේ මොනවාද කියා හිතා ගැනීමට අදටත් බොහෝ වාමාංශිකයන්ට නො හැකි බව බොරුවක් නො වේ.

ඒ නිසා රාජ්‍ය බලය අත්පත් කර ගැනීම මුඛ්‍ය කර ගැනීම වෙනුවට "යුක්තිගරුක සමාජයක් ඇති කර ගැනීම" පිණිස පෘථුල සමාජ සහභාගිත්වයක් ඇති කර ගත හැකි දේශපාලනයේ නව සුසමාදර්ශීය වෙනසක් කරා යොමු වීමේ අභියෝගයට අප මුහුණ දිය යුතු ය. එහි දී එම සුසමාදර්ශය මහජන මතය බවට පත් කිරීමේ ළා අප විසින් සලකා බැලිය යුතු මූලික දේශපාලනික ආර්ථික පිළිවෙත් කෙබඳු විය හැකි ද යන්න විමසා බැලීම ද අපේ සාකච්ඡාවේ මුඛ්‍ය කාරණයක් විය යුතු ය. ඊට හේතුව මෙතෙක් උත්කර්ෂයට නංවන ලද නවලිබරල්වාදී ආර්ථික ක්‍රමයේ අසාධාරණකම් සහ අසාර්ථක වීම් කලක සිට නිරන්තරයෙන් හෙළිදරව් වෙමින් තිබුණ ද එයට ඵලදායක විකල්පයක් යෝජනා කිරීමේ කටයුත්ත සාකච්ඡාවට ලක් කිරීමට එහි බොහෝ විවේචකයන් තවමත් මැලි වී ඇති බැවිනි.

ඒ අනුව මුලින් ම නව දේශපාලන සුසමාදර්ශයක් ඇති කර ගැනීමේ හැකියාව විමසා බැලීමට ප්‍රවේශයක් ලෙස ප්‍රංශ දාර්ශනිකයෙකු හා දේශපාලන විචාරකයෙකු වන ඇලන් බදියු 2017 දී ඕබ් ලැන්සෙලින් සමඟ එක් ව පළ කළ *In Praise of Politics (දේශපාලනය පසසනු වස්)* නම් කෘතියේ ඉදිරිපත් කරන දේශපාලනය වෙනත් ආකාරයකට සංකල්ප ගත කිරීම පිළිබඳ අදහස තවදුරටත් විමසා බැලීම අපට වැදගත් විය හැකි ය. රාජ්‍ය බලය අත්පත් කර ගැනීම පිළිබඳ ප්‍රශ්නය මුල් කර ගැනීමක් ලෙස දේශපාලනය උත්කර්ෂණයට

නංවනවා වෙනුවට ඇලන් බදියු යෝජනා කරන්නේ දේශපාලනය හා නෛසර්ගික සම්බන්ධයක් ඇති 'යුක්තිය සාක්ෂාත් කර ගැනීමේ කටයුත්ත' අප උත්කර්ෂයට නැංවිය යුතු බවයි[20]. දේශපාලනය යන්න නිර්වචනය කිරීමේ දී යුක්තිය යන්න ද නෛසර්ගික ව අන්තර්ගත වන්නේ නම් දේශපාලනය යන්න හුදෙක් බලය අත්පත් කර ගැනීම සඳහා කරන අරගලයක් වසයෙන් තැකිය නො හැකි ය. යුක්තිය යනු සමාජ සාධාරණත්වය යි. බදියුට අනුව ඇත්ත වසයෙන් ම මෙහි දී යුක්තිය සම්බන්ධයෙන් මුඛ්‍ය ප්‍රශ්නය විය යුත්තේ "සාධාරණ බලය යනු කුමක් ද?" යන්නයි. ඒ අනුව දේශපාලනය පිළිබඳ විවාදය හුදෙක් බලය උපයෝගී කර ගැනීම පිළිබඳ කතිකාවකට වඩා බලය සන්නිරීක්ෂණයට ලක් කරන උපමාන ද බලය සහ ප්‍රජාව අතර ඇති සහසම්බන්ධය *(correlation)* ද දේශපාලන බලයේ අභිමතාර්ථ යුක්ති යුක්ත ව සුජාතකරණය කිරීමේ මහජන සහභාගිත්ව ක්‍රියාන්විතයක් ද පිළිබඳ කතිකාවක් බවට පත් විය යුතු ය.

අප අත් දකින්නේ මුළුමනින් ම රාජ්‍යයේ බලය කේන්ද්‍ර කර ගැනීම මත මෙහෙයැවෙන දේශපාලනයකි. ඊට විකල්පයක් වන්නේ ප්‍රජා සමූහය සහ එහි සාමාජිකයන්ගේ අභිමතාර්ථ මොනවා ද ඔවුන් අතර තිබිය යුතු සමානාත්මතාව, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස කෙබඳු විය යුතු ද වැනි කරුණු ගැන අවධානය යොමු කරන යුක්තිය කේන්ද්‍ර කරගත් දේශපාලනයකි. මේ දෙක අතර සම්බන්ධතාවක් මෙන් ම ඝට්ටනයක් ද පවතින බව බදියු පෙන්වා දෙයි.[21] යුක්තිය කේන්ද්‍ර කරගත් සහ බලය කේන්ද්‍ර කරගත් දේශපාලනයක් අතර සම්බන්ධතාවක් ඇත්තේ යුක්තිය යන්න රාජ්‍ය නමැති යථාර්ථය කෙරෙහි කිසිදු බලපෑමක් නැති වියුක්ත දෙයක් විය නො හැකි බැවිනි. ඒ නිසා යුක්තිය පිළිබඳ ප්‍රශ්නය බදියු පෙන්වා දෙන අන්දමට අවශ්‍යයෙන්ම 'යුක්ති සහගත බලය' පිළිබඳ ප්‍රශ්නයක් බව ද සැලකිය යුතු ය.

20 Badiou, Alain with Lancelin, Aude, (2019) *In Praise of Politics,* Medford: Polity Press. p.3

21 ibid, p.4

අනෙක් අතට බැලුවොත් ඉතිහාසය පුරාම පෙන්නුම් කර ඇති පරිදි. ඉහත කී සංකල්ප දෙක අතර ගැටුමක් ඇති වීමට හේතුව, යුක්ති සහගත නො වන හැම විට ම දේශපාලන බලය සමාජයේ අවරෝහණය පිළිබඳ කේන්ද්‍රීය සාධකය බවට පත් ව තිබීමයි. ඒ නිසා ජන සමාජය මත යෙදීමට සිදු වන රාජ්‍ය බලය සාධාරණ ව යුක්ති යුක්ත කළ හැකි සහභාගිත්ව දේශපාලනයක් සහිත සමාජ සංස්කෘතියක් බිහි කිරීම අපේ වෑයම විය යුතු ය.

ඒ අනුව අපේ මුඛ්‍ය අරමුණ විය යුත්තේ මධ්‍යගත රාජ්‍ය බලය ශක්තිමත් වීම වළක්වා ඊට විකල්ප ව යුක්තිය කේන්ද්‍ර කොට රාජ්‍ය බලය නිරන්තරයෙන් සන්නිරීක්ෂණය කිරීමට පමණක් නො ව නිවැරදි කිරීමට ද සමත් තිරසාර අන්තර්ග්‍රහනීය *(inclusive)* මහජන ව්‍යාපාරයක් ගොඩනගා සක්‍රියව පවත්වා ගෙන යෑමයි. එහි දී ලැබිය යුතු සක්‍රිය මහජන දායකත්වය වීදි මට්ටමේ සිට ඍජු ව සහතික කිරීමට හැකි සංවිධාන ව්‍යුහයක් ඇති කර ගත යුතු ය. ඒ අර්ථයෙන් ම රාජ්‍ය පාලනය පිළිබඳ වග වීම ඉල්ලා සිටීමේ සන්නිරීක්ෂණ ක්‍රමවේද ද බිම් මට්ටම දක්වා විමධ්‍යගත විය යුතු ය. එය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය නමින් දැනට පවතින විකෘතියට හාත්පසින් ම වෙනස් ව ගොඩ නගන්නේ කෙසේ ද යන්න තවත් දුරටත් විමසා බලමු.

ප්‍රජාතන්ත්‍රවාදය එහි වර්තමාන විකෘත වීම්වලට වඩා හාත්පසින් ම වෙනස් අන්දමට සංකල්ප ගත කිරීමේ හැකියාවක් ද තිබේ. ග්‍රීක නිරුක්තියට අනුව ප්‍රජාතන්ත්‍රවාදයට කියන 'ඩිමොක්‍රසි' යන නම සැදී ඇත්තේ මහජනතාව යන තේරුම ඇති 'ඩිමොස්' සහ බලය යන තේරුම ඇති 'ක්‍රැටෝස්' යන දෙපද එක්වීමෙනි. ඒ නිසා ග්‍රීක යෙදුම අනුව නිශ්චිතව ම ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජන බලයයි. එහෙත් මහජන නියෝජනය වෙනුවට හුදෙක් මහජන බලය අවධාරණය කිරීම නිසා ඒ අන්දමින් ප්‍රජාතන්ත්‍රවාදය තේරුම් ගැනීම අනීතිකයැ'යි නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ගැන පාරම්බාන අය කියනු ඇත. ඒ කාරණය දිගු කලක් තිස්සේ විවාදයට ලක් වූවකි. ඉංග්‍රීසින් විසින් හඳුන්වා දුන් පාර්ලිමේන්තුව මඟින් කෙරෙන නියෝජනය

ප්‍රජාතන්ත්‍රවාදය ලෙස සැලැකීම අයුතු බව 18 වැනි සියවසේ විසූ ප්‍රකට ප්‍රංශ දාර්ශනිකයෙකු වූ ජීන් ජැක් රූසෝ පළ කළේ ය. ඔහුගේ විචාරයට අනුව කිසියම් කාලපරිච්ඡේදයකට වරක් තෝරා පත් කරන නියෝජිතයන් අතින් සිදු වන්නේ තමන් අභිමත දෙයක් කිරීමත් ඒ කාලය තුළ මහජනතාවට බොරු දෙසා බෑමත් පමණි.

"පැරණි සමූහාණ්ඩුවල මහජනතාවට නියෝජිතයෝ නො සිටියහ. මිනිස්සු තමන් ව නියෝජනය කිරීමට ඉඩ දුන් මොහොතේ සිට තම නිදහස නැති කර ගත්තෝ ය" යනුවෙන් ද රූසෝ සිය ප්‍රකට *Social Contract* කෘතියේ ලීවේ ය.[22] එනිසා ප්‍රජාතන්ත්‍රවාදය යන වචනය අප භාවිත කරන්නේ නම් ඒ මඟින් නිශ්චිතව ම අදහස් කරන්නේ කුමක් ද යන්න ද පැවසිය යුතු ය. වඩාත් පැහැදිලිව කිව හොත් ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අප අදහස් කරන්නේ මැතිවරණය හා නියෝජනය පාදක කරගත් රාජ්‍ය බලයට යටත් වූ ක්‍රමයක් ද නැතහොත් නියෝජන ක්‍රමවල ඇති දුර්වලකම් අවම කරන සුවිශේෂ කරුණු කාරණා සම්බන්ධයෙන් මහජන කැමැත්ත ප්‍රකාශ කළ හැකි විවෘත මහජන සංවිචාරණය *(deliberation)* මත පදනම් වූ ක්‍රමයක් ද යන්නයි.

ප්‍රජාතන්ත්‍රවාදය සුජාතකරණය කිරීම සඳහා බොහෝ විට යොදා ගන්නා මූලධර්මය වන්නේ කිසියම් කණ්ඩායමක් විසින් රාජ්‍ය බලය ක්‍රියාත්මක කරනු ලැබීම අනුමත කළ හැකි වන්නේ ඒ සඳහා එම බලයට නතු වන සමාජයේ සාමාජිකයන්ගෙන් ලැබෙන සාමූහික අනුමැතියක් මත පමණක් ය යන අදහසයි. ඒ අනුව මැතිවරණ පවත්වන්නේ එකී ජනතා අනුමැතිය ලබා දීමට ය. මැතිවරණයක දී අන් අපේක්ෂකයන් අබිබවා වැඩි කැමැත්ත දිනා ගන්නා අපේක්ෂකයන් මහජන නියෝජිතයන් වසයෙන් සැලකේ. ඔවුහු ජන සමාජයේ සාමූහික අධිකාරය සංකේතවත් කරන මන්ත්‍රණ සභාවක රැස් වී මහජනතාව වෙනුවෙන් රාජ්‍ය විචාරණය පිළිබඳ

22 Rousseau, Jean-Jacques. 1997. *The Social Contract and Other Later Political Writings*. Edited by V. Gourevitch. Cambridge: Cambridge University Press, p.114

කරුණු කාරණා පොදු යහපත මුල් කර ගනිමින් සාකච්ඡාවට ලක් කරති. එසේ මහජන නියෝජිතයන් විසින් සාකච්ඡා කොට වැඩි ඡන්දයෙන් එළඹ ගත් තීන්දු තීරණ අනුව රාජ්‍ය බලය පරිශීලනය කළ යුතු ය. මෙය පරමාදර්ශීය නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ලෙස සැලකිය හැකි ය.

එහෙත් 'නියෝජනය' නමැති සංකල්පයේ ඉතිහාසය විමසන විට එයට ම ආවේණික ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොමැති බව පමණක් නො ව කිසියම් අවදියක දී ඒ අදහස් දෙක එකිනෙකට පටහැණි ව යෙදුණු බව මොනිකා බ්‍රිටෝ වේරා හා ඩේවිඩ් රන්සිමාන් පෙන්වා දෙති.[23] ඔවුන් පෙන්වා දෙන පරිදි නියෝජනය යන යෙදුමට දේශපාලනික තේරුමක් ලබා දිය හැකි භාවිතයක් යුරෝපයේ උද්ගත වූයේ 13 වන සිය වසේ දී පමණ ය. එකල නියෝජනය යනුවෙන් තේරුම් ගනු ලැබුවේ පාලකයා, එනම් රජු ජනතාව නියෝජනය කරන බවයි. ඒ අනුව රජතුමා වනාහි ජනතාව වෙනුවෙන් කටයුතු ඉටු කරන සහ ජනතාව මූර්තිමත් කරන ජනතා සංකේතයයි. 'නියෝජනය' යන්න මෙහි දී තේරුම් කරනු ලැබුවේ පුරවැසියන් තම අදහස් ඔවුන්ගේ රජතුමාට ප්‍රකාශ කරන මාර්ගයක් ලෙස නො ව නව අය බදු සඳහා රජතුමා විසින් වැඩ වසම් ප්‍රභූ පෙළැන්තියේ එකඟත්වය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙස ය. ඒ අනුව ඒ අවධියේ දී නියෝජනය යන්න යොදා ගන්නා ලද්දේ ප්‍රභූ බලය භාවිත කිරීමේ ක්‍රමයක් ලෙස මිස ප්‍රභූ බලය පාලනය කිරීමේ ක්‍රමයක් ලෙස නො වේ.

ඇතැම් විචාරකයන්ට අනුව වෙනත් අය වෙනුවෙන් පෙනී සිටීම නියෝජනය වසයෙන් පිළිගැනීම රෝම නීතියේ එන මූලධර්ම දෙකකින් උද්ගත වූවකි.[24] 'ප්ලීනා පොටෙස්ටාස්' *(plena potestas)* නමින් හැඳින්වෙන පළමු මූලධර්මය වන්නේ 'ප්‍රොක්ටර්වරයෙකු'

23 Brito Vieira, M. and Runciman, D. (2008). *Representation,* (Cambridge: Polity Press). p. 125

24 Edwards, J. G. (1970). 'The Plena Potestas of English Parliamentary Representatives', in *Historical Studies of the English Parliament,* ed. E. B. Fryde and E. Miller, 2 vols. Cambridge: Cambridge University Press, I, pp. 136–49.

හෙවත් නියෝජිතයෙකු ලවා තමුන් ව නියෝජනය කරවා ගැනීමට කිසියම් පුද්ගලයෙකු හෝ සාමූහිකයක් එකඟ වීම යි. ඒ අනුව ඔවුන් වෙනුවෙන් එකී ප්‍රොක්ටර්වරයා විසින් පොරොන්දු වනු ලබන දේවල් ඉටු කිරීමට ඒ පුද්ගලයා හෝ සාමූහිකය අනිවාර්යයෙන් ම බැඳී සිටී. 'ක්වොඩ් ඔම්නෙස් ටැන්ජිට්' '*Quod omnes tangit*', යන ආප්තයෙන් හැඳින්වෙන දෙවැනි මූලධර්මය අනුව කිසියම් සමූහයක සියලු සාමාජිකයන්ගේ බැඳියාවලට බලපාන ඕනෑ ම කාරණයක් ඒ සමූහය විසින් සියල්ලන් වෙනුවෙන් ම කටයුතු කිරීමට බලය පවරන ලද නියෝජිතයන් මඟින් අනුමත කළ යුතු ය[25].

එංගලන්තයේ පාර්ලිමේන්තු ක්‍රමය ඇරඹෙන මුල් අවධියේ නියෝජනය පිළිබඳ අදහස භාවිත වූයේ රජුගේ පාලන බලය අර්ථවත් ලෙස සීමා කිරීමේ සංකල්පයක් ලෙස නො වේ. ඒ වෙනුවට ඇත්ත වසයෙන් ම සිදු වූයේ රජුගේ අධිකාරි බලයේ මෙවලමක් ලෙස පාර්ලිමේන්තුව භාවිත කොට රජුට වාසිදායක වන ලෙස ආණ්ඩුවේ නව විධිවිධාන සහ මූල්‍යමය අවශ්‍යතා සඳහා පාර්ලිමේන්තුවේ මනාපය ලබාගැනීම යි. මේ අනුව නියෝජන ආයතනයක් ලෙස පාර්ලිමේන්තුවේ භූමිකාව වූයේ ආණ්ඩුවේ මධ්‍යගත තීරණ ප්‍රාදේශික මට්ටමින් ද ඉටු වන බවට වග බලා ගනිමින් ඒවාට මනාපය සහතික කිරීම මිස රාජ්‍ය බලය යෙදිය යුතු ආකාරය පිළිබඳ ව රජු හා කේවල් කිරීම නො වේ.

දාහත්වැනි සිය වස වන විටත් 'නියෝජනය' යන්න භාවිත වූයේ හුදෙක් කිසියම් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් පෙනී සිටින්නෙකු යන තේරුමෙන් මිස ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වැදගත් සංකල්පයක් වසයෙන් නො වේ. සාමාන්‍යයෙන් එකල ප්‍රජාතන්ත්‍රවාදය සැලකුණේ රාජතාන්ත්‍රික, ප්‍රභූතාන්ත්‍රික සහ ප්‍රජාතාන්ත්‍රික යන අංග තුනෙන් ම සමන්විත අස්ථිර ආණ්ඩුක්‍රමයක්

25 Brito Vieira, M. and Runciman, D. (2008). Representation (Cambridge: Polity Press).p.15

ලෙස ය[26]. නියෝජනය යන්නෙන් ඒ වන විට අදහස් වුණේ කතිකා කොට ඥානාන්විත තීරණ ගැනීම  සඳහා ප්‍රභූ පෙළැන්තිය විසින් යොදා ගනු ලබන ක්‍රමවේදයක් ලෙස ය.

මේ නිසා පැරණි පාර්ලිමේන්තුව යනු මහජනයා හමුවේ රජු නියෝජනය කිරීම පිණිස සැකසුණ ආයතනයක් මිස රජු හමුවේ මහජනයා නියෝජනය කිරීම පිණිස සැකසුණු ආයතනයක් නො වීය.[27] අද්‍යතන ව්‍යවහාරයකින් කිව හොත් එකල පාර්ලිමේන්තු ක්‍රමය යනු කිරීටයේ පණිවුඩය ප්‍රකාශයට පත් කිරීමට යොදා ගත් මෙවලමයි. එහෙත් ඒ අතරම පාර්ලිමේන්තු මඟින් වෙනත් කටයුතු ද ඉටු විය. විශේෂයෙන් යුද්ධයක් වැනි අවස්ථාවක ඒ සඳහා සහයෝගය ලබා දීමට බැඳී සිටින අයගෙන් සහයෝගය ඉල්ලා සිටීම රජතුමාගේ වගකීමකි යන වැඩ වසම් සංකල්පය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තුව යෙදා ගැණිනි[28].  ඒ අතර ම මධ්‍ය කාලීන එංගලන්තයේ රජතුමා විසින් පිරිනමන ලද සංස්ථාපිත අනන්‍යතාවයක් සහිත කවුන්ටි, සුලු නගර සභා, කෝරල සහ නගරසභා ආදී විවිධාකාර ස්වයංපාලන ප්‍රජා ඒකක ප්‍රාදේශීය මට්ටමෙන් බිහි වීම වැඩි වෙමින් තිබුණි. ඒ නිසා ජාතික මට්ටමේ කරුණු සම්බන්ධයෙන් මනාපය ලබා දීම පිණිස ඒවාට නියෝජනය ලබා දිය යුතු ය යන අදහස ද  පාර්ලිමේන්තුවේ භූමිකාව පුළුල් කිරීමට හේතු විය.

ඒ හැර රජු සහ රාජකීය උපදේශක මණ්ඩලයේ අවධානය සඳහා දුක්ගැනවිලි යොමු කිරීම පිණිස පෙත්සම් ඉදිරිපත් කිරීමේ මාධ්‍යයක් ලෙස ද පාර්ලිමේන්තුව වැදගත් විය.  මෙම පෙත්සම් පාර්ලිමේන්තුව හරහා පැමිණිය යුතු විය. ඇතැම් රාජකීය ප්‍රතිපත්තිවල ඇති දෝෂ

26 Wood, G. S. (1992). Democracy and the American Revolution. In Democracy: The Unfinished Journey, 508BC to AD1993, ed. J. Dunn (Oxford: Oxford University Press), pp. 95–105.

27 Brito Vieira, M. and Runciman, D. (2008). Representation (Cambridge: Polity Press).p.15

28 Davies, R. G. and J. H. Denton (eds) (1981). *The English Parliament in the Middle Ages*. Manchester: Manchester University Press.

පෙන්වා දෙමින් නයිට්වරු සහ නාගරික පුරවැසියන් සාමූහික ව ඉදිරිපත් කළ පෙත්සම් නිසා කිසියම් දුරකට පාර්ලිමේන්තුව රාජ්‍ය විචාරණය පිළිබඳ විවේචන ඉදිරිපත් වන තැනක් බවට ද අනුක්‍රමයෙන් පත් විය. පාර්ලිමේන්තුව කිරීටය නියෝජනය කිරීමේ නෂ්ටාවශේෂ රාජාසන කතාවේ සිට මහජන පෙත්සම් කාරක සභාව දක්වා අද ද දැක ගන්නට ලැබේ.

කෙසේ වෙතත් නූතන පාර්ලිමේන්තු තුළ දේශපාලන පක්ෂ ක්‍රමය අනුව කටයුතු ඉටු කිරීමේ දී මහජන නියෝජිතයන්ගේ නියෝජන භූමිකාව එම පක්ෂවල දේශපාලන දෘෂ්ටිවාදය විසින් නියම කරනු ලබන ප්‍රමාණයට සීමා වෙයි. මේ නිසා ඇත්ත වසයෙන් ම සිදු වන්නේ ඡන්දදායකයන් නියෝජනය කිරීම පිණිස මහජන නියෝජිතයන් තෝරා පත් කර ගැනීමකට වඩා ඉදිරිපත් ව ඇති අපේක්ෂකයින් විසින් නියෝජනය කරනු ලබන සීමිත දෘෂ්ටිවාද සංඛ්‍යාවක් අතරෙන් තමන් විසින් තෝරා ගනු ලැබිය යුතු කුමන දෘෂ්ටිවාදය දැ'යි තීරණය කිරීමට ඡන්දදායකයාට සිදුවීමයි. ඉතින් එය ඡන්දදායකයන් නියෝජනය වන ප්‍රජාතන්ත්‍රවාදයක් වන්නේ කෙසේ ද?

ඒ නිසා දේශපාලනික නියෝජනය නිරායාසයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී වේ යැ'යි සිතීම වැරදි ය. එහෙත් හැම ප්‍රජාතන්ත්‍රවාදයක් ම වාගේ කිසියම් ආකාරයක නියෝජනයක් මත යැපෙන අතර හැම නියෝජන ක්‍රමයකට ම ඇතැම් ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග නිරූපණය කිරීමේ විභවය පවතින බව ද සැබෑවකි. එබැවින් මැතිවරණයෙන් නියෝජිතයන් තෝරා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය වසයෙන් සැලැකීම ඉක්මවා යන දේශපාලන කතිකාවක් අපට අවශ්‍ය ය.

පැරණි ග්‍රීසියේ පැවති පෞර ආණ්ඩුක්‍රම අතරින් ඡන්දයෙන් නියෝජිතයන් තෝරා ගත්තේ ස්පාටා නුවර පැවති ආණ්ඩුක්‍රමය යටතේ පමණි. එහෙත් ඇතන්ස් නුවර වැසියෝ එය සැලකුවේ කතිපයාධිපත්‍යයේ ම හෙවත් කුඩා බල කණ්ඩායමක් විසින් ආණ්ඩු බලය අල්ලා ගැනීමේ සටකපටකමක් ලෙස ය. ඇතන්ස් නුවර

පැවතුණේ ඊට වඩා හාත්පසින් ම වෙනස් ක්‍රමයකි. එහි දී සිදු වුණේ දේශපාලන නිලතල සඳහා අවශ්‍ය කරන පුද්ගලයන් කුසපත් ඇදීම මඟින් තෝරා ගැනීම යි. තනතුරුවලට පත් කිරීමට පෙර කුසපත් ඇදීමෙන් තේරුණු පුද්ගලයන්ගේ පුරවැසිභාවය සහ චර්යාව ප්‍රධාන මහේස්ත්‍රාත්වරයන් නව දෙනෙකුගෙන් යුත් අධිකරණයක් ඉදිරියේ විනිශ්චයට ලක් වේ. ඒ හැර තනතුරට පත්වීමෙන් පසුව ද ඕනෑම පුරවැසියෙකුට එසේ පත් වූ අයගේ චර්යාව ගැන අධිකරණයක දී අභියෝග කළ හැකි ය. එසේ කුසපත් ඇදීමෙන් තෝරා ගත් පුද්ගලයන් අයථා ක්‍රමවලින් මුදල් උපයා ඇත් දැ'යි සොයා බැලීම පිණිස ඔවුන්ගේ ගිණුම් වාර්ෂික ව විගණනයට ලක් කෙරේ.

ඇතන්ස් නුවර පැවති කුසපත් ඇදීමෙන් පාලන තනතුරුවලට තෝරා ගැනීමේ ක්‍රමය පුරවැසි සමානාත්මතාව යන සංකල්පය මත ඇති වූවකි.[29] අද පවා ස්වාධීන අධිකරණවල දී 'සමානයන් විසින් විනිශ්චයට භාජනය කරනු ලැබීම' යන සිද්ධාන්තය මත ජූරි සභිකයන් තෝරනු ලබන්නේ මෙකී කුසපත් ඇදීමේ ක්‍රමයට ය. මෙසේ කුසපත් ඇදීමේ ක්‍රමය මඟින් දේශපාලන නිලතලවලට පුද්ගලයින් තෝරා ගැනීම නිසා ධනය, ආගම, කුලය හා ජනවර්ගය, බලවත්කම, කල්ලිවාදය වැනි සාධක මත දේශපාලන බලය අත්පත් කර ගැනීම අසීරු ය.

12 හා 13 වැනි සියවස්වල ඉතාලියේ *popolo* නමින් හැඳින්වුණු නාගරික කොමියුන පාලන තන්ත්‍රයේ ද පාලනාධිකාරිය තෝරා ගනු ලැබුවේ ද කුසපත් ඇදීමේ ක්‍රමයෙනි. වැඩ වසම් රදල- ප්‍රවේණි දාස ක්‍රමය ගරාවැටීමත් සමඟ නිදහස් නගර ඇතිවීමත් වෙළඳ ශ්‍රේණිවල පාලනයට එම නගර නතු වීමත් සමඟ එසේ කුසපත් ඇදීමේ ක්‍රමය නගර පාලනාධිකාරිය තෝරා ගැනීමට බොහෝ සේ යොදා ගැණිනි. වැඩ වසම් ක්‍රමය පවත්වා ගනිමින් පරවේණියට අනුව තවදුරටත් රදල පෙළැන්තියට බලය ලබා දීම වැළැක්වීම සඳහා වාණිජ ශ්‍රේණිවල මෙහෙයවීමෙන් කුසපත් ඇදීමේ ක්‍රමය යොදා ගැනිණි. ෆ්ලොරන්ස්

29 Dowlen Oliver, (2008) *The Political Potential of Sortition,* Exeter: Imprint Academics,

සහ වැනීසිය වැනි නගරවල පාලනාධිකාරිය පත් කර ගැනීමට කුසපත් ඇදීම යොදා ගත් බව කුසපත් ඇදීමේ දේශපාලනික විභවය විචාරයට ලක් කරමින් *The Political Potential of Sortition* නම් කෘතිය ලියූ ඔලිවර් ඩොව්ලන් පැහැදිලි කරයි.[30]

ඇමෙරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ලියමින් තෝමස් පේන් සිය *Common Sense* නමැති කෘතියෙන් ඇමෙරිකානු ජනාධිපතිවරයා තෝරා ගැනීම පිණිස ද කුසපත් ඇදීමේ ක්‍රමය යොදා ගත යුතු බව යෝජනා කළේ ය. ඔහු කළ යෝජනාවට අනුව එක්සත් ජනපද ෆෙඩරල් රාජ්‍යයේ සාමාජික ජනපද 13 න් හැම එකක් ම දිස්ත්‍රික්ක 30 ක් බැගින් වූ ඡන්ද කොට්ඨාසවලට වෙන් කොට ඒවා නියෝජනය කිරීමට නියෝජිතයන් පත් කළ යුතු ය. අනතුරු ව ජනාධිපති ධුරය හිමි වන්නේ කිනම් ජනපදයකට යන්න කුසපත් ඇදීම මඟින් තෝරා ගත යුතු ය. ඉන් පසු එම ජනපදයට අයත් නියෝජිතයන් පමණක් ඔවුන් අතරෙන් ජනාධිපති තනතුරට පත් කළ යුතු තැනැත්තා ඡන්දයකින් තෝරා ගත යුතු ය. මේ යෝජනාව අනුව ජනාධිපතිගේ ධුර කාලය වසරකට සීමා වෙන අතර එම වසර අවසානයේ ඊ ළඟ ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා කුසපත් ඇදීමේ දී ජනපද 13 ට ම අවස්ථාව ලැබෙන තෙක් ඊට පෙර ජනාධිපතිවරුන් පත් වූ ජනපදවලට කුසපත් ඇදීමට සහභාගි විය නො හැකි ය. මේ ක්‍රමය මඟින් අනෙක් ජනපද අබිබවා එක් ජනපදයක් බලසම්පන්න වීම වැළකෙන බවත් ෆෙඩරල් ක්‍රමය තුළ සියලු ජනපද ඒකාග්‍රවී කටයුතු කිරීමට පෙලඹෙන බවත් පේන් විශ්වාස කළේ ය.

ඇමෙරිකානු යුද හමුදාව පිහිටුවීමේ ක්‍රමය සම්බන්ධයෙන් 1780 දී තෝමස් පේන් කළ යෝජනාවට ද කුසපත් ඇදීමේ ක්‍රමය යොදා ගෙන තිබුණි. ඒ අනුව එක් හමුදා භටයෙකු තෝරා ගැනීම පිණිස එක කණ්ඩායමකට තිහක් බැගින් වූ කණ්ඩායම්වලට සියලු වැඩිහිටියන්

30 Dowlen, Oliver, (2008) *The Political Potential of Sortition*, Exeter: Imprint Academics p. 144

වර්ග කළ යුතු ය. ඉන් අනතුරුව එකී තිස් දෙනා අතරින් කුසපත් ඇදීමේ ක්‍රමයට එක් තැනැත්තෙකු හමුදා භටයා ලෙස තෝරා ගත යුත්තේ ය. එහෙත් ඉතිරි 29 දෙනා සිය හමුදා භටයාගේ බරපැන දැරීමට සහ උපකරණ මිලට ගැනීමට වියදම සම සම ව දැරිය යුතු ය.

ප්‍රංශ විප්ලවයට පසු 1792දී කුසපත් ඇදීමේ ක්‍රමයක් මත දේශපාලනඥයන් තෝරා ගැනීමෙ ක්‍රමයක් ප්‍රංශ ව්‍යවස්ථා සම්පාදන සාකච්ඡාවේ දී තියඩෝර් ලෙසූර් *(Theodore Lesueur)* විසින් යෝජනා කරන ලදී. වඩා මෑතක 2007 දී ප්‍රංශ ජනාධිපතිවරණයට සමාජවාදී පක්ෂයෙන් ඉදිරිපත් වූ සෙගොලින් රෝයාල් මහත් උද්‍යෝගයකින් ප්‍රවර්ධනය කළ 'සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට' අනුව ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා නියෝජිතයන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම පිණිස කුසපත් ඇදීම මඟින් තෝරා ගන්නා ස්වාධීන පුරවැසි කමිටු පිහිටුවීමේ පොරොන්දුවක් ඇගේ මැතිවරණ ප්‍රකාශයට අඩංගු කළා ය.

කුසපත් ඇදීමේ ක්‍රමය මඟින් බොහෝ විට වැළැක්වීමට තැත් කර තිබෙන්නේ අද අප නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය නමින් හඳුන්වන ක්‍රමය නිසා ඇති වන විකෘතිය බව පැහැදිලි ය. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය නිසා ඇති වන විකෘති අවම කිරීම සඳහා එකක් නියෝජන ක්‍රමය යටතේ ද අනෙක කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ ද පත් කෙරෙන ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායක ක්‍රමයක් ජෝන් ගැස්ටිල් සහ එරික් ඔලින් රයිට් වැනි විචාරකයෝ යෝජනා කරති.[31] ඔවුන් යෝජනා කරන අන්දමට මණ්ඩල දෙකට ම එක සමාන ව නීති සම්පාදන බලය ලැබෙන අතර එසේ සම්පාදනය වන නීති කෙටුම්පත් මණ්ඩල දෙකේ ම වැඩි ඡන්දයෙන් අනුමත විය යුතු ය. මැතිවරණවලින් නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ දී මතවාදී හා පංතිමය ළැදිකමට සහ මුදල් බලයට අවනත වීමට ඇති ඉඩ කඩ වැඩිය. එහෙත් කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ ව්‍යවස්ථාදායක සභිකයන් තෝරා ගැනීමේ දී ඒ ඉඩ කඩ සීමා වෙයි. කුසපත් ඇදීමේ ක්‍රමය නිසා නුසුදුස්සන් තේරීම වැළැක්වීමට පැරණි ඇතන්ස්

31 John, Gastil & Erik, Olin Write (2019), *Legislature by Lot,* New York: Verso, p.11 KE

ප්‍රජාතන්ත්‍රවාදයේ දී මෙන් නුසුදුස්සන් අභියෝගයට ලක් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය හැකි ය. කුසපත් ක්‍රමය යටතේ තේරීමේ දී මුදල් බලය මෙන් ම පක්ෂග්‍රාහී ජනමාධ්‍ය මගින් ද බලපෑමක් කළ නො හැකි ය. මැතිවරණයක දී නැවත තරඟ කොට ජය ගැනීමේ අවශ්‍යතාව නිසා ඇති වන පීඩනය සහ පක්ෂ විනයකට යටත් වීමේ අවශ්‍යතාව කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ අදාළ නො වේ. එනිසා අවශ්‍ය තොරතුරු සහ දැනුම සැපයෙන්නේ නම් කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ පත් වන මන්ත්‍රණ සභාවකට සාම්ප්‍රදායික පක්ෂ විභජනය අබිබවමින් විවෘත මනසකින් යුක්ත ව අදාළ කරුණු සාකච්ඡා කළ හැකි විය යුතු ය.

ස්වාධීන මහජන සේවා ජනමාධ්‍ය වේදිකාවක් පවතින විට අදාළ ගැටලු ගැන හෘදයංගම මහජන කතිකාවකට මැදිහත් වීමට කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ පත් වන මන්ත්‍රණ සභිකයන්ට වැඩි හැකියාවක් ලැබේ. ඒ හැර දේශපාලන පක්ෂවල ධුරාවලිය විසින් පනවනු ලබන සීමා නොමැති බැවින් සමාජ මාධ්‍ය හරහා ඔවුන්ට මහජනතාව සමඟ විවෘත ව අදහස් හුවමාරු කර ගත හැකි ය. එහෙත් කුසපත් ඇදීමේ ක්‍රමය යටතේ පත් වන සභිකයන්ගේ කාර්ය සඵලතාව අසතුටුදායක නම් ඔවුන් ආපසු කැඳවීමේ හැකියාව මහජනතාවට තිබිය යුතු ය. කෙසේ වෙතත් කුසපත් ඇදීමේ ක්‍රමය යොදා ගැනීමේ දී වැදගත් ම කාරණය වන්නේ පොදු මහජනතාව සක්‍රිය දේශපාලනයේ නිරත කර ගැනීමට හැකි ස්වාධීන මහජන සංවිධාන හා ස්වාධීන මහජන සේවා ජනමාධ්‍ය වාතාවරණයක් නිරන්තරයෙන් පවත්වා ගෙන යෑමයි.

ඒ හැර ආණ්ඩු බලය මහජනයා විසින් විවෘත ව භාවිත කිරීම පිණිස යොදා ගත් විවිධ ක්‍රම පිළිබඳ සාර්ථක උදාහරණ කිහිපයක් ම පෙර අපර දෙ දිගින් ම දැකිය හැකි ය. උදාහරණයක් ලෙස 2017 දී දකුණු කොරියාවේ ජනාධිපති විසින් ප්‍රකාශ කළ බලශක්ති සැපයුම සඳහා න්‍යෂ්ටික බලය යොදා ගැනීම වහා ම අත්හිටවීමේ ප්‍රතිපත්තිය පුරවැසියන්ගේ සංවිචාරණීය මත විමසුමක *(deliberative*

*opinion poll)* ප්‍රතිඵල අනුව වෙනස් කිරීමට රජයට සිදු විය. මේ සඳහා කොරියානු ජනාධිපති මූන්ග්ගේ රජය අහඹු ලෙස *(random)* තෝරා ගත් පුරවැසියන් 500 දෙනෙකුට න්‍යෂ්ටික බලයට පක්ෂ හා විපක්ෂ කණ්ඩායම්වලට කන්දීමටත් න්‍යෂ්ටික බලයේ ආරක්ෂාව හා බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ විශේෂඥයන්ගේ ඉදිරිපත් කිරීම් සාකච්ඡා කිරීමටත් අවස්ථාව සැලසූහ. මෙම කතිකාව පුරා මාසයක් තිස්සේ පැවතුණ අතර ඉන් දෙමසකින් තව දුරටත් ඒ ගැන කරුණු කාරණා තක්සේරු කර බැලීමට එකී පුරවැසියන්ට අවස්ථාව ලැබුණු පසු අවසාන මත විමසුමට කැඳවන ලදී. ඒ සඳහා එකී පුරවැසි කණ්ඩායමෙන් 471ක් දෙනෙක් සහභාගි වූහ. විවාදයේ මූලික කාරණය වී තිබුණේ දැනට මත් සැලකිය යුතු ආයෝජනයක් කර ඇති පරමාණු බලාගාර දෙකේ ඉතිරි කටයුතු නිම කර ප්‍රයෝජනයට ගැනීම ද නැතහොත් ජනාධිපති මූන්ග් විසින් යෝජනා කළ පරිදි න්‍යෂ්ටික බලාගාර ඉදිකිරීම වහා ම නතර කළ යුතු ද යන්නයි. දැනට මත් සිදු කර ඇති ආයෝජනය සහ ආරක්ෂාකාරී න්‍යෂ්ටික බලය බලශක්ති ප්‍රභවයක් ලෙස ඛනිජ තෙල් යොදා ගැනීමට වඩා පරිසරයට හිතකර වේ යන මතය අනුව පුරවැසි කණ්ඩායමෙන් 59% ක් ජනාධිපතිවරයාගේ යෝජනාවට පටහැණි ව න්‍යෂ්ටික බලාගාර දෙකේ වැඩ කටයුතු වහාම අත්හිටු වීම ප්‍රතික්ෂේප කළහ.

ගබ්සා කිරීම අපරාධයක් කොට සැලකීම අවසාන කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අයර්ලන්තය කුසපත් ඇදීමෙන් අහඹු ලෙස තෝරා ගත් පුරවැසියන් 99 දෙනෙකුගෙන් යුත් පුරවැසි කතිකා පර්ෂදයක් කැඳවීය. එහි දී සාකච්ඡා කොට සම්මත කරගත් නිර්දේශ 2018 මැයි මාසයේ අයර්ලන්තයේ පැවති ජනමත විචාරණයකින් වලංගු කරන ලදී.[32] මේ පුරවැසි කතිකා මත විමසුම්වලට අහඹු ලෙස පත් කරගත් පුරවැසියන් අතරට තේරී සිටියේ වෘත්තීය දේශපාලනඥයෝ නො ව සාමාන්‍ය පුරවැසියෝ ය. එහි මුලසුන දැරුවේ කාන්තාවකි.

32 https://www.irishtimes.com/news/ireland/irish-news/the-citizens-assembly-a-canny-move-on-the-road-to-repeal-1.3510373 - Retrieved on 13 July 2021

ඉහත සඳහන් විධික්‍රම හැරෙන විට නියෝජිතයන් විරහිත ව විවෘත සහභාගිත්වය ප්‍රමුඛ කොට ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන නොයෙක් අවස්ථා ද තිබේ. එවැනි අවස්ථා වැඩවර්ජන වැනි කාර්මික අරගලවලට සහභාගි වීම සම්බන්ධයෙන් සාමූහික තීරණ ගැනීමේ දී මෙන් ම ඉන්දියාවේ දූෂණ විරෝධීන් අන්නා හසාරේගේ ජන් ලොක්පාල් ආන්දෝලන ව්‍යාපාරයේ මුල් කාලයේ දී තමන්ගේ ම වූ දූෂණ විරෝධී පනතක් සම්මත කර ගැනීමට ගත් වෑයමේ දී ද, නිව්යෝර්ක් නුවර ටයිම් චතුරශ්‍රයේ පැවති 'අත්පත් කර ගැනීමේ' *(Occupy Now)* වැනි උද්ඝෝෂණවල දී ද අපි දුටුවෙමු. එවැනි දැවැන්ත මහජන ව්‍යාපාර තම කටයුතු මැතිවරණ පාදක කරගත් මහජන නියෝජිතයන්ට ස්ථිරව ම පවරන්නේ නැත. එවැනි ව්‍යාපාරවල දෘෂ්ටිවාදී හා ප්‍රායෝගික කටයුතු මහජනතාව එක් රැස් වෙන විවිධ මට්ටමේ විවෘත රැස්වීම්වල දී ද එවැනි රැස්වීම්වල ගනු ලබන තීරණ අනුව පිහිටුවන කණ්ඩායම් රැස්වීම්වල දී ද මහජන විශ්වාසය දිනා ගත් කථිකයන් හා නායකයන්ගේ මෙහෙයවීමෙන් තීරණය වේ. ඒ කථිකයන් හා නායකයන් කෙරෙහි මහජනතාව විශ්වාසය තබන්නේ ඔවුන්ගේ සදාචාරාත්මක චර්යාව පිළිබඳ ව ඇති පැහැදීම, ඔවුන්ගේ නිපුණ බව සහ අවබෝධය පිළිබඳ ඇති පිළිගැනීම මත මිස ඔවුන් කිසියම් මහජන නියෝජන විධික්‍රමයකට අනුගත වීම නිසා නො වේ. ඒ නිසා ම එකී නායකයන් අතින් තම සදාචාරාත්මක බව හා පොදු යහපත සම්බන්ධයෙන් ඇති කැපවීම නිරන්තර ව නිරූපණය විය යුතු ය.

අද අප අත් දකින ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී නො වන බව බොහෝ අය. පිළිගන්නා කරුණකි. යථා ලෝකයේ දී දේශපාලනික සහ ආර්ථික මෙහෙයවීම් කටයුතු පිළිබඳ ඇත්ත තීරකයන් වන්නේ ආණ්ඩු කිරීමේ දී මහජනතාව නියෝජනය කිරීම පිණිස යැ'යි අදහමින් තෝරා පත්කර ගන්නා අය ම දැ'යි අපට නිශ්චිත ව කිව නො හැකි ය. බොහෝ විට අපේ ඡන්දයෙන් පත් වන ඊනියා නියෝජිතයන්ට සිදු වන්නේ තමන්ට වඩා බෙහෙවින්

බලගතු කොටස්වල අභිප්‍රායන්ට අවනත වීම යි. උදාහරණයක් වසයෙන් බහුජාතික සමාගම්වල විධායකයන් සහ ඔවුන්ගේ දේශීය නියෝජිතයන් මහජන ඡන්දයෙන් පත් වන අය නො වේ. එහෙත් තම කොටස්කරුවන් වෙනුවෙන් කිසිදු මහජන නියෝජන සභාවකට නැති අන්දමින් ආණ්ඩු මෙහෙයවීමේ හැකියාවක් ඔවුන්ට ඇත්තේ ය.

වර්තමාන ආර්ථිකය හා මූල්‍ය ගනුදෙනු පිළිබඳ කරුණු කාරණා සාමාන්‍ය මහජන නියෝජිතයන්ට නො තේරෙන තරම් සංකීර්ණ කර ඇති බැවින් ඒ සඳහා මහජන නියෝජිතයන් බොහෝ විට මැදිහත් වන්නේ හුදෙක් ප්‍රදර්ශනය සඳහා මිස ඇත්ත වසයෙන් ම මහජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ගැනීම සඳහා නො වේ. එවැනි වැදගත් කරුණු සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම සඳහා ඔය කියන මහජන නියෝජිතයන්ට කිසිදු බලයක් නැත. ඒවා තීරණය කරන්නේ භූ දේශපාලනයේ බලගතු පාර්ශවකරුවන්, බහුජාතික සමාගම් සහ ඔවුන්ගේ දේශීය නියෝජිතයන්, ව්‍යවසායක පැලැන්තිය, බැංකු, මුදල් විශුද්ධිකරුවන්, ආරක්ෂක කොන්ත්‍රාත්කරුවන් සහ ඉහළ පරිපාලකයන් යනාදීන්ගේ අවශ්‍යතා අනුව ය. ඒ නිසා ආණ්ඩුකරණය සම්බන්ධ සාමාන්‍ය ජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය වසර පහකට හෝ හතරකට වරක් පැවැත්වෙන මැතිවරණයකට සීමා වෙයි. ඒ අනුව ඇත්ත වසයෙන් ම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු වෙනත් තැනක සිට රාජ්‍ය බලය හොබවන අය විසින් ගනු ලබන තීන්දු තීරණවලට අනුගත වීම සඳහා සකසා ගත් ක්‍රමයකි.

ඒ නිසා බදියු පෙන්වා දෙන්නේ කලින් කලට මැතිවරණ මඟින් පත් කෙරෙන රාජ්‍ය මූලික තෝරා පත් කිරීම් මත රැඳෙනු වෙනුවට සුවිශේෂ ආර්ථික, දේශපාලනික හා සමාජීය කරුණු සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම පිණිස රට වැසියන්ගේ චින්තන ක්‍රියාවලිය හා ඍජු ලෙස අනුබද්ධ වන ක්‍රියාශීලී බිම් මට්ටමේ මහජන සහභාගිත්ව ක්‍රමයක් උපයෝගී කර ගත යුතු බවයි. කුසපත් ඇදීමෙන් අහඹු ක්‍රමයට තෝරා ගත් රටවැසියන් ප්‍රමුඛ කොට සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම පිළිබඳව හයවැනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කරන

විට බදියුගේ මේ අදහස මතක තබා ගැනීම වටී. බදියු අදහස් කරන අන්දමට එවැනි ජන සහභාගිත්ව දේශපාලනයක් සංකල්ප ගත කිරීමේ දී එම ක්‍රමය රාජ්‍ය සමඟ වහාම සම්බන්ධ වන ආකාරය ගැන වද වීමට අවශ්‍ය නො වේ. මන්ද වැඩි අවධානයක් රාජ්‍ය සඳහා යොදන විට සිදු විය හැක්කේ දේශපාලනය හුදෙක් රාජ්‍ය බලය අල්ලා ගැනීමකට සීමා වීමයි. එහි ප්‍රතිඵලය වන්නේ බලය නැති බැවින් රාජ්‍ය බලය අල්ලා ගැනීමකින් තොර ව අපට කිසිවක් කළ නො හැකි ය යන හැඟීම ඇතිවීමයි.

එහෙත් එය එසේ වීම අවශ්‍ය නැත. දේශපාලනය යන්නට මූලික විය යුත්තේ මනුෂ්‍යයන් ලෙස ප්‍රජාව කෙබඳු දියුණුවක් අත්පත් කර ගත යුතු ද යන්න සම්බන්ධයෙන් අපට ඇති දැක්ම යි. ඒකකයක් වසයෙන් ගත් විට මේ ප්‍රජාව අන්තර්ජාතික, කලාපීය හා ජාතික වැනි විශාල ඒකකවල සිට ප්‍රාදේශීය, නාගරික, ග්‍රාමීය, අසල්වාසික සහ වැඩපොළ මට්ටම දක්වා වූ වඩා කුඩා පරිමාණයේ ප්‍රජා කණ්ඩායම් සහ සමාජ ජාලවලින් ද සංයුක්ත විය හැකි ය. එහෙත් එවැනි දේශපාලනයක් ඇති කර ගත හැක්කේ කාට ද එවැනි දේශපාලනයක ප්‍රායෝගික තීන්දු තීරණ හැම ප්‍රජා මට්ටමකට ම කාන්දු වන ලෙස අර ගන්නේ කෙසේ ද වැනි ගැටලු මතු වෙයි. එම කටයුත්ත ඉටු කළ හැක්කේ මානව සමාජයේ අනාගතය කෙබඳු විය යුතු ද වැනි කරුණු පිළිබඳ ව පැහැදිලි උපාය මාර්ගික දැක්මක් ඇති අයට බව බදියු පවසයි. මන්ද බදියු පෙන්වා දෙන පරිදි ප්‍රායෝගික යථාර්ථය අනුව දේශපාලනය යනු එක් අතකින් සමාජයේ අනාගතය පිළිබඳ පැහැදිලි දැක්මක් ඇති මහජනතාවක් සිටීම සහ සුදුසු තත්වයක දී එවැනි සමාජයක් බිහි වීම අතර තිරසාර සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම යි.

ඒ නිසා මේ සඳහා හොඳ ක්‍රියාකාරිකයෝ අවශ්‍ය වෙති. ක්‍රියාකාරිකයන් යනු ප්‍රජාවේ අනාගත ඉරණම ගැන දැක්මක් ඇති නව සමාජ මං පෙත් ගවේෂණය කිරීමට කැප වූ, විවිධ අයහපත් තත්ව යටතේ ජීවත් වන මනුෂ්‍යයන් සැලකිය යුතු සංඛ්‍යාවක් නිතර මුණ ගැසෙන හා ඔවුන් මුහුණ දී ඇති ජීවන තත්වය සාකච්ඡාවට ලක්

කරන, ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ගෝලීය පර්යාලෝකයකින් තේරුම් ගැනීමට උදව් කරන පුද්ගලයෝ ය. ඒ අතර ම ඔවුන් අධ්‍යාපනික කටයුතු, සාකච්ඡා, පැහැදිලි කිරීම් ආදියේ නිරන්තරයෙන් නිරත වන, අර කී විවිධ අයහපත් තත්ව යටතේ ජීවත් වන මනුෂ්‍යයන්ට උනන්දුවෙන් කන් දෙන සහ අවසානයේ දි එකී තත්ව වෙනස් කිරීමට ඔවුන් හා එක් ව විවිධ මට්ටමින් වැඩ කරන අයයි. එකී විවිධ මට්ටම් යනු වැඩපොළක්, වීදියක්, ගමක්, නගරයක්, හෝ ඇතැම් තත්ව යටතේ රටක් හෝ කලාපයක් වුව ද විය හැකි ය. බදියු පෙන්වා දෙන අන්දමට එය රඳා පවතින්නේ උද්ගත වන අවස්ථානුගත සිද්ධි අනුව යි. සාමාන්‍යයෙන් ඒවා හැඳින්වෙන්නේ ඓතිහාසික අවස්ථා ලෙස ය.

ඒ නිසා බදියු පෙන්වා දෙන අන්දමට දේශපාලනය සහ ඉතිහාසය අතර ඇති වන අන්තර් ඡේදනය ඉතා වැදගත් කරුණකි. ඇත්ත වසයෙන් ම දේශපාලනය ඓතිහාසික වන්නේ අසාමාන්‍ය අවස්ථාවල දී ය. සාමාන්‍යයෙන් එවැනි අසාමාන්‍ය සිදුවීම් හඳුන්වන්නේ මින් පෙර නො වූ විරූ අවස්ථා මහා පරිමාණයෙන් මහජනතාවට පිරිනැමෙන සිද්ධි ලෙසයි.[33] එවැනි එක් ඓතිහාසික සිදුවීමක් නම් පැරණි ග්‍රීසියේ ඇතන්ස් නගරයේ රදලයන්ට එරෙහිව කලක් තිස්සේ පැවති ගොවි ජන අසහනය නිසා උද්ගත වූ දැවැන්ත විරෝධය සෝලොන් සහ අනතුරුව ක්ලයිස්තීනස් වැනි ප්‍රතිසංස්කරණකරුවන්ගේ මැදිහත් වීමෙන් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය බවට පරිවර්තනය කර ගැනීමයි.[34] තවත් එවැනි ඓතිහාසික සිද්ධියකට උදාහරණයක් නම් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය බිහි වීමට තුඩු දුන් 17 හා 18 සියවස්වල එංගලන්තයේ ඇති වූ සිවිල් යුද්ධයයි.

එවැනි ඓතිහාසික සංසිද්ධියක් සම්බන්ධයෙන් වඩා මෑතක උදාහරණයක් ලෙස 2010 දී ටියුනීසියාවේ රැකියා විරහිත මොහොමඩ් බුවාසිසි ගිනි තබා ගෙන සිය දිවි නසා ගැනීමත් සමග උද්ගත වූ

---

33 Badiou, Alan with Lancelin, Aude, (2019) *In Praise of Politics,* M*edf*ord: Polity Press, pp.13-14

34 Ehrenberg, V. (1968), *From Solon to Socrates,* London: Methuen.

'අරාබි වසන්තය' යනුවෙන් හැඳින්වෙන මහජන නැගිටීම සැලකිය හැකි ය. එහෙත් එවැනි අවස්ථා වහා ම උද්ගත වන බවක් දක්නට නැත්නම් වඩා සුලු පරිමාණයෙන් කටයුතු කර ගෙන යෑමට ප්‍රතිසංස්කරණකරුවන්ට සිදු වෙනු ඇත. මහා පරිමාණයේ සංසිද්ධියක් ඇති වෙන විට තීරණාත්මක ලෙස යොදා ගත හැකි වන්නේ යැ'යි යන දේශපාලන අවබෝධයකින් යුතු ව එවැනි කුඩා පරිමාණයේ සිදුවීම් නිශ්චිත කර ගත යුතු ය. කොටින් ම මෙහි දී අරමුණ වන්නේ දේශපාලනය යනු නායකයන් හෝ පක්ෂ තෝරා ගැනීම නො ව කිසියම් උචිත අවස්ථාවක දී උපයෝගී කර ගත හැකි 'තීරණාත්මක අදහස් ප්‍රමාණයක්' ජනනය කිරීම බව ඒත්තු ගැන්වීම යි. දේශපාලනයේ නිරත වීමේ දී අවශ්‍ය වන්නේ අනාගතයේ දී කෙබඳු තත්වයකට ප්‍රජාව පත් විය යුතු ද යන්න පිළිබඳ ව සංවිචාරණීය සාකච්ඡා *(deliberative discussions)* මත පදනම් වූ දැක්මකි. එම දැක්මට ග්‍රාමීය මට්ටමේ සිට කලාපීය හා ගෝලීය මට්ටම දක්වා හැකි හැම මට්ටමක දීම මහජනයා එක්රැස් කිරීමට ද යොදා ගැනීමට ද හැකියාවක් තිබිය යුතු ය.

මහා දේශපාලන සංසිද්ධියක් යනු එකී හැකියාව විශාල පරිමාණයකින් උද්ගත වන අවස්ථාවකි. සිය අදහස් නො පැකිළ ව ප්‍රකාශ කිරීමට මහජනතාව ඉදිරිපත් වන්නේත් බිම් මට්ටමේ කතිකා සහ පිවිසීම් මත පදනම් ව සිදුවීම්වල දිශානතිය තීරණය කිරීමට මහජනතාව ක්‍රියාකාරී ව මැදිහත් වන්නේත් එවැනි අවස්ථාවල දී ය. රාජ්‍ය බලය අල්ලා ගැනීම අත්‍යවශ්‍ය වේ යන්නට වඩා දේශපාලන සංසිද්ධිවල දී වැදගත් වන්නේ කුඩා පරිමාණයෙන් ආරම්භ වී ප්‍රජා ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යැ'යි සාකච්ඡාවට ලක් වූ මූලික යෝජනා අධිෂ්ඨානශීලී ව ක්‍රියාත්මක කිරීමට දැනුවත් ව මැදිහත් වීමයි. ඒ සඳහා මූලික ව අවශ්‍ය වන්නේ ව්‍යවස්ථා හා නීති සම්පාදනයට විවෘත ලෙස මහජනතාවට මැදිහත් වීමට ඉඩ සලසන වැදගත් ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගැනීමයි. අනෙක් මුඛ්‍ය කාරණය අණපනත් සහ යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී රාජ්‍ය බලය කාර්යක්ෂම ලෙස

මහජන සන්නිරීක්ෂණයට ලක් කරන ඵලදායක සංරචක හා නියාමන විධිවිධාන පනවා ගැනීමත් ය. මහජන පරිමණ්ඩලය අන්තර්ග්‍රහනීය ව පවත්වා ගෙන යෑමට හැකි ජනමාධ්‍ය පද්ධතියක් හා වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් ඒ අවශ්‍යතාවේ ම අනිවාර්ය අංගයකි.

# - 4 -

## සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය

"හැම වැඩිහිටියෙකු ම පාහේ දේශපාලන ක්‍රමය තුළ ඡන්දය භාවිත කළත් දැනුම, ධනය, සමාජ තත්වය, විධායකය මෙහෙයවීමේ හැකියාව සහ අනෙකුත් සියලු සම්පත් අසමාන ලෙස බෙදී ඇති විට ඇත්තට ම ආණ්ඩු කරන්නේ කවුද ?" යනුවෙන් වසර හැටකට පෙර යේල් සරසවියේ දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය රොබට් ඩාල් ඇසූ ප්‍රශ්නය නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් අදටත් වලංගු ය.[35] ඒ වන විට ආර්ථික විද්‍යාඥ ජෝශප් ෂුම්පිටර් 1942 දී පළ කළ ඔහුගේ ප්‍රකට *Capitalism, Socialism, and Democracy* නමැති කෘතියේ ප්‍රජාතන්ත්‍රවාදය නිර්වචනය කර තිබුණේ මිනිසුන්ගේ මනාපය පරිදි කටයුතු කිරීම පිණිස "නායකත්වයට පත් වීමට බලාපොරොත්තු වන අය විසින් මැතිවරණයක දී ඡන්ද සඳහා කරනු ලබන තරඟයක්" ලෙසයි.[36]

ෂුම්පිටර්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු චේතනාවක් නො ව "දේශපාලනමය, ව්‍යවස්ථාමය සහ පරිපාලනමය තීරණ ගැනීම පිණිස සකසන ලද කිසියම් ආයතන පද්ධතියක් පිළිබඳ ක්‍රමවේදයකි".[37]

35 Dahl, Robert A. (1961) Who Governs? Democracy and Power in an American City, New Haven: Yale University Press, p. 1."

36 Schumpeter, Joseph (1975), Capitalism, Socialism and Democracy New York: Harper & Row, p. 285, conditions for democracy 289-296.

37 Schumpeter, Joseph (1950) Capitalism, Socialism and Democracy, Melbourne: George Allen & Unwin Ltd, p. 242

වඩාත් ම හොඳින් සන්නද්ධ ව සිටින තරඟකරුවන් අතර දේශපාලන නායකත්වය සඳහා නිර්ප්‍රචණ්ඩ තරඟයක් එම ක්‍රමය මඟින් ප්‍රවර්ධනය කරන බව ෂුම්පිටර්ගේ මතය විය. ඡන්ද සඳහා වන දේශපාලන තරඟය තරඟකාරී වෙළඳ සමාගම් විසින් සිය අභිමතයට අනුව පාරිභෝගික මතය හැඩ ගස්වනු ලැබීමට සමාන බව ෂුම්පීටර් පැවසීය. ඒ අනුව මැතිවරණයක් යනු දේශපාලන පක්ෂ විසින් කරනු ලබන නියාමනය හරහා තරඟකාරී දේශපාලන ව්‍යවසායකයින් විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ගැන තීරණය කිරීමේ සටනකි.[38] ෂුම්පිටර්ගේ එම නිර්වචනය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සරල, සකසුරුවම් සහ විශිෂ්ට නිර්වචනයක් ලෙස එකල සැලකුණි.

බහුජන කැමැත්ත යනු ඇත්ත වසයෙන් ම බහු ජනතාවගෙන් ජනිත වන්නක් නො ව තරඟකාරී නායකයන් විසින් හැඩ ගස්වනු ලබන්නක් බව ජෝශප් ෂුම්පිටර් කියා සිටියේ ය. මැතිවරණයක දී සිදුවන්නේ පුරවැසියන් තමන් විසින් තෝරා ගනු ලබන නායකයින්ගේ මතවාදයට අනුගත වීමයි. මැතිවරණය සඳහා අවශ්‍ය කරන කොන්දේසි කිහිපයක් ගැන ෂුම්පිටර් සඳහන් කරන නමුදු ඔහුගේ නිර්වචනයට අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ හරය මැතිවරණයයි. ෂුම්පිටර්ගේ සිද්ධාන්තය තුළ පුරවැසි සහභාගිත්වයට වැදගත් ස්ථානයක් නො ලැබෙනවා පමණක් නො ව නිශ්චිත කාලසීමා අතර පැවැත්වෙන මැතිවරණවලට සහභාගී වීම හැරෙන විට පුරවැසියන්ට වෙනත් කිසිදු භූමිකාවක් නැත. ඒ නිසා ෂුම්පිටර් වර්ගයේ සාම්ප්‍රදායික සිද්ධාන්ත අනුව ප්‍රජාතන්ත්‍රවාදය යනු නායකත්වය සඳහා සුළුතර ප්‍රභූ පිරිසක් අතර කෙරෙන තරඟයක් සඳහා බහු ජනතාව අනුග්‍රහය ලබා දිය යුතු ක්‍රමයකි.

සියවස් දෙකකට ආසන්න කාලයක් ග්‍රීසියේ ඇතන්ස් නුවර පැවති ප්‍රජාතන්ත්‍රවාදී විධි ක්‍රමය ඊට බොහෝ වෙනස් වූවකි. ඇත්ත වසයෙන් ම සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ගැන පැරණි ම නිදර්ශනයක් වසයෙන් බොහෝ අය සලකන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ නිජ බිම ලෙස

38 Schumpeter, Joseph (1975), Capitalism, Socialism, and Democracy, New York: Harper & Row, p. 269.

සැලකෙන ඇතන්ස් නුවර පැවති ප්‍රජාතන්ත්‍රවාදයයි. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් අදහස් වන්නේ නියෝජිතයන් වෙනුවට දේශපාලන තීන්දු තීරණ ගැනීම ඍජු ව ම පුරවැසියන්ට පැවරෙන ප්‍රජාතන්ත්‍රවාදී විධික්‍රමයකි.

ඇතීනියානුවන්ගේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනෙකුත් බොහෝ ග්‍රීක පෞර රාජ්‍යවල පැවති පාලන ක්‍රමවලට වඩා අඩු ම වසයෙන් ලක්ෂණ දෙකකින් වෙනස් විය. පළමුවෙන් ම ඇතන්ස් නුවර නීති සම්පාදනය කිරීම කිසියම් ප්‍රභූ කණ්ඩායමකට සීමා නො වීය. ඒ වෙනුවට, වහලුන්[39] හා ස්ත්‍රීන් හැර, ඇතන්ස් නුවර විසූ අන් හැම පුරුෂයෙකු ම එකිනෙකා සමඟ සංවිචාරණය *(deliberation)* කරමින් හෙවත් 'හේතු යුක්ති සහගත ව සාකච්ඡා කරමින්' නීති සම්පාදනය හා ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමට සාමූහික ව සහභාගි විය යුතු ය. මේ සහභාගිත්වය තීරණය වූයේ සහභාගි වන්නාගේ පරම්පරාව, වංශය හෝ ගෝත්‍රය අනුව නො ව නාගරික පදිංචිය, නිවහලෙකු වීම සහ නගරවැසියන් අතර පැවති අන්‍යෝන්‍ය-උප ජීවනය *(interdependence)* යන කරුණු මතයි. ඇතන්ස් නුවර පුරවැසිභාවය යනුවෙන් හැඳින්වුණේ එය යි.

එක්ලෙසියා *(ecclesia)* නමින් හැඳින්වුණු ඇතන්ස් මන්ත්‍රණ සභා රැස්වීම පැවතුණේ ප්‍රේක්ෂකයන් 14,000 කට රැස් විය හැකි එළිමහන් රඟමඩලකයි. එම රැස්වීමක සාමාන්‍ය ගණපූරණය 6000 කි. හාවඩ් සරසවියේ දේශපාලන විද්‍යා මහාචාර්යවරියක වන ජේන් මැන්ස්බ්‍රිජ් පෙන්වා දෙන අන්දමට එක්ලෙසියා සභාව යනු "සිය පුද්ගලික කුටුම්බය පිළිබඳ ළැදිකම් අමතක කොට හැම දෙනෙකු ම හවුලේ භුක්ති විඳින ලෝකයක එකිනෙකා අභිමුඛ වන සහ සිය සහෝදර පුරවැසියන්ට වග වෙන පුරවැසි සභාවකි".[40] ඊට සහභාගි

39 ඇතන්ස් නුවර පැවති පාලන ක්‍රමය අනුව වහලුන් යනු දාසකම් කළ අය පමණක් නොවේ. බොහෝ විට සිවිල් සේවකයන් සහ පොලිස් භටයන් ලෙස කටයුතු කළේ ද පුරවැසියන් නො වන වහලුන් ය.

40 Mansbridge, Jane. 1980. *Beyond Adversary Democracy*. New York: Basic Books. pp. 13-14

වන හැම පුරවැසියෙකුට ම යුද්ධ ප්‍රකාශ කිරීමේ සිට බදු අය කර ගැනීම දක්වා වූ ඕනෑ ම විෂය කරුණක් ගැන සම්පාදනය විය යුතු යැයි තමන් විශ්වාස කරන නීතියක් යෝජනා කළ හැකි විය. එසේ නැති නම් වෙනත් පුරවැසියෙකුට එරෙහි ව විභාග කළ යුතු චෝදනාවක් ඉදිරිපත් කිරීම කළ හැකි විය. තීරණ ගැනීම සිදු වූයේ සම්මුතියට පැමිණීමෙන් බැවින් යෝජනාවට හෝ චෝදනාවට හෝ පක්ෂ ව ඉදිරිපත් කරන කරුණු තාර්කික සහ යුක්ති යුක්ත කළ හැකි ඒවා විය යුතු ය. නො වැදගත් යෝජනා සහ බොරු චෝදනා ඉදිරිපත් කළ හොත් ඒ සම්බන්ධ ව විභාග කිරීමට කුසපත් ඇදීමෙන් තෝරා ගත් ජූරි සභාවක් ද විය. කෙසේ වෙතත් මේ සා විශාල පිරිසක් එක් ව කරන සාකච්ඡාවක් නිසියාකාර ව පවත්වා ගැනීමට නම් සෑම පුරවැසියෙක් ම සැලකිය යුතු ඉවසීමකින් සහ අවධානයකින් කටයුතු කළ යුතු ය. එපමණක් නො ව විසම්මුතික අවස්ථාවල දී සහෝදර පුරවැසියන් යනු අවධානයකින් යුතු ව සවන් දීමට තරම් වටිනා අය බව පිළිගත හැකි නිවැරදි මනෝ ගතියක් ද රැස් වන පුරවැසියන් තුළ තිබිය යුතු විය. කොටින් ම සියලු පුරවැසියන් මිතුරන් ලෙස හැසිරිය යුතු ය. ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල් පැවසූ අන්දමට හොඳ මිත්‍රත්වයක් යනු "යහපත් සහ සත්ගුණවත් බවින් එක සමාන එකිනෙකාට යහපත පතන මිනිසුන්ගේ බැඳීමකි".

ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ වැඩි ඡන්දයෙන් තීරණ ගැනීමක් සිදු නො වූ තරම් ය. තීරණ ගැනීම හැකි තාක් දුරට සම්මුති එකඟත්වය මත ම සිදු කිරීම සම්ප්‍රදාය විය. මැන්ස්බ්‍රිජ් තේරුම් කරන අන්දමට "සාකච්ඡාව අවසානයේ එක් සාමාජිකයෙක් හෝ සාමාජිකයන් කිහිප දෙනෙක් සාකච්ඡාවලට අනුව ඒ වන විට සභාවට එළඹිය හැකි නිගමනය කුමක් ද යන්න කෙටියෙන් පැහැදිලි කරති. එලෙස ඉදිරිපත් කළ නිගමනය සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නො වී නම් එම නිගමනය එක්ලෙසියා සභාවේ සම්මුතිය ලෙස සැලකෙයි."[41] එහෙත් විරුද්ධත්වයක් ඇතිවී නම් කුමක් විය හැකි ද? සම්මුතියට

41 ibid. p 32

එළඹීමේ විධික්‍රම විවිධ බව පෙන්වා දෙන මෙන්සර් නිගමනය සම්බන්ධයෙන් කිසිවෙකු විසින් විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක දී බොහෝ විට සිදු වන්නේ එම විරුද්ධත්වයට හේතු වූ කාරණය යෝජිත සම්මුතියට අනුව සමථයට පත් කළ හැකි ආකාරය පළමුවෙන් ම වෙනත් අයෙකු විසින් පැහැදිලි කරනු ලැබීම යි.[42] එම පැහැදිලි කිරීම අසාර්ථක නම් විරෝධයට පාදක වූ තර්කයට අනුකූල වන ලෙස සම්මුතිය සඳහා ඉදිරිපත් වූ යෝජනාව ප්‍රතිශෝධනය කරනු ලැබේ. එහෙත් එසේ යෝජනාව ප්‍රතිශෝධනය කිරීම මඟින් විරෝධතාව සමනය කළ නො හැකි බව පෙනී ගිය හොත් උපයෝගී කර ගත හැකි තවත් ක්‍රම තුනක් ඉතිරි වේ. ඉදිරිපත් ව ඇති සමථ යෝජනාව ගැන වැඩිදුරටත් පැහැදිලි කිරීම් ලබා ගැනීමෙන් පසු විරෝධතාව දැක්වූ තැනැත්තා විසින් සිය විරෝධතාව ඉවත් කර ගැනීම ඉන් පළමු වැන්නයි. එහෙත් එසේ නො වී ප්‍රතිශෝධිත යෝජනාව පිළිගැනීම විරෝධතාකරු විසින් දිගින් දිගට ම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඉතිරි වන්නේ විකල්ප දෙකකි. ඉන් පළමුවැන්න විරෝධතාකරු විසින් යෝජනාව මුළුමනින් ම අවහිර කිරීමයි. එය බොහෝ දුරට නිෂේධ බලය භාවිත කොට යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට හැම සහභාගි වන්නෙකුට ම ඇති අයිතිය යොදා ගැනීමකි. එහෙත් තමන් විරුද්ධ වුවත් අන් අයගේ එකඟත්වයෙන් යෝජනාව සම්මත කර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතාකරුගේ විශාල අකැමැත්තක් නැත්නම් ඔහුට "පැත්තකට වී" යෝජනාවට සහයෝගය නො දක්වා සිටිය හැකි ය. ඒ අනුව අන් අය විසින් යෝජනාව සම්මත කොට ඒ අනුව කටයුතු කිරීම ගැන විරෝධතාකරු අමනාපයක් නො දක්වන නමුත් එම යෝජනාවට අනුව කටයුතු කිරීමේ වගකීමකට තමා බැඳී නැති බවට පිළිගැනීමක් අන් අයගෙන් ලබා ගනී.

ඇතීනියානු වර්ගයේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හරියට ම ක්‍රියාත්මක වීමට නම් පුරවැසියන් අවංක වීම සහ සිය පුද්ගලික අභිමතාර්ථ අබිබවා පොදු යහපත පිණිස කැප වූ අය වීම අත්‍යවශ්‍ය

42 Menser, Michael (2018): *We decide!: theories and cases in participatory democracy,* Temple University Press p. 266

විය. ඒ නිසා නිවැරදි මනෝ ගතිය පමණක් නො ව 'එක හිතකින්' කටයුතු කිරීමේ හැකියාවත් ඔවුන්ට තිබිය යුතු ය. ජේන් මැන්ස්බ්‍රිජ් එය හඳුන්වන්නේ 'ඒකීය ප්‍රජාතන්ත්‍රවාදය' *(unitary democracy)* ලෙසයි.[43] ඇයට අනුව කිසියම් ප්‍රතිපත්තියකට සහයෝගය දැක්වීම පමණක් නො ව සියලු දෙනා ම එම සහයෝගය දක්වන්නේ එක ම හේතු මත වීමත් එවැනි ඒකීය ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා අවශ්‍ය වේ. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මේ මුල්කාලීන මාදිලිය සමජාතීය *(homogeneous)* ප්‍රජාවක් පිළිබඳ කතන්දරයක් ලෙස සැලකිය හැකි ය.

ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදය යනු හුදෙක් පුරවැසියන්ගේ සාමූහික සාකච්ඡාව සහ නීති සම්පාදනය කිරීම පමණක් නො වේ. ආණ්ඩුකරණය සහ පරිපාලනය ද එයට අයත් ය. හැම ඇතීනියානු පුරවැසියෙකුට ම පරිපාලනයට දායක වීමේ අයිතිය තිබුණා පමණක් නො ව කිසියම් කාලසීමාවක් සඳහා රජයේ නිලයක් දැරීම ද ඉටු කළ යුතු වගකීමක් විය. හමුදා සේවය, බදු එකතු කිරීම ආදියේ සිට උත්සව සංවිධානය කිරීම සහ පොදු ස්ථාන පවත්වා ගෙන යෑම දක්වා ඉටු කළ යුතු ආණ්ඩුවේ විවිධ රාජකාරි කටයුතු ඒ අතර විය. හමුදා ජනරාල් වැනි විශේෂ ප්‍රාගුණ්‍යයක් තිබිය යුතු තනතුරුවලට පුද්ගලයන් තෝරා ගනු ලැබුවේ සමාන ඡන්දයෙනි. අනෙකුත් සියලු තනතුරු සඳහා පුරවැසියන් නම් කරනු ලැබුවේ කුසපත් ඇදීමෙන් අහඹු ලෙස තෝරා ගැනීමෙනි. එසේ තෝරා ගත් අයට සේවා දීමනාවක් ගෙවනු ලැබූ නමුත් සේවා කාලය කෙටි එකක් විය. එක් පුරවැසියෙකුට එක සේවා කාලයකට වඩා තම තනතුර තබා ගත නො හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිදු පුද්ගලයෙකුට හෝ පවුලකට ආණ්ඩුවේ කිනම් ආයතනයක් සම්බන්ධයෙන් වුව ද තම බලය තහවුරු කර ගැනීම අසීරු විය.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ එවැනි වැදගත් නිදර්ශන ඇතැම් ගෝත්‍රික සමාජවල ද පැවතුණි. ඒ අතරින් එක් විශිෂ්ට උදාහරණයක් වන්නේ උතුරු ඇමෙරිකාවේ පැවති ඉරොකොයිස්

43 Mansbridge, Jane. (1980). *Beyond Adversary Democracy.* New York: Basic Books. pp. 13-15

*(Iroquois)* යනුවෙන් හැඳින්වෙන ස්වදේශීය ගෝත්‍රික ෆෙඩරේෂණයයි. අවාසනාවකට මෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ නිජ බිම ඇතන්ස් නුවර ලෙස සලකන බොහෝ අයගේ නිසි අවධානයට යොමු ව නැතත් ආචාර්ය මයිකල් මෙන්සර් පෙන්වා දෙන පරිදි ඉරොකොයිස් ෆෙඩරේෂණය මෙතෙක් මිහි මත ඇති වූ වඩාත් ම ශක්තිමත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය විය හැකි ය.[44] ගෝත්‍ර පහකින් සමන්විත ව ක්‍රි.ව. 1570-1600 අතර ගොඩනැගුණ බව සැලකෙන ඉරොකොයිස් ෆෙඩරේෂණයට අයත් වූ ජනගහනය ප්‍රමාණයෙන් 20,000ක් පමණ විය. දිගු කාලයක් තිස්සේ පාරම්පරික ව පැවත ආ මුහුණට මුහුණ ලා සාකච්ඡා කරන රැස්වීම් ක්‍රමවේදයක් අනුගමනය කළ ඉරොකොයිස් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය නිසා දේශපාලන බලය ඒකරාශි වීම, ධුරාවලි සහ පංති ක්‍රම ඇති වීම ද වැළකුණු අතර ගෝත්‍රිකයන් වැඩි දෙනෙකුට ප්‍රතිපත්ති සම්පාදනය, නෛතික හා දේශපාලනික විනිශ්චයට දායක වීම සහ පරිපාලනයට සහභාගි වීමට ද ඉඩ සැලසුණි.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නූතන දෘෂ්ටිකෝණයකින් බැලූ විට ඉරොකොයිස්වරුන් කිහිප ආකාරයකින් ම ඇතීනියන්වරුන් ඉක්මවා යන බව ආචාර්ය මෙන්සර් පෙන්වා දෙයි. ඇතන්ස්වල මෙන් නො ව ඉරොකොයිස් ක්‍රමය යටතේ දේශපාලන තීරණ ගැනීමේ දී ස්ත්‍රීන්ට ද පූර්ණ සහභාගිත්වය හිමිවුණි. ස්ත්‍රීන් සඳහා වෙනම මන්ත්‍රණ සභාවක් තිබූ අතර ෆෙඩරේෂණයේ සාකච්ඡාවට ලක් වන සියලු කරුණු සහ යෝජනා පළමුවෙන් ම ස්ත්‍රීන්ගේ මන්ත්‍රණ සභාව තුළ සාකච්ඡා කළ යුතු විය. තීරණ ගැනීම සැම විට ම අවසානය දක්වා සාකච්ඡා කොට සියල්ලන්ගේ ම ඒකමතික එකඟත්වයෙන් සිදු විය යුතු විය. ඒ අතින් එය ඇතන්ස් නුවර 'එකාවන් ව තීරණ ගැනීමේ' සම්ප්‍රදායට බෙහෙවින් සමාන ය. එසේ ස්ත්‍රීන්ගේ මන්ත්‍රණ සභාව තුළ එකඟත්වයට පැමිණ ගනු ලැබූ තීරණ ඉන් අනතුරු ව පැවැත්වෙන පුරුෂ සම්මන්ත්‍රණ සභාවේ දී සාකච්ඡාවට ලක් විය

44 Menser, Michael (2018): *We decide!: theories and cases in participatory democracy,* Philadelphia PA: Temple University Press, p. 7

යුතු ය. අදාළ යෝජනාව සම්බන්ධයෙන් පුරුෂ සම්මන්ත්‍රණ සභාවේ ඒකමතික තීරණය ලැබුණොත් එය නැවත ස්ත්‍රී මන්ත්‍රණ සභාවට යොමු කරන අතර අවශ්‍ය නම් එහි දී අවසාන වරට යෝජනාව නැවත විමසුමට ලක් කෙරේ. මෙම ක්‍රමය අනුව ඉරොකොයිස් සමාජයේ පාලනය පිළිබඳ සියලු යෝජනා පළමුව ස්ත්‍රීන් විසින් අනුමත කරනු ලැබිය යුතු විය.

ඉරොකොයිස් ජනගහනයෙන් වැඩි පිරිසක් අද අප පුරවැසියන් ලෙස හඳුන්වන නිත්‍ය නේවාසිකයෝ ය. එහෙත් නිත්‍ය නේවාසිකයන් නො වන විදේශිකයන්ට පවා ඉරොකොයිස් දේශපාලන ක්‍රමයේ කොටස්කරුවන් ලෙස සලකා නිසි ගරු බුහුමන් දැක්වූහ. ඇතීනියන්වරුන් මෙන් ඉරොකොයිස්වරු වහල් හිමියෝ ද නො වූහ. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඔවුන්ගේ වටිනාකම් සහ ක්‍රමවේදය දේශපාලනයට පමණක් සීමා වූවක් නො ව ආර්ථිකය සහ කුටුම්බ ක්‍රමයට ද පැතිර ගිය එකක් විය. ඉරොකොයිස්වරුන්ගේ බිම් මට්ටමේ *(grassroot level)* ආර්ථික ක්‍රමයේ විශිෂ්ට ලක්ෂණය වූයේ ධනය සහ දේපළ අතළොස්සක් අතර සමුච්චයනය වීම හෙවත් ඒකරාශි වීම වැළැක්වීමයි. ඒ වෙනුවට ආර්ථික සම්පත් සියලු ගෝත්‍ර සහ කණ්ඩායම් අතර සංසරණය විය යුතු වූ දෙයක් ලෙස සලකන ලද අතර සාමාජිකයන් අතර පැවති ශ්‍රම දායකත්වය බෙහෙවින් සහභාගිශීලී වූවක් විය. එපමණක් නො ව පාරිසරික තිරසාරත්වය *(environmental sustainability)* පිළිබඳ ඉරොකොයිස්වරුන්ගේ වටිනාකම් සහ භාවිත ඉතා ප්‍රගාමී විය. තිරසාරත්වය ඔවුන් සැලකුවේ අවම වසයෙන් 'පරම්පරා හතක් වත්' *(7 generations)* පැවතිය යුතු දෙයක් ලෙස ය.

ඇතන්ස් නුවර මෙන් නො ව ඉරොකොයිස්වරුන්ගේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ඇරඹුණේ ම "ගැටුම් අවසන් කොට සාමය පවත්වා ගැනීම මඟින් පුද්ගල ස්වීයත්වය, කණ්ඩායම් අයිතිවාසිකම් සහ බලතල සුරකින අතර අනෙකුත් සංස්කෘති සම්බන්ධයෙන් විවෘත හා අන්තර්ග්‍රහනීය ආකල්පයක් ඇති

සමාජ ගතිකත්වයක් පවත්වා ගැනීම සහතික කිරීම"[45] උදෙසා ය. ඉරොකොයිස් මන්ත්‍රණ සභා වාර ආරම්භ කරන ලද්දේ "ඉරොකොයිස් සභාවේ පරිපූර්ණ එකඟත්වයකට පැමිණීමේ අරමුණ ඉටු කර ගැනීම පිණිස රැස්ව ඇති සියලු සචේතනික සිත්වලට පොළෝ මහීකාන්තාව, ජලය, වන සතුන් සහ ගහ කොළවල සිට මේඝ ගර්ජන, සඳ මිත්තණිය සහ ක්ෂීරපථයට අධිපති සියලු භූතාත්මයන්ට එකතුව ඉවහල් වන ලෙස"[46] ආයාචනා කරමිනි.

ඉරොකොයිස් ආර්ථිකය කෘෂිකර්මය, දඩයම, වෙළඳාම යන අංශවල මිශ්‍රණයක් වූ වත් කේන්ද්‍රීය ජීවනෝපාය වූයේ බෝග වගාවයි. ඒ වගාවේ මූලිකාංග වූයේ ඔවුන් විසින් සහෝදරියන් තිදෙනා ලෙස හැඳින්වුණු ඉරිඟු, බෝංචි සහ බටානා වට්ටක්කා යන බෝග තෙවර්ගය යි. ඒවා සලකන ලද්දේ හුදෙක් ප්‍රධාන කෘෂිකාර්මික බෝග වසයෙන් පමණක් නො ව ඉරෝකියානු සංස්කෘතියේ එන උත්පත්ති කතන්දරයේ මූල භාණ්ඩ ලෙස ය. ඒ නිසා එම බෝගවලට සුවිශේෂ අනන්‍යතාවක් තිබුණු අතර ඒවා සලකන ලද්දේ ඉරොකොයිස් සය ජාතීන්ගේ ඥාතීන් ලෙස ය. ඉරොකොයිස් ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය අනුව ස්ත්‍රීන් කුටුම්බ පාලනය සහ වැවිලි කටයුතුවල නිරත වීම කළ අතර පුරුෂයන්ගේ කාර්ය ලෙස සැලකුණේ සකසුරුවමින් දඩයම් කිරීම සහ වන සම්පත් උකහා ගැනීම, වෙළඳ කටයුතු හා ආරක්ෂාව ආශ්‍රිත කටයුතු ය. මේ හේතුව නිසා නිෂ්පාදන අතිරික්තය පිළිබඳ තීරණ ගැනීම සහ වාසභූමිය අවට ගොවි ඉඩම් බෙදා දීම වැනි පරිපාලන කටයුතු හුදෙක් ස්ත්‍රීන්ගේ නායකත්වය යටතේ සිදු විය.

ස්වභාවධර්මය ක්‍රියා කාරකයක් මෙන් ම පරිත්‍යාගයක් ලෙස ද තේරුම් ගැනීම ඉරොකොයිස්වරුන් ඉඩම් සහ දේපළ සම්බන්ධයෙන් දැක්වූ ආකල්පය ද බිම් මට්ටමේ ආර්ථිකය ක්‍රියාත්මක වූ ආකාරය ද ඔවුන්ගේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ද වටහා ගැනීමට උපකාරී වේ. ඉරොකොයිස්වරුන්ට අනුව ඉඩම් යනු කිසියම් පවුලකට හෝ

45 Menser, Michael (2018): *We decide! theories and cases in participatory democracy,* Philadelphia PA: Temple University Press, pp.17 -18

46 Mann, Barbara Alice. (2000). *Iroquoian Women:* α*' e Gantowisas.* New York: Peter Lang. p. 166

පුද්ගලයෙකුට අයත් සම්පතක් නො වී ය. ඒ නිසා මිනිසුන් යනු ඉඩම්වලට අයත් ජීවීන් කොටසක් මිස ඉඩම් යනු මිනිසුන්ට අයත් දෙයක් නො වේ. ගොවිතැන් කිරීමේ දී ඉඩම් කොටස්වලට වෙන් කර පවුල් අතර බෙදා දෙන ලද්දේ වරිගයේ දෙටු මෑණිවරුන් විසිනි. එහෙත් මේ ස්ත්‍රීන් විසින් එසේ ඉඩම් බෙදීම සිදු කරන ලද්දේ අත්තනෝමතික තීරණ මත නො ව වරිගය විසින් පිළිගෙන තිබූ චාරිත්‍ර වාරිත්‍රවලට අනුව එක් එක් පවුලේ ප්‍රමාණය, කෘෂි කාර්මික හැකියාව සහ සාධාරණත්වය සලකමිනි. සාමාන්‍යයෙන් වැඩි සාමාජික සංඛ්‍යාවකින් යුතු පවුල්වලට හොඳ ම ඉඩම් ලැබුණි. කෘෂිකර්මයට විශේෂයෙන් දක්ෂ පවුල් වී නම් ඒවාට වැඩිපුර ඉඩම් ලැබුණු නමුත් එසේ වැඩිපුර ලැබුණු ඉඩම් සරුසාර ඉඩම් නො විය යුතු විය. වඩා සශ්‍රීක වෙතැ' යි හැඟුණු ඉඩම් කන්නයෙන් කන්නයට පවුලෙන් පවුලට මාරු විය. මෙම විධිවිධාන විස්තර කිරීම වැදගත් වන්නේ ඉඩම් බෙදීම හුදෙක් අවශ්‍යතාව අනුව නො ව දක්ෂතාව ද සලකා සිදු වූවක් නිසා ය. එය කිසියම් දුරකට පරණ සමාජවාදී ආප්තෝපදේශය වූ "හැම කෙනෙකුගෙන් ම ඔහුගේ හැකියාව අනුව සහ හැම කෙනෙකුට ම ඔහුගේ අවශ්‍යතාව අනුව" යන්න සිහි ගන්වයි.[47] මෙසේ මාරුවෙන් මාරුවට හොඳ ඉඩම් අතිනත යැවීම සමාන අවස්ථා සැලසීම සහ බලය සංකේන්ද්‍රණය වීම වළක්වා සාධාරණත්වය ඉටු කිරීම සඳහා ගනු ලැබූ පියවරකි. එසේ හොඳ ම ඉඩම් කන්නයෙන් කන්නයට සීට්ටු ඇදීමෙන් මාරු කිරීම ඇතන්ස් නුවර පැවති කුසපත් ඇදීමේ ක්‍රමයට මහේස්ත්‍රාත් ධුර වැනි වැදගත් තනතුරු සඳහා පුද්ගලයන් තේරීම හා සමාන ය. ඉන් අපේක්ෂා කළේ ද කිසියම් පවුලකට හෝ පවුල්වලට බලය සංකේන්ද්‍රණය කර ගැනීමට ඉඩක් නො තැබීමයි.

ඉරොකොයිස් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හැරෙන විට සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තවත් එවැනි නිදර්ශන බොහෝ පැරණි සමාජවල පවතින්නට ඇත. ඉන්දියානු සමූහාණ්ඩු

47 Mann, Barbara Alice. (2000). *Iroquoian Women: α' e Gantowisas*. New York: Peter Lang. pp. 217-218

සම්ප්‍රදාය ගැන ලියන ස්ටීවන් මුහිබර්ගර් ගණ හා සංඝ ආදී වසයෙන් හැඳින්වුණු ඇතැම් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් වර්ණ හෙවත් කුල ක්‍රමය උත්කර්ෂණයට නැංවූ බ්‍රාහ්මණික සම්ප්‍රදායට අයත් මනුස්මෘතිය හා කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රය වැනි කෘතිවලින් හුවා දක්වනු ඇතැ'යි බලාපොරොත්තු නොවිය හැකි බව පවසයි[48]. ඉන්දියානු ගණ සංඝයක් වූ වජ්ජීන් අතර සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින්නට ඇතැ'යි මහා පරිනිබ්බාණ සූත්‍රයේ එන ඇතැම් කරුණුවලට අනුව අපට අනුමාන කළ හැකි ය. එම සූත්‍රයට අනුව මගධ රට රජකම් කළ අජාසත්ත රජු අති ප්‍රබල වජ්ජීන් යටත් කර ගැනීමට අදිටන් කොට ඒ සඳහා බුදුන් වහන්සේගේ උපදෙස් ලබා ගැනීමට සිය ඇමතියෙකු යැවීය. එහෙත් සූත්‍රයේ එන පරිදි වජ්ජීන් යටත් කිරීමට අපහසු හේතු බුදුන් වහන්සේ විස්තර කරන්නේ අර ඇමතියාට නො ව උපස්ථායක ආනන්ද හාමුදුරුවන්ට ය. මහා පරිනිබ්බාණ සූත්‍රයේ එන එම විස්තරයට අනුව වජ්ජීන් කිසියම් ආකාරයක සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්වා ගෙන ගිය බව පෙනේ.

පුරාතන ග්‍රීසියේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය පැවති කාලය තුළ ඇත්ත වසයෙන් ම ග්‍රීසිය සංස්කෘතික ව වඩාත් සමීප වූයේ බ්‍රිතාන්‍ය දූපත් ඇතුළු යුරෝපයට වඩා උතුරු අප්‍රිකාවට, මැදපෙරදිගට හා බැක්ට්‍රියානු ප්‍රදේශවලට බැවින් ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම යුරෝපය යැයි සැලකීම නිවැරදි නො වන බව ඩේවිඩ් ග්‍රේබර් සහ ඩේවිඩ් වෙන්ග්‍රෝ පෙන්වා දෙති. ප්‍රජාතන්ත්‍රවාදය වනාහි ඉතා භයානක ආණ්ඩුක්‍රමයකැ'යි හැරෙන්නට වෙනත් කිසිවක් කියූ ගත් කතුවරයෙක් 19 වන සියවසට පෙර යුරෝපයෙන් සොයා ගත නො හැකි තරම් බව ද ඔවුහු පවසති. උදාහරණයක් ලෙස ඔවුන්ට අනුව නිදහස, සමානාත්මතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේ වර්තමාන ප්‍රතිමාන *(norms)* බටහිර සම්ප්‍රදායේ නිපදවීම් ලෙස

48 Muhlberger, Steven (2011) *Republics and Quasi-Democratic Institutions in Ancient India* in The Secret History of Democracy, Ishakan. B and Stockwell. S (eds) London: Palgrave Macmillan, p.50

හැඳින්වීම වොල්ටෙයාර් *(1694-1774)* වැනි යුරෝපීය විද්වතෙකු විමතියට පත් කරන්නක් විය හැකි ය.[49]

කෙසේ වෙතත්, නූතන යුගයේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාව ඇරඹෙන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විවේචනයක් ලෙස 18 වැනි සියවසේ දී ප්‍රංශ දාර්ශනිකයෙකු වූ ජීන් ජැක් රූසෝ විසින් 'සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයක්' පිළිබඳ සංකල්පය හඳුන්වා දෙනු ලැබීම සමඟයි. උතුරු ඇමෙරිකාවේ ප්‍රංශ ජනාවාස බහි කිරීමට ගිය ගවේශකයන් ඇමරිකානු ස්වදේශික ජනයාගේ පාලන ක්‍රම සහ ඇවැතුම් පැවතුම් ගැන ලියූ දේවල් රූසෝ කියවා තිබුණි.

ආචාර්ය කැරොල් පේට්මන් විස්තර කරන අන්දමට පුරවැසි සහභාගිත්වය පිළිබඳ රූසෝ ඉදිරිපත් කරන තර්කය ඒ ගැන ඇති වෙනත් බොහෝ තර්කවලට වඩා වෙනස් ය. රූසෝට අනුව මහජනතාව ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් තමන්ට ඇති බලය කිසි සේත් ම අත්හැර දමා නො මැත. අර කණ්ඩායමට අයත් අය ලෙස හෝ මේ සමාජ පන්තියට අයත් අය ලෙස හෝ නො ව රටක පුරවැසියන් වසයෙන් එකමුතුව මුළු දෙන අවස්ථා පැමිණි සැම විටක ම ඔවුහු එම ව්‍යවස්ථා සම්පාදන ශක්‍යතාව වර්ධනය කර ගනිති. එවැනි අවස්ථාවල දී ඔවුන් රැස් වන්නේ ස්වාර්ථකාමී තනි පුද්ගලයන් ලෙස නො ව සියල්ලන්ගේ ම අනාගත අභිවෘද්ධිය සඳහා අනෙකුත් පුරවැසියන් සමඟ එක් ව දේශපාලන එකමුතුවක් පවත්වා ගැනීම පිණිස ය. එය පුද්ගලික අවශ්‍යතාවක් නො ව පොදු අවශ්‍යතාවකි. මේ පොදු අවශ්‍යතාව පැන නැගිය හැක්කේ ඔවුන් අතරින් හැම කෙනෙක් ම තම ජීවනෝපාය හෝ පදිංචි ස්ථානය හෝ නිසා ඇතිවිය හැකි ළැදියා නො තකා හැමදෙනෙකුගේ ම පොදු යහපත නිශ්චය කර ගැනීම තකා කටයුතු කරන විට දී ය. පොදු ජනතාවගේ 'පොදු අභිලාෂය' *(general will)* බිහි වන්නේත් ප්‍රදර්ශනය වන්නේත් එසේ ය. රජයේ කාර්යය වන්නේ එකී 'පොදු අභිලාෂය' සාක්ෂාත් කර දීමයි.

---

49 Graeber, David and Wengrow, David (2021) *The Dawn of Everything: A new History of Humanity,* New York: Allen Lane, p 30 KE

රූසෝ ගේ මතයට අනුව කිනම් නමකින් ඇමතුව ද ඡන්දයෙන් පත් වන මැති ඇමතිවරුන් යනු මහජනතාවගේ නියෝජිතයෝ නො ව පොදු අභිලාෂය අනුව පරිපාලන කටයුතු ඉටු කරන අයයි. රූසෝ පෙන්වා දෙන පරිදි ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු ම ජනතාව විසින් දේශපාලන තීන්දු ක්‍රියාවට නංවන ක්‍රමයකි. එහෙත් රටකට විශාල මිනිසුන් සංඛ්‍යාවක් සිටින බැවින් එය ප්‍රායෝගික ව ඉටු කළ නො හැක්කකි. ඒ අනුව ආණ්ඩු කිරීම යනු හුදෙක් අර කී පොදු අභිලාෂය සාක්ෂාත් කිරීමයි. ඒ නිසා අන් අයට පෙර ආණ්ඩුව නීතියට ඉඳුරා ම කීකරු වීම අත්‍යවශ්‍ය ය. එහෙත් රූසෝ අවධාරණය කළ පරිදි හැම විට ම උතුම් වන්නේ නීතිය නො ව මුළු දෙන පුරවැසියන්ගේ ව්‍යවස්ථාදායක ශක්‍යතාවයි.[50] නීතිය උද්ගත වන්නේ එතැනිනි.

රූසෝ අදහස් කළ පරිදි පුරවැසියන්ගේ මුළු දීමෙන් නිරූපණය වන සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ අභිප්‍රාය වූයේ ආණ්ඩුව නීතියට අවනත කරවන සාධාරණ සමාජයක් *(a just society)* ගොඩනැගීමයි. ඒ සඳහා සමාජයේ සාමාජිකයන්ගේ ක්‍රියාශීලී දේශපාලන සහභාගිත්වය අත්‍යවශ්‍ය ය.

දේශපාලන ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී යැ'යි හැඳින්වීම පිණිස ජාතික මට්ටමේ නියෝජන ආයතන තිබීම පමණක් ප්‍රමාණවත් නො වන බවත් රූසෝගේ මතය විය. ඒ අනුව යමින් පසු කාලීන විචාරකයෝ පෙන්වා දුන් පරිදි "ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පද්ධතියක පැවැත්ම පිණිස සහභාගිත්ව සමාජයක පැවැත්ම ද අත්‍යවශ්‍ය වේ. ඉන් අදහස් වන්නේ ආර්ථික ක්ෂේත්‍රය ද ඇතුළු, එහෙත් එයට පමණක් සීමා නො වී, සියලු දේශපාලන පද්ධති ප්‍රජාතන්ත්‍රීකරණය වූ සමාජයක් තිබීම යි".[51] මෙහි දී රූසෝ අනුගමනය කළ තවත් විචාරකයෝ "කාර්ය සාධනීය පුරවැසියන් බිහි කිරීමට අවශ්‍ය සබල ගැන්වීම *(empowerment)* සහ අධ්‍යාපනය යන දෙක ම පුරවැසියන්ට

50 Pateman, Carole (1985). *Problem of Political Obligation: A Critique of Liberal Theory.* Berkeley, CA: University of California Press. pp. 152, 150-162

51 Pateman, Carole (1970) Participation and Democratic Theory. Cambridge: Cambridge University Press Pp.42-43

ලබා දිය හැක්කේ පුරවැසි සහභාගිත්වය සඳහා ලැබෙන අවකාශය වැඩි කිරීමෙන්"[52] බව අවධාරණය කළහ.

මෑත කාලයේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂව කරුණු ඉදිරිපත් කළ මුල් ම ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන්ගෙන් කෙනෙකු වූයේ මිෂිගන් සරසවියේ ආචාර්ය ආර්නොල්ඩ් කවුෆ්මාන් ය. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය *(Participatory Democracy)* යන යෙදුම මුලින් ම භාවිත කරන්නට ඇත්තේ 1960 ගණන්වල දී කවුෆ්මාන් විසින් යැ'යි ඇතැම් විචාරකයෝ පවසති. කවුෆ්මාන් තර්ක කළ අන්දමට පුරවැසියන්ගේ සෘජු සහභාගිත්වය සහතික කරන ප්‍රජාතන්ත්‍රවාදී විධික්‍රමයක් මඟින් පුද්ගලයන්ගේ බුද්ධි මහිමය නිසැක ව ම වැඩි දියුණු වේ. ඔහුට අනුව "සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය නිසා බොහෝ ඵලදායී දේවල් ඇතිවිය හැකි වුවත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය සාධාරණීය කරනු ලබන ප්‍රධානතම කරුණ වූයේත් වන්නේත් මනුෂ්‍යයන්ගේ හැඟීම්, චින්තනය, සහ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා එය විසින් ලබා දෙන ඉමහත් දායකත්වයයි".[53] ඒ අර්ථයෙන් ගත් විට නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා බොහෝ දේවල් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට කළ හැකි ය. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයෙන් කෙරෙන්නේ හුදෙක් පුරවැසියන් කුරිරු පාලකයන්ගෙන් ආරක්ෂා කිරීම පමණක් නො ව දේශපාලන වසයෙන් පුරවැසියන් සබල ගැන්වීම සහ ඔවුන්ගේ බුද්ධිමය සංවර්ධනය ඇති කිරීමයි.

කවුෆ්මාන්ට අනුව ප්‍රමුඛතා සම්බන්ධයෙන් එකඟ වීම සඳහා පවත්වන මූලික සාකච්ඡාවලට පුරවැසියන් සහභාගි වීම මෙන් ම විධිමත් තීරණ ගැනීමේ දී සහ තීරණ ක්‍රියාත්මක කිරීමේ දී සමානයන් ලෙස පුරවැසි දායකත්වය ලබා දීම යන කරුණු දෙක ම සහභාගිත්වය යන්නට අයත් ය. කෙනෙකුගේ කාර්ය සාධනීය හා නිර්මාණාත්මක

52 Vick, Jason (2015) "Participatory Versus Radical Democracy in the 21st Century: Carole Pateman, Jacques Rancière, and Sheldon Wolin," New Political Science, Vol 37, No. 2, p. 208.

53 Kaufman, Arnold (1969). *"Participatory democracy and Human Nature*." In The Bias of Pluralism, edited by William Connolly, 178-200. New York: Atherton Press, p. 184

හැකියා වර්ධනය කර ගැනීම සහ සන්තුෂ්ටිය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය විසින් ඉටු කරනු ඇතැ'යි යන්න ප්‍රතික්ෂේප කළ හැකි ආනුභාවික හෝ දාර්ශනික හෝ සාක්ෂි මෙතෙක් ඉදිරිපත් ව නැති බව ද කවුෆ්මාන් පෙන්වා දුන්නේ ය.

නිකම් ම නිකම් ස්වාර්ථකාමී පුද්ගලික මිනිසෙකු වනවාට වඩා පුද්ගලයෙකු කල්පනාකාරී පොදු පුරවැසියෙකු බවට පත් කිරීමට නම් සහභාගිත්ව සමාජයක් අවශ්‍ය ය. ඒ නිසා ප්‍රජා මූල සහභාගිත්වයකින් තොර ව පොදු යහපත මුඛ්‍ය කරගත් සමාජයක් ගොඩ නැගිය නො හැකි බව සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කළ අයගේ අදහස විය. මෙම අදහස තවදුරටත් පුළුල් කරමින් ස්වයං පාලිත ප්‍රජාවකට පදනම විය යුත්තේ එම ප්‍රජාවේ සමජාතීය *(homogeneous)* ස්වභාවයට වඩා ඔවුන්ට ලැබෙන ප්‍රජා අධ්‍යාපනය, සහභාගිත්ව ආයතන ක්‍රමය සහ ප්‍රජා මූල ආකල්ප තුළින් ගොනු වෙන ඔවුන්ගේ පොදු අරමුණු බව සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් පෙනී සිටින විචාරකයෝ ප්‍රකාශ කළහ.[54] ඒ නිසා දේශපාලන න්‍යාය පත්‍රයේ මහජන පාලනය, දේශපාලන තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම ද පුරවැසි සහභාගිත්වය ප්‍රමුඛ කොට සිදු විය යුතු බව ද ඔවුහු පළ කළෝ ය.

1960 ගණන්වල මුලදී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාව නැවත ඉස්මතු වන විට ප්‍රජාතන්ත්‍රවාදය ගැන විවාදයේ ආධිපත්‍යය නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කළ අනුභූතික *(empirical)* න්‍යායිකයින්ට හිමි වී තිබුණි. දේශපාලනයට සහභාගි වීමට සාමාන්‍ය පුරවැසියන්ට අභිමතයක් මෙන් ම නිපුණත්වයක් ද නොමැති බැවින් වඩා සුදුසු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වන්නේ දැනුවත් අය මඟින් පුරවැසි නියෝජනයට ඉඩ සැලසීම බව මේ අනුභූතික න්‍යායිකයින්ගේ පොදු මතය විය. පුරවැසියන්ට තම දේශපාලන මනාපකම්වල ඵල විපාක ඍජු ලෙස නො දැනේ යැ'යි ද ඒ නිසා

54 Barber, Benjamin R, (2004) *Strong Democracy,* Oakland CA: University of California Press p. 117.

දේශපාලනය පිළිබඳ අවසාන නිගමනවලට එළඹීමට සාමාන්‍ය පුරවැසියන් මැලි වනු ඇතැ'යි ද ඔවුහු තර්ක කළහ.

මේ විවේචනවලට පිළිතුරු වසයෙන් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදීන් කියා සිටියේ සහභාගිත්වය සඳහා පුරවැසියන්ට අවශ්‍ය යැ'යි සලකන එකී ගුණාංග වර්ධනය වන්නේ සහභාගිත්වය තුළින් ම බවත් සහභාගිත්වය සඳහා ලැබෙන ඉඩප්‍රස්ථා වැඩි වන පමණට වඩ වඩා ඥානෝද්දීපිත *(enlightened)* සහ පොදු යහපත පිළිබඳ වඩා සවිඥානික පුරවැසියන් බිහිවීම වැඩි වන බවත් ය.[55] එනිසා උචිත තත්ව යටතේ පුරවැසියන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට ඍජු ව මැදහත් විය යුතු බවට ඔවුහු තර්ක කළහ.

මේ විවාදවල දී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය සාධාරණීකරණය කිරීමේ ලා මූලික කරුණු තුනක් ඉදිරිපත් විය. පළමු කොට ම සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ලිබරල් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් නිර්ව්‍යාජ සහ ප්‍රාමාණික වසයෙන් දියුණු අර්ථ දැක්වීමක් ඉදිරිපත් කරයි. ඒ අනුව දේශපාලනික, සමාජීය සහ ආර්ථික යන කිනම් ක්ෂේත්‍රයක වුව ද තමන්ට බලපාන කරුණු සම්බන්ධයෙන් පුරවැසියන්ගේ සහභාගිත්වයෙන් සාමූහික තීරණ ගන්නේ නම් පුරවැසියන් අතර දේශපාලන සමානාත්මතාව සහ පුරවැසියන්ගේ පුද්ගල ස්වීයත්වය වැඩි දියුණු වේ. එමගින් ප්‍රජාතන්ත්‍රවාදයේ නියම තේරුම වන 'ජනතාව විසින් පාලනය කරනු ලැබේ' යන්න තහවුරු වේ. දෙවැනි ව තීන්දු තීරණ ගැනීමේ දී පුරවැසියන්ගේ සහභාගිත්වය ඉහළ යෑම නිසා දේශපාලන ආයතන පිළිබඳ විශ්වාසය මෙන් ම ඒවාට ලැබෙන මහජන සහයෝගය වැඩි වේ. තෙවැනි ව, ඒ හා සමග ප්‍රජාතන්ත්‍රවාදය ද වඩා විශ්වාස දායක හා විචක්ෂණ පාලන ක්‍රමයක් ලෙස තහවුරු වේ.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදීන් තර්ක කළ අන්දමට ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය වැඩි වීමට අනුගාමී ව සමාජ අසමානතාව ද අඩු විය

55 Pateman, Carole. (1970) *Participation and Democratic Theory,* Cambridge: Cambridge University Press pp.42-43

හැකි ය. එමඟින් දේශපාලනික සමානාත්මතාව වැඩි වීම මෙන් ම හරයාත්මක වසයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති වැදගත්කම ගැන පෘථුල අවබෝධයක් ද ඇති වෙයි. ඇතැම් සමාජ-ආර්ථික කණ්ඩායම්වල දේශපාලන සහභාගිත්වය අඩු වීම ඔවුන්ගේ ඕනෑ එපාකම් පිළිබඳ අවධානය අඩු වීමට හේතු වනවා පමණක් නො ව එවැනි පිටමංවීම් නිසා දේශපාලන තීන්දු ගැනීම වරප්‍රසාද ලත් කොටස්වල ඒකාධිකාරයක් බවට පත්වීමට ද හේතු විය හැකි ය. එවැනි තත්වයක දී දේශපාලන සහභාගිත්වයක් නොමැති කොටස්වල ඕනෑ එපාකම් ගැන කරදර වීමට වරප්‍රසාද ලත් කොටස් තැත් නො කරනවා පමණක් නො ව අවවරප්‍රසාදිතයන් ගේ දේශපාලන සහභාගිත්වය හැකි තරම් අවහිර කිරීමට ද ඔවුන් පෙලඹෙනු ඇත. මේ නිසා දේශපාලනයේ දී බහුජන නියෝජනයට වඩා ඇත්ත වසයෙන් ම වැදගත් වන්නේ බහුජන සහභාගිත්වයයි.

මේ අනුව දේශපාලන ක්‍රියාවලිය තුළ පොදු ජනතාවගේ භූමිකාව ඡන්දය දීමට පමණක් සීමා නො කොට ඔවුන් පරිපූර්ණ ලෙස දේශපාලන ක්‍රියාවලියට සහභාගි කර ගැනීම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට යුරෝපයේ ඇතැම් පළාත් පාලන ආයතන උත්සාහ කළහ. ඉතාලියේ ටස්කනි ප්‍රාන්තයේ ප්‍රාදේශීය කවුන්සලය 2007 දී සම්මත කර ගත් අංක 69 දරණ ප්‍රාන්තීය හා ප්‍රාදේශීය ප්‍රතිපත්ති සැකසීමේ දී මහජන සහභාගිත්වය ප්‍රවර්ධනය කරන නීතියේ සඳහන් පහත දැක්වෙන ඡේද දෙක ඒ සඳහා උදාහරණයකට ගත හැකි ය.

- ප්‍රාන්තීය සහ ප්‍රාදේශීය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රජා සහභාගිත්වය අයිතියක් වසයෙන් සලකනු ලැබේ. මෙම නීතිය මඟින් ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය සඳහා වන ආකෘති සහ විධිවිධාන ප්‍රගාමී ලෙස ප්‍රවර්ධනය කරන අතර එම අයිතිය කාර්යසාධක ලෙස සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය මූල්‍ය හා ක්‍රමවේදීය සම්පත් සැපයිය යුතු බව ද දැනුම් දෙයි.
- පුරවැසි සහභාගිත්වය ශක්තිමත් කරන ස්වාධීන ව්‍යාපෘති යෝජනා කරන ලෙස මෙම නීතියෙන් ප්‍රාදේශීය පොදු අධිකාර,

පාඨශාලා සහ සමිති සමාගම් වැනි සංවිධානාත්මක සමාජ සංවිධාන දිරි ගන්වයි.

ස්ටැන්ෆර්ඩ් සරසවියේ ආචාරිනී ස්ටෙෆානි මැක්නල්ටි රටවල් 17ක මධ්‍යම ආණ්ඩු විසින් ප්‍රාදේශීය මට්ටමේ ආණ්ඩුකරණය සඳහා පුරවැසි සහභාගිත්වය හඳුන්වා දීමට ගන්නා ලද ප්‍රයත්න පිළිබඳ අධ්‍යනයක් කළා ය. ඇය සිය *Democracy From Above?* නම් කෘතියේ පෙන්වා දෙන අන්දමට සහභාගිත්වය මුල්කරගත් ප්‍රතිසංස්කරණ වර්ග දෙකක් තිබේ. ඉන් පළමු වර්ගය ජාතික මට්ටමින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දුවකට අනුව හෙවත් ඉහළ සිට පහළට කෙරෙන විධාන අනුව හඳුන්වා දෙන සහභාගිත්ව වර්ගයයි. පාර්ලිමේන්තුව හෝ විධායකය විසින් දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික මට්ටමින් ගනු ලබන තීරණයකට අනුව පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණය සඳහා සහභාගිත්ව ආයතන ක්‍රමයක් සැලසුම් කිරීම මේ පළමුවැනි වර්ගයට දිය හැකි උදාහරණයකි.

දෙවැනි වර්ගය වසයෙන් සැලකෙන්නේ මූලික වසයෙන් ම බිම් මට්ටමේ මහජන ක්‍රියාකාරකම්වල දී සහභාගිත්වය මත තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම මුල් කර ගෙන දියත් කරන හුදකලා ව්‍යාපෘතිය. බොහෝ විට රාජ්‍ය නො වන සංවිධාන විසින් අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ එක් ව මහජන සහභාගිත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන මෙවැනි ව්‍යාපෘතිවලින් දේශපාලනය ප්‍රතිසංස්කරණය කිරීමට විශාල බලපෑමක් ඇති නො වේ. බොහෝ විට ව්‍යාපෘති කාලයෙන් පසුව ඒවායේ ප්‍රජා සහභාගිත්වය අකර්මණ්‍ය වෙයි.

මැක්නල්ටි ඇගේ කෘතියෙන් වැඩියෙන් අවධානය යොමු කරන්නේ පළමුවැනි වර්ගයට අයත් ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය පුළුල් කිරීම පිණිස කෙරෙන දේශපාලන ප්‍රතිසංස්කරණ ලෙස හඳුන්වා දෙමින් මධ්‍යම ආණ්ඩු විසින් දියත් කරන ලද වැඩ පිළිවෙළවල් ය. ඒවායින් බොහොමයක් ම මධ්‍යම ආණ්ඩුවල ප්‍රතිපත්ති

තීරණ අනුව ප්‍රාදේශීය දේශපාලනයේ පුරවැසි සහභාගිත්වය වැඩි කිරීමට සැලසුම් කළ ඒවායි.

ජාතික මට්ටමේ මැතිවරණවලින් තෝරා පත් වූ ඇතැම් දේශපාලනඥයන් මේ අන්දමින් ප්‍රාන්ත හා පළාත් පාලන මට්ටමේ ආණ්ඩුකරණයට පුරවැසියන් සහභාගී කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය යළි ගොඩ දමා ගැනීමට ප්‍රයත්න දැරීමක් ලෙස සැලකිය හැකි ය. ටික කලක සිට ලොව පුරා හැම රටක ම පාහේ මිනිස්සු ඔවුන්ගේ පාර්ලිමේන්තු සභා සහ දේශපාලන පක්ෂ පිළිබඳ ව කලකිරී දේශපාලන ක්‍රියාවලියෙන් ඉවත් වෙමින් සිටියහ.[56] ප්‍රජාතන්ත්‍රවාදයේ මේ ගරා වැටීම නිසා බොහෝ ආණ්ඩුවලට එම රටවල ජනතාව අතර තම සුජාතභාවය තහවුරු කර ගැනීම අසීරු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 'පාලන ක්‍රමය උඩු යටිකුරු කොට හදන්නෙමි' යනුවෙන් වහසි බස් දොඩවමින් පැමිණෙන දේශපාලනික පිටස්තරයන්ට අනුග්‍රහය දැක්වීමට බොහෝ රටවැසියෝ පෙලඹුනහ. මේ ප්‍රවණතාව කිසිදු දේශපාලන අත්දැකීමක් නැති විකට නළුවෙක් 2015 දී රටේ නායකත්වයට පත්කර ගත් ගෝතමාලාවේ සිට කිසි දිනක දේශපාලන තනතුරක් දරා නැති රියලිටි ටීවී සංදර්ශනකාරයෙකු හා ව්‍යාපාරිකයෙකු වූ ඩොනල්ඩ් ට්‍රම්ප් 2017 දී ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපති කර ගැනීම දක්වා විවිධාකාරයෙන් දක්නට ලැබුණි.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය කඩවීම නිසා කලබල වූ ඇතැම් දේශපාලනඥයෝ එක්තරා ප්‍රමාණයකට සහභාගිත්ව ආණ්ඩුකරණය හඳුන්වා දී ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ දමා ගැනීමේ අටියෙන් ප්‍රාදේශීය මට්ටමේ ආණ්ඩුකරණය සඳහා පුරවැසි සහභාගිත්වය ප්‍රවර්ධනය කරන ආයතන ක්‍රමයක් පිහිටුවීමට හැකි ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්හ. ඉන්දියාව, චිලිය, පිලිපීනය, උගන්ඩාව සහ වෙනිසියුලාව වැනි රටවල් ගණනාවක ජාතික මට්ටමේ

56 Norris, Pippa (2011). *Democratic Deficit: Critical Citizens Revisited.* New York: Cambridge University Press.

දේශපාලනඥයන් විසින් ප්‍රාදේශීය අයවැය, පළාත් පාලන ආයතන මට්ටමේ ආණ්ඩුකරණය සහ ඒවාට ඡන්දයෙන් පත් වූ ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ කටයුතු සන්නිරීක්ෂණය සඳහා පුරවැසියන් සහභාගි කර ගත හැකි විධිවිධාන හඳුන්වා දෙන ලදී. මෙයින් තහවුරු කිරීමට උත්සාහ කළේ සිය පොදු යහපත තකා ආණ්ඩු කිරීමෙහි සහ පාලනය සන්නිරීක්ෂණය කිරීමේ ලා පුරවැසියන්ට ද කොටස්කරුවන් විය හැකි බවයි. මේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටි අය බොහෝ විට කියා සිටියේ එමඟින් මේ අතෘප්තිමත් යුගයේ ප්‍රජාතන්ත්‍රවාදය යළි ඵලදායක ලෙස ප්‍රතිෂ්ඨාපනය කළ හැකි බවයි.[57]

2002 දී ගෝතමාලාවේ ජාතික කොන්ග්‍රස් සභාව ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා සංවර්ධන සභාවලට සිය සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පුරවැසි සහභාගිත්වය සහිතව තීරණ ගැනීමට බලය පවරන නීතියක් සම්මත කිරීම ඒ සඳහා එක් උදාහරණයක් ලෙස සැලකිය හැකි ය. මැක්නල්ටි සිය කෘතියේ ගෝතමාලා නීතිය ප්‍රායෝගික ව ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ විශ්ලේෂණාත්මක විස්තරයක් ගෙන එයි.[58] ඒ ප්‍රජා සහභාගිත්වය පිළිබඳ නව නීතිය අනුව සැන් මිගෙල් ඩි එස්කොබාර් දිස්ත්‍රික්කයේ සුළු නගර සභා කොට්ඨාස අටක පිහිටුවන ලද ප්‍රජා සංවර්ධන සභා මඟින් තමන්ට අවශ්‍ය යටිතල පහසුකම් ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාවක් දියත් කළේ ය. එහෙත් 2010 ඇති වූ විනාශකාරී ගංවතුරෙන් පසු ඔවුන්ගේ ප්‍රමුඛතා වෙනස් විය. ඒ අනුව වඩා යහපත් ජලාපවහන ක්‍රමයක් සහ සෞඛ්‍ය සායන ක්‍රමයක අවශ්‍යතාව ප්‍රමුඛත්ව ලැයිස්තුවේ ඉදිරියට පැමිණ තිබුණි. ඒ පිළිබඳ ජන මතය අවදි කොට ඒකරාශි කිරීමේ වැඩසටහනක් සමාජ ක්‍රියාකාරීන් පිරිසක් විසින් ආරම්භ කර තිබුණි. එකී නව ප්‍රමුඛතා අනුව යාවත්කාලීන කළ ව්‍යාපෘති ලැයිස්තුවක් සමඟ ඔවුන් කිහිප වරක් ම නගරාධිපතිවරයා හමු වී ඒ සඳහා මුදල් වෙන් කිරීමේ සාකච්ඡාවක්

57 Poletta, Francesca (2013). *“Participatory Democracy in the New Millennium.”* Contemporary Sociology 42(1): 40–50”

58 McNulty, Stephanie L. (2019) *Democracy from Above?* Stanford: Stanford University Press, pp 13-14 (KE)

දියත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. එහෙත් සමාජ ක්‍රියාකාරීන් බොහෝමයක් නගරාධිපතිවරයාගේ දේශපාලන පක්ෂයේ අය නො වීම නිසා එම ඉල්ලීම් නො සලකා හැරිණි. එනිසා අධෛර්යමත් නො වූ සමාජ ක්‍රියාකාරීහු නගරසභා මැතිවරණය පැමිණි විට තම යෝජනාවලට සහාය දක්වන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලමින් උද්ඝෝෂණ ව්‍යාපාරයක් ගෙන ගියහ.

මැක්නල්ටිගේ මතය අනුව ඒ නිසා මෙවැනි ප්‍රතිසංස්කරණ නීතිවල කිසියම් වැදගත්කමක් තිබේ. ගෝතමාලාවේ ජාතික මට්ටමේ දේශපාලනයේ නිරත වන ප්‍රභූන් මෙවැනි ප්‍රතිසංස්කරණ වැළඳ ගන්නේ එමඟින් හෝ ගරා වැටෙන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය බේරා ගත හැකි වෙතැ' යි යන අදහසිනි. *Democracy from Above* නමැති කෘතියෙන් මැක්නල්ටි සාකච්ඡාවට ලක් කරන්නේ සංවර්ධනය වන රටවල ජාතික රාජ්‍ය මට්ටමේ විධාන මඟින් ප්‍රාදේශීය දේශපාලනයට සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීම සාර්ථකව කළ හැක්කක්ද යන්නයි. ඇය පෙන්වා දෙන පරිදි ගෝතමාලාවේ ප්‍රාදේශීය පාලන ආයතන සම්බන්ධයෙන් පුරවැසි දේශපාලන සහභාගිත්වයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම තරමක් දුරට හොඳ දෙයකි. මන්ද එමඟින් ඡන්දයෙන් පත් වන ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයන්ට පුරවැසියන් සම්බන්ධ ව ඇති වග වීම ශක්තිමත් කොට පාලන තන්ත්‍රය වඩා කාර්යක්ෂම කළ හැකි බැවිනි. එහෙත් උගන්ඩාවේ සහ රුවන්ඩාවේ ආණ්ඩු ප්‍රතිසංස්කරණවල දී සහභාගීත්වය ගැන කථා කළ අය ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වයට වඩා සැලකිලිමත් වූයේ ආණ්ඩුවේ කාර්යක්ෂමතාව සහ ඵලදායකත්වය වැඩි දියුණු කිරීම පිණිස ආණ්ඩුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ ලා ප්‍රාදේශීය මට්ටමෙන් රටවැසියන්ගේ දායකත්වය ලබා ගැනීම පිළිබඳව බව මැක්නල්ටි පෙන්වා දෙයි.

එක් අතකින් බැලූ විට ජාතික මට්ටමේ එදිනෙදා දේශපාලනයට වඩා ප්‍රාදේශීය බිම් මට්ටමේ දේශපාලන ඒකක පාදක කර ගෙන මෙසේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීමට තැත් කිරීම තාර්කිකය.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ දී එක කොන්දේසියක් වන්නේ සහභාගි වන කණ්ඩායමේ ප්‍රමාණය සියලු සාමාජිකයන්ට ක්‍රියාකාරී ව සහභාගිවීමට හෙවත් සහභාගිත්ව ක්‍රියාවලියේ කාරකත්වය *(agency)* පවත්වා ගෙන යෑමට අපහසු වන තරම් විශාල නො විය යුතු බව යි. ඒ අනුව සහභාගිත්ව ක්‍රියාවලියට සහභාගි වන සංඛ්‍යාව පමණට වඩා කුඩා හෝ විශාල වීම එම කොන්දේසිය උල්ලංඝණය කිරීමකි. එනිසා ජනගහනය මිලියන ගණන් වන රටවල් සහ මහා මෙගා නගර පාලන ඒකක වසයෙන් සලකා සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීම අසීරු ය. එවැනි සුවිශාල ජන රාශිවලට එකිනෙකා සහ සුහද ව සාකච්ඡා කොට කරුණු නිරාකරණය කර ගැනීමට තරම් සමීප දැන හැඳින ගැනීමක් ඇති කර ගැනීම ද අපහසු ය.

මෙවැනි ඉහළ සිට මධ්‍යම රජයෙන් පනවනු ලබන ප්‍රතිසංවිධාන මඟින් ප්‍රාදේශීය හා බිම් මට්ටමේ මහජන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට ගන්නා ප්‍රයත්නවලින් ඇතිවෙන සත්‍ය බලපෑම ගැන ප්‍රමාණවත් අධ්‍යන මෙතෙක් කර නොමැති බව මැක්නල්ටි පවසයි. එහෙත් ජාතික මට්ටමින් ගන්නා තීරණවලට අනුව පළාත් පාලන ආයතනවලින් ක්‍රියාත්මක වන කටයුතුවල ප්‍රමුඛත්වය තීරණය කිරීමට සාමාන්‍ය පුරවැසියන්ට සහ සිවිල් සමාජ සංවිධානවලට අවස්ථාව සැලසීම මඟින් කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී බලපෑමක් ඇතිවෙන බව ඇගේ මතයයි.

එහෙත් එම බලපෑම කරුණු කිහිපයක් මත රඳා පවතී. ඉන් ප්‍රධාන කරුණ වන්නේ ප්‍රජා සංවර්ධන සභා රැස්වීම්වලට මැදිහත් වන සිවිල් සමාජ සංවිධානවල ශක්තියයි. බොහෝ අවස්ථාවල දී නගරාධිපතිවරුන් තමන්ගේ 'හෙංචයියන්' වැඩි ප්‍රමාණයක් මෙවැනි නාගරික සංවර්ධන සභා රැස්වීම්වලට කැඳවා තම අභිමතය ජයග්‍රහණය කරවා ගැනීමට තැත් කර තිබුණි. සිවිල් සමාජ සංවිධානවල සහභාගිත්වය දුර්වල වී තිබූ ප්‍රජා සංවර්ධන සභාවල ඔවුන්ගේ උත්සාහය හැම විට ම පාහේ සාර්ථක විය. සහභාගිත්වය යනු බල ගැන්වීමේ *(empowering)* ක්‍රියාවලියක් බැවින් කලින් බලයක්

නොමැති ව සිටි කොටසක් බල ගැන්වීම සිදු කළ හැක්කේ තවත් තැනක බලය අඩු කොට එම බලය අලුතින් බල ගැන්විය යුතු අය වෙත බෙදා දීම මගිනි. එවිට බලය අඩු වන ආයතන හා පුද්ගලයන් එම බලය වෙනත් ආකාරයකට හෝ නැවත ලබා ගැනීමට තැත් කිරීම ස්වභාවයයි. ගෝතමාලාවේ බොහෝ නගරාධිපතිවරුන් ප්‍රජා සංවර්ධන සභා තම සහචරයන්ගෙන් පුරවා ගැනීමට තැත් කළේ තමන් ළඟ තිබී බෙදා දීමට සිදු වූ ඒ බලය එසේ වෙනත් අන්දමකින් යළි අත්පත් කර ගැනීමට අදහස් කළ නිසා යි.

ගෝතමාලා ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමේ නීතිය සම්බන්ධයෙන් ඇතිවුණු තවත් විවේචනයක් වූයේ කලක් තිස්සේ පැවති ස්වදේශිකයන් *(indigenous)* ගේ පාරම්පරික ප්‍රජා සංවිධානවල කටයුතුවලට නව නීතිය නිසා අවහිර සිදු වූ බවයි. ගෝතමාලාවේ වැඩි ජනගහනයක් එහි මුල් පදිංචිකාරයන් ලෙස සැලකෙන මපුචෙ, අයිමාරා, කිචුවා, මිස්කිටෝ, කිචෙ, බක්චිකිල්, සුටුජිල්, මාම් සහ සපොටෙක් *(Mapuche, Aymara, Quichua, Miskito, K'iché, Kaqchikel,Tzútujil, Mam and Zapotec)* වැනි ස්වදේශික ජන වර්ගවලට අයත් වූහ. ඔවුන්ට ආවේණික වූ පාරම්පරික ප්‍රජා සංවිධාන ව්‍යුහ තිබුණි. නව සහභාගිත්ව නීතිය යටතේ සමාන්තර ප්‍රජා සංවර්ධන සභා හඳුන්වා දීම ඒවාට අභියෝගයක් විය. ඒ අතර ස්පාඤ්ඤ සම්භවයක් ඇති සුළුතර ප්‍රභූ පෙළැන්තිය ආර්ථික හා දේශපාලන බලය අතින් ප්‍රබල විය. බොහෝ නගරාධිපතිවරු මේ ප්‍රභූ පෙළැන්තියට අයත් වූහ.

මැක්නල්ටිගේ විග්‍රහය තුළ සඳහන් නො වූවත් බිම් මට්ටමින් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීමට මධ්‍යම රජය ගත් මේ ප්‍රයත්නය ඇතැම් විට ස්වාධීන ප්‍රජා ගුවන් විදුලි සේවා තිබුණේ නම් මීට වඩා වෙනස් වන්නට ඉඩ තිබුණි. ලතින් ඇමෙරිකානු රටවල් අතරින් ගෝතමාලාව කලක් තිස්සේ බිම් මට්ටමේ *(grassroots level)* ප්‍රජා ගුවන් විදුලි සේවා මධ්‍යස්ථාන රැසක් පවත්වා ගෙන ගිය රටකි. සාමාන්‍යයෙන් සහභාගිත්ව සංනිවේදන වැඩසටහන් නිෂ්පාදනය හා

ප්‍රචාරණය පාදක කරගත් මේ ප්‍රජා ගුවන් විදුලි සේවා මඟින් බොහෝ ස්වදේශික ජන කණ්ඩායම්වල සමාජ කතිකාවට, භාෂා හා සංස්කෘතික ප්‍රවර්ධනයට මෙන් ම අධ්‍යාපනයටත් සැලකිය යුතු දායකත්වයක් ලැබී තිබුණි. ඒවායින් බොහෝමයක් අදාළ වසමේ පිහිටි පල්ලියේ අනුග්‍රහය ඇති ව පවත්වා ගෙන ගිය ඒවා විය.

එහෙත් 1960 සිට 1996 දක්වා ආණ්ඩුවේ හමුදා සහ විවිධ වාමවාදී සන්නද්ධ කණ්ඩායම් අතර සිවිල් යුද්ධය පැවති සමයේ මේ ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථාන මිලිටරිය විසින් දෘඪතර පාලනයකට ලක් කරන ලදි. හමුදා මර්දනය විවේචනය කළ ඇතැම් ප්‍රජා ගුවන් විදුලිවල ජනමාධ්‍යකරුවන් සාහසික ලෙස ඝාතනය කර තිබුණි. ඒ අතර 1980 දී නවලිබරල්වාදී ප්‍රතිපත්ති අනුව ගෝතමාලා රජය ගුවන් විදුලි සංඛ්‍යාත වෙන්දේසියේ විකුණන ලද බැවින් මිල අධික ලංසු ඉදිරිපත් කිරීමට නො හැකි ව බොහෝ ප්‍රජා ගුවන් විදුලි සේවා අකර්මණ්‍ය වී ගියේ ය. ඒ අනුව වැඩි ගුවන් විදුලි සංඛ්‍යාත ප්‍රමාණයක් වාණිජ ගුවන් විදුලි සේවාවල ග්‍රහණයට නතු විය. තරඟකාරී මිලට වෙන්දේසියෙන් බලපත්‍ර ලබා ගත නො හැකි වූ ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථාන පොලිසිය විසින් වසා දමන ලදි.[59] සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය බිම් මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට ඇත්ත අවශ්‍යතාවක් තිබුණේ නම් ප්‍රදේශීය දේශපාලනයේ පුරවැසි සහභාගිත්වය ශක්තිමත් කිරීමේ අත්‍යවශ්‍ය මෙවලමක් බවට ප්‍රජා ගුවන් විදුලි සේවා පත් කළ යුතු ව තිබුණි. එහෙත් මධ්‍යම රජය විසින් ප්‍රාදේශීය දේශපාලනය සඳහා සහභාගි ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීමේ ක්‍රමෝපායට එය අඩංගු නොවීය. සංනිවේදන විෂමතා ආමන්ත්‍රණය නො කොට සහභාගිත්වය සඳහා අවශ්‍ය දේශපාලන සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම අසීරු ය.

ඒ හැර ඉහළ සිට පහළට සහභාගිත්ව දේශපාලනය තල්ලු කිරීමට තැත් කරන මෙවැනි ප්‍රයත්නවල තවත් බොහෝ දුර්වලකම්

59 Lauer, Polly W., *"Community Radio in Guatemala: A Half-Century of Resistance in the Face of Repression"* (2017). Undergraduate Honors Theses. Paper 1051. JSTOR

දැක ගත හැකි ය. ස්වදේශික ප්‍රජා කණ්ඩායමක් විසූ සාන්ත මාරියා විසිටාසියොන්හි කරන ලද සමීක්ෂණයකට අනුව රාජ්‍ය නූතනීකරණය කිරීම සහ විමධ්‍යගතකරණය සඳහා බිහි කළ ප්‍රජා සංවර්ධන සභා වැනි නව ආයතන නිසා පවතින පාරම්පරික ස්වදේශික සමාජ ආයතනවල බල පෑම අඩු වීම ගැන ස්වදේශික ජනයා නො සතුටට පත් ව සිටියහ. නව ප්‍රජා සංවර්ධන සභා හරහා සංවර්ධන වැය විමධ්‍යගත කිරීම ඒ වන විටත් සැලකිය යුතු ප්‍රශ්නයක් ව තිබූ දූෂණය තවත් වැඩි කිරීමට හේතු වූ බව ඇතැම් නිරීක්ෂකයෝ වාර්තා කළහ.[60]

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මේ අත්හදා බැලීම්වලින් තහවුරු වන එක් කාරණයක් වන්නේ සහභාගිවීම අපේක්ෂා කරන ප්‍රජාවගේ දේශපාලනික, ආර්ථික, සාමාජික පමණක් නො ව සංනිවේදන සමානාත්මතාව ද ඒ සඳහා ඉතා වැදගත් වන බවයි.

ආචාර්ය මයිකල් මෙන්සර්ට අනුව ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය පුළුල් කිරීම අභිප්‍රාය ලෙස ප්‍රකාශ කරමින් දියත් කළ බොහෝ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති, වර්ග තුනකට බෙදිය හැකි ය.[61] පළමු වර්ගය මහජනතාව රවටන සහ බොරු සහභාගිත්වය සලසන වර්ගයයි. දෙවැන්න සංකේතාත්මක ව පමණක් සහභාගිත්වය ඉවසන වර්ගයයි. තෙවැන්න සහභාගිත්ව ක්‍රියාවලිය සම්බන්ධයෙන් තීරණාත්මක බලපෑමක් ඇති කළ හැකි වර්ගයයි. එම තුන් ආකාරයට අයත් ක්‍රියාන්විත පහත සඳහන් ලෙස අනුක්‍රමණිකව නැවත වර්ගීකරණය කළ හැකි ය.

1. **රැවටීම/නිහඬ කිරීම:** මෙවැනි සහභාගිත්ව වැඩසටහන්වල දී මහජනතාව සම්බන්ධ කර ගන්නා නමුත් මහජනතාවට නො මග යවන තොරතුරු ලබා දේ. තීරණ ගැනීම පිළිබඳ ව ඵලදායක හඬක් හෝ බලයක් මහජනතාවට

60 McNulty, Stephanie L. McNulty (2019) *Democracy from Above?* Stanford: Stanford University Press, pp 214-224 (KE)

61 Menser, Michael (2018): *We decide!: theories and cases in participatory democracy,* Temple University Press, pp. 61-63

නො ලැබෙයි - මේ සම්බන්ධයෙන් දී ඇති එක් උදාහරණයක් වන්නේ සංස්ථා මණ්ඩලවලට සේවක නියෝජිතයෙකු පත් කර සේවක සහභාගිත්වය ඇති බව ව්‍යාජ ලෙස නිරූපණය කිරීමයි. බොහෝ විට එහි දී සිදු වන්නේ සේවක නියෝජිතයාගේ මතය අවශේෂ බහුතරය විසින් උපක්‍රමශීලී ව නො සලකා හැරීමයි.

2. **දැනුම් දීම:** පාලන තන්ත්‍රය සිය ප්‍රතිපත්තියක් හෝ සැලැස්මක් ගැන මහජනතාවට දැනුම් දෙයි.

    මේ වර්ගයට අයත් වන කටයුතු සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමක් ලෙස නො සැලකේ. හදිසි අවස්ථාවක දී නගර වැසියන් ආරක්ෂිත ස්ථානයක් කරා ගෙන යෑමට නගර සභාව විසින් සැලසුම් කරන ලද වැඩපිළිවෙළක් පිළිබඳව දැනුවත් කිරීම වැනි කටයුත්තක් මේ සඳහා උදාහරණයකට ගත හැකි ය. ඒ පිළිබඳ ව නගරවැසියන්ට ප්‍රශ්න ඇසිය හැකි නමුත් විශේෂඥයන් විසින් සකසන ලද සැලැස්ම වෙනස් කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමක් පුරවැසියන්ගෙන් අපේක්ෂා නො කෙරේ. පුරවැසියන් විසින් කළ යුත්තේ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ විට සැලැස්මට අනුව කටයුතු කිරීමයි.

3. **උපදේශනය:** ආණ්ඩුවේ ප්‍රතිපත්ති/තීරණ ගැන තම අදහස් පළ කරන ලෙස ආණ්ඩුව මහජනතාවගෙන් ඉල්ලා සිටී. මෙහි දී සිදු වන්නේ පාලන තන්ත්‍රය විසින් මහජනයාට තොරතුරු දැනුම් දීම වෙනුවට මහජනයා සිය අදහස් උදහස් පාලන තන්ත්‍රයට දැනුම් දීමයි. මෙය බොහෝ විට ක්‍රියාත්මක වන්නේ ප්‍රශ්නාවලියක් සහිත සමීක්ෂණ, ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡා *(focus group discussions)* වැනි තොරතුරු රැස් කිරීමේ මෙවලම් යොදා ගැනීමෙනි.

4. **සාකච්ඡාව**: ආණ්ඩුව සහ මහජනතාව ඇතැම් කරුණු හා ප්‍රතිපත්ති පිළිබඳව සංවිචාරණීය *(deliberative)* කතිකාවක් පවත්වයි. දෙවැනි සහ තෙවැනි වර්ග මත ගොඩනගන මේ වර්ගයට අයත් ව්‍යාපෘතිවලින් කෙරෙන්නේ දෙපැත්ත ම සහභාගි වන එක ම රැස්වීමක දී ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රශ්න හා පිළිතුරු සාකච්ඡාවට ලක් කිරීමයි. සාර්ථකව සිදු කෙරෙන විට ප්‍රශ්න දෙපැත්තට ම යොමු විය හැකි නමුත් මහජනතාවගෙන් නැගෙන ප්‍රශ්නවලට ආණ්ඩුවේ නියෝජිතයන්ගෙන් දුර්වල හෝ වංක පිළිතුරු ලැබීමෙන් ප්‍රයත්නයේ අසාර්ථකත්වය පිළිබිඹු වේ.

5. **එක් ව තීරණය කිරීම**: ආණ්ඩුව සහ මහජනතාව යන කණ්ඩායම් දෙක අතර බලය සමාන ව බෙදා ගෙන එක් ව තීරණය කරති. උදාහරණයක් ලෙස කිසියම් ප්‍රතිපත්තියක් තීරණය කිරීම හෝ ක්‍රියාවක් තීන්දු කිරීමේ දී දෙපැත්තේ ම සමාන නියෝජනයක් ඇති තාවකාලික කමිටුවක් පිහිටුවා ඡන්ද බලය මහජනයා නියෝජනය කිරීමට තෝරා ගත් කමිටු සාමාජිකයන් අතර එක සමාන ව බෙදා ගනිති. එහෙත් ඒ අතර තීරණ ගැනීම හැකි තරම් දුරට එකඟත්වය මත පදනම් කර ගැනීමට උත්සාහ කරති.

6. **ස්වයං පාලනය හෝ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය**: මහජනතාව තීරණය කරති. ආණ්ඩුව තීරණ ගැනීමේ ක්‍රියාවලියට ආධාර කරයි. පාලන තන්ත්‍රය මහජනයාට සිය බලතල පවරා දෙයි. මෙයට හොඳ නිදර්ශනයක් වන්නේ කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණය ජනමත විචාරණයක ප්‍රතිඵලවලට අනුව තීන්දු කිරීමයි. ඇතැම් පළාත් පාලන ආයතනවල වාර්ෂික අය වැය යෝජනා විවෘත පුරවැසි සහභාගිත්වය මත *(participatory budgeting)* පදනම් ව පිළියෙළ කිරීම ද මේ ගණයට වැටෙන ව්‍යාපෘතියක් විය හැකි ය.

මධ්‍යම ආණ්ඩුවල මෙහෙයවීමෙන් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දීම අධ්‍යනය කළ ආචාර්ය මැක්නල්ටි මහජන සහභාගිත්වය පුළුල් කිරීම අභිමතාර්ථය ලෙස පළ කළ රජයේ ප්‍රයත්නවල යථාර්ථය මෙසේ පැහැදිලි කරයි:

> **"ඇතැම් අවස්ථාවල දී මධ්‍යම රජය විසින් හඳුන්වා දුන් නව ප්‍රතිසංස්කරණ ප්‍රාදේශීය මට්ටමේ පොදු ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී සහභාගිත්වය වැඩි කිරීමට හේතු විය. විශේෂයෙන් බොලීවියාවේ ක්‍රියාත්මක වූ ක්‍රමය මගින් පෙන්වා දෙන ලද පරිදි සංවිධානාත්මක සිවිල් සමාජ අංශය සහ කැපවීමෙන් වැඩ කරන නායකත්වයක් සහිත පරිසරයක ක්‍රියාවට නංවන ලද සහභාගිත්වලෝලී ප්‍රතිසංස්කරණවලින් ආණ්ඩුකරණයේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාරය *(responsiveness)* වැඩිදියුණු කළ හැකි බව පෙනී ගියේ ය. එහෙත් අධ්‍යනයට ලක් වූ හැම රටකින් ම දක්නට ලැබුණු උදාහරණවලින් පෙන්නුම් කළේ මධ්‍යම ආණ්ඩු විසින් දියත් කරන ලද සහභාගිත්වය පිළිබඳ මෙවැනි ප්‍රතිසංස්කරණ සැලසුම්වලට ශතවර්ෂ ගණනාවක් තිස්සේ පැවති පුරුෂෝත්තම සහ ජාතිවාදී ප්‍රතිමාන මෙන් ම දූෂණය ද පිටු දැකිය නො හැකි බවයි."[62]**

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඇති විවේචන බොහොමයක් ම පවතින නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ විකෘති විසින් සාධාරණීකරණය කරන ඒවා ය. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රධාන විවේචකයෙකු වන රොබට් මිචෙල්ස් තර්ක කරන පරිදි ආයතන සහ සංවිධානවල ඇති ශ්‍රම විභජනයේ ස්වභාවය විසින් ම ප්‍රතිපත්ති සහ වැදගත් කරුණු සම්බන්ධ තීරණ ගැනීමවල දී බහුජන සහභාගිත්වය අධෛර්යමත් කරවයි.[63] ඔහු පවසන පරිදි ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන බොහෝ සංවිධාන තුළ පවා එය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ නො හැකි ඒ නිසා ය. තවත් තර්කයක් වන්නේ දේශපාලන නායකත්වය විසින් මෙහෙයවනු ලැබීමට

62 McNulty, Stephanie L. McNulty (2019) *Democracy from Above?* Stanford University Press, Stanford, p. 264(KE)

63 Michels, Robert (1961). *Political Parties: A Sociological Study of the Oligarchical tendencies of Modern Democracy,* Free Press New York – quoted by Joel D. Wolfe in "A Defense of Participatory Democracy". *The Review of Politics.* Cambridge University Press 47 (3): 370–389.

ඇබ්බැහි වී ඇති පුරවැසියන් ඊට වෙනස් ආකාරයක සහභාගිත්වයක් සඳහා පොලඹවා ගැනීමට අසීරු බවයි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය යනු ඡන්ද දායකයන් විසින් තරඟකාරී නායකයන් අතරෙන් කෙනෙකු තෝරා ගනු ලැබීම බවත් එකී නායකයන් විසින් දේශපාලන කරුණු තීන්දු කරන බව ඡන්ද දායකයන් දන්නා නිසා සහභාගිත්වය ගැන ඔවුන් තුළ උනන්දුවක් ඇති විය නො හැකි බව ඒ හා ආනුෂංගික තවත් තර්කයකි. තීරණ ගැනීමට කරදර නො වී ඒ පිළිබඳ විශේෂඥයන්ට එම කටයුත්ත ඉටු කිරීමට ඉඩ දීම, සහ බහුතරය සිය දේශපාලන නායකයින් පූජනීයත්වයෙන් සලකන බැවින් දේශපාලන නායකත්වයේ සිතැඟි අනුව තීරණ ගැනීමට ඉඩ දීම වැනි කරුණු ද සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි ව යොදා ගන්නා ඇතැම් තර්ක අතර වෙති. මෙම විවේචන මුළුමනින් ම නො සලකා හැරිය හැකි ඒවා නො වන මුත් ඒ සියල්ලෙන් ම පැහැදිලි වන්නේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ අසමත්කම්වලට වඩා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාජ ස්වරූපයයි.

සහභාගිත්වය සඳහා අවශ්‍ය කරන කාලය සහ හැකියා බහු ජනතාව සතු ව නැතැයි යනුවෙන් 1960 ගණන්වල ඇති වූ විවේචනයට තුඩු දුන් හේතු, ගත වූ හැට වසර තුළ බෙහෙවින් වෙනස් වී ඇති බව කිව හැකි ය. අධ්‍යාපනික අවස්ථා පුළුල් වීම, සංනිවේදන තාක්ෂණය හා සමාජ මාධ්‍ය භාවිත කිරීමේ හැකියාව බෙහෙවින් වැඩි වීම ආදි සාධක සලකන විට විචාරාත්මක එළඹුමක් භාවිත කිරීමට බහු ජනතාවට ඇති හැකියාව 1960 ගණන්වලට වඩා කිසි සේත් ම වෙනස් වී නැතැයි කිව නො හැකි ය. සිදුවී අත්තේ එම හැකියා අන්‍යෝන්‍ය ලෙස මුවහත් කර ගැනීමට හැකි අවස්ථා සලසන විධි ක්‍රමයක් සහ මහජනයා අතර සංවිචාරණීය *(deliberative)* සංනිවේදනයකට දායක විය හැකි මහජන සේවා ජනමාධ්‍ය ක්‍රමයක් ඇති නො වීම යි.

සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඇති විවේචන සලකමින් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිගත හැකි ලෙස

ප්‍රතිෂ්ඨාපනය කිරීමට නම් කරුණු දෙකක් ඉටු විය යුතු බව ජොෂුවා ඩි වොල්ෆෙ යෝජනා කරයි. ඒ අනුව පළමුවෙන් ම කළ යුත්තේ දේශපාලන වසයෙන් හෝ සමාජීය වසයෙන් අපයෝජනය කළ නො හැකි අන්දමේ සමානාත්මතාවක් සිය සාමාජිකයන් අතර සාක්ෂාත් කර ගැනීමට කැප වන කුඩා ප්‍රජා සමූහයන් සංවිධානය කිරීමයි. එසේ බිම් මට්ටමෙන් ප්‍රජා සමූහ සංවිධානය වීමෙන් පසු නිශ්චිත කරුණු සම්බන්ධයෙන් එවැනි ප්‍රජා සමූහ අතර සාකච්ඡා සම්මේලන පවත්වා පොදු අවශ්‍යතා හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ හැකියැ'යි වොල්ෆෙ පෙන්වා දෙයි. ඉන් පසු එම ක්‍රියාවලිය මඟින් නිර්ණය කරනු ලබන පොදු අවශ්‍යතා වෙනුවෙන් අව්‍යාජ ව පෙනී සිටින හා කටයුතු කරන දේශපාලන නායකයන්ට පමණක් සහාය ලබා දීමට ප්‍රජා සමූහ අධිෂ්ඨාන කළ යුතු යැ'යි ඔහු පවසයි.

දෙවැනි කාරණය නම් සහභාගිත්වය දිරි ගැන්විය හැකි වන්නේ සාමාජිකයන් අතර දේශපාලන සමානාත්මතාව ඇත්නම් පමණක් බැවින් ඒ සඳහා සුදුසු පියවර ගත යුතු ය යන්න යි. ආදායම් විෂමතාව උග්‍ර වන සමාජයක මෙය සැලකිය යුතු අභියෝගාත්මක කරුණක් වන බැවින් සහභාගිත්වය සඳහා අවශ්‍ය වන දේශපාලන සමානාත්මතාව ඇති කිරීමට නම් සැමට මූලික ආදායමක් සහතික කිරීමට දායක වන සුවිශේෂ පියවර සැලසුම් කළ යුතු ය. ඒ සඳහා එක් විසඳුමක් ලෙස මෙම කෘතියේ 26 වැනි පරිච්ඡේදයේ සවිස්තර ව සාකච්ඡා වන 'සැමට සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම' යෙදා ගත යුතු බව කැරොල් පේට්මන් යෝජනා කරයි.[64] විෂමතා අධ්‍යනය පිළිබඳ විශේෂඥයෙකු ලෙස සැලකෙන ආර්ථික විද්‍යාඥ තෝමස් පෙකටි පෙන්වා දෙන අන්දමට ආදායම් බෙදී යෑම සම්බන්ධයෙන් මානව ඉතිහාසයේ මෙතෙක් ඇතිවූ දරුණුතම සමාජ විෂමතාව අප මේ වන විට අත්දකිමින් සිටිනවා විය හැකි ය.[65] පුරවැසියන් අතර

64 Pateman, Carol (2004) *"Democratizing Citizenship: Some Advantages of a Basic Income."* Politics and Society 32, no. 89: pp. 89-105.

65 Thomas Piketty, *Capital in the 21st Century* and Joseph Stiglitz, *The Price of Inequality: How Today's Divided Society Endangers Our Future.*

වැඩි වන ආර්ථික අසමානතා සියලු ආකාරයේ දේශපාලන හා සමාජ සම්බන්ධතා තුළ ඔඩු දුවමින් යයි.

සුලු දඩ මුදලක් ගෙවා ගැනීමට නො හැකි ව දස දහස් ගණන් සිරකරුවන් සිරකුඩුවල ලත වන අතර වංචනික ලෙස අයබදු ගෙවීම පැහැර හරින, අක්වෙරළ ගිණුම්වල *(offshore accounts)* මුදල් සඟවන ලොකු ව්‍යාපාරික සමාගම් සහ ධනකුවේරයින් ඡන්ද අපේක්ෂකයන්ගේ මැතිවරණ අරමුදල්වලට කෝටි සංඛ්‍යාත මුදල් පිරිනමයි. ඒ අනුව ආණ්ඩුවල ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කරන්නේ ධනවතුන්ට තව තවත් ධනවත් වීමට ඉඩ සැලසෙන ලෙසය. ලංකාවේ රටවැසියන්ගෙන් 60% කට ලැබී තිබෙන්නේ අපොස සාමාන්‍ය පෙළ වත් සාර්ථක ව සමත් කර ගත නො හැකි මට්ටමේ අධ්‍යාපනයකි. තරුණ තරුණියන්ට ලැබෙන රැකියා බොහෝමයක් ම එන්න එන්න ම කොන්ත්‍රාත්තු හෝ මැන්පවර් ක්‍රමයට ලැබෙන විශ්‍රාම වැටුප්වලට හිමිකම් නැති අස්ථිර ඒවායි. මේ ලක්ෂණ මඟින් පෙන්නුම් කරන්නේ සමාජය තුළ අප කවරෙක් ද සහ අපට කළ හැක්කේ කුමක් ද යන්න හුදෙක් අපට අත්පත් කර ගත හැකි ආර්ථික සම්පත් මත තීරණය වන සෙයකි. 21 වැනි සිය වසේ ප්‍රජාතන්ත්‍රවාදය සොයා ගත හැකි වන්නේත්, සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අර්ථාන්විත අත්දැකීමක් ලබා ගත හැකි වන්නේත් ආර්ථික, ලිංගික සහ වාර්ගික ඈ සියලු වර්ගවල පරිපීඩක අසමානතාවලට එරෙහිව කරන අරගල මගිනි.

එයට ප්‍රවේශයක් ලෙස අවම වසයෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම සම සහභාගිත්වය සහතික කිරීමට ඉරොකොයිස්වරුන්ගේ සම්ප්‍රදාය අනුව යමින් ස්ත්‍රීන්ගෙන් පමණක් සමන්විත මන්ත්‍රණ සභාවකින් සියලු අණපනත්, අයවැය සහ ප්‍රතිපත්ති පළමුව සම්මත කරන ද්වි මණ්ඩල ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීමට අප සූදානම් නො වෙන්නේ ඇයි? ගත වූ වසර හැත්තෑව පුරා පාර්ලිමේන්තුවලට හා දේශපාලන පක්ෂවලට කිසි සේත් ම කළ නො හැකි වූ විශිෂ්ට චින්තන හා සමාජ වෙනසක ඇරඹුම එය විය හැකි ය.

සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය වඩා ඵලදායක ලෙස ක්‍රියාත්මක කළ හැක්කේ බිම් මට්ටමේ ආණ්ඩුකරණ කටයුතු සඳහා බව ඒ සම්බන්ධයෙන් ඇති අත්දැකීම් වලින් පෙනී යයි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය යන දෙකෙහි ම ඇති දුර්වල කම් ඌණපූරණය කිරීම පිණිස සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය *(Deliberative Democracy)* ද එකී ක්‍රම දෙක සමග යොදා ගැනීමේ හැකියාව දැන් අප විමසා බැලිය යුතුය. ඉදිරි පරිච්ඡේද දෙක ම වෙන් කරන්නේ සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය විමසුමට ලක් කිරිමට යි.

# - 5 -

# නියෝජනය වෙනුවට සංවිචාරණය - අයිස්ලන්ත අත්දැකීම

හුදු නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති බොහෝ දුර්ගුණ නිෂේධ කරන සුවිශේෂ ගුණාංගවලින් යුත් සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය *(deliberative democracy)* පිළිබඳ ව මේ පරිච්ඡේදයේ දී සවිස්තර ව සාකච්ඡා කෙරෙන බැවින් සංවිචාරණය *(deliberation)* යන වචනය නිශ්චිත ව හඳුන්වා දීම මැනව යි මම සිතමි. 'සංවිචාරණය' යන වචනය අප මේ කෘතිය පුරා යොදා ගන්නේ 'හැම පැත්තක් ගැන ම කරුණු කාරණා ඉතා සැලකිල්ලෙන් හා ඉවසිල්ලෙන් සන්තුලනය කර බලන සාකච්ඡාවක්' යන අදහස දෙන *Deliberation* යන ඉංග්‍රීසි පදයෙන් හැඟවෙන තේරුම සඳහායි. තවත් අන්දමකින් කිව හොත් සංවිචාරණීය සාකච්ඡාවක් යනු ඉදිරිපත් කරන කරුණු පිළිබඳ පොදු එකඟතාවක් සඳහා එකී කරුණු විවේක බුද්ධියෙන් *(reason)* හේතු යුක්ති සහිත ව සාකච්ඡා කිරීමයි.

ඇතැම් අවස්ථාවල දී ඉතිහාසයෙන් අපට උරුම වී යැ'යි අප සිතන බොහෝ දේවල් අපට අත්විඳින්නට ලැබෙන්නේ මුල් ස්වරූපයේ විකෘතියක් ලෙස ය. අර්ථය සහ අන්තර්ගතය පිළිබඳ කොතෙක් විවාද තිබුණ ද සුජාතකරණය කළ හැකි එක ම ආණ්ඩුක්‍රමය ලෙස පෘථුල ව සලකන ප්‍රජාතන්ත්‍රවාදය ද එබන්දකි. ප්‍රජාතන්ත්‍රවාදය සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන කොන්දේසි

නිශ්චය කිරීමට දේශපාලන විද්‍යාඥයෝ අතිශය වෙහෙසක් දරති. බොහෝ විට එවැනි ප්‍රයත්නවලට යොදා ගන්නේ යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේ පවතින භාවිත ඇසුරෙන් පරමාදර්ශී කරන ලද කොන්දේසි ය. එකී පරමාදර්ශ මතු ව එන්නේ 'ප්‍රජාතන්ත්‍රවාදය යනු තරඟකාරී මැතිවරණවල හා ලිබරල් අයිතිවාසිකම්වල මිශ්‍රණයක හරය වේ' යන ඔවුන්ගේ මතවාද තුළින් ය. නිසැක ලෙස ම මේ ප්‍රයත්නවල වැදගත්කමක් ඇති නමුදු ඒවායේ උපයෝගීතාව බොහෝ විට ප්‍රතිමානක *(normative)* විග්‍රහවලට පමණක් සීමා වේ.

ප්‍රායෝගික අර්ථයෙන් ගත් විට නූතන ප්‍රජාතන්ත්‍රවාදය කිසි සේත් ම ග්‍රීක පෞර රාජ්‍යවල පැවති මුල් ප්‍රජාතන්ත්‍රවාදයට සම නො වේ. ඒ නිසා අපේ දේශපාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී යැයි අප හඳුන්වන්නේ ඇයි? යන්න පිළිතුරු දීමට දුෂ්කර ප්‍රශ්නයක් බව නිසැක ය. ඉතින් දැනට පෙනෙන පරිදි 'මහජනතාව විසින් පාලනය කරනු ලැබීම' යන්න නිරූපණය කළ හැකි ආසන්නතම විධි ක්‍රමය තරඟකාරී ලිබරල් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ද යන්න නිර්දය ව විමසා බැලිය යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදය ඊට වඩා අර්ථවත් ආකාරයකට සංකල්ප ගත කර හැකි වෙනත් ප්‍රායෝගික විකල්ප ක්‍රමවේද තිබේ දැයි පිරික්සා බැලීම යෝග්‍ය වන්නේ ඒ නිසා ය.

ඇට්ලාන්ටික් *(The Atlantic)* යනු 1857 තරම් ඈත කාලයක සිට ඇමෙරිකාවේ පළවන ජනප්‍රිය මාසික සඟරාවකි. 1988 අගෝස්තු මාසයේ ඇට්ලාන්ටික් සඟරාවේ ආචාර්ය ජේම්ස් එස් ෆිෂ්කින් නමින් ලිපියක් පළ විය. ලිපිය පිටු දෙකකට සීමා වුවත් එහි අන්තර්ගතය බොහෝ දෙනෙකුගේ විස්මයට හේතු විය. ලිපිය පළ වුණේ ජොෂ්ඨ ජෝජ් බුෂ් ජයග්‍රහණය කළ ඇමෙරිකානු ජනාධිපතිවරණයට මාස තුනකට පෙර ය.

එවකට ටෙක්සාස් සරසවියේ දේශපාලන විද්‍යාව පිළිබඳ තරුණ මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කළ ජේම්ස් ෆිෂ්කින් සිය ලිපියෙන් යෝජනා කර තිබුණේ ඇමෙරිකාව පුරා වෙසෙන පුරවැසියන් අතරෙන් අහම්බෙන් තෝරා ගත් 1500 දෙනෙකු සමඟ සියලු ජනාධිපති අපේක්ෂකයන් එක ම තැනක දී දෙසතියක කාලයක්

සඳහා එකට මුණ ගැස්විය යුතු බවයි. එහි දී ජනාධිපති අපේක්ෂකයන් සිය දේශපාලන හා ආර්ථික සැලසුම් ප්‍රමාණවත් විස්තර සහිතව එසේ රැස් වන පුරවැසියන්ට ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනා හේතු යුක්ති සහිතව මැන බලමින් එකිනෙකා හා සාකච්ඡා කිරීමේ නොහොත් සංවිචාරණය *(deliberation)* කිරීමේ අවකාශය පුරවැසියන් 1500 ට ම ලැබිය යුතු ය. මේ පුරවැසි සංවිචාරණය රූපවාහිනිය ඔස්සේ සජීවී ව ප්‍රචාරණය කරන බැවින් අවශේෂ පුරවැසියන්ට ද එයට කන් දී ජනාධිපතිවරණයේ දී මනා ලෙස දැනුවත් වූ තෝරා ගැනීමක් කළ හැකි ය. මේ කටයුත්ත සඳහා ග්‍රීසියේ පැරණි ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ අංග දෙකක් සුවිශේෂයෙන් ම යොදා ගත යුතු බව ෆිෂ්කින් සිය ලිපියෙන් කියා සිටියේ ය. සහභාගී විය යුතු පුරවැසියන් 1500 දෙනා ම අහඹු *(Random)* ලෙස තෝරා ගැනීම ඉන් පළමුවැන්නයි. එහෙත් එසේ අහඹු ලෙස තෝරා ගත්ත ද හැකි ඉහළ ම විවිධත්වය නිරූපණය වන ලෙස පුරවැසියන් තෝරා ගැනීමට සංවිධායකයින් වග බලා ගත යුතු ය. දෙවැන්න සහභාගී වන්නන්ට දිරි දීමනාවක් ගෙවීමයි. මෙම සංවිචාරණයට සහභාගි වන සියලු පුරවැසියන් අතර දේශපාලන සමානාත්මතාව සහතික කළ හැකි ය. ඒ ඔවුන් ලොට් නොහොත් කුසපත් ඇදීමෙන් අහඹු ලෙස තෝරා ගන්නා අය වීම නිසායැ'යි ෆිෂ්කින් පෙන්වා දුන්නේ ය. න්‍යායික ව බැලූ විට ඒ ක්‍රමය අනුව හැම ඇමෙරිකානු පුරවැසියෙකු සම්බන්ධයෙන් ම තෝරා ගනු ලැබීමට ඇති හැකියාව එක හා සමාන වේ. දේශපාලනමය අවස්ථාව හැමට සාධාරණ ලෙස බෙදී යෑමේ ඇතීනියානු සංකල්පය නැවත අවදි කිරීමක් ලෙස එය සැලකිය හැකි ය.

එහෙත් ඇත්ත වසයෙන් ම ෆිෂ්කින්ගේ හිතේ තිබුණේ ඔහුගේ යෝජනාව ක්‍රියාත්මක කිරීම මඟින් වෙනස් මාදිලියක ජන මත විමසුමක් අත්හදා බැලීමයි. එනම් අදාළ කරුණු ගැන කල්පනා නොකර තීරණය කරන විට මහජනතාව සිතන ආකාරය සහ එම කරුණු ගැන හොඳින් කල්පනා කර තීරණය කිරීමට අවස්ථාවක් ලැබුණු විට සිතන ආකාරය අතර ඇති වෙනස කුමක් ද යන්න ගැන ඔහු යෝජනා කරන සංවිචාරණීය මත විමසුම් ක්‍රමය මඟින් පරීක්ෂා කොට බැලීමයි.

මේ වන විටත් නොබෙල් ත්‍යාගලාභී ඩැනියෙල් කාහ්නෙමන් සිය ප්‍රකට *Thinking, Fast and Slow* (සිතීම, වේගයෙන් සහ හෙමින්) නමැති කෘතිය පළ කර නොතිබිණි. ඉන් අවුරුදු 23කට පසු එම කෘතිය පළ කරමින් අප හිතන ආකාර දෙකක් ඇති බව චර්යා ආර්ථික විද්‍යාව *(behavioural economics)* සංවර්ධනය කිරීමට විශාල මෙහෙවරක් කළ මනෝ විද්‍යාඥයෙකු වූ කාහ්නෙමන් පෙන්වා දුන්නේ ය. වැඩියෙන් ම භාවිත වන වඩා ක්ෂණික පළමු අකාරයට අනුව අප තීරණ ගන්නේ කිසිදු ආයාසයක් නො ගෙන පුරුද්දට මෙනි. එහෙත් දෙවැනි ආකාරයට අනුව තීරණ ගැනීමේ දී අපි අපේ අවධානය හා සංවිචාරණීය හැකියාව උපරිම ලෙස භාවිත කරමින් විවේක බුද්ධියෙන් යුතු ව තීරණ ගැනීමට වග බලා ගන්නෙමු. අප බොහෝ විට දේශපාලන තීන්දු ගන්නේ පළමුවැනි අකාරයට ය. එහි දී ස්වායත්ත ව හිතනවාට වඩා අප කරන්නේ වැඩි කරදර නො වී අනුන් හිතන අන්දමට සිතීමයි. කාහ්නෙමන්ගේ ඒ පොත මට සිහි වුණේ ජේම්ස් ෆිෂ්කින් 2018 පල කළ ඔහුගේ *Democracy When the People are Thinking* යන අලුත් පොතේ නමින් ම කියවෙන පරිදි ප්‍රජාතන්ත්‍රවාදය යනු මිනිසුන් දැනුවත් ව සිතන විට පමණක් පවතින දෙයක් බව පෙන්වා දෙන විට යි. සංවිචාරණයේ අරමුණ එවැනි දැනුවත් සිතීමකට මිනිසුන් යොමු කිරීමයි.

කෙසේ වෙතත් හුදෙක් කිසියම් දේශපාලනඥයෙකුට ඡන්දය දීම නො ව එකිනෙකා හා සමඟ මෙන් ම විෂය විශේෂඥයන් සමඟ ද හේතු යුක්ති විමසමින් සාකච්ඡා කොට දැනුවත් ව තීරණයකට එළඹෙන ප්‍රජාතන්ත්‍රවාදය යන අර්ථයෙන් 'සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය' *('deliberative democracy')* යන යෙදුම බිහිවුණේ 1988 ඇට්ලාන්ටික් සඟරාවේ ෆිෂ්කින් පළ කළ ඒ ලිපියෙනි.

නිශ්චිත සමාජ අභියෝග සම්බන්ධ සියලු අදාළ තොරතුරු සහ හේතු සාමූහික සංවිචාරණය කේන්ද්‍ර කොට සලකා බලා සහභාගිවන්නන් විසින් තාර්කික හා සංයුක්ත විසඳුම් සම්පාදනය කරන ක්‍රමයක් ලෙස සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්විණි.

එහෙත් සහභාගිවන්නන් අතරින් ස්වාධිකාරී අතළොස්සකගේ ග්‍රහණයට එවැනි සාමූහික සංවිචාරණයක් හසු වීම වැළැක්වීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගත යුතු ය. ඒ නිසා එවැනි සංවිචාරණයක දී වඩා කුඩා උප කණ්ඩායම්වලට බෙදී සාකච්ඡා ඇරඹීම, සාකච්ඡා සෙනාරිවල *(scenario)* දළ සැකසුම් කල් තියා සකසා තිබීම, වෘත්තීය ප්‍රමාණකරුවන් හෙවත් මොඩරේටර්වරුන් යොදා ගැනීම සහ උප කණ්ඩායම්වල වාර්තා සාකච්ඡා කරන පූර්ණ සැසි වාර පැවැත්වීම වැනි විධි විධාන යොදා ගත යුතු බව ද ෆිෂ්කින් යෝජනා කළේ ය.

සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මෑත කාලයේ විශාල ශාස්ත්‍රීය සාහිත්‍යයක් බිහි වී තිබේ. එහෙත් ඒ සඳහා මුල් වූ ආභාසය 2500 වසරක් තරම් පැරණි ය. එය දේශපාලන සමානාත්මතාව තහවුරු කරමින් කුසපත් ඇදීමේ ක්‍රමයට තෝරා ගත් පුරවැසියන් සිය ගණනක සංවිචාරණීය කතිකා මඟින් ප්‍රධාන තීරණවලට එළඹුණු පැරණි ඇතන්ස් පාලනය දක්වා දිවෙන්නකි. අසල්වැසි මැසිඩෝනියානු රාජාණ්ඩුවේ මිලිටරි බලය වැඩි වීමත් සමඟ ඇතීනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පරිහානිය ඇරඹුණි. ඒ සමඟ සංවිචාරණීය පාලන විධි ක්‍රමය ද අභාවයට ගියේ ය.

ඇට්ලාන්ටික් සඟරාවේ පළ කළ සිය යෝජනාව ෆිෂ්කින් බරපතළ කොට සැලකී ය. ඒ අනුව එවැනි සංවිචාරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සහයෝගය සහ සම්පත් සැපයිය හැකි සංවිධාන පිළිබඳ තොරතුරු රැස් කළ නමුත් 1992 ජනාධිපතිවරණය වන විටත් ඒ සම්බන්ධයෙන් තීරණයකට ඒමට ඔහුට නො හැකි විය. ඒ සා විශාල පිරිසක් රට පුරා විවිධ ප්‍රාන්තවල සිට ගුවන් මඟින් ගෙන ඒමේ බරපැන දරන්නේ කවුරුන් ද, ඔවුන් සඳහා සති දෙකක් නවාතැන් සැපයීම, සංවිධාන වියදම් ආදිය ගැන විවිධ සාකච්ඡා ඇති වූ නමුත් සාම්ප්‍රදායික දේශපාලන පක්ෂවල ඇතැම් මුල් පෙළේ අනුග්‍රාහකයෝ ෆිෂ්කින්ගේ අපූරු යෝජනාව ගැන වැඩි මනාපයක් නො දැක්වී ය.

ඒ අනුව ෆිෂ්කින් සිය යෝජනාව සංශෝධනය කොට අහඹු ලෙස තෝරා ගනු ලබන සහභාගිවන්නන් සංඛ්‍යාව 600 කට සීමා

කිරීමටත් සංවිචාරණය එක සති අන්තයක දී පවත්වා නිම කිරීමටත් යෝජනා කළේ ය. සංඛ්‍යාව අනුව එය ඇමෙරිකානු ජනතාව නියෝජනය කිරීමට ප්‍රමාණවත් නියැදියක් බවත් නිසි ලෙස සංවිධානය කළොත් සංවිචාරණය සහ මත විමසීම සති අන්තයක දී ඉටු කර ගත හැකි බවත් ඔහුට වැටහී තිබුණි. ඒ වන විට ෆිෂ්කින් වඩා කුඩා ප්‍රමාණයේ සංවිචාරණීය ව්‍යාපෘති කිහිපයක් බ්‍රිතාන්‍යයේ සංවිධානය කර අත්දැකීම් ද ලබා ගෙන තිබුණි.

1996 දී බිල් ක්ලින්ටන් සහ බොබ් ඩෝල් අතර ඇමෙරිකානු ජනාධිපති තරඟය පැවැත්වෙන සමය වන විට ජේම්ස් ෆිෂ්කින් සිය සංවිචාරණීය ජනමත විමසුම දියත් කිරීමට ප්‍රායෝගික ව සූදානම් ව සිටියේ ය. ඒ අනුව 1996 ජනවාරි 18 වැනි දින සිට 21 වැනි දින දක්වා ටෙක්සාස් ප්‍රාන්තයේ ඔස්ටින් නගරයේ දී 'ජාතික ගැටලු සමුලුව' *(National Issues Convention)* යන නමින් ප්‍රථම ඇමෙරිකානු සංවිචාරණීය ජනමත විමසුම පැවැත්වීමට ෆිෂ්කින්ට හැකි විය. ඒ සඳහා ඔහුට ඔස්ටින්හි මහ නගර සභාව, ඇමෙරිකානු මහජන විද්‍යුත් මාධ්‍ය සේවය *( Public Broadcasting Service)* සහ ඇමෙරිකානු ගුවන් සේවය ද ඇතුළු සංවිධාන රැසක් සහයෝගය දැක්වී ය. පරිත්‍යාග වසයෙන් ඩොලර් මිලියන හතරක මුදලක් ද ඒ සඳහා එකතු වී තිබුණි. අහඹු ලෙස තෝරා ගත් පුරවැසියන්ගේ සංවිචාරණය සහ ජනාධිපති අපේක්ෂකයන්ගේ මැදිහත් වීම් *PBS* මහජන විද්‍යුත් මාධ්‍ය සේවා විසින් විකාශනය කරන ලද බැවින් අවශේෂ ජනතාවට ද මේ සංවිචාරණයට අවධානයකින් යුතු ව සවන් දිය හැකි විය.

එහෙත් මෙතරම් සහයෝගයක් තිබිය දීත් ජේම්ස් ෆිෂ්කින්ට විරුද්ධවාදීන්ගේ කටුක විවේචනවලට මුහුණ දීමට ද සිදු විය. සංවිචාරණය ඇරඹීමට පෙර එයට එරෙහි ව ලිපි රැසක් පළ කළ *Public Perspective* නමැති සඟරාව ඇමෙරිකාව පුරා ජනමාධ්‍යවේදීන් අතර බෙදා හැර තිබුණි. සංවිචාරණය යනු අහඹු ලෙස තෝරා ගත් පුරවැසියන් පිරිසකට කළ හැකි දෙයක් නො වන බවත් එය අනවශ්‍ය දෙයක් පමණක් නො ව අනතුරුදායක දෙයක් විය හැකි බවත් ඇතැම් විරුද්ධවාදීහු කියා සිටියහ.

කෙසේ වෙතත් ෆිෂ්කින් එම විවේචනවලින් අධෛර්යයට පත් නොවීය. විද්‍යාර්ථියෙකු වසයෙන් ඔහුට අවශ්‍ය ව තිබුණේ මෙවැනි සංවිචාරණීය ක්‍රියාවලියක් මඟින් මිනිසුන්ට කිනම් ආකාරයක බලපෑමක් ඇති විය හැකි ද යන්න විද්‍යාත්මක ව විමසා බැලීමයි. සංවිචාරණයේ ප්‍රතිඵලයක් ලෙස සහභාගි වන්නන්ගේ පරිඥානය වෙනස් වන ආකාරය වටහා ගැනීමට ෆිෂ්කින්ට අවශ්‍ය වී තිබුණි. ඒ සඳහා ඔහු සංවිචාරණයට පෙර, සංවිචාරණය අතර මග දී මෙන් ම සංවිචාරණය අවසානයේ දී සහභාගි වන්නන් විසින් පිළිතුරු දිය යුතු ප්‍රශ්නාවලි තුනක් පිළියෙළ කර තිබුණි. සහභාගි වන්නන් හැම දෙනෙකුට ම සංවිචාරණයට විෂය වන කරුණු සහිත තොරතුරු ගොනුවක් කල් තියා සපයා දී තිබුණි. ඔවුනොවුන් අතර මෙන් ම විෂය විශේෂඥයන් සමඟ ද සාකච්ඡා කොට කරුණු විමසා බැලීමට හා ගැටලු නිරාකරණය කර ගැනීමට සහභාගි වන්නන්ට ප්‍රමාණවත් අවස්ථා ද සලසා දී තිබුණි. නිරීක්ෂකයන්ගේ නිරීක්ෂණවලට අනුව සහභාගී වූ බොහෝ අය තුළ තමන් සහභාගි වන්නේ පොදු මෙහෙවරක් සඳහා ය යන හැඟීම, අන්‍යෝන්‍ය ගරුත්වය සහ ප්‍රසාද ජනක බව තිබුණු අතර පරස්පර මත ඉතා ඉවසිල්ලෙන් සහ සාවධාන ව සාකච්ඡා කිරීමට තරම් සුදුසු වාතාවරණයක් නිරන්තරයෙන් පවත්වා ගෙන යෑමට ද ඔවුහු සමත් වූහ.

අවසානයේ දී සිය සංවිචාරණීය මත විමසුමේ අභිමතාර්ථය මුළුමනින් ම පාහේ ඉටු වූ බවට සෑහීමකට පත් වීමට ෆිෂ්කින්ට හැකි විය. සංවිචාරණයට පෙර සහ පසු තත්වය සසඳන විට සහභාගි වන්නන්ගේ අදහස්වල ඇතිවී තිබූ වෙනස් වීම විස්මය දනවන සුලු විය. දේශපාලන තීරණ ගැනීමේ සංකීර්ණ භාවය පිළිබඳ වඩා දැනුවත් වීම සිය අදහස් වෙනස් කර ගැනීමට සහභාගි වන්නන්ට සැලකිය යුතු ලෙස බලපා තිබුණි . සහභාගිත්ව සංවිචාරණය දේශපාලන තීන්දු ගැනීමෙහි ලා සහභාගී වූවන්ගේ හැකියාව සහ විදග්ධ බව බෙහෙවින් මුවහත් කළ බව නිසැක ලෙස පෙනී ගියේ ය. අවශ්‍ය මෙවලම් හා තොරතුරු සැපයූ විට සාමාන්‍ය ජනතාවට ද නිපුණ පුරවැසියන්

බවට පත් විය හැකි බව පළමු වරට විද්‍යාත්මක ව තහවුරු කළ අවස්ථාව එය බව ෆිෂ්කින්ගේ ප්‍රයත්නය ගැන විවරණයක් කරමින් රේබෲක් පවසයි.[66]

සිය අත්හදා බැලීම නිසා වොයිස් කට්, සටන් පාඨ, වෙළඳ දැන්වීම් හා ඊනියා ජනමත සමීක්ෂණ යොදා ගෙන පැවැත්වෙන ගාල ගෝට්ටි ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට නියම මහජන මතය සාවධානව ඉස්මතු කර ගැනීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදය වඩා ශක්තිමත් කිරීමට අවස්ථාවක් සැලසිය හැකි බව ෆිෂ්කින් විශ්වාස කළේ ය.

ජේම්ස් ෆිෂ්කින්ගේ මේ ශාස්ත්‍රීය කටයුතු දේශපාලන විද්‍යාවේ නියම සංවිචාරණීය හැරවුම නිසැක ව ම සලකුණු කළේ ය. බරපතළ ලෙස රෝගාතුර ව ඇති නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට නව ජීවන හුස්මක් පිඹීමට සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදයට ඇති හැකියාව තව දුරටත් සැක කිරීමට කිසිදු දැනුවත් විද්‍යාර්ථියෙකුට හේතුවක් නැති බව රේබෲක් පවසයි. පුරවැසි සහභාගිත්වය යනු හුදෙක් පෙළපාලි යෑමට, වැඩ වර්ජනය කිරීමට, පෙත්සම් අත්සන් කිරීමට හෝ පොදු තැන්වල එක් රැස්ව ජන ඝෝෂා පැවැත්වීමට ඉඩ ලබා දීම පමණක් නො වේ. පුරවැසි සහභාගිත්වය යනු ආණ්ඩුකරණය තුළ නිතිපතා ආයතනික ව තහවුරු කළ යුතු දෙයකි. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය එයට මඟ සලසයි.

ඉන් පසුව ද ෆිෂ්කින් ලෝකයේ විවිධ රටවල සංවිචාරණීය මත විමසුම් සංවිධානය කිරීමට දායක විය. ෆිෂ්කින් වැඩ කළ ටෙක්සාස් ප්‍රදේශය මූලික වසයෙන් ඛනිජ තෙල් නිපදවීම මත යැපෙන ජනපදයකි. එසේ වුව ද ඛනිජ තෙල් වෙනුවට පුනර්ජනනීය බලශක්ති ප්‍රභේද ප්‍රවර්ධනය කිරීමට කැමැත්ත දක්වන ටෙක්සාස් වැසියන් පිරිස 52% සිට 84% දක්වා වැඩි කර ගැනීමට සංවිචාරණීය මත විමසුම් ක්‍රමය යොදා ගැනීම මඟින් ඔහුට හැකි විය. එම සහයෝගය නිසා 2007 වන විට ටෙක්සාස් ජනපදය ඇමෙරිකා එක්සත් ජනපදය තුළ

66 Reybrouck, David Van (2016). *Against Elections: The Case for Democracy,* London: Bodley Head, p. 111

වැඩි ම සුළං බල විදුලි ජනක ප්‍රමාණයකින් විදුලි බලය සපයා ගන්නා ජනපදය බවට පත් විය. ඒ හා සමාන සංවිචාරණීය මත විමසීම් ජපානයේ විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් ද, බල්ගේරියාවේ රෝමා ජනවර්ගයට අඩු සැලකිලි දැක්වීම සම්බන්ධයෙන් ද, බ්‍රසීලයේ මහජන සේවකයන්ගේ වෘත්තීය හැකියාව දියුණු කිරීම සම්බන්ධයෙන් ද, චීනයේ නාගරික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ද පවත්වා ඇති බව රේඛාඃක් පෙන්වා දෙයි. ඉතාමත් දරුණු වාර්ගික හා ආගමික බෙදීම් ඇති තැන්වල පවා ෆිෂ්කින්ගේ සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදි විධික්‍රමය ඵලදායක ලෙස උපයෝගී කර ගෙන තිබේ. උදාහරණයක් වශයෙන් අයර්ලන්තයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාමූහික සංවිචාරණයකට ලක් කිරීමට අයර්ලන්තයේ එදිරිවාදී කතෝලික හා ප්‍රොතෙස්තන්ත්‍ර ආගම්වලට අයත් දෙමව්පියන් එකට එක් ව කටයුතු කළ හැකි විය. ඒ අනුව සාමාන්‍යයෙන් එකිනෙකා ගැන විවේචනය කිරීමට පුරුදු ව සිටි එදිරිවාදීන් එකිනෙකා හා සාකච්ඡා කිරීමට පෙලඹවීමට සංවිචාරණීය මත විමසුම් ක්‍රමය සමත් විය. 2021 ජූනිවල ෆිෂ්කින් කළ ඉදිරිපත් කිරීමකට අනුව මේ වන විට බටහිර රටවල් හැරෙන විට සෙනගාලය, ටැන්සානියාව, තායිලන්තය, උගන්ඩාව, ඝානා, බ්‍රසීලය, චිලිය, මොංගෝලියාවේ සහ මොරොක්කෝව වැනි රටවල ප්‍රජාතන්ත්‍රවාදී සංවිචාරණීය විධික්‍රමය උපයෝගී කර ගෙන තිබේ.

ඒ අතරින් අයිස්ලන්තයේ සහ මොංගෝලියාවේ සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය උපයෝගී කරගත් අකාරය මේ පරිච්ඡේදයේ දෙවැනි භාගයෙන් සවිස්තරව සාකච්ඡාවට ලක් වේ.

පොදුවේ ගත් විට සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය *(deliberative democracy)* යනු දේශපාලන තීන්දු තීරණ ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සාක්ෂාත් කරගැනීමට යොදා ගන්නා විචාරශීලී කාර්ය පටිපාටිමය එළඹුමක් ලෙස සැලකිය හැකිය. වඩාත් පහසුවෙන් තේරුම් ගැනීම පිණිස එය එහි විකල්පය වන මැතිවරණ තීන්දු තීරණ ගැනීමේ දී යෙදෙන සමුදායී ආකෘතිවලට *(aggregative forms)* වඩා වෙනස් වන්නේ කෙසේදැයි විමසා බැලිය හැකිය. සමුදායී ආකෘතියේදී

සහභාගිවන්නන්ට සිදුවන්නේ දැනටමත් නිගමනය කර ඇති ආස්ථාන *(positions)* අතරින් තමන්ට අඩු වැඩි වසයෙන් එකඟවිය හැකි ආස්ථානය තෝරා ගැනීමයි. එහිදී එකී ආස්ථාන වෙනස් කිරීමට, වැඩි දියුණු කිරීමට හෝ නව ආස්ථානයක් සාකච්ඡාවට ලක් කිරීමට සහභාගිවන්නන්ට අවස්ථාවක් නො ලැබේ. උදාහරණයක් ලෙස සමුදායි ආකෘතියක් වන මැතිවරණ දේශපාලන ක්‍රියායනයකට *(political process)* සහභාගි වන ඡන්දදායකයින්ට තමන් අතර හෝ තමන් හා ඡන්දාපේක්ෂකයන් අතර ඇතිවන ගැඹුරු කතිකාවකින් මතුවන නව ආස්ථානයක් මනාප තේරීමක් ලෙස මැතිවරණ වේදිකාවට එකතු කිරීමට අවස්ථාවක් නො ලැබේ. මැතිවරණයකට තරඟ කරන පක්ෂ තමන්ගේ ම ප්‍රතිපත්ති සමුදායක් ඉදිරිපත් කරන අතර ඡන්දදායකයාගේ කාර්ය වන්නේ සිය මනාපයට ගැලෙපන ප්‍රතිපත්ති සහිත පක්ෂය හෝ අපේක්ෂකයා තෝරා ගැනීමයි. එකී ප්‍රතිපත්ති ඡන්දදායකයන්ගේ ක්‍රියාකාරි මැදිහත් වීමෙන් ගැඹුරු සංවිචාරණයට ලක් කොට වැඩි දියුණු කර ගැනීමේ අවකාශයක් සමුදායි ආකෘතිය තුළ සාමාන්‍යයෙන් නොපවතී. ඒ නිසා සමුදායි ආකෘතියේදී ඡන්දදායකයා යනු අකර්මණ්‍ය පුද්ගලයෙකු මිස සක්‍රිය පුරවැසියෙකු නොවේ. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය ඊට වෙනස් ව සහභාගිවන්නන් අතර කෙරෙන දැනුවත් සංවිචාරණයක ප්‍රතිපලයක් ලෙස අභිමත පරිදි වඩාත් ම සුදුසු ආස්ථානය මුලු මනින්ම අලුතින් ගොඩ නැගීමට, වැඩි දියුණු කිරීමට හෝ තෝරා ගැනීමට ඉඩ සලස යි.

ප්‍රකට ජර්මන් සමාජ විද්‍යාඥයෙකු වන යුගන් හාබර්මාස්ට අනුව සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය යනු ලිබරල්වාදය *(liberalism)* හා සමූහාණ්ඩුවාදය *(republicanism)* අතර පිහිටි තවත් සුවිශේෂ දේශපාලන ආකෘතියකි. එහෙත් මෙකී ආකෘති තුනටම පුද්ගලයාගේ ස්වතන්ත්‍රබාවය, පුරවැසියන්ගෙන් සමන්විත දේශපාලනික ප්‍රජාවක් සහ රාජ්‍යය සමඟ සහසම්බන්ධතාවක් ඇති සිවිල් සමාජයක් තුළ පිහිටුවා තිබෙන පොදු අවකාශය *(public sphere)* යන ගති ලක්ෂණ තුන ම පොදුය. එහෙත් ඒ පොදු ලක්ෂණ තුන ලිබරල්වාදය, සමුහාණ්ඩුවාදය හා සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය තුළ අවධාරණය වන්නේ එකිනෙකට

වෙනස් ආකාරයෙනි. ඒ අනුව ලිබරල්වාදී ආකෘතිය වැඩි අවධාරණයක් යොදන්නේ පුද්ගල අයිතීන් යනු රජයේ බලපෑම් වලින් ආරක්ෂා කරගත යුතු ඒවා වසයෙන් සැලකීමට යි. සමූහාණ්ඩුවාදී හෙවත් ප්‍රජාමූලවාදී *(communitrarian)* ආකෘතියෙන් අවධාරණය කරන්නේ නිලධාරිවාදී රාජ්‍යය යන්ත්‍රණයක් වෙනුවට සදාචාරය මුල් කරගත් රටවැසියන්ගේ ස්වයංපාලනයකින් මෙහෙයවෙන දේශපාලනික ප්‍රජාවක් ගැන යි. එහෙත් සංවිචාරණීය ආකෘතියේ අවධාරණීය ලක්ෂණය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ විමුක්තිදායක විභවය උපයෝගි කොට දේශපාලනය පොදු යහපත තකා සංවිචාරණීයව දමනය කරගැනීම සඳහා සිවිල් සමාජය මුල්කරගත් පොදු අවකාශයට දී ඇති තීරණාත්මක වැදගත් කම යි.

සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් වටහා ගත යුතු කරුණ වන්නේ සංවිචාරණයයේදී මනාපයන් *(preferences)* ගොඩ නැගෙනවා මෙන්ම මනාප සම්බන්ධ කලින් තිබූ තෝරා ගැනීම් හා ඒවාට දී තිබූ ප්‍රමුඛත්වය ද වෙනස් විය හැකි බව යි. නියම සංවිචාරණයක දී ඊට සහභාගිවන්නන් අතර තමන් එතෙක් දැරූ මතය වෙනස් කරමින් වෙනත් මතයක් තෝරා ගැනීමට ඇති පෙළඹීම වැඩි විය යුතුය. සංවිචාරණයේ දී සුවිශේෂයෙන් සුලුතර මතය හා සුලු ජාතීන්ගේ පර්යාලෝක ගැන වැඩි සැලකිල්ලක් දැක්විය යුතු ය. ඒ නිසා පොදු යහපත මුල් කර ගැනීම මගින් ආත්මාර්ථකාමී ආකල්පවල බලපෑම හැකිතාක් දුරට සංවිචාරණයේ දී අවම කළ යුතුය. ඒ අනුව කලින් වෙනත් අදහස් දැරුවන් අතර පවා සංවිචාරණය අවසානයේ දී එළඹෙන නිගමන පිළිගැනෙන අයුරින් ඉවසිලිවන්තව හා මිත්‍රශීලීව සංවිචාරණය සිදුවිය යුතු ය.

අනෙකුත් එළඹීම්වලට වෙනස් ව විවිධාකාර සංවිචාරණීය ප්‍රජාතනත්‍රවාදී ආකෘති වල අඩංගු අංග ලක්ෂණ දහයක් පමණ සලකුණු කළ හැකි බව තෝමස් හොස්ලර් (2018:14-15) සිය *The Media and the Public Sphere A Deliberative Model of Democracy'* නම් කෘතියෙන් පෙන්වා දෙයි. ඒවා නම්:

1. හුදෙක් ඡන්දය පමණක් භාවිතා කිරීමට හෝ ලබා ගැනීමට සීමා නොවී ඊට වඩා ඉහළ වටිනා කමක් එකිනෙකා හා කෙරෙන සංවිචාරණයට පුරවැසියන් සහ ඔවුන්ගේ නියෝජිතයන් ලබා දිය යුතු ය.
2. මනා ලෙස දැනුවත් වූ තීරණ ගැනීමට එකී සංවිචාරණය සෘජුව ම උපයෝගි විය යුතු ය.
3. සංවිචාරණය මගින් එළඹෙන තීරණ පොදු යහපත වැඩි දියුණු කරන ඒවා විය යුතු ය.
4. සමාජ තරාතිරම නොතකා සංවිචාරණයට සහභාගිවන සියල්ලෝ ම එක සමාන ස්වතන්ත්‍ර පුද්ගලයන් ලෙස එකිනෙකා විසින් පිළිගෙන මිත්‍රශීලී ව සැලකිය යුතු ය.
5. සංවිචාරණීය දේශපාලන ක්‍රියායනයකට කෙනෙකු සහභාගි වන්නේ ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් අනුව බව සහභාගිවන සියල්ලන් ම විසින් පිළිගත යුතු ය.
6. පොදු යහපත යනු කුමක්ද යන්න සම්බන්ධයෙන් පුරවැසියන් අතර විවිධ හා ඇතැම් විට එකිනෙකට පටහැනි මත තිබිය හැකි බැවින් සංවිචාරණයට පෙර එකී මත ගැන සහභාගිවන්නන් අවසාන නිගමනයකට නොපැමිණිය යුතු ය.
7. සුදුසු මනාප සම්බන්ධයෙන් අවසානයේ එළඹෙන නිගමන හුදෙක් සංවිචාරණයේ ප්‍රතිඵලයක් ලෙස සාක්ෂාත් කරගත් ඒවා ම විය යුතු ය.
8. සංවිචාරණය හුදු පුද්ගලික සම්බන්ධතා මත කෙරෙන සාකච්ඡාවක් බවට පත් නොවී පුද්ගලික සම්බන්ධතා වලින් තොර බහුතරයක් හා කෙරෙන විවෘත හා අවංක සාකච්ඡාවක් විය යුතු ය.
9. හැම විටම සංවිචාරණයට පාත්‍ර විය යුත්තේ පෞද්ගලික ලැදියා පිළිබඳ ව නොව පොදු යහපත හා සහබද්ධ වූ කරුණකි.

10. එහෙත් පුරවැසියාගේ නිදහස, සමානාත්මතාව හා ස්වතන්ත්‍රභාවය හා ඍජු ලෙස සම්බන්ධ නොවූ කාරණයක් වුවද පොදු යහපත හා සම්බන්ධ නම් සංවිචාරණයට ලක් කිරීමට හැකි ය.

කෙසේ වෙතත් 'සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය' සහ 'සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය' යන දෙක එකක් නො වේ. ජේම්ස් ෆිෂ්කින් සිය '*When the People Speak*' නම් කෘතියේ පෙන්වා දෙන පරිදි සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන සමානාත්මතාව සමඟ ම සංවිචාරණය ද එක සමාන ව අවධාරණය කරයි.[67] එහෙත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය අවධාරණය කරන්නේ දේශපාලන සමානාත්මතාව සහ බහු ජන සහභාගිත්වයයි. මේ සංකල්ප දෙකේ ම ඇතැම් පොදු ලක්ෂණ තිබෙන නමුත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදීන් වැඩි සැලකිල්ලක් දක්වන්නේ තීරණ ගැනීමේ දී ප්‍රායෝගික ව ම බහු ජනතාවක් සහභාගී වීම ගැනයි. එහෙත් සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදීන් වඩා වැදගත් කොට සලකන්නේ එක්රැස් ව අදාළ විෂය පිළිබඳ ගැඹුරින් සලකා බැලීම සාර්ථක ලෙස කර ගත හැකි ප්‍රමාණයට අහඹු ලෙස *(randomly)* තෝරා ගත් මහජන නියැදියක් යොදා ගෙන කෙරෙන ගැඹුරු හා දැනුවත් සංවිචාරණයකින් පසුව එළඹිය හැකි එකඟත්වය මත තීරණ ගැනීමයි. එහෙත් මේ සංකල්ප දෙක අවශ්‍යයෙන් ම එකිනෙකට හා ප්‍රතිවිරුද්ධ වටිනාකම්වලින් යුත් ඒවා ලෙස සැලකිය යුතු නො වේ. තීරණ ගැනීමේ දී ඍජු මහජන සහභාගිත්වය බොහෝ සහභාගිත්ව එළඹුම්වලින් වැදගත් කොට සැලකූ අන්දම අප පසුගිය පරිච්ඡේදයෙන් සාකච්ඡා කළෙමු. එහෙත් සිය සමීක්ෂණ පාදක කර ගෙන ෆිෂ්කින් පෙන්වා දෙන්නේ අවශ්‍ය කරන සියලු තොරතුරු, ඍජු සහභාගිත්වය සහ සාකච්ඡා සඳහා සුදුසු රැස්වීම් ස්ථානයක් සපයන්නේ නම් වඩා දැනුවත් වීමේ හැකියාව සාමාන්‍ය ජනතාවට ඇති බවත් ඒ අනුව එතෙක් දරා සිටි මතය වෙනස් කිරීමට ඔවුන් සූදානම් බවත් ය.

ඉතා සරල අන්දමින් විස්තර කළොත් ෆිෂ්කින් විසින් හඳුන්වා දෙන ලද සංවිචාරණීය මත විමසීමේ ක්‍රමය මඟින් කෙරෙන්නේ විමර්ශනයට ලක් වන විෂය කරුණ පිළිබඳ ව හොඳින් කල්පනා

67 Fishkin, J (2009) *When the People Speak,* New York: Oxford University Press, p. 121.

කර බැලීමට තරම් ප්‍රමාණවත් කාලයක් ලැබුණොත් මහජනතාව සිය මුල් තීරණය වෙනස් කර ගන්නේ ද  යන්න විමසා බැලීමයි. එහි අරමුණ වැඩි කල්පනා කිරීමකින් තොර ව රැල්ල යන අත අනුව සාමාන්‍ය ඡන්දදායකයන් විසින් සම්ප්‍රදායානුකූල මැතිවරණ තේරීමක් කරනු ලබන ආකාරය මැන බැලීම නො ව මහජනතාවගේ ක්ෂුද්‍ර රූපයක් ලෙස සැලකිය හැකි ප්‍රමාණයෙන් කුඩා නියෝජන කණ්ඩායමක් යොදා ගෙන අදාළ කාරණය පිළිබඳ ව කෙරෙන හොඳ සංවිචාරණයකට පෙර සහ පසු ව ගන්නා තීරණ කිනම් ආකාරයකට එකිනෙකින් වෙනස් වන්නේ දැයි නිගමනය කිරීමයි. මත විමසුමට ලක් කෙරෙන කණ්ඩායමෙන් ප්‍රමාණවත් ලෙස මහජනතාව නියෝජනය වන බව පෙනෙන්නේ නම් ප්‍රතිඵලය මඟින් ද බොහෝ දුරට නිරූපණය වන්නේ අදාළ තොරතුරු සැපයෙන දැනුවත් සංවිචාරණයක කොටස්කරුවන් වීමට ඉඩ ලැබුණොත් පොදු මහජනතාව සවිඥානික ව තීරණ ගන්නා ආකාරයයි.

ෆිෂ්කින් ඇත්ත වසයෙන් ම අදහස් කළේ සිය සංවිචාරණීය මත විමසුම් ක්‍රමය පැරණි ඇතන්ස් නුවර පැවැති ජූරි සභා ක්‍රමය අනුව සැකසීමටයි.[68] නූතන ජූරි සභා ක්‍රමය මෙන් ඇතන්ස්හි  ජූරි සභා ක්‍රමය හුදෙක් අධිකරණයක විනිශ්චය සඳහා විනිසුරුට උපදෙස් දෙන කටයුත්තට යොදා ගත් එකක් පමණක් නො වී ය. එය ඇතන්ස් නුවර සමාජ දේශපාලනික හා ආර්ථික කරුණු පිළිබඳ යෝජනා ඉදිරිපත් කළ හා සාකච්ඡාවට ලක් කළ එක්ලෙසියා *(Ecclesia)* නමින් හැඳින්වුණ පුරවැසි මහ සභාවේ විධායක කමිටුව බඳු ආයතනයක් විය. එහි එක් සුවිශේෂ කටයුත්තක් වූයේ පුරවැසි මහ සභාව  හමුවට නීති විරෝධී හෝ වගකීම් විරහිත යෝජනා ගෙන එන අය විනිශ්චයට ලක් කිරීමයි. ඒ ජූරි සභාව සමන්විත වූයේ කුසපත් ඇදීමෙ ක්‍රමයට අහඹු ලෙස තෝරා ගත් පුරවැසියන් 500 කට කිට්ටු සංඛ්‍යාවකිනි. ඒ සා විශාල සංඛ්‍යාවකින් යුතු ජූරි සභාවකට අල්ලස් දීම හෝ බලය යොදා මෙහෙයවා ගැනීම අසීරු කටයුත්තකි. ඒ නිසා එවැනි ජූරි සභා විභාග යකට මුහුණ දීමට සිදු වන ආකාරයේ අනීතික හෝ වගකීම් විරහිත

68 Fishkin, J (2009) *When the People Speak,* New York: Oxford University Press, p. 11.

යෝජනා එක්ලෙසියා මහ සභාවට ඉදිරිපත් නො කිරීමට ද ඇතන්ස්හි පුරවැසියෝ වග බලා ගත්හ. එක්ලෙසියා මහ සභාව විසින් සලකා බැලූ යෝජනා හා තීන්දු වැඩිදුරටත් සලකා බලා අවශ්‍ය නම් ඇතැම් තීන්දු සංශෝධනය කිරීමට ද එම ජූරි සභාවට බලය ලැබුණි.

එකී ඇතීනියානු ජූරි සභා ක්‍රමය දෙයාකාරයකින් සුවිශේෂ යඃ එනම් දැඩි සංවිචාරණය සහ ජූරි සාමාජිකයන් කුසපත් ඇදීමෙන් අහඹු ලෙස තෝරා ගැනීමයි. එම සාධක දෙකේ ම එක්වීම සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් අභියෝගයක් වූ ජනගහනයේ ප්‍රමාණය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ගැටලුවට විශිෂ්ට විසඳුමක් වූ බව ෆිෂ්කින් අදහස් කරයි. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදයේ දී අවසාන නිගමනයට පැමිණීම පිණිස සහභාගි වන හැම කෙනෙකුගේ ම අදහස් එක සමාන ලෙස වැදගත් කොට සැලකිය යුතු ය. මෙම ක්‍රියාවලිය සංවිචාරණීය ක්‍රියාවලියක් ලෙස හඳුන්වන්නේ අදාළ කරුණුවල හේතු යුක්ති බව මෙන් ම විෂය විශේෂඥයින්ගෙන් ලබා ගන්නා නව දැනුම ද එකිනෙකා කෙරෙහි ඇති සමාන ගරුත්වය පදනම් කර ගෙන තරයේ සාකච්ඡාවට ලක් කරන බැවිනි. එසේ සංවිචාරණීය වන අතර එම ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී යැයි සැලකෙන්නේ සහභාගි වන හැම කෙනෙකුගේ ම අදහස් එක සමාන සැලකිල්ලකින් සාකච්ඡාවට ලක් කරන බැවිනි.

ෆිෂ්කින් ඉදිරිපත් කළ සංවිචාරණීය මත විමසුම් ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ දේශපාලන සමානාත්මතාව සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවිචාරණයට ගරු කරන අතර ම ප්‍රමාණයෙන් විශාල නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළට මුහුණට මුහුණ ලා කෙරෙන විමර්ශනාත්මක සාකච්ඡා ක්‍රමයක් ගෙන ඒමයි. අන්තර්ජාලය පදනම් කරගත් සංනිවේදන ක්‍රම සමඟ යොදා ගත් විට සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය තුළට වඩා පුළුල් මහජන සහභාගිත්වයක් ගෙන ආ හැකි ය. ඒ බව 2010 සිට 2013 දක්වා අයිස්ලන්ත වැසියන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා දැරූ ප්‍රයත්නයේ දී උපයෝගී කරගත් විවෘත සංවිචාරණීය *(deliberative)* ක්‍රමවේදයෙන් පෙන්නුම් කරයි. ඒ අනුව අයිස්ලන්ත අත්දැකීම ෆිෂ්කින් නිර්ණය කළ

සංවිචාරණය සහ අහඹු ලෙස තෝරා ගත් මහජන නියැදිය යන සාධක දෙකට අතිරේක ව අන්තර් ජාලගත *(online)* මහජන සහභාගිත්වය ද සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් සාධකයක් ලෙස එක් කළේ ය. ඒ නිසා අයිස්ලන්ත අත්දැකීම සවිස්තර ව සලකා බැලීම වටී.

2008 ආර්ථික අර්බුදයේ පීඩනය හමුවේ පවතින දේශපාලන ක්‍රමයට එරෙහිව ඒකරාශී වූ අයිස්ලන්ත රටවැසියෝ 2009 දී සිය රටට නව දැක්මක් අවශ්‍ය බව කියා සිටියෝ ය. ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ කාර්ය දියත් කිරීම එම උද්ඝෝෂණයේ ම ඉල්ලීමක් විය. නව ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී විනිවිදභාවය, විවෘතභාවය සහ මහජන සහභාගිත්වය යන කොන්දේසි තුන ප්‍රමුඛ කර ගත යුතු බව මහජන මතය විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා අන්තර්ජාල සංනිවේදනය හරහා සෘජු මහජන සහභාගිත්වය ලබාගත් ලෝකයේ ප්‍රථම 'ජන මූල' *(crowdsourced)* සංවිචාරණීය ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදන ක්‍රමය ලෙස බොහෝ දේශපාලන විද්‍යාර්ථීහු අයිස්ලන්ත අත්දැකීම අගයති.[69] ජන මූල යන්නෙන් මෙහි දී අදහස් වන්නේ ජන සමුදාය ප්‍රභවය කරගත් හෙවත් ජනතාවගෙන් එකතු කර ගත් යන තේරුමයි. මාර්ග ගත හෙවත් ඔන්ලයින් (*online)* ක්‍රම යොදා ගෙන 'ජන මූල' ව්‍යවස්ථා සම්පාදනයක් සාර්ථක කර ගැනීමට නම් ප්‍රමාණයෙන් කුඩා සමජාතීය ජනගහනයක්, ඉහළ අධ්‍යාපන මට්ටමක්, ඉහළ මැතිවරණ සහභාගිත්වයක් සහ ජනගහනයෙන් 96%කට අන්තර්ජාල පහසුකම් ඇති වාතාවරණයක් සහිත අයිස්ලන්තය ඒ සඳහා සුදුසු ම ස්ථානයක් වසයෙන් සැලකිය හැකි ය.

2008 ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස බැංකු කඩා වැටීම නිසා වැඩි ම හානියක් ඇති වූ රටවල් අතරින් අයිස්ලන්තය ද එක රටක් විය. නවලිබරල්වාදී ප්‍රතිපත්ති අනුව මූල්‍ය අංශය නියාමනය කිරීම හැකි තාක් දුරට ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියක් එකල අයිස්ලන්තයේ පැවති දක්ෂිණාංශික ආණ්ඩුව විසින් කලක් තිස්සේ ක්‍රියාත්මක කර

69 Hudson, Alexander (2021) The Veil of Participation, Cambridge: Cambridge University Press, pp. 114-115

තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය අර්බුදයත් සමඟ 2008 ඔක්තෝබර් මස අයිස්ලන්තයේ විශාලතම බැංකු තුන කඩා වැටුණේ ය. බැංකුවල මේ කඩා වැටීම 320,000 ක් පමණ වූ අයිස්ලන්තයේ ජනගහනයෙන් වැඩි කොටසකගේ බැංකු ගිණුම් අනතුරේ දමමින් ඉතිරි කිරීම් දියකර ඔවුන් ආර්ථික ව්‍යසනයකට ඇද දැම්මේ ය. පවතින පක්ෂ දේශපාලනය ගැන මහජන කලකිරීම වැඩි විය. 'හැළි වළං විප්ලවය' *(pots and pan revolution)* යන නමින් හැඳින්වූ උද්ඝෝෂණ ව්‍යාපාරයේ දී ඉවුම් පිහුම් භාජනවලට තට්ටු කරමින් ජන ඝෝෂා නගමින් දහස් ගණනින් වීදි බට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම නිරූපණය වූ මහජන විරෝධය බෙහෙවින් බරපතළ විය. එනිසා දක්ෂිණාංශික හා මධ්‍යමික කොටස් වලින් යුක්ත සභාග රජය අවසානයේ දී නව මහා මැතිවරණයක් කැඳවීය. ව්‍යවස්ථා සංශෝධනයක් පොරොන්දු වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා වාමාංශික හරිත ව්‍යාපාරයට ඒ අනුව තාවකාලික සභාග ආණ්ඩුවක් පිහිටුවීමට ඉඩ ලැබුණි.

ආර්ථික අර්බුදය නිසා අයිස්ලන්තයේ ප්‍රධාන බැංකු කඩා වැටීම එහි බිම් මට්ටමේ දේශපාලනය අවදි කර වීමට සමත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස *The Anthill* හෙවත් 'තුඹස' නමින් සංවිධාන ගත වූ මහජන ව්‍යාපාරයක් අයිස්ලන්තයේ අනාගතය කෙබඳු විය යුතු ද යන්න සාකච්ඡා කිරීමේ වැඩපිළිවෙළක් දියත් කළේ ය. එය ආරම්භ වූයේ 2009 නොවැම්බරයේ දී 'ප්‍රථම ජාතික සංවාද සභාව' යන නමින් පැවැත් වූ එක් දින සම්මේලනයකිනි. ඒ සඳහා පුද්ගලයන් 1500ක් සහභාගී වූ අතර එහි විශේෂත්වය වූයේ ඒ අතරින් 1200 දෙනෙකු ම ජාතික ජනගහන ලේඛනයෙන් අහඹු *(random)* ලෙස තෝරා ගත් අය වීමයි. ඉතිරි 300 දෙනා තෝරා ගන්නා ලද්දේ විවිධ ව්‍යාපාර, වෘත්තීය සහ සිවිල් සමාජ සංවිධාන නියෝජනය කිරීම සඳහායි. මේ රැස්වීමේ දී කතිකා කරගත් කරුණු අතර ප්‍රධාන වූයේ අයිස්ලන්ත ආණ්ඩුව සහ පරිපාලනය ප්‍රතිශෝධනය කිරීමේ දී උපයෝගී කර ගත යුතු ප්‍රමුඛතා සහ ප්‍රවර්ධනය කළ යුතු සමාජ වටිනාකම් මොනවාද යන්නයි. මෙකී සාකච්ඡා සභාවේ නිගමන ජනමාධ්‍ය මඟින් සහ නොයෙක් අතිරේක කතිකා හා සංවාද ඔස්සේ

පොදු අවකාශය තුළ තවදුරටත් සාකච්ඡාවට ලක් විය. ප්‍රථම ජාතික සංවාද සභාවේ සාර්ථකත්වය දුටු නව රජය ව්‍යවස්ථා සම්පාදන වැඩ පිළිවෙළ සූදානම් කිරීම පිණිස විශේෂඥයින් හත් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළේ ය. මේ විශේෂඥ කමිටුව *The Anthill* සංවිධානයත් සමඟ එක් ව නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ නිශ්චිත පියවරක් ලෙස 'දෙවැනි ජාතික සභාව' කැඳවී ය.[70]

2010 නොවැම්බරයේ පැවති දෙවැනි ජාතික සභාවට සහභාගි වන අය නම් කරණු ලැබුවේ ද ජාතික ජනගහන ලේඛනයෙන් අහඹු *(random)* ලෙස කළ තෝරා ගැනීමකිනි. එසේ අහඹු ලෙස තෝරා ගැනීමේ දී රට පුරා සෑම පළාතකින් ම නියෝජනය වන සහ හැකි තාක් දුරට එක සමාන ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාවක් අයත් වන ලෙස සහභාගි වන්නන් තෝරා ගැනිණි. මේ සඳහා *The Anthill* සංවිධානය අයිස්ලන්තයේ ප්‍රමුඛ සමීක්ෂණ සමාගමක ආධාරය ඇති ව ජනගහන ලේඛනය උපයෝගී කර ගෙන වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂ භාවය සහ ප්‍රාදේශීය නියෝජනය හැකි තාක් දුරට සමාන වන අන්දමින් අහඹු ලෙස තෝරා ගත් පුද්ගල ලැයිස්තුවක් සකස් කළේ ය. අනතුරු ව එසේ තෝරා ගත් පුද්ගලයන්ට ඒ බව දැනුම් දී අදාළ කාර්ය පිළිබඳ කෙටි විස්තරයක් සමඟ ව්‍යවස්ථා සම්පාදනයට සහභාගි වීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත විමසා ලිපි යවන ලදි. එහෙත් ලැබුණු ධනාත්මක ප්‍රතිචාර ප්‍රමාණය 20% කට වැඩි නො වී ය. අනතුරු ව දුර කථන මඟින් ද ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කිරීමට සිදු විය. කෙසේ වෙතත් අවසානයේ දී අවශ්‍ය වූ 950 දෙනා තෝරා ගැනීමට හැකි වූයේ අහඹු ලැයිස්තුවේ සඳහන් 3000 ක් පමණ වූ පුද්ගල සංඛ්‍යාවක් විමසීමෙන් පසුවයි. එසේ තෝරා ගත් සහභාගි වන්නන් කිසියම් අන්දමකින් සහභාගි වීම ප්‍රතික්ෂේප කළ හොත් එම පුරප්පාඩු පිරවීමට සමාන නිර්ණායක අනුව සැකසූ විකල්ප ලැයිස්තුවක් ද සූදානම් කර තිබුණි. ඒ අනුව ක්‍රමවේදය බොහෝ දුරට අහඹු තෝරා ගැනීම අනුගමනය කළ ද අදාළ සහභාගිත්ව නිර්ණායක අනුගමනය කිරීම පිණිස ඇතැම් තේරීම් එම නියැදිය

70 https://participedia.net/case/130 - Retrieved on 14 June 2021

මඟින් ම අභිමතය අනුව තීරණය කිරීමට සිදු විය. එහෙත් මුලු තේරීම් ක්‍රමය විනිවිද පෙනෙන සුලු සාධාරණීකරණය කළ හැකි ක්‍රමයක් වසයෙන් පවත්වා ගැනීමට සංවිධායකයෝ උත්සුක වූහ.

මේ ජාතික සාකච්ඡා සභාවට සහභාගී වූ 950 දෙනාට පැවරුණු කාර්ය වූයේ "රටේ ආණ්ඩුව සහ ව්‍යවස්ථාව සංවිධානය කර ගැනීම පිළිබඳව මහජනතාව විසින් අවධාරණය කළ යුතු මුඛ්‍ය කරුණු මොනවා ද යන්න කතිකා කොට නිගමනය කිරීමයි". ඒ අනුව දිනක් පුරා පැවති සාමූහික බුද්ධි කළම්බක *(brainstorming)* සැසියක් මඟින් ලබාගත් විවිධ අදහස් ප්‍රධාන තේමා අටක් යටතේ ලැයිස්තු ගත කෙරිණි. අනතුරු ව සාකච්ඡා සභාවට සහභාගි වූ සියල්ලෝ ම එක කණ්ඩායමකට අට දෙනෙකු වසයෙන් කණ්ඩායම්වලට බෙදී වට මේස සාකච්ඡා මඟින් එකී අදහස් තවදුරටත් සාකච්ඡාවට ලක් කර එක් එක් කණ්ඩායමේ නිගමන වෙන් වෙන් ව කෙටුම්පත් කරන ලදී. මෙම ක්‍රියාවලිය මෙහෙයවීමට පුහුණු පහසුකම් සපයන්නන් *(facilitators)* යොදා ගැණිනි. 'ලොඕස්' යන නමින් හැඳින්වුණු එම පහසුකම් සපයන්නන් අදාළ කරුණු සම්බන්ධ ව තම පුද්ගලික අදහස් පළ කිරීමෙන් වැළකිය යුතු වූ අතර ඔවුන්ගේ මූලික කාර්යය වූයේ හැම සහභාගි වන්නෙකුට ම සිය අදහස් නො පැකිළ ව ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීමයි. බොහෝ වට මේස සාකච්ඡා ආරම්භ වූයේ පහසුකම් සපයන්නා විසින් කරන ලද හැඳින්වීමකට පසුවයි. සහභාගිත්ව සාකච්ඡා පැවැත්වීම පිළිබඳ විශේෂඥ පුහුණු ආයතනයක් විසින් පිළියෙළ කරන ලද සම්මන්ත්‍රණ කාලසටහන මෙම සාකච්ඡාවල දී තදින් අනුගමනය කෙරිණි.

පෙරවරුවේ පැවති සාකච්ඡාවලට සහභාගි වූවන්ගේ කාර්යය වූයේ ප්‍රධාන තේමා අටකට වර්ග කරන ලද විවිධ සාධකවලට අදාළ විය යුතු දැක්ම සහ වටිනාකම් කෙබඳු විය යුතු ද යන්න කතිකා කර ගැනීමයි. ඉන් අනතුරුව පස්වරුවේ මුල් කොටස වෙන් වූයේ එක් එක් තේමාව පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වූ කණ්ඩායම් අතර සාකච්ඡා පැවැත්වීමටයි. මෙහි දී අරමුණ වූයේ එතෙක් එකී තේමා සම්බන්ධයෙන් ඉදිරිපත් ව තිබූ යෝජනා ඒවායේ වැදගත්කම අනුව

ලැයිස්තු ගත කිරීම වුවත් සම්මන්ත්‍රණයේ මේ කොටසේ දී සාකච්ඡාව බෙහෙවින් සංවාදශීලී ස්වභාවයක් ගත්තේ ය.

එසේ එක් එක් තේමාව අනුව රැස් වූ කණ්ඩායම් සිය සාකච්ඡාවලින් පසුව උදයවරුවේ සංයුක්ත වූ ආකාරයට යළිත් රැස්ව මෙතෙක් තමන් එක්රැස් කරගත් කරුණු නැවත සිය මුල් කණ්ඩායම තුළ සමාලෝචනයකට ලක් කළේ ය. එක් එක් කරුණ නැවත ගැඹුරින් විමසනවාට වඩා මෙම සාකච්ඡා වටය සාමාන්‍ය අදහස් හුවමාරු කර ගැනීමක ස්වරූපය ගත්තේ ය. එසේ කතිකා කරගත් කරුණු අනුව එක් එක් වට මේසය මුලින් ම සිය මුඛ්‍ය නිර්දේශ පහ සකස් කොට අවසානයේ දී ඉන් වඩාත් ම වැදගත් නිර්දේශ තුන ඡන්දයකින් සම්මත කර ගත්තේ ය.

මෙම සම්මන්ත්‍රණය අවසානයේ දී එළඹුණු නිගමනවලට අනුව නව ව්‍යවස්ථාවක තිබිය යුතු මුඛ්‍ය වටිනාකම් ලයිස්තුවක් සංවිධායකයින් විසින් පිළියෙල කරන ලදී. ඒ සඳහා අනුගමනය කළ පිළිවෙත මෙසේයි. කතිකාවට ලක් වූ එක් එක් තේමාව සම්බන්ධයෙන් නව ව්‍යවස්ථාවක තිබිය යුතු ම යැ'යි එක් එක් වට මේසය නිගමනය කරන කරුණ තනි වැකියකින් ප්‍රකාශ කළ යුතු විය. ඉන් පසු එක් එක් වට මේසය එම වට මේසය විසින් ආමන්ත්‍රණය කරන ලද තේමාව සම්බන්ධ වැදගත් ම කාරණය පිළිබඳ නිර්දේශය තනි වැකියකින් ඉදිරිපත් කළ යුතු ය. අනතුරුව, 'නව ව්‍යවස්ථාව සම්පාදනය කරන අයට ඔබ විසින් ඉදිරිපත් කරණු ලබන නිර්දේශ, උපදෙස් සහ ඉල්ලීම් මොනවාද?' යන ප්‍රශ්නයට කණ්ඩායමේ වැඩි ඡන්දයෙන් තෝරා ගත් හොඳ ම පිළිතුරු තුන ලබා දිය යුතු විය. අවසාන වසයෙන් සංවිධායකයෝ පහසුකම් සපයන්නන් ද ඇතුළුව සම්මන්ත්‍රණයට සහභාගි වූ එක් එක් අයගෙන් නව ව්‍යවස්ථාව සම්බන්ධව ඒ අයගේ පුද්ගලික නිර්දේශ ද එකතු කර ගත්තේ ය. අවසානයේ දී විශේෂඥයින් හත් දෙනාගේ කමිටුව විසින් මේ ජාතික සභාවේ නිර්දේශ පිළිබඳ විවරණයක් සමඟ නව ව්‍යවස්ථාවක් සඳහා පිළියෙළ කළ සැලසුම් දෙකක් සහිත නිගමන සියල්ල ඇතුළත් පිටු 700 කින් සමන්විත වාර්තාවක් සම්පාදනය කරන ලදී. එම වාර්තාව අදාළ සියලු ලේඛන

සමඟ ඡන්දයෙන් තෝරා ගන්නා සාමාජිකයන් විසිපස් දෙනෙකුගෙන් සමන්විත වන ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට යොමු කිරීමට සූදානම් කෙරුණි.

අයිස්ලන්ත ව්‍යවස්ථා සම්පාදන වැඩපිළිවෙළේ ඊළඟ වැදගත් පියවර වූයේ ව්‍යවස්ථාව කෙටුම්පත් කරන සාමාජිකයන් 25 දෙනෙකුගෙන් යුතු  ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය පිහිටුවීමයි. නව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ව්‍යවස්ථා සම්පාදන පනතට අනුව දේශපාලනය ගැන අත්දැකීමක් නැති ඕනෑ ම කෙනෙකුට තෝරා පත් විය හැකි මෙම මණ්ඩලය 'ආධුනිකයන්ගේ' මණ්ඩලයක් ලෙස හැඳින්වීමට හැකියැ'යි අයිස්ලන්ත ව්‍යවස්ථා සම්පාදන වැඩපිළිවෙළ විස්තර කරන ආචාර්ය හෙලන් ලැන්ඩ්මොර් සිය *Open Democracy: Reinventing Popular Rule for the Twenty First Century* නමැති කෘතියෙන් පෙන්වා දෙයි.[71] ඒ වන විට පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සිටින වෘත්තීය දේශපාලනඥයින් නව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට තේරී පත්වීම ව්‍යවස්ථා සම්පාදන නීතිය මඟින් වළක්වා තිබුණි. එහි අරමුණ වූයේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට තෝරා පත් වන්නන් අතරින් බහුතරය සාමාන්‍ය රටවැසියන් වීම සහතික කිරීමයි. මෙම විවෘත භාවය නිසා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට අයත් වන විසිපස් දෙනා තෝරා ගැනීමේ මැතිවරණයට 522 නෙක් තරඟ කළහ. වෙනත් සාම්ප්‍රදායික ව්‍යවස්ථා සම්පාදන මණ්ඩල මෙන් නො ව අවසානයේ දී තෝරා පත් වූ 25 දෙනාගෙන් අයිස්ලන්ත ජනසමාජයේ බහුවිධත්වය කදිමට නිරූපණය විය.

තාක්ෂණික හේතුවක් නිසා එම මැතිවරණයේ ප්‍රතිඵල අයිස්ලන්ත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවලංගු කළ ද මැතිවරණයෙන් තෝරා පත් වූ 25 දෙනා පාර්ලිමේන්තුවේ සම්මුතියෙන් යළි ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට තෝරා පත් කෙරිණි. සාමාන්‍ය මැතිවරණයකින් තෝරා පත් වන වෘත්තීය දේශපාලනඥයන් හෝ පරිපාලකයන් වෙනුවට මෙවර තෝරා පත් වූ බොහෝ අය ආධුනික

71 Landemore, Hélène (2020) *Open democracy: reinventing popular rule for the twenty-first century*, Princeton: Princeton University Press, p.160

දේශපාලනඥයන් වසයෙන් සැලකිය හැකි ය. ජාතික සාකච්ඡා සභා දෙකෙහි ම කතිකා කොට පැමිණ තිබූ නිගමන ගැන තම ස්ථාවරය මැතිවරණයට පෙර ඡන්දදායකයින්ට පැහැදිලි කිරීමට ඔවුන්ට සිදුවී තිබුණි. තෝරා පත් වූ අපේක්ෂකයින් විසිපස් දෙනා අතර කලින් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් හොබවා තිබුණේ දෙදෙනෙකු පමණි. නව ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය ස්ත්‍රීන් දස දෙනෙකුගෙන් සහ පුරුෂයන් පහළොස් දෙනෙකුගෙන් සමන්විත විය. ව්‍යවස්ථා සම්පාදන පනතට අනුව සාමාජිකයන් අතරින් අවම වසයෙන් 40% ක්වත් ස්ත්‍රීන් විය යුතු ය යන කොන්දේසිය එමඟින් සපුරා තිබුණි. තෝරා පත් වූ විසිපස් දෙනා අතර විශ්ව විද්‍යාල මහාචාර්යවරු පස් දෙනෙක්, ජනමාධ්‍යවේදීහු දෙදෙනෙක්, වෛද්‍යවරු තිදෙනෙක්, නීතිඥයෙක්, වෘත්තීය සමිති නායකයෙක්, ක්‍රිස්තියානි පූජකයෙක්, පොත් ප්‍රකාශකයෙක්, වීඩියෝ ක්‍රීඩා නිපදවන්නෙක්, වෙළඳ ව්‍යාපාරිකයෙක්, ජාතික කලා කෞතුකාගාරයේ වාස්තු විද්‍යාව පිළිබඳ කළමනාකරු, දේශපාලන විද්‍යාඥයෙක්, පාරිභෝගික සමාජ ක්‍රියාකාරිකයෙක්, නාට්‍ය නිෂ්පාදකයෙක් සහ ගොවියෙක් ද වූහ.

මේ තෝරා පත්වීම් විවිධත්වය අතින් විශාල පරාසයකට අයත් වුව ද ප්‍රාදේශීය හා සමාජ ආර්ථික නියෝජනය අතින් බැලූ විට තරමක් දුර්වල තේරීමක් විය. සාමාජිකයන් විසිපස් දෙනාගෙන් විසිතුන් දෙනෙක් ම රටේ අගනුවර වූ රයික්ජවික් නගර වැසියෝ වූහ. තෝරා පත් වූ අය අතර විද්‍යාර්ථීහු ද සැලකිය යුතු පිරිසක් වූහ. තෝරා පත් වූ එක ම ගොවියා ද ගොවි සමිති ව්‍යාපාරයේ සභාපතිවරයායි. බොහෝ අයගේ ප්‍රධාන විවේචනයක් වුණේ තේරී පත් වී ඇති බහුතරයක් මධ්‍යම පංතියට අයත් අය වීමයි.

කෙසේ වෙතත් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ කටයුතු ඇරඹීමෙන් පසු සෘජු මහජන සහභාගිත්වය වැඩි වසයෙන් දක්නට ලැබුණේ අන්තර්ජාලය ඔස්සේ මහජන ප්‍රතිචාර ලැබෙන අවදියේ යි. ඒ වන විට පවත්වා තිබූ මූලික ජාතික සාකච්ඡා සභා දෙකේ ම නිර්දේශ මාධ්‍ය හරහා සහ විවිධ සංවාද මණ්ඩප මඟින් පොදු අවකාශය තුළ සාකච්ඡාවට භාජනය වී තිබුණ බැවින් පුළුල් ව්‍යවස්ථා සාකච්ඡාවකට

සම්බන්ධ වීමට අවශ්‍ය දැනුම සැලකිය යුතු මට්ටමින් ජනගත ව තිබුණි. තමන්ට පැවරුණු කටයුත්ත ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට සීමා කර හුදකලාව කෙටුම්පත සකස් කරනවා වෙනුවට ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සාමාජිකයෝ බොහෝ දෙනෙක් එදිනෙදා සාකච්ඡා පිළිබඳ තම අදහස් කෙලින් ම අන්තර්ජාලය ඔස්සේ මහජනතාවට දැනුම් දෙමින් ඒ සම්බන්ධයෙන් මහජන ප්‍රතිචාර ලබා ගත්හ.

ව්‍යවස්ථා කෙටුම්පත්කරණයේ හැම අවධියක දීම සාකච්ඡාවට ලක් වී ඇති යෝජිත ව්‍යවස්ථා ඡේද අන්තර්ජාලය ඔස්සේ මහජනතාවට දැන ගැනීමට සලස්වනු ලැබී ය. ඒ අනුව ලැබුණු ෆේස්බුක්, ට්විටර්, විද්‍යුත් තැපැල මඟින් මෙන් ම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ වෙබ් අඩවිය ඔස්සේ ලැබුණු මහජන ප්‍රතිචාර ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ කතිකා වඩ වඩා පොහොසත් කළේ ය. මේ ක්‍රියාවලියේ දී අන්තර්ජාලය ඔස්සේ විවිධාකාර ප්‍රතිචාර අදහස් 3600 ක් පමණ ලැබුණි. එම අදහස්වල දිග ප්‍රමාණය එකිනෙකට වෙනස් වූ අතර ඉන් සැලකිය යුතු අදහස් ප්‍රමාණයක් කලින් දක්වා තිබූ අදහස්වලට ප්‍රතිචාර වසයෙන් ලබා දුන් ඒවා විය. අවසානයේ දී ඒ අතරින් සංයුක්ත ලෙස සලකා බැලිය යුතු අදහස් 360ක් හඳුනා ගත හැකි විය.

ඒ හා සමාන ඔන්ලයින් ක්‍රමවලින් අදහස් ලබා ගන්නා වෙනත් අවස්ථාවල දී මෙන් ම මෙහි දී ද වැඩියෙන් අදහස් පළ කර තිබුණේ උගත් නාගරික වැඩිමහල්ලන් ය. රයික්ජවික් සරසවියේ නීති විද්‍යා පීඨයේ ආචාර්යවරියක වූ හෙල්ගා ඩොටිර්ගේ මතයට අනුව මේ සඳහා අන්තර්ජාලය ඔස්සේ අදහස් ලබා ගැනීමේ දී නිරීක්ෂණය වූ අන්දමට ඒ අවස්ථාව වැඩි වසයෙන් භාවිත කර ඇත්තේ තරුණ පරපුරට අයත් අයට වඩා දැනට මත් දේශපාලන වසයෙන් සැලකිය යුතු බලපෑමක් කළ හැකි මැදි වයසේ ස්වදේශික පිරිමින් බව ය. ඇය පවසන අන්දමට සෘජු ව පාර්ලිමේන්තුවට සිය අදහස් ඉදිරිපත් කළ අය අතර ඊට වඩා විවිධත්වයක් තිබුණි.

කෙසේ වෙතත් සාම්ප්‍රදායික ක්‍රමය අනුව ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳව තම අදහස් සෘජු ව ම පාර්ලිමේන්තුවට යොමු කළ

පුද්ගලයන් සහ සංවිධාන 53 ට වඩා ප්‍රමාණයෙන් විශාල සංඛ්‍යාවක් අන්තර්ජාලය ඔස්සේ තම අදහස් ඉදිරිපත් කිරීම සඳහා සහභාගී වී තිබුණි. අන්තර්ජාලය ඔස්සේ අදහස් හුවමාරු කර ගැනීම බොහෝ විට නියෝජන විවිධත්වය අතින් දුර්වල විය. එහෙත් පාක්ෂික ස්ථාවර මත පාර්ලිමේන්තු කතිකාවලට ඉදිරිපත් කරන ප්‍රතිවිරුද්ධ අදහස් අනුපූරණය කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාලය පාදක කරගත් කතිකා ඉතා වැදගත් වේ. මන්ද අන්තර්ජාලය නො වන්නට සාම්ප්‍රදායික ක්‍රම අනුව මැදිහත් වීම් කිරීමට බොහෝ අයට අවස්ථාව හෝ අවකාශය නො ලැබෙන බැවිනි. ඒ නිසා කතිකා සඳහා අන්තර්ජාලය ඔස්සේ *crowdsourcing* හෙවත් ජනමූලීය ව අදහස් ලබා ගැනීම සැලකිය යුත්තේ මහජන සහභාගිත්වය පිළිබඳ විකල්ප ක්‍රමවේදයකට වඩා එකිනෙකා අභිමුඛ ව කෙරෙන කතිකා හා සම්මන්ත්‍රණවලට අනුපූරකයක් ලෙස බව හෙලන් ලැන්ඩ්මොර් පෙන්වා දෙයි.

බොහෝ අවස්ථාවල දී ව්‍යවස්ථා සම්පාදනය ගැන කෙරෙන සාම්ප්‍රදායික පාර්ලිමේන්තු සාකච්ඡාවලට අනුව අවසාන කෙටුම්පත පවතින ව්‍යවස්ථාවට වඩා දියුණු එකක් වෙන්නේ දැයි කල් තබා කිව නො හැකි ය. එහෙත් ව්‍යවස්ථා සම්පාදන මණ්ඩල කතිකාවේ විවිධ අවස්ථාවල දී අන්තර්ජාලය ඔස්සේ ලැබුණු ප්‍රතිචාරය හා දායකත්වය අවසාන ව්‍යවස්ථා කෙටුම්පතේ ස්වභාවය කෙබඳු විය හැකි ද යන්න පිළිබඳ විශ්වාසදායක අවබෝධයක් මහජනතාව අතර ඇති කිරීමට සමත් වූ බව ඇතැම් විචාරකයෝ පෙන්වා දුන්හ.[72] හුදෙක් මේ හේතුව නිසා ම පමණක් වුවද අයිස්ලන්ත ව්‍යවස්ථා සම්පාදන ප්‍රයත්නය සඳහා යොදා ගත් නව ප්‍රජාතන්ත්‍රවාදී කතිකා ක්‍රම පිළිබඳ ඉහත කී අපූරු අත්හදා බැලීම් ගැන උද්දාමයට පත් විය හැක්කේ එමගින් ලබා ගත් ප්‍රතිඵල ගුණාත්මක වසයෙන් ඉහළ නම් පමණි. මහජන මතය අනුව සකස් කළ ව්‍යවස්ථාව හොඳ ව්‍යවස්ථාවක් ලෙස සැලකිය හැකි වී ද? එය හොඳ ව්‍යවස්ථාවක් නම් එසේ හොඳ වූයේ එහි හැම සම්පාදන පියවරකට ම මැදිහත් වීමට සාමාන්‍ය ජනතාවට ඉඩ ලැබුණු නිසා ද?

72 Hudson, Alexander. 2018. *"When Does Public Participation Make a Difference? Evidence from Iceland's Crowdsourced Constitution." Policy & Internet* 10(2): 185–217. doi:10.1002/poi3.167.

මෙසේ සම්පාදනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ වටිනාකම 2012දී පැවති ජනමත විචාරණයෙන් එයට තුනෙන් දෙකක මහජන කැමැත්ත ලැබීමෙන් තහවුරු වූ බව පෙනී යයි. එහෙත් එසේ ජනමත විචාරණයෙන් අනුමත වුව ද අයිස්ලන්ත පාර්ලිමේන්තුව එම ව්‍යවස්ථා කෙටුම්පත පසෙක තැබීමට තීරණය කිරීමෙන් එහි දුර්වලකම ද නිරූපණය වන බව පෙනී යයි.

ඒ පිළිබඳ දැනට ලියැවී ඇති ශාස්ත්‍රීය විචාරවලින් ව්‍යවස්ථා කෙටුම්පතක් හොඳ වන්නේ කුමන ප්‍රමිති නිසාදැ'යි නො කියවේ. එහෙත් ඇතැම් ව්‍යවස්ථා විශාරදයන්ගේ මතය අනුව නව ව්‍යවස්ථා කෙටුම්පත ආකෘතික වසයෙන් සංසක්ත *(coherence)* නො වීම හෙවත් නො ගැළපීම් ඇතිවීම එය සම්බන්ධ පළ වූ ප්‍රධාන විවේචනයකි. ජනමත විචාරණයෙන් සම්මත වූ ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව අයිස්ලන්ත පාර්ලිමේන්තුව විසින් උපදේශන ලබා ගත් ඇතැම් යුරෝපීය නීති විශේෂඥයන් ද ව්‍යවස්ථා කෙටුම්පතින් යෝජනා කර තිබෙන ආයතන සහ ව්‍යවස්ථා වගන්ති අතර නොගැළපීම් ඇති බව පෙන්වා දීම ද කෙටුම්පත සංසක්ත නො වීම පිළිබඳ අදහස ශක්තිමත් කළේ ය. මේ නො ගැළපීම් පිළිබඳ විශේෂඥ මතවාද අයිස්ලන්ත ජනමාධ්‍ය විසින් බෙහෙවින් උපුටා දක්වනු ලැබුවේ ය. එහෙත් ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ කතිකා අනුපූරණය කිරීමට අන්තර්ජාලය ඔස්සේ මහජන අදහස් ලබා ගැනීම පොදු සහභාගිත්වය වැඩි කරන හොඳ නවෝත්පාදනයක් ලෙස සැබැවින් ම අගය කළ යුතු බව ලැන්ඩ්මොර් පෙන්වා දෙයි.

ලැන්ඩ්මෝර්ගේ මතය අනුව කෙටුම්පතේ සංසක්ත භාවය පිළිබඳ විවේචනය ඒ තරම් වැදගත් දෙයක් නොවෙන්නේ එවැනි නො ගැළපීම් වැඩි අපහසුවකින් තොර ව විසඳා ගත හැකි බැවිනි. නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා ව්‍යවස්ථාදායක මණ්ඩලයට දී තිබුණේ සිව් මසක සීමා සහිත කාලයක් වීම ද මෙවැනි නො ගැළපීම්වලට හේතු විය හැකි බව ද ඇය පවසයි.

ආකෘතික නො ගැළපීම් පිළිබඳ කාරණයට වඩා කෙටුම්පතේ අන්තර්ගතය සම්බන්ධයෙන් ලැන්ඩ්මෝර්ගේ නිරීක්ෂණය වූයේ

මතභේදයට ඒ තරම් තුඩු නො දෙන ගුණාංග දෙකක් සම්බන්ධයෙන් යෝජිත කෙටුම්පත බෙහෙවින් හොඳ තත්වයක පැවතුණු බවයි. එම ගුණාංග දෙක ඇය හඳුන්වන්නේ "*rights-heaviness*" හෙවත් 'අයිතිවාසිකම්වලින් බර වීම' සහ "*democraticity*" හෙවත් 'ප්‍රජාතන්ත්‍රවාදීත්වය' යනුවෙනි. අයිතිවාසිකම්වලින් බර වීම යනුවෙන් ඇය අදහස් කළේ බලාපොරොත්තු විය යුතු පරිදි ම පුද්ගල අයිතීන් සුරැකීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාව කෙතරම් ඉදිරිගාමී වී තිබේ ද යන්නයි. 'බර වීම' *(heaviness)* යන්නෙන් අදහස් වුණේ කෙටුම්පතේ සඳහන් අයිතිවාසිකම් සංඛ්‍යාවෙන් මෙන් ම ගුණාත්මක බවින් ද කැපී පෙනීමයි. ව්‍යවස්ථාවක අයිතිවාසිකම් සඳහන් කිරීම එම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ ලැබේ ය යන්න පිළිබඳ සහතිකයක් නො වන නමුත් ඉතා විශද ව හා සුපැහැදිලි ව අයිතිවාසිකම් සඳහන් කර තිබීම ව්‍යවස්ථාවක ගුණාත්මක භාවය පිළිබඳ වැදගත් නිර්ණායකයකි. අභිමත අයිතිවාසිකම් ව්‍යවස්ථාවේ පැහැදිලි ව සඳහන් කර තිබීම ඒවා සාක්ෂාත් කර ගැනීම රජයේ වගකීම බව ව්‍යවස්ථාවෙන් ම නියම කිරීමකි. ප්‍රජාතන්ත්‍රවාදීත්වය යනුවෙන් ලැන්ඩ්මොර් අදහස් කළේ පටිපාටිමය වසයෙන් ව්‍යවස්ථාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකී ඇත් ද යන්න පමණක් නො ව ව්‍යවස්ථා සම්පාදනය ද කොතෙක් දුරට ප්‍රජාතන්ත්‍රවාදී ව සිදුවී ද යන්නයි. මෙකී නිර්ණායක දෙක ම අනුව අයිස්ලන්ත ව්‍යවස්ථා කෙටුම්පත සාර්ථක ව තිබූ බව ලැන්ඩ්මෝර්ගේ මතයයි.

ඒ හැර යෝජිත කෙටුම්පතේ සඳහන් වූ ඇතැම් නව අයිතිවාසිකම් එවකට තිබූ ව්‍යවස්ථාවේ හෝ ව්‍යවස්ථා විශාරදයන් විසින් පිළියෙළ කරන ලද ව්‍යවස්ථා සැලසුම්වල හෝ නො තිබූ ඒවා විය. එයට එක උදාහරණයක් නම් නව ව්‍යවස්ථා කෙටුම්පතට අනුව අන්තර්ජාලයට පිවිසීමේ අයිතිය මහජනතාවගේ ව්‍යවස්ථාපිත අයිතියක් වසයෙන් පිළිගත යුතු වීමයි. ඒ හැර ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් වින්දිතයින් ආරක්ෂා කිරීම ද ආණ්ඩුවේ ව්‍යවස්ථාපිත කාර්ය භාරයක් බව කෙටුම්පතෙහි සඳහන් ව තිබුණි. ළමා අයිතිවාසිකම් පිළිබඳ විස්තීර්ණ පරිච්ඡේදයක් සහ අයිතියක් ලෙස නිරාගමික වීම සහ ප්‍රශ්න

කිරීම ද ඇතුළු ව ආගමික නිදහස පෘථුල ලෙස අර්ථකතනය කිරීමේ හැකියාව ද කෙටුම්පතෙන් තහවුරු කර තිබුණි.

අයිස්ලන්ත ව්‍යවස්ථා කෙටුම්පත් ක්‍රියාවලිය බෙහෙවින් විනිවිද පෙනෙන සුලු සංවිචාරණීය එකක් වූ බැවින් බහුතර ජනතාව ව්‍යවස්ථා සම්පාදනය ගැන සැලකිය යුතු අවබෝධයක් ඇති කර ගෙන තිබුණි. අවසානයේ දී පාරිසරික සංරක්ෂණය සම්බන්ධයෙන් යෝජිත වගන්ති පිළිබඳ ව්‍යාපාරික ක්ෂේත්‍රයෙන් මතු වූ නො රිස්සීම ඇතුළු නොයෙකුත් හේතු මත පාර්ලිමේන්තුව විසින් පැත්තකට කර තැබුවත් යෝජිත ව්‍යවස්ථා කෙටුම්පත විවෘත ප්‍රජාතන්ත්‍රවාදයක ඇති ඵලදායකත්වය මැනවින් පිළිබිඹු කළේ ය.




විවෘත ප්‍රජාතන්ත්‍රවාදය - 2010-2013 අයිස්ලන්ත ව්‍යවස්ථා කෙටුම්පත් විධික්‍රමය

දහ අටවන සිය වසේ සිට ලිබරල් සමූහාණ්ඩුවාදීන් විසින් උත්කර්ෂණයට නංවන ලද නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් හඳුන්වා දුන් ඡන්දයෙන් තෝරා ගත් ප්‍රභූන් සහ ඔවුන්ගේ අන්තේවාසිකයන් මත විශ්වාසය තැබීමට වෙනස් ව විවෘත සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය නිසා සාමාන්‍ය ජනතාවට දැනුවත් ව

සහ ඵලදායක ව දේශපාලනයට මැදිහත් වීමට ඇති හැකියාව අයිස්ලන්තයේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රමවේදය තුළ බෙහෙවින් දක්නට ලැබුණි.

සැලකිය යුතු ධනයක් වියදම් කරමින් කිසියම් දේශපාලන පක්ෂයක නායකත්වයේ අභිමතය පරිදි ඉල්ලන ඡන්දයක දී නොයෙක් මුසාවාද ඇද බාමින්, ව්‍යාජ පොරොන්දු හා අල්ලස් ලබා දෙමින් නියෝජිතයෙක් වසයෙන් තෝරා පත් කරවා ගැනීමට ප්‍රයත්න දරනවාට වඩා ඒ කිසිදු අකටයුත්තක් නො කර හුදෙක් ඡන්ද දායක නාම ලේඛනයේ ලියා පදිංචි වී සිටීම නිසා ම නීති සම්පාදනයට සහභාගි වීම සඳහා අහඹු ලෙස තෝරා පත්වීමට හැම පුරවැසියෙකුට ම එක හා සමාන අවස්ථාවක් ලැබෙන, සැලකිය යුතු රට වැසියන් පිරිසක් වැදගත් යැයි සලකන පනත් කෙටුම්පතක් ප්‍රජාතන්ත්‍රවාදී සංවිචාරණීය සභා, ජනමාධ්‍ය හා අන්තර්ජාලය භාවිත කොට සාමූහික ව සාකච්ඡා කොට තීරණය කළ හැකි විවෘත ප්‍රජාතන්ත්‍රවාදයක් කෙතරම් යහපත් ද?.

# - 6 -

# මොංගෝලියානු අත්දැකීම සහ සංවිචාරණයේ කොන්දේසි

ඉහත පරිච්ඡේදයේ විස්තර කළ අයිස්ලන්තයේ අත්දැකීම විග්‍රහ කරමින් විවෘත ප්‍රජාතන්ත්‍රවාදයක් යනුවෙන් ප්‍රායෝගික වසයෙන් අදහස් වන්නේ කුමක් ද යන පැනයට පිළිතුරු දෙන හෙලන් ලැන්ඩ්මොර් ඒ සඳහා සුදුසු තනි ක්‍රමයක් නොමැති බව පවසයි. අයිස්ලන්ත ව්‍යවස්ථා සම්පාදනයේ දී අනුගමනය කළ ක්‍රමෝපාය තුළ වැදගත් නව ක්‍රමවේද තිබුණ ද එය ද මුළුමනින් සාර්ථක උදාහරණයක් යැයි කිව නො හැකි ය. එහෙත් ඕනෑම සන්දර්භයක් යටතේ වුවද විවෘත ප්‍රජාතන්ත්‍රවාදයක මුඛ්‍ය සාධකය වන්නේ "*open mini-public*" හෙවත් 'විවෘත මිනි-ජන සමූහ' බව ඇය පෙන්වා දෙයි.[73] *Mini-public* හෙවත් 'මිනි-ජන සමූහ' යන යෙදුම භාවිත වෙන්නේ කිසියම් ගැටලුවක් සංවිචාරණයට ලක් කිරීම සඳහා අහඹු ලෙස තෝරා ගත් සංඛ්‍යාවෙන් තරමක් කුඩා කණ්ඩායමකට සීමා වූ සාකච්ඡා සභාවලට යි. සිය විචාර බුද්ධිය මෙහෙයවා පොදු වැදගත්කමකින් යුතු විෂය කරුණක් පිළිබඳව සංවිචාරණය *(deliberation)* කොට තීරණය කිරීම පිණිස රැස් වන එවැනි මිනි ජන සමූහ කුසපත් ඇදීමෙන් හෝ ඒ සමාන අහඹු ක්‍රමයකින් තෝරා ගත්, සාමාන්‍යයෙන් එකිනෙකා හා නිතර ඇසුරු නො කරන, විවිධ පසුබිම් වලින් යුත් පුරවැසියන්ගෙන්

73 Landemore, Hélène (2020) *Open democracy: reinventing popular rule for the twenty-first century,* Princeton: Princeton University Press, p. 92

සමන්විත විය යුතු ය. මිනි ජන සමූහ සාකච්ඡාවල දී මතු වෙන කරුණු හා යෝජනා සම්බන්ධයෙන් අවශේෂ මහජනතාවට දුරස්ථ ව ප්‍රතිචාර දැක්වීමට ඉඩ ප්‍රස්තා සලසා තිබිය යුතු ය.[74]

'විවෘත මිනි ජන සමූහය' *(open mini-public)* යනුවෙන් ලැන්ඩ්මෝර් හඳුන්වන්නේ පොදු ජනයා විසින් පුරවැසි මුලපිරුම් *(citizens initiatives)* මඟින් ඉදිරිපත් කරන අදහස්වලට අනිවාර්යයෙන් ම විවෘත වූ ද අහඹු ලෙස *(random)* තෝරා ගත් සාමාජිකයන්ගෙන් සමන්විත වූ ද මහජන සභාවකි. එය බොහෝ දුරට අයිස්ලන්ත ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීමට ~~අහඹු ලෙස~~ තෝරා ගත් විසිපස් දෙනාගෙන් යුත් ව්‍යවස්ථා කෙටුම්පත් සභාවට සමාන ය. ඔස්ට්‍රියාවේ අනාගත කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ සිට එක්සත් රාජධානියේ වැඩිහිටි සුභසාධනය සඳහා මුදල් වෙන් කිරීම දක්වා විවිධ ප්‍රශ්න හා විසඳුම් සාකච්ඡා කිරීම පිණිස යුරෝපා රටවල් ගණනාවක පැවති සියයකට අධික එවැනි 'විවෘත මිනි ජන සමූහ' පිළිබඳ විස්තර *http://www.participedia.net* වෙබ් අඩවිය වාර්තා කරයි.[75]

'විවෘත මිනි ජන සමූහ' කතිකා ක්‍රමවේදය තුළ විශේෂ මහජන සාකච්ඡා සභා පැවැත්වීම සහ අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාශීලී ලෙස ජනමූලීය *(crowdsourcing)* අදහස් හා ප්‍රතිචාර ලබා ගැනීමට නිත්‍ය විධික්‍රමයක් තිබීම සුවිශේෂ අංගයකි. එම කතිකා ක්‍රමවේදයේ කූට ප්‍රාප්තිය වන්නේ මුඛ්‍ය කාරණය පිළිබඳ ජන මත විචාරණයකි. බොහෝ විට එය පවා ජනමූලීය ප්‍රතිචාර ලබාගත් ආකාරයට සමාන ව අන්තර්ජාල පහසුකම් ඔස්සේ ම ක්‍රියාත්මක කළ හැකි ය. ඒ අනුව 'විවෘත මිනි ජන සමූහයේ' කාර්යභාරය වන්නේ කාර්යක්ෂම ව කතිකාව පවත්වා ගෙන යන අතර ම ඒ සඳහා පෘථුල මහජන සහභාගිත්වයක් ලබා ගැනීම බව ලැන්ඩ්මෝර් පෙන්වා දෙයි. ඒ අතරම පුරවැසි මුලපිරුම්වල සිට ජනමත විචාරණයක් දක්වා යොදා ගත

74 Graham Smith and Maija Setälä (2018) Mini-Publics and Deliberative Democracy in The Oxford Handbook of Deliberative Democracy, Andre Bächtiger, et. al. (eds) Oxford: Oxfords University Press, Oxford P.

75 https://participedia.net/collection/7119?page=1 Retrieved on 12 Aug 2021

හැකි විධිවිධාන නිසා 'විවෘත මිනි ජන සමූහය' විසින් තීරණය කරණු ලබන න්‍යාය පත්‍රයට විශාල බලපෑමක් කිරීමට පොදු ජනතාවට හැකි වේ. ඒ හැර 'විවෘත මිනි ජන සමූහයට' අහඹු ලෙස තෝරා පත් වූ අය ඒ සඳහා ඇති වෙබ් අඩවිය, ෆේස්බුක් පිටුව හා ට්විටර් පණිවිඩ ක්‍රම භාවිත කරමින් සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ ව පොදු ජනතාව හා නිරන්තර සංවාදයක යෙදෙයි. අහඹු ක්‍රමය අනුව තෝරා පත් වන පුරවැසියන් සියල්ලන්ට ම ඒ හැකියාව තිබේ දැයි නො දන්නා බැවින් 'විවෘත මිනි ජන සමූහය' සඳහා පත් කළ පහසුකම් සපයන්නන්ට හා කාර්ය මණ්ඩලයට ඒ සඳහා සහාය විය හැකි ය. අවසානයේ දී ඉතා වැදගත් කරුණු සම්බන්ධයෙන් අන්තර්ජාලය ද උපයෝගී කර ගෙන සිදු කරන ජනමත විචාරණයකින් සමස්ත මහජනතාව සහ විවෘත මිනි ජන සමූහය අතර පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී සහ-සම්බන්ධතාව තහවුරු කළ හැකි ය.

මෙවැනි විවෘත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක ඇති වාසි තුන් ආකාරයකින් විස්තර කළ හැකි බව ලැන්ඩ්මොර් පෙන්වා දෙයි. ප්‍රථමයෙන් ම විවෘත ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනප්‍රිය පාලනය පිළිබඳ පරමාදර්ශය විශ්වසනීය ලෙස ස්ථාපිත කිරීමේ ප්‍රයත්නයකි. එමඟින් ඉටු කෙරෙන්නේ මහජන අධිකාරය තහවුරු කිරීම පිණිස හැකි තාක් දුරට පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය තහවුරු කිරීම යි. මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ ඇතැම් සාම්ප්‍රදායික ලක්ෂණ එය තුළ තිබිය හැකි වුව ද රාජ්‍ය සම්බන්ධයෙන් රටවැසියන්ගේ භූමිකාව වඩා සක්‍රිය හා සඵලදායී එකක් බවට පත් කිරීම අතින් එය සාම්ප්‍රදායික නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය අබිබවා යයි. ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා මාර්ගෝපදේශ ලබා දීමේ දී මැතිවරණයෙන් මහජනතාවගේ කැමැත්ත ගැනීමෙන් පසු ඔවුන් ඈත් කොට තබනවාට වඩා විවෘත ප්‍රජාතන්ත්‍රවාදයෙන් කෙරෙන්නේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නොකඩවා සන්නිරීක්ෂණය කරමින් එයට මැදිහත් වීමට මහජනතාව සබල ගැන්වීමයි.

දෙවනුව, විවෘත ප්‍රජාතන්ත්‍රවාදය යනු වඩා පුළුල් පුරවැසි සහභාගිත්වයක් සලසන ක්‍රමයක් බැවින් එය ප්‍රජාතන්ත්‍රවාදී

තර්ක බුද්ධියට හෙවත් සාමූහික ප්‍රඥාවට *(collective wisdom)* වැඩි ඉඩක් සලසන ක්‍රමයකි. වෙනත් අන්දමකින් පැවසුවොත් විවෘත ප්‍රජාතන්ත්‍රවාදය යනු හුදෙක් අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයක් පමණක් නො ව එහි ඇති විවෘත ස්වභාවය නිසාම රටවැසියන්ගේ සුභසාධනය, සෞඛ්‍ය සහ සන්තුෂ්ටිය වැනි පොදු යහපත පිළිබඳ කරුණු ගැන දැඩි අවධානයකින් යුතු ව වඩාත් හොඳින් ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයකි.

තෙවනුව, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා විවෘත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාවරය, කල් පවතින සුලු ය. ඊට හේතුව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මෙන් නොව විවෘත ප්‍රජාතන්ත්‍රවාදය කිසියම් කතිපයාධිපත්‍යයක ග්‍රහණයට හසු වීමට ඇති ඉඩ කඩ අඩු වීමයි. නොයෙක් ආකාරයේ ඒකාධිපති ප්‍රවණතාවලට එරෙහි ව ප්‍රජාතන්ත්‍රවාදී සුජාතභාවය භාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට වඩා වැඩි ශක්‍යතාවක් ඇත්තේ විවෘත සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදයටයි.

ලැන්ඩ්මොර් පෙන්වා දෙන අන්දමට විවෘත ප්‍රජාතන්ත්‍රවාදය මැතිවරණ මාදිලියක් සහිතව ද පවත්වා ගෙන යා හැකි ය. උදාහරණයක් ලෙස අයිස්ලන්තයේ විසිපස් දෙනෙකුගෙන් සමන්විත ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තෝරා පත්කර ගන්නා ලද්දේ ආධුනික දේශපාලනඥයින්ට පමණක් තරග කළ හැකි මැතිවරණයකිනි. මැතිවරණවලින් තොර කුසපත් ඇදීම වැනි ක්‍රමවලින් නියෝජන ක්‍රමයේ ඇති අඩුපාඩු ඌණ පූරණය වන්නේ නම් සහ ව්‍යවස්ථා හා නීති සම්පාදනයේ දී නිරන්තර මහජන මැදිහත් වීම් සඳහා ව්‍යවස්ථාපිත ක්‍රමවේද සලසා තිබේ නම් විවෘත ප්‍රජාතන්ත්‍රවාදය තුළ පක්ෂ ක්‍රමය මුළුමනින් ම අහෝසි වෙතැ'යි බිය විය යුතු නැති බව ලැන්ඩ්මොර් පවසයි. එහෙත් මැතිවරණ වියදම් නියාමනය, පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විධිවිධාන, අපේක්ෂකයන්ගේ අසද්භාවය සහ මැතිවරණ දූෂණ පිටු දැකීමේ අව්‍යාජ විධිවිධාන සහ විද්‍යුත් මාධ්‍යයේ අපක්ෂපාතීත්වය වැනි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන කොන්දේසි නොමැති ව පවත්වා ගෙන යන පාලන ක්‍රමයක දේශපාලන පක්ෂයක්

යනු හුදෙක් බලය අල්ලා ගැනීමේ දේශපාලනය සඳහා අතළොස්සක් විසින් යොදා ගන්නා කෙමණකට වැඩි දෙයක් නො වේ.

විවෘත ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට හැකි බව කලින් පරිච්ඡේදයේ විස්තර කළ අයිස්ලන්ත අත්හදා බැලීම තහවුරු කළේ ය. ප්‍රජාතන්ත්‍රවාදය විවෘත කිරීම සඳහා විධිමත් සංවිචාරණය යොදා ගත් තවත් වැදගත් මෑත කාලීන අත්දැකීමක් ආසියානු රටක වැසියන් වන මොංගෝලියන්වරුන්ට ද තිබේ. එහි දී සංවිචාරණ ඡන්ද විමසුම *(deliberative poll)* නමැති ක්‍රමය හඳුන්වා ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් විවෘත කළ අන්දම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මහාචාර්ය ජේම්ස් ෆිෂ්කින් විසින් පළ කර තිබේ.[76] ඒ අනුව මොංගෝලියානු අත්දැකීම අදියර දෙකකින් යුක්ත ය. ඉන් පළමුවැන්න ක්‍රියාත්මක වුණේ 2015 දී ය. එහි මූලික අරමුණ උලන්බටාර් අගනුවර සම්බන්ධයෙන් යෝජනා කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 14ක වැදගත්කම සහ ප්‍රමුඛත්වය මහජන මතය අනුව තීරණය කිරීමයි. ඒ සඳහා නගරවැසියන්ගේ විවිධ ස්තර නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරා ගත් නිවාස 1502 ක නියැදියකින් පුරවැසියන් 400 දෙනෙක් අහඹු ලෙස තෝරා ගනු ලැබූහ. අහඹු නියැදියට *(random sample)* තේරුණු නිවාස සියල්ලට ම ව්‍යාපෘති 14 පිළිබඳ ප්‍රමුඛත්වය ප්‍රකාශ කළ හැකි ප්‍රශ්නාවලියක් සංවිචාරණයට පෙර පැවති ආධාරක සමීක්ෂණයේ දී ලබා දී තිබුණි. සංවර්ධන ව්‍යාපෘති 14 හි ප්‍රමුඛත්වය පිළිබඳ ඒ වන විට නගරවාසීන් අතර තිබූ මතය ගැන කිසියම් අවබෝධයක් ඒ අනුව ඇති කර ගත හැකි විය. එම ව්‍යාපෘති සියල්ල ම ණය ලබා ගැනීමෙන් ක්‍රියාත්මක කළ යුතු ඒවා විය. එම කාරණය ද සලකමින් ව්‍යාපෘතිවල වැදගත්කම අනුපිළිවෙළින් තේරීම සංවිචාරණීය ඡන්ද දායකයන් ලෙස අහම්බයෙන් තෝරා ගත් පුරවැසියන්ගෙන් බලාපොරොත්තු වූ කටයුත්ත විය. එසේ අහඹු ක්‍රමයට තේරී පත් වූ සංවිචාරණ ඡන්ද

76 Fishkin, James S. and Siu, Alice (2021) *Mongolia: Piloting Elements of a Deliberative System; Deliberative Democracy in Asia,* Baogang He et.al (eds.) New York: Routledge, pp. 191-204

හිමියන් 400 දෙනාට ම ඇරයුම් පත් සමඟ සාකච්ඡාවට ලක් වන ව්‍යාපෘති 14 පිළිබඳ අවශ්‍ය තොරතුරු අඩංගු ගොනුවක් යවා තිබුණි. සංවිචාරණ කතිකාව සඳහා අවම වසයෙන් ඉන් 300 දෙනෙකු පමණ පැමිණෙතැ'යි බලාපොරොත්තු විය. එහෙත් අවසානයේ කතිකාව සඳහා 317 දෙනෙකු ම පැමිණ තිබුණි.

ඒ අනුව ඔවුන් සියලු දෙනා ම කුසපත් ඇදීමෙන් එකකට පහළොස් දෙනෙකු පමණ වන කණ්ඩායම්වලට තෝරා වෙන් කොට ව්‍යාපෘති පිළිබඳ ව සංවිචාරණ කතිකාව කර ගෙන යෑම සඳහා ඉඩ සලසනු ලැබීය. එක් එක් ව්‍යාපෘතිය පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු මොඩරේටර්වරුන් හෙවත් මැදහත්කරුවන් විසින් සපයන ලද අතර නිශ්චිත න්‍යාය පත්‍රයකට අනුව හැම ව්‍යාපෘතියක් ගැන ම සංවිචාරණ සාකච්ඡා සැසි පැවැත්විණි. මොඩරේටර්වරුන් පුහුණු කර තිබුණේ සිය පුද්ගලික මතය ප්‍රකාශ කිරීමෙන් වැළකීම හා සහභාගි වන්නන්ගේ තේරීම්වලට බලපාන අන්දමින් මැදිහත් නො වී ම ඔවුන්ගේ භූමිකාවේ ප්‍රධාන කාර්යයක් ය යන අවබෝධය ද ලබා දෙමිනි. ඔවුන්ගේ කාර්ය වූයේ සියල්ලන්ගේ ම සහභාගිත්වය උත්තේජනය කරමින් හැම යෝජනාවක ම හොඳ සහ නරක සාකච්ඡාවට ලක් කිරීම සහ සහභාගි වන්නන් අතර අන්‍යෝන්‍ය ගෞරවය තහවුරු වන ලෙස ක්‍රියා කිරීමයි. එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැවතුණු කණ්ඩායම් සාකච්ඡා සැසි අවසන් වූයේ ප්‍රධාන සැසි වාරවලට පැමිණීමට නියමිත විශේෂඥයින්ගෙන් විමසිය යුතු කරුණු සහ ප්‍රශ්න මොනවාද යන්න තීරණය කර ගැනීමෙනි. මේ අන්දමින් ව්‍යාපෘති 14 ම සාකච්ඡා වෙන තෙක් දෙ දිනක් තිස්සේ මාරුවෙන් මාරුවට කණ්ඩායම් සාකච්ඡා සැසි සහ ප්‍රධාන සාකච්ඡා සැසි පැවැත්විණි. අවසාන දිනයේ දී සියල්ලෝ ම පළමුවෙන් ම පැවැත්වුණු ආධාරක සමීක්ෂණයේ දී බෙදා දුන් ප්‍රශ්නාවලිය නැවත විමර්ශනයට ලක් කරමින් ව්‍යාපෘති ප්‍රමුඛත්වය තීරණය කළෝ ය.

ඒ අනුව පුරවැසියන් විසින් සංවිචාරණ ඡන්ද ක්‍රමයෙන් තීරණය කළ ව්‍යාපෘති ප්‍රමුඛත්වය අනුව නගරසභාව විසින් නව ක්‍රියාන්විත

සැලැස්මක් සකස් කළේ ය. එම සැලැස්ම 2016 යෝජනා අංක 174 යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අතර ඒ අනුව කටයුතු ඉටු කිරීමට නගරවැසියන් සහ සියලු ම රාජ්‍ය ආයතන බැඳී සිටී. ප්‍රමුඛතම ව්‍යාපෘතිය ලෙස තෝරා ගන්නා ලද නගරයේ පාසල්වල පංති කාමර උණුසුම් කිරීම ඇතුළු ප්‍රමුඛ ව්‍යාපෘති ගණනාවක් ම කල් නො යවා ම දියත් කෙරිණි.

අගනුවර ව්‍යාපෘති 14 පිළිබඳ ප්‍රමුඛත්වය තීරණය කිරීමට පැවැත්වූ සංවිචාරණ ඡන්දයේ සාර්ථකත්වය දුටු මොන්ගෝලියානු පාර්ලිමේන්තුව සංවිචාරණ ඡන්ද ක්‍රමය ව්‍යවස්ථාපිත කිරීම පිණිස "*Law on Deliberative Polling*" හෙවත් 'සංවිචාරණ ඡන්දය පිළිබඳ නීතිය' යනුවෙන් විශේෂ නීතියක් 2017 පෙබරවාරියේ දී සම්මත කළේ ය. මෙම නීතිය මඟින් පක්ෂග්‍රාහිත්වයකින් තොර ව සහ වෘත්තීය ප්‍රමිති අනුව සංවිචාරණ ඡන්ද විමසුමක් පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන විස්තර කර තිබුණි. සංවිචාරණ ඡන්ද විමසුම පිළියෙළ කිරීම සහ ඊට විෂය වන කරුණු නිරවුල් ව ඉදිරිපත් කිරීම සඳහා උපදේශන මණ්ඩලයක් පත් කිරීම, එහි කාර්ය සහ බලතල, නියැදි සැකසීම, අහඹු තෝරා ගැනීම  සහ ආධාරක සමීක්ෂණ සඳහා වෘත්තීය සමීක්ෂණ ආයතනයක් යොදාගැනීම, නියැදියේ ප්‍රමාණය සහ සංවිචාරණ ඡන්ද විමසුම සඳහා සහභාගි විය යුතු අවම සංඛ්‍යාව ආදී කරුණු එම නීතිය මඟින් නිර්ණය කර තිබුණි. ප්‍රාදේශීය, පළාත් බද හා ජාතික මට්ටමේ ව්‍යාපෘති සම්බන්ධයෙන් සංවිචාරණ ඡන්ද පැවැත්වීමේ නිර්ණායක වෙන් වෙන් ව නීතිය මඟින් විස්තර විය. සංවිචාරණ ඡන්ද ක්‍රමය පිළිබඳ නීතිය යටතේ පැනවූ එක් විශේෂ විධිවිධානයක් වූයේ පාර්ලිමේන්තුව මඟින් මොන්ගෝලියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය පිළිබඳ යෝජනා සාකච්ඡා කිරීමට පෙර එම යෝජනා ජාතික සංවිචාරණ ඡන්දයකින් අනුමත වී තිබිය යුතු බව නියම වීමයි.

ඒ අනුව ඉදිරිපත් වූ ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යෝජනා 2017 අප්‍රියෙල්වල පැවැත්වුණු සංවිචාරණ ඡන්දයක දී විමසුමට ලක් විය. සංවිචාරණ ඡන්දයට පෙර සූදානමක් ලෙස

සලකා බැලිය යුතු විවිධ ව්‍යවස්ථා සංශෝධන රට පුරා පැවති විවිධ රැස්වීම්වල ඒ වන විට සාකච්ඡාවට ලක් වෙමින් තිබුණි. මහජනතාව විසින් කරන ලද එකී මැදිහත්වීම් සලකමින් සංවිචාරණ ඡන්ද උපදේශන කමිටුව අදාළ යෝජනා සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයක් සකස් කොට ප්‍රසිද්ධ කළේ ය. එයට අනුව සමීක්ෂණ කණ්ඩායම විසින් මූලික ආධාරක සමීක්ෂණය සඳහා ප්‍රශ්නාවලියක් සහ සංවිචාරණය සඳහා අවශ්‍ය තොරතුරු පත්‍රිකා සකස් කරන ලදී.

සංවිචාරණ ඡන්දදායකයන්ගේ නියැදිය සැකසීම සිදු කරන ලද්දේ ජාතික සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසිනි. ඒ සඳහා රටේ නොයෙක් ප්‍රදේශවලින් විවිධ සමාජ මට්ටම් නියෝජනය වන ලෙස කුසපත් ඇදීමේ ක්‍රමයට අහඹු ලෙස කුටුම්බ 1568ක් තෝරා ගන්නා ලදී. තෝරාගත් හැම නිවසකට ම ගිය සමීක්ෂකයෝ මූලික ප්‍රශ්නාවලිය මත ගෘහමූලිකයා හෝ සංවිචාරණයට සහභාගි වීමට පවුලේ අය විසින් තෝරා ගත් සාමාජිකයා ආධාරක සමීක්ෂණයට සහභාගි කර ගත්තේ ය. සමීක්ෂකයන් ඇත්ත වසයෙන් ම එකී නිවාසවලට යන්නේ දැ'යි නිරීක්ෂණය කිරීම පිණිස *GPS* හෙවත් ගෝලීය තැන් සෙවුම් පද්ධති තාක්ෂණය යොදා ගැනිණි. තෝරා ගත් නිවාස 1568 අතරෙන් 1554ක් ආධාරක සමීක්ෂණය සම්පූර්ණ කළ අතර ඉන් සංවිචාරණයට සහභාගි වීමට කැමැත්ත පළ කළ නිවාසවලින් අහඹු ලෙස තෝරා ගත් නිවාස 785කට සංවිචාරණ ඡන්ද විමසීමට සහභාගි වීමේ ආරාධනා පත්‍ර යවන ලදී. අනතුරු ව පැවති සංවිචාරණ සැසි වාර උලන්බටාර් නගර ව්‍යාපෘති සම්බන්ධයෙන් පැවති සංවිචාරණ වැඩපිළිවෙළට බෙහෙවින් සමාන විය. සංවිචාරණයට ලක් වූ ව්‍යවස්ථා සංශෝධන යෝජනා හය සම්බන්ධ ව විවිධ මානවලින් විමසන ප්‍රශ්නාවලියක් සංවිචාරණ කණ්ඩායම් කතිකාවල දී පිළියෙළ කරන ලදු ව අනතුරු ව ඒවා පදනම් කොට ප්‍රධාන සාකච්ඡා සැසි පැවැත්විණි. සියලු සංවිචාරණ සාකච්ඡා අවසානයේ යෝජනා හය ප්‍රමුඛත්වය අනුව ලැයිස්තු ගත කළ විට යෝජනා දෙකක් සම්බන්ධයෙන් හැර ඉතිරි ප්‍රතිඵලය බොහෝ දුරට මුලින් ම කළ ආධාරක සමීක්ෂණයේ ප්‍රතිඵල හා සමාන බව පෙනී ගියේ ය.

ආධාරක සමීක්ෂණයේ දී 61% ක් කැමති වූ පාර්ලිමේන්තුවේ කටයුතු සන්නිරීක්ෂණය කිරීම සඳහා දෙවැනි මන්ත්‍රණ සභාවක් පිහිටුවීමේ යෝජනාව සංවිචාරණ සාකච්ඡා වටවලින් පසුව 30% දක්වා අඩු වීම සංවිචාරණ ඡන්දයේ දී ඇති වූ කැපී පෙනෙන වෙනසක් විය. සංවිචාරණ ඡන්දයෙන් 50% ට වැඩි කැමැත්තක් ලබා ගැනීමට නො හැකි වූ නිසා එය පාර්ලිමේන්තු සාකච්ඡාව සඳහා අනුමත නො විණි. ඒ පිළිබඳ තිබූ ප්‍රධාන විවේචනය වූයේ යෝජිත දෙවැනි මන්ත්‍රණ සභාවේ නියෝජනය ද පක්ෂ ක්‍රමය අනුව සිදුවන්නක් බැවින් පාර්ලිමේන්තුවට වෙනස් ආකාරයක සේවයක් ඉන් ඉටු නො වන බවයි. දෙවැනි මන්ත්‍රණ සභාව කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු බවට යෝජනාවක් තිබුණේ නම් සමහර විට ඒ තීරණය වෙනස් වන්නට ඉඩ තිබුණි. අඩු සංවිචාරණ ඡන්දයක් ලැබීමෙන් ප්‍රතික්ෂේප වූ අනෙක් යෝජනාව වූයේ ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර හයක් වූ එක් වතාවකට සීමා කිරීම සහ සෘජු ඡන්දයකින් ජනාධිපති තෝරා පත් කිරීම වෙනුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු මහජන නියෝජිතයන් මගින් ජනාධිපති තෝරා ගැනීමයි. ආධාරක සමීක්ෂණයේ දී ඒ සඳහා 61.5% ක් කැමැත්ත පළ කර තිබූ නමුත් සංවිචාරණ ඡන්ද විමසීමේ දී එය 41% දක්වා අඩු විය. ආධාරක සමීක්ෂණයේ දී 57% ක් කැමති වූ කැබිනට් මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම හා ඉවත් කිරීම අගමැතිවරයාට පැවරිය යුතු ය යන යෝජනාවට සංවිචාරණ ඡන්දයේ දී 73% ක මනාපයක් ලැබීම අනික් කැපී පෙනෙන වෙනසයි.

සංවිචාරණ ඡන්දයේ ප්‍රතිඵල පාර්ලිමේන්තුවේ දී උණුසුම් සාකච්ඡාවකට ලක් විය. වඩාත් කැපී පෙනෙන කාරණය වූයේ ආණ්ඩු කරන දේශපාලන පක්ෂය ප්‍රබල ලෙස අනුමැතිය දැක්වූ ජනාධිපතිවරයා තේරීමේ ක්‍රමය වෙනස් කිරීමේ යෝජනාව සහ ප්‍රධාන විරුද්ධ පක්ෂය අනුග්‍රහය දැක්වූ ද්විමණ්ත්‍රණ සභාව යන යෝජනා දෙක ම සංවිචාරණ ඡන්දයෙන් ප්‍රතික්ෂේප වී තිබීමයි. මේ නිසා සංවිචාරණ ඡන්ද ක්‍රමය පිළිබඳ දේශපාලන පක්ෂ අකැමැත්තක් දැක්වූවත් අවසානයේ දී පාර්ලිමේන්තුව සංවිචාරණ ඡන්දයෙන් 50%

කට වැඩි අනුමැතියක් ලබාගෙන තිබූ යෝජනා අනුව අවශ්‍ය වූ පරිදි 2/3 වැඩි ඡන්දයකින් ව්‍යවස්ථාව සංශෝධනය කළේ ය.

මොන්ගෝලීය සංවිචාරණ ක්‍රමයේ මූලික පියවරවල් මෙසේ අනුපිළිවෙළින් පෙළ ගැස්විය හැකි ය

1. අදාළ මහජන න්‍යාය පත්‍රයට අඩංගු කළ යුතු යෝජනා සහ විකල්ප සාකච්ඡා කිරීම පිණිස රට පුරා පැවති පුරවැසි රැස්වීම් මාලාව.
2. උපදේශන මණ්ඩලයේ සාකච්ඡා - ආධාරක සමීක්ෂණය සඳහා යෝජනා හා ප්‍රශ්නාවලිය.
3. අභ්‍යු සංවිචාරණ සභාවේ සාකච්ඡාව සහ තීරණය.
4. නො සලකා හැරිය යුතු යෝජනා සනිටුහන් කරමින් අවශ්‍ය නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
5. තුනෙන් දෙකක වැඩි ඡන්දය ලැබේ නම් යෝජිත නිර්දේශ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීම.

මේ අත්දැකීම විස්තර කරමින් මොන්ගෝලියානු පාර්ලිමේන්තුවේ කථානායක සන්දන්ෂතාර් ඔහුගේ පුද්ගලික නිරීක්ෂණ මෙසේ පළ කළේ යඃ

> "සංවිචාරණයේ දී රටවැසියන් අතර හුවමාරු වූ අදහස් උදහස් ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාවලියේ දී ඉතා වැදගත් විය. පුරවැසි සහභාගිත්වය සහ පුරවැසියන්ට කන්දීම සංශෝධන ක්‍රියාවලියේ දී කේන්ද්‍රිය කරුණක් වූ අතර අපි ඒ සඳහා පුළුල් උපදේශන යන්ත්‍රණයක් යොදා ගත්තෙමු. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රට පුරා යමින් පුරවැසි රැස්වීම්වලට සහභාගි වෙමින් විවිධ අදහස්වලට කන්දෙමින් වැසියන් සමග සාකච්ඡා කළහ. එහි දී අපට දහස් ගණන් අදහස් සහ යෝජනා එකතු කර ගැනීමට හැකි විය. මෙතෙක් යොදා ගත් අනෙකුත් සියලු ම උපදේශන ක්‍රම හා සසඳන විට සංවිචාරණ ඡන්ද ක්‍රමය නිසා වඩාත් දැනුවත් සහ ප්‍රවේසමෙන් සලකා බලන ලද අදහස් සහ විශාල දත්ත ප්‍රමාණයක් අපට ලබාගත හැකි විය. ඒවා සංඛ්‍යාවෙන් මෙන් ම ගුණාත්මක බවින් ද ඉහළ මට්ටමක තිබුණි. ව්‍යවස්ථා සංශෝධන සාකච්ඡාවේ දී අපට ඒවා බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ඒ අනුව

**විශේෂඥයන්ගේ ද සහාය ඇති ව සංශෝධන තවදුරටත් විශුද්ධ කිරීමට අපට හැකි විය. එහෙත් සංවිචාරණ ඡන්ද ක්‍රමය මඟින් තහවුරු කළ මූලධර්මය සමස්ත ක්‍රියාවලිය තුළ ම නිරූපණය කළ බව අවසාන ප්‍රතිඵලයෙන් මනාව පෙනී යයි.”[77]**

දැන් පාර්ලිමේන්තු කටයුතු සඳහා පමණක් නො ව පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ද ආදේශ වන නීතියක් බවට පත් ව ඇති මොන්ගෝලියාවේ මේ අත්දැකීම විධිමත් සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම මඟින් වඩා අන්තර්ග්‍රහණීය හෙවත් සියල්ලන් අතුළත් වෙන සාමූහික තීරණ ගැණීමේ හැකියාව තහවුරු කරයි. එමඟින් දේශපාලන තීරණ ගැනීමේ දිශානතිය දමනය කිරීම මහජනතාව අතට පත් කරයි. ඒ අනුව මහජනයාගේ සංවිචාරණ ඡන්දයකින් අනුමත නො කරන කිසිදු තීරණාත්මක යෝජනාවක් පාර්ලිමේන්තුවට සම්මත කළ නො හැකි ය. මේ ක්‍රියාවලිය තුළ සංවිචාරණයට යොමු කරන සියලු යෝජනා සම්බන්ධයෙන් පුළුල් සමාජ සාකච්ඡාවක් ඇති වෙන අතර යෝජනාවලට පක්ෂ විපක්ෂ සියලු පාර්ශවවලට තම මතය සමානාත්මතාව මත අහඹු ලෙස තෝරා පත් කෙරෙන සංවිචාරකයන්ට ඉදිරිපත් කළ හැකි ය.

මොංගෝලියාවේ මේ අත්දැකීම පිළිබඳ විවරණයක යෙදෙන මහාචාර්ය ජේම්ස් ෆිෂ්කින් මහජනයා විසින් විචාරශීලී සංවිචාරණය මඟින් අන්ධුකරණය දමනය *(popular control)* කර ගැනීමට අවශ්‍ය වන මූලික සාධක කිහිපයක් හඳුන්වා දෙයි.[78] ඉන් පළමුවැන්න අන්තර්ග්‍රහනීය බව *(inclusiveness)* හෙවත් සංවිචාරණයට එක්වීමට සියල්ලන්ට ම සමාන අවස්ථා ලැබෙන ක්‍රමවේදයක් තිබිය යුතු වීමයි. ඒ අනුව අහඹු ලෙස කරන තේරීමක දී සමාජයේ ඕනෑ ම කෙනෙකුට ඔහුගේ හෝ ඇයගේ වත් පොහොසත්කම්, ස්ත්‍රී පුරුෂ භාවය හා අනෙකුත් සමාජ විෂමතා නො සලකා තීන්දු ගන්නා ඡන්දදායකයෙකු

77 Letter from Chairman Great Hural (Speaker of the Parliament) available at https://cdd.sta nford.edu/mm/2020/02/mongolia-letter.pdf.

78 Fishkin, James S. and Siu, Alice (2021) *Mongolia: Piloting Elements of a Deliberative System; Deliberative Democracy in Asia,* Baogang He et.al (eds.) New York: Routledge, p. 191

ලෙස සංවිචාරණයට තෝරා පත් වීමට ඉඩ ලැබේ. අවධාරණය කරන ඊ ළඟ වැදගත් සාධකය වන්නේ එකිනෙකට වෙනස් තෝරා ගැනීම් *(choice)* කිරීමට හැකි වීමයි. එනම් සංවිචාරණයේ දී අදාළ කාරණය ගැන තෝරා ගැනීමට ඇති අනෙකුත් විකල්ප එකිනෙකට සැලකිය යුතු ලෙස වෙනස් වූ සහ යථාර්ථවාදී වූ ඒවා වීමයි. තෙවැන්න මනා ලෙස දැනුවත් කළ සංවිචාරණයයි *(informed deliberation)*. ඉන් අදහස් වන්නේ ඉදිරිපත් ඇති යෝජනා සහ විකල්පවලට පක්ෂ ව හා විපක්ෂ ව ඇති කරුණු කාරණා හොඳින් විමසා බලා කල්පනා කිරීමට මහජනයා පොලඹවන සියලු වැදගත් දත්ත සහ තොරතුරු පුළුල් ලෙස සමාජ ගත කිරීමයි. අනෙක් වැදගත් සාධකය ලෙස ෆිෂ්කින් සඳහන් කරන්නේ සංවිචාරණයේ නිර්දේශිත ප්‍රතිඵල ප්‍රායෝගික වසයෙන් ක්‍රියාත්මක වීමයි *(impact)*. එනම් සංවිචාරණය මඟින් තීන්දු වූ තෝරා ගැනීම් ආණ්ඩුකරණය සම්බන්ධ තීරණ වසයෙන් කල් නො යවා නිශ්චිත ව ක්‍රියාවට නැංවීමයි.

අයිස්ලන්තීය සහ මොන්ගෝලියානු උදාහරණවලින් පෙන්නුම් කළ සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ න්‍යායික මට්ටමේ අදහස් කලක් තිස්සේ ම සාකච්ඡාවට ලක් ව තිබුණු ඒවා ය. ජේම්ස් බොමන් සහ විලියම් රෙග් විසින් සංස්කරණය කොට 1997දී පළ කළ *Deliberative Democracy: Essays on Reason and Politics* නමැති ලිපි සංග්‍රහයේ ඒ පිළිබඳ ජෝන් රොව්ල්ස් සහ ජෝසුවා කොහෙන් වැනි ප්‍රකට දේශපාලන විද්‍යාඥයන් ඉදිරිපත් කළ මතවාද සහ නිර්දේශ සංගෘහීත කර තිබේ. අනෙකුත් බොහෝ දේශපාලන න්‍යායවල දී මෙන් ම එකී නිර්දේශ දේශපාලන භාවිතයේ දී පරමාදර්ශ ලෙස සලකා යොදා ගත හැකි ඒවා ය.

දේශපාලන සංවිචාරණයේ දී අන් හැම දෙයකට ම වඩා මුඛ්‍ය කාරණය වන්නේ සහභාගි වන්නන් හෙවත් සංවිචාරකයන් අතර ඇති එක සමානාත්මතාව පිළිබඳ හැඟීම සංවිචාරණය සම්බන්ධයෙන් වැදගත් පූර්ව කොන්දේසියක් වීමයි. කුසපත් ඇදීමේ ක්‍රමය මඟින් එක සමාන ව තෝරා ගත් නිසා තීරණ ගැනීමට බලය ඇති කිසිදු

සහභාගි වන්නෙකුට අන් අය අබිබවා ගිය හැකි විශේෂ තත්වයක් හිමි නො වේ. ඒ නිසා නියම සංවිචාරණයක යෙදෙන කොටස්කරුවන් විධිමත් ව මෙන් ම හරායාත්මක ව ද සමානයෝ ය.

ඔවුන් විධිමත් ලෙස සමානයන් වන්නේ සංවිචාරණය සඳහා උපයෝගී කර ගන්නා කිසිදු නීතියක් හෝ රෙගුලාසියක් හෝ මඟින් කිසියම් පුද්ගලයෙකුට විශේෂ වරප්‍රසාදයක් සැලකිල්ලක් නො ලැබෙන බැවිනි. සංවිචාරණීය විධි ක්‍රමය තුළ හැම අදියරක දී ම සංවිචාරණීය හැකියා ඇති හැම කෙනෙකුට ම සම අවස්ථා ලැබේ. ඒ අනුව න්‍යාය පත්‍රයට කරුණු ඇතුළත් කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම සහ යෝජනා යුක්ති යුක්ත කිරීම හෝ විවේචනය කිරීම හැම සංවිචාරකයෙකුට ම කළ හැකි විය යුතු ය. එමෙන් ම තීරණ ගැනීමේ දී හැම කෙනෙකුට ම එක සමාන හඬක් තිබිය යුතු ය.

සහභාගි වන්නන් හෙවත් සංවිචාරකයන් හරායාත්මක වසයෙන් සමාන යැ'යි යන්නෙන් කියවෙන්නේ කිසිදු සංවිචාරකයෙකුගේ වත්කම් හා බලගතු බව සංවිචාරණයේ දී ඔහු හෝ ඇය හෝ ලබා දෙන දායකත්වයේ ස්වභාවය තීරණය වීමට හේතු නො විය යුතු බවයි. එමෙන් ම එවැනි විශේෂ සමාජ තත්වයක් සංවිචාරණයේ දී කිසිදු අධිකාරි භූමිකාවක් ඉටු නො කළ යුතු ය. සමානයන් අතර නිදහස් සංවිචාරණයක් සඳහා රාමුවක් ඇති කිරීම ගැන හැරෙන විට කිසිදු සංවිචාරකයෙකු පවතින ක්‍රමය තුළ ඇති අනෙකුත් අයිතිවාසිකම් හා රෙගුලාසිවලින් බැඳී නැත. ඒ වෙනුවට ඔවුහු පවතින ක්‍රමය ද සිය සංවිචාරණීය විනිශ්චයේ එක් ආරම්මණයක් *(object)* ලෙස සලකති.

හැම නියම සංවිචාරණයක් ම අවසානයේ දී හේතු යුක්ති කිරීම මඟින් පොලඹවන ලද සම්මුතියකට එළඹිය යුතු ය. එක සමානයන් ලෙස සියලු විකල්ප පිළිබඳ නිදහස් ව සහ සහේතුක ව කරන ලද ඇගයීමකින් එළඹුණු ප්‍රතිඵලය මත අවසානයේ දී කටයුතු කිරීමට කැප වී ඇති සියල්ලන්ට ම එම සම්මුතිය ඒත්තු යන සුලු විය යුතු ය. එහෙත් සුදුසු ම කොන්දේසි යටතේ වුව ද නිත්‍ය වසයෙන් ම සම්මුතිශීලී යුක්ති යුක්ත කිරීමක් සිදු වෙතැ' යි සහතිකයක් නැත.

එසේ සම්මුතියකට එළඹිය නො හැකි සංවිචාරණයක දී වැඩි ඡන්දයෙන් නිගමනයකට එළඹිය යුතු ය.

සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය විධිමත් ලෙස සංකල්ප ගත කිරීමේ දී විශේෂයෙන් සංවිචාරණය ප්‍රායෝගික වසයෙන් යොදා ගැනීමේ දී සැලකිය යුතු ලක්ෂණ කිහිපයක් ගැන ජොෂුවා කොහෙන් මෙසේ සඳහන් කරයි:

1. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය අඛණ්ඩ ස්වතන්ත්‍ර සමාගමයක් *(independent association)* ලෙස සැලකිය හැකි ය. එහි සාමාජිකත්වයට කාලසීමාවක් නොමැත.

2. සමාගමයේ සියලු සාමාජිකයන් එකාවන් ව පිළිගන්නා පරිදි *(එසේ පිළිගන්නා බව පොදු දැනුමකි)* සමාගමය සඳහා වන කොන්දේසි සංවිචාරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවෙන මෙන් ම සංවිචාරණය සඳහා රාමුවක් සපයන ප්‍රමිති වසයෙන් සැලකිය යුතු ය. සංවිචාරණයක ප්‍රතිඵල සුජාතකරණය කිරීමේ පදනම සංවිචාරණය නිදහස් එකක් වීම යි.

3. සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුත්වවාදී *(pluralistic)* සමාගමයකි. එහි සාමාජිකයන්ගේ මනාප, අවබෝධය සහ ජීවන වටිනාකම් විවිධ ය. සාමූහික තේරීම් පිළිබඳ ගැටලු සංවිචාරණය මඟින් විසඳා ගැනීමට ඔවුන් කැප වී ඇති නමුත් ඔවුන්ගේ අරමුණු එකිනෙකට වෙනස් විය හැකි ය. එනිසා ඉදිරිපත් ව ඇති යෝජනා සම්බන්ධ ව බුද්ධි ගෝචර බව හැරෙන විට අනිවාර්යයෙන් සැලකිය යුතු සුවිශේෂ මනාප, අවබෝධ හෝ වටිනාකම් ඇතැ'යි ඔවුහු නො සිතති.

4. ප්‍රජාතන්ත්‍රවාදී සමාගමයක සාමාජිකයන් සංවිචාරණීය ක්‍රමවේදය සලකන්නේ එකී සමාගමය සුජාතකරණය කිරීමේ ප්‍රභවය ලෙසයි. එනිසා ඔවුන්ගේ සමාගමය හුදෙක් සංවිචාරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නක් නො ව සංවිචාරණය මූර්තිමත් කරන දෙයක් ලෙස ඔවුන්ට හැඟී යා

යුතු ය. එනිසා සංවිචාරණයේ ප්‍රතිඵල මෙන් ම සංවිචාරණය ඇත්තට ම සිදු වන ආකාරය ද ඉතා වැදගත් ය.

5. සංවිචාරණීය සමාගමයේ යෙදෙන හැම දෙනෙකුට ම සංවිචාරණීය හැකියා එනම් සබුද්ධිමත් හේතු දැක්වීමක් කළ හැකි බවට සියලු සාමාජිකයන් පිළිගත යුතු ය. ඉන් අදහස් වන්නේ ඉදිරිපත් ව ඇති යෝජනා පිළිගැනීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම තාර්කික ව ඉටු කිරීමේ හැකියාව සහ සංවිචාරණයේ ප්‍රතිඵල අනුව කටයුතු කිරීමේ හැකියාව සියල්ලන්ට ම ඇත යන්නයි.

ජොෂුවා කොහෙන් හඳුන්වා දෙන *ideal deliberative procedure* හෙවත් පරමාදර්ශී සංවිචාරණීය ක්‍රමවේදයට අනුව සංවිචාරණය පෙළ ගැස්වීමේ දී කරුණු තුනක් ප්‍රධාන වේ. පළමුවෙන් ම සංවිචාරණය සඳහා න්‍යාය පත්‍රයක් තීරණය කළ යුතු ය. දෙවනු ව න්‍යාය පත්‍රයේ අඩංගු කර ඇති පිළිතුරු සැපයිය යුතු ගැටලු සම්බන්ධ හේතු යුක්ති කළ හැකි විකල්ප විසඳුම් කිහිපයක් තිබිය යුතු ය. තෙවනු ව අවම වසයෙන් ඉන් එක විකල්පයක් අවසානයේ දී එකඟ විය හැකි එකක් විය යුතු ය. අවසාන ප්‍රතිඵලය ප්‍රජාතන්ත්‍රවාදි ලෙස සුජාතකරණය කළ හැකි වන්නේ එය සමානයන් අතර නිදහස් සහ සබුද්ධික ලෙස එකඟත්වයකට පැමිණිය හැකි විසඳීමක් වුවහොත් පමණි.

නියම සංවිචාරණයක් *(ideal deliberation)* සිදුවීමට තවත් වැදගත් කොන්දේසි දෙකක් සපුරා ලිය යුතු යැයි කොහෙන් පවසයි. පළමුවෙන් ම සංවිචාරණයට සහභාගි වන අය බැඳී සිටින්නේ ඔවුන්ගේ සංවිචාරණය හා සම්බන්ධ පූර්ව කොන්දේසිවලින් සහ එම සංවිචාරණයේ ප්‍රතිඵලවලින් පමණක් බව සියල්ලන් විසින් ම පිළිගත යුතු වීමයි. යෝජනා සලකා බැලීමේ දී ඔවුන්ගේ සංවිචාරණීය චර්යාව ඉන් පෙර පැවති සම්මුති සහ එකඟතා නිසා සීමා නො විය යුතු ය. දෙවනු ව ඔවුන් විසින් එකඟ වන ප්‍රතිඵලය අනුව කටයුතු කිරීමට හැකි වනු ඇතැ'යි යන සහතිකයක් සහභාගි වන්නන්ට තිබිය යුතු ය. ඒ අනුව සංවිචාරණය මඟින් තීරණයකට එළඹීම ම එම තීරණයට

අනුව කටයුතු කිරීම සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් හේතුවක් විය යුතු ය.

සංවිචාරණය යුක්ති යුක්ත කළ හැකි හෙවත් තර්ක බුද්ධි ගෝචර විය යුතු ය. ඉන් අදහස් වන්නේ සංවිචාරණයේ යෙදෙන්නන් කිසියම් යෝජනාවක් ඉදිරිපත් කරන විට, ප්‍රතික්ෂේප කරන විට හා විවේචනය කරන විට එසේ කිරීම සම්බන්ධ ඔවුන් ඉදිරිපත් කරන හේතු පැහැදිලි ව හා තාර්කික ව සඳහන් කළ යුතු බවයි. ඔවුන් එසේ හේතු ඉදිරිපත් කරන්නේ එකී හේතුවල සබුද්ධික බව අනුව තත් යෝජනාවේ ඉරණම විසඳේ ය යන බලාපොරොත්තුවෙන් මිස ඔවුන්ගේ සමාජ තත්වය හෝ බලය නිසා යෝජනාව ප්‍රතික්ෂේප කළ යුතු ය යන අදහසින් නො වේ. හාබර්මාස් සඳහන් කරන අන්දමට නියම සංවිචාරණයේ දී "වඩා හොඳ තර්කයක් හැරෙන විට වෙනත් කිසිදු බලයක් භාවිත නො වේ".[79] සහභාගි වන අනෙක් අය මෙහි දී හේතු ඉදිරිපත් කරන්නේ වෙනස් අරමුණු සහිත සමානයන් අතර කෙරෙන නිදහස් සංවිචාරණයක් මඟින් කරුණු කාරණා තීරණය කිරීමට තමන් කළ කැපවීම සලකමිනි. ඉදිරිපත් වන ඇතැම් යෝජනා සාධාරණ ඒවා විය හැකි වුවත් සංවිචාරණයේදී පිළිගත හැකි හේතු දැක්වීමක් මඟින් සාධාරණීකරණය නො වෙන්නේ නම් ඒවා ප්‍රතික්ෂේප කළ යුතු ය. යෝජනා සම්බන්ධ සුදුසු තේරීම් තීරණය කිරීමේ දී හුදෙක් එම තේරීම් පුරවැසියන්ගේ මනාපය හා ගැළපෙනු ඇත යන්න පමණක් නො ව ඒවා සංවිචාරණීය ක්‍රමය යොදා තෝරා ගත් ඒවා වීම වැදගත් ය. විධිමත් සංවිචාරණයක මූලික කොන්දේසිය වන්නේ සමානාත්මතාවයි. නො එසේ නම් මිෂෙල් ෆූකෝ පැවසූ අන්දමට සංවිචාරණයක ප්‍රතිඵල තීරණය කරන්නේ බලය මිස තර්කණය නො වේ.[80] ඇතන්ස් නුවර සම්ප්‍රදාය අනුව යමින් ෆිෂ්කින් හඳුන්වා දුන් අන්දමට සංවිචාරණයේ දී සහභාගි වන්නන් අහඹු ලෙස තෝරා ගැනීම සහ බල කණ්ඩායම් ගැසීම වැළැක්වීමට ක්‍රියාමාර්ග

79 Habermas, J. (1975). Legitimation Crisis, trans. T. McCarthy (Boston, MA: Beacon Press) p.108

80 Foucault, M. (2001). Power [vol. 3 of The Essential Works of Foucault, 1954–1984], ed. J. B. Faubion, trans. R. Hurley and others (New York: New Press).

ගැනීම වැදගත් වන්නේ එබැවිනි. සංවිචාරණයට සහභාගි වන අය එකිනෙකා නාඳුනන එකිනෙකා ගැන නො දන්නා අය වන තරමට තර්ක බුද්ධිය විසින් මිස බලය විසින් සංවිචාරණයේ ප්‍රතිඵල තීරණ කිරීම වැළැක්විය හැකි ය.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දී මෙන් නො ව සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදයේ දී වැඩි අවධානයක් යොමු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී කතිකාව විවෘත එකක් වීම සහ එය සමානයන් අතර සංවිචාරණීය බව මුල් කොට සිදු කළ යුතු එකක් වීම ගැනයි. දේශපාලනඥයන් විසින් මෙහෙයවනු ලබන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බලාපොරොත්තු වේගයෙන් සුන් ව යමින් තිබේ. ෆුකෝ තර්ක කළ අන්දමට සාකච්ඡාවක ප්‍රතිඵල තර්කණය විසින් නො ව බලය විසින් තීරණය කිරීමට වැඩි ඉඩකඩක් ඇත්තේ පක්ෂ ක්‍රමය මත පදනම් වූ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ ය. බොහෝ දේශපාලනඥයන් දූෂිත බවත් ඔවුන් පොදු යහපත තකා තර්කානුකූල ව තීරණ ගනු ඇතැ'යි විශ්වාස කළ නො හැකි බවටත් පැතිර ඇති මතය ප්‍රබල ය. ඒ හැර ලංකාවේ බොහෝ ජනමාධ්‍ය විසින් දේශපාලනය වාර්තා කරනු ලබන පක්ෂග්‍රාහී ආකාරය පිළිබඳව සමාජ මාධ්‍යවල පළවන සෝපාහාස සහ නර්මාලාපවලින් ද පැහැදිලි වන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඇති පොදු අවිශ්වාසයයි. දේශපාලනඥයන්ගේ දේශපාලන ඥානය පිළිබඳ අධිකාරය තවදුරටත් පිළිගැනීමට තමන්ට හේතුවක් නැති බව පොදු ජනතාවට වැටහෙමින් තිබේ. මේ නිසා අප අත්දකින නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ විශාල අඩුවක් ඇති බව පැහැදිලි ය. එම අඩුව සපුරා ලිය හැකි වන්නේ සාමාන්‍ය ජනතාව වැඩි වැඩියෙන් දේශපාලන ක්‍රියාකාරිත්වය තුළට ගෙන ඒමෙනි. සාමූහික ව දේශපාලන තීන්දු ගැනීමේ දී බොහෝ පුරවැසියන්ට තමන්ගේ වෘත්තීය හා පුද්ගලික ජීවිතයේ නොයෙක් අත්දැකීම් උපයෝගී කර ගත හැකි ය. දේශපාලන පක්ෂ නායකයන්ගේ අභිමතය අනුව කටයුතු කිරීමට පුරවැසියන්ට බල කිරීමක් කළ නො හැකි ය. තර්ක බුද්ධියට අනුව තීරණ ගැනීමට වැඩි හැකියාවක් ඇත්තේ සංවිචාරණශීලී ජන සමූහයකට මිස පක්ෂ නායකත්වයේ විධානය අනුව කටයුතු කරන

දේශපාලනඥයන්ට නො වේ. ඒ නිසා දේශපාලනය හුදු නියෝජනය පිළිබඳ කාර්යයක් නො ව නිරන්තරයෙන් මහජනයාට විවෘත කාර්ය සාධක ලෙස සංවිචාරණීය වූ කාර්යයක් බවට පත් විය යුතු ය. ඒ අනුව දේශපාලන තීරණ පොදු යහපත මුල් කර ගෙන ගන්නා ඒවා බවට පත් කළ හැකිවා පමණක් නො ව පොදු ජනතාව විසින් හෘදයංගම ව පිළිගනු ලබන ඒවා බවට ද පත් කළ හැකි ය. අඩු ම වසයෙන් එම උපන්‍යාසය පරීක්ෂා කර බැලීම වටී.

එදිනෙදා ජීවිතයේ දී සාමාන්‍යයෙන් බොහෝ රටවැසියන්ට සිදු වන්නේ මොකක් හෝ මිථ්‍යාවකට ඡන්දදායකයා පොලඹවා ගැනීම අරමුණු කරගත් සිය ගණන් පණිවිඩවලට මුහුණ දීමට මිස දේශපාලන, ආර්ථික හා සාමාජීය කටයුතු සම්බන්ධයෙන් ඥානෝද්දීපනය වෙන අදහසක්, තොරතුරක් ලබා ගැනීමට නො වේ. තරඟකාරී මැතිවරණ ක්‍රමය තුළ තරඟ කරන පක්ෂවලට අවශ්‍ය වන්නේ මිථ්‍යාව හෝ පතුරා මැතිවරණ දිනීම මිස විසඳිය යුතු ප්‍රශ්න හා සම්බන්ධ ඇත්ත සාකච්ඡා කොට ඡන්දදායකයන් දිනා ගැනීම නො වේ. විවිධ ව්‍යාපාරික ළැදියා මත ස්වචන්දයෙන් ම පත් වන ලොබි කණ්ඩායම්වල බලපෑම්වලට පමණක් බොහෝ විට නතු වන තරඟකාරී නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ මැතිවරණයකින් තෝරා පත් වෙන අපේක්ෂකයන්ට පක්ෂ නායකත්වයේ අභිමතයට අනනුකූල ව අව්‍යාජ සංවිචාරණයක් පැවැත්වීමට දිරි ගැන්වීමක් නො ලැබේ. එනිසා අයිස්ලන්ත සහ මොන්ගෝලියානු නිදර්ශනවලින් තහවුරු වන පරිදි එවැනි ක්‍රමයක් තුළ වුවද ප්‍රබල සංවිචාරණීය අංගවලින් යුත් මහජනයාට විවෘත සංවිචාරණ ඡන්ද ක්‍රමයක පැවැත්ම ව්‍යවස්ථාව මඟින් ම සහතික කර තිබීම වැදගත් වර්ධනයකි. ඒ මඟින් විවෘත ප්‍රජාතන්ත්‍රවාදයකට අත්‍යවශ්‍ය සමානාත්මතා මූලධර්මය මත මැතිවරණ අතර දී වුව ද ආණ්ඩුකරණය සම්බන්ධයෙන් ඵලදායක ලෙස මැදිහත් වීමට පොදු ජනතාවට අවකාශ ලැබේ.

# - 7 -

# දේශපාලන සමානාත්මතාව හා පොදු අයිතිය

ප්‍රජාතන්ත්‍රවාදයේ අනිවාර්ය පදනම වන්නේ දේශපාලන සමානාත්මතාව යි *(political equality)*. එහෙත් එතෙක් මෙතෙක් ප්‍රජාතන්ත්‍රවාදයට සාක්ෂාත් කර ගැනීමට නො හැකි වූයේ ද එය යි. ඒ හැර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිට දේශපාලනික ආයතනවල ස්වරූපය දක්වා වූ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය යැයි සැලකෙන අනිකුත් හැම දෙයක් ම ප්‍රජාතන්ත්‍රවාදයක අනිවාර්ය අවශ්‍යතාවලට වඩා හුදු වෛකල්පික අවශ්‍යතා ලෙස සැලකිය හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඉඳුරා ම වැදගත් වන්නේ සියලු වැසියන් අතර තිබිය යුතු දේශපාලන සමානාත්මතාව යි. දේශපාලන බලයේ සංයුතිය සහ දේශපාලන බලය මෙහෙය වෙන ආකාරය සමස්ත ප්‍රජාව අනුමත කරන්නේත්, දේශපාලන බලය සමස්ත ප්‍රජාවට වග වන දෙයක් බවට පත් වන්නේත්, දේශපාලන සමානාත්මතාව සහතික වුව හොත් පමණි. එහෙත් දේශපාලන සමානාත්මතාව යනු හුදෙක් වයස සම්පූර්ණ වූ හැම පුරවැසියෙකුට ම මැතිවරණයක දී භාවිත කිරීම පිණිස එක සමාන ඡන්ද බලයක් හිමි ව තිබීම පමණක් ම නො වේ.

ඡන්ද බලය සමාන ව තිබුණ ද දේශපාලන සමානාත්මතාව අවහිර කරන වෙනත් සාධක ගණනාවකි. රටවැසියන් අතර ඇති අත්‍යන්ත සමාජ හා ආර්ථික විෂමතා ඒ අතරින් මුල් තැන ගනී.

අවවරප්‍රසාදිත ජන කොට්ඨාස දේශපාලනයෙන් පිට මං කිරීම, ජනමාධ්‍ය දූරාචාරය, අසමාන අවස්ථා නිසා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට අපහසු වීම සහ ජනමාධ්‍ය හා මැතිවරණ ක්‍රියාවලිය කූට ලෙස මෙහෙයවීම යනාදිය මඟින් ද දේශපාලන සමානාත්මතාව ඇතිවීම වැළකේ. එවිට සමස්ත ප්‍රජාවගේ යහපත වෙනුවට එම සමස්තයෙන් කොටසකගේ යහපත වෙනුවෙන් දේශපාලන බලය භාවිත කරනු ඇත. එසේ ම එකී දේශපාලන බලය මෙහෙයැවෙන්නේ ද සමස්ත ප්‍රජාව විසින් නො ව වරප්‍රසාද ලත් සුළු පිරිසක් විසිනි.

දේශපාලන සමානාත්මතාව කොයි තරම් ප්‍රජාතන්ත්‍රවාදයට වැදගත් ද යන්න "ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එක් එක් සාමාජිකයන් අතර තිබිය හැකි බලයේ වෙනස ප්‍රචණ්ඩත්වයක් ලෙස භාවිත කිරීමට තරම් වැඩි එකක් නොවිය යුතු ය" යනුවෙන් හා "වෙනත් අයෙකු මිලට ගැනීමට තරම් කිසිවෙකු පොහොසත් නො විය යුතු අතර තමන්ව විකුණා ගැනීමට බල කෙරෙන තත්වයකට පත් වෙන තරම් කිසිවකු දුප්පත් නො විය යුතු ය"[81] යනුවෙන් රූසෝ සමාජ ගිවිසුම *(Social Contract)* පිළිබඳ සිය ප්‍රකට කෘතියේ කළ අවධාරණයෙන් නිරූපණය වේ. රූසෝ ඉන් අදහස් කළේ වරප්‍රසාද ලත් අයගේ ප්‍රචණ්ඩත්වය හුදු පරපීඩනයකට හා දුප්පතුන්ගේ දිළිඳුකම හුදු අසාධාරණත්වයකට ලඝු කරනවාට වඩා ඒ දෙකම ප්‍රජාතන්ත්‍රවාදය අවලංගු කරන මූලික සාධක ලෙස සැලකිය යුතු බවයි.

ප්‍රජාතන්ත්‍රවාදයේ පුරෝගාමීන් ලෙස සැලකෙන ග්‍රීසියේ පුරාණ ඇතීනියන්වරුන් දේශපාලන සමානාත්මතාව ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම ලෙස සැලකූ බව බර්ක්ලි සරසවියේ ආචාර්ය වෙන්ඩි බ්‍රවුන් සිය *In the Ruins of Neoliberalism* නම් කෘතියේ පෙන්වා දෙයි.[82] ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුන ලෙස ඇතීනියන්වරුන් සැලකුවේ ඇතන්ස්හි පුරවැසි සභාවේ දී ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සිය අදහස් ප්‍රකාශ කිරීමටත්, එම අදහස්වලට පුරවැසි සභාව විසින් කන් දෙනු

81 Rousseau, Jean-Jacques, [1762] 1968, *The Social Contract* (London: Penguin,) pp,96

82 Wendy Brown (2019) *In the Ruins of Neoliberalism,* New York: Columbia University Press, pp. 24

ලැබීමටත් හැම පුරවැසියෙකුට ම ඇති අයිතිය හෙවත් අයිස්ගෝරියා *(isegoria)*, නීතිය ඉදිරියේ සියල්ලන් සමානයන් ලෙස සැලකීම හෙවත් අයිසොනොමියා *(isonomia)* සහ එක සමාන ඡන්ද බලය සමග දේශපාලන නිලතල සඳහා ඉදිරිපත් වීමට ඇති එක සමාන අයිතිය හෙවත් අයිසොපොලිටෙයා *(isopoliteia )* යන මූලික කොන්දේසි තුන යි. පුරවැසි ඇතීනියන්වරුන් අතර දේශපාලන සමානාත්මතාව ඇති කිරීමට එම කොන්දේසි තුන අත්‍යවශ්‍ය බව සැලකුණි. ඇතීනියන්වරු නිදහස අගය කළ නමුත් ප්‍රජාතන්ත්‍රවාදය පවතින්නේ අවම වසයෙන් අර කී මූලික කොන්දේසි තුන මගින් තහවුරු වන සමානාත්මතාවක් මත පමණක් බවත් තේරුම් ගත්හ.

එහෙත් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සාධකය වසයෙන් 'දේශපාලන සමානාත්මතාව' සැලකුවොත් ලිබරල්, සුලු ධනේශ්වර, ධනවාදී, සමාජවාදී ආදී විවිධාකාර විශේෂණ පදවලින් හැඳින්වෙන වර්තමාන ප්‍රජාතන්ත්‍රවාද කිසිවක් එම සාධකය ප්‍රමාණවත් තරම් සපුරා නැති බව පෙනී යනු ඇත. හැරත් එකී මාදිලියේ ප්‍රජාතන්ත්‍රවාදවල කිසියම් සාධනීය ලක්ෂණයක් වී ද ඒවා ද පසුගිය දශක කිහිපය තුළ අතුරුදහන් වී අනුක්‍රමයෙන් නිර්ප්‍රජාතන්ත්‍රවාදී වෙමින් තිබේ. එහෙත් ධනවාදී ආර්ථිකයක් ඇති ජාතික රාජ්‍ය ව්‍යුහයක් තුළ, අත්‍යන්ත සමාජ හා ආර්ථික විෂමතා තුරන් කොට දැනුම ලබා ගැනීමේ අවස්ථා අසමාන වීම වළක්වා සියල්ලන්ට පිළිගත හැකි දේශපාලන සමානාත්මතාවක් ඇති කර ගත හැක්කේ කෙසේ ද යන්න සැලකිය යුතු අභියෝගයකි. නූතන රාජ්‍යයේ සියලු ආකෘති ප්‍රජාතන්ත්‍රවාදී බවක් පෙන්වීමට තැත් කරන නමුත් ඒවා ඇත්ත වසයෙන් ම ප්‍රජාතාන්ත්‍රික නො වේ යැ'යි කාල් මාක්ස් පැවසුවේ එබැවිනි.

ඒ අනුව මුල්කාලීන යුරෝපියානු නූතනත්වය විසින් හඳුන්වා දෙන ලද ධනවාදය, ජාතික-රාජ්‍ය හා ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්ප ත්‍රිත්වය අතරින් භාවිතයේ දී ප්‍රායෝගික වසයෙන් වඩාත් දුර්වල ම සංකල්පය බවට පත් ව ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය බව පෙනී යයි. මේ ත්‍රිත්වය අතරින් ධනවාදය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මෙන් ම

නිර්ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ද මෙහෙයවිය හැකි ය. එමෙන් ම ජාතික රාජ්‍යය අඩු වැඩි වසයෙන් දේශපාලන සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමට මෙන් ම බෙහෙවින් දුර්වල කිරීමට ද යොදා ගත හැකි ය. ඇත්ත වසයෙන් ම 20 වැනි සියවසේ ඇති වූ ලෝක මහා යුද්ධ දෙකටත් වර්තමාන ජනවාර්ගික යුද්ධවලටත් ජාතික රාජ්‍ය සංකල්පය බෙහෙවින් බලපා තිබේ.

ඉදින්, හුදෙක් ධනවාදී ආර්ථික වර්ධනයේ අත පල්ලෙන් පහළ ආදායම් ලබන්නන් අතරට වැටෙනු ඇතැ'යි කියන සෞභාග්‍ය පිළිබඳ පුරසාරම් නො තකා ප්‍රජාතන්ත්‍රවාදය නියමාර්ථයෙන් ම අත්විඳීමට සියල්ලන්ගේ දේශපාලන සමානාත්මතාව තහවුරු කරන්නේ කෙසේ ද? දේශපාලන සමානාත්මතාව ඇතිවෙන්නේ සමාජ විෂමතා අවම කිරීමෙන් බව සැලකූ විට එදිනෙදා ජීවත් වීම පිණිස අවශ්‍ය කරන සාර්වත්‍රික මූලික ආදායමක් *(universal basic income)*, දැරිය හැකි කුලියකට/මිලකට ගත හැකි නිවාස, ගුණාත්මක නිදහස් අධ්‍යාපනය සහ ප්‍රමාණවත් නිදහස් සෞඛ්‍ය සේවා යනාදිය රජයේ නිසි මැදිහත් වීම් මඟින් සහතික කළ හැකි විය යුතු ය. අඩු ආදායම් ලබන කොටස් අතර දේශපාලන සහභාගිත්වයේ ලා ඇතිවිය හැකි ඉච්ඡාභංගත්වය ඒ මඟින් අවම කළ හැකි ය. එමෙන් ම නිරවද්‍ය තොරතුරු සංසරණය, ගුණාත්මක ප්‍රජා අධ්‍යාපනය, සාධාරණ හා පාරදෘශ්‍ය මැතිවරණ සහතික කිරීම, දේශපාලන නිලතල දැරීමට අවවරප්‍රසාදිත කණ්ඩායම් දිරිගැන්වීම, ප්‍රතිපත්ති හා නීති සම්පාදනයේ දී විවෘත සංවිචාරණීය සහභාගිත්වය සඳහා අවස්ථා සැලසීම ආදිය සඳහා උචිත ප්‍රතිපත්ති ද සමාජයට ක්‍රියාත්මක කළ හැකි ය.

ප්‍රජාතන්ත්‍රවාදී සමානාත්මතාව පිළිබඳ තවත් වැදගත් සාධකයක් වන්නේ පොදු දේවල්, පොදු පහසුකම් සහ පොදු අයිතිය යි. හැමට එක ලෙස කාර්යක්ෂම ව සේවය සලසන පොදු ප්‍රවාහන සේවා, පොදු අධ්‍යාපන ක්‍රමයක් සහ පොදු සෞඛ්‍ය සේවයක් ඒ අතර ඉතා වැදගත් ය. පොදු දේවල් යනුවෙන් හැඳින්වෙන හැම දෙයක් ම පොදු අයිතිය යටතේ නො පවතින බව ආචාර්ය බොනී

හොනිග් සිය *Public Things - Democracy in Disrepair* නම් කෘතියේ පෙන්වා දෙයි. අවශ්‍ය වන්නේ ඒවා පොදු යහපත තකා අධීක්ෂණය හෝ නියාමනය වීම හෝ පොදු භාවිතය සඳහා යොදා ගැනීම යි. උදාහරණයක් වසයෙන් බොහෝ පොදු විශ්ව විද්‍යාලවලට පෞද්ගලික ධන සම්පත්, හෝ අරමුදල් යෙදෙන නමුත් ඒ නිසා ම ඒවා පෞද්ගලික දේපළ බවට පත් නො වේ. මන්ද ඒවා පොදු යහපත මුල්කරගත් නියාමනයක් යටතේ පොදු පරමාර්ථ ඉටු කර ගැනීම වෙනුවෙන් ක්‍රියා කළ යුතු බැවිනි. පොදු දේවල්වලට පාසල්, විශ්ව විද්‍යාල, රෝහල්, රජයේ වනාන්තර සහ කැලෑ ප්‍රදේශ, ජාතික වනෝද්‍යාන, සිර ගෙවල්, මහාමාර්ග හා අනෙකුත් මං මාවත්, ගමනා ගමන සේවා, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, වරාය හා ගුවන් තොටුපළවල්, සුසාන භූමි, පොලිසිය, හමුදාව, ආණ්ඩු සහ රාජ්‍ය ආයතන, විදුලි, වායු, න්‍යෂ්ටික සහ අනෙකුත් බල ශක්ති ප්‍රභව, සාගර, ගංගා, ජලාශ හා ජල සැපයුම් පද්ධතිය හා තෙල් නල මාර්ග, තරංග සංඛ්‍යාත, ගුවන් විදුලි හා රූපවාහිනී ජාල, පුස්තකාල සහ තවත් බොහෝ දේවල් ඇතුළත් වේ.

එහෙත් ජාතික රාජ්‍යයක දේශපාලන බලය ඉක්මවා ගිය ක්ෂේත්‍රයක් වන 'පොදු ලෝක උරුමය' *(Global Commons)* නිර්ණය කරන්නේ මනුෂ්‍ය වර්ගයේ පොදු උරුමය යන මූලධර්මය සලකමිනි. භූමිය, වනාන්තර, මුහුදු සහ සාගර, වායු ගෝලය හා දේශගුණ පද්ධති ආදි වසයෙන් මේ පොදු ලෝක උරුමයේ ස්වරූපය කුමක් වුව ද තිරසාර හා සෞභාග්‍ය සම්පන්න අනාගත ලෝකයක් පිළිබඳ අපේ බලාපොරොත්තුව ඉෂ්ට කර ගැනීමට නම් එකී සාධක සියල්ලෙහි යහපැවැත්ම තහවුරු වීම අත්‍යවශ්‍ය වේ. ස්වාභාවික විද්‍යා පිළිබඳ නවීනතම සොයා ගැනීම් නූතන ශිෂ්ටාචාරය ආරම්භයේ සිට අපේ පරිසරය මුහුණ දී ඇති අවදානම් හැරවුම් ලක්ෂ්‍යන් පිළිබඳ අපට අනතුරු හඟවා තිබේ. මෙකී හැරවුම් ලක්ෂ්‍යන් පසු කළ විට ආපසු නිවැරදි කළ නො හැකි පරිදි ඇතිවෙන විපර්යාස පිළිබඳ විද්‍යාඥයන් අවුරුදු ගණනාවක් තිස්සේ නොකඩවා කොතෙකුත්

අවවාද දී තිබේ. එහෙත් ප්‍රතිපත්ති සම්පාදනයට ඍජු ව සම්බන්ධ වන සැලකිය යුතු බල ව්‍යුහ සහ ඒවායේ අනුග්‍රාහක ආයතන විසින් එම අනතුරු ඇඟවීම් බොහෝ විට මුළුමනින් ම නො තකා හැර තිබේ. එහි ප්‍රතිඵලය ගෝලීය උණුසුම වැඩි වීමට බලපාන සාධක අවම කිරීම සම්බන්ධයෙන් සාමූහික ව ක්‍රියා කිරීමට කටයුතු යෙදීමට අප අපොහොසත් වීම යි.

ස්වාභාවික සම්පත් බෙදා ගැනීම සහ නැවත බෙදී යෑමේ රටාව බොහෝ විට බහුතරයේ අවශ්‍යතාව නො තකන සුළුතරයක ප්‍රමුඛතා අනුව සිදු වන දෙයක් බවට පත්වී තිබේ. උදාහරණයක් වසයෙන් දේශගුණය වෙනස් වීම පිළිබඳ නියාම සහ විවිධාකාර අත්දැකීම් දිගින් දිගට ම උද්ධච්චකමින් ප්‍රතික්ෂේප කරන බලවේගවලින් මෙහෙයවන ලෝකයක ජීවත් වීමට අපට සිදුවී තිබේ. ඉහත කී දේශගුණික වෙනස්කම්වලට තුඩු දුන් කරුණු බොහෝමයක් ඇති වූයේ ද එකී බලවේගවල ක්‍රියාකාරකම් හේතු කර ගෙනයි. දේශගුණික විපර්යාස එදිනෙදා ජීවිතයට අතිශයින් විනාශකාරී ලෙස බලපා ඇති අන්දම ගැන අපි දැනටමත් බොහෝ දේ දන්නෙමු.

පොදු දේවල් යනු සක්‍රිය ප්‍රජාතන්ත්‍රවාදයක පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි. පොදු දේවල් පවත්වා ගෙන යෑම හා පරිහරණය පිළිබඳ කතිකාව ප්‍රජාතන්ත්‍රවාදය බිහි වීමට මූලික හේතුවක් විය. පොදු දේවල්වලින් තොර ව පොදු ජනතාවක් ද නැත. එවැනි පොදු දේවල් නොමැති නම් ප්‍රජාතන්ත්‍රවාදය හුදෙක් මැතිවරණ, බහුතරයේ පාලනය හා පාර්ලිමේන්තු විවාද පිළිබඳ පටිපාටිවලට පමණක් සීමා වෙනු ඇත. පොදු දේවලින් සමන්විත වන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය හෝ පොදු දේවල්වල අයිතිය, කාර්ය සාධනය සහ පැවැත්ම සම්බන්ධයෙන් රජයට ඇති වග වීම නැතිව ගියොත් ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසිභාවයකට පැවැත්මක් ද නො තිබෙනු ඇත.

පොදු දේවල් පුද්ගලීකරණය කිරීමට පක්ෂ වන බොහෝ අය එය සාධාරණීකරණය කිරීමට තැත් කරන්නේ එමඟින් වඩා කාර්යක්ෂම සේවාවක් සැපයිය හැකි ය යන තර්කය මතය. පොදු

දේවල් සම්බන්ධ නිලධාරිවාදය නිසා නාස්තිය වැඩි වෙන බවත් සේවකයන්ගේ කාර්යක්ෂමතාව වැඩි කරන වෙළඳපොළ පාදක කරගත් දිරිගැන්වීම්වලින් එකී සේවා ඇත් කර තැබීම සිවිල් සේවයේ ආකල්පය බවත් ඒ සම්බන්ධ ආනුෂංගික තර්ක ය. ඒ අනුව අකාර්යක්ෂම වන්නේ සමාගම් නිලධාරිවාදය නො ව රජයේ නිලධාරිවාදය යි. රජයේ අධීක්ෂණයකට වඩා වෙළඳපොළට වග කියන පුද්ගලික අංශයේ සේවා සපයන්නන් රජයේ ආයතනවලට වඩා විශ්වාසදායක යැයි කල්පනා කෙරේ. එහෙත් ඉතාමත් කාර්යක්ෂමව සේවය සලසන පොදු සේවා ඇති බව අප දනිමු. ප්‍රංශය ඩෙන්මාර්කය වැනි ඇතැම් යුරෝපීය රටවල පොදු ප්‍රවාහන සේවා හා මහජන සෞඛ්‍ය සේවා ඒවාට කදිම උදාහරණ ය. වඩා නාස්තියක් සිදු වන්නේ පුද්ගලික අංශයේ පාලනයෙන් ද නැත හොත් රාජ්‍ය අංශයේ පාලනයෙන් ද යන්න සම්බන්ධයෙන් ඇති සාක්ෂි පිළිබඳ ව අනුභූතිවාදීන්ට ඇති තරම් තර්ක කළ හැකි වූවත් හුදු කාර්යක්ෂමතාවට වඩා පොදු දේවල්වල පැවැත්ම අත්‍යවශ්‍ය වන තවත් වැදගත් සාධක ඇති බව අප අමතක නො කළ යුතු ය. ප්‍රජාතාන්ත්‍රික පුද්ගලභාවය හෙවත් ප්‍රජාතන්ත්‍රීය පුරවැසිභාවය නමැති සාධකය එක් ව අල්ලා ගෙන සිටින මැලියම වන්නේ පොදු දේවල් ය. ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතය පුරවනු ලබන්නේ පොදු දේවල්වලිනි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාමාජිකයන්ගේ සමාජීය හැඩගැසීම, ඌනතා සම්පූර්ණ කිරීම, නිදහස අත්විඳීම, තහංචි පැනවීම ආදියෙන් ඔවුන් පුරවැසිභාවයට පත් වන්නේ පොදු දේවල් නිසා ය.

ඒ නිසා හුදෙක් කාර්යක්ෂමතාවේ නාමයෙන් සිදු වන පෞද්ගලීකරණය ද ඇතුළු ව රාශි භූත වෙන නොහොත් සමුච්චයනය වන ධනය විසින් දේශපාලන බලයේ ලීවර අත්පත් කර ගනු ලැබීම වැළැක්වීමට නිතර විමසිලිමත් වීම ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයකි. ධනය සමුච්චයනය වීම කෝපරේට් - සාමූහික හෝ පුද්ගලික ආදි කොයි මට්ටමෙන් පැවතිය ද එහි අභිප්‍රාය වන්නේ එකී බලයේ ලීවර අත්පත් කර ගැනීම මඟින් ධනය ඒකරාශි වීම

තව තවත් වැඩි කර ගැනීමේ ආත්මාර්ථකාමී අවශ්‍යතාව ඉටු කර ගැනීම යි. ඒ අවශ්‍යතාව ඉටු කර ගැනීම පිණිස අවවරප්‍රසාදිත සහ ආන්තික කොටස්වලට දේශපාලන අයිතිය ලබා දීම සීමා කිරීමට වුවද සමුච්චයනය වන ධනය පසුබට වන්නේ නැත . කොටින් ම ජාතික රාජ්‍ය හා ධනවාදය යටතේ ප්‍රජාතන්ත්‍රීය පැවැත්මක් සහතික කර ගැනීමට නම් සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය පහසුකම්වල සිට ගුණාත්මක අධ්‍යාපනයක් දක්වා පොදු පහසුකම් සියලු දෙනාට ම සහතික කිරීමත්, ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල සාධාරණ ලෙස බෙදී යන ලෙස ප්‍රතිව්‍යාප්ත *(redistribution)* කිරීමත්, ධනය සමුච්චයනය වීම අරමුණු කර ඇතිවෙන ජාවාරම් හා දූෂණ ක්‍රියා වැළැක්වීමත් අනිවාර්යයෙන් ම සිදු විය යුතු ය.

ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම තහවුරු කිරීමට නම් වෙළඳපොළට පමණක් සහ වෙළඳපොළ ජය ගත් අයට පමණක් පාලනය බාර දීමට දරන ප්‍රයත්නයට ඉඩ නො දිය යුතු ය. ඇත්ත වසයෙන් කළ යුත්තේ දේශපාලන සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම පිණිස වෙළඳපොළ බලපෑම නියාමනය කිරීම යි.

ධන කුවේරයන් අතළොස්සක් බිහි කර බහුතරය සාපේක්ෂ දිළින්දන් වසයෙන් තබා ගැනීම ධනවාදයට ආවේණික වූ "සමාජ ප්‍රශ්නය" වසයෙන් 19 වැනි සිය වසේ සිට ම පැවත එන්නකි. මෙලෙස "සමාජ ප්‍රශ්නය" රාමු ගත කිරීමේ දී දුප්පතුන් කෙරෙහි දැක්විය යුතු කරුණාව, සාධාරණත්වය හෝ සමාජ අසහනය ගැන සැලකිලිමත් වීම ධනවාදයට දිය හැකි විසඳුම් ලෙස සැලකුණි. එහෙත් ඊට වෙනස් ව ඇත්ත වසයෙන් ම අවශ්‍ය වන්නේ අසල්වැසි බිම් මට්ටම දක්වා ස්වයංපාලනයක් පවත්වා ගෙන යෑමට හැකි වන සේ හැම පුරුෂයෙක් ම හැම ස්ත්‍රියක් ම හැකි තරම් සවිබල ගැන්වීම යි. එය වළක්වන සමාජීය හා ආර්ථික අසමානතා තීව්‍ර වීමට ඇති හැකියාව දේශපාලන සමානාත්මතාව තහවුරු කිරීම මඟින් අවහිර කළ යුතු ය.

අප අතර ඇති බහුවිධත්වය හා නොයෙකුත් වෙනස්කම් තිබිය දී වුව ද අන්‍යෝන්‍ය විශ්වාසය අත්විඳිය හැකි අප 'සමාජය' යනුවෙන් හඳුන්වන පොදු අවකාශයේ ශක්තිමත් වර්ධනය ද ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මට අත්‍යවශ්‍ය ය. ප්‍රායෝගික වසයෙන් ගත් විට රජය සහ අපේ පුද්ගලික ජීවිතය අතර පිහිටා තිබෙන 'සමාජය' නමැති මේ පොදු අවකාශය එකිනෙකට වෙනස් සම්පත් හා පසුබිම් සහිත ව පැමිණෙන පුරවැසියන් එකට එක් කරන සහ අන්‍යෝන්‍ය වසයෙන් එකට ඉගෙන ගැනීමට සලස්වන තැනයි. පොදු යහපත මුල් කර ගනිමින් අප දේශපාලන වසයෙන් එක් රැස් වන්නේත් අප දේශපාලන වසයෙන් බලාත්මක කරවනු ලබන්නේත් සමාජය තුළ යි. දේශපාලනයට පිවිසීමේ හැකියාව, දේශපාලන හඬ නැංවීම සහ සේවා පහසුකම් ලබා ගැනීම සම්බන්ධයෙන් ඇති විෂමතා නිරූපණය වන්නේ ද සමාජය නමැති පොදු අවකාශය තුළයි. එය අපේ දරු මුනුබුරන්ගේ අනාගතයේ යහපත් අයහපත් බව නිරූපණය කරන අවකාශය යි.

සමාජය යනු මතිභ්‍රමයක් නොව සැබවින්ම පවතින අවකාශයකි. එහි සුගමතාවය *(Intelligibility)* හෙවත් සුපැහැදිලි බව මෙන් ම මහජනතාව ස්තරායනය *(stratifying)* කිරීමේ ලා එයට ඇති හැකියාව ද අප අත්දැක තිබේ. එහෙත් ඒ සියල්ල අබිබවා යුක්තිය සහ පොදු යහපත ගැවසෙන අවකාශය ද සමාජය යි. කෙසේ වෙතත් 'සමාජය' යන්න සංකල්පීය වසයෙන්, ප්‍රතිමානික වසයෙන් සහ ප්‍රායෝගික වසයෙන් විනාශ කර දැමීම නවලිබරල්වාදී *(neo-liberal)* ආර්ථික හා දේශපාලන දර්ශනයේ අරමුණයි. *(නවලිබරල්වාදයේ එකී ආත්මාර්ථකාමී දේශපාලන දැක්ම ගැන අපි වෙන ම පරිච්ඡේදයකින් සාකච්ඡා කරමු.)* එහෙත් මානව සංහතියේ සාමූහික ප්‍රවර්තනය සහතික කළ හැක්කේ අප සියල්ලන්ගේ ම අන්‍යෝන්‍ය පැවැත්ම හිතකර ගෝලීය පරිසරය හා ඒකාබද්ධ කළ හැකි සංවිචාරණීය සමාජයක් ගොඩනැගීම මඟින් පමණි.

# 2. ආර්ථිකයේ නො දැක්ම

# - 8 -

## ප්‍රගතිය කෙබඳු විය යුතු ද?

අද පවතින ප්‍රජාතන්ත්‍රවාදී යැයි හඳුන්වා ගන්නා ආණ්ඩුක්‍රම තුළ මහජනයාගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඔවුන් වෙත ඉදිරිපත් කරන අතළොස්සක් වූ අපේක්ෂකයන් අතරෙන් වාරානුකූල ව නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට පමණක් සීමා වී ඇති බව අප දනිමු. මැතිවරණ ක්‍රමවල අසාර්ථක භාවයට තුඩු දෙන හේතු අතර පක්ෂ මඟින් අපේක්ෂකයන් ඉදිරිපත් කිරීමේ ක්‍රමයේ දුර්වලතා, මැතිවරණ සඳහා මුදල් ලබාගැනීමේ දූෂිත ක්‍රම සහ පක්ෂග්‍රාහී ජනමාධ්‍ය ආවරණය ප්‍රධාන වන බව අපි මුල් පරිච්ඡේදයේ දී සාකච්ඡා කළෙමු. බලය අත්පත් කර ගැනීම පාදක කරගත් දේශපාලන පංතියෙන් පැමිණෙන මේ නියෝජිතයන් විසින් බලය ග්‍රහණය කර ගනු ලැබීමෙන් පසු මහජනයා දර්ශනයෙන් අතුරුදහන් වී යයි. මහජනතාව යළි ඉස්මතු වීම අර නියෝජිතයන් සහ ඔවුන්ගේ අනුග්‍රාහක අර්ථපතියන් සලකන්නේ අනවශ්‍ය කන්කරච්චලයක් ලෙස ය. එවැනි හැම අවස්ථාවක දී ම තමන් වෙනුවෙන් කටයුතු කිරීමට සිය නියෝජිතයන්ට වරය දී ඇති බව මහජනතාවට මතක් කිරීමට දේශපාලන පංතිය නො වළහා කටයුතු කරයි.

16 වෙනි සිය වසේ ඉතාලියේ විසූ දේශපාලන උපදේශකයෙකු වූ මැකියාවෙල්ලි විසින් පුළුල් ව නිර්වචනය කර ඇති අන්දමට 'දේශපාලනය යනු බොරු කීමේ පරමාධිකාරී කලාවකි' *("a sovereign*

*art of lying*").[83] ඉටු කළ නො හැකි බොරු පොරොන්දු දීමට හැකි වීම බලය අත්පත් කර ගැනීමේ දේශපාලනය සඳහා අත්‍යවශ්‍ය දෙයක් ලෙස බොහෝ දේශපාලනඥයන් විසින් සලකනු ලැබීමෙන් එය කදිමට නිරූපණය වෙයි. එහෙත් දේශපාලනය යනු බොරු කීමේ රාජකීය කලාවක් නො ව සත්‍ය පිළිවෙතක් *(a truth procedure)* අනුගමනය කරන සදාචාරය, දයාව හා පොදු යහපත මුල්කරගත් සජ්ජන ක්‍රියාන්විතයක් විය යුතු ය. කොටින් ම ඉන් අදහස් වන්නේ දේශපාලනය යනු ඓන්ද්‍රිය ලෙස ම යුක්තිය පතා කරන අරගලයක් විය යුතු ය යන්නයි.

ෆ්‍රැන්සිස් ෆුකුයාමා පෙන්වා දෙන අන්දමට සියලු සමාජ සඳහා ප්‍රායෝගික ව මෙන් ම සදාචාරීය ව ද අවශ්‍ය වන්නේ රජය, නීතිය සහ වග වීම *(state, law and accountability)* යන සංයුක්ත සාධක තුන සමබර ව පවත්වා ගෙන යා හැකි දේශපාලන ක්‍රමයකි.[84] නීතියේ ආධිපත්‍ය සහ වග වීම විශේෂයෙන් අවශ්‍ය වන්නේ රජය අත්තනෝමතික වීමෙන් වැළැක්වීමට යි. එමෙන් ම සමාජයේ ආරක්ෂාව ආභ්‍යන්තරික ව හා බාහිර ව සහතික කිරීමට සහ පොදුවේ එකඟ වූ නීති ඵලදායක ව ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් බලයක් ද හැම සමාජයකට ම තිබිය යුතු ය. ඒ සමඟ ම තරාතිරම නො තකා සියලු පුරවැසියන් සම්බන්ධයෙන් නීතිය එක සේ ක්‍රියාත්මක කිරීම පිණිස එම බලය සමාජය විසින් නීත්‍යනුකූල ව නියාමනය කරනු ලැබිය යුතු ය. ප්‍රභූ පෙළැන්තියට හා ආණ්ඩුව කරවන අයට පමණක් සීමා නො වී රජය පුළුල් ප්‍රජාවගේ ඕනෑඑපාකම්වලට ද නිබඳ ව සවන් දිය යුතු ය. එමෙන් ම විවිධ දේශපාලන මතවාද, ආගමික හා ජනවාර්ගික බෙදුම්වලින් සමන්විත බහුත්වවාදී සමාජයක *(pluralistic society)* අනිවාර්යයෙන් ම පැන නැගිය හැකි ගැටුම් සාමකාමී ලෙස විසඳා ගත හැකි පිළිගත් ක්‍රමවේදයක් ද සමාජය විසින් පවත්වා ගෙන යා යුතු ය.

---

83 Badiou, Alain with Lancelin, Aude, (2019) In Praise of Politics, M*edf*ord: Polity Press, p.5

84 Francis, Fukuyama (2014). *Political Order and Political Decay.* London: Profile Books, p. 574 (KE)

රජය, නීතිය සහ වගවීම යන ඉහත කී මූලික සාධක තුන ඵලදායී ලෙස උපයෝගී කර ගත හැකි වන්නේ ඒ සම්බන්ධ කටයුතු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය වන ආයතන පද්ධතිය ගොඩ නගා ගැනීමෙනි. එම පද්ධතියට අයත් ආයතනවල කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම සියලු මානව සමාජවල මූලික අවශ්‍යතාවක් බව ෆුකුයාමා පවසයි. එම අවශ්‍යතාව බටහිර සංස්කෘතිය හෝ වෙනත් නිශ්චිත සංස්කෘතික කණ්ඩායමක් නියෝජනය කරන හෝ ඒ අනුව වෙනස් වන දෙයක් හෝ නො වේ. ඔහුට අනුව හොඳට හෝ නරකට හෝ නූතන 'අපුද්ගල රජය' *(impersonal state)* හැරෙන විට පොදු යහපත, සුපිළිවෙළ *(order)* සහ ආරක්ෂාව සහතික කරන ප්‍රභවය බවට පත් විය හැකි වෙනත් විකල්පයක් දැනට අපට නැත. නීතියේ ආධිපත්‍ය ආර්ථික කටයුතු සඳහා ද තීරණාත්මක ලෙස අවශ්‍ය කරන සාධකයකි. දේපළ අයිතිය සහ කොන්ත්‍රාත්තු සවිබල ගැන්වීම ආදිය පිළිබඳ නිසි නීති නොමැති ව දැන හඳුනන කුඩා කවයකට පමණක් සිය විශ්වාසය සීමා කර ගැනීම මගින් නිෂ්පාදකයින්ට හා ව්‍යාපාරිකයන්ට තම කටයුතු සාර්ථක කර ගැනීම අසීරු ය. ඒ නිසා නීතියේ ආධිපත්‍ය යනු සමාජයක පැවැත්මට අවශ්‍ය නිපැයුම් කටයුතු සහ අව්‍යාජ ව්‍යාපාරවල සාර්ථකත්වයට අත්‍යවශ්‍ය සාධකයකි.

කෙසේ වෙතත් ප්‍රජාතන්ත්‍රීය සහභාගිත්වය යනු හුදෙක් නින්දා ජනක, දූෂිත හෝ දුෂ්ට ආණ්ඩුවක් බිහි වීම වැළැක්වීමට පමණක් සීමා වූ ක්‍රියාන්විතයක් නො වේ. එයට පුද්ගලයාගේ අනුල්ලංඝනීය අයිතීන් නීතිය මගින් පූජනීයත්වයට පත්කර තිබෙනවා ද යන කාරණය ද වැදගත් ය. ඒ මගින් කාරකත්වය *(agency)* සතු අය වසයෙන් මිනිසුන්ට තිබිය යුතු අභිමානයට නිසර්ග වටිනාකමක් ද ලැබී තිබේ ද යන කාරණය ද එමෙන් ම වැදගත් ය. කාරකත්වය යනු සමාජ විද්‍යාවේ එන යෙදුමකි. කාරකත්වය යන්නෙන් අදහස් වන්නේ නිදහසේ තෝරා ගැනීම් කිරීමට සහ එම තෝරා ගැනීම් අනුව යුක්ති යුක්ත ව කටයුතු කිරීමට පුද්ගලයෙකුට ඇති හැකියාවයි. ඒ නිසා දේශපාලන කාරකත්වය යනු කෙනෙකුගේ ජීවිතය පොහොසත් සහ

පිරිපුන් කරන නිදහසේ මූලික පැතිකඩක් ලෙස අත්පත් කර ගත යුතු හැකියාවකි. කොටින් ම කාරකත්වය හිමි වීම ප්‍රගතියේ මූලික දර්ශකයකි. එහෙත් අනුග්‍රාහක සන්තෝසම් මත පැවැත්වෙන දූෂිත මැතිවරණ ක්‍රම මගින් ස්වායත්ත පුද්ගල කාරකත්වයක් සාක්ෂාත් කර ගත නො හැකිය. එය සාක්ෂාත් කර ගත හැකි වන්නේ සැමට යුක්තිය අත්පත් කර ගැනීම දේශපාලනයේ අරමුණ බවට පත් වූ විට ය.

මෙය මනෝරාජික සිතිවිල්ලක් නො වේ. යුක්තිය පදනම් කර ගත් දේශපාලනය යනු ප්‍රායෝගික ක්‍රියාකාරකම් සමුච්චයකි. එය සහභාගි වන්නන්, ක්‍රියාකාරීන්, සංවිධාන සහ ජනප්‍රිය ව්‍යාපාර අවශ්‍ය වෙන නිරන්තර ක්‍රියාවලියකි. එකී ක්‍රියාකාරකම් මගින් අදාළ ප්‍රජා සමූහය සත්‍ය වසයෙන් ම ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අභිමතාර්ථ ඉතා පැහැදිලි ව නිරූපණය විය යුතු ය. අත්තනෝමතික අධිකාරයන්ට හෝ විසඳිය නො හැකි බෙදීම් සහ විෂමතාවල ග්‍රහණයට ප්‍රජා සමූහය තල්ලු කිරීම දේශපාලනයේ කාර්ය නො විය යුතුය. ඒ වෙනුවට සියල්ලන් විසින් භුක්ති විඳිය යුතු යුක්තිය පිළිබඳ ප්‍රමිති මත පදනම් ව ප්‍රගතියේ දිශානතිය තීරණය කිරීමේ වගකීම තමන් වෙත පවරා ගත් ප්‍රජා සමූහයක් බිහි කර ගැනීම දේශපාලනයේ අභිප්‍රාය විය යුතු ය.

එහෙත් වසර 70 කට අධික කාලයක් තිස්සේ ලාංකේය ප්‍රභූ දේශපාලනයේ අත්දැකීම වී ඇත්තේ මැකියාවෙල්ලි විසින් හුවා දැක් වූ පරිදි දේශපාලනය යනු බොරු කීමේ රාජකීය කලාවකි යන්නයි. ඒ අතර යුක්තිය පැතූ දේශපාලන අරගල ද ඉඳහිට ඉස්මතු වූ අන්දම අප අත්දැක තිබේ.

උදාහරණයක් ලෙස අපේ හා සමීප පරම්පරාවේ තරුණ තරුණියෝ තම තම නැන පමණින් වටහා ගත් දේශපාලන මතවාදවලට අනුව යුක්තිගරුක යහපත් සමාජයක් ගොඩනගා ගැනීමේ අභිලාෂයෙන් දකුණේ කැරලි දෙකක් ද උතුරේ කැරැල්ලක් ද ගැසුවෝ ය. ඔවුන් අතරින් සැලකිය යුතු පිරිසක් මරා දමනු ලැබූහ.

ඒ කැරලි මර්දනයට යොදා ගත් අපේ ම තවත් තරුණ පිරිසක් හමුදා ඇඳුමින් ම මියගියහ. දැන් මේ සියලු දෙනා අභිවන්දනය කිරීමට ඒ ඒ පාර්ශව විසින් විප්ලවවාදීන්, මහ විරුවන්, රණවිරුවන් ආදී අභිධාන භාවිත කරන ලෙස ජීවත් ව සිටින අපට බල කළ ද සරල සත්‍ය නම් යෞවන වියේ දී මරණයට පත් වූ ඒ සියලු තරුණ තරුණියන් තමන් සතු ව තිබූ එක ම මනුෂ්‍යාත්මභාවය ප්‍රේම කිරීමකට, ප්‍රේමයට ලක් වීමකට, දරු සුරතල් බැලීමකට, දරුමුනුපුරන්ගේ ආදරයට ලක් වීමකට ද ඇතුළත් ව මහලු විය දක්වා පරිපූර්ණ කර ගැනීමකට ඉඩ නො දී ඔවුන්ට අකල් මරණයක් හිමි කර දීම ය.

දියුණුව, ප්‍රගතිය යනු හුදෙක් මනෝ මූලික මතිභ්‍රමයක් බව කෙනෙකුට පැවසිය හැකි ය. තවකෙක් එය සංස්කෘතියට සාපේක්ෂ ව තේරුම් ගත යුතු යැ'යි කියනු ඇත. බොහෝ දේශපාලනඥයන්ට අවිවාදයෙන් පිළිගැනීමට සිදු වන පරිදි ආර්ථික විද්‍යාඥයෝ එය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය, ඒක පුද්ගල ආදායමේ වැඩි වීම යනාදී වසයෙන් විස්තර කරනු ඇත. මෙවැනි නොයෙකුත් සංකීර්ණ වැල්වටාරම් නිසා ප්‍රගතිය කුමක්දැ'යි යන ප්‍රශ්නයට පිළිතුරු දීම අසීරු දෙයකැ'යි සාමාන්‍ය ජනයාට සිතෙන්නට පුළුවන. එහෙත් හාවඩ් සරසවියේ මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ස්ටීවන් පින්කර් සිය *Enlightenment Now: The case for Reason, Science, Humanism and Progress* නම් කෘතියෙන් ප්‍රකාශ කරන අන්දමට ප්‍රගතිය යනු කුමක් ද යන්න පිළිතුරු දීමට පහසු තම ප්‍රශ්නයයි.

පින්කර්ට අනුව ජීවත් වීම මරණයට පත් වීමට වඩා හොඳ බවට බොහෝ දෙනෙකු එකඟ වනු ඇත. එමෙන් ම රෝගී වීමට වඩා නිරෝගී වීම හොඳ බවත්, සාගින්නේ සිටීමට වඩා කුසට අහරක් ලැබීම හොඳ බවත්, හොඳ නිවසක් නරක නිවහනකට වඩා හොඳ බවත්, දුප්පත් වීමට වඩා තමන්ගේ සහ තම පවුලේ අවශ්‍යතාවලට සරිලන ආදායමක් ලැබීම හොඳ බවත්, අනතුරුවලට මූණ දීමට වඩා ආරක්ෂිත ව විසීම හොඳ බවත් පින්කර් පෙන්වා දෙයි. ඒ ක්‍රමය වෙනත් බොහෝ ක්ෂේත්‍රවලට ආදේශ කිරීමෙන් පින්කර් කියන

අන්දමට ප්‍රගතිය යනු කුමක් ද යන්න පිළිබඳ සෘජු මතයක් ඇති කර ගැනීම අපහසු නැත.

ඒ නිසා පින්කර් ට අනුව එකී හොඳ දේවල් විඳ ගැනීමට අපට ඇති හැකියාව අනුක්‍රමයෙන් වැඩි වී ඇත්නම් එයට ප්‍රගතිය, දියුණුව යැයි කිව හැකි ය. එහෙත් මේ හොඳ දේවල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ඒ සඳහා යොදා ගත හැකි භෞතික සම්පත් මත තීරණය වන බැවින් එම සම්පත් ප්‍රතිජනනය කිරීමක් සිදු නො වේ නම් එවැනි ප්‍රගතියක් පවා අසීමිත විය නො හැකි ය.

අනෙක් අතට පින්කර් සඳහන් කළ හොඳ දේවල්වල අනුක්‍රමික වැඩි වීම සමාජීය දියුණුවක් ලෙස සැලකිය හැකි වන්නේ ඒ හොඳ දේවල් ලබා ගැනීමට හා විඳ ගැනීමට ජන සමාජය තුළ ජීවත් වන සැම දෙනෙකුට ම කොතෙක් දුරට කොතෙක් කලක් අවකාශය හා හැකියාව ඇත් ද යන කරුණ මතයි. යුක්තිය මත පදනම් වන දේශපාලන සුසමාදර්ශයක මූලික ලක්ෂණයක් විය යුත්තේ එකී හොඳ දේවල් විඳ ගැනීමේ හැකියාව විෂමතාවකින් තොර ව හැම රටවැසියෙකුට ම අත්පත් කර දීමට කටයුතු කරන අතර ඒ නිසා හායනය *(depletion)* විය හැකි සම්පත් තිරසාර කිරීමේ වැඩපිළිවෙළක් දියත් කිරීමයි.

සිය විධි ක්‍රමය අනුව ප්‍රගතිය ලෙස නිර්ණය කරන හොඳ දේවලින් බොහෝමයක් මැන බැලිය හැකි දේවල් බව පින්කර් පෙන්වා දෙයි. උදාහරණයක් වසයෙන් 1950 දී පුද්ගලයෙකුගේ සාමාන්‍ය ආයු කාලය අවුරුදු 48 ක් වූ නමුත් අද එය අවුරුදු 71 දක්වා වැඩි වී තිබේ.

මේ කාලය තුළ ලෝකය පුරා බිලියන 2 කට වැඩි ජනතාවක් පළමු වතාවට සනීපාරක්ෂිත ජල සැපයුමක් සහ වැසිකිළි පහසුකම් ලබා ගැනීමට සමත් ව ඇත. මේ සියල්ල ම සිදුවී තිබෙන්නේ ලෝක ජනගහනය සියයට 40 කින් වැඩි වෙන අතරතුරේ දී බව පින්කර් අපට මතක් කරයි. එහෙත් ප්‍රගතිය පිළිබඳ පින්කර්ගේ විග්‍රහයේ ඇති

මූලික අඩුපාඩුවක් නම් මේ සා ප්‍රගතියක් අත්පත් කර ගැනීමේ දී පෘථිවියට ගෙවීමට සිදු ව ඇති වන්දියේ ඵල විපාක වළක්වා ගැනීම පිණිස කටයුතු කිරීම ඒ ප්‍රගතිය විසින් මුළුමනින් ම නො සලකා හරිනු ලැබීමයි.

අපේ අතීතය කොතරම් අසුන්දර වුවද මෙතෙක් මානව වර්ගයා අනුගමනය කර ඇති මාර්ගය ඔස්සේ ඉදිරියට ගිය විට අනාගතය ප්‍රියජනක විය හැකි බව පින්කර් පවසයි. දුප්පත්කම තුරන් කිරීම, ආදායම් අසමානතාව, සාමය හා ආරක්ෂාව වැනි ක්ෂේත්‍රවල විසඳිය යුතු ප්‍රශ්න තිබුණ ද පෘථිවිය මත ජීවත් වන ජනගහනයේ ප්‍රමාණය සැලකූ විට ඉතිහාසය පුරා මිනිසුන් විසින් අත්පත් කර ගනු ලැබූ දියුණුවට වඩා අද පවතින තත්වය විශිෂ්ට බව පින්කර් තර්ක කරයි. පින්කර්ට අනුව නූතන ජීවන ක්‍රමය ඊට පෙර පැවති ජීවන තත්වයට වඩා කොහොමටත් හොඳ ය. තම තර්කය තහවුරු කිරීමට සෞඛ්‍ය, අධ්‍යාපනය, සුවපහසුව ඇතුළු විවිධ කේෂ්ත්‍ර සම්බන්ධයෙන් ඔහු ඉදිරිපත් කරන ප්‍රගතිය පිළිබඳ සංඛ්‍යාලේඛන සැබැවින් ම ඒත්තු යන සුලුය. එහෙත් අධ්‍යාපනය, ඖෂධ හා වෛද්‍ය ප්‍රතිකාර, පෝෂණය ආදිය සම්බන්ධයෙන් ඇති සමාජ විෂමතා පින්කර් ඉදිරිපත් කරන සර්ව සුභවාදී චිත්‍රය මගින් නිරූපණය නොවේ.

පින්කර් මේ හා සමාන තර්කයක් සිය *Better Angels of Our Nature* නම් කෘතියේ ප්‍රචණ්ඩත්වය අඩු වීම සම්බන්ධයෙන් ද ඉදිරිපත් කර තිබුණි. ඔහු ඉදිරිපත් කළ කාරණා වලට අනුව ඉපැරණි සමාජ වල පැවැති ගෝත්‍රික යුද්ධ හා සසඳන විට නූතන සමාජ වල ප්‍රචණ්ඩ ගැටුම් සැලැකිය යුතු ලෙස අඩු වී තිබේ. ඒ නිසා ප්‍රචණ්ඩත්වය අඩු වීම ප්‍රගතියේ දර්ශකයක් ලෙස සැලැකිය හැකිය. මෙහි දී වුව ද ප්‍රචණ්ඩත්වය පිළිබඳ පින්කර්ගේ නිර්ණය මුහුණට මුහුණ ලා කෙරෙන ගෝත්‍රික යුද්ධ මගින් නිරූපණය වන පමණට සීමාවේ. එහෙත් නූතන ප්‍රචණ්ඩත්වය ගුවනින් හෙලන බෝම්බ, කාලතුවක්කු, මිසයිල, ඩ්‍රෝන වැනි දුරස්ථ අවි මගින් කෙරෙන දහස් සංඛ්‍යාත ජනයා අනාථ කරවන සිදුවීම් ය. ඇෆ්ගනිස්තානය, සිරියාව, යේමනය, බුරුමය

සහ යුක්‍රේනය ඒ සම්බන්ධ ඉතා සමීප උදාහරණයෝ ය. ඒ හැර සමාජ ප්‍රචණ්ඩත්වය පැත්තෙන් බැලුවොත් විරුද්ධවාදීන් මර්දනය කිරීම, ජන ගහනය විතැන්වීම්, වර්ණ භේදය, ආගමික හා වර්ගවාදී ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත සලකා බැලූ විට ප්‍රචණ්ඩත්වයෙන් මිදීමේ ප්‍රගතිය පින්කර් කියන තරම් ම සුභවාදී නොවිය හැකිය.

ප්‍රගතිය පිළිබඳ පින්කර්ගේ එලඹුම අභියෝගයට ලක් කරන ඩේවිඩ් ග්‍රේබර් සහ ඩේවිඩ් වෙන්ග්‍රෝ පින්කර්ගේ සංඛ්‍යා ලේඛන තාර්කික වෙන්නේ ඒවා උකහා ගත් පදනම ද සලකා බැලුවොත් පමණක් බව අපට මතක් කරයි.[85] පින්කර් සංඛ්‍යා ලේඛන මඟින් තහවුරු කිරීමට තැත් කරන ප්‍රගතියේ පදනම බටහිර ශිෂ්ටාචාරය යැ'යි සැලකුව හොත් බටහිර ශිෂ්ටාචාරය සියල්ලන්ගේ ම ජීවිත (කලු මිනිසුන්ගේ සහ සිරියානු අනාථයන් ද ඇතුළත් ව) යහපත් බවට පත් කර ඇත් දැයි ග්‍රේබර් සහ වෙන්ග්‍රෝ ප්‍රශ්න කරති. අවසානයේ දී පින්කර්ගේ මතය මිනිසුන්ගේ සතුට මැනිය හැක්කේ කෙසේ ද යන අසීරු ප්‍රශ්නයට ලඝු වන බවත් එක ජීවන ක්‍රමයකට වඩා අනෙක් ජීවන ක්‍රමය පරිපූර්ණ, සංතුෂ්ඨිමත්, ප්‍රසන්න එකක් දැයි තීරණය කර හැකි හොඳම ක්‍රමය එක පුද්ගලයෙකුට ජීවන ක්‍රම දෙක ම අත්විඳ ගැනීමට ඉඩ සලසා දීම බවත් ග්‍රේබර් සහ වෙන්ග්‍රෝ යෝජනා කරති.

පින්කර් මෙහි දී නිවැරදි නම් අත්‍යන්ත දරිද්‍රතාවෙන් පෙළෙන්නේ යැ'යි සැලකිය හැකි ගෝත්‍රික සමාජයක රැකවරණය හා බටහිර ශිෂ්ටාචාරයේ සෞභාග්‍යමත් සුරක්ෂිත බව යන දෙක ම අත්විඳ ඇති තැනැත්තෙකු අනිවාර්යයෙන් ම බටහිර ශිෂ්ටාචාරයේ සුරක්ෂිත බව තෝරා ගත යුතු ය. ආර්ථික හා දේශපාලන සරණාගතයන් වසයෙන් දිවි පරදුවට තබා බටහිර රටවලට සංක්‍රමණය වීමට බොහෝ අය තැත් කරන්නේ ඒ නිසා විය හැකියැ'යි කෙනෙකුට තර්ක කළ හැකි ය. එහෙත් ඒ අතරම එසේ සංක්‍රමණිකයන් බවට පත්වන අය අතරින් බොහෝ දෙනෙකු කලක් ගත වන විට බටහිර ශිෂ්ටාචාරයට

85 Graeber, David and Wengrow, David (2021) *The Dawn of Everything: A new History of Humanity,* New York: Allen Lane, p 43 KE

අධ්‍යාත්මිකව අනුගත වනවාට වඩා සිය නිජබිම්වල ජීවත් වන අය පරයා තම නිජබිම ගැන දේශප්‍රේමී බව පෙන්වීමට කැමති ඇයි ද යන ප්‍රශ්නයට ද පිළිගත හැකි පිළිතුරක් තිබිය යුතු ය.

කෙසේ වෙතත් ආනුභාවික දත්ත අනුව පින්කර්ගේ නිගමනය නිවැරදි නො වන බව ග්‍රෙබර් සහ වෙන්ග්‍රෝ පෙන්වා දෙයි. ඒ සඳහා ඔවුන් යොදා ගන්නා දත්ත අතර ඇමෙරිකාවේ ස්වදේශික ගෝත්‍රිකයන් අතර හැදී වැඩී නැවත බටහිර ශිෂ්ටාචාරයට අන්තර්ග්‍රහණය වීමට තැත් කළ අය පිළිබඳව දත්ත ඇතුළත් විය. සුදු ජාතිකයන් විසින් ගෝත්‍රික පවුල්වලින් පැහැර ගෙන ගිය ස්වදේශික දරුවන්ගේ මෙන් ම ගෝත්‍රිකයන් විසින් සුදු ජාතික පවුල්වලින් පැහැර ගෙන ගිය සුදු ජාතික දරුවන්ගේ වැඩිහිටි අත් දැකීම් ද ඒ අතර විය. එහි දී අනාවරණය වූ වැදගත් ම කරුණ වූයේ සුදු ජාතික ද ගෝත්‍රික ද යන්න නො තකා බොහෝ විට සිදු වූයේ සැලකිය යුතු කලක් ගෝත්‍රික අත්දැකීම් වින්දනය කළ සියල්ලෝ ම ගෝත්‍රික සමාජවලට ම ආපසු සම්බන්ධ වීමට ඉත සිතින් කැමති වීමයි.

එවැනි අත්දැකීම්වලට මුහුණ දුන් අය දැනුම් තේරුම් වියට එළඹුණු විට තමන්ට වඩා උචිත වන ශිෂ්ටාචාරය තෝරා ගැනීමේ අරගලයක යෙදුණු අය ලෙස සැලකිය හැකි ය. ඒ අතරින් යළිත් ගෝත්‍රික ජීවිතය වැළඳ ගැනීමට තීරණය කළ අය ඒ සඳහා දුන් හේතු ප්‍රගතිය පිළිබඳ ව පින්කර්ගේ අවධානයට යොමු නොවූ වැදගත් මානයක් හෙළිදරව් කරයි. ඔවුන් අතරින් ඇතමෙක් ස්වදේශික ඇමෙරිකානු ගෝත්‍රිකයන් අතර ලිංගික නිදහස ඇතුළු ව නිදහස පිළිබඳ ව පැවති විවෘත ආකල්පය අගය කිරීම යළි ගෝත්‍රික ජීවිතය තෝරා ගැනීමට හේතුවක් වසයෙන් දැක්වීය. නිරන්තරයෙන් ම ධනය සහ ඉඩම් අත්පත් කර ගැනීමට තැත් කිරීමට සිදුවීමෙන් නිදහස් වීම ද ගෝත්‍රික ජීවිතයෙන් ලද එක් වැදගත් වරප්‍රසාදයක් ලෙස සඳහන් විණි. තවත් අය තම සමාජය තුළ කිසිවකු දුප්පත් කමින්, කුස ගින්නෙන් සහ අසරණ බවින් පෙළීමට ස්වදේශික ගෝත්‍රිකයන් ඉඩ නො තැබීම යළි ගෝත්‍රික ජීවිතයට පිවිසීමේ හේතුව වසයෙන්

දැක්වීය. දුප්පත් කමට පත්වේ යැ'යි ඔවුන් තුළ බියක් ඇතිවීමකට වඩා එහි දී විශේෂයෙන් වැදගත් වූයේ කිසිවකුටත් අත්‍යන්ත අසරණ බවකට මුහුණ පෑමට සිදු නො වන එවැනි සමාජයක ජිවත් වීම ඉතා ප්‍රසන්න දෙයක් ලෙස ඔවුන් සැලකීමයි.

තවත් සමහරු යළිත් ගෝත්‍රික ජීවිතය තෝරා ගැනීමට තීන්දු කළේ කිසිම වෙනස්කමක් නො දක්වා ස්වදේශික ඉන්දියානු ගෝත්‍රිකයෝ පිටස්තරයන් සිය පවුල්වල සාමාජිකයන් බවට පත් කර ගැනීම ඔවුන් දිරි ගැන්වූ බැවිනි. ගෝත්‍රික සමාජවලට එක් වන පිටස්තරයන්ට ප්‍රධාන පවුල්වල සාමාජිකයන් වීමට පමණක් නො ව ගෝත්‍රික නායකයන් බවට පත්වීමට පවා අවස්ථාව ලැබේ. බටහිර ප්‍රවර්ධකයන් සමාන අවස්ථාවන් සැලසීමේ අවශ්‍යතාව ගැන නොකඩවා දේශනා කරන අතර මෙකී ස්වදේශික ගෝත්‍රවල එය යථාර්ථයෙන් ම පැවතුණි. එහෙත් වඩාත් ම පොදු හේතුව වසයෙන් බොහෝ අය දැක්වූයේ යුරෝපීය ජනාවාසවල නැති ආදරයක්, සජ්ජන සත්කාරයක්, රැකවරණයක් සහ ඒ සියල්ල පරයන සංතුෂ්ටියක් ස්වදේශික ඇමෙරිකානු ප්‍රජා කණ්ඩායම් තුළ විසීමෙන් විඳ ගැනීමට හැකිවීමයි.[86]

මේ අත්දැකීම් විමසන කෙනෙකුට ඇතිවෙන හැඟීම නම් ඇමෙරිකානු ස්වදේශිකයන්ගේ ගෝත්‍රික ජීවිතය යුරෝපීය ඇමෙරිකානුවන් සිය සුලු නගරවල සහ ජනාවාසවල ගත කළ ජීවිතයට වඩා බෙහෙවින් ආකර්ෂණීය වූ බවයි. එය නැවත යුරෝපීයන් අතරට පැමිණීමෙන් ලබාගත හැකි දෙයක් නො වීය. ජනාවාසවල යුරෝපීයන්ගේ ජීවිතය නොකඩවා වැඩ කිරීමෙන් හෙම්බත් වූ, ඒකාකාරී සහ සංකල්පීය වසයෙන් හිස් වූ ජීවිතයකි. ඒ නිසා ඊට විකල්ප වූ ජීවිතයක් කොයි තරම් සිත් අලළන සුන්දර එකක් දැයි හිතා ගැනීමට නො හැකි වීම ජීවිතයට වඩා ජීවිතය පිළිබඳව අපේ ඇති පරිකල්පනීය සීමා නිසා ඇතිවන්නකැ'යි ග්‍රේබර් සහ

86 Graeber, David and Wengrow, David (2021) *The Dawn of Everything: A new History of Humanity,* New York: Allen Lane, pp. 46-48 KE

වෙන්ග්‍රෝ පවසයි. මේ නිසා පෙර අපර කොයි දිගින් ආවත් ප්‍රගතිය යන්න හුදෙක් භෞතික හා තාක්ෂණික විසඳුම්වල කාර්යක්ෂමතාවට පමණක් ලඝු කළ හැකි දෙයක් නො වේ. ප්‍රගතියේ සලකුණ ලෙස සමාජයේ සද්ගුණවත්බව අපි වඩ වඩා අවධාරණය කල යුත්තේ එබැවිනි.

කෙසේ වෙතත්, පින්කර් හොඳ දේවල් ලෙස සඳහන් කරන බොහෝ අභිලාෂ අපේ ලැයිස්තුවල ද තිබේ. එහෙත් ඒ දේවල් සම්බන්ධයෙන් අප ලබා ඇති ප්‍රගතිය අසමමිතික පමණක් නො ව අහිංසකයන්ගේ අධ්‍යාත්මික පරිහානිය පවා සාධාරණීකරණය කරන්නක් ද වෙයි. අධ්‍යාපන අවස්ථා සම්බන්ධයෙන් බොහෝ නාගරික හා ග්‍රාමීය පාසල් අතර ඇති සමාජ විෂමතා වටා උද්ගත ව ඇති තත්වය ඊට එක් උදාහරණයකි. ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට අපේ දරුවන්ට ඇති අමාරුකම නගරවල ඇති 'හොඳ පාසලකට" සිය දරුවන් යැවීමට ඇති අවශ්‍යතාව හමුවේ අල්ලස් ගැනීමට හා අල්ලස් දීමට සූදානම් ගුරු දෙ ගුරුන්ගේ ආකල්පවලින් නිරූපණය වෙයි. හොඳ පාසලකට සිය දරුවන් ඇතුළත් කර ගැනීම පිණිස අල්ලස් දීමට පමණක් නො ව කූට ලේඛන සකස් කිරීමට සූදානම් දෙමව්පියන්ගෙන් බොහෝ අය සාමාන්‍ය ජීවිතයේ දී බොහෝ විට ගුණගරුක යහපත් පුද්ගලයෝ ය.

සමස්තයක් ලෙස බැලූ විට වෙළඳපොළ සීමාවලට යටත් ව බොහෝ සේවා පහසුකම් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව සැබෑවක් නමුත් මිහිපිට ජීවත් වන මිනිසුන් අතුරෙන් සෑම නව දෙනෙකුගෙන් ම එක් අයකුට තව මත් ප්‍රමාණවත් ආහාරයක් නො ලැබේ. පහසුවෙන් සුව කළ හැකි පාචනය සහ මැලේරියාව වැනි රෝගවලින් 2019 දී පමණක් ලොව පුරා වයස අවුරුදු පහට අඩු දරුවන් මිලියන 5.2 ක් මිය ගිය බව ගණන් බලා තිබේ.[87] ලෝකවාසී ජනතාවගෙන් බිලියන දෙකක් එනම් ලෝක ජනගහනයෙන් 26% ක්

87 https://www.who.int/news-room/fact-sheets/detail/children-reducing-mortality Retrieved on 08 Jan 2021

සිය අසීරු ජීවිතය ගැට ගසා ගන්නේ දිනකට ඇමරිකානු ඩොලර් තුනකට අඩුවෙන් ලැබෙන ආදායමකිනි.

ඒ අතර ලොව පුරා මිලියන හැත්තෑවකට අධික තරුණ තරුණියෝ රැකියා විරහිත භාවය නිසා ළත වෙති. නිසි සමාජ ආරක්ෂණ ක්‍රමයක් නැතිකම සහ නිතිපතා වැඩි වෙන සමාජ අසමානතාව නිසා මේ නැති බැරිකම් තව තවත් තීව්‍ර වී ඇත. ඒ අතර 2008 සිදු වූ මූල්‍යය කඩා වැටීම නිසා ඇති වූ ලෝක ආර්ථික අර්බුදය මිනිසුන් මිලියන ගණනාවකට රැකියාව අහිමි කළේ ය. වාරික ව ගෙවීමේ පදනම මත මිලට ගත් නිවාසවලින් අති විශාල ඇමෙරිකානු පවුල් සංඛ්‍යාවක් පිට මං කරනු ලැබී ය. ඒ ආර්ථික අර්බුදය ලොව පුරා මිලියන ගණනකගේ ඉතිරි කිරීම් සහ විශ්‍රාම පාරිතෝෂික නැතිහංග කර දැමී ය. ඒ අතර ලෝකය පුරා අසමානතා පරතරය පුදුමාකාර ලෙස වැඩි වී තිබේ. කෙසේ වෙතත් එසේ ආර්ථිකයේ ඇති වූ කඩා වැටීම් තිබිය දීත් 2015 වන විට ලෝකයේ පොහොසත් ම 1% ඉතිරි 99% ම සතු මුලු සේසතේ ම එකතුවට වඩා වැඩි ධන සම්භාරයක් අත්පත් කර ගැනීමට සමත් වූහ.

නොකඩවා ඇති වූ ආර්ථික වර්ධනය නිසා සංවර්ධනය වෙන රටවල අත්‍යන්ත දිළිඳු බව මෑත කාලයේ දී සැලකිය යුතු පමණින් අඩු වී තිබුණත් එකී ආර්ථික වර්ධනය විසින් ම එම රටවල මිලියන ගණනක දිළිඳු ජනතාව එම වර්ධනයේ නියම ප්‍රතිලාභවලින් පිට මං කර තිබේ. 2015 වන විට ලෝකයේ දිළිඳු ජනතාවගෙන් බහුතරය ජීවත් වූයේ වාර්ෂික ඒක පුද්ගල ආදායම අනුව ලංකාව ද ඇතුළුව මැදි ආදායම් ලබන රටවල් ලෙස වර්ගීකරණයට ලක් වූ රටවල ය. මේ දිළින්දන් අතර බහුතරය ජීවත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී යැ'යි සැලකෙන රටවල්වල නමුත් වර්ධනයේ ඵල ප්‍රයෝජන සාධාරණ ලෙස බෙදී යන ප්‍රතිපත්ති සම්පාදනයක් සඳහා බලපෑමක් කිරීමට තරම් ඇත්ත දේශපාලන බලයක් ඔවුන්ට නැත. උත්පාදනය වන ධනය සාධාරණ ව භුක්ති විඳීමට සමාජ වැඩපිළිවෙළක් සහතික කළ හැකි කාර්යක්ෂම ආදායම් බදු ක්‍රමයක් ලංකාව වැනි රටවලට

නැත. ඒ වෙනුවට දක්නට ලැබෙන්නේ නිස්සාරිත ආදායමෙන් වැඩි කොටසක් දේශපාලන පංතිය විසින් වංචා කරනු ලැබ අක් වෙරළ *(offshore)* හොර මුදල් තිප්පලවල්වල ආරක්ෂිත ව තබා ගැනීමයි.

ඉහළ ආදායම් ලබන සංවර්ධිතයැ'යි සැලකෙන රටවල් හා සසඳන විට මැදි ආදායම් රටවල පුද්ගලික ආදායම අනුව ආදායම් බදු අය කිරීම සෑහෙන දුර්වල මට්ටමක පවතී. සංසන්දනාත්මක ව බැලූ විට ඉහළ ආදායම් ලබන රටවල පොදු සමාජ ආරක්ෂණය සඳහා බදු ආදායමෙන් වැඩි පිරිවැයක් වෙන් කරන අතර ඒ වෙනුවට බොහෝ මැදි ආදායම් ලබන රටවල ඇත්තේ දේශපාලන අනුග්‍රහය රඳවා තබා ගැනීම අරමුණ කරගත් දූෂණයට තුඩු දෙන 'සමෘද්ධිය' වැනි වැඩපිළිවෙළවල් ය. මේ නිසා මැදි ආදායම් ලබන ලංකාව වැනි රටවල ප්‍රතිපත්තිය වී ඇත්තේ ආදායම් විෂමතාව අඩු කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනවා වෙනුවට විවිධ අනුග්‍රහාත්මක වැඩසටහන් මඟින් දේශපාලන අවනතභාවය තහවුරු කර ගැනීම පිණිස ආදායම් විෂමතාව පවත්වා ගෙන යෑමයි.

දැනට ඇති ආදායම් විෂමතා පරතරය පිළිබඳ කැපී පෙනෙන උදාහරණයක් වන්නේ ඉන්දියාවයි. ලෝකයේ විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රට ලෙස සැලකෙන ඉන්දියාව වසර 2009 දී අඩු ආදායම් කාණ්ඩයේ රටක සිට මැදි ආදායම් කාණ්ඩයේ රටක් බවට පත් වුවත් එහි ඇතිහැකි හා නැතිබැරි අය අතර ආදායම් විෂමතාවේ පරතරය දශ ලක්ෂ සංඛ්‍යාත අත්‍යන්ත දිළින්දන්ගේ දුක් සුසුම් මැද බිලියනපතියන් සංඛ්‍යාව අතින් ලෝකයේ තුන්වැනි තැන ගැනීමෙන් පෙන්නුම් කරයි.

මෙසේ තීව්‍ර වන සමාජ විෂමතාවලට අතිරේක ව අප වසන පෘථිවියට සිදුවී ඇති හානිය ද සුළු පටු නො වේ. මනුෂ්‍යයන්ගේ ධනලෝභී අකටයුතුකම් නිසා පෘථිවි ජීව පද්ධතියට බරපතළ පීඩනයක් එල්ල වී තිබේ. මහ පොළොවේ ජීව වස්තුවල පැවැත්මට හිතකර මට්ටමට වඩා සෙන්ටිග්‍රේඩ් අංශක 0.8 කින් ලෝක උෂ්ණත්වයේ සාමාන්‍යය දැනටමත් වැඩි වී තිබෙන අතර හරිතාගාර

වායු විමෝචනය සැලකිය යුතු ලෙස අඩු නො කළ හොත් වසර 2100 වන විට එය සෙන්ටිග්‍රේඩ් අංශක 4.5 කින් වුවද වැඩි වීමට ඉඩ ඇති බව 2021දී නිකුත් කළ *IPCC (The Intergovernmental Panel on Climate Change)* හෙවත් 'දේශගුණ විපර්යාසය පිළිබඳ අන්තර් ආණ්ඩු අනුමණ්ඩලයේ' හයවැනි තක්සේරු වාර්තාවෙන් අනතුරු හඟවයි.

හරිතාගාර වායු නිකුත් වීම පාලනය කිරීම හෝ නො කිරීම පිළිබඳ විද්‍යාත්මක දත්ත පදනම් කොට පුරෝකථනය කළ හැකි සෙනාරි *(scenarios)* හෙවත් පරිදර්ශන පහක් අනුව ඇති විය හැකි ඵල විපාක පිළිබඳ විස්තර මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර තිබේ. කාබන් ඩයොක්සයිඩ් නිකුත් කිරීම නො වළහා බලවත් ලෙස අඩු කරන සෙනාරියක සිට 2050 වන විට අමතර කාබන් ඩයොක්සයිඩ් විමෝචනය සම්පූර්ණයෙන්ම උදාසීන කොට 21 වැනි සිය වසේ දෙවැනි භාගය කිසිදු අමතර කාබන් විමෝචනයකින් තොර කිරීම දක්වා ද කිසිදු පාලනයකින් තොර ව කාබන් ඩයොක්සයිඩ් විමෝචනය නො කඩවා ඉහළ ගොස් 2050 වන විට අදට වඩා දෙගුණයකින් වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය වැඩී වී සහ 2100 වන විට කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය තුන් ගුණයකින් ඉහළ යෑමෙන් ඇති විය හැකි තත්වය දක්වා ද විවිධ සෙනාරි පහක් එම වාර්තාවෙන් ඉදිරිපත් කර තිබේ. ඒ එක් එක් සෙනාරියට අනුව ඇතිවෙන දේශගුණික විපර්යාස මට්ටම ද වාර්තාවෙන් විස්තර කරයි. ඒ අනුව ගෝලීය උෂ්ණුසුමේ සාමාන්‍ය වැඩි වීම වසර 2100 වන විට සෙන්ටිග්‍රේඩ් අංශක 1.4 නො ඉක්මවා පාලනය කර ගැනීම හෝ පාලනයකින් තොර ව එය සෙන්ටිග්‍රේඩ් අංශක 4.5 කින් ඉහළ යෑම දක්වා ඇති විය හැකි සෙනාරි පහක ඵල විපාක වාර්තාවේ සඳහන් වෙයි. අත්‍යන්ත සිනාරිවලට අනුරූප ව ඇති විය හැකි තාප තරංග, නියඟ, සුළි සුළං, අත්‍යධික වර්ෂාපතනය වැනි ව්‍යසනික වායුගෝලීය සිද්ධිවල සංඛ්‍යාත්මක වැඩි වීම සහ හිම තලා, නිත්‍ය තුහිනය *(permafrost)* සහ ග්ලැසියර දිය වීම, සාගර ජල මට්ටම ඉහළ යෑම සහ සාගර ආම්ලීකරණය වැනි සාගරයේ සහ හිම ගෝලයේ ඇතිවිය

හැකි විවිධ වෙනස්කම් ද විද්‍යාත්මක දත්ත පදනම් කොට *IPCC* වාර්තාවෙන් විස්තර කර තිබේ.[88]

ඒ මඟින් පෙන්නුම් කරන්නේ කාබන් විමෝචනය අවම කර ගැනීමට කඩිනමින් කටයුතු නො කළ හොත් මින් පෙර නො ඇසූ විරූ බරපතළ ගංවතුරු, නියඟ, සුළි කුණාටු සහ මුහුදු ජල මට්ටම ඉහළ යෑමේ තර්ජනයකට නුදුරු අනාගතයේ දී මුහුණ දීමට මිනිසුන්ට සිදු වන බවයි. කෘෂිකර්මය සඳහා ගෙන ඇති බිම් ප්‍රමාණයෙන් 40% දැනටමත් බරපතළ ලෙස නිසරු බවට පත් ව ඇති අතර 2025 වන විට ලෝකවාසී මිනිසුන් හැම තුන් දෙනෙකුගෙන් දෙදෙනෙකුට ම අඩු ජල සම්පත් ඇති ප්‍රදේශවල ජීවත් වීමට සිදු වනු ඇත. ඒ අතර රසායන ද්‍රව්‍ය, පොලිතින්, ප්ලාස්ටික් සහ කාර්මික, කෘෂිකාර්මික, වාසභූමි හා නාවික ක්ෂේත්‍රවල අපද්‍රව්‍ය, අසීමිත ව මසුන් මැරීම සහ ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන්ගේ බෝවීම නිසා සාගරවලට සිදුවී ඇති හානිය ද සුලු පටු නො වේ. මේ අපද්‍රව්‍යවලින් 80% ක් ම සාගරයට එක් වන්නේ ගොඩ බිමෙනි. ගෝලීය උණුසුම ඉහළ යෑමට අනුකූලව සාගර ජලයේ උෂ්ණත්වය ද ඉහළ යෑමෙන් ඇතැම් මුහුදු ජීවීන් වර්ග නෂ්ට ප්‍රාප්තියට මුහුණ දී සිටින අතර සාගර මතුපිට වායුව උණු ව ඉහළ නැගීමෙන් සුළි සුළං සහ කුණාටු ඇතිවීමේ විභවය විශාල වසයෙන් ඉහළ ගොස් තිබේ.

අද ජීවත් වෙන අයගෙන් බොහෝ දෙනෙකු 2050 දී ද ජීවත් වෙන බැවින් ගෝලීය උණුසුම ඉහළ යෑමෙන් ඇතිවිය හැකි ව්‍යසන පිළිබඳ දැනට මත් තක්සේරු කර ඇති ගණන් හිලව් අතිශයින් බරපතළ ය. ඒත් අනාගත අභියෝග මීටත් වඩා බරපතළ විය හැකි ය. දැනටමත් බිලියන 7.3 ක් වන ලෝක ජනගහනය 2050 වන විට බිලියන 10 දක්වා ඉහළ යනු ඇත. එය 2100 වන විට බිලියන එකොළහක් දක්වා ඉහළ යෑමට නියමිත ය. දැනට පවතින ක්‍රමය එලෙස ම පැවතුනොත් 2050 දක්වා ලෝක ආර්ථික නිෂ්පාදනය වාර්ෂිකව 3% බැගින් වර්ධනය වී 2037 වන විට එය දැනට ඇති

88 https://www.ipcc.ch/assessment-report/ar6/ Retrieved on 15 August 2021

ප්‍රමාණය මෙන් දෙගුණයකින් ද 2050 වන විට තුන් ගුණයකින් ද වැඩි වනු ඇතැ'යි ගණනය කර තිබේ. ඒ අතර අද බිලියන 2 කක් ව ඇති ලෝක මධ්‍යම පංතිය, එනම් දිනකට ඩොලර් 10 සිට ඩොලර් 100 දක්වා වියදම් කිරීමට හැකියාව ඇති අය, 2030 වන විට බිලියන 5 දක්වා වැඩි වනු ඇත. ඒ අනුව ඇතිවෙන ඉල්ලීම සපුරා ගැනීම සඳහා පාරිභෝගික ද්‍රව්‍ය මෙන් ම ගොඩනැගිලි ද්‍රව්‍ය ද අතිවිශාල වසයෙන් අවශ්‍ය වනු ඇත. විකල්ප විසඳුම් කරා නො ගියොත් විශාල හානියකින් තොර ව මිහිමත ඇති සම්පත්වලින් එම අවශ්‍යතා පිරිමසා ගැනීමේ හැකියාව අවම වෙමින් පවතී. විසි එක් වන සියවස මුල දී අපට හඳුනා ගත හැකි මේ ප්‍රවණතාව අපට සරිලන ලෙස හැඩ ගස්වා ගැනීමට අපේ ඉදිරි ගමන සඳහා අවශ්‍ය වන චින්තනය කුමක් විය යුතු ද?

ස්ටීවන් පින්කර් අනුගමනය කරමින් අප හොඳ දේවල් වසයෙන් කලින් සඳහන් කළ බොහෝමයක් දෑ ජන සමාජයේ ඇති හැකි අතළොස්සකට අඩු පාඩුවක් නැති ව භුක්ති විඳීමට හැකිව තිබෙන බව අපි දනිමු. මේ නිසා එකී දේවල් සාධාරණ ව සියල්ලන්ට ම භුක්ති විඳ ගැනීමට හැකි වන සේ සමාජ විෂමතා අවම කර ගැනීම අද දවසේ යුක්තිය පාදක කරගත් දේශපාලනයේ කේන්ද්‍රීය කාරණය විය යුතුයි. මේ අරමුණ ඇතිව මින් පෙර දැරූ මුල් පෙළේ උත්සාහයක් වූයේ වසර සියයකට පෙර රුසියානු බෝල්ෂේවික් විප්ලවයේ ඵලයක් ලෙස කළ අසාර්ථක අත්හදා බැලීමක් වූ රාජ්‍ය කේන්ද්‍රීය සෝවියට් ආර්ථික ක්‍රමයයි. එකල බෝල්ෂේවික් විප්ලවයට නායකත්වය සැපයූ අය අතර පවා ධනවාදී ආර්ථික ක්‍රමයට විකල්ප ප්‍රායෝගික ආර්ථික ක්‍රමයක් පිළිබඳ මුල දී නිශ්චිත අදහසක් නො තිබුණ බව රොබට් සර්විස් ඔහුගේ *Comrades - Communism( A World History* නමැති කෘතියෙහි පැහැදිලි කරයි. 20 වන සියවසේ මැද භාගය වන විට සෝවියට් ආර්ථික ක්‍රමය ඉහළ වර්ධනයක් දැක්වූයේ සෝවියට් නායකයන් විසින් ආර්ථිකය රාජ්‍ය කේන්ද්‍රීය ව සංවිධානය කරනු ලැබීම නිසා ම නො ව සාර් පාලනය යටතේ ඉතා පසුගාමී රටක් ව

පැවති රුසියාව සෝවියට් ක්‍රමය යටතේ කඩිනම් කාර්මිකකරණයට ලක් වීම නිසා ඇති වූ ආර්ථික වර්ධනය හේතු කොට ගෙන ය. එහෙත් 1980 වන විට සෝවියට් ආර්ථිකයේ වර්ධනය ඇනහිට සෝවියට් ක්‍රමය රුසියානුවන්ට එපා වන තැනකට පත් වී තිබුණි.

සෝවියට් ආර්ථික විධි ක්‍රමයේ අසාර්ථකත්වයත් නවලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික චින්තනයෙන් පන්නරය ලද සමාජවාදය නවීකරණය කිරීම යනුවෙන් හැඳින්වෙන චීන රාජ්‍ය ධනවාදයේ නැගීම සිදු විය. ඒ සමඟ සමාජ රක්ෂණය සහ ආර්ථික ඵලදායකත්වය සාධාරණ ලෙස බෙදී යෑම අරමුණු කර ගනිමින් කලක් කම්කරුවන්, වෘත්තීය සමිති ආදිය මත පදනම් වූ සාම්ප්‍රදායික වමේ ඉතුරු බිතුරු කොටස් සමාජ විෂමතාව අවම කිරීමේ දේශපාලන ඉලක්කය අතහැර දමා ඇති බව පෙනේ.

මෑතක් වෙන තෙක් ම ධනවාදි ආර්ථිකය විටින් විට උච්චාවචනයට ලක් වෙමින් සිය දරා ගැනීමේ හැකියාව පෙන්නුම් කළේ ය. එහෙත් දශක ගණනාවක් තිස්සේ උත්කර්ෂවත් ලෙස රාජ්‍ය නියාමනයෙන් මුදවා තබන ලද නව ලිබරල් ආර්ථික දර්ශනය ද සමඟ දැන් එය පෙර නො වූ විරූ අර්බුදකාරී තත්වයකට මුහුණ දී තිබේ. සම්භාව්‍ය ලිබරල්වාදය විසින් හඳුන්වා දුන් සමානාත්මතාව, සදාචාරය හා මානව අයිතිවාසිකම් කතිකාව නවලිබරල්වාදය සහමුලින්ම අවඥාවට ලක් කර තිබේ. නියෝ *(neo)* හෙවත් නව යන විශේෂණයෙන් සමන්විත වන අනෙකුත් බොහෝ වාද මෙන් ම නවලිබරල්වාදය යන යෙදුම නිරූපණය කරන්නේ සම්භාව්‍ය ලිබරල්වාදය විසින් හඳුන්වා දුන් පොදු සේවා ප්‍රමුඛ සමානාත්මතා සාරධර්ම විස්ථාපනය කොට යුක්තිය සහ සමාජ වග වීම වෙනුවට ධනලෝභී ස්වාර්ථකාමය ආදේශ කිරීමයි. මේ නවලිබරල්වාදී ආර්ථික දෘෂ්ටියේ මහානිසංස ලැබූවන් අතර ඒකාධිපති ආණ්ඩු යටතේ පොදු සම්පත් කුණු කොල්ලයට මිල දී ගත් අතළොස්ස, අයථා ලෙස මූල්‍ය වෙළඳපොළ ග්‍රහණයට ගෙන ඇති ජාවාරම්කරුවන්, ණයවරපත් මත සුවිශාල ලාභ උපයන බැංකුකරුවන් සහ විවිධාකාර මුදල්

විශුද්ධිකරුවන් ප්‍රධාන වේ. එහෙත් ඒ අතර ආර්ථික ව්‍යාධිවලට ඇති හොඳම විසඳුම නවලිබරල්වාදයයි යන මතය අභියෝගයට ලක් කළ හැකි ඒත්තු යන සුලු විකල්ප ආර්ථික දැක්මක් වර්ධනය කර ගැනීමට වම අපොහොසත් වී ඇත. ඒ වෙනුවට නවලිබරල්වාදී නිර්බාධක වෙළඳපොළ ආර්ථිකය සුළු සුළු වෙනස්කම් සහිත ව සාම්ප්‍රදායික වමේ ආර්ථික චින්තනය බවට ද පත් විය.

සාමාන්‍යයෙන් ආර්ථිකයක මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්ය වසයෙන් සැලකෙන්නේ සිය ධනෝපායන කටයුතු සඳහා අරමුදල් අවශ්‍ය කරන අයට මුදල් ඉතුරු කරන්නන්ගෙන් අරමුදල් ලබා දීම පිණිස මැදිහත්කරු වසයෙන් කටයුතු කිරීමයි. මෙය යහමින් බිත්තර වී ඇති ගොවියෙකු සිය අසල්වැසියාගේ ප්‍රයෝජනය සඳහා බිත්තර වී ලබා දුන් කාලයේ පැවති සරල ආර්ථිකයක සිට චිරාත් කාලයක් තිස්සේ පැවත එන මූලධර්මයකි. නූතන ආර්ථිකයක මේ මැදිහත්කාරකම *(intermediation)* ඉටු වෙන්නේ බොහෝ විට නිවසක් මිලට ගැනීමට, විශ්‍රාමික අවදිය සඳහා හෝ සිය දරුවාගේ උසස් අධ්‍යාපනය සඳහා හෝ මුදල් ඉතුරු කරන කෙනෙකුගේ ඉතුරු කිරීම් බැංකුවක මැදිහත් වීමෙන් ව්‍යාපාරික අංශයේ ආයෝජනවල යොදවා ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ විට දී ය.

එහෙත් නව රැකියා නිර්මාණය කරමින් සිය කටයුතු පුළුල් කිරීමට බලාපොරොත්තු වන සමාගම් සහ ඉතුරු කරන්නන් අතර මැදිහත්කාරකම ඉටු කිරීමේ සාම්ප්‍රදායික කටයුත්තෙන් බැංකු කෙමෙන් ඈත් වීමේ ප්‍රවණතාවක් මෑත කාලයක සිට දක්නට ලැබුණි. මෙය ප්‍රකට ව දක්නට ලැබුණේ බැංකුවල කටයුතු මූල්‍ය ආර්ථිකය මුල් කොට විකාශය වීම ඇරඹීමත් සමඟ ය. ඒ අනුව බැංකු වඩා උත්සුක වූයේ ඉතුරු කරන්නන් සහ කුටුම්බ අතර මැදිහත් වෙමින් ක්‍රෙඩිට් කාඩ් හෙවත් ණයවරපත් මඟින් යහමින් ණයට බඩු ගෙන තමන් උපයන මුදලට වඩා වැඩියෙන් වියදම් කිරීම පිණිස ගනුදෙනුකරුවන් පොලඹවා ගැනීමයි. ණයවරපත් මඟින් ණය ලබා දීම නිසා ඉහළ පොලියක්, ප්‍රමාද ගාස්තු හා බැංකු අයිරා ගාස්තු ආදි

විවිධ ගාස්තු අය කරමින් පාරිභෝගිකයන් පහසුවෙන් කොල්ල කෑමට බැංකුවලට හැකි විය. වෙළෙන්දන්ගෙන් සහ පාරිභෝගිකයන්ගෙන් අය කරන සේවා ගාස්තුවලට අතිරේක ව බැංකු ණයවර පත් සඳහා ණය අත්තිකාරමක් පාසා සාමාන්‍යයෙන් 4% ක ගනුදෙනු ගාස්තුවක් හා 21% ක වාර්ෂික පොලියක් අය කරති. බැංකුවල මේ ගොදුරු භක්ෂක කටයුතුවලට ඉඩ දෙමින් බැංකු නියාමනය ද තව තවත් ලිහිල් විය. ඒ අනුව බැංකුවලට සිය වෙළඳපොළ බලය යොදා ගනිමින් පාරිභෝගිකයන්ගෙන් මෙන් ම වෙළෙන්දන්ගෙන් ද එක ම වර ඉහළ ගාස්තු අය කර ගත හැකි විය. ණය දීමේ දී සමාගම්වලට වඩා ඉතා ලෙහෙසියෙන් පාරිභෝගිකයන් සූරාකෑම කළ හැකි බව බැංකු වටහා ගත්තේ ය. කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරවලට ණය දෙනවාට වඩා ණයවරපත් *(Credit Card)* මඟින් පාරිභෝගිකයන්ට ණය දීම වාසිදායක බව බැංකු වටහා ගත්තේ ය. ඒ නිසා සිය නවෝත්පාදන හා ව්‍යාපාරික කටයුතු වැඩිදියුණු කර ගැනීම පිණිස ප්‍රධාන බැංකුවලින් ණය ලබා ගැනීමේ අසීරු කම්වලට විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර නිරන්තරයෙන් මුහුණ දුන්නේ ය. උදාහරණයක් ලෙස එක්සත් ජනපදයේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත සඳහා ණය ලබා දීම 2008 ආර්ථික අර්බුදය අවදිය හා සසඳන විට ඉන් පසුව 14% කින් අඩු විය.

2020 මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නො වන ව්‍යවසායන් අතරින් 99% ක් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර වන අතර රටේ මුලු සේවා නියුක්තියෙන් 45% අයත් වන්නේ මේ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායවලට ය. මහ බැංකු වාර්තාවෙන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසාය දියුණු කිරීමට ඇති මූලික බාධාවක් වන්නේ ඒවාට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීමට තිබෙන සීමිත ප්‍රවේශයන් ය. බැංකු විසින් අවදානම් මූල්‍යකරණය මග හැර යනු ලැබීම සහ අධික ඇප සුරැකුම් ඉල්ලා සිටීම කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසාය සඳහා ණය ලබා ගැනීමට ඇති බාධා අතර

මුලින් ම සඳහන් වේ. මහ බැංකු වාර්තාවට අනුව 2020 අවසානයේ දී බැංකු විසින් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසාය සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය පෞද්ගලික අංශයට ලබා දි ඇති මුලු ණය ප්‍රමාණයෙන් 11%ක් පමණි.

මැදිහත්කාරකම ඉටු කරනු වෙනුවට කෙටි කාලීන ව වඩා වාසි සහගත සූදුකාර ව්‍යාපෘතිවල නියැලීමට බැංකු ක්ෂේත්‍රය උත්සුක වී තිබේ. ලාස් වේගාස් වැනි සූදුකාර නගරවල සරල ව ඔට්ටු ඇල්ලීම යනුවෙන් හඳුන්වන ක්‍රියාව බැංකු ක්ෂේත්‍රයට ආදේශ වන්නේ *Derivatives* යන මෝස්තරකාර නමිනි. ඉතා සරල ව කිව හොත් 'ඩෙරිවේටිව්ස්' යනු ඒ සඳහා අවධාරණීය වත්කම් *(underline assets)* වසයෙන් සැලකිය හැකි පොලී අනුපාතය, විනිමය අනුපාතය, එසේත් නැතිනම් ඛනිජ තෙල් වැනි භාණ්ඩයක මිල උච්චාවචනය සම්බන්ධයෙන් මූල්‍ය ආයතන විසින් ඔට්ටු අල්ලනු ලැබීමයි. මේවා සාමාන්‍යයෙන් මිලියන ගණන් වන ඔට්ටු ය. මේ ඔට්ටු වෙළඳපොළ පවතින්නේ ඒ හා අදාළ බැංකු ගිවිසුම් කිසියම් දුරකට රජය මඟින් රක්ෂණය වන බැවිනි. ඒ අනුව ඩෙරිවේටිව්ස් නිසා බැංකුවලට අති විශාල පාඩුවක් සිදු වු විට රජය විසින් හානිපූරණය කොට බැංකු බේරා ගනු ලැබේ. එහෙත් වාසි ලැබෙන අවස්ථාවල දී ඩෙරිවේටිව්ස් ඔට්ටුවල මුලු ලාභය ම බැංකුව සතු වේ.

පාර්ලිමේන්තුවේ පොදු දේපළ කමිටු වාර්තාවකින් හෙළි වූ පරිදි එකඟ වූ නියමිත මිලකට අමු තෙල් මිලට ගැනීමට 2008 දී ලංකා ඛනිජ තෙල් සංස්ථාව බැංකු සමඟ ඇති කරගත් හෙජින් ගිවිසුම මේ සම්බන්ධයෙන් උදාහරණයකට ගත හැකි ය. එම හෙජින් ගිවිසුම ඇති කර ගත්තේ අනුක්‍රමයෙන් ඉහළ යන අමු තෙල් මිල නිසා ඛනිජ තෙල් සංස්ථාවට ඉදිරියේ දී අමු තෙල් මිලදි ගැනීමට වැය කිරීමට සිදු වන වැඩිපුර මුදල ගිවිසුම අනුව බැංකුවලට දරා ගැනීමට සිදුවෙතැ'යි යන බලාපොරොත්තුවෙනි. බැලූ බැල්මට ම මෙය ඛනිජ තෙල් සංස්ථාවට වාසිදායක ගිවිසුමකි. එහෙත් බැංකු ඛනිජ තෙල් සංස්ථාවට වඩා නුවණක්කාර ය. එවැනි ගිවිසුම්වලට

බැංකු එළඹෙන්නේ භාණ්ඩයක මිල වෙනස් වීම ගැන සිය සමීක්ෂණ අනුව ඇති කර ගන්නා තක්සේරු කිරීම් පදනම් කොට ගෙන ය. ඒ ගිවිසුමට අනුව තෙල් මිලට ගත යුතු කාලයේ දී ඛනිජ තෙල් සංස්ථාව බලාපොරොත්තු නොවූ ලෙස අමු තෙල්වල මිල අඩු විය. එහෙත් හෙජින් ගිවිසුම නිසා එහි වාසිය ලබා ගත්තේ ඛනිජ තෙල් සංස්ථාව නො ව එය සමඟ හෙජින් ගිවිසුමට එළඹුණු වාණිජ බැංකුව විසිනි. මේ ගිවිසුම සම්බන්ධයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිවූ ආන්දෝලනය නිසා ගිවිසුම අනුව බැංකුවලට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමට ඛනිජ තෙල් සංස්ථාව මුලින් තැත් කළ ද ජාත්‍යන්තර බේරුම් කාර මණ්ඩලයේ තීරණය අනුව අවසානයේ දී ගිවිසුමට අනුව බැංකුවලට රුපියල් බිලියන 10.2 ක් ගෙවීමට ඛනිජ තෙල් සංස්ථාවට සිදු විය.

මෙවැනි අකටයුතු නිසා බැංකුවලට අධික ලාභ ලැබෙන නමුදු රටක ආර්ථිකයේ දියුණුවට එමඟින් ලැබෙන දායකත්වය ඉතා අල්ප ය. ඛනිජ තෙල් සංස්ථාව හෙජින් කටයුතු සඳහා පොලඹවා ගැනීමෙන් ඇත්ත වසයෙන් ම බැංකුව ආර්ථිකයට හානි කළේ ය. ලෝක මට්ටමෙන් ගත් විට ධනවතුන්ගේ මුදල් සඟවන අක් වෙරළ *(offshore banking)* බැංකු කටයුතු මඟින් බදු පැහැර හැරීමට උදව් කිරීම, එක ම ව්‍යාපාර ක්ෂේත්‍රයක තරඟ කරන සමාගම් ඒකාබද්ධ කොට ඒකාධිකාර ඇති කිරීමට මැදිහත් වීම ආදී කටයුතු අතින් ද බැංකු කරන හානිය සුළුපටු නො වේ. දැවැන්ත සමාගම්වල බදු ගෙවීම පැහැර හැරීමට බැංකු උදව් වන ආකාරය සුප්‍රකට ඇපල් සමාගම උදාහරණයකට ගෙන සිය ඡැදවකැ, *Power and Profits* නම් කෘතියේ ජෝසප් ස්ටිග්ලිට්ස් මෙසේ විස්තර කරයි:

> **"ඇපල් සමාගම එහි උපාය කෞශල්‍යය යොදා ගන්නේ හුදෙක් ආකර්ෂණීය නිෂ්පාදන හඳුන්වා දීම සඳහා පමණක් නො ව බදු ගෙවීම පැහැර හැරීම සඳහා ද යොදා ගනී. ඇපල් සමාගම සතු ව ඇති දැවැන්ත ධන සම්භාරය සැලකූ එහි ඇතැම් කොටස්කරුවෝ ලාභාංශ වසයෙන් තමන්ට අය විය යුතු මුදල් වහා ම ගෙවන ලෙස ඇපල් සමාගමෙන් ඉල්ලා සිටියහ. 2017 ට පෙර පැවති බදු නීතියට අනුව ලාභ මුදල්**

පිටරටක තැන්පත් කර තිබෙන විට ඇපල් සමාගමට බදු ගෙවීමට සිදු නො වේ. එහෙත් එම මුදල ඇමෙරිකානු එක්සත් ජනපදය තුළට ගෙන ආ විට ඒ සඳහා සාමාන්‍යයෙන් ගෙවිය යුතු සමාගම් බදු රජයට ගෙවිය යුතු විය. ඒ නිසා රටින් පිට තැන්පත් කර ඇති ලාභ මුදල උපයෝගී කර ගන්නවා වෙනුවට ඇපල් සමාගම කළේ ලාභාංශ ගෙවීම සඳහා සිය රටේ මූල්‍ය වෙළඳපොළට පැමිණ අවශ්‍ය මුදල බැංකුවලින් ණයට ලබා ගැනීමයි. ඒ අනුව තමන් සතු රටින් පිට තැන්පත් කළ ධනය රට තුළට ගෙන ආ විට ගෙවිය යුතු වූ බදු ආදායම රජයට අහිමි කිරීමට ඇපල් සමාගමට හැකි විය. එහෙත් බැංකුවල උදව්වෙන් ණයට ගත් මුදලෙන් සිය කොටස් කරුවන්ට ලාභාංශ ගෙවීමට ඇපල් සමාගමට හැකි විය." [89]

ආර්ථික විද්‍යාඥ මරියානා මස්සුකාටෝ සිය *Entrepreneurial State* නමැති ග්‍රන්ථයේ සවිස්තරව පෙන්වා දෙන පරිදි ඇපල් සමාගමේ නිෂ්පාදන බොහෝමයකට මුල් වූයේ රාජ්‍ය ආයතනවල මැදිහත් වීම මත හඳුන්වා දෙන ලද තාක්ෂණයයි. එහෙත් සිය ලාභය අයර්ලන්තය වැනි විදේශීය රටවල අක් වෙරළ *(offshore)* ගිණුම්වල ආරක්ෂිත තබා ගැනීමට පෙලඹීම මඟින් රජයෙන් ගනු මිසක් රජයට දෙනු නැති බව ඇපල් සමාගම නිරන්තරයෙන් පෙන්වා තිබේ. ස්ටිග්ලිට්ස් පෙන්වා දෙන පරිදි සමාගම්වල සමාජ වගකීම පිළිබඳ මුල් ම කොන්දේසිය විය යුත්තේ නිසි පරිදි බදු ගෙවීමයි. එය පැහැර හැරීමට සමාගම්වලට උදව් කිරීම බැංකු විසින් කරනු ලබන තදබල අකටයුත්තකි.

මේ නිසා තිරසාර ආර්ථික සංවර්ධනයකට වැඩි වැඩියෙන් අවශ්‍ය වන්නේ අකටයුතුකම්වලින් මුදල් උපයන ගොදුරු භක්ෂක බැංකු හා මූල්‍ය ආයතන නො ව ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් මඟින් බිහි කරන ප්‍රතිභාපූර්ණ නිර්මාණශීලී ව්‍යවසායකත්වයක් සඳහා අත හිත දෙන මූල්‍ය ප්‍රතිපත්තියකින් නියාමනය වන බැංකු සහ මූල්‍ය ආයතනයි. එවැනි ව්‍යවසායකත්වයක් සාර්ථක වීමට නම් නවෝත්පාදනය හා නව නිෂ්පාදන හඳුන්වා දීම මෙන් ම ප්‍රධාන කොට ම ඒවා සාර්ථක ව වෙළඳපොළට ඉදිරිපත් කිරීම සඳහා ආයෝජනය

89 Stiglitz, Joseph (2012) People, Power and Politics, New York: W.W.Norton and Company, p 103

කිරීමේ හැකියාව ව්‍යවසායකයාට තිබිය යුතු ය. ස්ටිග්ලිට්ස් පැහැදිලි ව පෙන්වා දෙන පරිදි ආර්ථිකය දියුණු කළ යුත්තේ නිෂ්පාදනය නව්‍යකරණය කිරීමෙන් හා වැඩි දියුණු කිරීමෙන් මිස ආර්ථික විද්‍යාඥයන් 'බදු කුලිය' හෙවත් *Rent* යනුවෙන් හඳුන්වන හම්බ කිරීමකින් තොර ව ලබන බදු කුලී අපේක්ෂිත *(rent seeking)*[90] ආදායම් වලින් නො වේ. එහෙත් නව ලිබරල්වාදයෙන් ආභාසය ලද කොල්ලකාරී මූල්‍ය වාදයක් ප්‍රමුඛ කොට කටයුතු කරන බැංකු හා මූල්‍ය ආයතන ක්‍රමයක් තබා ගෙන එය කළ නො හැකි ය.

කෙසේ වෙතත් 2008 ඇති වූ මූල්‍ය ක්ෂේත්‍රයේ කඩාවැටීමෙන් පසු නවලිබරල්වාදී ආර්ථික ක්‍රමය පිළිබඳ ආර්ථික විශේෂඥයන් අතර තිබූ අත්‍යන්ත උත්කර්ෂය සැලකිය යුතු ලෙස පහ ව ගොස් ඇත. එහෙත් නවලිබරල් ආර්ථික ක්‍රමයේ කොල්ලකාරී ඵලයක් ලෙස බිහි වූ සල්ලිකාර මාෆියාව බොහෝ රටවල දේශපාලන දේහය මෙහෙයවන්නන් බවට පත් වෙමින් තිබේ. පරණ ප්‍රජාතන්ත්‍රවාදී වහන්තරාව ඉවත දමමින් විචාරය වෙනුවට ආවේගය උපයෝගී කර ගන්නා වර්ගවාදී අනන්‍යතා දේශපාලන මාදිලියක් ඔවුන්ගේ බලය පවත්වා ගැනීමේ දී ජනමතය දිනා ගැනීමට නිරන්තරයෙන් යොදා ගනු ලැබේ.

---

90 බදු කුලී අපේක්ෂිත (*rent seeking*) කටයුතු යනු අලුතින් ධන සම්පත් නිපදවීමකින් තොරව තමන් සතු ධනය වැඩි කර ගැනීමට කරන කටයුතු යි. බදු කුලී අපේක්ෂිත කටයුතු වල ප්‍රතිඵල වන්නේ සම්පත් අනිසි ලෙස යොදා ගැනීම, ධන සම්පත් නිපදවීම අඩු වීම, රාජ්‍ය ආදායම අඩු වීම, ආදායම් විෂමතා වැඩි වීම ආදිය නිසා ආර්ථික කාර්යක්ෂමතාව අඩු වීම යි.

# - 9 -

## ධනවාදය බටහිරින් ආවේ ඇයි ?

වර්තමාන ආර්ථික චින්තනය බොහෝ දුරට ධනවාදය බිහි වීමට සමාන්තර ව විකාසනය වූවකි. සරල ව කිව්වොත් ධනවාදය, ධනවාදී ආර්ථිකය යන යෙදුම් අප යොදන්නේ 'ධනවාදය වනාහී හුදෙක් ධන හිමියාට හොඳ ලාභයක් උපයා ගැනීම මූලික පරමාර්ථය කරගත් සමාජ-ආර්ථික-දේශපාලනික දර්ශනයක් ය' යන අර්ථයෙනි. ධනවාදය බිහි වීමට පෙර පැවති ආර්ථික ක්‍රම හුදෙක් හොඳ ලාභයක් ඉපයීම අරමුණු කර ගෙන සංවිධානය වු ඒවාට වඩා එදිනෙදා ස්වයං පරිභෝජනය පිණිස භවභෝග හා භාණ්ඩ නිපදවීම, භාණ්ඩ හුවමාරු වෙළඳාම හෝ වැඩ වසම් සේවා සැපයීම වැනි කටයුතු මුල් කර ගෙන සංවිධානය වූ ඒවා යි.

අනෙකුත් හැම පූර්ව ධනවාදී සමාජයක් මෙන් ම බටහිර යුරෝපීය සමාජය ද ධනවාදය උද්ගත වීමට පෙර වෙනස් වූයේ ඉතා මන්දගාමී ව ය. එකල හැම සමාජයක් ම පාහේ සංවිධානය වී තිබුණේ ශත වර්ෂ ගණනාවක් තිස්සේ එක ම ආකාරයක ප්‍රාථමික තාක්ෂණයක් යොදා ගත් ගොවිතැන් කටයුතු පදනම් කර ගෙන ය. හස්ත කර්මාන්ත හා වාණිජ කටයුතු කෙරුණේ ඉතා සීමිත ව ය.

ධනවාදය ඇරඹුණේ දහසය හා දාහත් වන ශත වර්ෂයේ බ්‍රිතාන්‍ය ඇතුළු අද බෙල්ජියම සහ නෙදර්ලන්තය යනුවෙන් හැඳින්වෙන රටවල් ද ඇතුළත් වන බටහිර යුරෝපයේ ය. එය

චීනයේ හෝ ඉන්දියාවේ ඇති නොවී බටහිර යුරෝපයේ ඇති වුණේ ඇයි? යන්න නිම නො වන විවාදයකි. වාණිජ සහ කාර්මික කටයුතු සම්බන්ධයෙන් චීන ප්‍රභූ පැලැන්තිය තුළ පැවති පිළිකුල, බටහිරයන් විසින් ඇමෙරිකාව සොයා ගනු ලැබීමේ වාසිය, සාම්ප්‍රදායික කතෝලික පල්ලියේ ආගමික ආධිපත්‍යට එරෙහි ව මාටින් ලූතර් හඳුන්වා දුන් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදය මෙන් ම බ්‍රිතාන්‍ය සතු ව දැවැන්ත ගල් අඟුරු නිධි පවතින බව සොයා ගැනීම වැනි නොයෙකුත් හේතු ඒ විවාදය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබේ. තවත් මතයකට අනුව ධනවාදය බටහිරෙන් ඇරඹී තහවුරු වීමට වැදගත් සාධකයක් වූයේ බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර යුරෝපීය රටවල් විසින් යටත් විජිත අත්පත් කර ගැනීම ය.

බටහිර ධනවාදී දියුණුවට මූලික වූ කරුණු මොනවා ද යන්න සම්බන්ධයෙන් ඉහත සඳහන් පරිදි විවිධ මත පවතින නමුත් අසම්පූර්ණ විය හැකි වුව ද ඒ සම්බන්ධයෙන් වඩාත් ම කෙටි පිළිතුර විය හැක්කේ 'කරුණු කාරණා විමසීම සංවාදාත්මක තර්ක බුද්ධියට *(dialogical reason)* අනුව සිදුවිය යුතු බව බටහිර සමාජයේ දැනුවත් කොටස් අතර අනුක්‍රමයෙන් පිළිගැනීමට ලක් වීම බටහිර දියුණුවට මුල් වූ බවයි. ඒ අනුව එතෙක් පැවති ආධානග්‍රාහී හෙවත් අන් මත නො ඉවසන සුලු අධිකාරිවාදී ආගමික හා වැඩ වසම් විස්තර කිරීම් වෙනුවට හේතුවාදී තර්කනය මත පදනම් වූ නිදහස් චින්තනය දිරි ගැන්විණි. බටහිර නො වන රටවල හේතුවාදී තර්ක බුද්ධිය කිසි දිනක භාවිත නොවී යැ'යි ඉන් අදහස් නො වේ. උදාහරණයක් ලෙස සියවස් ගණනාවකට පෙර සිට නාගර්ජුන ඇතුළු බොහෝ ඉන්දියානු දාර්ශනිකයෝ තර්ක ගෝචර ලෙස දැනුම ලබා ගැනීමේ ප්‍රමාණ ශාස්ත්‍රය ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, අර්ථපත්ති සහ අනුපලබ්ධි ආදී වසයෙන් කොටස් කර දැක්වූහ. එහෙත් එකී තර්කන සම්ප්‍රදාය බොහෝ කොට භාවිත වූයේ ලෞකික කරුණුවලට වඩා පාරභෞතික හා දාර්ශනික මතවාද සම්බන්ධයෙනි. එහෙත් බටහිර තර්කන ප්‍රවේශය දර්ශනයට පමණක් සීමා වූවක් නො වී ය. එමඟින් එදිනෙදා

ජීවිතයට සෘජු ව සම්බන්ධ වූ දේවල් හා විශ්වාස ද ප්‍රශ්න කිරීමට ලක් විය. එහෙත් එය ක්‍රිස්තියානි ආගමට සහමුලින් එරෙහි වන තර්ක බුද්ධියක් ලෙස  සැලැකීම ද නො මග යෑමකි. තර්කනය මඟින් ඇතිවූ ඥානෝද්දීපනය  නිසැක ලෙස ම පල්ලිය විසින් පතුරවා තිබූ ඓතිහාසික සහ දාර්ශනික මිථ්‍යා සහ ඒ මත සදාචාරයේ නාමයෙන් පවත්වා ගෙන ගිය ප්‍රජාපීඩනයට අභියෝගයක් වූ බව සැබවි. ඒ හැර නූගත් මිනිසුන් අතර පැවති මිථ්‍යා ඇදහිලි  හා විශ්වාසවලට ද තර්ක බුද්ධිය එරෙහි විය. එහෙත් ඥානෝද්දීපනය පල්ලිය තුළ ද සිදුවිය. ක්‍රිස්තියානි ආගමේ එන අධිස්වාභාවික ඇදහිලි දුබල කොට ආචාරධර්මීය හා සදාචාරීය ඉගැන්වීම්වලට වැඩි අවධානයක් යොමු කිරීමෙන් තර්ක බුද්ධි ගෝචර ලෙස ක්‍රිස්තියානි ආගම පරිවර්තනයකට ලක් කිරීමට ද ප්‍රයත්න දැරිණි[91].  ඊට සමාන්තර ව තර්ක බුද්ධිය ප්‍රමුඛ කොට බිහි වූ විද්‍යාත්මක ක්‍රමවේදය නිසා ස්වාභාවික නියාම ධර්ම සහ ලෞකික ජීවිතයට බෙහෙවින් බලපාන නවෝත්පාදන ගැන උනන්දුව ද පෙරට වඩා වැඩි විය.

නූතන යුගයේ බටහිර බුද්ධිමය ආධිපත්‍යය ලෝකය පුරා පැතිරීමට මූලික ව හේතු වූයේ ද ලෞකික ජීවිතය සම්බන්ධයෙන් තර්ක බුද්ධියට ලැබූ එම ප්‍රමුඛත්වය යි. මෙසේ සම්ප්‍රදාය පරයා තර්ක බුද්ධිය ප්‍රමුඛ වීම එක්වර සිදු වූවක් නො ව සියවස් ගණනාවක් තිස්සේ සිදු වූ පරිවර්තනයක ඵලයකි. මේ බුද්ධිමය පිබිදීමේ මූලික ලක්ෂණ ඇති වන්නට පටන් ගත්තේ 13 වැනි සියවසේ සිට *Renaissance* හෙවත් පුනරුදය ඇරඹීමත් සමගයි. වචනාර්ථයෙන් ගත් විට *Renaissance* යන්නෙහි තේරුම 'යළි ඉපදීම' යන්න යි. ආගමික හා වැඩවසම් සීමා ඉක්මවා විමර්ශනය කිරීමේ ජීව ගුණය සමග මානව කුතුහලය උත්කර්ෂණයට නැංවූ ක්‍රියාවලියක් ලෙස පුනරුදය සංකල්පගත කළ හැකි බව පුනරුද යුගයේ ඉතාලිය ගැන ප්‍රමාණිකයෙකු සේ සැලකෙන යාකොබ් බර්ක්හාඩ්ට් පවසයි[92].

91 Robertson, Richie, The Enlightenment: *The Pursuit of Happiness,* London: Allen Lane, 2020 p. 27 (KE)

92 Burkhardt J, *The Civilization of the Renaissance in Italy,* (London: Penguin, 1990)

ආර්ථික සහ සංස්කෘතික භූවමාරුවීම්වල කේන්ද්‍රීය ස්ථාන ලෙස නගර සංවර්ධනය සිදුවීම ද යුරෝපයේ අඳුරු මධ්‍ය කාලීන යුගය අවසන් වීමේ ලා තීරණාත්මක සාධකයක් විය. යුරෝපයේ මධ්‍ය කාලීන යුගය සංලක්ෂිත වූයේ ඉඩකඩම් සමඟ ගොවියන් ද අයත් කර ගෙන සිටි බලසම්පන්න රදල වැඩවසම් ආධිපත්‍යයෙනි. ඒ වැඩවසම් සමාජය යැපුම් ගොවිතැන, සමාජය පුරා පැවති අසාක්ෂරතාව මෙන් ම සංස්කෘතික වසයෙන් ආගමික ආධිපත්‍යය මූලික ලක්ෂණය කරගත් පල්ලියට සුවිශාල දේශපාලන බලයක් තිබූ බෙහෙවින් මන්දගාමී සමාජයක් විය.

ඒ අතර නව වෙනි සියවසේ සිට දහතුන්වැනි සියවස දක්වා ම විද්‍යාව සහ බුද්ධිමය විමර්ශනය ගැන උනන්දුවක් දැක්වූ අයගේ ගමනාන්තය වූයේ යුරෝපය නො ව මැද පෙර දිග වර්තමාන ඉරාකයේ බැග්ඩෑඩ් නුවර යි. එකල ඥානයේ මධ්‍යස්ථානය ලෙස සැලකුණු බැග්ඩෑඩ් නගරය මුස්ලිම් කාලිෆ්වරයාගේ පාලනය යටතේ පැවතුණ කාලිෆෙට අධිරාජ්‍යයේ අගනුවර යි. පසු කලෙක යුරෝපීය භාෂාවන්ට පරිවර්තනය කරන තෙක් ප්ලේටෝ, ඇරිස්ටෝටල්, පයිතගෝරස් සහ යුක්ලීඩ් ආදී ග්‍රීක ශාස්ත්‍රඥයන්ගේ මුල් කෘති සුරක්ෂිත ව පැවතුණේ ඒවා කාලිෆෙටයේ දී අරාබි භාෂාවට පරිවර්තනය කොට භාවිත කරමින් තිබූ නිසා ය. 1258 දී මොන්ගෝල් ආක්‍රමණය නිසා බැග්ඩෑඩ් නුවර විනාශ වීමත් සමඟ කාලිෆෙට අධිරාජ්‍යයේ ස්වර්ණමය යුගය ද අවසන් විය. කෙසේ වෙතත් යුරෝපීය මධ්‍ය කාලීන යුගයේ නිමාව ගැන ඉතිහාසඥයන් අතර ද පැහැදිලි එකඟත්වයක් නැත. ඒ නිසා 1492දී ක්‍රිස්ටෝබල් කොලොන් හෙවත් කොලොම්බස් 'නව ලෝකයට' සම්ප්‍රාප්ත වීම සමඟ මධ්‍ය කාලීන යුගය සංකේතාත්මක ව නිමාවට පත් වී යුරෝපීය බලය ලොව පුරා පැතිර ගිය නූතන යුගය ඇරඹුණු බව පොදු පිළිගැනීම යි.

නූතන සමාජයේ පහළ වීම ඇරඹුණේ ඒ වන විට වර්ධනය වෙමින් පැවති පුනරුද බලපෑමට ලක් වූ නගරවල නිෂ්පාදකයන්, වෙළෙන්දන්, කර්මාර ශිල්පීන් සහ බැංකුකරුවන් එකට එක් වී

කටයුතු කිරීමෙනි. ඔවුහු සාම්ප්‍රදායික කෘෂිකාර්මික සමාජයේ පොත්ත ඉවත් කරමින් සාමූහික ව නූතන ධනවාදයේ න්‍යෂ්ටිය ලෙස කටයුතු කිරීම ඇරඹූහ. පල්ලිය සහ ලෞකික බලය අතරත්, පාප්තුමා සහ අධිරාජයන් අතරත්, රජවරුන් සහ රදලයන් අතරත් ආවේණික ව පැවති දේශපාලන අරගල සහ යුද්ධ අතරින් උපායමාර්ගික ව ඉස්මතු වීමට එසේ නැගී ගෙන ආ නාගරික මැද පන්තියට හැකි විය. ඒ අනුව අධිරාජ්‍යයන් සහ වැඩවසම් නින්දගම් කැඩී බිඳී විසිරී යන අතරතුර ඇතැම් ස්වාධීන යුරෝපීය නගර ස්වෛරීත්වය අත්පත් කර ගත්තේ ය. මේ සම්බන්ධයෙන් වඩාත් ම ප්‍රකට උදාහරණය වන්නේ ඉතාලියේ ෆ්ලොරන්ස් නුවර යි. අනුග්‍රහය දැක්වූ අර්ථපතියන් අමරණීය කරවමින් අද දක්වා ම පවතින බටහිර චිත්‍ර කලාවේ සහ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටතම කෘති ගණනාවක් ෆ්ලොරන්ස් නගරයේ දී දැක බලා ගත හැකි ය. යුරෝපයේ අනෙකුත් පෙදෙස්වලට ධනවාදය පැතිරවීමට පෙරමුණ ගැනීමේ ගෞරවය ද ෆ්ලොරන්ස්හි මධ්‍යම පාන්තිකයන්ට හිමි විය යුතු ය. බර්ක්හාඩ්ට් පෙන්වා දෙන පරිදි ප්‍රමාණයට සාපේක්ෂ ව බලන විට බටහිර ඉතිහාසය සම්බන්ධයෙන් වැදගත් ම නගරය ෆ්ලොරන්ස් විය හැකි ය.

පුරාතන යුගයේ සිට දාසය වැනි ශතවර්ෂය දක්වා අපරදිග දියුණුවේ උච්චතම අවස්ථා නිරූපණය වුණේ මධ්‍යධරණී මුහුද ආශ්‍රිත කලාපයේ ය. ඊට හේතුව අරාබි ලෝකය ද ඇතුළත් ව ඉන්දියාව සහ චීනය වැනි පෙරදිග ප්‍රදේශවල සිට නාවික වෙළඳ කටයුතු නිසා බොහෝ නව අදහස් සහ නවෝත්පාදන අපරදිගට පැමිණීම යි. උදාහරණයක් ලෙස භාවිතයට අපහසු රෝම අංක ක්‍රමය වෙනුවට ඉන්දියානු සහ අරාබි ආභාසයෙන් පැමිණි ඉලක්කම් යොදා ගැනීම නිසා ගණනය කිරීම සහ නූතන ගණිතය ඉගැන්වීම පෙර නොවූ අන්දමට පහසු වීම පෙන්වා දිය හැකි ය.

එහෙත් දහසය වැනි සියවසේ කතෝලික අධිකාරය අභියෝග යට ලක් කළ මාටින් ලූතර්ගේ ආගමික ප්‍රතිසංස්කරණවාදයේ ප්‍රචලිත වීමත් සමඟ බටහිර ප්‍රගතියේ අත්වැල මධ්‍යධරණී ප්‍රදේශයේ සිට

ප්‍රොතෙස්තන්ත වයඹ දිග යුරෝපයට මාරු විය. ප්‍රොතෙස්තන්තවාදය පාප්තුමාගේ සර්වාධිකාරය නිමාවට පත් කරමින් වතිකානුවට වඩා සමාජ හා සංස්කෘතික නවාංග බෙහෙවින් ඉවසන නව දේවස්ථාන ක්‍රමයක් හඳුන්වා දුන්නේ ය. දේව භාෂිතය හෙවත් ලතින් බසින් තිබූ බයිබලය කතෝලික පූජකවරුන් මඟින් අර්ථකථනය කරවා ගැනීම වෙනුවට තමන් විසින් ම සියබසින් ම කියවා දැන ගැනීම ප්‍රොතෙස්තන්ත අනුගාමිකයන්ගේ යුතුකම වසයෙන් සැලකුණ බැවින් බයිබලය සියබසට පරිවර්තනය කිරීමත් සමඟ ප්‍රොතෙස්තන්ත යුරෝපයේ සාක්ෂරතාවය ද සැලකිය යුතු පමණින් ඉහළ ගියේ ය. වර්ෂ 1439 ජර්මන් ජාතික යොහාන් ගතන්බර්ග් විසින් සචල මුද්‍රණාක්ෂර *(movable type)* ක්‍රමය හඳුන්වා දී තිබූ නිසා සාක්ෂරතාව වැඩි වීමත් සමඟ කියවීම සඳහා විවිධ විෂයයන් පිළිබඳ පත පොත මුද්‍රණයෙන් බිහි වීම ද වැඩි විය. වර්ෂ 1455-1500 අතර කාලය තුළ දී පමණක් ආසන්න වසයෙන් යුරෝපය පුරා මුද්‍රණාල 500 කින් පමණ පොත් 40,000 කට කිට්ටු සංඛ්‍යාවක් මුද්‍රණය වූ බව ගණන් බලා තිබේ.

ඒ අතර මේ වන විට යුරෝපීය නාවික බලය යුරෝපයෙන් බැහැර පිහිටි විදේශ භූමි ජය ගැනීමට යොදවා ගෙන තිබුණි. ස්පාඤ්ඤ සහ පෘතුගීසි ජාතිකයෝ මධ්‍යම හා දකුණු ඇමෙරිකාවේත් බ්‍රිතාන්‍යයෝ සහ ප්‍රංශ ජාතිකයෝ උතුරු ඇමෙරිකාවේත් ජනාවාස පිහිටුවා ගත් අතර ලන්දේසි ජාතිකයෝ ඉන්දුනීසියාව යටත් කර ගත්හ. අලුතින් 'සොයා ගත්' රටවල් සහ ඒවායේ විසූ ස්වදේශිකයන් උපයෝජනය කිරීමෙන් ඉමහත් ලාභයක් උපදවා ගැනීමට යුරෝපීයන්ට හැකි විය. ඒ අනුව දහසය වන සිය වසේ සිට යුරෝපීය නගර ආසියාවෙන් හා ඇමෙරිකාවෙන් පැමිණි නව අදහස්, ආහාර වර්ග, කුළුබඩු මෙන් ම රන් සහ රිදී වැනි අනෙකුත් වටිනා ද්‍රව්‍යවලින් සමෘද්ධිමත් විය.

හල් සරසවියේ මහාචාර්ය රෝලන්ඩ් ඉනොස්ට අනුව වැඩි රුවල් සංඛ්‍යාවකින් යුක්ත වූ ද එනිසා වැඩි වේගයකින් ගමන් කළ හැකි වූ ද යුරෝපීය රුවල් නැව්වලට අන් රටවල් අබිබවා මහා සාගරයේ නාවික ආධිපත්‍යය තහවුරු කර ගත හැකි විය. යටත්

විජිත අත්පත් කර ගැනීමේ දී හමුදා බලය භාවිත කිරීමේ ලා එය වැදගත් සාධකයක් විය[93]. ඉනොස් පෙන්වා දෙන පරිදි යුරෝපීය රුවල් නැව්වල එකී කාර්යක්ෂමතාවට ප්‍රධාන හේතුව වූයේ නැව් සඳහා අවශ්‍ය තරම් උසින් යුතු කුඹ ගස් යොදා ගැනීමට එම රටවලට හැකිවීම යි. නැවේ කුඹ ගස් උසින් සහ ශක්තියෙන් වැඩිවන තරමට යොදා ගත හැකි රුවල් ප්‍රමාණය ද ගමනට අවශ්‍ය සුළං බල ශක්තිය ද වැඩි කළ හැකි විය. පෘතුගාලය, ස්පාඤ්ඤය ප්‍රංශය, නෙදර්ලන්තය, බ්‍රිතාන්‍ය වැනි යුරෝපීය රටවලට පිරනීස් කඳුකරයේ, බෝල්ටික් ප්‍රදේශවල සහ උතුරු ඇමෙරිකාවේ වනාන්තරවලින් ඒ සඳහා සුදුසු උස මහත ගස් පහසුවෙන් ම සපයා ගැනීමට හැකි විය.

අනෙක් අතට එවකට පෙරදිග ලෝකයේ චීනය ද විශාල රුවල් සහිත ව දිගින් අඩි 200ක් පමණ වූ ලොකු නැව් තැනීමේ හැකියාව ඇති කර ගෙන තිබුණි. මින්ග් රාජ සමයේ *(*වර්ෂ.1368-1644*)* චීනය යුරෝපීය රටවලට වඩා බෙහෙවින් පොහොසත් රටක් වූ අතර තාක්ෂණය අතින් යුරෝපයට වඩා ඉදිරියෙන් සිටියේ ය. චීනයේ ප්‍රකට අද්මිරාල් ට්ෂෙන්ග් හෙ *(Zheng He)* යටතේ වර්ෂ 1405 දී ඉන්දියානු සාගරයේ රටවල් කිහිපයකට යාත්‍රා කල නාවික යාත්‍රා හමුදාව විශාල නැව් 60ක් ඇතුළු නැව් 250 කින් ද සොල්දාදුවන් ඇතුළු නාවිකයන් 27,000 කින් ද සමන්විත විය. වර්ෂ 1433 වන විට අද්මිරාල් ට්ෂෙන්ග් හෙ මෙහෙය වූ නැව් හමුදා ඉන්දියන් සාගර කලාපයේ එවැනි නාවික ක්‍රියාන්විත 7ක් මෙහෙයවා තිබුණි. වර්ෂ 1410-1411 ට්ෂෙන්ග් හෙ කළ නාවික චාරිකාවේ දී ලංකාවේ කෝට්ටේ රාජධානිය ආක්‍රමණය කොට ඔහුට "අකෘතඥ" වූ අලගක්කෝනාර රජ අත්අඩංගුවට ගෙන චීනයට ගෙන යාම ද ඉන් එක් ක්‍රියාන්විතයක කොටසක් විය. මෙම නාවික ක්‍රියාන්විත දියත් කරන ලද්දේ තම ඥාතියාගෙන් බලෙන් සිහසුන උදුරා ගත් මින්ග් රජ පෙළපතට අයත් යොන්ගල් නම් චීන අධිරාජයාට *(Yongle Emperor)* සිය ඔද තෙද චීන ජනතාව අතර දේශපාලනික ව තහවුරු කර ජන ප්‍රසාදය දිනා ගැනීමට අවශ්‍ය වූ නිසා බව ටන්සෙන්

93 Innos, Roland (2021) The Age of Wood: Our Most Useful Material and the Construction of Civilization (Scribner publishers) pp 1-1

සෙන් පවසයි.[94] එහෙත් මිල අධික මෙවැනි නාවික ක්‍රියාන්විත ගැන රජුගේ මුදල් ඇමතිවරයා ප්‍රමුඛ සම්ප්‍රදායික උපදේශකයෝ නිරතුරු ව මැසිවිලි නැඟී ය. එම උපදේශකයන් අතරෙන් බොහෝ දෙනෙකු අද්මිරාල් ට්ෂෙන්ග් හෙ ප්‍රමුඛ වාසල පණ්ඩකවරුන් *(eunuchs)* සතු බලය වැඩි වීම මෙන් ම චීනයේ විදේශීය බල ව්‍යාප්තිය ගැන ද මනාපයක් දැක්වූ අය නොවීය. රජුගේ උගත් උපදේශකයන්ගේ පොදු මතය වූයේ චීනය වැනි සම්භාව්‍ය දේශයකට විදේශිකයන්ගෙන් ඉගෙන ගැනීමට එතරම් දෙයක් නැති බව යි. අවසානයේ වර්ෂ 1525 දී චීනය සිය නාවික හමුදාවට අයත් විශාල නැව් සියල්ල ම විනාශ කර හෝ නො සලකා හැරීමට ඉඩ හැර ගොඩ බිමෙන් එන මොංගෝලියානු හා මැන්චූරියානු තර්ජන ගැන වැඩි අවධානයක් යොමු කළේ ය. ඇතැම් විචාරකයන් පවසන අන්දමට එසේ චීන නාවික බලය විනාශ කිරීම තමන් අබිබවා විදේශ වෙළඳාමෙන් අධික ලෙස පොහොසත් වීමට ඇතමුන්ට තිබූ හැකියාව අවහිර කිරීමට චීනයේ රාජකීය නිලධාරීන් විසින් යොදන ලද උපායක ප්‍රතිඵලයකි.

එසේ සැලකිය යුතු නාවික බලයක් සතු ව තිබූ සමයේ යුරෝපීය රටවලට පෙර ධනවාදය බිහි කිරීමේ සම්භාවිතාවක් චීනයට තිබෙන්නට ඇත. එහෙත් 1644 දී මින්ග් රාජවංශය පලවා හැර ඊසාන දිග චීනයේ විසූ මැන්චූරියානුවන් බීජිනයේ බලය අත්පත් කර ගෙන ක්වින්ග් රජ පෙළපත පිහිටුවීමෙන් පසු ඒ විභවතාව පිරිහී ගියේ ය. වර්ෂ 1644 සිට 1912 දක්වා රජ කළ ක්වින්ග් රජවරුන්ගේ සමයේ චීනය මූලික ව කෘෂිකර්මය පාදක කරගත් බෙහෙවින් සංවෘත වූ රාජධානියක් බවට පත් විය. විදේශ සමඟ කෙරෙන වෙළහෙළඳාම් දැඩි රාජ්‍ය පාලනයට ලක් වූ අතර ආයාත නිර්යාත වෙළදාම වරාය

94 Sen, Tansen (2016) The impact of Zheng He's expeditions on Indian Ocean interactions, *Bulletin of the School of Oriental and African Studies, University of London,* Vol. 79, No. 3 (2016), London: Cambridge University Press, pp. 609-636 – අලගක්කෝනාර අත්අඩංගුවට ගත් ගමනේ දී අද්මිරාල් ට්ෂෙන්ග් හේට පැවරුණු කාර්ය වූයේ දළදාව චීනයට රැගෙන ඒම බවට මින්ග් අධිරාජයා (Yongle Emperor) විසින් ලාමා සොන්ග්-කා-පා (Tsong-kha-pa) වෙත ක්‍රි.ව. 1413 මාර්තු වලදි යවන ලද ලිපියකින් පෙනී යන බවත් එම ලිපිය 1950 දී ලාෂා නුවර පෝතාල මාලිගයේ තිබී සොයා ගත් එකක් බවත් ලේඛකයා මෙම ලිපියේ විස්තර කරයි.

අතලොස්සකට පමණක් සීමා කෙරිනි. 1757 සිට විදේශ වෙළදාම කැන්ටන් වරායට පමණක් සීමා කරන ලද අතර වෙළඳ කටයුතු කොහොන්ග් යනුවෙන් හැඳින්වුණු චීන වණික් කුලකය මඟින් පමණක් කළ යුතු විය. කැන්ටන් නගරයේ සීමිත කොටසකට හැර විදේශ වෙළඳුන්ට චීනයට ඇතුළු වීම තහනම් විය.[95]

මේ අතර පහළොස්වැනි හා දාසයවැනි සියවස්වල ස්පාඤ්ඤය හා පෘතුගාලය වැනි රටවල් නව දේශභූමි 'සොයා ගැනීම' සමඟ වැදගත් විද්‍යාත්මක සොයා ගැනීම් කිහිපයක් ම සමපාත විය. විශ්වයේ කේන්ද්‍රය පෘථිවිය යැ'යි සහස්‍රක දෙකක් තිස්සේ පැවත ආ ඇදහීම පිටු දකිමින් පෘථිවිය සූර්යයා වටා භ්‍රමණය වන වස්තුවක්යැ'යි කොපර්නිකස් *(1473-1543)* යෝජනා කළේ ය. යාන්ත්‍රික විද්‍යාව බිහි කළ ගැලීලියෝ *(1564-1642)* කොපර්නිකස්ගේ ඒ අදහස අනුමත කරමින් ඉතාලි බසින් පොතක් ලීවේ ය. ඒ වන තෙක් පැවති සම්ප්‍රදාය වූයේ එවැනි කෘති ලතින් බසින් ලියා පළ කිරීම නමුත් ඉතාලි බසින් ලිවීම නිසා ගැලීලියෝගේ පොත වැඩි පිරිසකට කියවිය හැකි විය. එමෙන් ම ග්‍රහ වස්තුවල කක්ෂය පිළිබඳ නියාම කෙප්ලර් *(1571-1630)* විසින් ද ගුරුත්වාකර්ෂණයේ බලපෑම පිළිබඳ නියාම නිව්ටන් *(1642-1727)* විසින් ද විස්තර කර දෙන ලදි. විද්‍යාව විප්ලවකාරී ලෙස ඉදිරියට ආවේ මේ චින්තකයන් නිසා ය. නව යටත් විජිත සොයා ගැනීම සහ නූතන තාක්ෂණයේ පදනම ලෙස ස්වාභාවික විද්‍යා සම්බන්ධයෙන් ඇතිවූ විස්මය ජනක දියුණුව සමඟ දාසය සහ දාහත්වැනි සියවස්වල වාණිජ මාදිලියේ ධනවාදී වර්ධනයේ මුල් අවදිය ප්‍රංශයේ ද, එහි කාර්මික මාදිලිය දහ අටවන සහ දහනව වන සියවස්වල එංගලන්තයේ ද ආරම්භ විය. මේ සියල්ල එක ම ක්‍රියාවලියක විවිධ නිරූපණ ලෙස සැලකිය හැකි ය.

දියුණුතම ක්‍රිස්තියානි රටවල එතෙක් ආගම මඟින් මෙහෙයවූ බුද්ධිමය ආධිපත්‍යය සහ පල්ලිය මඟින් මෙහෙයවූ දේශපාලන

95 Waibel, Paul. R (2020) Western Civilization: A Brief History, Hoboken: John Wiley & Sons, p. 264

ආධිපත්‍යය දහඅට වැනි සියවස වන විට යුරෝපීය පුනරුදය විසින් නිමාවට පත් කරන ලදී. සමස්ත වැඩපිළිවෙළක් ලෙස සැලකූ විට එහි මූලික අභිප්‍රාය වූයේ සබුද්ධික චින්තනය සහ ප්‍රාමාණික දැනුමේ අවිවාදාත්මක ප්‍රභවය ලෙස විද්‍යාත්මක ක්‍රමවේදය ස්ථාපිත කිරීම යි. දහඅට වැනි සියවසේ පූර්ව විප්ලව අවදියේ සිට ප්‍රංශයෙන් පටන් ගත් පරිණාමන සංස්කෘතික ව්‍යාපාරය ඒ වන විටත් නූතනත්වයට ගොදුරු වී සිටි බ්‍රිතාන්‍ය, නෙදර්ලන්තය, බෙල්ජියම සහ ජර්මනිය වැනි අනෙකුත් යුරෝපීය රටවලට ද පැතිර ගියේ ය. අනතුරුව මෙකී දියුණු යැ'යි සැලකුණු රටවල සිට පුනරුදය චින්තනය යුරෝපයේ පරිධියේ පිහිටි රටවලට මෙන් ම විදේශගත ජනවාසවලට සහ විශේෂයෙන් උතුරු ඇමෙරිකාවට ද පැතිරුණි. වර්ෂ 1780 වන විට පුද්ගල මූලිකත්වය, ලෞකිකත්වය සහ සබුද්ධිකත්වය පාදක කරගත් ප්‍රගතිය සම්බන්ධ විශ්වාසය බටහිර ලෝකය පුරා පැතිර ගියේ ය.

පුනරුදයේ මුඛ්‍ය සංකල්පනය වූයේ ලෞකික සහ ප්‍රගතිගාමී මධ්‍යම පාන්තික ප්‍රජාතන්ත්‍රවාදය යි. ඉතිහාසඥයෙකු වන හොබ්ස්බෝව්ම් අදහස් කරන අන්දමට 'එය සහේතුකත්වයට මුල් තැන දෙන ලෝකයක සමාන ව ඉපදුණු සියලු මිනිසුන්ට (ස්ත්‍රීන්ට එම සැලකිල්ල හිමි නො වී ය.), අද අප කුසලතාවාදය *(meritocracy)* යනුවෙන් හඳුන්වන, බාධාවකින් තොර ව සිය කුසලතාව උපයෝගී කර ගත හැකි වන සමාජය බිහි වීම යි'. ඒ අනුව 'පොදු මිනිසා' යනු පූජ්‍ය පක්ෂයේ සහ ඉඩම් හිමි රදළයන්ගේ සාම්ප්‍රදායික ආධිපත්‍යයෙන් මුදවා ගනු ලැබූ තැනැත්තා ය. එමෙන් ම නූතන මධ්‍යම පාන්තික සමාජයේ විශිෂ්ට ඓතිහාසික ගුණය වසයෙන් සැලකුණේ සත්‍ය, ධනය සහ බලය අත්පත් කර ගැනීම සඳහා තරඟකාරී නිදහස හඳුන්වා දීම යි. දැනුම, තාක්ෂණය, නිෂ්පාදන හැකියාව, ලෞකික සුභසාධනය, ප්‍රජාතන්ත්‍රවාදය සහ කලාව ආදියේ දියුණුව සඳහා උචිත ම ක්‍රමය එකී නිදහස් තරඟය බව ඇදහිණි. නීතියේ ආධිපත්‍ය මඟින් සහතික කළ ධනවාදී 'නිදහස් වෙළඳපොළ' තුළ අනුක්‍රමයෙන් ප්‍රජාතන්ත්‍රවාදී බවට පත් වූ යුරෝපීය ජාතික රාජ්‍යය බටහිර යුගයේ සාර්ථකත්වය පිළිබඳ සංස්ථාපිත රාමුව වසයෙන් සැලකුණි.

දහඅට වැනි සියවසේ පුනරුදය විසින් උත්කර්ෂණයට නැංවූ සමානාත්මතාව, සහෝදරත්වය සහ නිදහස *(egalité, fraternité, liberté)* යන විප්ලවකාරී අදහස් අවසානයේ දී 1789 උද්ගත වූ ප්‍රචණ්ඩ ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය ලෙස තහවුරු විය. ප්‍රංශ විප්ලවය යුරෝපීය වැඩවසම් සමාජය හෙවත් පැරණි සමාජ ක්‍රමය වෙනස් කරමින් යුරෝපය පුරා මධ්‍යම පංතික ප්‍රජාතන්ත්‍රවාදය පැතිරවීමේ හැරවුම් ලක්ෂ්‍ය බවට පත් විය. කිසිදු බද්දක් නො ගෙවූ පාලක පංතියේ ප්‍රථම හා දෙවැනි ස්තර (ජනගහනයෙන් 2%-3% ක් පමණ වූ වංශවතුන් සහ පූජ්‍ය පක්ෂය) සහ තෙවැනි ස්තරය (මධ්‍යම පාන්තිකයන්, නාගරික නිර්ධනීන්, ගොවීන්, සිය ව්‍යාපාර හෝ ශිල්ප ඥානය ජීවිකාව කරගත් අය සහ ඔවුන්ට සහාය දැක් වූ අය) අතර එතෙක් තරණය කළ නො හැකි ව තිබූ ශක්තිමත් බාධකය ප්‍රංශ විප්ලවය විසින් බිඳ දමන ලදී.

ඒ සමයේ දීම ඒ හා සමාන වැදගත්කමක් ගනිමින් ද්‍රව්‍යයමය ඉසුර සහ නිෂ්පාදන ආර්ථිකයේ දැවැන්ත ඉදිරි පිම්මක් ඇති කළ එංගලන්තයේ කාර්මික විප්ලවය ද සිදුවිය. පසුගිය වසර 200 තුළ ඇතිවූ ආර්ථික වර්ධනය, ප්‍රාග්ධන අයිතිය, ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිලාභ, ශ්‍රම ආදායම සහ අසමානතාව පිළිබඳ ව තෝමස් පිකෙටි සිය *Capital in the Twenty First Century* නමැති කෘතියෙන් ගැඹුරු විවරණයක් කරයි. ඒ අනුව මන්දගාමී සියවස් ගණනාවකට පසු කාර්මික විප්ලවය අවදියේ දී ආර්ථික වර්ධනය ශීඝ්‍රයෙන් වැඩි වී තිබේ.[96] විදේශගත ජනාවාස සහ යටත් විජිතවලින් සමන්විත අධිරාජ්‍යයන් පිහිටුවා ගැනීම තුළින් බිහි වූ බටහිර හෙජමොනික ආධිපත්‍ය පැන නැගීමට යුරෝපයේ තාක්ෂණික සුපිරි භාවය බෙහෙවින් හේතු විය. අන්තර්ජාල විප්ලවය නිසා වඩා මෑතක ඇතිවූ ගෝලීයකරණ රැල්ල සම්බන්ධයෙන් පවා මේ ආධිපත්‍ය නොකඩවා ම පවතී.

සබුද්ධික ආර්ථික මිනිසා පිළිබඳ ඇදහිල්ල ප්‍රවර්ධනය කරන අය එය සාධාරණීකරණය කරණු පිණිස මීට පෙර පැවති රදලවාදය

96 Piketty, T. (2014) *Capital in the Twenty-First Century.* Cambridge, MA: Harvard University Press. p.83 (KE)

හා කුරිරු ප්‍රවේණිදාස ක්‍රමය අනුක්‍රමයෙන් ජය ගෙන සියල්ලන්ට ම පොහොසත්කම සහ සෞභාග්‍ය ළඟා කර දීමට හැකි ධනවාදය බිහි කර ගැනීමට ආත්මාර්ථකාමී ස්වභාවය නිසා ම අපට හැකි විණැ'යි පුන පුනා කියති. එය අපේ උත්පත්ති කතාව වන තරමට ප්‍රචලිත ව තිබේ. එහෙත් කොතෙක් ගැඹුරට අපේ විශ්වාස තුළට එය කිඳා බැස තිබුණ ද ඇත්ත කථාව එය නො වන බව ආචාර්ය ජේසන් හිකල් සිය *Less is More* නම් කෘතියෙන් පැහැදිලි කරයි

හිකල් පෙන්වා දෙන පරිදි රදලවාදයේ සිට ධනවාදයට සිදු වූ පරිවර්තනය අපට විශ්වාස කිරීමට උගන්වා ඇති පරිදි ඒ කියන තරම් ස්වාභාවික හා සාමකාමී එකක් නො වේ. එය කුතුහලය අවුස්සන කතාවක් විය හැකි නමුත් කිසි සේත් ම ප්‍රසන්න කථාවක් නො වේ. ඒ කථාවෙන් අපේ ආර්ථිකය ඇත්තටම ක්‍රියා කරන්නේ කෙසේ ද යන්න සහ එය වෙනස් කළ හැක්කේ කෙසේ ද යන්න ගැනත් කිසියම් අවබෝධයක් ලබා ගත හැකි ය.

ධනවාදය ගැන කතා කරන විට අපේ සිතට නිරන්තරයෙන් ම සිහි වන්නේ වෙළඳපොළ සහ වාණිජ කටයුතු වැනි අහිංසකයැ'යි සැලකිය හැකි ක්‍රියාකාරකම් ය. එහෙත් ධනවාදය හා වෙළඳපොළ කටයුතු අන්‍යෝන්‍ය වසයෙන් සමාන කිරීමට තැත් කිරීම වැරදි ය. වෙළඳපොළ යනු ධනවාදයේ සම්ප්‍රාප්තියට පෙර අවුරුදු දහස් ගණනාවක් තිස්සේ විවිධ කාලවල විවිධ මාදිලිවලින් විවිධ ස්ථානවල බිහි ව පැවත ආ දෙයකි. එහෙත් ධනවාදය ඊට වඩා බෙහෙවින් මෑත කලක දී බිහි වූවකි. ඇත්ත වසයෙන් ම ධනවාදයේ වයස දැනට අවුරුදු 500 කට වැඩි නො වේ. ධනවාදය සුවිශේෂ වන්නේ එයට වෙළඳපොළක් තිබෙන නිසා නො ව 'අනවරත වර්ධනය' *(perpetual growth)* නමැති ඒකායන ආර්ථික අරමුණ වටා ධනවාදය සංවිධානය වී ඇති බැවිණි. ඒ උදෙසා මිනිස් ශ්‍රමය සහ ස්වාභාවික ලෝකය ග්‍රහණයට ගෙන ධනය නිරන්තරයෙන් ඒකරාශි කර ගන්නා ආර්ථික පද්ධතියක් ලෙස ධනවාදී ක්‍රමය හැඳින්විය හැකි ය. ඒ සඳහා ධනවාදය වැඩ කරන්නේ ඉතා ඍජු හා සරල සූත්‍රයකට අනුව යි.

'තමන් දෙන දෙයට වඩා සැම විට ම වැඩිපුර දෙයක් ලබාගනු' යන්න ඒ සරල සූත්‍රය යි.

යුරෝපයේ පැවති රදල-වංශාධිපති ක්‍රමය ප්‍රවේණිදාසයන්ට දුක්ඛිත බව උරුම කළ කුරිරු ක්‍රමයක් බව අපි දනිමු. ඒ ක්‍රමය අනුව ඉඩම් අයිතිය හා පාලනය රදල වංශවතුන් සතු වූ අතර ඒ ඉඩම්වල පදිංචි වන ප්‍රවේණිදාසයන් අඳ කුලිය, බදු, සහ වැටුප් නො ලබන ශ්‍රමය ආදි වසයෙන් කලින් කලට ඉඩම් හිමි රදලයාට කප්පම් ගෙවිය යුතු විය. එහෙත් මේ ක්‍රමය නිමාවට පත් කළේ අපට උගන්වා ඇති පරිදි එවකට නැගී එමින් තිබූ ධනවාදය විසින් නො වේ. ජේසන් හිකල් පෙන්වා දෙන පරිදි ඒ ජයග්‍රහණය ඇත්ත වසයෙන් ම හිමි විය යුත්තේ දීර්ඝකාලීන සම්ප්‍රදායකින් පැවත එන එහෙත් කිසියම් හේතුවක් නිසා දැනට මුළුමනින් ම අමතක ව ගොස් ඇති ගොවි ජන සටන්කරුවන්ගේ ධෛර්ය සම්පන්න සටන්වලට ය.

උදාහරණයක් ලෙස 1300 මුල් දශක කිහිපයේ දී යුරෝපය පුරා ගොවි ජනතාව රදල ක්‍රමයට එරෙහිව කැරලි ගැසීම ආරම්භ කළහ. වංශවතුන් සහ පල්ලිය විසින් එතෙක් උකහා ගත් බදු, අඳ කුලිය සහ වැටුප් නො ලබන ශ්‍රමය තවදුරටත් ලබා දීම ප්‍රතික්ෂේප කළ කැරලිකරුවෝ තමන් වගා කළ ගොවි බිම්වල පාලනය තමන් සතු විය යුතු බව ඉල්ලා සිටියහ. මේ ඉල්ලීම ඉදිරිපත් වීම අතන මෙතන ඉඳහිට ඇති වූ සිල්ලර සිදුවීමක් නො ව මැනවින් සංවිධානය වූ විරෝධතාවක් බවට පත් විය. ඇතැම් අවස්ථාවල දී එකී විරෝධතා දිග්ගැස්සුණු සංවිධානාත්මක සන්නද්ධ සටන් දක්වා ද දියුණු විය. උදාහරණයක් ලෙස 1323 ෆ්ලාන්ඩර්ස්වල දී ඇති වූ ගොවි-කම්කරු සන්නද්ධ සටන වංශවතුන් අතින් පරාජයට පත්වීමට පෙර අවුරුදු පහක් පුරා පැවතුණි. යුරෝපය පුරා බෲග්ස්, හෙන්ට්, ෆ්ලොරන්ස්, ලයිජ් සහ පැරිස් වැනි ප්‍රදේශවල ද එයට සමාන සටන් ඇවුළුණි.[97]

---

97 Hickel, Jason, (2021) *Less is More: How De-growth will Save the Worlds,* London: William Heinemann pp. 56 -57 (KE)

කෙසේ වෙතත් මේ මුල්කාලීන කැරලිකරුවන්ගේ ප්‍රයත්න එතරම් සාර්ථක නො වී ය. මැනවින් සන්නද්ධ වූ ප්‍රභූ වංශවතුන්ගේ හමුදා මඟින් බොහෝ අවස්ථාවල දී ඔවුන්ගේ කැරලි නිර්දය ලෙස මර්දනය කෙරිණි. එහෙත් 1347 යුරෝපය පුරා කළු මහාමාරිය වසංගතය පැතිරුණු විට තත්වය මුළුමනින් ම වෙනස් විය. ඊට හේතුව මින් පෙර නො වූ විරූ සමාජ හා දේශපාලනික අර්බුදයක් ඇති කරමින් කළු මහාමාරිය විසින් යුරෝපයේ මුළු ජනගහනයෙන් තුනෙන් එකක් මරණයට පත් කරනු ලැබීම යි.

කළු මහාමාරිය වසංගතයෙන් ඇති වූ දරුණු විනාශය නිසා බලාපොරොත්තු නො වූ දෙයක් ද සිදු විය. ඒ වන විට ඕනෑවටත් වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් රදල ප්‍රභූ පෙළැන්තිය සතු ව තිබුණි. එහෙත් කළු මහාමාරියෙන් සිදුවූ දැවැන්ත මනුෂ්‍ය විනාශය නිසා රදලයන්ගේ ඉඩම්වල වැඩ කිරීමට අවශ්‍ය ශ්‍රමිකයන්ගේ දැඩි හිඟයක් ඇති විය. මේ නිසා තවමත් ඉතුරු වී සිටි ගොවි කම්කරුවන් පිරිසට සැලකිය යුතු ප්‍රමාණයක කේවල් කිරීමේ බලයක් අත් පත් විය. ඒ අනුව බිම් කුලිය අඩු කරන ලෙසත් සිය ශ්‍රමය සඳහා වඩා සාධාරණ ගෙවීමක් කරන ලෙසත් හාම්පුතුන්ගෙන් ඉල්ලා සිටීමට ඔවුන්ට හැකි විය. මේ හේතු කොට ගෙන රදල වංශවතුන්ට මඳක් පසුබෑමට සිදු වූ අතර ප්‍රථම වතාවට බලතුලනය පොදු ජනයාට වාසිදායක විය. මේ තමන්ගේ වාරය බව තේරුම් ගත් පොදු ජනයා සමාජ හා දේශපාලන ක්‍රමයේ පදනම වෙනස් කිරීමට තමන්ට අවස්ථාවක් පැමිණ ඇති බව වටහා ගත්තේ ය. ඒ නිසා බලාපොරොත්තු සහගත විශ්වාසයකින් යුක්ත ව ප්‍රබල කැරලිකාරී තත්වයක් උද්ගත වීමට අවශ්‍ය ජවය ගොවි ජනයා අතර එක් රැස් වෙමින් තිබුණි.

රැඩිකල් දේශනා කරුවෙකු වූ ජෝන් බෝල්ගේ "ඔබ බැඳ ඇති විය ගහෙන් සහ බන්ධනයෙන් මිදී නිදහස අත්පත් කර ගැනීමට දැන් කාලය පැමිණ තිබේ" වැනි ප්‍රකට කියමන්වලින් ආශ්වාදය ලැබූ වැට් ටයිලර්ගේ නායකත්වයෙන් එංගලන්තයේ රදලවාදයට එරෙහි ගොවි කැරැල්ල 1381දී ආරම්භ විය. 1382 ඉතාලියේ සියොම්පි නගරයෙන්

ඇරඹුණු කැරැල්ල ආණ්ඩු බලය අල්ලා ගැනීම දක්වා උග්‍ර විය. කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය නමින් සංවිධානය වූ කැරැල්ලක් මඟින් 1413දී පොදු ජනතාව පැරිසියේ බලය අල්ලා ගත්තේ ය. ජැක් කේඩ්ගේ කැරැල්ල යනුවෙන් පසුව හැඳින්වුණු තවත් බහුජන ව්‍යාපාරයක් 1450 දී කෙන්ට්වල සිට ලන්ඩන් දක්වා දැවැන්ත කැරලිකාරී පාගමනක නිරත විය. මුළු යුරෝපය පුරාම වාගේ මේ යුගයේ දී කලහකාරී පොදු ජන රැස්වීම්, පාද යාත්‍රා සහ පොදු ජන සන්නද්ධ සංවිධාන ඇති විය.

1400 ගණන්වල මැද භාගය වන විට බටහිර යුරෝපය පුරා ගොවීන් සහ වංශවතුන් අතර යුද්ධ පැන නැගී තිබුණි. කැරලිකරුවන්ගේ සේනාව වැඩි වීමත් සමඟ ඔවුන්ගේ ඉල්ලීම් ද පුළුල් වන්නට පටන් ගත්තේ ය. ඒ අනුව පවතින ක්‍රමයට කෙරෙන සුළු සුළු සංශෝධන වෙනුවට පූර්ණ වෙනසක් සඳහා කෙරෙන විප්ලවයක් ගොවියෝ බලාපොරොත්තු වූහ. මධ්‍යකාලීන යුගයේ දේශපාලන ආර්ථිකය පිළිබඳ විශේෂඥවරියක වන සිල්වියා ෆෙඩරිසි පවසන අන්දමට "කැරලිකරුවන් තවදුරටත් රදල පාලනය සම්බන්ධයෙන් යම් යම් සීමා පැනවීමෙන් හෝ හොඳ ජීවන තත්වයක් සඳහා කේවල් කිරීමෙන් හෝ පමණක් සෑහීමකට පත් වූ කණ්ඩායමක් නො වී ය. ඒ වෙනුවට කැරලි කරුවන්ගේ අපේක්ෂාව වූයේ රදල වංශවතුන්ගේ පාලනය මුළුමනින් ම අහෝසි කර දැමීම යි."[98]

එහෙත් බොහෝ හුදකලා කැරලි කෝලාහල දරුණු ලෙස මර්දනය කර දැමීමට වංශවතුන්ට හැකි විය. උදාහරණයක් ලෙස 1381 එංගලන්ත කැරැල්ලට නායකත්වය දුන් වැට් ටයිලර් සහ ජෝන් බෝල් සමඟ ඔවුන්ගේ මුල් පෙළේ අනුගාමිකයන් 1500කට කිට්ටු ප්‍රමාණයකට මරණ දඬුවම නියම විය. එසේ වුව ද සමස්තයක් වසයෙන් ගත් විට යුරෝපයෙන් වැඩි කොටසක ප්‍රවේණිදාස ක්‍රමය අහෝසි කර දැමීමට මේ කැරලි ව්‍යාපාරය සමත් විය. 1381 කැරැල්ලත් සමඟ ප්‍රවේණිදාස ක්‍රමය ද එංගලන්තයෙන් මුළුමනින් ම පාහේ අතුරුදහන් වී ගියේ ය. ඒ අනුව අවසානයේ දී ප්‍රවේණි දාසයෝ සිය

98 Federici, Silvia (2004) *Caliban and the Witch,* New York: Antonomedia, p.46

සතුන්ගේ ආහාර පිණිස තණබිම් ද, දඩයම් සහ දැව පිණිස වනාන්තර ද, ජල සම්පාදනය සහ මසුන් ඇල්ලීම සඳහා ජල මාර්ග ද පොදු දේපළ වසයෙන් භාවිත කළ හැකි, තමන් විසින් ම පාලනය කරනු ලබන ඉඩම්වලින් යැපෙන නිදහස් ගොවීන් බවට පත් වූහ. අමතර ආදායමක් අවශ්‍ය ම නම් බල කරනු ලැබීමට භාජනය වීමකින් තොර ව වැටුප් සඳහා වැඩ කිරීමේ හැකියාව ද ඔවුන්ට තිබුණි. ඒ අනුව ජර්මනියේ ඉඩම්වලින් 90% ක පාලනය නිදහස් ගොවීන් සතු විය. රදල-ප්‍රවේණිදාස යුගයේ පැවති සම්බන්ධතා ඒ ආකාරයෙන් ම පැවති ප්‍රදේශවල පවා ගොවීන්ගේ තත්වය බෙහෙවින් වැඩි දියුණු විය.[99]

රදල-ප්‍රවේණිදාස ක්‍රමය කඩා වැටීමත් සමඟ නව නිදහස් ගොවීන් එය වෙනුවට පැහැදිලි විකල්පයක් ගොඩ නැගීම ආරම්භ කළ බව තොරෝල්ඩ් රොජර්ස් සහ බුවාසොනේ වැනි ඉතිහාසඥයන් උපුටා දක්වමින් ජේසන් හිකල් පෙන්වා දෙයි. ග්‍රාමීය ස්වයං පෝෂණය මුල් කරගත් සමුපකාර සමාජ ක්‍රමයක් මත පදනම් වූ ඒ විකල්පය බෙහෙවින් සමානාත්මතාවාදී එකක් විය. පොදු මිනිසුන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් බැලූ විට මේ විප්ලවයේ ප්‍රතිඵල සැබවින් ම විස්මය ජනක විය. ඉතිහාසය තුළ එතෙක් වාර්තා ගත නො වූ පරිදි, සේවා නියුක්තිකයන් සඳහා ලැබෙන වැඩ කුලිය සහ වැටුප් දෙගුණයකින්, තෙගුණයකින් පමණක් නො ව ඇතැම් තැන්වල හය ගුණයක් පමණ වන තෙක් ඉහළ ගියේ ය. ඒ සමඟ ගෙවල් කුලී පහළ ගිය අතර, ආහාර මිල ද අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස පෝෂ්‍ය ජනක ආහාර පරිභෝජනය ද ඉහළ ගියේ ය. රැකියා කරන ස්ථානයෙන් ආහාර ලබා දීම, වැඩට යෑමට සහ ආපසු නිවසට පැමිණීමට ගමන් කළ යුතු සැතපුම් ප්‍රමාණය අනුව දීමනාවක් ගෙවීම, සති අන්ත නිවාඩුවකට හිමිකම සහ දිනකට වැඩ කළ යුතු කාලය අඩු කර ගැනීම වැනි කොන්දේසි කීපයක් ඉටු කරවා ගැනීමට රැකියාවල නියුක්ත වූ අය සමත් වූහ. රදල යුගයේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර තිබූ පුළුල් වැටුප් විෂමතාව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට

99 Hickel, Jason, (2021) *Less is More: How De-growth will Save the Worlds,* London: William Heinemann, pp. 59 (KE)

ද සේවා නියුක්තිකයෝ සමත් වූහ. අර කී ඉතිහාසඥයන් පැහැදිලි කරන අන්දමට 1350 සිට 1500 දක්වා වූ කාල පරිච්ඡේදය යුරෝපයේ වැඩ කරන ජනතාවගේ ස්වර්ණමය යුගය විය.[100]

ඒ යුගය යුරෝපයේ පරිසරය සම්බන්ධයෙන් ද ස්වර්ණමය යුගයක් විය. පරිසරය සම්බන්ධයෙන් බැලූ විට ඉන් පෙර පැවති රදල ක්‍රමය අතිශයින් විනාශකාරී වූවක් විය. ඉඩම් හිමි රදලයෝ තම ඉඩම් සහ කැලෑවලින් හැකි තරම් සාරයක් උරා ගැනීමට ප්‍රවේණිදාස ගොවීන්ට බල කළ නමුත් ඉඩම්වල සරු බව වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම ගැන සැලකිල්ලක් නො දැක්වූහ. මේ නිසා වඩා සරු ඉඩම් පතා කැලෑ එළි කිරීම වැඩි වීම, ප්‍රමාණය ඉක්මවා තණබිම් සූරාකෑම සහ පස නිසරු වීම වැනි දේවල් ඉතා සුලබ විය. එහෙත් 1350 දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා හට ගත් ජයග්‍රාහී ගොවි කැරැල්ලෙන් පසු කලක් ගත වන විට එම ප්‍රවණතාව ඇණ හිට ග්‍රාමීය ජෛව පරිසරයේ ප්‍රතිජනනය වීමක් උදා විය. ප්‍රභූන් සතු ඉඩම්වල ගොවිතැන් කිරීමේ හිමිකම තමන්ට ලැබුණු පසු සිය ඉඩකඩම් සරු කොට ස්වභාවධර්මය සමඟ වඩා ඵලදායක අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගෙන යෑමට ගොවියෝ සමත් වූහ. ඔවුහු පොදු ඉඩම්, තණබිම්, වන සම්පත් සහ වාරිමාර්ග ආදිය පොදුවේ භාවිත කිරීම සම්බන්ධ ව ප්‍රජාතන්ත්‍රවාදී කතිකා මඟින් එකඟ වූ ආරක්ෂණ නීති රීති සකසා පොදු යහපත තකා එකී සම්පත් සාමූහික ව පාලනය කළෝ ය. ඒ නිසා වන සම්පත සහ ගොවි බිම් යළිත් සාර සොබාවට ප්‍රතිස්ථාපනය වන්නට පටන් ගත්තේ ය.

එහෙත් මේ සමාජ පරිවර්තනය සම්බන්ධයෙන් යුරෝපීය වංශවතුන් ඇතුළු ප්‍රභූ පැලැන්තිය කිසි සේත් ම සතුටට පත් නො වූ බව රහසක් නො වේ. සිය සේවක ජනයාට වැඩි කුලියක් ගෙවීමට සිදුවීම ඔවුන් සැලකුවේ තම බල අධිකාරය කෙලෙසන නින්දිත ක්‍රියාවක් ලෙස ය. ඒ හැර එසේ කුලියට වැඩ කළ අයට තම තමන්ගේ

100 Rogers, Janes E Thorold, (1894) *Six Centuries of Work and Wages" The History of English Labour*, London, pp. 362ff; Boissonnade, P (1927) *Life and Work in Medieval Europe*, New York Alfred A Knopf, pp. 316-320

අභිමතය පරිදි වැඩ කරන කාලය හා දින ගණන තීරණය කිරීමට හැකි වීම මෙන් ම ප්‍රමාණවත් කුලියක් උපයා ගත් පසු වැඩට නො පැමිණ සිටීමට හැකි වීම ද ප්‍රභුවරුන්ට නුරුස්සන දෙයක් විය. "සේවකයෝ දැන් ස්වාමියෝ වෙලා! ස්වාමියෝ සේවකයෝ වෙලා!" යනුවෙන් ඉංග්‍රීසි කවියෙකු වූ ජෝන් ගවර් 1380 දී ඒ හැඟීම පිට කළේ ය. "ගොවියෝ දැන් ඕනෑවට වඩා පොහොසත්. කිසිම ගරුසරුවක් නැහැ. නීතියක් සම්ප්‍රදායක් තියෙන බවක් තඹයකට ගණන් ගන්නේ නැහැ. ඒ අය හිතන්නෙ වංශවතුන් නැත්තට ම නැතිවුනා නම් හොඳයි කියල යි"[101] තවකෙක් කීවේ ය.

ඉතිහාසඥයන්ගේ වචනවලින් විස්තර කළ හොත් 1300 සිට 1500 දක්වා පැවති විප්ලවකාරී කාල පරිච්ඡේදය තුළ යුරෝපීය ප්‍රභූ පැලැන්තිය 'දරුණු ධන විසංචිතවීමකට' *(Chronic disaccumulation)* හෙවත් තවදුරටත් තමන් ළඟ ධනය ඒකරාශි නො වීම පිළිබඳ තීරණාත්මක අර්බුදයකට මුහුණ දුන්හ. ගොවීන් විසින් බල කරනු ලැබූ ප්‍රතිසංස්කරණ නිසා ජාතික ආදායම වඩා සමාන ව බෙදී ගිය බැවින් රදල ප්‍රවේණිදාස යුගයේ මෙන් තමන්ට අභිමත පරිදි ලාභය පොදි ගසා ගැනීමට වංශවතුන්ට අසීරු විය. මෙය අතිශයින් ම වැදගත් කරුණක් ලෙස සැලකිය යුතු ය. අප බොහෝ විට විශ්වාස කරන්නේ රදලවාදය කඩාවැටීමේ ස්වාභාවික ඵලයක් ලෙස ධනවාදය උද්ගත වූ බවයි. එහෙත් එවැනි ස්වාභාවික පරිවර්තනයක් සිදුවීමට කිසිදු ඉඩක් එකල නො වී ය. ධනවාදී ක්‍රමය උද්ගත වීම පිණිස විශාල ප්‍රමාණයේ ආයෝජන කිරීමට අවශ්‍ය අතිරික්ත ධනයක් ඒකරාශී වීම අත්‍යවශ්‍ය ය. එහෙත් පශ්චාත් රදලවාදී සමාජ ක්‍රමය තුළ පැවති සමානාත්මතා ලෝලිත්වය, ස්වයංපෝෂිත බව, වැඩි වැටුප්, බිම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය සහ පොදු සම්පත් පිළිබඳ සාමූහික කළමනාකාරිත්වය එසේ ප්‍රභූ පංතිය අතර ධනය ඒකරාශි වීම නිබඳ ව අවහිර කළේ ය. ඇත්ත වශයෙන් ම යුරෝපීය ප්‍රභූ පැලැන්තිය <u>තදින් කෝප වී සිටියේ මේ </u>අවහිරය ගැන ය.

101 Hickel, Jason, (2021) *Less is More: How De-growth will Save the Worlds,* London: William Heinamann, p. 61(KE)

පශ්චාත් රදල යුගයේ එසේ බිහි වෙමින් පැවති සමානාත්මතා සමාජය පසු කලක කිනම් ආකාරයක ස්වරූපයක් ගැනීමට ඉඩක් තිබුණේ ද යන්න අපට කවදා වත් දැන ගත හැකි නො වන්නේ මෝදු වෙමින් තිබූ ඒ අපූරු සමසමාජය ප්‍රභූ පැලැන්තිය විසින් දරුණු ලෙස මර්දනය කොට විනාශ කර දමන ලද බැවිනි. වංශවතුන්, පල්ලිය සහ වෙළඳ ප්‍රජාව එක ම පෙරමුණකට පැමිණ ගොවීන්ගේ ස්වතන්ත්‍ර භාවය අවසන් කොට වැටුප් අඩු කිරීමට තැත් කිරීමත් ගොවීන් එයට එරෙහි ව නැගී සිටීමත් සමඟ එකී මර්දනය ඇරඹුණි. ඔවුන් ඒ මර්දනය සිදු කළේ ගොවීන් නැවත ප්‍රවේණිදාසයන් බවට පත් කිරීමෙන් නො ව ගොවිතැන් කළ ඉඩකඩම්වලින් ගොවීන් බලහත්කාරයෙන් පළවා හැරීමෙනි. යුරෝපය පුරා ම පාහේ සිදු වූ මෙම සිදුවීම බොහෝ විට ඉතා දරුණු මර්දනකාරී ස්වරූපයක් ගත්තේ ය. ගොවීන් විසින් පොදු සම්පත් ලෙස සාමූහික ව භාවිත කරනු ලැබූ තණබිම්, වනගහන, ජලාශ ආදිය ප්‍රභූ පන්තිය විසින් පුද්ගලීකරණය කොට මායිම් වැට යොදා කොටු කර ගන්නා ලදී. එතැන් සිට ඒවා හැඳින් වුණේ පොදු සම්පත් ලෙස නො ව 'දේපළ' *(property)* ලෙස ය.

ප්‍රභූවරුන්ගේ බලය යළි තහවුරු කර ගැනීමේ මෙම ක්‍රියාන්විතය හැඳින් වුණේ 'කොටු කිරීම' *(enclosure)* යන නමිනි. මේ කොටු කිරීමේ ක්‍රියාන්විතයේ දී ගොවීන්ගේ වගාවන් ගලවා පුලුස්සා දැමීම සහ ගම්මාන පිටින් මුලිනුපුටා දැමීම නිසා දහස් ගණන් ග්‍රාමීය ප්‍රජාවට යන එන මං නැතිව ගියේ ය. ඉඩම්වලට හෝ වනයට ඇතුළු වීම, දඩයම් කිරීම, තණකොළ කපා ගැනීම, මාලු ඇල්ලීම හෝ ජලය ලබා ගැනීම ආදි එදිනෙදා ග්‍රාමීය ජන ජීවිතයට අත්‍යවශ්‍ය දේවල් කිසිවක් කර ගැනීමට පොදු ජනයාට අවසර නො ලැබුණි. මෙයට අමතර ව යුරෝපයේ බොහෝ පෙදෙස්වල පැතිර ගිය රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණවාදය මේ හානිය තව තවත් උග්‍ර කළේ ය. ඊට හේතුව රෙපරමාදු බලය වැඩි වීමත් සමඟ ම යුරෝපය පුරා තිබූ කතෝලික පල්ලිවලට අයත් ඉඩම් ඩැහැ ගත් වංශවතුන් ඒවායේ පදිංචි ව සිටි සාමාන්‍ය මිනිසුන් එලවා දැමීමයි.

ඒ අතර ඇතැම් පළාත්වල ගොවීහු සටනකින් තොර ව යටත් වීම ප්‍රතික්ෂේප කළහ. එහෙත් ජය ගැනීම ඔවුන්ට ඉතා දුෂ්කර කටයුත්තක් විය. 1525 දි ජර්මනියේ දී එසේ පැන නැගි ගොවි ජන නැගිටීම ඉතිහාසයේ ඉතා දරුණු මනුෂ්‍ය ඝාතනවලින් එකක් ලෙස සැලකෙන, ලක්ෂයකට කිට්ටු ජනතාවක් මරා දැමීමෙන් අවසන් විය. 1549 රොබට් කෙට්ගේ නායකත්වයෙන් එංගලන්තයේ ඇති වූ නැගිටීමට රටෙහි දෙවැනි විශාලතම නගරය වූ නෝර්විච්හි පාලනය අත්පත් කර ගත හැකි වූ නමුත් පසු ව හමුදාව විසින් කැරලිකරුවන් 3500ක් පමණ මරා දමා කැරලි නායකයන් නගර ප්‍රාකාරය වටා එල්ලා එම නැගිටීම ද දරුණු ලෙස මර්දනය කරණු ලැබී ය. මිඩ්ලන්ඩ් කැරැල්ල යනුවෙන් 1607දි ඇති වූ නැගිටීමේ උච්චස්තානය නිව්ටන් නමැති නගරය අල්ලා ගැනීම වූ නමුත් එය ද රදල වංශවත්හු හමුදා යොදා දරුණු ලෙස මර්දනය කළහ.

මෙසේ සියවස් තුනක් තිස්සේ බ්‍රිතාන්‍යයේ සහ යුරෝපයේ විශාල කොටසක් රදල ප්‍රභූවරුන්ගේ ඉහත කී 'කොටු කිරීමේ' ව්‍යාපාරයට ගොදුරු විය. ඒ නිසා ඉඩම්වලින් පලවා හරින ලද මිලියන සංඛ්‍යාත ජනකායක් යන එන මං නැති ව විතැන් වී ආභ්‍යන්තරික සරණාගතයන් වීම නිසා දැවැන්ත අර්බුදයක් උද්ගත විය. මේ කාල පරිච්ඡේදයේ පැන නැගුණු සමාජ කැලඹිලි පමණ ඉක්මවා විස්තර කිරීම නො කළ යුත්තක් නමුදු සැබවින් ම එය අමානුෂික විපතක් වූ බව සැඟවිය නො හැකි ය. ඉතිහාසයේ මුල් වතාවට සිය එදිනෙදා ජීවිතයට අවශ්‍ය අතිශයින් මූලික දේවල් පවා සපුරා ගැනීමේ හැකියාව ගොවි ජනතාවට ක්‍රමානුකූල ව අහිමි කරන ලදී. ඒ මිනිසුන්ට තමන්ගේ නිවාස සහ කුසට අහර අහිමි විය. ප්‍රවේණිදාස ක්‍රමයටත් වඩා කුරිරු තත්වයක් 'කොටු කිරීමේ' ක්‍රියාන්විතය නිසා උද්ගත වූ බව වටහා ගැනීමට යැපීම් ආර්ථිකයක ගොවි ජීවිතය රොමාන්තිකකරණයට ලක් කිරීම අවශ්‍ය නො වේ. කෙසේ වෙතත් 'කොටු කිරීම' නිසා බිහි වූ ලක්ෂ සංඛ්‍යාත දිළින්දන් සහ පාදඩ ජනකාය විස්තර කිරීම පිණිස ඉන් පෙර ඉංග්‍රීසි පාඨයක ඉතා කලාතුරකින් හැර නො යෙදුණු

*Poverty* හෙවත් දරිද්‍රතාව යන වචනය ප්‍රථම වතාවට යහමින් භාවිත වීම එහි බරපතළකම පිළිබිඹු කරයි.

යුරෝපයේ ධන හිමියන්ගේ පැත්තෙන් බැලූ විට 'කොටු කිරීම' ඉතා හොඳින් සාර්ථක විය. එය මඟින් කලින් නො ලැබුණු අන්දමේ විශාල ඉඩම් හා සම්පත් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට ඔවුන්ට හැකි විය. ධනවාදය උද්ගත වීමට කිසියම් ආකාරයක ධනය සමුච්චිත වීමක් හෙවත් ඒකරාශි වීමක් අවශ්‍ය බව ආර්ථික විද්‍යාඥයන් හැම විට ම පවසන දෙයකි. ඇඩම් ස්මිත් එය හැඳින්වූවේ පූර්ව සමුච්චිත වීම *(previous accumulation)* යන නමිනි. ඔහුට අනුව පූර්ව සමුච්චිත වීමක් ඇති වන්නේ ඉතා වැර වෑයමින් වැඩ කරන මිනිසුන් අතළොස්සක් විසින් තමන් උපයා ගත් ධනය ප්‍රවේසමෙන් ඉතුරු කර ගනු ලැබීමෙනි. මේ නෝන්ජල් කතන්දරය තව මත් ආර්ථික විද්‍යා පෙළ පොත්වල පුන පුනා සඳහන් වේ. එහෙත් ඉතිහාසඥයන් එය දකින්නේ බොළඳ කතාවක් ලෙසිනි. මේ ධනය සමුච්චිත වීම කිසි සේත් අහිංසක ඉතුරු කිරීමක් නිසා සිදු වූවක් නො වේ. නිර්දය කොල්ලකෑමක් නිසා සිදු වූවකි. එකී ධන සමුච්චිත වීම තුළ නියෝජනය වන ම්ලේච්ඡ ප්‍රචණ්ඩත්වය හුවා දැක්වීම සඳහා එය 'ප්‍රාථමික සමුච්චිත වීම ' *(primitive accumulation)* යනුවෙන් හැඳින්විය යුතු බව මාක්ස් උදක් ම කියා සිටියේ ය.

එහෙත් ධනවාදයේ නැගී සිටීම තවත් එක් වැදගත් සාධකයක් මත රඳා පැවතුණි. එය නම් ශ්‍රමය යි. ශ්‍රමය සුලබ විය යුතු පමණක් නො ව ඉතා ලාභයට ලබා ගත හැකි ද විය යුතු ය. ධනවාදයට ඒ ප්‍රශ්නය ද ප්‍රභූවරුන්ගේ කොල්ලකාරී 'කොටු කිරීමේ' ක්‍රියාන්විතය නිසා විසඳා ගැනීමට හැකි විය. යැපීම් ආර්ථිකය විනාශ කර පොදු දේපළ භාවිතය අවහිර කර දැමීමෙන් පසු සිය ශ්‍රමය කුලියට විකිණීම හැරෙන්නට වෙන විකල්පයක් ගොවි ජනයාට ඉතිරි නො වී ය. ඒ පෙර මෙන් අමතර ආදායමක් ලබා ගැනීමට හෝ ප්‍රවේණිදාස ක්‍රමය යටතේ මෙන් ඉඩම් හිමි රදලයාගේ ඉල්ලීම සපුරා දීම සඳහා නො වේ. හුදෙක් ම පන නළ රැක ගැනීම සඳහා ය. 'නිර්ධනීන්' *(proletariat)*

යන නම ඔවුන්ට වඩාත් උචිත වූයේ ඒ නිස යි. ඉන් පෙර නො තිබූ නිර්ධනීන් යන එකී යෙදුම ලෝක ඉතිහාසයට මුළුමනින් ම නව්‍ය වූ භාවිතයක් විය. ඇතැම් විට මේ අය 'නිදහස් කම්කරුවන්' ලෙස හැඳින් වුණ නමුත් එය නිසැක ව ම වැරදි අර්ථ කථනයකි. වහලුන්ට හෝ ප්‍රවේණි දාසයන්ට හෝ මෙන් වැඩ කිරීමට නිර්ධනීන්ට බලකෙරීමක් නො තිබුණ බව සැබෑවක් නමුත් විකල්පයකට ඉතුරු වුණේ කුස ගින්නේ සිටීම බැවින් කුලියට වැඩ කිරීම හැර වෙනත් කිසිවක් තෝරා ගැනීමට හැකියාවක් ඔවුන්ට නො තිබිණි. ඒ අතර ඉතා අඩු වැටුපක් නියම කිරීමේ හැකියාව නිෂ්පාදන මාර්ග හිමියන්ට තිබු බැවින් දෙන වැටුපක් පිළිගැනීමට නිර්ධනීන්ට සිදු විය. කොයි තරම් සොච්චමක් වුවත් මරණයට මුහුණ දීමට වඩා ඕනෑ ම වැටුපක් හොඳ ය.

ධනවාදය උද්ගත වූ ආකාරය පිළිබඳ ව මෙතෙක් අපට උගන්වා ඇති සාම්ප්‍රදායික කතන්දරය මේ සියල්ලෙන් නිශ්ප්‍රභ වෙයි. ජේසන් හිකල් විස්තර කරන පරිදි ධනවාදය උද්ගත වීම කිසි සේත් ම ස්වාභාවික ව ඇතිවූ අනිවාර්ය ක්‍රියාවලියක් නො වේ. බොහෝ අය විශ්වාස කිරීමට කැමති පරිදි ධනවාදයේ සම්ප්‍රාප්තිය ක්‍රමානුකූල සංක්‍රාන්තියකින් සිදු වූවක් නො වනවා පමණක් නො ව කිසි සේත් ම සාමකාමී ලෙස සිදු වුවක් ද නො වේ. ධනවාදය උද්ගත වූයේ සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය, බහු ජනතාව හිඟමනට ඇද දැමීම සහ යැපුම් ආර්ථිකය ක්‍රමානුකූල ව විනාශ කර දැමීම මඟින් ය. ධනවාදය මඟින් ප්‍රවේණිදාස ක්‍රමය අවසන් කිරීම වෙනුවට ඇත්ත වසයෙන් ම සිදු වූයේ ප්‍රවේණිදාස ක්‍රමය අවසන් කර දැමූ ප්‍රගතිගාමී ගොවි ජන විප්ලවය ධනවාදය විසින් අවසන් කර දැමීම යි. නිෂ්පාදන මාර්ගවල සම්පූර්ණ පාලනය අත්පත් කර ගැනීමෙන් ගොවියන්ට සහ කම්කරුවන්ට තමන් මත පමණක් යැපීමට සැලැස්වීම මඟින් ධනපතියෝ ප්‍රවේණිදාස ක්‍රමයේ මූලධර්ම නව අන්තයකට ගෙන ගියහ. එහෙත් මේ නව ක්‍රමය දැත් විදහා පිළිගැනීම වෙනුවට පොදු ජනතාව එයට එරෙහි වන්නට පටන් ගත්හ. ඒ අනුව වසර 1500

සිට 1800 අතර කාර්මික විප්ලවය දක්වා වූ කාල පරිච්ඡේදය බටහිර ඉතිහාසයේ ඉතාමත් ම ප්‍රචණ්ඩ ලේ වැගිරීම් සහිත කලබලකාරී කාලපරිච්ඡේදයක් විය.

පොදු මිනිසුන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් සලකා බැලූ විට ප්‍රභූ වංශවතුන්ගේ 'කොටු කිරීමේ' ක්‍රියාන්විතය අතිශයින් විනාශකාරී විය. නිදහස් ගොවි ව්‍යාපාරය විසින් අනුක්‍රමයෙන් වර්ධනය කර ගෙන පැමිණි 'පොදු යහපත' ඒ මගින් සම්පූර්ණයෙන්ම ආපසු හැරවිණි. හෙන්රි පෙල්ප්ස් බ්‍රවුන් සහ ශීලා හොප්කින්ස් යන ආර්ථික විද්‍යාඥයන් දෙපොළ පෙන්වා දෙන පරිදි වසර 1500 සිට 1700 දක්වා කාලය තුළ මූර්ත වැටුප් 70%කින් තරම් පහත වැටිණි. ඒ සමග මන්ද පෝෂණය බහුල වූ අතර කුස ගින්න නිවා ගැනීමට නො හැකි වීම සාමාන්‍ය දෙයක් විය. යුරෝපීය ඉතිහාසයේ ඉතාමත් ම කුරිරු සාගත වාර්තා වන්නේ වසර 1500 ගණන්වල දී ය. මේ ව්‍යසනය එංගලන්තයේ මහජන සෞඛ්‍යය පිළිබඳ ඓතිහාසික ලේඛනවලින් මොනවට පැහැදිලි වෙයි. ඒ අනුව වසර 1500 දි වයස 43ක් වූ පරමායුෂ වසර 1700 වන විට වයස 35 දක්වා අඩු විය.[102]

යුරෝපයේ වෙනත් කවර රටකටත් වඩා 'කොටු කිරීමේ ක්‍රියාන්විතය' වඩාත් ඉදිරියට ගොස් තිබුණේ බ්‍රිතාන්‍යයේ ය. ඒ නිසා ඇතිවිය හැකි සමාජ කලබගෑනිය පිළිබඳ කනස්සල්ලට පත් වූ බ්‍රිතාන්‍යයේ රජ මුල් අවදියේ දී රදල වංශවතුන්ගේ 'කොටු කිරීමේ' ක්‍රියාන්විතය සීමා කිරීමට උත්සාහ කළේ ය. එහෙත් වසර 1640 සිවිල් යුද්ධය සහ විශේෂයෙන් ම ඊනියා ශ්‍රේෂ්ඨ විප්ලවය යනුවෙන් හැඳින්වූ වසර 1688 ඉංග්‍රීසි විප්ලවයෙන් පසු පාර්ලිමේන්තුවේ බලය ධනේශ්වරය විසින් අත්පත් කර ගැනීමත් සමග එකී සීමා අවලංගු කර දැමිණි. ඒ සමග රාජ්‍යයේ මුළු බලය යොදමින් පෙරටත් වඩා දුරදිග ගිය 'පාර්ලිමේන්තු සම්මත කොටු කිරීම' *(Parliamentary Enclosures)* යනුවෙන් හැඳින්වුණ ක්‍රියාන්විතය මගින් සියලු නිර්ප්‍රභූ වැසියන්ගේ

102 Hickel, Jason, (2021) *Less is More: How De-growth will Save the Worlds,* London: William Heinamann, p. 65 (KE)

වගා ඉඩම් අහිමි කිරීමේ දැවැන්ත රැල්ලක් ඇති විය. වාර්තාවලට අනුව වසර 1760 සහ 1870 අතරතුර එසේ පාර්ලිමේන්තු සම්මත කොටු කිරීමෙන් අල්ලා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය අක්කර මිලියන 7ක් හෙවත් එංගලන්තයේ මුළු භූමි ප්‍රමාණයෙන් හයෙන් එකක් පමණ විය. පෙර දී පොදුබිම් යනුවෙන් හැඳින්වුණු ඉඩම් මේ යුගය අවසන් වන විට තවදුරටත් ඉතිරි නො වී ය.

ඉංග්‍රීසි ගොවි ජන පිබිදීම විනාශ කිරීමේ කටයුත්ත සමාප්ත කළ මේ අවසාන ජවනිකාව සහ කාර්මික විප්ලවයේ සමාරම්භය එක විට ම සිදු වූවකි. වගා බිම් හා පදිංචිය අහිමි වී බලාපොරොත්තු සුන් වූ ගම්වැසියෝ එකල යන එන මං නැතිව නගරවලට රොක් වන්නට වූහ. විලියම් බ්ලේක් වැනි ඉංග්‍රීසි කවියන් විසින් සෝපහාසයෙන් හුවා දැක්වූ ඒ "අඳුරු සාතනික කම්හල්වලට" *(dark satanic mills)* ලාභ ශ්‍රමය සැපයුණේ ඔවුන්ගෙනි.

කාර්මික ධනවාදය ඇරඹුණේ එසේ ය. එහෙත් ඒ සඳහා අසාමාන්‍ය මිලක් ගෙවීමට සාමාන්‍ය මිනිසුන්ට සිදු විය. මහජන සෞඛ්‍ය දත්ත වාර්තා පිළිබඳ මුල් පෙළේ විශේෂඥයෙකු වූ සයිමන් ස්රේටර් පෙන්වාදෙන පරිදි කාර්මික විප්ලවයේ පළමු සිය වසරේ විශේෂ ලක්ෂණයක් වන්නේ 14 වන සිය වසේ කළු මහාමාරිය වසංගතයෙන් පසු ජීවිතාපේක්ෂාව පිළිබඳ දක්නට ලැබුණු දරුණු ම පිරිහීම ඒ කාලය තුළ දී සිදුවීම යි. එකල කාර්මිකකරණයේ දැවැන්ත මර්මස්ථාන වසයෙන් සැලකුණ මැන්චැස්ටර් සහ ලිවර්පූල් යන නගරවල ජීවිතාපේක්ෂා දර්ශකය කාර්මීකරණයට ලක් නො වූ ප්‍රදේශ හා සසඳන විට කැපී පෙනෙන ලෙස ඉතා පහළ වැටී තිබුණි. මැන්චැස්ටර්වල එය අවුරුදු 25 දක්වා පහළ වැටුණි. එංගලන්තයේ පමණක් නො ව අධ්‍යයනයට ලක් වූ යුරෝපයේ බොහෝ කාර්මික ප්‍රදේශවල තත්වය ද ඒ හා සමාන විය.[103] පූර්ව ධනවාදී යුගයේ කිසි කලක දක්නට නො ලැබුණු තරම් කුරිරු කාලකන්නි දුක්ඛිතකමක්

103 Szreter Simon,(2003) *The Population Health Approach in Historical Perspective,* American Journal of Public Health 93 (3), pp 421-431

ධනවාදය විසින් එහි ප්‍රථම සියවසර කිහිපයේ දී යුරෝපයේ නිර්ප්‍රභූ ජනතාවට හිමිකර දුන්නේ ය.

දේපළ 'කොටු කර ගැනීමේ' ක්‍රියාන්විතය මත ධනවාදය යුරෝපයේ උද්ගත වීම තේරුම් කිරීමට ඉතිහාසඥයන් සැහෙන මෙහෙයක් ඉටු කර තිබේ. එහෙත් ඒ කාල පරිච්ඡේදය තුළ දී ම යුරෝපීය වෙරළෙන් බැහැරව යුරෝපයේ සිදු වූ ක්‍රමයට බොහෝ දුරට සමාන ව 'ප්‍රාථමික සමුච්චනයක්' ඇති වූ බව අප අමතක නො කළ යුතු ය. පරිමාණය සැලකූ විට යුරෝපයේ සිදු වූ සිදුවීම් අඟුටු මිට්ටෙකු බවට පත් කරන තරමට යුරෝපීය ප්‍රභූන් විසින් රටවැසියන් සමඟ ම ගෝලීය දකුණේ ද අතිවිශාල භූමි ප්‍රමාණයක් ද යටත් විජිත ලෙස කොටු කර ගන්නා ලදී.

යුරෝපීයන් විසින් 1492 න් පසු ගත වූ දශක කිහිපයේ දී ඇමෙරිකා මහාද්වීප දෙක ම යටත් විජිතකරණයට ලක් කළේ පාසල් පොත්වල බෙහෙවින් රොමාන්තිකරණයට ලක් කර ඇති පරිදි හුදෙක් වීරයන් අතළොස්සකගේ දේශගවේෂණ සහ නො සංසිඳෙන කුතුහලය නිසා නො වේ. යටත්විජිතකරණය යනු යුරෝපයේ ගොවි විප්ලව නිසා සිදු වූ ධන විසංචිතවීම *(disaccumulation)* නිසා හෙවත් ධනය තමන් අත ඒකරාශී වීම ඇනහිටීම නිසා ඇති වූ අර්බුදයට යුරෝපීය ප්‍රභූ පෙළැන්තිය විසින් සොයා ගත් ප්‍රතිකර්මයකි. සිය රටවල කොටු කිරීම මඟින් සිදු කළ ආකාරයට ම ධන සමුච්චයනය සඳහා රටින් පිට ද ඔවුහු නව දේශ සීමා කොටු කළහ.

1525 ජර්මන් ප්‍රභූවරුන් සිය රටෙහි ගොවි කැරැල්ල මර්දනය කිරීම පිණිස ගොවීන් 100,000 මරා දමන විට ස්පාඤ්ඤයේ පළමු වැනි කාර්ලෝස් රජු මෙක්සිකෝව හරහා තම හමුදා මෙහෙයවමින් ඇස්ටෙක්වරුන්ගේ ටෙනෝච්ටිලාන් අගනුවර අල්ලා ගෙන ස්වදේශිකයන් 100,000 මරා දැමූ හර්නන් කෝටේට සිය රාජධානියේ ඉහළ ම සම්මානය පිරිනැමුවේ ය. මේ සිද්ධීන් දෙක ම එක විට සිදුවීම උත්ප්‍රාසයකි. ධනවාදයේ නැගීම ආරම්භ වූ ඒ දශක කිහිපය

තුළ යුරෝපයේ 'කොටු කිරීම' හා යටත්විජිතකරණය අතර නො සලකා හැරිය නො හැකි කුලුපග ඓතිහාසික සම්බන්ධකමක් තිබුණි.

මේ යටත් විජිතවලින් උදුරා ගත් ධන ප්‍රමාණය විස්මය ජනක විය. වසර 1500 ගණන්වල මුල සිට 1800 දක්වා කාලය තුළ යටත් විජිත හිමිකරුවන් ඇන්ඩිස් කඳුකරයේ රිදී ආකරවලින් පමණක් රිදී කිලෝග්‍රෑම් මිලියන 100ක් යුරෝපයට ගෙන ආ බව ගණන් බලා තිබේ. ඓතිහාසික වසයෙන් සාමාන්‍යකරණය කළ අනුපාතයකට අනුව වසර 1800 සිට ආයෝජනය කරන ලද්දේ නම් එම රිදී ප්‍රමාණයේ දැන් වටිනාකම ඩොලර් ට්‍රිලියන 165කට අධික වෙන බව ජේසන් හිකල් පෙන්වා දෙයි. එය සමස්ත ලෝකයේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය මෙන් දෙගුණයකි. ඒ එම කාලය තුළ ම දකුණු ඇමෙරිකානු ආකරවලින් හාරා ගන්නා ලද අතිමහත් රත්තරන් ප්‍රමාණයට අතිරේක ව ය. මේ අහඹු වාසිය යුරෝපීය ධනවාදයේ නැගී සිටීම සඳහා ප්‍රධානතම ආධාරකයක් විය. ඒ මඟින් ලැබුණු අතිරික්තයෙන් සැලකිය යුතු කොටසක් කාර්මික විප්ලවය සඳහා ආයෝජනය කරන ලදි. ඒ අනුව හවභෝග ආදී භූමිය ආශ්‍රිතව නිපදවෙන පරිභෝජන භාණ්ඩ නැගෙනහිරෙන් ලබාගෙන තම ජනතාව කෘෂිකර්මාන්තයේ සිට කාර්මික නිෂ්පාදනයට යොමු කිරීමට බටහිර යුරෝපයට හැකි විය. ඒ හැර යටත් විජිත ආදායමෙන් කොටසක් තව තවත් යටත් විජිත අත්පත් කර ගැනීම පිණිස සන්නද්ධ හමුදා ගොඩ නැගීමට වියදම් කෙරුණි.

කාර්මික විප්ලවය සඳහා අවශ්‍ය වූ අමුද්‍රව්‍ය සැපයුණේ ද මේ යටත් විජිත වලිනි. උදාහරණයක් ලෙස කපු සහ සීනි සලකා බලමු. බ්‍රිතාන්‍යය ධනවාදය නැගී සිටීම සම්බන්ධයෙන් වැදගත් ම පරිභෝජන භාණ්ඩය වූයේ එකල ලැන්කැෂයර් ප්‍රදේශය මූර්තිමත් කළ රෙදිපිළි කර්මාන්ත ශාලාවල ජීව රුධිරය වසයෙන් සැලකුණු කපු ය. ඒ අතර යුරෝපයේ කම්කරුවන් සඳහා අඩු මිලකට වැඩි කැලරි ප්‍රමාණයක් ලබාදෙන අත්‍යවශ්‍ය ආහාර අතිරේකයක් ලෙස සීනි සැලකුණි. එහෙත් කපු හෝ සීනි සඳහා අවශ්‍ය කපු පඳුරු සහ

උක් ගස් යුරෝපයේ වැවෙන ශාක නො වේ. ඒ නිසා ඒ සඳහා යුරෝපීයෝ බ්‍රසීලයෙන් සැලකිය යුතු කොටසක ද කැරිබියන් දූපත්වල සහ උතුරු ඇමෙරිකාවේ ද දසලක්ෂ සංඛ්‍යාත අක්කර ප්‍රමාණයක ඉඩකඩම් අත්පත් කරගත්තෝ ය.

කලින් කී රන් රිදී ආකර සහ මෙකී ඉඩම්වල වැඩට යොදා ගැනීමට ස්වදේශිකයන් මිලියන පහක් යුරෝපීයන් විසින් වහල් භාවයට පත් කර ගන්නා ලදී. වහල් භාවයට පත් කිරීමේ එකී ක්‍රියාන්විතය කොතරම් ප්‍රචණ්ඩ එකක් වී දැ'යි කිව හොත් ස්වදේශික ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් ඉන් ජීවිතක්ෂයට පත් විය.[104] එය පවා ප්‍රමාණවත් නොවූ බැවින් සියවස් තුනක් තිස්සේ අප්‍රිකාවෙන් තවත් මිනිසුන් මිලියන 15 ක් යුරෝපා රාජ්‍යානුග්‍රහයෙන් වහලුන් ලෙස අත්ලාන්තික් සාගරය හරහා ඇමෙරිකානු රටවලට නැව් ගත කෙරිණි. වහල් භාවයට පත් කරන ලද මේ අප්‍රිකානුවන්ගෙන් ඇමෙරිකානු එක්සත් ජනපදය කොයි තරම් ශ්‍රමයක් ඩැහැගත්තේදැ'යි කිව හොත් සම්මත අවම වේතනය ඔවුන්ට ගෙවා තිබුණේ නම් අඩු පොලී අනුපාතයක් අනුව ගණන් බැලුව ද එම මුදලේ එකතුව අද වන විට ඩොලර් ට්‍රිලියන 97ක් විය හැකි ව තිබුණි. එය ඇමෙරිකා එක්සත් ජනපදයේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතය මෙන් සිව් ගුණයකි. එයට කැරිබියන් දූපත්වල හා බ්‍රසීලයේ වැඩ කළ වහල්ලු අයත් නො වෙති. යුරෝපීය කර්මාන්ත හිමියන්ගේ විදේශික වතුවලට අවශ්‍ය ශ්‍රමය උදුරා ගත්තේ කුරිරු වහල් වෙළඳාම මගිනි.

මෙයට අමතරව වඩා අප්‍රකට ආකාරයේ ධන සමුච්චකරණයක් ද සිදු වෙමින් පැවතුණි. බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීහු අසාමාන්‍ය මුදලක් ඉන්දියාවෙන් බදු ලෙස රැස් කර ගැනීම ඊට හොඳ උදාහරණයකි. වසර 1765 ත් 1938 ත් අතර ඩොලර් ට්‍රිලියන 45 කට සමාන මුදලක් එසේ ඉන්දියාවෙන් බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරයට අය කර ගන්නා ලද බව ගණන් බලා තිබේ. මේ මුදල් ගලා ඒම බ්‍රිතාන්‍යයේ කාර්මිකකරණයට

104 Reséndez, Andrés, (2016) *The Other Slavery: The Uncovered Story of Indian Enslavement in America* , Houghton: Miffing Harcourt, p. 19

අත්‍යවශ්‍ය යකඩ, තාර සහ දැව වැනි උපායමාර්ගික ද්‍රව්‍ය සපයා ගැනීමට ප්‍රයෝජනවත් විය. හැරත් ඒ මුදල් කැනඩාවේ සහ ඔස්ට්‍රේලියාවේ සුදු ජාතිකයන්ගේ ජනපද ඇති කිරීමටත් කොටු කිරීම නිසා බිහි වූ කුරිරු දුක්ඛිත බවට පිළියම් යෙදීමටත් අවසානයේ දී 1870 ගණන්වල බිහි වූ සමාජ ආරක්ෂණ ක්‍රමය පවත්වා ගෙන යෑමටත් යොදා ගත හැකි විය. අද ඇතැම් බ්‍රිතාන්‍ය දේශපාලනඥයෝ යටත් විජිතවාදය ඉන්දියාව 'සංවර්ධනය' කිරීමට දායක වූ බව පැවසීමට උත්සුක වෙති. එහෙත් ඇත්ත වසයෙන් ම සිදු වූයේ ඉන්දියාව විසින් බ්‍රිතාන්‍යය දියුණු කරණු ලැබීම යි.

මෙහි දී අවධාරණය කිරීමට අවශ්‍ය කාරණාව වන්නේ කාර්මික විප්ලවය සහ යුරෝපීය කාර්මික වර්ධනය ඕපපාතික ව නොහොත් ඉබේ බිහි වූ දෙයක් නො වන බව යි. එය ඇතිවුණේ යටත් විජිතවාසීන්ගෙන් පැහැර ගත් නිජබිම්වල වහලුන් ලවා නිෂ්පාදිත අමුද්‍රව්‍ය යොදා 'කොටු කිරීම' මඟින් බලෙන් ඉවත් කළ යුරෝපීය ගොවීන් ලවා නිමි භාණ්ඩ නිෂ්පාදනය කර ගැනීමෙනි. සාමාන්‍යයෙන් අප සිතන්නේ මේවා එකිනෙකින් වෙනස් වූ සංසිද්ධි ලෙසයි. එහෙත් ඒ සියල්ලට ම පාදක වූයේ එකම න්‍යාය යි. කොටු කර ගැනීම යනු ආභ්‍යන්තරික යටත් විජිතකරණයක් වූ අතර යටත් විජිතකරණය යනු ද කොටු කර ගැනීමක් විය. යුරෝපීය ගොවීන් ඔවුන් ගොවිතැන් කළ ගොවි බිම්වලින් නෙරපා හැරීම ද ප්‍රතිඵලය අතින් ස්වදේශික ඇමෙරිකානුවන් ඔවුන්ගේ ඉඩම්වලින් පලවා හැරීමට සමාන ය. එකම වෙනස ඇමෙරිකානු ස්වදේශිකයන්ට ඔවුන්ගේ ඉඩම් අහිමි වීම පමණක් නො ව කුරිරු වධ හිංසාවලට ලක් වීමට ද බොහෝ විට ජීවිතක්ෂයට පත්වීමට ද සිදුවීම යි. වහල් වෙළඳාම යනු ද සිරුරු කොටු කර ගැනීමක් හෝ යටත් විජිතකරණයට ලක් කිරීමක් නො වේ නම් අතිරික්තය සමුච්චයනය කිරීම සඳහා යොදා ගත් ඉඩම් මෙන් ම දේපළක් වසයෙන් මිනිසුන් මිලට ගැනීමකි.

මෙකී ප්‍රචණ්ඩ ක්‍රියා ඇතැම් විට ධනවාදී ඉතිහාසය තුළ අහම්බෙන් ඇති වූ හුදු නො මඟ යෑමක් ලෙස සුළු කොට සැලකීමට

ද ඉඩ තිබේ. එහෙත් එය එසේ නො වේ. ධනවාදයේ මුල් පදනම වූයේ එකී ප්‍රචණ්ඩත්වය මයි. ධනවාදී වර්ධනය ඇති වුණේ ම යටත්විජිතකරණය නිසා ය.

මේ සියලු සාධකවලට අමතරව තවත් එක් සාධකයක් ධනවාදයේ නැගී සිටීම සඳහා එක් විය යුතු විය. ඔබ දැනට මත් දන්නා පරිදි එකල යුරෝපීය ධනවාදීන් විශාල පරිමාණයෙන් නිෂ්පාදන භාණ්ඩ බිහි කිරීමේ ක්‍රමයක් ඇති කළ නමුත් එම දැවැන්ත නිෂ්පාදන ප්‍රමාණය අලෙවි කිරීමට හැකි වැඩපිළිවෙළක් යොදා ගැනීමට ද ඔවුන්ට සිදුවිය. මේ සා විශාල නිෂ්පාදන සම්භාරයක් අලෙවි කර ගන්නේ කෙසේ ද? කලෙක ස්වයංපෝෂිත ව සිටි ගොවි ජන සමාජය විනාශ කර දැමූ අර 'කොටු කිරීමේ ක්‍රියාන්විතය' මේ ගැටලුවට යම් ප්‍රමාණයක විසඳුමක් ලබා දුන්නේ ය. මන්ද ඉඩම් අහිමි වූ ගොවීන් කම්කරු ජනතාව බවට පමණක් නො ව ආහාර, රෙදිපිළි සහ අනෙකුත් එදිනෙදා අවශ්‍යතා සඳහා බඩු භාණ්ඩ මිලට ගන්නා පාරිභෝගික ජනතාවක් බවට ද පත් වූ බැවිණි.

එහෙත් එය පමණක් ප්‍රමාණවත් නො විණි. සිය භාණ්ඩ සඳහා නව වෙළඳපොළවල් සොයා යෑමට යුරෝපීය ධනවාදීන්ට සිදු විය. එහෙත් ප්‍රශ්නයකට තිබුණේ ගෝලීය දකුණේ බොහෝ ප්‍රදේශවල විශේෂයෙන් ම ආසියාවේ ස්වදේශික ශිල්පීය කර්මාන්තකරුවන් දේශීය අවශ්‍යතා මෙන් ම අපනයනය සඳහා ද ඇතැම් භාණ්ඩ සපයමින් තිබූ බැවින් පිටරටින් ගෙන එන එවැනි භාණ්ඩ වැඩි මිලකට ගැනීම ගැන උනන්දුවක් නො දැක්වීම යි. උදාහරණයක් ලෙස ශාෂි තරූර් ඔහුගේ *Inglorious Empire* කෘතියේ පෙන්වා දෙන පරිදි 18 වන සිය වස මුල් භාගයේ දී සමස්ත ගෝලීය රෙදිපිළි වෙළඳාමෙන් 25%ක් සැපයුණේ ඉන්දියාවෙනි. බෙන්ගාලයේ අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයන් අතින් බිහි වූ සුමුදු මස්ලින් රෙදි යුරෝපීය ඇඳුම් මසන්නන් අතර බෙහෙවින් ජනප්‍රිය වී තිබුණි. 18 වන සිය වසේ අග භාගය වන විටත් බෙංගාලයේ නිෂ්පාදිත විවිධ රෙදිපිළි වර්ග ඉන්දියාවෙන් බටහිර පිහිටි ඊජිප්තුව, තුර්කිය සහ පර්සියාවට ද

පෙරදිග පිහිටි ජාවා, චීනය සහ ජපානය වැනි රටවලට ද නිර්යාත කරමින් තිබුණි. 1750 ස් ගණන්වල දී ඉන්දියාවෙන් නිර්යාත කරන ලද රෙදිපිළිවල වාර්ෂික වටිනාකම රුපියල් මිලියන 16ක් වී යැයි ගණන් බලා තිබේ. මින් මිලියන 5 හේ සිට 6 දක්වා වටිනා රෙදි තොගයක් ඉන්දියාවේ විසූ යුරෝපීය වෙළෙන්දන් විසින් නිර්යාත කරන ලදී. බ්‍රිතාන්‍ය මුදලේ වටිනාකම අනුව මේ වාර්ෂික අපනයනය පවුම්වලින් නම් මිලියන දෙකක් පමණ වේ. එය එකල අතිශයින් විශාල මුදලකි. මේ හැර 1753 දක්වා බෙන්ගාලයෙන් නිර්යාත කරන ලද සිල්ක් රෙදිවල වාර්ෂික වටිනාකම රුපියල් මිලියන 6.5 කි. පාලන බලය අත්පත් කර ගැනීමට පෙර 1757 වන තෙක් ම ඉංග්‍රීසිහු බෙන්ගාලයේ පෙනී සිටියේ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම යටතේ ඉන්දියානු භාණ්ඩ මිලට ගන්නා වෙළෙන්දන් වසයෙනි. ඔවුන්ගේ ඉල්ලුම නිසා ම එකල බෙන්ගාලයේ රෙදිපිළි හා සිල්ක් නිෂ්පාදනය 33% කින් ඉහළ ගියේ ය[105].

එහෙත් බ්‍රිතාන්‍යයේ රෙදිපිළි කර්මාන්තය වර්ධනය වීමත් සමඟ වඩා ලාභ ඉන්දියානු රෙදිපිළි සමඟ තරඟ කිරීමට අපොහොසත් වීම නිසා ඉන්දීය රෙදිපිළි කර්මාන්තය විනාශ කර දැමීමට බ්‍රිතාන්‍යයට අවශ්‍යය විය. ඒ අනුව එවකට පාලනය නතු කර ගෙන සිටි ඉංග්‍රීසි පෙරදිග ඉන්දියානු සමාගමේ සොල්දාදුවෝ බෙංගාලයේ රෙදිපිළි නිෂ්පාදකයන්ගේ අත් යන්ත්‍ර සොය සොයා ගොස් විනාශ කර දැමූහ. ශාෂි තරූර් උපුටා දක්වන එක් සමකාලීන වාර්තාවකට අනුව නැවත අත් යන්ත්‍ර මෙහෙයවීමට නො හැකි වන ලෙස ඉංග්‍රීසි සොල්දාදුවෝ ස්වදේශික රෙදි වියන්නන්ගේ මහපට ඇඟිලි කඩා දැමූහ. ඒ හැර ඉතිරි රෙදිපිළි නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන හැකියාව අවහිර කිරීම සඳහා 70% සිට 80% දක්වා වු බදු ප්‍රමාණයක් නිෂ්පාදිත රෙදිවලින් අය කෙරිනි. ඒ අනුව ඉන්දියානු රෙදිපිළි තවදුරටත් ලාභ දායක නොවීය. ඒ වෙනුවට එංගලන්තයේ ලැන්කැෂයර්හි නව වාෂ්ප ජනක කම්හල්වල නිපදවූ රෙදිපිළි බේල් ගණනින් ඉන්දියානු වෙළඳපොළට

105 Tharoor Shashi,(2017) *Inglorious Empire, Victoria: Scribe Publications, pp. 37-38*

නිකුත් කෙරිණ. වරාය මෙන් ම රජය ද බ්‍රිතාන්‍යයන් යටතේ පැවති බැවින් බ්‍රිතාන්‍ය රෙදිපිළිවලට ආනයන බද්දක් පැනවීමේ හැකියාවක් ඉන්දියානුවන්ට නො තිබිණි. ඒ අනුව ලාභ දායක බ්‍රිතාන්‍ය රෙදිපිළි හා තරඟ කිරීමට අපොහොසත් ව ඉන්දියානු රෙදි පිළි කර්මාන්තය මුළුමනින් ම කඩා වැටුණේ ය. බ්‍රිතාන්‍යය පෙරදිග ඉන්දියා සමාගමේ පාලනාධිකාරී විලියම් බන්ටිනික් සාමිවරයා උජාරුවෙන් ලියූ අන්දමට "රෙදි වියන්නන්ගේ ඇටකටුවලින් ඉන්දියාවේ තැනිතලා සුදු වී ගියේ ය"

බ්‍රිතාන්‍ය විසින් විනාශ නො කරන්නට කලක් ගත වන විට බොහෝ ඉන්දියානු රෙදි වියන්නන්ට වැඩිදියුණු කළ තාක්ෂණය යොදා ගනිමින් සිය කර්මාන්තය ඉදිරියට ගෙන යන්නට ඉඩ තිබුණි. එහෙත් අර ධනවාදී සාධකය, එනම් යුරෝපීය නිෂ්පාදනවලට වෙළඳපොළ පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව පිණිස ස්වදේශීය කර්මාන්ත බිල්ලට ගත යුතු විය. බලාත්කාරකම් සහ අසමමිතික වෙළඳ නීති යෙදා ගනිමින් යුරෝපීය ධනවාදීහු අමු ද්‍රව්‍ය ප්‍රභවයක් ලෙස පමණක් කටයුතු කිරීමට යටත් විජිතවලට බල කළා පමණක් නො ව යුරෝපීය නිෂ්පාදන භාණ්ඩ සම්භාරය සඳහා ගැලවී යා නො හැකි අල්ලා බැඳගත් වෙළඳපොළක් ද සකසා ගත්තේ ය. චක්‍රය මෙසේ සම්පූර්ණ වූ පසු යුරෝපීය ධනවාදය නො කඩවා වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස  ලෝක කාර්මික නිෂ්පාදනයේ මුළු ප්‍රමාණයෙන් 1750 වන විට ගෝලීය දකුණ සතු ව තිබූ 77% ක ප්‍රතිශතය 1900 වන විට 13% දක්වා අඩු විය.[106]

මේ අවහිරය විසඳීම පිණිස යටත්විජිතවාදීහු ස්වදේශිකයන්ගේ කර්මාන්ත විනාශ කිරීම සඳහා අසමමිතික වෙළඳ නීති පැනවූ හ. ඒ අනුව යුරෝපීය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයන්නන් ලෙස පමණක් කටයුතු කිරීමට ස්වදේශිකයන්ට බල කෙරිණි.

106 Tomlinson, B.R (1996) Economics: The Periphery, In the *"The New Cambridge History of India"*, Vol 3, 3, Cambridge: Cambridge University Press, p. 15.

# - 10 -

## ආර්ථික චින්තනයේ සීමා

නෝවා ගුඩ්වින් ප්‍රමුඛ අර්ථශාස්ත්‍රඥයන් විසින් ලියූ *Microeconomics in Context* කෘතියේ නවතම සංස්කරණය ආරම්භ වන්නේ "ආර්ථික විද්‍යාව යනු මිනිසුන් සිය අවශ්‍යතා සපුරා ගැනීම සහ තම යහපැවැත්ම *(well-being)* වැඩිදියුණු කර ගැනීම සඳහා තමන් සතු සම්පත් කළමනාකරණය කර ගන්නා ආකාරය අධ්‍යනය කිරීමයි" යනුවෙනි[107]. මෙහි දැක්වෙන 'යහපැවැත්ම' යන්න විවිධ පුද්ගලයන් විවිධාකාරයට තේරුම් ගනු ඇත. එහෙත් තමන් කල්පනා කරන ආකාරයට එවැනි අර්ථ දැක්වීමක් හැම දෙනෙකුට ම ආදේශ කළ හැකි දෙයක් විය යුතු බව ගුඩ්වින් පවසයි. අපේ යහපැවැත්ම සාමාන්‍යයෙන් රැඳී ඇත්තේ අප ලබන ආදායම සහ අපේ ජීවන මට්ටම ප්‍රදර්ශනය වන ද්‍රව්‍යයමය වස්තුවල අගය පිළිබඳ සාම්ප්‍රදායික දර්ශක මත යි. එහෙත් අප ජීවත් වන පරිසරයේ ප්‍රශස්ත බව, අපට ලැබෙන විවේක කාලය සහ අප අයත් වන සමාජය කොයි තරම් සාධාරණ ද යන්න පිළිබඳ අපේ අවබෝධය වැනි වෙනත් බොහෝ කරුණු මත ද අපේ යහපැවැත්ම නිර්ණය විය යුතුය. කෙසේ වෙතත් ඒවා ආර්ථික විද්‍යාවේ විෂය පථයෙන් බැහැර ව පවතින දේවල් බව සාම්ප්‍රදායික ඇදහීම යි.

පොදු ජනතාව අතර පවතින සාමාන්‍ය පිළිගැනීම වන්නේ ආර්ථික විද්‍යාව යනු අමාරු විෂයයක් බව යි. ආර්ථික විද්‍යාඥයෙකු

107 Goodwin, Neva et. Al. (2019) *Microeconomics in Context,* New York: Routledge p.1-2

රූපවාහිනිය ඔස්සේ තර්ක කරන අන්දම දකින කෙනෙකුට ඔහුගේ ඇතැම් තර්ක ප්‍රශ්නකාරී විය හැකිය. එහෙත් ආර්ථිකය පිළිබඳ ආර්ථික විද්‍යාඥයාට ඇතැ'යි සැලකෙන විශේෂඥ භාවය සලකා ඔහුගේ ඒ නො තේරෙන අදහස් පවා අවිචාරයෙන් පිළිගැනීමට බොහෝ අයට සිදු වෙයි.

කෙසේ වෙතත් එකක් පැහැදිලි යඃ එනම් ආර්ථික විද්‍යා නියාම අපේ එදිනෙදා ජීවිතයට බලපාන රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ ලා තීරණාත්මක භූමිකාවක් ඉටු කරන බව යි. අපේ රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ මව්බස වන්නේ ආර්ථික විද්‍යාවයි. එමෙන් ම සමාජයේ පොදු මානසිකත්වය හැඩ ගස්වන භාෂාව ද ආර්ථික විද්‍යාව යි. විසිඑක් වෙනි සියවසේ මේ මුල් දශකවල සංවර්ධනය පිළිබඳ මූලික ම කතන්දරය වී ඇත්තේ ද චිරාගත ආර්ථික විද්‍යා විශ්වාස, නවලිබරල්වාදී ආර්ථික වටිනාකම් සහ උපකල්පන අඩංගු වන සාම්ප්‍රදායික ආර්ථික විද්‍යා ආඛ්‍යානය යි. මේ ආඛ්‍යානයට අයත් වාං මාලාව ජනමාධ්‍ය හරහා පුනරුච්චාරණය කරන විවිධාකාර දේශපාලනඥයන්ගෙන්, ඔවුන්ගේ අනුශාසකයන්ගෙන් සහ අනුගාමිකයන්ගෙන් බොහෝ විට අපේ කන්වලට නිවනක් නැත.

මේ නිසා ආර්ථික විද්‍යාඥයින් මිනිසුන්ගේ සිතුම් පැතුම් මෙහෙයවන ඉමහත් බල අධිකාරයක් ගොඩනගා ගෙන තිබේ. ජාත්‍යන්තර ප්‍රතිපත්ති සාකච්ඡා කරන ලෝක බැංකුවේ සිට ලෝක වෙළෙඳ සංවිධානයේ රැස්වීම් දක්වා ඉදිරි පෙළ අසුන් අරක් ගෙන සිටින්නෝ ආර්ථික විද්‍යාඥයෝ ය. බලගතු අයගේ කන් ආර්ථික විද්‍යාඥයාගේ මතවලට නිරන්තරයෙන් ම විවෘතය. උදාහරණයක් වසයෙන් ගත්තොත් දිගු කලක සිට එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ ආර්ථික උපදේශක කවුන්සලය ධවල මන්දිරයේ ඇති උපදේශක මණ්ඩල අතරින් වඩාත් ම බලසම්පන්න උපදේශක මණ්ඩලය වී තිබේ. එයට අනුරූප ව පිහිටුවා ඇති පරිසරය පිළිබඳ උපදේශක මණ්ඩලය ගැන හෝ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ උපදේශක මණ්ඩලය ගැන හෝ කිසිවෙකු දන්නා බවක් වත් පෙනෙන්නට නැත.

ඇත්ත වසයෙන් ම මේ සා බල අධිකාරයක් ආර්ථික විද්‍යාවට තිබීම ගැන හැම ආර්ථික විද්‍යාඥයෙකු ම ඒ තරම් මනාපයක් දක්වා නැත. දෙවන ලෝක මහා යුද්ධයෙන් පසු ආර්ථික විද්‍යා චින්තනයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ ජෝන් මේනාඩ් කේන්ස් ආර්ථික විද්‍යාවේ මේ බලාධිකාරී භූමිකාව ගැන සැලකිය යුතු විවේචනාත්මක ආකල්පයක් දැරූ අයෙකි. ඔහුට අනුව ආර්ථික විද්‍යාඥයන් සහ දේශපාලන දාර්ශනිකයන් කියන දේවල්වලට අප ඒවායේ හරි වැරදි බව නො තකා සාමාන්‍ය බුද්ධිය ඉක්මවා ගිය අනවශ්‍ය බලසම්පන්න බවක් ආරෝපණය කර තිබේ. එම අදහස හරියටම ආර්ථික වර්ධනය හැර ලෝකය පාලනය කරන වෙනත් කිසිම දෙයක් නැතැයි සිතන තරමට ම මුල් බැහැ ගෙන තිබේ.

නවලිබරල්වාදයේ පියා ලෙස විරුදාවලි ලත් ඔස්ට්‍රියානු ආර්ථික විද්‍යාඥ ෆ්‍රීඩ්රික් වොන් හයෙක් 1940 ගණන්වල සිට ම කේන්ස්ගේ ආර්ථික මතවාද තදින් ම ප්‍රතික්ෂේප කළත් ආර්ථික විද්‍යාඥයින්ට අනවශ්‍ය අධිකාරයක් ලබා දීම සම්බන්ධයෙන් නම් කේන්ස් සමඟ මුළුමනින් ම එකඟ වීය. ගුනාර් මිර්ඩාල් සමඟ 1974 දී ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය බෙදා ගත් හයෙක් මෙසේ පැවසීය:

> **"මේ නොබෙල් ත්‍යාගය පිහිටුවන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් මගේ අදහස විමසී නම් නොබෙල් ත්‍යාගය පිහිටුවීම ගැන මම ඉඳුරා ම විරුද්ධ වෙමි. මන්ද නොබෙල් ත්‍යාගය මඟින් පුද්ගලයෙකුට පිරිනමන අධිකාරය ආර්ථික විද්‍යාවට අනුව කිසිදු කෙනෙකු විසින් හිමි නො කර ගත යුතු දෙයක් වන බැවිනි. ඊට හේතුව ආර්ථික විද්‍යාඥයෙකුගේ බලපෑමට වැඩියෙන් ම ගොදුරු වෙන්නේ දේශපාලනඥයන්, මාධ්‍යවේදීන්, සිවිල් නිලධාරීන් සහ පොදු ජනතාව වැනි ආධුනිකයන් වීම නිසයි.... ජනමාධ්‍ය විසින් බොහෝ විට සලකන අන්දමට මෙන් ම හා ඒ නිසා අවසානයේ දී අදාළ පුද්ගලයාට ම විශ්වාස කිරීමට බල කෙරෙන අන්දමට සමාජයේ ඇති හැම ප්‍රශ්නයක් පිළිබඳව ම සර්වතෝභද්‍රයෙකු වීමට ආර්ථික විද්‍යාවට කැපී පෙනෙන දායකත්වයක් දුන් අයෙකුට හැකියාවක් ඇතිවීමට කිසිම හේතුවක් නැත"[108]**

108 https://www.nobelprize.org/prizes/economic-sciences/1974/hayek/speech/ Retrieved on 21 April 2021

විසිවැනි සියවසේ විසූ වැදගත් ම ආර්ථික විද්‍යාඥයන් දෙපොළ ආර්ථික විද්‍යාවේ බල පෑම පිළිබඳ එසේ අනතුරු හඟවා තිබිය දීත් ආර්ථික විද්‍යාඥයින්ගේ ආධිපත්‍ය මොන තරම් ක්ෂේත්‍රවලට පැතිර ඇද්දැ'යි කිව හොත් දැන් මහජන ජීවිතයේ හැම දෙයක් ම නිර්ණය වන්නේ හුදෙක් ම ආර්ථික විද්‍යා තක්සේරු කිරීම්වලට අනුව ය. ඒ අනුව ආරෝග්‍ය ශාලාවල වෛද්‍යවරු සහ රෝගීන් අතර ඇති සම්බන්ධය හුදෙක් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන් අතර ඇති සම්බන්ධයක් ලෙස හඳුන්වනු ලැබේ. ඒ අතර ලෝකයේ ඇති තෙත් බිම්වල වාර්ෂික වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 3.4 බැගින් වන ලෙස ද ලොව පුරා කෘමීන් විසින් කරනු ලබන පරාග ණයේ වාර්ෂික වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 160 ක් ආදී වසයෙන් ද හැම මහාද්වීපයක ම වගාබිම් සහ වනගහනවල ගැබ් ව ඇති 'ස්වාභාවික ප්‍රාග්ධනය' සහ 'පරිසර පද්ධති මඟින් ඉටු වන සේවය' ආර්ථික විද්‍යාඥයින් විසින් මිල වටිනාකම්වලට හරවනු ලැබ තිබේ.

මේ අතර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල ශීර්ෂ පාඨ කොටස් මිල ගණන් සහ එක් එක් කාර්තුවේ දී මුල් පෙළේ කෝපරේට් සමාගම් ලබන ප්‍රතිලාභ උත්කර්ෂණයට නැංවීම මඟින් මූල්‍ය අංශයේ ඇති බර සාර වැදගත්කම අපට දිනපතා ඒත්තු ගැන්වීමට තැත් කරයි.

ආර්ථික විද්‍යාවට මහජන ජීවිතය සම්බන්ධයෙන් ආරෝපණය කර තිබෙන මේ බලසම්පන්න බව නිසා බොහෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ තම අධ්‍යාපනයේ කොටසක් වසයෙන් එක් ආර්ථික විද්‍යා පාඨමාලාවක් වත් ඉගෙන ගැනීමට උනන්දු වෙති. ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් හැම වසරක දී ම ශිෂ්‍ය ප්‍රජාවෙන් මිලියන 5 ක් තම උපාධිය සඳහා අවම වසයෙන් එක් ආර්ථික විද්‍යා පාඨමාලාවක් වත් හදාරන බව "ඩෝනට් ආර්ථිකය" *(Doughnut Economy)* නමැති කෘතිය ලියූ නව පරපුරක විචාරශීලී ආර්ථික විද්‍යාඥවරියක වන කේට් රේවර්ත් පෙන්වා දෙයි.

එක්සත් ජනපදය මුලින් ම හඳුන්වා දුන් *Econ-101* නම් මූලික ආර්ථික විද්‍යා පාඨමාලාව හැදෑරීම චීනයේ සිට චිලී රට දක්වා ලෝකය පුරා ශිෂ්‍ය ප්‍රජාවගේ නියත ඉරණමක් බවට පත් වෙන තරමට ප්‍රචලිත වී තිබේ. නොයෙකුත් භාෂාවන්ට පරිවර්තනය කර ඇති මේ පාඨමාලාව සඳහා තවමත් යොදා ගන්නේ චිකාගෝ, කේම්බ්‍රිජ් සහ මැසචුසෙට්ස් විශ්ව විද්‍යාලවල එකල ඒ සඳහා යොදා ගනු ලැබූ පාඨ ග්‍රන්ථවල පරිවර්තන බව විකල්ප ආර්ථික විද්‍යා චින්තනයක අවශ්‍යතාව හුවා දක්වමින් කේට් රේවර්ත් පෙන්වා දෙයි. අනාගතයේ දී තමන් ව්‍යවසායකයෙකු, වෛද්‍යවරයෙකු, මාධ්‍යවේදියෙකු හෝ දේශපාලන ක්‍රියාකාරියෙකු වේද යන්න නො තකා, මේ හැම ශිෂ්‍යයෙකුට ම *Econ-101* පාඨමාලාව සිය පුළුල් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත්කර ගැනීමට සිදු ව ඇත. එපමණක් නො ව කෙදිනක වත් ආර්ථික විද්‍යාව ඉගෙන ගෙන නැති අය සම්බන්ධයෙන් පවා සමාජ හා පෞද්ගලික කතිකා විවාදවල දී ආර්ථිකය යනු කුමක් ද? එය වැඩ කරන්නේ කෙසේ ද? කුමක් සඳහා ද? යන කරුණු කාරණා සම්බන්ධ සිතුම් පැතුම් පමණක් නො ව ආර්ථිකය පිළිබඳ භාෂා ව්‍යවහාරය පවා මෙහෙයවෙන්නේ *Econ-101* නම් මූලික පාඨමාලාවේ අනුභාවයෙනි.

සම්ප්‍රදායික ආර්ථික විද්‍යාවට අනුව සාර්ව ආර්ථිකය *(macro-economy)* නිරූපණය කරන දළ රූපාදර්ශයක් ආචාර්ය පොල් ඒ සැමුවෙල්සන් 1948 දී පළ කළ *Economics: An Introductory Analysis* නම් කෘතියේ එයි. වෘත්තාකාර ප්‍රවාහ රූසටහන *(Circular Flow Diagram)* නමින් හැඳින්වෙන ඒ රූපාදර්ශය සමස්ත ආර්ථිකය ගැන පොදු ජනතාවට පැහැදිලි කර දීමට යොදා ගත හැකි මාහැඟි රූසටහනක් ලෙස දිගු කලක් තිස්සේ සැලකුණි. සමස්ත ආර්ථිකය ගැන කල්පනා කරන විට සැමුවෙල්සන් අවධානය යොමු කර ඇත්තේ කිනම් ක්‍රියාකාරිකයින් සහ කිනම් භූමිකා ගැන ද යන්න එකී රූසටහනින් නිරූපණය වී යැයි සැලකිය හැකිය. එහෙත් එහි ඇති සීමාකම් විස්තර කිරීම පිණිස ඒ රූපාදර්ශයේ පහත දැක්වෙන

සංස්කරණය කේට් රේවර්ත් සිය *Doughnut Economics* කෘතියට ඇළත් කර තිබේ.

සර්ව ආර්ථිකය
*Macro-economy*




ඉහත රූපාදර්ශයෙන් පිළිබිඹුවෙන සම්ප්‍රදායික විශ්ලේෂණයට අනුව සමස්ත ආර්ථිකයේ ම කේන්ද්‍රීය කාරණය වන්නේ පවුල හෙවත් කුටුම්බය සහ ව්‍යාපාර අතර ඇති වෙළඳපොළ සම්බන්ධතාව බව රේවර්ත් පෙන්වා දෙයි. එයට අනුව කුටුම්බ තම ශ්‍රමය හෝ ප්‍රාග්ධනය හෝ ව්‍යාපාර සඳහා සපයා දී වැටුප් හෝ ලාභාංශ හෝ ලබාගනී. අනතුරුව එම ආදායම ව්‍යාපාර මඟින් සපයන භාණ්ඩ සහ සේවා මිලට ගැනීම සඳහා පරිභෝජන වියදම් ලෙස වැය කර යි. ඒ අන්දමින් නිෂ්පාදනය සහ පරිභෝජනය අතර පවතින අන්තර්ක්‍රියාකාරිත්වය නිසා ආදායමේ චක්‍රීය හෙවත් වෘත්තාකාර ප්‍රවාහයක් ඇති වේ. වෙනත් සාධක තුනක් එනම්, බැංකු, රජය සහ විදේශ වෙළඳාම මැදිහත් නො වන්නට බාධාවකින් තොර ව එම ආදායම් ප්‍රවාහය එසේ සරල වෘත්තාකාර ප්‍රවාහයක් ලෙස ම පවතින්නට ඉඩ තිබුණි. එහෙත් බැංකු, රජය සහ ආයාත නිර්යාත වෙළඳාම මඟින් කුටුම්බවල හා ව්‍යාපාරවල ආදායමෙන් කොටසක් වෙනත් කටයුතු සඳහා යොමු කර යි. ආදායම් සහ ඉතුරු කිරීම් තැන්පතු ලෙස ලබා ගන්නා බැංකු ඒවා ණය හා ආයෝජන වසයෙන් නැවත ලබා දේ. ආණ්ඩුව ද

ආදායමෙන් කොටසක් බදු වසයෙන් අය කර ගන්නා නමුත් එය පොදු වියදම් සඳහා යොදා ගනී. අපනයන වෙළඳාමෙන් උපයා ගන්නා විනිමයෙන් වැඩි කොටසක් භාණ්ඩ ආනයන සඳහා යොදා ගැනීමට සිදු වේ.

සැමුවෙල් මේ රූපාදර්ශය ජෝන් මේනාඩ් කේන්ස් ඉදිරිපත් කළ ආර්ථිකයේ සර්පිලාකාර අවධමනය පිළිබඳ මතය විස්තර කිරීමට ද යොදා ගත්තේ ය. ඒ අනුව කිසියම් හේතුවක් නිසා කුටුම්බ සිය වියදම් අඩු කළ විට (උදාහරණයක් ලෙස ඉදිරියේ දී අමාරු කාලයක් ඉදිරියේ ඇති වෙතැ'යි සිතීම නිසා) භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම ද අඩුවේ. ඒ අනුව ව්‍යාපාර හා කර්මාන්තවලට අවශ්‍ය කරන සේවක ප්‍රමාණය ද අඩුවේ. ඒ නිසා රැකියාවලින් ඉවත් කිරීම වැඩිවේ. රැකියා වියුක්තිය වැඩි වූ විට භාණ්ඩ විකුණා ගැනීමේ හැකියාව ද අඩුවේ. මෙය චක්‍රයක් මෙන් යළි යළි සිදුවිය හැකිය. එ නිසා කේන්ස් ට අනුව නැවත ආර්ථිකය කෙරෙහි විශ්වාසය තහවුරු වන තෙක් අවධමනය වැළැක්වීමට රජය වහා ම මැදිහත් වී රාජ්‍ය ව්‍යාපෘති මඟින් අන්තර්කාලීන ව රැකියා අවස්ථා ඇති කළ යුතු ය.

මෙම රූපාදර්ශය එක්තරා දුරකට සාර්ව ආර්ථිකයේ බහුවිධ පැතිකඩ නිරූපණය කරන රූපාදර්ශයක් බව සැබැවි. සමස්ත ආර්ථිකය පිළිබඳ ආදර්ශනයක් වසයෙන් ගත්තොත් සංවෘත පද්ධතියක් ලෙස එහි වැරැද්දක් නැති බව පෙනේ. එහෙත් අනෙක් ඕනෑම ආදර්ශනයක් මෙන් ම අදාළ ක්ෂේත්‍ර සම්බන්ධ එමඟින් ඉදිරිපත් වෙන සාධක මෙන් ම ඉදිරිපත් නො කරන සාධක සම්බන්ධයෙන් ද අප අවධානය යොමු කර යුතුය. ඒ අනුව ප්‍රශ්නය වන්නේ මතුපිටට නො පෙනෙන ඇතැම් තීරණාත්මක ආර්ථික සාධක ඉහත කී සම්ප්‍රදායික රූසටහනෙන් නො සලකා හැරීම යි. උදාහරණයක් වශයෙන් වැදගත් ම ආර්ථික සාධකයක් වන බලශක්ති අවශ්‍යතා එමඟින් සහමුලින් ම නො තකා හැර තිබේ. ඒ හැර ආර්ථික කටයුතු සඳහා අත්‍යවශ්‍යය වන ද්‍රව්‍යයමය සම්පත්වල තිරසාර පැවැත්ම පිළිබඳව ද එය නිහඬ ය. මෙම තීරණාත්මක දුර්වලකම් හිතා මතාම කළ නො සලකා හැරීමකට

වඩා සාර්ව ආර්ථිකය පිළිබඳ ඒ වන විට පැවැති  සීමිත අවබෝධය නිසා සිදු වූවක් විය හැකි ය.

විසි එක් වෙනි සියවස ඔස්සේ මනුෂ්‍ය ප්‍රගමනය මෙහෙයවන්නේ වර්තමානයේ ශිෂ්‍යයන් ලෙස උසස් අධ්‍යාපනය ලබන අනාගත ප්‍රතිපත්ති සම්පාදකයන්, ව්‍යවසායකයින්, ගුරුවරුන්, මාධ්‍යවේදීන්, සංවිධායකයන්, ප්‍රජා ක්‍රියාකාරියන් සහ ඡන්දදායකයන් විසිනි. ඒ අනුව 2050 වන විට මුල් පෙළේ පුරවැසියන් බවට පත් වීමට නියමිත ඒ අයගේ සිහි මොළය අවාසනාවකට මෙන් හැඩ ගැසෙන්නේ 1850ස් ගණන්වල බිහි වූ ආර්ථික න්‍යායන් පදනම් කොට 1950 ස් ගණන්වල ලියන ලද පාඨ ග්‍රන්ථවල ආභාසයෙන් බව කේට් පෙන්වා දෙයි. එහෙත් විසිඑක් වෙනි සියවසේ සිදු වෙමින් පවතින පෙර නොවූ විරූ ශීඝ්‍ර වෙනස්වීම් සලකා බැලූ විට එවැනි යල් පැන ගිය මොළ ශෝධනයක් සියල්ලන්ගේ ම ව්‍යසනයකට පාර  නො කපනු ඇතැ'යි අපට සහතික විය හැකි ද?.

ආර්ථික විද්‍යාව යනු  ඔය කියන තරම් අමාරු විෂයයක් ද? සරල කොයි කාටත් තේරෙන බසකින් විෂය කරුණු විස්තර කරන්නේ නම් ඇත්ත වසයෙන් ම ආර්ථික විද්‍යාව යනු අපහසු විෂයයක් නො වේ. *23 Things They Don't Tell You About Capitalism (*ධනවාදය ගැන ඔවුන් ඔබට නො කියන කරුණු විසි තුනක්*)* යන කෘතිය ලියූ ආර්ථික විද්‍යාඥ හා-ජූන්ග් චැන්ග් පවසන පරිදි ආර්ථික විද්‍යාවෙන් 95% ක් ම දුරවබෝධ හෙවත් අපභාෂණීය *(jargon)* වචන සහ ගණිතමය සූත්‍ර මඟින් බෙහෙවින් අමාරු විෂයයක් ලෙස පෙනෙන්ට සලස්වනු ලැබූ හුදු සාමාන්‍ය දැනීම යි.

යම් තාක්ෂණික දැනුමක් අවශ්‍ය ඕනෑ ම විෂයයක් - එය ආර්ථික විද්‍යාව, ජල නල කාර්මික ශිල්පය හෝ වෛද්‍ය කර්මය හෝ වේවා එම විෂය සම්බන්ධ වෘත්තීය සංනිවේදනය පිණිස යොදා ගන්නා අපභාෂණීය ව්‍යවහාරය එම විෂය ගැන පිටස්තරයන් සමඟ කෙරෙන සංනිවේදනය අමාරු දෙයක් බවට පත් කරයි. හා-ජූන්ග් චැන්ග්ගේ වචනයෙන් ම වඩා නරුම අන්දමකට කියන්නේ නම් යථා

තත්වයට වඩා සංකීර්ණ බවක් පෙන්නුම් කිරීම සියලු තාක්ෂණික වෘත්ති සම්බන්ධයෙන් පොදු ලක්ෂණයකි. එය අදාළ වෘත්තිකයන් සිය සේවා සඳහා ඉහළ ගාස්තු අය කිරීම සාධාරණීකරණය කිරීමට යොදා ගන්නා උපක්‍රමයකි.

මේ සියල්ල සලකා බැලූ විට ආර්ථික විද්‍යාව ඇසුරු කිරීමට, ආර්ථික විද්‍යාව හා නියුක්ත වීමට පොදු ජනතාව දක්වන මැලිකම ඒ ආකාරයෙන් ම පවත්වා ගැනීම අතින් ආර්ථික විද්‍යාව බෙහෙවින් සාර්ථක වී ඇති බව කිව හැකි ය. අදාළ විෂය ගැන තිබිය යුතු විශේෂඥභාවයක් තමන්ට නැති වුනත් දේශගුණය වෙනස් වීම, සමලිංගික විවාහය, අයිඑස්අයිඑස් ව්‍යාපාරය, න්‍යෂ්ටික බලාගාර වැනි බොහෝ කරුණු ගැන තම මතය ප්‍රබල ලෙස ප්‍රකාශ කිරීමට මිනිස්සු කිසිදු මැලිකමක් නො දක්වති. එහෙත් බොහෝ විට ආර්ථිකය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් මිනිසුන් ප්‍රබල මතයක් දක්වනවා තබා උනන්දුවක් වත් දක්වන බවක් වත් පෙනෙන්ට නැත.

යුරෝවල අනාගතය, චීනයේ මිනිසුන් අතර ඇති ආදායම් විෂමතාව, ඇඟලුම් වෙළඳපොළ හැකිළීම, ඇමෙරිකාවේ නිෂ්පාදන කර්මාන්තවල අනාගතය වැනි කරුණු ගැන ඔබ අවසන් වරට සාකච්ඡා කළේ කවදා ද? ඔබ කොහේ ජීවත් වුණත් එකී කරුණු ඍණාත්මක හෝ ධනාත්මක ලෙස හෝ ඔබේ රැකියා අවස්ථා, වේතනය සහ විශ්‍රාම වැටුප වැනි දෑ ගැන නිසැක ලෙස බලපානු ඇත. එහෙත් ඒවා ගැන ඔබ බරපතළ ලෙස කල්පනා කරන බවක් පෙනෙන්ට නැත.

මේ කුතුහලය දනවන මැලිකමට එක් හේතුවක් වන්නේ ආදරය, අවතැන් වීම, මරණය හෝ යුද්ධය වැනි දෑ සම්බන්ධයෙන් තරම් මනෝභාවීය ආකර්ෂණයක් ආර්ථික කරුණු සම්බන්ධයෙන් අපට ඇති නො වීම විය හැකි ය. විශේෂයෙන් පසුගිය දශක කිහිපය තුළ ආර්ථික විද්‍යාවේ පැවැත්ම තිබුණේ ම හුදෙක් එය රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව වැනි 'ශුද්ධ විද්‍යාවක්' ලෙස විශ්වාස කිරීමට

මිනිසුන්ට බල කරන ලද නිසා බව හා-ජුන්ග් චැන්ග් පවසයි. ශුද්ධ විද්‍යාවක දී නම් සියලු විමසීම් සම්බන්ධයෙන් තිබෙන්නේ එක් නිවැරදි උත්තරයක් පමණි. ඒ අනුව ගොස් විශේෂඥයන් නො වන අන් සියල්ලන් ම ආර්ථික විශේෂඥයන්ගේ මතය කිසිදු ප්‍රශ්න කිරීමකින් තොර ව පිළිගත යුතු ය යන ඇදහිල්ල සමාජ ගත කිරීමට හැකි විය. එහි ඵලය ආර්ථික කරුණු ගැන හිතන්නට විශේෂඥයන්ට ඉඩ දී නිහඬ වීමට පොදු ජනතාවට සිදු වීම යි. හාවඩ් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු හා බෙහෙවින් ජනප්‍රිය ආර්ථික විද්‍යා පෙළ පොතක කතුවරයෙකු වූ ග්‍රෙගරි මැන්කිව් ඒ ගැන මෙසේ පාපෝච්චාරණය කළේ යඃ

> **"නියම විද්‍යාඥයෙකු ලෙස පෙනී සිටීමට ආර්ථික විද්‍යාඥයා කැමැත්තක් දක්වයි. මා ඒ බව හොඳින් දන්නේ මමත් බොහෝ විට එසේ කරන බැවිනි. උපාධි අපේක්ෂක ශිෂ්‍යයන්ට උගන්වන අවස්ථාවල දී එම පාඨමාලාවෙන් කෙරෙන්නේ කිසියම් 'මඩකරි ශාස්ත්‍රයක්' කියා දීමට තැත් කිරීමක් යැයි කිසිදු ශිෂ්‍යයෙකු සිතීම වැළැක්වීමට ආර්ථික ක්ෂේත්‍රය හැදෑරීම යනු නිශ්චිත විද්‍යාවක් හැදෑරීම බව මම හිතාමතා ම ඔවුන්ට කියා සිටිමි[109]."**

වසර 2000 දී පැරිසියේ ආර්ථික විද්‍යා සිසුන් කණ්ඩායමක් සිය මහාචාර්යවරුන් අමතා විවෘත ලිපියක් ලියමින් මුඛ්‍ය ධාරාවේ ආධානග්‍රාහී ආර්ථික න්‍යායන් ඉගෙන ගැනීමෙන් පලක් නො වන බව කියා සිටියේ ය. "මවා ගත් ලෝකවලින් මිදීමට අපට අවශ්‍යයි. ප්‍රමාද වීමට පෙර අවදි වන්න" යැයි ඔවුහු සිය ගුරුවරුන්ගෙන් ඉල්ලා සිටියහ. ඉන් දශකයකට පසු හාවඩ් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා ශිෂ්‍යයන් සිය ආර්ථික විද්‍යාව පිළිබඳ ව මහාචාර්ය ග්‍රෙගරි මැනිකිව්ගේ පාඨමාලාව මඟින් පක්ෂග්‍රාහී පටු දෘෂ්ටිවාදයක් පැතිර වීමට තැත් කරන බව චෝදනා කොට ඔහුගේ පංතියෙන් පිටවී විරෝධය පෑවේ ය. "මේ පක්ෂග්‍රාහිත්වය, ශිෂ්‍යයන්ටත්, විශ්ව විද්‍යාලයටත් අපේ ශ්‍රේෂ්ඨ සමාජයටත් හානිදායක යැ'යි ශිෂ්‍යයෝ පැවසූහ[110].

109 Ha-Joon Chang (2014) *Economics The User's Guide,* London: Pelican, p.2

110 Kate Raworth (2017) Doughnut Economics: Seven ways to think like a 21st Century Economist, by Kate Raworth, New York: Random House, p.1

කෙසේ වෙතත් රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව හා සසඳන විට ආර්ථික විද්‍යාවට කෙදිනක වත් ශුද්ධ විද්‍යාවක් විය නො හැකි ය. නොයෙකුත් මාදිලිවල ආර්ථික න්‍යායන් පවතී. ඒ එක් එක් න්‍යායක් සංකීර්ණ යථාර්ථයක විවිධ අංශ අවධාරණය කරමින් එකිනෙකට වෙනස් නිගමනවලට එළඹෙමින් සදාචාරීය හා දේශපාලනික වටිනාකම් පිළිබඳ යම් විනිශ්චයක් ලබා දෙයි. එහෙත් තමන් අවධාරණය කරන ක්ෂේත්‍රය ගැන තිබෙන නියම ලෝක තත්වය අනුව අනාවැකි කීම සම්බන්ධයෙන් නම් මේ න්‍යායයෝ නිරන්තරයෙන් ම අසමත් වෙති.

"එක අතකට මෙසේත් විය හැකියි ඒත් අනික් අතට මෙසේත් විය හැකියි කියන ආර්ථික විද්‍යාඥයන් වෙනුවට මට එක් අතක් පමණක් ඇති ආර්ථික විද්‍යාඥයෙකු ලබා දෙන්න"[111] යැ'යි ඇමෙරිකානු ජනාධිපති හැරී ට්‍රූමන් *(*1945-1953*)* කළ උපහාසය ආර්ථික විද්‍යාවේ මේ අශුද්ධකම නිරූපණය කරයි.

පොදු යහපත සහ ආර්ථිකය අතර ඇති සම්බන්ධතාව ගැන ද ආර්ථික විද්‍යාව අනුසාරයෙන් කරන කතාබහ ද නො මග යවන සුලු ඒවා ය. උදාහරණයක් ලෙස 'ඒක ආර්ථිකයට හොඳයි' යන්නෙහි ඇත්ත තේරුම වන්නේ ව්‍යාපාරික ලෝකයට වාසි වන බව යි. පොදු යහපත පිළිබඳ ප්‍රතිපත්ති සාකච්ඡාවල දී 'ආර්ථිකයට හොඳයි' යන්න ඉදිරිපත් කරන්නේ 'වැඩි රැකියා අවස්ථා' ලැබීම පොදු යහපතට හේතු වන බව හඟවමිනි. මෙය සාමාන්‍යයෙන් ව්‍යාජ සාධාරණීකරණය කිරීමකි. විසි එක්වැනි සියවසේ බටහිර රටවල 'ආර්ථිකයට හොඳ වෙන්නේ' හොඳට ගෙවන රැකියා ප්‍රමාණය සැලකිය යුතු අයුරින් අඩු කිරීමෙනි. ඒ අනුව රැකියා විශාල ප්‍රමාණයක් අඩු වැටුප් ගෙවන රටවලට යවා ගැනීම 'ආර්ථිකයට හොඳ ය'. ඒ අනුව සිය රටෙහි රැකියා හිඟය වැඩි වීම ආර්ථිකයට කෙසේ වෙතත් පොදු යහපතට හොඳ වන්නේ කෙසේ දැ'යි යන්න ගැන ආර්ථික විද්‍යාව නිහඬ ය.

111 "Give me a one-handed Economist. All my economists say 'on hand...', then 'but on the other..." – Harry S TRUMAN

නිෂ්පාදන කටයුතු සහ සේවා කටයුතු විදෙස් රටවලට බහිස්සේවාර්පණය *(outsource)* හෙවත් අවුට්සෝර්ස් කිරීම ඇතැම් විට හාස්‍ය ජනක මට්ටමකට වැටී තිබුණ ද ඒවා ආර්ථික වසයෙන් ඉතා තාර්කික බව විශ්වාස කෙරේ. මේ සම්බන්ධයෙන් ඇමෙරිකාවේ භජඝ ගුවන් විදුලිය 2014 දී හෙලි කළ කාරණයක් එකී හාස්‍යජනක තත්වයට හොඳ උදාහරණයකි. ඒ වාර්තාවට අනුව ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇලස්කා වෙරළට ඔබ්බෙන් අල්ලා ගන්නා සැමන් මත්ස්‍යයන් කෙළින් ම අධිශීතකරණය කොට චීනයට යවනු ලැබේ. චීනයේ දී ඒවා හිම ඉවත් කිරීමෙන් පසු කටුව ඉවත් කොට පෙතිවලට කපා යළි අධිශීතකරණය කොට ඇමෙරිකා එක්සත් ජනපදයට නැවත යවනු ලැබේ. ඇමෙරිකානු කම්කරුවන් ඩොනල්ඩ් ට්‍රම්ප් වැනි 'ආර්ථික ජාතිකවාදියෙකුට' ඡන්දය දීමට පෙලඹුණේ මෙවැනි විහිළු සහගත අවුට්සෝර්ස් කිරීම්වලින් ඔවුන්ගේ රැකියා අවස්ථා අහිමි කොට ඇමෙරිකානු ශ්‍රම බලකාය අඩු කිරීම නිසා ඇති වූ කෝපය නිසයි.

එමෙන් ම භාවිතයේ දී බොහෝ ආර්ථික විද්‍යා පුරෝකථන විහිළු සහගත ලෙස අසමත් ව ඇති බව පෙනී යයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආර්ථික විද්‍යාඥයෙකු වන ප්‍රකාශ් ලූන්ගානි නිගමනය කර ඇති අන්දමට 'ආර්ථික අවධමනය පුරෝකථනය කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාව නිකැළැල් වාර්තාවක් තබා ඇත'.[112] වසර 2008 දී එක්සත් ජනපදයේ දැවැන්ත ලෙහ්මන් බ්‍රදර්ස් ව්‍යාපාරය කඩාවැටීමට පෙර වසරේ ආර්ථික පුරෝකථනයට අනුව ඊළඟ වසරේ දී 'ප්‍රධාන පෙළේ කිසිදු ආර්ථිකයකට අවධමනයකට මුහුණ දීමට සිදු නො වන බව' පළ විය. එහෙත් නූතන සමාජය යනු අත්‍යන්තයෙන් ම සංකීර්ණ වූ පද්ධතියකි. එය අපට පාලනය කළ නො හැකි බොහෝ විචල්‍යතා සහ අපට පැහැදිලිව නො පෙනෙන අනියම් සම්බන්ධතාවන්ගෙන් සමන්විත ය. ආර්ථික පුරෝකථන බොහොමයක් වරදින්නේ එබැවිනි.

112 Prakash Loungani et. al.(2018) IMF Working Paper : *How Well Do Economists Forecast Recessions?,* Washington: International Monetary Fund

කිසියම් කරුණක් ගැන ආර්ථික විද්‍යාව සතු ව නිවැරදි එක් උත්තරයක් නැත්නම් එය වනාහී අපට හුදෙක් විශේෂඥයන්ට පමණක් පවරා බලා සිටිය හැකි කාරණයක් නො වේ. ඉන් පවසන්නේ හැම වගකිවයුතු පුරවැසියෙකු ම ආර්ථික විද්‍යාව යම්කිසි පමණකට ඉගෙන ගත යුතු බවයි. එහෙත් හැම කෙනෙකු ම ආර්ථික විද්‍යාව පිළිබඳ තඩි පෙළ පොතක් ගෙන කියවිය යුතු බවක් ඉන් අදහස් නො වේ. අවශ්‍ය වන්නේ ආර්ථික තත්වය පිළිබඳ විස්තරවලට සදාචාරීය වටිනාකම් සහ දේශපාලනික අරමුණු අරභයා කොතෙක් දුරට විග්‍රහාත්මක විනිශ්චයන් කළ හැකි ද යන්න දැන ගත හැකි වන පමණට විවිධාකාර ආර්ථික තර්ක පිළිබඳ දැනුමක් ඇති කර ගැනීමයි.

අප ද ඇතුළු ව ආර්ථික විද්‍යා විෂය ගැන එතරම් දැනුමක් නැති කෙනෙකු ආර්ථික විද්‍යාව යනු හුදෙක් ආර්ථිකය ගැන අධ්‍යයනය කිරීම යැ'යි සිතනු ඇත. රසායන විද්‍යාව යනු රසායන ද්‍රව්‍ය අධ්‍යයනය කිරීම යි. ජීව විද්‍යාව යනු ජීවයක ඇති දේවල් අධ්‍යයනයට ලක් කිරීම යි. එමෙන් ම සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳව අධ්‍යයනය කිරීම යි. ඉතින් ඒ අනුව ආර්ථික විද්‍යාව යනු ආර්ථිකය පිළිබඳව අධ්‍යයනය කිරීම යැ'යි යන්න කෙනෙකුට නිරායාසයෙන් ම සිතෙන්ට පුළුවන.

එහෙත් අද කාලයේ ඇති බෙහෙවින් ජනප්‍රිය ආර්ථික විද්‍යා පාඨ ග්‍රන්ථවලට අනුව ආර්ථික විද්‍යාව යනු ඊට වඩා ඉතා පුළුල් දෙයකි. ඉන් ඇතැම් අදහසකට අනුව ආර්ථික විද්‍යාව යනු ජීවිතය, විශ්වය සහ කුඩු මහත් සියලු දේ ගැන පරම ප්‍රශ්නය *(ultimate question)* විමසීමට ලක් කිරීමකි.

*Undercover Economist* නමැති බෙහෙවින් සාර්ථක වූ කෘතිය ලියූ *Financial Times* පුවත්පතේ මාධ්‍යවේදියෙකු වන ටිම් හාෆෝඩ් පවසන අන්දමට ආර්ථික විද්‍යාව යනු ජීවිතය පිළිබඳව කතා කිරීමයි. ඔහු සිය දෙවැනි ආර්ථික විද්‍යා පොත නම් කළේ *Logic of Life* හෙවත් 'ජීවිතයේ තර්කනය' යන නමිනි.

කිසිදු ආර්ථික විද්‍යාඥයෙකු ආර්ථික විද්‍යාව මඟින් විශ්වය විස්තර කළ හැකි යැයි තවමත් පවසා නැති නමුත් ඇතැම් ආර්ථික

විද්‍යාඥයෙක් ඊට තරමක් සමීප ව ආර්ථික විද්‍යාව යනු ලෝකය ගැන කෙරෙන විග්‍රහයකැ'යි ඇඟවීමට උත්සාහ කළේ ය. උදාහරණයක් වසයෙන් රොබට් ෆ්‍රෑන්ක් ලියූ ජනප්‍රිය *Economic Naturalist* කාණ්ඩයට අයත් දෙවැනි වෙළුම නම් කළේ *How Economics Help you Make Sense of Your World?* හෙවත් 'ඔබේ ලෝකය තේරුම් ගැනීමට ආර්ථික විද්‍යාව උදව් වන්නේ කෙසේ ද?' යන නමිනි.

ආර්ථික විද්‍යාවට ආගන්තුක වූ අයකුට මේ කියමන් ගැන බොහෝ විට සිතෙන්නේ ඒවා ආර්ථික විද්‍යාවේ මූලික කාර්යය වන ආර්ථිකය ගැන කතා නොකර වෙනත් අනම් මනම් ගැන නන්දොඩවන හුදු පුරාජේරු ලෙස යි.

2008 ලෝක ආර්ථික අර්බුදය එළඹීමට ඉතා ආසන්න ව ආර්ථික විශේෂඥයන් බහුතරයක් කියා සිටියේ වෙළඳපොළට වරදින්නේ ඉතාමත් ම කලාතුරකින් බවත් වෙළඳපොළේ කිසියම් අවුලක් ඇත්නම් එය ස්වයං සමථයකට පත් කර ගැනීමට වෙළෙඳපොළ ඉඳුරා ම සමත් බවත් ය. 1955දී ආර්ථික විද්‍යාව සම්බන්ධ නොබෙල් ත්‍යාගය ලබාගත් රොබට් ලූකස් 2003 දී පැවසුවේ ආර්ථික පරිහානිය වැළැක්වීම පිළිබඳ ගැටලුව දැන් මුළුමනින් ම විසඳා අවසන් වී ඇති බව යි. එහෙත් සියල්ලන් අන්ද මන්ද කරමින් හිටි හැටියේ ම 2008 ලෝක ආර්ථික අර්බුදය උද්ගත වීම ඔහු ද ඇතුළු බොහෝ ආර්ථික විද්‍යාඥයන් අන්දමන්ද කිරීමට සමත් විය.

මේ සියල්ල සලකා බලන විට ආර්ථික විද්‍යාව යනු බරපතළ මෙගලොමේනියාවකින් හෙවත් අහංකාරෝන්මාදයකින් පෙළෙන විෂයයක් බව හා-ජුන්ග් චැන්ග් පවසයි. තමන්ට අයත් ක්ෂේත්‍රය වත් හරි හැටි විස්තර කිරීම කළමනාකරණය කර ගත නො හැකි විෂයයක් අනෙක් හැම දෙයක් ම පාහේ විස්තර කිරීමට සමත් බව කියා සිටින්නේ කෙසේ ද?

ආර්ථික විද්‍යාව අරහයා මවා පා ඇති රැස් වළල්ල නිසා බොහෝ නූතන වාමාංශික මතවාදීහු ආර්ථික ප්‍රශ්න විවරණය කිරීමට

වඩා 'උපරි ව්‍යුහයට අයත්' වෙනත් දේවල් ගැන කතා කිරීමට කැමැත්තක් දක්වති. ඔවුන්ගේ මුඛ්‍ය ප්‍රශ්නය විය යුතු ආර්ථික විෂමතා නිසා ඇතිවෙන සමාජ අසමානතාව කෙරෙහි දේශපාලනික වසයෙන් අඩු අවධානයක් දැක්වීම එහි අනවරත ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් ආර්ථිකය ගැන බඩපිනුම් ගැසීම ආර්ථික විද්‍යාඥයන්ට පමණක් සීමා කොට අතහැර දැමිය යුතු ක්ෂේත්‍රයක් නො වන බව ආර්ථික විද්‍යාඥයෙකුද වූ 2015 ග්‍රීක සිරිසා රජයේ මුදල් ඇමති ව සිටි යානිස් වරුෆාකිස්ගේ කීම අනුව පැවසිය හැකි ය.

ආර්ථික විද්‍යාවට පෙරටුගාමී වූ 'දේශපාලන ආර්ථිකය' *(Political Economy)* පිළිබඳ විෂය හඳුන්වා දුන් ආදිකර්තෘවරු ආර්ථිකයේ අරමුණ පිළිබඳ ව තම අදහස ප්‍රකාශ කිරීම අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකූ බව පෙනේ.

1767 ස්කොට් ජාතික නීතිඥයෙකු වූ ජේම්ස් ස්ටුවර්ට් *(*1712-1780*)* පළමු වරට 'දේශපාලන ආර්ථිකය' නමැති සංකල්පය ඉදිරිපත් කරන විට ඔහු දේශපාලන ආර්ථිකය හඳුන්වා දුන්නේ 'නිදහස් ජාතීන්ගේ දේශීය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාව' යනුවෙනි. විද්‍යාවක් යනුවෙන් නම් කළ ද එහි අරමුණ කුමක් දැ'යි යන්න සඳහන් නොකර සිටීමට ඔහුට එය හේතුවක් නොවීය. ඔහුගේ මතයට අනුව මෙම විද්‍යාවේ මූලික පරමාර්ථය සියලු දේශවාසීන්ට ජීවත් වීමට අවශ්‍ය අරමුදල් සහතික කර ගැනීම සහ එය අවහිර වීම වළක්වා ගැනීමත්, සමාජයේ අවශ්‍යතා පරිපූර්ණ කර ගැනීමත්, එකිනෙකා මත රඳා පැවැත්ම සහ එකිනෙකාගේ අවශ්‍යතා ඉටු කිරීමට මහජනතාව පෙලෙඹවීමත් ය.

ඇඩම් ස්මිත් *(1723-1790)* ද දේශපාලන ආර්ථිකයේ අරමුණු ගැන විශේෂයෙන් කතා කළේ ය. ඔහු සඳහන් කළ අන්දමට එහි අරමුණු දෙකක් වේ. ඉන් එකක් නම් ජනතාවට අවශ්‍ය යැපීම් සහ ආදායම් සැපයීම නොහොත් වඩා නිවැරදිව කියනවා නම් එවැනි ආදායම් උපයා ගැනීම පිණිස ඔවුන්ට අවස්ථාවක් සලසා දීම ය. දෙවන අරමුණ වන්නේ මහජන සේවා සැපයීම සඳහා රජයට

ප්‍රමාණවත් ආදායමක් උපයා දීම ය. නිදහස් වෙළඳපොළ මඟින් ආර්ථිකය ස්වයං නියාමනය වීම උත්කර්ෂණයට නැංවූ මුල් ම පුද්ගලයෙකු වසයෙන් වර්තමානයේ ඇඩම් ස්මිත් හුවා දැක්වීමට තැත් කරන බොහෝ අය අමතක කරන්නේ ඔහුගේ ආර්ථික චින්තනයට මහජන සේවා ප්‍රමුඛ නිශ්චිත සමාජීය අරමුණක් තිබුණ බව යි.

ඇඩම් ස්මිත් ගෙන් වසර හැත්තෑවකට පසු ජෝන් ස්ටුවර්ට් මිල් *(1806-1873)* දේශපාලන ආර්ථිකය *(Political Economy)* සම්බන්ධයෙන් කළ අර්ථකථනය ඒ සම්බන්ධයෙන් එතෙක් පැවති අරමුණ තරමක් වෙනස් කර ලී ය. දේශපාලන ආර්ථිකය යනු ධනය නිෂ්පාදනය කිරීම සඳහා මිනිසා විසින් කරනු ලබන ඒකාබද්ධ ක්‍රියාකාරකම්වලින් පැන නැගෙන සමාජීය ප්‍රපංච පිළිබඳ නියාමයක් සොයා බලන විද්‍යාවක් යයි මිල් පැවසී ය. මිල්ගේ මේ පටන් ගැනුමත් සමඟ වෙනත් අය විසින් තව දුරටත් අර්ථ දක්වන ලද පරිදි ආර්ථිකයේ අරමුණු පැහැදිලි කිරීම ඇනහිට ආර්ථිකය පිළිබඳව ඇතැ'යි සිතන සිද්ධාන්ත සම්බන්ධයෙන් අවධානය යොමු විය. එතැන් සිට සියවසක් පමණ යන තෙක් ආර්ථිකය නමැති මේ නූතන විද්‍යාව බොහෝ විට අර්ථකථනය වූයේ අවිනිශ්චිත ආකාරයකිනි.

එයට හොඳම උදාහරණය 1930 ගණන්වල දී චිකාගෝ ගුරුකුලයේ ආර්ථික විද්‍යාඥයකු වූ යාකොබ් වයිනර් ආර්ථික විද්‍යාව යනු හුදෙක් 'ආර්ථික විද්‍යාඥයින් විසින් කරනු ලබන දේවල් ය' යනුවෙන් පැවසීම ය. එහෙත් හැම කෙනෙක් ම එයට එකඟ නො වූහ. 1932 දී ලන්ඩන් ආර්ථික විද්‍යායතනයේ ලයනල් රොබින්ස් මේ අවුල ගැන නො මනාපයෙන් මෙසේ පැවසී ය. "අපි හැමෝම කතා කරන්නේ එකම දේ ගැන. ඒත් ඒ දේ මොකක්ද කියන එක ගැන අපි තවමත් එකඟ වී නෑ." එහෙත් ඒ සම්බන්ධයෙන් තමන්ට නිශ්චිත අදහසක් ඇති බව පැවසූ රොබින්ස් ආර්ථික විද්‍යාව යනු මාරුවෙන් මාරුවට වෙනස් වන අරමුණු සහ දුලබ විධික්‍රම *(ends and scarce means)* පිළිබඳ ව මනුෂ්‍ය හැසිරීම අධ්‍යනය කරන විද්‍යාව

යැ'යි පැවසී ය. එම ප්‍රකාශයත් සමඟ මේ පිළිබඳව ඇති වූ විවාදය තරමක් සංසිඳෙන බවක් පෙනෙන්ට තිබුණි. වර්තමානයේ ඇති පාඨ ග්‍රන්ථවල ආර්ථික විද්‍යාව පිළිබඳ ව ඇති නිර්වචන බොහෝ දුරට මෙයට සමාන යැයි කිව හැකි ය.' බොහෝ අය භාවිත කරන ග්‍රෙගරි මැන්කිව්ගේ *Principles of Economics* නමැති පොතේ මෑතකාලීන සංස්කරණවල දී ඇති 'ආර්ථික විද්‍යාව යනු සමාජය තමන් සතු හිඟ සම්පත් කළමනාකරණය කරන ආකාරය අධ්‍යයනය කරන විද්‍යාවයි' යන අර්ථකථනය ඒ අතරින් ඉතාමත් සංක්ෂිප්ත එකකි.

මෙකී විවිධ අර්ථකථන කෙරෙද්දී ආර්ථිකයට නිශ්චිත අරමුණක් තිබිය යුතු ය යන අදහස ගිලිහී ගියේ ය. මෙසේ වටිනාකම්වලින් නිදහස් ව ප්‍රතිමාන *(norms)* පිළිබඳ කතාවලින් මිදී අවසානයේ දී ආර්ථික විද්‍යාව යනු හුදෙක් එයින් කෙරෙන්නේ කුමක් ද යන්න සරල ලෙස විස්තර කරන විද්‍යාවක් ලෙස පිළිගැනීමට සිදු ව තිබීම ඉතා යහපත් දෙයක් ලෙස නවලිබරල්වාදී චිකාගෝ ගුරුකුලයට නායකත්වය දුන් මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් ප්‍රකාශ කළේ ය. එහෙත් ඉන් සිදු වූයේ ආර්ථික චින්තනයට සුවිශේෂ අරමුණු සහ වටිනාකම් නොමැති වීමෙන් ඇතිවූ හිදැස නොයෙක් නොයෙක් අය තම තමන්ට අභිමත අන්දමින් පුරවන්ට යෑමයි.

කෙසේ වෙතත් 'දේශපාලන ආර්ථිකය' නමැති විෂය ක්ෂේත්‍රය හඳුන්වා දුන් පුරෝගාමීහු ආර්ථිකයක අරමුණ කුමක් දැ'යි නිරාකරණය කිරීම අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකූහ. එහෙත් 19වන සියවසේ දී දේශපාලන ආර්ථිකය නමැති තනි විෂය ක්ෂේත්‍රය දේශපාලන දර්ශනය සහ ආර්ථික විද්‍යාව යනුවෙන් කොටස් දෙකකට වෙන් විය. *What Money Can't Buy: The Moral Limits to Markets* නම් කෘතිය ලියූ මයිකල් සැන්ඩල්ගේ යෙදුමකින් කිව හොත් "එනිසා මහජන ප්‍රතිපත්ති සම්පාදනයේ හරය තුළ 'සදාචාරය පුරප්පාඩු' *(moral vacancy)* වී තිබේ[113]". ආර්ථික විද්‍යාඥයන් ද දේශපාලනඥයන් ද අද

113 Sandel Michael J.(2012) What Money Can't Buy: The Moral Limits to Markets, New York: Alan Lane Penguin, p.2

ඉමහත් විශ්වාසයකින් යුතු ව ආර්ථික කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ වර්ධනය ගැන කතා කරන්නේ ඒවා ඉතා පහසුවෙන් තේරුම් යන දේවල් වසයෙන් සලකමිනි.

එහෙත් ඒ අතර ම ඔවුන් යුක්තිය, සාධාරණත්වය සහ අයිතීන් වැනි ආර්ථිකය විසින් තහවුරු කළ යුතු නියම වටිනාකම් ගැන කතා කිරීමට පැකිළෙති. ඒ නිසා එකී නියම වටිනාකම් සහ අරමුණු ගැන කතා කිරීම දැන් ආර්ථික විද්‍යාව තුළ නැවත සොයා ගත යුතු නැති වී ගිය කලාවක් බවට පත් වී තිබේ.

ප්‍රථම වතාවට යෞවනයන් අනාගත සමාජය ගැන තමන්ගේ හැඟීම් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට ඉගෙන ගෙන ඇති නිසා ආර්ථික විද්‍යාඥයෝ ද දේශපාලනඥයෝ ද අපි සියල්ලෝ ම ද දැන් හුදු වර්ධනයට වඩා උතුම් වූ ආර්ථික අරමුණක් ගැන කතා කිරීමට සුදුසු වචන සොයමින් සිටිමු. ඉතිං අපි නැවතත් අරමුණු, ප්‍රතිමාන සහ වටිනාකම් පිළිබඳව කතා කිරීමට සහ ඒවා විසිඑක් වෙනි සියවසේ අපේ ආර්ථික මනෝ ගතියේ *(mindset)* මූලධර්ම ලෙස සැලකීමට ඉගෙන ගන්නේ කෙසේ ද?

එක බලාපොරොත්තු සහගත ක්‍රමයක් වන්නේ තම ආර්ථික චින්තනයේ අරටුව ලෙස මනුෂ්‍යත්වය උත්කර්ෂණයට නැංවූ එහෙත් මෙතෙක් එතරම් ප්‍රශස්තියකට ලක් නො වූ ආර්ථික චින්තකයන්ගෙන් පටන් ගැනීමයි. 1819දී ෂෝන් සිස්මොන්ඩි නමැති ආර්ථික විද්‍යාඥයා දේශපාලන ආර්ථිකය යනු ධනය රැස් කිරීම නො ව මානව සුභසාධනය අරමුණු කරගත් දෙයක් ලෙස සැලකිය යුතු බව පැවසී ය. පසුව ඔහු අනුගමනය කළ ඉංග්‍රීසි ජාතික සමාජ චින්තකයෙකු වූ ජෝන් රස්කින් එකල පැවැති ධනය රැස් කිරීම මූලික කර ගත් ආර්ථික චින්තනය විවේචනය කරමින් මෙසේ කීවේ යː "ජීවිතය මිස ධනය කියා දෙයක් නැත, රටක් පොහොසත් යැයි කිව හැක්කේ සුඛිත හා සංතුෂ්ඨිමත් මිනිසුන් වැඩි ම සංඛ්‍යාවකින් ඒ රට සමන්විත වූ විටයි". 1900 ගණන්වල දී රස්කින්ගේ පොත කියවූ මහත්මා ගාන්ධි එහි තිබූ මූලික අදහස් ජීවමාන කිරීම පිණිස සදාචාරාත්මක

පුද්ගලභාවය මත පදනම් වූ සමූහ ගොවිපළක් ඇති කළේ ය. *Small is Beautiful* හෙවත් 'පුංචි දේ ලස්සනයි' යනුවෙන් පොතක් ලිවීමෙන් ඉමහත් ප්‍රසිද්ධියක් ලත් ඊ.එෆ්. ෂුමාචර් ආචාර ධර්ම සහ මානුෂික බව ආර්ථික චින්තනයේ මධ්‍ය ලක්ෂ්‍යය විය යුතු යැයි කීවේ ය. චිලියානු ආර්ථික විද්‍යාඥ මැන්ෆ්‍රඩ් මැක්නීෆ් ධරණීය හැකියාව, සහභාගිත්වය, නිර්මාණශීලී බව සහ අන්‍යෝන්‍ය සහයෝගය වැනි මූලික මානුෂික අවශ්‍යතා තත් සමාජයේ සංස්කෘතියට ගැළපෙන අයුරින් සකසා ගැනීමෙන් සංවර්ධනයේ අරමුණ නිශ්චය කර ගත යුතු යැ'යි පැවසී ය.

සංවර්ධනය නමැති සංකල්පය දෙස වඩා පුළුල් ලෙස බැලූ මේ අය ආර්ථිකය යන්නෙන් අදහස් කළ යුත්තේ කුමක් දැයි යන්න පිළිබඳව ද විකල්ප අදහස් ඉදිරිපත් කළත් ඒවා ආර්ථික විද්‍යා ශිෂ්‍යයන්ගේ අවධානයට ලක් නො කිරීමට සහ ඒවා මානුෂිකත්ව ආර්ථික විද්‍යාවක් පිළිබඳව අතිසංවේදී ගුරුකුලයක මනස්ගාත ලෙස බැහැර කිරීමට ද බොහෝ ආර්ථික විද්‍යා ආචාර්යවරු කටයුතු කළහ. කෙසේ වෙතත් අවසානයේ දී ඔවුන්ගේ ඒ මානුෂිකත්ව ව්‍යාපෘතිය පුළුල් අවධානයක් සහ විශ්වසනීය භාවයක් දිනා ගැනීමට සමත් විය.

එම කතිකාව ප්‍රධාන ධාරාව තුළට පැමිණීම ඇරඹුණේ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලත් ආර්ථික විද්‍යාඥයෙකු සහ දාර්ශනිකයෙකු වූ අමාත්‍ය සෙන්ගේ කෘති මාර්ගයෙනි. ඔහු තර්ක කළ අන්දමට සංවර්ධනයේ මූලික අරමුණ විය යුත්තේ මිනිසුන් ජීවත් වන ආර්ථිකයේ පොහොසත්කම වැඩි කිරීම නො ව මනුෂ්‍ය ජීවිතයේ පොහොසත්කම වැඩි කිරීමයි. දළ දේශීය නිෂ්පාදිතය වැනි මිනුම්වලට ප්‍රමුඛත්වය දෙනවාට වඩා අප කළ යුත්තේ සෞඛ්‍ය සම්පන්න වීම, බලායනය හෙවත් බලාත්මක කිරීම *(empowerment)* සහ නිර්මාණාත්මක වීම පිණිස මිනිසුන්ට අවශ්‍ය වන ශක්‍යතා *(capabilities)* පෝෂණය කොට තම තමන්ගේ වටිනාකම් අනුව සිය ජීවිතය පවත්වා ගෙන යෑමට අවශ්‍ය දෑ තෝරා ගැනීමට සහ යොදාගැනීමට ඔවුන්ට ඉඩ සලසා දීම බව සෙන් පෙන්වා දුන්නේ ය. එකී ශක්‍යතා

සාක්ෂාත් කර ගැනීම රඳා පවතින්නේ තමන් ජීවත් වන සමාජය තුළ පෝෂ්‍යදායක ආහාර, සෞඛ්‍යාරක්ෂාව, අධ්‍යාපනය, පෞද්ගලික සුරක්ෂාව සහ දේශපාලනික හඬ ප්‍රකාශ කිරීමේ නිදහස යනාදි ජීවිතයේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මිනිසුන්ට ඇති ඉඩකඩ අනුව බවත් සෙන් ප්‍රකාශ කළේ ය. අමාත්‍ය සෙන්ගේ ශක්‍යතා එළඹුම ඉදිරි පරිච්ඡේද වල සංවර්ධන කතිකාව විස්තර කරන විට තව දුරටත් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

2008 ආර්ථික අර්බුදය සමයේ දී අමාර්ත්‍ය සෙන් සහ තවත් නොබෙල් ත්‍යාග ලාභියෙකු වූ ජෝශප් ස්ටිග්ලිට්ස් ප්‍රධාන කොට ජාත්‍යන්තර කීර්තියක් ඇති ආර්ථික විශේෂඥයන් 25 දෙනෙකුට ආරාධනා කළ ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාකොස්කි රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට එවකට පාදක කොට ගත් ආර්ථික හා සාමාජික පියවර ඇගැයීමකට ලක් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ ය. ඒ සඳහා එවකට යොදා ගෙන තිබූ දර්ශක විමසීමකට ලක් කළ සෙන් ඇතුළු විශේෂඥ කණ්ඩායම "අපේ සමාජ ආර්ථිකය සම්බන්ධයෙන් මග පෙන්වීමට තැත් කරන්නන් හරියට මාලිමාවක් නැති ව ගමන් කරන ගුවන් යානයක නියමුවන් වැනිය" යනුවෙන් තම නිගමනය අරඹමින් මෙසේ ද කියා සිටියහ. "හසරක් නොදැන යන එවැනි ජෙට් යානයක මගීන් වීමට අප කිසි කෙනෙකුට අවශ්‍ය නැත. එබැවින් ප්‍රතිපත්ති සම්පාදකයන්, සමාජ ක්‍රියාකාරීන්, ව්‍යාපාරික නායකයන් සහ පුරවැසියන් යන සියල්ලන්ට ම විසි එක් වෙනි සියවසට උචිත ඥානාන්විත මාර්ගයක් ඔස්සේ එකාවන් ව සිය ගමන හසුරුවා ගැනීමේ ක්‍රමයක් ඉතා කඩිනමින් අවශ්‍ය වී තිබේ."[114] ඉතින් ඒ මාලිමාව කුමක් ද?

එවැනි මාලිමාවක් පිළිබඳ විචාරාත්මක කතිකාවක් මෑතක දී කේට් රේවර්ත් සහ මාරියානා මස්සුකාටෝ වැනි ආර්ථික

114 Stiglitz. J and Sen. A, (2008) Report by the Commission on the Measurement of Economic Performance and Social Progress, p.9 - https://ec.europa.eu/eurostat/documents/8131721/8131772/Stiglitz-Sen-Fitoussi-Commission-report.pdf - Retrieved on the 21 Aug 2021

චින්තකයන් විසින් කරළියට ගෙන තිබේ. අංගෝපාංග කිහිපයකින් සමන්විත එම කතිකාවේ එක අංගයක් අමාර්ත්‍ය සෙන්ගේ මිනිසුන් ශක්‍යතාවලින් *(capabilities)* බලාත්මක කිරීම හා බැඳේ. ඒ අනුව ආර්ථික සංවර්ධනයේ එක් අනිවාර්ය ඵලයක් විය යුත්තේ මිනිසුන්ට තමන් සතු මූලික අයිතිවාසිකම් පරිපූර්ණව භුක්තිවිඳීමට හැකිවීමයි. මානව අයිතිවාසිකම් පාදක සංවර්ධනය යනුවෙන් වරක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ද හඳුන්වාදීමට තැත් කළ ඒ සංකල්පයට අනුව අවශ්‍ය වන්නේ දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් සහ සමාජ ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් ද පරිපූර්ණව භුක්තිවිඳීම පිණිස සුදුසු වාතාවරණය ගොඩ නැගීමයි. අයිතිවාසිකම් හිමිකරුවන්ට එම අයිතිවාසිකම් භුක්ති විඳීමේ ශක්‍යතාව ඇති කිරීම අදාළ පොදු හා පෞද්ගලික අංශයේ ආයතනවල වගකීම යි.

ආර්ථික චින්තනයේ මෙතෙක් පැවති සීමා ඉක්මවා වඩා පරිපූර්ණ ආර්ථික දැක්මක් ගොඩ නගා ගැනීම සඳහා නව පරපුරකට අයත් බොහෝ ආර්ථික විද්‍යාර්ථීහු කටයුතු කරමින් සිටිති. ඔක්ස්ෆර්ඩ් සරසවියේ ඇදුරුවරියක ලෙස සේවය කරන කේට් රේවර්ත් එවැනි එක් තැනැත්තියකි. ඉමහත් පිළිගැනීමකට ලක් ව ඇති ඇයගේ 'ඩෝනට් ආර්ථිකය' නමැති ආර්ථික මොඩලය ගැන සවිස්තරාත්මක සාකච්ඡාවක් 22 වැනි පරිච්ඡේදයෙන් ගෙන එන බැවින් එයට පදනම් වූ ඇය *embedded economy* හෙවත් 'සහබද්ධිත ආර්ථිකය' යනුවෙන් හඳුන්වන සාර්වත්‍ර ආර්ථික සංකල්පය ගැන කෙටි හැඳින්වීමකින් මේ පරිච්ඡේදය අවසන් කිරීම වැදගත් යැයි සිතමි. රේවර්ත් 'සහබද්ධිත ආර්ථිකය' ගැන සිය හැඳින්වීම වැදගත් ප්‍රශ්නයකින් අරඹයි. අපේ අවශ්‍යතා සපයා ගැනීම පිණිස අපට රඳා පැවැත්මට සිදු ව ඇත්තේ කුමක් මත ද? යන්න ඒ ප්‍රශ්නයයි. මේ ඒ පැනයට පිළිතුර සාර්ව ආර්ථිකය පිළිබඳ පෝල් සැමුවෙල්සන් ඉදිරිපත් කළ සම්ප්‍රදායික රූපාදර්ශයට විකල්පයක් ලෙස නව සාර්ව ආර්ථිකය *(macro economy)* පිළිබඳ ව කේට් රේවර්ත් ඉදිරිපත් කරන මේ රූපාදර්ශයෙන් සහ එහි එක් එක් අංග පිළිබඳ ව අනතුරුව කෙරෙන විස්තරයෙන් පැහැදිලි වේ.




නව සාර්වත්‍ර ආර්ථිකය - කේට් රේවර්ත් ගේ *embedded economy* සහබද්ධිත ආර්ථිකය පිළිබඳ සංකල්පය

මේ මඟින් පෙන්නුම් කරන්නේ කුමක් ද - අපේ අවශ්‍යතා සපුරා ගැනීමේ පළමු සහ මූලික ම සාධකය පෘථිවිය හෙවත් සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන සජීවී ලෝකය බව යි. එම ලෝකය තුළ මානව සමාජයත් මානව සමාජය තුළ ආර්ථිකයත් ක්‍රියාත්මක වේ. ඒ ආර්ථිකය තුළ මානව අවශ්‍යතා සපුරා ගැනීමේ ලා වැදගත් වන කුටුම්බය, පොදු වස්තු, වෙළඳපොළ හා රජය යන ක්ෂේත්‍ර මූලික සාධකයෝ වෙති. ඒ සඳහා මූල්‍ය ප්‍රවාහය උත්තේජකයක් ලෙස කටයුතු කරයි. 21 වැනි සිය වසේ ආර්ථිකය පිළිබඳ වේදිකාව සැකසී ඇත්තේ මේ රූපාදර්ශය අනුව බවත් එහි නිරූපණය වන සාධකවල සමබරතාව අත්‍යවශ්‍ය බවත් රේවර්ත් පෙන්වා දෙයි. මේ රූපාදර්ශයේ නිරූපණය කෙරෙන සාධක ඒවායේ අනුක්‍රමය අනුව පහත සඳහන් පරිදි විස්තර කළ හැකි ය.

**පෘථිවිය *(Earth)*:** සමස්ත ආර්ථිකය ම පවතින්නේ අපේ පෘථිවියේ සංවේදී ජෛව ගෝලය තුළ යි. එම ජෛව ගෝලයට මහ පොළොවේ භූමියත්, සාගරය ඇතුළු ජල තලයත්, වායු ගෝලයත් අයත් ය. පෘථිවියේ ඇති ද්‍රව්‍යයමය හා ජෛවමය පද්ධතිවලින් නොකඩවා බලශක්තිය හා ද්‍රව්‍ය පදාර්ථ උපයෝගී කර ගන්නා ජෛව ගෝලය එමඟින් තාපය සහ ද්‍රව්‍යයමය දේවල් නිපදවයි. ගඩොල්වල සිට ලෙගෝ සෙල්ලම් බඩු දක්වා ද, වෙබ් අඩවිවල සිට දැවැන්ත මහල් ගොඩනැගිලි දක්වා ද, සහල්වල සිට ගෘහ භාණ්ඩ දක්වා ද, කේක්වල සිට අයිස්ක්‍රීම් දක්වා ද සියලු නිෂ්පාදිත දේවල් රඳා පවතින්නේ පෘථිවිය සතු බලශක්තිය සහ ද්‍රව්‍ය පදාර්ථ, ජෛව ස්කන්ධ, ඛනිජ ඉන්ධන, ලෝහ සහ ඛනිජ සම්පත් මතය. මේ කිසිවක් අප නො දන්නා දේවල් නො වේ. එහෙත් මෙතරම් සුපැහැදිලි ව ආර්ථිකය ජෛව ගෝලයට බද්ධ වී තිබිය දීත් ඒ වැදගත් සාධකය ආර්ථික විද්‍යාව ඉතා ඔලමොට්ටල ලෙස නො තකා හරින්නේ ඇයි?

දහඅට වැනි සියවසේ දී ඇඩම් ස්මිත් *(1723-1790)* සහ ඩේවිඩ් රිකාඩෝ *(1772-1823)* වැනි මුල් කාලීන ආර්ථික ශාස්ත්‍රඥයන් නිෂ්පාදන ක්‍රියාවලියේ සුවිශේෂ සාධක ලෙස ශ්‍රමය, ප්‍රාග්ධනය සහ භූමිය යන තුනම සැලකූ නමුදු විසි වැනි සියවස වන විට ප්‍රධාන ධාරාවේ ආර්ථික විද්‍යාඥයන්ගේ අවධානය ශ්‍රමයට සහ ප්‍රාග්ධනයට පමණක් සීමා විය. ඔවුන් භූමිය ද සැලකුවේ තවත් මාදිලියක ප්‍රාග්ධනයක් ලෙස ය. එහි ප්‍රතිඵලයක් ලෙස ජෛව ගෝලයත්, ප්‍රභාසංස්ලේෂණයේ සිට සියලු ජීවී අජීවී වස්තුවලට බලශක්තිය හා තාපය සපයන ප්‍රධාන ශක්ති ප්‍රභවය වන සූර්යාලෝකයත් ආර්ථික විද්‍යාඥයන් සලකන්නේ ඉතා සුළු කොට ය. හැරත් රේඛීය ආර්ථික නිෂ්පාදන *(linear economic development)* ක්‍රම නිසා පරිසරය මත ඇති කරන පීඩනයේ ඵල විපාක ලෙස ඇතිවෙන දේශගුණ විපර්යාස, වනගහන විනාශය, රසායනික දූෂණය, පාංශු ඛාදනය වැනි ගැටලු ගැන සාම්ප්‍රදායික ආර්ථික චින්තනයට වගේ වගක්වත් නැත.

ආර්ථිකය යනු ඛනිජ ඉන්ධන, මැටි, කොබෝල්ට්, තඹ, යපස් වැනි සීමිත පෘථිවි සම්පත් මෙන් ම දැව, භවභෝග, ධීවර කටයුතු සහ මිරිදිය ජලය වැනි පුනර්ජනනීය පෘථිවි සම්පත්වල ද පැවැත්ම මත රැඳී පවතින්නකි. එමෙන් ම හරිතාගාර වායු, රසායනික දූෂණකාරක හා ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් බැහැර කිරීමට ද ආර්ථිකය මුළුමනින් ම පාහේ යැපෙන්නේ පෘථිවිය මත ම ය. එහෙත් පෘථිවි ගෝලය යනු සංවෘත පද්ධතියකි. සූර්ය තාපය හැරෙන විට එයට කිසිවක් ඇතුළු වන්නේ වත් ඉන් කිසිවක් පිට වන්නේ වත් නැත. එනිසා ආර්ථිකය විසින් නිපදවන සියලු අපද්‍රව්‍ය, හරිතාගාර වායු සහ අධි තාපය පෘථිවි පද්ධතිය තුළ ම ගොඩ ගැසිය යුතු ය. ඉතා සීරුවෙන් සමබර වන දේශගුණ රටා සහ අතිශය සංවේදී පාරිසරික පද්ධතිවලින් යුක්ත පෘථිවියකට මේ නිසා මුහුණ දීමට සිදු විය හැකි අසහනය කෙබඳු විය හැකි ද? එහි දී බරපතළ ම ප්‍රශ්නය වන්නේ අපේ පැවැත්ම සහ ජීවි වර්ග ප්‍රවර්තනය කිරීමට පෘථිවියට ඇති හැකියාව අනතුරට දැමීමට පෙර කොතෙක් දුරට නිතිපතා ඉහළ යන ගෝලීය රේඛීය ආර්ථිකයේ බලශක්ති සහ ද්‍රව්‍යයමය අවශ්‍යතා සංසිඳවීමට අපේ ජෛව ගෝලයට හැකි වේවි ද යන්නයි.

**සමාජය *(Society)*:**. බ්‍රිතාන්‍යය අගමැතිනි මාග්‍රට් තැචර් *(*1979-1990*)* 'සමාජය කියා දෙයක් නැත' යන අදහස පළ කළ විට සමාජයට කෙසේ වෙතත් බොහෝ දෙනෙකුට එය විමතියට කරුණක් විය. ඒ අතර ප්‍රකට ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයෙකු වන රොබට් පුට්නම් සමාජ කණ්ඩායම් තුළ ඇති සම්බන්ධතා ජාල නිසා ජනිත වන අන්‍යෝන්‍ය විශ්වාසය සහ ප්‍රත්‍යෝපකාරීභාවය 'සමාජ ප්‍රාග්ධනය' *(social capital)* ලෙස හැඳින්වී ය.[115] ක්‍රීඩා කටයුතු, උත්සව, ආගමික ඇදහිලි, සමාජ සේවා, ශ්‍රමදාන ආදී කටයුතුවල දී එකිනෙකා හා සම්බන්ධ වීමටත් එකිනෙකා

115 https://www.socialcapitalresearch.com/putnam-on-social-capital-democratic-or-civic-perspective/ - Retrieved on 21 April 2021

කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමත් මඟින් අපි පොදු සම්බන්ධතා, නීති, ප්‍රතිමාන හා සදාචාරීය චර්යාව බිහි කර ගන්නෙමු. මේ සම්බන්ධතා මඟින් ඇතිවෙන සමාජමය බැඳීම අපේ මූලික මානුෂික අවශ්‍යතා වන සහභාගිත්වය, විනෝදය, අයිතියාව හෙවත් අයිති බව *(belongingness)* සහ ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීමේ ලා ඉතා වැදගත් ය. පුට්නම් පෙන්වා දෙන අන්දමට "ප්‍රජා සම්බන්ධතා යනු හුදෙක් ශිෂ්ට බවේ විශිෂ්ටත්වය ගැන පුරසාරම් කතාවක් නො වේ. හොඳින් අධ්‍යනය කොට දැන ගෙන ඇති පරිදි... සමාජ ප්‍රාග්ධනය *(social capital)* අප සුහුරු, යහපත්, පොහොසත් සහ ආරක්ෂිත සමූහයක් බවට පත් කරන අතර සාමූහික ව සාධාරණ සහ ස්ථාවර ප්‍රජාතන්ත්‍රවාදයක් පවත්වා ගෙන යෑමට ද අපට පිහිට වේ." හැම ක්‍රීඩාවක ම සාර්ථකත්වය එම ක්‍රීඩාවේ යෙදෙන ක්‍රීඩකයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රීඩා නීති අනුගමනය කිරීම මත රඳා පවතිනවා මෙන් ම ආර්ථිකයක උද්දීප්තිය සමාජය තුළ පෝෂණය කරනු ලබන විශ්වාසය, ප්‍රතිමාන සහ ප්‍රත්‍යුපකාරය පිළිබඳ ආකල්ප මත රඳා පවතී. එමෙන් ම සමාජයක උද්දීප්තිය ද එහි ආර්ථිකයේ ව්‍යුහය එනම් ආර්ථිකය මඟින් බිහි කරන සම්බන්ධතාවල ශක්තිය හෝ දුර්වලතා, එමඟින් ප්‍රවර්ධනය කරන හෝ බාදනය කරන පොදු බව පිළිබඳ ජීව ගුණය සහ එමඟින් ජනනය කරන වත්කම් බෙදා ගන්නා ආකාරය විසින් හැඩ ගස්වනු ලැබේ.

ඒ හැර එවැනි ක්‍රියාශීලී සමාජයක් තුළ ප්‍රජා රැස්වීම්, බිම් මට්ටමේ සංවිධාන, දේශපාලන නියෝජිතයන්ගේ වග වීම සහතික කරන දේශපාලන ව්‍යාපාර බිහි කිරීම වැනි උද්‍යෝගිමත් දේශපාලන ක්‍රියාකාරකම් දකින්නට ලැබෙනු ඇත. සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සහ ආර්ථිකය රඳා පවතින්නේ අවංක සංවිචාරණීය *(deliberative)* සාකච්ඡාවක නියැලීම සඳහා පුරවැසියන්ට ඇති අයිතිය සහ හැකියාව මතයි. - ජන සමාජයක දේශපාලන හඬ වැදගත් වන්නේ ඒ නිසා යි.

**ආර්ථිකය *(The Economy)*:** එකී සක්‍රිය සමාජ ජාලයට ම බද්ධ වී ඇති ආර්ථිකය යනු මිනිසුන් සිය අවශ්‍යතා සහ ඕනෑ එපාකම් සඳහා භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කරන, බෙදා හරින හා පරිභෝජනය කරන ක්ෂේත්‍රය යි. බොහෝ ආර්ථික විද්‍යා පන්තිවල ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් කියා නො දෙන එක් කාරණයක් නම් ආර්ථිකය ක්ෂේත්‍ර හතරක එක්වීමෙන් සැදුම් ලද්දක් බව යි. කේට් රේවර්ත්ගේ සහබද්ධිත ආර්ථිකය *(embedded economy)* පිළිබඳ රූපාදර්ශයේ පෙන්වා ඇති පරිදි ඒ ක්ෂේත්‍ර හතර වන්නේ පවුල හෙවත් කුටුම්බය, වෙළඳපොළ, පොදු වස්තු සහ රජයයි. මේ ක්ෂේත්‍ර හතර ම නිෂ්පාදනයට සහ බෙදාහැරීමට සම්බන්ධ නමුත් ඒ එක් එක් ක්ෂේත්‍රය සතු කාර්යභාරය එක හා සමාන නො වේ. උදාහරණයක් ලෙස කුටුම්බය එහි සාමාජිකයන් සඳහා අවශ්‍ය මූලික භාණ්ඩ තනයි. වෙළඳපොළ පුද්ගලික භාණ්ඩ නිෂ්පාදනය කරන්නේ ඒවා මිල දී ගැනීමට කැමති හා හැකි අයට යි. ජල සම්පත්, වන සම්පත් සහ සාගර වැනි පොදු වස්තු අදාළ ප්‍රජා කණ්ඩායම් සඳහා සහ-නිෂ්පාදිත *(co-produced)* භාණ්ඩ සපයයි. සාගර හා ජලාශ ආශ්‍රිත ව කෙරෙන ධීවර කර්මාන්තය එයට එක් නිදසුනකි. ඒ අතර රජය මුලු ජනගහනයට ම පොදු භාණ්ඩ සහ පොදු සේවා සපයයි. මේ ක්ෂේත්‍ර හතරෙන් එකක් හෝ නැති ආර්ථිකයක් සහිත සමාජයක ජීවත් වීමට බොහෝ අය අකැමැති වනු ඇත. ඒ එක් එක් ක්ෂේත්‍රයට ආවේණික වූ සුවිශේෂතා තිබෙන නමුත් ඒ හතරේ ම අගය වැඩි වන්නේ හතර ම එක් ව හා එකිනෙකට අනුපූරක ව ක්‍රියා කරන විට දී ය. සාම්ප්‍රදායික ආර්ථික සිද්ධාන්ත විසින් මූලික වසයෙන් සියලු මිනිසුන් ශ්‍රමිකයන්, පාරිභෝගිකයන් සහ ප්‍රාග්ධන හිමියන් වසයෙන් කොටස් තුනකට පමණක් බෙදනු ලබන නමුත් කේට් රේවර්ත්ගේ සහබද්ධිත ආර්ථිකය පිළිබඳ සංකල්පයට අනුව අප සතු ව වෙනත් බොහෝ ආර්ථික අනන්‍යතා ද පවතී. ඒ අනුව කුටුම්බයක දී මා දෙමව්පියන්ගෙන් කෙනෙකු, සාත්තු කාරයෙකු හෝ අසල්වැසියෙකු විය හැකි ය.

රජය සම්බන්ධයෙන් සලකන විට මා පොදු ප්‍රජාවේ සාමාජිකයෙකු, පොදු සේවා ලබන්නෙකු හා ඒ වෙනුවෙන් බදු ගෙවන්නෙකු විය හැකි යි. පොදු වස්තු පරිහරණයේ දී මා අනිකුත් අසල්වැසියන් සමඟ ඒවා නිර්මාණශීලී ව යොදා ගන්නෙකු හා පරිසරලෝලී ව රස විඳින්නෙකු විය හැකියි. සමාජයේ දී අපි සියල්ලෝ ම විටින් විට පුරවැසියෝ, ඡන්ද දායකයෝ, සමාජ ක්‍රියාකාරිකයෝ සහ ස්වේච්ඡා සේවකයෝ වෙමු. ඒ අනුව අපි අපේ භූමිකා හා ක්‍රියාකාරකම් පාරිභෝගිකයන්ගේ සිට නිර්මාපකයාට ද, වෙළඳපොළේ සිට රැස්වීම්පොළට ද, හෙට්ටු කිරීමේ සිට ස්වේච්ඡාවෙන් උදව් කිරීමට ද ආදී වසයෙන් දිනපතා ම පාහේ මාරු කර ගනිමින් සිටිමු.

**කුටුම්බය *(The Household)*:** වැටුප් ශ්‍රමයේ නිෂ්පාදන ඵලදායකත්වය පිළිබඳව සාම්ප්‍රදායික ආර්ථික චින්තනය බෙහෙවින් උනන්දු වෙන නමුත් නිෂ්පාදන කටයුතු සඳහා එම ශ්‍රමය ලබා ගත හැකි වූයේ කිසිදු වැටුපක් නො ලබා නිවෙස්වල වැඩ කරන ගෘහිණියන් නිසා බව මුළුමනින් ම අමතක කරයි. කුටුම්බය සම්බන්ධ 'වැඩ' සලකනු ලැබුවේ වැටුප් නො ගෙවන සත්කාර *(caring)* සේවා, ප්‍රජනක ආර්ථිකය *(reproductive economy)*, ද්විතීයික ආර්ථිකය ආදී නම්වලිනි. ආර්ථික විද්‍යාඥ නේවා ගුඩ්වින් අවධාරණය කරන පරිදි ද්විතීයික ආර්ථිකය යැ'යි හැඳින්වූ ව ද ආර්ථිකයේ අරටුව වන්නේ එය යි. කාලය, දැනුම, නිපුණතා, සත්කාරය, ඉගැන්වීම, ප්‍රත්‍යුපකාරය ආදී වසයෙන් මානව සම්පත් යොදමින් පවුලේ හා සමාජ ජීවිතයේ එදිනෙදා අවශ්‍යතා ඉටු කරමින් එමගින් ඉටු කරන කාර්යභාරය නො වන්නට ආර්ථිකයට ස්වාධීන පැවැත්මක් නැත. ගෘහිණියක් අතින් ඉටු වන කාර්ය ගැන ඔබ තවමත් ගැඹුරෙන් කල්පනා කර බලා නැත්නම් දිනපතා උදේ ආහාර වේල පිළියෙළ කිරීම, භාජන සේදීම, නිවස ඇමදීම, කඩේ යෑම, දරුවන් බලා කියා ගැනීම හා ඔවුන්ට ඉගැන්වීම, ඇඳුම් සේදීම, වැඩිහිටි දෙමව්පියන් බලා ගැනීම, අසල්වැසියන්ට උදව් කිරීම ආදී

කටයුතුවලින් ආර්ථිකයට දෙනු ලබන දායකත්වය ගැන හිතා බලන්න. ඇතැම් ග්‍රාමීය පළාත්වල රජයේ සේවා සැපයුම දුර්වල වූ විට සහ වෙළඳපළ දුර බැහැර වූ විට නේවාසිකයන්ට තම නිෂ්පාදන අවශ්‍යතා ස්වෝත්සාහයෙන් ම ඉටු කර ගැනීමට සිදුවේ. මේ ආර්ථිකය සඳහා වැටුප් නො ගෙවන බැවින් එයට යොමු වී ඇති අවධානය ද අඩු ය. අගයට ලක් වීමක් ද නැත. ඒ නිසා වැටුප් නො ලබන එම ආර්ථික කටයුතුවල නිරත වන ස්ත්‍රීන් හා වැටුප් ලබන පුරුෂයන් අතර ජීවිත කාලය පුරාම පැවතෙන සමාජ හා ආදායම් විෂමතා එමටය.

ආර්ථිකයේ හරය බඳු මේ කටයුතු නො තකා හැරීමෙන් වැටුප් උපයන ආර්ථිකය වැටුප් නො ලබන සේවා මත කොතෙක් රැඳී ඇත්තේද යන කාරණය අමතක කර දැමීමට සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාඥයන්ට හැකි වී තිබේ. අර කියූ ආහාර පිසීම, රෙදි සේදීම, සත්කාරය සහ ඇමදීම නොමැති ව හැම උදෑසනක ම පාතරාසය වළඳා වැඩට යෑමට සූදානම් කම්කරුවන් බිහි නො වනු ඇත. කුටුම්බ සත්කාරය මනුෂ්‍යයන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිසාත් වැටුප් ශ්‍රමය මත කෙරෙන නිෂ්පාදක කටයුතු ඒ මත රඳා පවතින නිසාත් මේ අවිධිමත් ආර්ථික හරය ආර්ථික චින්තනයේ වැදගත් අංගයක් විය යුතු ය. නව සාර්වත්‍ර ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ රූපාදර්ශයේ කුටුම්බයේ කේන්ද්‍රීය ස්වභාවය සනිටුහන් කිරීම ඒ සඳහා ගන්නා පළමු පියවරකි.

**වෙළඳපොළ *(The Market)*:** ආර්ථික විද්‍යාවේ පියා වසයෙන් සැලකෙන ඇඩම් ස්මිත්ගේ එක් තීක්ෂණ දැක්මක් වූයේ මිනිසුන්ගේ ඕනෑ එපාකම් සහ ඒවා සපුරාලීමට වැය වන මිල ගණන් පිළිබඳ තොරතුරු එක්රැස් කොට බෙදාහැරීමෙන් හා කිසිදු මධ්‍යගත පාලනයකින් තොර ව හුදෙක් මිල ගණන් පිළිබඳ ගෝලීය ක්‍රමයක් මඟින් පමණක් බිලියන ගණනක් වූ මිල දී ගන්නන් හා විකුණන්නන් සම්බන්ධීකරණය කිරීමට වෙළඳපොළට ඇති විශිෂ්ට හැකියාවයි. වෙළඳ පොළේ ඇති

මේ විස්තෘත හෙවත් පැතිරුණු කාර්යක්ෂමතාව *(distributed efficiency)* සැබවින් ම අසාමාන්‍ය ය. කාර්යක්ෂම ලෙස විස්තෘත වූ වෙළඳපොළකින් තොර ව ආර්ථිකය මෙහෙයවීමට තැත් කිරීම භාණ්ඩ හිඟයට සහ දිගු පෝලිම්වලට තුඩු දෙනු ඇත. නවලිබරල්වාදීන් වෙළඳපොළ සිය ආර්ථික දැක්මේ කේන්ද්‍රය බවට පත් කළේ මෙකී විස්තෘත කාර්යක්ෂමතාවේ වැදගත්කම නිසා ය. එහෙත් වෙළඳපොළ බලය සම්බන්ධ තවත් පැත්තක් ද වෙයි. වෙළඳපොළ අගය කරන්නේ මිල නියම කර ඇති දේවල් පමණි. එමෙන් ම එයට සන්තර්පණය තළ හැක්කේ ද මිල ගෙවිය හැකි අයගේ ඕනෑ එපාකම් පමණි. නිසි නියාමනයකින් තොර ව කටයුතු කිරීමට ඉඩ හැරියොත් වෙළඳපොළ පෘථිවියේ ඇති සම්පත් ඉවක් බවක් නැතිව වනසමින් ජෛව ගෝලයේ පැවැත්ම අනතුරට ලක් කරනු ඇත. අධ්‍යාපනය සහ එන්නත් කිරීමේ සිට මංමාවත් සහ දුම්රිය මාර්ග දක්වා වූ වෙළඳපොළ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය බොහෝ දේවල් නිසි ලෙස  සැපයීමට වෙළඳපොළට නො හැකි ය. ඒ අතර ම වෙළඳපොළට ආවේණික වූ ගතිකයන් විසින් සමාජ අසමානතාව වර්ධනය කොට ආර්ථික අස්ථාවරත්වය ද ඇති කළ හැකි ය. වෙළඳපොළ බලය පුළුල් ආර්ථිකය තුළ පොදු නියාමනය මඟින් හසුරුවා එහි වපසරිය පොදු යහපත මුල් කොට නිර්ණය කළ යුත්තේ එබැවිනි.

නිදහස් වෙළඳපොළ උත්කර්ෂණයට නංවන නොයෙක් කතන්දර තිබුණ ද නිදහස් වෙළඳපොළ නිරායාසයෙන් ම පිළිගැනීමට පෙලඹෙන බොහෝ අය ඒ තුළ ඇති සීමා දැකීමට අපොහොසත් වෙති.  ගමන් බලපත්‍ර සහ ඖෂධවල සිට ආයුධ දක්වා බොහෝ දේවල් නිල බලපත්‍රයක් නොමැතිව නිදහසේ මිලට ගැනීම හෝ විකිණීම කළ නො හැකි ය. වෘත්තීය සමිති, ආගමන විගමන ප්‍රතිපත්ති සහ අවම වැටුප් පිළිබඳ විධිවිධාන රටක වැටුප් සහ වේතන නිර්ණය කරයි. කෝපරේට් සමාගම්වල ලාභය කෙරෙහි සමාගමේ ගිණුම් වාර්තාකරණ අවශ්‍යතා, කොටස්කරුවන්ගේ

සංස්කෘතිය සහ ඔවුන්ට ලැබෙන ප්‍රමුඛත්වය, මූල්‍ය අර්බුදවල දී රජයේ මැදිහත් වීම ලබා ගැනීමේ හැකියාව ආදිය බෙහෙවින් බලපායි. එනිසා අප නිදහස් වෙළඳපොළ වෙනුවට සහබද්ධිත වෙළඳපොළ *(embedded market)* ගැන කතා කළ යුතු ය. ඒ අනුව වෙළඳපොළ නිර්නියාමනය යනුවෙන් දෙයක් නැති බව අප වටහා ගත යුතු ය. ඇත්ත වසයෙන් ම තිබිය යුත්තේ අවදානම සහ වියදම භාර ගැනීම මෙන් ම වැඩි වාසි සැලසෙන්නේ කාට ද යන්න පොදු යහපත තකා වෙනස් කළ හැකි දේශපාලනික, නෛතික සහ සංස්කෘතික නියාම ධර්ම සහිත සන්දර්භයක වෙළඳපොළ යළි නියාමනය වීමයි.

**පොදුවස්තු *(Commons)*:** පොදුවස්තු යනුවෙන් සැලකෙන්නේ රජය හෝ වෙළඳපොළ මත රැඳෙනු වෙනුවට ස්වයං සංවිධානය වීම තුළින් මිනිසුන් විසින් භාවිත කරනු ලබන ස්වාභාවික හා සමාජීය සම්පත් ය. ඒ සඳහා උදාහරණයක් වසයෙන් ගමක වැවක් හෝ අසබඩ කැලෑවක් සාමූහික ව භාවිත කරන ආකාරය ගත හැකියි. ඒ අනුව වැව සහ කැලෑව පොදු වස්තු ය. වෙළඳපොළ හෝ රජ්‍ය ආයතනයක මැදිහත් වීමකින් තොර ව ස්වේච්ඡා සේවා දායකත්වය මත බෙහෙවින් රැඳී ඇති විකිපීඩියා විශ්වකෝෂය ද එවැනි පොදු වස්තුවක් ලෙස සැලකිය හැකි ය. සාම්ප්‍රදායික ව ප්‍රජාවේ පොදු පරිහරණය සඳහා තිබූ තණබිම්, ජලාශ, ඇල දොළ, වෙරළ හා ධීවර කලාප සහ වනාන්තර ආදිය භාවිත කිරීම සම්බන්ධයෙන් පොදු එකඟතා මෙහෙයවුණේ වෙළඳපොළ හෝ රජයේ මැදිහත් වීමකින් නො වේ; ප්‍රජා සම්මුති මගිනි. ඒ හැර භාෂාව, වත්පිළිවෙත්, සාම්ප්‍රදායික සංගීතය, නැටුම්, ගැයුම්, වැයුම් ආදී සංස්කෘතික ලක්ෂණ ද, පාරම්පරික දැනුම ද අස්පර්ශණීය *(intangible)* පොදුවස්තු ගණයේ ලා සැලකිය හැකි ය. ඉතා වේගයෙන් ව්‍යාප්ත වූ තවත් පොදුවස්තු වර්ගයක් හැඳින්වෙන්නේ 'ඩිජිටල් කොමන්ස්' *(digital commons)* යන නමිනි. ඒවාට ඕපන් සෝස් හෙවත් විවෘත ප්‍රභව මෘදුකාංග, සමාජ ජාල, ඔන්ලයින් සහයෝගිතා ක්‍රියාකාරකම්, පොදු

නිර්මාණාත්මක *(creative commons)* බලපත්‍ර යටතේ ජනගත කරන නිර්මාණ, පොදු අරමුදල් භාවිත කොට නිපදවූ තොරතුරු සහ දැනුම අයත් වේ. උදාහරණයක් ලෙස රාජ්‍ය ආයතන සතු තොරතුරුවලට ප්‍රවේශ වීමට මහජනයාට ඇති අයිතිය තහවුරු වන්නේ එම තොරතුරු පොදුවස්තු නිසා ය.

නවලිබරල්වාදයට අනුව නම් පොදුවස්තු යනු ඛේදවාචකයකි. මන්ද ඔවුන් කල්පනා කරන අන්දමට තණබිම්, කැලෑව සහ ධීවර කලාප. සඳහා විවෘත ප්‍රවේශයක් තිබීමෙන් ඒවා පමණ ඉක්මවා භාවිත කිරීම නිසා විනාශ ව යෑමට ඉඩ තිබේ. ඒ නිසා භාවිතය සඳහා මුදල් අය කර ගැනීමෙන් එම තත්වය වළක්වා ගත යුතු ය. බැලූ බැල්මට ම එම තර්කය නිවැරදි නමුත් පොදුවස්තු සම්බන්ධයෙන් කළ පර්යේෂණ නිසා නොබෙල් අනුස්මරණ ත්‍යාගය දිනා ගත් ආර්ථික විද්‍යාඥ එලිනෝර් ඔස්ට්‍රොම් පෙන්වා දුන් පරිදි හැම ප්‍රජා කණ්ඩායමක් තුළ ම පාහේ පොදුවස්තු අරපරිස්සමෙන් පරිහරණය කිරීම සහතික කරන පොදු සම්මුති තිබේ. ඒ සම්බන්ධයෙන් ඇය ලියූ *Governing the Commons: The evolution of institutions for collective action* නම් කෘතියේ ලංකාවේ දකුණු පලාතේ මාවැල්ල ගමේ වෙරළ පොදු වස්තුවක් ලෙස සලකා වරකට එහි භාවිත කළ හැකි මාදැල් සංඛ්‍යාව පිළිබඳව ධීවර ප්‍රජාව අතර පවතින සම්මුතියක් ද එක් උදාහරණයක් වසයෙන් ගෙන තිබේ[116].

තාක්ෂණික දියුණුවත් සමඟ ඩිජිටල් කොමන්ස් යනුවෙන් හැඳින්වෙන ඩිජිටල් පොදුවස්තු වැඩි වසයෙන් යොදා ගැනීම නිසා ආර්ථික නිෂ්පාදන කටයුතුවල ඇතිවිය හැකි විප්ලවීය වෙනස ජෙරමි රිෆ්කින් වැනි ආර්ථික විශ්ලේෂකයන් විස්තර කර තිබේ. ඔහු පෙන්වා දෙන පරිදි ඩිජිටල් සංනිවේදනය, පුනර්ජනනීය බලශක්තිය සහ *3D* මුද්‍රණ ශිල්පයේ දියුණුවත්

116 Ostrom, Elinor (1990) *Governing the Commons: The evolution of institutions for collective action,* Cambridge: Cambridge University Press pp 185-190

සමඟ විස්තෘත *(distributed)* දායකයන් අතර සහයෝගිතාවෙන් නිෂ්පාදනය වන භාණ්ඩ නිසා සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රම වෙනස් විය හැකි ය. සූර්ය බලශක්තිය උපයෝගී කර ගැනීම, අන්තර්ජාලීය ධාරිතාවයේ වැඩි වීම සහ 3ද මුද්‍රණයේ දියුණුව මත සහයෝගිතා නිෂ්පාදනයේ දී භාණ්ඩවල අමතර ඒකක නිෂ්පාදනය සඳහා වැය වන මුදල විශාල වසයෙන් අඩු විය හැකි ය. ඒ අනුව බොහෝ විට යොදා ගන්නා ඕපන් සෝස් හෙවත් විවෘත ප්‍රභව භාණ්ඩ සැලසුම්, නොමිලේ සැපයෙන මාර්ගගත අධ්‍යාපනය (දැනටමත් නොයෙක් විෂය කරුණු හා නිර්මාණ ගැන අන්තර්ජාලය හරහා නොමිලේ ලබා ගත හැකි අධ්‍යාපනික වීඩියෝ) සහ විස්තෘත නිෂ්පාදන ක්‍රම නිසා පවතින වෙළඳපොළ හා සාර්ථක ව තරඟ කිරීම පමණක් නො ව එය විස්ථාපනය කිරීමට ද 'ඩිජිටල් කොමන්ස්වලට' ඇතැම් විට හැකි වනු ඇත.

පොදු ඉඩම් අල්ලා ගැනීමට තැත් කිරීම, කම්කරුවන් සහ හිමිකරුවන් වසයෙන් ව්‍යවසායන් දෙකට බෙදීම, රජය හා වෙළඳපොළ අතර තරඟය ආදී වසයෙන් සියවස් ගණනක් තිස්සේ පොදුවස්තු අත්පත් කර ගැනීමට වෙළඳපොළ මෙන් ම රාජ්‍යය ද තැත් කර තිබේ. පොදුවස්තු ගරහන එවැනි ආකල්ප බිහි වීමට සාම්ප්‍රදායික ආර්ථික චින්තනයේ එන 'පොදුවස්තු යනු කොහොමටත් අසාර්ථක වීමට නියමිත ඒවා ය' යන විශ්වාසය ද හේතු වන්නට ඇත. එහෙත් ඩිජිටල් යුගයත් සමඟ සාර්ථක වීමට වැඩි හැකියාවක් ඇති ඩිජිටල් කොමන්ස් වැනි දේවල් සලකන විට නව කාර්යක්ෂම ආර්ථික එළඹුමක් සඳහා ඇති ඉඩ කඩ වැඩිය. එබැවින් කේට් යෝජනා කරන සහබද්ධිත ආර්ථිකය පිළිබඳ රූපාදර්ශයේ පොදුවස්තු සුවිශේෂයෙන් නිරූපණය වීම වටී.

රජය ***(The State)***: නවලිබරල්වාදයේ ප්‍රකට න්‍යායාචාර්යවරයෙකු වූ මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් රජයේ ආර්ථික කාර්යභාරය ජාතික ආරක්ෂාව, පොලිස් සේවය සහ නීතිය ක්‍රියාත්මක කරලීමට

සීමා කළ යුතු යැ'යි පැවසී ය. ඔහු විශ්වාස කළ ආකාරයට රජය සුජාතකරණය කළ හැක්කේ වෙළඳපොළ කාර්යක්ෂමතාවට අත්‍යවශ්‍ය වූ පුද්ගලික දේපළ ආරක්ෂා කිරීම හා නීත්‍යනුකූල ගිවිසුම් බලාත්මක කිරීම නිසි ලෙස ඉටු කර දීමට එයට ඇති වගකීම නිසා ය. ඒ හැරෙන කොට ඔහුට අනුව ආර්ථිකය සම්බන්ධයෙන් රජය වෙනත් කිසි ම මැදිහත් වීමක් නො කළ යුතු ය. එහෙත් පෝල් සැමුවෙල්සන් වැනි ආර්ථික පාඨ ග්‍රන්ථ කර්තෘවරු ෆ්‍රීඩ්මන්ඩ්ගේ මතය ප්‍රතික්ෂේප කළෝ ය. සැමුවෙල්සන්ගේ මතය වූයේ 'සියලු දෙනාගේ ම පැවැත්ම එකිනෙකා මත රඳා පවතින මේ සා සුවිශාල ජන රාශියක් ඇති ලෝකයක ආර්ථික ජීවිතය සම්බන්ධයෙන් රජයට විශාල භූමිකාවක් ඇති බවයි[117]. එහෙත් රජය 'ආපසු තල්ලු කර දැමීමට' උත්සුක වූ අය අතර වඩා තහවුරු වූයේ ෆ්‍රීඩ්මන්ඩ්ගේ මතයයි.

කෙසේ වෙතත් නව ආර්ථිකය දැක්ම තුළ කුටුම්බය, පොදුවස්තු සහ වෙළඳපොළ යන ත්‍රිත්වයේ ම සහකරු වසයෙන් රජයේ කාර්ය වැදගත් තැනක් ගනී. පළමුවෙන් ම නිදහස් අධ්‍යාපනය සහ සෞඛ්‍යයේ සිට මංමාවත් සහ වීදි ආලෝකය දක්වා ගෙවිය හැකි අයට පමණක් නො ව නො ගෙවිය හැකි අයටත් සමාන ව භුක්ති විඳිය හැකි සමාජය සහ ආර්ථිකය කාර්යක්ෂම ව පවත්වා ගෙන යෑමට අවශ්‍ය පොදු භාණ්ඩ සහ සේවා සපයනු ලබන්නේ රජයෙනි. දෙවනු ව කුටුම්බයක මව් පිය දෙපොළ සබල ගන්වන ප්‍රසූත නිවාඩු, පිතෘ නිවාඩු මෙන් ම මුල් ළමා විය අධ්‍යාපනය සහ වැඩිහිටියන් සඳහා සත්කාර සේවා සැපයුම් බොහෝ රජයන් විසින් සහතික කරන සමාජ ආරක්ෂණ විධිවිධානවලට අයත් ය. එමෙන් ම පොදු දේපළ සහ පොදු වස්තුවල සාමූහික අයිතිය ආරක්ෂා කිරීමත් ඒවා අත්තනෝමතික ලෙස පෞද්ගලික අවශ්‍යතා සඳහා යොදා ගැනීම වැළැක්වීමත් රජය මඟින් කරන කටයුත්තකි. සමාජ යහපත මුල් කර ගෙන වෙළඳපොළ බලය නියාමනය

117 Samuelson, P. (1980) Economics, 11th edn. New York: McGraw Hill, p.592

කිරීමට රජයේ මැදහත් වීම අත්‍යවශ්‍ය ය. වෙළඳපොළ හා සහබද්ධිත වීමෙන් රජය පාරිභෝගික අයිතීන් සුරැකීමට, ආභ්‍යන්තරික කොටස් වෙළඳාම වැනි දුෂ්ක්‍රියාවලින් කොටස් වෙළඳපොළ ආරක්ෂා කිරීමට, හානිකර විෂ ද්‍රව්‍ය අලෙවිය තහනම් කිරීමට, භාණ්ඩ ප්‍රමිති නියාමනය කිරීමට, කම්කරු අයිතීන් සුරැකීමට සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ද කටයුතු යොදයි. වෙළඳපොළ විසින් ගැනීමට පසුබට වන ව්‍යවසායකත්ව අවදානම නො තකා නවෝත්පාදන කටයුතු ඉටු කිරීමට රජය සූදානම් ය. මේ පුරෝගාමී කාර්ය ඉටු කිරීමේ ලා රජයේ භූමිකාව අතිශයින් වැදගත් වන්නේ ඇයි යන්න රජයේ මැදිහත් වීමෙන් බිහි වූ නවෝත්පාදන පිළිබඳ විශේෂඥවරියක වන ආර්ථික විද්‍යාඥ මාරියානා මස්සුකාටෝ උදාහරණ සහිත ව පෙන්වා දෙයි. උදාහරණයක් ලෙස අද හැම සුහුරු ජංගම දුරකථනයක ඇති *GPS* පහසුකම, ප්‍රතිචාරක තිරය, මයික්‍රොචිපය පමණක් නො ව අන්තර්ජාලය බිහි වීමට තුඩු දුන් තාක්ෂණය ද එක්සත් ජනපද රජයේ නිෂ්පාදනයෝ ය. නවෝත්පාදනය සම්බන්ධයෙන් රජයේ මේ කාර්යසාධක භූමිකාව ගැන අපි 23 වැනි හා 24 වැනි පරිච්ඡේදවල වෙසෙසින් සාකච්ඡා කරමු.

එහෙත් ආර්ථිකයට කාර්යක්ෂම දායකත්වයක් රජයකට දිය හැකි වන්නේ එම රජයේ ආයතන කෙතෙක් දුරට අන්තර්ග්‍රහනීය *(inclusive)* හෙවත් සියල්ලන්ට ම සමානව සලකන සහ අදූෂිත ඒවා ද යන්න මතයි. ආර්ථික විද්‍යාඥ ඩැරොන් ඇසිමොග්ලු සහ දේශපාලන විද්‍යාඥ ජේම්ස් රොබින්සන් ලියූ උයහ *Nation Fails* නමැති කෘතියේ රජයක ආයතන අන්තර්ග්‍රහනීය වන විට ආණ්ඩුවේ කාර්යක්ෂමතාව ඉහළ යන අන්දම මැනවින් විස්තර කරයි. අන්තර්ග්‍රහනීය දේශපාලනික ආයතනවල ඇති ප්‍රයෝජනය නම් එමගින් ජනසමාජයේ විවිධ කණ්ඩායම් අතර බලය පිළිගත හැකි ලෙස බෙදා ගැනීමට හැකිවීම යි. මේ නිසා බලවත් අතළොස්සකගේ සුබවිහරණය පිණිස පොදු වත්කම් උදුරා ගැනීම පරමාර්ථය කරගත්

නිස්සාරක ආර්ථික ප්‍රතිපත්ති *(extractive economic policies)* ප්‍රතික්ෂේප කරලීමට හැකි වේ. අධිකාරිවාදී රජයකින් මෙන් ම මූල ධාර්මික වෙළඳපොළකින් ද දුර්විපාක ඇතිවිය හැකි ය. ප්‍රජා පීඩක ආණ්ඩුවක් මෙන් ම ප්‍රජා පීඩක වෙළඳපොළක් ද මෙල්ල කිරීමට ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක පැවැත්ම අත්‍යවශ්‍ය ය. පොදු සහ දේශපාලනික ජීවිතයේ වග වීම තහවුරු කිරීමට අවශ්‍ය වන ප්‍රජා සහභාගිත්වය බලමුළු ගැන්වීමට සමාජයට හැකි වන්නේ එම සමාජය කොතෙක් දුරට ප්‍රජාතන්ත්‍රවාදී ද යන්න මත ය.

**මූල්‍යය කටයුතු *(Finance)*:** කේට් රේවර්ත් පෙන්වා දෙන අන්දමට මූල්‍ය අංශය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික මිථ්‍යා මත තුනක් පවතී. වාණිජ බැංකුවල කාර්ය මහජනතාවගේ ඉතුරු කිරීම් ආයෝජන බවට පත් කිරීම ය, මූල්‍ය වෙළඳපොළ විසින් ආර්ථිකයේ උච්චාවචනය වීම සමනය කරණු ලැබේ සහ ඒ අනුව මූල්‍ය අංශය නිසා නිෂ්පාදන ආර්ථිකයට විශාල සේවයක් සැලසෙනු ඇත යන්න ඒ මිථ්‍යාවෝ වෙති. මේ මිථ්‍යා මත තුන ම ඉතාමත් ප්‍රකට ලෙස 2008 ආර්ථික අර්බුදයත් සමග සුනුවිසුනු වී ගියේ ය. බැංකුවලින් ඇත්ත වසයෙන් ම සිදු වන්නේ බැංකු ඉතුරු කිරීම්වලින් ණය ලබා දීමට වඩා ණය වසයෙන් මුදල් මවා පෑම යි. මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම වෙනුවට මූල්‍ය වෙළඳපොළ මඟින් ආවේණික ව කෙරෙන්නේ මූල්‍ය අංශය විචල්‍ය වීම යි. ඒ අනුව රේවර්ත් පවසන්නේ නිෂ්පාදන ආර්ථිකයට විශාල සේවයක් කිරීම වෙනුවට මූල්‍ය අංශය බල්ලෙකු වැනීමට තැත් කරන වලිගයක් මෙන් කටයුතු කරන බව යි.[118]

ආර්ථික විද්‍යා පාඨ ග්‍රන්ථවල කුමක් තිබුණත් බැංකු ණය දෙන්නේ ඉතුරු කරන්නන් විසින් බැංකුවල තැන්පත් කර ඇති ඉතිරි කිරීම් යොදා ගැනීමෙන් ම නො වේ. ණය මුදලක්

118 Raworth, Raworth (2017) *Doughnut Economics: Seven ways to think like a 21st Century Economist*, New York: Random House p.52

නිකුත් කරන හැම විට ම බැංකු කරන්නේ සිය ගිණුම් පොත්වල බැරකම් හෙවත් ණය ලබන්නාගේ වගවීම සහ පොලිය සමඟ ආපසු ගෙවිය යුතු ණය යන දෙක ම එක්වර ම සටහන් කිරීම යි. ඒ අකාරයට ණය නිර්මාණය කිරීම අලුත් දෙයක් නො ව අවුරුදු දහස් ගණනක සිට පැවත එන්නකි. නිසි නියාමනය යටතේ එමඟින් වැදගත් මෙහෙයක් ඉටු වන නමුත් 1980 ගණන්වල සිට ණය නිර්මාණය පමණ ඉක්මවා ගොස් තිබේ. ඊට හේතුව මූල්‍ය අංශයේ නියාමනය මුළුමනින් ම පාහේ ඉවත් කිරීම යි. ඇමෙරිකා එක්සත් ජනපදයේ එතෙක් පැවැති ග්ලාස් ස්ටීගල් පනත යටතේ ගනුදෙනුකරුවන්ගේ ඉතුරු කිරීම් සහ ණය බැංකුවල ආයෝජන කටයුතුවලින් වෙන් කොට සැලකිය යුතු බවට නියමිත ව තිබුණත් 1999 සිට එම අවශ්‍යතාව ඉවත් කරන ලදී. ඒ නිසා බැංකුවලට සිය මනාපය පරිදි ගනුදෙනුකරුවන්ගේ ඉතිරි කිරීම් අනතුරුදායක සමපේක්ෂණීය *(speculative)* ආයෝජනවල යෙදවිය හැකි විය.

'ආර්ථික ස්ථාවරභාවය ඇති කිරීම සඳහා මූල්‍ය වෙළඳපොළ වැදගත් මෙහෙයක් ඉටු කරයි' යන කතාවේ ද ඒ තරම් සත්‍යයක් නොමැති බව රේවර්ත් පෙන්වා දෙයි. 2004 දී ඇමෙරිකානු ෆෙඩරල් රිසව් බැංකුවේ සභාපති ඇලන් ග්‍රීන්ස්පෑන් ආර්ථිකයේ අස්ථාවරත්වය සම්බන්ධයෙන් සහතික කළ අන්දමට අවදානම නිසා තනි තනි මූල්‍ය ආයතනවලට කම්පනයකට මුහුණ දීමට සිදුවීමේ හැකියාව අඩුව ඇති අතර සමස්තයක් වසයෙන් ගත් විට මූල්‍ය පද්ධතිය වඩා ඔරොත්තු දෙන ප්‍රවණතාවක් ඇති කර ගෙන තිබුණි. එහෙත් ඉන් වසර හතරක් ගත වූ පසු පැමිණි 2008-2010 ආර්ථික අර්බුදයත් සමඟ ග්‍රීන්ස්පෑන්ගේ ප්‍රකාශය තීරණාත්මක ලෙස අනාථ වී ගියේ ය. මූල්‍ය වෙළඳපොළ යනු ආවේණික ව ම කාර්යක්ෂම වෙළඳපොළකි වැනි පුරසාරම් ද ඒ සමඟ අයාලේ ගියේ ය. රේවර්ත් පෙන්වා දෙන අන්දමට 70 දශකයේ හයිමන් මින්ස්කි වැනි ආර්ථික විද්‍යාඥයන් ඉදිරිපත් කළ මූල්‍ය අස්ථාවරත්වය පිළිබඳ උපන්‍යාසය අනුව මූල්‍ය

වෙළඳපොළ යනු ආවේණික ව ම වාෂ්පශීලී අස්ථාවර දෙයකි. 2008 අර්බුදය උත්සන්න වූ විට ආර්ථික විශ්ලේෂකයෝ නැවත මින්ස්කි කියවන්නට පටන් ගත්හ.

බැලූ බැල්මට තර්ක බුද්ධියට ගෝචර නො වන බව පෙනුණත් මින්ස්කි විස්තර කළ ආකාරයට මූල්‍ය වෙළදාම් කටයුතුවල ඇති විශේෂත්වය නම් මූල්‍ය ස්ථාවරත්වය ම මූල්‍ය අස්ථාවරත්වයට හේතු වෙන බව යි[119]. මින්ස්කිට අනුව ඊට හේතුව මූල්‍ය කටයුතු ශක්තිමත් වීම ප්‍රතිචාර ලූපයක් හෙවත් චක්‍රයක් මෙන් ක්‍රියා කරන නිසාය.

උදාහරණයක් ලෙස ආර්ථික වසයෙන් යහපත් කාලවල දී ආර්ථිකය ගැන ඇති විශ්වාසය වැඩි වෙන බැවින් බැංකු, සමාගම් සහ ණය ඉල්ලුම්කරුවෝ වඩ වඩා ආයෝජන අවදානම් ගැනීමට පෙලඹෙති. ඒ නිසා නිවාස ඇතුළු වාණිජ වත්කම්වල මිල ඉහළ යයි. මිල මෙසේ ඉහළ යෑම නිසා ණය දෙන්නන් සහ ණය ගන්නන් අතර වත්කම් මිල නො කඩවා ඉහළ නැගෙනු ඇතැ'යි යන බලාපොරොත්තුව තව තවත් තහවුරු කරවයි. මින්ස්කි පවසන අන්දමට මෙසේ 'සියල්ල වාසිදායක ලෙස සිදුවේය යන විශ්වාසය නිසා සමපේක්ෂණාත්මක ආයෝජනවල *(speculative investments)* හදිසි උත්පාතයක් ඇතිවීම ධනවාදී ආර්ථිකයේ අස්ථාවර බවට මූලික හේතුව යි'. ඉහළ බලාපොරොත්තුවලට සරිලන ආකාරයට මිල පවත්වා ගැනීමට තදනන්තර ව නො හැකි වූ විට අනිවාර්යයෙන් ම සිදු වන ආකාරයට ණය වාරික සහ පොලිය ගෙවීම අතපසු වෙන අතර වත්කම්වල මිල පහළ වැටීම ඇරඹේ. එම තත්වය උත්සන්න වූ විට මූල්‍ය බංකොලොත් බව ඇතිවී ආර්ථිකය කඩා වැටේ. එහෙත් කඩා වැටීමෙන් කලකට පසු ආර්ථිකය නැවත නැගී එන විට විශ්වාසය තහවුරු වෙන පමණට අර ක්‍රියාවලිය ම යළි යළි සිදු විය හැකි බව මින්ස්කි පෙන්වා දුන්නේ ය.

119 Raworth, Kate (2017) Doughnut Economics: *Seven ways to think like a 21st Century Economist*, New York: Random House p.189 (KE)

නිෂ්පාදන ආර්ථිකයට සහයෝගය දක්වනු වෙනුවට ඇත්ත වසයෙන් ම මූල්‍ය ආර්ථිකය කරන්නේ නිෂ්පාදන ආර්ථිකය අබිබවමින් ඒ මත ආධිපත්‍යය පැතිර වීම යි. බොහෝ රටවල බැංකු හා මූල්‍ය ආයතන නතු කර ගෙන ඇති මූල්‍යප්‍රභූවරු අතළොස්ස පුළුල් ආර්ථිකය අස්ථාවර කරමින් කොටස් වෙළඳපොළ මාට්ටු කිරීමෙන් සහ කපටි මූල්‍ය ගනුදෙනුවලින් අධික ලාභ උපයා ගනිති. එනිසා මේ මූල්‍ය දුසිරිත් නිවැරදි කර මුල්‍ය කටයුතු ආර්ථිකයේ සහ සමාජයේ යහපතට හේතු වෙන ලෙස මෙහෙයවීම පිණිස ආර්ථිකය යළි සැලසුම් කළ යුතු යැ'යි රේවර්ත් පවසයි.

ව්‍යාපාර සමාගම් ***(Business)***: වෙළඳපොළ හරහා නව නිපැයුමක් නිර්මාණය කොට හඳුන්වා දීම සඳහා කටයුතු කරන විට මිනිසුන්, තාක්ෂණය, බලශක්තිය, ද්‍රව්‍ය සහ මූල්‍ය සම්පත් එක් කිරීමේ ලා ව්‍යාපාර අසාමාන්‍ය කාර්යසාධක භූමිකාවක් ඉටු කරයි. නව ලිබරල්වාදී ආඛ්‍යානයට අනුව සමාගම් කාර්යක්ෂම වන්නේ වෙළඳපොළ යන්ත්‍රණය නිසා ය. එහෙත් කුටුම්බය සම්බන්ධයෙන් දැක්වූ ආකල්පය මෙන් ම සමාගම් තුළ සිදු වන ක්‍රියාවලිය ද නවලිබරල්වාදී ආඛ්‍යානයට වැදගත් නොවීය. සමාගම් තුළ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කුමක් සිදු වේද යන්න අධ්‍යයනය කිරීම අතිශයින් වැදගත් ය. සමාගමක සේවකයන් සහ කොටස් හිමි අයිතිකරුවන් අතර බලය හැසිරෙන ආකාරය නිෂ්පාදනයේ පැවැත්ම සම්බන්ධයෙන් තීරණාත්මක ය. ඊට මූලික වසයෙන් ම හේතු වන්නේ ඒ දෙකොට්ඨාසය අතර ඇති අසමානතාව යි. මේ බව වික්ටොරියානු යුගයේ සෞඛ්‍යයට අහිතකර අපිරිසිදු කර්මාන්ත ශාලා උදාහරණයට ගනිමින් මාක්ස් සහ එංගල්ස් විසින් පෙන්වා දී තිබේ. ඇතැම් විට වර්තමානයේ පවා එවැනි කර්මාන්ත ශාලා සහ ගොවිපළවල් දැක ගැණීමට හැකි ය. ලාභයේ හා තරඟකාරිත්වයේ නාමයෙන් බොහෝ කම්හල් කළමනාකරුවෝ කම්කරු නීති හා සේවක සුභසාධනය නො තකමින් ඇතැම් විට අගුලු දැමූ කම්හල්වල

කම්කරුවන් රඳවා ගනිමින්, වැසිකිළි භාවිතය සීමා කරමින්, ගර්භිනී වීම හෙළා දකිමින් හෝ ගර්භිනී කාන්තාවන් සේවයෙන් පහ කරමින්, ළමා ශ්‍රමිකයන් යොදා ගනිමින් කටයුතු කරනු දක්නට ලැබේ. නීත්‍යානුකූල ව කටයුතු කළත් ඇතැම් රටවල සමාගම් බොහෝ විට සේවකයන් යොදා ගන්නේ අස්ථිර පත්වීම් සහ මැන්පවර් කොන්ත්‍රාත්තු මත ගෙවිය හැකි අවම වැටුපට සේවය ලබා ගැනීම සඳහා ය.

සංවිධානය වීමේ අයිතිය පෙරදැරි කොට සාමූහික කේවල් කිරීමට හැකි වන ආකාරයට සේවකයන් සංවිධානය වීම මඟින් උග්‍ර විෂමතා සහිත සමාගම් තුළ සේව්‍ය සේවක බල සම්බන්ධතා තුලනය කර ගත හැකි වේ. තවත් ක්‍රමයක් වන්නේ සමාගම් හිමිකාර ව්‍යුහය වෙනස් කොට ශතවර්ෂ ගණනක් පැරණි සේව්‍ය සේවක බෙදීම අවසන් කිරීමයි. රේවර්ත් පෙන්වා දෙන පරිදි 21වැනි සියවසේ අභියෝග හමුවේ කොටස්වල මිල ඉහළ දමා ගැනීමට වඩා අගය කළ හැකි පරමාර්ථයක් සමාගම්වලට තිබිය යුතු ය. ව්‍යාපාරවල එකම සමාජ වගකීම ලාභ ලැබීමයි යන නවලිබරල්වාදී ගුරු මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ්ගේ පටු දැක්ම 21 වැනි සියවසට වලංගු නො වේ.

වෙළඳාම ***(Trade)***: සහබද්ධිත ආර්ථිකය *(embedded economy)* පිළිබඳ රේවර්ත්ගේ රූපාදර්ශය තනි ජාතික රාජ්‍යයක ආර්ථිකය නිරූපණය කිරීමට මෙන් ම ජාත්‍යන්තර වෙළඳාම ඇතුළු ව ගෝලීය ආර්ථිකය නිරූපණය කිරීමට ද යොදා ගත හැකි ය. ශීඝ්‍ර ගෝලීයකරණය නිසා පසුගිය වසර 20 තුළ දේශ සීමා ඉක්මවා යන වෙළඳාම වැඩි වූ අතර කොන්ටේනර් බහාලුම් නැව් සහ අන්තර්ජාලය නිසා ජාත්‍යන්තර පරිවහන හා සංනිවේදන වැය ද සැලකිය යුතු ලෙස අඩු විය. 1995 පිහිටුවන ලද ලෝක වෙළඳ සංවිධානයේ මෙහෙයවීමෙන් වෙළඳාම නිදහස් කිරීමේ න්‍යාය පත්‍රය රටවල් 164 ක ක්‍රියාත්මක වීම ද ගෝලීය වෙළඳපොළ ව්‍යාප්තියට බෙහෙවින් හේතු විය. තමන් විසින් සියලු ම දේවල් නිපදවා ගැනීමට තැත් කරනු ලබනවාට වඩා

එක් එක් රටවල් තම තමන්ගේ රටවල වඩා හොඳින් නිපදවිය හැකි දේවල් නිෂ්පාදනය කොට අනෙකුත් දේවල් වඩා හොඳින් නිපදවිය හැකි රටවල් සමඟ හුවමාරු කර ගැනීම වාසිදායක බව පැවසූ ඩේවිඩ් රිකාඩෝගේ විදේශ වෙළඳාම පිළිබඳ න්‍යාය සැලකිය යුතු බලපෑමක් ඇති කළ න්‍යායකි. වයින් සහ රෙදිපිළි උදාහරණයට ගෙන තම න්‍යාය විස්තර කළ ඩේවිඩ් රිකාඩෝ එවැනි අනෙකුත් නිමි භාණ්ඩ කෙසේ වෙතත් ඉඩම්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක එකල සැලකුවේ දේශ සීමා අතර හුවමාරු කර ගත නො හැකි දේවල් ලෙස ය. එහෙත් අද ඉඩම් හැරෙන විට අලුත් පලතුරුවල සිට නීති උපදේශනය දක්වා අනෙක් හැම දෙයක් ම භාණ්ඩ සහ සේවා වසයෙන් දේශ සීමා හරහා වෙළඳාම් කෙරේ. ඊට ව්‍යාපාර සහ දේපළ ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන සහ ජීවනෝපායක් සොයමින් විදේශවලට සංක්‍රමණය වන ශ්‍රමිකයෝ ද ඇතුළත් ය.

මේ සියලු ආකාරයේ දේශාන්තර භාණ්ඩ සහ සේවා ප්‍රවාහ තුළ ප්‍රතිලාභ මෙන් ම නොයෙකුත් අවදානම් ද අඩංගු වේ. සහල් වැනි ප්‍රධාන ආහාරයක් ස්වදේශීය ව වගා කරනවාට වඩා ලාභයට ආයාත කොට වෙළඳාම් කිරීමට හැකි වීමෙන් ආහාර මිල අඩු මට්ටමක පවත්වා ගත හැකි බව සැබෑ ය. එහෙත් එය දේශීය ආහාර නිෂ්පාදනයට තර්ජනයක් විය හැකි ය. ඒ අතරම ජාත්‍යන්තර වෙළඳපොළේ ආහාර මිල ඉහළ යන විට ඇතිවෙන බලපෑම දරා ගැනීමට නො හැකි වීම නිසා සමාජ වියවුල් ඇති විය හැකි ය. උදාහරණයක් ලෙස 2007-2008 කාලයේ ඊජිප්තුව සහ බුර්කිනා ෆාසෝවල ආහාර කැරලි ඇවිලීමට හේතුවක් වූයේ ගෝලීය වෙළඳ පොළේ තිරිඟු, ඉරිඟු සහ සහල් යනාදියේ මිල තුන් ගුණයකින් වැඩි වීමෙන් දේශීය වෙළඳ පොළේ ආහාර ද්‍රව්‍යය මිල දැරිය නො හැකි තරමට ඉහළ යෑම නිසාය. සංක්‍රමණය වන පුහුණු සේවකයන් විසින් සිය මව් රටවලට විදේශ විනිමය උපයන නමුත් ඒ නිසා ම මව් රටවලට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයක් ඇතිවිය හැකි ය. එමෙන් ම

විදේශ ආයෝජන නිසා නැගී එන දේශීය ආර්ථිකය තුළ කොටස් වෙළඳපොළ සරු විය හැකි වුවත් 1990 ගණන්වල තායිලන්තය, ඉන්දුනීසියාව සහ දකුණු කොරියාව වැනි රටවල සිදු වූවාක් මෙන් සමපේක්ෂණීය අවදානම *(speculative risk)* නිසා හිටි හැටියේ විදේශීය ආයෝජකයන් කොටස් වෙළඳපළෙන් ඉවත් වූ විට දේශීය ආර්ථිකය මුළුමනින් ම කඩා වැටීමට එය හේතු විය හැකි ය.

අද ඉහළ ආදායම් ලබන රටවල් ඒතැනට පැමිණ ඇත්තේ කලකට ඉහත දී ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙනි. එහෙත් තමන් එතැනට පැමිණි ඉණිමගට පයින් ගසා නිදහස් වෙළඳාම සඳහා සිය දේශ සීමා මුළුමනින් ම විවෘත කරන ලෙස එම රටවල් දැන් අඩු සහ මැදි ආදායම් ලබන රටවලට බල කිරීම අයුතු බව ආර්ථික විද්‍යාඥ හා ජූන් චැන්ග් පෙන්වා දෙයි. නිදහස් වෙළඳපොළක මහා ආනිසංස ගැන දැන් කොතරම් බණ දෙසුවත් ඇමෙරිකා එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය ඇතුළු ඉහළ ආදායම් ලබන රටවල් සිය කාර්මික ආර්ථික වර්ධනය ආරක්ෂා කර ගැනීම සඳහා විදේශීය නිමි භාණ්ඩ ආනයනය අධෛර්යමත් කරවන ආනයන බදු, ස්වදේශීය සමාග ම්වලට බදු සහන මෙන් ම සහනාධාර ලබා දීම සහ රාජ්‍ය ආයෝජන යොදවා අත්‍යවශ්‍ය සේවා සමාගම් පවත්වා ගෙන යෑම වැනි දේශීය නිෂ්පාදනවලට වැඩි වාසි සැලසෙන ලෙස වෙළඳපොළට මැදිහත් විය. 1830 සිට 1940 දක්වා ම ඇමෙරිකාව ස්වදේශීය ආර්ථිකය ගොඩනගා ගැනීම සඳහා වෙළඳපොළ සම්බන්ධයෙන් දැඩි ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ බව හා-ජුන් චැන්ග් උදාහරණ උපුටා දක්වමින් පෙන්වා දෙයි.[120] නවෝත්පාදනයයේ අරටුව වැනි බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් අදත් එම රටවල් සිය ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය දැඩි ලෙස ක්‍රියාත්මක කරයි.

120 Chang, H.J. (2010). 23 Things They Don't Tell You About Capitalism, London: Allen Lane p. 109-120 (KE)

නිදහස් වෙළඳපළක් කියා දෙයක් නැතිවාක් මෙන් ම නිදහස් වෙළඳාමක් ද නොමැති බව රේවර්ත් පවසයි. ඇය පෙන්වා දෙන පරිදි රටක දේශ සීමා හරහා භාණ්ඩ සහ සේවා හුවමාරු වීම එහි ජාතික ඉතිහාසය අතින් සැලකූ විට වර්තමාන ජාත්‍යන්තර බල සම්බන්ධතා හා ආයතනික පද්ධතියක සන්දර්භය තුළ සිදු වන දෙයකි. 2007- 2008 ආහාර අර්බුදය සහ ඒ සමඟ 2008-2010 පැන නැගුණු ආර්ථික අර්බුදය මඟින් පෙන්වා දුන් පරිදි දේශාන්තර ආර්ථික ප්‍රවාහයේ ප්‍රතිලාභ පුළුල් ලෙස සමාජය තුළ බෙදී යෑම සහතික කිරීමට අවසානයේ දී රටවල් අතර ඵලදායක සහයෝගයක් තිබිය යුතු ය. උදාහරණයක් ලෙස දකුණු ආසියාතික දේශපාලනික හා ආර්ථික සංගමයක් තුළ එක්සත් වීමෙන් ලක් වැසියන්ට ලබා ගත හැකි ඵල ප්‍රයෝජන එමටය.

බලය ***(Power)***: ආර්ථික විද්‍යාව පිළිබඳ නූතන පාඨ ග්‍රන්ථයක සූචිය විමසා බැලුවොත් බලය යන වචනය යෙදෙන එක ම තැන විදුලි බල ක්ෂේත්‍රය විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් පමණක් විය හැකියැ'යි කේට් රේවර්ත් උපහාසාත්මක ව පවසයි. එහෙත් ආර්ථිකය සහ සමාජය පුරා ම බලය ක්‍රියාත්මක නො වන තැනක් නැත. එදිනෙදා කුටුම්බය තුළ දරුවන් බලා කියා ගැනීම, අයිතිකරු සහ සේවකයින් අතර වැටුප් කේවල් කිරීම, ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සහ දේශගුණ විපර්යාසය ආමන්ත්‍රණය කිරීමේ සම්මන්ත්‍රණ ආදී වසයෙන් මිනිසුන් මැදිහත් වන හැම තැනක ම බල සම්බන්ධකම් ද ඇති වේ. සහබද්ධිත ආර්ථිකය පිළිබඳ රූපාදර්ශය තුළ ඇති හැම ක්ෂේත්‍රයක් තුළ මෙන් ම එම ක්ෂේත්‍ර අතර සම්බන්ධතාව සම්බන්ධයෙන් ද එකී බල සම්බන්ධකම් පවතින ආකාරය සිහියට නගා බලන්න.

මේ සියලු බල සම්බන්ධකම් අතරින් ආර්ථිකය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තීරණාත්මක ව බලපාන එක් සුවිශේෂ බල සම්බන්ධතාවක් වෙත අපේ අවධානය නිරායාසයෙන් යොමු

වෙයි. එය නම් ආර්ථිකයේ නීති හා විධිවිධාන තමන්ගේ වාසියට හැඩ ගස්වා ගැනීමට පොහොසතුන්ට ඇති බලය යි. ආර්ථිකය සම්බන්ධයෙන් කුටුම්බයේ වැදගත්කම ගැන කතා කරන විට අප මතක තබා යුතු වැදගත් ම කාරණය කුටුම්බය යනු සමජාතීය ඒකකයක් නො වන බවයි. ඇතැම් දැවැන්ත පාරජාතික සමාගම්, ව්‍යාපාර, කාටල් මෙන් ම ආණ්ඩු පවා පවත්වාගෙන යන්නේ සාමාන්‍ය ජනයා 'පවුල් බලය' යනුවෙන් හඳුන්වන සුවිශේෂ කුටුම්බ සම්බන්ධතාවල මෙහෙයවීමෙනි. ආර්ථිකය පිළිබඳ සාම්ප්‍රදායික රූපාදර්ශවල එන අන්දමට කුටුම්බය යනු ශ්‍රමය සහ ප්‍රාග්ධනය ආර්ථිකයට ලබා දී ඒ සඳහා ලැබෙන ප්‍රතිලාභ ලෙස වේතන සහ ලාභයෙන් කොටසක් සමජාතීය සමාගම්වලින් එක හා සමාන ලෙස ලබාගන්නා අහිංසක ප්‍රපංචයක් නො වේ. 2011 සැප්තැම්බර් මස ඇරඹුණු *Occupy (අල්ලා ගනිව්)* ව්‍යාපාරය විසින් පුළුල් භාවිතයක් බවට පත් කළ උද්ඝෝෂණ පාඨය වූ 1% ක් වූ සුපිරි පොහොසතුන් විසින් ඉතිරි 99% යේ ආර්ථිකය ග්‍රහණයට ගැනීම සලකන විට ආර්ථිකයේ බලය පරිහරණය වන ආකාරය කිසිසේත් ම සාධාරණ නො වන බව පෙනී යයි. මෑත දශක කිහිපය තුළ බොහෝ රටවල කුටුම්බ අතර මෙන් ම සමාගම් අතර ද විෂමතා පරතරය එන්න එන්න ම වැඩි වී තිබේ. බිලියනපතියන් සහ මහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල අතර අත්‍යන්තයෙන් සංකේන්ද්‍රණය වෙමින් පවතින සුවිශාල ආදායම් සහ වත්කම් ප්‍රමාණය ආර්ථිකය වැඩ කරන්නේ කා වෙනුවෙන් ද යන්න තීරණය කරන බල සාධකය බවට පත් ව තිබේ.

බොහෝ විට දේශපාලනයේ දී අද වැඩ කරන්නේ එසේ සංකේන්ද්‍රණය වූ ධනයෙන් ජනිත වන බලය යි. දේශපාලනය යනු පොදු අවකාශයේ විවෘතව පැවතිය යුතු දෙයක් වන නමුත් අද එය රහසිගත අතට අත දීම්වලින්, දොර වසා ගෙන කරන සාකච්ඡාවලින් සහ අත යට ගනුදෙනුවලින් යුත් පුද්ගලික කටයුත්තක් බවට පත් ව

තිබේ. දේශපාලන අපේක්ෂකයන්ට අත දිග හැර වියදම් කරන ව්‍යාපාරිකයෝ සහ කෝපරේට් සමාගම් තමන් කරන්නේ තමන්ට පෞද්ගලික ව වාසි ලැබෙන ආකාරයට ප්‍රතිපත්ති සකස් කරවා ගැනීමට කරන ආයෝජනයක් බව හොඳින් දනිති. රේවර්ත් *Doughnut Economy* කෘතියේ උපුටා දක්වන තොරතුරුවලින් තහවුරු වන පරිදි 1976 සිට දැවැන්ත සමාගම් එක්සත් ජනපදයේ මැතිවරණ සඳහා යෙදවූ මුලු මුදල 20 ගුණයකින් වැඩි වී තිබේ. දේශගුණ විපර්යාසය පිළිබඳ ප්‍රතිපත්තිවල දී කාබනික ඉන්ධන ව්‍යාපාරයට අවාසියක් සිදුවීම හැකි තරම් දුරට වළක්වා ගැනීම පිණිස ඉන්ධන සමාගම් විසින් පමණක් 2005 සිට ඇමෙරිකානු මැතිවරණ සඳහා ඩොලර් බිලියන 1.7ක් වියදම් කර තිබේ. ලංකාවේ මැතිවරණ සම්බන්ධයෙන් මුදල් යෙදවීම නියාමනය කරන ක්‍රමයක් නැති බැවින් කවුරුන් කුමන රහස් ගිවිසුමක් යටතේ දේශපාලන පක්ෂවලට ධනය සපයන්නේ දැ'යි යන්න දැන ගැනීමට ක්‍රමයක් නැත. ආර්ථිකය සැලසුම් කළ යුත්තේ අතළොස්සක් අතර ධන බලය හා ඒ නිසා දේශපාලන බලය ද ඒකරාශි වන අන්දමට නො වේ; ධනය හැකි තරම් ව්‍යාප්ත වන ආකාරයට ය. අප සමාජ විෂමතා අවම කරන සමානාත්මතාව අගය කරන නිර්මාණශීලී සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩ නැගිය යුත්තේ ඒ අරමුණෙනි.

# - 11 -

## වෙළඳපොළ සමාජය

ගත වූ දශක ගණනාවක් තිස්සේ මිනිසුන්ගේ 'නිදහස' පිළිබඳ මූලික ආකෘතිය වන්නේ නිදහස් වෙළඳපොළයි. - රාජ්‍ය නියාමනයකින් තොර ව භාණ්ඩ, සේවා, මූල්‍ය සම්පත් සහ ශ්‍රමය අලෙවි කිරීමේ හැකියාව නිදහස බවත්, 'නිදහස' ක්‍රියාත්මක විය යුත්තේ ද නිර්බාධක වෙළඳපොළක් කටයුතු කරන ආකාරයෙන් බවත් අපට පවසන ලදී. ව්‍යාපාර හිමියාගේ නිදහස, මාධ්‍ය අයිතිකරුගේ නිදහස, ඔබේ ශ්‍රමය විකිණීමට ඔබට ඇති නිදහස, යහපත් ජීවිතයකට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය මිල දී ගැනීමට ඇති නිදහස ආදී වසයෙන් නිදහස් වෙළඳපොළ විසින් පිරිනමනු ලබන විවිධ අවස්ථා මඟින් නිදහස භුක්ති විඳීමට අපට ඉඩ සලසන බව පැවසිනි. ඒ අනුව පාරිභෝගිකයන් ලෙස අදහස් ප්‍රකාශ කිරීමට අපට ඉඩ සලසන්නේ ද ඒ නිදහසම ය. පසුගිය දශක ගණනාව තිස්සේ අපේ දේශපාලනය හා ආර්ථිකය තුළ නිදහස පිළිබඳ මූලික හැඳින්වීමට බොහෝ විට පදනම වුණේ මේ පටු දැක්ම යි.

එහෙත් නිදහස් වෙළඳපොළේ මහිමය උත්කර්ෂණයට නැංවූ ඒ දැක්ම දැන් කලක සිට ම කඩා වැටෙන්නට පටන් ගෙන තිබේ. 2008-2010 ආර්ථික අර්බුදයත් සමඟ නියාමනයෙන් මිදුණු නිර්බාධක වෙළඳපොළ දැක්ම මත කටයුතු කළ ඇමෙරිකානු බැංකු සහ මූල්‍ය ආයතන ගණනාවක් කඩා වැටෙන්නට පටන් ගත් විට ඇමෙරිකානු සෙනෙට් සභාවේ ආණ්ඩු සංනිරීක්ෂණය සහ ප්‍රතිසංස්කරණ කමිටුව

හෙවත් "*House Committee on Government Oversight and Reform*" ඇති වී තිබෙන තත්වය පිළිබඳ විමර්ශනයක් කිරීමට තීරණය කළේ ය. ඒ අනුව 2008 ඔක්තෝබර් 04 වැනිදා එවකට අසූ දෙහැවිරිදි ව සිටි ඇලන් ග්‍රීන්ස්පෑන් එම කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවන ලදී. ඇලන් ග්‍රීන්ස්පෑන් නො කඩවා අවුරුදු 19ක් ඇමෙරිකානු ෆෙඩරල් රිසව් මධ්‍යම බැංකුවේ සභාපති වසයෙන් කටයුතු කර තිබුණි. 1987 දී ජනාධිපති රොනල්ඩ් රේගන් විසින් මුල් වරට පත් කරනු ලැබූ ඔහු රේගන්ගේ නවලිබරල්වාදී නිදහස් වෙළඳපොළ චින්තනයේ මුල් පෙළේ කස කරුවෙක් විය. ග්‍රීන්ස්පෑන් සෙනේට් සභා කමිටුව ඉදිරියේ සිය ප්‍රකාශය කියවී ය. එම ප්‍රකාශයෙන් ආර්ථික අර්බුදය මෝරමින් තිබූ ගත වූ වසර තුළ මූල්‍ය වෙළඳපොළ මේ සා වියරු ලෙස හැසිරීමට හේතු දැක්වීමට උත්සාහ කර තිබුණි. එහෙත් ලෝකය වැඩ කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව තමාට තිබුණේ වැරදි වැටහීමක් බව ග්‍රීන්ස්පෑන් පිළිගත්තේ ය. සෙනෙට් කමිටුවේ සභාපති ධුරය දැරූ ඩිමොක්‍රටික් පාක්ෂික සභිකයෙකු වූ හෙන්රි වැක්ස්මන් ප්‍රකාශය අවසානයේ ග්‍රීන්ස්පෑන්ගෙන් මෙසේ ඇසී ය. "වෙනත් විදියකින් කියනවා නම් ඔබේ ලෝක දර්ශනය, ඔබේ දෘෂ්ටිවාදය නිවැරදි නො වන බව, එය වැඩ නො කරන බව ඔබට තේරුණා?" ග්‍රීන්ස්පෑන්ගේ පිළිතුර පටන් ගත්තේ ම "හරියට ම හරි" *(precisely!)* යනුවෙනි. අනතුරු ව ඔහු මෙසේ ද කී ය "ඒක තමයි මට හරි තද කම්පනයක් දැනුණා. මොක ද ඒක ඉතාමත් හොඳින් වැඩ කරන බවට සාක්ෂි මම අවුරුදු හතළිහක් තිස්සේ දැකල තිබුණා".[121]

එහෙත් ඒ දක්වා ග්‍රීන්ස්පෑන් විසින් උත්කර්ෂණයට නංවනු ලැබූ නවලිබරල්වාදී නිර්බාධක වෙළඳපොළ සංකල්පය ගර්හාවට ලක් වීම ඇරඹුණේ1990 ගණන්වල අවසානයේ සිට බව ක්වීන්ස්ලන්ඩ් සරසවියේ ආර්ථික විද්‍යාඥ ජෝන් ක්විගින් පෙන්වා දෙයි[122]. මල ගිය

121 https://www.theguardian.com/business/2008/oct/24/economics-creditcrunch-federal-reserve-greenspan - Retrieved on 21 July 2021

122 Quiggin, J. (2018) *"Neoliberalism: Rise, decline and future prospects"* Damien Cahill et al (eds). The SAGE Handbook of Neoliberalism. London: Sage Publication Ltd, pp. 655-658 (KE)

නවලිබරල්වාදය තවමත් අප අතර හොල්මන් කරන ආකාරය පිළිබඳ ඔහු 2010දී "*Zombie Economics( How Dead Ideas Still Walk Among Us*" නමින් කෘතියක් පළ කළේ ය. ක්විගින්ට අනුව වඩාත් ම කැපී පෙනෙන නිර්බාධක වෙළඳපොළ විපාකය එල දුන්නේ 1997 ආසියානු මූල්‍ය අර්බුදය සහ 2000 දී අන්තර්ජාල සමාගම් කොටස්වල අනුහස ගැන පාරම් බෑ "ඩොට්කොම්" බුබුල පුපුරා ගිය විට දී ය. එම අර්බුද දෙක ම නිර්බාධක මුල්‍ය වෙළඳපොළ මහිමය පිළිබඳ නවලිබරල්වාදී පුරසාරම් අනාථ කළේ ය. ආසියානු මූල්‍ය අර්බුදය උද්ගත වීමට පෙර මූල්‍ය වෙළඳපොළ ලිහිල්කරණය කිරීමේ ආනිශංස මහ ඉහළින් වර්ණනා කළ වාර්තා ගණනාවක් දේශීය හා ගෝලීය මූල්‍ය ආයතන විසින් නිකුත් කර තිබුණි. ඒ අතරින් වඩාත් උද්‍යෝගිමත් වාර්තා නිකුත් කර තිබුණේ ලෝක බැංකුවෙනි. එහෙත් මුල්‍ය අර්බුදය හොඳින් කළමනාකරණය කර ගැනීමට හැකි වුණේ සම්මත නවලිබරල්වාදී මූලධර්මවලට පටහැණි ව ආණ්ඩුව මැදිහත් වී ප්‍රාග්ධන සංසරණය පාලනය කිරීම ක්‍රියාවට නැංවූ මලයාසියාව වැනි රටවල්වලට ය. ආසියානු මූල්‍ය අර්බුදය සම්බන්ධයෙන් ගෝලීය මූල්‍ය ආයතන දැක්වූ අසමත් ප්‍රතිචාරය එවකට ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික විශේෂඥයා ලෙස කටයුතු කරමින් සිට ඉවත් වූ ජෝසප් ස්ටිග්ලිස්ගේ තද දෝෂදර්ශනයට ලක් විය. නිර්නියාමනය කළ මූල්‍ය වෙළඳපොළක වාසි ගැන එතෙක් ගොඩනගා තිබූ විශ්වාසය ස්ටිග්ලිස්ගේ එම විවේචනයෙන් අඩපණ කර දැමිණි.

ඩොට්කොම් ආයෝජන බුබුල පුපුරා යෑම කැපී පෙනුණේ එය කෝඩුකාර මූල්‍ය ධනවාදය පැවති පරිධියේ පිහිටි රටක සිදු වූවාට වඩා ගෝලීය ධනවාදයේ මහා මධ්‍යස්ථානය වූ ඇමෙරිකා එක්සත් ජනපදයේ දී ම සිදුවූ බැවිනි. අන්තර්ජාල සෞභාග්‍ය පිළිබඳ 1990 ගණන්වල පතළ වූ සිහිනය අවසන් කරමින් ද කාර්යක්ෂම මූල්‍ය වෙළඳපොළ පිළිබඳ නව ලිබරල් මතවාදය කඩා ඉහිරවමින් ද ඩොට්කොම් ආයෝජන බුබුලෙන් ඔද වැටී තිබූ කොටස් වෙළඳපොළ හිටි හැටියේ කඩා වැටුණි. ඩොට්කොම් බුබුල පුපුරා යෑම කාර්යක්ෂම

වෙළඳපොළ පිළිබඳ නවලිබරල් උපන්‍යාසය බහුබූතයක් බවට පත් කළ බව ක්විගින් පවසයි. අර්බුදයත් සමඟ බංකොලොත් බව ප්‍රකාශ කරන තෙක් ම සුනඛ ආහාර අලෙවි කිරීම වැනි ඇතැම් අභූත රූපී අන්තර්ජාල ව්‍යාපාරවලට ඩොලර් බිලියන ගණනක කොටස් වෙළඳපොළ වටිනාකමක් ආදේශ කර තිබුණි. කාර්යක්ෂම වෙළඳපොළ පිළිබඳ නවලිබරල්වාදී උපන්‍යාසය එසේ ප්‍රතික්ෂේප වී යෑමත් සමඟ ඩොට්කොම් සමාගම් ව්‍යාප්තියෙන් පොරොන්දු වූ සෞභාග්‍ය ලබා දීමට නවලිබරල්වාදය අසමත් විය.

වැඩ කරන ජනතාව ඇතුළු හැම කෙනෙකුට ම නිර්බාධිත මූල්‍ය වෙළඳපොළ නිසා වාසි සැලසේ යන අදහස 1990 ගණන්වල පැවති ආර්ථික උත්පාත සමයේ විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ පතළ ව පැවති මතයක් විය. ඒ අනුව කොටස් හිමිකම පුළුල් වීම නිසා පෙරට වඩා පෘථුල ව ප්‍රාග්ධන ප්‍රතිලාභ බෙදී යන බවටත් ඒ නිසා සරු වන ආර්ථිකයේ ඵල ප්‍රයෝජන වැඩ කරන ජනයාට ලැබීම නියත බවටත් අනාවැකි පළ වුණි. එහෙත් වසර 2000 කොටස් වෙළඳපොළ කඩා වැටීමත් සමඟ ඒ සියලු බලාපොරොත්තු සුන් වී ගියේ ය.

ඉන් ටික කලකට පසු එක්සත් ජනපදයේ ආර්ථිකය තරමක් සුවය ලැබූ නමුත් ඒ වන විට නවලිබරල් නිර්බාධක වෙළඳපොළ මූලධර්මයේ අසාර්ථකත්වය බොහෝ දෙනෙකුට පැහැදිලි වෙමින් තිබුණි. ඒ අතර මේ කාලය තුළ එක්සත් ජනපදයේ කුටුම්බ ආදායමේ සාමාන්‍ය අගය කැපී පෙනෙන ලෙස අඩු ව ගියේ ය. යුරෝපයේ හා ජපානයේ ද ආර්ථික වර්ධනය ඇනහිටියේ ය.

ඒහි ප්‍රතිඵලය වූයේ ජන සමාජයේ ආදායම් විෂමතා කැපී පෙනෙන ලෙස වැඩි වීම යි. ඒ නිසා සිදු වූයේ අඩු ආදායම්ලාභීන්ට කෙසේ වෙතත් දේශපාලන පංතිය ඇතුළු ඉහළ ආදායම්ලාභීන්ගේ ජීවන තත්වය පමණක් නො කඩවා දියුණු වීම බව තෝමස් පිකෙටි

සහ සාස් පෙන්වා දෙයි.[123] 2008 ගෝලීය ආර්ථික අර්බුදයත් සමඟ නවලිබරල්වාදී නිර්බාධක වෙළඳපොළ සංකල්පයේ අසාර්ථකත්වය තවදුරටත් ප්‍රතික්ෂේප කළ නො හැකි ලෙස තහවුරු විය. ගෝලීය ආර්ථික අර්බුදය මෙන් ම එය විසඳීම සඳහා සැකසූ ප්‍රභූ ප්‍රතිපත්ති ද නවලිබරල්වාදය පිළිබඳ විශ්වාසයට මරු පහරක් විය. රාජ්‍යයේ මැදිහත් වීම ප්‍රතික්ෂේප කිරීම පුන පුනා දේශනා කළ නවලිබරල් දර්ශනයට පටහැණි ව දැවැන්ත රාජ්‍ය අරමුදලක් යොදා බැංකුකරුවන් සහ මූල්‍ය ක්‍රමය ගලවා ගැනීමට ප්‍රභූ පන්තිය කටයුතු කළේ ය. ඒ අතර සාමාන්‍ය ජනතාවට අර්බුදයේ මිල දරා ගැනීමට සිදු විය.

2008-2010 ආර්ථික අර්බුදයේ බලපෑම යුරෝ කලාපය තුළ තවත් බරපතළ විය. අර්බුදයට මුහුණ දීම සඳහා යුරෝපීය මහ බැංකුව විසින් පිළියෙළ කරන ලද සැලැස්මට අනුව දැඩි අරපිරිමැස්ම, අයවැය හිඟය අවම කිරීම සහ නො තිබෙන උද්ධමනයක් පාලනය කිරීම හැර වෙනත් සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සාමාජික රටවලට ඉඩ නො ලැබුණි. එහි ප්‍රතිඵලය වූයේ ඉන් පසු දශක ගණනාවක් තිස්සේ සංවර්ධිත ලෝකයට ආර්ථික අවපාතයකට මුහුණ දීමට සිදුවීම බව ක්විගින් පෙන්වා දෙයි. කිසියම් පමණකට ආර්ථික අවපාතයෙන් ගොඩ ආ එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යයේ පවා ජීවන මට්ටම ඉන් පෙර පැවති ආර්ථික වර්ධන යුගයේ තත්වයට නැවත ළඟා නොවූ අතර ආදායම් විෂමතාව පුළුල් වීම අන් කවර කලකටත් වඩා වැඩි වෙන බව පෙනුණි.

නිදහස් වෙළඳපොළ නිසා සමෘද්ධිමත් වන ආර්ථිකයේ ඵල සමාජයේ පහළ ස්තරවලට කාන්දු වන බවට පළ කළ අනාවැකි හරි ගිය බවක් දත්ත අනුව නො පෙන්වන බව ජෝන් ක්විගින් පෙන්වා දෙයි.[124] එයට සාක්ෂි ලෙස ඔහු වෙළඳපොළ නිදහස්කරණය ඵලදායක

123 Piketty, T. (2014) Capital in the Twenty-First Century. Cambridge, MA: Harvard University Press.

124 Piketty, Thomas, and Emanuel Saez (2003), “Income Inequality in the United States, 1913–1998,” Quarterly Journal of Economics, 118(1), 1–39.

වී යැයි සැලකෙන සමයේ එක්සත් ජනපදයේ සමාජ විෂමතා වැඩි වීම පිළිබඳ වැදගත් දත්ත උපුටා දක්වයි. උදාහරණයක් ලෙස එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2008 ආර්ථික අර්බුදය උද්ගත වූ වසර සම්බන්ධ නිකුත් කළ දත්තවලට අනුව ඒ වන විට ඇමෙරිකානුවන් මිලියන 49.1 ක් "ආහාර සුරක්ෂිතභාවයක් නැති" කුටුම්බවල සාමාජිකයන් ලෙස වර්ගීකරණය කර තිබුණි. ඊට හේතුව වසයෙන් දක්වා තිබුණේ ආහාර ඇතුළු මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ඔවුන් සතු නො වීම යි. ඒ අතර මිලියන 17.3 ක් වර්ගීකරණය කොට තිබුණේ ආහාර සුරක්ෂිත භාවය අතින් ඉතා දුර්වල කුටුම්බවලට අයත් සාමාජිකයන් ලෙස යි. ඒ අනුව වසර 2000 සිට 2008 වන විට එනම් නිදහස් වෙළඳපොළ මහිමය පැවැතියේ යැ'යි සැලකූ සමය තුළ ආහාර සුරක්ෂිතභාවයකින් තොර ජනගහනය දෙගුණයකින් වැඩි වී තිබුණි.

ඒ සමය තුළ ම සෞඛ්‍ය රක්ෂණයට දායකවීමට තරම් ආර්ථික ශක්තියක් නැති ඇමෙරිකානුවන්ගේ සංඛ්‍යාව මිලියන 46 දක්වා ඉහළ ගියේ ය. ප්‍රතිශතයක් ලෙස එය මුලු ජනගහනයෙන් 15%කි. රක්ෂිත ජනතාව අතරින් වැඩි කොටසක් ද රජය මගින් හඳුන්වා දුන් සහනදායී සෞඛ්‍ය හා ඖෂධ වැඩසටහන්වල උපකාරය පැතූහ.

ක්විගින් පෙන්නා දෙන පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයේ 'නිවාස රහිත වීම' *(Homelessness)* යනු මුළුමනින් ම පාහේ වෙළඳපොළ නිදහස්කරණ සමය තුළ උද්ගත වූ සමාජ ප්‍රශ්නයකි. ඉන් පෙර පූර්ණ රැකියා නියුක්තිය තිබූ අවදියේ පැවති 'නිවාස රහිත වීම' බොහෝ කොට මහලු වියට පත් මානසික ආබාධ හෝ මත් ද්‍රව්‍ය භාවිතය වැනි පුරුදුවලට ගොදුරු වූ පිරිමි අතළොස්සකට සීමා වී තිබුණි. එහෙත් 2007 වන විට මිලියන 1.7ක් නිවාස රහිතයන් බවට පත්වී තිබුණ අතර ඉන් 40%ක් දරුවන් සහිත පවුල්වල සාමාජිකයෝ වූහ.[125]

125 Quiggin, John (2010). *Zombie Economics: How Dead Ideas Still Walk Among Us.* Princeton: Princeton University Press, p. 155

උසස් අධ්‍යාපනය තවත් වැදගත් උදාහරණයකි. උසස් අධ්‍යාපනය සඳහා ගෙවිය යුතු මිල සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ලැබිය හැකි හොඳ ම රැකියාවලට මාර්ගය ලෙස සැලකෙන වංසක්කාර අධ්‍යාපන ආයතනවල ගාස්තු විශාල වසයෙන් ඉහළ ගියේ ය. මින් වැඩියෙන් ම අවාසි වුණේ මධ්‍යම පන්තික පවුල්වලින් පැමිණි තරුණ තරුණියන්ටයි. ඉතාමත් දීප්තිමත් දුප්පත් ශිෂ්‍යයන් අතළොස්සකට මුදල් ආධාර ලැබෙන ක්‍රම ක්‍රියාත්මක වූ නමුදු මැද පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වැඩි කළ ගාස්තු සහ අඩු කළ ආධාර යන දෙකට ම එක විට මුහුණ දීමට සිදු විය.

එහි ප්‍රතිඵලයක් ලෙස 1985 සිට 2000 දක්වා කාල පරිච්ඡේදය තුළ වංසක්කාර අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වූ ඉහළ ආදායම් සහිත පවුල්වල ශිෂ්‍ය ප්‍රමාණය 46% සිට 55% දක්වා වැඩි විය. මධ්‍යම ආදායම් සහිත පවුල්වල ශිෂ්‍ය ප්‍රමාණය 41% සිට 33% දක්වා අඩු විය.[126]

අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන දෙඅංශයේ ම උදාහරණවලින් පෙන්වා දෙන පරිදි වෙළඳපොළ නිදහස්කරණය යටතේ සේවා වැඩි වීමේ වාසිය එම සේවා යුක්ති යුක්ත ව ලබා ගැනීමට ඇති හැකියාව අඩු කිරීමෙන් නැති කෙරිණි.

ආර්ථික වර්ධනය පහළ ස්තරවලට කාන්දු වීම පිළිබඳ නවලිබරල් උපන්‍යාසය ප්‍රතික්ෂේප කිරීමට වෙළඳපොළ නිදහස්කරණය උත්කර්ෂණයට නැංවූ අවධියේ ඇමෙරිකාව ලැබූ අත්දැකීම් ඕනෑවටත් වඩා ප්‍රමාණවත් ය. ඒ යුගය තුළ යමක් කමක් ඇති අය ධනවත් වූ අතර ධනවත් පුද්ගලයෝ සුපිරි ධනවත්හු වූහ. සැලකිය යුතු තාක්ෂණික දියුණුවක් ඒ යුගයේ දී ඇති වුව ද මැදි ආදායම් මට්ටම්වල සිටි අයට නො වැටී එම මට්ටමේ ම රැඳී සිටීමට අරගල කිරීමට සිදුවුණි. බොහෝ පැතිවලින් බැලූ විට ඊටත් පහළ මට්ටමේ සිටි අයට සිදු වුණේ කබලෙන් ලිපට වැටීම වැනි දෙයකි. අවශ්‍ය විශ්වාසදායක දත්ත සොයා ගත හැකි නම් වෙළඳපොළ නිදහස්කරණය එක ම

126 Ibid, p. 157

පිහිට ලෙස වැළඳ ගත් සංවර්ධනය වෙන රටවල විෂමතා වැඩි වීම ද මීට දෙවැනි නො වන බව පෙන්වා දිය හැකි ය.

එහෙත් මෙවැනි ප්‍රබල සාක්ෂි නො තකා හැරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට දරන වෑයම් බහුල බව ක්විගින් පවසයි. ඒ අතරින් වඩාත් ම ජනප්‍රිය සහ මෝඩ ම නිරීක්ෂණය වන්නේ 'එකල මෙන් නො ව වෙළඳපොළ නිදහස්කරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දුප්පතුන්ට පවා රූපවාහිනියක්, ශීතකරණයක් මිල දී ගැනීමට හැකි වීම කොතරම් ලොකු දෙයක් ද' වැනි ප්‍රලාප ය.

උදාහරණයක් ලෙස මයිකල් කොක්ස් සහ රිචර්ඩ් ආල්ම් ලියූ *Myths of Rich and Poor( Why We're Better Off than We Think* නමැති කෘතියේ මෙසේ සඳහන් වෙයි. "1990 දුප්පත් කුටුම්බයක් 1970 පැවති කුටුම්බයකට වඩා රෙදි සෝදන යන්ත්‍රයක්, පිඟන් සෝදන යන්ත්‍රයක්, ශීතකරණයක්, වර්ණ රූපවාහිනියක්, පරිගණකයක් සහ දුරකථනයක් හිමි නිවසක් බවට පත්වීමට ඇති ශක්‍යතාව වැඩිය."

එහෙත් මෙකී උධෘතයේ සඳහන් සියලු මෙවලම් සම්බන්ධයෙන් පොදුවේ කිව හැකි වන්නේ සාමාන්‍ය භාණ්ඩ මිලට සාපේක්ෂ ව ඒවායේ මිල ගණන් බෙහෙවින් අඩු වීම බව ක්විගන් පෙන්වා දෙයි. ඒ නිසා ආදායම 1970 පැවති ආදායම ම වුවත් මෙවැනි භාණ්ඩ පරිභෝජනයේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබෙනු ඇතැයි ද ක්විගන් පවසයි. ප්‍රශ්නය වන්නේ මෙවැනි මෙවලම් ලාභයට ගත හැකි වූවත් සෞඛ්‍ය අධ්‍යාපනය වැනි ඊට වඩා බොහෝ වැදගත් දේවල් එතරම් ලාභයට ගත නො හැකි වීමයි. මිල අඩු වීමට අතිරේක ව ණයවරපත්, කොටස් වසයෙන් ගෙවීමේ ක්‍රම ආදී නොයෙක් වාණිජ උප්පරවැට්ටි මඟින් වැඩි ම පාරිභෝගික සංඛ්‍යාවකට ලාභ බඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් අලෙවි කිරීම ලාභදායක ව්‍යාපාරයක් බව ව්‍යාපාරිකයෝ දනිති.

ආර්ථික සහ දේශපාලන න්‍යායක් ලෙස නවලිබරල්වාදය ගරා වැටෙමින් ගියත් තවත් දශකයක් පමණ කාලයක් නිර්නියාමනය

කළ නවලිබරල්වාදී වෙළඳපොළ මහිමය පිළිබඳ විශ්වාසය ප්‍රධාන දේශපාලන පක්ෂ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ යුරෝපීය කොමිසම වැනි සංවිධාන තුළ හොල්මන් කළේ ය. ක්විගින් පවසන අන්දමට ඒ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් ආර්ථික විද්‍යා පණ්ඩිතයින් කිසිවක් ඉගෙන ගත් බවක් නො පෙනුණි.

2008 ඇරඹි ආර්ථික අර්බුදයත් සමඟ සංවර්ධිත රටවල් 1970 සිට දක්නට නො ලැබුණු පරිමාණයේ සමාජීය හා ආර්ථික පිරිහීමක් අත්දුටුවේ ය. බොහෝමයක් යුරෝපීය රටවල් දිගින් දිගටම නිදන් ගත අවධමනයකට ලක් විය. අර්බුදයෙන් හිස ඔසවන බව පෙනී ගිය රටවල පවා වර්ධන වේගය එක තැන පල් වෙන බව පෙනෙන්නට විය. දේශපාලන පිපිරීම ඊටත් වඩා බරපතළ විය. ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමෙරිකානු රිපබ්ලිකන් පක්ෂය ගෙලෙන් අල්ලා අවනත කොට ජනාධිපති විය. බ්‍රිතාන්‍යයෝ යුරෝපියානු සංගමයෙන් ඉවත් වූහ. වැඩි වෙන සමාජ විෂමතාව නිසා දක්ෂිණාංශික සහ අන්තවාදී පක්ෂ යුරෝපය සිසාරා හිස ඔසවන බව පෙනෙන්නට විය. නිදහස් වෙළඳපොළ දැක්ම තුළ වැඩි වූ සමාජ විෂමතාව හා ඉච්ඡා භංගත්වය නිසා වර්ගවාදී, ආගම්වාදී දක්ෂිණාංශික අනන්‍යතා දේශපාලනය ඉස්මතු වීම ගත වූ දශකය තුළ අනෙකුත් බොහෝ රටවල ද කැපී පෙනුණු ලක්ෂණයක් විය.

දේශපාලන අර්බුද, අනාරක්ෂාව, වසංගත වැනි අවදානම් අවස්ථාවල දී මිනිසුන්ගේ අභිලාෂ නිදහස් වෙළඳපොළ චින්තනය අබිබවා සජීවී වන ආකාරය ඔවුන්ගේ විසම්මුතික දේශපාලන මැදිහත් වීම්වලින් පෙනී යයි. අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම රජයේ වගකීමක් බව පවසන තරුණ තරුණියන්ගේ සංඛ්‍යාව එවැනි අවස්ථාවල දී වැඩි වෙමින් පවතී. නිදහස් වෙළඳපොළේ ඇතැම් අංග අබිබවා රජය කටයුතු කළ යුතු යැයි ඔවුහු අදහස් කරති. වෙළඳපොළ මත ම රඳා පැවැත්ම මිනිසුන් විසින් එසේ ප්‍රතික්ෂේප කරන විට අපට පෙනී යන්නේ නිදහස සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇත්තේ වෙනත් අභිලාෂයක් බව යි. 'සැමට සෞඛ්‍ය සේවය ලැබීම මානව

අයිතිවාසිකමක්' යැයි කියන විට මිනිසුන් ඉන් අදහස් කරන්නේ නිදහස් වෙළඳපොළ ග්‍රහණයෙන් අත් මිදීම යි. එහෙත් වෙළඳපොළක් නැති බවක් ඉන් අදහස් නො වේ. වෛද්‍යවරුන්ට සහ හෙදියන්ට ඔවුන්ගේ සේවයට සරිලන වැටුපක් ගෙවිය යුතු ය. වෛද්‍ය උපකරණ, බෙහෙත්, එන්නත් ආදිය මිලට ගත යුතු දේවල් ය. එහෙත් ඒ අතර පුද්ගලයන්ට ලැබෙන සෞඛ්‍ය පහසුකම් වෙළඳපොළ මඟින් පමණක් තීරණය කිරීම අයුතු ය. සෞඛ්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ අසනීප වූ අයට මිස අත මිට මුදල් ඇති ව අසනීප වූ අයට පමණක් නො වේ. එනිසා වෙළඳපොළ අබිබවා යන සමානාත්මතාව සලකන පොදු සෞඛ්‍ය සේවයක් පැවතිය යුතු ය.

එහෙත් අද නිදහස මෙන් ම සමානාත්මතාව යන්නට ද වෙළඳපොළේ ඇතැයි කියන නිදහස හැර වෙනත් තේරුමක් ආරෝපණය කරන බවක් නො පෙනේ. කෙසේ වෙතත් වෙළඳපොළ යන්න නිසග ලෙස ම අසමානතාව රජයන තැනකි. එය දිනන්නන් සහ පරදින්නන් ගැවසෙන තැන යි. එනිසා නිදහස් වෙළඳපොළ මත අලෙවිකරණයට යට වූ ප්‍රජාතන්ත්‍රවාදයක ප්‍රතිඵලය වන්නේ ද දිනන්නන් සහ පරදින්නන් බිහි වීම යි.

නිර්බාධක ව තිබෙන තාක් කල් තරඟකාරිත්වය මත නිදහස් වෙළඳපොළ මෙහෙය වෙන නිසා එමඟින් නවෝත්පාදනය දිරිගැන්වීම සහ පාරිභෝගිකයන්ට අත් වන අසාමාන්‍ය වාසි ගැන සහතික කිරීම් අපට සිය දහස් වරක් ඇසී තිබේ.. එහෙත් වරක් ලෝකයට ම ආදර්ශයක් යැයි සැලකූ ඇමෙරිකානු නිදහස් වෙළඳපොළ එම තරඟකාරිත්වය අත්හැර දමමින් සිටින බව ලොව වයස අවුරුදු 45ට අඩු විශිෂ්ටතම ආර්ථික විද්‍යාඥයන් 25 දෙනා අතරින් කෙනෙකු ලෙස වරක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නම් කළ තෝමස් පිලිපොන් පෙන්වා දෙයි. එය ඇමෙරිකාවට පමණක් සීමා වූ ගති ලක්ෂණයක් ද නො වේ. නිව්යෝක් සරසවියේ මූල්‍ය ආර්ථික විෂය පිළිබඳ ව මහාචාර්යවරයෙකු ලෙස සේවය කරන පිලිපොන් 2019 දී පළ කළ *The Great Reversal* නම් කෘතියෙන් විස්තර කරන පරිදි

ආයෝජනය සහ නවෝත්පාදනය මත ලාභ ඉපදවීම වෙනුවට බලසම්පන්න ඇමෙරිකානු සමාගම් දැන් මුල් තැන දී ඇත්තේ වාසි සඳහා දේශපාලන බලපෑම යෙදීම යි. දශක ගණනාවක් තිස්සේ නියාමනය පිළිකුල් කළ ඇමෙරිකානු වෙළඳපොළට දැන් මුහුණ දීමට සිදු ව ඇති අගතීන් කිහිපයක් ඔහු සිය කෘතියෙන් විස්තර කරයි. ඉන් පළමුවැන්න ඇමෙරිකානු ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල තරඟකාරිත්වය හීන වෙමින් යෑම යි. එයට හේතුව පිලිපෝන් මෙසේ විස්තර කරයිඃ "වෙළඳපොළ තරඟකාරිත්වයක් නොමැති වීම වැඩි වසයෙන් විස්තර කළ හැක්කේ ලොබි කිරීම සහ මැතිවරණ අරමුදල්වලට දායකවීම මඟින් තම සමාගම්වලට වාසිදායක වන ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කරවා ගැනීමට කෝපරේට් ප්‍රභූන් ඇති කරන බලවත් බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස යි"[127]. ගත වූ අවුරුදු විස්ස තුළ හැම ඇමෙරිකානු කෝපරේට් සමාගමක් ම නියාමකයන්, සෙනෙට් සභිකයන්, කොන්ග්‍රස් සභිකයන් සහ ප්‍රධාන මන්ත්‍රණ සභා කමිටුවල සාමාජිකයන් නම්මවා ගැනීමට මෙන් ම ෆෙඩරල් හා ප්‍රාන්ත රාජ්‍යවල මැතිවරණවලට කරන අධික වියදමෙන් මෙය පැහැදිලි වන බව ඔහු පෙන්වා දෙයි. මේ නිසා හැම විටම ප්‍රාන්තවල මෙන් ම කාර්මික ක්ෂේත්‍රවල නිදහස් වෙළඳපොළ අවුල් වන අන්දමත්, ඒකාධිකාර විරෝධී නීතිය *(Antitrust Law)* ක්‍රියාත්මක කිරීම හිතාමතා දුර්වල කරන, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර වර්ධනය අවහිර කරන සහ දැවැන්ත සමාගම් ආරක්ෂා කිරීමට තරඟකාරිත්වය වළක්වන බලවේග ඒ සඳහා දේශපාලන අනුග්‍රහය ලබා ගන්නා ආකාරයත් ඔහුගේ විමසුමට ලක් වේ.

තෙවැනි සාධකය ලෙස තරඟකාරිත්වය මේ අන්දමින් දුර්වල කිරීමේ ප්‍රතිඵල ලෙස වැටුප්, ආයෝජන, නිෂ්පාදනය හා වර්ධනය අවම මට්ටමක තබා ගැනීමට හැකි වෙන බවත් එනිසා සමාජ අසමානතාව වැඩි වෙන අන්දමත් පිලිපොන් පෙන්වා දෙයි. සමස්ත

127 Philippon Thomas (2019), *The Great Reversal,* Cambridge: Belknap Press of Harvard University Press, p. 21 (KE)

කර්මාන්ත ක්ෂේත්‍රය තුළ තරඟකාරිත්වය පහත වැටීම නිසා සාමාන්‍ය ඇමෙරිකානුවන්ගේ ආදායම අඩු වී ඇති ආකාරයත් සාමාන්‍යයෙන් ආර්ථික වර්ධනයේ ලක්ෂණ ලෙස සලකන ආයෝජන වැඩි වීම, තාක්ෂණික දියුණුව සහ වැටුප් වැඩි වීම තරඟකාරිත්වය අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස බෙහෙවින් පසු බා ඇති අන්දමත් පිලිපොන් නිදසුන් සහිතව විස්තර කරයි. මේ අනුව ආර්ථික වසයෙන් පමණක් නො ව දේශපාලන වසයෙන් ද අපේ ජීවිත යටත් කර ගැනීම අතින් ධනවාදය කොයි තරම් සාර්ථක වී ඇත් ද සහ වෙළඳපොළ මත ම රඳා පැවැත්මට සිදුවීම නිසා වෙළඳපොළ ආම්බාන් කිරීමට අප ගන්නා සියලු වෑයම් තළා පොඩි පට්ටම් කර දැමීමට වෙළඳපොළට හැකි වීම සම්බන්ධයෙන් ද ගත වූ දශක කිහිපය වැදගත් ය.

ධනවත් සමාගම් අයිතිකරුවන් විසින් දේශපාලන ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවනු ලැබීම පිළිබඳ විධිමත් විමසුමක් කළ හොත් ලංකාවේ තත්වය පිලිපෝන් විස්තර කරන තත්වයට වෙනස් නො වන බව පැහැදිලි වනු ඇත. කෙසේ වෙතත් මැතිවරණ සඳහා පක්ෂවලට හා අපේක්ෂකයන්ට ලබාදෙන මුදල් ප්‍රමාණය හඳුනා ගැනීමෙ ක්‍රමවේදයක් අපේ මැතිවරණ නීතිවල නැත.

පිලිපොන් පෙන්වා දෙන අන්දමට දේශපාලනය සඳහා අත දිග හැර වියදම් කිරීමෙන් නිදහස් වෙළඳපොළ ග්‍රහණයට ගත් කෝපරේට් සමාගම් විසින් තරඟකාරිත්වය දුර්වල කරනු ලැබීම ආර්ථික අසමානතාවට එක් හේතුවකි.

ඒ අනුව ඓතිහාසික වසයෙන් අසමානතාව ආරම්භ වූ ආකාරය පිළිබඳ විමසා බැලීම මේ සාකච්ඡාවට වැදගත් ය. *Talking to My Daughter About Economy* හෙවත් 'ආර්ථිකය ගැන මගේ දුවට කතා කිරීම' නමින් ලියූ කෘතියේ කර්තෘ හිටපු ග්‍රීක මුදල් ඇමති යානිස් වරුෆාකිස් නූතන ආර්ථික අසමානතා ඇතිවීමේ ඓතිහාසික සම්භවය කෘෂිකාර්මික අතිරික්තයේ ඵලයක් ලෙස මෙසේ විස්තර කරයිඃ

"1788 ජනවාරියේ දී බ්‍රිතාන්‍ය නැව් හතක් ඕස්ට්‍රේලියානු වෙරළට ළඟා විය. ඉන් පැමිණි මුල් ම යටත් විජිතවාදීන් තුවක්කු, ලෝහමය ආයුධ හා ආම්පන්න, ගෘහස්ථ කළ හීලෑ සතුන් හා යුරෝපියානු ලෙඩ රෝග ඔස්ට්‍රේලියාවට ගෙන ආවේ ය. එතෙක් ඔස්ට්‍රේලියාවේ විසූ එකම මිනිස් වර්ගය වූ ඇබොරිජින්ස් යන නමින් හැඳින්වුණු ඕස්ට්‍රේලියානු ස්වදේශිකයන්ට ඒ කිසිවක් නො තිබිණි. ඒ නිසා තමන්ගේ නිජබිම් ආගන්තුකයන් විසින් ඩැහැ ගනු ලැබීමට එදිරි ව කටයුතු කිරීමේ හැකියාවක් ඔවුන්ට නො වී ය.

එය අනෙක් අතට සිදු නොවී මෙසේ සිදුවුණේ ඇයි? වෙනත් අන්දමකට කිව හොත් බ්‍රිතාන්‍යයන් ඕස්ට්‍රේලියාව අත්පත් කර ගනු වෙනුවට ඕස්ට්‍රේලියානු ඇබොරිජින්වරුන්ට ලන්ඩනය ආක්‍රමණය කොට ජය ගැනීමට නො හැකි වූයේ ඇයි.? ආවේණික ලක්ෂණ ගත් විට ඇබොරිජින්වරුන් යනු යුරෝපීයන්ට වඩා අඩුවෙන් වර්ධනය වූ මිනිස් වර්ගයක් නො වේ. ඇබොරිජින්වරුන් සහ යුරෝපීයන් අතර තිබූ මූලික වෙනස එකී ජන සමාජ දෙක විසින් වර්ධනය කර ගනු ලැබූ ද්‍රව්‍යයමය තත්වයන් *(material conditions)* සහ ඒවාට ආරෝපණය කර තිබූ වටිනාකම් අතර කැපී පෙනෙන වෙනසක් තිබීම යි."

ජීවනෝපාය ලෙස දඩයම් කිරීමෙන් සහ වනඵල එක්රැස් කිරීමෙන් ඕස්ට්‍රේලියානු ඇබොරිජින්වරුන්ට සාමාන්‍යයෙන් පහසුවෙන් ම ජීවත් විය හැකි විය. එහෙත් බ්‍රිතාන්‍යයන්ගේ ජීවිතය රඳා පැවතුණේ පසුකලෙක සිදු වූ සමාජ පරිවර්තන රාශියකට හේතු වූ කෘෂිකර්මාන්තය මතයි.

එහෙත් ලෝකයේ වැඩි කොටසක් යුරෝපය විසින් යටපත් කර ගනු ලැබීමට කෘෂිකර්මාන්තය හේතුවක් වූයේ කෙසේ ද? ඇත්ත වසයෙන් ම මිනිසුන්ට සිය පරිභෝජනයට අවශ්‍ය වූ ආහාර ප්‍රමාණයට වඩා වැඩිපුර ආහාර ප්‍රමාණයක් නිපදවා ගත හැකි වූයේ වසර 12,000 කට පෙර කෘෂිකර්මාන්තය ඇරඹූ පසුව ය. අප මෙහි දී 'අතිරික්තය' *(surplus)* යනුවෙන් හඳුන්වන්නේ මෙසේ නිපදවන ලද ආහාර ප්‍රමාණයෙන් පරිභෝජනයට අවශ්‍ය වන ආහාර ප්‍රමාණය ඉක්මවා ලබා ගන්නා වැඩිපුර අස්වැන්න ප්‍රමාණය යි. අස්වැන්නක් අස්වැන්නක් පාසා මෙසේ ලබා ගත් අතිරික්ත ආහාර ප්‍රමාණය

අහේනියක් ඇති වුව හොත් සාගතයකට මුහුණ නො දී එදිනෙදා පරිභෝජනය සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් කෘෂි ජන සමාජවලට තිබූ ශක්තිමත් රක්ෂණයක් විය. එහෙත් ඒ සමඟ ම එසේ වරින්වර වැඩි වන අතිරික්තය ගබඩා කර කළමනාකරණය කර පවත්වා ගැනීම සඳහා නව විධික්‍රම ද සොයා ගත යුතු විය.

ප්‍රථමයෙන් ම කන්නයක් පාසා නිපදවෙන අතිරික්තය කලක් ගබඩා කර තැබිය හැකි ගොඩනැගිලි අවශ්‍ය විය. එමෙන් ම ගබඩා කර ඇති අතිරික්තය ගණන් තැබීමට හා ඒ පිළිබඳ වාර්තා තැබීමට ලේඛන කලාවක් ද අවශ්‍ය විය. ඉන් පසු මිනිසුන්ට අවශේෂ බඩු භාණ්ඩ හා හුවමාරු වෙළහෙළදාම් සඳහා එකී අතිරික්තය යොදා ගත හැකි විය. අතිරික්තය ගබඩාවල තිබිය දී ම වෙළඳාම පහසු කරවීමට ගබඩා කළ ධාන්‍ය ප්‍රමාණ නියෝජනය කරමින් නිකුත් කළ ටෝකන් යොදා ගැනීම ද ඒ සමඟ ඇරඹුණි. එමෙන් ම දැනට අතිරික්තයක් නැති වුව ද ඊළඟ කන්නයේ නිසැක ව ම ලැබෙන අතිරික්තය බලාපොරොත්තු වෙමින් අර කී ටෝකන් යොදා ගෙන පාරිභෝගික ද්‍රව්‍ය වෙළහෙළදාම දිගට ම කළ හැකි විය. මේ ටෝකන් එම ගනුදෙනුවල දී මුදල් ලෙස භාවිත වීම ඇරඹීමත් සමඟ එමඟින් ණය දීම හා ණයට ගැනීම ද ආරම්භ විය.

එහෙත් මුදල් යන්නට වලංගුභාවයක් ඇත්තේ මුදල් භාවිතය සම්බන්ධයෙන් සියල්ලන්ට ම එක සමාන විශ්වාසයක් ඇත්නම් පමණි. එම නිසා මුදල්වල වටිනාකම තහවුරු කිරීමට නම් මුදල්වල ස්ථාවර භාවය පවත්වා ගැනීමට නිලධාරි තන්ත්‍රයකුත් අවශ්‍ය වූ විට බලහත්කාර බලය යොදා මුදල්වල සුජාතභාවය සහතික කිරීමට හැකි සන්නද්ධ හමුදාවකුත් අවශ්‍ය වේ. මේ අනුව වැඩි කලක් නො ගොස් අතිරික්තය නිපදවීමට ඍජු සම්බන්ධයක් නැති එහෙත් අතිරික්තය බෙදා හැරීම සම්බන්ධයෙන් සැලකිය යුතු බලයක් ඇති නිලධර තන්ත්‍රයක් ඇති වේ. තදනන්තර ව සමාජ ධුරාවලිය *(social hierarchy)* බිහි වන්නේ ද ඊට අනුකූලව යි.

ඕස්ට්‍රේලියානු ඇබොරිජින්වරුන් වැඩි කලබලයක් නැති ව එදිනෙදා වේල සොයා ගනිමින් ගීතයෙන් සංගීතයෙන් සහ මිථ්‍යා කතන්දර නිර්මාණවලින් පොහොසත් සමාජයක ජීවත් වන අතර යුරෝපීයයෝ අතිරික්තය රැස් කර ගැනීමේ උත්සුක වෙමින් මුදල් හා සංකීර්ණ කළමනාකරණ ක්‍රම සහ ධුරාවලි මත පදනම් වූ සමාජයක ජීවත් වූහ. මේ සමාජ දෙක අතර ද්‍රව්‍යයමය වසයෙන් පැවති අසමානතාව ආවේණික වෙනස්කම් නිසා සිදු වූවක් නො ව ද්‍රව්‍යයමය තත්වවලට ආරෝපණය කළ සමාජ වටිනාකම් පිළිබඳ වෙනස නිසා ඇති වූවකි.

එහෙත් යුරෝපීයන් මේ සංසිද්ධිය දුටුවේ ඒ ආකාරයෙන් නො වේ. අනෙකුත් හැම සංස්කෘතීන්ට මෙන් ම යුරෝපීයන්ට ද විශ්වාස පද්ධතියක් හෙවත් අර කී වෙනස් ද්‍රව්‍යයමය තත්ව දෛවය අනුව ලැබෙන දේවල් බව තහවුරු කරන දෘෂ්ටිවාදයක් තිබුණි. ඒ දෘෂ්ටියට අනුව යුරෝපීයන්ට අන් අයට වඩා දේවල් තිබුණා පමණක් නො ව තව තවත් දේවල් අත්පත් කර ගැනීමේ හිමිකම ද තිබුණි. ඒ නිසා යුරෝපීය යටත් විජිතවාදීන් 1788 ඔස්ට්‍රේලියාවට සම්ප්‍රාප්ත වූයේ ඔස්ට්‍රේලියාව පවතින්නේ ම තමන්ට අත්පත් කර ගැනීම සඳහායි යන සිතුවිල්ලෙනි.

එහෙත් වටිනාකම් ඇත්තේ ද්‍රව්‍යයමය සම්පත්වලට පමණක් නො වේ. උදාහරණයක් වසයෙන් හිත මිතුරන් සමඟ සතුටු සාමීචියේ යෙදෙමින්, මැණියන් විසින් විශේෂයෙන් පිසින ලද ඇඹුල්තියල් මාලුවක් සහිත රසවත් ආහාර වේලකින් සන්තර්පණය වන අවස්ථාවකට ද වටිනාකමක් තිබේ. එහෙත් එය ඇමසන් වෙතින් ඔන්ලයින් ඇණවුම් කර ගෙන්වා ගන්නා භාණ්ඩයකට ආරෝපණය කරන වටිනාකම මෙන් නො වේ.

එහෙත් හැම බඩු භාණ්ඩයක් ම පාහේ එසේ රිසි සේ හිතමිතුරන් සමඟ බෙදා ගෙන කෑම සඳහා පිළියෙළ කළ අර ඇඹුල්තියල් හට්ටිය මෙන් නො වේ. ඇඹුල්තියල් හට්ටියේ වටිනාකම ඇත්තේ භාවිත වන

ආකාරය නිසා ය. එනම් මිත්‍රශීලී තෘප්තියකට තුඩු දෙන සතුටු සාමීචිය පවත්වා ගැනීමට ඉන් ලැබෙන රස නහර පිනවා යන පිටිවහල නිසා ය. එහෙත් ඇමසන් සමාගම හරහා ඔබ ඇණවුම් කරන අයිපෑඩය හෝ ඔරලෝසුව එසේ නො වේ. ඒවායේ වටිනාකම ඇත්තේ එම භාණ්ඩවල මිල ගණන්වල ය. එය ඇතැම් විට හුවමාරු වටිනාකම *(exchange value)* ලෙස ද හඳුන්වනු ලැබේ.

ඉතිං මේ වටිනාකම් දෙවර්ගය අතරින් වඩාත් වැඩි වටිනාකම ලෙස සැලකෙන්නේ කුමක් ද? අප කැමති වුණත් නැතත් නූතන ලෝකයේ වඩාත් ම රජයන වටිනාකම හුවමාරු වටිනාකම යි. කොටින් ම වෙළඳපොළ සමාජය *(market society)* අනෙක් සියලු වටිනාකම් වර්ගවලට වඩා හුවමාරු වටිනාකම ඉහළින් තබා කටයුතු කරන සමාජයකි.

අපේ සමාජය අප වෙළඳපොළ සමාජයක් ලෙස නම් කරන්නේ අපේ ජීවිතයේ හැම කටයුත්තක් සම්බන්ධයෙන් ම හුවමාරු වටිනාකම තදින් කාන්දු වී තිබෙන බැවිනි. ඔබ වෙසෙන නිවස, එය පිහිටා ඇති බිම් කඩ පමණක් නො ව ඔබේ ප්‍රයත්න සහ කාලය ආදී හැම දෙයකට ම මිලක් සහ වෙළඳපොළ හුවමාරු ප්‍රස්තාවක් නියම කර තිබේ. වෙනස් අන්දමකින් කිව හොත් ඒ සියල්ල වෙළඳ ද්‍රව්‍ය බවට පත්කර *(commodify)* තිබේ.

එහෙත් එය හැම දා ම පැවති දෙයක් නො වේ. පැරණි සමාජවල ද වෙළඳපොළවල් පැවතුණ ද ඒවාට අද මෙන් තීරණාත්මක බලයක් නො තිබිණි. උදාහරණයක් ලෙස පූර්ව කාර්මික මධ්‍ය කාලීන යුගයේ යුරෝපයේ ඉඩම් මිල දී ගැනීමක් හා විකිණීමක් නො තිබිණි. ඉඩම් යනු රජු විසින් පවරා දෙන පරිදි රදලයන්ට ප්‍රවේණියෙන් උරුම වූ දේවල් විය. ඒවායේ වැඩ කළ ප්‍රවේණි දාසයන්ට වැටුපක් නො ලැබුණි. ඔවුන් වැඩ කළේ එම ඉඩම්වල භවභෝග ආහාර ද්‍රව්‍ය නිපදවීම සඳහා ය. එහි නිෂ්පාදනය ඉඩම් හිමි රදලයා සතු ය. එදිනෙදා යැපීම සඳහා ප්‍රවේණි දාසයන්ට අවශ්‍ය ආහාර ඇඳුම්

ආදිය සමඟ ආරක්ෂාව ද රදලයාගෙන් ලැබුණි. මෙය ද එක්තරා හුවමාරුවකි. එහෙත් එය වෙළඳපොළ මත රැඳුණ අලෙවිකරණයක් නො වී ය. ඒ සඳහා මුදල් භාවිතයක් නො වී ය. එහි තිබුණේ කාට කුමක් ලැබේ ද යන්න තීරණය වන පාරම්පරික ප්‍රවේණිදාස රාජකාරිය ඉටු කිරීම සහ රදලයන් විසින් වරප්‍රසාද ලබා ගැනීම යන අභිලාෂ දෙක පමණි.

එහෙත් 1500 ගණන්වල දී වෙළඳාම ගෝලීය මට්ටමට පැතිර යන්නට පටන් ගත් විට මෙම රදල ප්‍රවේණිදාස ක්‍රමය තවදුරටත් පවත්වා ගැනීම අසීරු විය. ලෝම වැනි කල් පවතින භාණ්ඩ දුර බැහැර සිට පැමිණ මිල දී ගන්නන්ට අලෙවි කිරීමෙන් වෙළෙන්දෝ විශාල ධනයක් එක්රැස් කර ගත්තෝ ය. ඒ අතර ප්‍රවේණිදාස ගොවීන් අතින් පරිභෝජනයට ආහාර නිපදවෙන නමුත් ලෝම වැනි අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිපදවීමක් සිදු නො වන බව රදලයන්ට වැටහෙන්ට පටන් ගත්තේ ය. ඒ අනුව ලාභ දායක ගෝලීය වෙළඳාමේ කොටස්කරුවන් වීමේ අටියෙන් ප්‍රවේණිදාසයන් ඔවුන් ගොවිතැන් කළ ඉඩම්වලින් පලවාහරිමින් රදලයෝ ඒ ඉඩම් ලෝම වැනි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සතුන් ඇති කිරීම සඳහා වැඩි වැඩියෙන් යොදා ගත්හ.

මේ අනුව එක්වර ම ඉඩම්වලට හුවමාරු වටිනාකමක් ඇති විය. ඒ නිසා තව දුරටත් තම ආහාර සපයා ගැනීමට ඉඩම් භාවිත කිරීමට ප්‍රවේණිදාස ගොවීන්ට ඉඩ නො ලැබුණු අතර තමන් සතු එක ම වස්තුව වන කාලය හා ශ්‍රමය විකිණීම හැර ජීවිතය පවත්වා ගැනීමට ඔවුන්ට වෙනත් විසඳුමක් නො වී ය. එහෙත් මේ අනුව ශ්‍රමයට ද හුවමාරු වටිනාකමක් ඇති විය.

යුරෝපයේ සිදුවූ කාර්මිකකරණයට සහ කර්මාන්තශාලා බිහි වීම නිසා මේ තත්වය තවත් තීව්‍ර විය. ඒ නිසා පාරිභෝගික වෙළඳ පොළේ විකිණෙන බඩු භාණ්ඩ මිල දී ගැනීම පිණිස බොහෝ මිනිසුන්ට සිය ශ්‍රමය ශ්‍රම වෙළඳපොළේ විකිණීමට සිදු විය. මෙසේ

කලක් ගත වන විට මෙකී වෙළඳපොළ හුවමාරු වටිනාකම් ක්‍රමය කේන්ද්‍ර කර ගෙන සමාජය ප්‍රතිසංවිධානය වීම පටන් ගත්තේ ය.

ඔබ ද රදලයෙකුගේ ඉඩමෙන් නෙරපුණු ප්‍රවේණි දාසයෙකු යැයි මොහොතකට සිතන්න. නව වෙළඳපොළ සමාජයේ *(market society)* ජීවිතය ගැට ගසා ගැනීමට නම් ඔබ ද මුදල් ඉපයිය යුතු ය. ඔබට ඒ සඳහා අලුතින් පටන් ගත් ගල් අඟුරු ආකරයක වැඩට ගොස් කය වෙහෙසා ඔබේ ශ්‍රමය විකිණිය හැකි ය. එසේ නැත හොත් ව්‍යවසායකයෙකු ලෙස ලෝම නිෂ්පාදන ව්‍යාපාරයක් ඇරඹිය හැකි ය. මේ දෙක අතරින් බොහෝ අය වැඩි කැමැත්තක් දැක්වූයේ ලෝම නිෂ්පාදන කර්මාන්තයේ නියැලීමට යි. එහෙත් ඒ සඳහා ගෙවිය යුතු මිලක් තිබේ.

මුලින් ම ඔබට ආරම්භක වියදම් සඳහා ප්‍රාග්ධනයක්, එනම් ඉඩමක් කුලියට ගැනීමට, බැටළුවන් මිලට ගැනීමට හා අත්‍යවශ්‍ය සේවකයන්ට ගෙවීමට ආරම්භක මුදලක් අවශ්‍ය වේ. පොලිය සමඟ ආපසු ගෙවීමට කැමති නම් ප්‍රදේශයේ පොලී මුදලාලිගෙන් ඔබට එම මුදල ණයට ලබා ගත හැකි ය. ඒ අනුව ණයක් ගැනීමට ඔබ තීරණය කරයි.

දැන් ඉතිං ඔබ තවදුරටත් ප්‍රවේණි දාසයෙකු නො වන්නේ ය. ඒ වෙනුවට ඔබ දැන් ව්‍යවසායකයෙකි. එහෙත් ඒ සමඟ ම ඔබ ණයකාරයෙකි. ණයෙන් මිදිය හැක්කේ ලොම් වෙළඳාමෙන් ලාභයක් ඉපදීමට ඔබ සමත් වුව හොත් පමණි. වෙළඳපොළ සමාජයේ ඇති ලාභය පිළිබඳ නිරන්තර තෘෂ්ණාව සන්තර්පණය කිරීමට මෙසේ ණය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

එකිනෙකාට උදව් කිරීම මිනිසුන් අතර බොහෝ කලක් තිස්සේ පැවතුණකි. අසල්වැසියා ඔබේ ගස කැපීමට උදව් දුන් විට එවැනි ම උදව්වක් ඔබෙන් ද ඉල්ලා සිටිය හැකි බව ඔහු දනී. මෙවැනි අන්‍යෝන්‍ය උදව් පදනම් වී ඇත්තේ ප්‍රජා එකමුතුකම මතයි. එවැනි අවස්ථාවලදී "ස්තුතියි, මාත් ඔයාට ණයගැතියි" යනුවෙන් කීවත් ඉන් කිසි සේත් ම අදහස් වන්නේ මූල්‍යමය ණය ගනුදෙනුවක් නො වේ.

මූල්‍යමය ණයක් යන්න ඊට වඩා වෙනස් ය. මන්ද එමඟින් ඇති කරන සම්බන්ධතාවට නව ගනුදෙනු කොන්දේසි දෙකක් අයත් ය. ප්‍රථමයෙන් ම ණය ගනුදෙනුව ගිවිසුමක් මඟින් නීතිමය වගකීමක් බවට පත් කරනු ලැබේ. දෙවැන්න ණයට පොලියක් අය කරනු ලැබේ. මෙය ණයට ගන්නා ලද මුදල ආපසු ගෙවීමට අමතර ව ණයකරු විසින් ණය හිමියාට ගෙවිය යුතු ණය මුදලට එක් කරන ලද අමතර අගය යි.

වෙළඳපොළ සමාජයක දැනටමත් සල්ලි කාරයෙකු නො වන කිසියම් කෙනෙකුට නිෂ්පාදනයක යෙදීමට අවශ්‍ය නම් ණයක් ගත යුතු ම ය. එසේ ගන්නා ණයට පොලියක් අයවන නිසා හුදෙක් නිෂ්පාදන වියදම ආවරණය කිරීමට පමණක් භාණ්ඩ මිල නියම කළ නො හැකි ය. ඒ නිසා ණයකරු විසින් භාණ්ඩ මිල නියම කළ යුත්තේ ලාභයක් ලැබෙන පරිදි ය. තරඟකාරී වෙළඳපොළ තුළ ලාභ ගැනීම යනු ඇත්ත වසයෙන් අඩු ම වියදමක් දරමින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම යි.

ඒ නිසා ලොම් නිෂ්පාදනයේ යෙදෙන අපේ හිටපු ප්‍රවේණි දාසයා මෙන් ම සියලු ව්‍යවසායකයන් ද හැකි තාක් අඩු වැටුපක් තම සේවකයන්ට ගෙවමින් වැඩි වැඩියෙන් ඉඩම් සහ නිෂ්පාදන මෙවලම්වලට ආයෝජනය කළ යුතු ය. මෙකී පීඩනය නිසා ණය වීම, ලාභ ඉපයීම සහ වියදම් අඩු කිරීම  චක්‍රයක් මෙන් නො කඩවා ක්‍රියාත්මක වෙයි. එහි ප්‍රතිඵලය කුමක් ද? එහි ප්‍රතිඵලය වන්නේ ණය දීමට හැකි අය වැඩි වැඩියෙන් ධනය රැස් කර ගන්නා අතර වැඩ කරන අයට නිරන්තර මූල්‍ය ආතතියකට හෙවත් අගහිඟකම්වලට මුහුණ දීමට සිදුවීම යි.

ක්‍රිස්තියානි හා ඉස්ලාම් ඇතුළු ඇතැම් ආගම් ණය දීම අනුමත කළත් පොලිය අය කිරීම තහනම් කළේ ය. එහෙත් වෙළඳපොළ සමාජය තහවුරු වීමත් සමඟ මෙකී තහංචි දුර්වල වී ගියේ ය. සමාජය තුළ වර්ධනය වන ද්‍රව්‍යමය තත්වයන් විසින් සමාජයේ දෘෂ්ටිවාදය මෙහෙයවන බවට මෙය ද එක් නිදර්ශනයකි.

වෙළඳපොළ සමාජයේ සියලු ධනය පෝෂණය වන්නේ ණය නිසා ය. පසු ගිය සියවස් තුන පුරා නො සිතූ විරූ ධනයක් නිර්මාණය කිරීමට හැකි වීමේ ගෞරවය බැංකු වැනි ණය දෙන්නන්ට හිමි විය යුතු ය. එහෙත් වෙළඳපොළ සමාජයක බැංකුවලට අසාර්ථක විය නො හැකි ය. කිසියම් අසාර්ථක වීමක් සිදු වුනොත් එහි විපාක දැරිය යුත්තේ ඔබ මිස බැංකුව නො වේ.

ඔබ බැංකුවකින් ඩොලර් මිලියනයක ණයක් ගත්තායැ'යි මොහොතකට සිතන්න. එම මුදල් එන්නේ කොහෙන් ද? ඔබේ බැංකුවේ ඇති ආරක්ෂිත සේප්පුවක සිට ද? සත්තකින් ම නැත. බැංකුව ඇත්ත වසයෙන් ම කරන්නේ ඔබේ බැංකු ගිණුමේ ඉතිරි ව ඇති මුදල සංකේතික වන අංකවල අගට තවත් බිංදු කිහිපයක් එකතු කිරීම පමණි. හරියට ඩොලර් මිලියනයක් අසරු සැණකින් නිර්මාණය කළා වැනි ය.

මෙකී ඩොලර් මිලියනය දැන් ඔබේ ගිණුමේ පවතින්නේ අනාගතයේ දී එය ඔබ විසින් ආපසු බැංකුවට ගෙවිය යුතු ය යන කොන්දේසියට යටත් ව ය. එම කොන්දේසිය ඉටු කිරීමට අපොහොසත් වුව හොත් ඔබට දේපළ නැති ව යෑම වැනි දරුණු විපාකවලට මුහුණ දීමට සිදුවේ. ණයක් ලබා ගැනීමේ වරප්‍රසාදය වෙනුවෙන් ඔබට බැංකු ගාස්තු හා පොලිය ද ගෙවීමට සිදු වෙනු ඇත. බැංකුවලින් දෙන ණය වැඩි වෙන තරමට බැංකුවලට ආපසු ලැබෙන මුදල් ප්‍රමාණය ද වැඩිවේ. ඒ නිසා හැකි තරම් ණය ප්‍රමාණයක් නිකුත් කිරීම බැංකුවක අභිප්‍රාය යි.

එහෙත් ආපසු අය කර ගැනීමට නො හැකි ලෙස සියල්ලන්ට ම බොල් ණය *(bad debts)* දී තිබුණොත් බැංකුවලට සිදු වන්නේ කුමක් ද? බැංකුවලට එහි ඵල විපාක විඳීමට සිදු වේ ද? ඇත්තට ම නැති තරම් ය. මන්ද වෙළඳපොළ සමාජයක බැංකුවලට අසමත් වීමට නො හැකි ය. එහෙත් ඒ වෙනුවට ඔබට අසමත් වීමට සිදුවිය හැකි ය. වෙළඳපොළ සමාජයක ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වීමට නම් මුදල්

සංසරණය නිරන්තරයෙන් ම සිදුවිය යුතු ය. ණය දීමත් එම ණයවලට වග වීමත් මඟින් මේ ක්‍රියාවලිය නොකඩවා ඉටු කිරීමට බැංකු බෙහෙවින් දායක වෙයි. ඇතැම් විට මෙය සෑහෙන හොඳින් වැඩ කරයි. ඒ නිසා වැඩි වැඩියෙන් ව්‍යාපාර කිරීම මඟින් ව්‍යාපාරිකයන් වැඩි ගණනකට වැඩි වැඩියෙන් ලාභ උපයා ගත හැකි වේ. එහෙත් තෘෂ්ණාව තරමක් වැඩි වූ විට මේ චක්‍රය නිසා ඇතිවිය හැකි සුබදායක සර්පිලය දිගේ ආර්ථිකය ඉහළ නඟිනවා වෙනුවට පහළට රූටා වැටීම ද සිදුවිය හැකි ය.

බොහෝ විට එය සිදු වන්නේ වැඩිපුර ලාභ ලැබීමේ චේතනාවෙන් බැංකු අවදානම් සහිත ණය වැඩි වැඩියෙන් දීමට පටන් ගත් විට ය. අවදානම් ණයකරුවන්ට සිය ණය ආපසු ගෙවීමට නො හැකි වූ විට තමන්ට දරා ගැනීමට නො හැකි තරම් බොල් ණය කන්දරාවකට වගකීමට බැංකුවලට සිදු වෙයි. එවිට අදාළ බැංකුවේ මුදල් තැන්පත් කළ කෙනෙකුට තම මුදල් ආපසු ගැනීමට අවශ්‍ය වූ විට එම මුදල වහා ම ලබා දීමට බැංකුව අපොහොසත් වෙයි. ඒ නිසා තවත් ප්‍රමාද වීමට පෙර තම තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට සියල්ලෝ ම බැංකුවට දුවති.

ඒ අනුව නො වැළැක්විය හැකි ලෙස වෙළඳපොළ කඩා වැටීමත් සමඟ සමස්ත ආර්ථිකය පොඩි පට්ටම් වී යයි. මෙය වැළැක්වීමට රජය මැදිහත් වී බැංකුවලට ණයක් ලෙස විශාල වසයෙන් රාජ්‍ය අරමුදල් පොම්ප කළ යුතු ය. මෙය සාමාන්‍යයෙන් හඳුන්වන්නේ 'බේල්අවුට්' නැත්නම් 'ගලවා ගැනීම' යනුවෙනි. 2008 ඇමෙරිකානු එක්සත් ජනපදයේ නිවාස වෙළඳපොළ එසේ කඩා වැටුණු විට ඩොලර් බිලියන 700 පොදු අරමුදල් යොදමින් රජය එවැනි බේල්අවුට් ගලවා ගැනීමක් කළේ ය.

මෙවැනි අවස්ථාවක් උද්ගත වූ විට එවැනි ගලවා ගැනීමක් සිදු කිරීමට අවශ්‍ය නම් බැංකු විසින් කොන්දේසි කිහිපයක් ඉටු කළ යුතු යැ'යි රජයට නියම කළ හැකිවා පමණක් නො ව අර්බුදය

ඇති කළ බැංකුකරුවන්ට නොසැලකිලිමත්කම යන චෝදනාව මත දඬුවම් පැනවිය ද හැකි ය. එහෙත් දේශපාලනඥයන්ට මූල්‍ය අනුග්‍රහය දක්වන්නේ යහමින් මුදල් වියදම් කළ හැකි පොහොසත් බැංකුකරුවන් නිසා රජය කරවන අය එසේ සිය ව්‍යාපාරික සගයන්ට දඬුවම් කිරීමට බෙහෙවින් පසුබට වෙති.

මේ අන්දමට බැංකු කෙසේ හෝ දෙලොවට ම වැඩ සලසා ගනී. ආර්ථිකය යහපත් ව පවතින විට උඩින් ම ඇති මුදල් සම්භාරය උකහා ගැනීමට බැංකු සමත් වෙන අතර ආර්ථිකය අර්බුදයට යන විට බැංකුවලට තව තවත් මුදල් පොම්ප කිරීමට රජයට සිදුවේ. ඒ අනුව ආර්ථික අර්බුදයක දී ඔබ පැරදුනත් බැංකු හැම විට ම දිනුම් ය.

මුදල් සහ ශ්‍රමය යන දෙක ම හැසිරෙන්නේ ඒවාට ම ආවේණික වූ නීතිවලට අනුවයි. උදාහරණයක් ලෙස සුදුසුකම් ලත් ඉංජිනේරුවෙකු වූ නිමල්ට තමන්ට සරිලන රැකියාවක් සොයා ගැනීම අසීරු යැ'යි ද ඒ අතර සුනිල්ට නුවරඑළියේ පිහිටි තම නිවාඩු නිවස විකුණා දැමීමට අවශ්‍ය වූ නමුත් බලාපොරොත්තු වන මුදලට ඉල්ලන ගැනුම්කරුවෙකු සොයා ගැනීමට නො හැකි වීය යි ද සිතමු. ගැනුම්කරුවෙකු සොයා ගැනීමට අපහසු වී ඇති නමුත් මේ දෙදෙනා ම උත්සාහ කරන්නේ තමන් සතු කිසියම් දෙයක් විකුණා ගැනීමට යි. ඊට හේතුව ඔවුන් එම දෙය විකිණීමට බලාපොරොත්තු වන මිල ගණන් පමණට වඩා වැඩි වීම නිසා විය නො හැකි ද?

ඔව් සහ නැහැ යන දෙක ම එයට පිළිතුර විය හැකියි. සුනිල් ඔහුගේ නිවාඩු නිවසේ විකුණුම් මිල රුපියල් දහය දක්වා පහත දැමුව හොත් ඔහුට බොහෝ විට ගැනුම්කරුවන්ගෙන් අඩුවක් නැති වන්ට පුළුවන. මන්ද එතරම් අඩු මුදලකට නුවරඑළියෙන් නිවසක් මිල දී ගැනීමට හැම කෙනෙක් ම කැමැත්ත දැක්විය හැකි බැවිනි. එහෙත් එවැනි ක්‍රමයක් අනුගමනය කළොත් නිමල්ගේ තත්වය කෙබඳු විය හැකි ද? ඔහු සිය ශ්‍රමය රුපියල් දහයක් වැනි අඩු මුදලකට සැපයීමට තීරණය කළ හොත් පහසුවෙන් ම ගැණුම්කරුවන් සොයා ගත හැකි වෙතැ'යි ඔබ සිතන්නේ ද?

එය නම් හිතන තරම් පහසු කටයුත්තක් නො වනු ඇත. නිවාඩු නිවාස මෙන් නො ව මිනිසුන් ශ්‍රමය මිල දී ගන්නේ ඇත්ත අවශ්‍යතාවක් ඇති වුව හොත් පමණි. ඒ අනුව ශ්‍රමය සහ මුදල් යනු ඒවාට ආවේණික වූ විශේෂ නීති මඟින් පාලනය වන දේවල් ය.

නිවසක් මෙන් ම ශ්‍රමය ද මිල දී ගැනීම හා විකිණීම කළ හැකි නමුදු නිවස මෙන් නො ව ශ්‍රමය යනු *(ලිංගික ශ්‍රමය හැර)* ඔබට අත්විඳිය හැකි වටිනාකමකින් සමන්විත වූවක් නො වේ. උදාහරණයක් වසයෙන් අඩු මිලකට නිවාඩු නිවස මිලට ගත් අයෙකුට එය විවේක සුවයෙන් ගත කිරීමට යොදා ගත හැකි නමුත් සේව්‍යයෙකු විසින් බොහෝ විට ශ්‍රමය මිල දී ගනු ලබන්නේ එම ශ්‍රමය ලාභ ඉපයීම සඳහා යොදා ගත හැකි නම් පමණි.

උදාහරණයක් වසයෙන් ඔබ ශීතකරණ නිපදවන කර්මාන්ත ශාලාවක හිමිකරුවෙක් නම් ඔබ අමතර ශ්‍රමිකයන් බඳවා ගන්නේ ශීතකරණවලට ඇති ඉහළ ඉල්ලුමට අභිමුඛ වීමට එමඟින් ඔබට හැකිවෙතැ'යි යන අදහසිනි. එහෙත් ඔබ නිපදවන ශීතකරණ කිසිවෙකුත් මිල දී නො ගනී නම් අඩු මුදලකට ශ්‍රමය ලැබුණත් කම්හල සඳහා තව තවත් ශ්‍රමිකයන් බඳවා ගැනීමට ඔබට කිසිදු හේතුවක් නැත.

මේ තර්කණය මුදල් සම්බන්ධ ව ද ආදේශ වේ. කිසිවෙකු විනෝදයට මුදල් මිල දී ගැනීම - එනම් ණයට මුදල් ගැනීම හා පොලී ගෙවීම නො කරයි. ව්‍යාපාරිකයන් මුදල් මිලට ගන්නේ ම නව යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම වැනි ආයෝජන කටයුතු මඟින් ලාභය වැඩි කර ගත හැකි ය යන අදහසිනි. එනිසා අඩු පොලියක් අය කළ ද මුදල් ණයට ගැනීමට වෙනත් හේතුවක් නැත.

වෙළඳපොළ සමාජයක් තුළ මින් අදහස් වන්නේ කුමක් ද? ඉන් කියවෙන්නේ මිනිසුන් ශ්‍රමය හෝ මුදල් මිල දී ගන්නේ තමන් නිපදවන හෝ අලෙවි කරන භාණ්ඩවලට හෝ සේවාවලට හොඳ පාරිභෝගික ඉල්ලුමක් පවතින්නේ ය යන අදහසිනි. ආර්ථික

අවධමනයක් නැතහොත් පසුබෑමක් ඇති වූ විට වියදම් කිරීමට තරම් අමතර මුදලක් අත නැති වූ විට කිසිවෙක් ශ්‍රමිකයන් සේවයට බඳවා ගැනීමට හෝ නිෂ්පාදනය සඳහා ආයෝජන කිරීමට උත්සුක නො වෙති.

මේ හේතුව නිසා ආර්ථික අවධමනයක් පවතින විටක දී වුව ද මිනිසුන් අඩු මුදලකට ශ්‍රමය සැපයිය යුතු යැ'යි කීම පලක් නැති වැඩකි. එසේ හැම කෙනෙකු ම සිය ශ්‍රමයට අය කරන මිල අඩු කළ හොත් විය හැක්කේ කුමක්ද? ශ්‍රමිකයන්ට ලැබෙන වැටුප අඩු වීමෙන් ඔවුන්ගේ වියදම් කිරීමේ හැකියාව ද අඩුවේ. ඒ අනුව පාරිභෝගික භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ද අඩු වී යයි. ඒ නිසා ව්‍යාපාරවලට ශ්‍රමය මිලට ගැනීමේ හැකියාව ද අඩුවෙයි. සමස්තයක් වසයෙන් ගත් විට මේ චක්‍රය ආර්ථිකයට බෙහෙවින් අහිතකර ය.

මුදල්වල වටිනාකම හැම විටම දේශපාලනික ව තීන්දු වන්නකි. ඒ නිසා එය ප්‍රජාතාන්ත්‍රික ව සිදුවිය යුතු දෙයකි. රත්තරන්, කවඩි සහ කඩදාසි නෝට්ටු ආදී වසයෙන් ඉතිහාසය පුරා නොයෙකුත් දේවල් මුදල් වසයෙන් භාවිත වී තිබේ. දෙවැනි ලෝක මහා යුද්ධ සමයේ යුද සිරකරුවන් රඳවා තැබූ සිර කඳවුරුවල රතු කුරුස හමුදාව විසින් බෙදා දෙනු ලැබූ සිගරැට් මුදල් වසයෙන් භාවිත විය. ප්‍රමාණයෙන් කුඩා වූ ද පහසුවෙන් ගබඩා කර තබා ගත හැකි වූ ද පාරිභෝගික ද්‍රව්‍යයක් වූ සිගරැට්වලට විශාල ඉල්ලුමක් යුද සිරකරුවන් අතර පැවති බැවින් මුදල් වෙනුවට සිගරැට් හොඳ ආදේශකයක් විය.

මේ යුද හිර කඳවුරුවල දී සිගරැට්වල වටිනාකම සැපයුමට අනුව ඉහළ පහළ ගියේ ය. රතු කුරුස හමුදාවට යුද සිරකරුවන් අතර වැඩි සිගරැට් ප්‍රමාණයක් බෙදා දීමට හැකි වූ අවස්ථාවල දී එක සිගරැට්ටුවකට එක චොකලට් පෙත්තක් ලබා ගත හැකි විය. එහෙත් යම් යම් ප්‍රායෝගික දුෂ්කරතා නිසා රතු කුරුස හමුදාවෙන් ලැබෙන සිගරැට් සැපයුම අඩු වූ විට එක සිගරැට්ටුවකට චොකලට් පෙති 10 ක් ලබා ගත හැකි තරමට සිගරැට්වල වටිනාකම ඉහළ ගියේ ය.

හිර කඳවුරුවලින් පිටත සමාජයේ මුදල් භාවිතයේ දී මුදලේ වටිනාකම තීරණය වූයේ ද මේ අන්දමින් ම ය. එකම වෙනස සිගරැට් සම්බන්ධයෙන් රතුකුරුස හමුදාව අපක්ෂපාතී සපයන්නෙකු වූ නමුදු යථා ලෝකයේ දී මුදල් සැපයුම පාලනය වන්නේ ඒ තරම් ම අපක්ෂපාතී අන්දමින් නො වීම ය.

අප කලින් සඳහන් කළාක් මෙන් හුවමාරු විධික්‍රමයක් ලෙස මුදල් භාවිත වන්නේ මුදල් වර්ගයට දී ඇති වටිනාකම සම්බන්ධයෙන් හැම දෙනා අතර ම පොදු එකඟත්වයක් පවතින්නේ නම් පමණි. මුදලේ මේ සුජාතභාවය බලාත්මක කරන්නේ රජය විසිනි. ඒ නිසා බොහෝ විට අදාළ රටේ පාලකයන්ගේ රූපවලින් නෝට්ටු හා කාසි සැරසී තිබීම පුදුමයක් නො වේ. රෝම අධිරාජ්‍ය තුළ නිකුත් කළ කාසිවල රෝම අධිරාජයාගේ රූපය නිරූපණය වී තිබීම මෙයට කදිම උදාහරණයකි.

එහෙත් මුදලේ වටිනාකම සංසරණය වන මුදල් ප්‍රමාණය අනුව ද නියාමනය වේ. ලබා ගත හැකි භාණ්ඩ හා සේවාවලට සාපේක්ෂව සංසරණය වන මුදල් ප්‍රමාණය අධික වූ විට මුදලේ අගය අඩු වී යයි. මේ තත්වය හඳුන්වන්නේ *inflation* හෙවත් උද්ධමනය යන නමිනි. මෙහි අනෙක් පැත්ත නම් ප්‍රමාණවත් මුදලක් සංසරණයේ නැත්නම් එම මුදලේ අගය ඉහළ යෑම යි. එය හඳුන්වන්නේ *deflation* හෙවත් අවධමනය යන නමිනි.

ඒ අනුව මුදල් සැපයුම පාලනය කිරීම යනු බොහෝ බලසම්පන්න කටයුත්තකි. බොහෝ රටවල මේ බලය අත්පත් වී තිබෙන්නේ රටක *Central Bank* හෙවත් මධ්‍යම බැංකුව යන නමින් හැඳින්වෙන මහ බැංකුවට යි. මේ මහ බැංකු නාමික ව සැලකෙන්නේ ස්වාධීන ආයතනයක් ලෙස වුවත් ඒවා අනෙකුත් විශාල වාණිජ බැංකු සහ ධනවත් පංතියේ ප්‍රබල සාමාජිකයන් සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි. ඒ නිසා මේ මහ බැංකු මුදල් පාලනය සම්බන්ධ සිය බලතල භාවිත කරන විට මුලින් ම අර කී වාණිජ බැංකු හා ධනවතුන්ගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් වෙයි.

උදාහරණයක් වසයෙන් කඩා වැටීමට ආසන්න කිසියම් වාණිජ බැංකුවක් ගලවා ගැනීමේ අවශ්‍යතාව උද්ගත වූ විට මහ බැංකුව ඒ සඳහා මැදිහත් වන්නේ සෑහෙන ලිහිල් කොන්දේසි මත විය හැකි ය. එහෙත් පොදු ජනතාවට සෙත සැලසෙන යටිතල ව්‍යාපෘතියකට මුදල් අවශ්‍ය වූ විට ඒ තරම් පහසුවෙන් මුදල් ලැබෙන්නට නො පුළුවන. එහෙත් අනෙක් බොහෝ ආර්ථික කටයුතු මෙන් ම මෙය අනිවාර්යයය ඉරණම නො වේ. ප්‍රබල දේශපාලන අධිෂ්ඨානයක් ඇත්නම් මුදල් සැපයුම ද වඩා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට නතු කළ හැකි ය.

මෙහි දී මොහොතකට නතර ව ඇඩම් ස්මිත් විසින් එකල උත්කර්ෂයට නැංවූ තරඟකාරී වෙළඳපොළ නොහොත් නිදහස් වෙළඳ පොළ නූතන යුගයේ නිර්වචනය වන ආකාරය සිහියට නඟා ගැනීම වැදගත් ය. අද නිදහස් වෙළඳපොළ යන්න නොයෙක් දෙනා නොයෙක් ආකාරයෙන් විග්‍රහ කරති. ඇතමුන්ට නිදහස් වෙළඳපොළ, ධනවාදය සහ නිර්බාධක වෙළඳපොළ හෙවත් *laissez-faire* යනු එක සමාන තේරුම් ඇති යෙදුම් ය. කෙසේ වෙතත් නිදහස් වෙළඳපොළට ඇතැම් පොදු ලක්ෂණ තිබෙන බව ද පැවසේ. නිදහස් වෙළඳපොළ නමින් හැඳින්වෙන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ආර්ථික විද්‍යාඥයන් අතරද පැහැදිලි එකඟත්වයක් නැත. සාමාන්‍යයෙන් පිළිගැනෙන පරිදි වෙළඳ පොළක් යනු භාණ්ඩ සහ සේවා සැපයීම හා මිලට ගැනීම සිදු වෙන විමධ්‍යගත ආර්ථික ක්‍රමයකි. එය තුළ සැපයෙන භාණ්ඩ හෝ සේවා වළ මිල හා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ හුදෙක් වෙළඳපොළ බලවේග විසින් බව ද ඇදහේ. මේ සියල්ල සිද්ධ වෙන්නේ කිසිදු බලහත්කාර කමකින් හෝ බාධාවකින් සිදුවන අවහිර කමක් නොමැතිව යි. නිදහස් වෙළඳපොළ යනුවෙන් අදහස් වෙන්නේ එකී නිර්බාධක ස්වභාවයයි. මේ හැර නිදහස් වෙළඳපොළක තිබිය යුතු අවශේෂ ලක්ෂණ ගැන සඳහන් කරන නිර්වචන ද පවතී. උදාහරණයක් වසයෙන් ඇතැම් නිර්වචන වලට අනුව රැවටිලි සහ වංචාවලින් තොර වීම ද නියම නිදහස් වෙළඳපොළක පැවැත්මට අත්‍යවශ්‍ය කොන්දේසියකි.

ඉහත සඳහන් ආකාරයට නිදහස් වෙළඳපොළ තේරුම් කිරීම ගැන වැඩි මතභේදයක් නැති නමුත් මතභේදය වැඩි වසයෙන් ම පවතින්නේ කරුණු දෙකක් සම්බන්ධයෙනි. ඉන් එකක් නම් ඇතැම් අයට අනුව වෙළඳපොළට මැදිහත් වීමේ දී ඒ සම්බන්ධ බලහත්කාර බලය යෙදෙන්නේ රජයක් මැදිහත් වන විට පමණි. එහෙත් තවත් අය පෙන්වාදෙන පරිදි පුද්ගලික අංශයෙන් වුවද වෙළඳපොළ විකෘති කරන බලපෑම් ඇතිවිය හැකි බැවින් ප්‍රභවය කුමක් වුවත් නො සලකා පුද්ගලික අංශයෙන් සිදුවන බලපෑම් ද බලහත්කාරකම් ලෙස සැලකෙන අන්දමේ අර්ථකතනයක් නිදහස් වෙළඳපොළ යන්න නිර්ණය කිරීමේ දී අප යොදා ගත යුතු බව යි. දෙවැනි කරුණ වන්නේ "නිදහස් වෙළඳපොළ" යන අභිධානය ලැබීමට වෙළඳපොළක් කෙතෙක් දුරට තරගකාරී විය යුතු ද යන්නයි. ඇතැම් තර්ක වලට අනුව තරඟකාරිත්වය සීමා කිරීමට රජය මැදිහත් නො වන තාක් ඒකාධිකාරයක් හෝ කතිපයාධිකාරයක් ඇතුළු ඕනෑම ආකාරයක තරඟකාරිත්වයක් නිදහස් වෙළඳපොළ ලක්ෂණයක් ලෙස සැලකිය හැකි ය. ඊට පටහැණි මතය නම් නිදහස් වෙළඳපොළක් යනු අන් කිසිවක් නොව විශේෂයෙන්ම භාණ්ඩ හා සේවාවල මිල තරගකාරී ව වෙනස් වන වෙළඳපොළකි. මිල තරගකාරී නොවන විට නිදහස් වෙළඳපොළක් නො පවතී. එනිසා භාණ්ඩ හෝ සේවා මිල ගණන් නිතරඟයෙන් නියම කළ හැකි ඒකාධිකාර හෝ කතිපයාධිකාරයක් පවතින වෙළඳපොළක් නිදහස් වෙළඳ පොළක් විය නො හැකිය.

හුවමාරු වටිනාකමෙන් අතොරක් නැති ව සම්මෝහනය වී සිටින වෙළඳපොළ සමාජයක් බොහෝ විට පෘථිවියේ සමස්ත පැවැත්මට ද තර්ජනයක් විය හැකි ය. සිංහරාජයට නුදුරු කඳු බෑවුමක සාර සොබාවට වැඩුණු නො ඉඳුල් වැසි වනාන්තරයක් ගැන සිතින් සිතා ගන්න. මේ නො ඉඳුල් වනාන්තරය වටින්නේ ඇයි යන ප්‍රශ්නය ඔබෙන් ම අසා බලන්න. ඒ හුදෙක් එමඟින් ලැබෙන සෙවන හා සිසිල නිසා ද? නැතහොත් එහි ඇති ගහ කොළ මල් වැල් ආදියෙන් එන සිත නිවන සුගන්ධය නිසා ද? එසේත් නැතිනම් එහි වෙසෙන

විහඟුන්ගේ ප්‍රිය ජනක කූජනය නිසා ද? නො එසේ නම් එම සශ්‍රීක වනගහනය සමන්විත දැවැන්ත වෘක්ෂලතා කපා දමා ලබා ගත හැකි දැවවල වටිනාකම නිසා ද?

අවාසනාවකට මෙන් අපේ වෙළඳපොළ සමාජයට එහි ඇති එකම වටිනාකම වන්නේ වනයේ ඇති හුවමාරු වටිනාකම වසයෙන් සැලකෙන දැවවල වටිනාකම යි. ඇත්ත වසයෙන් ම මුළු මහත් ස්වාභාවික ලෝකය ම වෙළඳපොළ සමාජය විසින් අගයනු ලබන්නේ වෙළඳපොළ සඳහා සුදුසු පාරිභෝගික භාණ්ඩ ලබා ගත හැකි ස්වාභාවික සංචිතයක් ලෙස යි.

එහි අවාසනාව මේ පාරිභෝගික භාණ්ඩ අතරින් ගල් අඟුරු සහ ඛනිජ තෙල් වැනි ද්‍රව්‍ය නිමක් නැති පරිභෝජනය සඳහා යොදා ගැනීම නිසා ස්වාභාවික ලෝකයේ පැවැත්මට ඇතිවිය හැකි හානියයි.

අනෙක් සියල්ලට ම වඩා ලාභය ම වැදගත් කොට සැලකීම බරපතළ ප්‍රශ්නවලට තුඩු දෙන කරුණකි. අද පවතින වෙළඳපොළ තරඟයේ ස්වභාවය නිසා හැකි හැම දෙයක් ම ඒවායේ ධරණීයතාව නොහොත් තිරසාර පැවැත්ම සහතික කළ හැකි නො හැකි බව නො තකා සූරා ගෙන පරිභෝජන භාණ්ඩ බවට පත් කොට විකිණීමට සෑම පුද්ගලයෙකුට ම, සෑම පුද්ගලික ව්‍යාපාරයකට ම බල කරයි. මේ ප්‍රශ්නය පමණ ඉක්මවා අධික ලෙස මසුන් මැරීමේ සිට දිගින් දිගට ම ඛනිජ තෙල් විකිණීම සහ භාවිත කිරීම දක්වා හැම දෙයක් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ හැකි ය.

මේ නිරන්තර පරිසර විනාශය වැළැක්විය හැකි ද? ඒ සම්බන්ධයෙන් එක පිළියමක් විය හැක්කේ හුවමාරු වටිනාකම නො තකා ස්වාභාවික ලෝකය සුරැකීමට හැකි නීති සම්මත කර බලාත්මක කිරීමෙනි. සිය වැසිවනාන්තරවල වටිනාකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධානවලින් තහවුරු කොට ආරක්ෂා කිරීමට මෑතක දී ඉක්වදෝරය ගත් පියවර මෙයට එක් උදාහරණයකි. එහෙත් ව්‍යාපාරික අවශ්‍යතාවලින් සිර කරනු ලැබූ අනෙකුත් බොහෝ ආණ්ඩු ඒ හා සමාන තද බල නීති රීති හඳුන්වා දීම ට මැලි විය හැකි ය.

තවත් පිළියමක් වන්නේ අප ආශ්වාස කරන වාතය ඇතුළු සියලු ස්වාභාවික දේවල්වලට හුවමාරු මිලක් නියම කිරීම යි. වායුගෝලය දූෂණය කිරීමට අයිතිය ලබා ගැනීම පිණිස සමාගම් විසින් ගෙවිය යුතු බද්දක් ලෙස යෝජනා වූ කාබන් බද්දේ අරමුණ එය යි. ඉන් බලාපොරොත්තු වන්නේ එවැනි බද්දක් නියම කිරීම නිසා වායු ගෝලය දූෂණය වන හරිතාගාර වායු තම කර්මාන්තවලින් විමෝචනය වීම හැකි තාක් දුරට අඩු කිරීමට කම්හල් හිමියන් පෙලඹෙනු ඇති බවයි. එහෙත් එහි දී මිල, විමෝචන සීමා සහ නීති බලාත්මක කිරීම පැවරෙන්නේත් ව්‍යාපාරිකයන්ට හිතවත් ආණ්ඩුවලට ය. එමඟින් සිදුවිය හැක්කේ ද වෙළඳපොළ තර්කණය විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීම යි.

ඒ නිසා වඩාත් යහපත් විසඳුම විය හැක්කේ ලෝකයේ ඇති සම්පත් ප්‍රජාතන්ත්‍රවාදී ව කළමනාකරණය කිරීම යි. දැනට සිදු වන අන්දමට ලෝකයේ ඇති කිනම් සම්පතක් උකහා ගෙන අලවි කරන්නේ ද යන්න තීරණය කරන්නේ සුපිරි ධනවතුන් අතළොස්සක් විසිනි. සාගරබද මිලියන ගණනක් ජනතාවගේ අපේක්ෂාව සූර්ය බල ශක්තිය සඳහා කරන ආයෝජන තව තව වැඩි කර වීම වුවද මේ ධනවතුන්ට අවශ්‍ය කරන්නේ වැඩි වැඩියෙන් ඛනිජ තෙල් ලබා ගැනීම පිණිස වෙරළාසන්න සාගරය තව තවත් විද බැලීමටයි. අර කී ජනතාවට තනි තනි ව නො ව ප්‍රජා සමූහයක් ලෙස හඬ නැංවිය හැකි නම් බල ශක්තිය සඳහා වඩා තිරසාර සහ සාධාරණ විසඳුම ඉස්මතු කර ගත හැකි ය.

නූතන ගෝලීය ආර්ථිකය විස්තර කළ හැක්කේ ජීවිතයෙන් වැඩි කොටසක් වෙළඳපොළ බලවේගවලට අනුව හැසිරිය යුතු වෙළඳපොළ සමාජයක් ලෙසය. එහි තේරුම අපේ ස්වාභාවික සම්පත්වල සිට අපේ කාලය සහ ආයාසය දක්වා හැම දෙයක් ම ලාභය ජනනය කිරීමට ඇති හැකියාව පදනම් කොට ඇගයීමට හා පාරිභෝගිකකරණයට *(commodification)* ලක් වෙන බව ය. එහෙත් මෙකී ආර්ථික ක්‍රමය ස්වාභාවික දෙයක් වත් අනිවාර්ය දෙයක් වත්

නො වේ. දේවල්වල අයිතිය තීරණය වෙන ආකාරය සහ ඒවාට වටිනාකම් ආදේශ කරන ආකාරය වෙනස් කළ හැකි නම් ආර්ථිකය වඩා ප්‍රජාතන්ත්‍රවාදී කිරීම සහ වඩා සාධාරණ කිරීම අපට ඉඳුරා ම කළ හැකි ය.

# - 12 -

## ආර්ථික මිනිසා - මිථ්‍යාව හා යථාර්ථය

පුද්ගල බද්ධ ආර්ථික අභිලාෂ වසයෙන් අප හඳුනා ගන්නා බොහෝ දේවල සැබෑ අරමුණ වන්නේ හුදෙක් ධනය හා සම්පත් අත්පත් කර ගැනීමේ ඍජු අවශ්‍යතාවකට වඩා ගෞරවය සහ තත්වය දිනා ගැනීමේ මූලික කොන්දේසියක් ලෙස ධනවත්කම යොදා ගැනීමයි. නූතන ආර්ථික විද්‍යා න්‍යාය හා සුවිශේෂ වසයෙන් නවලිබරල්වාදී ආර්ථික චින්තනය බිහි වී ඇත්තේ ම 'මනුෂ්‍යයා වනාහි උපයෝගීතාව උපරිම කර ගැනීම සඳහා හෙවත් තමන්ගේ ද්‍රව්‍යයමය උන්නතිය සලසා ගැනීම පිණිස ස්වාර්ථය ම සලකා සබුද්ධික තීරණවලට එළඹෙන ආත්මාර්ථකාමී සත්ව විශේෂයකි' යන පදනම මත යි.[128] ඒ අනුව නම් දේශපාලනය යනු එකී උපයෝගිතාව උපරිමකරණය කර ගැනීමේ චර්යාව යි.

මනුෂ්‍යයන් ආවේණික ව ම ආත්මාර්ථකාමීය යන ආකල්පය මුල් කාලයේ සිට ම බටහිර දර්ශනය තුළ පැවත එන්නක් බව *Humankind: a Hopeful History* නමැති කෘතිය ලියූ රට්ගර් බ්‍රෙග්මන් පෙන්වා දී තිබේ. ඔහුට අනුව තුසිඩයිඩ්ස්, ඔගස්තීන්, මැකියාවෙල්ලි, හොබ්ස්, ලූතර්, කැල්වින්, බර්ක්, බෙන්තම්, නීචේ, ෆ්‍රොයිඩ් සහ ඇමරිකා එක්සත් ජනපදයේ පියවරු වසයෙන් සැලකෙන නායකයින් ද මේ හා සමාන ආකල්පයෙන් යුතු ව කරුණු දක්වා තිබේ. පැරණි

128 Arrow, Kenneth. 1980. *"Discrimination in the Labour Market,"* in J.E. King, ed. Oxford: Oxford University Press.

ග්‍රීකයන් අතර ද මිනිසුන් සම්බන්ධයෙන් මේ සමාන නින්දාශීලී ආකල්පයක් තිබුණි. කෝර්සිරා නමැති ග්‍රීක දූපතේ ක්‍රිස්තු පූර්ව 427 දී ඇති වූ කැරැල්ලක් විස්තර කරමින් මුල්ම ඉතිහාසඥයෙකු වන තුසිඩයිඩ්ස් 'කොතෙකුත් නීති තිබිය දීත් මනුෂ්‍ය ස්වභාවය සැම විටම පෙන්නුම් කරන්නේ මෘගයන් මෙන් ක්‍රියා කිරීමට සූදානම් බව යැ'යි පැවසීය[129].

මනුෂ්‍යයන් සම්බන්ධ මේ සමාන ම නරුම ආකල්පයක් ක්‍රිස්තියානි යුගයේ මුල් කාලයේ සිට ම පැවතුණි. කතෝලික ක්‍රිස්තියානි ආගමේ ඉපැරණි ම දේශකයෙකු වූ ඕගස්තීන් *(*354-430*)* 'මිනිසුන් උපදින්නේ ම පව්කාරයන් ලෙස යි' යන්න ජනප්‍රිය කරවීමට කටයුතු කළේ ය. ඔහුට අනුව පවුකාරකමෙන් කිසිදු මිනිසෙකුට ගැලවීමක් නැත. උපතෙන් පසු එක දිනක් පමණක් ජීවත් වෙන බිලිඳෙකුට වුව ද එය පොදු ය.

මුල්ම පාපය පිළිබඳ මේ අසුභ සංකල්පය කතෝලික පල්ලියෙන් කැඩී යෑමෙන් පසු ද රෙපරමාදු ප්‍රතිසංස්කරණවාදීන් අතර පවා පැවතුණි. රෙපරමාදු ප්‍රතිසංස්කරණවාදියෙකු වූ ජෝන් කැල්වින් ට අනුව 'මනුෂ්‍ය ස්වභාවය යනු කිසි ම හොඳකින් තොර වූ කාලකණ්නිකමකි'. මේ විශ්වාසය හෛදල්බර්ග් කැතිචිසමය යනුවෙන් 1563 දී ලියන ලද ප්‍රතිසංස්කරණවාදී මූල ලේඛනයක ද අඩංගු වේ. එයට අනුව මිනිසුන් පිළිසිඳ ගන්නේත් ඉපදෙන්නේත් පාපභරිත ව ය. *(*හෛදල්බර්ග් කැතිචිසමය - 7 වෙනි ප්‍රශ්නය හා පිළිතුර)

පුදුමයකට මෙන් ක්‍රිස්තියානි ආගම පමණක් නො ව විශ්වාසය වෙනුවට සහේතුක බව වැදගත් යයි සැලකූ බටහිර පුනරුදවාදීන් අතර ද මනුෂ්‍ය ස්වභාවය සම්බන්ධයෙන් තිබුණේ අයහපත් ආකල්පයකි. මනුෂ්‍යයන් දුරාචාරයට ම බර අය බවත් ඒ නිසා මනුෂ්‍යයන්ට කළ හැකි හොඳ ම දෙය ශ්‍රද්ධාව ඇති කර ගැනීම බවත් එකල සාම්ප්‍රදායික ආගමික විශ්වාසය විය. පුනරුදවාදී දාර්ශනිකයන්

129 Bregman, Rutger (2021) *Humankind: A Hopeful History*, London: Bloomsbury Publishing, p.39 (KE)

ද මිනිසුන් ස්වභාවයෙන් ම පවිටු අය බව පැවසූ අතර එය අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන්නේ ආගමික විශ්වාසය නො ව තර්කානුකූල සබුද්ධිය බව ප්‍රකාශ කළේ ය.

මනුෂ්‍ය ස්වභාවය සම්බන්ධයෙන් බටහිර චින්තනය එලෙස එකම ආකාරයක අසුභ ස්ථාවරයක් ගැනීම පුදුමය දනවනසුලු ය. දේශපාලන විද්‍යාවේ ආදි කර්තෘ ලෙස සැලකෙන නිකොලායි මැකියාවෙල්ලිට (1469-1527) අනුව මිනිසුන් යනු කිසිම කෙළෙහිගුණයක් නැති චපල කුහකයෝ ය. ඇමෙරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් පෙළේ මූලාරම්භකයෙකු ලෙස සැලකෙන ජෝන් ඇඩම්ස් ට අනුව පුළුවන්කමක් ඇත්නම් හැම මිනිසෙකු ම ප්‍රජා පීඩකයෙකු වීමට කැමති ය. 'අප පැවතෙන්නේ අප්‍රමාණ සංඛ්‍යාත වූ මිනීමරු පරම්පරා ගණනාවකින්' යැයි නූතන මනෝවිද්‍යාවේ පියා වසයෙන් සැලකෙන සිග්මන් ෆ්‍රොයිඩ් පැවසී ය.

ඩාවින්ගේ පරිණාමවාදය පවා මේ අසුබ සංකල්පය ප්‍රචලිත කිරීමට යොදා ගන්නා ලදි. සමකාලීන ප්‍රකට ඩාවින්වාදියෙකු වූ තෝමස් හක්ස්ලි ට අනුව 'ජීවිතය යනු මිනිසෙකු විසින් තවත් මිනිසෙකුටත් ජාතියක් විසින් තවත් ජාතියටත් එරෙහිව කරනු ලබන ශ්‍රේෂ්ඨ අරගලයකී. ස්වභාවධර්මයාගේ පරම උත්සාහය අසමර්ථයන් ලෝකයෙන් තුරන් කොට සාර්ථක අයට ඉඩ සලසා දීම බැවින් මෙකී සටන ඇවිළවීමට අප උත්සුක ව කටයුතු කළ යුතු බව පළ කළ බ්‍රිතාන්‍ය දාර්ශනිකයෙකු වූ හර්බට් ස්පෙන්සර්ගේ (1820-1903) පොත් දස දහස් ගණනින් විකුණුණි.

පුදුමයකට මෙන් මෙකී චින්තකයන් යථාර්ථවාදීන් ලෙස අභිවන්දනයට ලක් වූ අතර ඊට ප්‍රතිපක්ෂ ව මනුෂ්‍ය ස්වභාවයේ යහපත් බව විශ්වාස කළ චින්තකයන් පරිභවයට ලක් වූ බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. නිදහස හා සමානාත්මතාව සඳහා අරගල කළ නිසා ම ඇගේ ජීවිත කාලය පුරා නිග්‍රහයට සහ අපවාදවලට ලක් වූ ස්ත්‍රීවාදී එමා ගෝල්ඩ්මන් (1869-1940) වරක් මෙසේ ලීවා ය. "අහෝ! දුප්පත් මනුෂ්‍ය ස්වභාවය, ඔබේ නමට මොන තරම් දරුණු

අපරාධ බැර කර තිබේ ද.... වංචාකාරයා ඉස්තරම් වන තරමට මනුෂ්‍ය ස්වභාවයේ දුෂ්ට බව සහ දුර්වලකම් ගැන ඔහුගේ අවධාරණයේ තීරණාත්මක බව ද ඉහළ යයි."[130]

මේ කාරණය වඩාත් සවිස්තර ව සාකච්ඡා කිරීම අවශ්‍ය වන්නේ 'මනුෂ්‍යයන් තීරණ ගන්නේ ම ස්වාර්ථය ම සලකාය' යන දෘෂ්ටිය මත පදනම් වී ඇති නූතන ආර්ථික චින්තනයේ විකාසනය විමසීමට ලක් කිරීම සමාජ විෂමතාව ආමන්ත්‍රණය කිරීමේ වැඩපිළිවෙළක් පිළිබඳ කතිකාවේ මුල් පියවරක් විය යුතු බැවිනි. හැරත් නවලිබරල්වාදී ආර්ථික චින්තනයට බැරෑරුම් විකල්පයක් ඉදිරිපත් කිරීමට එහි විවේචකයින් අපොහොසත් වීම තේරුම් ගැනීමටත් සාම්ප්‍රදායික ආර්ථික චින්තනයේ විකාසනය එවැනි ආගන්තුක කියවීමකට ලක් කිරීම වැදගත් ය.

සම්ප්‍රදායික ආර්ථික විද්‍යා දැක්මට අනුව ආත්මාර්ථකාමී වීම *(self-interested)* මිනිසුන්ගේ අනිවාර්ය ගති ලක්ෂණයකි. බොහෝ ආර්ථික විග්‍රහවලට අනුව පුද්ගල චර්යාව මෙහෙයවෙන්නේ "තෘෂ්ණාවේ දැවැන්ත බලවේග" වලිනි. ආර්ථික ක්‍රම පිළිබඳ ආදර්ශනවල දී මිනිස් ක්‍රියාකාරිකයන් නිරූපණය කරන්නේ 'බොරු කීම, සොරකම සහ රැවටීම වැනි නිහීන ක්‍රියා කරන, බොහෝ විට සියුම් ක්‍රම මඟින් වංචා කරන්නන්" ලෙස ය.[131]

නූතන ජාතික රාජ්‍ය පදනම් කොට ආර්ථිකය හැසිරෙන ආකාරය පිළිබඳ ව අධ්‍යයන කළ යටත් විජිත යුගයේ විසූ යුරෝපීය බුද්ධිමතුන් අතරින් ඇඩම් ස්මිත් (1723-1790), ඩේවිඩ් රිකාඩෝ *(*1772-1823*)* සහ ජෝන් ස්ටුවර්ට් මිල් (1806-1873*)* බෙහෙවින් ප්‍රකට ය. තමා අවට ලෝකයේ දේශපාලනය සහ ආර්ථිකය විග්‍රහ කිරීම පිණිස මූලික මූලධර්ම කිහිපයක් ම ඔවුහු ලෝකයට හඳුන්වා දුන්හ. මෙකී මූලධර්ම

130 Goldman Emma, (2010) *Anarchism and Other Essays* (New York: Stillwell, 2008), p. 29.

131 Williamson, Oliver. 1985. The Economic Institutions of Capitalism. New York: Free Press. ("self-interest seeking with guile (which) includes . . . more blatant forms, such as lying, stealing, and cheating … (but) more often involves subtle forms of deceit")

අතරින් අතිශයින් වැදගත් මූලධර්මයක් ලෙස සැලකුණේ *Economic Rationality* හෙවත් 'ආර්ථික තාර්කිකත්වය' යි. එහි දී තාර්කිකත්වය යන්නෙන් සරල ව අදහස වුණේ සිය අරමුණු හැකි තරම් කාර්යක්ෂම ව සහ ප්‍රායෝගික ව සාක්ෂාත් කර ගැනීමට කෙනෙකුට ඇති ඒකායන අභිලාෂය යි. මේ මතයට අනුව තාර්කික මිනිසෙකු යනු හැම ප්‍රතික්‍රියාවක් මඟින් ම ස්වාර්ථය ම පමණක් සලකා තමන්ට හැකි ඉහළ ම වාසිය ලබාගැනීමට තැත් කරන පුද්ගලයෙකි. ඒ අනුව කම්හල් හිමියෙකුගෙන් හැකි ඉහළ ම වේතනය දිනා ගැනීමට සේවකයා කටයුතු කරන අතර සේවකයාගෙන් අඩු ම වේතනයකට වැඩ ගැනීමට කම්හල් හිමියා කටයුතු කරයි. ඒ හා සමාන ව පාරිභෝගිකයාද අඩු ම මිලකට භාණ්ඩ ලබා ගැනීමට උත්සාහ කරන අතර නිෂ්පාදකයා වැඩි ම මිලකට තම භාණ්ඩ අලෙවි කිරීමට බලාපොරොත්තු වෙයි. ස්වාර්ථකාමී ව තාර්කික යැ'යි සැලකුණ මේ මානව අන්තර්ක්‍රියා හෙවත් ගනුදෙනු එක් කරන තැන 'වෙළඳපොළ' යන නමින් හැඳින්විණි.

එහෙත් තාර්කික මිනිසා යන්න හුදෙක් ආර්ථික කටයුතුවලට පමණක් සීමා වූවක් නො වී ය. අර කී බුද්ධිමතුන්ට එකල බටහිර ලෝකයේ තිබූ සමාජවල සියලු යථා හැසිරීම් තනි තනි පුද්ගලයින් ස්වාර්ථය සලකමින් එකිනෙකා හා ජාලගත වීම නිසා සිදු වන දේවල් ය. ඒ අනුව පොහොසත් ජාතීන් සහ සරුසාර සමාජ බිහි වන්නේ එසේ ස්වාර්ථය සලකන තාර්කික මිනිසුන් ජාලගත වීම මගිනි. ඒ නිසා ඇතැම් නාගරික ප්‍රදේශවල ප්‍රාග්ධන හිමියන්ට විශාල ලාභයක් ලැබෙන බව සැබෑවක් මෙන් ම ඒ නිසා කම්කරුවන්ගේ පවා ජීවන තත්වය ඉහළ නැංවෙන බවට ද තර්ක කෙරුණි. අනෙක් අතට මේ ස්වාර්ථකාමී තාර්කිකත්වය ප්‍රතික්ෂේප කරන සමාජ, ප්‍රතිගාමී සහ දුප්පත් නොහොත් නො දියුණු අයගේ සමාජ වසයෙන් සැලකිනි.

තාර්කික ස්වාර්ථකාමිත්වය පිළිබඳ මේ සංකල්පය නිෂ්පන්න වූයේ 'ආර්ථික මිනිසා' හෙවත් 'හෝමෝ එකොනොමිකස්' *(Homo Economicus)* නමින් එකල ව්‍යවහාරයට පැමිණි මතවාදයෙනි. තම

වියදම ගණින, කෙරෙන නිෂ්පාදනයේ ලාභ ප්‍රයෝජන නිතර මැන බලන, අලෙවිය, සේවා සහ භාණ්ඩ මිල දී ගැනීම ආදියේ නිරත වෙමින් රට පුරා වෙළඳපොළ ආශ්‍රිත කටයුතුවල නිරත වන තාර්කික ඒජන්තවරයෙකු එකී 'හෝමෝ එකොනොමිකස්' හෙවත් 'ආර්ථික මිනිසා' යන්නෙන් අදහස් කෙරිණි. මුලින් ම හුදු ස්වයංගවේෂණීය *(heuristic)* වහරක් ලෙස ජෝන් ස්ටුවර්ට් මිල් විසින් නිර්මාණය කළ මේ සංකල්පය, ආර්ථික විද්‍යාව සහ ආර්ථික මානව විද්‍යාව හඳුන්වා දීමට පෙර තිබූ 'දේශපාලන ආර්ථිකය' *(Political Economy)* නමැති අධ්‍යන ක්ෂේත්‍රයේ නියැලුනු බුද්ධිමතුන් අතර සෘෂි භාෂිතයක් ලෙස සැලකිනි.

සරලව කිව්වොත් 'හෝමෝ එකොනොමිකස්' යන්නෙන් අදහස් වන්නේ මනුෂ්‍යයන් යනු නිදහස් වෙළඳපොළක් හරහා අන් අය සමඟ ස්වේච්ඡාවෙන් කරන හුවමාරු මඟින් සිය ද්‍රව්‍යයමය ඕනෑ එපාකම් උපරිම මට්ටමෙන් ඉටු කර ගැනීමට කටයුතු කරන සමාජ සත්ව විශේෂයක් බව යි. මේ දැක්මට අනුව ආර්ථික කටයුතු සහ දේශපාලන කටයුතු යනු එකිනෙකින් වෙන් ව තබා ගත හැකි ඒවා යි. එහෙත් ඒ දෙක අතරින් ආර්ථිකය වඩා උසස් වන්නේ එය වඩාත් හොඳින් කටයුතු කරන්නේ දේශපාලනය මෙන් නො ව ආණ්ඩුවේ මැදිහත්වීකින් තොර ව සුසංවාදී ක්‍රමයක ස්වාභාවික නීති *(a harmonious system of natural laws)* යටතේ ක්‍රියාකරන විට පමණක් වන බැවින් යැයි ඇදහිනි.

තමා බලාපොරොත්තුවන උපයෝගිතාව උපරිම කර ගැනීමට හොඳ නරක දෙකම නිරන්තරයෙන් එක විට යොදා ගන්නා සදාකාලික මිනිස් චර්යාවක් පිළිබඳ මේ සංකල්පය මිනිසාගේ ආර්ථික චර්යාව ස්වාර්ථය ම මත තීරණය වන්නක් බව පිළිගැන්වීමට යොදා ගැණිනි. සදාචාරය, පියකරු බව, පක්ෂපාතීත්වය සහ සත්‍යගරුක බව වැනි වෙනත් උසස් චේතනා මඟින් ද මානව චර්යාව මෙහෙය වෙන බව ඇතැම් ආර්ථික විද්‍යාඥයන් පිළිගනු ලැබුව ද තාර්කික ආර්ථික මිනිසා පිළිබඳ මොඩලය සාම්ප්‍රදායික ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව

ද ඉක්මවා ගොස් විවාහයේ සිට වැඩපොළ උසස් වීම දක්වා සකල මානව චර්යා සම්බන්ධයෙන් ම තීරණාත්මක ලෙස ආදේශ විය.

මේ සංකල්පයේ මූලික තර්කයක් වූයේ කෙනෙකු ස්වාර්ථය ම තකා කටයුතු කරන විට වඩා පුළුල් වූ පොදු සමාජ සුභසාධනය ද ඒ මඟින් ඉටු වෙන බවයි. ඇඩම් ස්මිත්ගේ මේ ප්‍රසිද්ධ ප්‍රකාශය එයට සාධකයකි.

> "අප රාත්‍රි ආහාරය බලාපොරොත්තු වන්නේ මස්කඩකරුවාගේ, බේකරිකරුවාගේ හෝ තැබෑරුම්කරුවාගේ කරුණාව මත නො ව ඔවුන් තමන්ගේ ස්වාර්ථය ම සලකා කරන කටයුතු මත ය. ඒ අනුව අප ආමන්ත්‍රණය කරන්නේ ඔවුන්ගේ මනුෂ්‍යත්වයට නො ව ඔවුන්ගේ ඒ ස්වාර්ථකාමිත්වයටයි. ඒ නිසා හුදෙක් ඔවුන්ට සිදු වන වාසිය මිස අපේ අවශ්‍යතාව පිළිබඳ කිසි දිනක ඔවුන් හා කතා කළ යුතු නැත. හිඟන්නෙකු හැරෙන්නට වෙනත් කිසිවෙකු මූලික වසයෙන් සිය සහවර පුරවැසියන්ගේ කරුණාව මත යැපීමට නො සිතති."[132]

මේ මතයට අනුව මනුෂ්‍යයන් වන අපි ස්වභාවයෙන් ම ලාභය ම පෙරදැරි කර කටයුතු කරන ස්වාර්ථකාමී තීරකයෝ ය. ආර්ථික මිනිසා හෙවත් 'හෝමෝ එකොනොමිකස්' යන වහර අපට යෙදෙන්නේ එබැවිනි. නූතන ආර්ථික විද්‍යාවට පදනම වී ඇති 'මනුෂ්‍යයන් වනාහී නිරන්තරයෙන් ම උපයෝගිතාව හෙවත් ප්‍රයෝජ්‍යත්වය *(utility)* උපරිම කර ගැනීමට සහේතුකව වෙර දරන ස්වාර්ථකාමී සත්ව විශේෂයකි' යන්න නවලිබරල්වාදී ආර්ථික චින්තනය විසින් වෙසෙසින් හුවා දක්වන මානව චර්යා සිද්ධාන්තයකි. ඒ සිද්ධාන්තයට අනුව හැම මනුෂ්‍යයෙක් ම තමන්ගේ ඥානික හැකියාව පුද්ගල ස්වාර්ථය සඳහා ම යොදා ගනියි. මේ සිද්ධාන්තයට අනුව නම් ස්වාර්ථය පිළිබඳ ප්‍රායෝගික ඒකකය වන්නේ පුද්ගලයා අයත් යැයි සැලකෙන ඔහුගේ ගෝත්‍රය හෝ ජාතිය නො ව හුදෙක් තනි පුද්ගලයායි.

ස්වාර්ථය පිළිබඳ තවත් වැදගත් කාරණයක් වන්නේ අර කී ප්‍රයෝජ්‍යත්වයෙන් ඉටු කර ගැනීමට තැත් කරන අපේක්ෂාවේ

132 Smith Adam (1776), *An Inquiry into the Nature and Causes of the Wealth of Nations*, Harvard Classics eds. By Elliot C.W, New York: P.F.Collier, p.19

ස්වභාවයයි. එය අලුත් වාහනයක් ලබා ගැනීම, ලිංගික සන්තර්පණයක් දිනා ගැනීම එසේත් නැතිනම් විනෝද ජනක නිවාඩුවක් ගත කිරීම වැනි දෙයක් විය හැකි ය. ආර්ථික විද්‍යාඥයන් උපයෝගිතා හෙවත් ප්‍රයෝජ්‍යතා කටයුත්ත යනුවෙන් එය හඳුන්වන්නේ එක් එක් තැනැත්තාගේ පුද්ගලික අභිමතය අනුව ඒවා සිදු වෙති යි යන්න සලකමිනි. කෙසේ වෙතත් ආර්ථික විද්‍යාඥයන් සිය අවධානය යොමු කරන්නේ එම අභිමතය සාක්ෂාත් කර ගැනීමට පුද්ගලයන් කටයුතු කරන ආකාරය ගැන පමණි.

එහෙත් සිය ආයෝජන සඳහා උපරිම ලාභයක් ලබා ගැනීමට කටයුතු කරන පුද්ගලයා ද තම සගයන්ගේ දිවි ගලවා ගැනීම සඳහා සිය ජීවිතය පූජා කරන සොල්දාදුවෙකු ද කරන ක්‍රියාව එකිනෙකට වෙනස් වුව ද දෙදෙනා ම කරන්නේ අර කියන උපයෝගීතාව වෙනස් ආකාරවලින් උපරිම කර ගැනීමේ කටයුත්තක් බව *Identity:The Demand for Dignity and the Politics of Resentment* නමැති කෘතියේ ෆ්‍රැන්සිස් ෆකුයාමා පෙන්වා දෙයි[133]. ඒ අනුව මූලධර්මවාදී ත්‍රස්තවාදියෙකු සිය දිවි නසා ගන්නා බෝම්බ කරුවෙකු බවට පත් වන්නේ ආගමික වීරයෙකු වීම සහ මරණින් මතු අත්බවයේ ලැබෙන කන්‍යාවන් ගණනාවකගේ පහස විඳ ගැනීමට ඇති හැකියාව සිය ක්‍රියාවේ උපයෝගීතාව උපරිම කර ගැනීමක් ලෙස සලකමිනි.

එහෙත් ලෞකික හා ද්‍රව්‍යයමය අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමේ ස්වාර්ථය ගැන කියන ආර්ථික සිද්ධාන්තවලින් අර කියන සොල්දාදුවාගේ හෝ බෝම්බකරුවකු වී ජීවිතක්ෂයට පත් වන මූලධර්මවාදියාගේ චර්යාව විස්තර නො කරයි. ඒ නිසා ඇතැම් අය ධනය සහ ලෞකික සම්පත් හඹායන අතර තවත් අය ස්වාර්ථය ඉක්මවා ගොස් කිසියම් ඇදහිල්ලක් මුල්කරගත් ව්‍යාපාරයක් සඳහා ජීවිත පූජා කරන්නේ ඇයි ද යන්න විස්තර කෙරෙන සිද්ධාන්තයක් අපට තිබිය යුතු බව ෆකුයාමා පෙන්වා දෙයි.

133 Fukuyama, Francis (2019) *Identity: The Demand for Dignity and the Politics of Resentment,* New York: Farrar, Straus and Giroux, p.24

ලෞකික අවශ්‍යතා මුල් තැනෙහි ලා කටයුතු කිරීම මනුෂ්‍ය ස්වභාවය බව නවලිබරල්වාදී මෙන් ම මාක්ස්වාදී යන ආස්ථාන දෙකට ම අයත් ආර්ථික විද්‍යාඥයන්ගේ පොදු පිළිගැනීමකි. කෙසේ වෙතත් චර්යාවක් වසයෙන් එම අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට පෙලඹීම පිළිබඳ ව ආර්ථික විද්‍යා සිද්ධාන්තවලට තිබෙන්නේ බෙහෙවින් පටු සීමිත අර්ථකථනයකි.

ද්‍රව්‍යයමය අවශ්‍යතා අතිශයින් වැදගත් බව අවිවාදිත ය. ඒ අනුව ද්‍රව්‍යයමය අවශ්‍යතා පිළිබඳ උපයෝගීතාව වැඩි කර ගැනීමේ අදහසින් මනුෂ්‍ය චර්යාව ද ප්‍රතිචාරය දක්වන බව නිවැරදි ය. චීන කොමියුනිස්ට් පක්ෂය විසින් මුලින් ම හඳුන්වා දුන් ක්‍රමය යටතේ කොමියුනිස්ට් චීනයේ ගොවීන්ට තමන් විසින් නිපදවන අතිරික්ත අස්වැන්නට හිමිකම් කීමට ඉඩ නො ලැබුණි. ඒවා සමස්ත ජනතාවගේ ප්‍රයෝජනය සඳහායි යන පදනම මත රජය සතු විය. එහි ප්‍රතිඵලය වුණේ කිසිදු ආකාරයක අතිරික්තයක් ඉපදවීමෙන් වැළකී සිටීමට එකල චීන ගොවියන් වග බලා ගැනීම යි. ඒ අනුව අස්වැන්නේ බලාපොරොත්තු වූ වැඩි වීම සාක්ෂාත් කර ගැනීමට චීන රජයට නො හැකි විය. එහෙත් එම ප්‍රතිපත්තිය වෙනස් කොට අතිරික්තය තමන්ට අවශ්‍ය පරිදි විකුණා ගැනීමට ගොවියන්ට ඉඩ දුන් විට චීනයේ සමස්ත අස්වැන්න දෙගුණයක් ඉක්මවා ඉහළ ගියේ ය.

මේ අනුව ද්‍රව්‍යයමය අවශ්‍යතා පිළිබඳ මනුෂ්‍ය චර්යාවේ ස්වභාවය නිර්ණය වෙන සාධක බොහෝමයක් සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාව නිවැරදි විය හැකි නමුත් සියලු ම චර්යා වර්ග එම අර්ථකතනවලින් පමණක් තේරුම් කළ නො හැකි ය. *Thinking Fast and Slow* නමැති පොත ලියූ මනෝවිද්‍යාව පිළිබඳ කීර්තිමත් විශේෂඥයෙකු වන ඩැනියෙල් කාහ්නෙමන් පෙන්වා දෙන පරිදි මිනිසුන් ප්‍රායෝගික කටයුතුවල දී හැම විටම තාර්කිකව ක්‍රියාකරතැ'යි බලාපොරොත්තු නො විය යුතු ය. උදාහරණයක් වසයෙන් ඔහු පැහැදිලි කරන පරිදි තමන් විසින් ම මහන්සි වී සිතාමතා තෝරා බේරා වඩාත් ඵලදායක ප්‍රතික්‍රියාවක් සොයා ගන්නවාට වඩා මිනිස්සු

බොහෝ විට තමන් වටා සිටින උදවිය විසින් කරනු ලබන ප්‍රතික්‍රියාව පුරුද්දක් වසයෙන් ම අනුගමනය කිරීමට පෙලඹෙති[134].

මිනිසුන්ගේ චර්යාවට බලපාන හේතු සම්බන්ධයෙන් කළ චර්යා විද්‍යාත්මක පර්යේෂණ ඇසුරෙන් බ්‍රිතාන්‍ය රජය 2010 දී සිවිල් සේවා නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා *MINDSPACE* නමින් විමර්ශන හෙවත් සමුද්දේශ රාමුවක් *(frame of reference)* සකස් කළේ ය. *London School of Economics* හි සමාජ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය පෝල් ඩෝලන් ප්‍රමුඛ විශේෂඥයන් පිරිසක් විසින් සකස් කළ විශ්ලේෂණ වාර්තාවක් මේ සමුද්දේශ රාමුවට පදනම් විය[135]. අපරාධ වැඩි වීම, වැඩි වන තරබාරුකම, පරිසර තිරසාරත්වය ආදි විවිධ ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති පිළියෙල කිරීමේ දී ඇතිවෙන අභියෝග ජය ගැනීමට එකී සමුද්දේශ රාමුව යොදා ගත හැකි යැයි යෝජනා විය. කිසිදු බලහත්කාරයකින් තොර ව පුරවැසියන් මෙන් ම සේවකයන් ද ප්‍රතිචාර දක්වන සාධක නවයක් ඇති බවත් ඵලදායක ලෙස ප්‍රතිපත්ති සම්පාදනයට එම සාධක උපයෝගී කර ගත හැකි බවත් වාර්තාවෙන් කියැවිනි. "ඒ අනුව බලහත්කාර බලයකින් තොර ව සියල්ලන්ගේ ම චර්යාවට බලපාන ප්‍රබලතම සාධක නවය අපි මෙසේ හඳුන්වා දෙ මු" යැයි සඳහන් කරමින් වාර්තාව ඒ කරුණු නවය පහත දැක්වෙන පරිදි ගෙන හැර දක්වයි.

- පණිවිඩකරු *(Messenger)* - අපට තොරතුරු ලබාදෙන පණිවිඩකරු කවුද යන්න මත අප සිතන ආකාරය තීරණය වෙයි.
- දිරිගැන්වීම් *(Incentives)* - දිරිගැන්වීම් සම්බන්ධ අපේ ප්‍රතිචාර බොහෝ විට හානි මඟ හරවා ගැනීමට ඇති හැකියාව වැනි වහා සිහියට එන මානසික ප්‍රතික්‍රියා මත රඳා පවතී.

134 Kahneman, Daniel (2013), *Thinking, Fast and Slow,* New York: Farrar, Straus, and Giroux.

135 https://www.instituteforgovernment.org.uk/sites/default/files/publications/MINDSPACE.pdf Retrieved on 21Aug 2021

- ප්‍රතිමාන *(Norms)* - අන් අය කටයුතු කරන ආකාරය අනුකරණය කිරීමේ ප්‍රවණතාව ප්‍රබල ලෙස අපට බලපායි.
- පෙරනිමිය *(Defaults)*- බොහෝ විට අපි අපට නිතර හුරු පුරුදු වූ පටිපාටි අතුරෙන් එකක් තෝරා ගැනීමට කැමැත්තෙමු.
- විෂදබව *(Salience)* - අපට හොඳින් ගැළපෙතැයි අප සිතන අලුත් ම දේවල්වලට අපේ ඇති ආකර්ෂණය විසින් ද අපේ චර්යාව මෙහෙයවනු ලැබේ.
- පූර්වගමනය *(Priming)* - අපේ ක්‍රියාකාරකම් බොහෝ විට ක්ෂණික උපවිඥානික ඉඟිය අනුව මෙහෙයවෙයි.
- ආවේදනය *(Affect)*- අපේ මනෝභාවික *(emotional)* සබඳතාවලට අපේ ක්‍රියාකාරකම් ප්‍රබල ලෙස හැඩ ගැස්විය හැකි ය.
- කැපවීම් *(Commitments)* - අපේ සාමාන්‍ය නැඹුරු ව ප්‍රසිද්ධියේ පොරොන්දු වූ දේවල් ඉටු කිරීම සහ ප්‍රත්‍යුපකාරයයි.
- අහංභාවය - *(Ego)* අපේ මමංකාරය වඩවන නොහොත් අප ගැන ම සතුටක් දැනෙන ආකාරයට කටයුතු කිරීමට අප තුළ ඇති ආවේණික නැඹුරුව මත ද අපේ චර්යාව තීරණය වෙයි.

මිනිස්සු තාර්කික තෝරා ගැනීම් කරන ආර්ථික සත්වයන් ය යන සාම්ප්‍රදායික ආර්ථික විද්‍යා සිද්ධාන්තය නූතන චර්යා ආර්ථික විද්‍යාඥයන්ගේ ද දෝෂදර්ශනයට ලක් වී ඇත. අවුරුදු 150ක් තිස්සේ සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාවේ පැවත ආ තාර්කික ආර්ථික මිනිසා පිළිබඳ අදහස චර්යා ආර්ථික විද්‍යාව *(Behavioral Economics)* රැඩිකල් ලෙස බැහැර කරයි.

ස්වාර්ථකාමී තාර්කිකත්වය යන අදහස ඇරිස්ටෝටල්ගේ කාලයේ සිට පැවත එන අදහසකි. එයට අනුරූප ව මනුෂ්‍යයා ස්වභාවයෙන් ම ආත්මාර්ථකාමීය යන අදහස ද පෘථුල ව පවතින්නකි. ඒ අදහස සජීවී ව තබා ගැනීමට ඇතැම් දේශපාලන හා සංස්කෘතික න්‍යාය ද කටයුතු කර තිබේ. 19 වන සිය වසේ විසූ

බ්‍රිතාන්‍ය ජාතික දේශපාලන දාර්ශනිකයෙකු වූ හර්බට් ස්පෙන්සර් විසින් ඉදිරිපත් කළ සමාජ-ඩාවින්වාදය *(Social Darwinism)* එබඳු අදහසකි. සත්ව පරිණාමය පිළිබඳ ඩාවින් විසින් තහවුරු කරන ලද න්‍යාය විකෘත කරමින් ඇති හා නැති අය අතර පරතරය තේරුම් ගැනීමට ස්පෙන්සර් ඉදිරිපත් කළ *Survival of the Fittest* හෙවත් 'ප්‍රබලතමයාගේ ප්‍රවර්තනය' යන ප්‍රකට කියුම ඇති වූයේ ඒ නිසා ය. සමාජ ඩාවින්වාදයට අනුව ජීවිතය සාර්ථක කර ගන්නා අය අනෙක් අයට අත දීම වැරදි ය. මන්ද ඒ නිසා ජීවිතය සාර්ථක කරගත් අය පහළට ඇද ගැනීමට ජීවත් වීමට අරගල කරන අය විසින් තැත් කරනු ඇති බැවිනි. මේ හා සමාන ආත්මාර්ථකාමී ආකල්පයක් ව්‍යාපාර ලෝකයෙන් ද බෙහෙවින් අසන්නට ලැබේ.

කුඩා ව්‍යාපාර පාගා ගෙන මහා ව්‍යාපාර ව්‍යාප්ත වීම අනුමත කළ ඇමෙරිකානු ප්‍රකෝටිපතියෙකු වූ ජෝන් ඩී රොකෆෙලර් එය "ස්වභාවධර්මයට අනුකූලව සිදුවන්නක්"යැ'යි පැවසුවේ ස්පෙන්සර්ගේ සමාජ ඩාවින්වාදයට අනුව ය. ඩොලර් බිලියන 60 ක වත්කම් හිමි ව තිබී 2001 දී බංකොලොත් බව ප්‍රකාශ කරන ලෙස ඉල්ලීමට පෙර ඇමෙරිකානු බල ශක්ති ක්ෂේත්‍රයේ දැවැන්තයෙකු වූ කුප්‍රකට එන්රොන් සමාගම විදුලිය මිල ඉහළ නැංවීමට කෘත්‍රිම විදුලි බල ඇනහිටීම් හා විදුලි බලය අවහිර කිරීම් වැනි අසික්කිත උපක්‍රම යොදා ගත් අන්දම එළිදරව් වීම ප්‍රකට කරුණකි.[136] එම නිහීන උපක්‍රම නිසා ශ්වසන යන්ත්‍ර සහ විදුලි සෝපාන යන්ත්‍ර හිටි හැටියේ අතර මග නතර වීම නිසා මිනිසුන් මුහුණ දුන් අකරතැබ්බ ගැන හෙළි වූ අප්‍රසන්න කරුණු ඇතැම් දැවැන්ත ව්‍යාපාරවල වනචර ආත්මාර්ථකාමයට උදාහරණයෝ ය.

ආවේණික ව ම මිනිසුන් ආත්මාර්ථකාමී ය යන අදහස ඇතිවීමට තුඩු දුන් එක හේතුවක් වූයේ මිනිසුන් ස්වභාවයෙන් ම ප්‍රචණ්ඩකාරී ය, කලහකාරී ය යන විශ්වාසය විය හැකි බව වානර චර්යාව පිළිබඳ විශේෂඥයෙකු වන ෆ්‍රාන්ස් ඩි වාල් පවසයි. දෙවන

136 https://www.theguardian.com/business/2005/feb/05/enron.usnews - Retrieved on 22 Aug. 2021

ලෝක යුද්ධය අවසන් වන විට බ්‍රිතාන්‍ය අගමැති ව සිටි වින්ස්ටන් චර්චිල් වරක් පැවසූ අන්දමට "මිනිසාගේ කතන්දරය යනු යුද්ධයේ කතන්දරයයි. ඉඳහිට ඇති වූ විරාමයක දී හැරෙන විට ලෝකයේ කිසි දිනක සාමය නො තිබිණි. ඉතිහාසය ඇරඹීමට පෙර ද මේ මිනීමරු අභිප්‍රාය සර්වව්‍යාපී නො නවතින දෙයක් විය."

එහෙත් ඉතිහාසය සමීප ව විමසුමට ලක් කළ විට චර්චිල්ගේ නිගමනයේ සත්‍යයක් නො තිබෙන බව පෙනේ. වඩාත් නිවැරදි වන්නේ මානව ඉතිහාසය යනු දීර්ඝ කාලීන සාමය සමඟ ඉඳ හිට කෙටි සටන් උද්ගත වූ ඉතිහාසයක් බවයි. උදාහරණයක් ලෙස ලෝකයේ පැරණි ම නගරයක් වන පරණ තෙස්තමේන්තුවේ සඳහන් ජෙරිකෝ නගරය වටා ඉදි කර තිබූ පවුරු ආරක්ෂක පවුරක් වසයෙන් කලක් තිස්සේ සැලකුව ද ඇත්ත වසයෙන් ම එය ඉදි කර තිබුණේ මඩ ප්‍රවාහ ගලා ඒම වැළැක්වීමට සඳහා බව වඩා මෑත දී කරන ලද පුරා විද්‍යා පර්යේෂණවලින් හෙළි වී තිබේ. ඉන් පෙර ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවතුණයි විශ්වාස කළ යුද්ධ පිළිබඳව ඇති ව තිබූ සාවද්‍ය මත ගැන මාක් ඩබ්. ඇලන් සහ ටෙරි ජෝන්ස් සංස්කරණය කළ *Violence and Warfare of Hunter Gatherers* කෘතියේ මෙසේ සඳහන් කරයි:

> **"මේ පරීක්ෂණවලින් සොයා ගත් තොරතුරු සම්භාරය කෙසේ වුව ද ප්‍රාග් ඓතිහාසික යුද්ධ පිළිබඳව පුරාවිද්‍යාව විසින් නො තකා හරින ලද ඉතා වැදගත් සාධකයක් වෙයි. ස්වදේශික යුද්ධ හා ප්‍රචණ්ඩ ක්‍රියා සාරාංශ ගත කොට ලියන ලද බොහෝ කෘති දඩයමින් යැපුණු සමාජ ගැන සලකා බලා තිබුණ ද එවැනි සමාජ සහ සමකාලීන කෘෂි ගොවි සමාජ අතර තිබූ වෙනස ගැන සලකා බලා නැත. මේ මගහැරීමෙන් නිරූපණය වන්නේ පූර්ව ශිෂ්ටාචාර යුගයේ පැවති සමාජ රටාව ගැන නො සිතා හුදෙක් ස්වදේශික යුද්ධවල දරුණු ගති ලක්ෂණ සහ ප්‍රචණ්ඩ බව උලුප්පා පෙන්වීමට තිබූ අභිලාෂය යි.".[137]**

ඒ හැර නිව්ගිනිහි ගෝත්‍ර අතර පැවති ආක්‍රමණශීලී ක්‍රියාවන්ට බොහෝ විට හේතු වුණේ තමන්ගේ රැහෙන් පිට ස්ත්‍රීන් ලබා ගැනීමේ

137 Allen W.M, (2014) Hunter Gatherer Conflict: *The Last Bastion of the Pacified Past? in Violence Warfare Among Hunter Gatherers,* Mark W. Allen & Terry L Johns (eds.), Walnut Creek: Left Coast Press, p.16

ජීව විද්‍යාත්මක අවශ්‍යතාව විසින් මෙහෙය වූ සහෘද කණ්ඩායම් අන්‍ය ගෝත්‍රික ස්ත්‍රීන් පැහැර ගැනීම සිරිතක් කර ගැනීම නිසා බව ද මානව විද්‍යාඥයෝ පෙන්වා දෙති. එය වෙනත් කණ්ඩායම්වලට එරෙහි ව ප්‍රචණ්ඩත්වය පවත්වා ගැනීමට වඩා තම ඥාති කණ්ඩායම තුළ ම ප්‍රජනනය සිදුවීමෙන් ඇති විය හැකි දුර්වලකම් වළක්වා ගැනීම පිණිස උපයෝගී වූ ක්‍රියාන්විතයක් බවයි ඉන් අදහස් වන්නේ.

ස්වාර්ථය ම සලකන 'හෝමෝ එකොනොමිකස්' හෙවත් ආර්ථික මිනිසා යනු ප්‍රධාන ධාරාවේ ආර්ථික චින්තනයේ හරය වසයෙන් සැලකිය හැකි මූලධර්මයකි. හෝමෝ එකොනොමිකස් යන නිර්වචනය මඟින් කෙරෙන්නේ මනුෂ්‍යයන් ආවේණික වසයෙන් ම සබුද්ධික එහෙත් පුද්ගල ස්වාර්ථය ම මුල් කොට ගත් සත්ව කොට්ඨාසයක් ලෙස නිරූපණය කිරීමයි.

වඩා සාධාරණ, සහෝදරකාමී සහ තිරසාර ආර්ථික අනාගතයක් ගැන ඵලදායක කතිකාවක් ඇති කිරීමට මිනිසුන්ට නොහැක්කේ ස්වභාවයෙන් ම උරුම වන මෙකී හෝමෝ එකොනොමිකස් ගති ගුණ නිසා යැ'යි ඇතැම් අය අදහති. 'මිනිස්සු ස්වභාවයෙන් ම ආත්මාර්ථකාමීහු ය. ඒ නිසා විශ්වාසය, සාධාරණත්වය මත පදනම් වූ කිසි ම දෙයක් හෝ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය හෝ මිනිසුන් සමඟ ඉස්ට කරන්න පුළුවන් දේවල් නො වෙයි' යනුවෙන් අනන්තවත් අප අසා ඇති බවට සැකයක් නැත.

මේ හෝමෝ එකොනොමිකස් නමැති අභිධානය අපට ආවේ කොහෙන් ද? එමඟින් අදහස් කරන සදාතනික ආත්මාර්ථකාමී බව සත්‍යයක් ද? අපි හුදෙක් ස්වාර්ථය ම සලකන අය ද? නැතහොත් අපේ කරුණාවන්ත, සහානුකම්පිත, පරාර්ථකාමී ස්වභාවය යටපත් කරන වැරදි අර්ථ නිරූපණ නිසා ආත්මාර්ථකාමීන් යැ'යි හංවඩු ගසන ලද්දෝ ද? නැතහොත් අපේ සත්‍ය ස්වභාවය ඒ දෙඅන්තය අතර දෙයක් ද?

පුරාවිද්‍යාවේ සිට අපරාධ විද්‍යාව දක්වා වූ ක්ෂේත්‍රවල නවතම විද්‍යාත්මක සොයා ගැනීම් දෙස බැලුවොත්, හෝමෝ එකොනොමිකස්

අභිධානයෙන් යුක්ත ව ආත්මාර්ථකාමිත්වය පිළිබඳ කිරුළ දරා සිටිනවාට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් වූ ආඛ්‍යානයක් සොයා ගැනීමට අපට හැකි වනු ඇත. අප සහජයෙන් ම ආත්මාර්ථකාමී නො වන බවත් අප මුහුණ දෙන අර්බුද ස්වයංක්‍රීය ව අපව ම්ලේච්ඡයන් බවට පත් නො කරන බවත් රට්ගර් බ්‍රෙග්මන් සිය *Humankind* නමැති කෘතියෙන් පෙන්වා දෙයි. .

බ්‍රෙග්මන් උපුටා දක්වන අන්දමට යුද්ධය වැනි අර්බුදවල දී ජනතාව භීතියට පත්වන අතර ඔවුන්ගේ සැබෑ ස්වභාවය නො පිට හැරී ප්‍රචණ්ඩකාරී හා ආත්මාර්ථකාමීන් බවට පත් වෙන අයුරු 1885 දී ප්‍රංශ ජාතික ගුස්ටාව් ලෙ බොන් සිය *The Psychology of Crowds* නම් කෘතියෙන් විස්තර කර තිබුණි. දෙවැනි ලෝක මහා යුද්ධයට නායකත්වය දුන් ඇඩොල්ප් හිට්ලර්, ජෝසප් ස්ටාලින්, බෙනිටෝ මුසොලිනි, වින්ස්ටන් චර්චිල් සහ ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් ද එම තෘතිය කියවා තිබුණි. ලෙ බොන්ගේ මතයට අනුව, මිනිසුන් තම ජීවිත ගැන බිය වන විට ම්ලේච්ඡයන් බවට පත් වේ. එවිට ඔවුන් තමන්ගේ පුද්ගලික පැවැත්ම හැර අන් කිසිවක් ගැන සැලකිලිමත් නො වේ. 1940 දී හිට්ලර් සිය බෝම්බ හෙලන ලුෆ්ට්වාෆ් ගුවන් යානා 348 ක් ලන්ඩනයට යවන විට ලෙ බොන්ගේ අදහස් මත පිහිටා කටයුතු කරන්නට ඇති බව නිසැක ය. ඒ අනුව බෝම්බ වැස්සෙන් ලන්ඩනයේ වැසියන් සංත්‍රාසයට හා ම්ලේච්ඡත්වයට පත් වනු ඇතැ'යි හිට්ලර් විශ්වාස කළේ ය.

මෙවැනි බෝම්බ වර්ෂාවක් නිසා ඇතිවිය හැකි භීතිකාවට හා භින්නෝන්මාදයට ප්‍රතිකාර කිරීමේ අපේක්ෂාවෙන් හදිසි මනෝ චිකිත්සක වාට්ටු ගණනාවක් කල් තියා ලන්ඩනයේ ඉදි කර තිබුණි. 'බ්ලිට්ස් *(Blitzs)* ක්‍රියාත්විතය' යනුවෙන් හැඳින්වුණ එම බෝම්බ වර්ෂාව නිසා ලන්ඩනයේ පමණක් 40,000කට අධික පිරිසක් මරණයට පත් වූහ. එහෙත් අරුමයකට මෙන් මනෝචිකිත්සක වාට්ටු භාවිත කිරීමට තරම් මනෝභීතිකාවක් ලන්ඩන් වැසියන් තුළ උද්ගත නො වී ය.

ජර්මන් ගුවන් ප්‍රහාර බොහෝ කලක සිට පැවතුණ ද, බ්‍රිතාන්‍යයන් සිය දෛනික ජීවිතය අඩු වැඩි වසයෙන් සාමාන්‍ය පරිදි ගත කළ ආකාරය බොහෝ නිරීක්ෂකයන් විස්තර කර තිබේ. ළමයින් සෙල්ලම් කළ අතර ස්ත්‍රීහු සාමාන්‍ය පරිදි සාප්පු සවාරියේ ගියහ. දුම්රිය ද නො කඩවා ධාවනය විය. බෝම්බ පිපිරීම නිසා ඇති වූ කම්පනයට වීදුරු ජනේල ඉරි තැළී බිඳී ගිය ද ලන්ඩනයේ වැසියෝ සන්සුන්ව තේ පානය කළහ.

එලෙස ලන්ඩන් වැසියන් අනපේක්ෂිත ලෙස සන්සුන් ව සිටියා පමණක් නො ව - බොහෝ ආකාරවලින් ඔවුහු වෙන කවරදාකටත් වඩා මානසික වසයෙන් යහපත් වූහ. බෝම්බවලින් ඇති වූ මරණ නිසා ඔවුන් තුළ හෘදයංගම ශෝකයක් ඇති වී තිබුණු බව සැබෑවක් වූ නමුත් අධික මත්පැන් පානය ද සිය දිවි නසා ගැනීම් ද බෙහෙවින් අඩු වී තිබුණි. බියෙන් වියරු ව ඇන කොටා ගන්නා නගර වැසියන් දැකීමට බලාපොරොත්තු වූ හිට්ලර්ගේ 'බ්ලිට්ස්' ක්‍රියාන්විතයෙන් සිදු වුණේ ලන්ඩන් වැසියන් එකිනෙකාගේ ඕනෑ එපාකම් සොයා බලමින් සහානුකම්පාවෙන් සාමූහික ව කටයුතු කිරීමට පෙලඹීම යි. යුද්ධය අවසන් වූ විට, බොහෝ ලන්ඩන් වැසියෝ යුද සමය ගැන කාංසාවෙන් කතා කළහ. සාමාන්‍ය තත්ව යටතේ සිදු වෙනවාට වඩා මිනිසුන් එකිනෙකාට උදව් කරමින් වගා කරගත් සුහදත්වය ඔවුන්ගේ මතකයේ නිරන්තරයෙන් රැඳී තිබුණි. කොටින් ම, ලන්ඩන් වැසියෝ හිට්ලර්ගේ අපේක්ෂා කඩාකප්පල් කළ අතර ගුස්ටාව් ලෙ බොන්ගේ න්‍යාය ද බොරු කළහ.

පැවැත්ම පිළිබඳ තර්ජනයක් නිසා නිරායාසයෙන් ම මනුෂ්‍ය ස්වභාවය කුරිරු බවට පත් නො වන බවත් ඒ නිසා ම මිනිසුන් ස්වභාවයෙන් ම ආත්මාර්ථකාමී වෙතැ'යි කීම නිවැරදි නො වන බවත් ලන්ඩන් වැසියෝ ඔප්පු කළහ. ඇත්ත වසයෙන් ම යුද්ධය ඔවුන්ට ප්‍රායෝගික ව ම පෙන්වා දී තිබුණේ සහානුකම්පිත ව සාමූහික ව කටයුතු කිරීම එවැනි අවස්ථාවල දී පැවැත්ම පිළිබඳ තර්ජනයට මුහුණ දිය හැකි හොඳ ම ආකාරය බව යි. ලෙ බොන්ගේ නිබන්ධනයට

පටහැණි ව, හිට්ලර්ගේ 'බ්ලිට්ස්' ක්‍රියාන්විතය බොහෝ ආකාරවලින් බ්‍රිතාන්‍ය සමාජය ශක්තිමත් කළේ ය. හිට්ලර් සිය සැබෑ ඉලක්කයට හරියටම ප්‍රතිවිරුද්ධ විපාකයක් අත් කර ගෙන තිබුණි.

යුද සමයේ දී බ්‍රිතාන්‍යයන් දැක් වූ සන්සුන් භාවය අද පවා ඔරොත්තු දීමේ හැකියාව බ්‍රිතාන්‍ය චරිතයේ ඉතා වැදගත් අංගයක් ලෙස හුවා දැක්වීමට සාක්ෂියක් ලෙස යොදා ගැනේ. එහෙත් ඇත්ත වසයෙන් එය හුදෙක් බ්‍රිතාන්‍යයන්ට පමණක් සීමා වූවක් නො ව මනුෂ්‍ය සංහතියේ ම සහජ ගති ලක්ෂණයකි. මාරාන්තික ආවේගවලට නො නැමී, බ්‍රිතාන්‍යයන් හැසිරුණු ආකාරයට අනුරූප ව ව්‍යසනය හමුවේ කලබල නො වී සාමූහික ව සහානුකම්පාවෙන් කටයුතු කිරීමට මිනිසුන් පෙලඹෙන බව තහවුරු කරන එවැනි උදාහරණ ගණනාවක් ම වෙයි. නිදසුනක් ලෙස දක්වනවා නම් 2001 සැප්තැම්බර් 11 දින නිව්යෝක් නුවර වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර් කුලුනු යුගලයට එල්ල කළ ත්‍රස්තවාදී ප්‍රහාරයත් සමඟ, සාමාන්‍යයෙන් ආත්මාර්ථකාමී යැ'යි හැඳින්වෙන නිව්යෝර්ක් වැසියන් අන් අයගේ ජීවිත බේරා ගැනීම සඳහා තම ජීවිතය පරදුවට තබා ඉදිරිපත් වූ අන්දම ගත හැකි ය. එම අර්බුදය විසින් දිරි ගන්වන ලද්දේ ම්ලේච්ඡත්වය නො ව සහයෝගීතාව යි.

ඉතිහාසය නැවත නැවතත් පෙන්නුම් කරන්නේ ව්‍යසන වැනි ආන්තික අවස්ථාවල දී මිනිසුන්ගේ යහගුණය කැපී පෙනෙන ලෙස ඉස්මතු වන බව යි. ආපදාවකින් පසු මිනිසුන් ආත්මාර්ථකාමයකින් තොර ව ක්‍රියා කිරීමට පෙලඹෙන බව ඩෙලවාර් විශ්ව විද්‍යාලයේ ආපදා පර්යේෂණ මධ්‍යස්ථානය ක්ෂේත්‍ර පරීක්ෂණ 700 කින් ලබාගත් දත්ත මත නිගමනය කළ බව රට්ගර් බ්‍රෙග්මන් පෙන්වා දෙයි. ව්‍යසනයකින් පසු මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ සහ හොරකම් කිරීම අඩු වෙන නමුත් සාමාන්‍ය මතය වන්නේ එවැනි තත්වයක් තුළ මිනිසුන් තිරිසනුන් මෙන් හැසිරෙන බවයි. 2005 කැත්‍රිනා සුළි කුණාටුව ඇමෙරිකාවේ නිව් ඕර්ලියන්ස් නගරයට බලවත් හානියක් කරමින් හමා ගිය අවස්ථාවේ දී වෙළඳසැල් කොල්ල කෑම සම්බන්ධ

ඇඟ කිලිපොළා යන කතන්දර ජනමාධ්‍යයෙන් ප්‍රචාරය විය. එහෙත් ඒ පිළිබඳ ව පසු ව සිදු කළ සමාජ විද්‍යාත්මක ගවේෂණවලින් හෙළිවුණේ එම සිදුවීම්වලින් බොහෝමයක් ම ආත්මාර්ථකාමී මංකොල්ල කෑම් නිසා ඇති වූ සිදුවීම් නො ව නිවාස කැඩී බිඳී යෑම නිසා දහස් සංඛ්‍යාත ගණනින් විතැන්ව අධිකාරීන්ගේ හව්හරණයකින් තොර ව සරණාගතයන් බවට පත් ව සිටි සහෝදර නගරවාසීන්ට ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමට තරුණයන් විසින් කරන ලද රොබින් හුඩ් වර්ගයේ සොරකම් බවයි.

එහෙත් අපි නිරතුරුව ම මනුෂ්‍යත්වය පිළිබඳ අප විසින් මවා ගෙන ඇති නිෂේධාත්මක ප්‍රතිරූපයට ඇලුම් කරමු. ජනමාධ්‍ය වාර්තා කරන්නේ සාමාන්‍ය දේවල් ලෙස නො සැලකෙන අසාමාන්‍ය සිදුවීම් සහ පුද්ගල චර්යා ය. සිදුවීමක් ප්‍රවෘත්තියක් වසයෙන් සලකනු ලබන්නේ එය අසාමාන්‍ය නම් පමණි. අතන සිදු වන ත්‍රස්තවාදී ප්‍රහාරයක්, මෙතැන සිදු වන ස්වාභාවික ව්‍යසනයක් ආදි වසයෙන් කෙරෙන ප්‍රවෘත්ති ප්‍රකාශ යනු බොහෝ විට වේදනාව හා අවාසනාව පෙළ ගස්වන අවමගුල් පෙරහැරක් බඳු ය. දිනපතා ප්‍රවෘත්තිවලින් අප නිරන්තරයෙන් ම නිරාවරණය වන්නේ අයහපත පිළිබඳ කතන්දරවලට ය. ‘අද යුරෝපයේ යුද්ධයක් ප්‍රකාශයට පත් නො වී ය’ යනුවෙන් කියවෙන සිරස්තලයක් ඔබ කිසි විටෙකත් නො දකිනු ඇත.

දිනපතා ප්‍රවෘත්ති කියවන හෝ බලන අයට සහජයෙන් ම මිනිසුන් නරක ය යන හැඟීම ඇති වීම පුදුමයක් නො වේ. දේශපාලනඥයන්ගේ බොරු හා කපටිකම්වල සිට විවිධ පුද්ගලයන්ගේ වංචා සොරකම්, දූෂණ අඩු සැලකිලි දැක්වීම් හා මිනී මැරීම් දක්වා වූ කරුණු දිනපතා පාහේ ප්‍රවෘත්ති මඟින් අනාවරණය වන විට අපට සිතෙන්නේ මිනිසුන්ගේ මෘග ගති පැවතුම් නැවැත්විය හැක්කේ එකී අපරාධවලට දැඩි දඬුවම් ලබා දීම පිණිස ආණ්ඩුව විසින් නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම මඟින් පමණක් බවයි.

මෙවැනි ලෝකයක තමන් ගැන හිතන අයට හැර අන් අයට තැනක් නැත, හැම දෙයක් ම බලු පොරයක් වැනි ය. පැවැත්ම තහවුරු

කර ගන්නේ බලපුලුවන්කාරකම වඩාත් ම යොදා ගත හැකි පුද්ගලයා පමණි යන්න පොදු චින්තනය බවට පත් වීම පුදුමයක් නො වේ.

ප්‍රවෘත්ති පමණක් නො ව අපට කියවන්ට ලැබෙන බොහෝ ප්‍රබන්ධ කතන්දරවලින් ද මිනිසුන් සාමාන්‍යයෙන් ම දුෂ්ටය හෝ ආත්මාර්ථකාමීය යන හැඟීම ප්‍රචාරණය කරවයි. මේ කතන්දරවල අයථා ස්වභාවය පිළිබඳ උදාහරණයක් රට්ගර් බ්‍රෙග්මන් විසින් කළ කදිම විමර්ශනයකින් උපුටා දැක්විය හැකි ය. යොවුන් පාඨකයන් අතර බෙහෙවින් ජනප්‍රිය ප්‍රබන්ධ කතාවක් මෙන් ම එහි කතුවර විලියම් ගෝල්ඩින්ට නොබෙල් ත්‍යාගය හිමි වීමට හේතු වූ *Lord of the Flies* කෘතියට බ්‍රෙග්මන්ගේ අවධානය යොමු විය. ගෝල්ඩින්ට අවශ්‍ය ව තිබුණේ දූපතක හුදකලා වන ළමයින් හැසිරෙන ආකාරය විස්තර කරන 'සත්‍ය' තොරතුරු මත ප්‍රබන්ධ කතන්දරයක් ලිවීමට යි. ඔහුගේ නව කතාවේ එන අන්දමට පුරුදු සමාජයෙන් ඈත් ව හුදකලාව විසීම නිසා එකිනෙකා අතර ඇතිවෙන අවුල් සහගත අරාජික තත්වයකට පසු කතාවේ පාත්‍රවර්ගයා අතරින් ළමයි කිහිප දෙනෙක් මියයති. ගැටීම් වැළැක්වීම සඳහා නීත්‍යනුකූල බලයක් සහිත බේරුම්කරුවෙක් සමාජයක් තුළ නොමැති විට මිනිසුන් කෙබඳු ලෙස හැසිරේ ද යන්න මේ කතාව මඟින් තාත්වික ව නිරූපණය කිරීම සම්බන්ධයෙන් ගෝල්ඩින්ග් බොහෝ විචාරකයන්ගේ පැසසුමට ලක් විය.

එහෙත් මේ කතාවෙන් හෙළි කළ ගැටුම්කාරී චර්යාව පදනම් කරගත් සත්‍ය කථාව ගැන බ්‍රෙග්මන්ට සැක පහළ වී තිබුණි. ගෝල්ඩින්ගේ ප්‍රබන්ධ කතාවේ එන අන්දමින් දූපතක හුදකලා වූ ළමයින් පිරිසක් ඇත්ත වසයෙන් ම හැසිරී ඇත්තේ කෙසේ දැ'යි සොයා බැලීමට බ්‍රෙග්මන්ට අවශ්‍ය විය. ඒ අනුව 1966දි ළමයින් හය දෙනෙකුට පැසිෆික් සාගරයෙ පාලු දූපතක මාස 15ක් තිස්සේ හුදකලාව ජීවත් වීමට සිදුවූ සත්‍ය සිද්ධියක් ගැන සොයා බැලීමට ඔහුට හැකි විය.

එහෙත් එම සත්‍ය සිද්ධියේ දී ළමයින් හැසිරුණේ ගෝල්ඩින්ග්ගේ කථාවේ සඳහන් ආකාරයට වඩා හාත්පසින් ම වෙනස් අයුරින්

බව බ්‍රෙග්මන්ග්ට සොයා ගැනීමට හැකි විය. යථා ජීවිතයේ දී අරාජිකත්වයක් රජ නො කරයි. ඇත්ත වසයෙන් ම රංචු සරුවල් නො කර ගැනීමේ ගිවිසුමක් දූපතේ හුදකලා වූ ළමයින් විසින් ඇති කර ගෙන තිබුණි. ආහාර පුලුස්සා කෑම පිණිස ගිනිමැලයක් දල්වා ගත් ඔවුහු අවුරුද්දකට වැඩි කාලයක් එය සාමූහික ව පවත්වා ගෙන ගියහ. අවසානයේ දී දූපතට අහම්බයෙන් පැමිණි යාත්‍රාවකින් ගලවා ගනු ලැබූ ඔවුහු හයදෙනා ම අතිජාත මිත්‍රයන් වසයෙන් ඉතිරි කාලය දිවි ගෙවූහ. ඉදින් මේ කතන්දර දෙකෙන් මනුෂ්‍යයාගේ ඇත්ත ස්වභාවය පවසන කතාව කුමක් ද?

ඒ හුදකලා වු දරුවන් පිළිබඳ හද කකියන සුලු සත්‍ය කතන්දරය අහම්බයක් ද? එමඟින් අපේ සත්‍ය ස්වභාවය ඇත්තටම නිරූපණය නො කරන්නේ ද?

එහෙත් දාහත්වැනි සියවසේ ඉංග්‍රීසි දාර්ශනිකයෙකු වූ තෝමස් හොබ්ස් උපකල්පනය කළේ ස්වාභාවික තත්වයේ සිටින තාක් මිනිසුන් "නරක" බවයි - හොබ්ස්ට අනුව මිනිසුන් කටයුතු කරන්නේ ආත්මාර්ථකාමිත්වය මුල් කර ගෙන ය. රාජ්‍යයක් සහ නීති රීති නොමැති නම් මනුෂ්‍යත්වය යනු නිරන්තරයෙන් "සියල්ලන්ට එරෙහි සියල්ලන් විසින් කරනු ලබන යුද්ධයක්" බවට පත් වනු ඇතැ'යි හොබ්ස් ප්‍රකාශ කළේ ය. අප දැක ඇති පරිදි, මෙම ලෝක දෘෂ්ටිය අදටත් පවතී.

නමුත් හොබ්ස්ට මෙන් නො ව, අපට දැන් දාර්ශනික උපකල්පනයෙන් ඔබ්බට ගොස් ශිෂ්ටාචාරය උදා වීමට පෙර පැවති මිනිස් ජීවිතය පිළිබඳ වඩාත් ආනුභාවික චිත්‍රයක් ඉදිරිපත් කරන විවිධ විද්‍යාත්මක සාක්ෂි තිබෙන බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි.

මෑතක් වනතුරු ම, ක්ෂේත්‍ර කටයුතු සහ පුරාවිද්‍යාත්මක කැණීම් යන දෙක ම හොබ්ස්ගේ අසුභ ලෝක දෘෂ්ටිය සනාථ කරන බවක් පෙනෙන්නට තිබුණි. උදාහරණයක් ලෙස ඇමෙරිකානු මානව විද්‍යාඥයෙකු වූ නැපෝලියන් චැග්නොන්, ඇමසන් කලාපයේ

වෙසෙන යානෝමාමි දඩයම් ගෝත්‍රය ගැන අධ්‍යයනයකින් පසු ලියන ලද නිබන්ධනය සඳහන් කළ හැකි ය. එම අධ්‍යයනය පදනම් කොට 1968 දී චැග්නොන් ලියූ *The Fierce People* කෘතියේ ඔහු හුවා දැක්වූයේ යානෝමාමි ගෝත්‍රිකයන් නිරන්තරයෙන් ස්ථිර යුද්ධයක යෙදී සිටින බව යි.

එමෙන් ම මනෝ විද්‍යාඥ ස්ටීවන් පින්කර් විසින් 2011 දී තරම් මෑත දී පළ කළ *The Better Angels of Our Nature* නමැති ග්‍රන්ථයේ ඉදිරිපත් කළ සංඛ්‍යාත්මක විස්තරයකින් හොබ්ස්ගේ ආකල්පය අනුමත කරන බව පෙනේ. ඒ අනුව කැණීම්වල දී සොයා ගත් ඇටසැකිලි මත පදනම් ව, පින්කර් පෙන්වා දුන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මිනිසුන්ගෙන් සියයට 14 ක පමණ ප්‍රමාණයක් යුද්ධවලට ගොදුරු වන්නට ඇති බව යි. කෙටියෙන් කිව හොත්, ඒ 14% ඝාතනයට ලක් වූ අයයි. එහෙත් නූතන කාලවල දී, කොතෙකුත් යුද්ධ පැවතුණ ද ලොව පුරා මිනීමැරුම් අනුපාතය වන්නේ සියයට එකක් පමණි. හොබ්ස්ගේ සම්ප්‍රදායට අනුව යමින් "අප තුළ ඇති යුධකාමී ම්ලේච්ඡයා මෙල්ල කිරීමට හැකි වූයේ ශිෂ්ටාචාරයට පමණි." යනුවෙන් පින්කර් නිගමනය කළේ ය.

එහෙත් ස්ටීවන් පින්කර්ගේ නිගමනය සහ යානෝමාමි ගෝත්‍රිකයන් පිළිබඳ නැපෝලියන් චැග්නොන්ගේ නිරීක්ෂණ යන දෙක ම දෝෂ සහිත බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. ප්‍රථමයෙන් ම යානෝමාමි ගෝත්‍රිකයෝ පූර්ව ශිෂ්ටාචාර යුගයේ අපේ මුතුන් මිත්තන් ජීවත් වූ ආකාරය කිසි සේත් ම නියෝජනය නො කරති. චැග්නොන් සිය කෘතිය ප්‍රකාශයට පත් කරන විට, යානෝමාමි ගෝත්‍රිකයන් සැහෙන කලක් තිස්සේ ඇමසන් ගොවීන් හා නූතන නාගරිකයන් සමඟ සම්බන්ධකම් පවත්වා තිබුණි. චැග්නොන් පවා සිය ක්ෂේත්‍ර පර්යේෂණයේ දී ගෝත්‍රිකයන්ට පොරෝ සහ ගිනිකූරු වැනි භාණ්ඩ ද ලබා දී තිබුණි. ඒ අනුව ඔහුට නිරීක්ෂණය කරන්නට ලැබුණේ යැයි කියන යානෝමාමි ගෝත්‍රිකයන්ගේ ප්‍රචණ්ඩත්වය ශිෂ්ටාචාරයට අභිමුඛ වීමට පෙර සිට පැවත එන්නකැ'යි නිගමනය කිරීම සදොස් ය.

පින්කර්ගේ සංඛ්‍යා ලේඛනත් නිදොස් ඒවා නො වේ. යුද්ධවලින් 14% ජනගහනයක් ඝාතනය වී යැයි තහවුරු කිරීමට ඔහු විසින් උපුටා දක්වන කැණීම් විසි එකෙන් විස්සක් ම කෘෂිකර්මය හඳුන්වා දීමෙන් පසු මිනිසුන් ස්ථිර පදිංචිය තෝරා ගත් කාලවල දී සිදු වූ සිදුවීම්වලට අයත් ඒවා ය. ඒ අනුව පින්කර් හුවා දක්වන සංඛ්‍යා ලේඛන කෘෂිකර්මයට පෙර පැවති පූර්ව ශිෂ්ටාචාර යුගයේ මානව සමාජවල චර්යාව නිරූපණය කරන සංඛ්‍යා ලේඛන ලෙස සැලකිය හැකි නො වේ.

කෘෂිකර්මය හඳුන්වා දීමට පසු 'ශිෂ්ට' සම්පන්න වීමට පෙර අප ගල්යුගයේ දී ගත කළ ජීවිතය පිළිබඳ වඩා විශ්වාසදායක සාක්ෂියක් ලෙස ඒ කාලයට අයත් ගුහා චිත්‍ර සැලකිය හැකි ය. එවැනි ගුහා සිතුවම් ප්‍රංශයේ සිට ඉන්දුනීසියාවේ සුලවෙසි දූපත් දක්වා ලෝකයේ විවිධ තැන්වලින් සොයා ගෙන තිබේ. ප්‍රංශයේ සහ ස්පාඤ්ඤයේ පමණක් එවැනි චිත්‍ර සහිත ගුහා 350 කට කිට්ටු සංඛ්‍යාවක් සොයා ගෙන තිබේ. වඩාත් ජීවමාන ලෙස චිත්‍රණය කරන ලද සිතුවම් ලැස්කෝ සහ ඇල්ටමීරා වැනි ගුහාවල දක්නට ලැබේ. දඩයම් යුගයට අයත් යැයි සැලකෙන චිත්‍ර ඇති බොහෝ ගල්ගුහාවල නිරූපණය වන්නේ දඩයමට ගොදුරු වන සතුන් සහ දඩයම් කිරීම පිළිබඳව සිතුවම් ය. එහෙත් ඒ අතරින් මිනිසුන්ගේ ප්‍රචණ්ඩත්වයක් හෝ යුද්ධයක් හෝ නිරූපණය කරන කිසිදු සිතුවමක් සොයා ගෙන නැති බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. ඇතැම් ගුහාවල මිනිසුන්ට විදින දුනුවායන්ගේ රූප සටහන් හමු වී ඇති නමුත් ඒවා වඩා මෑතක දී එනම් කෘෂිකාර්මික යුගයේ දී ඒ වන විටත් ගල්ගුහාවල ජීවත් වූ දඩයමින් යැපුණු මිනිසුන් විසින් අඳින ලද ඒවා බව සැලකේ.

අපේ අතීතය අධ්‍යනය කරන නූතන මානව විද්‍යාඥයන්ගේ මතය වන්නේ දඩයමින් හා වන සම්පතින් ජීවත් වූ යුගයේ දී තැනින් තැන සැරිසරමින් දිවි ගෙවූ මිනිස් කණ්ඩායම් තුළ ප්‍රචණ්ඩත්වය යනු ඉතා කලාතුරකින් දක්නට ලැබුණු දෙයක් බවයි. ඒ වෙනුවට ඔවුන්ගේ පැවැත්ම සඳහා සාමුහිකව කටයුතු කිරීම හා එකිනෙකා ගෙන්

ඉගෙන ගැනීම අත්‍යවශ්‍ය දෙයක් විය. කලක් ජීවත් වීමටත් දූ දරුවන් බිහි කිරීමටත් හැකි වූයේ සහයෝගයෙන් කටයුතු කිරීමට සමත් මනුෂ්‍යයන්ට ය. ඒ අනුව ස්වභාවධර්මය වැඩි සැලකිල්ලක් දැක්වූයේ ශක්තිමත් ම මිනිසාට හෝ වඩාත් ම ආත්මාර්ථකාමී මිනිසාට නො ව වඩාත් ම සහයෝගයෙන් කටයුතු කළ හැකි මිනිසාට යි.

දඩයම් යුගයට අයත් ගුහා චිත්‍රවල ප්‍රචණ්ඩත්වය නොමැති වීම පමණක් නො ව අපේ මුහුණු සහ සිරුරුවල ස්වරූපය පරිණාමය වී ඇති ආකාරය ද එම නිගමනය තහවුරු කරන බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. නූතන මිනිසාගේ මුහුණුවල ලක්ෂණ අපේ පූර්වජයන්ගේ මුහුණුවල ලක්ෂණවලට වඩා බෙහෙවින් මිත්‍රශීලී ය; මෘදු; වටකුරු ය; සිනහමුසුය. ඊට හේතුව අප විසින් ම අප ගෘහස්ථකරණය *(domestication)* කර ගෙන තිබීම යි. සුනඛයන් පරිණාමයට ලක් කරගත් ආකාරයට ම අප මිත්‍රශීලී ස්වභාවය ඉස්මතු වන ලෙස අප විසින් අපව ම පරිණාමයට ලක් කර ගෙන තිබේ. ඒ නිසා 'හෝමෝ පපි' යන නාමය අපට වඩා ගැළපෙන බව බ්‍රෙග්මන් පවසයි.

අපේ පෙනුමෙන් පමණක් නො ව අප ඉගෙන ගන්නා ආකාරයෙන් ද කියවෙන්නේ මිනිසුන්ගේ පැවැත්ම සහතික වන්නේ එකිනෙකා සමඟ සහයෝගයෙන් ජීවත් වීමට ඇති හැකියාව මත බවයි. තනි තනි ව ගත හොත් අප එතරම් සපන් පුද්ගලයෝ නො වෙමු. ළදරුවන් සහ චිම්පන්සි පැටවුන් සැසඳීමේ දී තහවුරු වී අති පරිදි මිනිස් දරුවන් වානර දරුවන්ට වඩා දක්ෂ වන්නේ 'සමාජමය ඉගෙනීම' යන අධ්‍යන ප්‍රවර්ගය සම්බන්ධයෙන් පමණි. එහි දී අපි චිම්පන්සියන්ට සහ ඔරං ඔටං වානරයන්ට වඩා බෙහෙවින් ඉදිරියෙන් සිටිමු. එකිනෙකාගෙන් ඉගෙන ගැනීම සම්බන්ධයෙන් අප කොතරම් දක්ෂ දැ'යි කිව හොත් මිනිසුන් සම්බන්ධයෙන් නම් ඥානන හැකියාව සහ සහයෝගිතා හැකියාව යන දෙක ම එකම කාසියක දෙපැත්ත වසයෙන් සැලකිය හැකි බව බ්‍රෙග්මන් සඳහන් කරයි.

ඉතින් ශිෂ්ටාචාර බිහි වීමට පෙර නො පැවති ප්‍රචණ්ඩත්වයක් ශිෂ්ටාචාර බිහි වීමට පසු අප තුළ ඇති වන්නට ඇත්තේ කෙසේ ද ?

මෑත කාලීන පුරාවිද්‍යා පර්යේෂණවලට අනුව මීට අවුරුදු 12,000 කට පමණ පෙර ප්‍රථම අයිස් යුගය අවසානයේ ජීවනෝපාය ලෙස කෘෂිකර්මය හඳුනා ගත් පසු මිනිස්සු වඩා ස්ථිර වාසභූමිවල දිවි ගෙවීමට පුරුදු වූහ. ඒ සමඟ වාසභූමි වටා ප්‍රථම ආරක්ෂක පවුරු බැමි බැඳීම ද ආරම්භ විය. ඇතැම් ගුහා චිත්‍රවල දුනුවායන් නිරූපණය වීම ඇරඹියේ ද මේ අවධියේ දීම ය. මේ යුගයේ කැණීම්වලින් සොයා ගත් මිනිස් ඇට සැකිලිවලින් ඇතැම් ඒවාවල තිබූ ලකුණු නිසා එම ඇට සැකිලි ප්‍රචණ්ඩ ක්‍රියා නිසා මරණයට පත් වූ අයගේ බවට තීරණය කළ හැකි විය. ඉන් පැහැදිලි වන්නේ කෘෂිකර්මයට පුරුදු වීමත් සමඟ අප ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම ද ඇරඹුණු බවයි. මන්ද කෘෂිකර්මයට පිවිසීමත් සමඟ ඉඩම් අත්පත් කර රැක ගැනීමට සහ භෝග ආරක්ෂා කර ගැනීමට ද සිදු විය. කොටින් ම කෘෂිකර්මයට පිවිසීමත් සමඟ දේපොළ ගැන ද දේපොළවල ආරක්ෂාව සහ අයිතිය ගැන ද මිනිසුන්ට කරදර වීමට මිනිසුන්ට සිදුවිය.

දේපොළ අයිතිය ඇතිවීමත් සමඟ අන් අය ගැන සැක මුසු බව ද අපේ සිත් තුළ පහළ විය. දඩයමින් සහ වන සම්පතින් ජීවත් වූ යුගයේ දී එක් එක් පුද්ගලයාට අයත් සරල ආම්පන්න ගැන බෙහෙවින් ලිහිල් එකඟත්වයක් තිබුණු නමුත් ඉඩකඩම් හා ස්ථිර වාසස්ථාන පිළිබඳ අයිතිය ඊට වඩා වෙනස් ආකාරයක පුද්ගලික භුක්තිය පිළිබඳ ස්වාර්ථකාමී ආකල්පයක් බවට පත් විය. තැනින් තැන සැරිසරමින් ගත කළ දඩයක්කාර ජීවිතයේ දී නිශ්චිත ගෝත්‍රයකට අයත් වීම මිනිසුන්ට අනිවාර්යය නො වූ අතර බොහෝ විට මග දී මුණ ගැසෙන නව කණ්ඩායම් සමඟ එක්වීම ද සිදු විය. එහෙත් කෘෂිකර්මය සඳහා මිනිසුන් ස්ථිර පදිංචිය තෝරා ගත් පසු මේ සියල්ල වෙනස් විය. එතැන් සිට 'අපි නිදහසේ සැරිසරන සාර්වභෞමිකයන්ගේ සිට පරජන භීතිකාවෙන් නිතර පෙළෙන සැක මුසු අය' බවට පත්වීමු යැ'යි බ්‍රෙග්මන් පවසයි.

ප්‍රචණ්ඩත්වය ඉස්මතු වීමට තවත් හේතුවක් වසයෙන් බ්‍රෙග්මන් පෙන්වා දෙන්නේ ශිෂ්ටාචාරය ඇතිවීම සමඟ සමාජ ධුරාවලිය ද

ඇතිවීම යි. ලොකු ජනගහනයක් ඇති ජනාවාස පිහිටු වීමට පෙර සිටි දඩයමින් යැපුණු කාණ්ඩවල නායකයන්ට තම කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්ට ඉහළින් සිය තනතුරේ වැජඹීම පහසු කරුණක් නො වී ය. ඊට හේතුව තැනින් තැන සැරිසරමින් ගත කළ ජීවන ක්‍රමයක් තුළ සාමාජිකයන් අතර අසමානත්වය තහවුරු වීමට තිබූ ඉඩකඩ බෙහෙවින් සීමිත වීම යි. පුරා තත්ව විද්‍යාව මඟින් සොයා ගෙන ඇති සාක්ෂිවලට අනුව දඩයමින් සහ වන සම්පතින් ජීවත් වූ බොහෝ සමාජ ඒවායේ සාමාජිකයන්ගේ හැසිරීම නින්දාලාප මත නියාමනය වන ක්‍රමයක් පවත්වා ගෙන ගිය බව හෙළිදරව් වී තිබේ. ඒ අනුව කිසියම් සාමාජිකයෙකු අනෙක් අය පාලනය කිරීමට තැත් කළ හොත් කණ්ඩායමේ අවශේෂ සාමාජිකයෝ නින්දාලාප අවියක් කොට ගෙන තුල්‍ය පීඩනය *(peer pressure)* මඟින් සමානයින්ට අවනත වීමට පොලඹවා ගනිමින් ඔහු නිසි තැන තැබීමට වග බලා ගනිති.

එහෙත් මීට වසර 10,000 කට පමණ පෙර ස්ථිර ජනාවාස ඇති වූ පසු නායකයන් බවට පත් වූ බලගතු පුද්ගලයන් හුදු ඔප්පාදූපවලින් හෝ නින්දාලාපවලින් දමනය කිරීමට නො හැකි විය. අවශ්‍ය වූ වහාම තමා වටා සිටි හිතවත් චණ්ඩි සගයන් සහායට කැඳවා ගත හැකි වු නිසා එවැනි නායකයන්ට පහසුවෙන් තම බලය තහවුරු කර ගත හැකි විය. අද කාලයේ නම් පාලකයන් විශාල හමුදාවල අධිපතියන් බවට පත් ව තිබෙන බැවින් හුදු අවඥා සහගත ෆෙස්බුක් පෝස්ට්වලින් හෝ නින්දාලාපී ට්වීට් පණිවුඩවලින් ඔවුන් බලයෙන් පහ කළ නො හැකි ය.

අපේ ආදි මානවයෝ නෂ්ට වී යෑමේ තර්ජනයට නිරන්තරයෙන් ම ගොදුරු වූහ. ඔවුන් කුඩා කණ්ඩායම් ලෙස අවශේෂ කණ්ඩායම්වලින් බොහෝ ඈත් ව ජීවත් වූ අතර එකල මුලු ලෝකයේ ම සිටි මානව ජනගහනය දහස් ගණනකට සීමා විය. වාල් පවසන පරිදි එවැනි තත්වයක් යටතේ ආදි මානව සමාජ අතර නිරන්තරයෙන් ම යුද්ධ ඇති වී යැයි සිතිය නො හැකි ය. මෙකී මානවයන් වර්තමානයේ අප්‍රිකාවේ කලහාරි කාන්තාරය අසබඩ ජීවත් වන බුෂ්මන් ගෝත්‍රිකයන්ට සමාන ය.

ඔවුන් අතර මෙන් එකල මානව සමාජවල ද ඉඳ හිට ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වන්නට ඇති නමුත් ඒවා කලාතුරකින් පමණක් සිදු වන දේවල් ය.

ඔබේ ඈනුම් යෑම බෝවෙන රෝගයක් මෙන් අවට සිටින අයට ද පැතිරෙන්නේ ඇයි? මිනිසුන් අතර පමණක් නො ව චිම්පන්සියන් අතර ද මෙසේ ඈනුම් යෑම බෝවන බව කියෝටෝ විශ්ව විද්‍යාලය කළ පරීක්ෂණයක් උපුටා දක්වමින් වානර චර්යාව පිළිබඳ විශේෂඥයෙකු වන ෆ්‍රාන්ස් ඩි වාල් ඔහුගේ *Age of Empathy* නමැති කෘතියේ පෙන්වා දෙයි. මේ හා සමාන වෙනත් ආකාරයේ හැසිරීම ද සත්ව රාජධානියේ දක්නට ලැබේ. පිංචි කුරුල්ලන් වලාකුළක් මෙන් රංචු ගැසී එක ම රටාවකට ඇඹරෙමින් කැරකෙමින් එක ම දිසාවකට පියාසර කරන ආකාරය තවත් එවැනි එක් උදාහරණයකි. දිග දුර පියාසර කරන සංක්‍රමණික පක්ෂීන් අතර ද මෙවැනි හැසිරීම් දක්නට ලැබේ. මෙසේ එකම රටාවකට හැසිරීම හඳුන්වන්නේ *synchronization* හෙවත් සමකාලනය යන නමිනි. සහජාශිය සම්බන්ධීකරණය හෙවත් අන්තර්ඥානයෙන් මෙන් සහෘදයන් සමඟ මෙසේ එක ම රටාවකට හැසිරීමට පෙලඹීම සාමූහිකත්වය සහජයෙන් ම තහවුරු කරන්නක් බව වාල් පවසයි.

වාල්ට අනුව මේ සමකාලනීය චර්යාව අපේ සාමූහික පැවැත්මට අත්‍යවශ්‍ය දෙයකි. පෙම්වතිය සමඟ සතුටු සාමීචියෙන් ගත කරන මෙහොතක ඇය සිනාසෙන විට ඔබ සිනාසෙන්නේත් ඔබ වතුර බොන විට ඇය ද ඒ සමඟ වතුර බොන්නේත් පෙම් යුවල අතර සහසම්බන්ධය සමකාලනය මඟින් පවත්වා ගැනීමටයි. මේ ආකාරයෙන් මනුෂ්‍යයන් යනු නිසර්ගයෙන්ම එකිනෙකා සමඟ බැඳුම් ඇති කර ගැනීමට නැඹුරු වූවෝ වෙති.

ඒ නිසා මරණය ළඟට මිනිසෙකුට දිය හැකි දරුණු ම දඬුවම වන්නේ හුදකලාව සිරකර තැබීම යි. එය කෙතරම් අමාරු දෙයක් දැ'යි කිව හොත් එසේ හුදකලාවට ලක් වන බොහෝ සිරකරුවෝ සිය මුරකරුවන් සමඟ කළහ කිරීමට පෙලඹෙන්නේ හුදකලාව දරුණු වූ අවස්ථාවල දී බව නිරීක්ෂණය කර තිබේ. එමඟින් ඔවුන් තැත්

කරන්නේ හුදකලාවෙන් මිදීමට යි. ඒ නිසා සමාජය යනු එකිනෙකාගෙන් ස්වායත්ත වූ හුදකලා ආත්මාර්ථකාමී මිනිසුන්ගේ එකතුවක් ලෙස සැලකීම වැරදි ය.

මෙකී සියලු තර්ක වලංගු යැයි මොහොතකට සිතමු. ඒ අනුව මනුෂ්‍යයෝ ස්වභාවයෙන් ම යහපත් ය. අනෙක් අයට හානියක් කිරීම ඔවුන්ගේ සහජ ගතියක් නො වේ. විද්‍යාව මගින් බොහෝ විට කරන්නේ දැනට මත් දන්නා එවැනි විශ්වාස සාක්ෂි මත තහවුරු කිරීම යි. එහෙත් මේ සහජ මනුෂ්‍යත්වයට පටහැණි ව යුද වැදීම වැනි අවස්ථාවල දී ඇතිවෙන ප්‍රචණ්ඩ ක්‍රියා විස්තර කරන්නේ කෙසේ ද?

එම පැනයට පිළිතුරු වෙනත් එවැනි ම පැනයක් පිටු පස සැඟවී තිබුණු අන්දම රට්ගර් බ්‍රෙග්මන් ඔහුගේ *Humankind* නමැති කෘතියේ විස්තර කරයි. ඒ පැනය නම් දෙවන ලෝක මහා යුද සමය අවසානයේ 1944 දී මිත්‍ර පාක්ෂිකයන් තමන්ගෙන් ම අසා ගත් පැනයකි. එනම් මේ සා පැහැදිලි පරාජයක් ඉදිරියේ සතුරු ජර්මන් සොල්දාදුවන් තවමත් මිත්‍රපාර්ශ්වික හමුදා මෙන් දෙගුණයක උනන්දුවකින් සටන් කරන්නේ ඇයි? පරාජය පෙනි පෙනීත් ඉතා කැපවීමෙන් සටන් කළ බොහෝ ජර්මන් සොල්දාදුවෝ කිසි සේත් ම යුද බිම අතහැර පලායෑමද නො කළෝ ය. මෙය මිතුරු හමුදාවලට පුදුම ගැටලුවක් විය.

තමන්ට වඩා විශාල සේනාවකින් වට කරනු ලැබ තිබිය දීත් ජර්මන් හමුදා නො කඩවා සටන් කරන්නේ ඇයි දැ'යි යන කරුණ ගැන විමර්ශනයක් කිරීමට ඇමෙරිකානු සමාජ විද්‍යාඥයෙකු වන මොරිස් ජැනොවිට්ස්ට පැවරුණි. ඒ යුගයේ විසූ අනෙකුත් බොහෝ සමාජ විද්‍යාඥයන් මෙන් ම ජර්මන් සොල්දාදුවන්ගේ සටන්කාමී හැසිරීම ගැන ජැනොවිට්ස්ට කීමට තිබුණේ එක ම දෙයකි. එනම් හිට්ලර්ගේ ෆැසිස්ට් දෘෂ්ටිවාදයෙන් මත් කර පමණ ඉක්මවා තම පිතෘ භූමිය වන්දනා මාන කිරීම පිණිස දරුණු මොළ ශෝධනයකට *(brainwash)* ලක් කර ඇති නිසා ජර්මන් සොල්දාදුවන් මෙසේ වියරුවෙන් මෙන් සටන් කරන බව යි.

ඒ අනුව මේ දෘෂ්ටිවාදයට එරෙහි ව ජර්මන් සොල්දාදුවන් නම්මවා ගැනීමේ ප්‍රචාරණ ක්‍රියාන්විතයක් මිත්‍ර හමුදාවල මෙහෙයවීමෙන් දියත් විය. ජර්මන් සොල්දාදුවන් විසින් අල්ලා ගත් පෙදෙස්වලට ගුවනින් ගොස් දස දහස් ගණනින් ප්‍රචාරක පත්‍රිකා විසුරුවා හරින ලදී. ඒවායේ සඳහන් වූයේ "ඔබට කිසිදු බලාපොරොත්තුවක් තබා ගත නො හැකි ය! මිත්‍ර හමුදාවේ ජය නියත යි!" වැනි ප්‍රතිඋද්‍යෝග පාඨයන් ය. එහෙත් ජර්මන් යුද භටයන් ඒ ප්‍රචාරණවලට රැවටුණේ නැත. ඒ ඇයි? හේතුව ජර්මන් සොල්දාදුවන්ගේ පෙලඹවීම සම්බන්ධයෙන් සමාජ විද්‍යාඥයන්ගේ උපකල්පන සියල්ල වැරදි වීම නිසා යි.

ඒ බව හෙළිවුණේ සටන් බිමේ දී අල්ලා ගනු ලැබූ ජර්මන් සොල්දාදුවන් හා කතා බහ කිරීමේ අවස්ථාව මොරිස් ජැනොවිට්ස්ට ලැබුණු පසුව යි. ප්‍රශ්න කිරීම්වලින් මොරිස් තේරුම් ගත් පරිදි ජර්මන් සොල්දාදුවන් නො කඩවා සටන් කළේ ඔවුන් නාසිවාදී මොළ ශෝධනයකට ලක් ව තිබූ නිසා නො වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අන්ධානුකරණයෙන් නාසිවාදය විශ්වාස කළ අය නො වූහ. ඒ සියල්ල පරයා ඔවුන් තුළ පැවති ශක්තිය වූයේ හුදෙක් සිය රෙජිමේන්තු සගයන් එක කුස ඔත් සහෝදරයන් ලෙස සලකමින් තද සාමූහික ආකල්පයකින් හා කැපවුණු මිත්‍රත්වයකින් කටයුතු කිරීමට සාමාන්‍ය ජර්මන් සොල්දාදුවන් පුරුදු වී සිටීම යි. නාසි ජනරාල්වරු මෙය හොඳින් අවබෝධ කර ගෙන සිටි අතර සිය බළඇණි තුළ සිටි සොල්දාදුවන් අතර එකී සහෝදරත්වය හා සහෘද බව වැඩි කළ හැකි හැම දෙයක් ම ඉටු කිරීමට ඔවුහු නො පැකිළ ව යුහුසුලු වූහ.

ඒ අනුව බලන විට ප්‍රචණ්ඩ අපරාධකරුවෝ පවා සාමූහිකත්වය තකන සහ ආත්මාර්ථකාමිත්වය නො තකන අය වෙත් ද? ජර්මන් සොල්දාදුවන්ගේ හැසිරීම අනුව බලන විට එම ප්‍රශ්නයට පිළිතුර වන්නේ පැහැදිලිව ම 'ඔව්' යන්නයි. මේ සියල්ල මෙහෙයවෙන්නේ ඒ සහානුකම්පාව නමැති බෙහෙවින් ම මානුෂික වූ හැඟීම නිසා යි.

කෙසේ වෙතත් වරකට අපට සහානුකම්පාව දැක්විය හැක්කේ සීමිත පිරිසක් සඳහා පමණි. බොහෝ විට අපේ සහානුකම්පාව යොමු

වන්නේ අප අවට සිටින අපට දැනෙන හා ඇහුන්කන් දෙන අය වෙත ය. ඒ නිසා බොහෝ දෙනෙක් අපේ සහානුකම්පා පථයට හසු වන්නේ නැත. ඒ නිසා සහානුකම්පාව යනු අඩු පිරිසක් අන්තර්ග්‍රහණය කරන ඊට වැඩි පිරිසක් බහිෂ්කරණය කරන මනෝභාවයකි. ඇතැම් විචාරකයන් පෙන්වා දෙන පරිදි සහානුකම්පාව ද දෙපැත්ත කැපෙන ආයුධයක් වසයෙන් සැලකිය හැකි ය. මන්ද එය එක් අතකින් ඔබේ සාහානුකම්පාවට භාජනය වන අයට උදව් කිරීමට ඔබ පොලඹවන අතර අනෙක් අතට යුද්ධයක් වැනි ජීවිතය හා මරණය අතර සිදුවීමක දී ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් වෙනත් අයෙකු මරා දැමීම සාධාරණීකරණය කිරීමට ද එම සහානුකම්පාව හේතු විය හැකියැ'යි ඔවුහු තර්ක කරති.

එහෙත් හොඳින් විමසා බැලූ විට එම උපකල්පනය ද නිවැරදි යැ'යි කිව නො හැකි ය. මන්ද යුදපිටියේ දී මිනිසුන් හිටි හැටියේ ම ම්ලේච්ඡයන් ලෙස කටයුතු කරනු ඇතැ'යි සිතීම අසීරු ය. කුරිරු යුද්ධයක දී වුව ද එකිනෙකා හා අභිමුඛ වන විට තවකෙකු මරා දැමීමට කොකා ගැස්සීම යනු පහසු දෙයක් නො වේ. ජීවිතයත් මරණයත් අතර තීරණාත්මක අවස්ථාවක දී වුව ද සාමාන්‍යයෙන් මිනිසුන් නැඹුරු වන්නේ ප්‍රචණ්ඩත්වයට පිටු පෑමට යි.

මේ පිළිබඳව අධ්‍යයන කළ අය අතරින් මුල් ම තැනැත්තෙකු වන්නේ ඇමෙරිකානු හමුදා කර්නල්වරයෙකු මෙන් ම ඉතිහාසඥයෙකු වූ සැමුවෙල් මාෂල් ය. 1943 දී ජපනුන් විසින් අත්පත් කර ගෙන සිටි 'මාකන්' නමැති පැසිෆික් දූපත අල්ලා ගැනීමේ ක්‍රියාන්විතයකට මාෂල් නායකත්වය දුන්නේ ය. ඉතා හොඳ සන්නද්ධ පුහුණුවක් තිබූ ඇමරිකානු සොල්දාදුවන් 300 කින් යුත් ඔහුගේ බළඇණිය ප්‍රමාණයෙන් සතුරන්ට වඩා විශාල වුවද දූපත අල්ලා ගැනීමේ ප්‍රයත්නය අසාර්ථක විය. මේ නිසා විමතියට පත් මාෂල් ඊට හේතු සොයා බැලීමට තීරණය කළේ ය.

සාමාන්‍යයෙන් පැවති හමුදා සම්ප්‍රදායට පටහැණි ව ඔහු එක් එක් සොල්දාදුවා පුද්ගලික සම්මුඛ සාකච්ඡාවකට කැඳවා හැකි

තරම් අවංකව සිය අදහස් ප්‍රකාශ කිරීමට සොල්දාදුවන් පොලඹවා ගත්තේ ය. එමගින් සොයා ගත් කරුණු ඔහු විමතියට පත් කළේ ය. ඒ අනුව සොල්දාදුවන් 300 දෙනා අතරින් සටනේ දී සිය ආයුධය භාවිත කර තිබුණේ සොල්දාදුවන් 36 දෙනෙකු පමණි. ආයුධ භාවිතය සම්බන්ධයෙන් කොතරම් හොඳ පුහුණුවක් ලබා තිබුණ ද හැම සොල්දාදුවෙකු ම පාහේ සිය ආයුධයෙන් වෙඩි තබා තවත් කෙනෙකු මරණයට පත් කිරීමට කැමැත්තක් දක්වා නො තිබිණි.

දෙවැනි ලෝක මහා යුද්ධයේ දී මියගිය බ්‍රිතාන්‍ය සොල්දාදුවන් ගැන රැස් කළ දත්තවලින් ද මෙය හෙළිදරව් වේ. එම යුද්ධයෙන් මියගිය සොල්දාදුවන්ගෙන් 75% කගේ මරණවලට හේතු වී තිබුණේ ගුවන් මඟින් දැමූ බෝම්බ සහ සටන් බිමේ අටවා තිබූ බිම් බෝම්බ ය. එයින් තේරුම් යන්නේ මුහුණට මුහුණ ලා කරන සටන්වල දී සතුරු සොල්දාදුවන් විසින් හිතාමතා වෙඩි තැබීමෙන් මරණයට පත්වී ඇත්තේ අඩු ප්‍රමාණයක් බව යි. තුවක්කුවකින් වෙඩි තබනවාටත් වඩා අසීරු ක්‍රියාවක් වන්නේ මුහුණට මුහුණ ලා සටන් කළ පැරණි ක්‍රමයට අනුව බයිනෙත්තුවලින් ඇන මරා දැමීම යි. 1815 දී නැපෝලියන්ගේ සේනා පරාජයට පත් වූ වෝල්ටර් ලූ සටනේ දී බයිනේත්තුවලින් තුවාල ලත් හෝ මරණයට පත් වූ සොල්දාදුවන්ගේ සංඛ්‍යාව 1% ක් තරම් අඩු ප්‍රමාණයක් වූ බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. ප්‍රචණ්ඩ ලෙස අනෙකා මරා දැමීමට මිනිසුන් තුළ කැමැත්තක් ඇති බව පෙන්නුම් කරන චිත්‍රපට හා ටෙලිවිෂන් නාටක කොතෙක් තිබුණ ද යථා ලෝකයේ යුද්ධවල දී සොල්දාදුවන්ගේ සැබෑ හැසිරීම බොහෝ විට ඊට හාත්පසින් ම වෙනස් ය.

පළමුවැනි ලෝක යුද්ධය පවතින අතරතුර 1914 නත්තල් දා බටහිර යුරෝපීය යුද පෙරමුණේ දෙපිළට බෙදී සටන් කළ ජර්මන් සොල්දාදුවන් සහ බ්‍රිතාන්‍ය ප්‍රංශ සොල්දාදුවන් ඔවුන්ට ඉහළින් ලැබුණු ආඥා නො තකා සටන් නවතා සටන් බිම හරහා ගොස් එකිනෙකාට සුබ පතමින්, කමින් බොමින්, තෑගි හුවමාරු කර ගනිමින් නත්තල් ගී ගයමින් දවස ගත කළහ. ඉන් පසු සිය සොල්දාදුවන්ට

සටන් කිරීම පිණිස බල කිරීමට අණ දෙන නිලධාරීන්ට සිදු විය. එහෙත් දෙපිළේ ම සොල්දාදුවෝ එකිනෙකාට රහසිගත පණිවිඩ යවමින් සටන් කිරීමට නියමිත වේලාවල් දැනුම් දුන්හ. ඒ අනුව දෙපැත්තේ ම සොල්දාදුවෝ එකිනෙකාට තුවාල නො වීමට හිසට ඉහළින් එල්ලය ගැනීමට කටයුතු කළෝ ය.

බ්‍රෙග්මන් පෙන්වා දුන් පරිදි අප ශිෂ්ට වන තෙක් ම යුද්ධ ඇති නො වීය. ඒ නිසා 'අර්බුදයක් ඇති වූ විට ශිෂ්ටාචාරයේ කඩතුරාව කඩා වැටේ' යන කීම නිවැරදි නො වේ. ප්‍රචණ්ඩත්වය සාධාරණය කළ හැකි යුද්ධයක් වැනි අවස්ථාවල දීත් ප්‍රචණ්ඩ ක්‍රියා කිරීමට අපි මැලි වන්නෙමු. ඒ නිසා අප ඔය කියන තරම් ස්වභාවයෙන් ම නරක ආත්මාර්ථකාමී මිනිස්සු නො වෙමු.

මිනිසුන්ගේ ආත්මාර්ථකාමිත්වය ඔවුන්ගේ ආර්ථික තර්කානුකූල බවට හේතුවක් බව සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාව උපකල්පනය කරයි. එයින් කියවෙන්නේ භාණ්ඩයක් හෝ සේවාවක් මිල දී ගැනීමට පාරිභෝගිකයන් පෙලඹෙන්නේ එම භාණ්ඩය හෝ සේවාව මගින් ලැබෙන ඵල ප්‍රයෝජන ඒ සඳහා වැය කිරීමට සිදු වන මුදලට සාපේක්ෂ ව ඥානාන්විත ව, තාර්කික ව සහ ආත්මාර්ථකාමී ලෙස තක්සේරු කර බැලීමෙන් පසු ව බවයි.

උත්කර්ෂණ පරිභෝජනය *(Conspicuous Consumption)* යන යෙදුම හඳුන්වා දුන් ඇමෙරිකානු ආර්ථික හා සමාජවිද්‍යාඥයෙකු වූ *Thorsten Veblen (1857-1929)*, එය නිර්වචනය කළේ "ප්‍රායෝගික ව අපට අවශ්‍ය වන මට්ටම ඉක්මවා ගුණයෙන් හෝ ප්‍රමාණයෙන් වැඩි භාණ්ඩ පරිභෝජනය කිරීම" යනුවෙනි. ජෝන් මේනාඩ් කේන්ස්ගේ මතය අනුව මනුෂ්‍ය අවශ්‍යතා දෙවර්ගයකට අනුව භාණ්ඩ වර්ග කළ හැකි ය. ඉන් එක් වර්ගයක් නම් ඕනෑම තත්වයක් යටතේ අපට අත්‍යවශ්‍ය ම වන භාණ්ඩ යි. අනික් වර්ගය නම් අපේ සහචර මිනිසුන්ට වඩා අපි ඉහළින් සිටිමු යන සතුට නිසා අප තුළ අතිමානයක් ඇති කළ හැකි වර්ගයේ භාණ්ඩ යි.

එහෙත් සැබෑ ලෝකයේ දී මිනිසුන් හැම විටක දී ම අනිවාර්යයෙන් ම මේ කියන අන්දමට තර්කානුකූල ව හිතමින් මිලට සරිලන ඵල ප්‍රයෝජන ගැන ක්ෂණික ව තක්සේරු කරමින් හැසිරෙන බව පිළිගැනීම අපහසු බව චර්යා ආර්ථික විද්‍යාව *(Behavioral Economics)* පැහැදිලි කරයි. දිනපතා දහස් ගණන් කුඩා මහත් තේරීම් ගැන තීරණ ගැනීමට සිදු වන විට අප නො වරදවා ම ඥානවන්ත තර්කානුකූල තේරීම කරන්නේ යැයි කීම අසීරු ය. ඒ හැම තේරීමක ම වටිනාකම සැසඳීමට, ඒ හැම භාණ්ඩයක ම උපයෝගීතාවේ සාපේක්ෂ වාසි ගැන තීරණය කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු නිරායාසයෙන් ම අපට ලබා ගත නො හැකි ය. අනෙක් අතට අප හුදෙක් ආත්මාර්ථකාමී ලෙස ම එම තෝරා ගැනීම කරන්නේ ද නැත. ඇත්ත වසයෙන් ම අපේ තේරීම අන් අයට බලපාන්නේ කෙසේ ද යන්න ගැන අපි බොහෝ විට සංවේදී ය.

පාරිභෝගිකයන් තාර්කිකව තීරණ ගනිති යි යන මතය අභියෝගයට ලක් වීම චර්යා ආර්ථික විද්‍යාව බිහි වීමට හේතු විය. පාරිභෝගිකයන්ගේ තේරීම් හුදෙක් නව සම්භාව්‍ය ගුරුකුලයේ සරල මතවාදයට වඩා බෙහෙවින් සංකීර්ණ කරුණු මත කෙරෙන දෙයක් බව විස්තර කරන 'චර්යා ආර්ථික විද්‍යාව' ඒ සඳහා මනුෂ්‍යයා හා සම්බන්ධ මනෝවිද්‍යාත්මක පරිඥානය *(insight)* උපයෝගී කර ගනී.

චර්යා ආර්ථික විද්‍යාවේ පුරෝගාමියෙකු ලෙස රිචඩ් තේලර් සැලකෙයි. චර්යා ආර්ථික විද්‍යාව හඳුන්වා දීම සම්බන්ධයෙන් කළ සේවාව සලකා ඔහු 2017 දී නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලැබීය. තේලර් තර්ක කළ පරිදි නව සම්භාව්‍ය සම්ප්‍රදායේ ආර්ථික විද්‍යාඥයන් පවසන අන්දමේ "තාර්කික පාරිභෝගිකයන්" කියා ජාතියක් නො පවතී.

තේලර් පෙන්වා දෙන පරිදි හැම විටක ම මනුෂ්‍යයන් තාර්කික තීරණ ගනිති යැ'යි නිසැක ලෙස කිව නො හැකි ය. එබැවින් පරිභෝජනය කළ යුතු සහ පරිභෝජනය නො කළ යුතු දේවල් සම්බන්ධයෙන් ඔවුහු නිතරම නිවැරදි තීරණ නො ගනිති. චර්යා

ආර්ථික විද්‍යාව තැත් කරන්නේ "ඊනියා තාර්කික මනුෂ්‍යයා" වෙනුවට "නියම මිනිසා" සිය තීරණ ගන්නා ආකාරය තේරුම් ගැනීමට යි. එම තේරුම් ගැනීම් උපයෝගී කර ගෙන වඩා හොඳ තේරීම් කිරීමට පාරිභෝගිකයා දැනුවත් කිරීමත් ඒ අනුව සුදුසු ප්‍රතිපත්ති තීරණවලට එළඹීමට රජයට උපකාර කිරීමත් චර්යා ආර්ථික විද්‍යාවේ අරමුණ යි.

රිචඩ් තේලර් සහ ඔහුගේ සහෘද ආර්ථික විද්‍යාඥයෙකු වන කේස් සස්ටෙයින් ලියූ *Nudge: Improving Decisions about Health, Wealth and Happiness* නම් කෘතියේ තමන්ට මෙන් ම සමාජයට ද යහපත් වන ස්වේච්ඡා තීරණ ගැනීමට හැකි වන ලෙස පාරිභෝගිකයන්ට පොඩි තල්ලුවක් *(nudge)* ලබා දීමට රජයට මැදිහත් විය හැකි බව පෙන්වා දී තිබේ. උදාහරණයක් වසයෙන් ගත් විට පිරිසැකසුම් කළ ආහාර ටින්වල එම ආහාරයේ ඇති පෝෂ්‍ය පදාර්ථ සංඛ්‍යාත්මක වසයෙන් විස්තර කළ යුතු යැයි රජය තීරණය කළ විට ඇත්ත වසයෙන් ම රජය කරන්නේ වඩා පෝෂ්‍යදායක ආහාර පරිභෝජනය කිරීමට පාරිභෝගිකයන්ට "පොඩි තල්ලුවක්" ලබා දීම යි.

"පොඩි තල්ලුවක්" පිළිබඳ මේ න්‍යාය සම්බන්ධයෙන් චර්යා ආර්ථික විද්‍යාඥයන් කර ඇති විමර්ශනවල ප්‍රතිඵල බොහෝ රජයන් හා රාජ්‍ය ආයතනවල තීරණ කෙරෙහි බලපා ඇත. එම තීරණ බොහෝමයක් ම යහපත් පාරිභෝගික තීරණ ගැනීමට පාරිභෝගිකයන්ට "පොඩි තල්ලුවක්" දෙන ආකාරයේ ඒවා ය. උදාහරණයක් වසයෙන් පැණි බීමවල අන්තර්ගත වන සීනි ප්‍රමාණය බෝතල් ලේබලයේ සඳහන් කිරීම රජය විසින් අනිවාර්ය කළ විට එය සීනි අඩුවෙන් ඇති පැණි බීම වර්ග තෝරා ගැනීමට පාරිභෝගිකයාට දෙන පොඩි තල්ලුවකි. මෙකී ප්‍රතිපත්ති තීරණ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය ඉහළ නැංවීමට මෙන් ම ප්‍රජා සමූහ හා පරිසරය සුරැකීමට ද දායක වේ.

පොඩි තල්ලුවක් පිළිබඳ මේ න්‍යාය පිළිබඳ විවේචකයින් බොහෝ විට එන්නේ නවලිබරල්වාදී හෙවත් මූල්‍යවාදී ගුරුකුලයෙනි. ඔවුන් පවසන අන්දමට ඕනෑ ම ආකාරයක රාජ්‍ය මැදිහත් වීමක්

පුද්ගල අයිතීන්ට පටහැණි විය හැකි ය. ඒ හැර මහජනතාවට වඩාත් ම උචිත දේවල් මොනවා ද යන්න රජය නො දනී. එම නිසා ඒ සම්බන්ධයෙන් පොඩි තල්ලුවක් කිරීමට රජයට ඉඩ දීම එතරම් විශ්වාසදායක දෙයක් නො වේ. මේ විරසකය වෙළඳපොළ ක්‍රියාකාරිත්වයේ දී ඉටු කළ යුතු වැදගත් භූමිකාවක් රජයට ඇත්තේ ය සහ ඊට එරෙහි ව රජයේ ඇඟිලි ගැසීම්වලින් තොර ව නිර්බාධක ස්වයං නියාමනයට ඉඩ දුන් විට වෙළඳපොළ කාර්යක්ෂම ව කටයුතු කරන්නේ ය යන මතවාදී කඳවුරු දෙක අතර ඇති මතභේදය පිළිබඳ හොඳ උදාහරණයකි. කෙසේ වෙතත් චර්යා ආර්ථික විද්‍යාඥයන් පවසන්නේ ස්වයං නියාමනය වන වෙළඳපොළක් වඩා කාර්යක්ෂම යැයි ඇදහීම මූලික වසයෙන් රඳා පවතින්නේ ම පාරිභෝගිකයන් තාර්කික තේරීම් කිරීමට ඒකායන වසයෙන් සමත් ය යන විශ්වාසය මත බව යි. එහෙත් මේ විශ්වාසය අභියෝගයට ලක් වී ඇති බව චර්යා ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති. ඔවුන් විසින් කර ඇති පර්යේෂණ රාශියකට අනුව පාරිභෝගිකයන්ගේ තෝරා ගැනීමේ අයිතියට පටහැණි නො වන ලෙස නිවැරදි තේරීම තෝරා ගැනීම පිණිස මනෝ විද්‍යානුකූල ව පාරිභෝගිකයන්ට පොඩි තල්ලුවක් දෙන්නේ කෙසේ ද යන්න පෙන්වා දීම චර්යා ආර්ථික විද්‍යාවේ අරමුණ යි.

විසි වැනි සියවසේ විසූ දැවැන්තයින් වන කේන්ස් සහ හයෙක්ගේ මතවාද අතර මොන පරස්පරතා තිබුණත් ඔවුන් කළ වාද විවාද තුළින් විශිෂ්ට අදහස් ජනිත වූ බව සැබෑවකි. එහෙත් ඔවුන්ගේ වැරදි උපකල්පන සහ ඒ දෙදෙනාට ම නො පෙනුණ වැදගත් සාධක කිසිදු සැලකිය යුතු පිරික්සුමකට ලක් නොවී ඒ මතවාද අතර තිබූ නොයෙකුත් පරස්පරතා තුළ ම ඉතුරු විය. එනිසා විසි එක් වැනි සිය වසේ අපට මුහුණ දීමට සිදුවී ඇති නව සන්දර්භය එකී වැරදි උපකල්පන මැනවින් අධ්‍යනය කොට අනාවරණය කිරීමත් ඔවුන්ට නො පෙනුණු සාධක පෙන්වා දීමත් නො පමාව කළ යුතු දෙයක් බව කේට් රේවර්ත් පැහැදිලි කරයි.

'හෝමෝ එකොනොමිකස්' දර්ශනයෙන් මුළාව දශක ගණනාවක් තිස්සේ නවලිබරල්වාදී ආර්ථික චින්තනය අනුව යමින් මිනිසුන් සහජයෙන් ම ආත්මාර්ථකාමී යැයි අපි අප ගැන ම ව්‍යාජ ප්‍රතිරූපයක් ගොඩ නඟා ගෙන ඇත්තෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස අපි බොහෝ විට ජීවත් වන්නේ ජීවිතය තරඟයක් කොට ගෙන එකිනෙකා කෙරෙහි අවිශ්වාසයෙනි. ඒ නිසා ඇතිවෙන බිය අපට වර්ගවාදය, ආගම් වාදය, කුලවාදය ආදි නොයෙකුත් කඩතුරා තුළ ආරක්ෂාව සොයා ගැනීමට බල කර තිබේ. එහෙත් අපේ ප්‍රචණ්ඩත්වය සහ ආත්මාර්ථකාමී චර්යාව වළක්වන්නේ ශිෂ්ටාචාරයට හෝ දඬුවමට ඇති බිය නිසා නො වේ. පරිණාමීය වසයෙන් බැලුවොත් අපි මමංකාරයෙන් හෝ මිනීමැරීමේ ආශාවෙන් පෙළෙන අය නො ව මිත්‍රශීලී ව සහ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති සත්වයෝ ය. ආහාර සම්පත් අඩු වූ විට චිම්පන්සි කණ්ඩායම තුළ සහයෝගය වැඩි වූ බව චිම්පන්සීන්ගේ හැසිරීම සම්බන්ධයෙන් චිකාගෝහි වානර අධ්‍යනය සහ සංරක්ෂණය පිළිබඳ ලෙස්ටර් ෆිෂර් ආයතනය ප්‍රධාන ආයතන කිහිපයක පර්යේෂණවලින් හෙළිදරව් වී තිබේ.[138] ඒ සහජ ගතිගුණ පරිණාමයෙන් අපට ද උරුම වී තිබේ. ඒ බව විවිධ අර්බුදවලට අප මුහුණ දී ඇති ආකාරයෙන් ස්ඵුට වේ. ඒ නිසා නවලිබරල්වාදය විසින් පොරවන ලද ආත්මාර්ථකාමී හෝමෝ එකොනොමිකස් වහන්තරාව ගලවා දමා මනුෂ්‍යත්වය ගැන වඩා බලාපොරොත්තු සහගත දයාබර හැඟීමක් ඇති කර ගැනීම අද අපට අත්‍යවශ්‍ය වේ.

'වචන දහසකින් කිව හැකි දෙයක් එක පින්තූරයකින් කිය හැකියැ'යි කතාවක් තිබේ. එසේ නම් අපි අපේ ස්ව-ආලේඛනය *(self-portrait)* හෙවත් තම පින්තූරය තමන් විසින් ම ඇඳිය යුතු වන්නේ කෙසේ ද? අප ජීවත් වන ප්‍රජා සමූහය තුළ සාමාජිකයන් වසයෙන් ගත හොත් අප තරම් සමාජශීලී වෙනත් සත්ව විශේෂයක් නැති තරම් ය. නො එසේ නම් අනෙක් සත්ව විශේෂවලට වෙනස් ව මේ සා

138 Calcutt, S.E et el.(2014) Captive chimpanzees share diminishing resources, in Behaviour, Brill Publishers

දැවැන්ත මානව ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමට අපට හැකි වන්නේ ද නැත. අනෙක් අතට අපි අනෙකුත් සියලු සත්ව ශාක ආදී ජීවීන් සමඟ එක ම දැවැන්ත ජීව ගෝලයක කොටස්කරුවෝ ද වෙමු. අපේ ජීවිතය රඳා පවතින්නේ ඒ ජීව ගෝලයේ යහපැවැත්ම මත ය. අපේ ජන සමාජ ඒ ජීවී ගෝලය තුළ සහපරිණාමය *(co-evolve)* වූ ඒවා ය.

අප කිසිවකුටත් තනි තනි ව සාක්ෂාත් කර ගැනීමට නො හැකි බොහෝ දේවල් සහානුකම්පාව, අන්‍යෝන්‍ය උපකාරය, විශ්වාසය සහ සහයෝගය මත සාක්ෂාත් කර ගැනීමට අපට හැකි ව තිබේ. ඒ අනුව හෝමෝ එකොනොමිකස් විසින් නිරූපණය කරන ආත්මාර්ථකාමී ස්වරූපය වෙනුවට ඒ සියලු ගුණාංග පිළිබිඹු වෙන ස්ව-ආලෙඛනයක් වසයෙන් අපේ බහුවිධ ස්වරූපය ඇඳීමට අපට හැකි විය යුතු ය. දැන් තිබෙන හෝමෝ එකොනොමිකස් *(homo economicus)* ප්‍රතිරූපය කිසි සේත් ම පරිපූර්ණ එකක් නො වේ. එහෙත් දැනටමත් ඒ ප්‍රතිරූපය විසින් අප බොහෝ දුර නො මඟ යවනු ලැබ තිබේ. අවුරුදු 200ක් තිස්සේ අප කර ඇත්තේ කුමක් ද? අතේ යහමින් මිල මුදල් ගැවසෙන, හිසේ ගණක යන්ත්‍රයක් පිහිටුවා ඇති, දෙපා ළඟ ස්වභාවධර්මය දන නමා ඇති, අතෘප්තිකර තෘෂ්ණාවක් ඇති හෝමෝ එකොනොමිකස් මිනිසුන් ලෙස අප පිළිබඳ වැරදි ප්‍රතිරූපයක් ඔසවා ගෙන යෑම ය. එහෙත් අපේ පමණක් නො වන පෘථිවිය නමැති මේ අපේ පොදු නිවහන තුළ එකිනෙකා මත යැපීමෙන් සරු ඵල ලබන මිනිසුන් ලෙස අපේ ස්ව-ආලේඛනය අමුතුවෙන් ඇඳීමට දැන් කාලය පැමිණ තිබේ.

මිනිසුන් වන අපට විශාල පරාසයක වටිනාකම් අනුව නම්‍යශීලී විය හැකි ය. නිරන්තරයෙන් වෙනස් වන ආර්ථිකයේ ස්වභාවයට අනුව කේවල් කිරීම, පරිත්‍යාග කිරීම, තරග කිරීම සහ බෙදා හදා ගැනීම ආදී මේ සියල්ල එක ම විට යුක්ති සහගත ව හා සාධාරණ ව ඉටු කිරීමට අපට හැකි විය යුතු ය.

ඒ අනුව 'හෝමෝ එකොනොමිකස්' යන යෙදුම අත්හැරීමට අප සූදානම් නම් ඒ වෙනුවට යොදා ගත හැකි නම කුමක් ද?. ඒ සම්බන්ධයෙන් හෝමෝ හියුරිස්ටිකස් *(Homo heuristicus)*

හෙවත් 'හෝමෝ ස්වයංගවේෂණික', හෝමෝ රෙසිප්රොකන්ස් *(Homo reciprocans)* හෙවත් 'හෝමෝ ප්‍රත්‍යෝපකාරික', හෝමෝ අල්ත්රුයිස්ටිකස් *(Homo altruisticus)* හෙවත් 'හෝමෝ පරාර්ථකාමික' සහ හෝමෝ සෝසියලිස් *(Homo socialis)* හෙවත් 'හෝමෝ සමාජශීලික' ආදී විකල්ප නම් කිහිපයක් ම යෝජනා කර තිබේ. එහෙත් ඉන් අදහස් කරන පරිදි මනුෂ්‍යයා ඉන් එක් ස්වභාවයක් සමඟ පමණක් ප්‍රතිරූප ගත කිරීම තේරුමක් නැති වැඩක් වන්නේ එකී සියලු ස්වභාව එක ම මිනිසා තුළ ~~අවස්ථෝචිත~~ ප්‍රතිචාර වසයෙන් දක්නට ලැබෙන බැවිනි. මිනිස්සු ගනුදෙනු කිරීමට, කේවල් කිරීමට සහ හුවමාරු කිරීමට කැමැත්තෝ ය යනුවෙන් කියන විට ඇඩම් ස්මිත් බෙහෙවින් නිවැරදි ය. එහෙත් ඇඩම් ස්මිත් ඊටත් වඩා නිවැරදි වන්නේ 'අපේ සමාජ සමෘද්ධිමත් වන්නේ අප මනුෂ්‍යත්වය, යුක්තිය, නිර්ලෝභීත්වය සහ පොදු හැඟීම මත කටයුතු කරන විට දී ය' යන ඔහුගේ කීම සම්බන්ධයෙනි. ඒ නිසා යෝජනා කර ඇති නම්වලින් එකක් පමණක් තෝරා ගන්නවා වෙනුවට ඒ සියලු නම්වලින් කියැවෙන ගුණාංග නිරූපණය කිරීමට අපේ නව ස්වආලෙඛනයට හෙවත් නව ස්වරූපය පෙන්වන පින්තූරයට හැකියාව තිබිය යුතු ය.

# - 13 -

## නිස්සාරක ධනවාදය

ප්‍රංශ විප්ලවයේ සිට මේ දක්වා ඇතිවූ සංසිද්ධිවලින් ජනිත වූ දේශපාලන චින්තනය දිශානති වසයෙන් ගත හොත් විකල්ප දෙකකට අයත් වන බව අලන් බදියු පෙන්වා දෙයි[139]. මේ අතරින් වඩා ප්‍රමුඛ විකල්පය වන්නේ අද්‍යතන සමාජයේ නියම ස්වාමි දරුවන් වන ආර්ථිකය මෙහෙයවන අර්ථපතියන්ගේ සිතැඟි ඉටු කිරීමයි, මේ අර්ථපතියන් යනු නිෂ්පාදන මාර්ගවල අයිතිකරුවන් සහ ධනවාදී මූල්‍ය වෙළඳපොළ මෙහෙයවන බලවේග යි. මැතිවරණ පාදක කරගත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට අනුව කාට ආණ්ඩු බලය ලැබුණත් මේ අර්ථපතියන්ට කමක් නැත. මන්ද කවුරුන් බලයට පත් වුවත් එකී අර්ථපතියන් විසින් මෙහෙයවෙන "විවෘත වෙළඳපොළ" මඟින් ඉල්ලා සිටින දේවල් ඉටු කිරීමට බලයට පත්වූවන්ට සිදු වන බැවිනි. දැනට ලොව පුරා ක්‍රියාත්මක වන මේ දේශපාලන විකල්පය හැඳින්වෙන්නේ ධනවාදී විකල්පය යනුවෙනි.

නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥයෙකු වන ජෝසප් ස්ටිග්ලිට්ස් පෙන්වා දෙන අන්දමට සාමාන්‍යයෙන් රටක ජාතික ආදායම කොටස් තුනකට බෙදිය හැකිය. ඒවා නම් ශ්‍රමයෙන් ලැබෙන ආදායම ප්‍රාග්ධන ආයෝජනයෙන් ලැබෙන ආදායම සහ ඉතුරු සියලු දේවලින් ලැබෙන ආදායම යි. මේ ඉතුරු සියලු දේවලින් ලැබෙන

139 Badiou, Alain with Lancelin, Aude, (2019) *In Praise of Politics*, M*edf*ord: Polity Press, , p.15

ආදායම යනුවෙන් බොහෝ විට අදහස් කරන්නේ ආර්ථික විද්‍යාඥයන් 'බදු කුලිය' හෙවත් *Rent* යනුවෙන් හඳුන්වන හම්බ කිරීමකින් තොර ව ලබන ආදායම යි. මේ සම්බන්ධයෙන් පැහැදිලි ම උදාහරණය වන්නේ කිසිදු වෙහෙසක් නො ගෙන උපයා ගත හැකි ඉඩම් බදු කුලිය යි. එහෙත් ස්වාභාවික සම්පත් ඒකාධිකාරවල ලාභය සහ බුද්ධිමය දේපළ හිමිකම සඳහා ලැබෙන ආදායම වැනි දේවල් ද සැලකෙන්නේ මෙකී බදු කුලී ආදායම් ගණයට ය. කෙසේ වෙතත් වැඩ කිරීමෙන් සහ බදු කුලී මඟින් ලබාගත් ආදායම් අතර මූලික වෙනසක් පවතී. ඒ මෙසේ යඃ කම්කරුවන් වැඩියෙන් වැඩ කළ විට ජාතික ආදායමේ ප්‍රමාණය ද ඉහළ යයි. ස්ටිග්ලිට්ස් පවසන අන්දමට කිසිදු දොසක් නැති පරිසමාප්ති වෙළඳපොළක නම් එසේ කම්කරුවන් විසින් ජාතික ආදායමට එක් කරන ලද අතිරේක මුදල ඔවුන්ගේ උත්සාහයට ගෙවීමක් ලෙස ආපසු කම්කරුවන්ට ම ලැබිය යුතු ය.

එයට වෙනස් ව ඉඩමක හෝ වෙනත් ආකාරයක බදු කුලියෙන් උපයන වත්කමක අයිතිකරුට ආදායමක් ලැබෙන්නේ හුදෙක් ඔහු එම වත්කමෙහි හිමිකරු වීම නිසා මිස වෙන කිසි ම හේතුවක් නිසා නො වේ. ඉඩමක් වැනි බදු කුලිය ලබන වත්කමක් යනු නියත දෙයකි - ඒ අනුව හුදෙක් එවැනි වෙනස් නොවෙන වත්කමක හිමිකරු විසින් කෙරෙන දෙයකින් ජාතික ආදායමට අමතර කිසිවක් එකතු නො වේ. උදාහරණයක් ලෙස ඉඩමකට ශ්‍රමය යොදා වගාවක් කළොත් හැරෙන්නට හිස් ඉඩමකින් ජාතික ආර්ථිකයට පළක් නො වේ. එහෙත් ඉඩම්වල හිඟයක් පවතින බැවින් කලක් ගත වූ පසු ඉඩම් හිමියෙකුට හිස් ඉඩමක් විකිණීමෙන් වුව ද විශාල ආදායමක් ලබා ගත හැකි ය. එහෙත් එම ආදායම බොහෝ විට ඔහුට ලැබෙන්නේ වෙනත් ස්වදේශිකයෙකුගෙන් බැවින් ඒ ක්‍රියාව නිසා ජාතික ධනයට අලුතින් යමක් එකතු නො වේ. ඇත්ත වශයෙන් ම එහි දී ඉඩම් හිමියා ලබා ගන්නේ අනෙක් අයට ද බෙදී යා යුතු ධනයකි. ඒකාධිකාරවල තත්වයත් ඒ හා සමාන ය. ඒකාධිකාරවල බලය වැඩි වෙන විට ඒකාධිකාරීන්ට වැඩිපුර ලාභ නොහොත් බදු කුලිය වැඩියෙන් ලබා ගත

හැකි ය. එහෙත් මෙහි දී ජාතික ආදායමේ ප්‍රමාණය එයට අනුරූපී ව අඩු විය හැකි ය. ඊට හේතුව සිය වෙළඳපොළ බලය උපයෝගී කර ගැනීමට ඒකාධිකාර හිමිකරු විසින් තම භාණ්ඩ නිෂ්පාදනය සීමා කරනු ලබන බැවිනි. එවැනි අවස්ථාවල දී බොහෝ විට කෙරෙන්නේ ලාභය වැඩි කිරීම පිණිස භාණ්ඩ හිඟයක් ඇති කිරීම යි.

උපයා ගත් සහ උපයා නො ගත් ආදායම අතර පැහැදිලි වෙනසක් පවතින බව අප වටහා ගත යුතු ය. ඉපයූ ආදායම යම් ආකාරයක ප්‍රයෝජනවත් වැඩක් සඳහා ගෙවීමක් වන අතර, උපයා නො ගත් ආදායම යනු *rentier* යනුවෙන් ආර්ථික විද්‍යාවේ හඳුන්වන ස්වෝත්සාහයෙන් ඉපයීමක් නො කොට උරුමයෙන් හෝ වෙනත් නිස්සාරණ ක්‍රමවලින් ලබාගන්නා ආදායම යි.

සාමාන්‍යයෙන් ව්‍යාපාර කටයුතුවල ස්වභාවය අනුව සාම්ප්‍රදායික ව සමාගම් වර්ග තුනකට වෙන් කළ හැකි ය. ඉන් පළමු වැනි වර්ගය අමුද්‍රව්‍ය සැපයීම කරන ප්‍රාථමික ව්‍යාපාර සමාගම් ය. දෙවැන්න භාණ්ඩ නිෂ්පාදන සමාගම් වන අතර තෙවැනි වර්ගය සේවා සපයන සමාගම් වේ. එහෙත් බොහෝ නිස්සාරක සමාගම් මේ සාම්ප්‍රදායික වර්ගීකරණයට අයත් නො වේ. උදාහරණයක් ලෙස ඉහත කී එකද වර්ගීකරණයකට අයත් නො වන, 2021 වසරේ ඩොලර් බිලියන 29 ක් ඉපයූ *Facebook* සමාගම ගත්තොත් එය වෙළඳපොළ තුළ ඒකාධිකාරය තහවුරු කර ගෙන ඇත්තේ මහජනයා විසින් දිනපතා නො මිලේ සපයන අන්තර්ගතය සහ පොදු දේපළක් වන අන්තර්ජාලය භාවිත කිරීමෙනි. මරියානා මස්සුකාටෝ ඇයගේ *The Entrepreneurial State: Debunking Public vs, Private Sector Myths* නමැති කෘතියේ පෙන්වා දුන් පරිදි මෙවැනි ප්‍රකට ව්‍යාපාරික සමාගම් බොහෝමයක් සිය ඒකාධිකාරී ව්‍යාපාර සහ බුද්ධිමය දේපළ ගොඩ නඟා ගෙන ඇත්තේ පොදු අරමුදල්වල උදව්වෙන් බිහි කරන ලද තාක්ෂණය සහ දැනුම උපයෝගී කර ගැනීමෙනි. එහෙත් ඒ සමාජ හිමිකම උපයෝගී කර ගැනීම වෙනුවෙන් සැලකිය යුතු කෘතෝපකාරයක් එම සමාගම්වලින් උපයන ලාභයෙන් ජනසමාජයට නො ලැබේ.

වෙනත් නිසි පාරිභාෂික පදයක් නැති බැවින් *Rentier Capitalism* යන්නට සිංහලෙන් 'නිස්සාරක ධනවාදය' යන යෙදුම ගැළපේ යැ'යි මම සිතමි. *Rentier Capitalism* යන්නට එකිනෙකට අනුපූරක තේරුම් කිහිපයක් යෙදෙන බව පෙනෙන නිසා මෙහි දී ආචාර්ය බ්‍රෙට් ක්‍රිස්ටොපර්ස් '*Rent*' හෙවත් 'කුලිය' යන්න තේරුම් කරන ආකාරය වටහා ගැනීම වැදගත් ය. "*Rent* හෙවත් කුලිය යන්නෙන් මෙහි දී අදහස් කරන්නේ තරඟකාරිත්වය අතිශයින් සීමා කර ඇති හෝ කිසිදු තරඟයක් නැති තත්වයන් යටතේ අයිතියට, සන්තකයට හෝ පාලනය නතු කර ගෙන ඇති දුලබ හෝ දුලබ බවට පත් කරන ලද වත්කම්වලින් ලැබෙන ආදායමටයි."[140] කිසිදු තරඟකාරිත්වයකින් තොර ව (බොහෝ විට හුදෙක් දේශපාලන අනුග්‍රහය මත) තමන් සන්තක කර ගෙන ඇති පොදු දේපළ, ස්වාභාවික සම්පත්, පොදු ව්‍යාපාරවලින් මෙන් ම වෙළඳපොළ තුළ අත්පත් කර ගෙන ඇති ඒකාධිකාරීත්වය නිසා උපයන ආදායම් ද මේ ගණයට වැටේ. සේවක අර්ථ සාධක අරමුදල වැනි පොදු අරමුදල් අවභාවිත කරමින් "කොටස් වෙළඳපොළ කරකවා අතාරින" ව්‍යාපාරිකයන්ගේ කූට ක්‍රියාන්විතවල සිට 'ප්‍රයිමරි ඩීලර්ස්' යනුවෙන් තරඟකාරිත්වය සීමා කරමින් බැඳුම්කර හරහා විශාල වසයෙන් ආදායම් නිස්සාරණය කර ගන්නා බ්‍රෝකර් සමාගම් ද ඇතුළු මූල්‍ය ධනවාදී ක්ෂේත්‍රයේ බොහෝ කටයුතු නිස්සාරක ධනවාදය ලෙස සැලකිය හැකි ය.

මුළු ගෝලීය ආර්ථිකය ම දැන් විශාල වසයෙන් රඳා පවතින්නේ '*rentier capitalism*' හෙවත් මේ නිස්සාරක ධනවාදය මත බව ආචාර්ය ක්‍රිස්ටොපර්ස් පෙන්වා දෙයි. එහි දී භෞතික, මූල්‍යමය හා බුද්ධිමය වසයෙන් ගැනෙන දේපළවලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ අත්‍යන්තයෙන් ඉහළ ගොස් ඇති අතර ශ්‍රමයට ලැබෙන ප්‍රතිලාභ අඩු වෙමින් පවතී. කොටින් ම නිෂ්පාදනයෙන් ලැබෙන ලාභය සහ ශ්‍රමයෙන් ලැබෙන ආදායමට සාපේක්ෂව නිස්සාරණයෙන් ලැබෙන ආදායම ඉතා ඉහළ යමින් පවතී. ඒ අතර තරඟයක්

140 Brett Christophers. (2021) *Rentier Capitalism: Who Owns the Economy, and Who Pays for It?,* London: Verso, p.

නොමැති වෙළඳපොළවල් තුළ අධික මිල ගණන් මඟින් ඒකාධිකාරී සමාගම් නිස්සාරණය කරන විශාල ලාභය සේවකයන් හා බෙදා ගැනීමක් ද සිදු නො වේ. මෑත දී කරන ලද අධ්‍යනයකට අනුව බ්‍රිතාන්‍ය කොටස් වෙළඳ පොළේ ලැයිස්තු ගත කර ඇති ඉහළ ම සමාගම් 300 පසුගිය දශක තුන තුළ සිය ආදායම සේවකයන් සමඟ බෙදා ගැනීම අනුක්‍රමයෙන් අඩු කර ඇති බව පෙනී ගියේ ය.

ඒ අනුව ස්ටිග්ලිට්ස් පෙන්වා දෙන්නේ ඉතා යහපත් තත්වයක් යටතේ වුව ද *rent* හෙවත් බදු කුලිය යනු රටක ආර්ථික වර්ධනයට හෝ කාර්යක්ෂමතාව වැඩි කිරීමට දායක වන සාධකයක් නො වන බවයි. නරක තත්ව යටතේ බදු කුලිය ඇත්තට ම හානිදායක වීමට ද හැකි ය. එය හානි දායක වන්නේ නියම ධනය නිපදවීමේ කටයුත්තට පදනම වන "යහපත්" ආර්ථික කටයුතු එමඟින් විස්ථාපනය කරමින් ආර්ථිකය විකෘත කිරීමක් සිදු වන නිසා ය. බදු කුලිය මඟින් වැඩි වැඩියෙන් ඉපයීමට තැත් කිරීම ආර්ථික විද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන්නේ *'rent seeking'* හෙවත් 'බදු කුලී ලොල් වීම' යනුවෙනි.

සමාජයක සිටින ප්‍රතිභාපූර්ණ පුද්ගලයන් වැඩි දෙනෙක් සමාගම් ඒකාධිකාරවල බලයෙන් හෝ බැංකු හා මූල්‍ය අංශයේ වෙනත් නොයෙක් කුටෝපායෙන් හා සූදුකාර දුෂ්ට මූල්‍ය උපායමාර්ගවලින් හුදෙක් බදු කුලී ලෝලී කටයුතු මඟින් පමණක් මුදල් උපයා ගැනීමට උත්සුක වීම අනර්ථකාරී ය. මන්ද ඒ නිසා සමාජයක නියම අවශ්‍යතා සපුරන සහ නියම ධන සම්පත් උපයා ගැනීමට හේතු වන මූලික නවෝත්පාදන හා පර්යේෂණ කටයුතුවල නිරත වීමට අවශ්‍ය තරම් ප්‍රතිභාපූර්ණ පුද්ගලයන් ප්‍රමාණයක් ඉතිරි නො වනු ඇතැ'යි ස්ටිග්ලිට්ස් පවසයි. ඒ හැර සිය විශ්‍රාම ජීවිතය සඳහා ඉතුරු කිරීමට හෝ තමන්ගෙන් පැවත එන්නන්ට ධනය උරුම කිරීමට හෝ බදු කුලිය නිපදවන ඉඩම් වැනි වත්කම්වල ආයෝජනය කිරීමට ඇති හැකි අය පෙලඹෙන විට නිෂ්පාදන කටයුතු වැඩි දියුණු කරන කම්හල් සහ යන්ත්‍ර සූත්‍ර ආදී ගාමක වත්කම් සඳහා කෙරෙන ආයෝජන අඩු විය හැකි ය. ඒ නිසා ඇත්ත වසයෙන් ම අප කළ යුත්තේ මුදල්

විශුද්ධිකරණය සහ මූල්‍ය අංශයේ කට්ට කෛරාටික කම්වලින් ලැබිය හැකි වාසි ගැන සිහින මවමින් මූල්‍ය ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීම මත විශ්වාසය තැබීම නො ව අපේ ප්‍රතිභාපූර්ණ තරුණ තරුණියන් නවෝත්පාදනයට හා නිර්මාණශීලී නිෂ්පාදනයට යොමු කරවන ආර්ථිකයක් ගොඩ නැගීමට අවශ්‍ය සාධක ඇති කිරීම යි.

ආර්ථික ක්‍රමයක් නිසි ලෙස ක්‍රියාත්මක වීමට විශ්වාසය නමැති සාධකය අත්‍යවශ්‍ය වේ. මෙය වඩාත් ම අදාළ වන්නේ බැංකු හා මූල්‍ය ආයතනවලට ය. අපට අවශ්‍ය වේලාවට අපේ බැංකු තැන්පතු ආපසු ලබාගැනීමටත් අප සංකීර්ණ මූල්‍ය මෙවලම් බැංකු හා මූල්‍ය ආයතනවලින් මිල දී ගන්නා විට රැවටිලි හා වංචාවලට ගොදුරු නො වේ යැ'යි විශ්වාස කිරීමටත් අපට හැකි විය යුතු ය. එහෙත් නොයෙකුත් රටවල බැංකු හා මූල්‍ය ආයතන කඩා වැටීම් විමසා බලන විට තවදුරටත් එකී ආයතන කෙරෙහි විශ්වාසය තැබිය නො හැකි බව පැහැදිලි වේ. එය සමස්ත ආර්ථිකය පිළිබඳ විශ්වාසයට ද අභියෝග කරයි. සිය කීර්ති නාමය වෙනුවට ක්ෂණික ලාභය තකා වැඩිදුර කල්පනා නො කිරීමේ ඇබ්බැහිකම අගය කිරීමට බැංකු පුරුදු වී ඇති බව මෑතක මූල්‍ය අංශයේ ඇතිවූ අර්බුදවලින් පැහැදිලි වේ. "සාම්ප්‍රදායික ව පැවති අවංකකම සහ විශ්වාසය පිළිබඳ කීර්තිය බැංකුවල වත්කමක් ලෙස සැලකීම අතීතයට අයත් අඳුරු නෂ්ටාවශේෂයකි" යනුවෙන් සුප්‍රකට ගෝල්ඩ්මන් සාච් බැංකුවේ අධිපති ලොයිඩ් බ්ලැන්ක්ෆයින්ගේ ප්‍රකාශයෙන් ඒ බව තහවුරු නො වන්නේ ද? ගෝල්ඩ්මන් සාච් යනු අසාර්ථක වීම සඳහා ම සුරැකුම්පත් සැලසුම් කළ ආයතනයක් බව ස්ටිග්ලිට්ස් පෙන්වා දෙයි. ඉහළ විධායකයන්ට දැවැන්ත පාරිතෝෂික මුදල් උපයා ගත හැකි කෙටි කාලීන ලාභය හඹා යෑම සඳහා ආයෝජකයන් සහ තැන්පත්කරුවන් රවටමින් ආයෝජන බැංකු හා මූල්‍ය ආයතන කටයුතු කර තිබූ ආකාරය 2008 උද්ගත වූ ගෝලීය ආර්ථික අර්බුදයට හේතු සොයා යෑමේ දී පැහැදිලි විය. ඒ අර්බුදය නිසා එක්සත් ජනපද රජයට ඩොලර් බිලියන 700ක මහජන අරමුදල් වැය කොට බැංකු සහමුලින් ම කඩා වැටීම වළක්වා ගැනීමට සිදු විය.

ස්ටිග්ලිට්ස් ඔහුගේ *People, Power and Profits: Progressive Capitalism for an Age of Discontent* නමැති කෘතියේ පෙන්වා දෙන අන්දමට රටවලට පොහොසත් විය හැකි ක්‍රම දෙකක් තිබේ[141] ඉන් එක් ක්‍රමයක් වන්නේ යටත් විජිත යුගයේ දී මෙන් අනෙක් රටවල ධන සම්පත් විවිධ ක්‍රමවලින් සූරා කෑමයි. දෙවැනි ක්‍රමය වන්නේ නවෝත්පාදනය සහ ශිල්පීය ප්‍රාගුණ්‍ය හෙවත් දැනුම උපයෝගී කර ගෙන ධනය නිපදවා ගැනීම යි. සමස්තයක් ලෙස ගත් විට ධනය නිපදවීම සඳහා වඩාත් උචිත ප්‍රභවය වන්නේ දෙවැනි ක්‍රමය යි.

ස්ටිග්ලිට්ස් පෙන්වා දෙන පරිදි රටවලට පමණක් නො ව පුද්ගලයන්ට ද මේ කියූ ක්‍රම දෙක අදාළ ය. ඒ අනුව නීතියේ ආධිපත්‍යයක් නොමැති රටවල නීතිය නැමීමෙන්, අයුතු නීති යොදා ගැනීමෙන්, බලහත්කාරී බලපෑමෙන් හා වහලුන් මෙන් සේවකයන් සූරා කෑමෙන් කෙනෙකුට පොහොසත් විය හැකි ය. ඇමෙරිකානු ආර්ථිකය තුළ නම් එය ඊට වඩා කූට ලෙස කළ යුතු බව ස්ටිග්ලිට්ස් පවසයි. වෙළඳපොළ තුළ තමන්ට ඇති උපක්‍රමීය මෙහෙයවුම් බලය *(manipulative power)* උපයෝගී කර ගෙන පාරිභෝගිකයන්ගෙන් වැඩි මිලක් අය කිරීම, පෞද්ගලික සෞඛ්‍ය සේවා සැපයීමේ දී මෙන් පාරිභෝගිකයන්ගෙන් දුරවබෝධ සංකීර්ණ ගාස්තු අය කිරීම ආදිය ඒ සඳහා ඇතැම් උදාහරණ යි. එමෙන් ම 'ගොදුරු භක්ෂණීය ණය දීම' (*predatory lendin*ට), වංචනික ලෙස වෙළඳපොළ මෙහෙයවීම *(Wod: Inside Trading)* ඇතුළුව අයුතු ආකාරයේ කොටස් වෙළඳාම හෝ මූල්‍ය අංශයේ කුප්‍රකට කපටිකම් ලෙස පතළ නොයෙකුත් අනිසි ක්‍රමවලින් ද ධනය උපයා ගනු ලැබේ. ධනය කොල්ලකෑමේ තවත් ප්‍රධාන ක්‍රමයක් වන්නේ දූෂණය යි. අඩු සංවර්ධිත රටවල නම් දූෂණය යනුවෙන් බොහෝ විට හැඳින්වෙන්නේ ලියුම් කවරයක බහාලූ මුදලක් අල්ලස් ලෙස දී තමන්ට ලාභයක් සැලසෙන වරදානයක් ලබා ගැනීම යි. එහෙත් ඇමෙරිකානු ක්‍රමයේ දූෂණය එයට වඩා සංකීර්ණ බව ස්ටිග්ලිට්ස් පෙන්වා දෙයි. ආරක්ෂක අංශයේ කොන්ත්‍රාත්තුවල දී

141 Stiglitz, J (2020) *People, Power and Profits: Progressive Capitalism for an Age of Discontent*, London: Penguin, p.57

මෙන් ඉතා වැඩි මුදලක් රජයෙන් අය කර ගැනීමට හැකි වන ලෙස අනෙකුත් කොන්ත්‍රාත්තු හා ගිවිසුම් නීති සකස් කර ගැනීම මෙන් ම ඛනිජ ඉන්ධන, ආකර කර්මාන්ත හා දැව සඳහා වනාන්තර එළි කිරීම වැනි ධනය උපයා ගැනීම පිණිස පොදු දේපළ භාවිත කිරීමට අවශ්‍ය වන කටයුතුවල දී ඒ සඳහා හැකි තරම් අඩු මිලක් රාජ්‍ය භාගය වසයෙන් ගෙවීම පිණිස ගිවිසුම් ගසා ගැනීම වැනි අකටයුතු එම ක්‍රමයට අයත් වේ.

එහෙත් ඊට විකල්ප ව කෙනෙකුට නවෝත්පාදන හා නව නිෂ්පාදන හඳුන්වා දීම මඟින්, අවම වසයෙන් එම නිපැයුම අන් අය විසින් වැඩිදියුණු කර හෝ අගය එකතු කර ලාභයක් ගැනීමට පෙර ටික කාලයකට හෝ විශාල ලාභයක් ලබා ගත හැකි ය. ඒ අන්දමේ ධන නිෂ්පාදනය රටක ජාතික ධනය ප්‍රමාණාත්මක ව වැඩි කිරීමට ඍජු ව ම දායක වේ. ස්ටිග්ලිට්ස් පෙන්වා දෙන අන්දමට අපට අවශ්‍ය වන්නේ එවැනි ආකාරයේ ධන නිෂ්පාදනය යි.

ගසා කෑම මඟින් පොහොසත් වීමේ එක් ක්‍රමයක් වන්නේ සමාජ පිරමීඩයේ පහළ තලවල සිට ඉහළ තලවලට ධනය උදුරා ගැනීම යි. ස්ටිග්ලිට්ස්ගේ මතයට අනුව මෙහි දී ඇත්ත වසයෙන් ම සිදු වන්නේ ධනය අලුතින් ඉපයීමකට වඩා ඉපද වූ ධනය විනාශ කිරීමකි. මේ ගසා කෑමේ ක්‍රමය බැංකු හා මූල්‍ය සමාගම් ක්ෂේත්‍රයේ ගොදුරු භක්ෂණීය ණය ක්‍රම, ණයවරපත් හෙවත් ක්‍රෙඩිට්කාඩ්පත් මඟින් ගසා කෑම, උපක්‍රමික ව වෙළඳපොළ මෑනවීම් සහ කොටස් වෙළඳාමේ අකටයුතුකම් මඟින් සාක්ෂාත් කර ගනී.

"හුදෙක් තමන්ගේ අභිවෘද්ධිය තකා ම කටයුතු කරන පුද්ගලයින් සහ සමාගම්වල කටයුතු නිසා අදෘශ්‍යමාන හස්තයකින් මෙන් අවශේෂ සමාජීය අවශ්‍යතා ද ඉටු වේ" යන ඇඩම් ස්මිත්ගේ කියමන බොහෝ උජාරුවෙන් උපුටා දක්වමින් නිදහස් වෙළඳපොළ ඔජ වඩන ප්‍රවර්ධකයෝ එක් දෙයක් අමතක කරන බව ස්ටිග්ලිට්ස් පවසයි. එය නම් ඇඩම් ස්මිත්ගේ ම තවත් කියමනක් වන "එක ම වෙළඳාමක යෙදෙන මිනිසුන් විනෝදය සඳහා හෝ එක් වන්නේ

කලාතුරකිනි. එහෙත් එසේ වූ විට ඔවුන්ගේ කතාබහ අවසන් වන්නේ පොදු ජනතාවට එරෙහි ව කරන කුමන්ත්‍රණයකින් හෝ මිල ඉහළ දැමීමේ උපක්‍රමයකිනි"[142] යන්නයි. නිරන්තරයෙන් ඇතිවෙන මේ තර්ජනය හේතු කොට ගෙන මීට අවුරුදු 125 කට පෙර ඇමරිකානු කොන්ග්‍රසයට වෙළඳපොළ තරඟය මඟ හරවන ක්‍රියාකාරකම් සහ තරඟය අවම කරන කුමන්ත්‍රණ තහනම් කිරීම පිණිස ඇන්ටිට්‍රස්ට් *(antitrust)* හෙවත් 'ප්‍රතිභාරකාරත්ව නීති' සම්පාදනය කිරීමට සිදු විය.

සියවස් දෙක තුනක් පැවති ධනවාදී සංවර්ධනයේ ඇතැම් ප්‍රතිඵල ප්‍රගති දායක වූ බව සැබෑවකි. එහෙත් 1970 ගණන්වල සිට අතළොස්සක් අත ධනය සමුච්චයනය *(accumulation)* වීම මත පදනම් වන නවලිබරල්වාදී එළඹුම එන්න එන්න ම මානව සමාජයේ යහ පැවැත්මට අභියෝගයක් වූ බව පෙන්වන සාධක එමට ය. ඒ බව නො කඩවා වැඩි වෙන ආදායම් පරතරය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල සමාජ විෂමතා, ආත්මාර්ථකාමී චර්යාව උත්කර්ෂයට නැංවීම, ඉවක් බවක් නැති පරිභෝජන රටාව, මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම, වංචනික හා දූෂිත දේශපාලනය හා පරිපාලනය, සමාජ ආරක්ෂණය සහ ඇතුළු පොදු සේවාවල අවනතිය, ජන වාර්ගික හා ආගමික ගැටුම්, ස්වාභාවික සම්පත්වලට හා පරිසරයට සිදුවී ඇති හානිය මෙන් ම වැඩි වෙන ගෝලීය උණුසුම නිසා ඇතිවිය හැකි අස්ථාවර භාවය පිළිබඳ විවිධ සාධකවලින් ද හෙළි වේ.

එහෙත් අසම්පූර්ණ ව අත්හදා බැලුණු ඒ නිසාම සාර්ථක ව සාක්ෂාත් කර ගත නො හැකි වූ තවත් වැදගත් විකල්පයක් ද වෙයි. එය පදනම් වී ඇත්තේ ප්‍රජා පැවැත්ම පිළිබඳ සියලු මාර්ග ප්‍රජාව විසින් ම අත්පත් කර ගත යුතු ය, ප්‍රජා සන්නිරීක්ෂණය යටතේ ප්‍රජා යහපත සඳහා මෙහෙයවිය යුතු ය යන අදහස මතය. මෙහි දී මූලික අරමුණ වන්නේ සියල්ල මෙන් ම සියලු දෙනා ම ද ස්වාර්ථකාමී 'හෝමෝ එකොනොමිකස්' ගැන බලාපොරොත්තු තබා කටයුතු

142 Stiglitz, J (2020) People, *Power and Profits: Progressive Capitalism for an Age of Discontent*, London: Penguin, p 59

කරනවාට වඩා පොදු යහපත මුල් කර ගෙන කටයුතු කළ යුතු බව යි. ඊට අනුව දේශපාලනය යනු නූතන ධනවාදී ක්‍රමයේ දුර්වල ශරීර සෞඛ්‍ය ඊනියා යහපාලනයක් මගින් යහතින් පවත්වා ගෙන *hd* හැකි යැ'යි විශ්වාස කිරීම නො වේ. ඒ වෙනුවට මේ විකල්පයේ දී දේශපාලනය යනුවෙන් හැඳින්වෙන්නේ පොදු බව, සහ පොදු යහපත භුක්ති විඳිය යුත්තේ පොදුවේ ය යන අවබෝධය ප්‍රායෝගික ව සහ දයාන්විත ව ක්‍රියාවට නැංවීමයි.

මේ සඳහා කෙරෙන දැනුවත් සාකච්ඡාව තුළ අඩ සිය වසක් තිස්සේ උත්කර්ෂණයට නංවන ලද නවලිබරල්වාදී ආර්ථික චින්තනයේ පැහැදිලි අසාර්ථකත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස මුල් බැස ගත් ධනය ජුගුප්සාජනක ලෙස කොල්ලකෑම හා අතළොස්සක් අත ධනය සංකේන්ද්‍රණය වීම සහ මානවයා ආත්මාර්ථය ම ප්‍රමුඛ කොට ගත් හුදු ආර්ථික සත්වයෙක් ලෙස සැලකීමේ ප්‍රතිවිපාක තාර්කික විනිශ්චයකට ලක් විය යුතු ය. එමෙන් ම සමාජ හා ආදායම් විෂමතාව අවම කිරීම සහ අත්‍යවශ්‍ය පරිසර පද්ධති සංරක්ෂණය හා ගෝලීය උණුසුම වැඩි වීම පිළිබඳව කාර්යක්ෂම හා සාධාරණ විසඳුම් සොයා ගත යුතු ය. මේවායින් බොහෝමයක් දේශපාලන ඒකකයක් වසයෙන් ජාතික රාජ්‍ය මට්ටමෙන් පමණක් විසඳීමට නො හැකි කරුණු නිසා කලාපීය හා ගෝලීය මහජන සහයෝගිතාව මත විසඳුම් ගෙන ඒමේ හැකියාව ගොඩනගා ගත යුතු ය. ඒ සඳහා පෙළ ගැසිය යුතු දේශීය, කලාපීය හා ගෝලීය මට්ටමේ මහජන සහභාගිත්වය හා සන්නිරීක්ෂණය තහවුරු කිරීමට උචිත සංවිධානාත්මක හා ව්‍යුහාත්මක වෙනස්කම් නිශ්චය කර ගත යුතු ය. ඒ අනුව අපේ අරමුණ විය යුත්තේ නවලිබරල්වාදය විසින් උත්කර්ෂණයට නංවන ලද ධනවාදී වටිනාකම් වෙනුවට පොදු අයිතිය, පොදු යහපත, අන්‍යෝන්‍ය සහයෝගිතාව, සහරක්ෂණය සහ දයානුකම්පාව පෙරදැරි කරගත් සජ්ජන සමාජයක් ගොඩ නැගීමයි.

පොදු යහපත මුල්කරගත් සජ්ජන සමාජයක් දේශීය, කලාපීය හා ගෝලීය වසයෙන් බිහි කිරීමට අත්‍යවශ්‍ය එකිනෙක මත යැපෙන, සාකච්ඡා කොට සාක්ෂාත් කර ගත යුතු වැදගත් සංක්‍රාන්තීය

කොන්දේසි ගණනාවක් තිබිය හැකි ය. ඒ සඳහා අවශ්‍ය වන සංවිධාන ව්‍යුහය හා ව්‍යවස්ථාපිත විධි විධාන කෙබඳු ස්වරූපයක් ගත යුතු ද යන්න පිළිබඳ නිසි අවධානයක් යොමු කිරීමට නම් හඳුන්වා දීමට බලාපොරොත්තු වන නව ආර්ථික එළඹුම පිළිබඳව අදහස් අප පළමුවෙන් නිරවුල් කර ගත යුතු ය. එකී අදහස්වලින් වැදගත් යැ'යි සැලකිය හැකි  කිහිපයක් මෙසේ පෙළ ගැස්විය හැකියඃ

පුද්ගලික ධනය අසාධාරණ ලෙස ඒකරාශි වීම වළක්වා ධනය ඵලදායක ලෙස ප්‍රතිව්‍යාප්ත- කිරීම, මුදල් විශුද්ධිකරණය හා සැඟවීම වැළැක්වීම, බදු ආදායම කාර්යක්ෂම හා සාධාරණීකරණය කිරීම, සමාජ වගකීමක් ලෙස සැමට 'සාර්වත්‍රික මූලික ආදායමක්' *(Universal Basic Income)* සහතික කිරීම, පොදු සේවා කාර්යක්ෂම කිරීම,  එසේ ම පොදු යහපත මුල්කරගත් ජනතා සහභාගිත්වය ඉහළ නැංවීම පිණිස සහ නිවැරදි හා පරිපූර්ණ තොරතුරු සැපයීම මඟින් පුරවැසියන්ගේ ඥානෝද්දීපනය *(enlightenment)* කළ හැකි මහජන සේවා විද්‍යුත් මාධ්‍ය ද *(Public Service Broadcasting)* ඇතුළුව බහුත්වවාදී ජනමාධ්‍ය හා සංනිවේදන පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම, දැනුම ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපනයේ විචාරශීලී බව ඉහළ නැංවීම හා සැමට සුභාවිත හා ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සැලසීම, වැඩ කරන සතිය දින හතර දක්වා කෙටි කිරීම මඟින් සැමට පවුල හිත මිතුරන් හා ප්‍රජාව සමඟ මෙන් ම තමා හා ගත කරන ගුණාත්මක කාලය *(quality time)* වැඩි කර ගැනීමට ඉඩ සලසා දීම සහ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය  ආර්ථිකය ප්‍රතිසංස්කරණ කිරීමට දායක වන කරුණු  එකී  නිරවුල් කර ගැනීමේ කටයුත්තේ දී සවිස්තරව සාකච්ඡා කළ හැකි ය.

මේ කාර්යයේ දී වැදගත් වන්නේ නවලිබරල්වාදී වර්ධන වේගය මුල්කරගත් ආර්ථික චින්තනය වෙනුවට පොදු යහපත, සදාචාරය, අන්‍යෝන්‍ය සහයෝගය, හා පරාර්ථකාමී තෘප්තිය වර්ධනය වෙන අන්තර්ග්‍රහණීය *(inclusive)* තිරසාර සංවර්ධනයකට තුඩු දෙන පරිසර

සංවේදී මෙහෙවර ආර්ථික *(mission economy)* එළඹුමක් අනුගමනය කිරීම යි. ඒ සඳහා නව පරපුරට අයත් ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස් විමසමින් නවලිබරල්වාදී ආර්ථික චින්තනය අතික්‍රමණය කළ හැකි, සමාජ අසමානතාව අවම කරන, හුදු ස්වාර්ථකාමය වෙනුවට දයාව හා සහජීවනය මත පදනම් වන සමාජයක් ඇති කර ගැනීමට උචිත ආර්ථික චින්තනයක් බිහි කර ගැනීමේ හැකියාව අප සලකා බැලිය යුතු ය. ඒ අනුව ඇලන් බදියු හුවා දක්වන යුක්තිය සාක්ෂාත් කර ගැනීමේ දේශපාලනයක ඵලයක් ලෙස බිහි වෙන නව දේශපාලන සුසමාදර්ශයක් මඟින් තිරසාර සංවර්ධනය තහවුරු කරමින් නිෂ්පාදන ආර්ථිකය ප්‍රතිසංවිධානය වන අන්දම ද අප ගැඹුරින් සාකච්ඡාවට ලක් කළ යුතු ය.

# - 14 -

## නව ලිබරල්වාදයේ ආගමනය

ඇඩම් ස්මිත්ගේ (1723-1790) ආදිකර්තෘත්වයෙන් බිහි වූ සම්භාව්‍ය ලිබරල් ආර්ථික දර්ශනයට පදනම වූයේ 'මනුෂ්‍යයා වනාහි නිදහස් වෙළඳපොළක කෙරෙන තාර්කික ගනුදෙනු මඟින් සිය පුද්ගලික ද්‍රව්‍යයමය අවශ්‍යතා සපුරා ගන්නා සත්වයෙකි' යන්නයි. මේ දැක්මට අනුව දේශපාලනය හා ආර්ථිකය යනු බොහෝ දුරට එකිනෙකින් වෙන් ව පවත්වා ගත යුතු ක්ෂේත්‍රයෝ ය. එහෙත් මේ වෙනස පවත්වා ගෙන යෑමේ දී ආර්ථික ක්ෂේත්‍රය සුවිශේෂ කොට සැලකුණි. මන්ද ස්මිත්ගේ මතය අනුව ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන්නේ ආණ්ඩුවේ දේශපාලනික මැදිහත් වීමකින් තොර ව වෙළඳපොළ තුළින් ම ඇතිවෙන නියාමනයට අනුව නිෂ්පාදන හා ගනුදෙනු කටයුතු කරන විට දී බැවිනි. ඒ අනුව ස්වාර්ථය තකා කටයුතු කරන පුරවැසියන්ගේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීම වෙනුවට රජය විසින් කළ යුතු වන්නේ හුදෙක් තරඟකාරී වෙළඳපොළ මඟින් නිර්බාධක ව ආර්ථික කටයුතු කර ගෙන යෑමට ඉඩ සලසා දීම යි. ඒ කෙසේ වුවද වෙළඳපොළ අසමර්ථකම් ද ඇතිවිය හැකි බව ඇඩම් ස්මිත් වටහා ගෙන තිබුණි. ඒ නිසා අවශ්‍ය විට දී පමණක් ආර්ථිකය සම්බන්ධයෙන් නිශ්චිත පටු ක්ෂේත්‍රයක් තුළ රජයට තීරණාත්මක ව මැදිහත් විය හැකි තර්කනයක් ද ඔහු විසින් ගොඩ නගා තිබුණි. ඒ පටු ක්ෂේත්‍රය තුළ ගිවිසුම් නීතිය ක්‍රියාත්මක කිරීමට අතිරේක ව රජයේ කාර්යය වූයේ වෙළඳ ඒකාධිකාර ඇතිවීම

වැළැක්වීම සහ වෙළඳපොළ විකෘති කිරීම් ඇති කිරීමට තැත් කිරීම වැළැක්වීම යි.

ඉන් පසු ඩේවිඩ් රිකාඩෝ *(1772-1823)* ඉදිරිපත් කළ සාපේක්ෂ වාසිය ***(comparative advantage)*** පිළිබඳ මතය නිදහස් වෙළඳපොළ උත්කර්ෂණයට නංවන සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදීන්ගේ වැදගත් ආදර්ශ පාඨයක් බවට පත් විය. එක් එක් රටවල් තම තමන්ට අවශ්‍ය සියලු ම දේ නිෂ්පාදනය කිරීමට තැත් කරනවාට වඩා තමන් සතු විශේෂතා අනුව ලෝක වෙළඳපොළේ දී සංසන්දනාත්මක ව තමන්ට වැඩි වාසියක් ලැබිය හැකි දේවල් පමණක් නිපදවීම වාසිදායක බව රිකාඩෝගේ මතය විය. උදාහරණයක් ලෙස එංගලන්තයට වඩා ලාභයට වයින් නිෂ්පාදනය කිරීමට පෘතුගාලයට හැකි ය. අනෙක් අතට පෘතුගාලයට වඩා ලාභයට රෙදිපිළි නිපදවීමට එංගලන්තයට හැකි ය. ඒ අනුව තම තමන් සතු සාපේක්ෂ වාසිය අනුව භාණ්ඩ නිපදවා කරන වෙළඳ හුවමාරුවකින් රටවල් දෙකට ම වඩා වාසි සැලසේ. තනි රටක් තුළ සියලු විශේෂඥතා තිබුණ ද මෙසේ සාපේක්ෂ වාසිය මත වෙළඳාම කිරීම සියලු රටවලට වාසිදායක බව රිකාඩෝ තර්ක කළේ ය.

ඒ වන විටත් රජවරුන්ගේ ඍජු පාලනය වැඩි වසයෙන් පැවති යුරෝපීය රටවල විසූ සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදීන් නිෂ්පාදකයන් සහ පාරිභෝගිකයන් සැලකුවේ තම තමන්ගේ ඕනෑ එපාකම් තමන්ට අභිමත ලෙස විචාරශීලී ව සාක්ෂාත් කර ගැනීමට හැකි සමානයන් ලෙසයි. ස්වාමිත්වකාමී පුද්ගලික දේපළ ආරක්ෂා කිරීම සහ කොන්ත්‍රාත්තු ගිවිසුම් නීත්‍යනුකූල ව බලාත්මක කිරීම නිසි ලෙස ඉටු වන්නේ නම් රට තුළ සම්පත් වෙන් කර ගැනීමට සහ වැඩි සමානත්වයක් ඇති කර ගැනීමටත් ජාතීන් අතර සාමකාමී වාණිජ කටයුතු කර ගෙන යෑමටත් කාර්යක්ෂතම හා ඵලදායක ම යන්ත්‍රණය වෙළඳපොළ නමැති 'අදෘශ්‍යමාන හස්තය' බව සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදීහු තර්ක කළහ.

එමෙන් ම එතෙක් පැවති ආර්ථික චින්තනය වූ 'වාණිජවාදයේ' *(mercantilism)* බිඳවැටීමටත් සම්භාව්‍ය ලිබරල්වාදීන්ගේ අදහස් දායක විය. යුරෝපීය රජවරුන්ගේ අනුග්‍රහයෙන් එතෙක් පවත්වා ගෙන ගිය වාණිජවාදී ආර්ථික සංකල්පයට අනුව ලෝකයේ පවතින්නේ නිශ්චිත වත්කම් ප්‍රමාණයකි. එබැවින් ඉන් වැඩි ම ප්‍රමාණයක් අත්පත් කර ගැනීම රජතුමාගේ අරමුණ විය යුතු යැ'යි අදහස් විණි. ඒ අනුව යටත් විජිතවලින් ධනය සූරා ගැනීම හැරෙන විට නිර්යාත භාණ්ඩ අලෙවි කොට ධනය අත්පත් කර ගත යුතු ය. එහෙත් එම වාණිජවාදයට අනුව දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීම පිණිස බදු අය කිරීම මඟින් ආනයනය හැකි තරම් සීමා කළ යුතු විය.[143]

ඒ අතර 19වන සියවසේ විසූ සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදීන්ගේ අනුගාමිකයෝ බොහෝ ආර්ථික අමාරු කම්වලට හේතුව ඕනෑවට වඩා රජයේ ඇඟිලි ගැසීම් නිසා ඇතිවෙන අසමත්කම බව මහජනයාට පෙන්වා දුන්හ. රජය මැදිහත් නොවෙන්නේ නම් වෙළඳපොළ යනු ස්වාභාවික ව ම සාර්ථකව පවත්වා ගෙන යා හැකි යන්ත්‍රණයක් බව ද ඔවුහු තර්ක කළහ. ඔවුන්ගේ අදහස් 18වැනි සියවසේ යුරෝපීය රාජකීයයන් බලයෙන් පහ කිරීමට තුඩු දුන් විප්ලව ජනිත වීමටත්, රජය සහ පල්ලිය එකිනෙකින් වෙන් කර තැබීමටත් හේතු විය.

එහෙත් 1929 සිට 1933 දක්වා මාස 43ක් තිස්සේ පැවති මහා ආර්ථික අවපාතයෙන්[144] සහ දරුණු ලෝක මහා යුද්ධ දෙකකින් හෙම්බත් වූ විසිවැනි සියවසේ මුල්භාගය තුළ සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදයේ හොඳ පණ ගොස් තිබුණි. එතැන් සිට 1980 ගණන්වල දී නවලිබරල්වාදීන් විසින් අලුත් ඇඳුමින් සරසා කරළියට ගෙන එනු ලබන තෙක් සම්භාව්‍ය ලිබරල් ආර්ථික මතවාදවලට කර බාගෙන සිටීමට සිදු විය. ඒ අතර කාලය තුළ වැඩි බලපෑමක් ඇති කිරීමට සමත් ආර්ථික චින්තනය වූයේ රැකියා නියුක්තිය වැඩි කිරීම පිණිස ජෝන්

143 Colic-Peisker, Val and Flitney, *Adrian (2018) The Age of Post-Rationality: Limits of Economic Reasoning in the 21st Century,* London: Palgrave Macmillan, P. 37

144 මේ දැවැන්ත ආර්ථික අවපාතය නිසා දළ දේශීය නිෂ්පාදිතය ගෝලීය මට්ටමෙන් සෘණ -26.7% කින් අඩු වූ අතර රැකියා වියුක්තිය 24.9% කින් ඉහළ ගොස් තිබුණි.

මේනාඩ් කේන්ස් සහ කාල් පොල්යානි වැනි ආර්ථික චින්තකයන් යෝජනා කළ රාජ්‍ය ආයෝජන මගින් ආර්ථිකය උත්තේජනය කිරීමේ වැඩ පිළිවෙළයි. නවලිබරල්වාදය ගැන ගැඹුරින් විමසීමට පෙර "රජය යනු හුදු රාත්‍රී මුරකාරයෙක් පමණක් නො වේ" යනුවෙන් සම්භාව්‍ය ලිබරල් ආර්ථික වාදය ගර්හාවට ලක් කළ කේනීසියානු ආර්ථික දැක්ම පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීම වැදගත් ය.

නිරන්තර ආර්ථික අර්බුදවලින් පෙන්නුම් කරන්නේ ධනවාදයේ අනවරත බිඳ වැටීම සහ විප්ලවකාරී නිර්ධන පංතියේ ජයග්‍රහණය බව පැවසූ මාක්ස්වාදීන් සමග කේන්ස් සහ ඔහුගේ සමානාත්මතා ලිබරල්වාදීහු එකඟ නොවූහ. විප්ලව ඇතිවීම ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් වැළැක්වීමට අදිටන් කර ගෙන සිටි බ්‍රිතාන්‍ය අගමැති (1941-1951) ක්ලෙමන්ට් ඇට්ලි සහ ඇමෙරිකානු ජනාධිපති (1933-1945) ෆ්‍රෑන්ක්ලින් ඩී රූස්වෙල්ට් පුද්ගල ස්වායත්ත භාවය සහ දේපොළ අයිතිය ආරක්ෂා කිරීමට තරයේ කැප වූ අය වූහ. එහෙත් ඒ අතර ම නූතන ධනවාදය ශක්තිමත් රාජ්‍ය නියාමනයක් මගින් පාලනය කළ යුතු බව අවබෝධ කර ගැනීමට අසමත් වීම සම්බන්ධයෙන් ඔවුහු සම්භාව්‍ය ආර්ථිකවාදයට ද දොස් පැවරූහ.

මේ අතර ආර්ථික අර්බුදවල දී නව රැකියා ඇති කර වැටුප් ආදායම් ලබන පාරිභෝගිකයන් වැඩියෙන් වියදම් කිරීම සඳහා පෙලඹවීමට රැකියා සැපයීමේ දැවැන්ත ව්‍යාපෘති සඳහා රජය විසින් ආයෝජන කළ යුතු බව කේන්ස් පවසා තිබුණි. ඒ අනුව ආර්ථික අර්බුදයක දී වෙළඳපොළ යන්ත්‍රණය ස්වයං සිද්ධ ලෙස නිවැරදි වෙමින් යළිත් පූර්ණ සේවා නියුක්තිය ඇති කරන බව කී සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදී මතය ඔහු අභියෝගයට ලක් කළේ ය. කේන්ස්ට අනුව රැකියා වියුක්තිය වැඩි වන්නේ ආර්ථිකයක පුද්ගලික ආයෝජන හා වියදම් අඩු වීම නිසා ය. මේ අඩු වීම සම්බන්ධයෙන් ඔහු දෝෂාරෝපණය කළේ කෙටි කාලීන ලාභ ප්‍රයෝජන තකා වෙළඳපොළ අස්ථාවර කිරීමට හේතු වෙන සංශයාත්මක ආයෝජන කිරීමට නිතර පෙලඹෙන, කිසිදු දිගු කාලීන දැක්මක් නැති

තෘෂ්ණාධික ආයෝජකයන්ට යි. වෙළඳපොළ මූලධර්ම සඳහා කැප වූවත් නියාමනය නො කළ වෙළඳපොළකට කැමැත්තක් නො දැක්වූ කේනීසියානුවාදය දුම්රිය සේවය හා බලශක්ති සැපයුම වැනි තීරණාත්මක පොදු සේවා නිරන්තරයෙන් රජයේ හිමිකාරිත්වය යටතේ පැවතිය යුතු බවට උපදෙස් දුන්නේ ය.

දෙවැනි ලෝක මහා යුද්ධය නිමා වීමෙන් පසු ලෝක ආර්ථිකය සැලසුම් කිරීම පිණිස එක්සත් ජනපදයේ බ්‍රෙටන්හුඩ් හි 1944 පැවති අන්තර්ජාතික රැස්වීමට සහභාගී වූ බ්‍රිතාන්‍ය නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරනු ලැබුවේ කේන්ස් විසිනි. මේ රැස්වීමේ දී ගත් තීරණයකට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටුවනු ලැබී ය. ඒ හැර යුරෝපය නැවත ගොඩ නැගීම පිණිස ණය ආධාර සැපයීමට පසු කලක ලෝක බැංකුව යන ප්‍රකට නමින් හැඳින් වූ 'යළි ගොඩනැගීම සහ සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව' ද පිහිටු වීය. එහෙත් ලෝකය පුරා සංවර්ධනය වෙමින් පවතින රටවල නොයෙකුත් කාර්මික ව්‍යාපෘති ඇරඹීම පිණිස ණය ආධාර සැපයීමට හැකි වන සේ එම වරම 1950ස් ගණන්වල දී ම තවත් පුළුල් විය. අනතුරු ව නොයෙකුත් බහුපාර්ශ්වීය වෙළඳ ගිවිසුම් බලාත්මක කරන යන්ත්‍රණයක් ලෙස 1947 දී *GATT (General Agreement on Tariffs and Trade)* යනුවෙන් හැඳින්වෙන තීරු බදු සහ වෙළඳාම පිළිබඳ පොදු ගිවිසුම ඇති කර ගන්නා ලදි. එහි අනුප්‍රාප්තිකයා වසයෙන් 1995දී නව ලිබරල් ආශිර්වාදය යටතේ *WTO* හෙවත් ලෝක වෙළඳ සංවිධානය පිහිටුවනු ලැබීය. මහත් මතභේදවලට තුඩු දුන් නවලිබරල්වාදි නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීමේ මූලස්ථානය වසයෙන් මේ ලෝක වෙළඳ සංවිධානය සැලකුණි.

කේනීසියානු අදහස්වල ආභාසයෙන් මෙහෙයවන ලද දේශපාලනය රජයූ 1945 සිට 1975 පමණ දක්වා වු කාලය ඇතැම් ආර්ථික විද්‍යාඥයන් හඳුන්වන්නේ "පාලිත ධනවාදයේ ස්වර්ණමය යුගය" *('golden age of controlled capitalism')* ලෙස යි. රටවැසියන් අතර බෙහෙවින් ප්‍රසාදයට ලක් වූ ස්වීඩන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

සුභසාධනයට අනුරූප ව ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට් ජනාධිපතිවරයා දියත් කළ *New Deal* හෙවත් "නව ගනුදෙනුව" නමැති වැඩපිළිවෙළ මෙන් ම බ්‍රිතාන්‍ය අගමැති ක්ලෙමන්ට් ඇට්ලි 1945 දී දියත් කළ බ්‍රිතාන්‍ය මාදිලියේ සමාජ සුභසාධන වැඩ සටහන ද 1963-1969 දක්වා ඇමෙරිකානු ජනාධිපති ව සිටි ලින්ඩන් බී ජොන්සන් දියත් කළ *Great Society Programme* හෙවත් 'ශ්‍රේෂ්ඨ සමාජීය වැඩ සටහන' නමින් හැඳින් වූ වැඩ පිළිවෙළ කේන්සියානුවාදය අනුදත් පාලිත ධනවාදය යටතේ ක්‍රියාත්මක වූ ඒවා ය. කේන්සියානු ආර්ථික දර්ශනයේ ආකර්ෂණය බටහිර ජාතීන්ගේ දේශපාලනය තුළ කෙතරම් බලපෑමක් ඇති කළා දැයි කිව හොත් පාලිත ධනවාදයේ ප්‍රතිඵලවලින් උද්දාමයට පත් ඇතැම් පණ්ඩිතයෝ සියලු දෘෂ්ටිවාදී විවාදවල අවසානය එළඹ ඇතැ'යි ද ප්‍රකාශ කළහ. කේන්සියානු ආර්ථික චින්තනයට අනුව රට තුළට එන සහ රටින් පිටවෙන මුදල් සංසරණය හැකි තරම් දුරට රජයේ පාලනයට නතු විය යුතු විය. ඒ හැර සමුච්චයනය වෙන ධනය අනුව පොහොසත් ධන හිමියන් සහ ලාභ ලබන සමාගම් විසින් අනුක්‍රමයෙන් වැඩි වෙන ලෙස අයබදු ගෙවිය යුතු විය. ඒ නිසා වැඩි වූ බදු ආදායමෙන් මහජන සුභසාධනය ද සැලකිය යුතු ලෙස පුළුල් කිරීමට ආණ්ඩුවලට හැකි විය. ඒ අනුව වැඩි වෙන වැටුප් ආදායම සහ සමාජ සේවා පහසුකම් නිසා ගෝලීය උතුරේ පිහිටි පොහොසත් රටවල සේවකයන්ට අපහසුවකින් තොර ව මධ්‍යම පංතියට එක්වීමට අවස්ථාව ලැබුණි.

කේන්සියානුවාදය බටහිර දේශපාලනයේ කෙතරම් මුල් බැස ගෙන තිබුණේ දැ'යි කිව හොත් 1970 තරම් පසු කාලයක දී කොන්සර්වෙටිව් රිපබ්ලිකන්වාදියෙකු වූ ඇමෙරිකානු ජනාධිපති *(*1969-1974*)* රිචඩ් නික්සන් පවා "අපි සියල්ලෝ ම දැන් කේන්සියානුවාදීයෝය" යැ'යි පැවසීය. ක්‍රියාශීලී ප්‍රබල රජයක්, නියාමනය කළ කර්මාන්ත ක්ෂේත්‍රයක්, පොහොසතුන්ට වැඩි බදු සමඟ සැමට පුළුල් සුභසාධනයක් සහිත ව ලිබරල්වාදයට නූතන සමානාත්මතාවාදී තේරුමක් ගෙන දුන්නේ රාජ්‍යයේ නිශ්චිත මැදිහත්

වීම සහ නියාමනය කරන ලද වෙළඳපොළ කේන්ද්‍රීය සාධකය කරගත් ඒ කේන්සියානු ආර්ථික දෘෂ්ටිය යි.

දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු ගත වූ දශක තුන තුළ දී ඒ නූතන සමානාත්මතා ලිබරල්වාදය විසින් විස්මය ජනක ආර්ථික වර්ධන වේගයක්, වැඩි වැටුප්, අඩු උද්ධමනය සහ පෙර නො වූ විරූ තරම් ද්‍රව්‍යයමය යහපැවැත්මක් සහ සමාජ ආරක්ෂණයක් බටහිර රටවල වැසියන්ට අත් කර දුන්නේ ය.

එහෙත් ඒ පාලිත ධනවාදයේ මේ ස්වර්ණමය යුගය 1970 ගණන්වල ඇතිවූ දරුණු ආර්ථික අර්බුදයත් සමඟ ඇනහිටියේ ය. ඛනිජ තෙල් නිපදවන මැදපෙරදිග ප්‍රමුඛ ඔපෙක් රටවල් විසින් හිටි හැටියේ තෙල් මිල ඉහළ දමනු ලැබීම නිසා තෙල් මිල තෙගුණයකින් ඉහළ ගියේ ය. ඒ හා සමඟ උද්ධමනය පිම්මේ දිව ගිය අතර සමාග ම්වල ලාභය අඩු වීම ආදිය නිසා රැකියා විරහිත බව උග්‍ර විය. මේ අර්බුදය නිසා සම්භාව්‍ය ලිබරල්වාදයේ ඇතැම් අංගවලට පණ පිඹීමෙන් ගෝලීයකරණය පිළිබඳ අලුත් කොන්දේසි ඉදිරිපත් කරමින් ඉස්මතු වීමට නව ආරක ලිබරල්වාදීන්ට ඉඩ සැලසුණි.

මේ නවලිබරල්වාදීහු නිදහස් වෙළඳාම සහ නිදහස් වෙළඳපොළ ලොව පුරා පතුරවන ආර්ථික මොඩලයක් වෙනුවෙන් කැප වුණු පොදු දේශපාලන හා දෘෂ්ටිවාදී දැක්මක් වෙනුවෙන් පෙනී සිටියහ. එහෙත් අදාළ සමාජ සන්දර්භයට අනුව ඔවුහු සිය න්‍යායයේ නිදහස් වෙළඳපොළ වැනි ඇතැම් අංග වැඩියෙන් අවධාරණය කළ හ. කේන්සියානුවාදීන්ගේ ගර්හාවටත් සිය අනුගාමිකයන්ගේ ඉමහත් ප්‍රසාදයටත් ලක් වූ නවලිබරල්වාදීන් 1980 ගණන්වල මුල් භාගය වන විට ඊළඟ විසිපස් වසර පුරා රජ කළ ලෝක ආර්ථික සහ දේශපාලනික න්‍යාය පත්‍රය සකස් කිරීමට සමත් වූහ. ඔවුන් තර්ක කළ අන්දමට 1970 ගණන් පුරා කාර්මික රටවල දක්නට ලැබූ අධික උද්ධමනය සහ අසතුටුදායක ආර්ථික වර්ධනයට හේතු වුණේ ආර්ථිකය කොර කරන ආණ්ඩුවේ රෙගුලාසි, සීමාව ඉක්මවා යන පොදු වියදම් සහ අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධ ඉහළ තීරු

බදු පැනවීමයි. මේ තර්කයට බටහිර ලෝකයේ පොදු පිළිගැනීමක් ලැබුණු පසු නවලිබරල්වාදීන්ගේ ඊළඟ පියවර වූයේ ගෝලීය දකුණ සම්බන්ධයෙන් ද සංවර්ධනයට බාධකයක් ව ඇත්තේ මෙකී සාධක බව ඒත්තු ගැන්වීම යි.

ඒ අනුව ඉදිරිපත් කළ නවලිබරල්වාදී සංවර්ධන න්‍යාය පත්‍රය මූලික වශයෙන් ම *'Structural Adjustment Programme'* හෙවත් 'ව්‍යුහාත්මක ගැළපුම් ක්‍රියාමාර්ගය' සහ ජාත්‍යන්තර නිදහස් වෙළඳ ගිවිසුම් මත පදනම් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව මඟින් සපයනු ලබන ණය ආධාර මත පදනම් වූ එකී ව්‍යුහාත්මක ගැළපුම් ක්‍රියාමාර්ගයට රාජ්‍ය ආයතන පුද්ගලීකරණය කිරීම, නිර්බාධක වෙළඳපොළ ප්‍රවර්ධනය සහ රාජ්‍ය ගිණුම් හිඟය අවම කිරීම වැනි කොන්දේසි ඇතුළත් විය. එමඟින් සියලු ආකාරයේ රාජ්‍ය සහනාධාර සහ පොදු සේවා වෙනුවට නිදහස් වෙළඳපොළ බලවේගවලට නිර්බාධක ව ඉඩ ලබා දීම පොදු සංවර්ධන ප්‍රතිපත්තිය වශයෙන් ප්‍රවර්ධනය කෙරිණි.

ඒ වන විට ණය බරින් මිරිකී සිටි සංවර්ධනය වෙමින් පැවති රටවලට ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගැනීමට මෙකී නවලිබරල්වාදී න්‍යාය පත්‍රය අනුගමනය කිරීමට සිදු විය. 1991දී සෝවියට් දේශය කඩා වැටීම සහ කොමියුනිස්ට් චීනයේ වෙළඳපොළ පාදක ප්‍රතිසංස්කරණ ශීඝ්‍ර කිරීම නිසා නවලිබරල්වාදී ආර්ථික මොඩලය සමකාලීන ආර්ථික චින්තනය තුළ ඉන් පෙර නොවූ විරූ ආධිපත්‍යක් අත්පත් කර ගත්තේ ය.

නවලිබරල්වාදය හෙවත් *Neoliberalism* යන යෙදුම මුල් වරට භාවිත වුණේ 1938 පැරිසියේ පැවති රැස්වීමක ය. ඔස්ට්‍රියානු සම්භවයක් තිබූ ලුඩ්විග් වොන් මිසෙස් සහ ෆෙඩ්රික් වොන් හයෙක් එම රැ ස්වීමට සහභාගි වූ ආර්ථික විද්‍යාඥයන් දෙදෙනෙකි. මේ දෙදෙනා ම 1933-1945 දක්වා ඇමෙරිකානු ජනාධිපති ව සිටි ෆ්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට්ගේ *New Deal* හෙවත් 'නව ගනුදෙනුව' නම් සුභසාධන වැඩපිළිවෙළ සහ 1945-1951 දක්වා බ්‍රිතාන්‍යයේ ලේබර් පාක්ෂික

අගමැති ක්ලෙමන්ට් ඇට්ලිගේ මෙහෙයවීමෙන් ගොඩ නැගෙමින් තිබූ සුභසාධන රාජ්‍ය මඟින් කිසියම් දුරකට නිරූපණය කළ 'සමාජ ප්‍රජාතන්ත්‍රවාදය' *(social democracy)* සැලකුවේ නාසිවාදය හා කොමියුනිස්ට් වාදයට අනුරූප වූ සමූහකරණය කිරීමේ වෑයමක් ලෙසිනි. වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙන අන්දමට හයෙක්ගේ මතය අනුව සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ නරක ම වැරැද්ද වන්නේ සම්ප්‍රදාය හා චාරිත්‍ර වාරිත්‍ර මඟින් ඓතිහාසික ව බිහි වී ඇති සුපිළිවෙළ වෙනුවට තර්ක බුද්ධිය මත පදනම් ව සමාජය හැඩ ගැස්වීම සඳහා මහා සැලැස්මක් පිළියෙළ කිරීම යි[145].

1930 ජෝන් මේනාඩ් කේන්ස් *A Treatise on Money* නමැති සිය කෘතිය පළ කොට වසරක් ගෙවී ගිය පසු හයෙක් එම කෘතිය විවේචනය කරමින් කේන්ස්ගේ අදහස් විවාදයට ලක් කළේ ය. කේන්ස්ට අනුව රැකියා වියුක්තියට සහ සම්පත් උපයෝගී කර ගැනීමට නො හැකි වීමට හේතුව ඵලදායක ඉල්ලුමක් නො පැවතීම යි. එහෙත් හයෙක් සිය විචාරයෙන් තර්ක කළ අන්දමට ඒවාට හේතු වූයේ ඊට පෙර පැවති පහසුවෙන් මුදල් ලබා ගැනීමට හැකි වැඩසටහන් සහ කෘත්‍රිම ලෙස පහත දැමූ පොලී අනුපාතයන් ය. "සමාජ සාධාරණත්වය පිළිබඳ විශ්වාසය විසින් දේශපාලන ක්‍රියා මෙහෙයවන විට අනුක්‍රමයෙන් සිදු විය හැකි දෙය වන්නේ ඒකාධිපති ක්‍රමයක් කරා යෑමයි"[146]යනුවෙන් හයෙක් ලීවේ ය.

1944 දී පළ කළ *The Road to Serfdom ('දාස භාවයට මාර්ගය')* නම් සිය කෘතියෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය විවේචනයට ලක් කරමින් ආණ්ඩුවේ මධ්‍යගත සැලසුම් සහ පෞද්ගලිකත්වය පිටු දැකීමේ ප්‍රයත්න නියත වසයෙන් ම ඒකාධිපති රජයකට පාර කපන බව හයෙක් තර්ක කළේ ය. හයෙක්ගේ *The Road to Serfdom* කෘතිය බොහෝ ධනකුවේරයන්ගේ අවධානයට යොමුව තිබුණි. එමඟින්

145 Wendy Brown (2019) In *the Ruins of Neoliberalism: The Rise of Anti-Democratic Politics in the West,* New York: Columbia University Press, p. 91 (KE)

146 Hayek (1978) *Law Legislation and Liberty*. Vol. 2, Chicago: University of Chicago Press, p.68

ඉදිරිපත් කළ ආර්ථික දර්ශනය ආදායම් බදු ගෙවීමෙන් මෙන් ම රාජ්‍ය නියාමනයෙන් අත් මිදීම සඳහා ද තමන්ට අවශ්‍ය කරන සියලු ම තර්ක සපයන බව මේ ධන කුවේරයෝ විශ්වාස කළහ. ඒ අනුව නවලිබරල්වාදී දර්ශනය ප්‍රචලිත කිරීම පිණිස 1947 'මොන්ට් පෙලරින් සමාජය' නමැති සංවිධානය හයෙක් විසින් පිහිටනු ලැබූ විට ඊට මූල්‍යමය ආධාර සපයන ලද්දේ මේ ධනකුවේරයන් විසිනි.

සිය අනුග්‍රාහක ධනකුවේරයන්ගේ ආධාරයෙන් අත්ලාන්තික් සාගරය දෙපැත්තෙන් ම විද්වතුන්, ව්‍යාපාරිකයන්, මාධ්‍යවේදීන් සහ සමාජ ක්‍රියාධරයන්ගෙන් සමන්විත නවලිබරල්වාදී ජාත්‍යන්තරයක් හා සමාන ප්‍රවර්ධන ජාලයක් ගොඩනගා ගැනීමට හයෙක්ට හැකි විය. මේ ව්‍යාපාරයට සහයෝගය දැක්වූ විශාල ධනකුවේරයන් සංඛ්‍යාවක් නවලිබරල් දෘෂ්ටිවාදය ඔප මට්ටම් කොට ප්‍රවර්ධනය කිරීම සඳහා බුද්ධි මණ්ඩල *(think tanks)* කිහිපයක් ම ස්ථාපනය කොට පවත්වාගෙන යෑම පිණිස නො මසුරු ව මුදල් වැය කළේ ය. එසේ පිහිටුවන ලද බුද්ධි මණ්ඩල අතර *American Enterprise Institute, the Heritage Foundation, the Cato Institute, the Institute of Economic Affairs, the Centre for Policy Studies iy the Adam Smith Institute* යන ආයතන වෙසෙසින් කැපී පෙනේ. ඒ හැර චිකාගෝ හා වර්ජිනියා වැනි විශ්ව විද්‍යාලවල නවලිබරල්වාදී විද්‍යාර්ථී තනතුරු බිහි කිරීමේ බරපැන දැරීමට ද ඔවුහු උර දුන්හ.

ඒ අතර අනුක්‍රමයෙන් පරිණාමය වූ නවලිබරල්වාදය වඩ වඩා කර්කෂ ස්වභාවයක් ගත්තේ ය. ඒකාධිකාර ඇතිවීම වැළැක්වීම පිණිස කිසියම් රාජ්‍ය නියාමනයක මැදිහත් වීම ප්‍රයෝජනවත් යැ'යි හයෙක් විශ්වාස කළ නමුත් හයෙක්ගේ අනුප්‍රාප්තික නවලිබරල්වාදී ගුරා වූ මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් ඒකාධිකාරී බලය සැලකුවේ සමාගමක කාර්යක්ෂමතාවට ලැබෙන මහඟු තෑග්ගක් ලෙසිනි. "මම ඉතාමත් ඉහළින් හයෙක්ව අගය කරමි. නමුත් ඒ ආර්ථික විද්‍යාව සඳහා නම් නො වේ" යැ'යි[147] වරක් ෆ්‍රීඩ්මන්ඩ් පැවසී ය.

147 Hayek and Friedman: Head-to-Head, Garrison, Auburn University – Wikipedia

කොතරම් නො මසුරු මූල්‍ය අනුග්‍රහ රැසක් ලැබුනත් ආර්ථික දෘෂ්ටියක් ලෙස මුල් අවදියේ දී නවලිබරල්වාදය පැවතුණේ එවකට පැවති මුල් පෙළේ මතවාදවලට වඩා සෑහෙන දුරකින් ආර්ථික විද්‍යා කතිකාවේ අද්දරට වෙන්න ය. ඇත්ත වසයෙන් ම දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු වඩාත් ප්‍රබල ආර්ථික දැක්ම බවට පත්වී තිබුණේ ජෝන් මේනාඩ් කේන්ස්ගේ පූර්ණ සේවා නියුක්තිය සහ දරිද්‍රතාව සඳහා සහන සැලසීම අරමුණු කර ගනිමින් රාජ්‍ය මැදිහත් වීමට මුල් තැන ලැබුණු සුභසාධනවාදය යි. ඒ මතය අනුගමනය කළ එක්සත් ජනපදයේ සහ යුරෝපයේ රජයන් ඉහළ සමාජ ස්තර සඳහා වැඩි ආදායම් බද්දක් හඳුන්වා දෙමින් එම ආදායම නව පොදු සේවාවන් සහ සමාජ ආරක්ෂණ ක්‍රම ඇති කිරීමට යොදා ගෙන තිබුණි.

එහෙත් 1970 ගණන්වල දී ඇතිවූ ආර්ථික අර්බුදයත් සමඟ කේන්සියානු ප්‍රතිපත්ති අසාර්ථක වීමට පටන් ගත් විට නවලිබරල්වාදය ඇඟපත හිරි අරිමින් හිස ඔසවන්නට විය. "වෙලාව පැමිණි විට ඔබ වෙනස් වීමට සූදානම් විය යුතුයි.... ඒ වෙනස සඳහා තෝරා ගැනීමට සුදුසු වෙනත් විකල්පයක් අපට තිබේ" යනුවෙන් ෆ්‍රීඩ්මන්ඩ් එකල පැවසී ය. ඒ අනුව හිතවත් ජනමාධ්‍යවේදීන් සහ දේශපාලන උපදේශකයන්ගේ මාර්ගයෙන් නවලිබරල්වාදයේ යම් යම් ගුණාංග, විශේෂ වසයෙන් ම මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ නිර්දේශ, ඇමෙරිකාවේ ජිමී කාටර් ජනාධිපතිවරයාගේ (1977-1981) සහ බ්‍රිතාන්‍යයේ අගමැති (1976-1979) ජිම් කැලහන්ගේ ආණ්ඩු ලවා ක්‍රියාත්මක කරවා ගැනීමට ෆ්‍රීඩ්මන්ඩ් සමත් විය.

එහෙත් නවලිබරල්වාදය පූර්ණ වසයෙන් ම ක්‍රියාත්මක කළ ප්‍රථම රට වූයේ ඒකාධිපති (1973-1981) ජනරාල් පිනොචෙට්ගේ පාලනයට යටත් වූ චිලී රටයි. ඒ ගැන අප 16 වැනි පරිච්ඡේදයේ දී වඩා සවිස්තර ව විමසමු. චිලී රටේ නවලිබරල්වාදී වැඩසටහන සම්බන්ධයෙන් කථා කරමින් 'මගේ පුද්ගලික කැමැත්ත ඇත්තේ ලිබරල්වාදයෙන් තොර ප්‍රජාතන්ත්‍රවාදී රජයකට වඩා ලිබරල් ඒකාධිපතිවාදයකටයි" යනුවෙන් මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් පැවසී ය.

නවලිබරල්වාදය මේ ලිබරල් නිදහස පිරිනමන්නේ ගොදුරුභක්ෂක තෝරුන්ට හා මෝරුන්ට මිස හාල් මැස්සන්ට හා කූනිස්සන්ට නො වේ.

නවලිබරල්වාදයට අනුව වෘත්තීය සමිතිවලින් සහ සාමූහික කේවල් කිරීම්වලින් නිදහස් වීම යනු කම්කරුවන්ට අඩු වැටුප් ගෙවීමට ඇති නිදහස යි. නියාමන නීතිවලින් නිදහස් වීම යනු ගංගා ඇල දොළ සිතැඟි පරිදි දූෂණය කිරීමට, කම්කරුවන් අනතුරට ලක් කිරීමට, ගිනි පොලී අය කිරීමට සහ විදේශජ මූල්‍ය මෙවලම් සැලසුම් කිරීමට ඇති නිදහස යි. බදුවලින් නිදහස ලැබීම යනු මිනිසුන් දිළිඳු කමින් මුදවා ගැනීම පිණිස ධනය ප්‍රතිව්‍යාප්ත කිරීමෙන් නිදහස් වීමයි.

දේශීය වසයෙන් නවලිබරල්වාදී ප්‍රතිපත්ති ඍජු ව ආදේශ කිරීමට නො හැකි අවස්ථාවල දී අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්වල අඩංගු වන ආයෝජකයන් සහ රාජ්‍ය අතර ආරවුල් නිරාකරණය කිරීමේ විධිවිධාන යටතේ ඒවා අන්තර්ජාතික ව ආරෝපණය කළ හැකි විය. සාමාන්‍යයෙන් විදේශවල පැවැත්වෙන බේරුම්කාර මණ්ඩල මඟින් සමාජ හා පාරිසරික ආරක්ෂණ කටයුතුවලට තුඩු දෙන කොන්දේසි ඉවත් කර ගැනීමට අන්තර්ජාතික සමාගම් කටයුතු කරන අන්දම ප්‍රකට කරුණකි. සිගරැට් වෙළඳාම සීමා කිරීම, ඛනිජ ආකර සමාගම්වලින් ජල සැපයුම බේරා ගැනීම, ඖෂධ සමාගම්වල අයුතු සූරාකෑම් වැනි කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මැදිහත් වන අවස්ථාවල දී ප්‍රජාතන්ත්‍රවාදය හුදු නාටකයක් බවට පත් කරමින් ඒවාට එරෙහි ව අන්තර්ජාතික බේරුම්කාර මණ්ඩල ක්‍රමය සාර්ථක ව යොදා ගැනීමට ජාත්‍යන්තර සමාගම්වලට හැකි වීම මීට එක් නිදසුනකි.

නවලිබරල්වාදය පිළිසිඳ ගනු ලැබුවේ ස්වාර්ථය ම තකන ජාවාරමක් ලෙස නොවූවත් ඉතා ඉක්මනින් එය එබන්දක් බවට පත් විය. 1980 ගණන්වලින් ඇරඹුණු නවලිබරල්වාදය තදින් ම ක්‍රියාත්මක වූ කාලයේ බ්‍රිතාන්‍යයේ සහ එක්සත් ජනපදයේ ආර්ථික වර්ධන වේගය ඊට පෙර පැවතුණාට වඩා බෙහෙවින් අඩු විය. එහෙත් ඒ

ධන කුවේරයන් සඳහා නො වේ. එතෙක් හැට වසරක් තිස්සේ අඩු වෙමින් පැවති ආදායම් සහ වත්කම් බෙදී යෑමේ විෂමතාව වෘත්තීය සමිති කඩාකප්පල් කර දැමීම, බදු අඩු කිරීම, වැඩි වන ගෙවල් කුලිය, පුද්ගලීකරණය සහ නිර්නියාමනය නිසා ඉතා ශීඝ්‍රයෙන් වැඩි විය. ඒ අතර ආදායම් පරතරය ශීඝ්‍ර වෙමින් බිලියනපතියන් ගණනාවක් ද බිහි විය.

බලශක්තිය, ජලය, දුම්රිය, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, මහාමාර්ග හා බන්ධනාගාර ආදී පොදු සේවා පුද්ගලීකරණය කිරීම හෝ වෙළඳපොළකරණයට ලක් කිරීම නිසා පුද්ගලික සමාගම්වලට අත්‍යවශ්‍ය සම්පත් අත්පත් කර ගෙන පුරවැසියන්ගෙන් සහ රජයෙන් ද ඒ සඳහා බදු කුලිය අය කර ගැනීමට හැකි ව තිබේ. '*Rent*' හෙවත් 'බදු කුලිය' යනු හම්බ නො කරන ආදායමට ආර්ථික විද්‍යාවේ භාවිත වෙන යෙදුමකි. මෙය පුද්ගලීකරණය කළ බ්‍රිතාන්‍ය දුම්රිය සේවයට විසි වසරක් ගත වීම නිමිත්තෙන් ආදිත්‍ය චක්‍රබොර්ති 'ද ගාඩියන්' පුවත් පතට ලියූ විචාරාත්මක ලිපියක එන කරුණකින් පැහැදිලි කළ හැකි ය.[148] ඔහුට අනුව නව පුද්ගලික දුම්රිය සමාගම විසින් වැඩි කළ මිලට මගියෙකු දුම්රිය ගමන් බලපත්‍රයක් මිල දී ගත් විට ඉන් දුම්රිය සේවයේ වැටුප්, ඉන්ධන සහ අවශේෂ වියපැහැදම් සඳහා වැය වන්නේ කොටසක් පමණි. ඉතිරි සියල්ල සමාගම කිසිදු අමුතු ආයෝජනයකින් තොර ව ලබා ගන්නා ලාභය යි. මෙය පැහැදිලි කරමින් චක්‍රබොර්ති පෙන්වා දෙන්නේ කිසිදු අමුතු ආයෝජනයක් යෙදීමකින් තොර ව රජය මඟින් සැපයූ යටිතල පහසුකම් සහ දුම්රිය භාවිත කොට 147% ලාභයක් ලබා ගැනීමට බ්‍රිතාන්‍ය දුම්රිය සමාගම්වලට හැකි ව ඇති බවයි. එහෙත් පුද්ගලික අංශයට පැවරීම නිසා බ්‍රිතාන්‍ය දුම්රිය සේවය යහපත් වූ බවක් මගීන්ගෙන් අසන්නට නො ලැබුණි.

බදු කුලිය මෙන් ම පොලිය ද කිසිදු හම්බ කිරීමකින් තොර ව ලබා ගන්නා ආදායමකි. දුප්පතුන් දුප්පත් වෙන පමණට

148 https://www.theguardian.com/commentisfree/2013/nov/04/rail-privatisation-train-operators-profit (Retrieved on 14 June 2021)

පොහොසතුන් පොහොසත් වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ ඉතා වටිනා වත්කමක් වන මුදල් සම්පත් පාලනය කිරීම පොහොසතුන් අතළොස්සක් අතට පත්වීමයි. පොලී ගෙවීම් යනු වැඩි වසයෙන් ම දුප්පතුන්ගේ මුදල් පොහොසතුන් කරා සංක්‍රමණය වන ක්‍රමයකි. නිවාස හා දේපොළ ණය, ක්‍රෙඩිට් කාඩ් හෙවත් බැංකු ණයවර පත් සහ ෆයිනෑන්ස් කිරීම් මඟින් බැංකු හා මූල්‍ය ආයතන අය කරන අධික පොලිය එවැනි හම්බ කිරීමකින් තොර ව ලබන ආදායම් ය.

ගත වූ හතළිස් වසර බැලුවොත් මුදල් සංක්‍රමණය සිදු වන්නේ දුප්පතුන්ගේ සිට අතළොස්සක් වූ පොහොසතුන් වෙත පමණක් නො වේ. භාණ්ඩ නිෂ්පාදනය හා සේවා සැපයීම වැනි වැඩකට ඇති නියම ආර්ථික කටයුතුවල යෙදෙන පොහොසතුන්ගේ සිට මූල්‍ය වත්කම්, බදු කුලී, පොලී අය කිරීම් සහ කොටස් වෙළඳපොළ උපක්‍රමික ව මැනවීම් ආදී වසයෙන් සිය මූලික ආදායම් මාර්ගය මූල්‍යකරණය *(Financialization)* බවට පත් කරගත් අසික්කිත පොහොසතුන් *(filthy rich)* අතළොස්ස වෙත ද විශාල වසයෙන් මුදල් සංක්‍රමණය සිදු වෙයි.

1980 සහ 1990 ගණන්වල නවලිබරල්වාදය එහි උච්චතම අවධියේ දී දැවැන්ත බූවල්ලෙකු මෙන් ලෝකයෙන් වැඩි කොටසක් ග්‍රහණයට ගෙන තිබුණි. ඇමෙරිකානු -බ්‍රිතාන්‍ය දේශපාලනඥයන් වන රොනල්ඩ් රේගන් *(*1981-1989), මාග්‍රට් තැචර් (1979-1990), බිල් ක්ලින්ටන් *(*1993-2001*)* සහ ටෝනි බ්ලෙයාර් (1997-2007*)* ආදීන් විසින් උත්කර්ෂණයට නැංවූ නවලිබරල්වාදය ගෝලීය දකුණේ ආර්ථික ප්‍රගතිය සඳහා ඉතා දැඩි කොන්දේසි ඉදිරිපත් කළේ ය. අවශ්‍යතාව අනුව සිය මූලික ස්වභාවය වෙනස් නො කර අපූරු අන්දමින් නම්‍යශීලී වූ නවලිබරල්වාදය පරණ සෝවියට් සංගමය ද සාර්ථක ව ආක්‍රමණය කළේ ය. එපමණක් නො ව පශ්චාත් මාවෝ යුගයේ චීනයේ නායකයන් බවට පත් වූ ඩෙන්ග් ෂාවෝ පින්ග් (1978-1989), ජියාන්ග් සෙමින් (1993-2003*)* සහ හ්‍යු ජින්ටාවෝ (2003-2013*)* ද " චීන ලක්ෂණ සහිත සමාජවාදය" යන ලේබලයෙන් නවලිබරල්වාදය වැලඳ ගැනීමට සාර්ථකව පෙලෙඹවීය. ඒ ක්‍රියාවලිය තුළ චීන

කොමියුනිස්ට්වාදය ද ධනවාදයේ දුර්විපාක බොහෝමයක් උරුම කර ගත්තේ ය. ඊළඟ දශක කිහිපය තුළ මන්මෝහන් සිං (2204-2014), ජුනිචිරෝ කොයිසුමි (2001-2006), ජෝන් හොවාඩ් (1996-2007), ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් (2001-2009) බැරක් ඔබාමා (2009-2017) සහ සි ජින්ග්පින්ග් (2013 -) විසින් ද නවලිබරල්වාදී න්‍යාය පත්‍රයේ වැඩි කොටසක් මහත් භක්තියකින් අනුගමනය කරන ලදී. එහෙත් මෙකී දේශපාලන නායකයන් කිසිවෙක් නවලිබරල්වාදය නමැති සමස්ත ලේබලය අලවා නොගත් හ. නමුත් ඔවුහු ජාතික ආර්ථිකය නිර්නියාමනය කිරීම, ජාත්‍යන්තර වෙළඳාම ලිබරල්කරණය කිරීම, රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීම, රාජ්‍ය ප්‍රමාණයෙන් අඩු කිරීම, බදු කපා හැරීම සහ තනි ගෝලීය වෙළඳපොළක් නිර්මාණය කිරීම වැනි නවලිබරල්වාදී ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු ලෙන්ගතුකමක් දැක්වූහ.[149]

එහෙත් වෙළඳපොළ කඩා වැටීම් නිසා නවලිබරල්වාදී ප්‍රතිපත්ති බොහෝ විට අසාර්ථක විය. 2008 දී කඩා නො වැටෙන තරම් විශාල යැ'යි සැලකූ මූල්‍ය ආයතන මෙන් ම පෞද්ගලීකරණය යටතේ පොදු සේවා පවත්වා ගැනීම පැවරුණු ඇතැම් පෞද්ගලික සමාගම් කඩා වැටීම ද එම වෙළඳපොළ අසාර්ථක වීම්වලට නිදසුන් ය. වැදගත් පොදු සේවා කඩා වැටීමට කිසි සේත් ම ඉඩ දිය යුතු නැති බව හයෙක් අමතක කළේ ය. ඒ නිසා තරඟකාරිත්වය මඟින් සියල්ල ඉටු වෙතැ'යි බලාපොරොත්තු වීම මායාවකි. ලාභය ව්‍යාපාරිකයන්ටත් අවදානම රජයටත් යන සූත්‍රයට අනුව පොදු සේවා සැපයීම පවත්වා ගෙන යෑම කළ නො හැකි ය. පොදු සේවා නිසා ආර්ථිකයේ අනෙකුත් අංශවලට ලැබෙන අමිල වාසිය පොදු සේවාවල ශේෂ පත්‍රවලින් බලා ගත නො හැකි ය.

වඩ වඩා අන්තයට යන විට නවලිබරල්වාදය එහි අසමර්ථකම තව තවත් ඉස්මතු කර පෙන්වයි. ඒ අනුව නවලිබරල්වාදී අර්බුද

149 Manfred B. Steger (2021). *Neoliberalism: A Very Short Introduction,* Oxford: Oxford University Press, Oxford

උද්ගත වූ විට බදු අඩු කිරීමට, සුභසාධනය කප්පාදු කිරීමට, ඉතිරි ව ඇති පොදු ආයතන පෞද්ගලීකරණය කිරීමට, සමාගම් නිර්නියාමණය කිරීමට සහ පුරවැසි ක්‍රියාකාරකම් යළි නියාමනය කිරීමට එම අර්බුදය නිදහසට කරුණක් ලෙස උපයෝගී කර ගැනීමට ආණ්ඩු පෙලඹේ.

නවලිබරල්වාදයේ වඩාත් ම බියකරු බලපෑම වන්නේ එමගින් ඇති කරන ආර්ථික අර්බුදයට වඩා මතවාදී මට්ටමේ දී එය මගින් ප්‍රවර්ධනය කරන අර්බුදකාරී දේශපාලනයයි. නවලිබරල්වාදය මගින් රාජ්‍ය නමැති මූලික ආයතන පද්ධතියේ කාර්යභාරය ලුහු කරයි. එනිසා ඡන්දය දීම හෝ නො දීම ඇතුළු දේශපාලන මැදිහත්වීම් මගින් අපට අභිමත පරිදි අපේ ජීවිත හැඩගැස්වෙන ප්‍රතිපත්ති වෙනස් කිරීමට ප්‍රයත්න දැරිය හැකි අවස්ථා ද හැකිළී යයි. නවලිබරල්වාදී න්‍යාය කියන්නේ ඒ වෙනුවට අපට වියදම් කළ හැකි ආකාරය සම්බන්ධයෙන් අප්‍රමාණ තෝරා ගැනීම් කිරීමට නව ලිබරල් ක්‍රමය යටතේ අපට හැකි වෙන බවයි. එහෙත් ඇතැම් අයට අනෙක් අයට වඩා වැඩියෙන් වියදම් කිරීමේ හැකියාවක් තිබෙන බැවින් එවැනි පාරිභෝගික ප්‍රජාතන්ත්‍රවාදයක සියලු දෙනාට සමාන ඡන්දයක් හිමි නො වේ. එහි ඇත්ත ප්‍රතිඵලය වන්නේ දුප්පතුන් සහ මැද පංතිය කෙමෙන් බල විරහිත කිරීම සහ බිලියනපතියන් අතළොස්සකගේ ග්‍රහණයට දේශපාලනය නතු වීම යි. දක්ෂිණාංශයේ සහ සාම්ප්‍රදායික වමේ පක්ෂ නවලිබරල් ප්‍රතිපත්ති වැලඳ ගැනීමත් සමග මේ බල විරහිත කිරීම ඡන්ද බලය නැති කිරීමක් හා සමාන වෙයි. ඒ අනුව විශාල ජන සංඛ්‍යාවක් දේශපාලන ක්‍රියාකාරකම්වලින් හා සමාජ සහභාගිත්වයෙන් ඉවතට තල්ලු කර දමයි.

"ෆැසිස්ට්වාදී ව්‍යාපාර ගොඩ නැගෙන්නේ දේශපාලන වසයෙන් සක්‍රිය කොටස් අතරින් නො ව තමන්ට කිසිදු හඬක් නැතැයි විශ්වාස කරන, පවතින දේශපාලනය තුළ තමන්ට තැනක් නැතැයි විශ්වාස කරන, දේශපාලනික ව අක්‍රිය කර දමනු ලැබූ ජන කොටස් වලිනි" යනුවෙන් *Days of Destruction, Days of Revolt (*2012*)*

නමැති ජනප්‍රිය කෘතිය ලියූ ක්‍රිස් හෙජස් පැවසීය.[150] දේශපාලන සංවාදය තවදුරටත් අව්‍යාජ ලෙස ජනතාවගේ ප්‍රශ්න ආමන්ත්‍රණය නො කරන විට හිස් සටන් පාඨ, සංකේත සහ ප්‍රකෝප කිරීම්වලට අවනත වීමට ජනතාව පෙලඹෙති. ඇමෙරිකානු ජනාධිපති ට්‍රම්ප්ට වහ වැටුණු අයට සත්‍ය කරුණු හා තාර්කික කතිකා අරහං බවට පත් වුණේ එබැවිනි.

මහජනතාව සහ රජය අතර සාමාන්‍යයෙන් ඇතිවෙන ප්‍රත්‍යවර්ත්‍ය ප්‍රතික්‍රියා සම්භාරය හුදු අධිකාරි බලයට කීකරු වීමක් දක්වා අවම කරනු ලැබූ විට අප සියලු දෙනා එක් කර තැබීමට ඉතිරි වන එක ම බලය වන්නේ ඒකාධිකාරී රාජ්‍ය බලය පමණි. ෆ්‍රීඩ්රික් වොන් හයෙක් බියවූ ඒ ඒකාධිපතිවාදය ඇත්ත වසයෙන් ම ඇති විය හැක්කේ පොදු සේවා පවත්වා ගෙන යෑමේ කැපවීම තුළින් මතු වන සදාචාරීය වගකීම ආණ්ඩුවලින් ගිලිහී ගොස් ආණ්ඩුකරණය යනු මිනිසුන් රවටන, මිනිසුන්ට තර්ජනය කරන සහ අවසානයේ දී බලහත්කාර බලය යොදමින් මිනිසුන් අවනත කර ගැනීමේ ප්‍රෝඩාවක් බවට පත්වීමයි.

ඇතිවී තිබෙන විවිධ සමාජ විෂමතාවලට වගකීමට සිදුවේ ය යන බිය නිසා නවලිබරල්වාදය තවදුරටත් නවලිබරල්වාදය නමින් කරළියට පැමිණීමට මැලි වෙයි. ඒ වෙනුවට එය විවිධ තැන්වල දී විධාකාරයෙන් භාවිත කළ හැකි වාංමාලාවක් යොදා ගනී. උදාහරණයක් ලෙස නවලිබරල්වාදීන් විසින් බෙහෙවින් යොදා ගනු ලබන 'වෙළඳපොළ' යන යෙදුම බොහෝ විට භාවිත කිරීමට තැත් කරන්නේ ගුරුත්වාකර්ෂණය හෝ වායුගෝලීය පීඩනය වැනි අප සියල්ලන්ට ම එක සමාන ව බලපාන පොදු සාධකයක් ලෙස ය. එහෙත් වෙළඳපොළ යනු නොයෙකුත් බල සම්බන්ධතාවලින් පිරුණු ඒ බල සම්බන්ධතාවලින් මෙහෙයවෙන තැනක් බව අපි අත්දැකීමෙන් දනිමු. ඒ අනුව වෙළඳපොළ අවශ්‍යතා යනුවෙන් ඇත්තට ම අදහස් වෙන්නේ සමාගම් සහ ඒවායේ හිමිකරුවන්ගේ අවශ්‍යතා යි.

---

150 https://www.truthdig.com/articles/the-revenge-of-the-lower-classes-and-the-rise-of-american-f*asci*sm-2/

ඒ ආකාරයෙන් ම ආයෝජන යනුවෙන් මහත් අභිමානයෙන් හඳුන්වන යෙදුම ද දෙයාකාරයක මැදිහත්වීම් ආකුල කිරීම පිණිස බහුල ව යොදා ගැනෙන්නකි. ඉන් එකක් වන්නේ ඵලදායක නවෝත්පාදන හා සමාජීය වසයෙන් ප්‍රයෝජනවත් දෑ නිපදවීමට කෙරෙන ආයෝජනය යි. අනෙක දැනටමත් පවතින වත්කම් මිල දී ගෙන ඒවායින් බදු කුලිය, පොලිය, ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ ආදී වසයෙන් හම්බ කිරීමකින් තොර ව ආදායම දොවා ගැනීම යි. එක ම වචනය මේ ක්‍රම දෙකට ම යොදා ගැනීම මඟින් ධනය උත්පාදනය වන සත්‍ය ප්‍රභවය සැඟවීමට හැකි වන නිසා ධනය නිස්සාරණය කිරීම හෙවත් උද්ධරණය *(extraction)* සහ ආර්ථිකයට වඩා වැදගත් වන ධනය නිර්මාණය කිරීම *(creation)* අතර ඇති වැදගත් වෙනස ව්‍යාකුල කර තිබේ.

සිය වසකට පමණ පෙර පරම්පරා ගත උරුමය නිසා ධනවතුන් බවට පත් වූ අය විසින් අලුත් සල්ලිකාර ව්‍යවසායකයින් ගර්හාවට ලක් කරනු දක්නට ලදී. "උන්ට කවුද හිර දෙන්නේ" යනුවෙන් මාටින් වික්‍රමසිංහගේ ගම්පෙරළිය නවකතාවේ දී අලුත් සල්ලිකාර පියල් සම්බන්ධයෙන් නන්දාගේ වලව්කාර අම්මා පවසන්නේ එබැවිනි. එනිසා එකී ව්‍යවසායකයෝ සිය ව්‍යාපාරික ප්‍රතිරූපයට වඩා වත්කම් හිමි බදු කුලී ආදායම් ලබන්නන් වසයෙන් පෙනී සිටීමට කැමැත්තක් දැක්වූහ. එහෙත් අද කාලයේ මේ පෙළගැස්ම අංශක 180 කින් ආපසු කැරකී ගොස් බදු කුලිය හා උරුමයෙන් ලැබෙන ධනවත්කම වෙනුවට වත්කම් උරුමක්කාරයෝ පවා ව්‍යවසායකයන් වසයෙන් පෙනී සිටීමට කැමැත්ත දක්වති. ඒ සිය වත්පොහොසත්කම් තමන් විසින් ම දුක් මහන්සියෙන් හරි හම්බ කරගත් දේවල් ලෙස පෙන්නුම් කිරීමට ඔවුන්ට ඇති අභිලාෂය නිසයි.

වෙසෙසින් 1970 ගණන්වල සිට 2008 පමණ දක්වා කාලය තුළ දී පෙන්නුම් කළ පරිදි නව ලිබරල්වාදයේ තාවකාලික ජයග්‍රහණය මඟින් සාම්ප්‍රදායික වමේ අසමර්ථකම ද නිරූපණය විය. ඊට පෙර පැවති සම්භාව්‍ය ලිබරල් ආර්ථිකවාදය අනුදත් රාජ්‍ය නිර්බාධ ආර්ථික චින්තනය 1929 දි ඇමෙරිකානු ආර්ථික පරිහානියට හේතු විය. ඒ

සමඟ එය වෙනුවට යොදා ගත හැකි ඉල්ලුම් කළමනාකරණය නම් පරිපූර්ණ ආර්ථික න්‍යායක් ජෝන් මේනාඩ් කේන්ස් විසින් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත් කේනීසියානු ඉල්ලුම් කළමනාකරණය 1970 දී අර්බුදයට ගිය විට ඒ වෙනුවට විකල්පයක් ලෙස වේදිකාවට ප්‍රවිෂ්ට වීමට නවලිබරල්වාදය සමත් විය. එහෙත් 2008 දී නව ලිබරල්වාදයේ අසාර්ථකත්වය සක්සුදක් සේ පැහැදිලි වන විට එය වෙනුවට යොදා ගත හැකි වෙනත් විකල්පයක් අපට නො වීය. ඒ නිසා නවලිබරල්වාදී අවතාරවලට තවමත් හොල්මන් කළ හැකි ය. ඒ අතර අවුරුදු 80කට කිට්ටු කාලයක් තිස්සේ වම සහ මැද යන දෙක ම ආර්ථික චින්තනය පිළිබඳ නව පොදු චින්තන රාමුවක් ඇති කර ගැනීමට අපොහොසත් ව ලත වෙති.

කෙසේ වෙතත් මේ ප්‍රශ්නයට පිළිතුරු ලෙස කේන්ස් නැවත අවදි කර ගැනීමට තැත් කිරීම ඵල රහිත ක්‍රියාවකි. 21 වැනි සියවසේ අර්බුදවලට කේන්ස්ගේ විසඳුම් භාවිත කිරීමට යෝජනා කරන අය වැදගත් ගැටලු තුනක් නො සලකා හරිති. ප්‍රථමයෙන් ම පැරණි අදහස් වටා ජනතාව එක්රැස් කිරීම අපහසු දෙයකි. දෙවනුව, 70 ගණන්වල අනාවරණය වූ කේනීසියානු ක්‍රමයේ අසමත්කම් තවමත් ඉවත් වී නැත. තෙවනුව වඩාත් ම වැදගත් කාරණය වන්නේ කේනීසියානු විසඳුම් අප මුහුණ දෙන බරපතළ ම ආපදාව වන පරිසර අර්බුදය ගැන කිසිවක් සඳහන් නො කිරීමයි. කේනීසියානුවාදය වැඩ කරන්නේ පරිභෝජන ඉල්ලීම් උත්තේජනය කිරීම් මඟින් ආර්ථික වර්ධනය ඉහළ යන්නේ ය යන තර්කය මත ය. එහෙත් පාරිසරික විනාශය මෙතරම් තීව්‍ර වී ඇත්තේද පාරිභෝගික ඉල්ලීම සහ ආර්ථික වර්ධනය ඉහළ යෑම නිසා ය.

කේනීසියානු වාදය හා නවලිබරල්වාදය යන දෙකේ ම අසාර්ථකත්වයෙන් අපට පෙන්වන්නේ කඩා වැටුණු චින්තන ක්‍රමයකට හුදු විරෝධය දැක්වීමක් පමණක් ප්‍රමාණවත් නො වන බව ය. ඒ වෙනුවට වෙනත් පැහැදිලි සංගත විකල්පයක් සොයා ගත යුතු ය.

නවලිබරල්වාදී ගෝලීයකරණයේ ඇති මූලික ප්‍රශ්නය වන්නේ හැම දෙයක් ම සම්බන්ධයෙන් පාහේ ලොව පුරා එක විට වෙනස් කිරීමකින් තොර ව කිසි දෙයක් වෙනස් කිරීමට නො හැකි වීමයි. උදාහරණයක් වසයෙන් තනි රටක් බදු වැඩි කිරීමට තීරණය කළ විට ප්‍රාග්ධනය බදු අඩු තැනකට පලා යයි. එමෙන් ම ආර්ථිකයට වන අමාරුකම් නො තකා දේශගුණ විපර්යාසයට විසඳුම් සෙවීමට තනි රටක් තැත් කරන විට එම රටේ ආර්ථිකයට එය ප්‍රශ්නයක් විය හැකි නමුදු අනෙකුත් රටවල් ද එම ක්‍රියාව අනුගමනය නො කරයි නම් පෘථිවි දේශගුණයට එම විසඳුමෙන් වන සෙතක් නැත. ඒ හා සමාන ව වියදම් අඩු කිරීම පිණිස සේවක සංඛ්‍යාව අඩු කිරීම හෝ වඩා ලාභ ශ්‍රමය සපයා ගත හැකි රටවල ඇති ව්‍යාපාරවලට සිය කර්මාන්තය මාරු කිරීම මඟින් ගෝලීය මට්ටමින් තරඟකාරීවීමට ද නො හැකි ය. ඒ නිසා සිදු කළ යුතු කුමන වෙනසක් වුවද එක්කෝ ගෝලීය මට්ටමෙන් ම සිදු විය යුතු ය නැතිනම් කිසි සේත් ම සිදු නොවිය යුතු ය.

සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාවෙන් ගැලවී මේ අර්බුදයේ දී පශ්චාත් නවලිබරල්වාදී යුගයක් ගැන කථා කිරීමට අපට සිදු වනු ඇත. අප ඉන් අදහස් කරන්නේ බටහිර ලෝකය දුර්වල කිරීම හෝ එහි විනාශය ප්‍රාර්ථනා කිරීම හෝ, බටහිර භංගවේවා කඳවුරට එක්වීම හෝ නො වේ. කෙසේ වෙතත් වර්තමානයේ තාක්ෂණික, ආර්ථික, සමාජීය සහ දේශපාලන ක්ෂේත්‍රවල ගෝලීය මට්ටමින් ඇතිවෙමින් තිබෙන සිදුවීම් පරිවර්තනීය අවදියක අභියෝග වසයෙන් සැලකීමට අපට සිදුවී තිබේ. මෙම පරිවර්තනය සම්බන්ධයෙන් සබුද්ධික විවාදයකට එළඹීමට නම් බටහිරෙන් උරුම වූ බල දේශපාලනය, ප්‍රචණ්ඩත්වය සහ නො රිස්සීම වෙනුවට අපි සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය, සංවිචාරණය (*deliberation*) සහ අන් මතවලට ද කන්දීම පිළිබඳ ජාත්‍යන්තර සම්ප්‍රදායේ එන හොඳ ම ආදර්ශ ආදේශ කර ගත යුතු වෙමු.

# - 15 -

## නව ලිබරල්වාදයේ දේශපාලන දැක්ම

බර්ක්ලි සරසවියේ ආචාරිනී වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙන පරිදි නවලිබරල්වාදය යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ ප්‍රාග්ධන සංසරණයට හා ප්‍රාග්ධනයේ නිර්බාධිත ක්‍රියාකාරිත්වයට මෙන් ම ප්‍රාග්ධනය රාශි භූත වීමට *(accumulation of capital)* ද අසීමිත ව ඉඩ සලසන නිශ්චිත ආර්ථික හා දේශපාලනික ප්‍රතිපත්ති සමුච්චයකි.[151] මෙකී නිශ්චිත ප්‍රතිපත්ති සමුච්චයට මූලික වසයෙන් අයිතිවන්නේ ප්‍රාග්ධන හිමිකරුවන් සඳහා උපරිම බදු සහන ලබා දීම, භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්ෂේත්‍ර නිර්නියාමනය *(deregulation)* කිරීම, රජය යටතේ පවතින පොදු සේවා සහ භාණ්ඩ සැපයීම් මුළුමනින් ම පෞද්ගලීකරණය කිරීම, සුභසාධන රාජ්‍ය ක්‍රමය බිඳ දැමීම සහ ශ්‍රමය සංවිධානය කර ගැනීමට වෘත්තීය සමිති ව්‍යාපාරවලට ඇති හැකියාව නැති කර දැමීම යි. රජය විසින් ඉටු කළ යුතු ජාතික ආරක්ෂක සහ අධිකරණමය සේවා හැර අනෙකුත් සියලු නිෂ්පාදන හා පොදු සේවා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් රජය සතු කර ගෙන ඇති භූමිකාව ඊට වඩා කාර්යක්ෂම ලෙස නිර්බාධක වෙළඳපොළ මඟින් ඉටු කර ගත හැකි බව නවලිබරල්වාදය අදහයි.

ඒ හැර මිචෙල් ෆූකෝ විසින් පෙන්වා දී ඇති පරිදි නවලිබරල්වාදය යන්න සුවිශේෂ මාදිලියක පාරිභෝගික වැසියන්,

151 Wendy Brown (2018) Authoritarianism: *Three Inquiries in Critical Theory,* Chicago: University of Chicago Press, p.12

හැසිරීම්, සමාජීය තේරුම් සහ වටිනාකම් නිර්මාණය කරන්නා වූ පරිපාලනමය තාර්කිකත්වයක් *(governing rationality)* ලෙස ද ග්‍රහණය කර ගත යුතු සංකල්පයකි. සාමාන්‍ය දෘෂ්ටිවාදවලට වඩා වෙනස් ආකාරයෙන් යථාර්ථය ගූඪකරණයට හෝ විකෘතියට ලක් කරන නවලිබරල්වාදී තාර්කිකත්වය එහි වෙළඳපොළ අරමුණුවලට අනුව ලෝකය ප්‍රතිනිර්මාණය කරයි. හැම ක්ෂේත්‍රයක් ම හැම මානව ප්‍රයත්නයක් ම සම්බන්ධයෙන් පොදු යහපතට වඩා එහි දී මුල් වන්නේ ප්‍රාග්ධනයේ නිර්බාධිත ක්‍රියාකාරිත්වය සලසන ආර්ථික කාර්යක්ෂමතාවයි. යුක්තිය පදනම් කරගත් සමාජයක් වෙනුවට සමාජය වෙළඳපොළ පදනම් කර ගත යුතු ව ඇති බවත් රාජ්‍යය ක්‍රියාත්මක විය යුත්තේ එම වෙළඳපොළ අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම පිණිස බවත් නවලිබරල්වාදය අදහයි. කොටින් ම ඒ අනුව රාජ්‍ය විචාරණය මූලික වසයෙන් ම සිදු විය යුත්තේ නිර්බාධක වෙළඳපොළ ප්‍රතික්‍රියා හරහායි.

අනුක්‍රමයෙන් සමාජයේ සාර්වත්‍රික සාමාන්‍ය දැනුම බවට පත් වෙන මේ නවලිබරල්වාදී මූලධර්ම රජය පමණක් නො ව වැඩපොළ, පාසල්, රෝහල්, පොලිසි ආදියෙහි කටයුතු සහ සියලු ආකාරයේ මිනිස් චර්යා සහ තීරණ කෙරෙහි ද බලපායි. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය උදාහරණයකට ගත්තොත් නවලිබරල්වාදී තාර්කිකත්වයට අනුව උසස් අධ්‍යාපනය හුදෙක් මිනිස් ප්‍රාග්ධනයේ අනාගත වටිනාකම වැඩි කිරීම සඳහා කෙරෙන මූල්‍ය ආයෝජනයක් වසයෙන් සලකනු ලැබේ. ඒ අනුව සාමාන්‍යයෙන් අස්පෘශ්‍ය *(Intangible)* අදහසක් සහ භාවිතයක් වසයෙන් මෙතෙක් කල් සැලකුණ අධ්‍යාපනය යනු පොදු ප්‍රජාතන්ත්‍රවාදී යහපතකි යන අදහස බැහැර කෙරේ. මේ නවලිබරල්වාදී චින්තනය අද බොහෝ විශ්ව විද්‍යාලවල පාඨමාලා, විෂය නිර්දේශ, ගාස්තු, ඇතුළුවීම් සහ බඳවා ගැනීම්, ඉගැන්වීම් සහ සමීක්ෂණ හා පර්යේෂණ ප්‍රමුඛතා සහ පරිපාලන පරමාර්ථ ආදී සෑම දෙයක් සම්බන්ධයෙන් ම බලපායි.

එපමණක් නො ව එතෙක් පැවති පොදු යහපත අරමුණු කරගත් සාම්ප්‍රදායික ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රජය ද නවලිබරල්වාදී චින්තනයට

අනුව සාර්ථක වෙළඳ සමාගමක් මෙන් යළි සැකසීමට ලක් විය යුතු යැ'යි ද අදහස් කෙරේ. ඒ අනුව 2017 පැවති මැතිවරණයෙන් ප්‍රංශ ජනාධිපති වසයෙන් තේරී පත් වූ එමානුවෙල් මැක්‍රොන් ප්‍රංශය *start-up* හෙවත් මුල සිට ඇරඹෙන නව සමාගමක් මෙන් කටයුතු කරමින් ඉදිරියට යන රටක් බවට පත් විය යුතු යැ'යි පැවසී ය. ඇමෙරිකානු නවෝත්පාදනය පිළිබඳ ධවල මන්දිර කාර්යාලයීය මෙහෙවරකරු සහ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ බෑණනුවන් වූ ජාරෙඩ් කුෂ්නර් පැවසූ අන්දමට ආණ්ඩුව පවත්වා ගෙන යා යුත්තේ විශාල ඇමෙරිකානු සමාගමක් පවත්වා ගෙන යන ආකාරයෙනි. සමාගමක් මෙන් ම ආණ්ඩුවේ ද අරමුණ විය යුත්තේ පාරිභෝගිකයන් වන රටවැසියන් සඳහා සාර්ථකව හා කාර්යක්ෂමව සේවා සැපයීමයි. සමාගම්වලට පාරිභෝගිකයන් මෙන් ම කොටස්කරුවන් ද සිටින බව සිය තර්කයට උචිත ලෙස කුෂ්නර් අමතක කරයි.

නවලිබරල්වාදයේ දී නිදහස යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳව යම් යම් වෙනස්කම් තිබුණත් පොදුවේ ගත් විට නිදහස යනු නිර්බාධිත වෙළඳපොළ ඇසුරෙන් ඇතිවිය යුත්තක් බව නවලිබරල්වාදීහු අදහති. කෙසේ වෙතත් මෙහි දී නිදහස යන්න ස්වෛරීත්වය සහ ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදයට එහි ඇති සම්බන්ධය තහවුරු කරන දේශපාලනික සාරයෙන් වියුක්ත කොට සැලකේ. ඒ වෙනුවට නවලිබරල්වාදය නිදහස යන්න ස්වාමිත්වකාමී පුද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමට ඇති අවකාශය යන්නට මුළුමනින් ම සමාන වූ සංකල්පයක් ලෙස ප්‍රවර්ධනය කරයි. එයට අනුකූලව නිර්නියාමනය, තරඟකාරිත්වය, වටිනාකම වැඩි කර ගැනීමට ඇති හැකියාව නවලිබරල්වාදී නිදහසේ මූලික අංග විය යුතු ය. මේ කියන නිදහසේ දේශපාලන වටිනාකම ප්‍රතිෂේධාත්මක ය; ඒ නිසා නවලිබරල්වාදී නිදහස සාර්ථක වන්නේ දේශපාලනයේ විශේෂයෙන් ම ආණ්ඩුවක බලපෑම නැති වන තරමට ය. නිදහස යන්නේ අර්ථය මෙසේ නවලිබරල්වාදය විසින් වෙනස් කරනු ලබන විට වම යනු හුදෙක් නිර්බාධක වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට පමණක් නො ව නිදහසට විරුද්ධ බලවේගයක් යැයි ද හංවඩු ගැසෙයි.

නවලිබරල්වාදය බිහි වූයේ ජර්මනියේ ෆැසිස්ට්වාදය සහ සෝවියට් ඒකාධිකාරීවාදයේ බලපෑම අත්දැක තිබූ තත්වය යටතේ ය. ඒ ක්‍රම දෙක අතර වෙනස්කම් තිබුණත් මූලික වසයෙන් ඒ දෙක ම සැලසුම්ගත ව රාජ්‍ය පාලනයට නතු වූ දේශපාලන-ආර්ථික ක්‍රම විය. සෝවියට් ආර්ථික ක්‍රමය රජයේ මධ්‍යගත සැලසුමට අනුව ක්‍රියා කල යුතු වූ අතර ෆැසිස්ට්වාදී ජර්මනියේ පැවති ක්‍රමයට අනුව වෙළඳපළ මෙහෙයවීම ජර්මන් රජයේ කාර්යභාරය විය. 1947 දී මොන්ට් පෙලරින් සමාජය *(Mont Pelerin Society)* නමැති චින්තන පර්ෂදය බිහි වූයේ ආර්ථිකය සම්බන්ධයෙන් රජයේ මේ මැදිහත් වීම පිටු දැකීම අත්‍යවශ්‍ය බව ඒත්තු ගැන්වීම සඳහා ය. එකී චින්තන පර්ෂදයේ මතය අනුව කේන්සියානු සුභසාධන රාජ්‍ය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සහ පොදු අයිතිය වැනි සියල්ල වහල්භාවයට මාවත වෙයි. මොන්ට් පෙලරින් සමාජයේ පුරෝගාමී ආර්ථික විද්‍යාඥයෙක් වූ ෆ්‍රීඩ්රික් වොන් හයෙක් "*Road to Surface*" නම් සිය සුපතළ කෘතියට පාදක කරගත් මූලික තර්කය වූයේ එයයි. පසු ව එය නව ලිබරල්වාදයේ දේශපාලනික අනුග්‍රාහිකාව වූ බ්‍රිතාන්‍ය අගමැතිනී මාග්‍රට් තැචර්ගේ ප්‍රියතම කෘතිය විය. ෆ්‍රීඩ්රික් වොන් හයෙක් සහ චිකාගෝ ගුරුකුල නායකයා ලෙස විරුදාවලි ලත් මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් නව ලිබරල් වාදය උත්කර්ෂණයට නැංවූ ආර්ථික විද්‍යා ප්‍රාමාණිකයන් වසයෙන් සැලකෙයි.

සම්භාව්‍ය ලිබරල්වාදයට වඩා නවලිබරල්වාදය දේශපාලනික වසයෙන් හාත්පසින් ම වෙනස් ය. සම්භාව්‍ය ලිබරල්වාදයට අනුව ජාතික රාජ්‍ය යන්නෙන් අදහස් වන්නේ සමාන අයිතීන් භුක්ති විඳිය යුතු සංයුක්ත පුරවැසි සමාජයකි. එහෙත් නවලිබරල්වාදීන්ට අනුව ජාතික රාජ්‍ය යනු තනි තනි පුද්ගලයන්ගේ හුදු එකතුවකි. නවලිබරල්වාදයට වෙනස් ව සම්භාව්‍ය ලිබරල්වාදයට අනුව දේශපාලනික නිදහස අවශ්‍ය වන්නේ තනි තනි පුද්ගලයන් වසයෙන් කටයුතු කිරීමට පමණක් නො ව ප්‍රජාවක් හෝ සමාජයක් වසයෙන් කටයුතු කිරීම සඳහා ය.

එහෙත් 'සමාජය කියා දෙයක් නැත, ඇත්තේ තනි පුරුෂයින් ස්ත්‍රීන් සහ ඔවුන්ගේ පවුල් පමණි'[152] යනුවෙන් බ්‍රිතාන්‍ය අගමැතිනී මාග්‍රට් තැචර් පැවසුවේ නවලිබරල්වාදී ආභාසය නිසා ය. තැචර් ඇදහූ නවලිබරල්වාදී දේශපාලනයේ මුල් ගුරුවරයා වූ ෆෙඩ්රික් හයෙක්ට සමාජය යන්න අරහං විය. ඊට හේතු වුණේ එය අනිවාර්යයෙන් ම සාධාරණය සහ සුපිළිවෙළ යන දෙක ම රාජ්‍ය සැලසුම් කිරීම් මඟින් අත්පත් කර දීමට තැත් කරන සංකල්පයක් බවට ඔහු තුළ තිබූ විශ්වාසයයි. සුවිශේෂිත අරමුණකින් තොර ව වෙළඳපොළ සහ සාම්ප්‍රදායික සදාචාරය යන දෙකේ එකතුව නිසා ඉබේ ඇතිවෙන ගතික සුපිළිවෙළ *(dynamic order)* රාජ්‍ය මැදිහත් වීම නිසා අවහිර වෙන බව හයෙක් කියා සිටියේ ය. සර්වව්‍යාපී නීතිරීති මත තහවුරු වෙතැ'යි සැලකෙන සාධාරණත්වයක් 'සමාජ සාධාරණත්වය' යනුවෙන් ජනයා වෙත ආදේශ කිරීම වැරදි වැටහීමක් බව ද ඔහුගේ අදහස විය. ඇත්ත වසයෙන් ම සමාජ සාධාරණය තැත් කරන්නේ සාම්ප්‍රදායික සදාචාරය විස්ථාපනය කොට ඒ වෙනුවට කිසියම් එක් කණ්ඩායමක් විසින් හොඳ යැ'යි සලකන දෙයක් ආදේශ කිරීම බව ද ඔහු පැවසී ය.

ඒ ගැන වෙන්ඩි බ්‍රවුන් මෙසේ ලියයි. "සමාජීය යන අදහස ඉතා භයානක, තේරුමක් නැති, හිස්, විනාශකාරී වංක 'ශබ්දාර්ථ ප්‍රෝඩාවක්' *(semantic fraud)* බව හයෙක්ගේ අදහස විය. සමාජීය යන්න සාමූහික පැවැත්ම ආණ්ඩුමට්ටු කිරීම පිණිස දරන තුච්ඡ උත්සාහයේත් ප්‍රජාපීඩනයේත් සංකේතයක් බව ද ඔහු සැලකීය. 'සමාජය' යන්න ද එය මඟින් ඉස්මතු කරන බලාපොරොත්තු කඩ වූ විට පැමිණිලි කිරීමට අප විසින් නිම වූ 'නව දෙවියෙකු' සඳහා 'අටවා ගන්නා ලද යෙදුමකි' යනුවෙන් හයෙක් තව දුරටත් පැවසීය. පොදු අරමුණක් ඉටු කර ගැනීමට සාමූහික ව කටයුතු කරන ලදැයි

152 "They are casting their problems at society. And, you know, there's no such thing as society. There are individual men and women and there are families". – Margaret Thacher in an interview in Women's Own in 1987. - https://www.theguardian.com/politics/2013/apr/08/margaret-thatcher-quotes Retrieved on 21 March 2021

යන වැරදි උපකල්පනය මත ක්‍රියාත්මක වෙන්නට ඇතැ'යි සිතන පුරාණ ලෝකයේ තිබූ කුඩා හා කුලුපග පයිරුපාසානයක් ගැන කාංසාවක් සමාජය යන යෙදුමෙන් පිළිබිඹු කරන බව ද ඔහුගේ අදහස විය. එහෙත් ඔහුට අනුව 'නරක ම තත්වය නම් එය රාජ්‍ය සතු බලහත්කාර බලය සඟවා ගැනීමට යොදන යෙදුමක් වීමයි". හයෙක්ට අනුව සමාජ සාධාරණය යන්න ද මිරිඟුවකි. එයට ආකර්ෂණය වීම නිදහස් ශිෂ්ටාචාරයක ඇති අනෙකුත් සියලු වටිනාකම්වලට බරපතළ අනතුරක් කැඳවීමකි."[153]

සමාජ සාධාරණත්වයට අතිරේක ව නවලිබරල්වාදීන් නො කැමැත්ත පළ කළ අනෙක් සංකල්පය වූයේ 'දේශපාලනය' බව වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙයි. හයෙක්ගේ අගසව්වෙකු වසයෙන් හැඳින්විය හැකි මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් පෙන්වා දුන් පරිදි නිදහසට එරෙහි වන ද්විත්ව බලය වන්නේ වෙළඳපොළ බලවේග විසින් පලවා හැරෙන දේශපාලන බලය යළි සංකේන්ද්‍රණය වීමට ඇති ඉඩකඩ සහ වෙළඳපොළ මත නිදහස් ලෙස කෙරෙන තේරීම් වෙනුවට නීති හෝ විධාන මඟින් බලහත්කාරය පැටවීමට දේශපාලන බලය පෙලඹීම යි. දේශපාලන බලය මත සුරකෙන කොන්ත්‍රාත්තු ගිවිසුම් නීති ආදී ක්‍රියා වෙළඳපොළ පවත්වා ගෙන යෑමට අවශ්‍ය ස්ථාවර භාවය සැලසුව ද පොදුවේ ගත් විට හැම දේශපාලන ක්‍රියාවක් සහ විධි විධානයක් ම ෆ්‍රීඩ්මන්ඩ්ට අනුව පුද්ගල නිදහසෙන් කෙරෙන අඩු කිරීමක් වන්නේ ය. ඒ අනුව බහුතරයකගේ මතය සුළුතරයක් මත පටවන බැවින් සෘජු ප්‍රජාතන්ත්‍රවාදයකින් වුවද සිදු වන්නේ පුද්ගල නිදහස අවම කිරීමකි. මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් එය පැහැදිලි කරන්නේ මෙසේයඃ

> **"වෙළඳපොළ ක්‍රියාවලියට පදනම් වන දේශපාලනික මූලධර්මය ඒකමතික එකඟත්වයයි. පුද්ගලික දේපළ මත රඳා පවතින නියම නිදහස් වෙළඳපොළක කිසිදු පුද්ගලයෙකුට තවත් පුද්ගලයෙකු බලහත්කාරයෙන් නතු කර ගත නො හැකි අතර සියලු සහයෝගිතා ස්වේච්ඡාවෙන් ම සිදු වෙයි. එකී සහයෝගිතාව යනු සහභාගි වන සියල්ලන්ට ම එල**

153 Wendy Brown (2019), *In the Ruins of Neoliberalism,* New York: Columbia University Press, , p. 33 (KE)

**ප්‍රයෝජන සලසන සහයෝගිතාවකි. නො එසේ නම් සහභාගි වීම අවශ්‍ය නො කෙරේ. පුද්ගලයන් සතු වගකීම් සහ හවුල් වටිනාකම් හැරෙන්නට වෙන යම් අර්ථයකින් ගත හැකි සමාජ වගකීම් හා වටිනාකම් කියා දෙයක් එහි නොමැත."[154]**

හයෙක්ට අනුව දේශපාලනය, විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය යනු බලය සංකේන්ද්‍රණය කරන්නා වූ ද, පුද්ගල ක්‍රියා යටපත් කරන්නා වූ ද, නිරායාසයෙන් ම ඇතිවෙන වෙළඳපොළ සුපිළිවෙලට *(order)* බාධා කරන්නා වූ ද, ස්වාභාවික දිරි ගැන්වීම් හා බෙදා හැරීම් විකෘති කරන්නා වූ ද ඒ නිසා ම වෙළඳපොළ සෞඛ්‍යයට තර්ජනයක් වන්නා වූ ද දෙයකි. *Law, Legislation and Liberty* නම් කෘතියේ වෝල්ටර් ලිප්මන් උපුටා දක්වමින් හයෙක් මෙසේ සඳහන් කරයි. "නිදහස් සමාජයක රජය මිනිසුන්ගේ කටයුතු පරිපාලනය නො කරති. රජය කරන්නේ තම තමන්ගේ කටයුතු තම තමන් විසින් ම ඉටු කර ගන්නා මිනිසුන් අතර යුක්තිය පසිඳා ලීම යි."

ඉහත කී අන්දමින් රාජ්‍ය විචාරය සහ ආර්ථිකය වෙත යොමු වෙමින් විස්තර කිරීමට තැත් කළ ද නියම නවලිබරල්වාදී නිදහස යනු ආර්ථිකය ද ඉක්මවා පුද්ගලීකරණය සහ නිර්නියාමනය පුළුල් සදාචාරීය දෘෂ්ටියක් බවට පත් කරන ප්‍රයත්නයක් බව වෙන්ඩි බ්‍රවුන් පවසයි.

නිදහස යන්නෙන් නවලිබරල්වාදීන් අදහස් කරන්නේ කුමක් ද යන්න ගැන අඩු වැඩි වසයෙන් එකිනෙකට වෙනස් වූ මත තිබිය හැකි වුව ද පොදුවේ ගත් විට හයෙක් අදහස් කරන ලිබරල්වාදී නිදහස කුමක් ද යන්න සාමාන්‍යකරණයකට ලක් කිරීම අපහසු නො වේ. ෆ්‍රීඩ්රික් හයෙක් සිය කෘතියෙන් අවධාරණය කරන පරිදි නිදහස යනු අන් කිසිවක් නො ව තවත් කෙනෙකුගේ අත්තනෝමතික විධාන මත ක්‍රියා කිරීමට සිදු නො වීම යි. ඒ නිසා තර්ජන ගර්ජන මෙන් ම රෙගුලාසි, නියාමන නීති රීති, විධාන ආඥා ආදී සියල්ල ද නිදහස සීමා කරන දේවල් ය. ඒ හැර වෙනත් කිසිදු ආකාරයක අර්ථයකින්

154 Friedman, Milton (1970), *"The Social Responsibility of Business is to Increase Profits"*, New York Times Magazine, 13 Sept 1970 – quoted by Wendy Brown

නිදහස තේරුම් කිරීමට හයෙක් එකඟ නො වේ. ඔහු විශේෂයෙන් ම විරුද්ධ වන්නේ නිදහස සහ මහජන පරමාධිපත්‍ය එක හා සමාන කිරීමට යි. මහජන පරමාධිපත්‍ය යන භාවිතය සමඟ සම්පත් බෙදා හැරීම රජයේ පාලනයට නතු විය යුතු දෙයකි යන්න ගම්‍ය වන බැවින් නිදහස මහජන පරමාධිපත්‍යය හා සම කිරීම හෝ එහි ලක්ෂණයක් ලෙස සැලකීම මුළුමනින් ම වැරදි දෙයක් ලෙස හයෙක් සලකන බව වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙයි. ඊට අනුව නිදහස යන්න කිසියම් කාරකත්වයක් *(agency)*, හැකියාවක් හෝ පරමාධිපත්‍යයක් ලෙස පිළිගැනීම මඟින් සිදු වන්නේ නියම නිදහස සහ එනිසා නිරායාසයෙන් බිහි වන සුපිළිවෙළ *(order)* අහෝසි කිරීම යි. කොටින් කිව්වොත් නිදහස් වෙළඳපොළ යන අර්ථයෙන් හැරෙන්නට අනෙක් ඕනෑ ම අර්ථයකින් නිදහස භාවිත කිරීමෙන් හයෙක්ට අනුව සිදු විය හැක්කේ අනිවාර්යයෙන් ම එම භාවිතය නිදහසේ විරුද්ධාර්ථය බවට පත් වීම යි. ඒ නිසා සියලු සමානාත්මතාවාදී ව්‍යාපාර ද නියම නිදහස පිළිබඳ නවලිබරල්වාදීන්ගේ මතයට ප්‍රතිවිරුද්ධ ව්‍යාපෘති වසයෙන් සැලකිය යුතු ය.

හයෙක්ගේ මතයට අනුව වෙළඳපොළ නිදහස උත්කෘෂ්ට ය. සමාජය කාර්යක්ෂම වන්නේ වෙළඳපොළක් මෙන් සංවිධානය වුවහොත් පමණි. ඒ නිසා පුද්ගල, දේශපාලනමය, ප්‍රජාමය ආදී ඕනෑම ආකාරයක නිදහසකට වෙළඳපොළක් වැනි ආකෘතියක් පවති. නිදහස විසින් වගකීම ද, වගකීම විසින් විනය ද විනය විසින් නවෝත්පාදන ද බිහි කරනු ලබයි. විනය මඟින් කාර්යක්ෂමතාව සහ සුපිළිවෙළ ද ජනිත වෙයි.

ඉතින් හයෙක් කියන මේ නිදහස සියලු ක්ෂේත්‍රවලට ආදේශ කරන්නේ කෙසේ ද? වෙනත් අන්දමකින් කිව හොත් දේශපාලනයේ බලය සහ වපසරිය සීමා කිරීම මඟින් හයෙක් පවසන නිදහස තහවුරු කරන්නේ කෙසේ ද? ඒ සඳහා ඔහුට ඇති ප්‍රකට විසඳුම වන්නේ පොදු දේවල් පෞද්ගලීකරණය කිරීමයි. ඒ මඟින් හයෙක්ගේ අරමුණ වන්නේ දේශපාලන වපසරියේ බලපෑම අවම කොට "පුද්ගල

ආරක්ෂිත අවකාශය" *(the personal, protected sphere)* සුරක්ෂිත කොට 'සමාජය' යන්නට ඇති පොදු පිළිගැනීම බිඳ දැමීම යි. මේ නිසා හයෙක් නිර්වචනය කරන පරිදි නිදහස යනු රජයේ අයිතියෙන් හා නියාමනයෙන් මුක්ත වීම මත පවතින දෙයක් ලෙස පිළිගත යුතු වේ. හයෙක්ගෙන් ලැබූ බුද්ධිමය ආභාසය අනුව පොදු දේවල් පෞද්ගලීකරණය කිරීම මාග්‍රට් තැචර් හා රොනල්ඩ් රේගන් 1980 සහ 1990 ගණන්වල දී සිය නායකත්වයේ මූලික ක්‍රමෝපායක් ලෙස යොදා ගත්තේ එමගින් 'සමාජය' යන්නට ඇති පිළිගැනීම බිඳ දැමීමට ඇති අධිෂ්ඨානයත් සමඟ ය. "සමාජය කියා දෙයක් නැත, ඇත්තේ තනි පුරුෂයින් ස්ත්‍රීන් සහ ඔවුන්ගේ පවුල් පමණි" යනුවෙන් මාග්‍රට් තැචර් ප්‍රකාශ කළේ එබැවිනි.

ඒ අනුව නවලිබරල්වාදී නිදහස පිළිබඳ ව්‍යාපෘතිය මගින් සිදු කරන්නේ උපරිම ක්‍රියාකාරකම් ප්‍රමාණයක් පුද්ගලික *(private)* ගණයේ ලා සැලකීම යි. එපමණක් නො ව එම ක්‍රියා සියල්ල සුදුසු පරිදි නිර්නියාමනය *(deregulation)* විය යුතු අතර ප්‍රජාතන්ත්‍රවාදී සමානාත්මතා බලපෑම්වලින් මුක්ත විය යුතු ය. ඒ අනුව හයෙක් පවසන අන්දමට අප බලහත්කාර බලයෙන් මුදා හරින ප්‍රථම කොන්දේසිය වන්නේ පුද්ගලික අවකාශය නිර්ණය කරන "දේපළවල පුද්ගලික අයිතිය" පිළිගැනීම යි. පුද්ගලික අවකාශය ලෙස හැඳින්වෙන මෙම අවකාශය හුදු භෞතික අවකාශයක් පමණක් නො වේ. ඒ අවකාශය පුද්ගල ක්‍රියා සුරක්ෂිත කරන දේශපාලන අවකාශයක් ලෙස ද තහවුරු කළ යුතු ය.

රජයේ බලපෑම ද ඉන් බාහිර සමාජ බලපෑම් ද ඇතුළු ව බලහත්කාර බලපෑමට එරෙහි ව පුද්ගල නිදහස තහවුරු කර ගැනීම පිළිබඳ මේ වියුක්ත මූලධර්මය එක්සත් ජනපදයේ නව ලිබරල් තර්කනයේ මූලික අංගයක් බව වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙයි. එම තර්කනයේ දී වරණ නිදහස හෙවත් තෝරා ගැනීමට ඇති නිදහස *(freedom of choice)* යන්න මූලික වසයෙන් ම යෙදෙන්නේ සමානාත්මතාව *(equality)*, උත්ප්‍රේක්ෂාව *(tolerance)*

සහ අන්තර්ග්‍රහණය *(inclusion)* වැනි ප්‍රජාතන්ත්‍රවාදි සංකල්පවලට එරෙහිව ය.

අනෙක් අතට පොදු යහපත මුල් කර ගෙන පිහිටුවා ඇති සහ අභියාචනා ක්‍රමයක රැකවරණය සහ ප්‍රජාතන්ත්‍රීය වග වීමක් ඇති අධිකරණ ක්‍රමයකට අභිමුඛ වීම වෙනුවට වෙළඳපොළ සම්බන්ධ බොහෝ තීන්දු තීරණ නවලිබරල්වාදී චින්තනයෙන් අනුදත් ආකාරයට අනිවාර්ය බේරුම්කාර ක්‍රමවලට යොමු කිරීම ද වැඩි වෙමින් පවතී.

පුද්ගලීකරණය පිළිබඳ මේ භාවිතය මඟින් සමානාත්මතාව මෙන් ම අඩු සැලකිලි දැක්වීමට එරෙහි වීම ද අභියෝගයට ලක් කරනවාට වඩා වැඩි දෙයක් ද සිදු කරයි. ඒ හයෙක්ගේ "පුද්ගලික සුරක්ෂිත අවකාශය" යන්නට පවුල් වටිනාකම්, චාරිත්‍ර වාරිත්‍ර සහ සදාචාරාත්මක විශ්වාස ද ඇතුළත් වන බැවිනි. ඒ අනුව නවලිබරල්වාදය විසින් පොදු තන්ත්‍රය යන්න ආර්ථිකකරණයට පමණක් නො ව කුටුම්බකරණයට ද ලක් කරනු ලබයි. එනිසා සමස්තයක් වසයෙන් ගත් විට සමානාත්මතාව, ලෞකිකවාදය *(secularism)*, බහුත්වවාදය *(pluralism)* සහ අන්තර්ග්‍රහණය *(inclusion)* වැනි නූතන ප්‍රජාතන්ත්‍රවාදී හර වෙනුවට නවලිබරල්වාදී චින්තනය සමාජ වටිනාකම් ලෙස ආදේශ කරන්නේ හයෙක් සිය කුටුම්බකරණය තුළින් දකින "සාම්ප්‍රදායික සදාචාරීය වටිනාකම්"ය. මේ අනුව අධ්‍යාපනයට පොදු අරමුදල් ආයෝජනය කිරීම වෙනුවට තනි තනි පවුල්වලට නිකුත් කෙරෙන මුදල් වවුචර මඟින් එම පවුල්වල වටිනාකම්වලට අනුකූලව තීරණය කරන අභිමත අධ්‍යාපනයක් ලබා දීමට පවුල්වලට ම ඉඩ සැලසිය යුතු බව අදහස් කෙරේ[155]. එමඟින් අධ්‍යාපනයේ සමානතාව පිළිබඳ සංකල්පය සහමුලින් ම බැහැර කෙරේ. මේ කියන පවුල් වටිනාකම් චාරිත්‍ර වාරිත්‍ර සහ විශ්වාසවලට සම්බන්ධ ඒවා මිස අවංකකම, ගුණගරුක භාවය ආදී සාරධර්ම වසයෙන් තේරුම් ගැනීමට අවශ්‍ය කරන ඒවා නො වේ. එකල නිව්යෝක්

155 Wendy Brown (2019), *In the Ruins of Neoliberalism,* New York: Columbia University Press, p. 91 (KE)

දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ කැපී පෙනුණු ව්‍යාපාරිකයෙකු වූ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් 1987 දී පළ කල *The Art of the Deal* නම් කෘතියේ "ව්‍යාපාරික කටයුතුවල දී අවංකභාවය යනු හොඳ ම ගුණාංගය නො වේ"යැ'යි සඳහන් කරන්නේ එබැවිනි.

ඒ හා සමාන සාම්ප්‍රදායික සදාචාරීය වටිනාකම් ආදේශ කිරීම සම්බන්ධයෙන් තවත් උදාහරණයක් වන්නේ සිය සේවකයන් රක්ෂණය කිරීම සම්බන්ධයෙන් ඇමෙරිකාවේ ෆෙඩරල් සමානාත්මතා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමට "සාම්ප්‍රදායික සදාචාරීය වටිනාකම්" නමැති වහන්තරාව යොදා ගැනීමයි. ඒ සම්බන්ධ ප්‍රකට නිදසුන වන්නේ ගබ්සා කිරීම ආවරණය වලංගු වන රක්ෂණ ගිවිසුම්වලට තම දායකත්වය දීම ආගමික විශ්වාසය අනුව ප්‍රතික්ෂේප කිරීමට සමාගම්වලට අයිතිය දීමට ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කිරීම යි. මේ අනුව "තෝරා ගැනීමට ඇති නිදහස"*(freedom of choice)* යන්න කොන්සර්වේටිව්වාදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් විසින් රාජ්‍ය නියාමනයෙන් සමාගම් මුක්ත කිරීමටත්, සමාගම්වලට දේශපාලන ජීවිතයේ ඇතැම් අංශ සම්බන්ධයෙන් මැදිහත් වීමටත් ඉඩ දෙන තීන්දුවලට පාදක කර ගෙන ඇති බව වෙන්ඩි බ්‍රවුන් පෙන්වා දෙයි. මේ නිසා කලින් පුද්ගලිකව පුද්ගලයන්ට පමණක් ආදේශ වූ ආගමික නිදහස වැනි සිවිල් අයිතීන් නවලිබරල්වාදී ආකල්පවලට අනුව සමාගම්වලට ද ඇතැ'යි යන්න ඇතැම් තීන්දුවලින් පෙන්නුම් කරයි.

කෙටියෙන් පැවසුවොත් පොදු යහපත, බහුත්වවාදී බව සහ ලෞකික ගුණාංගවලින් සමන්විත ජාතික රාජ්‍යයක් පිළිබඳ ප්‍රතිරූපය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී වපසරිය අඩු කොට හයෙක්ගේ "සුරක්ෂිත පුද්ගලික අවකාශය" සමඟ පුද්ගලීකරණය, සමජාතීය බව *(homogeneity)* සහ කුටුම්බීය වටිනාකම් මුල්කරගත් ජාතික රාජ්‍යයක් නිදහසේ නාමයෙන් ප්‍රතිරූපගත කිරීම නව ලිබරල්වාදයේ දෘෂ්ටිමය අභිලාෂය යි.

සම්භාව්‍ය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ජාතික රාජ්‍ය පිළිබඳ කලින් පැවති ප්‍රතිරූපය මඟින් පාරදෘශ්‍ය භාවය, නීතියේ ආධිපත්‍ය,

සංස්කෘතික හා ආගමික බහුවිධත්වය නිරූපණය කළ නමුත් නවලිබරල්වාදී ප්‍රතිරූපය නිරූපණය කරන්නේ සම්ප්‍රදාය ගරු කරන, සමජාතීය *(homogeneous)*, බහිෂ්කරණීය *(exclusionary)* සහ සංක්‍රමණික විරෝධී ජාතියකි. අනෙක් අතට නවලිබරල්වාදී ආර්ථිකයේ එන පුද්ගලීකරණය ප්‍රජාතන්ත්‍රවාදය කඩාකප්පල් කර දමන්නකි. සම්භාව්‍ය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සංයුක්ත කොට තබන හුය වන්නේ පොදු යහපත සහ එයට ආනුෂංගික පොදු අයිතිය බැවින් සෑම ක්ෂේත්‍රයක ම පුද්ගල අයිතිය සහ පුද්ගලික යහපත ප්‍රවර්ධනය කරන නවලිබරල්වාදයට සම්භාව්‍ය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ පොදු යහපත පිළිබඳ පදනම සුරැකිය නො හැකි ය. ඒ වෙනුවට නවලිබරල්වාදී පුද්ගලීකරණයෙන් උත්කර්ෂණයට නංවන්නේ පොදු දේපළවල පුද්ගලික අයිතිය, අසමානතාව හා ප්‍රාග්ධන ඒකරාශි වීම මත බිහි වන අසීමිත ව ධනකුවේර භාවය ප්‍රවර්ධනය කරන නිර්ප්‍රජාතන්ත්‍රවාදයකි.

ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රාග්ධන වටිනාකම්වලටත් වඩා ඇතැම් විට ප්‍රජාතන්ත්‍රවාදය කඩාකප්පල් කිරීමට උපයෝගී වන්නේ ලිබරල්වාදී පුද්ගලීකරණයේ දේශපාලනික ආස්ථානය වසයෙන් සැලකිය හැකි නිර්ප්‍රජාතන්ත්‍රවාදී සදාචාරීය හා කුටුම්බීය වටිනාකම් ය. ඒ අනුව ආර්ථික ක්ෂේත්‍රයට අතිරේක ව "පුද්ගල ආරක්ෂිත අවකාශයේ" නාමයෙන් අපේකම, සදාචාරීය විශ්වාස, කුටුම්බීය වටිනාකම් ප්‍රමුඛ කර ගැනීම මඟින් පුළුල් පොදු යහපත පදනම් කරගත් සම්භාව්‍ය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය අවතක්සේරු කිරීමට නවලිබරල්වාදය දායක වෙයි.

නවලිබරල්වාදී දේශපාලන සන්දර්භය අධ්‍යයනය කිරීමේ දී සිවිල් අයිතිවාසිකම් පිළිබඳ සාමාන්‍ය භාෂා ව්‍යවහාරයෙන් අප මුලාවට පත් නො විය යුතු ය. මන්ද සමානාත්මතාව, සිවිල් ක්‍රියාකාරිත්වය, අන්තර්ග්‍රහණය සහ සමාජ සාධාරණත්වයට එරෙහි ව නූතන විකල්ප-දක්ෂිණාංශය භාවිත කරන දෙපැත්ත කැපෙන ආයුධයක් වසයෙන් සැලකිය හැක්කේ පුද්ගල අයිතියක් වසයෙන්

සැලකෙන භාෂණයේ නිදහස වන බැවිනි. මෙය මෙහෙයවෙන්නේ වෙළඳපොළ වටිනාකම් උත්කර්ෂණයට නැංවීම මගිනි. උදාහරණයක් වසයෙන් ඇතැම් පුද්ගලික විද්‍යුත් නාලිකා හුදෙක් දක්ෂිණාංශික මතවාද ප්‍රචාරය කිරීමට මුල් තැන දෙන්නේ විද්යුත් මාධ්‍යයේ පුද්ගලික අයිතිය භාෂණයේ පුද්ගල නිදහස හා සම කිරීමෙනි. ඇමෙරිකා එක්සත් ජනපදයේ බොහෝ පුද්ගලික කථන ගුවන් විදුලි නාලිකා *(talk radio)* මේ ඒක පාක්ෂික භාෂණයට නිදසුන් ය.

එය එසේ වුව ද මීට අවුරුදු හතළිහකට පෙර එනම් නව ලිබරල්වාදයේ බලපෑම ඇමෙරිකානු අධිකරණ ක්ෂේත්‍රයට තවමත් කාන්දු නො වී තිබූ 1969 දී රෙඩ් ලයන් ගුවන් විදුලි සමාගම එදිරි ව ෆෙඩරල් සංනිවේදන කොමිසම නඩුවේ දී පිළිබිඹු විය. රෙඩ් ලයන් ගුවන් විදුලි වැඩ සටහනක් මඟින් විවේචනයට භාජනය වූ පාර්ශවයක් එම විවේචනයට පාදක වූ කරුණු අභියෝග කරමින් තමන්ට ද අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දෙන ලෙස කළ ඉල්ලීමක් රෙඩ් ලයන් ගුවන් විදුලි ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. අගතියට පත් පාර්ශවය එයට එරෙහි ව කළ පැමිණිල්ලක් විභාග කළ ෆෙඩරල් සංනිවේදන කොමිසම එම ඉල්ලීමට ඉඩ දෙන ලෙස රෙඩ් ලයන් ගුවන් විදුලි ආයතනයට නියෝග කළේ ය. එම නියෝගය නිසා සිය අභිමතයට අනුව තම භාෂණයේ අයිතිය භාවිත කිරීම උල්ලංඝනය වන්නේ ය යන පදනම මත ෆෙඩරල් සංනිවේදන කොමිසමේ නියෝගය අවලංගු කරන ලෙස රෙඩ් ලයන් ගුවන් විදුලි ආයතනය ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටියේ ය. එහෙත් තමන්ට අභිමත මතය පමණක් තෝරා ප්‍රචාරය කිරීමට පොදු දේපළක් වන ගුවන් විදුලි තරංග භාවිත කරන ගුවන් විදුලි ආයතනයට ඉඩ දිය නො හැකි බවත් අභිමත අදහසක් ප්‍රකාශ කිරීමට ගුවන් විදුලියට ඇති අයිතියට වඩා වැදගත් වන්නේ එම ගුවන් විදුලිය අසන අයට අදාළ කරුණ පිළිබඳ ව සියලු පැති දැන ගැනීමට ඇති අයිතිය බව අවධාරණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය රෙඩ් ලයන් ගුවන් විදුලියේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. කෙසේ වෙතත් ගුවන් විදුලි තරංග පොදු

දේපළකි යන මතය මත විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වල සාධාරණත්වය පිළිබඳ මූලධර්මය ක්‍රියාත්මක වීම *(fairness doctrine)* සන්නිරීක්ෂණය කිරීමට එතෙක් ෆෙඩරල් සංනිවේදන කොමිසමට තිබූ නියාමන බලය නවලිබරල්වාදී රේගන් පාලනය යටතේ අහෝසි කිරීමෙන් පසු ඇමෙරිකා එක්සත් ජනපදයේ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය, විශේෂයෙන් බොහෝ කථන ගුවන් විදුලි නාලිකා ඒක පාක්ෂික දක්ෂිණාංශික කථකයන්ගේ ආධිපත්‍යට යටත් විය.[156]

මේ අනුව කොන්සර්වෙටිව් පවුල් වටිනාකම්වලට එරෙහි යැ'යි සැලකෙන අදහස් දරුණු ලෙස අවමානයට ලක් කරන පුද්ගලික ගැරහීම්, අවලාද හා තර්ජන කිරීම් භාෂණයේ නිදහස නාමයෙන් ඒක පාක්ෂික ව යොදා ගැනීමට ඇමරිකා එක්සත් ජනපදයේ දක්ෂිණාංශික ගුවන් විදුලි මාධ්‍ය කරුවන්ට ඉඩ ලැබී තිබේ. එය කිසිවකුට කිසිදු තත්වයක් යටතේ තවත් කෙනෙකුට සීමා පැනවිය නො හැකි ය යන නවලිබරල්වාදී චින්තනය හා ගැළපේ.

මින් අදහස් වන්නේ පවුල් වටිනාකම් වෙනුවෙන් ජාතිවාදී ප්‍රකාශ හා අන් අය ගැරහීම හයෙක් අනුමත කළ බවක් නො වේ. ඉන් කියවෙන්නේ නවලිබරල්වාදී ආඛ්‍යානය මඟින් සාධාරණීකරණය කිරීමට තැත් කරන පුද්ගල නිදහස නියාමනය කිරීම රජයේ බලහත්කාර බලයක් භාවිත කිරීමක් ලෙස සලකන නවලිබරල්වාදී මතවාදයේ ආශිර්වාදයට එය මුවා වෙන බවයි. පුද්ගලයා හා සමාගම යන දෙපාර්ශ්වයම එකම ලෙස පුද්ගල අයිතීන් ආදේශ කිරීම මඟින් සමාගම් විසින් නියම කෙරෙන දක්ෂිණාංශික සදාචාරීය වටිනාකම්වලට එහි සේවකයන් යටත් කර තැබීම නවලිබරල්වාදයට අනුව නිවැරදිය.

අප මෙතෙක් සලකා බැලූ ආකාරයට පුද්ගලීකරණයේ ආර්ථික හා දේශපාලනීය පැතිකඩ දෙක ම ජාතික රාජ්‍යයට ආදේශ කළ විට එය තවදුරටත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය මත පිහිටු විය නො

156 Matzako, Paul (2020), *Talk Radio Is Turning Millions of Americans Into Conservatives*, New York Times, 09 Oct 2020

හැකි ය. ආර්ථික වසයෙන් හොඳ ඩීල් එකක් දැමීමට හැකි හෙවත් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි තරඟකාරී ව්‍යාපාර හිතෛෂී භූගෝලීය ඒකකයක් ලෙස එක් අතකින් ද අනෙක් අතට සුළු ජාතිකයන් ද ඇතුළු අහිතකර පිටස්තරයන් විසින් සාම්ප්‍රදායික පවුල් වටිනාකම් අභියෝගයට ලක් කිරීමට එරෙහි වන කුටුම්බවල එකතුවක් යන දෙලක්ෂණයෙන් ම සමන්විත දෙයක් ලෙස ද නවලිබරල්වාදී ජාතිය සැලකේ. නූතන දක්ෂිණාංශික දේශපාලනය දෝලනය වන්නේ මේ දෙඅන්තය අතර ය. දක්ෂිණාංශික මාරි ලපෙන්ගේ "ප්‍රංශය ප්‍රංශ ජාතිකයන්ට පමණයි" සහ ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ "ඇමෙරිකාව යළි ශ්‍රේෂ්ඨත්වයට නංවමු" වැනි සටන් පාඨවලින් ගම්‍ය වන්නේ එයයි. ලංකාවේ සිංහල බෞද්ධකම සහ ඉන්දියාවේ හින්දුත්වවාදය දේශපාලනයේ පෙරමුණට එන්නේ ද ඒ ද්වි ලක්ෂණ සහිත නවලිබරල්වාදී චින්තනය තුළ ය.

ජාතිකවාදයේ නැගිටීම යනු හුදෙක් ම නවලිබරල්වාදය නිසා පමණක් ඇති වූ දෙයක් ලෙසට සැලකීමට වඩා එය නවලිබරල්වාදී විරුද්ධාභාෂයක් *(a paradox)* නිසා පෝෂණය වූවක් ලෙස සැලකිය හැකි ය. නවලිබරල්වාදී ආර්ථික එළඹුම විසින් ජනිත කර ඇති ආදායම් විෂමතා නිසා වැඩි දෙනෙකුට ජීවත් වීමට සරිලන ආදායමක් සහතික කර ගැනීමට නො හැකි වීම, විශ්‍රාම වැටුප් ක්‍රම අනිස්ථිර වීම සහ රැකියා සුරක්ෂිතභාවය ඇතුළු සමාජ රක්ෂණ ක්‍රම අහෝසි වී යෑමේ තර්ජනය නිසා ඇති වී තිබෙන අසහනය එක් අතකින් ද අනෙක් අතින් පොදු වියදම් කපා හැරීම, ධන හිමියන්ට වැඩි බදු සහන ලබා දීම පිණිස ආදායම් හිඟය පියවීමට ගත් පියවර සහ වෙළඳපොළ ගෝලීයකරණය හමුවේ දේශීය කර්මාන්ත අභියෝගයට ලක් වීම ආදිය ද නිසා 'අනෙකා' පිට මං කරන ජාතිවාදයක් කරා නැඹුරු වීමට බහුතරය පෙළඹුනහ. ඇතිවෙන ආර්ථික අසීරුකම්වලට අතිරේක ව ගෝලීයකරණය නිසා ජාතික රාජ්‍ය අභියෝගයට ලක් වන බව මේ ජාතිමාමකයන්ගේ නිරීක්ෂණය විය. බොහෝ කොට බටහිර රටවල දී මෙම තත්වය සාම්ප්‍රදායික සුදු ජාතික මමංකාරය බෙහෙවින් අභියෝගයට ලක් කරන්නක් විය.

කර්මාන්තශාලා පිටින් ම ගලවා ගෙන ගොස් අඩු වැටුප් ගෙවන රටවල පිහිටුවීම, තමන් විසින් සැපයූ සේවා අඩු වියදම් මත ඉටු කළ හැකි රටවලට විතැන් කිරීම, පොදු සේවයක් වසයෙන් සැලකුණු නාගරික නිවාස ඉදිකිරීම අහෝසි කිරීම හෝ පෞද්ගලීකරණය කිරීම නිසා ඉහළ ගිය ගෙවල් කුලී, පෙර නොවූ විරූ අන්දමට අනෙකුත් රටවලින් පැමිණි සංක්‍රමණිකයන් නිසා ශ්‍රමයට පැවති මිල පහළ වැටීම ආදිය නිසා එතෙක් සිය පවුල සම්බන්ධ වගකීම් ඉටු කර දීමේ ලා සුදු ජාතික ගෘහමූලිකයාට සාම්ප්‍රදායික ව හිමි ව තිබූ භූමිකාව නවලිබරල්වාදී ආර්ථිකය තුළ අභියෝගයට ලක් වී තිබුණි. මේ තත්වය ආපසු හැරවිය නො හැකි නමුත් ආදායම් හා සමාජ විෂමතා අවම කිරීමේ වමේ ක්‍රියාකාරී භූමිකාව අතුරුදහන් වීම තුළ දේශපාලන වසයෙන් ඒකරාශී වීමට එම අසහනය දක්ෂිණාංශයට වාසිදායක ලෙස යොදා ගත හැකි වූවක් විය.

ඉහත කී ලක්ෂණ සම්භාව්‍ය ප්‍රජාතන්ත්‍රවාදය විකෘති කිරීමට දායක වූයේ කෙසේ දැ'යි මොහොතකට සලකා බලමු. නවලිබරල්වාදයට අනුව සෝෂල් හෙවත් 'සමාජීය' යන්නෙන් අදහස් වන්නේ වෙළඳපොළ සහ සාම්ප්‍රදායික සදාචාරය විසින් අනවරතයෙන් ගොඩ නගනු ලබන සුපිළිවෙළ වෙනුවට සමානාත්මතාවක් හඹා යන මිථ්‍යා ප්‍රබන්ධයක් ආදේශ කිරීමකි. නවලිබරල්වාදයට අනුව දේශපාලනය යනු බලහත්කාර බලය නීත්‍යනුකූල කිරීම යි. මේ නො පනත්කම් දෙකට ප්‍රතිකාරයක් වසයෙන් නවලිබරල්වාදී යෝජනාව වන්නේ නිර්දේශපාලනීකරණය වූ ද, නිර්නියාමණය කරන්නා වූ ද රජයක් මඟින් පෞද්ගලීකරණය සහ පුද්ගල අවකාශය පුළුල් කිරීම යි. කෙසේ වෙතත් මේ ප්‍රතිකාරයේ ප්‍රතිඵලය වන්නේ දේශපාලන සංස්කෘතිය නිර්ප්‍රජාතන්ත්‍රීය කිරීම මෙන් ම සමානාත්මතාවය, අන්තර්ග්‍රහණය *(inclusion)*, සහ බහුත්වවාදය ගැරහීමට ලක් කිරීම යි. අනෙක් අතට සමානාත්මතාව ප්‍රමුඛ ඉහත කී ප්‍රතිමාන ප්‍රවර්ධනය කිරීමට තැත් කිරීම පුද්ගල නිදහස කඩාකප්පල් කිරීමට තුඩු දෙන දේශපාලන වරමක් විසින් සදාචාරය විස්ථාපනය කිරීමේ ඒකාධිකාරවාදයක් ගොඩ නැගීමට කරන වෑයමක් බව නවලිබරල්වාදය පවසයි.

ඒ අනුව නවලිබරල්වාදය විසින් වෙළඳපොළ සහ කුටුම්බ වටිනාකම් මත පදනම් වූ සාම්ප්‍රදායික සදාචාරය යොදා සමාජය හා ප්‍රජාතන්ත්‍රවාදය විස්ථාපනය කරනු ලබන අතර ජාතිය යන්න ප්‍රජාතාන්ත්‍රික රටවැසියන්ගෙන් සමන්විත වූවකට වඩා අර කී කුටුම්බ වටිනාකම් අනුව සිතන පතන රටවැසියන්ට අයත් දෙයක් ලෙස සැලකේ. අවස්ථෝචිත ව අත්තනෝමතික බලය යොදා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදයේ ම කොටසක් වසයෙන් සැලකිය යුතු බව හුවා දක්වන ෆ්‍රීඩ්රික් හයෙක්ගේ මේ ස්ථාවරය ඕනෑම ආකාරයක අධිපතිවාදියෙකුගේ අමන්දානන්දයට හේතු වනු ඇත.

> **"තර්ජනයට ලක් ව ඇති මූලික වටිනාකම වසයෙන් ප්‍රජාතන්ත්‍රවාදය සැලකීමේ මෝස්තරකාර ගොනු වීම අනතුරුදායක නො වන දෙයක් නො වේ. බලයේ පරම ප්‍රභවය බහුතරයේ කැමැත්ත නිසා එම බලයට අත්තනෝමතික නො විය හැකි බවට ඇති වැරදි සහ පදනමක් නැති විශ්වාසයට එම ගොනු වීම හේතුවක් වී තිබේ... ප්‍රජාතන්ත්‍රවාදී විධික්‍රමයක් යටතේ පවරන ලද බලයකට අත්තනෝමතික විය නො හැකියැ'යි යන විශ්වාසය සාධාරණීකරණය කළ හැක්කක්ද නො වේ. නියමිත නීතිවලින් මෙහෙයවිය නො හැකි බලයක මැදිහත් වීම අවශ්‍ය කරන කාර්යයක් විසඳීමට ප්‍රජාතන්ත්‍රවාදයට සිදු වුවහොත් එසේ යොදා ගන්නා බලය අත්තනෝමතික බලයක් බවට පත් විය යුතු ය."[157]**

එහෙත් දේශපාලන බලයේ ලීවර ධන සමුච්චකයන් විසින් ඩැහැ ගනු ලැබීම වැළැක්වීමට නිරන්තරයෙන් අවදි ව සිටීම ප්‍රජාතන්ත්‍රවාදයේ වගකීමකි. සමාගමික, එකාබද්ධිත හෝ පෞද්ගලික යන ඕනෑ ම ආකාරයකින් සමුච්චිත ධනයට පැවතිය හැකි ය. වරක් දේශපාලන බලය ග්‍රහණය කරගත් පසු ස්වාර්ථකාමය වෙනුවෙන් ඕනෑ ම දෙයක් ඉටු කර ගැනීමට සමුච්චිත ධනය සූදානම් ය. එකී ස්වාර්ථකාමය සඳහා සාමාන්‍ය මිනිසුන්, දුප්පතුන් සහ ඓතිහාසික වසයෙන් අඩු සැලකිලිවලට ගොදුරු වූ සමාජ කොටස් සිය දේශපාලන අභිලාෂ සාක්ෂාත් කර ගැනීමට දරන වෑයම කඩාකප්පල් කිරීමට පමණක් නො ව සිය වාසිය තකා ඔවුන්ගේ ඡන්ද බලය නො

157 Hayek, F. A. 2007 [1944]. *The Road to Serfdom: The Definitive Edition*. Edited by Bruce Caldwell. Chicago, IL: University of Chicago Press. pp. 110-111

මඟ යැවීමට ද සමුච්චිත ධනය නො පැකිළේ. කොටින් ම ධනවාදී ජාතික රාජ්‍ය සන්දර්භයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මක් ප්‍රවර්තනය වීමට නම් සෞඛ්‍ය සේවයේ සිට අධ්‍යාපනය දක්වා ඉමහත් පරාසයක කාර්යක්ෂම සහ ගුණාත්මක මහජන සේවා සැපයීම, ආර්ථික ප්‍රතිව්‍යාප්තිය සහ ධන හිමියන්ගේ දූෂණ කටයුතුවලට එරෙහිව බලවත් ලෙස කටයුතු කිරීම රජයේ හා සමාජයේ වගකීම විය යුතු ය. වෙළඳපොළට හෝ වෙළඳපොළ ජය ගන්නා අයට හෝ පාලන කටයුතු පවරා දීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්තනය කළ නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන දේශපාලන සමානාත්මතාව වෙනුවෙන් ඒ දෙකම නියාමනය හා සීමායනය *(containment)* කළ යුතු ය.

කෙසේ වෙතත් පුද්ගල නිදහස පිළිබඳ නවලිබරල්වාදී සංකල්පය හා පීඩාකාරී ආණ්ඩුවලට එරෙහි ව මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම එකක් නො ව දෙකක් බව අප මතක තබා ගත යුතු ය. නවලිබරල්වාදී පුද්ගලික නිදහස ධනය ඒකරාශි කර ගැනීමට පුද්ගලයාට තිබිය යුතු යැ'යි අදහස් වූ නිදහස ප්‍රමුඛ කොට ගොඩ නැගුණු සංකල්පයකි. අනෙක් අතට විශ්ව මානව අයිතිවාසිකම්වලට අයත් සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්වලට පදනම වූයේ හිට්ලර්ගේ ජනප්‍රිය නාසිවාදී ජාතික චින්තනය මඟින් ගාල් කරනු ලැබූ ජන විඥානය යටතේ යුදෙව් ජාතිකයන් වැනි ආන්තික කොටස් ප්‍රමුඛ සියලු විසම්මුතිකයන් නො මිනිසුන් ලෙස සැලකීම යළි උද්ගත වීම වළක්වනු වස් නිර්ණය කළ ජාත්‍යන්තර ප්‍රමිති ය. මේ වැදගත් වෙනස චිලියේ ඒකාධිපති පිනෂේට් රජය නව ලිබරල්වාදයෙන් ලද ආභාසය සම්බන්ධයෙන් මී ළඟ පරිච්ඡේදයේ එන විස්තරයෙන් පැහැදිලි වෙයි.

1970 සිට හෙජමොනික ආන්ඩුකරණ වර්ගයක් බවට ගෝලීය වසයෙන් නවලිබරල්වාදය නැගී ඒමට හේතු වූ ව්‍යුහාත්මක පරිවර්තන, දේශීය හා ගෝලීයකරණීය වර්ධන ගැන ලියැවුණු පොහොසත් සාහිත්‍යයක්[158] තිබෙන බව පෙන්වා දෙන මාඩ්රා සහ අඩමාන්

158 (see, e.g., Duménil and Lévy, 2004; Harvey, 2005; Cerny, 2008; Klein, 2008)

නවලිබරල්වාදය එහි ආර්ථිකකරණීය එළඹුම මඟින් සමාජ සහ දේශපාලන ක්ෂේත්‍ර පොදු ජනයා සඳහා නිර්දේශපාලනීකරණය කිරීමට වෑයම් කරන දෘෂ්ටිවාදයක් ලෙස තේරුම් ගැනීම අතිශයින් වැදගත් බව පවසයි[159]. එම ආර්ථිකකරණීය වැඩපිළිවෙළට මනුෂ්‍යයන් යනු ආර්ථික වාසි හඳුනන සහ ඒවාට ප්‍රතිචාරය දක්වන සත්වයන් ය යන අදහස මුල්කරගත් 'හෝමෝ එකොනොමිකස්' ප්‍රමුඛ කොට සියලු ආයතනික වාතාවරණ යළි සකසා ගැනීම, සියලු ආකාරයේ සමාජ හා දේශපාලන ගැටලු ආර්ථික දිරිගැන්වීම් නිර්මාණය කිරීමෙන් විසඳීම අරමුණු කරගත් නවලිබරල්වාදී ආණ්ඩුකරණයක් පිහිටුවීම ද ඇතුළත් ය. ඒ අනුව අපි නවලිබරල්වාදය යනු හුදෙක් වෙළඳපොළකරණය, පුද්ගලීකරණය සහ වාණිජ හා මූල්‍ය ලිහිල්කරණය යන ආර්ථික සාධකවල එකතුවක් ය යන සුලබ ආඛ්‍යානයට සීමා නො විය යුතු ය. මන්ද එමඟින් අපට විවිධ ආකාරයේ නවලිබරල්වාද ග්‍රහණය කර ගැනීමට නො හැකි වන බැවිනි. උදාහරණයක් වසයෙන් සමාජය ආර්ථිකකරණයට යටපත් කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අතර ම රජයේ මෙවලම්වල තීරණාත්මක මැදිහත් වීම ද යොදා ගන්නා තුර්කියේ එර්ඩොගාන් වැනි දේශපාලනඥයන් පවත්වා ගෙන යන අන්දමේ නවලිබරල්වාදී මාදිලිය එමඟින් ආවරණය නො වන බව මාඩ්රා සහ අඩමාන් පවසයි. ඒ වෙනුවට අප කළ යුත්තේ මානව චර්යාව යනු සහයෝගිතාව හා සහකම්පනය මත නො ව හුදෙක් මිල සහ ප්‍රතිලාභ ගණනය කිරීම ප්‍රමුඛ කර ගැනීම මත තීරණය වන දෙයක් ලෙස සැලැකීමට රාජ්‍ය ආයතන මෙන් ම, ඇතැම් විට වෙළඳපොළ ප්‍රමුඛ නො වන උපක්‍රම පවා යොදා ගන්නා වූ පුළුල් පරාසයක න්‍යායික සහ ප්‍රතිපත්තිමය ස්ථාවර අතර වැඩ කරන ආණ්ඩුකරණීය විධි ක්‍රමයක් ලෙස නවලිබරල්වාදය විස්තර කිරීම ය.

159 Madra Y.M and Adaman (2018) *"Neoliberal Turn in the Discipline of Economics: Depoliticization Through Economization" in The SAGE Handbook of Neoliberalism,* Damien Cahill et.el (eds) London: Routledge, p. 515

# - 16 -

# නවලිබරල්වාදය සහ ජනරාල් පීනෂේගේ සංස්ථාපිත පෞද්ගලික රාජ්‍යය

නවලිබරල්වාදය හුදු ආර්ථික චින්තනයක් පමණක් නො ව මානුෂික නිදහස මුල්කරගත් සම්භාව්‍ය ලිබරල්වාදය අනුදත් ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම ආර්ථික වර්ධනයේ නාමයෙන් නො සලකා හරින ආත්මාර්ථකාමී දේශපාලන චින්තනයක් ලෙස ද හැඳින්විය හැකි ය. චිලී රටේ ඒකාධිපති හමුදා ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමට ගිය මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් ඇතුළු චිකාගෝ ගුරුකුලයට අයත් ආර්ථික විද්‍යාඥයන්ගේ නවලිබරල්වාදී ක්‍රියාන්විතය විමසා බැලීමෙන් එය තේරුම් ගත හැකි ය.

1970 නොවැම්බර් 03 දින මැතිවරණයකින් බලයට පත් වූ සමාජවාදී ජනාධිපති සැල්වඩෝර් අලියෙන්ඩේගේ ආණ්ඩුව 1973 සැප් 11 දින හිංසාකාරී හමුදා කුමන්ත්‍රණයකින් පෙරළා දමා චිලී රටේ ආණ්ඩු බලය එහි හමුදාපති ජෙනරාල් අගෝස්ටෝ පීනෂේ ප්‍රමුඛ ජනරාල්වරුන් විසින් අත්පත් කර ගන්නා ලදී. පසු කලක තහවුරු වූ පරිදි ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුවේ පූර්ණ ආශිර්වාදය ද ඇති ව ක්‍රියාත්මක වූ මේ හමුදා කුමන්ත්‍රණයේ දී ජනාධිපති අලියෙන්ඩේ ඇතුළු වාමවාදීන් 3000 කට වැඩි ප්‍රමාණයක් මරා හෝ අතුරුදහන් කර හෝ දමන ලද අතර 80,000 කට අධික සංඛ්‍යාවක් හිර භාරයට ගනු ලැබූහ.

හමුදා ආණ්ඩුවේ මර්දනකාරි වැඩපිළිවෙළ මඟින් සහතික කළ ස්ථාවරත්වය පාදක කරගත් නවලිබරල්වාදී චිකාගෝ ගුරුකුලයේ නියමු මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ්ගේ චිලියානු ගෝලයෙකු වූ සර්ජියෝ ඩි කැස්ත්‍රෝ ප්‍රමුඛ ආර්ථික විශේෂඥයෝ හමුදා ආණ්ඩුවේ නව ආර්ථික ප්‍රතිපත්තිය සඳහා පිඹුරු පත් සකස් කළෝ ය. සිය ගුරුවරයා වූ මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ්ගේ නවලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති ප්‍රථම වරට ප්‍රායෝගික ව අත්හදා බැලීමේ පර්යේෂණාගාරයක් ලෙස චිලී රට යොදා ගැනීමට සර්ජියෝ ඩි කැස්ත්‍රෝ ඇතුළු ඔහුගේ චිකාගෝ ගුරු කුලවාදී චිලියානු සගයෝ උත්සුක වූහ.

හමුදා කුමන්ත්‍රණයෙන් පසු ගත වූ අවුරුදු එකහමාර සපුරා ම ජනරාල් පීනෂේගේ රජය සර්ජියෝ පිඹුරු පත් කළ ආර්ථික ප්‍රතිපත්තිය නො වළහා ක්‍රියාත්මක කළේ ය. රාජ්‍ය බැංකු ඇතුළු රජයේ ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් පෞද්ගලීකරණයට ලක් කරන ලද අතර එතෙක් චිලී රටේ නිෂ්පාදන ආරක්ෂා කිරීමට ආනයන භාණ්ඩවලට පනවා තිබූ සියලු ම සීමා ඉවත් කර දමන ලදී. රජයේ මර්දනකාරී අවශ්‍යතා සලකා හමුදාවේ වැය ශීර්ෂය වැඩි කරන ලද නමුත් අවශේෂ රාජ්‍ය ආයතනවල වැය ශීර්ෂ 10%කින් කපා හැරිණි. අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් එතෙක් පනවා තිබූ පාලන මිල ද මුළුමනින් ම ඉවත් කෙරිණි.

සර්ජියෝ ඇතුළු ආර්ථික උපදේශකයන් පීනෂේට විස්තර කළ අන්දමට ජාතික ආර්ථිකයට රජයේ මැදිහත් වීම මේ අන්දමින් එක් වර ම අවසන් කිරීමට ගත් තීරණය නිවැරදි වන්නේ ආර්ථික විද්‍යාවේ ස්වාභාවික නියාමවලට අනුව ආර්ථිකය ස්වයං ක්‍රියාකාරී ව සමතුලිත වීම නියත වන බැවිනි. ඔහු විස්තර කළ පරිදි නිර්බාධක වෙළඳපොළක් ඇති කිරීම සහතික කිරීමට නම් එයට පටහැණි සියලු සාධක ඉවත් කළ යුතු ය. ඒ අන්දමින් ආර්ථික වර්ධනයට පටහැණි සියලු රෝග කාරක ඉවත් කර දැමූ විට ආර්ථිකයේ පිබිදීම සහතික කළ හැකි ය. කෙසේ වෙතත් සර්ජියෝගේ සුභවාදී අනාවැකියට පටහැණි ව

රටේ උද්ධමනය 375%කින් ඉහළ ගියේ ය. එය අලියෙන්ඩේ යුගය අවසානයේ පැවති උපරිම උද්ධමනය මෙන් දෙගුණයකින් වැඩි වීමකි. පාලන මිලෙන් ඉවත් කරන ලද පාන් වැනි මූලික භාණ්ඩවල මිල පෙර නො තිබූ විරූ අන්දමින් ඉහළ ගියේ ය. එතෙක් සැලකිය යුතු සාර්ථකත්වයක් පෙන්නුම් කර තිබූ බොහෝ දේශීය කර්මාන්තශාලා පීනෂේගේ නිර්බාධක ආනයන ප්‍රතිපත්තිය නිසා පාඩු ලැබීමට හා වසා දැමීමට සිදු වූ බැවින් රැකියාවලින් නෙරපීම හා රැකියා වියුක්තිය ඉහළ ගියේ ය. මේ නිසා හමුදා ආණ්ඩුවක් යනු ව්‍යාපාරික අවශ්‍යතාවක් යැ'යි කල්පනා කළ ස්වදේශික ධනපතියන් අතර පවා චිකාගෝ ගුරුකුලයේ චිලියානු ගෝලයන්ගේ ආර්ථික වැඩපිළිවෙළ ගැන කුකුසක් ඇති විය.

එහෙත් සර්ජියෝ ඩි කැස්ත්‍රෝ ඇතුළු උපදේශකයන්ගේ මතය වූයේ මේ පසු බෑමට හේතුව ඔවුන්ගේ ආර්ථික න්‍යායේ වැරැද්ද නො ව ඔවුන් විසින් දුන් උපදෙස් තරයේ අනුගමනය කිරීමට රජයට නො හැකි වීමයි. ඒ නිසා මීටත් වඩා තදින් වෙළඳපොළ නිර්බාධකරණය පවත්වා ගැනීම පිණිස ආර්ථිකයට රජයේ ඇති මැදිහත් වීම සහමුලින් ම අහෝසි කළ යුතු බව ඔවුහු තර්ක කළහ. ආර්ථිකය සමතුලිතභාවයට පත්වීම වැළකී ඇත්තේ අඩ සිය වසක කාලයක් තිස්සේ ආර්ථිකයට රජයේ මැදිහත් වීම නිසා ඇටුවන් බැහැ ගෙන ඇති ඇතැම් බාධක තවමත් ඉතිරි වී ඇති නිසා බව සර්ජියෝ පැවසී ය.

එහෙත් හමුදා රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණවලින් වැඩි වාසියක් අත්පත් කර ගෙන ඇත්තේ විදේශික සමාගම් සහ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමෙන් හා කොටස් වෙළඳපොළ අභිමත පරිදි මෙහෙයවා අති විශාල ධනස්කන්ධයක් නිස්සාරණය කරගත් 'පිරන්හා' යන ආරූඪ නමින් හැඳින්වුණු කොල්ලකාරී අතළොස්සක් බවත් චිකාගෝ ගුරුකුල ගෝලයින්ගේ උපදෙස්වලින් ආසක්ත ව සිටි දේශීය ව්‍යාපාරික පැලැන්තියේ ඇතැම් නායකයෝ

නිරීක්ෂණය කළහ. (පිරන්හා යනුවෙන් හැඳින්වෙන්නේ ලතින් ඇමෙරිකානු රටවල වෙසෙන ඇටකටු පමණක් ඉතුරු වෙන තෙක් සිය ගොදුර පණ පිටින් ගසා කන දරුණු මාංශ භක්ෂක මත්ස්‍ය වර්ගයකි.) මිල්ටන් ෆ්‍රිඩ්මන්ඩ්ගේ චිකාගෝ ගුරුකුලයේ චිලියානු ගෝලබාලයන් ජනරාල් පිනෂේට හඳුන්වා දී තිබුණේ හමුදා කුමන්ත්‍රණයේ උද්‍යෝගිමත් සහායකයෙකු වූ දේශීය කර්මාන්ත හිමියන්ගේ සංගමයේ සභාපති ඔර්ලන්ඩෝ සේන්ස් විසිනි. දේශීය කර්මාන්ත හිමියන් බොහෝමයක් අලියෙන්ඩේගේ සමාජවාදයට එරෙහි වුව ද දේශීය කර්මාන්ත ප්‍රවර්ධනයට හිතකර වූ ඔහුගේ ඇතැම් ආර්ථික ප්‍රතිපත්තිවලට විරුද්ධ නොවූහ.

සිය නවලිබරල්වාදී ආර්ථික උපදෙස් නිසා තත්වය තව දුරටත් උග්‍ර වී ඇති බව වටහා ගත් සර්ජියෝ කැස්ත්‍රෝ කර්මාන්ත හිමියන්ගේ සංගමයේ සභාපති ඔර්ලන්ඩෝ ප්‍රමුඛ ප්‍රධාන සාමාජිකයන්ගේ මැසිවිලි සලකා උද්ගත වී ඇති තත්වය හොඳින් විමසුමට ලක් කොට වඩා සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන ලෙස සිය මුල් ගුරුවරයා වූ චිකාගෝ ගුරුකුලයේ නායක මිල්ටන් ෆ්‍රිඩ්මන්ඩ්ට ආරාධනා කළේ ය. ඒ අනුව ප්‍රධාන පෙළේ බැංකුවක අනුග්‍රහයෙන් 1975 මාර්තු මාසයේ ෆ්‍රීඩ්මන්ඩ් චිලියේ සන්තියාගෝ අගනුවරට සම්ප්‍රාප්ත විය. ඔහුගේ සම්ප්‍රාප්තිය හමුදා රජයේ පාලනයට නතු වූ ජනමාධ්‍ය වර්ණනා කළේ මුල් පෙළේ ජාත්‍යන්තර නළුවෙකුගේ සම්ප්‍රාප්තියකට නො දෙවෙනි උත්කර්ෂයකිනි. එවකට නව ලිබරල්වාදයේ ජාත්‍යන්තර සුරුවම ලෙස සැලකුණ මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ්ගේ මේ තීරණාත්මක මැදිහත් වීම පිළිබඳ විවරණයක් කරන නයෝමි ක්ලයින් සිය '*The Shock Doctrine*' නම් කෘතියේ මෙසේ සඳහන් කරයි.

> "ෆ්‍රීඩ්මන්ඩ්ගේ හැම කියමනක් ම පාහේ පුවත්පත්වල ශීර්ෂ පාඨ බවට පත් විය. ඔහුගේ ශාස්ත්‍රාලයීය දේශන සියල්ල ම ජාතික රූපවාහිනී සේවය මඟින් විකාශනය කරන ලද අතර ෆ්‍රීඩ්මන්ඩ් සමඟ පැවති හැම පුද්ගලික සාකච්ඡාවකට ම ජනරාල් පිනෂේ ඉමහත් උනන්දුවකින් සහභාගී විය."

චිලියේ ගත කළ මුළු කාලය තුළ ම ෆ්‍රීඩ්මන්ඩ්ගේ මුඛ්‍ය පාඨය වූයේ හමුදා ජුන්ටාව හොඳ ආරම්භයක් ගෙන ඇති බවත් එහෙත් එය පරිපූර්ණවීමට නම් ආර්ථිකයට රාජ්‍යයේ ඇති මැදිහත් වීම සහමුලින් ම අහෝසි කොට චිලී රජය නිර්බාධිත නිදහස් වෙළඳපොළ මුළු හදින් ම වැළඳ ගත යුතු ය බව යි. මෙතෙක් කිසි කලක යථා ලෝකයේ ආර්ථික අර්බුද සම්බන්ධ ව භාවිත නො වූ ආකාරයේ අපූරු යෙදුමක් ඔහු සිය සම්මුඛ සාකච්ඡාවල දී හා දේශනාවල දී ප්‍රකාශයට පත් කළේ ය. එනම් චිලියේ ආර්ථිකයට *"a Shock Treatment"* හෙවත් "තද ප්‍රකම්පනයක් දනවන ප්‍රතිකාරයක්" අත්‍යවශ්‍ය වී ඇති බව යි. නිවැරදිව ම එක ම බෙහෙත එය පමණක් බවත් වෙනත් කිසිදු දිගු කාලීන විසඳුමක් නැති බවත් 'ප්‍රකම්පන ප්‍රතිකාරය' ගැන සඳහන් කරමින් ෆ්‍රීඩ්මන්ඩ් ප්‍රකාශ කළේ ය."[160]

ක්ලයින් වාර්තා කරන පරිදි මේ " තද ප්‍රකම්පන ප්‍රතිකාරය" ගැන විමසූ චිලියානු වාර්තාකරුවෙකු නිදහස් වෙළඳපොළ නියාමනය කිරීම පිණිස එවකට සිටි ඇමෙරිකානු ජනාධිපති රිචඩ් නික්සන් පවා රෙගුලාසි යොදා ඇති බව පෙන්වා දුන් විට "මම ඒවා අනුමත කරන්නේ නැහැ. මා විශ්වාස කරන අන්දමට ඒවා මෙහි දී ද යොදා ගත යුතු නැහැ. මගේ රටේ දී මෙන් ම චිලියේදීත් රජය ආර්ථිකයට මැදිහත් වෙනවාට මම විරුද්ධයි" යනුවෙන් ෆ්‍රීඩ්මන්ඩ් පිළිතුරු දුන්නේ ය.

ජනරාල් පීනෂේ සමඟ පැවති එක සාකච්ඡාවක් පිළිබඳ ව පසු කලක ෆ්‍රීඩ්මන්ඩ් පළ කළ මතක සටහන්වල මෙසේ සඳහන් කරයි. "තද ප්‍රකම්පන ප්‍රතිකාරය පිළිබඳ මගේ අදහසට ජනරාල්වරයා ඇලුම් කළත් ඒ නිසා තාවකාලික ව ඇති විය හැකි දැවැන්ත රැකියා වියුක්තිය සම්බන්ධයෙන් ඔහු තෝන්තුවාවට පත්වී ඇති බව මට පෙනුණි." මේ වන විට විරුද්ධවාදීන් තොග ගණනින් පාපන්දු පිටිවලට ගෙන ගොස් මරා දැමීම ගැන පීනෂේට එරෙහිව ලෝක

160 Naomi Klein (2007), *The Shock Doctrine,* London: Penguin Books Ltd, p.81

ජනමතය තීව්‍ර වෙමින් තිබුණි. ඒ නිසා ප්‍රකම්පන ප්‍රතිකාරයෙන් රට වැසියන්ට ඇති විය හැකි හානිය ගැන ලෝකාපවාද ලැබීමට ඇති ඉඩ කඩ ගැන පීනෂේ කරදර වීම ස්වාභාවික ය. මේ නිසා මදක් පසු බෑ ෆ්‍රීඩ්මන්ඩ් ආපසු සිය රට පැමිණි පසු පීනෂේට ලිපියක් යවමින් ජනරාල්වරයාගේ අතිශය ඥානවන්ත තීරණය බෙහෙවින් අගය කරන අතර කෙසේ නමුත් ඉදිරි මාස හය තුළ රජයේ සමස්ත වියදම අවම වසයෙන් 25% කින් කපා හරින ලෙස ඉල්ලා සිටියේ ය. මෙසේ වියදම කපා හැරීමත් සමඟ පරිපූර්ණ නිර්බාධක වෙළඳාම සඳහා ව්‍යාපාරිකයන් දිරි ගන්වන ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන ලෙස ද ෆ්‍රීඩ්මන්ඩ් නිර්දේශ කළේ ය. රාජ්‍ය අංශය සංකෝචනය වීම නිසා රැකියාවලින් දොට්ට දමනු ලබන සේවකයන්ගේ රැකියා ප්‍රශ්නය නිදහස් වෙළඳපොළ ප්‍රසාරණය වීමට ඇති සියලු බාධක ඉවත් වූ පසු පුද්ගලික අංශය තුළ බිහි වන රැකියා නිසා විසඳෙනු ඇතැ'යි ද ෆ්‍රීඩ්මන්ඩ් පැවසී ය.

තමන්ගේ උපදෙස් අකුරට ම පිළිපදින්නේ නම් මාස කිහිපයක දී උද්ධමනය අවසන් වී ඇතිවෙන "ආර්ථිකයේ ආශ්චර්ය" පිළිබඳ ගෞරවය ඔබට හිමි වනු ඇතැ'යි ජනරාල් පීනෂේට යැවූ ලිපියේ ෆ්‍රීඩ්මන්ඩ් සහතික විය. රැකියා වියුක්තිය ද ඒ හා සමාන ව අඩුව යන අතර අනතුරු ව ආර්ථිකය වේගයෙන් යහපත් අතට හැරෙනු ඇතැ'යි ද ෆ්‍රීඩ්මන්ඩ් සිය ලිපියේ තවදුරටත් සඳහන් කළේ ය. කලින් මෙන් ටිකෙන් ටික කටයුතු කිරීම තවදුරටත් වලංගු නො වන බව සඳහන් කරමින් නො පමාව සහ වේගවත් ලෙස තම යෝජනා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ ෆ්‍රීඩ්මන්ඩ් *Shock Treatment* හෙවත් 'ප්‍රකම්පන ප්‍රතිකාරය' යන යෙදුම තම ලිපියේ තෙවරක් ම සඳහන් කළේ ය.

ෆ්‍රීඩ්මන්ඩ්ගේ දැක්ම සහ නිර්දේශ ජනරාල් පීනෂේ මුලු හදින් ම ඇදහීය. "මගේ ඉහළ ම ප්‍රණාමය සමඟ ඔබ කෙරෙහි ඇති අත්‍යන්ත ගෞරව උපහාරය කරුණාවෙන් පිළිගන්න" යනුවෙන් ෆ්‍රීඩ්මන්ඩ්ට යැවූ

පිළිතුරු ලිපිය ඇරඹූ ජනරාල් පීනෂේ "දැන් අපි සැලැස්ම පරිපූර්ණ ලෙස ම ක්‍රියාත්මක කරමින් සිටිමු" යනුවෙන් සඳහන් කළේ ය. ෆ්‍රීඩ්මන්ඩ්ගේ සන්තියාගෝ ගමනෙන් පසු ආර්ථිකය පිළිබඳ සිය ඇමතිවරයා තනතුරෙන් පහකර දැමූ පීනෂේ ඒ වෙනුවට ෆ්‍රීඩ්මන්ඩ්ගේ දේශීය ගෝලයා වූ සර්ජියෝ කැස්ත්‍රෝ පත් කළේ ය. පසුව ඔහු මුදල් ඇමති තනතුරට උසස් කෙරිණි. රජයේ වගකිවයුතු ආර්ථික තනතුරු තම චිකාගෝ ගුරුකුලවාදී චිලියානු සගයන්ගෙන් පුරවා දැමීමට සර්ජියෝ වග බලා ගත්තේ ය. කර්මාන්ත ක්ෂේත්‍රයේ බොහෝ සේවකයන් සේවයෙන් පහකර දැමීමට සිදුවීම ගැන අසතුටෙන් සිටි ඔර්ලෙන්ඩෝ සේන්ස් වෙනුවට සර්ජියෝ කැස්ත්‍රෝගේ ප්‍රතිපත්තිවලට අනුග්‍රහය දැක්වූවෙකු කර්මාන්ත හිමියන්ගේ සංවිධානයේ සභාපති ධුරයට පත්කර ගන්නා ලදී.

යෝජිත වැඩපිළිවෙළ අනුව ජනරාල් පීනෂේ සහ සර්ජියෝ කැස්ත්‍රෝ චිලී රටේ ඉතුරුව තිබූ රාජ්‍ය සුභසාධන සේවා ද නතර කර දැමී ය. 1975දී එක වරම රජයේ වියදම 27% කින් කපා හැරිණි. මේ කපා හැරීම 1980 ගණන් දක්වා දිගට ම කර ගෙන ගිය අතර ඒ නිසා වඩාත් ම පහර වැදුණේ මහජන සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට යි. රජයට අයත් ව තිබූ බැංකු සහ වෙනත් ආයතන පන්සීයකට අධික ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ ගජ මිතුරන්ට පවරන ලදී. සර්ජියෝට අවශ්‍ය ව තිබුණේ හැකි ඉක්මනින් එම ආයතන රජයේ පාලනයෙන් ඉවත් කර පෞද්ගලික අංශය පුළුල් කිරීමයි. දේශීය කර්මාන්ත ගැන කිසිදු අනුකම්පාවක් නො දැක්වූ සර්ජියෝ ආනයන සඳහා පනවා තිබූ සියලු බාධක ඉවත් කළේ ය. ඒ අනුව 1973 සිට 1983 කාලය තුළ කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා 177,000 අහෝසි කොට සේවකයන් පහකර දැමීමට සිදු වූ බව නයෝමි ක්ලයින් පෙන්වා දෙයි.

ෆ්‍රීඩ්මන්ඩ්ගේ 'ප්‍රකම්පන ප්‍රතිකාරය' නිසා පළමු වසර තුළ චිලියේ ආර්ථිකය 15% කින් සංකෝචනය විය. අලියෙන්ඩේගේ පාලන සමය තුළ 3% ක් ව පැවති රැකියා හිඟය 20% දක්වා වැඩි විය. මාස

කිහිපයකින් අවසන් වෙනවා වෙනුවට ෆ්‍රීඩ්මන්ඩ්ගේ අනාවැකියට පටහැණි ව රැකියා හිඟය වසර ගණනාවක් තිස්සේ පැවතුණි.

එහෙත් ෆ්‍රීඩ්මන්ඩ්ගේ ගෝලයෝ සිය ගුරුවරයා නිර්දේශ කළ මූලික ප්‍රතිසංස්කරණ දිගට ම කර ගෙන ගියෝ ය. ඒ අනුව පොදු සේවා පාසල් ක්‍රමය වෙනුවට වවුචර ක්‍රමයක් යටතේ අධ්‍යාපනයට මිල නියම කරමින් බලලත් පාසල් ක්‍රමයක් දිරි ගන්වනු ලැබී ය. සෞඛ්‍ය සේවා සඳහා මිලක් නියම විය. ළදරු පාසල් මෙන් ම සුසානාගාර හා සොහොන් බිම් පවා පෞද්ගලීකරණයට ලක් විය. වඩාත් ම තීරණාත්මක වූයේ එතෙක් කලක් රජය මඟින් පවත්වා ගෙන ගිය සමාජ ආරක්ෂණ ක්‍රමය ද මුළුමනින් ම පෞද්ගලීකරණය කිරීමයි.

නිදහස් වෙළඳපොළ උත්කර්ෂණයට නැංවූ නවලිබරල්වාදීන්ගේ සාඩම්බර ආදර්ශය බවට මෙසේ චිලී රට පත් විය. ඒ අතර පීනෂේගේ පෞද්ගලික ධනය සහ විදෙස් බැංකුවල තැන්පතු ප්‍රමාණය ද විශාල ලෙස ඉහළ ගියේ ය. පසු කලක ජනාධිපති ධුරයෙන් ඉවත් කෙරුණු පීනෂේට එරෙහිව  මුදල් වංචා කිරීම හා විශුද්ධිකරණය, ආදායම් බදු ගෙවීම පැහැර හැරීම, අවි වෙළඳාමෙන් කොමිස් ගැනීම යන කරුණු සම්බන්ධ දූෂණ චෝදනා එල්ල වීමට එය හේතු විය.  කෙසේ වෙතත් සැලකිය යුතු කාලයක් තිස්සේ ඇතැම් ප්‍රධාන පෙළේ ජන මාධ්‍ය සහ නව ලිබරල්වාදයේ ප්‍රවර්ධකයන් ආර්ථිකයේ වර්ධන වේගය වැඩි වීම චිලී රටේ සෞභාග්‍ය උදා වීම පිළිබඳ දර්ශකයක් ලෙස හුවා දැක්වූයේ ය. 2006 දී ෆ්‍රීඩ්මන්ඩ්ගේ අභාවයෙන් මසක් ගත වීමත් සමඟ එවකට බලයෙන් පහකර දමා තිබූ ජනරාල් පීනෂේ මිය ගිය විට "ඔහු අනුගමනය කල නිදහස් වෙළඳපොළ ප්‍රතිපත්තිය චිලියානු ආර්ථික ආශ්චර්ය බිහි කරලීමට හේතු විය" යනුවෙන් වොෂින්ටන් පෝස්ට් පුවත් පත වාර්තා කළේ ය. එහෙත් මෙකී චිලියානු ආර්ථික ආශ්චර්ය පිළිබඳ ඇත්ත තත්වය බෙහෙවින් විවාදාත්මක කරුණක් බවට පත් ව තිබුණි.

ජනප්‍රිය මහජන නැගිටීමකින් පසු අවසානයේ බලයෙන් ඉවත් කරන තෙක් පීනෂේ 1973 සිට 17ත් වසරක් තිස්සේ චිලී රටේ මර්දනකාරී ඒකාධිපති රජයක් පවත්වා ගෙන ගියේ ය. ඒ මර්දනය ෆ්‍රීඩ්මන්ඩ්ගේ අත්හදා බැලීම්වලට නිසි තෝතැන්නක් සැපයූ නමුත් ඒ සඳහා චිලියේ රටවැසියන්ට ගෙවීමට සිදු වූ සමාජීය වන්දිය ඉතා අධික විය. ඇතැම් නවලිබරල්වාදීන් පාරම්බාන චිලියේ ආර්ථික වර්ධන වේගයේ වැඩි වීම සිදු වූයේ ෆ්‍රීඩ්මන්ඩ්ගේ 'ප්‍රකම්පන ප්‍රතිකාරය' ලබා දී දශකයකට පසු එනම් සෑහෙන කලක් ගත වී අසූව දශකයේ මැද භාගයේ දී ය. නයෝමි ක්ලයින් පෙන්වා දෙන අන්දමට එය ද සිදු වූයේ එතෙක් පැවතුණු නවලිබරල්වාදී ආර්ථික වැඩපිළිවෙළේ වැරදි හදා ගැනීමට පීනෂේට බල කෙරුණු පසු ය. එයට හේතුව චිකාගෝ ගුරුකුලයේ නිර්දේශ අකුරට ම ක්‍රියාත්මක කළ ද 1982 වන විට චිලියේ ආර්ථිකය විශාල වසයෙන් කඩා වැටීමේ අනතුරකට මුහුණ දීමයි. ඒ වන විට රාජ්‍ය ණය ප්‍රමාණය දරා ගත නො හැකි මට්ටමට ළං ව තිබූ අතර උද්ධමනය ද විශාල ලෙස ඉහළ ගොස් තිබුණි. රැකියා විරහිත භාවය 30% කින් එනම් අලියෙන්ඩේගේ පාලන සමයේ පැවති ප්‍රමාණය මෙන් දස ගුණයකින් ඉහළ ගියේ ය. මීට එක් හේතුවක් වූයේ චිකාගෝ ගුරුකුලවාදීන් විසින් මූල්‍ය ආයතන නියාමනය පිටු දැකීමෙන් පසු පිරන්හා කල්ලිවලට අයත් මූල්‍ය ආයතන රජයේ සමාගම් කුණුකොල්ලයට මිල දී ගැනීමට අසීමිත ව විදේශ ණය ලබා ගැනීමයි. රජයේ මැදිහත් වීම මත ලබාගත් ඒ ණය ප්‍රමාණය ආපසු ගෙවීමට නො හැකි තරම් වූ ඩොලර් බිලියන 14 දක්වා ඉහළ ගොස් තිබුණි. ඒ ණය කන්දරාව ආපසු ගෙවීම කර ගැසීමට රජයට සිදු විය.

මේ නිසා රටේ තත්වය කෙතරම් අස්ථාවර වී ද යත් කලින් අලියෙන්ඩේ කළ දේ ම කිරීමට පීනෂේට සිදු විය. එනම් ඔහුගේ මුදල් ඇමති සර්ජියෝ කැස්ත්‍රෝ විසින් පුද්ගලික අංශයට පවරා දෙන ලද රජයේ සමාගම් යළි ජන සතු කිරීම යි. වැඩේ මෙසේ බකල් වී යන එන මං නැති වීම නිසා සර්ජියෝ කැස්ත්‍රෝ ඇතුළු ව චිලියේ

බොහෝ චිකාගෝ ගුරුකුල ගෝලයන්ට පීනෂේගේ රජයේ ගරු ගම්භීර තනතුරුවලින් ඉවත් වීමට සිදු විය. ඉන් ඇතැම් චිකාගෝ ගෝලයන් සහ පිරන්හා කල්ලියේ සාමාජිකයන් බොහෝ දෙනෙකු පසුව දූෂණ හා වංචා චෝදනාවලට ලක් වූහ.

ආර්ථිකයේ සමස්ත කඩා වැටීමකින් එවර චිලී රට ගැලවුණේ කලකට පෙර සමාජවාදී අලියෙන්ඩේ විසින් ජනසතු කර තිබූ කොඩෙල්කෝ නමැති සුවිශාල තඹ ආකර සමාගම පුද්ගලීකරණය කිරීම පීනෂේ ප්‍රතික්ෂේප කළ නිසා බව නයෝමි ක්ලයින් පෙන්වා දෙයි. චිලී රටේ නිර්යාත ආදායමෙන් සියයට 85% ක් ම උපයන ලද්දේ කොඩෙල්කෝ සමාගම විසිනි. ඒ නිසා චිකාගෝ ගුරුකුලය මවා පෑ මූල්‍ය බුබුල පුපුරා ගිය පසු ද රජයට සැලකිය යුතු ස්ථාවර ආදායමක් සැපයීමට රජය සතු කොඩෙල්කෝ සමාගමට හැකි විය.

නයෝමි ක්ලයින් පෙන්වා දෙන පරිදි ඇත්ත වසයෙන් ම මිල්ටන් ෆ්‍රීඩ්මන්ඩ් ඇතුළු නවලිබරල්වාදීන් හුවා දැක් වූ අන්දමට චිලී රට කිසි සේත් ම 'සුපිරිසිදු' තරඟකාරී නිදහස් වෙළඳපොළක් නො වීය. සිදු වූයේ රජයට සමීප ගජ මිතුරු ධනපති අතළොස්සකට ඩොලර් සම්භාරයක් ණයට ලබා ගෙන රජය ලවා ඒවා නැවත ගෙවීමට සැලැස්වීම මඟින් අසික්කිත ප්‍රකෝටිපතියන් වීමට හැකි වීම පමණි. පීනෂේ සහ ඔහුගේ චිකාගෝ ගුරුකුල ගෝලබාලයින් චිලිය ඔවුන්ට හිමිකම් ඇති කෝපරේට්වාදී පෞද්ගලික රාජ්‍යයක් කළා මිස තරඟකාරී ධනවාදී රාජ්‍යයක් බවට පත් නො කළ බව නයෝමි ක්ලයින් පෙන්වා දෙයි. ඇගේ විවරණයට අනුව ඇත්ත වසයෙන් ම පීනෂේ කළේ පොලිස්කාර ආණ්ඩුව හා විශාල සමාගම් අතර අන්‍යෝන්‍ය සහයෝගිතාව සහතික කරමින් කම්කරුවන් හීලෑ කර තබන දූෂිත කොපරේට්වාදී රජයක් පවත්වා ගෙන යෑම යි.

1988 වන විට චිලී රටේ ආර්ථික වර්ධනය වේගයෙන් ඉහළ යමින් තිබුණු නමුත් රට වැසියන්ගෙන් 45% ක් දරිද්‍රතා රේඛාවෙන්

පහළට වැටී තිබුණි. එහෙත් 10%ක් වූ අධි පොහොසතුන්ගේ ආදායම 83%කින් ඉහළ ගියේ ය. 2007 වන විට පවා පොහොසතුන් සහ දුප්පතුන් අතර වැඩි ම ආදායම් පරතරය ඇති රටක් වසයෙන් චිලී රට සැලකුණි. රටවල් 123 ක සමාජ විෂමතා දත්ත පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්තාවට අනුව ලෝකයේ වැඩි ම සමාජ විෂමතාවක් ඇති රටවල් අතරින් චිලී රට අට වැනි ස්ථානයට පත්වී තිබුණි.

1981දී සන්තියාගෝ අගනුවරට පැමිණි චිකාගෝ ගුරුකුලයේ සාන්තුවරයා ලෙස පිදුම්වලත් ෆ්‍රීඩ්රික් වොන් හයෙක් පිනෂේ මුණගැසී චිලී රටේ සිදු වෙන ආර්ථික ප්‍රතිසංස්කරණ ගැන සිය උද්දාමය ප්‍රකාශ කළේ ය. ඉන් නො නැවතුණ ඔහු සිය හිත මිතුරියක වූ බ්‍රිතාන්‍යයේ කොන්සර්වෙටිව් පාක්ෂික අගමැතිනී මාග්‍රට් තැචර්ට ලිපියක් යවමින් බ්‍රිතාන්‍යයේ පැවති කේන්සියානු ආර්ථිකය පරිවර්තනය කිරීම පිණිස චිලී රට ආදර්ශයට ගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. මාග්‍රට් තැචර් සහ පිනෂේ පසු කලක තදබල මිතුරන් බවට පත් වූහ. බලයෙන් පහවූ පසු 1998 බ්‍රිතාන්‍යයට පැමිණි මහලු ජනරාල්වරයා බ්‍රිතාන්‍ය අධිකරණය විසින් ජනඝාතය, වද හිංසනය සහ රාජ්‍ය තස්ත්‍රවාදය යන චෝදනා මත නිවාස අඩස්සියේ තබනු ලැබූ කල්හි ඒ වන විට රැජිනගෙන් බැරනස් අභිධානය ලබා තිබූ මාග්‍රට් තැචර් ඔහු මුණ ගැසී තම සහයෝගය ප්‍රකාශ කළා ය.

පිනෂේගේ වැඩපිළිවෙළ ගැන ප්‍රසාදයක් දැක්වූ නමුත් හයෙක්ගේ යෝජනාවට අනුව චිලියේ "තද ප්‍රකම්පන ප්‍රතිකාරය" බ්‍රිතාන්‍යයට යොදා ගැනීමට මාග්‍රට් තැචර් මැලි විය. 1982 පෙබරවාරියේ දී සිය වියත් මිත්‍ර ෆෙඩ්රික් වොන් හයෙක්ට ලිපියක් ලියූ තැචර් "බ්‍රිතාන්‍යයේ අපේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ සාමූහික එකඟත්වයක අවශ්‍යතාව සලකන විට චිලියේ යොදා ගත් ඇතැම් ක්‍රියාමාර්ග කිසි සේත් අපේ රටට පිළිගත හැකි ඒවා නො වන බව ඔබ තේරුම් ගනු ඇත. අපේ ප්‍රතිසංස්කරණ අපේ ම සම්ප්‍රදාය හා ආණ්ඩුක්‍රමයට එකඟ ඒවා විය යුතු ය. බොහෝ විට එවැන්නක්

ක්‍රියාත්මක කිරීම වේදනාත්මක හා ඉතා මන්දගාමී දෙයක් විය හැකි ය." යනුවෙන් සිය අසීරුකම විස්තර කළා ය[161].

කොටින් ම කිව්වොත් තැචර් ප්‍රකාශ කළේ චිලී රට මෙන් නො ව චිකාගෝ ගුරුකුල ක්‍රමයේ 'තද ප්‍රකම්පන ප්‍රතිකාරය' බ්‍රිතාන්‍ය වැනි ප්‍රජාතන්ත්‍රවාදී රටවල කළ නො හැකි බව යි. චිලියේ ආදර්ශයට අනුව චිකාගෝ ගුරුකුලය යෝජනා කළ ආර්ථික ප්‍රතිසංස්කරණ අඩු වැඩි වසයෙන් අත්හදා බැලිය හැකි වූයේ මිලිටරි ඒකාධිපති පාලන පැවති ඉන්දුනීසියාව, ඝානාව, දකුණු කොරියාව හා තුර්කිය වැනි රටවල සහ තනි පක්ෂ පාලන ක්‍රමයක් පැවති මෙක්සිකෝව, සිංග ප්පූරුව, හොංකොං හා තායිවානය වැනි රටවල පමණි.

එසේ වුව ද එවැනි රටවල පවා ආර්ථිකයට හා පොදු සේවා සැපයීමට රජයේ මැදිහත් වීම මුළුමනින් ම අතහැර දැමීමට බොහෝ ආණ්ඩු පසුබට විය. නවලිබරල්වාදී නැඹුරුවක් ඇති එකොනොමිස්ට්, වෝල් ස්ට්‍රිට් ජර්නල් වැනි ප්‍රකාශන කියවන බොහෝ දෙනෙකුට සිංගප්පූරුවේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය හා විදේශ ආයෝජන දිරි ගන්වන ව්‍යාපාරික වාතාවරණය ගැන නිතර ම අසන්නට ලැබේ. ඒ අනුව සිංගප්පූරුවේ ආර්ථික සංවර්ධනය තනිකර ම නිදහස් වෙළඳාම සහ නිදහස් වෙළඳපොළ මත සිදු වූ දෙයක් යැයි සිතෙන්නට පුළුවන. එහෙත් සිංගප්පූරුව යනු රජය වෙනුවට මුළුමනින් ම පෞද්ගලික අංශය ආදේශ කරගත් රටක් නො වේ. උදාහරණයක් ලෙස බැලූ විට සිංගප්පූරුවේ නිවාස ප්‍රමාණයෙන් 85% ක් ම සපයන්නේ රජයට අයත් නිවාස සංවර්ධන මණ්ඩලයෙනි. ඒ අනුව බැලූ විට නවලිබරල්වාදී, මාක්ස්වාදී හෝ කේන්සියානුවාදී ආදී කිසිදු තනි ආර්ථික න්‍යායක් මඟින් නිදහස් වෙළඳපොළ සහ සමාජවාදය එකිනෙකට අනුපූරණය වෙන ලෙස ආර්ථිකයට බලපාන ආකාරය විස්තර කිරීම කළ නො හැකි දෙයකි. නයෝමි ක්ලයින්ගේ *The Shock Doctrine* කෘතියේ එන මෙවැනි තවත් උදාහරණවලින් එළිදරව්

161 Klein, Naomi (2007), The Shock Doctrine" London: Penguin Books Ltd, p.131

වන අන්දමට හුදෙක් නවලිබරල්වාදී ආර්ථික න්‍යාය මත පිහිටා දේශපාලන ප්‍රතිපත්ති සැදීම ගැන බොහෝ විට ඇති විය හැක්කේ අවිශ්වාසයකි. ට්‍රිලියන ගණනක රාජ්‍ය අරමුදල් යොදා කළ දැවැන්ත රාජ්‍ය මැදිහත් වීමක් මඟින් සමථයකට පත් කර ගැනීමට සිදු වූ 2008 -2010 ගෝලීය ආර්ථික අර්බුදයත් සමඟ ආර්ථික චින්තනයක් ලෙස නව ලිබරල්වාදයේ අසාර්ථකත්වය බොහෝ දෙනෙකුට පැහැදිලි වූ නමුත් දේශපාලන චින්තනයක් ලෙස නවලිබරල්වාදය මඟින් ප්‍රජාතන්ත්‍රවාදයට කරන ලද හානිය සුළුපටු නො වේ.

# 3. සංවර්ධනයට විකල්පයක්

# - 17 -

## විකල්ප සංවර්ධනයකට ප්‍රවේශයක්

නව දේශපාලන සුසමාදර්ශයක් පිළිබඳ අපේ කතිකාවේ වඩාත් වැදගත් මානයක් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය සහ එය විසින් අනුගමනය කරන ආර්ථික හා සමාජීය සංවර්ධන පිළිවෙත අතර තිබිය යුතු සම්බන්ධතාව කුමක් ද යන්නයි. අප අනුගමනය කළ යුතු ආර්ථික හා සමාජීය සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් සාකච්ඡාවක් ජනිත කිරීමට විවිධ මාදිලියේ නවලිබරල්වාදී ආර්ථික එළඹුම්වලට දැනටමත් කැප ව සිටින පක්ෂවලින් සමන්විත පාර්ලිමේන්තුවකට හෝ ඊට අනුරූප නියෝජිත මන්ත්‍රණ සභාවකට හැකියාවක් නැත. කොහොමටත් ආර්ථික හා සංවර්ධන ප්‍රතිපත්ති තීරණය වුණේ ධනවාදී විශේෂඥයින් විසින් ඒ ඒ අවස්ථාවල මතු වන අර්බුද සඳහා හඳුන්වා දෙනු ලබන ආධිපත්‍යවාදී දෘෂ්ටිවාද අනුවයි.

ධනවාදී ආර්ථිකය යටතේ අත්‍යන්ත දුප්පත්කම බොහෝ දුරට අඩු වී ඇති බව එක්තරා දුරකට නිවැරදිය. එහෙත් ඒ හා සමඟ ම සමාජ ස්තර අතර ආදායම් විෂමතාව විශාල වසයෙන් වැඩි වී තිබෙන බව අප අමතක නො කළ යුතු ය. 1990 සිට ගණන් බැලූ විට අත්‍යන්ත දුගී බව, එනම් දිනකට ඩොලර් 1.90 ක ට (2015 අගය අනුව රු. 275/-) අඩුවෙන් උපයන අයගේ සංඛ්‍යාව 2015 වන විට ලෝක ජනගහනයෙන් 9.6% දක්වා අඩු විය. ලෝක බැංකුව පවසන පරිදි ඊට හේතු වූ සාධක අතර සංවර්ධනය වන රටවල ශීඝ්‍ර ආර්ථික

වර්ධනය සහ අධ්‍යාපනය, සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය සඳහා යොදවන ආයෝජන වැඩි වීම ද ප්‍රමුඛ විය.[162] එහෙත් පෘථිවි සම්පත් බහුල වසයෙන් අපතේ යවන රේඛීය ආර්ථිකයක *(Linear Econom)* ශීඝ්‍ර වර්ධනය විසින් පෘථිවි පරිසරය මත පටවන ව්‍යසනකාරී පීඩනය සලකන විට අත්‍යන්ත දුප්පත්කම අවම කිරීමට රේඛීය ආර්ථික වර්ධනය හොඳ විසඳුමක් ලෙස සාධාරණීකරණය කිරීම අසීරු ය. මන්ද ඒ ආර්ථික වර්ධන එළඹුම විසින් ම සමාජ විෂමතා ද නො කඩවා වැඩි කරනු ලැබ තිබෙන බැවිණි.

මහ බැංකු වාර්තා උපුටා දක්වමින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය *(The Centre for Poverty Analysis)* පෙන්වා දෙන පරිදි ලංකාවේ සමස්ත කුටුම්බ ආදායමෙන් හරි අඩක් ම අයත් වන්නේ පොහොසත් ම 20% ට වන අතර දුප්පත් ම 20% අතර බෙදී යන්නේ සමස්ත ආදායමෙන් 5%ක් පමණි. ආදායම අනුව පතුලට ම වැටී සිටින 10% ට ලැබෙන්නේ සමස්ත කුටුම්බ ආදායමෙන් 1.6% ක කොටසක් පමණි.[163] මේ ආදායම් විෂමතාව මන්ද පෝෂණය, ණයගැති භාවය, අධ්‍යාපනික අවස්ථා ගිලිහී යෑම, නිසි සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අපහසුව, මහලු වියේ දී අසරණ බවට පත්වීමේ සිට එදිනෙදා අසන්තුෂ්ටිය, අන්‍යෝන්‍ය අවිශ්වාසය, වාර්ගික ද්වේශය සහ බලාපොරොත්තු කඩවීම දක්වා විවිධාකාර ස්වරූපවලින් නිදර්ශිත විය හැකි ය.

රටවැසියන් අතර විශාල ආදායම් විෂමතාවක් පවත්වා ගනිමින් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගිය නො හැකි ය. අධික සමාජ විෂමතාවට පිළියමක් ලෙස සමුච්චයනය වන ධනය විභජනය කරමින් හැම පුරවැසියෙකුට ම සාර්වත්‍රික මූලික ආදායමක් *(Universal Basic Income)* ලබා දීමේ අවශ්‍යතාව පිළිබඳ කලක සිට ඇතැම් රටවල දේශපාලන විචාරකයන්ගේ අවධානයට යොමු ව

162 https://www.worldbank.org/en/news/press-release/2015/10/04/world-bank-forecasts-global-poverty-to-fall-below-10-for-first-time-major-hurdles-remain-in-goal-to-end-poverty-by-2030 - Retrieved on 07 Feb 2021

163 https://www.cepa.lk/blog/the-correlation-between-poverty-and-inequality/

තිබේ. ඒ ගැන අපි විසි හයවැනි පරිච්ඡේදයේ දී සවිස්තරව සාකච්ඡා කරමු. එහෙත් ලංකාවේ දිළිඳුකම පිටු දැකීම සඳහා සැලසුම් කර ඇති සමෘද්ධි වැඩසටහන විමර්ශනය කරන විට පෙනී යන කරුණක් වන්නේ එය පවත්වා ගෙන යන්නේ හුදෙක් ම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට පරායත්ත භාවය *(dependency)* ආදේශ කොට මැතිවරණ ජය ගැනීම සඳහා බව ය.

වසර 2017 ගණන් බැලීම්වලට අනුව ලංකාවේ පවුල් හෙවත් කුටුම්බ ප්‍රමාණය මිලියන 4.9 ක් පමණ වන අතර ඉන් සමෘද්ධිලාභී පවුල් ප්‍රමාණය මිලියන 1.38 කි (1,381,242).[164] ඒ අනුව ලංකාවේ පවුල්වලින් 28% ක් පමණ සමෘද්ධිලාභී පවුල් ය. එහෙත් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2016 වාර්තාවලට අනුව දිළින්දන් ප්‍රමාණය ජනගහනයෙන් 4.1% ක ක් පමණි. ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 21.6ක් ලෙස සැලකූ විට ඒ අනුව ඒ ගණයේ දිළින්දන් 885,000 ක් පමණ සිටිය යුතු ය. ශ්‍රී ලංකාවේ කුටුම්බයකට සාමාන්‍යයෙන් පුද්ගලයන් 3.8 ක් අයත් වෙතැ'යි සැලකෙන බැවින් ඒ අනුව දිළිඳු පවුල් සංඛ්‍යාව 233,000 කට පමණ විය යුතු ය. එහෙත් එමෙන් පස් ගුණයකට වැඩි පවුල් සංඛ්‍යාවකට ආණ්ඩුව සමෘද්ධි දීමනා ලබා දෙන්නේ ඇයි? ඊට හේතුව සමෘද්ධි වැඩසටහන පවත්වා ගෙන යන්නේ ම මැතිවරණ ප්‍රතිඵලයට සැලකිය යුතු බලපෑමක් කළ හැකි දේශපාලන අනුග්‍රාහක වැඩසටහනක් වසයෙන් නිසා නො වේ ද?. සමෘද්ධි වැඩ සටහන සම්බන්ධයෙන් කර ඇති අධ්‍යයන කිහිපයකින් ම හෙළිදරව් වන කරුණු අනුව ඉහත කාරණය තහවුරු වෙයි.

සමෘද්ධිලාභීන් තෝරා ගැනීමේ දී සාධාරණ හා විනිවිද පෙනෙන තේරීම් ක්‍රමයක් අනුගමනය කර නොමැති බව ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි බෝධි ග්‍රාමය නමැති ගම අසුරෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ මහාචාර්ය ලලිතා ප්‍රනාන්දු ප්‍රමුඛ පර්යේෂණ

164 Auditor General's Report on Samurdhi Programme (2018), Auditors General Department, Colombo

කණ්ඩායම විසින් කරන ලද සමීක්ෂණයකින් තහවුරු කර තිබේ[165]. සමීක්ෂණයට ලක් වූ සමෘද්ධිලාභීන්ගෙන් බහුතරයක් කල්පනා කරන ආකාරයට ස්ථිර ආදායමක් නැති සහ ඉතාමත් අඩු ආදායම් ලැබෙන ඇතැම් අයට, ආබාධිත අයට සහ ඉතා මහලු අයට සමෘද්ධි දීමනාව නො ලැබෙන නමුත් අගහිඟ නැති පවුල්වලට සමෘද්ධි වැඩ සටහනේ ප්‍රතිලාභ හිමි වෙන බොහෝ අවස්ථා තිබේ. කැලණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන නදීකා බණ්ඩාර කළ සමීක්ෂණයකින් තහවුරු වන පරිදි ආරම්භයේ සිට ම සමෘද්ධි වැඩසටහන යනු පක්ෂ දේශපාලනයේ ග්‍රහණයට තදින් අසු වී තිබෙන්නකි. හැම ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශයකට ම එක් අයෙකු බැගින් සමෘද්ධි නිලධාරීන් පත් කොට තිබෙන්නේ ද දේශපාලන අනුග්‍රහය මත ය. සමෘද්ධි වැඩසටහන් ඉලක්ක කිරීම පිළිබඳ විවරණයක යෙදෙන නදීකා බණ්ඩාරගේ නිරීක්ෂණ අනුව සමෘද්ධිලාභීන් නිසි ලෙස ඉලක්ක කර ගැනීමට අසමත් වී ඇත්තේ සමෘද්ධි වැඩසටහන දේශපාලනීකරණය වී ඇති බැවින් සහ ඒ නිසා ම සමෘද්ධිලාභීන් මුහුණ දෙන පරායත්ත මනෝභාවය නිසා ය.[166] සමෘද්ධි ප්‍රතිලාභ හා බැඳී ඇති ඒ පරායත්තභාවය හා අවනතකම පවතින තාක් පාලක දේශපාලනඥයන්ට සමෘද්ධිලාභීන් ස්වායත්ත ප්‍රජාතන්ත්‍රවාදයෙන් පිට මං කොට අවනත කර තබා ගැනීම පහසු ය. සමෘද්ධිය යනු ඡන්ද මැෂිමකැ'යි හිටපු සමෘද්ධි ඇමතිවරයෙක් කියන්නට ඇත්තේ ඒ බව නො දැන නො වේ[167]. පවුල් මිලියන 1.3කට අයත් තීරණාත්මක ඡන්ද ප්‍රමාණයක් පාලක දේශපාලන

165 Fernando R. Lalitha S. & Gunasekara H.O.C. et.al. (2020) Samurdhi Programme as a Poverty Alleviation Strategy: An Evaluation Study Based on Sri Bodhi Gramma Village in Gampaha District in Sri Lanka, Nurul Momen et.al (eds)Building Sustainable Communities: Civil Society Response in South Asia, Palgrave Macmillan, London, p.63

166 Bandara, N. D. M. (2016). Causes and Consequences of Poverty Targeting Failures: The Case of the Samurdhi Program in Sri Lanka. *Asian Politics & Policy*, 8(2), 281–303. Policy Studies Organization. Published by Wiley Periodicals, Inc.

167 දිසානායක, ධම්ම (2019) ලංකාදීප පුවත්පත 2019 ජුනි 28 එම කථාව ගැන කළ සඳහන.

පක්ෂයේ අත් අඩංගුවේ තබා ගැනීමට ඉඩ දෙමින් නැති නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන අප උද්දාම විය යුත්තේ ඇයි?

විෂමතා අධ්‍යනය පිළිබඳ ප්‍රාමාණිකයෙකු වසයෙන් නමක් දිනා ඇති ආර්ථික විද්‍යාඥ තෝමස් පිකෙටි සිය *Capital and Ideology* නමැති කෘතියෙන් පෙන්වා දෙන අන්දමට මිනිස් සමාජයේ ඉතිහාසය යනු යුක්තිය අත්පත් කර ගැනීමේ පිපාසය පිළිබඳ ඉතිහාසයකි[168]. ඒ තුළ ආගමික ඇදහිලිවල සිට ආර්ථික න්‍යාය දක්වා බොහෝ ක්ෂේත්‍රවල විෂමතාව සාධාරණීකරණය සඳහා ගොඩ නැගූ විවිධ මතවාද දැක ගත හැකි ය. කලක් පින් පව්, ඉරණම, දේව කැමැත්ත වැනි සංකල්ප මඟින් සාධාරණීකරණය කළ විෂමතාවල පැවැත්ම නූතන යුගයේ සාධාරණීකරණය කිරීමට තැත් කරන්නේ ව්‍යවසායකත්වය *(entrepreneurship)*, කුසලතා වාදය *(meritocracy)* වැනි සංකල්පවලිනි. ඒ නිසා විෂමතා අවම කරමින් යුක්තිය අත්පත් කර ගත හැකි මග එළිපෙහෙළි කර ගත හැකි වන්නේ මෙකී මතවාද මෙන් ම ඒවායින් නො කිය වෙන දේවල් පිළිබඳ ඓතිහාසික හා පුද්ගලික අත්දැකීම් සංසන්දනය කිරීමෙන් සහ ඒවා හැකි තරම් පුළුල් ලෙස සවිචාරී සාකච්ඡාවකට ලක් කිරීමෙනි.

ගෝලීය උණුසුම වැඩි වීම මෙන් ම සමාජ විෂමතාව වැඩි වීම ද අද ලෝකය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයකි. විසි වන සියවසේ දී සැලකිය යුතු ලෙස අඩු වූ ආදායම් පරතරය 1980න් පසු නවලිබරල්වාදී බලපෑමත් සමඟ ලොව පුරා ම වැඩි වෙමින් පැවතීම ප්‍රගතිය පිළිබඳ අපේ අභිමතාර්ථවලට එල්ල වී ඇති දැඩි අභියෝගයකි. සමාජ විෂමතාව පිළිබඳ අභියෝගය දේශගුණ විපර්යාසයට මුහුණ දීමේ අභියෝගයට ද සෘජු ලෙස සම්බන්ධය. මිනිසුන්ගේ ජීවන රටාව වෙනස් කිරීමකින් තොර ව ගෝලීය උණුසුම ඉහළ යෑම නතර කිරීම හෝ පාලනය කිරීම කළ නො හැකි බව ඉතා පැහැදිලි ය. එවැනි චර්යා වෙනසක අවශ්‍යතාව බහුතරය විසින් පිළිගැනීමට නම් වෙනස

168 Piketty, Thomas (2020) Capital and Ideology, Cambridge NY: The Belknap Press of Harvard University Press, KE p 1452

සඳහා ඉටු කළ යුතු කටයුතුවල වගකීම ගෝලීය උණුසුමට තුඩු දුන් සාධක බිහි කිරීමට දුන් දායකත්වයට සමානුපාතික ලෙස අප අතර බෙදා හදා ගැනීමට හැකි විය යුතු ය. එම අනුපාතය තීරණය කිරීමේ දී සැලකිය යුතු වඩාත් ම වැදගත් කාරණය වන්නේ දේශගුණ විපර්යාසයේ කුරිරු බලපෑමට වැඩියෙන් ම ලක් වන්නේ දුප්පතුන් වන නමුත් ගෝලීය උණුසුම ඉහළ යෑමට තුඩු දුන් හරිතාගාර වායු නිපදවීමට වැඩි වසයෙන් වගකිවයුත්තේ පොහොසතුන් වීමයි.

එබැවින් ප්‍රමාණවත් මහජන සහභාගිත්වයක් සහිත විවෘත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ගැන කල්පනා කිරීමේ දී ඒ මඟින් ඉහත කී විෂමතා අවම කළ හැකි උචිත සංවර්ධන දිශානතියක් තෝරා ගැනීමේ සංවිචාරණීය කතිකාව ඵලදායක ව පවත්වා ගෙන යෑමේ හැකියාව එම ආණ්ඩුක්‍රමයට ඇත් දැයි සොයා බැලීම ද ප්‍රජාතන්ත්‍රවාදය විවෘත කර ගැනීමේ කාර්යයේ ම කොටසක් වසයෙන් සැලකිය යුතු ය. ඒ සඳහා මෙතෙක් කලක් ආර්ථික සංවර්ධනය ප්‍රමුඛ සංවර්ධනය පිළිබඳ මතවාද උද්ගත වූ අන්දම ගැන විමසා බැලීම ද වැදගත් ය. ඒ ගැන අපි දාහත්වැනි පරිච්ඡේදයේ සිට සවිස්තරව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු. එහෙත් ආරම්භයේ ම සංවර්ධනය නමැති අදහස සම්බන්ධයෙන් එසේ විචාරශීලී වීමේ අවශ්‍යතාව වඩාත් නිරවුල් කර ගැනීම වැදගත් ය. ඒ සඳහා සංවර්ධනය නමැති සංකල්පය ගැන නූතන ජර්මන් සමාජ විද්‍යාඥයෙක් වන වොල්ෆ්ගැන්ග් සාච් මෑත දී කර ඇති විවරණය මෙහි දී තරමක් සවිස්තරව විමසීම වැදගත් වේයැ'යි මම සිතමි.

දෙවැනි මහා ලෝක සංග්‍රාමයෙන් පසු හානියට පත් යුරෝපීය රටවල් නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපදය මාෂල් වැඩ සටහන දියත් කළේ ය. එක්තරා ආකාරයකට එය සංවර්ධනය පිළිබඳ වැඩසටහනකි. එහෙත් දකුණේ රටවල්වලට අදාළ වන සංවර්ධනය පිළිබඳ අදහස හුදෙක් ම 1949 දී එවකට ඇමෙරිකානු ජනාධිපති වසයෙන් කටයුතු කළ හැරී එස් ට්රූමන් ඇමෙරිකානු කොන්ග්‍රස් සභාව අමතා කළ කතාවකින් නිෂ්පන්න

වූවකි. ලෝක ජනගහනයෙන් හරි අඩකට ජීවත් වීමට සිදුවී ඇත්තේ 'ඌණ සංවර්ධිත' ප්‍රදේශවල බව ට්රූමන් එම කතාවේ දී අවධාරණය කළේ ය. ඌණ සංවර්ධනය පිළිබඳ එම කතාවත් සමඟ යටත් විජිත යුගයෙන් අනතුරුව බිහි වූ වසර 40 ක පමණ කාල පරිච්ඡේදය 'දියුණු වෙමින් පවතින' දකුණේ රටවල 'සංවර්ධන යුගය' යනුවෙන් හැඳින්විණි. යුරෝපයේ මාෂල් වැඩ සටහනට වෙනස් ව එහි තිබූ විශේෂත්වය වූයේ එතැන් සිට 'සංවර්ධනය' යන්න 'සංවර්ධනය වන' *(developing countries)* රටවලට මිස 'සංවර්ධිත' රටවලට *(developed countries)* අදාළ වන කටයුත්තක් වසයෙන් නො සැලැකීම යි.

මෙසේ උද්ගත වූ සංවර්ධනය නමැති සංකල්පය සතර ආකාරයක ලක්ෂණවලින් යුක්ත වූ  බව වුල්ෆ්ගැන්ග් සාච් පෙන්වා දෙයි[169]. කාලානුක්‍රමික දේශපාලනය අනුව බැලුවොත් පළමුවෙන් ම හැම දියුණු වන ජාතියක් ම ඒ අනුව තමන් දියුණු වීමට උත්සාහ කරන්නේ එක ම දිශානතියකට අනුව බව විශ්වාස කළ යුතු වූ බව ඔහු පෙන්වා දෙයි. ඒ නිසා ඒක රේඛීය දිශානතියක් සහිත සංවර්ධන මාවත ඔස්සේ ජාතියකට ප්‍රගතිය කරා ඉදිරියට යා හැකි ය යන විශ්වාසය අනුව සංවර්ධනය වන රටවල් කටයුතු කළ යුතු විය. එසේ නැති නම් විය හැකි එක ම දෙය ආපසු රූටා වැටීමෙන් පරිහානියට පත් වීමයි.

දෙවැනි ව, ඒ සංවර්ධන මාර්ගයේ දැනට මත් බොහෝ දුර ගොස් ඇති නායකයන් වසයෙන් භූ දේශපාලනයට අනුව සැලකෙන දියුණු සංවර්ධිත ජාතීන් විසින් නො දියුණු ජාතීන්ට යා යුතු මග පෙන්වනු ලැබිය යුතු ය. ඒ අනුව ලෝකයේ රටවල් පොහොසත් හා දුප්පත් වසයෙන් සරල ලෙස වර්ග කෙරිණි. ඇතැම් ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සංවර්ධන ව්‍යාපෘති සඳහා පොහොසත් රටවලින් යම් පමණකට ආධාර සැපයුණේ ද ඒ අනුව යි.

---

169 Wolfgang Sachs, eds. (2019), The Development Dictionary: A Guide to Knowledge as Power, London : Zed Books Ltd, , pp 3-4

තෙවැනි ව, සමාජීය හා දේශපාලනික වසයෙන් රටක සංවර්ධනය මනිනු ලැබිය යුත්තේ දළ දේශීය නිෂ්පාදිතයේ *(Gross Domestic Product)* වර්ධනයෙන් නිරූපණය කරනු ලබන සමස්ත ආර්ථිකයේ කාර්ය ඵලයට අනුව ය. එබැවින් කලක් තිස්සේ යටත් විජිත වසයෙන් පැවත නිදහස් වූ රටවල් වහාම තම අනාගතය ආර්ථිකයේ අත්අඩංගුවට පත් කළ යුතු විය.

සිව්වැනි ව, ජාතියක් සංවර්ධනය කරා තල්ලු කරනු ලබන්නේ මූලික වසයෙන් ම රජයේ විශේෂඥයින්, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා කලාපීය සංවර්ධන බැංකු සහ පාරජාතික *(transnational)* සමාගම් සහ ඔවුන්ගේ ජාතික නියෝජිතයන් විසින් බව පිළිගනු ලැබිය යුතු විය.

1980 ගණන්වල නව ලිබරල්වාදයේ ජයග්‍රාහී ආගමනයත්, බර්ලින් තාප්පය කඩා වැටීමෙන් පිළිබිඹු කළ සීතල යුද්ධයේ අවසානයත් සමඟ ගෝලීයකරණය විසින් ජාතික රාජ්‍ය නිර්දය ව බාහිර ලෝකයට නිරාවරණය කරනු ලැබීය. ඒ අනුව මුදල්, තොරතුරු, මාධ්‍ය ගත ප්‍රතිරූප, දෘෂ්ටිමය මතවාද සහ සංක්‍රමිකයන් ආදී වසයෙන් දේශ සීමා ඉක්මවා සංචරණය වූ හා සංනිවේදනය වූ නොයෙකුත් ස්පෘශ්‍ය *(tangible)* සහ අස්පෘශ්‍ය *(intangible)* දේවල් නිසා ආර්ථික වසයෙන් මෙන් ම සංස්කෘතික වසයෙන් ද පාරජාතික වූ සමාජ අවකාශයක් *(transnational social space)* හැම රටක ම පාහේ බිහි විය. නව තාක්ෂණික දියුණුවත් සමඟ මේ සමාජ අවකාශය තුළ ජාතික රාජ්‍යයේ දේශ සීමා හා දුරස්ථ බව නො තකා තථ්‍යකාලික *(real-time)* සංනිවේදන කටයුතු සහ නොයෙකුත් අන්තර්ක්‍රියාකාරිකම් ඇති කර ගැනීමට හැකි විය. ඒ නිසා මේ ක්‍රියාවලිය තුළ අනෙකුත් කාරකයන් අනුක්‍රමයෙන් ජාතික රාජ්‍ය අබිබවමින් සංවර්ධනයේ වැදගත් භූමිකා ඉටු කරන්නන් බවට පත් විය. උදාහරණයක් වසයෙන් දකුණේ රටවලට යෙදවුණ පුද්ගලික විදේශීය ආයෝජන අරමුදල් එතෙක් එම රටවලට ලැබුණු නිල සංවර්ධන අධාර ප්‍රමාණය ඉක්මවා ගියේ ය. රූපවාහිනී වැඩ සටහන් දියුණු රටවල ජීවන රටාව ලෝකය

පුරා අනුකරණය කළ යුතු ප්‍රමිතිය බවට පත් කළේ ය. ගෝලීය පරිභෝජනය විසින් දේශීය සුලු කර්මාන්ත විනැන් කරන ලදී. ඒ අනුව එතෙක් භෞමික ජාතික රාජ්‍යයේ ස්වෛරී කටයුත්තක් ව පැවති සංවර්ධනය ගෝලීයකරණය හා නිදහස් වෙළඳපොළ හමුවේ මුළුමනින් ම පාහේ අභෞමික පාරජාතික කටයුත්තක් බවට පත් විය.

ඒ හැර සීතල යුද්ධයේ සහ එතෙක් පැවති නියාමන යුගයේ නිමාවත් සමඟ පාරජාතික සමාගම් ඔවුන්ගේ දේශීය නියෝජිතයන් සමඟ එක් ව ලෝකය පුරා සිය ආධිපත්‍ය පැතිර වීම ආරම්භ කළේ ය. ඒ සමඟ ගෝලීයකරණය විසින් ධනවාදී ආර්ථික සංවර්ධනය එහි ඉෂ්ටාර්ථය වන ධන සමුච්චයනය කරා මෙහෙයවනු ලැබීය. සීතල යුද්ධ සමයේ පැවති විභේදන නැති ව ගොස් කෝපරේට් සමාගම් නිදහසේ දේශ සීමා අභිභවනය කරමින් ලාභදායක රටවල්වලට තම කම්හල් විතැන් කළෝ ය. දේශපාලනඥයන් ද ජනතාව ද බටහිර ක්‍රමයේ පරිභෝජන සමාජයක් ඇති කිරීම පිණිස යුහුසුලු ව උත්සුක වූහ. ඒ අනුව ආර්ථිකය යනු පවතින අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ මාර්ගයකට වඩා නව අවශ්‍යතා නිර්මාණය කිරීමේ මාර්ගයක් වශයෙන් සැලකුණි. සාච් පෙන්වා දෙන පරිදි එවැනි ආර්ථිකයක වැදගත් කොට සැලකෙන්නේ භාණ්ඩ සහ සේවාවල සංකේතාත්මක අගයයි. භාණ්ඩවලින් කෙරෙන කාර්යයට වඩා භාණ්ඩ මඟින් සංනිවේදනය වෙන දෑ එහි දී වැදගත් විය. හැම මහාද්වීපයක ම පාහේ ජීවන රටාව ඒ අනුව එක සමාන විය යුතු විය.

මෙසේ වෙළඳපොළ ගෝලීයකරණය වීම හරියට ජාතික රාජ්‍යයකින් තොර ව සංවර්ධනය සිදුවීමක් බඳු විය. මෙයින් වඩාත් ම එල ප්‍රයෝජන ලබා ගත්තේ ගෝලීය මධ්‍යම පංතියයි. යටත් විජිත යුගයේ සිට පැවති දේශීය මධ්‍යම පංතිය මෙන් නො ව ඇමෙරිකාවේ ද, යුරෝපයේ ද, ආසියාවේ ද, අප්‍රිකාවේ ද ලතින් ඇමෙරිකාවේදැ'යි නො තකා හැම මහාද්වීපයක ම වෙසෙන නූතන ගෝලීය මධ්‍යම පංතියට තිබෙන්නේ එක සමාන අභිලාෂයෝ ය. ඔවුන් සාප්පු යන්නේ එක ම ආකාරයකට සකස් වූ සාප්පු සංකීර්ණවල ය; අඳින්නේ එක ම

සන්නාම ඇති නිමි ඇඳුම් ය; භාවිත කරන්නේ එක ම ආකාරයක ඉලෙක්ට්‍රොනික උපකරණ ය; මිල දී ගන්නේ ද එක ම ආරක වාහන ය; නරඹන්නේ ද එක ම ආකාරයක චිත්‍රපට සහ රූපවාහිනී මාලා නාටක ය; අන් මධ්‍යම පංතිකයන් මෙන් ම විදේශ සංචාරවල යෙදෙන ඔවුහු ලොව සියල්ලන් ම එක මට්ටමට තබා සලකන තීරණාත්මක මාධ්‍ය වන මිල මුදල් නිර්ලෝභී ව වියදම් කළහ.

දළ වසයෙන් බැලුවොත් 2010 වන විටත් ගෝලීය මධ්‍යම පංතියෙන් හරි අඩක් සංවර්ධිත යැ'යි සැලකුණු උතුරු රටවලත්, ඉතිරි අඩ තවමත් සංවර්ධනය වෙමින් පවතින්නේ යැ'යි සැලකෙන දකුණේ රටවලත් විසූහ. 1990 දී ගෝලීය මධ්‍යම පංතියෙන් 26% ක් දකුණු රටවල ජීවත් වූ නමුත් 2010 වන විට එම ප්‍රතිශතය 58% දක්වා ඉහළ ගියේ ය.[170] හමේ පාට වෙනස් වුණත් හැසිරීම් සහ ජීවන විලාසිතා අතින් ඔවුහු එක සමාන වූහ. අනුමානයකින් තොර ව ගෝලීය මධ්‍යම පංතියේ මේ ලෝක ව්‍යාප්තිය සංවර්ධනයේ විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ව තිබුණි. එහෙත් සාච් පෙන්වා දෙන පරිදි එය තීරණාත්මක ලෙස අසමර්ථ වීමට නියමිත වූ සංසිද්ධියකි.

අද්‍යතන ලෝකය මුහුණ දෙන විවිධාකාර සංකූලතා ගැන සැලකූ විට සමාජීය ගැටලු "සංවර්ධන ගැටලු" ලෙස රාමු ගත කිරීමට තැත් කිරීම අරුමයකට මෙන් දැන් යල්පැන ගොස් තිබෙන බව තේරුම් ගත යුතු ව තිබේ. වුල්ෆ්ගැන්ග් සාච් පෙන්වා දෙන පරිදි දැනට ඇතිවෙමින් තිබෙන පරිවර්තනය ගැන කියවෙන ආඛ්‍යාන වර්ග තුනක් පැහැදිලිව හඳුනා ගත හැකි ය.[171] ඔහු ඒ තෙවර්ගය හඳුන්වන්නේ බළකොටු ආඛ්‍යාන *(narratives of fortress)*, ගෝලීයවාදී *(globalism)* ආඛ්‍යාන සහ සහයෝගිතාවාදී *(solidarity)* ආඛ්‍යාන යනුවෙනි.

නව ජාතිකවාදීන්ගේ චින්තනය වන 'බළකොටු' ආඛ්‍යානවල පදනම වන්නේ මනඃකල්පිත ජනතාවකගේ විභූති මත් අතීතයක්

170 UNDP Human Development Report, 2013, p. 14

171 Sachs, Wolfgang, eds. (2019), *The Development Dictionary: A Guide to Knowledge as Power,* London: Zed Books Ltd, , pp. 5-7

ආරෝපණය කර ගැනීම යි. එය පසුබිම් කොට අධිකාරවාදී පාලකයන් විසින් යටගිය අභිමානය යළි ස්ථාපනය කරනු ඇතැ'යි බලාපොරොත්තු වන අතර මුස්ලිම්වරුන් ගේ සිට එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වා වූ දේවල් සම්බන්ධයෙන් පරජන භීතිකාව හැකි තරම් ව්‍යාප්ත කරයි. බොහෝ විට ආගමික අන්තවාදය මත යැපෙමින් සංක්‍රමණිකයන් හා විදේශිකයන්ට එරෙහිව වෛරය පැතිරීම ද බළකොටු වාදයේ තවත් එක් ක්‍රමෝපායකි. බළකොටු ආඛ්‍යානය ප්‍රවර්ධනය කරන ට්‍රම්ප් වර්ගයේ නව ජාතිකවාදීන්ගේ "මුලින් ම ඇමෙරිකාව!" *(America First)* වැනි ප්‍රකාශවලින් සෞභාග්‍යලෝලී දේශානුරාගයක් නිරූපණය වේ. එය විශේෂයෙන්ම දක්නට ලැබෙන්නේ සිය ද්‍රව්‍යයමය වත් පොහොසත්කම් දුප්පතුන්ගෙන් ආරක්ෂා කර ගත යුතුයැ'යි සිතන මධ්‍යම පංතිකයන් අතරයි.

මෙයට වෙනස් ව 'ගෝලීයවාදී ආඛ්‍යානය' *(globalism)* ගොඩ නැගෙන්නේ පෘථිවි ගෝලයේ ප්‍රතිරූපය එහි පුරාකෘතික *(archetypal)* සංකේතය ලෙස යොදා ගනිමිනි. බළකොටුවාදීන් මෙන් "මුලින් ම ඇමෙරිකාව"යන ආරක්ෂණවාදී වාණිජකරණය ප්‍රවර්ධනය කරනු වෙනුවට ගෝලීයවාදීන් විසින් ප්‍රවර්ධනය කරනු ලබන්නේ නියාමන විධිවිධානවලින් නිර්බාධිත වූ මුළුමනින් ම නිදහස් ගෝලීය වෙළඳපොළකි. එමගින් සමාගම්වලට මෙන් ම පාරිභෝගිකයන්ට ධනයත් යහපතත් ගෙන එනු ඇතැ'යි ඔවුහු අදහස් කරති. ඔවුන්ගේ තවත් ලක්ෂණයක් වන්නේ නවලිබරල්වාදී දේශපාලනය හා සසඳන විට ඊට වඩා බහුපාර්ශ්වීය ආණ්ඩුකරණය සඳහා වැඩි ඉඩක් ලබා දීමට ඇති කැමැත්තයි. මේ ගෝලීය ප්‍රභූ පෙළැන්තිය ද අනාගතය සම්බන්ධයෙන් බියක් දක්වන නමුදු ඒ සම්බන්ධයෙන් උද්ගත වන ගැටලු අන්තර්ග්‍රහනීය *(inclusive)* සහ හරිත වර්ධනයෙන් *(green growth)* මෙන් ම සුහුරු තාක්ෂණයෙන් *(smart technologies)* විසඳා ගත හැකියැ'යි විශ්වාස කරති. කිසියම් දුරකට මේ ගෝලීයවාදී චින්තනය තිරසාර සංවර්ධන අරමුණුවලින් නිරූපණය වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය සමඟ ද අනුගත වෙයි.

වුල්ෆ්ගැන්ග් සාච් පෙන්වා දෙන තෙවැනි ක්‍රමෝපාය වන 'සහයෝගිතාව' *(solidarity)* පිළිබඳ ආඛ්‍යානය මේ දෙකට ම වඩා බෙහෙවින් වෙනස් ය. එමඟින් ප්‍රවර්ධනය කරන සමාජීය හා පාරිසරික ආචාර ධර්ම ඉහත කී බළකොටු ආඛ්‍යානයට මෙන් ම ගෝලීයවාදී නිර්බාධිත වෙළඳපොළ චින්තනයට ද ප්‍රතිපක්ෂව පෙනී සිටී. අන් සියල්ලට ම ඉහළින් සාමූහික සහ පෞද්ගලික මිනිස් අයිතිවාසිකම් සුරැකීම කළ යුතු බව සහයෝගිතාවාදීහු අදහස් කරති. පරිසර විද්‍යාත්මක මූලධර්ම බෙහෙවින් අගය කරන අතර ඔවුන් වෙළඳපොළ බලවේග දකින්නේ අවසාන ඵලය කුමක් දැයි තීරණය කරන්නන් ලෙස නො ව අභිමත සමාජ හා පරිසර යුක්තිය සාක්ෂාත් කර දීමට දායකවීම වගකීමක් ලෙස සලකන කොටස්කරුවන් ලෙස ය. සහයෝගිතාවාදීන් වැඩි කැමැත්තක් දක්වන්නේ දේශීය මෙන් ම ගෝලීය මට්ටමෙන් ද සිදු වන තාක්ෂණික වූ වෙනසකට වඩා සමූපකාරී ආර්ථික පිළිවෙත් සහ මහජන සුභසාධනය මුල් කරගත් සමාජ සංස්කෘතික වෙනසක් ඇති කිරීමට ය. ගෝලීයවාදී ආඛ්‍යානයට වෙනස් ව පාරිසරික සදාචාරය ඇති කිරීම පිණිස සහයෝගිතාවාදීන් කේන්ද්‍රීය කර ගන්නේ ජාතික රාජ්‍යය ව්‍යුහයට පහළින් බිම් මට්ටමේ වෙසෙන ක්‍රියාකාරීන් සහ සමාජ සංවිධාන හා වෘත්තීය සමිති ආදියෙන් සමන්විත පාරජාතික සිවිල් සමාජයයි *(transnational civil society)*. ඒ නිසා එය දේශ සීමා ඉක්මවා යන කලාපීය හා ගෝලීය බහුජන ව්‍යාපාර පදනම් කරගත්තකි. 'ගෝලීය ව හිතන්න, දේශීය ව කටයුතු කරන්න' යන ප්‍රකට සටන් පාඨයෙන් නිරූපණය වන අන්දමට සහයෝගිතාවාදීන් බිම් මට්ටමේ අර්ථකථන සමඟ ග්‍රාමීය හා ප්‍රාදේශීය දේශපාලනයේ නියැළීම මඟින් ද වඩා පුළුල් අවශ්‍යතා සඳහා බහුජන සහයෝගය ලබා ගැනීම ගැන උත්සුක වෙති.

මේ ක්‍රමෝපායේ අරමුණ වන්නේ ධනවාදී කාර්මික ශිෂ්ටාචාරය විසින් ඉල්ලා සිටි ආත්මාර්ථකාමී සුඛල්ලිකානුයෝගී ජීවන රටාව අත්හරිමින් සහයෝගයෙන් සමෘද්ධිය සකසුරුවම් කරන තෘප්තිමත් යුක්තිගරුක ජීවන රටාවක් සාමූහික ව ගොඩනගා ගැනීමේ

අවශ්‍යතාව සඳහා ජනමතය ඒකරාශි කිරීම යි. ඉන් අදහස් වන්නේ අප නැවත බර කරත්ත යුගය කරා යා යුතු බව නො ව සමස්ත මානව සමාජය මෙන් ම එහි පැවැත්ම පිළිබඳ තීරණාත්මක සාධකය වන පෘථිවි පරිසරය, යුක්තිය හා පොදු යහපත මුල් කොට ගෙන පවත්වා ගැනීමට මෙතෙක් අත්පත් කර ගෙන ඇති හා අත්පත් කර ගත හැකි දැනුම හා තාක්ෂණය උපයෝගී කර ගැනීම යි. සැමට යුක්තිය අත්පත් කර ගැනීමේ දේශපාලනය මුඛ්‍ය කාරණාව බවට පත් විය යුත්තේ එබැවිනි.

ඒ නිසා සමස්තයක් වසයෙන් ගත්තොත් වර්තමාන දේශපාලනයේ මූලික දිශානතිය වෙනස් කිරීම පිණිස හුරුපුරුදු සාම්ප්‍රදායික දේශපාලනය පසෙක තැබිය යුතු ව ඇත. මෙය තරමක් අසීරු ආරවුලක් විය හැකි නමුත් කරන්නන් වාලේ හුදෙක් බලය අත්පත් කර ගැනීමේ සිල්ලර දේශපාලනයට දායක වෙමින් කාලය නාස්ති කිරීමට අපට තවදුරටත් නො හැකි ය. ලොව පුරා බොහෝ රටවල දැනුවත් විද්‍යාර්ථීන් විසින් දැනට මත් ශාස්ත්‍රාලයීය මට්ටමෙන්[172] තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ පුළුල් විමර්ශනශීලී කතිකාවක් ආරම්භ කර තිබේ. යුක්තිය සාක්ෂාත් කර ගැනීම ප්‍රථම වරට සංවර්ධන අරමුණක් ලෙස තිරසාර සංවර්ධන කතිකාව හරහා ඉස්මතු වෙමින් තිබේ. සංවෘත නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ සීමා අතික්‍රමණය කළ හැකි වඩා විවෘත ප්‍රජාතන්ත්‍රවාදයක් දිනා ගැනීම එම කතිකාවේ ම කොටසක් බවට පත් කරමින් තිරසාර සංවර්ධන අරමුණු පිවිසුමක් ලෙස භාවිත කරමින් නව දේශපාලන සුසමාදර්ශයක් ගොඩනැගීමට අවශ්‍ය සාධක අපට සාකච්ඡා කළ හැකි ය.

.

172 *Google Scholar* යටතේ 2020 වර්ෂය සඳහා පමණක් තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධ ලියැවුණු ලේඛන හා පත්‍රිකා ප්‍රමාණය 17,200ක් වශයෙන් දැක්වේ.

# - 18 -

## සංවර්ධන කතිකාවේ නව දිශානතිය

සංවර්ධනය යනු සැහෙන කලක් තිස්සේ එක්තරා ආකාරයක ධනාත්මක තේරුමක් ගෙන දුන් එහෙත් බොහෝ විට හිස් වචනයක් ලෙස පැවතුණු දෙයකි. කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සිට රාජ්‍ය නො වන සංවිධාන දක්වා වූ විශාල පරාසයක ජාල ගත වීම් තුළ සංවර්ධනය යන්න පිළිබඳ ව පොදු ජාත්‍යන්තර පර්යාලෝකයක් ඇති කර ගෙන තිබුණි. ඒ අනුව 1986 දී පැවති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිපූර්ණ මහා මණ්ඩල සැසියක දී සම්මත වූ "සංවර්ධනය සඳහා ඇති අයිතිය" යන්න මේ සංවර්ධන කතිකාව තුළ නිරන්තරයෙන් ම යෙදුණු වහරක් විය.

වුල්ෆ්ගැන්ග් සාච් පෙන්වා දෙන අන්දමට අද වන විට 'සංවර්ධනය' යන සංකල්පය සැලකිය යුතු පරිවර්තනයකට භාජනය වී තිබේ. උදාහරණයක් ලෙස 2015 වන විට පරණ වී ගොස් තිබූ සංවර්ධනය පිළිබඳ කතිකාව වෙනුවට ඊට වඩා බෙහෙවින් පොහොසත් සහ ඖචිත්‍ය කතිකාවක් ඇරඹීමට නියමිත බව එම වසරේ සැප්තැම්බරයේ එළිදැක්වූ එක්සත් ජාතීන්ගේ 'තිරසාර සංවර්ධන අරමුණු' *(Sustainable Development Goals)* දාහතෙන් සහ දෙසැම්බරයේ සම්මත කළ දේශගුණ විපර්යාසය පිළිබඳ පැරිස් සම්මුතියෙන් පැහැදිලි විය. තිරසාර සංවර්ධන අරමුණු මඟින් පළමු වරට 'යුක්තිය' සහ මානව වර්ගයාගේ පැවැත්ම සංවර්ධන කතිකාව

තුළ මුඛ්‍ය කාරණා ලෙස මතු කර තිබුණි. (තිරසාර සංවර්ධන අරමුණු වටා යුක්තිය දිනා ගැනීම සඳහා දේශපාලනික ව මැදිහත් වීම ගැන වඩාත් විස්තරාත්මක සාකච්ඡාවක් දාහත් සහ දහඅටවැනි පරිච්ඡේදවල අඩංගු වේ.) වුල්ෆ්ගැන්ග් සාච් පැහැදිලි කරන අන්දමට තිරසාර සංවර්ධනය හා දේශගුණ විපර්යාසය පිළිබඳ මේ අන්තර්ජාතික ප්‍රකාශන දෙක ම තවදුරටත් නියෝජනය කරන්නේ අර සාම්ප්‍රදායික සංවර්ධන කතිකාව නො ව අලුතින් ගොඩ නැගෙමින් ඇති පශ්චාත් සංවර්ධන චින්තනය යි.

කලක් තිස්සේ පැවති සංවර්ධනය නමැති සාම්ප්‍රදායික අදහස දැන් අවලංගු වී ඇති බව එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය හෙවත් 'තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ වැඩපිළිවෙළ' දෙස විමසිල්ලෙන් බැලූ විට පෙනී යයි. එයට අනුව සංවර්ධනය යන්න තවදුරටත් ප්‍රගතිය පිළිබඳ පොරොන්දුවක් නො වේ. බොහෝ කලක් තිස්සේ අලුත බිහි වූ රටවල අභිප්‍රාය වූයේ සංවර්ධන මාර්ගය ඔස්සේ ඒකාකාරී ව ප්‍රගතිය කරා ගමන් කිරීම යි. ඒ අනුව සිය අගහිඟකම් අඩු කර ගනිමින් අවසානයේ දී දියුණු කාර්මික ශිෂ්ටාචාරයක ඵල නෙළා ගැනීමට සියලු සමාජවලට හැකි වෙතැ 'යි යන ප්‍රගතිය පිළිබඳ දැවැන්ත ඓතිහාසික පොරොන්දුවක් සංවර්ධනය පිළිබඳ පරණ කතිකාව තුළ ගැබ් ව තිබුණි.

දැන් ඒ යුගය අහවර වී තිබේ. ඒ අනුව සංවර්ධනය යනු තවදුරටත් ප්‍රගතිය පිළිබඳ සංකල්පයක් නො ව අනතුරට ලක් ව ඇති අපේ සාමූහික පැවැත්ම හෙවත් මිනිස් වර්ගයාගේ ප්‍රවර්තනය *(survival)* රැක ගැනීමේ උත්සාහයක් බවට පත් වී තිබේ. තිරසාර සංවර්ධන අරමුණු සැලසුම් කර ඇත්තේ අඩු වැඩි නැති ව මානව අයිතිවාසිකම් සහ ජීවත් වීමට අවශ්‍ය පාරිසරික තත්ව සහතික කිරීමේ ප්‍රයත්නයක් ලෙස ය. දියුණු වීම, ප්‍රගතිය පිළිබඳ එකල පැවති උත්කර්ෂවත් විශ්වාසය වෙනුවට දැන් අපට කතා කරන්නට සහ කටයුතු කරන්නට සිදුවී ඇත්තේ බලවත් ව්‍යසනයකින් තොර ව අපේ සාමූහික පැවැත්ම රැක ගන්නේ කෙසේ ද යන මූලික ප්‍රශ්නය ගැන ය.

පසුගිය කාලය තුළ දරිද්‍රතාව පිටු දැකීමේ දේශපාලනය ඇතැම් තැන්වල සාර්ථක වී ඇති බව සැබෑවක් නමුත් ඒ සඳහා ගෙවන්නට සිදු වූ වන්දියට වෙනත් තැන්වල අසමානතා උග්‍ර කිරීමේ සිට යළි පිළිසකර කළ නො හැකි තරමට පරිසරයට හානි සිදු කිරීම ද අයිති වූ බව අප අමතක කළ යුතු නො වේ. 2018 ලෝක අසමානතා වාර්තාවට අනුව උතුරු ඇමෙරිකාවේ, චීනයේ සහ ඉන්දියාවේ ද පොහොසත් ම 1% විසින් අත්පත් කර ගෙන ඇති ජාතික ආදායමේ ප්‍රතිශතය ඉතා වේගයෙන් වැඩි වෙමින් පවතී.[173] ඊට වඩා තරමක් අඩු වේගයකින් සිදු වුව ද ආදායම් විෂමතාව වැඩි වීමේ එම ප්‍රවණතාව යුරෝපයේ ද වෙනත් රටවල ද බහුලව දක්නට ලැබේ. බලය, වත්කම් සහ සම්පත් අකාර්යක්ෂම ලෙස යොදා ගැනීම අතර අනවරත සම්බන්ධතාවක් ඇති බව ඇතැම් විචාරකයෝ පෙන්වා දෙති. වත්කම් අසමානතාව, බලය හා ආයතනවල කාර්යක්ෂමතාව අතර ද එවැනි ම අනර්ථකාරී සහසම්බන්ධයක් තිබේ.[174]

ඒ අතර මේ අසමානතාව උග්‍ර කරන සම්පත් සපයා දීම පිණිස දිගින් දිගට ම පෘථිවි ග්‍රහලෝකය ඉවක් බවක් නැති ව උපයෝගී කර ගැනීම එහි අන්තයට ම ගෙන ගොස් තිබේ. ගෝලීය පාරිසරික පා සටහන පිළිබඳ කරන ලද ගණනය කිරීම්වලින් අනාවරණය කර ඇති පරිදි මනුෂ්‍ය වර්ගයා විසින් වාර්ෂික ව පෘථිවි ජීවි ගෝලය මෙන් 1.7 ගුණයක වපසරියක් පරිභෝජනයට ගැනීමෙන් ම ඒ බව පෙනී යයි. රටක් සිය කර්මාන්ත සඳහා උද්ධරණය *(extract)* කොට යොදා ගන්නා ජෛව ස්කන්ධ *(biomass)*, ෆොසිල ඉන්ධන, ලෝපස් සහ වැලි, සිමෙන්ති, ගල් , ගඩොල්, ගල් තාර වැනි ගොඩනැගුම් අමු ද්‍රව්‍ය ආදී ස්වාභාවික සම්පත් ප්‍රමාණයේ සමස්ත එකතුව හඳුන්වන්නේ ජාතික ද්‍රව්‍යමය පා සටහන *(Nation's global material foot print)*

173 Piketty Thomas et al (eds) *World Inequality Report 2018,* World Inequality Lab, Paris https://wir2018.wid.world/files/download/wir2018-summary-english.pdf - Retrieved on 14 Feb 2021

174 Gabardo, F.A., Pereima, J.B. and Einloft, P. (2017) "*The incorporation of structural change into growth theory: A historical appraisal*", Economia, vol. 18, no. 3, 392-410.

යනුවෙනි. මේ පා සටහනේ ප්‍රමාණය එම රට විසින් පරිසරය කෙරෙහි ඇති කරනු ලබන පීඩනය නිරූපණය කරයි. පාරිසරික පා සටහන *(Ecological Footprint)* යනුවෙන් ද හැඳින්වෙන එය කිසියම් මානව ක්‍රියාකාරකමක් ඉටු කිරීම සඳහා වැය කළ යුතු පෘථිවියේ ප්‍රතිජනනීය ධාරිතාව මැනීම පිණිස යොදා ගන්නා මිම්මකි. ඒ සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා ඒකකය වන්නේ *gha* යන සංකේතයෙන් හඳුන්වන ගෝලීය හෙක්ටෙයාරයයි.[175] මේ පාරිසරික පාද සටහනේ ප්‍රමාණය එම රටවල ජීව ධාරිතාව *(biocapacity)* ඉක්මවා ගිය විට පාරිසරික හිඟයක් *(ecological deficit)* ඇති වෙතැ 'යි සැලකේ. ඒ අනුව 2021 වැඩි ම පාරිසරික හිඟය ඇති කළ රට වසයෙන් සැලකෙන්නේ චීනය යි. එය සෘණ ඒකක -3435 කි. ඇමෙරිකාවේ පාරිසරික හිඟය සෘණ -1416 ක් වන අතර ඉන්දියාවේ එය සෘණ -878 කි. ශ්‍රී ලංකාවේ පාරිසරික හිඟය සෘණ ඒකක -18.57ක් පමණක් වුවද දකුණු ආසියාවේ වැඩි ම ඒක පුද්ගල පාරිසරික පාද සටහන වන 1.32 *gha* වාර්තා වන්නේ ද ශ්‍රී ලංකාවෙනි.[176]

පාරිසරික හිඟය පිළිබඳ මේ දර්ශකවලින් පෙන්නුම් කරන්නේ අප අනුගමනය කළ සංවර්ධනය විසින් කොතරම් පරිපීඩනයක් පෘථිවි පරිසරය මත මුදා හරිනු ලැබ ඇත් ද යන්නයි. එහි ඵල විපාක සාගර ජලයේ අඩංගු අති විශාල ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් ද, කෘමි සතුන්ගේ නො නවතින නෂ්ට ප්‍රාප්තියෙන් ද, ආක්ටික් අයිස් ආවරණය පෙර නොවූ විරූ ලෙස දිය වී යෑමෙන් ද තවත් බොහෝ පූරණය කළ නො හැකි පාරිසරික හානිවීම්වලින් ද පැහැදිලි වේ.[177]

දේශගුණ අර්බුදය මෙන් ම ශාක සහ සත්ව ගහනයේ අනුක්‍රමික පරිහානියට තුඩු දුන් නිසැක හේතු හා පරිභෝජන රටාව අතර ඇති

175 Fath. B (eds) 2019, *Encyclopedia of Ecology,* Amsterdam: Elsevier

176 https://worldpopulationreview.com/country-rankings/ecological-footprint-by-country Retrieved on 14 Feb 2021

177 මේ පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ආචාර්ය ටිම් ෆ්ලැනරි විසින් We are the Weather Makers යනුවෙන් ලියූ ම විසින් 'අප කාලගුණ කාරකයෝය' නමින් පරිවර්තනය කොට අගහස් ප්‍රකාශකයෝ පළ කළ කෘතියේ එයි.

නාස්තිකාර සම්බන්ධය හෙළිදරව් වීම නිසා සමාජ පරිණාමයේ උත්කර්ෂය සංවර්ධිත රටවල් යැ'යි මෙතෙක් පිළිගෙන තිබූ මතය දැන් අවලංගු වෙමින් තිබේ. පෘථිවි ගෝලයේ ස්වාභාවික සම්පත් නිස්සාරණය *(extraction)* කිරීම හෙවත් උදුරා ගැනීම හැර ධනවාදී ක්‍රමයට වෙනත් විකල්පයක් නැත. ඒ නිසා ඇතිවී තිබෙන පූරණය කළ නො හැකි හානිය සැලකූ විට එකල මානව ප්‍රගතිය *(progress)* ලෙස සැලකූ සංසිද්ධිය දැන් අපට මානව ප්‍රතිගමනය *(regress)* ලෙස සැලකීමට සිදුවී තිබේ. දේශගුණ විපර්යාසය පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ *(IPCC)* මෑත කාලීන සොයා ගැනීම්වලින් තහවුරු වන විශ්ලේෂණවලට අනුව සිදුවී ඇති විනාශය ආපසු හැරවිය නො හැකි තරම් බරපතළය. ඒ අනුව ධනවාදී ආර්ථික වර්ධනය පොදු සමාජ සංවර්ධනය ලෙස සලකා දිගින් දිගට ම කටයුතු කිරීම පෘථිවි ග්‍රහයා මිනිසුන්ට ජීවත් වීමට නො හැකි තැනක් බවට පත් කිරීමට නිසැක ව ම හේතු වීමට ඉඩ ඇති බවට සාක්ෂි ඕනෑ තරම් තිබේ.

එයට හේතුව වන මානව ක්‍රියාකාරකම් නිසා ගෝලීය උණුසුම ඉහළ යෑම අවම වසයෙන් කාර්මික යුගයට පෙර පැවති ගෝලීය උෂ්ණත්වයට වඩා සෙන්ටිග්‍රේඩ් අංශක 1.5 ඉක්මවා නො යැවීමට කටයුතු කළ යුතුයැ'යි බොහෝ රටවල් 2015දී එකඟ වූයේ එබැවිනි. එහෙත් එම එකඟත්වය පවා ප්‍රමාණවත් නො වන බව 2021ජූලිවල දී පළ වූ *IPCC* වාර්තාවේ සඳහන් කරුණු තහවුරු කරයි.[178] 2021 සැප්තැම්බර් මැද නිකුත් කළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශ්ලේෂණ වාර්තාවට අනුව 2030 වන විට ගෝලීය කාබන් ඩයොක්සයිඩ් විමෝචනය 2010 පැවති ප්‍රමාණයට වඩා 16% කින් වැඩි විය හැකි ය.[179] ඒ නිසා සමාජ සහ පරිසර යුක්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුන්වා දුන් 'තිරසාර සංවර්ධන අරමුණු' *(Sustainable Development Goal)* නමැති යෙදුමට වඩා ඇත්ත වසයෙන් ම

178 https://www.ipcc.ch/sr15/download/#chapter – Retrieved on 17 Feb 2021

179 https://www.newscientist.com/article/2290746-un-says-global-carbon-emissions-set-to-rise-16-per-cent-by-2030/?utm_source=onesignal&utm_medium=push&utm_campaign=2021-09-17-Global-emission - Retrieved on 17 Feb 2021

ගැළපෙන්නේ එම අරමුණු 'තිරසාර ප්‍රවර්තන අරමුණු' *(Sustainable Survival Goals)* යනුවෙන් හඳුන්වා කටයුතු කිරීම යි.[180]

පරණ සංවර්ධනය පිළිබඳ භූ දේශපාලනය ද ඇතුළතින් කඩා වැටෙමින් තිබේ. 2015 දී හඳුන්වා දුන් තිරසාර සංවර්ධන අරමුණුවලට හාත්පසින් ම වෙනස් ව 2000 දී සහස්‍රක සංවර්ධන අරමුණු *(Millennium Development Goals)* පිළියෙළ වුණේ පැරණි සංවර්ධන ආකල්පයට අනුව ප්‍රාග්ධනය, වර්ධනය සහ උචිත සමාජ ප්‍රතිපත්ති ඇති කර ගැනීමට සංවර්ධිත රටවල් දුප්පත් රටවලට උදව් කළ යුතු ය යන මතය පදනම් කර ගනිමිනි. එය සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධිතයැ'යි නම් කොට තිබූ රටවල් හා සමෝසමේ ආර්ථික වර්ධනය අත්පත් කර ගැනීමට තැත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ පශ්චාත් යටත් විජිත සමයේ සිට පැවති ආකල්පයේ ම දිගුවක් විය. සංවර්ධිත රටවල් හා හැම අතින් ම සම වීම නැමති ඒ සංවර්ධන සිහිනයට කුමක් වී ද?

තිරසාර සංවර්ධන අරමුණු හඳුන්වා දුන් පූර්විකාවේ මෙසේ සඳහන් වෙයි. "මෙම න්‍යාය පත්‍රය මින් පෙර නො දුටු විරූ විෂය පරාසයක් හා සුවිශේෂතාවක් පිළිබඳවයි. මෙහි සඳහන් වන අරමුණු සාර්වත්‍රිකය *(Universal)*. එනම් ඒවා සංවර්ධනය වන රටවල් මෙන් ම හා සංවර්ධිත රටවල් ද  එක හා සමාන ව හසු කර ගන්නා සමස්ත ලෝකයට ම අදාළ අරමුණු වීමයි." ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු ද දේශගුණ විපර්යාසය පිළිබඳ පැරිස්/ග්ලාස්ගෝ සම්මුති මෙන් ම ගෝලීය ය; සාර්වත්‍රිකය. සංවර්ධනය සම්බන්ධයෙන් මෑතක දී ඇතිවී තිබෙන සුසමාදර්ශීය වෙනස් වීම මීට වඩා පැහැදිලි කරන වෙනත් උදාහරණයක් නැති තරම් ය. 'භූ දේශපාලනයට අනුව දුප්පත් රටවලට ඒකාන්ත ආදර්ශය විය යුත්තේ දියුණු කාර්මික රටවල් ය' යන සංවර්ධනය පිළිබඳ එතෙක් රජයූ ප්‍රවාදය ඒ මඟින් අත්හැර දමා තිබීම මුඛ්‍ය වෙනසකි. 1989 දී සීතල යුද්ධය නිමාවට පත් වූ ආකාරයෙන් ම සංවර්ධිත රටවල් හා සම වීම පිළිබඳ මිරිඟුව ද 2015දී

180 Sachs, Wolfgang (2017) The Sustainable Development Goals and Laudato si': varieties of post-Development. Third World Quarterly Vol 38 issue12, London: Routledge,

නිමාවට පත් විය. දැන් ඉතින් තිරසාර ලෙස සංවර්ධිතයැ'යි කිව නොහැකි සංවර්ධනයකින් ඇති ඵලය කුමක් ද?

ඒ හැර ලෝක ආර්ථිකයේ භූගෝලීය ස්වරූපය ද බෙහෙවින් වෙනස් වී තිබේ. භූ දේශපාලනික බලපෑම ගත් විට ලෝකයේ දෙවැනියට විශාලතම ආර්ථික බලය ඇති රට ලෙස චීනයේ ශීඝ්‍ර නැගී ඒම විස්මය දනවන සුලු විය. *G7* කණ්ඩායමට අයත් රටවල් තවමත් ලෝකාධිපති රටවල් ලෙස පෙනී සිටීමට උත්සාහ දරන නමුත් එම රටවලට වඩා අලුතින් කාර්මිකකරණයට ලක් වූ රටවල් හත ම ආර්ථික වසයෙන් බලගතු ය. එතෙක් කල් පැවති උතුරු දකුණු බෙදීම ගෝලීයකරණය මඟින් නිතිපතා දියකර හරිමින් තිබේ.

සංවර්ධනය යන්න හැම විටම සංඛ්‍යාත්මකව නිරූපණය කිරීමට වෑයම් කරන ලද ප්‍රපංචයකි. දළ දේශීය නිෂ්පාදිතය නමැති මැජික් අංකයෙන් තොර ව ජාතීන්ගේ සංවර්ධන ප්‍රයත්න අගය කිරීමේ වෙනත් මිම්මක් නොමැති තරම් ය. රටවල් අතර වත්කම් සහ දුප්පත්කම් මැනීමේ දී එසේ ආදායම් සංසන්දනය යොදා ගැනීම පරණ සංවර්ධන චින්තනය තුළ බෙහෙවින් භාවිත කළ මිම්මක් විය.

තිරසාර සංවර්ධන අරමුණු පරණ සංවර්ධන චින්තනයේ සුසමාදර්ශීය වෙනසකට මං පාදන නමුත් තිරසාර සංවර්ධන අරමුණු තුළ ද එකී දුර්වලකම දක්නට ලැබේ. එක අතකින් සාගර සහ භෞමික පරිසර පද්ධතිවලට සිදු වී ඇති හානිය ගැන ද ආදායම් පරතරය වැනි නොකඩවා වැඩි වෙන සමාජ විෂමතා ආමන්ත්‍රණය කිරීමේ අවශ්‍යතාව ගැන ද එමඟින් අවධාරණය කරන අතර ම අනික් අතට ඇතැම් තිරසාර සංවර්ධන අරමුණු මඟින් දුප්පත් රටවල් සඳහා අවම වසයෙන් 7%ක ආර්ථික වර්ධනයක් ද අපේක්ෂා කරයි. වර්ධනය සහ තිරසාර බව අතර ඇති ප්‍රතිවිරෝධය අන්තර්ග්‍රහනීය වර්ධනය *(Inclusive Growth)* සහ හරිත වර්ධනය *(Green Growth)* වැනි ප්‍රයත්න මඟින් සමනය කර ගැනීමට අදහස් කරන බව පවසන නමුත් මූල්‍ය වෙළඳපොළවල් හැසිරෙන ආකාරය අනුව තීරණය වන ඕනෑ ම ආකාරයක විශේෂණ පදයක් සහිත වර්ධනයක ප්‍රතිඵලය විය

හැක්කේ අසමානතාව නැවත නැවත ප්‍රතිනිෂ්පාදනය කිරීම බව ඉදිරි පරිච්ඡේදවල කෙරෙන සාකච්ඡාවලින් පැහැදිලි වනු ඇත.

ඉහත කී දුර්වලකම් තිබිය දී වුව ද තිරසාර සංවර්ධන අරමුණු පරිසර හා සමාජ යුක්තිය මුල් කොට මිනිස් වර්ගයාගේ පැවැත්ම රැක ගැනීම පිණිස බිම් මට්ටමේ සිට ගෝලීය මට්ටම දක්වා වූ ක්‍රියාකාරී සහෘදත්වයක් ගොඩනගා ගැනීම පිණිස මෙතෙක් නොවූ විරූ ආකාරයේ වේදිකාවක් සපයයි. මේ සම්බන්ධයෙන් ආර්ථික විද්‍යාඥ කේට් රේවර්ත් ඇයගේ ඩෝනට් ආර්ථිකය *(doughnut economy)* නමැති ආකෘතිය මඟින් ඉදිරිපත් කරන යෝජනාව ගැන 22 වැනි පරිච්ඡේදයේ දී සවිස්තර ව විමසා බැලිය හැකි ය.

1990 ගණන්වල තිබූ නවලිබරල්වාදී විජයග්‍රාහී ආකල්ප 2008 ආර්ථික අර්බුදයත් සමඟ බෙහෙවින් මිලින ව ගොස් තිබේ. ඒ සමඟ චීනයේ නැගීම, බටහිර ලෝකයේ බලය ගිලිහීම, මූල්‍ය වෙළඳපළෙහි ආක්‍රමණශීලී ආධිපත්‍ය සහ අධිකාරවාදී රාජ්‍යයන්ගේ පුනරාගමනය නූතන ඉතිහාසයේ විගඩම් ලෙස සැලකිය යුතු ය. උත්තරාර්ධ ගෝලය පුරාත් දක්ෂිණාර්ධ ගෝලයේ සැලකිය යුතු කොටසකත් දක්නට ලැබෙන වර්තමාන වටපිටාව විස්තර කළ හැකි හොඳ ම යෙදුම වන්නේ 'අනාගතය පිළිබඳ පවතින බිය' කියා ය. බොහෝ දෙනෙකුගේ ජීවන තත්වය අසීරු වන බවත් දරු මුනුබුරන්ට මුහුණ දීමට සිදු වන තරඟකාරී අනාගතය ඒ තරම් සුභදායී නො වන බවටත් ඇති හැඟීම පොහොසත් රටවල මධ්‍යම පංතිය තුළ පවා පවතී. ඒ නිසා ඔවුහු ආරක්ෂණවාදී අනන්‍යතා දේශපාලනය වෙත වැඩි වැඩියෙන් යොමු වෙමින් සිටිති. ඒ අතරම සිය සම්ප්‍රදායන්ගෙන් දුරස්ථ වූ බටහිර ජීවන රටාව සුහුරු දුරකථන හා රූපවාහිනී තිර ඔස්සේ දැක බලා ඇති, එහෙත් නූතන ලෝකයෙන් පිටුවහල් කර තිබෙන දකුණේ රටවල විශාල ජන කොටසක් ජාතික අභිමානය සොයමින් ලත වෙති. පෙර අපර හැම තැනක ම පොහොසතුන් හා දුප්පතුන් වසයෙන් දැවැන්ත ධ්‍රැවීකරණය වීමක් දක්නට ඇත. ජාතික රාජ්‍ය රැජයූ අතීතයේ දී පරාජිත රටවලට ජයග්‍රාහකයන්ගෙන්

නිවැරදි කිරීම් ඉල්ලා සිටීමට හැකි වූව ද සියල්ල ගෝලීයකරණය වීමත් සමඟ තව දුරටත් ඒ ඉල්ලීම වලංගු නො වේ. පාරජාතීය *(transnational)* ආර්ථිකය, විශේෂයෙන්ම එහි මූල්‍ය අංශය හැම රටක ම ජීවන තත්වය, රාජ්‍ය ණයවල සිට පුද්ගලික ණයවරපත් *(credit card)* දක්වා නිරූපණය වී ඇති අන්දමට ග්‍රහණයට අර ගත්තේ ය. ජනප්‍රිය නව-ජාතිකවාදය *(popular neo-nationalism)* හිස ඔසවන්නට පටන් ගත්තේ මේ සියල්ලට පිළිතුරක් ලෙසයි.

එහෙත් ජනප්‍රිය නව-ජාතිකවාදය *(popular neo-nationalism)* යනු බොරු වළවල් රැසකින් සමන්විත වූවකි. ඒ අතරින් වැඩි දෙනෙකුගේ අවධානයට යොමු නො වී ඇති එක බොරු වළක් වන්නේ පරණ කාර්මික යුගය පිළිබඳ ජාතිකවාදීන්ගේ ඇති නොස්ටැල්ජියානු කාංසාවයි. ජාතිය හා පීතෘභූමිකත්වය පිළිබඳ ඇති ආදරයට අමතර ව පරිසර වාදයට අවඥා කිරීම හැර ඔවුන් සතු වෙන යමක් නැත. ජනප්‍රිය ජාතිකවාදීහු ඛනිජ ඉන්ධන සොයා ගැනීමට සාගරය කැණ බැලීම, පාෂාණ ස්තර පසාරු කොට ගෑස් වායු ලබා ගැනීම, ගල් අඟුරු කැණ ගැනීම සහ වනාන්තර එළි කිරීම යනාදිය කළ යුතු ම දේවල් වසයෙන් සලකති. ඔවුන් අදහස් කරන පරිදි දේශගුණ විපර්යාසය යනු ජාතික ආර්ථිකයට සතුරුකම් කිරීමට සැදී පැහැදී සිටින්නන් විසින් අටවනු ලබන මර උගුලකි. බ්‍රසීලයේ බොල්සොනාරෝ වැනි ජනප්‍රිය නව ජාතිකවාදීන් විසින් පෙන්වා දී ඇති පරිදි ස්වභාවධර්මය කොල්ලකෑම උත්කර්ෂයට නැංවිය යුතු ක්‍රියාවකි. ඔවුන්ගේ ප්‍රකට පරජන භීතිකාව *(xenophobia)* හැරෙන විට ඔවුන් සැලකිය යුත්තේ 1950ස් ගණන්වල පැවති පරණ සංවර්ධන දෘෂ්ටිවාදය අමාරුවෙන් කර තබා ගෙන යන්නන් ලෙසිනි. කෙසේ වෙතත් නව ජාතිකවාදී ව්‍යාපෘතිය පසු බෑමකට ලක් ව ඇති බව දේශගුණ විපර්යාසය දේශපාලන කතිකාවේ කේන්ද්‍රීය සාධකයක් ලෙස ඉස්මතු කළ නෝර්වේ[181] සහ ජර්මනිය වැනි රටවල මැතිවරණවල දී නිරූපණය වූ මෑත කාලීන දේශපාලන ප්‍රවණතාවලින් පෙන්නුම් කරයි.

181 https://www.reuters.com/world/europe/norway-opposition-expected-win-election-fought-oil-inequality-2021-09-13/

# - 19 -

## වර්ධනය යනු සංවර්ධනය ම ද?

රටක ආර්ථිකයේ සාර්ථකත්වය සාම්ප්‍රදායික ව මනිනු ලබන්නේ *GDP (Gross Domestic Product)* හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉහළ යෑම මත ය. දළ දේශීය නිෂ්පාදිතය වසයෙන් හඳුන්වනු ලබන්නේ වසරක දී රට තුළ නිපදවන භාණ්ඩ සහ සේවාවල මුළු එකතුවේ වටිනාකම යි. වෙළඳපොළ ආර්ථිකයක නිෂ්පාදනය කරන හැම භාණ්ඩයක් හා සේවාවක් ම විකිණීමකට හා මිල දී ගැනීමකට ලක් වන්නේ ය යන පදනම මත දළ දේශීය නිෂ්පාදිතය ගිණීමේ ක්‍රමය වන්නේ අදාළ වසරේ රට තුළ නිපදවෙන භාණ්ඩ හා සැපයෙන සේවාවල සමස්ත වටිනාකම ගණන් බැලීම යි. මේ මිණුමට අනුව භාණ්ඩ හා සේවාවල පුද්ගලික පරිභෝජනයේ එකතුව, නව වත්කම් සඳහා කර ඇති ආයෝජන, රාජ්‍ය සේවක වැටුප් ඇතුළු රජයේ වියදම් සහ නිර්යාත ආදායම ද ඇතුළත් ව ගණනය වන මුලු මූල්‍යමය වටිනාකම මත දළ දේශීය නිෂ්පාදනය ගණනය වෙයි. එහෙත් මෙහි දී ඉතිරි කිරීම් වසයෙන් සැලකෙන කොටස් මිල දී ගැනීම් සහ දැනටමත් හිමි ව ඇති දේපළ සම්බන්ධයෙන් කෙරෙන ආයෝජනය ගණන් නො ගැනේ. එමෙන් ම සමාජ ආරක්ෂණය වැනි යළි බෙදාහැරීම සඳහා වන වියදම් මේ ගණනයෙන් ඉවත් කෙරේ.

දළ දේශීය නිෂ්පාදිතය මත ආර්ථික සාර්ථකත්වය මනින මෙම සාම්ප්‍රදායික ක්‍රමය තාක්ෂණික වසයෙන් මෙන් ම හරය වසයෙන් ද

පලුදු සහගත බව පෙයිස්කර් සහ ෆ්ලිට්නි සිය *"The Age of Post-Rationality* කෘතියේ පෙන්වා දෙයි. ඔවුන් පෙන්වා දෙන පරිදි තාක්ෂණික ව ගත් විට 'අළුපැහැ ආර්ථිකය' *(grey economy)* හෝ 'අත යට මුදල්' හෝ යනුවෙන් හැඳින්වෙන අවිධිමත් ආර්ථිකය දළ දේශීය නිෂ්පාදිතය තුළ නිරූපණය නො වේ. මේ ඌණතාව ආමන්ත්‍රණය කිරීමට ඇතැම් සංවිධාන මෑතක දී කිසියම් උත්සාහයක් ගෙන තිබුණි. යුරෝපා සංගමය තුළ නීති විරෝධී ගණිකා වෘත්තිය සහ මත් ද්‍රව්‍ය ජාවාරම් පවා දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වසයෙන් සැලකිය යුතු යැයි සැලකීම එයට එක් උදාහරණයකි.

ඒ අතර 'සමාජීය ආර්ථිකය' *(social economy)* යනුවෙන් හැඳින්විය හැකි ක්ෂේත්‍රය ද දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ මිනුම්වලින් ආවරණය නො වන තවත් වැදගත් ක්ෂේත්‍රයකි. උදාහරණයක් වසයෙන් මිතුරන් අතර හා පවුලේ සාමාජිකයන් අතර මුදල් හුවමාරුවකින් තොර ව සිදු වන උදව් පදව්, සේවා සහ ආච්චිලා සීයලා විසින් මුනුබුරු මිනිබිරියන් බලා ගැනීමේ සිට අසල්වාසීන් විසින් එකිනෙකාට උදව් කර ගනු ලැබීම දක්වා කරන පරෝපකාරී කටයුතු බෙහෙවින් අගය කළ යුතු ඒවා වන නමුත් එවැනි දේවල් ආර්ථික අගයක් ඇති දේවල් ලෙස දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ සංකල්පය තුළ නො සැලකේ. මැදි ආදායම් සහ අඩු ආදායම් ලබන රටවල එවැනි 'සමාජීය ආර්ථික' කටයුතු බෙහෙවින් පවතින නමුත් ඒවා දළ දේශීය නිෂ්පාදන මිණුම්වල දී කිසිදු සැලකීමකට ලක් නො වේ. ඒ නිසා එම රටවල දුප්පත්කම ඇත්ත වසයෙන් ම පවතිනවාට වඩා අතිශයෝක්තියකින් නිරූපණය වේ.

ඉහත කී පරෝපකාරී 'සමාජීය ආර්ථිකයක' පැවැත්ම ධනවාදී ආර්ථික තාර්කිකත්වයට අනුව නම් ක්‍රම විරෝධී දෙයක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව උදව්වක් ලෙස ඔබේ මිතුරෙකු ඔබ ඔබේ ම වාහනයෙන් ගුවන් තොටුපලට ගෙන ගොස් ඇරලීම ගැනෙන්නේ දළ දේශීය නිෂ්පාදිතයට සිදු වූ පාඩුවක් ලෙස ය. මන්ද එම ගමන දළ දේශීය නිෂ්පාදිතයට සිදු වන වාසියක් ලෙස සැලකිය හැකි වන්නේ

ඔබේ මිතුරා එම ගමන මුදල් ගෙවා කුලී රථයකින් ගියේ නම් පමණක් වන බැවිනි. දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ මිනුමේ ඇති බරපතළ දුර්වලතාව වන්නේ අපේ ජීවිතවල සාමූහික ගුණාත්මක භාවය ඇත්ත වසයෙන් ම අඩු කිරීමට තුඩු දෙන අප්‍රසන්න වියදම් ද එම මිනුම තුළ අන්තර්ගත වීම යි. ඒ අනුව අපරාධ ප්‍රමාණය වැඩි වුණ විට නීතිය ක්‍රියාත්මක කිරීම සහ බන්ධනාගාර පවත්වා ගෙන යෑම සඳහා වැඩි වන වියදම නිසා ද රිය අනතුරු වැඩි වන විට අලුත්වැඩියා කිරීමේ වියදම වැඩි වීම නිසා ද දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යයි. අපේ දළ දේශීය නිෂ්පාදිතයට වායු දූෂණය ද, දුම් පානය දිරි ගන්වන ප්‍රචාරක කටයුතු ද අඩංගු වන බව අමතක නො කළ යුතු බව රොබට් කෙනඩි වරක් ප්‍රකාශ කළේ දළ දේශීය නිෂ්පාදිත මිණුමේ වැඩි වීම යනු ප්‍රගතිය නො වන බව අවධාරණය කිරීම සඳහා ය.

මෙහි දී ප්‍රධාන ගැටලුව වන්නේ *GDP* හෙවත් දළ දේශීය නිෂ්පාදනය යනු සමාජයට සහ මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක භාවයට සිදු වන්නේ කුමක් දැ'යි නො තකා සියලු ම ආකාරයේ මූල්‍යමය ගනුදෙනු අඩංගු කර ගන්නා ප්‍රමාණාත්මක මිණුමක් බවට පත්වී තිබීම යි. සාම්ප්‍රදායික ව ජාතියක ආර්ථික ප්‍රගතිය මැනීමේ දී දළ ඒක පුද්ගල දේශීය ආදායම ඉහළ යා හැකි නමුදු වැඩිවන සමාජ අසමානතාව නිසා එය හුදෙක් සුළුතරයක් අතර කේන්ද්‍ර ගත වන ධනයක් පිළිබඳ මිම්මක් ද විය හැකි ය. වසර 2000 සිට 2008 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ සමස්ත ආර්ථික වර්ධනය ඉතා ඉහළ මට්ටමක පැවතුණ නමුත් උද්ධමනයට අනුව සැකසූ මිණුම්වලට අනුව ඒ කාලය තුළ කුටුම්බ ආදායම 4% කින් අඩු විය. එහෙත් ඒ අතර ඉහළ ආදායම් ලබන 1%ක උපයා ගත් ප්‍රමාණය සාපේක්ෂ ව සැලකිය යුතු පමණින් වැඩි විය. ඒ නිසා සමාජ විෂමතාව දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ මිනුම්වලින් එළිදරව් නො වේ. කෙසේ වුව ද ආර්ථික විද්‍යාඥයෝ ආර්ථික ප්‍රගතිය මනින්නේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය අනුව යි. එනිසා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය කොතෙක් දුරට වැදගත් ද කියා විමසිය යුතු ය.

දළ දේශීය නිෂ්පාදිතය හෙවත් *GDP*ය පිළිබඳ සංකල්පය හඳුන්වා දීමට එක්තරා අන්දමකට හේතු වුණේ එක්දහස් නවසිය තිස් ගණන්වල දී ඇමරිකානු කොංග්‍රස් සභාව ඇමරිකාවේ ජාතික ආදායම මැනීමට සුදුසු මිම්මක් සකස් කිරීම ආර්ථික විද්‍යාඥයකු වන සයිමන් කුස්නෙට් ට පැවරීමේ ප්‍රතිඵලයක් ලෙස යි. ඒ අනුව ලෝකය පුරා ම ඇමෙරිකාව විසින් වාර්ෂිකව ජනිත කරනු ලබන ඉපයුම්වල වටිනාකම පදනම් කර ගෙන දළ ජාතික නිෂ්පාදිතය *(Gross National Product)* යනුවෙන් හැඳින්වෙන මිම්මක් කුස්නෙට් විසින් හඳුන්වා දෙන ලදී. මේ නිසා ප්‍රථම වතාවට ලොව පුරා ඇමෙරිකාව සතු සම්පත් මඟින් වාර්ෂිකව බිහි වෙන නිපැයුම්වල වටිනාකමට ඩොලර්වලින් මිලක් නියම කිරීමට හැකි විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ මහා අවපාතයට(1929-1941*)* මුහුණ දීමට තමන් විසින් හඳුන්වා දෙන ලද ප්‍රගතිශීලී ප්‍රතිපත්ති නිසා ඇති වූ ප්‍රගතිය මැන බැලීමට ජනාධිපති රූස්වෙල්ට්ට මේ මිම්ම අතිශයින් ප්‍රයෝජනවත් විය. මෙයට අනුරූප ව පසු කලක දළ දේශීය නිෂ්පාදිතය යනුවෙන් හැඳින්වුණු මිම්ම මඟින් මනින ලද්දේ වාර්ෂිකව දේශීය නිෂ්පාදනයේ එනම් අදාළ රට තුළ පමණක් බිහි කරන නිෂ්පාදිතයේ මුළු වටිනාකම යි. එය දළ දේශීය නිෂ්පාදිතය *(Gross Domestic Product)* හෙවත් GDP යනුවෙන් හැඳින්විණි. මේ අනුව බලන විට ජනාධිපති රූස්වෙල්ට් සිය සංවර්ධන ප්‍රතිපත්තිවල ප්‍රගතිය මැන ගැනීම සඳහා යොදා ගත් මිම්ම වර්තමානයේ දී සමස්ත ආර්ථිකයේ ප්‍රගතිය පිළිබඳ නිර්ණායකය පමණක් නො ව මූලික ප්‍රතිපත්තිය බවට පත්වී තිබීම ද උත්ප්‍රාසයකි.

ඉතා භක්තිමත් ව *GDP* හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉලක්කය කරගත් අලුත් ම තරඟකාරී ආර්ථික නියාම මොනවා දැ'යි නිරන්තරයෙන් විමසා බැලීමට තමන් ද ඇතුළුව ආර්ථික විද්‍යාව ඉගෙන ගන්නා ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාලයේ දී උත්සුක වූ බව ඉදිරියේ දී අප සවිස්තරව සලකා බැලීමට අදහස් කරන ඩෝනට් ආර්ථිකය *(Doughnut Economics)* යන උත්තේජනීය සංකල්පය ඉදිරිපත් කළ තරුණ ආර්ථික විද්‍යාඥවරියක වන කේට් රේවර්ත් පවසයි. දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනයක් ඇති වන්නේ

ජාතියක් නව තාක්ෂණය යොදා ගැනීම නිසා ද? නැත්නම් වැඩි වන කර්මාන්තශාලා යන්ත්‍ර සූත්‍ර ප්‍රමාණයේ ප්‍රතිඵලයක් වසයෙන් ද? එසේත් නො වේ නම් මානව ප්‍රාග්ධනය වැඩි වීමක් නිසා ද? වැනි විමසුම් සියල්ල එකල ඉතා ආකර්ෂණීය ප්‍රශ්න වූ බව ද ඇය සඳහන් කරයි. එහෙත් ඔවුන් කවදාවත් මොහොතක් නැවතී දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සැම විට ම අවශ්‍ය වන දෙයක් ද? හැම විට ම අභිමත වන දෙයක් ද? ඇත්ත වසයෙන් ම දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය හැම විට ම සාක්ෂාත් කර ගත හැකි දෙයක් දැ'යි බරපතළ ලෙස විමර්ශනය කිරීමක් නො කළ බව ද ඇය සිහිපත් කරයි. අනතුරුව ආර්ථික චින්තනයේ අරමුණ කුමක් විය යුතු ද යන ප්‍රශ්නය තමාගේ හිතට නැගුණේ එකල එතරම් සැලකිල්ලක් නො දැක්වූ මාතෘකාවක් ලෙස ගැනුණු සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකය පිළිබඳ ව විමසිලිමත් වූ විට බව රේවර්ත් පවසයි.

එහි දී කේට්ගේ හිතට නැගුණු අභියෝගාත්මක ප්‍රශ්නය වූයේ සංවර්ධනයේ සාර්ථකත්වය තක්සේරු කිරීමේ හොඳම ක්‍රමය කුමක් ද යන්නයි. ඒ බව ඇය සඳහන් කරන්නේ මෙසේයි. "මේ ප්‍රශ්නය මෙසේ සිතට නැගීම මා විමතියටත් භ්‍රාන්තියටත් පත් කරන්නක් විය. වසර දෙකක ආර්ථික විද්‍යා අධ්‍යාපනයකින් පසුව ආර්ථික චින්තනයේ නියම අරමුණ කුමක් ද යන්න ගැන ප්‍රථම වරට ප්‍රශ්න කිරීමට මට සිදුවී තිබේ. එම ප්‍රශ්නය අපේ සිත්වලින් මග හැරී යෑම මට මෙතෙක් කල් පෙනී නො තිබීම පුදුමයකි".[182]

සෝවියට් දේශය ඉස්මතු වීම තරඟයක් ලෙස සැලකූ ඇමරිකාව එක්දහස් නවසිය හැට ගණන්වල ජාතික ආරක්ෂාව සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් යොදවමින් එය දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීම සඳහා යොදා ගත්තේ ය. ඇමෙරිකාව සහ සෝවියට් සංගමය අතර තිබූ දෘෂ්ටිවාදී තරඟය නිදහස් වෙළඳපොළ සහ මධ්‍යගත සැලසුම් මත ආර්ථිකය කළමනාකරණය කරන ආර්ථික මතවාද අතර තරඟයක් බවට පත් විය. කිනම් ආර්ථික දෘෂ්ටිවාදයක් වඩා බලවත්

182 Kate Raworth (2017) Doughnut Economics: Seven ways to think like a 21st Century Economist, by Kate Raworth, New York: Random House, p.36

වේද යන කාරණය පිළිබඳ ඇමෙරිකාව සහ සෝවියට් සංගමය අතර වූ තරඟයේ දී දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය තීරණාත්මක සංවර්ධන සංරචකයක් ලෙස ඇමෙරිකාව විසින් ප්‍රවර්ධනය කරන ලදී. 1960 ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේ දී ජෝන් කෙනඩිගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් වූයේ ඇමරිකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය 5% ක් දක්වා වැඩි කර ගන්නා බවයි. මැතිවරණය ජයග්‍රහණය කළ වහා ම ඔහු සිය ආර්ථික උපදේශකයන් ගෙන් ඇසූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ අපට 5% ක වර්ධන වේගයක් පවත්වා ගෙන යෑමට ඇත්තට ම පුළුවන් වේවි ද යන්නයි.

එහෙත් කුස්නෙට් පවා තමන් විසින් හඳුන්වා දෙනු ලැබූ දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ දර්ශකය ආර්ථික ප්‍රගතියේ දර්ශකයක් වසයෙන් හුවා දැක්වීමට මැලි විය. ඊට හේතු වූයේ එකී දර්ශකය පිළියෙල කිරීම පිණිස යොදා ගත් ගණනය කිරීම්වල සීමාසහිත ස්වභාවය ඔහු දුටු බැවිනි. කුස්නෙට් විස්තර කළ අන්දමට දළ ජාතික නිෂ්පාදිතය මඟින් ගණනය කරනු ලැබුවේ ආර්ථිකයක් තුළ භාණ්ඩ සහ සේවාවල වෙළඳපළ අගය පමණි. එදිනෙදා ජීවිතයේ දී ගෘහස්ථ ව නිපදවන භාණ්ඩ සහ සපයන සේවා සිය දර්ශකය පිළියෙළ කිරීමේ දී මුළුමනින් ම නො තකා හැර ඇති බව ඔහු පෙන්වා දුන්නේ ය. අනික් අතට තමන් හඳුන්වා දුන් දර්ශකය මඟින් ආදායම හා පරිභෝජනය කුටුම්බ අතර ඇත්ත වසයෙන් ම බෙදී යන්නේ කෙසේ ද යන්න ගැන සැලකිල්ලක් නො දැක්වූ බව ද ඔහු පෙන්වා දුන්නේ ය. ජාතික ආදායම පිළිබඳ මිම්ම ආදායම් ප්‍රවාහය පිළිබඳ මිම්මක් නිසා එම ආදායම නිපයූ ධන සම්පත් පිළිබඳ විගණනයක් සහ එකී ධන සම්පත් බෙදී යන ආකාරය පිළිබඳ විශ්ලේෂණයකින් තොර ව දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සියල්ල සඳහා ප්‍රයෝජනයට ගත හැකි දර්ශකයක් නො වන බව කුස්නෙට් දුටුවේ ය. 1960 ගණන්වල දී දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ දර්ශකයෙහි ජනප්‍රියතාව උච්චතම ස්ථානයක තිබුණු අවධියේ ඒ පිළිබඳ ව දරුණු ම විවේචකයා වූයේ කුස්නෙට් ය. ජාතියක සුභසාධනය ජාතික ආදායම පිළිබඳ මිම්මකින් අනුමානය කිරීම අසීරු බව ඔහු මුල සිට ම පෙන්වා දුන්නේ ය.

දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ මිම්මේ නිර්මාතෘවරයා එසේ අනතුරු හැඟවුව ද ආර්ථික විද්‍යාඥයන් මෙන් ම දේශපාලනඥයන් ද එකාවන් ව කුස්නෙට්ගේ එම අවවාදය නො තකා හැරියේ ය. වසරෙන් වසරට ඇති වෙතැ'යි සැලකෙන ආර්ථික ප්‍රගතියක් මැන බැලීමේ තනි මිම්මකට තිබූ ආකර්ෂණය ඉතා බලවත් එකක් විය. ඒ නිසා වසර 50 තුළ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය *(Growth Rate)* ප්‍රතිපත්තිමය තේරීමක් පමණක් නො ව දේශපාලනික අවශ්‍යතාවක් බවට ද පත් විය. ඒ අනුව තත්වාකාරයෙන් ම අවසානයේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සංවර්ධනයේ මූලික ප්‍රතිපත්තිමය අරමුණ බවට පත් විය. එනිසා තව දුරටත් වර්ධන වේගය වැඩි කර ගැනීම හැම විට ම අභිමතයක් විය යුතු ම ද, අත්‍යවශ්‍ය ම ද නැත හොත් හැම දා ම සාක්ෂාත් කර ගත හැකි වන දෙයක් ද යන්න විචාරශීලී ව විමසීම ආර්ථික විද්‍යාඥයන්ට මෙන් ම දේශපාලනඥයින්ට ද දේශපාලනික වසයෙන් සිය දිවි හානිකර ගැනීමක් බඳු විය. (දරුණු ගංවතුර උවදුරකින් පවුල් ගණනාවක් ම අවතැන් වූ එක් අවස්ථාවක එවකට සිටි ජනාධිපතිවරයා ගංවතුර පැමිණි හැම වසරක දී ම ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගිය බව කියමින් උදම් ඇනීම දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට ඇති ලොල් බව කොතෙක් දුරට දේශපාලනඥයන් අතර ඇටුවන් බැහැ ඇති සංකල්පයක් ද යන්න පෙන්වයි.)

සමාජ විෂමතාව, සමාජ සාධාරණය පිළිබඳ කාරණය සම්බන්ධයෙන් නූතන ආර්ථික විද්‍යාවේ මතය වූයේ මුල දී කැපී පෙනෙන ලෙස සමාජ විෂමතා ඇතිවීම ස්වාභාවික වන නමුත් ආර්ථික වර්ධනයත් සමඟ නිදහස් වෙළඳපොළ ක්‍රමය තුළ එකී විෂමතා බොහෝ දුරට සමනය වන බව යි. මේ අදහස කුස්නෙට් විසින් මුලින් ම සමාජගත කරන ලද අතර පසු ව නව ලිබරල් වාදය විසින් උත්කර්ෂණයට නංවනු ලැබ ඇත. උදාහරණයක් ලෙස කාර්මිකකරණයේ මුල් අවදියේ දී වායු අපද්‍රව්‍ය නිසා නාගරික ප්‍රදේශ බෙහෙවින් පරිසර දූෂණයට ලක් වුණත් ආර්ථික වර්ධනය ඉහළ

යැමත් සමඟ කාර්යක්ෂමතාව වැඩි කිරීමට වඩා දියුණු තාක්ෂණය යොදා ගැනීමෙන් එම තත්වය පාලනය වූ බව ඔවුන් ඒ සම්බන්ධයෙන් ගෙන හැර දක්වන තර්කයකි. එය හුදෙක් නිදහස් වෙළඳපොළ නිසා ඇතිවෙන ස්වයං නියාමනයක් බවට ලඝු කිරීමට තැත් කළත් ඇත්ත වසයෙන් ම සමාජය වඩ වඩා ප්‍රජාතන්ත්‍රීකරණයට ලක් වීම නිසා පරිසරය හා සෞඛ්‍යාරක්ෂාවට හිතකර නියාමනයක් සඳහා මැදිහත් වීමට රජයට බල කිරීමට මහජනතාවට හැකි වීම අර කියන ස්වයං නියාමනයට වඩා වැදගත් විය.

වර්ධනය උත්කර්ෂණයට නැංවීම ප්‍රශ්න කිරීමට තරම් ධෛර්යය සම්ප්‍රයුක්ත වූ එක් තැනැත්තියක් වූයේ පද්ධති චින්තනය පිළිබඳ විශේෂඥවරියක් වූ ඩොනෙල්ලා මීඩොව්ස් *(Donella Meadows)*ය. ඇය 1972 දී පළ වූ *Limits to Growth* හෙවත් 'වර්ධනයේ සීමා' නමැති වාර්තාවේ ප්‍රධාන කර්තෘවරියකි. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට ලබා දී ඇති අනවශ්‍ය තැන ගැන ඇගේ නො මනාපය විස්තර කරමින් ඕනෑ ම සංස්කෘතියක් විසින් වර්ධනය තම මූලික අරමුණ වසයෙන් සලකනු ලැබීම මුග්ධකමක් බව ඇය පැවසුවා ය.[183] 1990 ගණන්වල දී තව දුරටත් ඒ ගැන කරුණු දැක්වූ ඩොනෙල්ලා "අපට දැන් මේක හොඳට ම ඇති වෙලා. තව තවත් වර්ධනය අවශ්‍යයි කියන කංකරච්චලයට පිළිතුරු වසයෙන් වර්ධනය කුමක් ගැනද ඇයි වර්ධනය කා සඳහා ද වර්ධනය සඳහා මිල ගෙවන්නේ කවුද වර්ධනය කොතෙක් කලක් පවතී ද වර්ධනය සඳහා පෘථිවිය විසින් ගෙවිය යුතු මිල කොතරම් ද කොයි තරම් වර්ධන මට්ටමකින් අපට සංතෘප්ත විය හැකි ද වැනි ප්‍රශ්න අප විසින් මතු කළ යුතු යැයි" ඇය ප්‍රකාශ කළා ය[184]. එහෙත් දශක ගණනාවක් තිස්සේ ප්‍රධාන ධාරාවේ ආර්ථික විද්‍යාඥයෝ ඇගේ අදහස් රැඩිකල් යයි මුග්ධ ලෙස නො සලකා හැරිය හ.

183 Meadows, Donella H., Dennis L. Meadows, Jørgen Randers, and William W. Behrens III. (1972). The Limits to Growth. New York: Universe Books.

184 Meadows, D. (1999) 'Sustainable Systems'. Lecture at the University of Michigan, 18 March 1999, https://www.youtube.com/watch?v=HMmChiLZZHg

සාතීය වර්ධනය - *Exponential Growth*




එහෙත් ඇත්තටම ඇගේ අදහස් කුස්නෙට්ගේ අදහස්වල දෝංකාරයක් බඳු විය. වර්ධනය ගැන කතා කරන විට අප වර්ධනයේ ගුණාත්මක භාවය සහ ප්‍රමාණාත්මක භාවය, වර්ධනයේ මිල සහ ලැබෙන ප්‍රතිලාභ සහ වර්ධනයේ කෙටි කාලීන සහ දිගු කාලීන ඵල විපාක අතර ඇති වෙනස්කම් සිත්හි තබා ගත යුතු යැයි කුස්නෙට් 1960 ගණන්වල දී පවසා තිබුණි. වර්ධනය තවතවත් වැඩි කර ගැනීම ගැන සිතන්නේ නම් වැඩි වර්ධනයක් යනු මොකක් ගැනද කුමක් උදෙසා ද යන කරුණු පැහැදිලි විය යුතු බව කුස්නෙට් පැවසීය.

2008 මූල්‍ය කඩාවැටීම, 2011 ඔක්‍යුපයි ව්‍යාපාරයේ ගෝලීය දෝංකාරය, දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් පියවර ගැනීම පිණිස වැඩිවන මහජන බලපෑම ආදිය නිසා තරමක් අන්ද මන්ද වී ඇති දේශපාලනඥයෝ සමාජ හා ආර්ථික ප්‍රගතිය ගැන වඩා ආකර්ෂණීය දැක්මක් ප්‍රකාශ කිරීමට උචිත වදන් මොනවා දැ'යි සෙවීම ආරම්භ කර ඇති බව රේවර්ත් පවසයි. එහෙත් ඔවුහු ඒ හැම විට ම අර එක ම පිළිතුර වන 'වර්ධනය' නමැති කෝකටත් තෛලය කරා ආපසු කැරකී යති. ඔවුන් අතින් සිදු වන්නේ වර්ධනය නමැති ඒ සාර්වත්‍රික නාම පදයට විශේෂණ පද මඟින් උත්කෘෂ්ට අභිලාෂ වැලක් එකතු කිරීම පමණ ය. දරිද්‍රතාව, දේශගුණ විපර්යාසය සහ වැඩි වන සමාජ විෂමතාව මැද මූල්‍ය අර්බුදය නිසා අවදි වූ කෙනෙකුට දේශපාලනඥයන්ගේ ඒ කියුම් කෙරුම් දුටු විට මතක් වන්නේ

සාමාන්‍ය සැන්විච් එකක් මිල දී ගැනීමට ගිය කෙනෙකුට එය මැදට දැමීම පිණිස තෝරා ගැනීමට ඇති විවිධාකාර පිරවුම් දැක කුමක් තෝරා ගනිම් දැ'යි උභතෝකෝටිකයකට පත් වී වික්ෂිප්ත වූ අයෙකුට සිදු වන දෙයයි. අද ඔබ කැමති මොන ජාතියේ වර්ධනයකට ද යනුවෙන් රේවර්ත් සෝපහාසයෙන් විමසන්නේ ඒ නිසා ය.

ඒ අනුව ඇන්ජලා මර්කල් තිරසාර වර්ධනයක් ගැන කතා කළා ය. ඩේවිඩ් කැමරූන් ද සමබර වර්ධනයක් ගැන කතා කළේ ය. බැරැක් ඔබාමා තමා කැමති දිගුකාලීන ව කල් පවතින වර්ධනයකට බව කීවේ ය. යුරෝපා කවුන්සිලයේ සභාපති හොසේ මැනුවෙල් බරොස්සෝ හුරුබුහුටි, තිරසාර, අන්තර්ග්‍රහනීය වර්ධනයක් ගැන කතා කළේ ය. ලෝක බැංකුව පොරොන්දු වන්නේ අන්තර්ග්‍රහනීය හරිත වර්ධනයකි. ඉතින් තවත් ඒවගේ රස ජාති තිබේ ද?. සමහරක් විට ඔබේ කැමැත්ත වන්නේ සාධාරණ, යහපත්, හරිතමය, කාබන් අඩු, වැඩි වගකීමකින් යුතු ශක්තිමත් වර්ධනයකට විය හැකියි. කෙසේ වෙතත් ක්‍රියා පදය වසයෙන් වර්ධනය තෝරා ගන්නා තාක් ඔබට අන් අයගෙන් ණයට ගත් කැමති විශේෂණ පදයක් යොදා ගත හැකි යැ'යි රේවර්ත් සිය උපහාසය තීව්‍ර කරයි.

ඉතින් අප සිනාසිය යුතු ද? නැතහොත් ඇඬිය යුතු ද? ඉතිහාසයේ මේ සා තීරණාත්මක අවස්ථාවක දී ආර්ථික චින්තනයට නිසි ඉදිරි දැක්මක් නො මැති වීම පිළිබඳ ව ඇත්ත වසයෙන් ම අපි ඇඬිය යුතු වෙමු යැයි කේට් පවසයි. ඉන් පසු අප සිනාසිය යුත්තේ දළ දේශීය නිෂ්පාදිතය උත්කර්ෂණයට ලක් කොට එයට සුජාතභාවය ලබා දීමට දේශපාලනඥයන් මොන තරම් විශේෂණ පද සංඛ්‍යාවක් යොදා ගන්නවා ද යන කාරණය සම්බන්ධයෙනි. වර්ධනයට ඔබ්බෙන් යන කිසියම් දෙයක් අවශ්‍ය බව ඔවුන්ට දැනුනත් ඒ කුමක් දැයි පැහැදිලිව විස්තර කිරීමට සුදුසු වචන සොයා ගැනීමේ අපහසුවකින් ඔවුන් පෙළෙන බව පෙනේ. ආර්ථික විද්‍යාඥයන් එවැනි වචන ඔවුන්ට සපයා නො දීම ද ඊට එක් හේතුවකි. ඉතින් අපට හැඬීමත් සිනාසීමත් යන දෙකම එක විට කළ හැකි වුවත් ඇත්තට ම

අවශ්‍ය වන්නේ කුමක් ද කියා සාකච්ඡා කිරීම වඩාත් වැදගත් යැයි රේවර්ත් සඳහන් කරයි.

ආර්ථික වර්ධනය ප්‍රතිපත්ති ප්‍රකාශනවල මූලික අරමුණ බවට පත්වීමත්, එය වඩාත් හොඳින් සාක්ෂාත් කර ගත හැක්කේ නියාමනය අත්හැර දැමීමෙන් ය යන විශ්වාසයත් සැබවින් ම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යෑමට හේතු වන්නට ඇතැ'යි යන්න කිසියම් කාලසීමාවක් සම්බන්ධයෙන් පිළිගත හැකි වුවත් එය බලාපොරොත්තු නො වූ ප්‍රතිවිපාක ඇති කිරීමට හේතු වූ බවත් අප අමතක නො කළ යුතු ය. මේවා අතරට 1970 ගණන්වල සිට නිරන්තරයෙන් වැඩිවන සමාජ අසමානතාව සහ ආර්ථික වර්ධනය අවධාරණය කරමින් ප්‍රගතිය නිර්ණය කිරීමේ දී තරඟකාරිත්වයට ලැබුණු ප්‍රමුඛත්වය නිසා ආතතිය, රෝග පීඩා වැනි තත්වයන් වැඩි වීම ද දක්නට ලැබුණි. උදාහරණයක් ලෙස වසංගත රෝග, මානසික ආබාධ, මත් ද්‍රව්‍ය භාවිතය, ස්ථූලතාව *(දරුවන්ගේ ස්ථූලතාද ඇතුළුව)* දියවැඩියාව හා රුධිර පීඩනය වැනි ආබාධවල සැලකිය යුතු වැඩි වීමක් දක්නට ලැබීම සෞඛ්‍යය වාර්තාවලින් මනාව තහවුරු වී තිබේ. බොහෝ විශේෂඥයින්ට අනුව බටහිර රටවල ජීවිතාපේක්ෂා කාලය උපරිමයට පැමිණ ඇති බැවින් අධි සංවර්ධනය සහ ඉසුරුමත්කම සම්බන්ධ මෙවැනි ගැටලු දැනට වඩා වැඩි අවධානයකට ලක් විය යුතු ව තිබේ.

රටක ආර්ථික සාර්ථකත්වය මැනීම සඳහා *GDP* හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පිළිබඳ මිම්ම යොදා ගැනීමෙන් සෑහීමකට පත් නො වීමත් මූල්‍යමය, දේශපාලනමය හ සමාජමය වසයෙන් *GDP* මිම්මට ලොල් වීමත් යනු දෙකකි. සමාජ ප්‍රගතිය නිර්වචනය කිරීමට ආර්ථික වර්ධනය පිළිබඳ මිම්මක් අවශ්‍ය ම ද නැද්ද යන්න ගැන අප එතරම් කලබල විය යුතු නැත. ආර්ථික වර්ධන වේගය වැඩි වීමේ අවශ්‍යතාව ගැන අප තුළ තිබිය යුත්තේ ඇදහිල්ලක් වැනි විශ්වාසයක් නො ව කිසියම් ආකාරයක අඥෙයවාදී *(Agnostic)* ආකල්පයක් බව කේට් රේවර්ත් ඇගේ *Doughnut Economy* කෘතියෙන්

යෝජනා කරයි. (අඥෙයවාදියා යන්න යොදා ගැනෙන්නේ දෙවියන් වහන්සේ යනුවෙන් කෙනෙකු සිටී ද නො සිටී ද යන විවාදයේ දී ඒ ආස්ථාන දෙකම සම්බන්ධයෙන් කිසිදු පැත්තක් නොගන්නා තැනැත්තාටයි.) වර්ධන වේගය ගැන අපේ වැටහීම ද එබඳු විය යුතු බව කේට් රේවර්ත් අදහස් කරයි. එසේ අඥෙයවාදී වීම වර්ධනය ම ඉල්ලා සිටින හා වර්ධනය මත ම යැපෙන අපේ ආර්ථිකය හා සමාජය දේශපාලනමය වසයෙන් ව්‍යුහාත්මක පරිවර්තනයකට ලක් කිරීමේ අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටීමක් වන බව ද කේට් සඳහන් කරයි.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය මෙන් ම ආර්ථිකය නිරූපණය කරන විවිධාකාර ප්‍රස්තාර සටහන් ආර්ථික විද්‍යාවේ දී දක්නට ලැබේ. නිදසුනක් ලෙස ලෙනින්ගේ අනුග්‍රහය ලැබ සෝවියට් පාලනයේ නව ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට කටයුතු කළ, පසුව 1938 දී ස්ටාලින් විසින් මරණයට පත් කළ ආර්ථික විද්‍යාඥයෙකු වූ නිකොලායි කොන්ඩ්රාටීව් හඳුන්වා දුන් ආර්ථික චක්‍ර පිළිබඳ ප්‍රස්තාර හුවා දැක්විය හැකි ය. කොන්ඩ්රාටීව් තර්ක කළ අන්දමට ධනවාදී ප්‍රගතිය රේඛීය දෙයක් නො ව ඉහළ පහළ යන ආර්ථික චක්‍රවලින් යුක්ත ය. ඒ නිසා ධනවාදය එය තුළ ම ඇති ප්‍රතිවිරෝධ නිසා මුළුමනින් ම කඩා වැටෙන බව අනුදත් සම්භාව්‍ය මාක්ස්වාදී මතයට කොන්ඩ්රාටීව් එකඟ නොවීය. ඔහුට අනුව හැම ධනවාදී ආර්ථික චක්‍රයක් ම ක්‍රියා කරන්නේ වසර 25ක් පමණ වන කාලයක ඉහළට නැගීමක් සහ තවත් වසර 25ක පමණ කාලයක් පහළට රූටා යෑමක් ද ඇතිවෙන ආකාරයට යි. එහි දී ආර්ථිකය ඉහළට නැගීමට හේතු වන්නේ දියුණු තාක්ෂණය සහ සාර්ථක ආයෝජනයි. කෙසේ වෙතත් පහළට රූටා යෑමේ ප්‍රතිඵල වන්නේ ආර්ථික අවපාතය, රැකියා විරහිත භාවය, සමාගම් බංකොලොත් වීම් සහ ණය ලබා ගැනීමට හෝ දීමට නො හැකි වීම යි.

කොන්ඩ්රාටීව්ගේ න්‍යාය උපයෝගී කර ගත් ඔස්ට්‍රියානු ජාතික ජෝසප් ෂුම්පිටර් නමැති ආර්ථික විද්‍යාඥයා පළ කළ අදහස්වලට අනුව ධනවාදයේ ඉතිහාසය 1790 සිට1848 දක්වාත්, 1840 සිට1890

ගණන්වල මැද භාගය දක්වාත්, 1890 ගණන්වල මැද භාගයේ සිට 1945 දක්වා සහ 1945 සිට 2008 දක්වාත් වසයෙන් ආර්ථික චක්‍ර හතරකට වෙන් කළ හැකි ය. අවසානයට සඳහන් කළ හතරවැනි ආර්ථික චක්‍රය ඉහළ නැගීමේ ආරම්භය බොහෝ දුරට සනිටුහන් කළේ 1947 දී ට්‍රාන්සිස්ටරය හඳුන්වා දීමත් සමඟයි. එහෙත් ඉන් අවුරුදු ගණනාවකට පසු 1973 අරාබි රටවල් ඛනිජ තෙල් සම්බාධක හඳුන්වා දීමත් සමඟ බටහිර ආර්ථිකය පසුබෑමකට හෙවත් අවධමනයකට *(recession)* ලක් විය. එය හතර වැනි ආර්ථික චක්‍රයේ පහළට රූටා යෑමේ ආරම්භය ලෙස සැලකිය හැකියි.

1945 සිට ම බටහිර ආර්ථිකය කිසිදු පසුබෑමකට ලක් නොවී තිබුණු නමුත් 1973 සිට 2008 මූල්‍ය අර්බුදය සිදු වන තෙක් වූ කාලය තුළ ආර්ථික අවධමන *(recessions)* හයක් බටහිර ලෝකයේ සිදු ව තිබේ. කෙසේ වුණත් ඉහළ පහළ යන ආර්ථික චක්‍ර පිළිබඳ මේ රටාවේ කිසියම් කැඩීමක්1990 ගණන්වල දී හතරවැනි චක්‍රය අවසන් වීමට ආසන්න ව සිදු වූ බවත් ඊට හේතුව නව අන්තර්ජාල තාක්ෂණය, ජංගම දුරකථන පදනම් කරගත් සංනිවේදනය සහ වඩා ජාලගත වූ ගෝලීය වෙළඳපොළක් වැනි පස්වැනි ආර්ථික චක්‍රයකට උචිත මූලිකාංග බිහි වීම බව ඇතැම් ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස විය. අවුරුදු 7-10ත් අතර කාලාන්තරවල වරින් වර උන්නතිය *(boom)* හා අවනතිය *(bust)* ඇති වෙතැ'යි සැලකෙන මේ ආර්ථික චක්‍ර පිළිබඳ ප්‍රස්තාර ආර්ථික විද්‍යාව විද්‍යාවක් ලෙස නිරූපණය කිරීමට කළ තවත් වෑයමක් ලෙස සැලකිය හැකි යි. එහෙත් කොන්ඩ්රාටීව් හඳුන්වා දුන් මේ ආර්ථික චක්‍ර පිළිබඳ න්‍යාය නව ලිබරල්වාදයේ අසමත්කම නිසා ඇනහිට තිබෙන සෙයක් පෙනෙන බව පශ්චාත් ධනවාදය ගැන පෝල් මේසන් ලියා ඇති *Post Capitalism: A Guide to Our Future (*2016*)* කෘතියේ පෙන්වා දී තිබේ.

කෙසේ වෙතත් පසුගිය අතීතයේ ශතවර්ෂ කිහිපයක් තුළ දීර්ඝකාලීන ව දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වෙනස් වූ අන්දම හෝ ඉදිරි ශතවර්ෂ කිහිපයක දී වෙනස් වීමට හැකි

අන්දම පිළිබිඹු කරන ආර්ථික ප්‍රස්තාර දැක ගැනීම උගහට ය. ඊට එක හේතුවක් වන්නේ එලෙස දීර්ඝකාලීන ව ආර්ථික වර්ධනය ප්‍රක්ෂේපණය කිරීම ආර්ථික විද්‍යාඥයන්ට කිසි සේත් ම කළ නො හැකි කටයුත්තක් වන බැවිනි.

1950 ආර්ථිකයේ ශීඝ්‍ර වර්ධනය ඇතිවීමත් සමඟ ගෝලීය මට්ටමෙන් ගත් විට දළ ගෝලීය නිෂ්පාදිතය මේ වන විට පස් ගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. ආර්ථික විද්‍යාඥයින්ගේ පුරෝකථනවලට අනුව ඉදිරි වසර කිහිපය තුළ වර්ධනය 3-4% දක්වා ඉහළ යා හැකි ය. එහෙත් ගෝලීය ආර්ථික වර්ධනය මනිනු ලබන්නේ එකිනෙකට බෙහෙවින් වෙනස් දෙසීයකට ආසන්න රටවල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගවල එකතුවේ සාමාන්‍ය අනුව ය. එම රටවල් අතරින් වර්ධන වේගය 7%-10% දක්වා ඉහළ අගයක් ඇති කාම්බෝජය සහ ඉතියෝපියාව වැනි අඩු ආදායම් ලබන රටවල් මෙන් ම වර්ධන වේගය 0.2%ක් තරම් අල්ප වූ ජපානය සහ ප්‍රංශය වැනි අධි-ආදායම් ලබන රටවල් ද වෙති.

ඝාතීය වර්ධනය *(exponential growth)* යනුවෙන් හැඳින්වෙන්නේ නො කඩවා සිදු වෙන ඕනෑ ම වර්ධනයක් කල් යෑමේ දී දැක්වෙන ආකාරය නිරූපණය කරන දත්ත රටාවටයි. එය ඝාතීය ඵලය *(exponential function)* ලෙස ද හැඳින්වේ. උදාහරණයක් වසයෙන් පළමු වසරේ දී මීයන් දෙදෙනෙකුගෙන් ආරම්භ වී, දෙවැනි වසරේ 4 දෙනෙකුගෙන් ද තෙවැනි වසරේ දී 16 කින් හා සිව්වැනි වසරේ දී 256 කින් ආදී වසයෙන් හැම වසරක දී ම දෙකේ බලයකින් වැඩිවන වර්ධනයක් ඝාතීය වර්ධනයක් ලෙස හැඳින්විය හැකි ය. තර්කානුකූලව බැලුවොත් පාලනයකින් තොර ව සිදු වන ඕනෑම ඝාතීය වර්ධනයක් අප හිතා ගත නො හැකි තරම් ඉක්මනින් අනන්තයට ගමන් කරනු ඇත. අපේ මොළ හැඩ ගැසී ඇත්තේ ඉලක්කම් එකතු කිරීමට මිස ඒ වායේ දෙකේ බල ගුණිතය හෝ ඊට වැඩි බල ගුණිත ගණනය කිරීමට නො වේ. මනුෂ්‍ය වර්ගයාගේ ලොකු ම දුර්වලකම ඝාතීය ඵලය තේරුම් ගැනීමට නො හැකි වීම යයි න්‍යෂ්ටික භෞතික විද්‍යාඥයෙකු

වන අල් බාර්ට්ලට් වරක් පැවසීය. එයට හේතුව පොකුණක ඇල්ගී, බැංකුවක ණය, හෝ ජාතියක බල ශක්ති භාවිතය ආදී ඕනෑම දෙයක් වේගයෙන් සහ ප්‍රමාණයෙන් යන දෙකෙන් ම නො කඩවා වැඩි වීම අප සාමාන්‍යයෙන් බලාපොරොත්තු වෙනවාට වඩා විස්මය ජනක ලෙස වැඩි වීම යයි ඔහු පෙන්වා දුන්නේ ය.

ආර්ථිකයේ වර්ධන වේගය ගැන මන්මත් වී සිටින අය ද ආර්ථිකයේ නො කඩවා වර්ධනය වීමක් ප්‍රක්ෂේපණය කරන්නට තැත් කරන විට වැටිය හැකි අමාරුව ගැන අවදියෙන් සිටිය යුතු ය. උදාහරණයක් ලෙස වසර 2000 දී පැවති ගෝලීය ආර්ථිකය වසරකට 3% සාමාන්‍ය වර්ධන වේගයකින් ව්‍යාප්ත වී යැයි සිතමු. මෙවැනි අඩු මට්ටමක වර්ධන වේගයකින් ව්‍යාප්ත වුව ද ගණනය කර බැලූ විට හැම අවුරුදු විසි තුනකට වරක් එම ව්‍යාප්ත වීම දෙගුණයක් විය යුතු ය. එහි තේරුම ශත වර්ෂය මැද වන විට එනම් මිනිසෙකුගේ ආයු කාලයෙන් අඩක දී ආර්ථිකය 2000 දී පැවතුණාක් මෙන් සිව් ගුණයකින් වැඩිවන බවයි. වර්ධන වේගය නො කඩවා ඒ අන්දමින් ම පැවතුණ හොත් ශත වර්ෂය අවසන් වන විට ආර්ථිකය වසර 2000 තිබුණාක් මෙන් විසි ගුණයකින් වැඩි වී තිබිය යුතු ය. 2000 දී කොයි තරම් මහත් ගෝලීය ආර්ථිකයක් පැවැතියේ දැ'යි සැලකුවොත් ඊට වඩා විසි ගුණයකින් විශාල රේඛීය ආර්ථිකයක් පවත්වා ගැනීමට කෙබඳු සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය දැයි සලකා බැලිය යුතු ය. ගෝලීය ආර්ථික වර්ධනය 3% ප්‍රමාණයට පැවතීමෙන් ගෝලීය පරිසරයට හා ස්වාභාවික සම්පත්වලට දැනටමත් සිදු ව ඇති හානිය සලකා බැලුවොත් එ වැනි අසාහාය ප්‍රමාණයකින් වැඩි වෙන දැවැන්ත වර්ධනයක් සහ අත්‍යන්ත පරිභෝජනයක් දරා ගැනීමට පෘථිවියට හැකි වේද යන ප්‍රශ්නය මිනිස් පැවැත්ම සම්බන්ධයෙන් අතිශයින් තීරණාත්මක වනු ඇත. ඒ අන්දමින් තවත් වසර 100 ක් ගත වූ විට ආර්ථිකය 370 ගුණයකින් ද ඉනුත් වසර 100කට පසු ආර්ථිකය 7000 ගුණයකින් ද විශාල වනු ඇත[185]. එය අපේ සියලු ආකාරයේ

185 Hickel, Jason, (2021) *Less is More: How De-growth will Save the Worlds,* London: William Heinemann, p. 114 (KE)

පරිකල්පන අවඥාවට ලක් කරයි. වර්ධන වේගය ගැන මන්මත් වීම එබඳු ය.

ඇමෙරිකානු ආර්ථික විද්‍යාඥයෙකු වූ ඩබ්. රොස්ටොව් *The Stages of Economic Growth* නමැති සිය ප්‍රකට කෘතියේ දියුණු වීමට තැත් කරන හැම රටක් ම ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් නිශ්චිත අවධි පහක් පසු කළ යුතු ය යන මතය ඉදිරිපත් කළේ ය. නූතනීකරණ න්‍යාය *(Modernization Theory)* යනුවෙන් හැඳින්වෙන එම මතයට අනුව රටක සංවර්ධනය පහත සඳහන් අනුක්‍රමික අවධිවලින් යුක්ත වෙයිඃ

1. සාම්ප්‍රදායික සමාජය
2. උත්ප්ලවය *(take off)* සඳහා අවශ්‍ය වන කොන්දේසි (උත්ප්ලවය යනු ගුවන් ගත වීම වැනි රූපකයකින් නිරූපණය වන අන්දමින් දියුණුව කරා පියෑඹීමට පියවර ගැනීමයි)
3. උත්ප්ලවය *(take off)*
4. පරිණත වීමට ගන්නා ආයාසය
5. අධිපරිභෝජන අවධිය

මේ අවධි පහ අනුව ආර්ථික වර්ධනය නමැති ගමන මුලින් ම ඇරඹෙන්නේ පාරම්පරික යැපුම් කෘෂිකර්මයේ සීමාවල සිර ව සිටි සාම්ප්‍රදායික සමාජවලිනි. එවැනි සමාජ තුළ ආර්ථික වර්ධනයේ උත්ප්ල්වයීය *(take off)* තත්වය ඇතිවෙන්නේ නූතනීකරණය හෙවත් ආර්ථික වර්ධනය යනු ජාතික අභිමානය පමණක් නො ව පුද්ගලික ලාභය, පොදු යහපත සහ තම දරුවන්ට වඩා යහපත් ජීවන තත්වයක් ඇති කිරීමට අත්‍යවශ්‍ය වන කොන්දේසියකි යන අදහස පෘථුල සමාජය විසින් වැළඳ ගනු ලැබීමත් සමඟ ය. ඒ අනුව විවෘත වන බැංකු, ආයෝජනය කරන ව්‍යවසායකයන්, ගොඩ නැගෙන පරිවහන හා සංනිවේදන පද්ධති, නූතන ආර්ථිකයකට අවශ්‍ය අධ්‍යාපනය සමඟ නව ජාතිකත්වයක් ද ගොඩ නගන නූතන රාජ්‍ය යන්ත්‍රණය බිහි වෙන බව රොස්ටොව්ගේ මතය විය.

රොස්ටොව්ට අනුව මේ සියලු වෙනස්වීම් සාම්ප්‍රදායික සමාජ නූතන සමාජ බවට පත් කරන ගුවන් ගමනක ගුවන් යානය ගුවන් ගත වීමේ අවස්ථාව හා සමාන උත්ප්ලවීය *(take off)* කටයුතු ය. ඒ නිසා පොළොවේ සිට ගුවන් ගත කිරීමේ අවස්ථාවේ දී ඒ සඳහා ගුවන් යානයකට අධික බලශක්තියක් අවශ්‍ය කරනවා මෙන් ම ආර්ථිකයකට ද පියසර මට්ටමට එළඹීමට ශක්තිය ලබා දීම පිණිස සැලකිය යුතු ආයෝජනයක් කළ යුතු ය. එහි දී ආර්ථික වර්ධන වේගය යන්න ගුවන් යානය අනුක්‍රමයෙන් ඉහළට නංවන ප්‍රමාණයට සමරූපී ය. එහෙත් මේ ගුවන් යානය ඉහළට යෑමක් මිස යා යුතු තැනක් හෝ බෑ යුතු ගුවන් තොටුපලක් ගැන හෝ රොස්ටොව්ට අදහසක් නො තිබිණි. ඒ අනුව රොස්ටොව්ගේ ආර්ථික වර්ධනය සදාකාලික අධිපරිභෝජන කක්ෂයක කක්ෂගත විය යුතු ය. ජනාධිපති ජෝන් එෆ් කෙනඩි රජයේ ආර්ථික උපදේශකයෙකු වසයෙන් කටයුතු කළ රොස්ටොව් ගේ මතය වූයේ දිගින් දිගටම 5% වර්ධන වේගයක් පවත්වා ගෙන යෑමට අවශ්‍ය පහසුකම් සැපයීම ඇමෙරිකානු රජයේ ආර්ථික කාර්යය විය යුතු බව ය.

කෙසේ වෙතත් ආර්ථික වර්ධනය යනු සදාකාලික ත්වරණයක *(acceleration)* නො නැවතී යන ගුවන් ගමනක් නො වේ. දැනට ඇති තත්වයට අනුව ආර්ථික ගමන යා හැක්කේ පෘථිවිය මත ඇති සම්පත් උපයෝගී කර ගැනීමෙනි. ඒවා අසීමිත සම්පත් නො වේ. ඒ නිසා වර්ධන වේගය පිළිබඳ නොකඩවා ඉහළ යන ප්‍රස්තාරයට යම් අවස්ථාවක දී ඒ ඉහළ යෑම නතර කොට අඩු ම වසයෙන් ප්‍රස්තාරයේ $X$ අක්ෂයට සමාන්තරව ගමන් කිරීමට සිදු ව තිබේ. එය වර්තමානයේ ඉහළ ආදායම් ලබන රටවල දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික වර්ධන වේගයේ මන්දගාමී බවින් එක්තරා දුරකට පෙන්නුම් කරයි. කෙසේ වෙතත් වර්ධන වේගයේ මේ මන්දගාමී බව සමඟ ඉහළ ආදායම් ලබන රටවල අඩු ආදායම් සහ අධික ආදායම් ලබන ජන කොටස් අතර ආදායම් පරතරය ද බෙහෙවින් වැඩි වෙමින් තිබේ. ගෝලීය මට්ටමෙන් ගණන් බැලූ විට 1980වේ සිට අඩු ම ආදායම ලබන 50%

ක ජනගහනයක ඉපයීම්වල එකතුව මෙන් දෙගුණයක ආදායමක් වැඩිම ආදායම ලබන 1% විසින් අත්පත් කරගත් බව 2018 පළ වූ ලෝක අසමානතා වාර්තාව *(World Inequality Report)* පෙන්වා දෙයි.[186]

රොස්ටොව්ගේ මතයට අනුව සාම්ප්‍රදායික යැයි සැලකූ අඩු ආදායම් ලබන රටවල් උත්ප්ලවීය *(takeoff)* අවධියකට එළඹීමට නම් අවශ්‍ය තරම් ආර්ථික බලයක් මුලදී ම ලබාගත යුතු ය. එය කළ හැකි වන්නේ සැලකිය යුතු ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කිරීමට හැකි කොන්දේසි පවත්වා ගැනීමෙන් සහ විදේශාධාර වලිනි. රොස්ටොව්ගේ මේ මතය 1980 ගණන් දක්වා ම ගෝලීය උතුර හා දකුණ අතර පැවති සංවර්ධන සහයෝගිතා එළඹුමට පදනම විය. කෙසේ වෙතත් නවීකරණය වීම සඳහා ඉහළ ආදායම් ලබන රටවල් අනුගමනය කළ සියලු අවධි ඒ ආකාරයෙන් ම පසු කර යෑමේ අවශ්‍යතාවක් අඩු ආදායම් ලබන රටවල්වලට ඇති නො වේ. මන්ද බටහිර රටවල් මෙන් වාෂ්ප බලය යොදා ගැනීමෙන් පටන් ගෙන ගල් අඟුරු, ඛනිජ තෙල් වැනි දූෂණ කාරක ඉන්ධන මත ගොඩනැගුණු කාර්මිකකරණයට ප්‍රවිෂ්ට වීම වෙනුවට වඩා කාර්යක්ෂම නවීන බලශක්ති විසඳුම් මත පරිසර හිතකාමී නවීකරණයක් බිහි කිරීමේ පුරෝගාමීන් වීමට ගෝලීය දකුණේ රටවලට හැකියාව ඇති බැවිනි. ඒ නිසා ගෝලීය දකුණේ රටවල් නවෝත්පාදනය දිරිගැන්විය හැකි, නව තාක්ෂණික විසඳුම් සොයා ගත හැකි නිර්මාණශීලී උගත් යොවුන් පරපුරක් බිහි කිරීමට හැකි යාවජීව අධ්‍යාපනයක් සඳහාත් ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සඳහාත් වැඩි වැඩියෙන් ආයෝජනය කළ යුතු ය.

වර්ධනය සම්බන්ධයෙන් අප අමතක නො කළ ම යුතු එක් වැදගත් කරුණක් වෙයි. එය නම් සමස්තයක් ලෙස ගත් විට සංවර්ධනයේ නාමයෙන් සියලු ම රටවල් විසින් දැනටමත් ගෝලීය පරිසර පද්ධතියට පටවනු ලැබ ඇති බර පෘථිවියට දරා ගත නො හැකි තරම් වැඩි බවයි. ඒ නිසා අප හැම කෙනෙකුට ම ස්වීඩනයේ,

186 https://wir2018.wid.world/files/download/wir2018-full-report-english.pdf - Retrieved on 17th July 2021

කැනඩාවේ සහ එක්සත් ජනපදයේ ජීවත් වන මධ්‍යම පංතිකයෙකු මෙන් ජීවත් වීමට අවශ්‍ය නම් තවත් පෘථිවි හතරක් වත් අවශ්‍ය බව කේට් රෙවර්ත් පවසයි.

මේ සන්දර්භය යටතේ වර්ධන වේගය පිළිබඳ විවාදය "වර්ධනය වෙමින් නො නැවතී ඉහළට පියාඹමු' සහ "පියැඹුවා ඇති. ගොඩ බෑම පිණිස පහත් කිරීම පටන් ගනිමු" යන අන්ත දෙකට ධ්‍රැවිකරණය වෙමින් තිබේ. මේ අන්ත දෙක නියෝජනය කරන අය අතර ඇති වෙනස බැලූ බැල්මට තාක්ෂණික කරුණුවලට සීමා වී තිබේ. උදාහරණයක් ලෙස ප්‍රමාණවත් තරම් පුනර්ජනනීය බල ශක්තිය යොදා ගැනීමට හැකි වන තරමට සූර්ය බල ශක්තියේ ආයෝජන මිල පහළ බසී විද, චක්‍රීය ආර්ථිකයක් ඇත්ත වසයෙන් ම කොයි තරම් කාර්යක්ෂම වේද සහ ඩිජිටල් ආර්ථිකය, ආර්ථික වර්ධනයට කොයි තරම් දායකත්වයක් ලබා දේවි ද වැනි තාක්ෂණික ප්‍රශ්න ඒ අතර ප්‍රධාන වේ. එහෙත් දේශපාලන තලයේ දී මේ අන්ත දෙක ඊට වඩා දෘෂ්ටිවාදී ස්වරූපයක් ගනී. ඒ අනුව වර්ධන ලෝලීන්ගේ ස්ථාවරය වන්නේ ආර්ථික වර්ධනය යනු තවමත් ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් වන බවයි. එනිසා වර්ධනය දිගින් දිගටම කළ හැකි දෙයකි යන්න වර්ධන ලෝලීන්ගේ ස්ථාවරය වන අතර වර්ධන විරෝධීහු වර්ධනය යනු තවදුරටත් පවත්වා ගෙන යා හැකි දෙයක් නො වේ, ඒ නිසා එය ප්‍රගතියට අත්‍යවශ්‍ය කොන්දේසියක් නො විය යුතු ය යන ස්ථාවරය දරයි.

*In Defense of Economic Growth* කෘතිය ලියූ ආර්ථික විද්‍යාඥ විල්ෆ්‍රඩ් බෙකර්මන් පවසන අන්දමට "ප්‍රතිපත්තිමය අරමුණක් ලෙස වර්ධනය අතහැර දැමීමට සිදුවුණ හොත් ප්‍රජාතන්ත්‍රවාදය ද අතහැර දැමීමට අපට සිදු වනු ඇත. හිතාමතාම වර්ධනය අවහිර කිරීම සමාජ ප්‍රගමනයට අත්‍යවශ්‍ය දේශපාලන සමාජීය පරිවර්තන සිදු කිරීම සම්බන්ධයෙන් නම් ඉතා අහිත කර වනු ඇත".[187] 'ආර්ථික

187 "Beckerman, W. (1972) In Defense of Economic Growth. London: Jonathan Cape, pp. 100–101."

වර්ධනය දේශපාලන අවශ්‍යතාවයකි' යන බෙකර්මන්ගේ අදහස බොහෝ ආර්ථික හා දේශපාලන චින්තකයන්ගේ සුපුරුදු ආස්ථානය බවට පත් ව තිබේ. එම අදහස ම අනුගමනය කරන තවත් ආර්ථික විද්‍යාඥයෙකු වන බෙන්ජමින් ෆ්‍රීඩ්මන්ඩ්ට අනුව බහුවිධත්වය ගරු කිරීම, සමාජ සචලතාව *(social mobility)*, සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදයට කැපවීම සහ සමාන අවස්ථා විවෘත කර දීම වැනි සාධක ඇති කිරීමට අවශ්‍ය වන්නේ ඉහළ යන වර්ධනයකට වඩා නො නවත්වා පවත්වා ගෙන ගිය හැකි වර්ධනයකි. එනිසා ආර්ථික වර්ධන වේගය පිරිහී යෑම යනු මානව ප්‍රගමනයට සහ සමාජ දේශපාලන ස්ථාවරභාවයට ද හානිදායක විය හැකි ය යන අදහස සමඟ ඔහු ද එකඟ වෙයි. එසේ 'වර්ධනය යනු දිගින් දිගට ම පවතින දෙයකි' යන්න වෙනුවෙන් පෙනී සිටින ආර්ථික විද්‍යාඥයින් විසින් හුවා දක්වන තවත් කරුණක් වන්නේ ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමඟ වැඩි වැඩියෙන්  ස්වයංක්‍රියාකාරි රොබෝ යාන්ත්‍රික විසඳුම් යොදා ගැනීම මත ඇති වන දෙවැනි කාර්මික විප්ලවය නිසා දළ දේශීය නිෂ්පාදනය වැඩි වීමේ නව වර්ධන රැල්ලක් ඇතිවෙන බවයි.

මේ අතර හරිත වර්ධනයක් *(green growth)* වෙනුවෙන් පෙනී සිටින එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ යුරෝපා සංගමය වැනි ආයතන දළ දේශීය නිෂ්පාදිතයේ ග්‍රහණයෙන් පාරිසරික සංරක්ෂණයට අහිතකර හරිතාගාර වායු ජනනය කරන සාධක ඉවත් කිරීම ගැන කතා කරති. ඉන් ඇත්තට ම අදහස් වන්නේ වර්ධනය පවත්වා ගෙන යන අතර වර්ධනයට අවශ්‍ය සම්පත් භාවිතයේ දී මිරිදිය ජල භාවිතය, රසායනික පොහොර භාවිතය අරපිරිමැස්මකින් හා පරිසර හිතකාමී ව කර ගැනීමට සහ හරිතාගාර වායු විමෝචනය හැකි තරම් අවම කර ගැනීමට වැඩි අවධානයක් යෙදිය යුතු බවයි. මිරිදිය ජලය සහ බල ශක්ති භාවිතය සම්බන්ධයෙන් හරිතප්‍රිය විසඳුම් යොදා ගැනීමට කටයුතු යෙදීම අඩු ආදායම් ලබන රටවලට සැලකිය යුතු ඉදිරි පියවරකි.

එහෙත් තවදුරටත් දරා ගත නො හැකි තරම් සම්පත් ප්‍රමාණයක් වැය කිරීමට පෘථිවියට බල කෙරෙන අධිපරිභෝජනයක් සහිත ඉහළ ආදායම් ලබන රටවල් ගෝලීය උණුසුම ඉහළ නැංවීමට දායක වන කාබනික බලශක්ති භාවිතය ඇතුළු අනෙකුත් හේතු මුළුමනින් ම පාහේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන සාධකවලින් ඉවත් කළ යුතු ය. ඇතැම් රටවල මෙය සෙමින් සෙමින් හෝ සිදු වෙමින් තිබෙන බව කේට් රෙවර්ත් පෙන්වා දෙයි. ඇය විසින් උපුටා දක්වනු ලබන සංඛ්‍යා ලේඛනවලට අනුව2000 සහ 2013 අතර ජර්මනියේ දළ දේශීය ආදායම 16%කින් වර්ධනය වූ නමුත් ගෝලීය උණුසුම ඉහළ යෑමට තුඩු දෙන දූෂක හරිතාගාර වායුවක් වන කාබන් ඩයොක්සයිඩ් විමෝචනය 12% කින් අඩු විය. එමෙන් ම මහා බ්‍රිතාන්‍යයේ දළ දේශීය ආදායම එම කාලය තුළ 27% කින් වැඩි වූ නමුත් කාබන් ඩයොක්සයිඩ් විමෝචනය 9% කින් අඩු විය.

මේ දත්ත මඟින් එක්තරා දුරකට පෙන්නුම් කරන්නේ කාර්මිකකරණය නිසා අතීතයේ සිදුවූ පාරිසරික හානියෙන් බැහැර වීමේ හොඳ ප්‍රවණතාවකි. එහෙත් තවමත් අවශ්‍ය කරන තරමට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉහළ නැංවීම පෘථිවි පරිසරයට හානිදායක සාධකවලින් ඉවත් වී ඇතැ'යි සෑහීමකට පත් වීමට නො හැකි ය.

එසේ නම් නිරන්තරයෙන් වැඩි වෙන දළ දේශීය නිෂ්පාදනයක වර්ධනය පෘථිවි සම්පත් හා පරිසර භායන *(depreciation)* සාධකවලින් මුළුමනින් ම පාහේ ඉවත් කිරීම ඇත්තට ම කළ හැකි දෙයක් ද? හරිත වර්ධනයක හැකියාව වෙනුවෙන් පෙනී සිටින අයගේ මතය අනුව නම් තුන් ආකාරයක විසඳුම් මඟින් එය නියත ලෙස ම ඉටු කළ හැකි ය. ඒ සඳහා පළමුවෙන් ම අවශ්‍ය වන්නේ ඛනිජ තෙල් පදනම් කර ගෙන බලශක්තිය නිපදවීමෙන් සියලු රටවල් හැකි ඉක්මනින් ඉවත් වී සූර්ය බලය, සුළං බලය හා ජල බලය වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභව කරා යොමු කිරීම යි. දෙවනුව දැනට ඇති නිෂ්පාදනය කොට පරිභෝජනයෙන් පසු අපද්‍රව්‍ය ලෙස පරිසරයට එක් කරන දූෂණකාරක

රේඛීය ආර්ථිකය *(linear economy)* වෙනුවට පෘථිවි සම්පත්වලට දරා ගත හැකි, අපතේ යැවීම සහ හායනය *(depletion)* අවම කරන ප්‍රතිචක්‍රීකරණයක් *(recycling)* මත පදනම් වන චක්‍රීය ආර්ථිකයක් *(circular economy)* ඇති කර ගැනීමයි. තුන්වෙනුව ද්‍රව්‍යයමය නිෂ්පාදන වෙනුවට බුද්ධිමය නිෂ්පාදන විසින් මෙහෙයවනු ලබන හා පෘථිවියට බරක් නැති ඩිජිටල් නිෂ්පාදන හා සේවා ආර්ථිකයක් *(weightless economy)* මත පැවතෙන දළ දේශීය නිෂ්පාදනයක වර්ධනයක් කරා යොමු වීමයි.[188]

එහෙත් වැඩිවන වර්ධන වේගයකින් තවත් ඉහළට පියැඹීම නතර කොට වර්ධන යානය බිමට බෑමට කාලය පැමිණ ඇතැ'යි කියන අයගේ අදහස වන්නේ හරිත හිතකර එළඹුමක් අනුගමනය කිරීමෙන් වුවද වර්ධනයේ අනිසි විපාක අවම කර ගැනීමට ඉහළ ආදායම් ලබන රටවලට දැන් හැකියාවක් නැති බව යි. මෙය තේරුම් ගැනීමට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ගැන කලක් තිස්සේ පැවති උපකල්පන විමසා බැලිය යුතු ය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය වර්ධනය වීමට තුඩු දුන් හේතු විමසීම සඳහා අඩසිය වසක ආර්ථික දත්ත භාවිත කරමින් 1950ස් ගණන්වල දී රොබර්ට් සොලොව් විසින් විමර්ශනයක් සිදු කරන ලදී. එයට අනුව ආර්ථික වර්ධනය නිරූපණය කිරීමේ දී වර්ධනයට තුඩු දෙන ප්‍රාග්ධන වැය කිරීම් අනුව ශ්‍රමිකයන් සඳහා වියදම් කිරීමට සිදු වන ඒක පුද්ගල වැය ප්‍රමාණය 13%ක් බව සොයා ගැණිනි. ඒ අනුව ඉතිරි 87%ම වැය වන්නේ ආර්ථික වර්ධනය ඉහළ දැමීමට අවශ්‍ය දියුණු තාක්ෂණය යොදා ගැනීමේ සංක්‍රමණික කටයුතු සඳහා යැයි උපකල්පනය කිරීමට සොලොව්ට සිදුවිය.[189] රොබට් සොලොව්ගේ

188 "Bowen, A. and Hepburn, C. (2012) Prosperity with Growth: Economic Growth, Climate Change and Environmental Limits, Centre for Climate Change Economic and Policy Working Paper no. 109, and Brynjolfsson, E. (2013) 'The key to growth? Race with the machines', TED Talk, February 2013. https://www.ted.com/talks/erik_brynjolfsson_the_key_to_growth_race_em_with_em_the_machines?language=en"

189 Solow, R. (1957) 'Technical change and the aggregate production function', Review of Economics and Statistics 39: 3, p. 320.

සමකාලීනයෙකු වූ මෝසස් ඇබ්‍රොමොවිට්ස් මේ සා විශාල ප්‍රතිශතයක් තාක්ෂණ සංක්‍රමණයේ වැය ලෙස සැලකීම විවේචනය කළේ ය. රොබට් සොලොව් යොදා ගත් දත්ත හා උපකල්පනවලින් ඇත්ත වසයෙන් ම පෙන්නුම් කරන්නේ ආර්ථික වර්ධනයට හේතු වන ඇත්ත කරුණු ගැන අපේ ඇති නො දැනුවත්කම හැර වෙන කිසිවක් නො වන බව ඇබ්‍රොමොවිට්ස්ගේ මතය විය.

එතැන් සිට බොහෝ ආර්ථික විද්‍යාඥයෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට තුඩු දෙන ඇත්ත හේතු සොයා ගැනීමට උත්සුක විය. කේට් රේවර්ත් අදහස් කරන පරිදි පාරිසරික ආර්ථික විද්‍යාඥයෙක් වන බෙන්ජමින් වෝර් භෞතික විද්‍යාඥයෙකු වන රොබර්ට් අයර්ස් සමඟ එක් ව ආර්ථික වර්ධනය සම්බන්ධ 2009 දී ඉදිරිපත් කළ නව මොඩලය අලුත් පර්යාලෝකයකින් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන සාධක විමසිල්ලට ලක් කළ ආකාරය සලකා බැලීම මෙහි දී වැදගත් ය. වර්ධනය පිළිබඳ සිය මොඩලය ඉදිරිපත් කරමින් ඔවුහු එතෙක් සාම්ප්‍රදායික ව පිළිගැනුණු ප්‍රධාන නිෂ්පාදන සාධක වන ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන ද්විත්වයට තුන්වැනි ප්‍රධාන සාධකය ලෙස 'බලශක්ති උපයෝගීතාව' ද එක් කළහ. 'බලශක්ති උපයෝගීතාව' *(exergy)* යන්නෙන් මෙහි දී අදහස් වන්නේ අපතේ යැවීමකින් තොර ව ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා උපයෝගි කර ගත හැකි බලශක්ති ප්‍රමාණයයි. මේ අන්දමින් ශ්‍රමය, ප්‍රාග්ධනය හා බලශක්ති උපයෝගිතාව යන සාධක ත්‍රිත්වය ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ජපානය සහ ඔස්ට්‍රියාව යන රටවල විසිවැනි සියවසේ ඇති වූ වර්ධනය සම්බන්ධයෙන් ආදේශ කොට බැලූ විට වැටහී ගියේ බලශක්තිය කොයි තරම් කාර්යක්ෂමතාවකින් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත්තේ ද යන්න එම රටවල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට තීරණාත්මක ව හේතු වුණ බව යි. කොටින් ම ඉන් කියවෙන්නේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ යෑම ආර්ථික වර්ධනයේ ගාමක බලවේගය බව යි.

මේ අනුව පසුගිය ශත වර්ෂ දෙක තුළ ඉහළ ආදායම් සහිත රටවල ඇති වූ ඉමහත් ආර්ථික වර්ධනයට වැඩියෙන් ම දායක වුණේ ලාභයට සපයා ගත හැකි වූ ඛනිජ තෙල් බව පැහැදිලි ය. එක ඛනිජ තෙල් ගැලුමක අඩංගු බලශක්ති ප්‍රමාණය දින 47ක මිනිස් ශ්‍රමයට සමාන වන බව ගණන් බලා තිබේ. මේ අනුව එක දිනක් තුළ ගෝලීය වසයෙන් නිපදවන ඛනිජ තෙල් ප්‍රමාණය අදෘශ්‍යමාන වහලුන් බිලියන ගණනාවක් එක දිනක් තුළ ලබා දෙන ශ්‍රමය හා සමාන ය. එය එසේ නම් නුදුරු අනාගතයේ ඇති වෙන පශ්චාත් ඛනිජ තෙල් යුගයක දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය කෙබඳු ස්වරූපයක් ගනු ලබයි ද? අයර්ස් සහ වොර් අනතුරු අඟවන අන්දමට " එවිට ආර්ථික වර්ධනය මන්දගාමී විම පමණක් නො ව ඍණ අගයකින් යුක්ත වීම ද අප බලාපොරොත්තු විය යුතු ය. කොටින් කියතොත් අනාගතය සම්බන්ධයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සහතික කළ නො හැකි වනවා පමණක් නො ව ඉදිරි දශක කිහිපය තුළ දී වර්ධනය සම්පූර්ණයෙන්ම නතර වීමට ද ඉඩ තිබේ."[190]

මේ සම්බන්ධයෙන් විකල්පයක් ලෙස පුනර්ජනනීය බලශක්තියට කළ හැකි වන්නේ කුමක් ද? පුනර්ජනනීය බලශක්තියේ මිල ශීඝ්‍රයෙන් පහළ යන නමුත් ඛනිජ තෙල් බලශක්තිය වෙනුවට අවශ්‍ය තරමට සූර්ය බල, සුළං බල හා ජල විදුලි බලශක්ති ප්‍රභව ආදේශ කිරීම තරමක් කල් ගත වන කටයුත්තකි. කාබන් විමෝචනය අඩු කර ගැනීමට ඉක්මනින් ම ඛනිජ තෙල් භාවිතයෙන් ඉවත් වීමට සිදු වුව හොත් ආර්ථිකය ඉල්ලා සිටින බලශක්ති ප්‍රමාණය සපුරාලිය හැකි තරම් වේගයකින් පුනර්ජනනීය බලශක්තිය සැපයීමට නො හැකි වනු ඇතැ'යි වර්ධන යානය බිමට බෑමට දැන් කල් පැමිණ ඇතැ'යි කියන අය තර්ක කරති. වර්ධන වේගය නො කඩවා ඉහළ යැවීම පිණිස දැරීමට සිදු වන මිල නො තකා වර්ධන ලෝලී වීම නැවත හිතා බැලිය යුතු කාලය පැමිණ ඇතැ'යි පවසන ඇමෙරිකානු

190 Ayres. R. and Ayres, E. (2010) Crossing the Energy Divide: Moving from Fossil Fuel Dependence to a Clean Energy Future. Upper Saddle River, NJ: Wharton School Publishing, p. 14.

බලශක්ති ආර්ථික විද්‍යාඥයෙකු වන ඩේවිඩ් මර්පි සඳහන් කරන අන්දමට "ඉදිරි අවුරුදු 100 තුළ ආර්ථික වර්ධන වේගය කිසි සේත් ම පසුගිය අවුරුදු 100 තුළ සිදුවූ ආර්ථික වර්ධන වේගය වැනි ම වෙතැ'යි නො සිතිය යුතු ය."[191]

නව ඩිජිටල් තාක්ෂණය මගින් බිහි කරන දෙවැනි කාර්මික විප්ලවය නිසා වර්තමානයේ වැඩි වසයෙන් ද්‍රව්‍යයමය දේවල් මත රඳා ඇති ආර්ථිකය ද්‍රව්‍යයමය දේවල් අඩුවෙන් භාවිත කරන වඩා සැහැල්ලු ආර්ථිකයක් බවට පත් වනු ඇතැ'යි යන බලාපොරොත්තුව සම්බන්ධයෙන් ද වර්ධන විරෝධීන් දක්වන්නේ සංශයවාදී ආකල්පයකි. ඩිජිටල් විප්ලවය සිදු වන්නේ ද්‍රව්‍යයමය උපාංග සහ බහුල බලශක්ති භාවිතයක් ඇති යටිතල පහසුකම් මත බව පෙන්වා දෙන ඔවුහු මෘදුකාංග, සංගීතය, අධ්‍යාපනය, වින්දනය සහ වෙළඳාම දැනටමත් ආර්ථිකය තුළ මංගත *(Online)* නිෂ්පාදන සහ සේවා වසයෙන් පවතින බව පෙන්වා දෙති. ඒ අනුව ද්‍රව්‍යයමය දේවල් මත රඳා නො පවතින ආර්ථිකයක් ගැන බලාපොරොත්තු තැබීම සැක සහිත කටයුත්තක් බව ද ඔවුහු පවසති.

පරිසර සංරක්ෂණවාදීන්ට හා වර්ධන විරෝධීන්ට කෙසේ වෙතත් සාම්ප්‍රදායික දේශපාලනඥයින්ට නම් ආර්ථික වර්ධන වේගය ඉහළ දැමීම නැතිව ම බැරි දේශපාලන අවශ්‍යතාවයකි. එයට අවම වසයෙන් හේතු දෙකක් තිබේ. ඉන් පළමුවැන්න ආර්ථික වර්ධන වේගය වැඩි වීම යනු බදු වැඩි කිරීමකින් තොර ව රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේ ක්‍රමයක් බවට දේශපාලනඥයන් අතර ඇති පිළිගැනීම යි. දෙවැන්න වර්ධන වේගය අඩු වීම රැකියා වියුක්තිය වැඩි වීමට හේතු වනු ඇතැ'යි යන බිය යි.

පොදු යහපත සඳහා අවශ්‍ය වන ආයෝජන කිරීමට ආණ්ඩුවලට බදු අය කිරීමෙන් පොදු අරමුදලට එකතු වන ආදායම අත්‍යවශ්‍ය වේ. ලංකාව වැනි රටවල බදු ආදායමෙන් වැඩි කොටසක් ලැබෙන්නේ

191 Murphy, D.J. (2014) 'The implications of the declining energy return on investment of oil production', Philosophical Transactions of the Royal Society 372, p. 16.

පරිභෝජන භාණ්ඩවලට අය කරන වැට් බදු වැනි වක්‍ර බදුවලිනි. ආර්ථික වර්ධනය ඉහළ යන විට පරිභෝජනය ද ඉහළ යතැ'යි විශ්වාස කෙරේ. ඒ අනුව පරිභෝජන භාණ්ඩ සඳහා අය කරන බදු ආදායම ද ඉහළ යන බව සැලකේ. ඒ අනුව ආණ්ඩුවල අපේක්ෂාව වන්නේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය හරහා පුළුල් වන පරිභෝජනය අනුව සෘජු බදු වැඩි කිරීමකින් තොර ව ම කලින්ට වඩා වැඩි බදු ආදායමක් ලබා ගැනීම යි. එනිසා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට මේ සා ඇබ්බැහි වී ඇති දේශපාලකයන් වර්ධනයක් නැති හෝ අඩු වර්ධනයක් ඇති ආර්ථිකයක් ගැන කැප වෙතැ'යි සිතන්නේ කෙසේ ද?

මේ සඳහා අපට ප්‍රවර්ධනය කළ හැකි එක පිළිවෙතක් වන්නේ ස්කැන්ඩිනේවියානු රටවල මෙන් හැම කෙනෙකුට ම ගුණාත්මක පොදු සේවාවක් ලබා දීමට රජයට හැකි වන ලෙස ආදායම් බදු වැඩි කිරීමට මහජන කැමැත්ත ලබා ගැනීම යි. ඒ අනුව බදු ආදායම්වල ඇත්ත අරමුණ ගුණාත්මක සේවා සැපයීම මඟින් ඉහළ ජීවන තත්වයක් පවත්වා ගැනීමට හැකි වීම බව පෙණී යන ලෙස බදු ප්‍රතිපත්තිය පැහැදිලි ව යළි රාමු ගත කළ යුතු වේ. ආර්ථික විද්‍යාඥ කේට් රේවර්ත් යෝජනා කරන පරිදි මෙහි දී බදු කතිකාව කේන්ද්‍ර කර ගත යුත්තේ "බදු සහන" යන සංකල්පය මත නො ව "බදු සාධාරණය" යන සංකල්පය මත යි. එමඟින් යථා ලෙසම අදහස් වන්නේ ගුණාත්මක පාසල් සහ අධ්‍යාපන ආයතන, කාර්යක්ෂම සහ සැප පහසු පොදු ප්‍රවාහන සේවා, නවීන සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා, සැමට විශ්‍රාම වැටුප් හා සාර්වත්‍රික මූලික ආදායමක් සහතික කරන අසමානතා අවම කාරුණික සජ්ජන සමාජයක් ගොඩ නැගීම පිණිස උපයන හා උරුම වන ආදායම් අනුපාතය ප්‍රමුඛ කොට සාධාරණ ආදායම් බදු ක්‍රමයක් පවත්වා ගැනීම යි.

දෙවනු ව බදු ක්‍රමවල ඇති දුර්වලකම්වලින් රිංගා යෑමට ධන කුවේරයන්ට ඉඩ තැබීම නිසා ඇති වෙන අසාධාරණය නිමාවට පත් කළ යුතු ය. මෙයට 'අක් වෙරළ රහස්‍ය ගිණුම්' *(Off shore Accounts)*

පවත්වා ගෙන යෑම, ලාභය වෙනත් තැන්වලට මාරු කර සැඟවීම සහ ලොව මුල් පෙළේ පොහොසතුන්ට, ඇමසන් සහ ඇපල් වැනි දැවැන්ත කෝපරේට් සමාගම්වලට තම ව්‍යාපාර ඇති රටවලට අල්ප බද්දක් ගෙවීමට ඉඩ දෙන විශේෂ බදු සහන නතර කිරීම ද අයත් විය යුතු ය. ධන කුවේරයන් විසින් අක් වෙරළ ගිණුම්වල සඟවා ඇති ඩොලර් ට්‍රිලියන 18.5ක් පමණ මුදල් සඳහා වාර්ෂික ව ඩොලර් බිලියන 156ක් බදු වසයෙන් අය විය යුතු බව ගණනය කර තිබේ.[192] ඒ හැර බහු ජාතික සමාගම් ද වසරක් පාසා ඩොලර් බිලියන 660 කට කිට්ටු මුදලක් ආදායම් බදු ප්‍රතිශතය බිංදුවට පමණ බස්සවා ඇති නෙදර්ලන්තය, අයර්ලන්තය, බර්මුඩා සහ ලක්සෙම්බර්ග් වැනි රටවලට යවා බදු ගෙවීමෙන් මග හැර ඇති බව ද වාර්තා වේ.[193] බදු සාධාරණත්වය පිළිබඳ ගෝලීය සංධානය *(The Global Alliance for Tax Justice)* බදු ගෙවීම පැහැර හැරීම පිළිබඳ ව සොයා බලමින් කෝපරේට් සමාගම්වල පාරදෘශ්‍ය භාවය සහ වග වීම, සාධාරණ ජාත්‍යන්තර බදු රෙගුලාසි හා ප්‍රගතිගාමී ජාතික බදු ප්‍රතිපත්තිවල අවශ්‍යතාව වෙනුවෙන් පෙනී සිටිමින් මේ බදු මග හැරීම ගැන වැදගත් තොරතුරු එකතු කර තිබේ.[194] එහෙත් මේ කටයුත්ත සාර්ථක ව ඉටු කර ගැනීමට නම් ජාත්‍යන්තර ගිවිසුම් මෙන් ම ඒවා බලාත්මක කිරීම පිණිස උචිත අන්තර්ජාතික සංවිධානවලට බලය පැවරිය යුතු ය. අප අදහස් කරන පරිදි සැමට සාර්වත්‍රික මූලික ආදායමක් *(Universal Basic Income)* සහතික කිරීම වැනි කටයුතු ඉටු කිරීමට බොහෝ විට හැකි වන්නේ ඒ සඳහා ගෝලීය බදු ක්‍රමයක් හඳුන්වා දීමෙනි.

තෙවනුව, බදු අය කිරීමේ පදනම වෙනස් කිරීම ද ඉතා වැදගත් ය. දැන් ඇති අයබදු ක්‍රමය අනුව බොහෝ විට සිදු වන්නේ පුද්ගලයන්

192 Oxfam (2013), 'Tax on the "private" billions now stashed away in havens enough to end extreme world poverty twice over', 22 May 2013. https://www.oxfam.org/en/pressroom/pressreleases/2013-05-22/tax-private-billions-now-stashed-away-havens-enough-end-extreme

193 Tax Justice Network (2015) 'The scale of Base Erosion and Profit Shifting' (BEPS). http://www.taxjustice.net/scaleBEPS/

194 Global Alliance for Tax Justice, http://www.globaltaxjustice.org

සහ සමාගම්වල වාර්ෂික ආදායම මත බදු ගණනය කිරීම යි. ආදායම මත බදු ගණනය කරන ක්‍රමය වෙනුවට සමුච්චිත වූ ධනය හෙවත් දේපළ සහ මූල්‍ය වත්කම් ඇතුළු රැස්කරගත් ධනය මත බදු අය කිරීමට වැඩි ප්‍රමුඛත්වයක් දිය හැකි ය. වැඩිවන නිෂ්පාදනය හා පරිභෝජනය මත වැඩි බදු ආදායමක් ලැබෙතැ'යි බලාපොරොත්තුවෙන් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වාර්ෂික ව වැඩි කර ගැනීමේ අවශ්‍යතාව එවිට උද්ගත නො වේ. කෙසේ වෙතත් මෙවැනි ප්‍රගතිගාමී බදු සංශෝධන අධික දේපළ හා මූල්‍ය වත්කම් හිමි ධන කුවේරයන්ගේ සහ කෝපරේට් සමාගම්වල විරෝධයට හේතු වනු නිසැක ය. එවැනි විරෝධතා සුපුරුදු පරිදි පොදු සේවාවල අකාර්යක්ෂමතාව සහ දූෂණය වෙනුවෙන් තව තවත් මුදල් ආයෝජනය කිරීමේ වැරැද්ද පිළිබඳ මැසිවිලි ලෙස නැවත නැවතත් අපට අසන්ට ලැබෙනු ඇත. එහෙත් ඉන් ගම්‍ය වන්නේ ආණ්ඩුවල වග වීම සහතික කළ හැකි ප්‍රබල සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයක් බිහි කිරීමේ ඇත්ත අවශ්‍යතාවයි. ආණ්ඩුවල වග වීම සහතික කර ගැනීම සඳහා කැප වෙන ප්‍රබල හා ක්‍රියාකාරී සිවිල් සමාජ ව්‍යාපාරයක වැදගත්කම ද ඒ සමඟ ඉස්මතු වනු ඇත. බදු ක්‍රමයේ පදනම මෙසේ තීරණාත්මක ව වෙනස් කිරීමේ අවශ්‍යතාව තවදුරටත් පැහැදිලි කරන ආර්ථික විද්‍යාඥ තෝමස් පිකෙටිගේ අදහස් ගැන 25වැනි පරිච්ඡේදයේ දී අපි වඩාත් සවිස්තර ව සාකච්ඡා කරමු.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය අඩු වීම රැකියා වියුක්තිය වැඩි වීමට හේතුවන බවට දේශපාලනඥයන් අතර ඇති මතය ද විමසිල්ලට ලක් කිරීම වැදගත් ය. මනුෂ්‍යයන් වනාහි විචක්ෂණ සත්ව විශේෂයකි. අවශ්‍යතාවක් ඇත්නම් වැඩ කරන ආකාරය වෙනස් කර ගැනීමෙන් ඵලදායකත්වය වඩා ඉහළ නැංවීමට ඔවුන්ට හැකි ය. හෙන්රි ෆෝඩ් සිය මෝටර් රථ නිෂ්පාදන ක්‍රමයට ඇසම්බ්ලි ලයින් හෙවත් 'ඇමුණුම් පේළි ක්‍රමය' හඳුන්වා දුන් පසු ඔහුගේ මෝටර් රථ නිපදවීමේ හැකියාව පස් ගුණයකින් ඉහළ ගියේ ය. හෙන්රි ෆෝඩ්ගේ *T* වර්ගයේ මෝටර් රථ සඳහා නිතිපතා වැඩි වෙන ඉල්ලුම නො

වන්නට ඔහුට වඩා කුඩා සේවක පිරිසකින් තම සැපයීම ඉටු කර ගන්නට බෙහෙවින් ඉඩ තිබුණි. පුළුල් වන ආර්ථිකයක නම් එක ව්‍යාපාරයකින් අස් කරනු ලැබූ සේවකයන්ට තවත් ව්‍යාපාරයක රැකියා සොයා ගැනීම අපහසු නැත. එහෙත් ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය පුළුල් නො වන විට රැකියා වියුක්තිය ද වැඩි විය හැකි ය. ඉතිහාසය විසින් පෙන්නුම් කරන ලද පරිදි රැකියා වියුක්තිය වැඩි වීම නිසා ඇතිවෙන අතිථිභීතිකාව *(xenophobia)* හෙවත් අන්‍යයන් නො රිස්සීම ප්‍රකෝපකාරී අන්‍යන්‍යතා දේශපාලනයේ *(identity politics)* සිට ප්‍රචණ්ඩ පැසිස්ට්වාදය දක්වා සමාජ විරෝධී ප්‍රවණතා බිහි වීමට ද තුඩු දිය හැකි ය. එක්දහස් නවසිය තිස් ගණන්වල ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ලෝකයේ ඇති වූ මහා ආර්ථික අවපාතය හමුවේ පෝලිම් ගැසුණු රැකියා වියුක්තියකින් පිළිබඳ ගැටලුව විසඳීමට නම් දළ දේශීය නිෂ්පාදනයේ සැලකිය යුතු වර්ධනයක් අත්‍යවශ්‍ය බව එකල ජෝන් මේනාඩ් කේන්ස් පැවසුවේ එබැවිනි.

එහෙත් හෙන්රි ෆෝඩ් හඳුන්වා දුන් ඇමුණුම් පේළි ක්‍රමයට අනුව වැඩ සංවිධානය කිරීම දැන් සිදු වන්නේ එකල මෙන් මිනිස් ශ්‍රමය යොදා ගැනීමෙන් නො ව වැඩි වැඩියෙන් ස්වයංක්‍රියාකාරි *(automation)* යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමෙනි. ඒ අනුව නිෂ්පාදනය වැඩි වෙන පමණට මිනිස් ශ්‍රමයට ඇති ඉල්ලුම ද එකල මෙන් ම අද ද වැඩි වෙනු ඇතැ'යි සිතීම වැරදිය. ඒ නිසා ස්වයංක්‍රීයකරණය නිසා ඇතිවිය හැකි රැකියා වියුක්තිය සමනය කිරීමට දළ දේශීය ආදායමේ වර්ධන වේගය වැඩි වීම පිළිතුරකැ'යි කීම තවදුරටත් වලංගු නො වේ. එබැවින් ඒ සඳහා අප 26 වැනි පරිච්ඡේදයේ දී සවිස්තරව සාකච්ඡා කරන 'සැමට සාර්වත්‍රික මූලික ආදායම' *(Universal Basic Income)* සහතික කිරීම සහ 'වැඩ සතිය කෙටි කිරීම' වැනි විසඳුම් කරා යොමු විය යුතු ය.

දේශපාලනය සහ ආර්ථිකය යන ක්ෂේත්‍ර දෙක ම එකිනෙක විසින් පෝෂණය හෝ මන්දපෝෂණය කරන බව අපි දනිමු. මේ ක්ෂේත්‍ර දෙක ම සම්බන්ධ කෙරෙන මැදිහත් වීම් පදනම් කර ගෙන

ඇත්තේ දේශපාලනය හා ආර්ථිකය යනු ජාතික රාජ්‍යයන් විසින් තම තම හැකියා අනුව විසඳුම් සොයා ගත යුතු ප්‍රශ්න වසයෙනි. ඒ සම්බන්ධ කෙරෙන අන්තර්ජාතික කටයුතු ද සංකල්ප ගත වන්නේ ජාතික රාජ්‍ය අතර සිදු වන ගනු දෙනු වසයෙනි.

ඇතැම් රටවල් සිය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වැඩි කිරීම ගැන උත්සුක වන්නේ ගෝලීය ආර්ථික බලයේ තීරණාත්මක හිමිකරුවන් වීමේ බලාපොරොත්තුවෙනි. එනිසා ගෝලීය වේදිකාවේ ප්‍රධාන භූමිකාවලින් විසි වී නො යෑමට නම් දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වර්ධනය අත්‍යවශ්‍ය කොන්දේසියකැ'යි ඒ රටවල් අදහති. එහෙත් මෙහි විරුද්ධාභාසය *(paradox)* වන්නේ සංහතියක් ලෙස මනුෂ්‍යයන්ට නුදුරු කාලයේ මුහුණ දීමට සිදු වන ගෝලීය උණුසුම ඉහළ යෑම ඇතුළු තීරණාත්මක ප්‍රශ්න තවදුරටත් ජාතික රාජ්‍ය මට්ටමෙන් පමණක් විසඳා ගත හැකි ඒවා නො වීමයි. එපමණක් නො ව ආදායම් විෂමතාව අවම කොට සැමට සාර්වත්‍රික මූලික ආදායමක් සහතික කිරීම පිණිසත්, වත්කම් ප්‍රමුඛ කොට බදු ක්‍රමය සංශෝධනය කිරීමටත් බදු සාධාරණත්වය තහවුරු කිරීම සඳහාත් අක් වෙරළ ගිණුම්වල මුදල් සැඟවීම හා මුදල් විශුද්ධිකරණය වැනි කටයුතු වැළැක්වීම සඳහාත් අපට අද අන් කවර කලකටත් වඩා ජාතික රාජ්‍යයේ ඊනියා ස්වෛරිත්වය ඉක්මවා ගොස් කලාපීය හා ජාත්‍යන්තර වසයෙන් සංවිධානගත වීමට සිදු ව තිබේ.

වර්ධනයට ඇති ඇබ්බැහිකමින් අත් මිදීමට නම් වර්ධන වේගය වෙනුවට සාර්ථකත්වය පිළිබඳ විකල්ප දර්ශක අපට යොදා ගත හැකි බව කේට් රේවර්ත් පෙන්වා දෙයි. සාර්ථක ආර්ථිකයක් යන්නෙන් අදහස් කරන්නේ විෂමතා අඩු සමබර දියුණුවක් සලසන ආර්ථිකයක් නම් එම සාර්ථකත්වය මුදල්වල ප්‍රතිශතයක් ලෙස නො ව සමස්ත ජීවන ක්‍රමය මගින් පිළිබිඹු වන මානව සමෘද්ධිය පිළිබඳ දර්ශක මගින් නිරූපණය විය යුතු ය. දැනට මත් ඇති ඇතැම් ප්‍රකට දර්ශක මේ ගුණයෙන් සම්ප්‍රයුක්ත වෙයි. ඒ අතර රටක ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව, අධ්‍යාපනය හා ආදායම පදනම් කොට 1990 දී

හඳුන්වා දුන් එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන දර්ශකය හෙවත් *Human Development Index* ප්‍රකට ය. ඒ හැර *Happy Planet Index*[195], *the Inclusive Wealth Index, and the Social Progress Index* වැනි වෙනත් දර්ශක ද වෙයි.

තවත් උපායමාර්ගික වැදගත්කමක් ඇති කටයුත්තක් වසයෙන් සැලකිය හැක්කේ ජාතික රාජ්‍ය අතර ඇති තරඟය ඉක්මවා යමින් පුරවැසියන් අතර සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කලාපීය හා ගෝලීය වසයෙන් අන්තර්ජාතික සහයෝගිතාව ගොඩ නගන මහා නගර ජාලයක් බිහි කිරීම යි. එම ජාලය තුළ දූෂණ කාරක ආර්ථික වර්ධනයේ දුර්විපාක අවම කරන නිෂ්පාදන හා පරිභෝජන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම පිණිස විසඳුම් සහ තාක්ෂණික දැනුම සෘජු ව ම බෙදා හදා ගත හැකි වේ. ගෝලීය උණුසුම වැඩි වීම වැනි ගැටලු ආමන්ත්‍රණය කිරීමට දැනට පිහිටුවා ගෙන ඇති *C40* නමින් හැඳින්වෙන මෙගා නගර ජාලය වඩා දේශපාලනික මෙහෙවරක් සහිතව ප්‍රතිව්‍යුහගත කිරීමෙන් මේ කටයුත්ත ඉටු කළ හැකිදැ'යි සොයා බැලිය හැකි ය.[196] ලොව පුරා ඇති මෙගා නගර 80 කට වැඩි සංඛ්‍යාවක් *C40* නගර ජාලයට අයත් වේ. එම නගර 80 ජනගහනය මිලියන 550 ක් වන අතර දළ ගෝලීය නිෂ්පාදිතයෙන් 25% ක ආර්ථික අගයක් එම නගර එකතුවෙන් ජනනය වේ. උචිත දේශපාලනික දැක්මක් ඇත්නම් මෙම අන්තර්ජාතික නගර ජාලය ජාතික රාජ්‍ය ඉක්මවා යන ගෝලීය මට්ටමේ පුරවැසි ව්‍යාපාරයක කොඳු නාරටිය බවට පරිවර්තනය කිරීමට හැකි ය. අනුක්‍රමයෙන් ලෝක ජනතාවගෙන් වැඩි කොටසකට නගරවල ජීවත් වීමට සිදු වන බැවින් ජාතික රාජ්‍ය ව්‍යුහයට ඉහළින් තැබිය හැකි ක්‍රියාකාරී අන්තර්ජාතික නගර ජාලයක් මඟින් සංවර්ධනයේ දේශපාලනය පරිසර හා මානව හිතවාදී ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කළ හැකි ය.

අවසාන වසයෙන් කල්පනා කළ යුතු වන්නේ සමාජීය වසයෙන් අප හැම දෙනෙක් ම වාගේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය නිසා

195 http://happyplanetindex.org/

196 https://www.c40.org/

මේ තරම් ආවේශ වී ඇත්තේ ඇයි ද යන්නයි. සමාජය තුළ පවතින විවිධ විෂමතා නිසා ඇතිවෙන ආතතිය සහ පරිභෝජන සංස්කෘතිය විසින් අප මෙහෙයවනු ලැබීම ඊට මූලික වසයෙන් හේතු විය හැකි බව කේට් රෙවර්ත් සඳහන් කරයි. නූතන සමාජයේ ජීවත් වන අපි සියලු දෙනා ම ඉපැරණි ජන සමාජවල විසූ ගෝත්‍රික රජවරුන්ට වඩා බහු භාණ්ඩිකයෝ ය. නොයෙකුත් භාණ්ඩ අත්පත් කර ගැනීමට අප දක්වන ආශාව විසින් අපේ නිෂ්පාදන ක්‍රමය හා ඒ සඳහා අවශ්‍ය සම්පත් ප්‍රමාණය ද තීරණය වෙයි. අප මිලට ගන්නා දේවල් අනුව බොහෝ විට අපේ අනන්‍යතාව හා සමාජ සම්බන්ධකම් නිර්ණය වන බව අපි දනිමු. අප සැසඳීමට යොදා ගන්නා අසල්වැසියා හෝ ඥාති මිත්‍රාදීන්ට නො දෙවෙනි ව ප්‍රකට සන්නාම සහිත භාණ්ඩ අපට හිමි බව පෙන්වීමට අපි කැමැත්තෙමු. අලුත් ම පන්නයේ අයිෆෝනයක් අත තබා ගෙන යෑමට අප පෙලඹෙන්නේ එබැවිනි. ධනවාදී ආර්ථික ක්‍රමය යනු පාරිභෝගිකයා තෘප්තියට පත්වීම මත පවතින ආර්ථික ක්‍රමයක් නො ව සදාකාලික අතෘප්තිය ජනනය කිරීම මඟින් මෙහෙයවනු ලබන ආර්ථික ක්‍රමයකි. තරඟකාරී වාණිජ ප්‍රචාරණ විධි මේ බව මැනවින් අවබෝධ කර ගෙන තිබේ. විසි වැනි සියවසේ බිහි වූ වාණිජ ප්‍රචාරණයේ පදනම සමාජ ඉණිමගේ අප ඉහළට යන බව දැනෙන්නේ අසල්වැසියාට වඩා තවත් යමක් මිල දී ගැනීමට අපට ඇති හැකියාව ප්‍රදර්ශනය කිරීම මඟින් බවට අප තුළ ඇති ඇදහිල්ල යි. ඉතින් මේ විසිවැනි සිය වසේ බිහි වූ ඒ අතෘප්තියේ උරුමය අත් හැර දැමීමට අපට හැකි වේද?

ඒ සඳහා කෙරෙන උත්සාහයක් ලෙස ස්වීඩනය සහ නෝර්වේ වැනි රටවල් දැනටමත් වයස 12ට අඩු දරුවන් ඉලක්ක කොට වෙළඳ දැන්වීම් ප්‍රචාරණය කිරීම තහනම් කර තිබේ. දෘශ්‍ය දූෂණය *(Visual Pollution)* නැති කිරීම සඳහා ප්‍රංශයේ ග්‍රෙනොබෙල් සහ බ්‍රසීලයේ සාඕ පව්ලූ වැනි නගරවල වෙළඳ දැන්වීම් පුවරු ඇටවීමට අවසර දෙනු නො ලැබේ. එහෙත් ඒ අතර අන්තර්ජාල හැසිරීම අනුව අපේ රුචිඅරුචිකම් නිරීක්ෂණය කරමින් පුද්ගලිකව ම අපට ඉලක්ක කරනු

ලබන මංගත *(online)* වෙළඳ දැන්වීම් ප්‍රචාරණයේ සැලකිය යුතු වැඩි වීමක් ද දක්නට ලැබේ. වෙළඳ ප්‍රචාරණය මත යැපෙන සේවා ගණනාවක් ආර්ථිකය තුළ ද පැලපදියම් වී ඇති බැවින් සචේතනික උත්සාහයකින් තොර ව බහු භාණ්ඩික අධි පරිභෝජනවාදයේ මූල්‍යමය හා සංස්කෘතික ආධිපත්‍යයෙන් ගැලවීමට අපට පහසු නො වනු ඇත. එහෙත් ස්මාට් හෙවත් සුහුරු නගර සංකල්පය තුළ ප්‍රවාහනය ඇතුළු පොදු සේවා වැඩි දියුණු කිරීම මඟින් සහ යාන වාහන සහ මෙවලම් ආදිය බෙදා හදා ගැනීමේ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම මඟින් මේ අධික පරිභෝජනය අවම කළ හැකි දැ'යි සොයා බැලිය හැකි ය. මේ සඳහා ඇතැම් නගරවල ඇති පාපැදි හා රෙදි සේදීමේ යන්ත්‍ර පොදුවේ භාවිත කිරීම වැනි නිදසුන් සලකා බැලිය හැකි ය.

අධිපරිභෝජනවාදී සංස්කෘතිය ගැන කල්පනා කරන විට අපට පෙනී යන එක් වැදගත් දෙයක් වන්නේ ද්‍රව්‍යයමය සමෘද්ධිය කොතෙකුත් තිබුණත් භාවාත්මක සමෘද්ධිය *(emotional abundance)* අතින් අප ඉතා දුප්පත් බවයි. භාවාත්මක සමෘද්ධිය යනු අපට ඇත්තට ම වැදගත් වන දේවල් ලැබී තිබීම යි. අපේ කුසලතා ප්‍රයෝජනයට ගැනීම, අන්‍යයන්ට අධාර උපකාර කිරීම, අප විශ්වාස කරන වටිනාකම් වෙනුවෙන් පෙනී සිටීම ආදී වසයෙන් ඇත්තට ම අපට භාවාත්මක ව වැදගත් වන දේවල් මොනවා ද යන්න සම්බන්ධ ව විවිධ මත තිබිය හැකි ය. මනෝවිද්‍යාත්මක පර්යේෂණ රාශියකින් ලබා ගත් දත්ත භාවිත කරමින් *New Economics Foundation* හෙවත් නව ආර්ථික පදනම නමැති සංවිධානය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව යහජීවනය *(wellbeing)* ප්‍රවර්ධනය කිරීමට භාවාත්මක වසයෙන් වැදගත් වන දේවල් සරලව කොටස් පහකට බෙදිය හැකි ය. එනම් අප අවට වෙසෙන අය සමඟ **සබැඳියාව** ඇති කර ගැනීම, ශාරීරිකව හා මානසික ව **සක්‍රිය වීම**, ලෝකය ගැන **සිහි නුවනින් සිටීම**, **නව හැකියා** ඉගෙන ගැනීම සහ **පරෝපකාරී** බව ඒ කොටස් පහයි.[197]

197 Aked, J. et al. (2008) Five Ways to Wellbeing: The Evidence. London: New Economics Foundation.

මේ අන්දමේ යහජීවනයක් ඇති කර ගැනීමට ආත්මාර්ථකාමිත්වය ම උත්කර්ෂණයට නංවන විෂමතා දායක නාස්තික ආර්ථික චින්තනය වෙනුවට ආදායම් අසමානතාව අවම කෙරෙන, පරිසර සංරක්ෂණය ආර්ථිකයේ ප්‍රතිලාභයක් ලෙස සැලකෙන, පරිභෝජන නාස්තිය අවම කෙරෙන සහ සහභාගිත්වය හා සහයෝගය සහතික කෙරෙන චක්‍රීය ආර්ථිකයක් *(circular economy)* ගොඩ නැගිය යුතු ය. ඒ චක්‍රීය ආර්ථිකය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ගැන අඥෙයවාදී *(agnostic)* ආකල්පයක් දරන්නක් විය යුතු ය.

# - 20 -

## තිරසාර සංවර්ධන අරමුණු දක්වා සංවර්ධන දැක්ම

ආර්ථික වර්ධන වේගය නො තකා සමාජ අසමානතාව *(social inequality)* වැඩි වීම නිසා ප්‍රගතිය යන්න හුදෙක් *GDP* හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ මිම්මක් ලෙස හුවා දැක්වීම බොහෝ විචාරකයන්ගේ විවේචනයට ලක් විය. ඒ නිසා සමාජ ප්‍රගතිය සම්බන්ධයෙන් ඍජු ආර්ථිකමය නො වන දර්ශක ඇති කර ගැනීම පිළිබඳ කලක් තිස්සේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් විශේෂ අවධානයක් යොමු කර තිබුණි.

ආර්ථික නො වන සමාජ දර්ශක කිහිපයක් ම හඳුන්වා දීමට ගත වූ දශක ගණනාවක් තිස්සේ විවිධ උත්සාහ ගෙන තිබේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානය 1976 දී කැඳවූ ලෝක රැකියා නියුක්තිය පිළිබඳ සම්මේලනයක දී මූලික අවශ්‍යතා *(Basic Needs)* යනුවෙන් හඳුන්වා දුන් වුවමනාකම් සපුරාලීම සංවර්ධන දර්ශකයක් ලෙස සැලකීම ඉන් ප්‍රමුඛ එකකි. ඒ අනුව පුද්ගලයෙකුට අවශ්‍ය ආහාර, පානීය ජලය, නිවාස, ඇඳුම්, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන මූලික අවශ්‍යතා කොතෙක් දුරට සපුරා ගත හැකි ද? යන්න සංවර්ධනයේ අත්‍යවශ්‍ය දර්ශකය වශයෙන් එකල සැලකුණි. 1980 දී සාක්ෂරතාව, ළදරු මරණ අනුපාතිකය සහ ජීවිතාපේක්ෂාව අඩංගු වන ජීවිතයේ

භෞතික ගුණාත්මක භාවය පිළිබඳ දර්ශකය *Physical Quality of Life Index (PQLI)* හඳුන්වා දෙන ලදී.[198]

ප්‍රකට ආර්ථික විද්‍යාඥයෙකු වන අමාර්ත්‍ය සෙන් ඒ කාලයේ දී ම ඔහුගේ ශක්‍යතා න්‍යාය *(capability theory)* හඳුන්වා දෙමින් ආදායම මඟින් සමාජීය ඇගයුම *(social value)* තක්සේරු කිරීම වෙනුවට පුද්ගලයෙකුට කළ හැකි කාර්ය සහ පුද්ගල ශක්‍යතාව මත කෙනෙකුගේ වටිනාකම නිර්ණය කළ යුතු බව පෙන්වා දුන්නේ ය. සෙන්ගේ ශක්‍යතා න්‍යායට අනුව ආරක්ෂාකාරී තත්වයන් යටතේ වැටුප් සඳහා වැඩ කිරීමට මිනිසුන්ට ඇති හැකියාව සහ මිනිසුන්ගේ සෞඛ්‍ය සම්පන්න බව කිනම් ශක්‍යතාවලින් සන්නද්ධ වීමට එම මිනිසුන්ට හැකි ව ඇත් ද යන කාරණය මත තීන්දු වන්නකි.

රටක සංවර්ධනය මැනීමේ දී වියුක්ත ආර්ථික වර්ධන දර්ශක පමණක් නො ව ආර්ථිකය නිසා රටවැසියන්ට අත් වන විවිධාකාර ඵල විපාක සහ හැකි නො හැකියා ද කේන්ද්‍ර කර ගත යුතු ය යන අදහස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන *(UNDP)* විසින් 1990 ගණන්වල ප්‍රවර්ධනය කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ උපදේශකයෙකු ලෙස කටයුතු කළ පාකිස්ථානු ජාතික ආර්ථික විද්‍යාඥයෙකු වූ මහබුබ් උල් හක්ගේ මෙහෙයවීමෙන් එම අදහස මුල් කර ගෙන එක්සත් ජාතීන්ගේ *Human Development Index (HDI)* නොහොත් මානව සංවර්ධන දර්ශකය හඳුන්වා දෙන ලද්දේ එහි ප්‍රතිඵලයක් වසයෙනි. යේල් සරසවියෙන් ආචාර්ය උපාධිය ලබාගෙන හාවඩ් සරසවියේ පශ්චාත් ආචාර්ය පර්යේෂණ කටයුතු කර තිබූ උල් හක් 1960 ගණන්වල සිට 70 ගණන් දක්වා ම පාකිස්ථානයේ සැලසුම් කොමිසමේ සභාපති ධුරය ද දැරීය. පකිස්ථානය ආර්ථික ලිබරල්වාදය දෙසට යොමු වුණේ ද ඒ කාලයේ දී ය.

එහෙත් උල් හක් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශක ආර්ථික ලිබරල්වාදයේ සාම්ප්‍රදායික වර්ධන මැනුම් ඉක්මවා යමින් මානව

198 Morris, M.D. (1980), "The physical quality of life index (PQLI)," Development Digest, Vol. 18(1), pp. 95–109.

සංවර්ධනයේ වැදගත් මාන *(dimension)* තුනක් විශේෂයෙන් ම සලකා බැලීය. ඒවා නම් මිනිසුන්ට අත්පත් කර ගත හැකි දීර්ඝායුෂ හා එයට පදනම වන සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව, දැනුම අත්පත් කර ගැනීමට ප්‍රමාණවත් අධ්‍යාපනයක් සහ තෘප්තිමත් ජීවන තත්වය යි. මෙම සංවර්ධන දර්ශක සාධාරණීකරණය කරමින් ඔහෘජ හෙවත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙනුවෙන් උල් හක් සංවර්ධනය පිළිබඳ සිය අදහස මෙසේ ගොනු කරයිඃ

> **"සංවර්ධනයේ මූලික අභිප්‍රාය වන්නේ මිනිසුන්ගේ තෝරා ගැනීම් හැකි තරම් පුළුල් කර ලීම යි. මෙකී තේරීම් විවිධත්වය අතින් අනන්ත අප්‍රමාණ විය හැකි අතර කාලාන්තරයක දී ඒවා වෙනස් වීමට ද ඉඩ තිබේ. දැනුම අත්පත් කර ගැනීමේ හැකියාව, හොඳ පෝෂණයක් සහ සෞඛ්‍ය සේවයක් ලබා ගැනීමේ හැකියාව, වඩා ආරක්ෂිත ජීවන ක්‍රමයක් තිබීම, අපරාධවලට සහ ශාරීරික පීඩාවට එරෙහි ව ආරක්ෂාව ලැබීම, විවේක කාලය සතුටෙන් ගත කිරීමට ඇති හැකියාව, දේශපාලනික හා සංස්කෘතික නිදහස සහ අව්‍යාජ ව ප්‍රජා කටයුතුවලට සහභාගි වන්නේ යැ'යි යන හැඟීම වැනි ආදායම් සහ වර්ධන වේගය පිළිබඳ සංඛ්‍යාවන්ගෙන් කිසි සේත් ම හෝ වහාම පෙන්නුම් නො කරන බහුවිධ වටිනාකම් සාක්ෂාත් කර ගැනීමේ හැකියාව මහජනයා බෙහෙවින් අගය කොට සලකති. ඒ අනුව සංවර්ධනයේ අරමුණ විය යුත්තේ සැමට දීර්ඝ, සෞඛ්‍ය සම්පන්න සහ නිර්මාණාත්මක ජීවිතයක් අත්විඳ ගැනීමට හැකි වාතාවරණයක් බිහි කිරීම යි".[199]**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන *(UNDP)* විසින් හඳුන්වා දෙන ලද මානව සංවර්ධන දර්ශකවල අඩංගු ත්‍රිමාන අතරින් සෞඛ්‍ය පිළිබඳ මානය නිර්ණය කරන ලද්දේ අදාළ වසරේ උපදින සාමාන්‍ය පුද්ගලයෙකුට එම රටේ ඇති සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් අනුව අපේක්ෂා කළ හැකි ජීවිත කාලය අවුරුදු කීයක් වේ ද යන කරුණ මත යි. විසිවැනි සිය වස තුළ කිසිදු රටක සාමාන්‍ය ජීවිතාපේක්ෂාව අවුරුදු 20ට වඩා අඩු වී නොමැති බැවින් රටක ජීවිතාපේක්ෂාව ප්‍රමුඛ සෞඛ්‍ය පිළිබඳ මානය ගණනය කිරීමේ දී අවම අගය අවුරුදු 20ක් ලෙස ද උපරිම අගය අවුරුදු 85ක් ලෙස

199 Mahbub ul Haq, Reflections on Human Development (Oxford: Oxford University Press, 1995), 14

ද සලකන ලදී. මේ අනුව 2020 දී සෞඛ්‍ය මානය සම්බන්ධයෙන් ඉදිරියෙන් ම සිටින්නේ වයස 84.6 ක සාමාන්‍ය ජීවිතාපේක්ෂාව ක් ඇති ජපානය යි. ඒ වසර සඳහා ලංකාවේ ජීවිතාපේක්ෂාව වයස 77 කි. දෙවෙනි මානය වන දැනුම ලබා ගැනීමේ අවස්ථා පිළිබඳ මානය පුරවැසියෙකු අධ්‍යාපනයට කැප කරන වසර ගණන අනුව ගණනය කෙරිණි. ඒ අනුව වයස විසිපහ ඉක්මවන වැඩිහිටියන් පාසල් ගිය වසර ප්‍රමාණයේ සාමාන්‍යය සහ පාසල් යන වියේ සිටින දරුවන් අඛණ්ඩ ව පාසල් යතැ'යි බලාපොරොත්තුවිය හැකි වසර ප්‍රමාණය යන කරුණු දෙක මත දැනුම අත්පත් කර ගැනීමෙ හැකියාව පිළිබඳ මානය ඇගයිනි. වයස 25 ඉක්මවූ ලාංකිකයෙකු සාමාන්‍යයෙන් වසර 10.9ක පාසල් අධ්‍යාපනයක් ලබන විට එම වයසේ ජර්මන් තරුණයෙකු වසර 14.2 ක් අධ්‍යාපනය ලබයි. තෙවනු ව ජීවන තත්වය පිළිබඳ මානය ඒක පුද්ගල දළ ජාතික ආදායම මත ඇගයීමට ලක් කෙරිනි. ජීවන තත්ව මානය අනුව වසර 2020 දී ඉදිරියෙන් ම සිටින නොර්වේ රටේ ඒක පුද්ගල දළ ජාතික ආදායම ලංකාවේ ඒක පුද්ගල ජාතික ආදායම මෙන් පස් ගුණයක් විය. මෙකී මාන තුන ම සඳහා දෙනු ලබන අගයන්වල එකතුවේ සාමාන්‍යය අනතුරුව සංඛ්‍යාත්මක ව සංයුක්ත සූචකයක් ලෙස නිරූපණය කිරීම මානව සංවර්ධන දර්ශකය ලෙස හැඳින්විණි.

කෙසේ වෙතත් මානව සංවර්ධන සූචකය මඟින් නිරූපණය වන්නේ මානව සංවර්ධනයෙන් එක් පැතිකඩක් පමණි. එමඟින් සමාජීය අසමානතා, දරිද්‍රතාව, මානව සුරක්ෂාව, පුද්ගල සබල ගැන්වීම *(empowerment)* වැනි සංවර්ධනය සම්බන්ධ අනෙකුත් වැදගත් මාන නිරූපණය නො වේ.

හක් අදහස් කළ අන්දමට මානව සංවර්ධනය යනු වැදගත් සාධක කිහිපයක් පදනම් කරගත්තකි. ඒ අනුව ප්‍රථම කොට නූතන සමාජය පැවතිය යුත්තේ ම අත් කර දිය හැකි හොඳ ම ජීවිතය එහි සියලු සාමාජිකයන්ට ලබා දීමට යි. දෙවනුව, තමන්ට අත් කර ගත ගත හැකි හොඳම ජීවිතය දිනා ගැනීමට නම් තමන් කෙබඳු අයෙකු

විය යුතු ද ඒ සඳහා තමන්ට අවශ්‍ය වන්නේ මොනවා දැයි තීරණය කිරීමටත්, ඒ අනුව තම අරමුණ ඉටු කර ගැනීම කරා යෑමටත් සමාජයේ හැම කෙනෙකුට ම හැකි විය යුතු ය. ඒ නිසා ආර්ථික සංවර්ධනය විසින් කළ යුත්තේ ඒ ශක්‍යතාව හෙවත් හැකියාව ඔවුන්ට ලබා දීම බව හක් පැවසී ය.

බැලූ බැල්මට ම එය විවාදාත්මක ප්‍රකාශයක් නො වේ. එහෙත් හක්ගේ අදහස විශේෂ වෙන්නේ ආර්ථික සංවර්ධනය පමණක් ම මානව සංවර්ධනයට තුඩු දෙනු ඇතැ'යි යන මතය ඔහු තරයේ ප්‍රතික්ෂේප කළ බැවිනි. ආර්ථික වර්ධනය පොහොසතුන්ට සහ හොඳ සම්බන්ධකම් ඇති අයට සෞභාග්‍ය ළඟා කර දුන්නත් බොහෝ විට දුප්පතුන් එම සෞභාග්‍යයෙන් පිට මං කර තැබීමට කටයුතු කරනු ඇතැ යි ඔහු තර්ක කළේ ය. ඒ හැර දුප්පතුන්ගේ අධ්‍යාපන හා සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීමට පොහොසතුන් වියදම් කරනු ඇතැ'යි ද සිතිය නො හැක. ඔහුගේ ඒ අදහස 1990 ගණන්වල දොහොත් මුදුනින් පිළිගෙන තිබූ නවලිබරල්වාදී ආර්ථික දර්ශනයට හාත්පසින් ම ප්‍රතිවිරුද්ධ විය. නවලිබරල්වාදී චින්තනයට අනුව අවම රජයේ මැදිහත්වීම් සහ නිදහස් වෙළඳපොළක් ඇත්නම් ව්‍යාපාර කටයුතු ආරම්භ කොට මුදල් ඉපයීමට මිනිස්සු පෙලඹෙති. එහෙත් හක් ඒ මතය හා එකඟ නොවීය. හක් තර්ක කළ අන්දමට සමාජය පවතින්නේ මිනිසුන්ගේ ජීවන තත්වය දියුණු කිරීමට නම් ආර්ථික සංවර්ධනයේ අරමුණ ද එය ම විය යුතුය. ආර්ථික වර්ධනය වැඩිවන තරමට ම සමාජ විෂමතා ද වැඩි වී සැලකිය පිරිසකගේ තත්වය අන් අයට වඩා පිරිහී ඇත්නම් නම් එය අභූතරූපී සංවර්ධනයකි. ඒ අනුව හක්ගේ අවධානය බෙහෙවින් ම යොමු වුනේ සංවර්ධනය නිසි මානව අරමුණු කරා යොමු කිරීමට යි.

ඒ සඳහා ඔහු මානව සංවර්ධන දර්ශක *(Human Development Index)* හඳුන්වා දුන්නේ ය. රටක ආර්ථික සෞභාග්‍ය *(economic prosperity)*, අධ්‍යාපනය *(education)* සහ ආයු අපේක්ෂාව *(life expectancy)* පිළිබඳ තෝරා ගත් ක්ෂේත්‍රවලින් සංයුක්ත කළ දර්ශක

මඟින් එම රටේ සංවර්ධන මට්ටම ගැන පරිපූර්ණ චිත්‍රයක් ලබා ගත හැකි වේ යැයි හක් අදහස් කළේ ය. හක් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශක යාවත්කාලීන කරමින් 1990 සිට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සියලු රටවල් සම්බන්ධයෙන් මිනුම් අඩංගු මානව සංවර්ධන වාර්තාව *(Human Development Report)* එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන විසින් වාර්ෂික ව ප්‍රකාශයට පත් කරනු ලැබේ..

කෙසේ වෙතත් හක්ගේ මානව සංවර්ධන දර්ශක ගැන සැලකිය යුතු විවේචන ද එල්ල වී තිබේ. මුල්ම විවේචන පැමිණියේ යෝජිත දර්ශක හඳුනා ගැනීමේ ක්‍රමවේදය ගැනයි. "හුදෙක් ආදායම මැනීම ඉක්මවා සංවර්ධනයේ අර්ථය පුළුල් කිරීම පිළිබඳ ව මානව සංවර්ධන වාර්තාවේ එන  දැක්ම හා අප එකඟ වන නමුත් එය දර්ශකවලට පරිවර්තනය කිරීම ගැන අප තුළ සැලකිය යුතු විචිකිච්ඡා තිබේ" යනුවෙන් දකුණු ආසියානු ශාස්ත්‍රඥයන් දෙදෙනෙකු වූ  ඒ.ඩී. සාගර් සහ ඒ. නජාම් පැවසීය.[200]  එවැනි විවේචන බොහෝ විට සාධනීය ඒවා විය. මානව සංවර්ධන දර්ශක තිබිය යුතු බව සැබෑ නමුත් නිසි ක්‍රමවේදයකට අනුව දර්ශක සකස් කළ යුතු බව එම විවේචනවලින් අවධාරණය විය.

ඕස්ට්‍රේලියානු ශාස්ත්‍රඥයෙකු වූ මාක් මැක්ගිලිව්රේ තර්ක කළ පරිදි මානව සංවර්ධන දර්ශකවලින් ඉන් පෙර පැවති මිනුම්වලින් හෙළිදරව් වනවාට වඩා වැඩි දෙයක් හෙළිදරව් නො වේ. හක් යෝජනා කර ඇති විචල්‍යතා *(variables)* තුන (ආයු කාලය, අධ්‍යාපනය සහ ධන සම්පත්) පිළිබඳ මිනුම් බොහෝ විට එම අගයන් සහිතව ම කොහොමටත් පවත්වා ගෙන යන බවත් ඉන් එක විචල්‍යතාවක් පිළිබඳ අගය ගත්තත් බොහෝ අවස්ථාවල දී එය විචල්‍යතා තුනේ ම සංයුක්ත අගයට සමාන වන බවත් ඔහු පෙන්වා දුන්නේ ය. දේශීය වශයෙන් සංවර්ධනය මැනීමේ  නව දැක්මක් ඉදිරිපත් කරනවාට වඩා මානව සංවර්ධන දර්ශක භාවිතා වන්නේ සමාජ සංවර්ධනය

200 Sagar,  A. D. and Najam, A.(1998), "The Human Development Index: A Critical Review," Ecological Economics 25, no. 3 p. 251.

පිළිබඳ දෘෂ්ටිවාදී චින්තනය ප්‍රවර්ධනය කිරීමට බව මැක්ගිලිව්රේගේ අදහස විය.[201] ඉන්දියානු ආර්ථික විද්‍යාඥයෙකු වූ ටී. එන්. සිරිනිවාසන් පෙන්වා දුන් පරිදි පුද්ගලයන් සහ සමාජ ආර්ථික කණ්ඩායම් වෙන් වෙන් ව ලා සැලකුවොත් මානව සංවර්ධන දර්ශකවලින් කියැවෙන අගයන් සාපේක්ෂව එක සමාන නොවේ.

කෙසේ වෙතත් මානව සංවර්ධන දර්ශකවල සීමිත උපයෝගිතාව මෙන් ම හක් යෝජනා කළ බහුවිධ මානව සංවර්ධනය පිළිබඳ අදහසේ වැදගත්කම නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥයෙකු වූ අමාර්ත්‍ය සෙන්ගේ පහත දැක්වෙන ප්‍රකාශයෙන් සාරාංශ ගත කළ හැකි ය.

> **"මානව සංවර්ධන දර්ශක හෝ එවැනි ඕනෑම සංයුත දර්ශකයක්** *(aggregative index)* **ගැන වැඩි අවධානයක් යොමු කිරීම වරදකි.... මෙවැනි දර්ශක රළු සහ එසැණ වැඩ සඳහා ප්‍රයෝජනවත් ය. නමුත් මානව සංවර්ධන එළඹුමේ නියම වටිනාකම වන්නේ සංවර්ධනය බහුවිධ ව ඇගයීමේ අවශ්‍යතාව පිළිබඳ අවධානය යොමු කිරීම නිසා මිස එමඟින් ඉදිරිපත් කරන සංයුත මිනුම්වලින් විවිධාකාර සංඛ්‍යාලේඛන තේරුම් ගැනීමට ආධාර කරන නිසා නොවේ."**[202]

90 දශකයේ පමණ සිට සංවර්ධන ආධාර ලබා දීමේ මූලික අරමුණ බවට 'සංවර්ධනය යනු දුප්පත්කම තුරන් කිරීමයි' යන්න පත් වීමට මානව සංවර්ධන දර්ශක ද හේතු විය. බොහෝ ආධාර ලබාදෙන රටවල් නියෝජනය කරන *OECD :(Organization of Economic Cooperation and Development)* හෙවත් ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානය '21 වැනි සියවස හැඩ ගැස්වීමඃ සංවර්ධන සහයෝගිතාවේ දායකත්වය' යනුවෙන් ප්‍රතිපත්ති ප්‍රකාශයක් 1996 දී පළ කළේ ය. එහි සඳහන් වූ පරිදි ආර්ථිකයේ අරමුණ විය යුත්තේ මූල්‍යමය වර්ධනය නො ව දැනට පවතින අත්‍යන්ත දුප්පත්කම 2015 වන විට අඩකින් අඩු

201 McGillivray, Mark (1991)"The Human Development Index: Yet Another Redundant Composite Indicator?" World Development 19, no. 10 p. 1461.

202 Sen, Amartya (2000) "A Decade of Human Development," *Journal of Human Development* 1, no. 1 p. 21.

කිරීම යි[203]. සංවර්ධනය යනු මනුෂ්‍ය අවශ්‍යතා සපුරා දීමට හැකිවීම යැයි යන පිළිගැනුම ඒ ආකාරයෙන් දුප්පත්කම තුරන් කිරීම ලෙස අර්ථකතනය විය.

අමාර්ත්‍ය සෙන් අදහස් කළ පරිදි සංවර්ධනය සංකල්ප ගත කිරීමේ දී මූලික අවධානය යොමු විය යුත්තේ තමන් විසින් සාක්ෂාත් කර ගත යුතු යැයි තෝරා ගනු ලබන ශක්‍යතා හෙවත් හැකියා වර්ධනය කර ගැනීමට හැම පුද්ගලයෙකුට ම අවස්ථාව හා පහසුකම ලබා දීම සංවර්ධනයේ මූලික අරමුණ බවට පත් කිරීම පිණිස යි. "ජීවිතයේ ගුණාත්මක බව සහ ජීවන තත්ව ඇගයීමට ලක් කිරීමේ ලා ස්ථාවර පදනමක් ලෙස මානව ශක්‍යතාවල තීරණාත්මක වැදගත්කම සැලැකිය හැකි ය"[204] යනුවෙන් සෙන් සඳහන් කරයි.

කෙසේ වෙතත් සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවේ දී අන්තර් ජාතික සංවිධාන වැඩි අවධානයක් යොමු කළේ අත්‍යන්ත දරිද්‍රතාව තුරන් කිරීම පිළිබඳ වැඩපිළිවෙළවල් කෙරෙහි ය. කලක් තිස්සේ ම අත්‍යන්ත දරිද්‍රතාව නිර්ණය කරන ලද්දේ ආදායම් දරිද්‍රතාව මත ය. වඩා මෑත මිනුම්වලට අනුව දිනකට ඇමෙරිකානු ඩොලර් 1.90 (ආසන්න වසයෙන් රු.400/- කට)කට වඩා අඩු ආදායමක් ලබන්නෝ අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන අය වෙති. දරිද්‍රතාව විවිධ මානවලින් ප්‍රකාශ වන්නේ යැයි යන අදහස අනුව ඔක්ස්ෆර්ඩ් සරසවියේ සබිනා අල්කයර් සහ ජේම්ස් ෆොස්ටර් බහුමාන දරිද්‍රතා දර්ශක හඳුන්වා දීමට යෝජනා කළ හ. මානව සංවර්ධනය සම්බන්ධයෙන් බහුමාන පර්යාලෝකයක අවශ්‍යතාව සංවර්ධනය නිර්වචනය කිරීම පිළිබඳව අමාර්ත්‍ය සෙන් ඉදිරිපත් කළ ශක්‍යතා එළඹුමේ *(capability approach)* ද හුවා දක්වා තිබුණි.

---

203 Organization of Economic Cooperation and Development, *(1996) Shaping the 21st Century: The Contribution of Development Cooperation* (Paris: OECD,),p 2

204 Sen, Amartya.( 2003). Development as Capability Expansion. In *Readings in human development*, ed. S. Fukuda-Parr, et al. New Delhi: Oxford University Press.

අල්කයර් සහ ෆොස්ටර්ගේ බහුමාන දරිද්‍රතා දර්ශක සෙන්ගේ චින්තනයෙන් ලද ආභාසය අනුව සකස් කළ ඒවා ය. එතෙක් අනුග මනය කළ ආදායම සහ පරිභෝජනය මැනීම මත දරිද්‍රතාව විස්තර කිරීම මඟින් දිළිඳු බව පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගත නො හැකි බව අල්කයර් සහ ෆොස්ටර් මතය විය. ඒ අනුව ඔවුන්ගේ මෙහෙයවීමෙන් ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන වැඩසටහන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන එක් ව අධ්‍යාපනය, සෞඛ්‍යය හා ජීවන තත්වය යන ප්‍රවර්ග තුනක් සම්බන්ධයෙන් දර්ශක දහයකින් යුත් බහුමාන දරිද්‍රතා දර්ශක හඳුන්වා දුන්නේ ය. යම් යම් වෙනස්කම් සහිතව මෙකී දර්ශක ශ්‍රී ලංකා රජයේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2019 සිට උපයෝගී කර ගෙන තිබේ. පහත සඳහන් වන්නේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශයට පත් කර ඇති ඒ බහුමාන දර්ශක දහය යි:[205] වරහන් ඇතුළත සඳහන් කර ඇත්තේ ඔක්ස්ෆර්ඩ් දරිද්‍රතා සහ මානව සංවර්ධන වැඩසටහන විසින් හඳුන්වා දුන් මුල් දර්ශකය යි[206].

### අධ්‍යාපනය

1. **පාසල් යන වසර ප්‍රමාණයඃ** කුටුම්බයට අයත් වයස 15ට වැඩි සාමාජිකයෙකු අවම වශයෙන් වසර 5 ක් වත් පාසල් ගොස් නැති නම් එම කුටුම්බය පාසල් අධ්‍යාපනය අහිමි කුටුම්බයක් සේ සැලකේ. *(කුටුම්බයක සුදුසුකම් ඇති අයෙකු වසර හයක පාසල් අධ්‍යාපනයක් සම්පූර්ණ කර නො තිබීම දරිද්‍රතා දර්ශකයකි.)*

2. **පාසල් යෑමඃ** කුටුම්බයට අයත් වයස 5-14 ත් අතර දරුවෙකු පාසල් නො යන්නේ නම් එම කුටුම්බය පාසල් ගමන අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(අටවැනි පන්තිය දක්වා*

205 http://www.statistics.gov.lk/Poverty/StaticalInformation/GlobalMultidimensional Poverty for SriLanka

206 https://ophi.org.uk/multidimensional-poverty-index/

*ඉගෙනීමට ගත වෙන වයස් ප්‍රමාණය දක්වා පාසලකට නොයන දරුවෙකු කුටුම්බයක සිටීම දරිද්‍රතා දර්ශකයකි.)*

**සෞඛ්‍යය**

3. **පෝෂණය:** පෝෂණ තොරතුරු ලබාගත හැකි කුටුම්බයක වයස 15-49 අතර ස්ත්‍රියක හෝ වයස අවුරුදු 5 හට අඩු දරුවෙකු හෝ මන්දපෝෂණයෙන් පෙළෙන්නේ නම් එම කුටුම්බය පෝෂණය අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(කුටුම්බයක පෝෂණය පිළිබඳ ව තොරතුරු හා සැසඳූ විට එම කුටුම්බයට අයත් වයස 70ට අඩු ඕනෑම පුද්ගලයෙකු මන්දපෝෂණයෙන් පෙළීම දරිද්‍රතා දර්ශකයකි.)*

4. **ළදරු මරණ:** ගත වූ වසර පහ ඇතුළත කිසියම් කුටුම්බයක වයස අවුරුදු 5 කට අඩු දරුවෙකු මිය ගොස් ඇත්නම් එම කුටුම්බය ළදරු මරණ සම්බන්ධ අසමත් කුටුම්බයක් සේ සැලකේ. *(සමීක්ෂණයට පෙර ගත වූ වසර පහ තුළ කුටුම්බයේ වයස 18ට අඩු දරුවෙකු මියගොස් තිබීම දරිද්‍රතා දර්ශකයකි.)*

**ජීවන තත්වය:**

5. **විදුලි බලය:** කුටුම්බයක නිවහනට විදුලි බලය ලැබී නොමැති නම් එය විදුලි බලය අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(කුටුම්බයේ නිවහනට විදුලි බලය නොමැති වීම දරිද්‍රතාව පිළිබඳ දර්ශකයකි.)*

6. **පානීය ජලය:** කුටුම්බයකට ආරක්ෂාකාරී පානීය ජලය ලබා ගැනීමට නැති නම් හෝ පානීය ජලය ලබා ගැනීමට විනාඩි 30කට වැඩි කාලයක් ඇවිද යෑමට සිදුවන්නේ නම් හෝ එම කුටුම්බය පානීය ජලය අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(කුටුම්බයේ පානීය ජල ප්‍රභවය සනීපාරක්ෂක නො වීම හෝ පානීය ජලය ගෙන ඒමට විනාඩි 30කට වඩා ඇවිද ගොස් ඒමට සිදුවීම දරිද්‍රතාව පිළිබඳ දර්ශකයකි.)*

7. **සනීපාරක්ෂක කටයුතුඃ** කුටුම්බයක වැසිකිළි වැඩිදියුණු නොකළ (උදාඃ ජල මුද්‍රිත නො වන) ඒවා නම් හෝ වෙනත් කුටුම්බ සමඟ හවුලේ භාවිතා කළ යුතු ඒවා නම් හෝ එම කුටුම්බය සනීපාරක්ෂාව අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(වැඩිදියුණු නොකළ වැසිකිළි පහසුකම් හෝ කිසිදු වැසිකිළි පහසුකමක් කුටුම්බයකට නො තිබීම හෝ වැඩිදියුණු කළ වැසිකිළියක් අනෙකුත් කුටුම්බ සමඟ හවුලේ භාවිත කිරීමට සිදුවීම දරිද්‍රතාව පිළිබඳ දර්ශකයකි.)*

8. **සුදුසු ගෙබිමඃ** කිසියම් කුටුම්බයක ගෙබිම සෑදී ඇත්තේ මඩ, මැටි හෝ වැලිවලින් නම් එම කුටුම්බය සුදුසු ගෙබිමක් නැති කුටුම්බයක් ලෙස සැලකේ. *ඃකුටුම්බයක නිවහනේ ගෙබිම, වහල සහ බිත්ති උචිත ගොඩනැගිලි ද්‍රව්‍යවලින් තනා නො තිබීම දරිද්‍රතාව පිළිබඳ දර්ශකයකි.)*

9. **පිසීමේ ඉන්ධනඃ** කිසියම් කුටුම්බයක් ආහාර පිසීම සඳහා භාවිත කරන්නේ දර, ලී කුඩු, දහයියා හා අඟුරු වැනි දේවල් නම් එම කුටුම්බය පිසීමේ ඉන්ධන අහිමි නිවසක් ලෙස සැලකේ. *ඃකුටුම්බයක් ගොම, පිදුරු, දර, අඟුරු හා ගල් අඟුරු වැනි ඝන ද්‍රව්‍යයක් පිසීමේ ඉන්ධන වශයෙන් භාවිත කිරීම දරිද්‍රතාව පිළිබඳ දර්ශකයකි.)*

10. **වත්කම්ඃ** කුටුම්බයකට රේඩියෝවක්, රූපවාහිනියක්, බයිසිකලයක්, මෝටර් සයිකලයක් හෝ ශීතකරණයක් යන භාණ්ඩ වර්ග අතුරින් එක් වර්ගයකට වඩා නැති අතර ම මෝටර් රථයක් හෝ ට්‍රක් රථයක් ද නැති නම් එම කුටුම්බය වත්කම් අහිමි කුටුම්බයක් ලෙස සැලකේ. *(මේ දර්ශකය වෙනස් කර නැත.)*

අත්‍යන්ත දරිද්‍රතාව තුරන් කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් මෙවැනි ප්‍රාථමික මට්ටමේ බහුමාන දර්ශක තිබීම ප්‍රයෝජනවත් විය හැකි වුව ද ඉහත දැක් වූ ආකාරයට සූත්‍රගත කිරීම තුළ ඉදිරියේ දී සාකච්ඡා කෙරෙන තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම එම

දර්ශකවලින් නිරූපණය කළ හැක්කේ ඉතා සීමිත ව ය. උදාහරණයක් ලෙස අධ්‍යාපනය පිළිබඳ ඉහත දැක්වෙන දර්ශක දෙක මඟින් තිරසාර සංවර්ධන අරමුණුවල සඳහන් වන ගුණාත්මක අධ්‍යාපනයක් *(quality education)* සහ යාවජීව ඉගෙනුම් අවස්ථා ලබා ගැනීමට ඇති හැකියාව නිරූපණය නොවේ. තිරසාර සංවර්ධන අරමුණු 17 අතරින් සිව් වැන්න වන්නේ "හැම දෙනෙකුට ම අන්තර්ග්‍රහනීය *(inclusive)* සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම සහතික කිරීම සහ යාවජීව ඉගෙනුම් අවස්ථා ලබා ගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම" යි.

16 වැනි තිරසාර සංවර්ධන අරමුණේ එන "යුක්තිය සාක්ෂාත් කර ගැනීමට සියල්ලන්ට හැකිවීම" වැනි ඉලක්ක හා අදාළ දර්ශක බැහැර කිරීම මඟින් මෙකී දරිද්‍රතාව පිළිබඳ මිනුම් අදේශපාලනිකව තබා ගැනීමට අල්කයර් සහ ෆොස්ටර් වෑයම් කර තිබෙන බව පෙනී යයි. එහෙත් තිරසාර සංවර්ධනය යනු හුදෙක් අත්‍යන්ත දුප්පත්කම තුරන් කිරීම නොවේ. අනෙක් අතට බහුමාන දර්ශක යොදා ගැනීම යනු ආදායම් දරිද්‍රතාව නො තකා හැරීම නොවිය යුතුය. මන්ද දුප්පත්කම පිළිබඳ ප්‍රධාන නිර්ණායකයක් වන්නේ ජීවත් වීමට සරිලන ආදායමක් උපයා ගැනීමට නො හැකි වීම බැවිනි.

කෙසේ වෙතත් දුප්පත්කම නිර්වචනය කිරීම සංවර්ධන කතිකාව තුළ කලක් විවාද ජනක කරුණක් බවට පත් ව තිබුණි. දුප්පත්කම යන්න නිවැරදිව අවබෝධ කර ගත හැක්කේ පරිභෝජන අසමත්කම, ආදායම හෝ වත්කම් ඌනතා අනුව නො ව කෙනෙකු සතු ශක්‍යතා හෙවත් හැකියාවල අසමත්කම හෙවත් ඌනතා අනුව බව අමාර්ත්‍ය සෙන් නො කඩවා තර්ක කළේ ය. අවශ්‍ය කරන හැකියාවල ඌනතා නිසා තමන්ට ලැබිය හැකි නොයෙක් අවස්ථා උපයෝගි කර ගැනීමට මිනිස්සු අපොහොසත් වෙති. එහෙත් අඩු ආදායමක් ලැබීම හා එවැනි ඌනතා අතර හැම විටම නියත සම්බන්ධයක් නැත. සෙන් පෙන්වා දෙන පරිදි සමාජයේ ආන්තික තත්වයට පත් ව ඇති නිර්ප්‍රභූ ජනතාවට ලැබෙන ආදායම වුව ද

ශක්‍යතා නැතිකම නිසා සඵලදායක ක්‍රියාකාරකම් බවට නියත ලෙස ම හැරවීම අසීරු දෙයකි. ඒ අනුව "දුප්පත්කම යනු කිසිදු බලයක් නැතිකම පිළිබඳ හැඟීමත්, දුප්පතුන් කියන දෙයක් ගණනකට නො ගැනීමත් ය"[207] යනුවෙන් දුප්පත් කැමරූන් ජාතිකයෙකු සිය දුප්පත්කම විස්තර කළ ආකාරය දුප්පත්කම ගැන දිය හැකි කදිම අර්ථකතනයකි. දුප්පතුන් විසින් ම දුප්පත්කම නිර්ණය කරන ආකාරය සම්බන්ධයෙන් ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් රටවල් පනහකින් එකතු කළ දත්ත අනුව සමීක්ෂණයක් කළ දීපා නාරායන් ඒ බව සිය *Voices of the Poor( Can Anyone Hear Us?* නම් කෘතියේ සඳහන් කරයි.

කලින් කල ඇතිවෙන ව්‍යසනවලින් ජනගහනයෙන් සැලැකිය යුතු කොටසක් මියයෑම ස්වභාවයකි යන ජනගහන න්‍යාය 18 වැනි සිය වසේදී ඉදිරිපත් කළ තෝමස් මැල්තුස් දුප්පත්කම ද අනිවාර්ය දෙයක් බව පැවසීය. ස්වාභාවික නියාමවලට අනුව ඇතැම් මනුෂ්‍යයන් දුප්පත් වීම අනිවාර්යතාවක් බවත් ජීවිතය නැමති ලොතරැයියේ තෑගි අහිමි ව අසන්තෝෂයට පත් මිනිසුන් වන්නේ ඔවුන් බවත් මැල්තුස් ප්‍රකාශ කළේ ය.[208] දුප්පත්කම කරුම විපාකයක් බව විශ්වාස කිරීමට තවමත් මිනිසුන් පොලඹවන සමාජයක වෙසෙන අපට 18වනි සියවසේ විසූ මැල්තුස් එසේ පැවසීම ගැන පුදුම විය නො හැකිය. බොහෝ අයගේ වැටහීම අනුව දුප්පත්කම යනු ඉතිහාසය පුරාම පැවති යථාර්ථයකි. එනිසා දුප්පත්කමෙන් තොර සමාජයක් ගැන සිතීම පවා බොහෝ දෙනෙකුට අසීරු විය.

එහෙත් දුප්පත්කම අනිවාර්යතාවකි යන මැල්තුස්ගේ මතය සාවද්‍ය බව මැල්තුස්ගේ මරණයෙන් පසු ගත වූ සියවස් දෙක තුළ සිදු වූ වෙනස්කම් මඟින් ඉගෙන ගැනීමට අපට හැකි විය. අතීතයේ පැවති අත්‍යන්ත දුප්පත්කම අනිවාර්ය දෙයක් නො වන බව අපි දැන්

207 Deepa Narayan (2000), Voices of the Poor: Can Anyone Hear Us?, Oxford University Press, p.39

208 Thomas Malthus (1798) – An Essay on the Principle of Population. Chapter X, paragraph 29, lines 12-15. (Online)

දනිමු. ආර්ථික වර්ධනය නිසා අතීතයේ පැවති අත්‍යන්ත දුප්පත්කමින් සහමුලින් ම පාහේ මිදීමට ඇතැම් සමාජවලට හැකිව තිබේ.

ධනවත් ම රටවල් අතරින් 16 වෙනි ස්ථානයේ ලා සැලකෙන ස්වීඩනය උදාහරණයකට ගත්තොත්. 2020 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ලංකාවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 6,382ක් වන විට ස්වීඩනයේ එය ඩොලර් 56,270 ක් විය. එම වෙනස නව ගුණයකට ආසන්න ය.

එසේ වුව ද සියවස් දෙකකට පෙර ස්වීඩනයේ ජනතාවගෙන් සාතිශය බහුතරයක් අත්‍යන්ත දිළිඳු කමින් පෙළුනි. එකල ස්වීඩනයේ ඉපදුණු හැම දරුවන් හතර දෙනෙකුගෙන් එක් අයෙකු දිළිඳුකම නිසා මිය ගිය හ. දිළිඳුකම එවකට කොතරම් පෘථුල දෙයක් දැයි කිව හොත් ජීවත් වීමට සුදුසු තැනක් පිළියෙල කර ගැනීමට, නිවස උණුසුම් කර ගැනීමට හෝ මන්දපෝෂණයෙන් මිදීමට හැකි ආහාරයක් ගැනීමට ස්වීඩනයේ ජනගහනයෙන් 90% කට පමණ හැකියාවක් නො වීය.

එහෙත් 19වෙනි සියවසේ සිට ස්වීඩනය නූතන නිෂ්පාදන තාක්ෂණය උපයෝගී කර ගෙන දැවැන්ත ආර්ථික වර්ධනයක් ඇති කර ගත්තේ ය. අනතුරු ව මීට සියවසකට පෙරත් ස්වීඩනය දුප්පත් රටක් ලෙස සැලකුණු නමුත් ඒ වන විටත් ඇති වෙමින් තිබූ ආර්ථික වර්ධනය නිසා ජනගහනයෙන් බහුතරයට අත්‍යන්ත දරිද්‍රතාවෙන් අත් මිදීමට හැකි වී තිබුණි. අද ස්වීඩනයේ දරිද්‍රතාවෙන් පෙළෙන අය ලෙස සැලකෙන්නේ දිනකට ඇමෙරිකානු ඩොලර් 30 කට (ආසන්න වසයෙන් දිනකට රුපියල් 6000/- කට) අඩු ආදායමක් ලබන්නේ නම් පමණි.[209] ඒ අනුව ස්වීඩනයේ ජනගහනයෙන් 6%ක් හෙවත් 570,000 ක් පමණ දුප්පත් වීමේ අවදානමට ලක් වූ අත්‍යවශ්‍ය ජීවන වියදම දැරීමට අපහසු අඩු ආදායම් ලබන්නන් වසයෙන් සැලකේ. ඒ අය අතරෙන් සැලකිය යුතු පිරිසක් අඩු ආදායම් ලබන රටවලින් පැමිණි සංක්‍රමණිකයෝ ය.

209 https://ourworldindata.org/history-of-poverty-has-just-begun retrieved on 19 Jan 2022

ආර්ථික වර්ධනයට අතිරේකව ගෝලීය මට්ටමට සාපේක්ෂව දුප්පත්කම මුළුමනින් ම පාහේ තුරන් කර දැමීමට ස්වීඩනයට හැකි වූ ප්‍රධාන හේතුවක් නම් කාර්යක්ෂම බදු ක්‍රමයක් මඟින් ධනය නැවත බෙදී යෑම තහවුරු කරන ඵලදායක සමාජ සුභසාධන ක්‍රමයක් ඇති කර ගැනීමට හැකිවීමයි. කාලාන්තරයක සිට පවත්වා ගෙන යන එම සුභසාධන ක්‍රමය මඟින් හැම රටවැසියෙකුට ම අවම ආදායමක් සහතික කර තිබේ. එය ස්වීඩනයේ සාමාන්‍ය වැටුපෙන් 60%-70% අතර ප්‍රමාණයකි. එයට පවුලේ සෑම ළමයෙකු වෙනුවෙන් ම දෙමව්පියන්ට ලැබෙන බදු රහිත දීමනාවක් (තනි මවකට හෝ පියෙකුට ඒ සඳහා අමතර දීමනාවක් ද ලැබේ), හැම ළමයෙකු වෙනුවෙන් ම පළමු පාසල් වසර දක්වා දොළොස් මසක වැටුප් සහිත නිවාඩුවක් භුක්ති විඳීමට දෙමව්පියන්ට ඇති අයිතිය, අනුපූරක ගාස්තු යටතේ නිවසේ දී හෝ ආණ්ඩුවේ දිවා පහසුකම් මධ්‍යස්ථානයක දී හෝ ළමයින් රැක බලා ගැනීමේ වියදමෙන් කොටසක් ලබා ගැනීමේ අයිතිය. පෙර පාසල් සඳහා සහන ගාස්තු, එතෙක් ලැබුණු ආදායමෙන් 80%ක් පමණ රැකියා විරහිත රක්ෂණය යටතේ ලැබීමේ අයිතිය වැනි හිමිකම් අයත් වේ. ඒ හැර වයස 6-19 අතර සියලු දරුවන්ට නොමිලයේ අධ්‍යාපනය ලබා දේ. ඒ අනුව 2017 දී ස්වීඩනයේ පාසල් හැර යන වියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගෙන් 90% ක් ඇමෙරිකාවේ ශාස්ත්‍රාලයීය ඩිප්ලෝමාවට සමාන සුදුසුකම් සපුරා සිටියේ ය. මේ ක්‍රමය පවත්වා ගැනීම සඳහා ස්වීඩන රජය සැලකිය යුතු බදු ආදායමක් අය කරයි. ඇමෙරිකානු වැසියෙකු 10%ක ආදායම් බද්දක් ගෙවන විට ස්වීඩන රටවැසියෙක් ආදායමේ ප්‍රමාණය අනුව තම ආදායමෙන් 29%සිට 35% දක්වා ප්‍රමාණයක් ආදායම් බදු වශයෙන් ගෙවිය යුතුය.

2016දී රැස් කළ දත්තවලට අනුව ස්වීඩන ජනගහනයෙන් 1% කටත් වඩා අඩු සංඛ්‍යාවක් අත්‍යන්ත ද්‍රව්‍යමය දරිද්‍රතාවෙන් *(Severe Material Poverty)* පෙළෙන බව වාර්තා විය. අත්‍යන්ත ද්‍රව්‍යමය දරිද්‍රතාවෙන් පෙළන්නන් වශයෙන් එහි දී සලකන ලද්දේ පහත

සඳහන් ශක්‍යතා හය අතරින් අවම වසයෙන් හතරක් වත් සාක්ෂාත් කර ගත නො හැකි වූ කුටුම්බවාසීනු යි[210].

1. අනපේක්ෂිත වියදම් දරා ගැනීමට ඇති හැකියාව
2. වසරකට වරක් වත් නිවසින් බැහැර සතියක නිවාඩුවක් ගත කිරීමේ වියදම දරා ගැනීමට ඇති හැකියාව
3. දවසක් ඇර දවසක් වත් මස් හෝ මාලු සහිත ආහාරයක් ගැනීමේ හැකියාව.
4. ශීත කාලයේ දී නිවස උණුසුම් කිරීමේ වියදම දරා ගැනීමේ හැකියාව
5. රෙදි සෝදන යන්ත්‍රයක්, වර්ණ රූපවාහිනියක්, දුරකථනයක් හා වාහනයක් වැනි ප්‍රාග්ධන භාණ්ඩ සතු ව තිබීම
6. ණය ගෙවීමේ හැකියාව (උකස්, කුලී, සේවා බිල්පත්, ගාස්තු, ණය වාරික ගෙවීම ද ඇතුළත් ව)

කෙසේ වෙතත් ලෝක බැංකුව ඇතුළු ජාත්‍යන්තර සංවිධානය දරිද්‍රතාව ලෙස සලකන්නේ දිනකට ඇමෙරිකානු ඩොලර් 1.90කට අඩු (ආසන්න වසයෙන් රුපියල් 400/- ක්) ආදායමක් ලැබීමයි. මෙම ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව ලෝකයේ අඩු ආදායම් මට්ටමේ රටවල් 15 ක දත්ත මත නිර්ණය කරන ලද්දකි.

එහෙත් ඉහළ ආදායම් මට්ටමේ ලා සලකන බොහෝ රටවල දෛනික දරිද්‍රතා රේඛාව ද ස්වීඩනයේ මෙන් ම ඩොලර් 30 (රු. 6000/-) ක මට්ටමට පවතී. ඒ අනුව ඩොලර් 30 ක ට වඩා අඩු දෛනික ආදායමක් ඇති අය දුප්පතුන් වශයෙන් සැලකුවොත් වර්තමානයේ ලෝක ජනගහනයෙන් 85% ක් ම අයත් වන්නේ දුප්පතුන්ගේ ගණයට බව ආචාර්ය මැක්ස් රෝසර් පෙන්වා දෙයි[211].

ස්වීඩනයේ මෙන් දිනකට ඩොලර් 30 කට වැඩි ආදායමක් නො ලැබීම දරිද්‍රතාව ලෙස ආදේශ කර ගත හැකි තරම් ඉහළ

210 https://www.eapn.eu/wp-content/uploads/2019/01/EAPN-EAPN-SE-Poverty-Watch-2018-En-Final.pdf retrieved on the 19 Jan 2022

211 Roser, Max (2022), The history of the end of poverty has just begun, published at https://ourworldindata.org/history-of-poverty-has-just-begun retrieved on the 19 Jan 2022

ආර්ථික වර්ධනයක් හැම රටකට ම ඇති කර ගැනීමට නම් ගෝලීය ආර්ථික වර්ධනය අද මෙන් පස් ගුණයකින් පමණ වැඩි විය යුතු බව ආචාර්ය රෝසර් පවසයි. එහෙත් චක්‍රීය ක්‍රමවලට සංක්‍රමණය නොවී රේඛීය නිෂ්පාදන විධි ක්‍රම පවත්වා ගනිමින් පස් ගුණයක ආර්ථික වර්ධනයක් ලොව පුරා ඇති කර ගැනීමට තැත් කිරීම තුලින් තිරසාර සංවර්ධනයක් සහතික කළ නො හැකිය.

තදනන්තර ව සංවර්ධනය යන්න නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම මත අර්ථකථනය කළ වෑයමක් ලෙස 2000 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් සහස්‍රක සංවර්ධන අරමුණු *(Millennium Developments Goals)* සැලකිය හැකි ය. මේ යටතේ නිශ්චිතව විසඳීම පිණිස සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන දිළිඳුකම ප්‍රමුඛ සංවර්ධන ගැටලු කිහිපයක් තෝරා ගන්නා ලදී. අනතුරු ව ඒවා කිනම් ප්‍රමාණයකට හෝ ආකාරයකට විසඳිය යුතු ද යන්න නිශ්චය වන අරමුණු සහ ඉලක්ක වසයෙන් නිරූපණය කොට එම ඉලක්කවල සාර්ථකත්වය විනිශ්චය කළ හැකි දර්ශක ද හඳුන්වා දෙනු ලැබීය.

එම සහස්‍රක සංවර්ධන අරමුණුවල පරමාර්ථය වූයේ අත්‍යන්ත දිළිඳුකම සහ සාගින්න පිටුදැකීම, සැමට ප්‍රාථමික අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ ස්ත්‍රීන් සබල ගැන්වීම, ළමා සෞඛ්‍යය, මාතෘ සෞඛ්‍යය, ඒඩ්ස් පැතිරීම වැළැක්වීම, පාරිසරික තිරසාර භාවය සුරැකීම සහ සංවර්ධනය සඳහා නව ගෝලීය සහයෝගීතාව ගොඩනැගීම යන අට වැදෑරුම් මූලික අරමුණු වසර 15 ක කාලයක් ඇතුළත සපුරා ගැනීම යි. මේ එක් එක් අරමුණක් ඉලක්ක සහ දර්ශක වසයෙන් ඉදිරිපත් කිරීම සහස්‍රක සංවර්ධන අරමුණුවල විශේෂත්වය විය. උදාහරණයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමානතාව සහ ස්ත්‍රීන් සබල ගැන්වීම යන අරමුණ යටතේ ඉලක්ක වසයෙන් සැලකුණේ වසර 2005 වන විට ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට සහභාගී වීම සම්බන්ධ ඇති ස්ත්‍රී පුරුෂ අසමානතාව අහෝසි කිරීම සහ වසර 2015 වන විට සියලු මට්ටම්වල අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාන සහභාගිත්වයක්

ඇති ව තිබීම යි. මේ පොදු ඉලක්කයේ දර්ශක වසයෙන් සලකන ලද්දේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගැහැණු හා පිරිමි දරුවන් අතර ඇති අනුපාතිකය, වයස 15-24 දක්වා අයගේ සාක්ෂරතාවය සම්බන්ධයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ඇති අනුපාතිකය, කෘෂිකාර්මික නො වන අංශවල වැටුප් සහිත රැකියාවල නියුක්ත ව ඇති ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය සහ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රීන් විසින් නියෝජනය කරනු ලබන ආසන ප්‍රමාණයේ ප්‍රතිශතයයි. එසේ ප්‍රගතිය ප්‍රමාණාත්මක ලෙස නිරූපණය කළ යුතු බව ඉල්ලා සිටීම සහස්‍ර සංවර්ධන අරමුණුවල විශේෂත්වයක් විය.

අත්‍යන්ත දිළිඳුකම අඩකින් අඩු කිරීම ඉලක්ක කරගත් සහස්‍ර සංවර්ධන අරමුණු මගින් දිළිඳුකම නිර්වචනය කළේ දිනකට ඩොලර් 1.25 ට අඩුවෙන් උපයන අය දිළින්දන් වසයෙන් සලකමිනි. ආදායමින් දිළින්දන් වන අය හැරෙන විට වෙනත් සමාජ විෂමතා නිසා දිළින්දන් වන අය ගැන සැලකිල්ලක් දැක්වීමට එම අර්ථකථනය තුළ අවකාශ නොවීය. ඒ අනුව දියුණු රටවල සමාජ විෂමතාව නිසා ඇතිවෙන සාපේක්ෂ දිළිඳුකම ආමන්ත්‍රණය කිරීමක් සහස්‍ර සංවර්ධන අරමුණු තුළින් ඉටු නො වී ය. අනික් අතට සහස්‍ර අරමුණු සංකල්ප ගත වුණේ ම දියුණු රටවල් නො දියුණු රටවලට ආධාර කිරීම යන සාම්ප්‍රදායික අනුග්‍රාහක සංකල්පයට අනුව ය.

කෙසේ වෙතත් සහස්‍ර සංවර්ධන අරමුණු පිළිබඳ පුළුල් දේශපාලනික සාකච්ඡාවක් තම තමන්ගේ රටවල් තුළ ඇති කිරීමට ආණ්ඩු බලය දරන හෝ බලය අත්පත් කර ගැනීම අරමුණු කරගත් දේශපාලන පක්ෂ කණ්ඩායම් මෙන් ම රාජ්‍ය නො වන සංවිධාන ද එතරම් උනන්දු නො වී ය. ඒ අනුව පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රීන්ගේ ආසන සංඛ්‍යාව වැඩි වීම සහස්‍ර සංවර්ධන අරමුණුවලින් ඉල්ලා සිටි දර්ශකයක් බව බොහෝ ඡන්ද දායකයෝ නො දනිති. ජනවාර්ගික හා ආගමික පක්ෂපාතකම් මත අධිපතිවාදී දේශපාලන ව්‍යාපෘති පවත්වා ගෙන ගිය ලංකාව වැනි ඇතැම් රටවල් මානව අයිතිවාසිකම් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳ දැක්වූ නුරුස්සන

ආකල්පය ද සහස්‍රක සංවර්ධන අරමුණු පිළිබඳ ප්‍රමාණවත් දේශපාලන සාකච්ඡාවක් ජනගත වීම වැළැක්වීමට හේතු වූවා විය හැකි ය.

2015 වන විට ඇතැම් සහස්‍රක සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ කිසියම් ප්‍රගතියක් අත්පත් කර ගෙන තිබුණි. උදාහරණයක් ලෙස 1990 දී ලොව පුරා අත්‍යන්ත දිළිඳුකමින් පෙළුණු ජනගහනය බිලියන 1.9ක් වූ අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාවලට අනුව 2015 වන විට එය මිලියන 836 දක්වා අඩු ව තිබුණි. එහෙත් අනෙකුත් ඇතැම් අරමුණු බලාපොරොත්තු වූ ආකාරයෙන් ම සාක්ෂාත් කර ගැනීමට නො හැකි විය.[212] ඒ බව දිගින් දිගට ම පවතින ස්ත්‍රී පුරුෂ අසමානතාව, පොහොසතුන් හ දුප්පතුන් අතර ආදායම් පරතරය අතිශයින් වැඩි වීම, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර පහසුකම් විෂමතාව, අධ්‍යාපන අවස්ථාවල හා ගුණාත්මක බව පිළිබඳ විෂමතාව, ගෝලීය උණුසුම ඉහළ යෑම නිසා ඇතිවෙන ව්‍යසන හා දේශගුණික වෙනස් වීම්, පරිසර ගැටලු හා මානව සංවර්ධනයට එරෙහි වන විවිධ ගැටුම් යනාදියෙන් පැහැදිලි වේ. මෙකී සෘණ විපාකවලට බොහෝ දුරට හේතු වූයේ සාම්ප්‍රදායික ආර්ථික වර්ධන වේගය ඉස් මුදුනේ තබා ගත් දේශපාලන ආර්ථික චින්තනය යි. දේශපාලනික වසයෙන් සහස්‍රක සංවර්ධන අරමුණු සියල්ල ඒකාග්‍ර ලෙස ප්‍රක්ෂේපණය කර ගැනීමට හැකි ක්‍රමවේදයක් ද එම වැඩ පිළිවෙළ තුළ නො තිබිණි. සමස්තයක් ලෙස ගත් විට සහස්‍රක සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම අධිපතිවාදී ආර්ථික චින්තනය තුළ සංවේදී දේශපාලන කරුණක් බවට පත් නො වීම බලාපොරොත්තු විය යුත්තකි.

ඒ හැර රටවල ආභ්‍යන්තරික විෂමතා ද, විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ අවගමනය ද මේ අසමබර වර්ධනයට හේතු විය. ගෝලීය බල දේශපාලනය මෙන් ම රටවල් අතර පැවති විෂමතාව ද ඊට බෙහෙවින් බලපෑවේ ය. උදාහරණයක් ලෙස සහරා උප කලාපයට අයත් රටවල් මූලික අවශ්‍යතා සපුරා ගැනීම ආසියාතික හා ලතින් ඇමෙරිකානු රටවලට වඩා සෑහෙන පහළ මට්ටමක

212 Hazra, Somnath and Bhukta, Anindya (eds.) (2020), p. vii, Sustainable Development Goals, An Indian Perspective, New York: Springer

පැවතුණි. තෙවැනි ව සහස්‍රක සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට එකඟ වූ පහළොස් අවුරුද්ද තුළ සංවර්ධන අවශ්‍යතා පිළිබඳ පර්යාලෝකය ද සැලකිය යුතු ලෙස වෙනස් වී තිබුණි. උදාහරණයක් ලෙස පෘථිවි පරිසරයට දැඩි පීඩනයක් එල්ල වී තිබූ බැවින් පරිසර සංරක්ෂණය පිළිබඳ අවශ්‍යතාව ඉස්මතු වෙමින් තිබූ අතර කෙමෙන් උග්‍ර වෙමින් තිබූ බලශක්ති සහ ජල පරිභෝජන අවශ්‍යතා විසඳීමට වැඩි ප්‍රමුඛත්වයක් දීමට සිදුවිය. අනික් අතට සහස්‍රක සංවර්ධන අරමුණු තුළ දේශපාලනය යුක්ති සහගත කිරීමට හා ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය පුළුල් කිරීමට තුඩු දෙන ඍජු අරමුණු අඩංගු වී නො තිබිණි. සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගිතාව ගොඩ නැගීම වැනි අරමුණු කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නො වූ අතර නවලිබරල්වාදී ආකල්පය විසින් උත්කර්ෂණයට නංවන ලද තරඟකාරී ගෝලීය වෙළඳපොළ හා සංවර්ධනයේ දර්ශකය ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ යෑම ගැන අවධාරණය කිරීම ගෝලීය සහයෝගිතාවට ආදේශයක් වසයෙන් යොදා ගැණිනි.[213]

අත්‍යන්ත දිළිඳු බව අවම කිරීම වැනි ඇතැම් අරමුණු සම්බන්ධයෙන් සමහර රටවල් සතුටුදායක ප්‍රතිඵල ලබා තිබුණ ද පොදුවේ ගත් විට සහස්‍රක සංවර්ධන අරමුණු අනුව කටයුතු කිරීම සහ ඒ මඟින් ඉලක්ක කරගත් සැබෑ ප්‍රතිඵල සම්බන්ධ ව තිබුණේ සංශයවාදී ආකල්පයකි. වසර 2000 දී සහස්‍රක සංවර්ධන ඉලක්ක ප්‍රකාශයට පත් කළ පසු ඒ මඟින් දී තිබූ ඉලක්ක අත්පත් කර ගැනීම ගැන සංඛ්‍යානමය වසයෙන් වැදගත් තොරතුරු නොමැති බව ෆ්‍රීඩ්මන්ඩ් විසින් කරන ලද අධ්‍යනයකින් යෝජනා කළේ ය.[214] විලියම් ඉස්ටර්ලි වැනි ඇතැම් විචාරකයින්ගේ විවේචනවලට අනුව සහස්‍රක සංවර්ධන අරමුණු මඟින් ප්‍රවර්ධනය කරන ලද සංවර්ධනය

213 Lomazzi, Marta et el. (2014) The Millenium Development Goals, Experiences

214 Friedman, HS (2013) Causal Inference and the Millennium Development Goals (MDGs): Assessing Whether There Was an Acceleration in MDG Development Indicators Following the MDG Declaration. MPRA Paper no. 48973, 3rd August 2013. Available at https:// mpra.ub.uni-muenchen.de/48793/. (Accessed on 14 June 2021)

පිළිබඳව ආකල්පය වැරදි එකකි. ඒ සංවර්ධනය යනු තාක්ෂණික, අනුග්‍රාහක ආධාර මත ඉටු වන දෙයක් ලෙස සලකමින් සහස්‍රක සංවර්ධන අරමුණු ඉන්ද්‍රජාලික ව දේශපාලනයෙන් වියුක්ත කර තිබූ බැවිනි. සංවර්ධනය යනු බටහිරෙන් එන ගැලවුම්කරුවන් පිළිබඳ බලාපොරොත්තුවක් නො ව දේශපාලන නිදහස පුළුල් කර ගැනීමට ස්වදේශිකයන් ගන්නා උත්සාහය තුළින් ජනිත වන්නකි.[215] තවත් බොහෝ විචාරකයෝ තෝරා ගත් සහස්‍රක සංවර්ධන අරමුණුවලින් නවලිබරල්වාදී වටිනාකම් ප්‍රතික්ෂේප නො කළ බව පෙන්වා දුන්හ. උදාහරණයක් ලෙස යාන් වැන්ඩර්මූටල් පෙන්වා දුන් පරිදි "සහස්‍රක සංවර්ධන අරමුණු නවලිබරල්වාදී න්‍යාය පත්‍රය වෙනුවෙන් සංවර්ධනයේ සමාජමය මාන *(social dimensions)* නො සලකා හැරී ය. සහස්‍රක සංවර්ධන අරමුණුවලට ආදායම් දරිද්‍රතාව ඉක්මවා මානව දරිද්‍රතාවේ බහුවිධ ස්වභාවයට සහ පටු වර්ධන සුසමාදර්ශයක සිට පුළුල් මානව කේන්ද්‍රීය තිරසාර යහජීවනයක් පිළිබඳ දැක්මකට අවධානය යොමු කිරීමට නො හැකි විය. ඒ නිසා සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික ආඛ්‍යානය ගොඩ නැගීම පිණිස වියුක්ත මූල්‍ය කේන්ද්‍රීය දැක්මක් සහස්‍රක සංවර්ධන අරමුණු සඳහා අයුතු ලෙස යොදා ගැනිණි."[216]

සාමාජික රටවල් ඒ තරම් උනන්දුවක් නො දැක්වුව ද සහස්‍රක සංවර්ධන අරමුණු හඳුන්වා දුන් අවධියේ දී ම එනම් 1999 දී ආර්ථික විද්‍යාඥයෙකු වූ නොබෙල් ත්‍යාගලාභී අමාත්‍ය සෙන්ගේ *Development as Freedoms (*1999)යන කෘතියෙන් පැහැදිලි කළ ශක්‍යතා එළඹුම *(Capability Approach)* වැනි සංකල්ප ද එක්සත් ජාතීන්ගේ

215 See Sakiko Fukuda-Parr, "Reducing Inequality: The Missing MDG: A Content Review of PRSPs and Bilateral Donor Policy Statements," IDS Bulletin 41, no. 1 (2010): 26–35; Sakiko Fukuda-Parr, "Theory and Policy in International Development: Human Development and Capability Approach and the Millennium Development Goals," International Studies Review 13, no. 1 (2011): 122–132; Fukuda-Parr and Hulme, "International Norm Dynamics."

216 Vandemoortele, Jan "The MDG Story: Intention Denied," Development and Change 42, no. 1 (2011): 1–21.

සංවිධානයේ විශේෂඥයින්ගේ අවධානයට යොමු වී තිබුණි. අමාත්‍ය සෙන්ගේ ශක්‍යතා එළඹුමට අනුව සාම්ප්‍රදායික දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවන වර්ධනය, තාක්ෂණික දියුණුව හෝ කාර්මිකකරණයට වඩා මානව සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ "අපට අගය කිරීමට හේතු ඇති ආකාරයේ ජීවිත ගත කිරීමට ඇති හැකියාවයි"[217]. එහි දී සෙන්ගේ අවධානය යොමු වන්නේ පුද්ගලයන්ගේ ශක්‍යතා, වගකීම් සහ අවස්ථා ඇතුළත් ව පුද්ගලයාගේ කාරකත්වය *(Agency)* හෙවත් ස්වතන්ත්‍ර ව ක්‍රියා කිරීමට හා තෝරා ගැනීම් කිරීමට පුද්ගලයාට ඇති හැකියාව සහ පුද්ගල විචාර බුද්ධිය වර්ධනය කිරීමයි. සෙන්ට අනුව මනුෂ්‍යයන්ගේ ශක්‍යතා වර්ධනය කිරීම හොඳ දෙයක් වන්නේ එමඟින් ඔවුන්ගේ තෝරා ගැනීමේ හැකියාව, යහජීවනය සහ නිදහස පුළුල් වන නිසාත්, සමාජය වෙනස් කිරීම සහ ආර්ථික නිෂ්පාදනය සම්බන්ධයෙන් බලපෑම් කිරීමේ භූමිකාව සවිබල ගැන්වෙන නිසාත් ය.

ශක්‍යතා එළඹුම හඳුන්වා දෙමින් සමානාත්මතාව ඇගයුමට ලක් කිරීමේ ලා පුද්ගලයන්ගේ 'ශක්‍යතාව' *(Capability)* මූලික සාධකයක් ලෙස පෙන්වා දීම සංවර්ධනය පිළිබඳ කතිකාවට අමාර්ත්‍ය සෙන් ලබා දුන් කේන්ද්‍රීය දායකත්වය ලෙස සැලකිය හැකිය.

ශක්‍යතා එළඹුම *(Capability Approach)* හඳුන්වා දීමේ ලා නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥ අමාර්ත්‍ය සෙන් සමඟ පුරෝගාමී වූ ප්‍රකට විද්‍යාර්ථියෙකු වූයේ වර්තමානයේ චිකාගෝ සරසවියේ නීතිය හා ආචාරධර්ම පිළිබඳ මහාචාර්යවරියක ලෙස සේවය කරන ආචාර්ය මාර්තා සී නුස්බවුම් ය. ශක්‍යතා එළඹුම සහ මානව අයිතිවාසිකම් අතර ඇති සහසම්බන්ධය විස්තර කරමින් අයිතිවාසිකම් පිළිබඳ භාෂාව වෙනුවට ශක්‍යතා පිළිබඳ භාෂාව යොදා ගැනීමේ අවශ්‍යතාව නුස්බවුම් මෙසේ පැහැදිලි කරයි:

> **"මා කල්පනා කරන අන්දමට ශක්‍යතා ඉතා සමීප ලෙස අයිතිවාසිකම්වලට සම්බන්ධ වේ. එහෙත් ශක්‍යතා පිළිබඳ භාෂාව අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම ගැන අයිතිවාසිකම් පිළිබඳ භාෂාවට**

217 Sen, A (1999) p. 285 Development as Freedom, New York

දැනට වඩා වැදගත් හා නිශ්චිත පැහැදිලි කිරීමක් එකතු කරයි. මානව අයිතිවාසිකම් යනු සුපැහැදිලි අදහසක් ම නො වේ. අයිතිවාසිකම් යන්න විවිධාකාරයෙන් තේරුම් ගෙන තිබේ. එමෙන් ම අයිතිවාසිකම් පිළිබඳ භාෂාව මඟින් ඇතිවෙන අසීරු න්‍යායික ප්‍රශ්න නිසා ඇතැම් විට ඒවායේ තේරුම විකෘත වෙයි. එනිසා ගැඹුරු දාර්ශනික වෙනස්කම් පවතිද්දී වුවද අයිතිවාසිකම් පිළිබඳ එකඟත්වයක් ඇති බවට වැරදි හැඟීමක් ඇති විය හැකි ය."[218]

ජනතාවට මූලික අයිතිවාසිකම් සාක්ෂාත් කර දීම යනු එම අයිතීන් භුක්ති විඳීම සඳහා ජනතාවට අවශ්‍ය ශක්‍යතා ලබා දීම යි. දේශපාලන සහභාගිත්වය සඳහා අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඇතුළු අයිතීන් මහජනතාවට සාක්ෂාත් කර ගැනීමට හැකි වන්නේ ඒවායේ නිරත වීමට අවශ්‍ය ශක්‍යතා හිමිකර ගෙන ඇත්නම් පමණි. අමාර්ත්‍ය සෙන් සඳහන් කළ අන්දමට ශක්‍යතා ඇති කර ගැනීමේ හැකියාව සංවර්ධනය ලෙස සැලකුව හොත් සජ්ජන සමාජයක පොහොසත් සාමාජික ජීවිතයකට අවශ්‍ය කරන ශක්‍යතා කෙබඳු විය හැකි ද යන්න පිළිබඳව විමසා බැලීමෙන් 'ශක්‍යතාවලින් පොහොසත් වීම' යන්න තේරුම් කිරීමට අපහසු නැත.

එනිසා මානව අයිතිවාසිකම් පිළිබඳ හුදු ලිබරල් මතයට වඩා අමාර්ත්‍ය සෙන් පෙන්වා දුන් ශක්‍යතා එළඹුම මත අයිතිවාසිකම් තහවුරු කිරීම වඩා සාධනීය බව නුස්බවුම් පෙන්වා දෙයි. එසේ කිරීමේ දී අප වඩා අවධාරණය කරන්නේ සැමට අයිතිවාසිකම් තහවුරු කිරීම සහ ඒ සඳහා ආයතනික සහයෝගය සහතික කිරීමයි. ලිබරල් හා විශේෂයෙන්ම නව ලිබරල් මතයට අනුව නම් කළ යුත්තේ පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත් වීම් වැළැක්වීම නමුත් ශක්‍යතා එළඹුම අනුව අයිතිවාසිකම් භුක්ති විඳීම පිණිස ශක්‍යතා වර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයට සාධනීය කාර්යභාරයක් තිබේ. උදාහරණයක් ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ව්‍යවස්ථාවෙන් සහතික කර තිබුනත් මාධ්‍ය අයිතිය සංකේන්ද්‍රණය වීම වැළැක්වීම ප්‍රමුඛ බහුවිධ මාධ්‍ය වාතාවරණයක් දිරි

218 Nussbaum, Martha C. (2000) Women and Development} Capability Approach, London: Cambridge University Press p.97-

ගන්වන විධි විධාන ස්වාධීන නියාමනයක් මඟින් ඇති කර ගැනීමට නො හැකි නම් මහජනතාවට එම අයිතිය පරිපූර්ණව භුක්ති විඳීමට අවශ්‍ය කරන ශක්‍යතා බිහි නො වීමට ඉඩ තිබේ.

ශක්‍යතා එළඹුම යනු මූලික ව අයිතිවාසිකම් පදනම් කරගත් එළඹුමකි. කොටින් ම ශක්‍යතා *(capabilities)* නො මැති ව අයිතිවාසිකම් භුක්ති විඳිය නො හැකිය. පුද්ගල යහපැවැත්ම ඇගයීමට, ප්‍රතිපත්ති සම්පාදනයට, සමාජ වෙනස්කම් යෝජනා කිරීමට සහ සමාජ වැඩපිළිවෙළවල් ඇගයීමට බොහෝ අය ශක්‍යතා එළඹුම යොදා ගෙන තිබේ. ශක්‍යතා එළඹුම මඟින් විමසනු ලබන මූලික ප්‍රශ්න දෙක වන්නේ "මිනිසුන්ට ඇත්තටම කළ හැකි කුමක් ද ? සහ මිනිසුන්ට කිනම් ආකාරයක අය විය හැකි ද ?"[219] යන්නයි. මෙම ප්‍රශ්නය ශක්‍යතා එළඹුමේ ඇති මාන දෙක එනම් කෘත්‍යයන් *(functionings)* හා හැකියා *(abilities)* පිළිබිඹු කරයි. මෙහි දී කෘත්‍යයන් යනු 'පැවතුම් සහ කෙරුම්' *(beings and doings)* ය. මිනිසුන්ට පත් වීමට හැකි තත්ව සහ මිනිසුන්ට කළ හැකි දේවල් ලෙස ද එය හැඳින්විය හැකිය. පැවතුම්වලට උදාහරණ ලෙස බෙහෙවින් පෝෂ්‍යජනක ව විසීම ද අතිශයින් සංතාපයට පත් ව සිටීම ද නිවහනක් ඇතිව විසීම ද අසනීපයෙන් සිටීම ද උදාහරණ ලෙස ගත හැකිය. කෙරුම් යන්නෙන් අදහස් වන්නේ සංචාරය කිරීම, ඡන්දය භාවිතා කිරීම, ආහාර ගැනීම වැනි විවිධ ක්‍රියා ය. ශක්‍යතා යනු මෙවැනි කෘත්‍යයන් ඉටු කර ගැනීම සඳහා කෙනෙකුට තිබිය යුතු නියම නිදහස, අවකාශ සහ හැකියා ලෙස සැලකිය හැකිය. උදාහරණයක් ලෙස පෝෂ්‍යජනක ව විසීම කෘත්‍යයක් වන නමුත් එයට අදාළ වන ශක්‍යතාව වන්නේ ප්‍රමාණවත් තරම් පෝෂ්‍යජනක ආහාර පරිභෝජනය කිරීමට තිබෙන හැකියාවයි. මෙම ශක්‍යතා ඇත්ත වශයෙන් ම අත්පත් කර ගැනීමට හැකි විය යුතු තත්‍ය ඒවා මිස හුදෙක් නීතියෙන් හෝ සම්මුතියකින් පමණක් මිනිසුන්ට හිමි වන ඒවා නොවේ. ඒ අර්ථයෙන් ශක්‍යතා එළඹුම යනු හුදෙක් අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම ඉක්මවා යන්නකි.

219 Sen. Amartya (2009) The Idea of Justice (London: Allen Lane), p' 354

ලිබරල් මතවාදයට අනුව සාමාන්‍යයෙන් අයිතීන්, විශේෂයෙන් සිවිල් හා දේශපාලන අයිතීන් තේරුම් ගනු ලබන්නේ රජයේ මැදිහත්වීම්වලින් මුක්ත වූ ඒවා ලෙසයි. ඒ අනුව රජය මැදිහත් නො වන තාක් දුරට එකී අයිතිවාසිකම් තහවුරු වූවා ලෙස සැලකේ. ඒ නිසා එකී මතයට අනුව වරක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගත් පසු ඒවා තහවුරු කිරීම හෝ සියල්ලන්ට ම භුක්ති විඳීමට හැකිවීම සම්බන්ධයෙන් රජයේ විශේෂ මැදිහත් වීමක් අපේක්ෂා නො කරයි. ඇමෙරිකානු ව්‍යවස්ථාවේ සඳහන් "කිසිදු ප්‍රාන්ත රාජ්‍යයක් එක්සත් ජනපදයේ පුරවැසියෙකු සතු වරප්‍රසාද හා විනිර්මුක්තිය සීමා කරන නීතියක් පැනවිය නො යුතු ය, නීත්‍යානුකූල ව හැරෙන විට කිසිවකුගේ ජීවිතය, නිදහස හෝ දේපළ අහිමි කිරීමට කටයුතු නො කළ යුතු ය, කිසිවෙකු නීතිය ඉදිරියේ සමානයන් ලෙස සැලකීමෙන් වැළැක්වීමට කටයුතු නො කළ යුතුය" වැනි නො කිරීම පෙරදැරි කරගත් ව්‍යවස්ථා බස් වහර එයට උදාහරණයකට ගත හැකි ය. එමඟින් රජයක් විසින් නො කළ යුතු දේවල් නිෂේධිතව *(negatively)* සඳහන් කිරීමෙන් තත් අයිතිවාසිකම් තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ. මෙසේ රජයේ මැදිහත් වීම නිෂේධනය කිරීමෙන් පුද්ගලික නිදහස තහවුරු කිරීමට තැත් කිරීම රාජ්‍ය නිර්බාධක නිදහස් වෙළඳපොළක් ගැන නව ලිබරල්වාදීන්ගේ අදහස හා බොහෝ දුරට සමපාත වේ.

"සාමකාමී ව රැස්වීමට ඇති අයිතිය අවහිර කිරීමට කොන්ග්‍රස් සභාව නීති නො පැනවිය යුතු ය" යනුවෙන් ඇමරිකානු ව්‍යවස්ථාවේ ප්‍රථම සංශෝධනයෙන් තේරුම් ගැනීමට සිදුවීම එසේ නිෂේධාත්මක *(negative)* යෙදුම් මඟින් අයිතීන් තහවුරු කිරීමට තැත් කිරීම පිළිබඳ තවත් පැහැදිලි උදාහරණයකි. එහෙත් ඊට වෙනස්ව ඉන්දියානු ව්‍යවස්ථාව එම අයිතිය තහවුරු කරන්නේ නිශේධනාත්මක ව්‍යවහාරයකින් නො ව සාධනීය ව්‍යවහාරයකිනි. ඉන්දියානු ව්‍යවස්ථාවේ 19 වෙනි ඡේදයේ ඒ බව මෙසේ සඳහන් වේ. "සියලු රටවැසියන්ට භාෂණයට සහ ප්‍රකාශනයට; නිරායුධ ව සාමකාමී ලෙස රැස්වීමට; සමාගම් සහ වෘත්තීය සමිති පිහිටුවීමට..... අයිතිය ඇත...."

රජය හැරෙන විට අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙළඳපොළ, පුද්ගලික ආයතන, බල කණ්ඩායම් සහ වෙනත් රාජ්‍ය නො වන අංශ විසින් යොදා ගත හැකි නිෂේධනාත්මක ක්‍රියාකාරකම් ගැන ලිබරල් සම්ප්‍රදාය මුළුමනින් නිහඬ ය. උදාහරණයක් ලෙස ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14.1.(ඇ) වගන්තිය ට අනුව "වෘත්තීය සමිති පිහිටුවීමේ හා වෘත්තීය සමිතියකට බැඳීමේ නිදහස" මූලික අයිතිවාසිකමකි. එහෙත් බොහෝ පුද්ගලික සමාගම් විවිධ උපක්‍රම යොදා වෘත්තීය සමිති පිහිටුවීම අධෛර්යමත් කිරීමට කටයුතු කරන බව නො රහසකි. ඉන්දීය ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් බස් වහර අනුව රාජ්‍ය නො වන ක්‍රියාකාරීන් විසින් කරනු ලබන අවහිරකම් ද අයිතීන් උල්ලංඝනයේ ලා සැලකෙන බව නුස්බවුම් පෙන්වා දෙයි.[220] ඒ හැර රටවැසියන්ගේ ශක්‍යතා ගොඩ නැගීම පිණිස සාධනීය රාජ්‍ය මැදිහත්වීම්වලට ඉඩ සලසන වැදගත් ප්‍රතිපාදන ඉන්දියානු ව්‍යවස්ථාවේ විශේෂයෙන් දක්නට ලැබේ. විශේෂයෙන් කුලයෙන් පහත් යැයි ගැනෙන ආන්තික සමාජ කොටස්වලට සහ ස්ත්‍රීන්ගේ හැකියා වැඩි දියුණු කිරීමේ වැඩපිළිවෙළවල් හඳුන්වා දීම ඉන්දියානු රජයේ ව්‍යවස්ථාපිත වගකීමක් වීම ඊට එක් උදාහරණයකි.

මානව අයිතිවාසිකම්වලට පදනම් වන හේතු සම්බන්ධයෙන් මිනිසුන් අතර වෙනස් මත පැවතිය හැකි ය. ඒ අතර තර්ක බුද්ධිය, සංවේදනා, ඓතිහාසික සංසිද්ධි හෝ හුදෙක් ජීවිතය නිසාම ඇතිවෙන අයිතිය ආදි හේතු මත අයිතිවාසිකම් සාධාරණීකරණය කිරීමේ වෑයම් දැක ගත හැකි ය. අයිතිවාසිකම් යනු පූර්ව දේශපාලන අවදියේ සිට පැවතුණි ද නො එසේ නම් නීතිමය සහ ආයතනික විධිවිධාන මඟින් පිහිට වූ ඒවා ද වැනි ප්‍රශ්න ද ඒ අතර වේ. අයිතිවාසිකම් යනු පුද්ගලිකව අයත් වන දේවල් ද නැතහොත් සාමූහික ව අයත් වන ඒවා දැ යි තවත් අය ප්‍රශ්න කරති. ධනවාදයට පදනම් වූ ස්වාමිත්වකාමී පුද්ගල අයිතිය සහ පුද්ගල ස්වතන්ත්‍රබාවය

220 Nussbaum, Martha C (2006) Poverty and Human Functioning: Capability as Fundamental Entitlements in Poverty and Inequality, David B Grusky and Ravi Kanbur (eds.) (Stanford: Stanford University Press) p.54

මුල් කරගත් මානව අයිතීන් අතර ඇති වෙනස වටහා ගැනීමට ඇතමුන්ට නො හැකිය. ඒ නිසාම ඔවුන් මානව අයිතීන් සාමූහික අයිතීන් වලට එරෙහිව ස්ථාන ගත කිරීමට පෙලඹෙති. ඒ හැර අරමුණු කරා යන ගමනේ දී අයිතිවාසිකම් යනු බාධකයක් ද නැතහොත් අරමුණුවල ම ඒකාග්‍ර කොටසක් ලෙස සැලැකිය යුතු ඒවා ද යන්න තවත් අය නගන ප්‍රශ්නයකි, අයිතිවාසිකම් සහ යුතුකම් අතර ඇති සම්බන්ධතාව ගැන විවිධ අදහස් දරන්නෝ ද වෙති. විවිධ අයිතීන් අතරින් තමන්ට පුද්ගලිකව ලබා දිය යුතු අයිතීන් මොනවාද හෝ ඒවා ලැබීමට නියමිත කුමන තත්වයන් යටතේ ද? අයිතිවාසිකම් මඟින් සම්පත් සඳහා ඇති අයිතිය තහවුරු කරයි ද ආදී එවැනි කොතෙකුත් ප්‍රශ්න නැගිය හැකිය.

මෙවැනි මතභේදකාරී ප්‍රශ්න සම්බන්ධයෙන් පැහැදිලි ස්ථාවරයක් ඉදිරිපත් කළ හැකි බැවින් සහ අභිප්‍රේරණීය අවශ්‍යතා සහ අරමුණු නිශ්චිතව සඳහන් කරන බැවින් අයිතිවාසිකම් වෙනුවට ශක්‍යතා එළඹුම මඟින් සංවර්ධන දර්ශක සකස් කර ගැනීම වඩා සුදුසු බව ආචාර්ය මාර්තා සී නුස්බවුම් පෙන්වා දෙයි.

හැකියාව යන්න එහි දී යෙදුණේ තමන් විසින් කළ යුතු යැයි මිනිසුන් අගය කරන ශක්‍යතා තෝරා ගැනීමේ කාරකත්වයට යි *(agency)*.මේ කාරකත්වය යන්න අසමානතාව තේරුම් ගැනීමේ ලා සෙන් විසින් එක් කරන ලද වැදගත් මූලික සාධකයකි. කෙසේ වෙතත් සන්දර්භය අනුව අදාළ කාරකත්වය කුමක් විය යුතු ද යන්න සම්බන්ධයෙන් සමාජය විසින් කරනු ලබන පොදු ඇගයීමක් තිබිය යුතු බව සෙන් පවසයි . මන්ද අන් අයට අනතුරු කිරීම වැනි දේවල් එකී කාරකත්වයේ ලා සැලකිය නො හැකි බැවිනි. ඒ ඒ සන්දර්භයට විශේෂිත වූ ශක්‍යතා ලැයිස්තු ගත කිරීමේ සාධකයක් ලෙස ද කාරකත්වය නමැති සංකල්පය සෙන් සලකයි. එහෙත් එවැනි ශක්‍යතා ලැයිස්තු ගත කළ යුත්තේ පුළුල් ජන සමාජයේ සංවාදශීලී සාකච්ඡාවකින් සහ හේතු යුක්ති විමර්ශනයකින් අනතුරුව සන්දර්භයට අනුව බව ද ඔහු සඳහන් කරයි.

සිය ශක්‍යතා එළඹුම හඳුන්වා දීමේ දී විශ්ලේෂණ ඒකකය වශයෙන් පුද්ගලයා කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම ගැන ඇතැම්හු සෙන් විවේචනය කළහ. එහෙත් ඒ විවේචනය වැරදි වැටහීමක් නිසා ඇතිවෙන දෙයක් බව පෙන්වා දෙමින් ආචාර්ය ඉන්ග්‍රිඩ් රොබේන්ස් මෙසේ පවසයි. "තනි පුද්ගලයන් ලෙස ඇගයීමට ලක් වීම සහ සත්භාවීය පුද්ගලත්වභාවය *(ontological individualism)* යනු දෙකකි. සත්භාවීය පුද්ගලත්වභාවයට අනුව මිනිස් සමාජය යනු සියලු පුද්ගලයන් සහ එම පුද්ගලයන්ගේ ගුණාංගවල එකතුවකි. *(*සමාජය යනු පුද්ගලයන් හැර වෙන කිසිවක් නො වේ*)* එබැවින් විවරණාත්මක පුද්ගලභාවය *(Evaluative individualism)* යන්න හැම සමාජ ප්‍රපංචයක් ම දෙස බලන්නේ පුද්ගලයන් සහ එම පුද්ගලයන්ගේ ගුණාංග වශයෙනි. *(*සමාජයක හැම දෙයක් ම සිදුවන්නේ මනුෂ්‍ය ක්‍රියා නිසාය*)* විවරණාත්මක පුද්ගලභාවය මුළුමනින් ම අවධානය යොමු කරන්නේ පුද්ගලයා ගැන ය. මන්ද විස්තර කිරීමට සහ විශ්ලේශණය කිරීමට හැකි යමක් පවතින්නේ එවිට බැවිණි."[221]

මෙකී අදහස තේරුම් ගැනීම ඉතා වැදගත් වන්නේ මානව අයිතිවාසිකම් වැනි සංකල්ප හුදෙක් ලිබරල් පුද්ගල වාදයට ලඝු කර පහසුවෙන් ම නො තකා හැරීමට ඇතමුන් පුරුදු වී සිටින බැවිනි. සංවර්ධනය යනුවෙන් අප හැඳින්විය යුත්තේ ජෙරමි බෙන්තම්ගේ උපයෝගිතාවාදයට *(utilitarianism)* අනුකූල ව වැඩිම පුද්ගල සංඛ්‍යාවකට වැඩි සතුට ලබා දීමට සැලසීම නො ව කිසිවෙකුත් අත නො හැර සමාජය තුළ ජීවත් වන හැම පුද්ගලයා ම එකිනෙකට වෙනස් අනන්‍ය වූ පුද්ගලයන් බව සලකමින් සැබෑ ශක්‍යතා අත්පත් කර ගැනීමට අවශ්‍ය සාධාරණ අවස්ථා සැමට ඇති කර දීමයි. සද්ජන සමාජයක් ගොඩ නැගීය හැක්කේ කරුණා, මෙත්තා, මුදිතා, උපේක්ඛා සහ අහිංසා යන ශික්ෂා මත පිහිටා කටයුතු කිරීමට හැකි වන ලෙස තමන්ට අනන්‍ය වූ ශක්‍යතා වගා කර ගැනීමට සමාජයේ හැම පුද්ගලයෙකුට ම හැකි වන පමණට ය. සද්ජන සමාජය සැදෙන්නේ තනි පුද්ගල ශක්‍යතාවල එකතුවකිනි.

221 Robeyns, Ingrid (2017) Wellbeing Freedom and Social Justice (Cambridge: Open Book Publishers) p.184-185

න්‍යායක් වශයෙන් සලකන විට ශක්‍යතා එළඹුම කිසියම් පොදු ශක්‍යතා ලැයිස්තුවක් පිළියෙළ කිරීමට යොදා ගැනීම සෙන් උනන්දුවක් නො දැක්වීය. ඒ වෙනුවට ඔහු වැඩි වැදගත්කමක් දෙන්නේ අදාළ ශක්‍යතාව තෝරා ගැනීමේ විධික්‍රමය, තෝරා ගැනීම සාධාරණීකරණය කිරීමට ඇති නිදහස සහ පුද්ගල කාරකත්වයට යි. සෙන් පෙන්වා දෙන පරිදි එවැනි ශක්‍යතා ලැයිස්තුවක් පිළියෙළ කිරීම ප්‍රජාතන්ත්‍රවාදී කටයුත්තක් විය යුතුය. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ශක්‍යතා එළඹුම යොදා ගන්නේ නම් එම ප්‍රතිපත්ති සඳහා වැදගත් වන ශක්‍යතා මොනවාද යන්න තීරණය කළ යුත්තේ ප්‍රතිපත්තියේ බලපෑමට ලක් වන ජනතාව විසිනි. මේ අනුව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය ශක්‍යතා හඳුනා ගැනීම සහ වර්ධනය කර ගැනීම පිළිබඳ බිම් මට්ටමේ තීන්දු ගැනීම මහජන කතිකාව හා සහභාගිත්වය මුල්කරගත් සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කොට සිදුවිය යුතුය.

ඒ ඒ සන්දර්භයට අනුකූලව මිස විශ්ව සාධාරණ ශක්‍යතා ලැයිස්තුවක් පිළියෙල කිරීමට සෙන් මැලි වීම විවේචනය කළ මාර්තා නුස්බවුම් යෝජනා කළ අන්දමට "මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධ ප්‍රතිමානීය විස්තරයක් සහ යහපත් ජීවිතයකට හේතු වන්නේ කිනම් ක්‍රියාකාරිත්ව දැයි විෂය මූලික ව අගය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමෙන් මෙතෙක් කල් කටයුතු කළ අන්දමට වඩා වැඩි රැඩිකල් බවක් සෙන් පෙන්විය යුතු ය".[222] ස්වකීය විවේචනය අනුව යමින් නුස්බවුම් ඇයගේ *Women and Human Development* නම් කෘතියෙන් 'කේන්ද්‍රීය මානව ශක්‍යතා' දහයක් යෝජනා කොට සෙන්ගේ ශක්‍යතා එළඹුම පිළිබඳ ව ඇති විවේචනවලට විසඳුමක් ලෙස ඒවා ප්‍රායෝගික ව යොදා ගත හැකි බව පෙන්වා දුන්නා ය.

ඕනෑම කෙනෙකුට තිබිය යුතු හිමිකම් ලෙස නුස්බවුම් හඳුන්වා දුන් එම ශක්‍යතා දහය මානව අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය විසින් අවධාරණය කළ දේශපාලන නිදහස, රැස්වීමේ නිදහස, කැමති

222 Nussbaum, Martha C (1988) "Nature, Function, and Capability: Aristotle on Political Distribution," in Oxford Studies in Ancient Philosophy: Supplementary Volume (Oxford: Oxford University Press, ), p. 145-184.

 රැකියාවක් තෝරා ගැනීමේ නිදහස මෙන් ම විවිධ ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් ද බොහෝ දුරට නිරූපණය කරයි. මානව අයිතිවාසිකම් මෙන් ම සිය ශක්‍යතා හිමිකම් ලැයිස්තුව ද "ආර්ථික විද්‍යාඥයන් නිතර කියන ධනවත්කම සහ දුප්පත්කම ගැන කතන්දරය" වෙනුවට සදාචාරීය සහ මානවීය වසයෙන් පොහොසත් සංවර්ධන අරමුණු කුලකයක් සපයන බව නස්බවුම් පවසයි. නස්බවුම් යෝජනා කරන එම කේන්ද්‍රීය මානව ශක්‍යතා දහය මානව සංවර්ධනයේ ප්‍රතිමාන පිළිබඳ දැනුවත් සංවිචාරණයකට බෙහෙවින් උචිත ය. ඒවා පහත දැක්වේ:

**කේන්ද්‍රීය මානව ශක්‍යතා** *(ආචාර්ය මාර්තා සී නස්බවුම්ට අනුව)*:[223]

1. **ජීවිතය** *(Life)*: සාමාන්‍ය මිනිස් ජීවිතයක කල් පිරෙන වයස දක්වා ම ජීවත් වීමට ඇති හැකියාව; අකල් හි හෝ ජීවිතයට වටිනාකමක් නැති වීම නිසා ජීවත් විමෙන් පලක් නො මැති වීමේ හේතුව නිසා හෝ මරණයට පත් නො වීම.
2. **ශාරීරික සෞඛ්‍ය** *(Bodily Health)*: ප්‍රජනක සෞඛ්‍ය ද ඇතුළුව යහපත් සෞඛ්‍ය තත්වයකින් යුතු ව විසීමට හැකිවීම; ප්‍රමාණවත් පෝෂණයක් ලැබීම; ප්‍රමාණවත් නිවහනක් තිබීම.
3. **ශාරීරික ආර්ජවය** *(Bodily Integrity)*: නිදහස් සංචරණයකට ඇති හැකියාව; ලිංගික හිංසනය සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ද ඇතුළුව ප්‍රචණ්ඩ ප්‍රහාරයන්ට ලක් නො වී සිටීම: ලිංගික තෘප්තිය ලබා ගැනීමට හා ප්‍රජනක කටයුතු සම්බන්ධයෙන් අභිමත තෝරා ගැනීම් කිරීමේ හැකියාව.
4. **සංජානන, පරිකල්පනය හා චින්තනය** *(Senses" Imagination" and Thought)*: සිය පරිකල්පනය, සිතීම සහ තර්ක බුද්ධිය පිණිස සැබෑ මානවීය *("truly human")* ක්‍රමයට, එනම්

223 Nussbaum, Martha C. (2000) Women and Development} Capability Approach, London: Cambridge University Press p.78-80,

සාක්ෂරතාව සහ මූලික ගණිතමය හා විද්‍යාත්මක පුහුණුව ද ඇතුළත් ව සහ එහෙත් එයට පමණක් සීමා නො වූ, ප්‍රමාණවත් අධ්‍යාපනයක් මඟින් සුභාවිත හා දැනුවත් කරන ලද සංජානන යොදා ගැනීමේ හැකියාව; තමන් කැමති ආගමික, සාහිත්‍යයමය, සංගීතමය ආදී විවිධ ක්ෂේත්‍රවල කෘති හා සංසිද්ධි නිර්මාණය කිරීම හා විඳ ගැනීම පිණිස පරිකල්පනය හා චින්තනය මෙහෙය වීමට හැකි වීම; දේශපාලනය සහ කලා කටයුතු යන දෙකෙහි දී ම භාෂණයේ නිදහස ද ආගමික නිදහස ද උපයෝගී කර ගැනීමට සිත මෙහෙයවා ගැනීමට ඇති හැකියාවः සංතුෂ්ටීමත් අත්දැකීම් විඳ ගැනීමට සහ ඵලයක් නො මැති වේදනා මඟ හරවා ගැනීමට ඇති හැකියාව.

5. **මනෝභාවය** *(Emotions)* බාහිර මිනිසුන් සහ දේවල් හා බැඳීම් ඇති කර ගැනීමේ හැකියාව; අපට ආදර සත්කාර කරන්නන්ට ආදරය කිරීම සහ ඔවුන්ගේ වියෝ වීමේ දී දුක් වීම; කොටින් ම ආදරය කිරීමට, දුක් වීමට, මනදොළ සපුරා ගැනීමට, කෘතගුණ දැක්වීමට සහ සාධාරණ කෝපය පළ කිරීමට හැකිවීම; බිය සහ අසහනය නිසා කෙනෙකුගේ උද්වේගී වර්ධනය *(emotional development)* බොල් නො වීම (මෙම ශක්‍යතාව වර්ධනය කිරීමට ආධාර කිරීම යනු ඒවා වර්ධනය කිරීමේ ලා තීරණාත්මක වන මානව සම්බන්ධතා ඇති කර ගැනීමට ආධාර කිරීමයි.)

6. **ප්‍රායෝගික විචාර බුද්ධිය** *(Practical Reason)*ः හොඳ යනු කුමක් ද යන්න ගැන ප්‍රබුද්ධ සංකල්පයක් ඇති කර ගැනීමටත් සිය ජීවිතය සැලසුම් කිරීමේ දී විචාරශීලී ප්‍රත්‍යවේක්ෂණයක *(critical reflection)* නියැළීමටත් ඇති හැකියාව (හෘද සාක්ෂියට එකඟ ව කටයුතු කිරීමට සහ අභිමත ආගමක් පිළිපැදීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති නිදහස ද මෙයට ඇතුළත් ය.)

7. **සම්බන්ධතා** *(Affiliation)*: (අ). අන් අය හා එකට ජීවත් වීමේ හැකියාව, අනෙකුත් මනුෂ්‍යයන් සම්භාවනය *(recognition)*, ඔවුන් කෙරෙහි සැලකිලිමත් වීමට හා නොයෙක් ආකාරයේ සමාජ ක්‍රියාකාරකම්වලට දායක වීමේ හැකියාව; අන් අය පත් ව ඇති තත්වය සංජානනය කිරීමේ හැකියාව (මෙම හැකියාව සාක්ෂාත් කිරීමට එවැනි සම්බන්ධතා ඇති කරන සහ පෝෂණය කරන ආයතන මෙන් ම රැස්වීමේ නිදහස සහ දේශපාලන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම ද ඇතුළත් ය.)

(ආ). අවමානයට ලක් නො වන ආත්ම ගෞරවය රැකෙන සමාජ පදනම්වලින් යුතු වීම; අන් අය හා සමව අගය කළ හැකි අභිමානවත් තැනැත්තෙකු වශයෙන් සැලකීමට ලක් වීමට හැකිවීම; මෙයට ජාතිය, ලිංග භේදය, ලිංගික නැඹුරුව, ජනවර්ගය, කුලය, ආගම, ජාතිකත්වය මත අඩුසැලකිලිවලට ලක් නො වීමේ හැකියාව ද අඩංගු වේ.

8. **අවශේෂ සත්ව විශේෂ** *(Other Species)*: සොබා දහම, ශාක සහ සත්ව විශේෂ පිළිබඳ සැලකිල්ලක් දක්වමින් ඒවා සමඟ සහබන්ධුත්වයකින් යුක්ත ව ජීවත් වීමට ඇති හැකියාව.

9. **කෙළිලොල් බව** *(Play)* සිනාසීමට, සෙල්ලම් කිරීමට, විනෝද ක්‍රියාවලින් ප්‍රීති වීමට ඇති හැකියාව;

10. **තම වාතාවරණය පාලනය කර ගැනීමේ හැකියාව** *(Control over One's Environment.)*

(අ). **දේශපාලනික**: තමන්ගේ ජීවිතය හසුරුවන දේශපාලන තේරීම්වලට අනුව ඵලදායක ලෙස දේශපාලනයට සහභාගිවීමට ඇති හැකියාව; දේශපාලන සහභාගිත්වයට ඇති අයිතිය අනුව ප්‍රකාශන නිදහස සහ රැස්වීමේ නිදහස තහවුරු කිරීම;

(ආ). ද්‍රව්‍යයමයඃ දේපළ *(නිශ්චල හා චංචල)* හිමි කර ගැනීමේ හැකියාව සහ අන් අය හා සමාන පදනමකින් දේපළ අයිතිය භුක්ති විඳීමට හැකිවීම; අනවශ්‍ය පරීක්ෂා කිරීම්වලින් සහ අත්පත් කර ගැනීම්වලින් නිදහස් ව විසීමට හැකිවීම; වැඩ කිරීමේ දී ප්‍රායෝගික විචාර බුද්ධිය අනුව කටයුතු කිරීමට අනෙකුත් සගයන් සමඟ අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුත් අර්ථවත් සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකිවීම.

ශක්‍යතා එළඹුම *(Capability Approach)* නොයෙක් ශාස්ත්‍රාලයීය දායකත්ව නිසා නිරන්තර ව යාවත්කාලීන වෙන සංවර්ධන සිද්ධාන්තයකි. යුට්රෙක්ට් විශ්ව විද්‍යාලයේ ආචාරධර්ම ආයතනයේ සභාපති ආචාර්ය ඉන්ග්‍රිඩ් රොබේන්ස් පෙන්වා දෙන පරිදි "ශක්‍යතා එළඹුම ගැන කතා කිරීමට අපේ කාලය යෙදීම වැදගත් වන්නේ මිනිසුන්ගේ ජීවිත පිළිබඳවත් එම ජීවිත ගෙවෙන සමාජය පිළිබඳවත් නව ඇගයීම් ක්‍රමයක් එමඟින් අපට ලබා දෙන බැවිනි. එම ඇගයීමේ දී වැඩි අවධානයක් යොමු කෙරෙන්නේ සංවර්ධනය විග්‍රහ කිරීමේ දී මෙතෙක් එතරම් සැලකිල්ලක් ලැබී නැති යහපැවැත්ම, නිදහස සහ යුක්තිය වැනි කරුණු ගැන ය. එබැවින් එය සංවර්ධනය ගැන විකල්ප කතිකාවක් හෙවත් සුසමාදර්ශයක් පමණක් නො ව සමාජය, දරිද්‍රතාව සහ සෞභාග්‍ය පිළිබඳව දැනට ප්‍රධාන ධාරාව අරක් ගෙන තිබෙන සිද්ධාන්ත ගණනාවකට ම ප්‍රතිවිරුද්ධ සිද්ධාන්තයක් ද වන්නේ ය"[224].

අමාත්‍ය සෙන්ගේ ශක්‍යතා එළඹුමෙන් ලද ආභාසය අනුව දේශපාලනික යුක්ති සහගත භාවයට ප්‍රමුඛත්වය දිය හැකි ලෙස සංවර්ධනය පරිකල්පනය කිරීමේ වෑයමක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන *(UNDP)* තුළ සාකච්ඡා විය. ඒ අනුව 'සංවර්ධනය යනු මූලික මිනිස් අයිතිවාසිකම් පරිපූර්ණ ලෙස භුක්ති විඳීමට මිනිසුන්ට ඇති හැකියාව යි' යන අදහස මුල්කරගත්

224 Robeyns, Ingrid (2017) Wellbeing Freedom and Social Justice (Cambridge: Open Book Publishers) p.10-11

සංවර්ධනය පිළිබඳ මානව හිමිකම් පාදක එළඹුමක් *(Human Rights Based Approach to Development)* හඳුන්වාදීමට 1997 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රතිසංවිධානය කිරීමේ වැඩසටහන යටතේ එහි මහ ලේකම් කොෆි අනාන් යෝජනා කළේ ය. ඉන් අදහස් වුණේ එක් අතකින් සිය අයිතිවාසිකම් මොනවාද යන්න දැන ගෙන ඒවා භුක්ති විඳීමට සියලු මිනිසුන් බලාත්මක කිරීමත් අනික් අතින් සියල්ලන්ට ම එම අයිතීන් අඩුවකින් තොර ව භුක්ති විඳීමට අවශ්‍ය වටාපිටාව සහ පහසුකම් වර්ධනය කිරීම රාජ්‍යයේ මූලික වගකීම වශයෙන් සැලකීමත් ය. ඒ අනුව සිවිල් හා දේශපාලන අයිතීන් ඇතුළුව විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ සඳහන් සියලු ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතීන් ද රටවැසියන්ට පරිපූර්ණව භුක්ති විඳීමට ඉඩ සැලසීම අරමුණු කර රටක පොදු ආයතනවල ශක්‍යතාව හා ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සංවර්ධනයේ කේන්ද්‍රීය උපාය මාර්ගය විය යුතු යැයි අදහස් විය.

නමුත් බොහෝ සාමාජික රටවල ආණ්ඩු එවැනි මානව අයිතිවාසිකම් පාදක සංවර්ධනයක් ගැන එතරම් උනන්දුවක් නො දැක්වීය. ඒ අනුව එම අදහස එක්සත් ජාතීන්ගේ අන්තර් ආයතන සහයෝගිතා *(inter-agency cooperation)* වැඩපිළිවෙළකට සීමා කිරීමට සිදුවිය. ආණ්ඩු පමණක් නො ව ආණ්ඩු බලය බලාපොරොත්තු වූ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් ද මානව අයිතිවාසිකම් පාදක සංවර්ධන එළඹුම මඟින් යෝජනා කළ අන්දමට මිනිසුන් සබල ගැන්වීම ගැන උනන්දුවක් නො දැක්වීය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් යෝජනා වෙන කිසිදු ක්‍රියාවක් හා අනන්‍ය වීමට ජාතිකත්වය හා මානව හිමිකම් යනු එකිනෙකට පටහැණි සංකල්ප ලෙස මැතිවරණ ව්‍යාපාරවල දී අලෙවි කිරීම බලය අත්පත් කර ගැනීම සිය දේශපාලන වසයෙන් සලකන දේශපාලන පක්ෂවලට එවැනි හැකියාවක් නොවීය.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ඇරඹෙන 'එක්සත් ජාතීන්ගේ ජනතාව වන අපි....' *We the Peoples of the United Nations* යන යෙදුම

සංකේතාර්ථයක් වසයෙන් මෙහි දී වැදගත් ය. ඒ අනුව නම් එක්සත් ජාතීන්ගේ සංවිධානය මිනිස් සංහතිය කේන්ද්‍ර කොට ගත්තක් මිස ජාතික රාජ්‍ය කේන්ද්‍ර කොට ගත්තක් නො වේ. ඉන් අනතුරු ව ප්‍රඥප්තියේ මානව සංහතිය වසයෙන් අප අධිෂ්ඨාන කරන්නේ කුමක් ද යන්න සඳහන් වන ...... "අපේ ජීවිත කාලය තුළ දෙවරක් ම අප්‍රමාණ දුක්කම්කටොලු මිනිස් වර්ගයාට ගෙන ආ යුද්ධයේ පරිපීඩිනයෙන් මතු පරපුර ගලවා ගැනීමටත්, මූලික මානව අයිතිවාසිකම්, මිනිසා නමැති පුද්ගලයාගේ අභිමානය හා වටිනාකම, පුරුෂයන් සහ ස්ත්‍රීන් අතර සහ කුඩා හා විශාල ජාතීන් අතර සමාන අයිතිවාසිකම් පිළිබඳ විශ්වාසය යළි තහවුරු කිරීමටත්, ගිවිසුම් සහ වෙනත් ප්‍රභවවලින් එන අන්තර්ජාතික නීති ප්‍රකාර යුතුකම් අනුව යුක්තිය තහවුරු කිරීමත්, විසල් නිදහස තුළ සමාජ ප්‍රගතිය සහ ජීවන ප්‍රමිති ප්‍රවර්ධනය කිරීමත් උදෙසා..." යනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ අභිමතාර්ථය සංකල්ප ගත කර ඇත්තේ ජාතික රාජ්‍ය ඉක්මවා යන මානව සංවර්ධනයක් ගැන අවධාරණය කිරීමට ඉඩ සලසමිනි.

ඒ අනුව ප්‍රඥප්තියේ පූර්විකාව "මූලික මානව අයිතිවාසිකම් සහ මිනිසා නමැති පුද්ගලයාගේ අභිමානය හා වටිනාකම පිළිබඳ විශ්වාසය" සහ "විසල් නිදහස තුළ සමාජ ප්‍රගතිය සහ ජීවන ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම" යනුවෙන් මානව අයිතිවාසිකම් සහ සංවර්ධනය අන්‍යෝන්‍ය වසයෙන් ප්‍රතිපෝෂණය වන දේවල් ලෙස සලකයි. මේ වගන්ති ඉන් වසර ගණනාවකට පසු නොබෙල් ත්‍යාගලාභි අමාර්ත්‍ය සෙන් විසින් පහත කියවෙන පරිදි පැහැදිලි කරන ලද මානව අයිතිවාසිකම් පාදක සංවර්ධනය යන්නෙහි සාරය නිරූපණය කරයි.

> "මානව අයිතිවාසිකම් යනු කුරිරු අපයෝජනවලින් මෙන් ම අහිමි කිරීම්වලින් ආරක්ෂා කිරීම සහ අභිමානවත් ජීවිතයකට අවශ්‍ය නිදහස සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් සියලු මිනිසුන්ට අවශ්‍ය සමාජ විධිවිධාන පිළිබඳ එඩිතර ප්‍රකාශනයකි. අනික් අතට මානව සංවර්ධනය යනු මානව ශක්‍යතා වර්ධනය කරන හැම කෙනෙකුට ම ගෞරවනීය හා අගය කළ හැකි ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය තෝරා ගැනීම් සහ අවස්ථා පුළුල් කරන ක්‍රියාමාර්ගයකි. මානව අයිතිවාසිකම්

**සහ මානව සංවර්ධනය එක් ව ගමන් කරන විට මිනිසුන්ගේ හැකියා සහ ඔවුන්ගේ අයිතීන් සහ මූලික නිදහස ආරක්ෂා කරමින් එකකින් අනෙක පෝෂණය කරයි.”[225]**

මානව අයිතිවාසිකම් වර්ගීකරණයට අනුව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පළමු පරම්පරාවට අයත් අයිතිවාසිකම් ලෙස සැලකේ. පුද්ගල අයිතිවාසිකම් ලෙස සැලකෙන ඒවා ප්‍රජාතන්ත්‍රවාදය සහ සිවිල් සමාජය සක්‍රිය ව සංවිධානය කර ගැනීමට සෑම පුද්ගලයෙකුට ම අවශ්‍ය වන අයිතිවාසිකම් ලෙස ගැනෙයි. එම අයිතීන්ට අයත් වන්නේ ඡන්දය දීමේ අයිතිය, භාෂණයේ නිදහස, නිදහස් ලෙස රැස්වීමට ඇති අයිතිය, සාධාරණ විනිශ්චයකට භාජනය වීමේ සහ නීතිය ඉදිරියේ සමාන සැලකුම් ලැබීමට ඇති අයිතිය, පුරවැසියෙකු වීමේ අයිතිය, පෞද්ගලිකත්වයට ඇති අයිතිය, තම අදහස ප්‍රකාශ කිරීමේ අයිතිය, අභිමත ආගමක් ඇදහීමේ අයිතිය, මහජන නියෝජිතයෙකු වසයෙන් තෝරා පත් කරනු ලැබීමට ඇති අයිතිය, සමාජීය සහභාගිත්වය සඳහා ඇති අයිතිය ආදිය යි. ඒ හැර තම පුද්ගල අභිමානයට නිගරු නො වන ලෙස සලකනු ලැබීමට, ආරක්ෂිත ව ජීවත් වීමට, ආගම, ජනවර්ගය හා ස්ත්‍රී පුරුෂ භේදය නිසා අඩු සැලකිල්ලකට පාත්‍ර නො වීමට, නීත්‍යනුකූල ව්‍යාපාරයක නිරත වීමට, හිංසනයට, වධ බන්ධනයට සහ බලහත්කාරයට භාජනය නො වීමට ඇති අයිතිය ද ප්‍රථම පරම්පරාවේ අයිතීන් ලෙස සැලකෙයි.

රූසෝගේ අදහස්වලින් ආභාසය ලත් පරිදි පුද්ගලයාගේ වටිනාකම පිළිබඳ සම්භාව්‍ය ලිබරල් මතවාදය මත පදනම් වූ මෙම අයිතීන් අමුතුවෙන් දිනා ගත යුතු ඒවා නො ව මනුෂ්‍යයෙකු වීම නිසා නිසර්ගයෙන් ම උරුම වන ඒවා ලෙස සලකන ලදි. රාජ්‍යයේ කාර්ය වන්නේ සෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් ම ඔහු සතු මේ පරම අයිතීන් උල්ලංඝනය නො වන පරිදි ආරක්ෂා. කර දීම යි. රජය මඟින් මේ කටයුත්ත ඉටුවෙති'යි අපේක්ෂා කෙරෙන්නේ යට කී අයිතීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය නීති සම්පාදනය හා බලාත්මක

225 UNDP (2000) Human Development Report - 2000, United Nations Development Programme, New York, p. 2

කිරීම ඉටු කිරීම රජයක මූලික කාර්ය වන බැවිනි. ඇතැම් විචාරකයින් පෙන්වා දෙන පරිදි පළමු පරම්පරාවට අයත් අයිතීන් පුද්ගල පාදක ඒවා ලෙස සලකනු ලැබීමට එක් මූලික හේතුවක් වූයේ එකී අයිතීන් උල්ලංඝනය වූ විට ඒ පිළිබඳ ව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී පුද්ගල පාදක පැමිණිලි වසයෙන් ඒවා ඉදිරිපත් කිරීමට සිදු වූ බැවිනි. කෙසේ වෙතත් සමාජය යනු තනි තනි පුද්ගලයන්ගේ එකතුවක් බැවින් සමාජ අභිවෘද්ධිය මැනීමේ දී වුව ද විශ්ලේෂණ ඒකකය බොහෝ විට පුද්ගල පාදක වීම ගැන අහිතක් ඇති කර ගත යුතු නැත.

සංවර්ධනය සම්බන්ධයෙන් රාජ්‍යයේ වගකීම සහ ආර්ථිකයේ අරමුණ සෘජු ව ම නිර්ණය කෙරෙන දර්ශක වසයෙන් සැලකිය හැකි දෙවැනි පරම්පරාවට අයත් අයිතීන් වසයෙන් සැලකෙන්නේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික යන ක්ෂේත්‍රයන්ට අයත් අයිතිවාසිකම් ය. මිනිසෙකු වසයෙන් පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන සමාජමය ප්‍රතිපාදන සහ සේවා ලබා ගැනීමට සෑම අයෙකුට ම ඇති හිමිකම මේ අයිතීන් මඟින් ආවරණය වෙයි. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සවිස්තර ව දක්වා ඇති මේ ගණයට අයත් අයිතීන්ට අනුව වැඩ කිරීමේ අයිතියත්, තම රැකියාව තෝරා ගැනීමේ නිදහසත්, සාධාරණ හා සතුටුදායක රැකියා කොන්දේසි සඳහා ඇති අයිතියත්, විරැකියාවෙන් ආරක්ෂා වීමේ අයිතියත් සෑම කෙනෙකුට ම හිමි වේ. ඒ හැර කිසිදු ආකාරයක අඩු සැලකිල්ලකට ලක් විමෙන් තොර ව සමාන වැඩට සමාන වැටුප් ලැබීමේ අයිතිය සෑම කෙනෙකුට ම හිමි වේ. අවශ්‍ය නම් අනෙකුත් සමාජ ආරක්ෂණ විධි විධාන මඟින් ප්‍රදානය කරන පරිපූරකයන් ද සහිත ව වැඩ කරන සෑම අයෙකුට ම තමාගේ හා තම පවුලේ මානව අභිමානයට සරිලන පරිදි සාධාරණ හා සතුටුදායක වේතනයක් ලබා ගැනීමට අයිතිය ඇත්තේ ය. තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා වෘත්තිය සමිති පිහිටු වීමටත් වෘත්තීය සමිතියකට බැඳීමටත් සෑම අයෙකුට ම අයිතිය ඇත්තේ ය. වැඩ කළ යුතු පැය ගණන පිළිබඳ සාධාරණ සීමාවක් ද වැටුප් සහිත ව කලින් කලට ලැබෙන නිවාඩු දිනයන් ද

සහිත ව විවේකය හා නිවාඩු ගැනීම සෑම කෙනෙකුගේ ම අයිතියකි.

මෙකී අයිතීන් කාණ්ඩයට අනුව තමාගේ හා තම පවුලේ සෞඛ්‍යය හා සුභසාධනය සඳහා ප්‍රමාණවත් වන පරිදි ආහාර, ඇඳුම්, නිවාස, වෛද්‍ය සේවාව හා අවශ්‍ය සමාජ සේවාවන්ගෙන් සමන්විත ජීවන තත්වයක් භුක්තිවිඳීමට සියල්ලන්ට ම මේ යටතේ හිමිකම ඇති අතර විරැකියාව, රෝගාබාධ, වැන්දඹු වීම, මහලු වීම හා ඒ හා සමාන වූ තම පාලනයෙන් තොර ආපදාවක් සිදු වූ විටක දී රැකවරණය ලැබීමටත් සියලු දෙනාට ම හිමිකම ඇත්තේ ය. මාතෘ භාවය හා ළදරුභාවය විශේෂ උපකාරයට හා සාත්තුවට උරුම වූ තත්වයෝ ය. සුජාත හෝ අවජාත බව නො සලකා, සමාජ ආරක්ෂාව එක සමාන ව භුක්ති විඳීම සියලු ම දරුවන්ට හිමි ය.

ඒ හැර අධ්‍යාපනය ලබාගැනීමට සෑම පුද්ගලයෙකුට ම අයිතිය ඇත්තේ ය. අවම වසයෙන් ප්‍රාථමික හා මූලික අධ්‍යාපනය නො මිලේ ලබා ගැනීමට හැකි විය යුතු ය. ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය විය යුතු වේ. කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව පොදුවේ සැලසිය යුතු වන අතර ඒ හා සමාන ව, සියල්ලන්ට ම දක්ෂතාව පදනම් කොට ගෙන උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව ද සැලසිය යුත්තේ ය. මනුෂ්‍යයාගේ ස්වීයත්වය පරිපූර්ණ කර ගැනීමත් මානව අයිතිවාසිකම් හා මූලික නිදහසට ගරු කිරීම ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කොට අධ්‍යාපනය සකස් විය යුතු ය. සියලු ජාතිකත්ව, ජාති හා ආගමික කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධය, රිස්සීම හා මිත්‍රත්ත්වය වර්ධනය කිරීමටත් සාමය පවත්වා ගෙන යෑම උදෙසා එක්සත් ජාතීන්ගේ මැදිහත්වීම් තව දුරට කර ගෙන යෑමටත් අධ්‍යාපනයෙන් අනුබලය දිය යුත්තේ ය. සිය දරුවන්ට දිය යුතු අධ්‍යාපනයේ ස්වභාවය තීරණය කිරීමේ ප්‍රමුඛ අයිතිය දෙමව්පියන් සතු ය ආදි වසයෙන් මේ අයිතීන් මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ නිශ්චිත ව සඳහන් වේ.[226]

226 https://www.un.org/en/about-us/universal-declaration-of-human-rights Retrieved on 21 August 2021

18 වන සිය වසේ සම්භාව්‍ය ලිබරල්වාදයෙන් ජනිත වූ සිවිල් හා දේශපාලනික අයිතීන්ට වෙනස් ව දෙවැනි පරම්පරාවට අයත් ඉහත දැක්වෙන මානව අයිතිවාසිකම්වල බුද්ධිමය ප්‍රභවය 19වන හා 20 වෙනි සියවස්වල උද්ගත වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී චින්තන සම්ප්‍රදායට අයත් වේ.

කෙසේ වෙතත් සිවිල් හා දේශපාලනික අයිතීන් කෙරෙහි දක්වන තරම් අවධානයක් ලිබරල්වාදය මෙකී ආර්ථික, සංස්කෘතික හා සමාජීය අයිතිවාසිකම් කෙරෙහි දක්වා නැත. එයට එක් හේතුවක් වූයේ රාජ්‍යයේ මැදිහත් වීම අවම කිරීම අරමුණු කරගත් සාම්ප්‍රදායික ධනවාදී ආර්ථික චින්තනය රැකියා නියුක්තිය සහතික කිරීම, නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවය වැනි සංකල්ප ප්‍රතික්ෂේප කරමින් ඒවා තරඟකාරී වෙළඳ පළ මඟින් සැපයිය හැකි ඒවා වසයෙන් සැලකීම යි.

ඒ අනුව පළමු පරම්පරාවට අයත් මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙස සැලකෙන ජනඝාත හෝ අමානුෂික වද හිංසනයට ලක් කිරීම මත රජයකට හෝ රාජ්‍ය නායකයන්ට චෝදනා එල්ල කොට නඩු විභාග පැවැත්වීමට අන්තර්ජාතික අයිතිවාසිකම් නීතිවලට අනුව හැකි වුව ද දෙවන පරම්පරාවට අයත් අයිතීන්වලට ගැනෙන තම ජනතාවට ගුණාත්මක නිදහස් අධ්‍යාපනයක් හෝ ගුණාත්මක නිදහස් සෞඛ්‍ය සේවාවක් ලබා නො දෙන රජයකට හෝ රාජ්‍ය නායකයෙකුට චෝදනා එල්ල කොට විභාග කිරීම පිණිස ප්‍රතිපාදන අන්තර් ජාතික නීතියේ නොමැත.

කෙසේ වෙතත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඇගයූ ස්කැන්ඩිනේවියානු හා යුරෝපීය රටවල් ධනවාදි ආර්ථික ක්‍රමය යටතේ ද මෙකී අයිතීන් සාක්ෂාත් කර දීම රජයේ කාර්යයක් ලෙස සැලකූහ. ඒ සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ *(social security)* වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට එම රටවල් කටයුතු කළහ. ශක්තිමත් සමාජ ආරක්ෂණ ක්‍රම ඇති රටවල සමානාත්මතාව ද සැලකිය යුතු අන්දමින් ප්‍රවර්ධනය වීම එම රටවල ප්‍රජාතන්ත්‍රවාදය තිරසාර වීමට ද හේතුවක් වී තිබේ. ඊට සමාන ව 1944 ජනවාරි 11 දින ඇමෙරිකානු කොන්ග්‍රස් සභාව හමුවේ සිය

වාර්ෂික කථාව පැවැත්වූ ෆැන්ක්ලින් රූස්වෙල්ට් ජනාධිපතිවරයා නව සම්භාව්‍ය ආර්ථික ගුරුකුලයේ මතවාදයට පටහැණි ව ඇමෙරිකානු ව්‍යවස්ථාවේ සඳහන් දේශපාලන හා සිවිල් අයිතීන්ට අනුපූරකයක් වසයෙන් මහජනතාවගේ ආර්ථික අයිතීන් සාක්ෂාත් කිරීම පිණිස ආර්ථික අයිතිය පිළිබඳ පනතක් *(Economic Bill of Rights)* කොන්ග්‍රස් සභාව විසින් සම්මත කළ යුතු යැ'යි කියා සිටියේ ය. ඔහු යෝජනා කළ පරිදි එම පනතින් සියලු ඇමෙරිකානුවන්ට පහත කියවෙන අයිතීන්ට හිමිකම තිබිය යුතු යඃ

> **වේතනයක් සහිත ප්‍රයෝජනවත් රැකියාවක නියැලීමේ අයිතිය, ආහාර ඇඳුම් සහ විනෝදය සඳහා වැය කිරීමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමේ අයිතිය, තම හා තම පවුලේ ජීවිකාව සඳහා සෑහෙන ආදායමක් ලබා ගැනීම සඳහා නිෂ්පාදනය කිරීමට හා අලෙවි කිරීමට ගොවීන්ට ඇති අයිතිය, දේශීය හා විදේශීය ඒකාධිකාරවල ග්‍රහණයකින් හා අසාධාරණ තරඟකාරිත්වයකින් තොර ව තම ව්‍යාපාරික කටයුතු නිදහසේ කර ගෙන යෑමට ව්‍යාපාරිකයන්ට ඇති අයිතිය. උචිත නිවාසයක් ලබා ගැනීමට සෑම පවුලකට ම ඇති අයිතිය, යහපත් සෞඛ්‍යයක් හා ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමේ අයිතිය, වැඩිහිටියෙකු වීම, රෝගී විම, අනතුරකට ලක් වීම, රැකියා වියුක්ත වීම නිසා ඇතිවිය හැකි ආර්ථික අමාරුකම්වලින් මිදීම සඳහා ප්‍රමාණවත් රැකවරණය ලැබීමේ අයිතිය හා හොඳ අධ්‍යාපනයකට ඇති අයිතිය.**

එහෙත් 1945 අප්‍රියෙල් 12 වන දින ජනාධිපති රූස්වෙල්ට් මියගිය අතර ඇමෙරිකානු කොන්ග්‍රස් සභාව රූස්වෙල්ට්ගේ එම අදහස නො සලකා හැරියේ ය. කෙසේ වෙතත් ආර්ථික හා සමාජීය අයිතීන් විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයට ඇතුළත් කිරීම පිණිස අවසානයේ ඇමෙරිකානු පාලනතන්ත්‍රය එකඟ කර ගැනීමට විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනය කෙටුම්පත් කළ එක්සත් ජාතීන්ගේ කමිටුවේ සභාපති එලිනෝර් රූස්වෙල්ට් ට හැකි වුණේ ජනාධිපති වසයෙන් ඇගේ සැමියා පැවැත්වූ මේ කථාව නිසා බව මානව අයිතිවාසිකම් ඉතිහාසය පිළිබඳ විශේෂඥයෙකු වූ මිචෙලින් ඉෂායි සිය *History of Human Rights* කෘතියෙන් පෙන්වා දෙයි.[227]

227 Ishay, Micheline R (2004) The History of Human Rights, Berkly: University of California Press, p 222

අනෙකුත් බොහෝ රටවල මෙන් ම රටවැසියන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වී තිබේ. සර්වජන ඡන්ද බලය සහ ඡන්දයෙන් පත්කර ගත් සිය නියෝජිතයන් මඟින් ක්‍රියාත්මක කරන ආණ්ඩුක්‍රමයට අතිරේක ව රටේ ජනතාවගේ පරමාධිපත්‍යය සමන්විත වන අනෙක් අංගය වන්නේ මෙකී මූලික අයිතිවාසිකම් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ. ආගමික නිදහස, ක්රෑර වධහිංසා සහ අවමානවලට ලක් නො වීම, නීතියේ සාධාරණ සැලකිල්ල, භාෂණයේ හා සමාගමයේ නිදහස වැනි සීමිත ක්ෂේත්‍රයක් ආවරණය වන පරිදි සැකසී ඇති මෙකී මූලික අයිතිවාසිකම්වල එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දී සම්මත කරගත් මූලික මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වන සමාජීය සංස්කෘතික හා ආර්ථික අයිතිවාසිකම් ඇතුළු අනෙකුත් බොහෝ වැදගත් අයිතිවාසිකම් අඩංගු නො වේ.

අභිමතාර්ථය අතින් ගත් විට මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අඩංගු වී ඇති අයිතීන් විශේෂයෙන්ම වැඩිදියුණු කළ ආර්ථික, සංස්කෘතික හා සාමාජික අයිතීන්වලට පාරිසරික අයිතීන් ද එක් කළ විට එම අයිතීන් භුක්ති විඳීමේ හැකියාව සියල්ලන් සඳහා ම සාක්ෂාත් කර ගැනීම සංවර්ධනයේ ප්‍රධාන අරමුණක් වසයෙන් සැලකිය හැකියි. ඒ අනුව වෙසෙසින් ම මනුෂ්‍යයන්ට තම ශක්‍යතාව පරිපූර්ණ ලෙස උපයෝගී කර ගැනීමට හැකි වන ලෙස පිරිසිදු වාතය, පිරිසිදු ජලය සහ ආහාර සහිත යහපත් පරිසරයකට ඇති අයිතිය ද මානව අයිතිවාසිකම් වසයෙන් පිළිගත යුතු ය.[228] මෙම අවබෝධය පළමු පරම්පරාවට අයත් ලිබරල් මතවාදී මානව අයිතිවාසිකම්වල ම දිගුවක් ලෙස සැලකිය හැකි ය. එමඟින් පරිසර දූෂණයට ලක් වන ජන කොටස් මානව අයිතිවාසිකම් උල්ලංඝනයට ලක් වූවන් ලෙස සලකමින් පරිසර සක්‍රියවාදය *(Environmental Activism)* මානව අයිතිවාසිකම් අරගලයේ ඒකාග්‍ර කොටසක් බවට පත් කරයි.

228 Ife, Jime (2008) Human Rights and Social Work, Cambridge: Cambridge University Press, p..45

එම අයිතිය තනි තනි පුද්ගලයාට මෙන් ම පුද්ගලයා අයත් වන සාමූහිකයට ද පොදු ය.

විශ්ව ප්‍රකාශනයේ සඳහන් වන දෙවැනි පරම්පරාවට අයත් බොහෝ අයිතිවාසිකම් වැඩිදියුණු කළ යුතු ඒවා වන්නේ ඒවා සකස් කිරීමේ දී කොතෙක් දුරට ඒවා සාක්ෂාත් කර දීමට හැකි වේ ද යන සැකය එම අයිතිවාසිකම් කෙටුම්පත් කළ කමිටුවේ ඇතැම් සාමාජිකයන් තුළ පවා තිබූ බැවිනි[229]. එම නිසා සුභාවිත 'ගුණාත්මක අධ්‍යාපනයක්' ලබා ගැනීමට ඇති අයිතිය වෙනුවට නිකම් ම අධ්‍යාපනයක් ලබා ගැනීමේ අයිතිය යනුවෙන් සඳහන් කිරීමට ඔවුන්ට එකඟ වීමට සිදු විය. මේ නිසා මුල් ලේඛනයේ ජීව ගුණය වඩාත් තියුණු කිරීම පිණිස ආර්ථික, සාමාජික හා සංස්කෘතික අයිතිවාසිකම් නිශ්චිත දර්ශකවලින් නිරූපණය වන ලෙස තවදුරටත් වැඩි දියුණු කළ හැකි ය.

මානව අයිතිවාසිකම් බටහිර ආධිපත්‍යයේ මෙවලම් ලෙස සැලකීමේ ආධානග්‍රාහී ආකල්පය නිසා මානව අයිතිවාසිකම් පාදක සංවර්ධනය පිළිබඳ නිසි අවධානයක් සංවර්ධනය වෙමින් පවතිනවා යැ'යි සැලකෙන රටවල වියතුන් අතර ද වාමවාදී දේශපාලන ව්‍යාපාර තුළ ද ඇති නොවූ බව කිව හැකි ය. මානව අයිතිවාසිකම් යනු පුද්ගල ස්වතන්ත්‍රභාවය පිළිබඳ නිර්ණායක බව පිළිගැනීමට පක්ෂයේ ආධිපත්‍ය මුදුන් කොට සැලකූ වාමාංශිකයන් මැලි විය. තවත් අය ධනවාදය විසින් ඔජවඩන ලද ස්වාමිත්වකාමි *(possessive)* පුද්ගලික අයිතිය සහ පුද්ගල ශක්‍යතා පදනම් කරගත් මානව අයිතිවාසිකම් අතර ඇති දෘෂ්ටිවාදී වෙනස දැකීමට අපොහොසත් වූහ. දෙවන ලෝක මහා යුද්ධයේ දී යුදෙව් ජන වර්ගයට එරෙහි ව අමානුෂික ජනඝාතය රාජ්‍ය ප්‍රතිපත්තියක් වසයෙන් ක්‍රියාත්මක කළ ආර්යෝත්තමික නාසිවාදය වැන්නක් නැවත බිහි වීම වැළැක් වීම පිණිස යොදා ගත

229 මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ ඉතිහාසය අලළා 2012 දී මා ලියූ "නියත විවරණය" කෘතිය කියවන්න. එය රාවය ප්‍රකාශනයකි.

හැකි මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක අවශ්‍යතාව පිළිබඳ කතිකාව දෙවැනි ලෝක මහා යුද්ධය ඇරඹීමත් සමඟම බිහි වූවකි. බ්‍රිතාන්‍ය ගත්කතුවර එච්. ජී. වෙල්ස් 1939 දී ලන්ඩන් ටයිම්ස් පුවත් පතට ලිපියක් ලියමින් මානව අයිතිවාසිකම් ප්‍රකාශයේ අරමුණ පැසිස්ට්වාදයට එරෙහිව අප යුද වැදී ඇත්තේ කිනම් වටිනාකම් ආරක්ෂා කර ගැනීම සඳහා ද යන්න ගැන අපේ තරුණ තරුණියන්ට අවබෝධයක් ලබා දීම යැයි කියා සිටියේ ය.

අමාර්ත්‍ය සෙන්ට අනුව මානව අයිතිවාසිකම් විමර්ශනයේ දී වැදගත් වන්නේ එම අයිතිවාසිකම්වලට පාදක වූ මනුෂ්‍ය නිදහසෙහි සුවිශේෂ වැදගත්කම යි. එම වැදගත්කම අපට අපේ ම වූ අයිතීන් තහවුරු කර ගැනීමේ වටිනාකම පමණක් නො ව අන් සියලු අය සඳහා ද එම අයිතීන් තහවුරු කර දීමේ වැදගත්කම ද අවබෝධ කර දෙයි.[230] ඒ අනුව මානව අයිතිවාසිකම්වලින් මූලික වසයෙන් උත්කර්ෂණයට නංවන්නේ පුද්ගල ස්වතන්ත්‍රභාවය මිස පුද්ගලික ආත්මාර්ථය නො වේ. මානව අයිතිවාසිකම් කතිකාව බටහිර ලෝකයේ පැවති රදල- ප්‍රවේණිදාස ක්‍රමයට, ආගමික සංවීක්ෂණයේ *(Inquisition)* පරිපීඩනයට සහ ආධිපත්‍යට එරෙහි ව නිෂ්පන්න වූ බව සැබෑවකි. එහෙත් එම අයිතීන් උත්ප්‍රේක්ෂාව *(tolerance&*, නිදහස හා පුද්ගල ස්වතන්ත්‍රභාවය යන ගුණාංග ප්‍රමුඛ කරගත් පොදු මානව ශිෂ්ටාචාරයක් ගොඩ නැගීමේ පූර්ව කොන්දේසි වසයෙන් පෙර අපර දෙ දිගට ම පිළිගැනීමට හැකි ය. සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයකට අත්‍යවශ්‍ය අංගයක් වන්නේ දේශපාලන සමානාත්මතාව තහවුරු කිරීම යි. ඒ සඳහා අවශ්‍ය වන්නේ පුද්ගල ස්වතන්ත්‍ර භාවය අඛණ්ඩ ව පවත්වා ගැනීමට රට වැසියන්ට ඇති හැකියාව නිරන්තරයෙන් තහවුරු කරන මානව ශිෂ්ටාචාරයකි .

මානව අයිතිවාසිකම් පාදක සංවර්ධන එළඹුමක දී සංවර්ධනයේ දර්ශකයක් ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සැලකිය යුත්තේ කෙසේ ද යන්න විමසා බැලූ විට මෙම අදහස තව දුරටත් පැහැදිලි

230 Sen, Amartya (2010). The Idea of Justice. Penguin UK. pp. 366-367, Kindle Edition.

කර ගත හැකි ය. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය බටහිර රටවල බොහෝ විට නිරූපණය වන්නේ ජනමාධ්‍ය නිදහස පිළිබඳ ආයතනික ප්‍රශ්නයක් ලෙස ය. උදාහරණයක් ලෙස *Reporters without Borders* හෙවත් 'දේශ සීමාවලින් තොර වාර්තාකරුවෝ' නමැති ප්‍රකට රාජ්‍ය නො වන ජාත්‍යන්තර සංවිධානය වාර්ෂික ව නිකුත් කරන ලෝක ජනමාධ්‍ය නිදහස පිළිබඳ දර්ශක මඟින් හැම රටක ම මාධ්‍ය බහුවිධත්වය, මාධ්‍ය ස්වාධීනත්වය, මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ නීතිය මඟින් ලැබෙන ආවරණය අනුව ජන මාධ්‍ය නිදහස පිළිබඳ සංඛ්‍යාත්මක අගයක් ලබා දෙයි[231]. එහෙත් ඒ මඟින් ජනමාධ්‍ය අන්තර්ගතයේ ගුණාත්මක භාවය, බහුවිධත්වය හා නාගරික මෙන් ම ග්‍රාමීය ප්‍රදේශවල ද වෙසෙන විවිධ ජන කොට්ඨාශවලට සිය අදහස් ප්‍රකාශ කිරීමට ජනමාධ්‍ය උපයෝගී කර ගැනීමට ඇති හැකියාව නිරූපණය නො වේ.

ඒ නිසා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පරිපූර්ණ ලෙස භුක්ති විඳීමට නම් එම අයිතිය නීතියෙන් සහතික කිරීමට අමතර ව රටවැසියන්ට සිය අදහස් ප්‍රකාශ කිරීම පිණිස කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගත හැකි බහුත්වවාදී ජන සංනිවේදන පද්ධතියක පැවැත්ම ද අවශ්‍යය වේ. එහි දී මහජන මතය ගොඩ නැගීමේ ලා වඩා දැනෙන බලපෑමක් කළ හැකි විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය බහුවිධත්වය හා සංස්කාරක ස්වාධීනත්වය සහතික කළ හැකි ස්වාධීන නියාමන ක්‍රමයක් මඟින් ඵලදායී ප්‍රජාතන්ත්‍රවාදී කතිකා යන්ත්‍රණයක් ලෙස පවත්වා ගෙන යෑම වැදගත් ය. විශේෂයෙන් දේශපාලනික, සමාජීය, පාරිසරික හා ආර්ථික සාක්ෂරතාවය ගුණාත්මක හා ප්‍රභේද්‍ය *(distinctive)* වැඩසටහන් මඟින් ප්‍රවර්ධනය කළ හැකි ස්වාධීන මහජන සේවා විද්‍යුත් මාධ්‍ය *(Public Service Broadcasting)* සහ බිම් මට්ටමේ දේශපාලන සහභාගිත්වය සහතික කිරීම පිණිස ස්වාධීන ප්‍රජා ගුවන් විදුලි *(Community Radio)* හා පරිස්ථානීය පුවත්පත් *(Local Newspapers)* වැනි ජනමාධ්‍ය මෙවලම් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය

231 https://rsf.org/en/ranking#

පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය ය. දැරිය හැකි මිලකට අන්තර්ජාල පහසුකම් ලබා දීම මඟින් මංගත *(Online)* තොරතුරු සඳහා ප්‍රවේශ වීමට, ප්‍රතිචාර දැක්වීමට සහ සමාජ මාධ්‍ය පරිහරණය කිරීමට ඇති හැකියාව ද අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය භුක්ති විඳීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි අතර වැදගත් වෙයි. ඒ අනුව අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය යනු හුදෙක් අගනුවර පාදක කරගත් සහ බොහෝ විට පවතින ආණ්ඩුවේ ව්‍යාපාරික අනුග්‍රහය සහතික කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස පවත්වා ගෙන ගිය හැකි ජනමාධ්‍ය ආයතන අතළොස්සක් පිහිටුවා ගැනීමට ඉඩ දීමෙන් පමණක් සාක්ෂාත් කර ගත හැක්කක්ද නො වේ. සමස්තයක් ලෙස ගත් විට ජන මාධ්‍ය පද්ධතිය කොතෙක් දුරට සමාජයේ හැම ස්තරයක් ම ඵලදායකව නියෝජනය කිරීමට සමත් වේද යන්න යුක්තිගරුක දේශපාලනයට අත්‍යවශ්‍ය වන සහභාගිත්වය හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධ වැදගත් ම සාධකයයි.

අනන්‍යතා දේශපාලනය නිසා විභේදනය වී ඇති මනුෂ්‍ය වර්ගයාට සමානාත්මතාව පදනම කර ගැනීමට හැකි විශ්ව සාධාරණ වූ පොදු චින්තනයක් විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනය සපයයි. එම ප්‍රකාශනයේ අඩංගු සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ විවේචන බොහෝමයක් ම අනන්‍යතා දේශපාලනය මත පදනම් වූ අනන්‍යතා දේශපාලනය සමඟ ම පිටු දැකිය හැකි ඒවා ය. වඩා වැදගත් වන්නේ මනුෂ්‍යයන් අතර ඇති පුද්ගල අසමානතා සලකමින් වුව ද සිවිල් හා දේශපාලනික මෙන් ම ආර්ථික, සමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රවල නිශ්චිත මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාන සැලකීම් ලැබීමට අනන්‍යතා නො තකා සියලු මනුෂ්‍යයන්ට ඇති සමාන හිමිකම පිළිග ැනීමත් එය සාක්ෂාත් කර ගැනීමට කටයුතු යෙදීමත් ය. ඒ අනුව ආර්ථිකයේ පොදු අරමුණ ද මානව අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම අන්තර්ග්‍රහණය කරගත් සංකල්පයකින් සමන්විත විය යුතු වේ.

සාම්ප්‍රදායික ව වම තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් තිබූ ආකල්පය ලෙනින් ජාතීන්ගේ සංගමය

සම්බන්ධයෙන් තිබූ සෘණ ආකල්පයට වඩා වෙනස් නොවීය. විශේෂයෙන් ගැටුම් සමනයේ දී බලවත් රටවල ආධිපත්‍යවාදී න්‍යාය පත්‍ර එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා ක්‍රියාත්මක කිරීමට තැත් කළ ද එක්සත් ජාතීන්ගේ සංවිධානය යනු විවිධ ආකාරයේ ප්‍රතිවිරෝධිතා නියෝජනය වන ගෝලීය වේදිකාවකි. මේ වෙනස තේරුම් ගැනීමට නම් බහුපාර්ශවික ජාත්‍යන්තර ආයතන, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ලෝක බැංකුව, සංවර්ධනය යන්න එකිනෙකට වෙනස්ව අර්ථකතනය කළ ආකාරය පිළිබඳ ඉතිහාසය මඳක් විමසා බැලිය යුතු ය

එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිට වූ මුල් කාලයේ දී 'සංවර්ධනය' සහ 'ආර්ථික ප්‍රගතිය' සමාන තේරුම් ඇති යෙදීම් වසයෙන් භාවිත විණි. 'ආර්ථික සංවර්ධනය' යන යෙදුම ආර්ථික විද්‍යාඥ ජෝශප් ෂුම්පිටර් වැනි අය විසින් විසිවැනි සිය වසේ මුල් කාලයේ සිට ම භාවිත කරන ලද්දකි. එහෙත් 'ආර්ථික සංවර්ධනය' යන්නෙන් එකල අදහස් වුණේ නො වෙනස් වන විසංක්‍රාන්තීය තත්වයක් නො ව එක තත්වයකින් වඩාත් ඉහළ තත්වයකට සංක්‍රමණය වන සංක්‍රාන්තීය ක්‍රියාවලියකි. ඒ අනුව ඒ සංක්‍රාන්තිය සඳහා අවශ්‍ය උත්තේජකයක් සැපයෙන්නේ නම් ඌණ සංවර්ධිතයැ'යි ගැනෙන රටවල් සංවර්ධිත රටවල් බවට පරිණාමනය කළ හැකි යැ'යි ඉන් අදහස් විය. ඒ නිසා හැම රටක් ම සංවර්ධිත තත්වයට පත්වීම සිය අභිප්‍රාය කර ගත යුතු ය. *(වර්ධන වේගය මත සංවර්ධනය තීරණය වීම මේ වන විටත් වේදිකාවට පැමිණ තිබුණේ නැත)* මේ මතය විදහා දක්වමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය 1948 දී *A/RES/198 (III)* හා *A/RES/200)3)* යන යෝජනා දෙක සම්මත කර ගත්තේ ය. එම යෝජනා අනුපිළිවෙළින් සංවර්ධනය සඳහා ණය ආධාර සැපයීම සහ තාක්ෂණික සහාය ලබා දීම හා සම්බන්ධ ව ඒවා විය. එකල *International Bank for Reconstruction and Development* නමින් හැඳින්වුණු ලෝක බැංකුව විසින් සංවර්ධන ණය ලබා දීම ඉටු කරනු ඇතැ'යි එම යෝජනා මඟින් අපේක්ෂා කෙරිණි.

මේ ආකාරයෙන් සංවර්ධනය සංකල්පගත කිරීමට එක් හේතුවක් වූයේ දෙවැනි ලෝක මහා යුද්ධයේ දී හානියට ලක් වූ යුරෝපීය රටවලට ඇමෙරිකාවේ මාෂල් සැලැස්ම යටතේ ලැබුණු මූල්‍ය ආධාර මත සිදු කෙරුණු ප්‍රතිස්ථාපන කටයුතු නිසා ඇති වූ දියුණුව යි. එහෙත් මේ දියුණුව වැඩි වසයෙන් ඇති වූයේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍ය සහ වග වීම යන සාධක තුන ම සතුටුදායක ව ක්‍රියාත්මක වුණ යුරෝපීය රටවල මිස 1970 ගණන් දක්වා ම ඒකාධිපති පාලන තන්ත්‍ර පැවති පෘතුගාලය සහ ස්පාඤ්ඤය වැනි දකුණු දිග යුරෝපීය රටවල නො වන බව ද අප මතක තබා ගත යුතු ය.

ඉන් අනතුරුව ගත වූ වසර කිහිපය තුළ සංවර්ධනය යන්න වඩාත් නිර්මාණාත්මක ව අර්ථ කථනය කිරීමේ කතිකාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සේවය කළ විශේෂඥයන්ගේ මැදිහත් වීමෙන් බිහි විය.

මේ කතිකාවල දී පැහැදිලි තේමා දෙකක් ඉස්මතු විය. ඒ අනුව පළමුවෙන් ම, සංවර්ධනය සඳහා ප්‍රාග්ධනය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සැලකිණි. එයට පදනම් වූයේ නූතනීකරණ න්‍යාය හඳුන්වා දුන් ඇමෙරිකානු ආර්ථික විද්‍යාඥයෙකු වූ වෝල්ට් රොස්ටොව් පෙන්වා දුන් පරිදි කාර්මිකකරණය හරහා ආර්ථික වර්ධනය වැඩි කර ගැනීම තුළින් සංවර්ධිත හා ඌණ සංවර්ධිත රටවල් අතර ඇති අසමතුලිතතාව ආමන්ත්‍රණය කිරීමට ප්‍රාග්ධන ආයෝජන හේතු වනු ඇතැ'යි යන අදහස යි. උත්ප්‍රාසයට හේතුවක් වන්නේ මුල් අවධියේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥයින් ප්‍රාග්ධනයේ කේන්ද්‍රීය බව උදක් ම කියා සිටිමින් ඌණ සංවර්ධිත රටවලට සහන දායක ණය පහසුකම් සපයන ලෙස ලෝක බැංකුවෙන් ඉල්ලා සිටීම යි. මුලදී එම ඉල්ලීම ගැන ලෝක බැංකුව එතරම් කැමැත්තක් නො දැක්වූ නමුත් 1969දී ලෝක බැංකුව විසින් මෘදු ණය ලබා දීම පිණිස ජාත්‍යන්තර සංවර්ධන සංගමය *(International Development Association)* පිහිටුවන ලදී. ඉන් පසු ව ණය ආධාර ලබා දීමේ

විශාලතම අනුග්‍රාහකයා බවට ලෝක බැංකුව පත් විය. මේ නිසා එහි මූල්‍යමය බල පරාක්‍රමය සමඟ බහුපාර්ශවික ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ සංවර්ධනය පිළිබඳ බරසාර ම හඬ ලෝක බැංකුව සතු විය. 'මුදල් කතා කරයි' යන්න සම්බන්ධයෙන් ඊට වඩා හොඳ නිදසුනක් සොයා ගැනීමට නො හැකි තරම් ලෝක බැංකුවේ ස්ථාවරය දියුණු වන රටවල සංවර්ධනයේ දිශානතිය තීරණය කිරීමට බලපා තිබේ. ඒ අතර 1960 ගණන්වල සිට ලෝක බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ගෝලීය දකුණේ අවධානය දිනා ගැනීම සම්බන්ධයෙන් සමාදාන නො වන එදිරිවාදීන් ලෙස කටයුතු කර තිබේ. නොකඩවා පුළුල්වෙන ලෝක බැංකුවේ තාක්ෂණික ආධාර වැඩපිළිවෙළ මේ විරසකය තවත් තීව්‍ර කළේ ය.[232]

ආර්ථික වර්ධන වේගය අනුව සංවර්ධනය අර්ථකථනය කිරීමේ සුර දූතයා වසයෙන් සැලකිය හැකි ලෝක බැංකුව හා සැසඳූ විට දෘෂ්ටිවාදී වසයෙන් වර්තමානයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය සංවර්ධන කතිකාවේ වාමාංශය දෙසට වඩා නැඹුරු බව පැහැදිලිය. ඇතැම් සාමාජික රටවල පාලකයන්ගේ නො රුස්නා භාවය ද නො තකා මානව සංවර්ධන වාර්තාව *(Human Development Report)*, මානව සංවර්ධන දර්ශක *(Human Development Index)* වැනි මෙවලම් ද ඇතුළු ව නොයෙකුත් අන්තර්ජාතික ගිවිසුම්, ප්‍රොටෝකෝල සහ වැඩ සටහන් මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම්, කම්කරු අයිතීන් ද ඇතුළු ව මානව සංවර්ධනය සමස්තයක් ලෙස ග්‍රහණය කිරීමේ ජාත්‍යන්තර ප්‍රවර්ධකයාගේ භූමිකාව ඉටු කිරීමට තැත් කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය වාර්ෂිකව නිකුත් කරන *Human Development Report (*මානව සංවර්ධන වාර්තාව*)* සහ ලෝක බැංකුවේ වාර්ෂික ප්‍රකාශනය වන *World Development Report (*ලෝක සංවර්ධන වාර්තාව*)* මඟින් සංවර්ධනය පිළිබඳ එම ආයතන දෙක පිළිවෙලින් වාම හා දක්ෂිණාංශික නැඹුරුතා අඩු වැඩි

232 Stephen Browne and Tomas G. Weiss (2021) p.14-15, UN development System: Origins, Structure, Status in Routledge Handbook on UN and Development, (eds) Stephen Browne and Tomas G. Weiss, Routledge New York

වසයෙන් නියෝජනය කරන බව එම වාර්තා පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් කළ ඩෙවින් ජෝසි හා රොනි කේ ඔඩෙල් පෙන්වා දෙයි.[233]

ඔවුන් පෙන්වා දෙන පරිදි පෙරට වඩා අසමමිතිකකම් අඩු බව පෙනුනද මේ වාර්තා දෙක මගින් ඉදිරිපත් කරන කතිකාවල හරය අතර ඇති වෙනස සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ලෝක බැංකුව අනුගමනය කරන දිශානතිවල වෙනස මනාව පිළිබිඹු කරයි. කතිකාවේ විෂය පථය, භාවිත පාරිභාෂික පද සහ ප්‍රශ්න රාමු ගත කරන ආකාරවල පෙරට වඩා පොදු බවක් මෑතක සිට දක්නට ලැබුණ ද කිසි සේත් ම එය සංවර්ධනය අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් ආයතන දෙක අතර දෘෂ්ටිවාදීමය එකඟ වීමක් ලෙස සැලකිය නො හැකි බව ද ඔවුන්ගේ මතය යි. බොහෝ විට ලෝක බැංකු වාර්තාවල ඇති කතිකාමය වෙනස්කම් යනු පුරුදු ප්‍රතිපත්තිය දිගින් දිගට ම පවත්වා ගෙන යෑම මුවා කිරීමට කරන ලද දක්ෂ මහජන සම්බන්ධතා ව්‍යායාමයකට වැඩි යමක් නොවිය හැකි බව ද ඩෙවින් ජෝසි හා රොනි කේ ඔඩෙල් පවසති.

කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ සංවිධානයට වඩා වැඩි බලපෑමක් දියුණුවන රටවල සංවර්ධන දිශානතිය කෙරෙහි ඇති කිරීමට බ්‍රෙටන්වුඩ් සම්මුතිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව සමත් ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අනුදක්නා මානව අයිතිවාසිකම් සුරැකීම, ජන මාධ්‍ය නිදහස වැනි සංකල්ප සහ වංචා හා දූෂණ වැළැක්වීම, වද හිංසනයට එරෙහි වීම ආදී කරුණු පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පිළිබඳ කොහොමටත් නුරුස්නා ආකල්පයක් දරන පාලකයෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඉතසිතින් අනුදක්නා ලෝක බැංකුවේ සංවර්ධන සංකල්ප දෝතින් ම පිළිගැනීමට සූදානම් ය.

233 Devin Joshi and Roni Kay O'Del (2013) p. 249-275, Global Governance and Development Ideology in Global Governance: A Review of Multilateralism and International Organizations (ed. Alynna J. Lyon et.al) Vol 19-2

සංවර්ධන යන්න ආර්ථික සංවර්ධනය වසයෙන් පිළිගැනීමට ලක් වීමත් දළ දේශීය නිෂ්පාදිතය සංවර්ධනයේ මානකය වසයෙන් ඉස්මතු වීමත් සමඟ අනුක්‍රමයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි විශේෂඥ ආයතන සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවෙන් කොන් වී ගියේ ය. ඒ වෙනුවට නවලිබරල්වාදය උත්කර්ෂණයට නැංවූ ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලපෑමට සංවර්ධනය පිළිබඳ මතවාද නතු විය. කෙසේ වෙතත් වර්ධනයේ ගුණාත්මක භාවය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එහි විශේෂඥ ආයතන දිගින් දිගට ම කරුණු දැක්වීය. එම කරුණු දැක්වීම්වලට විෂය වූ කරුණු බොහෝමයක් විශ්ව මානව ප්‍රකාශනයේ මානව අයිතිවාසිකම් වසයෙන් දක්වා තිබූ ඒවා විය. ඒ අතර සැමට ප්‍රාථමික අධ්‍යාපනය සහතික කිරීම, ස්ත්‍රී පුරුෂ සමානතාව ප්‍රවර්ධනය කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම, සැමට සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සහතික කිරීම සහ පරිසර සංරක්ෂණය එක්සත් ජාතීන් දියත් කළ කතිකාව තුළ මුල් තැනක් ගත්තේ ය. ඒ වන විට එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් ජාත්‍යන්තර කම්කරු සංවිධානය *(ILO)* ආර්ථික වර්ධනය මානව කේන්ද්‍රීය විය යුතු බවත් එහි එක් ප්‍රධාන ඵලයක් විය යුත්තේ සැමට ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ නිවාස වැනි මූලික අවශ්‍යතා සහතික කිරීම ඇතුළුව සුභසාධනය සැලසීම බව පෙන්වා දෙමින් "මූලික අවශ්‍යතා එළඹුම" *(Basic Need Approach)* නම් සංවර්ධන සංකල්පය එක්සත් ජාතීන්ගේ සංවර්ධන කතිකාවට හඳුන්වා දී තිබුණි. මෙම එළඹුම දිළිඳු බව මුලිනුපුටා දැමීමට ප්‍රමුඛත්වය දුන් 'වෙනත් සංවර්ධනයක්' *(Another Development)* යන මැයෙන් හැඳින්විණි. එහෙත් 1990 වන තෙක් ම දිළිඳු බව අවම කිරීම ලෝක බැංකුවේ වැඩසටහන්වලට ඇතුළත් නො වී ය.

ලෝක බැංකුව මෙන් නො ව සාමාජික රටවල අධිකාරි බලයෙන් මිදෙමින් නිදහස් මතධාරී විෂය විශේෂඥයන්ගේ සහ සිවිල් සංවිධානවල අදහස්වලට වැඩි වැඩියෙන් කන්දීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි පරිවාර ආයතන අනුක්‍රමයෙන් පෙලඹී තිබේ. උදාහරණයක්

ලෙස බලගතු සාමාජික රටවල හා අන්තර්ජාතික සමාගම්වල කෙනෙහිලි මැද වුවද දේශගුණ විපර්යාසය පිළිබඳ විද්‍යාත්මක මතය ජයග්‍රහණය කරවීමට එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය *(Intergovernmental Panel on Climate Change)* සමත් වී ඇත්තේ තම රටවල ආණ්ඩුවලින් ස්වාධීන වූ විෂය විශේෂඥයන්ගේ සහ සිවිල් සංවිධානවල පුළුල් සහයෝගිතා පෙරමුණක් ගොඩනගා ගැනීමට එයට හැකි ව තිබෙන නිසා ය. ඒ හැර මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ එන කැපවීමට අනුව විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ සඳහන් මානව අයිතිවාසිකම් ගෝලීය ප්‍රමිති ලෙස ප්‍රවර්ධනය කිරීමට අදාළ එක්සත් ජාතීන්ගේ ආයතනවල කාර්ය මණ්ඩල දක්වා ඇති කැපවීම ද අගය කළ යුතු ය. සිවිල් සංවිධාන සමඟ එක් ව එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල බොහෝ විට ක්‍රියාකර ඇත්තේ එහි ප්‍රඥප්තියේ සඳහන් "එක්සත් ජාතීන්ගේ ජනතාව වන අප" *(We the peoples of the United Nations)* යන්න කේන්ද්‍ර කර ගනිමින් මිස එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් යන්න කේන්ද්‍ර කර ගනිමින් නො වේ. කනිෂ්ඨ ජෝජ් බුෂ් ජනාධිපතිවරයා ඉරාකය ආක්‍රමණය කිරීමට තීරණය කළ විට එක්සත් ජාතීන්ගේ මහ ලේකම් එය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට විරුද්ධ ක්‍රියාවක් බව නො පැකිළ ව පෙන්වා දීම ඊට එක් උදාහරණයකි.

සංවර්ධන අවශ්‍යතාවක් ලෙස දේශපාලනය යුක්තිගරුක කිරීම සම්බන්ධයෙන් සහස්‍රක සංවර්ධන අරමුණු *(Millennium Development Goals)* බෙහෙවින් දුර්වල විය. එහි තිබූ ප්‍රමුඛ දුර්වලතාවක් වූයේ සහස්‍රක සංවර්ධන අරමුණු නිර්ණය කිරීමට පූර්විකාවක් ලෙස සහස්‍රක ප්‍රකාශනයෙන් *(Millennium Declaration)* මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් රටවල් පොරොන්දු වූ කැපවීම ක්‍රියාවට නංවන කිසිවක් සහස්‍රක සංවර්ධන අරමුණුවල නො තිබීමයි. ගෝලීය වසයෙන් එකඟ වූ න්‍යාය පත්‍රයකින් වැදගත් මාතෘකා ඉවත් කළ විට එම මාතෘකා ගැන වාර්තා කිරීමක් සිදු නොවන බැවින් ප්‍රමුඛතා පිළියෙළ කිරීමේ දී එවැනි මාතෘකා පිළිබඳ ප්‍රතිපත්ති තීරණය

කිරීම හා ප්‍රවර්ධනය සඳහා සාමාජික රටවල් මුදල් වෙන් නොකරන බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය සහස්‍රක සංවර්ධන අරමුණු ගැන 2013 දී කළ විවේචනයකින් පෙන්වා දුන්නේ ය.[234]

හුදු ආර්ථික වර්ධනය පදනම් කොට සංවර්ධනය සංකල්පගත කිරීමට කිසියම් දුරකට විකල්පයක් ලෙස 'තිරසාර සංවර්ධනය' යන අදහස මුලින් ම සමාජ ගත වූයේ ධ්‍රැවාසන්න වායුගෝලයේ ඉහළින් පිහිටි ඕසෝන් ස්තරය ක්ෂය වීම, වැඩිවන ගෝලීය උණුසුම නිරීක්ෂණය වීම සහ ලෝක ජනගහනයේ ජීවන තත්වයන්ට බලපාන අනෙකුත් පාරිසරික ගැටලු විමසා වාර්තා කිරීම පිණිස 1983දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පත් කරන ලද අන්තර්ජාතික කොමිසමක නිර්දේශ නිසාය. පාරිසරික විශේෂඥයන්, දේශපාලනඥයන් සහ සිවිල් නිලධාරීන් ගෙන් සමන්විත මෙම කොමිසමේ සභාපතිත්වය දැරුවේ නෝර්වේජියානු අගමැතිනි ග්‍රෝ හාර්ලම් බ්‍රන්ට්ලන්ඩ් ය. 'අපේ පොදු අනාගතය' *(Our Common Future)* යන නමින් 1987 දී නිකුත් වූ බ්‍රන්ට්ලන්ඩ් කොමිසමේ වාර්තාව 'තිරසාර සංවර්ධනය' යන්න අර්ථ කථනය කරන ලද්දේ "අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීම අසීරුවට ලක් නො කරමින් වර්තමාන අවශ්‍යතා සපුරා ගැනීම පිණිස කරන සංවර්ධනය" යනුවෙනි. මේ අර්ථකථනය සැපයීමට අතිරේක ව දිළින්දන්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දීම මෙන් ම වර්තමාන හා අනාගත අවශ්‍යතාව සපුරාලීමට පරිසරයට ඇති හැකියාව තාක්ෂණය සහ සමාජය සංවිධානය වී ඇති ආකාරය අනුව සීමා වී තිබීම ද වාර්තාවෙන් අවධාරණය කළේ ය.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය මඟින් නිරූපණය වන ධනවාදී ආර්ථික සංවර්ධනයේ ඵල ප්‍රයෝජන *trickle down* නොහොත් අතපල්ලෙන් වැටීමෙන් දුප්පතුන්ට ද වාසිදායක වෙතැ'යි යන අදහස කලක් තිස්සේ ම පිළිගත් සංවර්ධන න්‍යායක් ලෙස උත්කර්ෂණයට නංවා තිබුණි. එම අදහස ම සංවර්ධනය යනු වෙළඳපොළ බලවේගවල

234 Statement by 17 Special Procedures mandate-holders of the Human Rights Council on the Post-2015 development agenda, 21 May 2013, https://newsarchive.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=13341&LangID=E

අදෘශ්‍යමාන ස්වර්ණමය හස්තය විසින් මෙහෙයවන දෙයක් ලෙස නවලිබරල්වාදය විසින් ද ඔප වඩවා තිබුණි. එහෙත් ඒ අනුව වුව ද පරිසර සංරක්ෂණය අනතුරේ වැටීම හා අධිපරිභෝජනය නිසා අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීම අසීරුවට ලක් නො කර නිරායාසයෙන් ම තිරසාර වන සංවර්ධනයක් ඇති කිරීම උගහට බව ඇතැම් ප්‍රතිපත්ති විශ්ලේෂකයන් විසින් පෙන්වා දෙන ලදී.

සංවර්ධනය පිළිබඳ බොහෝ මුල් කාලීන විග්‍රහ *trickle down* නොහොත් ධනවතුන් විසින් නිපදවන ධනයෙන් කොටසක් වැටුප් හා බදු වසයෙන් ඔවුන්ගේ අත පල්ලෙන් වැටීමෙන් අවශේෂ අයට ද වාසි සැලසේ ය යන ධනවාදී අදහස මත පදනම් වූ ඒවා විය. එහෙත් එයට පටහැණි ව සමාජ විෂමතාව වැඩි වීම නිසා විසිවැනි සිය වසේ අවසාන කාර්තුව වන විට මේ අදහස ගර්හාවට ලක් ව තිබුණි. ඉන් පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ *(IMF)* මෙහෙයවීමෙන් *'Structural Adjustment Programme*' හෙවත් 'ව්‍යුහාත්මක ගැලපුම් ක්‍රියාමාර්ගය' යනුවෙන් 1990 ගණන්වල දී තවත් සංවර්ධන සංකල්පයක් ඉදිරිපත් කර තිබුණි. එමඟින් සියලු ආකාරයේ රාජ්‍ය සහනාධාර සහ පොදු සේවා වෙනුවට නිදහස් වෙළඳපොළ බලවේගවලට නිර්බාධක ව ඉඩ ලබා දීම පොදු සංවර්ධන ප්‍රතිපත්තිය වසයෙන් ප්‍රවර්ධනය කළේ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙහෙයවීමෙන් වර්තමානයේ වඩා පරිපූර්ණ සහ ඒකාග්‍ර වැඩ සටහනක් ලෙස තිරසාර සංවර්ධන අරමුණු සම්පාදනය වී ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකී 'ව්‍යුහාත්මක ගැලපුම් වැඩසටහන' *(structural adjustment program)* කේන්ද්‍ර කර ගත් සංවර්ධන උපාය මාර්ගය ද අසාර්ථක වූ නිසාය.

කෙසේ වෙතත් සංකල්පයක් ලෙස ගත් විට සංවර්ධනය යනු විශේෂයෙන් පශ්චාත් යටත් විජිත යුගයේ බෙහෙවින් භාවිතයේ තිබී 1980 ගණන්වල අගභාගය වන විට වේදිකාවෙන් අතුරුදහන් ව ගිය ප්‍රපංචයකි. ඉන් අදහස් කරන්නේ විවෘත වෙළඳපොළ මත පදනම් වූ ආර්ථික සංවර්ධනය ගැන නො ව නව ලිබරල්වාදයේ ග්‍රහණයට හසු වීමට පෙර සංවර්ධනය වන රටවල්වල නායක කාරකාදීන් කතා

කළ, බොහෝ විට විදේශාධාර මත දියත් කරනු ලැබූ නැවත පදිංචි කිරීමේ ජනපද ව්‍යාපෘති, ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති, අධ්‍යාපන හා ඉඩම් ප්‍රතිසංස්කරණ ආදි කටයුතුවලට පාදක වූ සංවර්ධනය නමැති සාම්ප්‍රදායික සංකල්පයයි. එකල බොහෝ ඒකාධිකාරී පාලකයෝ ඒ පැරණි මෝස්තරයේ සංවර්ධනයට වහ වැටී සිටියහ. එහෙත් මෑත දී ඇතිවූ ජනප්‍රිය ජාතිකවාදී දේශපාලනයේ නැගීමත් සමඟ ඔවුන් අතර පවා සංවර්ධනය තවදුරටත් ඒ තරම් උත්කර්ෂයක් දනවන ඉදිරිගාමී සංකල්පයක් ලෙස නො සැලැකුණි. එහෙත් ට්‍රම්ප්, බොල්සොනාරෝ, එර්ඩොගාන් සහ මෝඩි වැනි අය විශාල ව්‍යාපෘති, පරිභෝජනය වැඩි කිරීම සහ නවලිබරල්වාදී නිර්නියාමනය මඟින් කෝපරේට් සමාගම්වල ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම වැනි "සංවර්ධන" කටයුතු ගැන විශ්වාසය තබා නැති බවක් ඉන් අදහස් නො වේ. එහෙත් සංවර්ධනය නමින් අප කලින් දැන සිටි සාම්ප්‍රදායික සංකල්පය දැන් පිළුණු වී ඇටකටු බවට පත්වී තිබේ. ඒ නිසා, ඒකාධිකාරය සහ පරජන භීතිකාව වැපිරීම හැරෙන විට, ට්‍රම්ප් ආදී ජනප්‍රිය ජාතිකවාදී දේශපාලකයන් භූ සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට පරිසරයේ සතුරන් වසයෙන් පෙනී සිටීමට වුව ද අකැමැත්තක් නො දැක්වීම පුදුමයට කරුණක් නො වේ. එහෙත් ඒ අතර ම ජනප්‍රිය ජාතිකවාදී දේශපාලනයේ ඇති එක් අසන්තතියක් වන්නේ එය බෙහෙවින් ආත්මාර්ථකාමී ස්වවර්ග කේන්ද්‍රීය මතවාද ප්‍රවර්ධනය කිරීම බව ද අමතක නොකළ යුතු ය.

කෙසේ වෙතත් දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු බිහි වූ සංවර්ධනය යන්න හොඳට හෝ නරකට හෝ හැම විට ම රාමු ගත වුණේ ජාතීන් අතර බහුපාර්ශ්වීය *(multilateralism)* සහයෝගය මත සිදුවිය යුතු දෙයක් ලෙස යි. එහෙත් ට්‍රම්ප්ගේ "මුලින් ම ඇමෙරිකාව" *(America First)* නමැති ජනප්‍රිය ජාතිකවාදී කාහල නාදයත් සමඟ බහුපාර්ශ්වීය සහයෝගය ඒකපාර්ශවීය අභිලාෂය බවට පත් විය. ඒ නිසා වැදගත් වන්නේ එක් ජාතිකත්වයක ඕනෑ එපාකම් පමණි. අනෙකුත් ජාතීන්ගේ ඕනෑ එපාකම් නො සලකා හැරිය හැකි ය. ඒ

අනුව බහුපාර්ශ්වීය සහයෝගය තුළ රාමු ගත වූ සංවර්ධනය පිළිබඳ යුගය ඉක්ම ගොස් තාක්ෂණය සහ සංස්කෘතිය පදනම් කරගත් පශ්චාත් සංවර්ධන යුගයක් එළඹ ඇතැ'යි ඇතැම් විචාරකයෝ පවසති. එහෙත් පැරණි සංවර්ධන සංකල්පය විතැන් කිරීමේ සමාරම්භය ඇත්ත වසයෙන් ම සනිටුහන් වන්නේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ කතිකාව ඇරඹීමත් සමඟ ය.

## තිරසාර සංවර්ධන අරමුණු

තිරසාර සංවර්ධන අරමුණු *(Sustainable Development Goals)* යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සියලු සාමාජික රටවල් විසින් අංක 70/1 දරණ යෝජනාව අනුව 2015 දී ඒකමතිකව සම්මත කරගත් සංවර්ධන අරමුණු 17ක එකතුවකි. 2000 සිට 2015 දක්වා ක්‍රියාත්මක වූ සහස්‍රක සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ වැඩ සටහන නිමාවට වසර දෙකකට පෙර 2013 දී *Rio*+20 යනුවෙන් හැඳින්වෙන එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ලෝක සමුළුව පවත්වා තිබූ අතර එහි නිගමන '*The Future We Want*' (අපට අවශ්‍ය අනාගතය*)* යනුවෙන් ප්‍රකාශයට පත් කර තිබුණි. තිරසාර සංවර්ධන අරමුණු නිර්ණය කිරීම සහ ඒ සඳහා එක්සත් ජාතීන්ගේ මුල් පෙළේ දේශපාලන කේන්ද්‍රයක් පිහිටුවිය යුතු බව එම ලේඛනයේ යෝජනා වූ එක් නිර්දේශයකි. ඒ අනුව සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ඒ සඳහා පත් කරන ලද අතර තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ සාකච්ඡා කෙටුම්පත සම්පාදනය වුණේ ඔවුන් අතිනි.

වසර 2030 වන විට සාක්ෂාත් කරගත් යුතු නිශ්චිත ඉලක්කවලින් සමන්විත එම තිරසාර සංවර්ධන අරමුණු හරය වසයෙන් ගත් විට සාමකාමී හා සෞභාග්‍යමත් මිනිස් වර්ගයක් මෙන් ම නිරෝගී පෘථිවියක් හා වායුගෝලයක් ද ගොඩනැගීමට හේතු වනු ඇතැ'යි බලාපොරොත්තු වේ.

නිශ්චිත තිරසාර සංවර්ධන අරමුණු 17 කින් සමන්විත එම වැඩපිළිවෙළ මඟින් සමස්ත ලෝකයේ ම සංවර්ධනය තිරසාර ලෙස

සිදුවිය යුතු ය යන්න අවධාරණය කෙරේ. ඒ නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට වෙසෙසින් එල්ල කරන ලද සහස්‍රක සංවර්ධන අරමුණු මෙන් නො ව තිරසාර සංවර්ධන අරමුණු සමස්ත ලෝකයාට ම අඩු වැඩි වසයෙන් අදාළ වන සියලු රටවල් එක් ව හවුලේ සාක්ෂාත් කර ගත යුතු ඒවා වසයෙන් සැලකේ. මේ අරමුණු 17 වන්නේ:

1. සියලු තැන්වල ඇති හැම ආකාරයක ම දරිද්‍රතාව අවසන් කිරීම *(end poverty in all its forms everywhere);*
2. සාගින්න අවසන් කිරීම, ආහාර සුරක්ෂිතතාව අත්පත් කර ගැනීම, පෝෂ්‍යදායකත්වය වර්ධනය කිරීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම *(end hunger, achieve food security and improved nutrition, and promote sustainable agriculture);*
3. සියලු වයස් කාණ්ඩවලට අයත් සියලු ම දෙනාට සෞඛ්‍ය සම්පන්න සුවපහසු දිවියක් සහතික කිරීම *(ensure healthy lives and promote well-being for all at all ages);*
4. හැම දෙනෙකුට ම අන්තර්ග්‍රහනීය *(inclusive)* සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම සහතික කිරීම සහ යාවජීව ඉගෙනුම් අවස්ථා ලබා ගැනීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම *(ensure inclusive and equitable quality education and promote life-long learning opportunities for all)*;
5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අත්පත් කර ගැනීම සහ කාන්තාවන් හා දැරියන් සවිබල ගැන්වීම *(achieve gender equality and empower all women and girls)*;
6. සැමට සුලබ ව සහ තිරසාර කළමනාකාරිත්වයක් සහිතව ජලය සහ සනීපාරක්ෂාව සාක්ෂාත් කිරීම *(ensure availability and sustainable management of water and sanitation for all)*;
7. පහසු මිලකට විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තිය ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීම *(ensure access to affordable, reliable, sustainable, and modern energy for all)*;

8. සැමට ශිෂ්ට-කාර්ය සම්ප්‍රයුක්ත පූර්ණ සහ ඵලදායී රැකියා නියුක්තියක් සහිත පෝෂිත, අන්තර්ග්‍රහනීය සහ තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම *(promote sustained, inclusive and sustainable economic growth, full and productive employment and decent work for all);*

9. ප්‍රත්‍යස්ථිත *(resilient)* හෙවත් ඔරොත්තුදෙන යටිතල පහසුකම් ගොඩ නැගීම, අන්තර්ග්‍රහනීය සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනය පරිපෝෂණය කිරීම *(build resilient infrastructure, promote inclusive and sustainable industrialization and foster innovation);*

10. රටවල් තුළ සහ රටවල් අතර ඇති අසමානතා අවම කිරීම *(reduce inequality within and among countries);*

11. නගර සහ මිනිස් ජනාවාස අන්තර්ග්‍රහනීය, ආරක්ෂිත, ප්‍රත්‍යස්ථිත සහ තිරසාර ඒවා බවට පත් කිරීම *(make cities and human settlements inclusive, safe, resilient and sustainable)*;

12. තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටා තහවුරු කිරීම *(ensure sustainable consumption and production patterns);*

13. දේශගුණ විපර්යාසයට සහ එහි බලපෑම්වලට එරෙහිව සටන් කිරීමට වහාම ක්‍රියාත්මක වීම *(take urgent action to combat climate change and its impacts);*

14. තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සාගර සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම *(conserve and sustainably use the oceans, seas and marine resources for sustainable development);*

15. භූමි පරිසර පද්ධති ආරක්ෂා කිරීම, පුනස්ථාපනය කිරීම සහ ඒවායේ තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම, ඉඩම් හායනය නතර කොට ප්‍රතිහායනය කිරීම සහ ජෛව විවිධත්වයට හානි වීම නතර කිරීම *(protect, restore and promote sustainable use of terrestrial ecosystems,*

*sustainably manage forests, combat desertification, halt and reverse land degradation and halt biodiversity loss);*

16. තිරසාර සංවර්ධනය උදෙසා සාමකාමී සහ අන්තර්ග්‍රහනීය සමාජ ප්‍රවර්ධනය කිරීම, යුක්තිය සාක්ෂාත් කර ගැනීමට සියල්ලන්ට ම හැකි වීම සහ වග වීම සහිත අන්තර්ග්‍රහනීය සහ ඵලදායී ආයතන හැම මට්ටමක ම ගොඩනැගීම *(promote peaceful and inclusive societies for sustainable development, provide access to justice for all and build effective, accountable and inclusive institutions at all levels)*;

17. තිරසාර සංවර්ධනය ක්‍රියාවට නැංවීමේ විධික්‍රම ශක්තිමත් කිරීම ඒ සඳහා ගෝලීය සහයෝගිතාව යළි පණගැන්වීම *(strengthen the means of implementation and revitalize the global partnership for sustainable development).*

ඉහත කී එක් එක් අරමුණ නිශ්චිත ඉලක්ක ගණනකින් සමන්විත ය. එම ඉලක්කවල එකතුව 119 කි. උදාහරණයක් ලෙස 16 වැනි අරමුණ ලෙස සැලකෙන "තිරසාර සංවර්ධනය උදෙසා සාමකාමී සහ අන්තර්ග්‍රහනීය සමාජ ප්‍රවර්ධනය කිරීම, යුක්තිය සාක්ෂාත් කර ගැනීමට සියල්ලන්ට ම හැකි වීම සහ හැම මට්ටමක ම වග වීම සහිත අන්තරීභූත සහ ඵලදායී ආයතන ගොඩනැගීම" යන්න සාමකාමී සමාජ, නීතියේ ආධිපත්‍ය සහ යුක්තිය අත්පත් කර ගැනීම, වග වීම සහිත ඵලදායී අන්තර්ග්‍රහනීය ආයතන, මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස යන උප කාණ්ඩවලට අයත් පහත දැක්වෙන ඉලක්කවලින් සමන්විත ය.

1. ලොව පුරා සියලු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ හා සම්බන්ධ මරණ අනුපාතික සැලකිය යුතු ලෙස අඩු කිරීම *(Significantly reduce all forms of violence and related death rates everywhere)*;

2. ළමයින් අපයෝජනය, උපයෝජනය, හොර ජාවාරම්වලට යොදා ගැනීම සහ ළමයින්ට එරෙහි සියලු ආකාරවල

ප්‍රචණ්ඩකම් හා ළමයින් වධ හිංසනයට ලක් කිරීම අවසන් කිරීම *(End abuse, exploitation, trafficking and all forms of violence against and torture of children)*;

3. ජාතික මට්ටමේ ද ජාත්‍යන්තර මට්ටම්වල ද නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම සහ සියල්ලන්ට ම යුක්තිය අත්පත් කර ගැනීමේ හැකියාව සහතික කිරීම *(Promote the rule of law at the national and international levels and ensure equal access to justice for all)*;

4. 2030 වන විට නීති විරෝධී මූල්‍ය කටයුතු සහ ආයුධ සංසරණය සැලකිය යුතු පමණින් අඩු කිරීම, සොරා ගත් වස්තු හා වත්කම් ප්‍රතිසාධනය සහ ආපසු භාර දීම ශක්තිමත් කිරීම සහ සියලු ආකාරයේ සංවිධානාත්මක අපරාධවලට එරෙහි ව සටන් කිරීම *(By 2030, significantly reduce illicit financial and arms flows, strengthen the recovery and return of stolen assets and combat all forms of organized crime);*

5. සියලු ආකාරයේ අල්ලස් හා දූෂණ තථ්‍ය ලෙස ම අවම කිරීම *(Substantially reduce corruption and bribery in all their forms);*

6. කාර්යක්ෂම, වග වීම සහිත, පාරදෘශ්‍ය ආයතන සියලු මට්ටම්වල සංවර්ධනය කිරීම *(Develop effective, accountable and transparent institutions at all levels);*

7. ප්‍රතිචාරශීලී, අන්තර්භූත, සහභාගිත්ව සහ නියෝජනීය තීරණ ගැනීමේ විධිවිධාන සියලු මට්ටමින් සහතික කිරීම *(Ensure responsive, inclusive, participatory and representative decision-making at all levels);*

8. ගෝලීය පාලනය මෙහෙයවන ආයතන තුළ සංවර්ධනය වන රටවල සහභාගිත්වය ශක්තිමත් කිරීම *(Broaden and strengthen the participation of developing countries in the institutions of global governance);*

9. 2030 වන විට සියල්ලන්ට ම උත්පත්තිය ලියා පදිංචි කිරීම ද ඇතුළත් ව නීත්‍යනුකූල අනන්‍යතාවයක් ලබා දීම *(By 2030, provide legal identity for all, including birth registration);*
10. ජාතික නීති සහ අන්තර්ජාතික ගිවිසුම්වලට අනුව තොරතුරුවලට ප්‍රවේශ වීමට මහජනයාට ඇති අයිතිය සහතික කිරීම සහ මූලික අයිතීන් ආරක්ෂා කිරීම *(Ensure public access to information and protect fundamental freedoms,in accordance with national legislation and international agreements);*
11. විශේෂයෙන් ම සංවර්ධනය වන රටවල ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට, ත්‍රස්ත්‍රවාදයට සහ අපරාධවලට එරෙහිව කටයුතු කිරීමට අන්තර්ජාතික සහයෝගය ද සමඟ අදාළ ජාතික ආයතන ශක්තිමත් කිරීම *(Strengthen relevant national institutions, including through international cooperation,for building capacity at all levels, in particular in developing countries, to prevent violence and combat terrorism and crime);*
12. තිරසාර සංවර්ධනය උදෙසා අඩු සැලකිලි දැක්වීමට නොහැකි නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම *(Enforce non-discriminatory laws and policies for sustainable development);*

ඉතිරි තිරසාර සංවර්ධන අරමුණු 16 සම්බන්ධයෙන් ද මේ ආකාරයෙන් නිශ්චිත ඉලක්ක හඳුන්වා දී තිබේ. තිරසාර සංවර්ධන අරමුණු 17 සම්බන්ධව 2015 සැප්තැම්බරයේ දී එකඟත්වයට පැමිණීමට එක්සත් ජාතීන්ට අයත් රටවලට හැකි වීමෙන් පසු ගත වූ පස් වසර තුළ ඒ සම්බන්ධයෙන් ශාස්ත්‍රාලයීය මට්ටමෙන් සැලකිය යුතු විචාර කෘති සංඛ්‍යාවක් පළ වී තිබේ. ඒ අනුව සංවර්ධනය සම්බන්ධයෙන් මින් පෙර පැවති සංකල්ප ගත කිරීම්වලට වඩා වැඩි අවධානයක් ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන් අතර දිනා ගැනීමට තිරසාර සංවර්ධන අරමුණුවලට හැකි ව තිබෙන බව පෙනී යයි.

**තිරසාර සංවර්ධන අරමුණු දක්වා සංවර්ධන දැක්ම**




තිරසාර සංවර්ධන අරමුණුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සංවර්ධනය සම්බන්ධයෙන් අපට ඉදිරි දශක දෙක තුන තුළ මුහුණ දීමට සිදු වන ඉතාමත් ම වැදගත් කාරණය වසයෙන් සැලකෙන ගෝලීය උණුසුම වෙනස් වීම නිසා ඇතිවිය හැකි දේශගුණ විපර්යාස හා අනෙකුත් ව්‍යසන සම්බන්ධයෙන් වැදගත් වන ඒවා ය. ගෝලීය උණුසුම ඉහළ යෑමෙන් ඇතිවිය හැකි අනතුරු පිළිබඳව වසර තිහකට ආසන්න කාලයක් තුළ අප විසින් ඉමහත් දැනුම් සම්භාරයක් එකතු කර ගෙන තිබේ. එහෙත් මුලින් සිතුවාට වඩා වේගයකින් ගෝලීය උණුසුම ඉහළ යෑමේ ප්‍රවණතාව මානව සංවර්ධනයට අභියෝග යක් විය හැකි බව දැන් අපි දනිමු. ගෝලීය උණුසුම ඉහළ යෑම වළක්වා ගැනීමට සැලකිය යුතු කැප කිරීමක් කිරීමටත් විශේෂයෙන් බල ශක්ති ප්‍රභවවල තීරණාත්මක වෙනසක් ඇති කිරීමටත් සිදු වනු ඇත. එහෙත් දේශපාලන දේහය මෙහෙයවනු ලබන්නේ එයට අවහිර කරන ව්‍යාපාරික බලවේග විසිනි. ඒ අනුව ගෝලීය උණුසුමේ වැඩි වීම කාර්මික යුගයට පෙර පැවති උෂ්ණත්වය ඉක්මවා උපරිම

වසයෙන් සෙන්ටිග්‍රේඩ් අංශක 02 ක සීමාව තුළ රඳවා ගැනීමට 2015 පැවති පැරිස් සමුළුවේ ඇති කරගත් එකඟත්වය ක්‍රියාත්මක කිරීම සැලකිය යුතු අභියෝගයක් වී තිබේ. ඒ අතර ඒ සම්බන්ධයෙන් දැනෙන ලෙස මැදිහත් වීමට වෘත්තීය සමිති හා වාමවාදී ව්‍යාපාර තව මත් සමත් වී නැත.

16 වැනි තිරසාර සංවර්ධන අරමුණේ සඳහන් 'යුක්තිය සාක්ෂාත් කර ගැනීම සියල්ලන්ට ම හැකි වීම' අපේ නව දේශපාලන සුසමාදර්ශයේ මුඛ්‍ය පාඨය යි. එ බැවින් තිරසාර සංවර්ධනය පිළිබඳ කතිකාව නව දේශපාලන සුසමාදර්ශයක් පිළිබඳ කතිකාවක් බවට පත් කර ගැනීමේ හැකියාව අප ගැඹුරින් විමසා බැලිය යුතු ය. නව දේශපාලන හා ආර්ථික එළඹුමක් සංකල්ප ගත කිරීමේ දී එකී තිරසාර සංවර්ධන අරමුණුවල ඇති ශක්‍යතා හා ඌනතා පිළිබඳ දැනුවත් සාකච්ඡාවක් ඉතා වැදගත් වනු ඇත. උදාහරණයක් ලෙස 'යුක්තිය සාක්ෂාත් කර ගැනීම සියල්ලන්ට ම හැකි වීම' යන ඉලක්කය යටතේ අවධානයට යොමු වී නැති කරුණු අතර වැදගත් ම කාරණයක් වන්නේ යුක්තිගරුක ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවක් පවත්වා ගෙන යෑමට අත්‍යවශ්‍ය සාධකයක් වන නිදහස්, ස්වාධීන හා බහුවිධ ජනමාධ්‍ය වාතාවරණය යි.

යුක්තිය සාක්ෂාත් කර ගැනීම සියල්ලන්ට ම හැකි වීමට නම් රටක ජනමාධ්‍ය පද්ධතිය අයිතිය සහ අන්තර්ගතය අතින් බහුවිධත්වය හා විවිධත්වය පිළිබිඹු විය යුතු ය. නිරවද්‍ය තොරතුරු සැපයීම මුල් කොට ප්‍රජාතන්ත්‍රවාදී කතිකාව පවත්වා ගෙන යෑමට දැනුවත් වේදිකාවක් වීම ජනමාධ්‍යයේ කේන්ද්‍රීය කාර්යභාරය යි. ඒ සඳහා ජනමාධ්‍ය සංලේඛ්‍ය නිදහසින් *(editorial independence)* අනූන විය යුතු අතර වෘත්තීය නිපුණත්වය අතින් ඉහළ ජනමාධ්‍යවේදීන්ගෙන් සම්ප්‍රයුක්ත විය යුතු ය. 16 වැනි තිරසාර අරමුණ සම්බන්ධයෙන් නිශ්චය කර ගෙන ඇති ඉලක්කවල එක දුර්වලකමක් වන්නේ එමඟින් මේ අවශ්‍යතාව ආමන්ත්‍රණය නො කිරීමයි. එනිසා එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් අධ්‍යාපනය හා සංනිවේදනය පිළිබඳ විශේෂඥ ආයතනය වසයෙන් සැලකෙන යුනෙස්කෝ ආයතනය

මඟින් කතිකා කොට සම්මත කර ගෙන ඇති මාධ්‍ය සංවර්ධන දර්ශක යොදා ගැනීමෙන් යුක්තිය සාක්ෂාත් කර ගැනීම සියල්ලන්ට ම හැකි වීමට දායකවන ජනමාධ්‍ය පද්ධතියක සංවර්ධන අවශ්‍යතා නිගමනය කළ හැකි ය. යුනෙස්කෝ මාධ්‍ය සංවර්ධන දර්ශක පහත දැක්වෙන අන්දමින් ප්‍රවර්ග පහකට වෙන් කර තිබේ:

- ප්‍රකාශනයේ නිදහස, මාධ්‍ය බහුවිධත්වය හා විවිධත්වය ප්‍රවර්ධනය කරන නියාමන විධිවිධාන හා නීති;
- මාධ්‍ය හිමිකාරිත්වයේ පාරදෘශ්‍යභාවය හා බහුවිධත්වය, මාධ්‍යවල ආර්ථික ශක්තිය හා සමස්ත මාධ්‍ය පද්ධතියේ බහුවිධත්වය;
- ජනමාධ්‍යය භූමිකාව ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවේ වේදිකාවක් ලෙස ඉටු වීම;
- ප්‍රකාශනයේ නිදහස, බහුවිධත්වය හා විවිධත්වය වෙනුවෙන් පෙනී සිටින ආයතනවල සහ ජනමාධ්‍යයේ වෘත්තීය ධාරිතාවය සහ ඒවා ප්‍රවර්ධනය සඳහා ලැබෙන සහයෝගය;
- නිදහස්, ස්වාධීන හා බහුවිධත් ව මාධ්‍ය පද්ධතියක් සඳහා අවශ්‍ය යටිතල පහසුකම්;

ඉහත කී මාධ්‍ය සංවර්ධන දර්ශක පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ මාධ්‍ය පද්ධති සම්බන්ධයෙන් මෙම කතුවරයාගේ උපදෙස් මත කරන ලද පුළුල් සහභාගිත්ව විමර්ශනයකට අනුව නාලක ගුණවර්ධන සංගෘහිත කළ අගැයීම් වාර්තාවක් 'ජනතාවට වග කියන මාධ්‍ය කර්මාන්තයක්: ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය හා වෘත්තිය නගා සිටවීමට සැලැස්මක්' යනුවෙන් 2016දී ප්‍රකාශයට පත් කර ඇත.[235]

දේශපාලන මට්ටමේ දී තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ සාකච්ඡා තවමත් සීමා වී ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධන වැඩසටහනට සම්බන්ධ නිලධාරීන්ට පමණි. ඒ පිළිබඳ

235 ජනතාවට වග කියන මාධ්‍ය කර්මාන්තයක් උදෙසා: ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය සහ වෘත්තිය නංවා සිටුවීමට සැලැස්මක් (2016), නාලක ගුණවර්ධන (සංස්.) ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතාව *(International Media Support), Colombo*

උනන්දුවක් දේශපාලන පක්ෂ, සිවිල් සමාජ සංවිධාන හා පොදු මහජනතාව අතර දක්නට නො ලැබේ. කොටින් ම මේ තිරසාර සංවර්ධන අරමුණු දේශපාලන ඉල්ලීම් බවට පරිවර්තනය වී නැත. එනිසා ඒවා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික නියෝජිතයා හා රජය අතර පවතින සාකච්ඡාවලට පමණක් සීමා විය හැකි ය. මේ අන්දමින් තිරසාර සංවර්ධනය පිළිබඳ සාකච්ඡාව මඟ හැර යෑමට වාමවාදීන් දක්වන තැත බොහෝ දුරට මානව අයිතිවාසිකම් ගැන වාමවාදීන් මුල දී දැක් වූ නො සැලකිල්ලට සමානය. තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධ ඉලක්ක 169 පමණට වඩා වැඩි යැ'යි කෙනෙකුට හැඟෙන්නට පුළුවන් වුවද වඩා උචිත අරමුණුවලට සහ ඉලක්කවලට වැඩි ප්‍රමුඛත්වයක් දිය හැකි ය. ඩෙන්මාර්කයේ මානව හිමිකම් කවුන්සිලය විසින් කරවන ලද ශාස්ත්‍රාලයීය විශ්ලේෂණයකට අනුව එකී ඉලක්ක 169න් ඉලක්ක 156ක්ම මානව හිමිකම් හා සම්බන්ධ ඒවා ය. කෙසේ වෙතත් සංවර්ධනය සම්බන්ධ යුක්තිය සාක්ෂාත් කර ගැනීමේ දේශීය ව්‍යාපාරවලට මෙන් ම ඒ සඳහා වඩා ඵලදායක ලෙස කලාපීය හා ගෝලීය මට්ටමේ මහජන සහයෝගිතා ව්‍යාපාරයක් ගොඩ නැගීමට ද තිරසාර සංවර්ධන අරමුණු සාකච්ඡාව පිවිසුමක් ලෙස යොදා ගත හැකි ය.

තිරසාර සංවර්ධන අරමුණු අන්තර්ගත වන වඩා පරිපූර්ණ ආර්ථික දැක්මක් ඔක්ස්ෆර්ඩ් සරසවියේ ආර්ථික විද්‍යාව ඉගැන්වූ කේට් රේවත් 2018 දී පළ කළ *Doughnut Economics* නමැති කෘතියෙන් හඳුන්වා දී තිබේ. තිරසාර සංවර්ධන අරමුණුවලට බද්ධ ව මානව හිමිකම් පාදක සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ජීවිත ප්‍රවර්තනය සඳහා අත්‍යවශ්‍ය පෘථිවි ආධාරක පද්ධතිය සමස්තයක් ලෙස ගෙන සංකල්ප ගත කර ඇති ඩෝනට් ආර්ථික එළඹුම සංවර්ධනය පිළිබඳ වඩාත් අන්තර්ග්‍රහනීය ආදර්ශයක් *(inclusive model)* යෝජනා කරයි. එය පෘථිවිය සතු සම්පත් විනාශකාරී ලෙස යොදා ගැනීමෙන් වැළකී ජීවිතය උපරිම ලෙස විඳ ගැනීමට අපට ඇති හැකියාව වර්ධනය කර ගැනීම අරමුණු කරගත් ආර්ථික එළඹුමකි. ඊළඟ පරිච්ඡේදයක දී අපි ඒ ගැන සවිස්තරාත්මක ව විමසා බලමු.

සමාජ විෂමතාව අවම කරන විකල්ප ආර්ථික ප්‍රවේශයක් ගොඩ නැගීමේ දී වැදගත් ම කාරණයක් වන්නේ එම ආර්ථික ප්‍රවේශය මඟින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන මෙහෙවර *(mission)* ගැන නිශ්චිත අවබෝධයක් ඇති කර ගැනීම යි. ආදායම් විෂමතාව අවම කළ හැකි සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම, දින හතරක වැඩ සතියක් ලබා දීම, අධ්‍යාපන අවස්ථා පිළිබඳ විෂමතාව නැති කිරීම සහ අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම වැනි කරුණු කේට් රෙවර්ත් යෝජනා කරන ඩෝනට් ආර්ථික එළඹුම තුළ ස්ථාන ගත කර ගැනීමෙන් එවැනි මෙහෙවරක් නිශ්චය කර ගැනීමට අපට හැකි වනු ඇත. ආර්ථික විද්‍යාඥ මරියානා මස්සුකාටෝ 'මෙහෙවර ආර්ථිකය' *(mission economy)* යන යෙදුම යොදා ගන්නේ ආර්ථිකය මෙහෙයවිය යුත්තේ කල් තියා එකඟ වූ සමාජ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා බව අවධාරණය කිරීමට යි. ඒ ගැන 24 වැනි පරිච්ඡේදයේ දී සවිස්තර ව සාකච්ඡා කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

# 4. නව ආර්ථික දැක්මක්

# - 21 -

# රේඛීය ආර්ථිකය වෙනුවට චක්‍රීය ආර්ථිකයක්

ආර්ථිකයේ තිරසාරත්වය හෙවත් ධරණීයතාවය *(sustainability)* සම්බන්ධයෙන් අප අද මුහුණ දෙන බොහෝ අභියෝග "රේඛීය ආර්ථිකය" යනුවෙන් හඳුන්වනු ලබන ආර්ථික කටයුතුවල අනිවාර්ය ප්‍රතිඵල නිසා උද්ගත වන ඒවා ය. මේ නිසා මෙතෙක් පැවති රේඛීය ආර්ථිකයට වඩා වෙනස් චක්‍රීය එළඹීමක් සහිත නව ආර්ථික චින්තනයක් අවශ්‍ය බව ඩෝනට් ආර්ථික එළඹුම හඳුන්වා දුන් ආර්ථික විද්‍යාඥ කේට් රේවර්ත්ගේ අදහස යි. රේවර්ත්ගේ ඒ ආර්ථික ආකෘතිය ගැන අපි පසුව විමසා බලමු. ඒ අතර එයට පූර්විකාවක් ලෙස රේඛීය ආර්ථිකයක සිට චක්‍රීය ආර්ථිකයකට මාරු වීමේ යෝජනාව විමසා බැලීම වටී. රේඛීය ආර්ථිකයක් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න පිළිබඳ දළ අදහසක් පහත දැක්වෙන සංකල්ප සටහන ඇසුරෙන් ඇති කර ගත හැකි ය.

රේඛීය ආර්ථිකය තුළ නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාවලිය පහත දැක්වෙන ආකාරයට නිරූපණය කළ හැකි ය:



'ගන්න' යනුවෙන් මෙහි දී අදහස් වන්නේ පාරිභෝගික භාණ්ඩ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යය ද ඇතුළු ව සියලු සම්පත් පෘථිවියෙන් ලබාගන්නා බව යි. හදන්න යන්නෙන් ඒවා පරිභෝජනය සඳහා නිෂ්පාදනය කිරීම ද (නිෂ්පාදනය සඳහා යොදන බලශක්තිය බොහෝ විට පෘථිවියෙන් ම ලබාගත යුතු ය), අපතේ යවන්න යන්නෙන් පරිභෝජනයෙන් පසු අපද්‍රව්‍ය වසයෙන් ඉවත දැමීම ද අදහස් කෙරේ.

රේඛීය ආර්ථිකය නිසා මෙසේ අපතේ යැවෙන විශාල අප ද්‍රව්‍ය ප්‍රමාණයක් පුලුස්සා දැමේ; නැත් නම් කුණු වසයෙන් පහත් බිම් පිරවීමට යොදා ගැනේ. මේ රේඛීය ක්‍රියාවලිය නිසා ගොඩ ගැහෙන අති මහත් අපද්‍රව්‍ය ප්‍රමාණය කළමනාකරණය කිරීම අපහසු වනවා පමණක් නො ව ඒ නිසා ඇති විය හැකි සනීපාරක්ෂක හා පාරිසරික අවදානම ද ඉමහත් ය. එපමණක් නො ව ස්වාභාවික සම්පත් නො කඩවා යොදා ගැනීම මත යැපෙන රේඛීය ආර්ථිකය නිසා පෘථිවි සම්පත් වේගයෙන් වියැකී යෑම ද සිදු වේ.

නයිජීරියාවේ ලාගෝස් නුවර අසබඩ 'ඔලුසොසුන්' කුනු කන්ද අප්‍රිකාවේ විශාලතම කුනු කන්ද යි. ලොව පුරා විවිධ පෙදෙස්වලින් ගෙනෙන ලදු ව දිනකට එයට හෙලන කුණු ප්‍රමාණය ටොන් 10,000 කට වැඩි ය. එයට එන බොහෝ කුණු ඉවත දමන කොම්පියුටර, ජංගම දුරකථන, රූපවාහිනි වැනි ඉලෙක්ට්‍රොනික අප ද්‍රව්‍යය යි. දිනෙන් දින නව නිපැයුම් මෙන් ම පවතින නිපදවුම්වල නව මාදිලි වෙළඳපොළට එන බැවින් ඒවා මිලට ගෙන පැරණි ඒවා ඉවත දැමීමට බොහෝ ඇති හැකි මිනිසුන් පුරුදු වී ඇත. එනිසා අප ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට ගෝලීය මට්ටමින් ඇති ව තිබෙන අභියෝගය සුලු පටු නො වේ. රේඛීය ආර්ථිකය මඟින් අපතේ යවන ප්ලාස්ටික් ප්‍රමාණය ද අති විශාල ය. වසර 2018 දී අපද්‍රව්‍ය වසයෙන් ගෝලීය පරිසරයට එක් වූ ප්ලාස්ටික් ප්‍රමාණය දළ වසයෙන් ටොන් මිලියන 348 ක් බවත් 2010 සිට එකතු කළ දත්තවලට අනුව එම ප්‍රමාණයෙන් ටොන් මිලියන 4.7 සිට 12.7 දක්වා ප්‍රමාණයක් වාර්ෂිකව සාගර දූෂණයට

දායක වන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය 2021 දී පළ කළ දෙවැනි ලෝක සාගර ඇගයුම් වාර්තාවේ සඳහන් කරයි.[236]

එහෙත් දිගු කලක් තිස්සේ සාම්ප්‍රදායික ආර්ථික න්‍යායවලින් ප්‍රකාශ කළ පරිදි පිරිසිදු පරිසරයක් යනු ධනයෙන් ආඪ්‍ය ඇති හැකි අයට පමණක් භුක්ති විඳිය හැකි සුඛෝපභෝගී පහසු කමකි. දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ අදහස හඳුන්වා දුන් ආර්ථික විද්‍යාඥ කුස්නෙට් ඔහුගේ චිර ප්‍රසිද්ධ පාරිසරික කවය *(Environmental Kuznets Curve)* මඟින් නිරූපණය කළ පරිදි ආර්ථික වර්ධනය සිදු වන විට පරිසරය යහපත් වීමට පෙර කොහොමටත් පරිසර දූෂණය ඉහළ යෑම අනිවාර්ය වේ. ඒ මතයට අනුව පරිසරය නැවත යථාතත්වයට පත් වන්නේ ආර්ථිකය වර්ධනය වී රට සශ්‍රීක වූ පසුව ය.




236 The Second World Ocean Assessment: Vol. II (2021), United Nations Publications, New York, p. 123

එහෙත් කුස්නෙට් යෝජනා කළ ඒ පරිසර දූෂණ න්‍යාය ප්‍රායෝගික වසයෙන් ආදේශ වන්නක් නො වේ. මන්ද, පරිසර දූෂණයට මෙන් ම පරිසර හායනයට හෙවත් නාස්තියට ද හේතු වන්නේ ආර්ථික වර්ධනය නො ව භාණ්ඩ නිෂ්පාදනය සඳහා උපයෝගී කර ගන්නා පරිහානි දායක කාර්මික නිෂ්පාදන රටාව යි *(degenerative industrial design)*. එනිසා විසි එක්වැනි සියවසට අවශ්‍ය වන්නේ නාස්තිකාර රේඛීය ආර්ථිකයක් නො ව ප්‍රතිජනනීය රටාවක් *(regenerative design)* පාදක කරගත් ආර්ථික චින්තනයකින් මෙහෙයවෙන චක්‍රීය ආර්ථිකයකි. එම ආර්ථික චින්තනය මනුෂ්‍යයන් හෝමෝ එකොනොමිකස් ලෙස නො ව මහ පොළොවේ චක්‍රීය ජීවන කාර්යාවලිවල පූර්ණ හා අවියෝජනීය කොටස්කරුවන් ලෙස ප්‍රතිස්ථාපනය කළ යුතු ය.

ආර්ථික වර්ධනය ඉහළ යන විට ඉහළ යන පරිසර දූෂණය පසුව සමනය වෙතැ'යි යන ඇදහිල්ල ඉන්දියාවට ආදේශ කළ ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ පරිසර ආර්ථික විද්‍යාඥයෙකු වන මුතුකුමාර මානි "ගත වූ වසර ගණනාව තුළ ආර්ථික වසයෙන් ඉන්දියාව විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති නමුත් පරිසරය සම්බන්ධයෙන් නම් ඒ බවක් නො පෙන්වයි. දැන් වර්ධනයට ඉඩ දී පසුව පිරිසිදු කරමු යන්න ඇත්ත වසයෙන් ම සිදු වන දෙයක් නො වේ."[237] යනුවෙන් සඳහන් කරයි.

ආර්ථික වර්ධනය සමඟ ඉහළ යන පරිසර දූෂණය රට සශ්‍රීක විමෙන් පසු සමනය වෙතැ'යි යන කුස්නෙට්ගේ මතය උත්කර්ෂණයට නංවමින් ඇතැම් ආර්ථික විද්‍යාඥයෝ හා දේශපාලකයෝ අපරීක්ෂාකාරී ආර්ථික ප්‍රතිපත්ති නිසා පස, සාගර, පරිසර පද්ධති, ජෛව විවිධත්වය, දේශගුණය යනාදිය කෙරෙහි ඇතිවෙන අහිතකර බල පෑම පිළිබඳ පරිසරවේදීන්ගේ විවේචන හුදෙක් අනවශ්‍ය ලෙස බියවැද්දීම සඳහා කරන ඒවා යැයි ගැරහීමට

237 Mallet, V. (2013) 'Environmental damage costs India $80bn a year', Financial Times 17 July 2013, http://www.ft.com/cms/s/0/0a89f3a8-eeca-11e2-98dd-00144feabdc0.html#axzz3qz7R0UIf

ලක් කළහ. එහෙත් ඒ සමඟම කුස්නෙට් කවය මඟින් පෙන්නුම් කරන අන්දමට වර්ධනයෙන් පසු ඇතිවෙන සශ්‍රීකත්වය මඟින් පරිසරය නැවත පිරිසිදු කරනු ඇතැ'යි යන උපකල්පනය දත්ත මඟින් තහවුරු කළ නො හැකි බව ද ඔවුහු පිළිගත්හ. එනිසා ඔවුන් එයට නිදහසට තර්ක තුනක් ඉදිරිපත් කළහ. පළමුවැනි තර්කය වූයේ රටක ආර්ථික වර්ධනය වැඩිවන විට එහි රට වැසියන් යහපත් පාරිසරික ප්‍රමිති ඉල්ලා සිටින බවයි. දෙවැන්න ආර්ථික වර්ධනයෙන් ලැබෙන ප්‍රතිලාභ නිසා සිය කර්මාන්ත සඳහා දූෂණ නිවාරක තාක්ෂණය යොදා ගැනීමට කර්මාන්ත හිමියන්ට ඉඩ ලැබේ. තෙවනුව වර්ධනය වන ආර්ථිකයක පදනම නිෂ්පාදන කර්මාන්තවල සිට සේවා සැපයීමකට පරිවර්තනය වීමේ ප්‍රවණතාව වැඩිය. ඒ අනුව දුම් දමන කම්හල් වෙනුවට වැඩි වැඩියෙන් 'කෝල් සෙන්ටර්' වැනි සේවා සැපයුම් ස්ථාන ඇතිවිය හැකි ය.

බැලූ බැල්මට ම මේ තර්ක ප්‍රබල යැයි පෙනුන ද කුස්නෙට් කවය අනුව ම දූෂණයේ සිට පරිසරය දූෂණ නිවාරණය කරා ගමන් කිරීමට වර්ධනය වන ආර්ථිකය හේතු වනු ඇතැ'යි යන්න තහවුරු වන ප්‍රබල සාක්ෂි නැත. පළමු කොට වඩා යහපත් පරිසර ප්‍රමිති ඉල්ලා සිටීමට රට වැසියන් දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඉහළ යන තෙක් බලා සිටීම අවශ්‍ය නො වේ. කේට් රේවත් උපුටා දක්වන පරිදි  මරියානෝ ටෝරාස් සහ ජේම්ස් කේ බොයිස් විසින් රටවල් ගණනක් සම්බන්ධයෙන් කළ සමීක්ෂණයකට අනුව ආදායම සැලකිය යුතු ලෙස බෙදී යෑමත්, ඉහළ සාක්ෂරතාවත් සමඟ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්වලට ගරු කිරීමත් යන කරුණු සම්බන්ධ ව ඉහළ අගයක් ඇති නම් අඩු ආදායම් සහිත රටවල පවා පරිසරයේ ගුණාත්මක බව ඉහළ මට්ටමක තිබූ බව තහවුරු විය.[238] ඒ අනුව වාතයේ සහ ජලයේ ගුණාත්මක බව තීරණය කරන්නේ ආර්ථිකය විසින් නො ව පරිසරය සුරැකීම වෙනුවෙන් පෙනී සිටින මහජන මතය කොතෙක් ශක්තිමත් ද නැද්ද යන කාරණය මත ය. එමෙන් ම

238 Torras .M and Boyce J.K. (1998) Income, inequality, and pollution: a reassessment of the environmental Kuznets Curve in Ecological Economics Vol 25, issue 2 pp. 147-160

කර්මාන්ත හිමියන් හා නිෂ්පාදන සමාගම් පරිසර හිතකාමී තාක්ෂණය යොදා ගන්නේ හුදෙක් ඔවුන්ගේ ආදායම වැඩි වීම නිසා නො ව පරිසර හිතකාමී නියාමන ක්‍රම හා රෙගුලාසි ඉල්ලා මහජනයා විසින් රජයට සහ කර්මාන්ත හිමියන්ට කරන අඛණ්ඩ බලපෑම නිසා ය. තෙවනු ව දූෂණ කාරක කර්මාන්ත වෙනුවට ආර්ථිකය සේවා සැපයීමට පරිවර්තනය වීමේ ප්‍රවණතාව සම්බන්ධයෙන් කිව යුත්තේ ඇත්තටම මේ පරිවර්තනය සිදු වන්නේ සිය රටේ මහජන මතය, පාරිසරික රෙගුලාසි සහ වැඩි වැටුප්වලින් ගැලවීම සඳහා නිෂ්පාදන සමාගම් තම කර්මාන්ත ශාලා ගලවා ගෙන ගොස් වඩා ලාභදායක රටවල පිහිටුවීම නිසා බව යි. ඒ නිසා කුස්නෙට්ස් කවයට අනුව ආර්ථික වර්ධනය වැඩි වී සශ්‍රීක වූ පසු හැම රටක ම පරිසර දූෂණය අඩු වුවහොත් කර්මාන්ත හිමියන්ට දූෂණ කාරක කර්මාන්ත ශාලා විතැන් කිරීමට හැකි වෙනත් රටක් ඉතිරි විය නො හැකි ය. එහෙත් එය එසේ නො වන බව අපි දනිමු.

1990 සිට 2007 දක්වා ඉහළ ආදායම් ලබන රටවල වර්ධන වේගය ඉහළ ගිය විට ඒ සඳහා වැය කළ යුතු ද්‍රව්‍යය සම්භාරය නිරූපණය වන ද්‍රව්‍යයමය පා සටහන *(material footprint)* ද සුලු ප්‍රමාණයකින් නො ව සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේ ය. ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය, නවසීලන්තය යන රටවල එම ඉහළ යෑම 30%ක් වූ අතර ස්පාඤ්ඤය, පෘතුගාලය හා නෙදර්ලන්තය යන රටවල එය 50% කින් ඉහළ ගියේ ය. වැඩිවන වර්ධනයත් සමඟ ඉහළ ගොස් නැවත පහළට එතැ'යි උපකල්පනය කළ කුස්නෙට්ස් පරිසර කවයේ පොරොන්දුව කෙසේ වෙතත් දත්ත අනුව අපට ඇත්තට ම අත්දකින්නට ලැබෙන්නේ ද්‍රව්‍යයමය පා සටහනට අනුරූප ව පාරිසරික පා සටහන ද විපත්තිකාරි ලෙස තව තවත් ඉහළට යන බව යි. උදාහරණයක් ලෙස ගෝලීය ඒක පුද්ගල පාරිසරික පා සටහන *gha* ඒකක හෙවත් ගෝලීය හෙක්ටෙයාර් 1.7ක් වන නමුත් යුරෝපා සංගමයට අයිති රටවල පමණක් ඒක පුද්ගල පාරිසරික පා සටහන ගෝලීය හෙක්ටෙයාර් 4.7 කි. මේ දත්තවලට අනුව දියුණු

රටවලට අනුරූප ව දියුණු වෙන රටවල ද්‍රව්‍යයමය පා සටහන සලකුණු කළ යුතු වුවහොත් අවශ්‍ය වන ස්වාභාවික සම්පත් ප්‍රමාණය සැපයීමට තවත් පෘථිවි තුනක් වත් තිබිය යුතු ය. අධිපරිභෝජනය සම්බන්ධයෙන් පවතින විෂමතාව ද එවැනි ය. උදාහරණයක් ලෙස සත්ව ප්‍රෝටීන වර්ග අනුභව කිරීමේ දී යුරෝපීයයෝ පෝෂණ උපදේශවල නිර්දේශිත ප්‍රමාණයට වඩා 70% ක් වැඩියෙන් ප්‍රෝටීන් පරිභෝජනය කරති. ඒ අතර ගෝලීය උණුසුමට තුඩු දෙන හරිතාගාර වායු ප්‍රමාණයෙන් 14.3% ක් නිපදවෙන්නේ මේ සත්ව ප්‍රෝටීන සැපයෙන පශු කර්මාන්තයෙනි.[239]

ඒ නිසා ජාතික නිෂ්පාදනයේ වර්ධනය ඉහළ ගිය පසු පරිසරය වැඩි දියුණු වෙතැ'යි කියවෙන ආර්ථික පුරසාරම් ඉවත දැමීමට දැන් කල් පැමිණ තිබේ. ආර්ථික විද්‍යාව යනු ලෝක ස්වභාවය පිළිබඳ නියාම සොයා ගැනීමේ කලාවක් නො වේ. මෙතැන මූලික වැරැද්ද ඇත්තේ දෝෂ සහගත කාර්මික නිපදවුම් රටාවේ ය. ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කරගත් පසුව ද පොහොසත් රටවල කෙරෙන කටයුතුවලින් ගෝලීය පරිසරයට දැවැන්ත පීඩනයක් එල්ල කර තිබේ. ඊට හේතුව පසුගිය වසර 200 තිස්සේ එම රටවල ක්‍රියාත්මක වූ සියලු කාර්මික නිෂ්පාදන කටයුතු ආවේණික ව ම පරිහානි දායක රටාවකින් යුත් රේඛීය කාර්මික නිෂ්පාදන විධික්‍රමයක් මත පදනම් වූ බැවිනි. එම කාර්මික විධික්‍රමයේ පිළිවෙත වුණේ ගන්න, හදන්න, භාවිත කරන්න, අපතේ දමන්න යන්න යි. එම රේඛීය ක්‍රියා පටිපාටියට අනුව සිදු වන්නේ මහ පොළොවේ ඛනිජ ද්‍රව්‍ය, ජෛව ස්කන්ධ සහ ෆොසිල ඉන්ධන උද්ධරණය කොට උපයෝගී කොට නිෂ්පාදිත නිමි භාණ්ඩ වැඩි කල් නො යවා ඉවත වීසි කර දැමීමට පාරිභෝගිකයන් අතට පත් කිරීම යි. සරල රූපයකින් නිරූපණය කරන්නේ නම් මෙම රේඛීය නිෂ්පාදන ක්‍රමය හරියට එක් පැත්තකින් නොකඩවා වියරුවෙන් මෙන් බුදින අනික් පැත්තෙන් නොකඩවා අපද්‍රව්‍ය පිට කරන දැවැන්ත දළඹුවෙකු වැනිය.

239 Fath. B (eds) 2019, Encyclopedia of Ecology, Elsevier

ලොව පුරා පැතිර ඇති මේ පරිහානිදායක කාර්මික නිෂ්පාදන විධික්‍රමය බොහෝ ව්‍යාපාර ලාභයෙන් පිනවා ඇති අතර කාලාන්තරයක් තිස්සේ රටවල් ගණනාවක් මූල්‍යමය වසයෙන් පොහොසත් කර තිබේ. එහෙත් එහි සැලැස්ම මූලික වසයෙන් ම දෝෂ සහගත ය. මන්ද එය ක්‍රියා කරන්නේ කාබන්, ඔක්සිජන්, ජලය, නයිට්‍රජන් සහ පොස්ෆරස් වැනි ජීවයේ තැනිලි කැට *(building blocks)* නො කඩවා ප්‍රතිචක්‍රීකරණය *(recycling)* කිරීමෙන් වැජඹෙන ස්වාභාවික ජීව ලෝකයට එදිරි ව ය. පෘථිවි සම්පත් හිස් කරමින් දැවැන්ත අපද්‍රව්‍ය ප්‍රමාණයක් නිපදවමින් පරිසරය දූෂණය කරන රේඛීය කාර්මික නිෂ්පාදන විධික්‍රමය විසින් මේ ස්වාභාවික ප්‍රතිචක්‍රීකරණ චක්‍රය බිඳ දමනු ලැබ තිබේ. පොළොවෙන් සහ මුහුදින් ඛනිජ තෙල්, ගල් අඟුරු සහ ගෑස් උද්ධරණය කොට දවා ලමින් වායුගෝලයට නිකුත් වන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි කරමින් ගෝලීය උණුසුම ඉහළ නැංවීමට හේතු වන්නේ මේ රේඛීය නිෂ්පාදන විධික්‍රමය යි. එමෙන් ම නයිට්‍රජන් සහ පොස්ෆරස් රසායනික පොහොර බවට හරවමින් එම කෘෂි රසායනික අප ද්‍රව්‍ය පිටාරය සාගර සහ ජලාශවලට මුසු කරමින් පාරිසරික පද්ධතිවලට කරන විනාශය සුලු පටු නැත. පාරිභෝගික භාණ්ඩ බවට හරවා භාවිතයෙන් පසු කසල කඳුවල ගොඩ ගැහෙන සහ ජලයට, වාතයට හා පසට වස විස ලෙස එක් වන ලෝහ සහ ඛනිජ වර්ග නිස්සාරණය සඳහා වනාන්තර මුලින් උදුරමින් කටයුතු කරන මේ රේඛීය ආර්ථික නිෂ්පාදන රටාව දිගින් දිගටම පවත්වා ගෙන යා හැකි දෙයක් නො වේ.

රේඛීය ආර්ථිකයේ ඇති සෘණ බාහිරතා *(negative externalities)* ලෙස හඳුන්වන මේ පරිහානිදායක ඵල විපාකවල අනතුර ආර්ථික න්‍යාය විසින් පිළිගෙන තිබේ. එය ආමන්ත්‍රණය කිරීම සඳහා ආර්ථික විද්‍යාඥයන් වැඩි කැමැත්තක් දක්වන්නේ කෝටා සහ බදු වැනි වෙළඳපොළ මෙවලම් යොදා ගැනීමට යි. ඒ අනුව විසඳුම් අතර මූලික වන්නේ පරිසර දූෂණය සඳහා දායක විය හැකි උපරිම සීමාවක් නියම කිරීම සහ පරිසර දූෂණ අයිතිය වෙළඳ පොළේ විකිණීමට සැලසීම

වැනි විසඳුම් ය. තවත් යෝජනාවක් වන්නේ පරිසර දූෂණයේ සමාජ බරපැනට සමාන අගයකට සරිලන ලෙස බදු අය කිරීමක් කොට කොයි තරම් පරිසර දූෂණයක් ඇති කිරීමට ඉඩ ලැබෙන්නේ ද යන කාරණය වෙළඳපොළ හරහා විසඳා ගැනීමයි.

**පරිහානිදායක කාර්මික සැලසුම් රටාව**
*Degenerative industrial design*
කේට් රේවර්ත්ට අනුව




ඇත්ත වසයෙන් ම එයින් ඇතැම් විසඳුම් මඟින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගත් අවස්ථා ද තිබේ. උදාහරණයක් ලෙස 1999 සිට 2003 දක්වා කාලය තුළ ජර්මනිය ප්‍රවාහනය, නිවෙස් උණුසුම් කිරීම සහ විදුලිය ජනනය කිරීම සඳහා යොදා ගන්නා ඛනිජ තෙල් සඳහා විශේෂ පරිසර බද්දක් නියම කොට ඊට සමාන බදු ප්‍රමාණයක් වේතන බදු සහන වසයෙන් පාරිභෝගිකයන්ට ලබා

දුන්නේ ය. ඒ අනුව තමන් ගෙදර ගෙන යන වැටුප වැඩි වූ නමුත් ෆොසිල ඉන්ධන සඳහා වැඩියෙන් මුදල් ගෙවීමට පාරිභෝගිකයන්ට සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ අරපරිස්සමින් ඉන්ධන භාවිත කිරීමට පාරිභෝගිකයන් පෙලඹීමයි. ඒ නිසා ඉන්ධන භාවිතය 17% කින් අඩු වූ අතර ඒ අනුව වාතයට මුසු වන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය ද 3%කින් අඩු කර ගැනීමට හැකි විය. ඒ හැර පුද්ගලික වාහන හවුලේ ප්‍රවාහනය සඳහා යොදා ගැනීම 70% කින් ද වැඩි වූ අතර අමතර රැකියා අවස්ථා 250,000ක් බිහි කිරීමට ද එම විසඳුමට හැකි විය.[240] ජලය හා විදුලි බලය සඳහා මසකට අවශ්‍ය කරන අවමය ඉක්මවා භාවිත කරන ජලය සඳහා ඒකක ගාස්තුව වැඩි කිරීම ද මේ හා සමාන විසඳුමකි. දකුණු අප්‍රිකාවේ ඩර්බන් නගර සභාව ජීවිතය සඳහා අත්‍යවශ්‍ය ජලය ලබා ගැනීම පුරවැසියන්ගේ ව්‍යවස්ථාදායක අයිතියක් ලෙස සලක යි. එබැවින් අඩු ආදායම් ලබන පවුල්වලට සැපයෙන ජලය සම්බන්ධයෙන් නිශ්චිත මාසික කෝටාවක් නියම කොට ඒ සඳහා ගාස්තුවක් අය නො කරන නමුත් එම කෝටාව ඉක්මවා ගිය විට ගාස්තු අය කෙරේ.

එහෙත් බදු අය කිරීම සහ කෝටා ක්‍රමය මඟින් ම රේඛීය ආර්ථිකය විසින් පෘථිවි පරිසරයට එල්ල කර ඇති පීඩනය අවම කළ හැකි යැයි සිතිය නො හැකි ය. ප්‍රායෝගික ව බැලුවොත් එකී විසඳුම් අප මුහුණ දී ඇති හරිතාගාර වායු ජනක පාරිසරික අභියෝගවලට මුහුණ දීමට ප්‍රමාණවත් ඒවා නො වේ. අනෙක් අතට බදු අඩු කිරීම සහ කෝටා වැඩි කිරීම සම්බන්ධයෙන් සමාගම් විසින් කරනු ලබන බලපෑම්වලට කන්දීමට ආණ්ඩුවලට බොහෝ විට සිදු වේ. මැතිවරණ කටයුතු සඳහා මේ සමාගම්වලින් සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් ලැබෙන බැවින් සමාගම්වල ඉල්ලීම් නො තකා හැරීමට දේශපාලනඥයන්ට අසීරු ය.

240 "Heinrich Böll Foundation (2012) 'Energy transition: environmental taxation', available at: http://energytransition.de/2012/10/environmental-taxation/" – Retrieved on 17 July 2021

එනිසා ඇත්ත වසයෙන් ම අවශ්‍ය ව ඇත්තේ රේඛීය ආර්ථික ක්‍රමය අනුව සැකසුණ පැරණි කාර්මික නිෂ්පාදන පිළිවෙත වෙනුවට ප්‍රතිචක්‍රීකරණය *(recycling)* මුල් කරගත් නව චක්‍රීය නිෂ්පාදන පිළිවෙතක් හඳුන්වා දීම යි. ගෝලීය උණුසුම පිළිබඳ සංශයවාදීන්ගේ නො මඟ යැවීම් මැද වුව ද එම පිළිවෙත දැන් ගොඩ නැගෙමින් තිබේ. ව්‍යාපාර ලෝකයේ ඇතැම් උදාහරණවලින් ඒ බව පෙනී යන බව කේට් රේවර්ත් සඳහන් කරයි. ගෝලීය උණුසුම වැඩි වීම සහ භූගත ජලය අඩු වීම නිසා කපු, කෝපි, මිදි සහ සේද සම්බන්ධ සැපයුම් දාම අඩපණ වී යෑමේ තර්ජනය ගැන එම කර්මාන්තවලින් යැපීමට හා ලාභ ලැබීමට බලාපොරොත්තුවන ව්‍යාපාරිකයෝ කනස්සල්ලට පත් වෙමින් සිටිති.

ඒ නිසා ගෝලීය උණුසුම ඉහළ යෑම වළකන ක්‍රියාකාරකම්වලට දායකත්වය සැපයීමට ඇතැම් ව්‍යාපාරිකයෝ සූදානම් ය. ගෝලීය උණුසුම වැඩි වීමට තුඩු දෙන හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සහ අරපරිස්සම් ජල භාවිතය පිළිබඳ තාක්ෂණික විසඳුම් යොදා ගැනීම මඟින් තම ලාභය වැඩි කර ගැනීමට හැකි බව ද ඇතැම් ව්‍යාපාරිකයන් මෙන් ම ආයෝජකයන් ද වටහා ගෙන තිබේ. උදාහරණයක් ලෙස උග්‍ර භූගත ජල හිඟයකට මුහුණ දී ඇති මෙක්සිකෝවේ ජැලිස්කෝ නගරයේ පිහිටි නෙස්ලේ සමාගමේ කිරි කර්මාන්ත ශාලාව එයට අවශ්‍ය ජලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ලබා ගන්නේ කිරි රත් කිරීමේ දී නිකුත් වන ජල වාෂ්ප ඝනීභවනය කිරීමෙනි. එමෙන් ම, ගෝලීය උණුසුම ඉහළ නැංවීමට දායක වන පරිභෝජන භාණ්ඩ තමන් අතින් නිෂ්පාදනය නො වන බවට සහතිකයක් දීම පාරිභෝගික විශ්වාසය දිනා ගැනීම සහ සන්නාම ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමෝපායක් ලෙස සැලකීමට ද ඇතැම් ව්‍යාපාරිකයෝ උත්සාහ කරති.

ගෝලීය උණුසුම ඉහළ යෑමේ ප්‍රමුඛතම හේතුව මානව ක්‍රියාකාරකම් නිසා වායුගෝලයට එක් වන කාබන් ඩයොක්සයිඩ් සහ මීතේන් වැනි හරිතාගාර වායු ප්‍රමාණය *(Greenhouse Gas)* ඉහළ

යැමයි. ඉන් වැඩි කොටසක් අප භාවිත කරන ඛනිජ තෙල්, ගල් අඟුරු සහ ගෑස් වැනි ෆොසිල ඉන්ධන නිසා වාතයට විමෝචනය වෙන හරිතාගාර වායුව යි. එක් එක් රටක් විසින් වායුගෝලයට එක් කරනු ලබන හරිතාගාර වායු ප්‍රමාණයට සමාන හරිතාගාර වායු ප්‍රමාණයක් වායුගෝලයෙන් ඉවත් කිරීමේ වකවානුව ඉලක්කයක් ලෙස ප්‍රකාශ කිරීම *Net-Zero Goal (*ශුද්ධ ශූන්‍යය ඉලක්කය) යනුවෙන් හැඳින්වේ. එය ඉටු කර ගැනීමට නම් හරිතාගාර වායු නිකුත් කිරීමට දායක වන ෆොසිල ඉන්ධන භාවිතය අනුක්‍රමයෙන් අඩු කිරීම, කාබන් ඩයොක්සයිඩ් වායුව අවශෝෂණය කිරීම පිණිස වනගහනය හා ශාක ප්‍රමාණය වැඩි කිරීම, හරිතාගාර වායු නිකුත් නො වන පුනර්ජනනීය බලශක්තිය වැඩි වැඩියෙන් භාවිත කිරීම, ස්වාභාවික සම්පත් අපතේ යවන රේඛීය නිෂ්පාදන - පරිභෝජන ක්‍රමය පරිසර හිතකාමී ප්‍රතිචක්‍රීය නිෂ්පාදන-පරිභෝජන ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම වැනි කටයුතු රැසක් සැලසුම් කළ යුතු ය.

ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ හා දේශපාලනඥයන් ඒ සම්බන්ධ කෙබඳු ඉදිරි දැක්මක් තමන්ට ඇත් දැයි මහජනයාට විස්තර කර දී නැත. දැනටමත් ස්වාභාවික ව්‍යසන නිසා ලංකාවේ ආර්ථිකයට සාමාන්‍යයෙන් වසරකට ඩොලර් මිලියන 330 ක අලාභයක් සිදු වන බව ලෝක බැංකුව පවසයි. 2020 *German Watch* වාර්තාවට අනුව දේශගුණ විපර්යාසය නිසා ඇති විය හැකි අනතුරුවල අවදානමට ලක් වීමට ඇති ප්‍රවණතාව අතින් ලංකාව සිටින්නේ හය වැනි ස්ථානයේ ය. 2020 *UNEP* වාර්තාවට අනුව රටවල් 126ක් මේ වන විට *Net-Zero* ඉලක්කය ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව ලංකාව ද ඇතුළු බොහෝ රටවල් තම *Net Zero* ඉලක්කවලට ළඟා වීමට බලාපොරොත්තු වන්නේ 2050 දී පමණ මේ සිය වස මැද භාගයේ දී ය. එහෙත් 2021 පිට කළ *IPCC* වාර්තාවේ නිගමන අනුව එම ඉලක්කය ප්‍රමාණවත් වේයැ'යි සැක සහිත ය.

ගෝලීය උණුසුම ඉහළ යැමට මූලික හේතුව රේඛීය ආර්ථික ක්‍රමය තුළ මිනිස් ක්‍රියාකාරකම් නිසා වායුගෝලයට එක් වන කාබන්

ඩයොක්සයිඩ් වැනි හරිතාගාර වායු ප්‍රමාණය වැඩි වීමයි. එහෙත් ඒ අතර කොතරම් කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයක් වාතයට මුසු කිරීමට අපට හැකි වේද කොතරම් භූගත ජල ලීටර ප්‍රමාණයක් අපට උකහා ගැනීමට ඉඩ ලැබේ ද වැනි ප්‍රශ්න අසන කිසියම් පමණකට හෝ පරිසර දූෂණකාරක කටයුතු කිරීම සිය අයිතියක් බව ද සිතන ව්‍යාපාරිකයෝ ද කොතෙකුත් වෙති. ඉනුත් ඔබ්බට ගොස් තවත් අය පාරිසරික නියාමන විධිවිධාන රුවටිය හැකි ක්‍රම යොදා ගැනීමට ද පසුබට නො වෙති. එයට උදාහරණයක් ලෙස සිය කර්මාන්ත ශාලාවලින් නිකුත් වන ඩීසල් වාහන පරීක්ෂක අවස්ථාවෙ දී අඩු කාබන් විමෝචනයක් පෙන්නුම් කරන ආකාරයට වාහන මෘදුකාංග වෙනස් කිරීමේ චෝදනාවට වොක්ස්වැගන් මෝටර් රථ සමාගම 2015 දී වරදකරු වීම පෙන්වා දිය හැකි ය.

කෙසේ වෙතත් රේඛීය ආර්ථිකය චක්‍රීය ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා ව්‍යවසායක චින්තනය පිළිබඳ මූල ධාර්මික වෙනසක් ඇති කිරීමට සිදු වෙයි. එම වෙනස හුදෙක් මිනිසා යනු ස්වාර්ථය ම සලකන ආර්ථික සත්වයෙක් ය යන පදනමෙන් කළ නො හැකි ය. ඒ වෙනුවට නිෂ්පාදක පාරිභෝගික යන දෙකොට්ඨාසයේ ම තිරසාර පැවැත්ම ස්වාභාවික සම්පත්වල තිරසාර පැවැත්ම හා සහසම්බන්ධ වී ඇති බව අප වටහා ගත යුතු ය. එබැවින් නිෂ්පාදන කාර්යයේ දී ස්වාභාවික සම්පත් අපතේ යැවීම වෙනුවට ප්‍රතිචක්‍රීකරණය මඟින් හැකි තරම් ඒවා ආපසු ස්වභාවධර්මයට ම ලබා දීම නිෂ්පාදන සමාගම්වල සමාජ වගකීම බවට පත් කළ යුතු ය. ඒ සඳහා ඉල්ලීම් කිරීමට පාරිභෝගිකයන් පෙලඹවිය යුතු අතර ප්‍රතිචක්‍රීය නිෂ්පාදන ක්‍රියාවලියක් මඟින් නිපදවෙන පරිසර හිතකාමී භාණ්ඩ අලෙවිය ප්‍රවර්ධනය කිරීමට භාවිතයෙන් ම සහභාගී වන ලෙස පාරිභෝගිකයන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. එවැනි වැඩපිළිවෙළක ප්‍රතිඵලය විය යුත්තේ ස්වභාව ධර්මයේ චක්‍රීය පැවැත්ම හා බද්ධ වන පුනර්ජනනීය නිෂ්පාදන විධික්‍රම අනුගමනය කිරීමට ව්‍යවසායකයින් දිරි ගැන්වීම යි.

ඒ සඳහා කාබන් විමෝචනය අවම කිරීම දිරි ගැන්වෙන ප්‍රතිපත්ති ලෙස කාර්මික නිෂ්පාදනයේ දී විමෝචනය වන කාබන් සඳහා මිලක් නියම කිරීම, ආදායම් බදු වෙනුවට නිෂ්පාදන ක්‍රියාවලියේ දී විමෝචනය වන කාබන් ප්‍රමාණය අනුව කාර්මික ක්ෂේත්‍රයේ බදු අය කිරීම සහ කාබන් සඳහා බදු ගෙවීමේ වගකීම සාමාන්‍ය පුරවැසියාගේ සිට පරිසර දූෂකයාට පැවරීම වැනි දෑ කළ හැකි ය. ඒ හැර ආර්ථික හා පිස්කල් ප්‍රතිපත්ති සැකසීමේ දී හා තීරණ ගැනීමේ දී කාබන් විමෝචනය අවම කරන කාබන් උදාසීන *(carbon neutral)* පිළිවෙතක් අනුගමනය කිරීම, හරිත ආර්ථිකයක් දිරිමත් කරන අනුවර්තනයන්ට සහ ධරණීය බවට මුල් තැනක් ලැබෙන නිපැයුම් කටයුතු දිරි ගැන්වීම කළ යුතු ය. ඒ හැර සියලු පෞද්ගලික හා රාජ්‍ය ආයෝජන තිරසාර සංවර්ධන අරමුණු සහ ආර්ථිකය නිර්කාබනය *(decarbonize)* කිරීමේ ශුද්ධ ශුන්‍ය ඉලක්කවලට *(net zero goal)* දායක වන ආකාරයට මෙහෙය විය යුතු ය. බහුපාර්ශවික, කලාපීය සහ ජාතික මට්ටමේ අනුග්‍රහය සහ ආධාර ලබන සංවර්ධන වැඩසටහන් මෙන් ම රාජ්‍ය හා පෞද්ගලික බැංකු ව්‍යාපාර ණය ද නිකුත් කළ යුත්තේ එම ව්‍යාපාර ආර්ථිකය විකාබනය කිරීමට දායක වන්නේ නම් පමණි. කොටින් ම ව්‍යාපාර ණය ලබා දිය යුත්තේ රේඛීය නිෂ්පාදන ක්‍රම වෙනුවට චක්‍රීය නිෂ්පාදන හා පරිභෝජන ක්‍රම හඳුන්වා දීම සඳහා ය.

පරිහානිදායක නිෂ්පාදන සැලැස්මක් පුනර්ජනනීය නිෂ්පාදන සැලැස්මක් බවට රූපාන්තරණය කළ හැක්කේ චක්‍රීය ආර්ථිකයක් තුළ ය. ස්වරූපයෙන් ම චක්‍රීය ආර්ථිකයක් පුනර්ජනනීය වන්නේ එහි මූලික නිෂ්පාදන විධික්‍රමය ශාකවල සිදු වන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියට අනුරූප ව හුදෙක් පුනර්ජනනීය බලශක්තිය යෙදා ගැනීම මඟින් ද්‍රව්‍යාත්මක දේවල් ප්‍රයෝජනවත් භාණ්ඩ හා සේවා බවට පත් කිරීම නිසා ය. ස්වභාව ධර්මයේ විශාලතම නිෂ්පාදන ක්‍රියාවලිය හැඳින්වෙන්නේ ප්‍රභාසංස්ලේෂණය *(photosynthesis)* යනුවෙන් ශාක පත්‍රවල සිදු වන ක්‍රියාදාමය යි. ඉන් සිදු කරන්නේ ශාක පත්‍ර තුළ ජලය සහ කාබන් ඩයොක්සයිඩ් සංශ්ලේෂණය කිරීම මඟින් සූර්ය

බල ශක්තිය ශාකවලට අත්‍යවශ්‍ය රසායනික ශක්තිය බවට හැරවීම යි. එම ක්‍රියාවලිය තුළ අපද්‍රව්‍ය වසයෙන් නිපදවන ඔක්සිජන් අප ද ඇතුළු අවශේෂ ජීවීන්ගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යය. අනෙක් අතට එම ජීවීන් විසින් ප්‍රභාසංස්ලේෂණය නිසා ලබා ගෙන ආශ්වාස කරන ඔක්සිජන් නැවත පිට කරන්නේ ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය කාබන් ඩයොක්සයිඩ් ලෙසිනි. ප්‍රභාසංස්ලේෂණය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියක් යැයි කියන්නේ එබැවිනි. එය තුළ අපතේ යෑමක් සිදු නො වේ.

ප්‍රාග්ධනය හා ශ්‍රමයට අතිරේක ව ආර්ථිකයක තුන්වැනි මූල සාධකය ලෙස බලශක්තිය හැඳින්වීමේ අවශ්‍යතාව ගැන අප මීට පෙර සාකච්ඡා කළෙමු. චක්‍රීය ආර්ථිකයක් පවත්වා ගෙන යෑම කළ හැකි වන්නේ එහි නිෂ්පාදන කටයුතු සඳහා විස රසායනික ඇතුළු සියලු ආකාරවල අපද්‍රව්‍ය නිකුත් කිරීමෙන් තොර ව බලශක්තිය ලබා දෙන සූර්යයා, සුළං, මුහුදු රළ සහ භූතාපය වැනි පුනර්ජනනීය ප්‍රභව යොදා ගැනීමෙනි. ගෝලීය වසයෙන් ගත් විට රේඛීය ආර්ථිකය තුළ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා විදුලි බලශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා බල ශක්ති ප්‍රභව *World Energy 2020* වාර්තාව අනුව මෙසේ යඃ



ඉහත සඳහන් දත්ත නිරූපණයට අනුව පුනර්ජනනීය, න්‍යෂ්ටික හා ජල විදුලි යන ප්‍රභව තුන ම පාරිසරික වසයෙන් පිරිසිදු ප්‍රභව ලෙස සැලකෙන බැවින් ගෝලීය විදුලිය සැපයුමෙන් 37% ක් පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවවලින් ලැබෙන බව පෙණේ. ජල විදුලි බලාගාර සම්බන්ධ ව ඇති බරපතළ විවේචනයක් වන්නේ ජලාශ ඉදිකිරීම සහ විශාල වේලි බැඳීම සඳහා මිනිසුන් විතැන් කරමින් සැලකිය යුතු භූමි ප්‍රමාණයක් ජලයට යට කිරීමට සිදුවීම යි. අනෙක කලක දී එම ජලාශවල රැඳෙන රොන්මඩ මීතේන් ආදී හරිතාගාර වායු විමෝචනයට දායක වීම යි. කෙසේ වෙතත් බොහෝ අවස්ථාවල දී ජල විදුලි බලය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සැලකේ.

ගල් අඟුරු සහ ඛනිජ තෙල් හා සසඳන විට ස්වාභාවික වායු *(natural gas)* ද අඩු කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයක් විමෝචනය කරන බල ශක්ති ප්‍රභවයක් ලෙස සැලකිය හැකි ය. එහෙත් ස්වාභාවික වායු යනු හායනය වන ස්වාභාවික සම්පතක් වන බැවින් එය චක්‍රිය ආර්ථිකයක ප්‍රබල සාධකයක් ලෙස නො සැලකේ. ඒ අර්ථයෙන් ගත් විට න්‍යෂ්ටික බලය නිපදවීම සඳහා අවශ්‍ය වන යුරේනියම් ප්‍රමුඛ න්‍යෂ්ටික ඉන්ධන ද හායනය වන සම්පතකි. එහෙත් න්‍යෂ්ටික බලය යනු අඩු ම හරිතාගාර වායු ප්‍රමාණයකට දායක වන බල ශක්ති ප්‍රභේදයකි. ප්‍රංශයේ විදුලි බලයෙන් 70% ප්‍රමාණයක් නිපදවෙන්නේ න්‍යෂ්ටික බලය බලශක්ති ප්‍රභවය වසයෙන් යොදා ගැනීමෙනි.

කෙසේ වෙතත් පුනර්ජනනීය බලශක්ති හිතකර ප්‍රතිපත්ති තදින් අනුගමනය නො කළ හොත් ලෝකයට අවශ්‍ය මුලු විදුලි බල ශක්ති ප්‍රමාණය දූෂණකාරක නො වන පිරිසිදු බලශක්ති ප්‍රභවවලින් පමණක් ලබා ගැනීම පහසු කටයුත්තක් නො වේ. ඒ විදුලි බල උත්පාදනය වැඩි වසයෙන් ම ගල් අඟුරු, ඛනිජ තෙල් සහ ස්වාභාවික වායු වැනි ෆොසිල ඉන්ධන තවමත් ලාභයට ලබාගත හැකි වීම නිසා ය. එපමණක් නො ව සංසන්දනාත්මක ව බලන විට බොහෝ අවස්ථාවල දී ෆොසිල ඉන්ධනවල බල ඝණත්වය හෙවත් වර්ග මීටරයකට නිපදවිය හැකි විදුලි බල වොට් ප්‍රමාණය සැහෙන ඉහළ මට්ටමක පවතී.

ගෝලීය උණුසුම ඉහළ යෑම සම්බන්ධයෙන් ෆොසිල ඉන්ධන භාවිතය කොයි තරම් ප්‍රබල සාධකයක් වුව ද බල ශක්ති භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති තීරණ ගැනෙන්නේ ජාතික රාජ්‍ය මට්ටමෙන් මිස ජාත්‍යන්තර මට්ටමෙන් නො වේ. ප්‍රාග්ධනය හා ශ්‍රමය මෙන් ම බලශක්තිය ද රේඛීය කාර්මික නිෂ්පාදන ක්‍රමයේ ප්‍රධාන සාධකයක් වන බැවින් අඩු වියදමකින් වැඩි කාර්යක්ෂමතාවක් ඇති බල ශක්තිය යොදා ගැනීම තරඟකාරී වෙළඳපොළ ක්‍රමය තුළ බලාපොරොත්තු විය යුතු දෙයකි. ලාභ ළමා ශ්‍රමය සපයා ගැනීම ද ඇතුළුව සේව්‍යයාට වාසිදායක සේවා කොන්දේසි යටතේ අඩු වැටුපට ශ්‍රමය සූරා ගැනීම ද ධනේශ්වර වෙළඳපොළ ක්‍රමය යටතේ කලක් තිස්සේ සිදු වූව කි. එහෙත් ශ්‍රමය සම්බන්ධයෙන් බැලූ විට තමන්ගේ ම වූ වෘත්තීය සමිති තුළ සංවිධානය වී පාර්ලිමේන්තු අණපනත් සහ සේවා ගිවිසුම් මඟින් යහපත් සේවා සහ වේතන කොන්දේසි දිනා ගැනීමට සේවකයන්ට ඇතැම් විට හැකි ව තිබෙන අතර ශ්‍රමිකයන්ගේ සංවිධානවල බලපෑම නිසා ජාත්‍යන්තර මට්ටම් දක්වා සිය අරගලය ගෙන යෑම මඟින් යහපත් සේවා තත්ව සඳහා ජාත්‍යන්තර සම්මුති කිහිපයක් ම ඇති කර ගැනීමට හැකිව තිබේ.[241] ස්ත්‍රී පුරුෂ සම වැටුප්, ස්ත්‍රීන් රාත්‍රි සේවා මුර සඳහා කැඳවීම, ළමා ශ්‍රමය, ගර්භණී නිවාඩු ආදී වසයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මැදිහත් වීමෙන් මෙකී ගිවිසුම් ඇති කර ගත හැකි වූයේ බොහෝ දුරට වෘත්තීය සමිති සංවිධාන ජාතික මෙන් ම ජාත්‍යන්තර වේදිකාවේ ද ඇති කළ අඛණ්ඩ බලපෑම නිසා ය. ඒ සමාන කාර්යභාරයක් ඉටු කරමින් කාබන් විමෝචන කාරක ඉන්ධන භාවිතය වෙනුවට පුනර්ජනනීය බලශක්තිය ආදේශ කිරීම දිරි ගන්වන ප්‍රතිපත්ති සහ අන්තර් ජාතික ගිවිසුම් ඇති කිරීම සඳහා චක්‍රීය ආර්ථිකයක් වෙනුවෙන් ක්‍රියාශීලී ව පෙනී සිටින පුරවැසි ව්‍යාපාරයක් ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කළ යුතු ව ඇත.

241 https://www.ilo.org/moscow/areas-of-work/gender-equality/WCMS_249143/lang–en/index.htm

බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත් විට ගත වූ දශකය තුළ තාක්ෂණික දියුණුවත් සමඟ විදුලි බලය නිපදවීම සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමේ වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබේ. එම මිල, ප්‍රකාශ වොල්ටීය *(photovoltaic)* කෝෂ සහිත සූර්ය බලය යොදා ගැනීම සම්බන්ධයෙන් 90% කින් ද සුළං බලය යොදා ගැනීම සම්බන්ධයෙන් 70% කින් ද තරම් විශාල ප්‍රමාණයකින් අඩු වී තිබේ. ප්‍රථම සූර්ය බලශක්ති ජාතිය බවට පත්වීම අභිප්‍රාය කරගත් අසල්වැසි බංගලාදේශය තම තමන්ගේ ගම්වල පුනර්ජනනීය බලශක්ති උපකරණ සවි කිරීම හා නඩත්තු කිරීම කළ හැකි ප්‍රජා ඉංජිනේරුවන් ලෙස කටයුතු කිරීමට දහස් ගණන් කාන්තාවන් පුහුණු කරමින් සිටී. සූර්ය බලශක්තිය යොදා ගැනීමේ දී සූර්ය පුවරු ඉදි කිරීම පිණිස යොදා ගත යුතු ගොඩ ඉඩම් ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා ජලාශවල පාවෙන සූර්ය බල පුවරු යොදා ගැනීම සම්බන්ධයෙන් දැන් වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. ඒ අතර ප්‍රතිශතයක් වසයෙන් ගත් විට විදුලි බලය නිපදවීම ප්‍රමුඛ කොට සියලු ක්ෂේත්‍ර සඳහා පුනර්ජනනීය බලශක්තිය භාවිතයේ සැලකිය යුතු දියුණුවක් ඇතැම් රටවල දක්නට ලැබේ. ඒ අතරින් ඉදිරියෙන් ම සිටින අයිස්ලන්තයේ සමස්ත බලශක්ති ප්‍රතිශතයෙන් 79%ක් ම ප්‍රධාන වසයෙන් භූතාප ශක්තිය යොදා ගැනීමෙන් සැපයේ. සුළං බලය සහ සූර්ය බලය මුල් කොට ගත් ඩෙන්මාර්කයේ පුනර්ජනනීය බලශක්තිය මුලු බලශක්ති නිෂ්පාදනයෙන් 50% කි.

| **මූලික බල ශක්ති සැපයුම සඳහා ශ්‍රී ලංකාව යොදා ගන්නා බලශක්ති ප්‍රභව ප්‍රතිශතයක් ලෙස (2018)[242]** | |
|---|---|
| ▪ ඛනිජ තෙල් | 40% |
| ▪ ජෛව ස්කන්ධ (දර ද ඇතුළත් ව) | 36% |
| ▪ ගල් අඟුරු | 10% |
| ▪ ජල බලය | 10% |
| ▪ සූර්ය බලය හා සුළං බලය | 4% |

242 Sri Lanka Sustainable Energy Authority (2018) Sri Lanka Energy Balance, Colombo

ඇමෙරිකා එක්සත් ජනපදයේ පුනර්ජනනීය බලශක්තිය නිපදවීම සඳහා වැය වන මිල වසර 2018 සිට ගල් අඟුරු භාවිත කිරීමෙන් බල ශක්තිය නිපදවීමේ මිලට වඩා අඩුව ඇති බව ෆෝබ්ස් සඟරාව වාර්තා කළේ ය.[243] එම වාර්තාවට ම අනුව ප්‍රථම වරට 2019 සිට ඇමෙරිකා එක්සත් ජනපදයේ ගල් අඟුරු භාවිතය ඉක්මවා යමින් විදුලි බල නිෂ්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම ඇරඹුණි. ඒ අනුව 2020 වන විට විදුලි බල නිෂ්පාදනය සඳහා ගල් අඟුරු භාවිත කිරීම 13%කින් අඩු වූ අතර එයට අනුරූප ව ජල විදුලිය නො වන පුනර්ජනනීය බලශක්තිය යොදවා විදුලිය නිපදවා ගැනීම ද 13% කින් වැඩි වී තිබේ.

ෆෝබ්ස් වාර්තාව සඳහා යොදා ගෙන ඇති එක් තොරතුරු ප්‍රභවයක් වන ලිසාඩ් බලශක්ති මිල විශ්ලේෂණ වාර්තාවට *(Lizard's levelized cost of energy analysis - version 13)*[244] අනුව ප්‍රජා මට්ටමේ ප්‍රකාශ වොල්ටීය කෝෂ සහිත සූර්ය බලශක්ති ජනක උපයෝගී කර ගැනීමේ දී විදුලි බලය මෙගා වොට් පැයක් සඳහා යන නිෂ්පාදන වියදම ඇමෙරිකානු ඩොලර් 64-147ක් අතර ප්‍රමාණයක් වේ. එහෙත් ගල් අඟුරු භාවිත කළ විට මෙගා වොට් පැයකට ඩොලර් 66 සිට 152 දක්වා වියදම් විය හැකි බව ගණන් බලා තිබේ. වඩාත් ම වැදගත් කරුණ වන්නේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් බැලූ විට පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම ගල් අඟුරු යොදා ගැනීමට වඩා බෙහෙවින් ලාභ දායක වීම යි. එහි දී සූර්ය බලශක්තිය සහ සුළං බලය යොදා විදුලිය නිපදවීමේ දී කිලෝ වොට් එකක් සඳහා ප්‍රාග්ධන වියදම පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් 1600-2250 සහ 1100-1500 දක්වා වන නමුත් ගල් අඟුරු යොදා විදුලි බලය නිෂ්පාදනය කිරීමේ දී කිලෝවොට් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 3000-6250 දක්වා

243 [8] https://www.forbes.com/sites/energyinnovation/2020/01/21/renewable-energy-prices-hit-record-lows-how-can-utilities-benefit-from-unstoppable-solar-and-wind/?sh=72c982312c84 – Retrieved on 17 July 2021

244 https://www.lazard.com/media/451086/lazards-levelized-cost-of-energy-version-130-vf.pdf - Retrieved on 17 July 2021

ඉහළ ප්‍රාග්ධන වියදමක් දැරීමට සිදුවේ. ඒ අතර පුනර්ජනනීය බලශක්තිය සඳහා වැය වන ප්‍රාග්ධන වියදම් අවුරුදු පතා සැලකිය යුතු ලෙස අඩු වෙමින් යයි.

විදුලි බලය නිපදවීම සඳහා ගල් අඟුරු වැනි ෆොසිල ඉන්ධන භාවිතය වෙනුවට පුනර්ජනනීය බලශක්තිය භාවිත කිරීම නිසා ලැබෙන මූල්‍යමය ලාභයටත් වඩා වැදගත් වන්නේ එමඟින් ගෝලීය උණුසුම ඉහළ නැංවීමට දායක වන මුළු හරිතාගාර වායු ප්‍රමාණය 27% කින් අඩු කර ගැනීමට හැකි වීමයි.[245] ඊට අතිරේක ව බඩු භාණ්ඩ නිපදවීමට, ප්‍රවාහන කටයුතු සඳහා සහ ශීතකරණ උණුසුම්කරණ කටයුතු සඳහා ද ෆොසිල ඉන්ධන වෙනුවට වැඩි වැඩියෙන් පුනර්ජනනීය බලශක්තිය භාවිත කිරීම කළ හැකි නම් මේ ප්‍රතිශතය 50% කින් වැඩි කර ගත හැකි විය යුතු ය.

| **කෙරෙන කටයුතු අනුව නිපදවෙන හරිතාගාර වායු ප්‍රතිශතය[246]** | |
|---|---|
| ද්‍රව්‍ය නිෂ්පාදනය (සිමෙන්ති, වානේ සහ ප්ලාස්ටික්) | 31% |
| විදුලි බල නිෂ්පාදනය (ෆොසිල ඉන්ධන යොදාගැනීමෙන්) | 27% |
| භවභෝග නිෂ්පාදනය (ශාක සහ සත්ව) | 19% |
| ප්‍රවාහන කටයුතු (රථ වාහන, ගුවන් යානා සහ ජල යාත්‍රා) | 16% |
| උණුසුම් කිරීම, වායුසමනය හා ශීතකරණය | 7% |

245 Gates Bill (2021) How to avoid a climate disaster, London: Penguin Random House, p 55

246 Gates, Bill (2021) How to Avoid Climate Disaster, London: Penguin Random House, p. 55

## රේඛීය ආර්ථිකය වෙනුවට චක්‍රීය ආර්ථිකයක්

චක්‍රීය ආර්ථිකයකට පුනර්ජනනීය බලශක්තිය අතිශයින් වැදගත් ය. චක්‍රීය ආර්ථිකයක වැදගත් ම ලක්ෂණය වන්නේ නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය ද සූර්යයාගේ නිරන්තර බල ශක්ති ප්‍රභාව මඟින් නිෂ්පාදිත ද්‍රව්‍ය හා සේවා බවට පරිවර්තනය කිරීම යි. රේඛීය ආර්ථිකයක් යනු නොකඩවා කාගෙන කාගෙන යමින් අපද්‍රව්‍ය බහිස්‍රාවය කරන දැවැන්ත දළඹුවකු ලෙස නිරූපණය කළොත් චක්‍රීය ආර්ථිකය ලස්සන සමනලයෙකුගේ අනුරුවකින් නිරූපණය කළ හැකි ය. ඇත්ත සමනලයෙකුගේ මෙන් ම චක්‍රීය ආර්ථික සමනලයාගේ ද අලංකාරය ඇත්තේ පහත රූ සටහනින් පෙන්වන පරිදි එහි පියාපත්වල ය.

### චක්‍රීය ආර්ථිකය - ප්‍රතිජනන රටා සැලැස්ම

කේට් රේවර්ත්ට අනුව




මේ ප්‍රතිජනනීය කාර්මික රටා මෝස්තරයේ සමනළයාට පියාසර කළ හැකි වන්නේ ඇයි? ඉහත පින්තූරයේ මැද කොටසින් පෙනෙන ලෙස එය තවමත් විසිවැනි සිය වසේ මෙන් නො කඩවා ඛනිජ ද්‍රව්‍ය කැණීමටත්, ෆොසිල ඉන්ධන සඳහා පොළොව විදීමටත් අතිමහත් අපද්‍රව්‍ය ප්‍රමාණයක් පරිසරයට එක් කිරීමටත්

කැපවුණු ගන්න, සදන්න, පරිභෝජනය කරන්න, ඉවත ලන්න යන ක්‍රියා පිළිවෙතට අනුගත කෑදර දළඹුවා වැනි ය. එහෙත් දැන් එය පුනර්ජනනීය බලශක්තිය පාදක කරගත් පියාපත් සහිත සමනලයෙකු බවට අනුක්‍රමයෙන් රූපාන්තරණය වෙමින් තිබේ. එන්න එන්න ම එය බලශක්තිය ලබා ගන්නේ සූර්යයා, සුළඟ, මුහුදු රළ, ජල විදුලි බලය, භූතාපය වැනි පුනර්ජනනීය ප්‍රභවයන්ගෙනි. ඒ නිසා හරිතාගාර වායු විමෝචනය, විස රසායන පරිසරයට එක්වීම සහ විශාල අපද්‍රව්‍ය ප්‍රමාණයක් පරිසරයට එක් කිරීම නව චක්‍රීය ආර්ථිකයේ ප්‍රතිචක්‍රීය කාර්මික සැලැස්ම මඟින් ම වළක්වා තිබේ. හුදෙක් කුණු කඳු තවතවත් පිරවීමට යොදා ගනු වෙනුවට චක්‍රීය ආර්ථිකයක ඉවත ලන ආහාර ද්‍රව්‍යවල සිට පරණ යකඩ දක්වා සියලු ආකාරයේ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කොට වෙනත් භාණ්ඩ නිපදවීමේ මූලද්‍රව්‍ය ලෙස යොදා ගනු ලැබේ. මෙය නිසි ලෙස ක්‍රියාත්මක වීමට නම් හැම අපද්‍රව්‍යත් ම පාංශු, ශාක හා සත්ව ආදී ජීව විද්‍යාත්මක පෝෂක හෝ ප්ලාස්ටික්, සින්තටික් ද්‍රව්‍ය සහ ලෝහ වැනි තාක්ෂණික පෝෂක හෝ යන චක්‍ර දෙකෙන් එකකට අයිති ලෙස සැලකිය යුතු ය. මේ චක්‍ර දෙක චක්‍රීය ආර්ථිකයේ සමනල තටු දෙක නිරූපණය කරයි. ඒ තටු දෙක මඟින් නිරූපණය වන චක්‍ර දෙකට අයත් ද්‍රව්‍ය කෙදිනක වත් භාවිත කොට අවසන් වන හෝ අපද්‍රව්‍ය වසයෙන් ඉවත ලන දේවල් නො ව ප්‍රතිචක්‍රීකරණය කොට නැවත නැවත භාවිත වන දේවල් ය.

අමුද්‍රව්‍යවල සිට භාණ්ඩය නිපදවීම දක්වා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එතෙක් පැවති තිරස් ද්‍රව්‍ය සැපයුම ප්‍රතිජනනීය ආර්ථිකයක දී චක්‍රාකාර ද්‍රව්‍ය සැපයුමක් බවට පරිවර්තනය වෙයි. එහෙත් කේට් රේවර්ත් පෙන්වාදෙන පරිදි ඇත්ත පරිවර්තනය සිදු විය යුත්තේ අප දේවල් අගය කරන ආකාරය සම්බන්ධයෙනි. එහි දී "ජීවිතය මිස වත්කම් යනුවෙන් දෙයක් නොමැත" යනුවෙන් වික්ටෝරියානු යුගයේ විසූ ඉංග්‍රීසි කිවියෙකු වූ ජෝන් රස්කින් ලියූ වැකිය හුදු කාව්‍යෝක්තියක් පමණක් නො ව ප්‍රබල අනාගත වාක්‍යයක් ලෙස ද සැලකිය යුතු ය. ආර්ථික වටිනාකම ඇත්ත වසයෙන් ම පවතින්නේ

නිෂ්පාදනයේ තිරස් ද්‍රව්‍ය සැපයුම තුළ නො ව එහි අඛණ්ඩ ප්‍රභවය වන විවිධාකාර වත්කම් තුළ ය. එම වත්කම් තුළ ට්‍රැක්ටර්වල සිට නිවාස දක්වා මිනිසා විසින් නිපදවන ලද දේවල් මෙන් ම මිනිසා සතු කුසලතා සහ මිනිසා විසින් දිනා ගෙන ඇති ප්‍රජා විශ්වාසදායකත්වය ද, වනාන්තරවල සිට මුහුදු පත්ල දක්වා වැජඹෙන ජීව ගෝලය ද, විකිපීඩියාවේ සිට මානව ජෙනෝමය දක්වා ද බිහි කරන ලද දැනුම් සම්භාරය ද ආදී සියලු දේවල් අඩංගු ය. එහෙත් මේ ආකාරයේ වත්කම් පවා අවසානයේ දී විසිර යයි. ට්‍රැක්ටර් වළ මල බැඳේ. ශාක ද්‍රව්‍ය දිරාපත් වෙයි. මිනිස්සු මියැදෙති. අදහස් අමතක වී යයි. කාලය ගත වන විට ඉතිරි වන එක ම වත්කම් වර්ගය සූර්යයා විසින් සබල ගන්වන ජීවයේ ප්‍රතිජනනීය බලයයි.

කර්මාන්ත ශාලා ද කර්මාන්ත ද ප්‍රතිජනනීය නිෂ්පාදන ක්‍රියාවලියට උචිත ලෙස සැලසුම් කළ හැකි ය. ඒ සඳහා භාණ්ඩ නිෂ්පාදනයේ දී පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම, ඉහළ ගුණාත්මක භාවය, කල් පැවැත්ම, වහා ඉවත දැමීමෙන් තොර ව අලුත්වැඩියා කොට භාවිත කිරීමට හැකිවීම, යොදා ගන්නා නිෂ්පාදන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට සුදුසු වීම සහ එසේ නොමැති ද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස ජීර්ණ වීම සහතික වීම ඇතුළත් නිෂ්පාදන සැලසුම් දිරි ගන්වන සුලු ප්‍රතිපත්ති සහ දණ්ඩන නියාමන ක්‍රම හඳුන්වා දිය යුතු ය. කර්මාන්ත සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය නිෂ්කාෂණය දැඩි පරිසර හිතකාමි නීතිවලින් නියාමනය විය යුතු ය. නිෂ්පාදිත භාණ්ඩ හා සේවා සැපයුම් පරිසර හිතකාමී චක්‍රීය නිෂ්පාදන ප්‍රමිතිවලට අනුකූල වීම පිළිබඳ සහතිකයක් ලබා දීමට ප්‍රමිති කාර්යාංශවලට හැකි ය. කර්මාන්ත ණය සහ ආධාර ලබා දීම චක්‍රීය නිෂ්පාදනය දිරි ගන්වන කොන්දේසි යටතේ සිදු කළ හැකි ය.

එමෙන් ම නාගරික වාසභූමිය ද එසේ ප්‍රතිජනනය මුල් කොට සැලසුම් කළ හැකි ය. ප්‍රතිචක්‍රීකරණය මුල් කොට ගත් ස්මාට් නගර බිහි කිරීම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවල එක් ඉලක්කයකි. එවැනි නගරයක හැම නිවසක් ම පුනර්ජනනීය බලශක්ති

උත්පාදන ඒකකයක් විය හැකි ය. නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීමේ සැලසුම් සඳහා ප්‍රතිචක්‍රීය ගොඩනැගීම්වලට අනුගත වන ආකාරයේ නියාමන නීති පැනවිය හැකි ය. ගෙවතු වගා කිරීම සඳහා ප්‍රතිචක්‍රීකෘත ජලය හා ගබඩා කළ වර්ෂා ජලය යොදා ගැනීම දිරිගැන්විය හැකි ය. ආදායමට සරිලන පහසු මිලකට හිමි කර ගත හැකි පරිසර හිතකාමී නිවාස ක්‍රමවල ඉදි කළ හැකිය. ගමනාගමනය සඳහා විදුලි බලයෙන් දිවෙන කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවා යෙදවීම පුරවැසියන්ගේ ගමනාගමන කටයුතු නිර්කාබනය කිරීමට උදව් කරයි. ගෘහස්ථ අපද්‍රව්‍ය නිෂ්කාෂණය ප්‍රතිචක්‍රීකරණය දිරි ගන්වන නියාමන රෙගුලාසිවලින් පාලනය විය යුතු ය. දැනටමත් ඇතිවී ගෙන යන ප්‍රවණතා සලකා බැලූ විට නාගරික ජනාවාස තුළ ජනගහනය සංකේන්ද්‍රණය වීම දේශපාලන ඒකකයක් වසයෙන් පෞර රාජ්‍ය ව්‍යුහය වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්ව පාලන ක්‍රමයක් පවත්වා ගෙන යෑමට යොදා ගත හැකි විය යුතු ය. ජාතික රාජ්‍ය ඉක්මවා ගොස් ප්‍රජා මට්ටමේ සහභාගිත්වය මුල් කොට කලාපීය වසයෙන් හා ගෝලීය වසයෙන් ද චක්‍රීය ආර්ථිකයකට කැප වෙන අන්තර් නගර ජාලයක් ස්ථාපිත කොට පවත්වා ගෙන යෑම මඟින් චක්‍රීය ආර්ථිකය ප්‍රවර්ධනය සඳහා ගෝලීය සහයෝගිතාව වර්ධනය කල හැකිය.

චක්‍රීය ආර්ථිකයේ මූලධර්ම බොහෝ කොට එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හා ගැලපිය හැකි ය. ඒ අනුව තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ කතිකාවට සක්‍රිය ව දායකත්වය සැපයීමෙන් මහජන සංවිධානවලට චක්‍රීය ආර්ථික එළඹුම පිළිබඳ කතිකාව ද පෝෂණය කළ හැකි ය. 2019 දී යුරෝපීය සංගමය චක්‍රීය ආර්ථිකයකට ක්‍රියාන්විත වැඩපිළිවෙළක් යනුවෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළේ ය. ඒ අනුව 2020 මාර්තු මාසයේ දී යුරෝපීය කොමිසම චක්‍රීය ආර්ථිකයක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළේ ය.[247] භාණ්ඩ නිෂ්පාදනය සම්බන්ධයෙන් යුරෝපා සංගමයේ හරිත සැලැස්ම

247 https://ec.europa.eu/environment/strategy/circular-economy-action-plan_en - Retrieved on 18 July 2021

පිළිබඳ විධානයට *(EU Eco-design Directive)* අනුගත වීම, භාණ්ඩ හා සේවාවල තිරසාර බව වැඩි කිරීම, භාණ්ඩවල කල් පැවැත්ම, අලුත්වැඩියා කිරීමේ හැකියාව, අමතර කොටස් ලබාගැනීම සහතික කිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි හඳුන්වා දීම, භාණ්ඩ සඳහා හරිතප්‍රිය සලකුණ යෙදීමේ දී ප්‍රතිචක්‍රීකරණය කිරීමේ හැකියාව අනුව වර්ග කිරීමේ නව නීති, පොදු ආයතනවල ප්‍රසම්පාදන කටයුතු නව චක්‍රීය ආර්ථික රෙගුලාසි අනුව සිදු කිරීම අනිවාර්ය කිරීම වැනි ක්‍රියාන්විත 35ක් ඇති ඒ සැලැස්ම ගැන විචාරශීලී කතිකාවක් දැන් ඇති ව තිබේ.[248] අපේ ආර්ථිකය ද චක්‍රීය ආර්ථිකයක් බවට පත් කිරීමේ පරිවර්තනීය සැලැස්මක් සැකසීමට දැන් කාලය පැමිණ තිබේ. කලාපීය වශයෙන් එය කළ හැකි නම් වඩා සඵලදායක බලපෑමක් ඇති කළ හැකි ය. ඒ අනුව යුරෝපා සංගමය සකස් කර ඇති සැලැස්ම ආදර්ශයට ගෙන දකුණු ආසියානු කලාපය තුළ පිහිටි සියලු රටවල මහජන සංවිධාන, විශ්ව විද්‍යාල, විද්වතුන්, ව්‍යාපාරිකයන්, පාරිභෝගික සංවිධාන සහ දේශපාලන ක්‍රියාධරයන් සහභාගී වන කතිකාවක් මඟින් චක්‍රීය ආර්ථිකයක් සඳහා මූලික සැලැස්මක් පිළියෙළ කිරීම කරා යොමු විය හැකි ය.

248 Delivering a circular economy within the planet's boundaries: An analysis of the new EU Circular Economy Action Plan (2021), Institute of European Environmental Policy, Bruxelles

# - 22 -

# චක්‍රීය ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ ඩෝනට් මොඩලය

ආර්ථික විද්‍යාවේ විවිධ ශාඛා සහ විවිධ ගුරුකුල අතර නිතර ම පාහේ වාද විවාද ඇති වී තිබෙන අතර ආර්ථික විද්‍යාව හදාරන ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාල ඇතුළු උසස් අධ්‍යාපන ආයතනවල ඉගැන්වෙන ප්‍රධාන ධාරාවේ ආර්ථික විද්‍යා උපකල්පන හා ඉලක්කවල අසාර්ථක ප්‍රතිඵල ගැන එන්න එන්න ම තම නො සතුට පළ කරති. ඒ අතර ආණ්ඩු සහ ව්‍යාපාර සිය තීරණ ගැනීමට එකී පටු ආර්ථික න්‍යායන් උපයෝගී කර ගනිති. ඒ නිසා ආර්ථික විද්‍යාවේ සුසමාදර්ශීය වෙනසකින් තොර ව දේශගුණය වෙනස් වීම සහ වැඩිවන සමාජ ආර්ථික විෂමතාව නිසා ඇති වෙන අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට අසීරු බවට ඇති මතය අවඥාවෙන් බැහැර කළ නො හැකි ය.

ආර්ථික විද්‍යා විෂය වෙනස් විය යුතු ය යන ඉල්ලීම පදනම් කොට ගත් ශිෂ්‍ය ව්‍යාපාර ලෝකය පුරා බොහෝ රටවලට පැතිර ගොස් තිබේ. ආර්ථික චින්තනය පිළිබඳ ශික්ෂණයට ආර්ථික විද්‍යා න්‍යායවල එන සාම්ප්‍රදායික උපකල්පන දැඩි ලෙස ප්‍රශ්න කිරීම ඇතුළත් විය යුතු බවත් අනෙකුත් ආර්ථික චින්තන ගුරුකුල හා මතවාදවල අදහස් ද විමසිය යුතු බවත් එකී ශිෂ්‍ය ව්‍යාපාරවල එක්

ප්‍රබල ඉල්ලීමකි.[249] ආර්ථික විද්‍යාව යනු හුදෙක් නවලිබරල්වාදය ප්‍රමුඛ නව සම්භාව්‍ය සම්ප්‍රදායේ විවිධ ප්‍රභේදවල නිරූපණයක් නො වන බවත් අප මතක තබා ගත යුතු ය. චක්‍රීය ආර්ථිකය සම්බන්ධයෙන් උනන්දුව තව තව තවත් වැඩි වීමත් සමඟ ආර්ථික විද්‍යාව සම්බන්ධ සැලකිය යුතු සුසමාදර්ශීය වෙනසක් සිදු කිරීමට ඇතිවෙන බලපෑම වැඩි විය හැකි ය.

ආර්ථික විද්‍යාඥයින් අතර කොතෙකුත් දෘෂ්ටිවාද හා පරස්පරතා තිබුණ ද ආර්ථික විද්‍යාව සහමුලින්ම බැහැර කොට අපට කටයුතු කළ නො හැකි ය. එහෙත් සාම්ප්‍රදායික ආර්ථික න්‍යායවලින් ආර්ථික විද්‍යාව පටන් ගන්නවා වෙනුවට මනුෂ්‍යත්වයේ දිගුකාලීන අරමුණුවලින් පටන් ගෙන ඒ අරමුණු සාක්ෂාත් කර ගත හැකි ආර්ථික විද්‍යා චින්තනයක් ගොඩනගා ගත්තොත් කොතරම් ආශ්චර්යයක් ද?.

ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යා ආචාර්යවරියක ලෙස කටයුතු කළ කේට් රේවර්ත් පවසන අන්දමට ආර්ථික විද්‍යාව ගැන නැවත සිතීම යනු නිවැරදි ආර්ථික විද්‍යාවක් සොයා ගැනීම නො ව, *(මන්ද නිවැරදි ආර්ථික විද්‍යාවක් කියා දෙයක් නො පවතින බැවිනි)* අපේ අරමුණ සඳහා වඩාත් සුදුසු ආර්ථික විද්‍යාවක් තෝරා ගැනීම හෝ නිර්මාණය කර ගැනීම යි. මනුෂ්‍යත්වයේ සන්දර්භය තුළ වටිනාකම් සහ අරමුණු යනු නිරන්තරයෙන් ම විකාසනය වන ඒවා බැවින් ආර්ථිකය පිළිබඳ අපේ දැක්ම ද එසේ විකාසනය වන එකක් විය යුතු ය.

දැනට තිබෙන දෘෂ්ටිවාද අතරින් ඒ සඳහා අවශ්‍ය කරන නිවැරදි රාමුවක් අපට නැති වෙන්නට පුළුවන. *(මන්ද එවැනි නිවැරදි රාමුවක් ඇත්ත වසයෙන් ම නොමැති බැවිනි)* අවශ්‍ය වන්නේ අප එකඟ වන අරමුණට සරිලන හොඳ ම රාමුවක් තෝරා ගැනීම හෝ නිර්මාණය කර ගැනීමයි. ආර්ථික විද්‍යාව විෂයයක් වසයෙන් හදාරා තිබුණත්

249 Delreal, J. (2011) ‘Students walk out of Ec 10 in solidarity with “Occupy”’, The Harvard Crimson 2 November 2011. http://www.thecrimson.com/article/2011/11/2/mankiw-walkout-economics-10/ - Retrieved on 18 July 2021.

නැතත් අප කිසිවෙකුටත් ආර්ථික විද්‍යාවේ බලපෑමට ලක් නො වී විසිය නො හැකි ය. ආර්ථික විද්‍යාඥයින්, දේශපාලන ක්‍රියාකාරීන් හා ජනමාධ්‍යකරුවන් ආර්ථිකය අර සම්ප්‍රදායානුකූල ආර්ථික විද්‍යා ප්‍රස්තාර රූසටහන් ආදිය මඟින් කොයි තරම් සැරට රාමු ගත කරන්නේ ද යත් අප ද ඒවායේ එන වාංමාලාව භාවිත කරන්නේ නිරායාසයෙනි. එහෙත් ඔබ කෙදිනකවත් ආර්ථික විද්‍යා දේශනයකට සවන් දී නැත්නම් එය ඇතැම් විටක සාම්ප්‍රදායික චින්තනයෙන් මිදුණු නව ආර්ථික චින්තනයක් තේරුම් ගැනීමේ දී විශේෂ වාසියක් වීමටත් ඉඩ තිබේ. "හුරුපුරුදු චිත්ත රූප සහ ප්‍රකාශනවලින් මිදීමේ අරගලය අසීරු වන්නේ නව අදහස් පිළි නො ගැනීමේ ප්‍රවණතාව නිසා නො ව අපේ සිත්වල හැම අස්සක් මුල්ලක් පාසා ම අතු අතුපතර විහිදී ඇති අප සතු පරණ අදහස්වලින් ගැලවීමේ අපහසුව නිසා යි" යන ජෝන් මේනාඩ් කේන්ස්ගේ කියමන අනුව එය නිවැරදි විය යුතු ය.

කේට් රේවර්ත් යෝජනා කරන ආර්ථික චින්තනයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ආර්ථිකය, සමාජය සහ පරිසරය අතර පවතින එකිනෙක මත යැපීම *(dependence)* ආර්ථික විග්‍රහයේ දී ප්‍රමුඛ කොට සැලකීම යි. ඒ අන්‍යෝන්‍ය යැපීම නො තකන ආර්ථික කටයුතු අද ලෝකය මුහුණ දෙන ව්‍යසනකාරී අභියෝග බොහෝමයක් තව තවත් උග්‍ර කරනු ඇත. එය ජය ගැනීමට සප්තාංගයකින් සමන්විත එළඹුමක් අනුගමනය කළ යුතු බව ඇය යෝජනා කරයි. ඒ ගැන අපි පසුව විස්තර කරමු.

රේවර්ත් තර්ක කරන අන්දමට 21 වැනි සියවසේ උද්ගත ව ඇති අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට හැකි වෙන පරිදි මුළුමනින් ම වෙනස් වූ රැඩිකල් ආර්ථික විද්‍යා එළඹුමක් අප යොදා ගත යුතු ය. සාම්ප්‍රදායික ආර්ථික මොඩල අනුව ආර්ථික වර්ධනය ගැන ම ප්‍රහර්ෂයෙන් ඇලී ගැලී සිටීමේ ප්‍රතිඵලය වී ඇත්තේ ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් ඇති අත්‍යන්ත විෂමතා මෙන් ම අවිචාරවත් ලෙස පෘථිවි සම්පත් යොදා ගැනීමෙන් සජීවි ලෝකය විනාශ වී යෑම නො සලකා හැරීමට සිදුවීම බව ඇය පෙන්වා දෙයි. ඒ

නිසා රේවර්ත් පවසන අන්දමට ආර්ථිකය පිළිබඳ අපේ පරමාර්ථය රැඩිකල් ලෙස වෙනස් කර ගත යුතු ය. ආර්ථිකයේ පරමාර්ථය හුදෙක් ආර්ථික වර්ධනය ඇති කර ගැනීම හෝ නිෂ්පාදනය වැඩි කර ගැනීම හෝ විය නො හැක. "විසිඑක් වැනි සියවසට ඊට වඩා සුවිසල් පරමාර්ථයක් අපට අවශ්‍ය වේ. නිරන්තරයෙන් ඉහළ යා යුතු දළ ජාතික නිෂ්පාදිතයක් වෙනුවට පෘථිවියේ සම්පත්වලට සරිලන ලෙස මිනිස් අයිතිවාසිකම් හා අවශ්‍යතා යුක්තිගරුක ව සාක්ෂාත් කර ගැනීම අපේ පරමාර්ථය විය යුතු ය. පෘථිවියේ පාරිසරික සීමාවන් තුළ සමබර කරගත් සෞභාග්‍යයක් අත්පත් කර ගන්නේ කෙසේ ද? යන්න සොයා ගැනීමට අපට කාලය පැමිණ තිබේ"[250] කේට් රේවර්ත් පවසන අන්දමට මෙය සිදුවිය හැක්කේ ආර්ථිකය යන්න වියුක්ත දෙයක් නො ව සමාජය සහ පෘථිවි පරිසර පද්ධතිය තුළ ඒකාග්‍ර ව ක්‍රියාත්මක වන දෙයක් ලෙස සලකන්නට පටන් ගත් විට ය.

මේ සම්බන්ධයෙන් අප මුහුණ දෙන අභියෝග සහ අප සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු විය යුතු ලෝකය කුමක් ද? යන්න විදහා දක්වන කදිම රූප සටහනක් කේට් විසින් සම්පාදනය කර ඇත. ඒක කේන්ද්‍රීය වෘත්ත දෙකකින් සමන්විත කේට්ගේ මොඩලය දිස් වන්නේ ඩෝනට් නමින් හැඳින්වෙන මැද හිඩැසක් සහිත වටකුරු රස කැවිල්ලක ස්වරූපයෙනි. ඩෝනට් යනු ස්වරූපයෙන් හා ප්‍රමාණයෙන් උළුඳු වඩයක් වැනි එහෙත් මැද හිඩැස තරමක් ලොකු රස කැවිල්ලකි. ඇය ඇගේ ආර්ථික මොඩලය සංයුක්ත කර පෙන්වීමට මේ ඩෝනට් මොඩලය පහත දැක්වෙන අන්දමින් රූපාදර්ශයක් ලෙස භාවිත කරයි.

250 Raworth, Kate (2017) Doughnut Economics: Seven ways to think like a 21st Century Economist, New York: Random House, p. 26

## චක්‍රීය ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ ඩෝනට් මොඩලය




කේට් රේවර්ත්ගේ *Doughnut Economics* කෘතිය අනුව

ඉහත දැක්වෙන ඩෝනට් රූපාදර්ශයේ පිහිටි කළු පැහැති වළලු දෙක අතරින් ඇතුළත වළල්ලෙන් නියෝජනය වන්නේ ජන සමාජයේ සමාජ පදනම යි. මෙහි දී සමාජ පදනම යනුවෙන් හැඳින්වෙන්නේ ජනසමාජය තුළ ශිෂ්ට ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රමාණවත් වන ලෙස හැම පුද්ගලයෙකුට ම සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව සහතික කෙරෙන දේශපාලන, ආර්ථික හා සමාජීය වාතාවරණය යි. සමාජ පදනම යනු ජීවත් වන හැම කෙනෙකුට ම අවම වසයෙන් දොළොස් ආකාරයක මූලික අවශ්‍යතා ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක ව ද සපුරා ගැනීමට හැකියාව ජනසමාජයේ අඩිතාලම ලෙස සැලකීමයි. එම මූලික අවශ්‍යතා නම්, ප්‍රමාණවත් ආහාර, පිරිසිදු ජලය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂාව, පහසුවෙන් බලශක්තිය ලබාගැනීමේ හැකියාව සහ පිරිසිදුව ආහාර පිස ගැනීමේ පහසුකම්, ගුණාත්මක අධ්‍යාපනය හා සුව සේවා පහසුකම්, ප්‍රමාණවත්

මූලික ආදායමක් සහ යෝග්‍ය රැකියාවක් ලබා ගැනීමේ හැකියාව සහ තොරතුරු ජාලවලට ප්‍රවේශ වීමේ සහ සමාජ ආධාර ජාලවල සේවය ලබා ගැනීමේ හැකියාව ද යන මූලික අවශ්‍යතාවයෝ ය. මේ අවශ්‍යතා සපුරා ගැනීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, සමාජ සාධාරණය, දේශපාලන හඬ නැංවීමේ හැකියාව, සාමය සහ යුක්තිය සහතික කෙරෙන අන්දමට ඉටු විය යුතු ය.

ඉහත කී මූලික අවශ්‍යතාවලින් වැඩි කොටසක් 1948දී සම්මත කරගත් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිමාන *(norms)* සහ නීති යටතේ කිසිදු වෙනස්කමකින් තොර ව හැම පුද්ගලයෙකුගේ ම අයිතීන් ලෙස හිමිකර දීමට උත්සාහ කර තිබේ. ඒවා සාක්ෂාත් කර දීම සම්බන්ධයෙන් නිශ්චිත දින වකවානු හඳුන්වා දීම අසාමාන්‍ය ලෙස උන්නතිකාමී වීමක් යැ'යි එකල කෙනෙකුට පැවසිය හැකි වුවත් අවුරුදු 67කට පසු දැන් එම අයිතීන් සාක්ෂාත් කර දීම දින වකවානු හා නිශ්චිත ඉලක්ක සහිතව නිල වසයෙන් ම ප්‍රකාශයට පත් කර තිබේ. රටවල් 195ක් එක් ව 2015දී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු ප්‍රකාශයට පත් කරමින් ඉහත කී අයිතීන් පරිපූර්ණ ලෙස සාක්ෂාත් කර දීමේ ඉලක්කය වසර 2030 ලෙස ප්‍රකාශ කිරීම එම නිල ප්‍රකාශනය යි.

ඩෝනට් ආර්ථික මොඩලය පිළිබඳ ඉහත රූපාදර්ශයේ බාහිර කළු වළල්ලෙන් පෙන්නුම් කරන්නේ ආර්ථිකය  ක්‍රියාත්මක වන පෘථිවි පරිසරයේ සීමා මායිම් ය. අපේ ආර්ථික හා සමාජීය කටයුතු මේ සීමා මායිම් ඉක්මවා යන තරම් පීඩනයක් පරිසරයට එල්ල කරන විට පෘථිවි පරිසර පද්ධති සහ එම පරිසර පද්ධති තුළ අපට ජීවත් වීමට ඇති හැකියාව අනතුරට ලක් වේ.

ඒ නිසා මනුෂ්‍යයන් සඳහා වඩාත් රක්ෂිත කලාපය වසයෙන් හැඳින්විය හැක්කේ ඉහත රූපාදර්ශයේ බාහිර සහ අභ්‍යන්තරය වළලු අතර ඇති අළු පැහැති ප්‍රදේශයයි. එම කලාපය මානව හිමිකම් සුරැකෙන, යුක්තිය සාක්ෂාත් කර ගත හැකි දේශපාලන අවකාශය මෙන් ම, ප්‍රතිජනනය *(regeneration)* සහ ප්‍රතිඵල අතළොස්සක් අත

සංකේන්ද්‍රණය වීම වෙනුවට පුළුල් ව විභජනය කෙරෙන *(distributive)* චක්‍රීය ආර්ථිකයේ අවකාශය නියෝජනය කරයි. කේට් රේවර්ත්ගේ මතය වන්නේ සියලු ආර්ථික පරමාර්ථ, ආදර්ශන සහ න්‍යායවල කාර්ය විය යුත්තේ අප සියලු දෙනා ම මෙකී රක්ෂිත කලාපය තුළ යුක්තිය සාක්ෂාත් කර ගනිමින් වෙසෙන බවට වග බලා ගත යුතු බව යි. පෘථිවියේ පාරිසරික සීමා නො ඉක්මවමින් යුක්තිගරුක ව මනුෂ්‍ය අවශ්‍යතා සහ මානුෂික අයිතිවාසිකම් සාක්ෂාත් කර ගත හැකි ආර්ථික චින්තනයක් කේට් රේවර්ත් සිය ඩෝනට් ආර්ථික මොඩලයෙන් යෝජනා කරයි.

විසිවැනි සියවසේ මැද භාගයේ සිට ඇති වූ ගෝලීය ආර්ථික සංවර්ධනය ලොව පුරා මිලියන ගණනක් මිනිසුන් අගහිඟකම්වලින් මුදවා ගැනීමට සමත් විය. බොහෝ විට ප්‍රථම වරට සිය පවුල්වලට ප්‍රමාණවත් ආහාර, බීමට පිරිසිදු ජලය, නිවසට විදුලිය, සෑහෙන අධ්‍යාපනයක් සහ සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට හැකි වූ පරම්පරාව ඔවුන් විය හැකි ය. මේ පරිවර්තනය සමඟ බොහෝ දෙනෙකුට ස්ත්‍රී පුරුෂ සමානතාව පිළිගැනීමට සහ දේශපාලන හඬ නැංවීමට ඉඩ දීමට සිදුවිය. එහෙත් මේ ගෝලීය ආර්ථික සංවර්ධනය මිනිසුන් විසින් පෙර නො වූ විරූ ලෙස මිහිපිට සහ භූගත ව ඇති සම්පත් උද්ධරණය කොට ප්‍රයෝජනයට ගැනීම ද සීමාන්තික ව වැඩි කළේ ය. මුලින් ම එය ඉහළ ආදායම් සහිත රටවල සම්පත් භක්ෂක ජීවන රටාව නිසා සිදුවිය. වඩාත් මෑතක දී ඉහළ ආදායම් සහිත රටවල ජීවන රටාව අනුකරණය කිරීම ගෝලීය මධ්‍යම පන්තියේ වර්ධනය නිසා දෙගුණ වීමේ ප්‍රතිඵලයක් ලෙස එම උද්ධරණය තවත් වැඩි විය. ඒ හැර 1950-2010 අතර කාල පරාසය තුළ දී ගෝලීය ජනගහනය ප්‍රමාණයෙන් තුන් ගුණයකින් පමණ වැඩි වූ අතර සමස්ත ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතය හත් ගුණයකින් ඉහළ ගියේ ය. ඒ අනුව ලොව පුරා මිරිදිය ජල භාවිතය තුන් ගුණයකින් ද, බලශක්ති භාවිතය සිව් ගුණයකින් ද, පොහොර භාවිතය දස ගුණයකින් ද ඉහළ ගියේ ය.[251]

251 Raworth, Raworth (2017) Doughnut Economics: Seven ways to think like a 21st Century Economist, New York: Random House. pp. 37-38

මෙසේ මානව ක්‍රියාකාරකම් වේගයෙන් වැඩි වීමේ දුර්විපාක පෘථිවි ජීවන පද්ධතිවල වර්තමාන තත්වය විදහා දක්වන දර්ශක ගණනාවකින් ම පෙන්නුම් කරයි. එම දර්ශකවලින් පෙන්වන පරිදි ගෝලීය උණුසුම ඉහළ නැංවීමට තුඩු දෙන වායුගෝලයේ හරිතාගාර වායු ප්‍රමාණය වැඩි වීමේ සිට සාගර ආම්ලීකරණය සහ ජෛව විවිධත්වයට සිදුවී ඇති හානිය දක්වා වූ පාරිසරික බලපෑම් ගණනාවක් 1950 සිට වැඩි වී ගොස් තිබේ. "මේ වෙනසේ පරිමාණය සහ වේගය අධිතක්සේරු කිරීමට අපට අසීරු ය." යනුවෙන් එම ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කළ විද්‍යාඥ කණ්ඩායම මෙහෙය වූ විල් ස්ටෙෆාන් පවසයි[252]. "මනුෂ්‍යයින් එක පරම්පරාවක් ඇතුළත ග්‍රහලෝක මට්ටමින් භූවිද්‍යා බලවේගයක් බවට පත්වී තිබේ.... මෙය නව ආකාරයක ප්‍රපංචයකි. එමගින් පෙන්නුම් කරන්නේ මනුෂ්‍ය වර්ගයාට මේ ග්‍රහලෝකය සම්බන්ධයෙන් ගෝලීය මට්ටමෙන් නව වගකීම් ඇති බව යි."

මානව ක්‍රියාකාරකම් වේගයෙන් වැඩි වීම නිසැක ව ම අපේ ග්‍රහලෝකය මත ඉමහත් පීඩනයක් ඇති කර තිබේ. එහෙත් මේ ග්‍රහලෝකය තුළ අපේ පැවැත්ම තහවුරු කරන ජීවදාන පද්ධති බිඳවැටීමට පෙර තවත් කොතරම් පීඩනයක් එයට දරා ගත හැකි වෙයි ද? වෙනත් අන්දමකින් කිව හොත් කේට් රෙවර්ත්ගේ ඩෝනට් ආර්ථික මොඩලයේ උපරිම පාරිසරික සීමාව කුමක් විය හැකි ද? එම පැනයට පිළිතුරු සෙවීමට පසුගිය වසර ලක්ෂය තුළ පෘථිවියේ අප ගත කළ ජීවිතය දෙස ආපසු හැරී බැලිය යුතු ය. මුල් වරට මිනිසුන් අප්‍රිකාවෙන් නිකුත් ව ගොස් අනෙක් මහාද්වීප කරා සංක්‍රමණය වන අවධියේ දී පෘථිවියේ උෂ්ණත්ව සාමාන්‍යය විටින් විට ඉහළ පහළ යමින් තිබුණි. එහෙත් පසුගිය වසර 12,000 තිස්සේ පැවති උණුසුම් දේශගුණය බෙහෙවින් ස්ථාවර විය. මේ කාල පරිච්ඡේදය 'හොලෝසීන අවධිය' යන නමින් හැඳින්වෙන බව අප මුල් පරිච්ඡේදයේ දීම සනිටුහන් කළ බව ඔබට මතක ඇති. එම යෙදුම මතක තබා ගැනීමට වටින්නේ

252 Steffen, W. et al. (2015) 'The trajectory of the Anthropocene: The Great Acceleration', Anthropocene Review 2: 1, pp. 81–98.

මනුෂ්‍ය වර්ගයා ලෙස අපේ මිහිපිට වාසයේ ඇති හොඳම අවධිය ද එය වන බැවිනි.

මහාද්වීප ගණනක එක ම විට කෘෂිකර්මය සොයා ගනු ලැබුවේ මේ හොලෝසීන අවධියේ දී ය. කෘෂිකර්මය එසේ සියලු මහාද්වීපවල සමපාත ව  බිහි වීම අහම්බයක් නො වන බව විද්‍යාඥයන්ගේ මතයයි. පෘථිවි දේශගුණයේ නව ස්ථාවරත්වය, එතෙක් තැනින් තැන යමින් දඩයමින් සහ වන ඵලවලින් ද ජීවත් වෙමින් සිටි අයගෙන් පැවත ගෙන එන අයට එක තැනක පැළපදියම් වී සෘතුවට අනුව  වැසි සමය බලාපොරොත්තු වෙමින් බීජ තෝරා ගනිමින්, පැල කරමින් සහ අස්වැන්න නෙළමින් දිවි ගෙවීමට ඉඩ සැලසීය. එමෙන් ම ඉන්දු නිම්නය, පුරාණ ඊජිප්තුව, චීනයේ ෂැන්ග් රජ පෙළපත, මායාවරු, රෝම සහ ග්‍රීක වැනි සියලු වැදගත් මානව ශිෂ්ටාචාර මේ හොලෝසීන අවධියේ බිහි වීම ද අහම්බයක් නො වේ.

වඩාත් සුවිශේෂ කාරණය හොලෝසීන යුගයේ මේ වාසිදායක තත්වය ඇති ව තිබෙන්නේ අනෙක් බොහෝ ග්‍රහලෝකවල කක්ෂවලට වෙනස් ව අසාමාන්‍ය ලෙස වෘත්තාකාර වී ඇති කක්ෂයක වර්තමානයේ පෘථිවිය සූර්යයා වටා ගමන් කිරීමයි. *(අනෙක් බොහෝ ග්‍රහයන් ගමන් කරන්නේ ඉලිප්සාකාර කක්ෂයක යි)* අවසාන වරට මින් වසර හාරලක්ෂයකට පෙර ඇති වී නැවතත් සිදු වන මේ සංසිද්ධිය කිසියම් අහේතුවකින් නතර නො වුව හොත් තවත් වසර 50,000ක් පමණ පැවතීමට ඉඩ තිබේ. මේ වනාහි දැඩි අවධානයක් යොමු කරමින් කල්පනා කර බැලිය යුතු සංසිද්ධියකි. දැනට දන්නා පරිදි එසේ කලාතුරකින් සිදු වන අකාරයකට දිගින් දිගට ම සූර්යයා වටා වෘත්තාකාර ව කක්ෂ ගත වී සිටීම නිසා ඇති වූ හොඳ ම තත්වය සහිත යුගයක ආශීර්වාදය ලත් එකම ජීවමාන ග්‍රහ වස්තුව මත අපි බිහි වී ඇත්තෙමු. ඒ නිසා ස්වෝත්සාහයෙන් ම මේ හොලෝසීන අවධියෙන් ඉකුත් ව යැමට තැත් කිරීම තරම් උමතු ක්‍රියාවක් තවත් තිබිය නො හැක. එනමුදු අප දැන් නිසැක ව ම කරමින් සිටින්නේ ද එකී උමතු ක්‍රියාව යි. අප විසින් නො කඩවා පෘථිවිය මත ඇති

කෙරෙන පීඩනය නිසා මේ ග්‍රහ වස්තුව වෙනස් කරන එක ම තනි සාධකය මනුෂ්‍ය වර්ගයා බවට පත්කර තිබේ. අප විසින් ඇති කර තිබෙන එකී බලපෑමේ පරිමාව අනුව දැන් අපි හොලෝසීන අවධිය අවසන් කොට අප තව මත් හරියට ම නො දන්නා ඇන්ත්‍රොපසීන් අවධියට එළඹ ඇත්තෙමු. ඇන්ත්‍රොපසීන් අවධිය යනු හුදෙක් මිනිස් ක්‍රියාකාරකම් නිසා ම හැඩ ගැසෙන ප්‍රථම භූවිද්‍යාත්මක අවධිය යි. හොලෝසීන අවධියේ අපට ලැබුණු හිතකාමී ස්ථාවර දේශගුණය, ඇති පදම් මිරිදිය ජලය, සප්‍රාණික ජෛව විවිධත්වය සහ නිරෝගී සාගරය වැනි හිතකාමී ස්වාභාවික තත්ව දැන් අප වසන ඇන්ත්‍රොපසීන් අවධියේ දී ද නො වෙනස් ව පවත්වා ගෙන යෑමට නම් අප කුමක් කළ යුතු ද?

ඉහත සඳහන් කළ ප්‍රශ්නය 2009 දී ජෝන් රොක්ස්ට්‍රොම් සහ විල් ස්ටෙෆාන් ප්‍රමුඛ භූගෝලීය පද්ධති පිළිබඳ විද්‍යාඥයින් සමූහයකගේ විමසුමට ලක් විය. ඒ අනුව අභිවෘද්ධි දායක හොලෝසීන තත්ව පවත්වා ගැනීමට පෘථිවියට හැකි වන දේශගුණ පද්ධතිය සහ මිරිදිය ජල චක්‍රය වැනි තීරණාත්මක ස්වාභාවික ක්‍රියාවලි නවයක් ඔවුන් විසින් හඳුනා ගනු ලැබී ය. ඒ ක්‍රියාවලි නවය මෙසේ යඃ

**දේශගුණ විපර්යාසය** *(Climate change);* වායුගෝලයට එක් වන කාබන් ඩයොක්සයිඩ්, මීතේන් සහ නයිට්‍රස් ඔක්සයිඩ් වැනි හරිතාගාර වායු පෘථිවියේ ස්වාභාවික හරිතාගාර බලපෑම තීව්‍ර කරමින් වායුගෝලය තුළ සිර වෙන තාප ප්‍රමාණය වැඩි කරවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වැඩිවන ගෝලීය උණුසුම නිසා උෂ්ණත්වය ඉහළ නැගීම, නිරන්තරයෙන් අත්‍යන්ත කාලගුණ ව්‍යසන ඇතිවීම සහ සාගර ජල මට්ටම් ඉහළ යෑම සිදුවේ.

**සාගර ආම්ලීකරණය** *(Ocean acidification);* මිනිස් ක්‍රියාකාරකම් නිසා විමෝචනය වන කාබන් ඩයොක්සයිඩ්වලින් හතරෙන් එකක් පමණ අවශෝෂණය වන්නේ සාගර ජලයේ දිය

වීම මගිනි. එසේ දිය වෙන කාබන් නිසා ඇතිවෙන කාබොනික් අම්ලය මඟින් සාගර මතුපිට ජලයේ *ph* අගය අඩුවෙයි. එයින් කියවෙන්නේ ජලයේ අම්ල සංයුතිය වැඩි වන බවයි. මෙසේ සාගරයේ ආම්ලීකරණය වැඩි වීම නිසා සාගර ජීවීන්ගේ අස්ථි මෙන් ම බෙලි කටු වැනි ආරක්ෂිත ආවරණ තැනීමට දායක වන කාබනේට් අයනවල පැවැත්ම බෙහෙවින් අඩු කරයි. ඒ නිසා කොරල්, බෙල්ලන් සහ ප්ලැන්ක්ටන් වැනි සාගර ජීවීන්ගේ වැඩීම හා පැවැත්ම බාල කරමින් හෝ අවහිර කරමින් සාගර පරිසර පද්ධති සහ ආහාර දාම දුර්වල කරයි.

**රසායනික දූෂණය** *(Chemical pollution);* ජීව ගෝලයට මුදා හැරෙන කෘත්‍රිම කාබනික දූෂණකාරක සහ බැර ලෝහ ඇතුළු විෂ සංයෝග ආපසු හැරවිය නො හැකි දුර්විපාක ඇති කරමින් බොහෝ කලක් යන තෙක් ම ජීව ගෝලයේ පවතී. පක්ෂීන් සහ ක්ෂීරපායීන් ඇතුළු බොහෝ ජීවීන්ගේ පටකවලට කාන්දු වන මේ දූෂණ කාරක සහ විෂ ද්‍රව්‍යවලට එම ජීවීන්ගේ ජනක ශක්තිය අඩු කළ හැකි අතර ගොඩ බිම හා සාගර පරිසර පද්ධති අනතුරට ලක් කරමින් ජානවලට ද හානි පැමිණ විය හැකි ය.

**නයිට්‍රජන් සහ පොස්ෆරස් අධි භාවිතය** *(Nitrogen and phosphorus loading);* කෘෂිකාර්මික පොහොරක් ලෙස ප්‍රතික්‍රීය නයිට්‍රජන් සහ පොස්ෆරස් බෙහෙවින් භාවිත වන නමුත් භෝගවලින් උරාගන්නේ ඉන් කුඩා ප්‍රමාණයක් පමණි. ඉතිරියෙන් බොහෝමයක් ගංගා, ජලාශ සහ සාගර ජලයට මුසු වී ජලය කොළ පැහැය ගන්වන ඇල්ගී යවට *(algae blooms)* ඇති කිරීමට හේතු වෙයි. මේ යවට විස සහගත විය හැකි අතර ජලයෙන් ඔක්සිජන් ලබා ගැනීම වළක්වා ලමින් අනෙකුත් ජලජ ජීවීන් මරණයට පත් කරයි.

**මිරිදිය නිෂ්ක්‍රමණය** *(Freshwater withdrawals);* ජීවය පවත්වා ගැනීම සඳහා ජලය අත්‍යවශ්‍ය වන අතර එය කෘෂිකාර්මික, කාර්මික සහ නේවාසික කටයුතු සඳහා ද බෙහෙවින් යොදා ගැනේ. එහෙත් අධික ලෙස ජලය නිෂ්ක්‍රමණය කිරීම හෙවත් ඉවත් කිරීම පරිසර පද්ධතිවලට හානි කරමින් ජල චක්‍රය සහ දේශගුණය විපර්යාසයට ලක් කරමින් ජලාශ, ගංගා සහ භූ ජලධර දුබල කිරීමට පමණක් නො ව ඒවා වියලා දැමීමට ද හේතු විය හැකි ය.

**භූමි පරිවර්තනය** *(Land conversion);* මිනිසාගේ ප්‍රයෝජනය සඳහා වනාන්තර සහ තෙත් බිම් වැනි ස්වාභාවික භූමි නගර, ගොවි බිම්, සහ මහා මාර්ගවලට යොදා ගැනීම පෘථිවියේ කාබන් අවශෝෂණ හැකියාව දුර්වල කරමින් වනජීවි වාසස්ථාන ද විනාශ කරයි. ඒ හැර ජල චක්‍රය නිසි ලෙස ක්‍රියා කිරීමට, අතිරික්ත නයිට්‍රජන් සහ පොස්ෆරස් ඉවත් කිරීමට ද මේ භූමි පරිවර්තනය අහිතකර ලෙස බලපායි.

**ජෛව විවිධත්වය හානි වීම** *(Biodiversity loss);* ජීවීන් විශේෂ විවිධත්වයෙන් හා සංඛ්‍යාවෙන් අඩු වීම පරිසර පද්ධතිවල පැවැත්මට හානිදායක වන අතර ජීවි විශේෂ නෂ්ට ප්‍රාප්තියට *(extinction)* ද හේතු වෙයි. එමඟින් පරිසර පද්ධතිවල හිටි හැටියේ ආපසු හැරවිය නො හැකි අන්දමේ වෙනස් වීම් ඇතිවීමේ අනතුර වැඩි කරමින් ප්‍රත්‍යස්ථිතිය *(resilience)* අඩු කරමින් ආහාර, ඉන්ධන, තන්තු ලබා දීමට සහ ජීවීන් ප්‍රවර්තනය *(sustain)* කිරීමට ඒවාට ඇති හැකියාව අවිනිශ්චිත කරවයි.

**වායු දූෂණය** *(Air pollution);* වාතයට නිකුත් වන එයරොසොල් *(aerosol)* හෙවත් දුම්, දූවිලි, දූෂණකාරක ගෑස් වැනි ක්ෂුද්‍ර අංශුවලට ජීවීන්ට හානි කළ හැකි ය. ඒ හැර මෙකී ක්ෂුද්‍ර අංශු වාතයේ ඇති ජල වාෂ්ප සමඟ ප්‍රතික්‍රියා කිරීම නිසා වලාකුළු ජනනය වීමෙහි ලා බලපෑම් කරයි. විශාල

පරිමාවලින් නිකුත් වන විට මෙම එයරොසොල්වලට සර්ම කලාපයේ මෝසම් වැසි පතිත වන ප්‍රදේශ පමණක් නො ව කාල වකවානු පවා වෙනස් කරමින් කලාපීය වර්ෂාපතන රටා වන්ට සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති කළ හැකි ය.

**ඕසෝන් ස්තරය ක්ෂය වීම** *(Ozone layer depletion);* සූර්යයාගේ සිට පොළොව දෙසට එන පාරජම්බුල කිරණ පෙරා හරින්නේ වායුගෝලීය ස්ට්‍රැටොෂ්පියරය හෙවත් ස්තර ගෝලයේ පිහිටා ඇති ඕසෝන් වායු ස්තරය මගිනි. මිනිසුන් විසින් සාදනු ලබන සසස හෙවත් ක්ලෝරොෆ්ලූරොකාබන් නමැති රසායනය වායු ගෝලයට මුදා හැරිය විට ස්ට්‍රැටොෂ්පියරයේ පිහිටි ඕසෝන් ස්තරය ක්ෂය වීමට එය බලපායි. එවිට පෘථිවිය මත වෙසෙන මිනිසුන් ඇතුළු සියලු ජීවීන් සූර්යයාගේ හානිකර පාරජම්බුල කිරණවලට නිරාවරණය වෙයි.

වසර දහස් ගණනක් තිස්සේ මනුෂ්‍යයන්ගේ අභිවෘද්ධියට හේතුවන ලෙස ස්ථායී ව පැවතුණ තීරණාත්මක ක්‍රියාවලි නවයක් ඉහත කී අන්දමට හානි දායක ලෙස වෙනස් විය. ජීවීන්ගේ පැවැත්ම දැඩි ලෙස අනතුරට ලක් කිරීමට නම් ඉහත කී එක් එක් ක්‍රියාවලිය මත කොතරම් පීඩනයක් පැටවීමට සිදුවේ ද යන්න ජෝන් රොක්ස්ට්‍රොම් සහ විල් ස්ටෙෆාන් ප්‍රමුඛ විද්‍යාඥයින්ගේ විමසිල්ලට ලක් විය. එහෙත් ඒ වන විටත් එක් එක් ක්‍රියාවලිය තුළ සිදුවී ඇති වෙනස් වීම් බොහොමයක් ආපසු හැරවිය නො හැකි ඒවා වී ඇති බැවින් ප්‍රශ්නය වූයේ අනතුර ඇත්තේ ක්‍රියාවලියේ කොතැන දැ'යි නිශ්චයට ම දැන ගැනීමට අපහසු වීමයි. කෙසේ වෙතත් අත්දැකීමෙන් ම එය හඳුනා ගැනීමට ඉඩ දීම ද නුවණක්කාර වැඩක් නො වේ. එනිසා එම ක්‍රියාවලි නවයේ අවදානම් කලාපවලට එළඹීමට පෙර ඒ ගැන අනතුරු හඟවන සීමා සලකුණු සටහන් කර තැබීම වැදගත් යැ'යි ඔවුහු කල්පනා කළහ. එය හරියට ම ගඟක උඩුගම් බලා යාත්‍රා කරන

කෙනෙකුට දිය සුළි සහිත අවදානම් කලාප ගැන කල් තියා අනතුරු හඟවන දැන්වීම් පුවරුවක් පිහිටුවනවා වැනි ය.

එම අනතුරු සංඥාවලින් කියන්නේ මොනවා ද? දේශගුණ විපර්යාසය අනතුරුදායක මට්ටමට එළඹීම වැළැක්වීමට නම් වායුගෝලීය සංයුතියේ සෑම කොටස් මිලියනයකට ම කාබන් ඩයොක්සයිඩ් කොටස් 350 ක උපරිම සීමාව නො ඉක්මවීමට කටයුතු කළ යුතු බව ඉන් එක් අනතුරු සංඥාවකි. භූමියේ ස්වභාවය පරිවර්තනය වන කටයුතු කිරීමේ උපරිම සීමාව ලෙස අවම වසයෙන් සමස්ත ගෝලීය භූමි ප්‍රමාණයෙන් 75%ක් වනගහණ වසයෙන් පවත්වා ගෙන යෑමට වග බලා ගත යුතු බව තවත් එක් සංඥාවකි. කෙසේ වෙතත් කලාපීය වසයෙන් ගත් විට මේ උපරිම සීමාවන් සැලකීම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්වයන් තිබිය හැකි ය. එහෙත් හරය වසයෙන් ගත් විට අප ඇන්ත්‍රොපසීන් යුගයේ සිටියත් ඉහත සඳහන් කළ පෘථිවි ග්‍රහ සීමා *(planetary ceilings)* නවයට ගරු කිරීම හොලෝසීන අවධියේ පැවති අභිවෘද්ධි දායක තත්වය අත් නො හැර සිටීමේ හැකියාව පිළිබඳ හොඳ ම සහතිකය ලෙස සැලකිය හැකි ය. රේවර්ත්ගේ ඩෝනට් ආර්ථික මොඩලයේ හුවා දැක්වෙන පාරිසරික සීමාවලින් නිරූපණය වන්නේ මේ කියන පෘථිවි ග්‍රහ සීමාවන් හෙවත් ව්‍යසනයකට තුඩු නො දෙන මට්ටමට පෘථිවියට දරා ගත හැකි පාරිසරික සීමා ය. අපේ නිවහන වන පෘථිවියේ ස්ථාවර භාවය ආරක්ෂා කර ගැනීමට නම් මෙකී සීමා ඉක්මවා යන පීඩනයක් තවදුරටත් මේ ග්‍රහලෝකය මත නො පැටවිය යුතු ය.

කේට් රේවර්ත්ගේ ඩෝනට් ආර්ථික රූපාදර්ශයේ අභ්‍යන්තර හා බාහිර වළලු පිළිවෙළින් සමන්විත වන්නේ මානව අයිතීන් පිළිබඳ සමාජ පදනම සහ උපරිම ග්‍රහ පාරිසරික සීමා මායිම් නියෝජනය වන වළලු දෙකෙනි. ඒ දෙක ම ගැඹුරු ලෙස අන්‍යෝන්‍ය වසයෙන් සම්බන්ධ ය. එම සීමා වළලු දෙක සම්බන්ධ කරුණු අතර ඇති සහසම්බන්ධය විමසා බැලූ විට මෙය මනාව තේරුම් ගත හැකි ය.

උදාහරණයක් ලෙස කඳු බෑවුම්වල ඇති වනගහණ එළි කිරීම සලකා බලමු. මෙහි දී භූමියේ ස්වභාවය පරිවර්තනයට ලක් වීම ජෛව විවිධත්වයට හානිදායක වන අතර වායුගෝලයේ ඇති ජල වාෂ්ප වනගහනය තුළ ඝනීභවනය වීමෙන් ඇතිවිය යුතු මිරිදිය ජල චක්‍රය ද දුර්වල කරමින් දේශගුණ විපර්යාසකාරකයක් බවට පත් වෙයි. මෙසේ එක තැනක වනගහනය විනාශ වීම යනු ඉතිරිව ඇති වනගහනවලට පැටවෙන පීඩනය ද වැඩි කිරීමකි. වනගහන විනාශය නිසා ජල චක්‍ර දුර්වල වීම අසල්වැසි ප්‍රජා සමූහවල ආහාර නිෂ්පාදන කටයුතුවලට, පානීය ජල සැපයුමට මෙන් ම සනීපාරක්ෂාවට ද සැලකිය යුතු බලපෑමක් කරයි.

අනෙක් අතට මෙවැනි හානි ප්‍රතිවිරුද්ධ අතට හැරවීම ද මානව ක්‍රියාකාරකම් මඟින් ම ඉටු කළ හැකි ය. උදාහරණයක් ලෙස පැළ සිටවීම මඟින් වනය නැවත ප්‍රතිෂ්ඨාපනය කළ විට ජෛව විවිධත්වය ද ප්‍රතිෂ්ඨාපනය වී පසෙහි සශ්‍රීකත්වය හා ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි වෙයි. ඒ අනුව ශාක මඟින් කාබන් ඩයොක්සයිඩ් සහ පාංශුවල ඇති ක්ෂුද්‍ර ජීවීන් මඟින් කාබන් ජීර්ණය කිරීම ද වැඩි කරවයි. එපමණක් නො ව යළි වගා වෙන වනය නිසා අසල්වැසි ප්‍රජාවගේ භවභෝග සහ පරිභෝජනය සඳහා අවශ්‍ය ජල සැපයුම ද වනඵල නෙලා ගැනීම ද ප්‍රතිෂ්ඨාපනය වෙයි.[253]

එහෙත් සරල එළඹුමක් ලෙස පෘථිවි ග්‍රහ මායිම් උල්ලංඝනය වීම වැළැක්වීම සහ සමාජ පදනම සුරක්ෂිත කිරීම පිණිස එක් එක් පාරිසරික සීමා පිළිබඳ වෙනස් වෙනස් ප්‍රතිපත්ති සැකසීමට ඇති පෙලඹීමෙන් අප මිදිය යුතු ය. ඒ වෙනුවට පාරිසරික සීමා සහ සමාජ පදනම හා ඇති සහසම්බන්ධය ද සමස්තයක් ලෙස ගෙන ඒ හැම ප්‍රශ්නයක් ම ඒකාග්‍ර වූ සංකීර්ණ පද්ධතියක ඇති ගැටලු ලෙස සලකා ප්‍රතිපත්තිමය විසඳුම් සකස් කළ යුතු ය.

ඩෝනට් ආර්ථික මොඩලය සිසාරා නිරූපණය වන බොහෝ අන්තර් සම්බන්ධකම් සලකා බැලූ විට මානව වර්ගයාගේ අභිවෘද්ධිය

253 Folke, C. et al. (2011) 'Reconnecting to the biosphere', AMBIO 40, p. 719.

පෘථිවියේ යහ පැවැත්ම හා එකට බැඳී ඇති බව පෙනේ. හැම දෙනෙකුට ම සෑහෙන පෝෂ්‍යදායක ආහාර වර්ග වගා කිරීමට පෝෂකවලින් පොහොසත් සරු පසක්, ඇති තරම් ජලය, ජෛව විවිධත්වයෙන් යුතු භෝග වර්ග සහ ස්ථාවර දේශගුණයක් අවශ්‍යය වේ. බීම සඳහා පිරිසිදු ජලය ලබා ගැනීම රඳා පවතින්නේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් සමඟ ගංගා සහ භූජලධරය *(aquifers)* පෝෂණය කරන දේශීය හා ගෝලීය ජල චක්‍රය මතය. ජීවත් වීමට අවශ්‍ය හුස්ම ගැනීම යනු පෙනහලු ආසාදනය කරන විෂාංශුවලින් තොර පිරිසිදු වාතය සහිත වායුගෝලයක පැවැත්ම සහතික කිරීමකි. හිරුගේ කිරණවල උණුසුම ආපදාවකින් තොර ව විඳ ගැනීමට අපට හැකි වන්නේ ඕසෝන් ස්තරය මඟින් හිරුගෙන් එන පාරජම්බුල කිරණ අවහිර කළොත් සහ වායුගෝලයේ ඇති හරිතාගාර වායු සංයුතිය වැඩි වීම නිසා හිරු රස්නය විනාශකාරී ගෝලීය උණුසුමක් බවට පත් නො කළොත් පමණි.

විසි එක් වැනි සියවසේ අපට ඇති අභියෝගය වන්නේ කේට් රේවර්ත්ගේ ඩෝනට් රූපාදර්ශයේ අභ්‍යන්තර හා බාහිර වළලු අතර ඇති සුරක්ෂිත යුක්තිගරුක ප්‍රදේශයට මාරු වීම යි. එසේ නම් ඇසිය යුතු වැදගත් ප්‍රශ්නය වන්නේ දැන් අප කරන කටයුතු එයට සැබැවින් ම දායක වන්නේ ද යන්න යි. පෘථිවි විද්‍යාව මෙන් ම මානව හිමිකම් පිළිබඳ දත්ත පිළියෙළ කිරීම සම්බන්ධයෙන් ලබා ඇති දියුණුවට පින් සිදු වන්නට අන් කවර කලකටත් වඩා ඒ සම්බන්ධයෙන් පැහැදිලි චිත්‍රයක් ලබාගැනීමට දැන් අපට හැකි ව තිබේ. ඒ අනුව පසුගිය 70 වසර තුළ මානව සුභසාධනය සම්බන්ධයෙන් කොයි තරම් දියුණුවක් ලබා තිබුණත් අපි දැනටමත් රේවර්ත්ගේ ඩෝනට් රූපාදර්ශයේ දෙපැත්තේ ම ඇති සීමා මායිම් ඉක්මවා බොහෝ දුර ගොස් ඇත්තෙමු.

**චක්‍රීය ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ ඩෝනට් මොඩලය**




ඩෝනට් ආර්ථික මොඩලය - රේවර්ත්ගේ *Doughnut Economics* කෘතිය අනුව

ඩෝනට් රූපාදර්ශයේ සමාජ පදනම නිරූපණය වන ඇතුළත වළල්ල තුළ පෙන්වා ඇති එක් එක් මාන සම්බන්ධයෙන් බැලූ විට ජනගහනයෙන් මිලියන ගණනාවක් තව මත් ජීවත් වන්නේ එකී අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරා ගැනීමේ ලා සම්මත ප්‍රමිතිවලට වඩා බෙහෙවින් පහළින් අගහිඟකම්වලින් මිරිකෙමිනි. උදාහරණයක් ලෙස ලොව පුරා හැම නව දෙනෙකුගෙන් ම එක් අයෙකුට තවමත් දෛනික ව ප්‍රමාණවත් ආහාරයක් ලබා ගැනීම අසීරු කරුණක් වී තිබේ. හැම සිව් දෙනෙකුගෙන් ම එක් අයෙකුට ජීවත් වීමට සිදු ව ඇත්තේ දිනකට ඩොලර් 3 *(*රු. 600/-*)* කට අඩු ආදායමකිනි. එමෙන් ම

තරුණ අය අතරින් හැම අට දෙනෙකුගෙන් එක් අයෙකුට කුලියක් හෝ වැටුපක් හෝ උපයා ගත හැකි වැඩක් සොයා ගැනීම අසීරු වී තිබේ. හැම තුන් දෙනෙකුගෙන් ම එක් අයෙකුට සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් නැති අතර හැම එකොළොස් දෙනෙකුගෙන් එක් අයෙකුට පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ හැකියාවක් නැත. වයස 12ත් 15ත් අතර පාසල් යා යුතු දරුවන් හය දෙනෙකු අතරින් එක් අයකු පාසල් නො යන අතර ඉන් බහුතරයක් ගැහැනු දරුවෝ වෙති. ලෝක ජනගහනයෙන් 40% ක් ම ජීවත් වන්නේ ආදායම් විෂමතා වැඩියෙන් ම ඇති රටවල යි. ඒ අතර ලෝක ජනගහනයෙන් හරි අඩක් ජීවත් වන්නේ දේශපාලන හඬක් නැගීමට පොදු ජනතාවට අවස්ථාවක් නො දෙන රටවල ය. ජීවිතයක් පරිපූර්ණ ලෙස විඳ ගැනීමට සපුරා ගත යුතු මෙකී අවශ්‍යතා විසි එක් වැනි සියවසේ දී පවා මේ සා විශාල ලෝකවාසීන් පිරිසකට අහිමි ව තිබීම මොන තරම් ඛේදවාචකයක් ද?.

ඒ සමඟ ම මිනිසුන් විසින් මහ පොළොවේ ජීවදාන පද්ධතියට මින් පෙර නො වූ විරූ අන්දමේ ආතතියක් ඇති කර තිබේ. ඇත්ත වසයෙන් ම මේ වන විටත් අපි දේශගුණ විපර්යාසය, භූමි පරිවර්තනය, නයිට්‍රජන් සහ පොස්ෆරස් දරා ගැනීම සහ ජෛව විවිධත්වයට හානි පැමිණීම යන සිව් ක්ෂේත්‍රවල පෘථිවි ග්‍රහ ධාරිතා සීමා මායිම් *(planetary boundaries)* අතික්‍රමණය කර තිබේ. අපේ කටයුතු නිසා වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණය ද එහි වායුගෝලීය කොටස් මිලියනයකට තිබිය යුතු සීමාව වන කොටස් 350 ඉක්මවා ගොස් තිබේ. 2020 දී එය කොටස් 412.5ක් දක්වා වැඩි විය. ඒ අනුව අප වඩ වඩා රස්නය සහ වියලි බව ඇති අහිතකර දේශගුණයක් කරා යොමු කරවමින් ගෝලීය උෂ්ණත්වය තව තවත් ඉහළ නගිමින් තිබේ. ඒ සමඟ ලොව පුරා දූපත් සහ වෙරළ බද නගරවල පැවැත්මට තර්ජනයක් වන අන්දමින් සාගර ජල මට්ටම ද තව තවත් ඉහළ යමින් පවතී. තවත් අතකින් අධික රසායනික පොහොර භාවිතය නිසා මහ පොළොවේ පසට ආරක්ෂාකාරී ව දැරිය හැකි ප්‍රමාණයට වඩා දෙගුණයක නයිට්‍රජන් සහ පොස්ෆරස් අප විසින් එකතු කර

තිබේ. එමඟින් ජලයට එක් වන විෂ රසායනික ද්‍රව්‍ය නිසා බොහෝ ජලාශ, ගංගා සහ සාගරවල ජලජ ජීවිතය කඩා වැටී ඇත. ඇතැම් සාගර කලාපවල මේ කඩා වැටීම මෙක්සිකෝ බොක්ක තරම් විශාල ප්‍රදේශයක් පුරා පැතිරී තිබේ. වනාන්තර පිළිබඳ ව සලකා බැලුවොත් ලොව පුරා දැනට ඉතිරි ව ඇති වනාන්තර ප්‍රමාණය වනාන්තර වසයෙන් ඇත්ත වසයෙන් ම පැවතිය හැකි බිම් ප්‍රමාණයෙන් 62% ක් පමණි. එය ද නිතිපතා අඩු වෙමින් කාබන් අවශෝෂණය කිරීමට පෘථිවියට ඇති හැකියාව තව තවත් දුර්වල කර දමයි.

ජෛව විවිධත්වයට ඇති ව තිබෙන හානිය ද අතිවිශාල ය. පෘථිවියේ ප්‍රවේසම් සහගත ග්‍රහ *(planetary)* ධාරිතා සීමා මායිම් ඉක්මවා දස ගුණයක වේගයෙන් පෘථිවියේ ජීවි විශේෂ වඳ වී යයි. 1970 - 2016 ත් අතර සිට ලොව පුරා ම සිව්පා, පක්ෂි, උරග, උභයජීවී සහ මත්ස්‍ය විශේෂවල ජනගහනය 68% කින් අඩු වී තිබෙන අතර ඇතැම් කලාපවල එම අඩු වීම 73% කි.[254] ලෝක මට්ටමින් ඇති ව තිබෙන රසායනික දූෂණය තවමත් ප්‍රමාණාත්මක වසයෙන් හරියට ම ගණන් බලා නැති නමුත් එහි බලපෑම විද්‍යාඥයන්ගේ දැඩි කනස්සල්ලට හේතු වී තිබේ. තීරණාත්මක පෘථිවි පද්ධති ක්‍රියාකාරකම් මත මනුෂ්‍යයන් විසින් ඇති කර තිබෙන පීඩනය නිසා වැඩි වන මිරිදිය ජල භාවිතය සහ සාගර ආම්ලීකරණය පෘථිවි ග්‍රහ ධාරිතා මට්ටමේ කලාපීය අර්බුද හා අනතුරු ඇති වීම දක්වා තීව්‍ර විය හැකි ය.

21 වැනි සිය වසේ මුල දී මනුෂ්‍ය වර්ගයා සහ අපේ පෘථිවි ග්‍රහ නිවහන පිළිබඳ ඉහත විස්තර කළ අඳුරු පින්තූරය මෙතෙක් අප අනුගමනය කර ඇති ගෝලීය ආර්ථික සංවර්ධන පිළිවෙතට එරෙහි ව අධි චෝදනා පත්‍රයක් ලෙස සැලකිය යුතු ය. ලෝක වාසීන් බිලියන ගණනකට තම මූලික අවශ්‍යතා තවමත් සපුරා ගැනීමට නො හැකි ව සිටිය දී පෘථිවියේ අභිවෘද්ධි දායක ස්ථාවරභාවය උවදුරට ලක් කරමින් දැනට මත් අපි ගෝලීය පාරිසරික අනතුරු කලාපයට අවතීර්ණ වී සිටිමු. මේ සන්දර්භය තුළ ප්‍රගතිය යන්න කෙබඳු ස්වරූපයක් ගත හැකි ද?

254 WWF (2020) Living Planet Report. Gland: WWF International. Gland

## ඩෝනට් අන්තර්කලාපය තුළ අපට විසීමට හැකි වෙයි ද?

කේට් රේවර්ත්ගේ ඩෝනට් ආර්ථික මොඩලය අපට 21 වැනි සියවසට ඔබින කදි ම මග පෙන්වීමක් කරන නමුත් එම රූපාදර්ශයේ සීමා වළලු දෙක අතර කලාපයෙන් පෙන්නුම් කරන සුරක්ෂිත සහ යුක්තිය ඉටු කෙරෙන අවකාශය අත්පත් කර ගැනීමට ඇත්තට ම අපට හැකි වේද නැද්ද යන්න තීරණය කරන සාධක මොනවා ද? මේ සම්බන්ධයෙන් සාධක පහක් වැදගත් වන බව කේට් රේවර්ත් පෙන්වා දෙයි. ඒවා නම් ජනගහනය *(population)*, ප්‍රතිලාභ විභජනය *(distribution)* හෙවත් බෙදාහැරීම, අභිලාෂය *(aspiration)*, තාක්ෂණය *(technology)* සහ ආණ්ඩුකරණය යි *(governance)*,

ජනගහනයේ ප්‍රමාණය පැහැදිලිව ම වැදගත් සාධකයකි. වැඩිවන ජනගහනයක අවශ්‍යතා සහ අයිතීන් සාක්ෂාත් කිරීම පිණිස වැඩි වැඩියෙන් සම්පත් අවශ්‍ය වන වෙන බැවින් මානව ජනගහනයේ ප්‍රමාණය ස්ථාවරව පවත්වා ගෙන යෑම අවශ්‍යතම කාරණයකි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් සතුටු විය හැකි කාරණය වන්නේ ගෝලීය ජනගහනය තව මත් වැඩි වෙමින් පවතින නමුත් 1971 සිට ජනගහන වර්ධන වේගය ශීඝ්‍රයෙන් පහළ යමින් තිබීම යි. අනෙක ඉතිහාසයේ ප්‍රථම වරට මේ පහළ බැසීම සිදුවී ඇත්තේ සාගතයක්, වසංගතයක් හෝ යුද්ධයක් නිසා නො ව දශක ගණනාවක් තිස්සේ පොදු අංශයේ ආයෝජන නිසා  වැඩි දියුණු වූ ළදරු සහ ළමා සෞඛ්‍යය, ගැහැණු දරුවන්ගේ  අධ්‍යාපනය හා ස්ත්‍රීන්ගේ ප්‍රජනන සෞඛ්‍යය නිසා සිය පවුලේ දරු උපත් ප්‍රමාණය තීරණය කිරීමට ස්ත්‍රීන්ට හැකි වීම නිසාය. ඩෝනට් ආර්ථික මොඩලයට අනුව බලන විට පණිවිඩය පැහැදිලි ය. මානව ජනගහනය ස්ථාවර ව පවත්වා ගැනීමට හැකි හොඳ ම ක්‍රමය වන්නේ හැම කෙනෙකුට ම ඩෝනට් මොඩලයේ සමාජ පදනම සහ පාරිසරික සීමාව නිරූපණය වන වළලු අතර පිහිටි සුරක්ෂිත සහ යුක්තිගරුක කලාපයට පිවිස අගහිගයකින් තොර ජීවිතයක් ගත කළ හැකි නම් ය.

ජනගහනය වැදගත් නම් ආදායම් බෙදාහැරීම හෙවත් විභජනය *(distribution)* ද ඒ සම ව වැදගත් ය. මන්ද අත්‍යන්ත අසමානතා

විසින් ඩෝනට් ආකෘතියේ දෙපැත්තේ ම සීමා මායිම්වලින් ඔබ්බට මනුෂ්‍යත්වය තල්ලු කර දමනු ලබන බැවිනි. ගෝලීය ආදායම් විෂමතාවය නිසා ගෝලීය හරිතාගාර වායු විමෝචනය සම්බන්ධ වග කීම ද අවුල් වී ඇත. හැම මහාද්වීපයක ම වැඩියෙන් ම කාබන් ඩයොක්සයිඩ් විමෝචනය කරන 10% මුළු කාබන් ප්‍රමාණයෙන් 45% ක් විමෝචනය කරන අතර අඩුවෙන් ම විමෝචනය කරන 50% නිසා වායු ගෝලයට එක් වන්නේ 13% ක කාබන් ප්‍රමාණයක් පමණි. ආහාර පරිභෝජනය පිළිබඳ දත්ත ද එවැනි අසාමාන්‍ය ස්වරූපයක් ගනී. ඒ අනුව ලෝක ජනගහනයෙන් 13%ක් මන්දපෝෂණයෙන් පෙළෙති. එහෙත් ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතාවලට සරිලන ආහාර සපයා ගැනීමට වැය වන්නේ ලෝක ආහාර නිෂ්පාදනයෙන් 3% ක් පමණි. එය තවදුරටත් විමසා බැලුවොත් ගෝලීය ආහාර නිෂ්පාදනයෙන් 30%-50% අතර සැලකිය යුතු ආහාර ප්‍රමාණයක් පශ්චාත් නිෂ්පාදන කටයුතුවල දී, ගෝලීය සැපයීම් දාමවල දී ද, පිඟන් සෝදන තැන්වල සහ මුළුතැන්ගෙවල්වල ඉඳුල් ලෙස ද අපතේ යයි.

බ්‍රිතාන්‍යයේ පාන් නිෂ්පාදනයෙන් පාන් ගෙඩි මිලියනයක් හෙවත් පාන් පෙති මිලියන 24ක් දිනපතා අපතේ යන බව එහි ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලය[255] වාර්තා කරන අතර එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු සංඛ්‍යාලේඛනවලට අනුව සමස්ත ආහාර නිෂ්පාදනයෙන් 30%-40% ප්‍රමාණයක් අපතේ යයි.[256]

ගෝලීය වසයෙන් නිපදවෙන මුලු ආහාර ප්‍රමාණයෙන් කිසි ම විටක කෑමට නො ගන්නා 10%කින් ලොව පුරා සාගින්න සහමුලින්ම අවසන් කර දැමිය හැකි ය. මේ උදාහරණවලින් පැහැදිලි වන්නේ ඩෝනට් ආර්ථික ආකෘතියට පිවිසීම යනු මනුෂ්‍යයා විසින් සම්පත් උපයෝගී කර ගැනීම වඩ වඩා සාධාරණ ලෙස සිදු කළ යුතු බව යි.

තුන් වැනි සාධකය අභිලාෂය යි. එනම් හොඳ ජීවිතයකට අවශ්‍ය යැයි මිනිසුන් අපේක්ෂා  කරන කුඩු මහත් දේවල් ය. අපේ අභිලාෂ

255 https://www.theguardian.com/environment/2015/sep/22/one-in-five-uk-households-dump-a-loaf-of-bread-in-the-bin-survey-reveals - Retrieved on 21 July 2021

256 https://www.usda.gov/foodwaste/faqs - Retrieved on 21 July 2021

කෙරෙහි වැඩි ම වසයෙන් බලපාන්නේ අප කෙසේ කොතැනක ජීවත් වෙන්නේ ද යන කාරණ යි. වසර 2009 වන විට ප්‍රථම වරට ලෝක ජනගහනයෙන් අඩකට වඩා වාසභූමිය කර ගෙන තිබුණේ නගර හෝ සුළු නගර යි. 2050 වන විට මේ නාගරිකයන්ගේ ප්‍රමාණය මුළු ලෝක ජනගහනයෙන් 70%ක් පමණ වීමට නියමිත ය. තමා අවට වෙසෙන්නන්ගේ උජාරු පාරිභෝගික අනුහස මෙන් ම සුවිසල් දැන්වීම් පුවරුවල දිදුලන පින්තූරවලින් කියැවෙන පරිදි හොඳ නාගරික ජීවිතයක් යනු තවත් මිල දී ගැනීමක්, වඩා වේගයෙන් යන මෝටර් රථයක්, වඩා සිහින් ලැප්ටොප් පරිගණකයක් සහ උන්මාද ජනක නවීනතම ඉලෙක්ට්‍රොනික මෙවලමක් අත්පත් කර ගැනීමට ඇති හැකියාව යි. ආර්ථික විද්‍යාඥ ටිම් ජැක්සන්ගේ හුරුබුහුටි වචනවලින් කිව්වොත් එය 'අප විසින් සැකිල්ලකට නො ගන්නා මිනිසුන් තුළ වැඩි කලක් නො පවතින අපට අත්‍යාවශ්‍ය නො වන ප්‍රතිරූපයක් ගොඩ නගා ගැනීම පිණිස අපට අවශ්‍ය නො වන මෙවලමක් සඳහා අනවශ්‍ය වියදමක් කිරීමට අප මෙහෙයවනු ලබයි. ගෝලීය මධ්‍යම පන්තිය වේගයෙන් වැඩි වෙමින් යන බැවින් මධ්‍යම පාන්තිකයන්ගේ අභිලාෂය බවට පත් වන ජීවන රටාව පෘථිවි ගෝලයේ ග්‍රහ ධාරිතා මායිම් හා සීමා *(planetary ceilings)* සම්බන්ධයෙන් ඔවුන් විසින් පටවනු ලබන පීඩනයේ ප්‍රමාණය තීරණය කරයි.

නාගරීකරණය මඟින් පරිභෝජනවාදය උත්සන්න කරනවා විය හැකි නමුත් එමඟින් නිවාස, ප්‍රවාහන කටයුතු, ජල පහසුකම්, සනීපාරක්ෂාව, ආහාර සහ බලශක්තිය වැනි බොහෝ මහජන අවශ්‍යතා වඩා කාර්යක්ෂම ලෙස සාක්ෂාත් කර ගැනීමේ අවස්ථාවක් ද උදා කරවයි. වසර 2030 වන විට ලොව පුරා නාගරීකරණයට ලක් වනු ඇතැ'යි ගණන් බලා ඇති භූමි ප්‍රමාණයෙන් 60%ක් තව මත් සූදානම් කොට නො මැති බැවින් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඉදි කිරීමේ දී යොදා ගනු ලබන විසඳුම් බෙහෙවින් දුරදිග යන සමාජීය සහ පාරිසරික බලපෑම්වලට හේතු වනු ඇත. එනිසා නගර මංමාවත්වල තදබද වන පුද්ගලික මෝටර් රිය පෝලිම් වෙනුවට වේගවත් සහ මිල පහසු පොදු ප්‍රවාහන සේවාවක් මඟින්

එම සේවාව ඉටු කිරීමට නව ප්‍රවාහන පද්ධති සැලසුම් කළ හැකි ද ෆොසිල ඉන්ධන මඟින් බලශක්තිය ඉපදවීම වෙනුවට ගොඩනැගිලි වහල මත ඇති සූර්ය පුවරු ජාලයකට නගරයට විදුලිය සැපයීමට හැකි වන ලෙස නූතන නාගරික බලශක්ති ක්‍රම සැලසුම් කළ හැකි ද නගරයේ ගොඩනැගිලි ඉබේ උණුසුම සහ සිසිලකරණය සිදු වන අන්දමට සැලසුම් කළ හැකි ද වැඩි කාබන් ප්‍රමාණයක් පොළොවට අවශෝෂණය කර ගත හැකි ක්‍රමවලින් නගරයට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවා ගත හැකි ද සහ ප්‍රමාණවත් විවේකයක් ලැබිය හැකි හොඳ රැකියා ද ඇති කළ හැකි ද වැනි ප්‍රශ්න වලට කාර්යසාධක පිළිතුරු සෙවීමට සිදු වනු ඇත. ඒවායින් බොහෝමයක් නගර ඉදිකිරීම සහ පවත්වා ගැනීම සඳහා යොදා ගන්නා නව තාක්ෂණික විසඳුම් මෙන්ම නාගරික දේශපාලනයේ සුසමාදර්ශීය වෙනසක් අනුව සිදුවිය හැකි දේවල් ය.

ඒ නිසා ග්‍රාමීය හා නාගරික මට්ටමේ සිට කලාපීය සහ ගෝලීය මට්ටම දක්වා ආණ්ඩුකරණයේ ස්වභාවය ද මෙහි දී අතිශය වැදගත් සාධකයකි. අප මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සුදුසු ආණ්ඩුකරණයක් සැලසුම් කිරීමේ දී රටවල්, කෝපරේට් සමාගම් සහ ප්‍රජා කණ්ඩායම් තුළ දිගු කලක සිට පවතින ළැදියා සහ බලාපොරොත්තු හා ගැටෙන දේශපාලන ගැටලුවලට අභිමුඛ වීමට අපට සිදු වනු ඇත. උදාහරණයක් ලෙස පෘථිවි ග්‍රහ ධාරිතා සීමා මායිම් මත මනුෂ්‍යයන් විසින් පටවා ඇති පීඩනය කලාපීය හා ජාතික මට්ටම්වල දී ඇති කර තිබෙන අනිසි ඵල විපාකවල වගකීම පෘථුල ලෙස බෙදා ගැනීමට හැකි වන අන්දමේ ගෝලීය ආණ්ඩුකරණ ව්‍යුහයක් අද අපට අවශ්‍යය.

රේවර්ත් පෙන්වා දෙන අන්දමට අවශ්‍ය කරන දත්ත එක් රැස් කිරීමේ හැකියාව පුළුල් වීමත් සමඟ ඩෝනට් ආකෘතියේ ඇති මිණුම්වලට අනුව අප කටයුතු කරන්නේ ද යන බව සැලකිය යුතු තරම් නිවැරදි ලෙස සොයා ගැනීම අපහසු නො වේ. සමාජ පදනම සම්බන්ධ බොහෝ දේවල දියුණුවක් දක්නට ලැබෙන අතර බොහෝ දුරට ඒ සම්බන්ධ අවක්‍රමණයක් ඇතිවීම වළක්වා ගැනීමට අපට හැකි

ව තිබෙන්නට පුළුවන. එහෙත් පාරිසරික කටයුතු සම්බන්ධ ග්‍රහ ධාරිතා සීමාවන් ඉක්මවා කටයුතු කිරීමට අප පෙලඹී තිබීම අකටයුත්තක් බව වටහා ගත යුතු ව ඇත.

විසි එක්වැනි සියවසට ඔබින ආර්ථික විද්‍යාඥයෙකු මෙන් සිතීමට නම් පැරණි ආර්ථික චින්තනයේ සිට නව ආර්ථික චින්තනයකට මාරු වීමට සිදු වේ. ඒ සඳහා කේට්ගේ ඩෝනට් ආර්ථික විද්‍යාව මඟින් යෝජනා කරන සප්තාංගික මාර්ග මෙසේ යිඃ

| **නව ආර්ථික චින්තනයක් කරා සප්තාංගික මාර්ග** | **20 වැනි සියවසේ පැරණි ආර්ථික විද්‍යාව** | **21 වැනි සියවසේ ආර්ථික විද්‍යාව** |
|---|---|---|
| 1. අභිමතාර්ථය වෙනස් කර ගනිමු *(Change the Goal)* | දළ දේශීය නිෂ්පාදිත වර්ධන ආර්ථිකය *(GDP)* | ඩෝනට් ආර්ථිකය *The doughnut economy* |
| 2. සමස්ත පින්තූරය දෙස බලමු *(See the big picture)* | ස්වයං පූර්ණ වෙළඳපොළ *(Self-contained market)* | අන්තරීකෘත වෙළඳපොළ *(Embedded Market)* |
| 3. මනුස්සකම පෝෂණය කරමු *(nurture the human nature)* | යථාවාදී ආර්ථික මිනිසා *(rational economic man)* | සමාජ අනුවර්තනීය මනුෂ්‍යයා. *(Social adaptable human)* |
| 4. පද්ධතික චින්තනය ගැන සුහුරු වෙමු *(get savvy with systems)* | යාන්ත්‍රික සමතුලිත බව *(mechanical equilibrium)* | ගතික සංකීර්ණත්වය *(Dynamic complexity)* |
| 5. විසරිත කිරීමට සැලසුම් කරමු *(design to distribute)* | වර්ධනය මඟින් ම අසමානතා යළි සමපාත වෙතැ'යි විශ්වාසය *(growth will even it up again)* | ප්‍රතිලාභ බෙදී යෑම ආර්ථික සැලසුම මඟින් ම සහතික කිරීම *(Distributive by design)* |

චක්‍රීය ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත්ගේ ඩෝනට් මොඩලය

| නව ආර්ථික චින්තනයක් කරා සප්තාංගික මාර්ග | 20 වැනි සියවසේ පැරණි ආර්ථික විද්‍යාව | 21 වැනි සියවසේ ආර්ථික විද්‍යාව |
|---|---|---|
| 6. ප්‍රතිජනනය සඳහා නිර්මාණය කරමු *(create to regenerate)* | අපිරිසිදු වීම වර්ධනය මඟින් ම පිරිසිදු කරනු ඇත *(Growth will clean it up again)* | ප්‍රතිජනනය ආර්ථික සැලැස්ම මඟින්ම සහතික කිරීම *(regenerative by design)* |
| 7. වර්ධනය ගැන අඥෙයවාදී වෙමු *(be agnostic about growth)* | වර්ධන ලෝලී *(Growth addicted)* | වර්ධන අඥෙයයි *(Growth agnostic)* |

පළමුවෙන් ම අපේ මූලික අභිමතාර්ථය නොහොත් අරමුණ වෙනස් කර ගනිමු. අවුරුදු හැත්තෑවකට අධික කාලයක් තිස්සේ ආර්ථික විද්‍යාඥයෝ *GDP* හෙවත් දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීම ප්‍රගතියේ මූලික මිම්ම ලෙස සැලකූහ. මෙසේ දළ දේශීය නිෂ්පාදිතය උත්කර්ෂණයට නැංවීම සමාජය තුළ ඇති ආදායම්වල සහ වත්කම්වල පවතින අත්‍යන්ත අසමානතා නො සලකා හැරීම සහ පෙර නොවූ විරූ අන්දමට ජීව ලෝකය විනාශ කර දැමීම සාධාරණීකරණය කිරීම සඳහා යොදා ගන්නා ලදී. එහෙත් විසිඑක් වැනි සියවස සඳහා අපට ඊට හාත්පසින් ම වෙනස්, වඩා වැදගත් විපුල ජීවිත අරමුණක් අවශ්‍ය වේ. එය නම් අපට ජීවන හුස්ම ලබා දෙන මේ මහ පොළොවේ ධාරිතාවය තුළ සමාජ විෂමතාවය අවම කොට සියල්ලන්ට ම මානව අයිතීන් පරිපූර්ණව භුක්ති විඳිය හැකි දයාව හා කරුණාව මුල්කරගත් සජ්ජන සමාජයක් ගොඩනගා ගැනීම යි. මානව අයිතීන් සාක්ෂාත් කර ගැනීම යනු සියල්ලන්ට ම සිවිල්, සමාජීය, ආර්ථික හා සංස්කෘතික අයිතීන් යන මේ සියලු මානව අයිතීන් සාක්ෂාත් කර දීම යි. එය තමා සඳහන් කරන ඩෝනට් ආර්ථිකයේ සමස්තය තුළ සපුරා පැවතිය යුතු බව කේට් පවසයි. අභියෝගය වන්නේ දේශීය හා ගෝලීය වශයෙන් සමස්ත මනුෂ්‍යවර්ගයා ම කේට්ගේ ඩෝනට් ආර්ථිකයේ නිරූපණය

වන සමාජ ආරක්ෂණය සහ සාධාරණත්වය නමැති අවකාශයට ගෙන ඒමයි. ඒ නිසා නිරන්තරයෙන් ඉහළ යැවිය යුතු දළ දේශීය නිෂ්පාදනයකට වඩා යහපත් සමබරතාවක් සහිත එළඹුමක් තුළ අපට මිනිසුන් වසයෙන් සඵල දායක විය හැකි වන්නේ කෙසේ දැ'යි යන්න සොයා ගත යුතු ය.

එනිසා ආර්ථිකය නව ආකාරයකට සංකල්ප ගත කිරීමට නම් ආර්ථිකය යනු ස්වභාවධර්මය හා සමස්ත සමාජය තුළ ගැබ් ව පවතින දෙයක් විය යුතු බවත් අවසාන විග්‍රහයේ දී එය සවි බල ගැන්වෙන්නේ හුදෙක් සූර්යයාගෙන් බවත් පැහැදිලි ය. ආර්ථිකය පිළිබඳ කේට් රේවර්ත් කරන නව අර්ථ ගැන්වීම තුළ වෙළෙඳපොළ සතු බලය, රජය හා හවුල්කාරකම, ගෘහයේ මූලික භූමිකාව සහ පොදු අයිතියේ නිර්මාණාත්මක භාවය පැහැදිලි කරන නව ආඛ්‍යානයක් ද අඩංගු විය යුතු ය.

තෙවනුව, නව ආර්ථික චින්තනය මිනිස් ගුණය පෝෂණය කරන්නක් විය යුතු ය *(nurture human nature)*. විසිවැනි සියවසේ පැවති සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාවේ හරය මඟින් නිරූපණය කළේ හුදු යථාර්ථවාදී ආර්ථික මනුෂ්‍යයෙකි *(rational economic man)*. ඒ මඟින් අපට පැවසූ අන්දමට එකී ආර්ථික මනුෂ්‍යයා ස්වාර්ථය ම සලකන *(self-interested)* අන්‍යයන් ගෙන් හුදකලා වූ *(isolated)* තමන්ගේ ම වාසිය සොයන *(calculating)* තමන්ට ම පුද්ගලික වූ ආසාවන්ගෙන් හරිත *(fixed in tastes)* සහ අනවරතයෙන් ම ස්වභාව ධර්මය කෙරෙහි සිය ආධිපත්‍යය පතුරවන්නා වූ පුද්ගලයෙකි. යථාර්ථවාදී ආර්ථික මනුෂ්‍යයා පිළිබඳ ඒ ඒකාකෘතික පින්තූරය සමාජය තුළ අප කෙබඳු ජීවිතයක් ගත කළ යුතු ද යන්න ගැන අපට නියෝග කරයි. එහෙත් ඒ වෙනුවට අපේ නව්‍ය ප්‍රතිමූර්තිය පිළිබඳ මුල් අවධියේ රූසටහන්වලින් පෙන්වන පරිදි අපේ මනුස්සකම, මනුෂ්‍ය ස්වභාවය *(human nature)* ඊට වඩා බෙහෙවින් පොහොසත් ය. මිනිසුන් වසයෙන් අපි සමාජීය, අන්තරායත්ත *(interdependent)* නොහොත් උනුන් මත යැපෙන, සන්නිකර්ෂණීය *(approximating)* හෙවත් සම ගුණගරුක හැසිරීම් ඇති, වෙනස් වන වටිනාකම් අගයන

*(fluid in values)* සහ සහමුලින් ම ලෝකයේ සජීවී ස්වභාවය මත යැපෙන්නෝ වෙමු. එනිසා සියල්ලට ම වඩා වැදගත් වන දෙය නම් කේට්ගේ ඩෝනට් ආර්ථික මොඩලයේ කේන්ද්‍රස්ථානය වන සුරක්ෂිත සාධාරණ සමාජ අවකාශය කරා සියල්ලන් ම රැගෙන යෑමට අපට හැකි වන ලෙස මේ සහානුකම්පිත මිනිස්කම, මේ යුක්තිගරුක මනුෂ්‍ය ස්වභාවය සවිඥානිකව පෝෂණය කළ හැකි දෙයක් බවට පත් කර ගැනීම යි.

සිව්වැනි ව, අප පද්ධතික චින්තනය ගැන සුහුරු විය යුතු ය. හැම ආර්ථිකවිද්‍යා ශිෂ්‍යයෙකුට ම පළමුවෙන් ම අභිමුඛ වන රූප සටහන වෙළඳපොළ ඉල්ලුම හා සැපයුම නියෝජනය කරන වක්‍ර රේඛා එකිනෙක කැපී යන සාම්ප්‍රදායික ඉල්ලුම් සැපයුම් ප්‍රස්තාරය යි. එහෙත් එයට පාදක වී ඇත්තේ දැන් අවතැන් වී ඇති යාන්ත්‍රික සමතුලිතතාව පිළිබඳ ව 19 වන සියවසේ පැවති රූපකයකි. රේවර්ත්ට අනුව ආර්ථික විද්‍යාවේ ගතික ස්වභාවය පිළිබඳ ඊට වඩා බෙහෙවින් සුහුරු ඇරඹුම් ලක්ෂ්‍යයක් වන්නේ සරල ප්‍රතිචාර ලූප යුගලයකින් සංක්ෂේප කර පෙන්විය හැකි පද්ධතික චින්තනයයි *(system thinking)*. ඩොනෙලා මිඩොව්ස් පෙන්වා දෙන අන්දමට පද්ධති චින්තනය යනුවෙන් හැඳින්වෙන්නේ ඕනෑම පද්ධතියක් සම්බන්ධයෙන් බැලූ බැල්මට ම සරල යැයි පෙනෙන සාධක කිහිපයක අන්තර්ක්‍රියාකාරිත්වය මත පදනම් වූ සංකල්පයකි. ඒ සාධක වලට තත් පද්ධතියට අයත් වන විවිධ කොටස්, පද්ධතියක ප්‍රවාහයේ ස්වරූපය හා ප්‍රතිචාර ලූප සහ ඇතිවිය හැකි පමා වීම් ද අයත් වේ. එකී සාධක සරල ඍජු ඒවා වුවත් සිතා ගත නොහැකි තරම් සංකීර්ණ ප්‍රතිඵල පද්ධතියක ඇතිවෙන්නේ ඒව එකිනෙක හා අන්තර් ක්‍රියාකාරිත්වයක නියැලෙන විට ය. ඒ අන්තර්ක්‍රියාකාරිත්වය නිසා කල් තියා කිව නො හැකි පුදුමාකාර අහඹු ප්‍රතිඵල ඇති විය හැකිය. උදාහරණයක් ලෙස දහස් සංඛ්‍යාත වැහිලිහිණි රැනක් අහස සිසාරා විවිධ රටා මවමින් පියාඹන විට ඊළඟට මැවෙන කණ්ඩායම් රටාව කෙබඳු දැයි අපට කල් තියා කිව නොහැකිය. එහෙත් පද්ධතියක් වසයෙන් ගත් විට එම කුරුලු රැන නො විසිරී විවිධ සංකීර්ණ රටා මවමින් නො කඩවා

පියාඹති. ඉතින් එය අරුමයක් නොවේ ද? අපේ සිරුරත් එවැනි පද්ධතියකට හොඳ උදාහරණයකි. අවට පරිසරය උණුසුම් වූ විට සිරුරේ උෂ්ණත්ව සාමාන්‍ය පවත්වා ගැනීමට ප්‍රතිචාර ලූපයක් ලෙස වැඩියෙන් දහදිය පිට කිරීමට අපට සිදුවේ. අනෙක් අතට දරා ගත හැකි පමණට වඩා සිරුර සීතල වූ විට අපේ ඇඟ ගැහෙන්නන්ට පටන් ගෙන උණුසුම ඇති කිරීමේ ප්‍රතිචාර ලූපය ක්‍රියාත්මක වෙයි. හැම පද්ධතියක ම සංකීර්ණ පැවැත්ම සඳහා එවැනි ධනාත්මක හෝ ඍණාත්මක ප්‍රතිචාර ලූප ඇතිවිය හැකි බව මීඩොව්ස් පෙන්වා දෙයි. මෙලෙස කිසියම් පද්ධතියකට අයත් කොටස්, ප්‍රවාහ, ප්‍රතිචාර ලූප සහ ප්‍රමාද අතර ඇතිවෙන අන්තර්ක්‍රියාකාරිකම් නිසා වඩා සංකීර්ණ අනුවර්තනීය පද්ධති බිහි විය හැකිය. ආර්ථික පද්ධතිය ද අනුවර්තනය වන්නේ මේ නියාම ධර්මය ආර්ථික පද්ධතියට ද අදාළ නිසාය.

ඒ නිසා ආර්ථික විද්‍යාවේ හරය ගතිකයන් මත ක්‍රියාකරන්නක් ය යන පදනමින් කල්පනා කිරීම මූල්‍ය වෙළඳ පොළේ උත්පාත සහ බිඳ වැටීම්වල සිට ආර්ථික විෂමතාව ස්වයං වර්ධනය වීම සහ දේශගුණ විපර්යාසවල හැරවුම් ලක්ෂ්‍යය අභිමුඛ වීම දක්වා වූ බොහෝ ගැටලු සම්බන්ධ නව අන්තර්ඥාන පහළ වීමට හේතු වන බව රේවර්ත් පෙන්වා දෙයි. එනිසා ආර්ථිකයේ ඇතැ'යි සිතන දුරවබෝධ පාලන ලීවර සොයමින් යෑම නතර කොට ආර්ථිකය යනු විකාසය වන සංකීර්ණ පද්ධතියක් *(complex system)* ලෙස සලකා මෙහෙය වීමට දැන් කාලය පැමිණ තිබේ.

පස්වැනි ව, නව ආර්ථික චින්තනය යනු ධනය සමුච්චනය හෙවත් එක් රැස් කිරීම වෙනුවට ධනය විභජනය හෙවත් නැවත බෙදී යෑම සඳහා සැලසුම් කළ හැකි එකක් විය යුතු ය. විසි වෙනි සිය වසේ දී කුස්නෙට්ගේ වක්‍රය *(Kuznets Curve)* යනුවෙන් හඳුන්වන එක්තරා සරල වක්‍රයක් සමාජ අසමානතාව ගැන අපට බලසම්පන්න පණිවුඩයක් කොඳුරා පැවසී ය. ඉන් කියවුණේ සමනය වීමට පෙර කොහොමටත් අසමානතාව වනාහි තීව්‍ර වීමට නියමිත දෙයක්

බවත් ආර්ථික වර්ධනය විසින් ම අනතුරු ව අසමානතා නැවත සමනය කරනු ඇති බවත් ය. එහෙත් අසමානතාව යනු අනිවාර්ය ආර්ථික අවශ්‍යතාවක් නො වන බවත් එය හුදෙක් අසාර්ථක ආර්ථික සැලසුම්වල ප්‍රතිඵලයක් බවත් දැන් වැටහී තිබේ. ආර්ථිකය විසින් ජනනය කරනු ලබන වටිනාකම් වඩාත් සාධාරණ ලෙස බෙදී යෑම උදෙසා ම එකී ආර්ථිකයන් සැලසුම් කිරීමේ ක්‍රම ගණනාවක් ම ඇති බව විසි එක් වැනි සියවසේ ආර්ථික විද්‍යාඥයන් තේරුම් ගෙන ඇත. මේ අදහස වඩාත් විශද ලෙස නියෝජනය වී ඇත්තේ සංජාල ප්‍රවාහ *(networks of flows)* පිළිබඳ සංකල්පයක් ලෙස යි. එහි තේරුම නම් හුදෙක් ආදායම නැවත බෙදී යෑම පමණක් නො ව ඉන් ඔබ්බට ගොස් වත්කම්, විශේෂයෙන් ම ඉඩම්, ව්‍යවසාය, තාක්ෂණය, දැනුම සමඟ මුදල් නිර්මාණය කිරීමේ බලය ද ඵලදායක ලෙස නැවත බෙදා දීමේ විවිධ විධික්‍රම ගවේෂණය කළ යුතු බවයි.

හයවැනි ව, නව චින්තනයේ තවත් ඉලක්කයක් විය යුත්තේ ප්‍රතිජනනය කිරීම උදෙසා ම නිර්මාණය කිරීම හා ප්‍රතිජනනීය නිපදවීම *(Regenerative production)* දිරිගැන්වීම යි. 'පිරිසිදු' පරිසරයක් යන්න වත්පොහොසත්කම් ඇති අයට පමණක් ඔරොත්තු දෙන සුඛෝපභෝගී දෙයක් ලෙස සාම්ප්‍රදායික ආර්ථික න්‍යාය මඟින් නිරූපණය කරයි. ඒ අදහස ම තවත් අයුරකින් කොඳුරන කුස්නෙට්ගේ පරිසරය පිළිබඳ ඒ කුප්‍රකට වක්‍රය, පිරිසිදු වීමට පෙර පරිසරය දූෂණය වීම නියත බවත් අනතුරු ව එන ආර්ථික වර්ධනය විසින් එය නැවත සමනය කරනු ඇති බවටත් පොරොන්දු වෙයි. එහෙත් එවැනි ආර්ථික න්‍යායක් යථා ලෝකයේ නොමැති බව අපි දනිමු. පාරිසරික හායනය යනු කොටින් ම වෙන කිසිවක් නො ව පරිසරය ගැන තැකීමක් නැති හානිදායක කාර්මික සැලසුම්වල ඒකායන ප්‍රතිඵලය යි. එනිසා මේ සියවසට අවශ්‍ය කරන්නේ වර්ධන ලෝලී රේඛීය ආර්ථික චින්තනයක් නො ව පෘථිවි ජීවිතයේ චක්‍රීය ක්‍රියාවලියට සහභාගී වන පූර්ණ හවුල්කාරයන් ලෙස මනුෂ්‍යයන් ඔසවා තැබිය හැකි, චක්‍රීය ආර්ථිකයක් ගොඩනැගීමට අවශ්‍ය වන ප්‍රතිජනනීය සැලසුම් නිරතුරු ව මුදා හරින නව ආර්ථික චින්තනයකි.

හත්වැනි ව, වර්ධනය ගැන අප අඥෙයවාදී හෙවත් උපේක්ෂා සහගත විය යුතු ය. නොහොත් වර්ධන ලෝලී හෝ වර්ධන විරෝධී නොවිය යුතුයි. ආර්ථික විද්‍යාව ගැන ඇති එක් දළ රූප සටහනක් කොයි තරම් භයානක දැ'යි කිව හොත් ඇත්තට ම එය කිසි දා නො අඳින රූප සටහනකි. එය නම් නිමක් නැති ව දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීමේ දිගු කාලීන මාවත පිළිබඳ දළ රූප සටහන යි. ප්‍රධාන ධාරාවේ ආර්ථික විද්‍යාව නිමක් නැති වර්ධනය සලකන්නේ අත්‍යවශ්‍ය ම දෙයක් ලෙස යි. එහෙත් ස්වභාවධර්මයේ දී කිසිම දෙයක් සදාකාලික ව වර්ධනය නො වේ. නිමක් නැති වර්ධනයක් කරා අප තල්ලු කරන මේ ප්‍රවණතාව නිසා ඉහළ ආදායම් සහ පහළ වර්ධන වේගයන් ඇති රටවලට ඉතා අසීරු ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවී තිබේ. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ආර්ථිකයේ ඉලක්කය වසයෙන් සැලකීම අතහැර දැමීම අසීරු නො වුණත් එයට අපේ ඇති ආසක්ත වීම ජය ගැනීම ඊට වඩා අසීරු දෙයක් විය හැකි ය. අපට කිසියම් වැඩක් තිබුණත් නැතත් වර්තමානයේ ද යම් පමණකට වර්ධනය අවශ්‍ය කරන ආර්ථික පවතී. එහෙත් වර්ධනයක් වුවත් නැතත් ඇත්ත වසයෙන් අවශ්‍ය වන්නේ අප සියල්ලන්ගේ ම අභිලාෂයට අනුව මිනිසුන් වසයෙන් දියුණු විය හැකි ආර්ථිකයකි. එනිසා අපේ පර්යාලෝකයේ රැඩිකල් වෙනස ආර්ථික වර්ධනය සහ සුවිශේෂයෙන් ම වර්ධන වේගය ගැන අඥෙයවාදී වන ලෙස අපෙන් ඉල්ලා සිටී. එසේ ම දැනට මූල්‍යමය, දේශපාලනික සහ සමාජමය වසයෙන් අතිශයින් වර්ධන ලෝලී වී ඇති ආර්ථිකයන් වර්ධනය ඇතිව හෝ නැතිව ඵල දායකවීමට ඉගෙන ගත යුත්තේ කෙසේ ද යන්න ගැඹුරින් ගවේෂණය කිරීම ද එම ඉල්ලීම තුළ ගැබ් වෙයි.

ඉහත කී සප්තාංගික මාර්ගය ආර්ථික විද්‍යාව ගැන 21 වැනි සියවසට ඔබින අන්දමින් අලුතෙන් සිතීමට අපට උදව් වෙන බව නිසැක ය. එහෙත් එමඟින් අනාගත ආර්ථිකය සම්බන්ධයෙන් සුවිශේෂ ප්‍රතිපත්ති හෝ ආයතනික වෙනස්කම් පිළිබඳ නිශ්චිත යෝජනා ඉදිරිපත් නො කරයි. එමෙන් ම එමඟින් අප මුහුණ දෙන ප්‍රශ්නවලට වහාම ක්‍රියාත්මක කළ හැකි පිළිතුරු හෝ පරිපූර්ණ

පිළිතුරු හෝ ලබා නො දේ. එහෙත් මේ සියවස ඉල්ලා සිටින ආකාරයේ ආර්ථිකයක් පිළිබඳව කල්පනා කිරීම රැඩිකල් වෙනසකට ලක් කිරීමේ ලා ඉහත කී සප්තාංගික මාර්ගය ප්‍රමුඛ වන බව කේට් රේවර්ත් පෙන්වා දෙයි. එමඟින් හඳුන්වා දී ඇති මූලධර්ම සහ චින්තන රටාව සියල්ලන්ට ම සමෘද්ධිය ගෙන දෙන ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා නව පරපුරක ආර්ථික චින්තකයන් මෙන් ම අප සියල්ලන් තුළ ජීවත් වන ආර්ථික විශේෂඥයන් ද සන්නද්ධ කරනු ඇත. ඉදිරි වර්ෂවල දී සිදු වන වෙනස්වීම්වල වේගය, පරිමාව සහ අවිනිශ්චිත භාවය නිසා අනාගතය සඳහා අවශ්‍ය කරන සියලු ප්‍රතිපත්ති සහ ආයතන දැන් තියා ම නිර්දේශ කිරීම තරමක මෝඩකමකි. සන්දර්භය නිරන්තරයෙන් ම වෙනස් වන බැවින් කුමක් සාර්ථක වේ ද කුමක් අසාර්ථක වේ ද යන්න අත්හදා බැලීම් කොට සොයා දැන ගැනීමට නව පරපුරේ චින්තකයන් සහ ක්‍රියාකාරීන් වඩා උචිත තැනක සිටිනු ඇත. අපට දැනට කළ හැක්කේත් අප කළ යුත්තේත් අප අතර ඉස්මතු වන හොඳ ම අදහස් එක් රැස් කොට අනම්‍ය නො වී විකාසය වන *(evolving)* නව ආර්ථික මනෝ ගතියක් *(new economic mindset)* නිර්මාණය කිරීම යි.

ඒ අනුව අනාගත ආර්ථික චින්තකයන්ගේ කාර්යභාරය වන්නේ ඉහත කී සප්තාංගික චින්තනය වැඩි දියුණු කොට ප්‍රායෝගික ව උපයෝගී කර ගැනීම යි. මෙය ආර්ථික විද්‍යාව නැවත හිතා බැලීමකට ලක් කිරීම පිළිබඳ වික්‍රමයක ඇරඹුමක් පමණක් බව රේවර්ත් පවසයි.

21 වෙනි සියවසේ ජීවත් වන මිනිසුන් අතරින් මේ තරම් ප්‍රමාණයකට සිය ශක්‍යතා සීමා කර ගනිමින් ඔය තරම් අගහිඟකම් ඇති ව ජීවත් වීමට සිදුවීම පුදුම සහගත ය. මේ අතර මනුෂ්‍යයෝ පෘථිවියේ ජීවධරණී පරිසර පද්ධතිවලට පෙර නොවූ විරූ පීඩනයක් එල්ල කරමින් සිටිති. දැනට මත් ඔවුන් දේශගුණ විපර්යාසය, භූමි පරිවර්තනය, අධික නයිට්‍රජන් සහ පොස්ෆරස් භාවිතය සහ ජෛව විවිධත්ව හානිය සම්බන්ධ පෘථිවි ග්‍රහ ධාරිතා සීමා මායිම් ඉක්මවා ගොස් තිබේ.

අවම වසයෙන් තිරසාර සංවර්ධනය පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ගෙන ඇති ඉලක්ක අවංක ව ම හඹා ගිය හොත් අපට මේ තත්වය තරමක් පාලනය කර ගත හැකි වෙන නමුත් ඒ සඳහා ඇති නියම දේශපාලනික කැපවීම ඇති කර ගැනීමට හැකි වන්නේ ගෝලීය මට්ටමේ බහුජන ව්‍යාපාරයක් මගිනි.

ඒ සන්දර්භය තුළ කේට් රේවර්ත්ගේ ඩෝනට් ආර්ථික මොඩලය මනුෂ්‍යයාගේ පොදු අනාගතය පිළිබඳ ව ශුභවාදී දැක්මක් සහිත චින්තනයක් බිහි කිරීම දිරි ගන්වයි. ඒ සඳහා පාදක කර ගෙන ඇති විභජනීය *(distributive)* සහ ප්‍රතිජනනීය *(regenerative)* සැලැස්ම මගින් සමබර සශ්‍රීකත්වයක් බිහි කරන ගෝලීය ආර්ථිකයක් ඇති කර ගැනීමට හැකි වෙතැ'යි සිතිය හැකි ය. කෙසේ වෙතත් දේශගුණ විපර්යාසය, ප්‍රචණ්ඩ ගැටුම්, බලහත්කාර සංක්‍රමණ, වැඩිවන ආදායම් විෂමතා, පරජන භීතිකාව, ආවේණික මූල්‍ය අස්ථාවරත්වය ආදී එකිනෙක හා බැඳුණු අභියෝගවලට මුහුණ දෙන අතර එවැනි ශුභවාදී දැක්මක් හා චින්තනයක් ගැන බලාපොරොත්තු තබා ගැනීම මුග්ධ කමකැ'යි කෙනෙකුට සිතෙන්නට පුළුවන. ජනමාධ්‍ය අපේ සාලය මැද හෝ අතැති ජංගම මෙවලම හරහා අප වෙත ගෙන එන පුවත් දෙස බැලූ විට සමාජීය, පාරිසරික, ආර්ථික සහ දේශපාලන කඩා වැටීම මොන තරම් ඇත්තක් දැයි අපට සිතෙනු ඇත. එහෙත් කේට් රේවර්ත් පවසන අන්දමට පෘථිවි ග්‍රහලෝකය නමැති අපේ මේ පොදු නිවහනට අප විසින් කර ඇති ඉමහත් හානිය අවබෝධ කර ගනිමින් සිටින ප්‍රථම පරම්පරාව අපි වෙමු. එමෙන් ම ඒ සම්බන්ධයෙන් කිසියම් ඵලදායක දෙයක් කළ හැකි අවසාන පරම්පරාව ද අපි වෙමු. සාමූහික ව කටයුතු කිරීමට තීරණය කළ හොත් සියලු ම ආකාරයේ දරිද්‍රතා අවසන් කිරීම සඳහා අවශ්‍ය කරන තාක්ෂණය, දැනුම සහ මූල්‍ය සම්පත් අප සතු බව ජාත්‍යන්තර ප්‍රජාවේ ඒකාග්‍ර කොටසක් වසයෙන් අපි දනිමු.

ශිෂ්ට ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රමාණවත් වන ලෙස හැම පුද්ගලයෙකුට ම සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව සහතික කෙරෙන දේශපාලන, ආර්ථික හා සමාජීය වාතාවරණයක් බිහි කිරීම

ඩෝනට් ආර්ථික මොඩලයට අනුව කේන්ද්‍රීය අවශ්‍යතාවයකි. කේට් එය හඳුන්වන්නේ 'සමාජ පදනම ගොඩනැගීම' ලෙස ය. සමාජ පදනම යනු ජීවත් වන හැම කෙනෙකුට ම අවම වසයෙන් මූලික අවශ්‍යතා එනම්, ප්‍රමාණවත් ආහාර, පිරිසිදු ජලය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂාව, පහසුවෙන් බලශක්තිය ලබාගැනීමේ හැකියාව සහ පිරිසිදුව ආහාර පිස ගැනීමේ පහසුකම්, ගුණාත්මක අධ්‍යාපනය හා සුව සේවා පහසුකම්, ප්‍රමාණවත් මූලික ආදායමක් සහ යෝග්‍ය රැකියාවක් ලබා ගැනීමේ හැකියාව, තොරතුරු ජාලවලට ප්‍රවේශ වීමේ සහ සමාජ ආධාර ජාලවල සේවය ලබා ගැනීමේ හැකියාව ද යන මූලික අවශ්‍යතා ය. මේ අවශ්‍යතා සපුරා ගැනීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, සමාජ සාධාරණය, දේශපාලන හඬ නැංවීමේ හැකියාව සහ සාමය හා යුක්තිය සහතික කෙරෙන අන්දමට ඉටු විය යුතු බව කේට් අවධාරණය කරයි. සංවර්ධනය මානව අයිතිවාසිකම් මුල් කොට සිදු කෙරෙන දෙයක් විය යුත්තේ එබැවිනි.

එහෙත් සැමට මානව අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා අවශ්‍ය කරන ශක්‍යතා ඇති කර ගන්නා තෙක් සමාජය සාධාරණ යුක්තිග රුක සමාජයක් ලෙස සැලකීම උගහටය. අයිතිවාසිකම් සාක්ෂාත් කර ගත හැකි වන්නේ ඒ සඳහා අවශ්‍ය කරන ශක්‍යතා අනුව යැයි කීම මගින් අප අදහස් කරන්නේ අයිතියක් හුදෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හෝ කිසියම් විධානයක සඳහන් වීම පමණක් ප්‍රමාණවත් නො වන බවත් එම අයිතිය භුක්ති විඳීමේ ශක්‍යතාව හෙවත් හැකියාව ද මහජනතාවට ලබා දිය යුතු බවත් ය. උදාහරණයක් වශයෙන් ලංකාව ද ඇතුළුව බොහෝ රටවල ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය ක්‍රියාත්මක වන්නේ නාමික ව පමණි. නිවසෙන් බැහැර රැස්වීම් සඳහා යෑමට අපහසු වීම, තනිපංගලමේ ගමන් කිරීමෙන් ඇති විය හැකි අනාරක්ෂාව, ඉවුම් පිහුම් හා ළමයින් බලා ගැනීමට සිදුවීම, එදිනෙදා නිවසේ කටයුතු ඇතුළු අනෙකුත් කුදු මහත් හේතු නිසා දේශපාලන සහභාගිත්වයට ස්ත්‍රීන්ගේ ඇති ශක්‍යතාව මඳ වී තිබේ. එනිසා එවැනි ශක්‍යතා ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමෙන් තොර ව ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගීත්වය පුළුල් කිරීම අසීරුය. අයිතිවාසිකම් භුක්ති

විඳීමේ ශක්‍යතාව කේන්ද්‍රීය කාරණය කරගත් විට යම් කිසිවකු සඳහා අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ සැලසීම යනු කුමක්දැ' යි වටහා ගැනීම අපහසු නො වේ.

21 වැනි සියවසේ කාර්යභාරය ඉතා පැහැදිලි ය. කේට් රේවර්ත් පෙන්වා දෙන අන්දමට එය ඩෝනට් ආර්ථික මොඩලය මඟින් නිරූපණය කළ ආරක්ෂිත සහ යුක්තිය රජයන අවකාශය තුළ සප්‍රාණික ජීවී සංජාලයක් සමඟ සියලු මනුෂ්‍යයන් සඳහා සමබර සශ්‍රීකත්වයක් ප්‍රවර්ධනය කළ හැකි ආර්ථිකයක් නිර්මාණය කිරීම යි. එය ඇරඹෙන්නේ දේශීය හෝ ගෝලීය වසයෙන් වෙනසක් නො කොට හැම ආර්ථිකයක් ම රඳා පවතින්නේ සමාජය සහ සජීවී ලෝකයේ ඒකාබද්ධ පැවැත්ම මතය යන ඒකාන්ත අවබෝධයත් සමඟ ය. කුටුම්බය, පොදු දේපළ, වෙළඳපොළ සහ රාජ්‍ය යන සියලු සාධක අපේ බොහෝ ඕනෑකම් සහ අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත් වන බවත් එය වඩාත් හොඳින් ම ඉටු වන්නේ එම සියලු සාධක එකට එක් ව කටයුතු කරන විට බවත් ඒ අතර ම අප මතක තබා ගත යුතු ය. මනුෂ්‍යයාගේ ස්වභාවය පිළිබඳ අපේ අවබෝධය වැඩි දියුණු කර ගැනීමෙන් අපට සමාජීය ප්‍රත්‍යුපකාරය සහ අනෙකුත් සමාජ වටිනාකම් පිටු දැකීම වෙනුවට ඒවා දිරි ගන්වන ආයතන සහ ක්‍රමවේද හඳුන්වා දිය හැකි බවත් ආර්ථිකයට ආවේණික සංකීර්ණත්වයක් ඇති බව පිළිගෙන එය තුළ නිරන්තරයෙන් පරිණාමය වන ගතිකයන් අනුව ආර්ථිකය විචක්ෂණ ව මෙහෙයවිය හැකි බවත් කේට් රේවර්ත් පවසයි. ඒ අනුව අද පවතින භේදකාරී පරිහානිදායක ආර්ථිකයන් පරිවර්තනීය ලෙස සැලසුම් කිරීම මඟින් විභජනීය *(distributive)* සහ ප්‍රතිජනනීය ආර්ථික බවට හැරවිය හැකි ය. එය වර්ධනය ගැන උපේක්ෂා සහගත ව අඥෙයවාදී වීමටත් වර්ධනය වීම හෝ නො වීම ගැන කරදර නොවී සෞභාග්‍ය ගෙන එන ආර්ථිකයන් නිර්මාණය කිරීමටත් අපට ආරාධනා කරයි.

# - 23 -

## අරමුණු පාදක මෙහෙවර ආර්ථිකයක්

වර්ජිනියා විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය ස්ටීව් රෝඩ්ස් 1984 දී පළ කළ *The Economist's view of the World* නමැති ග්‍රන්ථයේ නව 35 වැනි සංවත්සර සංස්කරණය ගැන ලියමින් රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තිවල ඵලදායකත්වය ගැන ෆ්‍රැන්සිස් ෆුකුයාමා අපට නැවත වැදගත් කරුණක් මතක් කරයි. රාජ්‍ය කාර්මික ප්‍රතිපත්ති මඟින් ආර්ථික වර්ධනය ඇති කිරීමේ වෑයම හැම විට ම නවලිබරල්වාදී ආර්ථික චින්තකයන්ගේ ගර්හාවට ලක් විය. එසේ ගර්හාවට ලක් කිරීම සඳහා යොදා ගන්නා ලද තර්ක අතර අනාගතයට අවශ්‍ය කරන තාක්ෂණය සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ට අවබෝධයක් නැත, ඒ අනුව ගත යුතු අවදානම් තීරණ සහ ආයෝජන ප්‍රමුඛත්වය තීරණය කිරීමට රජයට හැකියාවක් නැත. ඒ හැර, රජයේ තීරණ එදිනෙදා දේශපාලන අවශ්‍යතා සලකා ගන්නා ඒවා මිස පුළුල් ආර්ථික අවශ්‍යතා මත ගන්නා ඒවා නො වේ යනාදී වසයෙන් රටක කාර්මික ප්‍රතිපත්තිය රජය විසින් තීරණය කරනු ලැබීම නවලිබරල්වාදී චින්තනයේ තදබල විවේචනයට ලක් විය.

එහෙත් බොහෝ විට නවලිබරල්වාදී ආර්ථික විද්‍යාඥයන් විසින් පිළිගැනීමට අකැමැති වුවත් ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බොහෝ රටවල රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තිය බෙහෙවින් සාර්ථක ව ක්‍රියාත්මක වී ඇති බව ෆුකුයාමා පෙන්වා දෙයි. එමෙන් ම ජපානය,

තායිවානය හා චීනය වැනි නැගෙනහිර ආසියාතික රටවලට පෙර නො වූ විරූ ආකාරයක ඓතිහාසික ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකිවීම විවිධ මාදිලියේ රාජ්‍ය කාර්මික ප්‍රතිපත්ති නිසා සිදු වූවක් බව ද ඔහු පෙන්වා දෙයි.[257] එහෙත් නවලිබරල්වාදී ආර්ථික විද්‍යාඥයෝ මෙය තේරුම් නො ගත්හ. උදාහරණයක් ලෙස ෆුකුයාමා පෙන්වා දෙන පරිදි 1993 දී ලෝක බැංකුව පිළියෙළ කළ ලෝක සංවර්ධන වාර්තාවේ 'නැගෙනහිර ආසියාවේ ප්‍රාතිහාර්ය' යන මැය යටතේ තත් ආර්ථික වර්ධනයට මූලික හේතුව නව සම්භාව්‍ය ආර්ථික විද්‍යාව විසින් උත්කර්ෂණයට නැංවූ මුදලේ ස්ථාවරත්වය සහ මූල්‍ය විනය පිළිබඳ අවශ්‍යතාව බව සඳහන් විය. එහෙත් එම වාර්තාව සඳහා බරපැන දැරූ ජපානය මේ නිගමන ගැන නො සතුටට පත් විය. ඊට හේතුව වූයේ නිශ්චිත තාක්ෂණ ක්ෂේත්‍රවලට පහසු රාජ්‍ය ණය වැඩි වැඩියෙන් ලබා දීම කාර්මික ප්‍රතිපත්තියක් ලෙස හඳුන්වා දීම ආර්ථික වර්ධනයට බල පෑ මූලික සාධකයක් ලෙස ජපානය සැලකූ බැවිනි. ඒ නිසා අකමැත්තෙන් වුව ද සිය වාර්තාව යළි සංස්කරණය කිරීමට ලෝක බැංකුවට සිදුවිය.

තීරණ ගැනීමේ දී අනිසි දේශපාලන පීඩනවලින් මිදුණු වෘත්තීය ස්වතන්ත්‍ර භාවයක් සහිත විෂය විශේෂඥයන්ගේ උපදෙස් තකන විචක්ෂණ රාජ්‍ය නිලධාරි තන්ත්‍රයක් ඇත් නම් දියුණු හා කාර්යක්ෂම රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තියක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම අපහසු කරුණක් නො වේ.

රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තියක් ලෙස නාමකරණය නොකළ ද ඉදිරි ආරක්ෂක පර්යේෂණ *(Advance Defense Research)* සඳහා ඉතා දියුණු තාක්ෂණය යොදා ගැනීම පිණිස ඇමෙරිකානු එක්සත් ජනපදයේ රාජ්‍ය ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම් හා මඟ පෙන්වීම් ආර්ථික වර්ධනයට තුඩු දුන් නොයෙකුත් නිෂ්පාදන කර්මාන්ත බිහි වීමට හේතු වූ බව නො රහසකි. ඇත්ත වසයෙන් ම

257 Francis Fukuyama, (2021) In praise of Industrial policy - https://www.americanpurpose.com/blog/fukuyama/in-praise-of-industrial-policy/ – Retrieved on 12 April 2021

පරිගණක, මෘදුකාංග, රේඩාර්, සෙමිකොන්ඩක්ටර්, සංයුක්ත පරිපථ සහ සුප්‍රකට අන්තර්ජාලය පවා බිහි වූයේ එකී මග පෙන්වීම් සහ ඒ සඳහා යොදන ලද රාජ්‍ය ආයෝජන නිසා ය. නව තාක්ෂණයෙන් වෙළඳපොළ ජය ගත් දැවැන්ත නවෝත්පාදකයන් ලෙස සැලකෙන ඇපල්, ගූගල්, ෆෙස්බුක් වැනි සමාගම්වලට ඇමෙරිකානු රාජ්‍යයේ ක්‍රියාශීලී සහායකින් තොර ව එකී නවොත්පාදන එළිදැක්වීමට ඉඩ නො ලැබෙන බව නව පරපුරේ ආර්ථික විද්‍යාඥවරියක වන ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය මරියානා මාස්සුකාටෝ සිය *The Entrepreneurial State: Debunking Public vs' Private Sector Myths* නමැති ග්‍රන්ථයේ පෙන්වා දෙයි.[258]

මාස්සුකාටෝ උපුටා දක්වන පරිදි ඇමෙරිකානු එක්සත් ජනපදය විසින් හඳුන්වා දෙන ලද පෙරළිකාර නවොත්පාදන සැලකිය යුතු ප්‍රමාණයක් 1982දී ඇමෙරිකානු රජයේ *Small Business Innovation Research Programme (SBIR)* හෙවත් කුඩා ව්‍යාපාර නවොත්පාදන පර්යේෂණ වැඩ සටහන යටතේ නවොත්පාදන හා නව තාක්ෂණය බිහි කිරීම පිණිස පර්යේෂණ කටයුතු කිරීමට වාර්ෂික ව කුඩා සමාගම්වලට ආධාර ලබා දීම සඳහා පිහිටුවූ අරමුදල නිසා බිහි වූ ඒවා ය. මේ වන විට එම අරමුදල ඩොලර් බිලියන 2 ක් දක්වා වැඩි කර තිබේ. ඒ මඟින් බිහි කර ඇති පුරෝගාමී නවොත්පාදන සමාගම් සහ නව තාක්ෂණ නිර්මාපකයන් ගණනාවකි. පෙරළිකාර තාක්ෂණික හඳුන්වාදීම්වලට ප්‍රකට ඇපල් සමාගම පවා රාජ්‍ය අරමුදල්වල දායකත්වයෙන් සාර්ථකත්වයෙන් ඵල ප්‍රයෝජන ලබා ගත්තේ ය. ඇපල් සමාගමේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස්ගේ ප්‍රතිභාපූර්ණ ආකර්ෂණීය නිපැයුමක් ලෙස සැලකෙන අයිෆෝනයට යොදා ගෙන ඇති *GPS* හෙවත් ගෝලීය තැන් සෙවුම් පද්ධතිය, ස්පර්ශ සංවේදන තිරය සහ අන්තර්ජාල තාක්ෂණය රජයේ දායකත්වය නිසා බිහි වූ නවොත්පාදන අතර ප්‍රධාන ය.

258 Mariana Mazzucato (2015) The Entrepreneurial State: Debunking Public vs. Private Sector Myths, Public Affairs K.E

ගූගල් සමාගම උදාහරණයකට ගත්තොත් එහි සෙවුම් යන්ත්‍රය *(search engine)* විසින් උපයෝගී කර ගනු ලබන ඇල්ගොරිතම ගූගල් සමාගම විසින් ස්වෝත්සාහයෙන් ආයෝජනය කොට සොයා නිපදවා ගත් දේවල් නො වේ. නවෝත්පාදන සඳහා මුදල් යෙදවීමේ අවදානම ගැනීමට බොහෝ පෞද්ගලික ආයෝජකයන් මුල දී මැලි වෙද්දී එම ඇල්ගොරිතම වර්ධනය කර ගැනීමට තුඩු දුන් පර්යේෂණවලට අවශ්‍ය අරමුදල් සැපයුණේ රාජ්‍ය අංශයෙන් බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

ජනාධිපති බයිඩන් විසින් මෑත දී විධායක නියෝග මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති නව රාජ්‍ය කාර්මික ප්‍රතිපත්ති දෙක ඉන් පෙර පැවති රාජ්‍ය නිර්බාධ නවලිබරල්වාදී ආර්ථික චින්තනයට කළ පිටු පෑමක් ලෙස හුවා දැක්විය හැකි ය. ඉන් පළමු වැන්න වන්නේ මෙතෙක් චීනය ආදී විදේශීය රටවල් මත රඳා පැවතුණු උසස්-තාක්ෂණය සම්බන්ධ සැපයුම් දාමය යළි අත්පත් කර ගැනීම යි. ඒ අනුව දැනට චීනය සහ තායිවානය වැනි රටවල සැපයුම මත රැඳී ඇති ඇමෙරිකානු හා යුරෝපීය තාක්ෂණික හැකියාවන්, විශේෂයෙන් සෙමිකොන්ඩක්ටර් හා ප්‍රොසෙසර් වැනි තීරණාත්මක තාක්ෂණික උපාංග නිෂ්පාදන හැකියාව යළි අත්පත් කර ගැනීමට ඇමෙරිකාව අදහස් කරයි. උදාහරණයක් වසයෙන් දැනට ගෝලීය සෙමිකොන්ඩක්ටර් සැපයුමෙන් හරි අඩක් ඕඑක නමැති තායිවාන සෙමිකොන්ඩක්ටර් සමාගම විසින් නිපදවනු ලබයි. ඒ අතර වඩා වැඩි ලාභයක් ලබා ගැනීම සඳහා ඉන්ටෙල් වැනි ප්‍රවීණ ඇමෙරිකානු සෙමිකොන්ඩක්ටර් සමාගම් සිය නිෂ්පාදන කර්මාන්ත ශාලා චීනයට විතැන් කර තිබේ. චීනය දැනට මත් ප්‍රකාශ කර ඇති පරිදි ඉදිරි වසර කිහිපය තුළ තායිවානය චීනයේ කොටසක් බවට පත් වුවහොත් සමස්ත ගෝලීය සෙමිකොන්ඩක්ටර් නිෂ්පාදනය තීරණාත්මක ලෙස චීනය සතු විය හැකි බැවින් ඉන්ටෙල් වැනි සමාගම්වලට ලැබිය හැකි අධික ලාභය නො තකා සැපයුම් ජාලය චීනයේ ආධිපත්‍යයෙන් මුදා ගැනීම ජනාධිපති බයිඩන්ගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වී තිබේ. සැපයුම් ජාලය සුරක්ෂිත කිරීම හැරෙන විට

බයිඩන් ආණ්ඩුවේ අනෙක් වැදගත් ම රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තිය වසයෙන් සැලකෙන්නේ ඛනිජ ඉන්ධන භාවිතය අවම කළ අඩු කාබන් විමෝචනයක් සහිත ආර්ථිකයකට සංක්‍රමණය වීම වේගවත් කිරීම යි. එය ද ආර්ථිකයට රාජ්‍යයේ තීරණාත්මක මැදිහත් වීම පිළිබිඹු කරන්නකි. ජපානය 1960 ගණන්වල දී අනුගමනය කළාක් මෙන් මෙවැනි රාජ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දීම නවෝත්පාදන සහ නව තාක්ෂණික විසඳුම් දිරි ගන්වන සුලු පුරෝගාමී කාර්යයන් ලෙස සැලකිය හැකි ය. එහෙත් එවැනි රාජ්‍ය මැදිහත්වීම් වෙළඳපොළ මඟින් සියල්ල තීරණය වන නවලිබරල්වාදී ආර්ථික චින්තනයට නම් අනුකූල නො වේ.

විචක්ෂණ ඉදිරි දැක්මක් ඇති ව ආණ්ඩුවක් කටයුතු කරන විට එමඟින් ආර්ථික සංවර්ධනයට තුඩු දෙන නවෝත්පාදන බිහි කිරීම ඉලක්ක කර ගෙන ම රාජ්‍යය ප්‍රතිපත්ති සැකසීම අත්‍යවශ්‍ය ම කොන්දේසියක් නො වේ. මාස්සුකාටෝ විස්තර කරන පරිදි 1962 සැප්තැම්බරයේ දී ඇමෙරිකානු ජනාධිපති ජෝන් කෙනඩි "මනුෂ්‍ය සංහතිය විසින් මෙතෙක් අත්දැක ඇති ඉතාමත් භයානක සහ අනතුරුදායක වික්‍රමය" යනුවෙන් හඳුන්වමින් මිනිසෙකු සඳ මතට යවා ආපසු ගෙන්වා ගැනීමට ගත් තීරණය එවැන්නකි. ලයිකා නමැති බැල්ලගෙන් පටන් ගෙන ඒ වන විට රුසියාවේ යූරි ගගාරින් වොස්ටොක් චන්ද්‍රිකාවෙන් පොළොව වටා ඉහළ අජටාකාශයේ භ්‍රමණය වී පැමිණ තිබූ නමුත් මිනිසෙකු චන්ද්‍රයා මතට බැස නැවත පැමිණීමට සැලසුම් කිරීම ඒ කාලයේ මනුෂ්‍යයන්ට අත්පත් කර ගත හැකි ඉහළතම ජයග්‍රහණය විය. සෝවියට් රුසියාව සහ ඇමෙරිකාව අතර පැවති සීතල යුද්ධය නිසා ඇමෙරිකාව පරයා රුසියානු අජටාකාශ තාක්ෂණය ඉදිරියට ඒම පිළිබඳ බිය එකී වික්‍රමාන්විත ප්‍රයත්නයට එක් හේතුවක් විය. එහෙත් සඳ තරණය ප්‍රමුඛ අජටාකාශ ගවේෂණය සඳහා හඳුන්වා දුන් ඇපලෝ වැඩසටහන නිසා එක්සත් ජනපදයේ නාසා *(NASA)* ආයතනය ඇතුළු තාක්ෂණික ක්ෂේත්‍රයට අයත් විවිධ රාජ්‍ය ආයතන, විශ්ව විද්‍යාලවල පර්යේෂණ අංශ සහ කොන්ත්‍රාත්තු

ක්‍රමයට යොදා ගත් පෞද්ගලික අංශයේ විශේෂඥ සමාගම් විසින් ලබා දුන් දායකත්වය අජටාකාශ ගවේෂණය පිළිබඳ නව යුගයක් පමණක් නො ව තාක්ෂණය පදනම් කරගත් නවෝත්පාදන රැසක් බිහි කිරීමට ද හේතු විය.

ඇපලෝ ව්‍යාපෘතියට ඩොලර් බිලියන 28ක් (2020 වටිනාකම අනුව ඩොලර් බිලියන 283ක්) හෙවත් ඇමෙරිකානු රාජ්‍ය අයවැයෙන් 4%ක් වෙන් කෙරුණි. එම වැය ශීර්ෂයේ විශාලත්වය ගැන සඳහන් කළ කෙනඩි ජනාධිපතිවරයා "මේ මඟින් ලැබිය හැකි ඵල ප්‍රයෝජන මොනවා දැ'යි හරියට ම කිව නො හැකි නමුත් එක්තරා අන්දමකට මෙය අපේ ඉදිරි දැක්ම පිළිබඳ අප තබා ඇති විශ්වාසයේ සහතිකයක් යැ'යි" සඳහන් කළේ ය.[259]

මහජන අරමුදල් යොදා ගැනීම සම්බන්ධ අද කාලයේ ඇති විවේචන අනුව ඇපලෝ වැඩසටහනට යොදන ලද මුදල් අපතේ යැවීමක් ලෙස සලකනු ඇත. එහෙත් ඇපලෝ ව්‍යාපෘතිය නිසා විවිධ ක්ෂේත්‍රවල ඇති වූ තාක්ෂණික ප්‍රගතිය සෑහෙන කලක් තිස්සේ ඇමෙරිකාව විද්‍යාත්මක දියුණුවේ පුරෝගාමී දායකයා ලෙස බුහුමනට ලක් කිරීමට සමත් විය. මුල් පෙළේ විද්‍යා පර්යේෂණ ආයතන, කීර්තිමත් විශ්ව විද්‍යාල, නොබෙල් ත්‍යාගලාභී සංඛ්‍යාව, කීර්තිමත් විද්‍යා වාර ප්‍රකාශන සහ නවෝත්පාදන සඳහා ලබාගත් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව ආදි දැනුම පිළිබඳ දර්ශක අතින් අනෙකුත් බොහෝ රටවලට වඩා ඇමෙරිකාව ඉදිරියෙන් සිටීම මඟින් පිළිබිඹු කරන්නේ එයයි.

වසර දහයක් ඇතුළත හඳට මිනිසෙකු යවා නැවත ගෙන්වා ගැනීමේ අරමුණ මුල් කොට බිහි වූ ඇපලෝ ව්‍යාපෘතියට යොදා ගත් තාක්ෂණය සහ සංවිධානීය වැඩපිළිවෙළ මින් පෙර නොවූ විරූ එකක් විය. නාසා ආයතනය, විවිධ විශ්වවිද්‍යාල පර්යේෂණායතන හා කොන්ත්‍රාත්කාර පෞද්ගලික සමාගම් ද ඇතුළු ව 400,000 කට

259 Mariana Mazzucato (2020), Mission Economy – A moonshot guide to changing capitalism, Penguin, London, pp 26 K.E

කිට්ටු කාර්ය මණ්ඩලයක් ඇපලෝ වැඩපිළිවෙළට යොදා ගනු ලැබී ය. අද අප පරිගණක මෘදුකාංග යනුවෙන් හඳුන්වන නිෂ්පාදනවල සමාරම්භය ඇපලෝ ව්‍යාපෘතියයි. මේ ව්‍යාපෘතිය නිසා බිහි වූ දැවැන්ත සංකීර්ණ කටයුතු කොටස්වලට බෙදා කළමනාකරණය කිරීමේ විධික්‍රමය පසුව බෝයිං සමාගම විසින් ලෝකයේ ප්‍රථම ජම්බෝ ජෙට්යානය නිපදවීමේ දී යොදා ගන්නා ලදී. හඳට මිනිසෙකු යැවීමේ අභිමතාර්ථය ජය ගැනීම 'මෙහෙවරක්' *(Mission)* ලෙස සලකමින් කටයුතු කළ අන්දමට භයානක වසංගත රෝග ජය ගැනීම, ගෝලීය උණුසුම ඉහළ යෑම නතර කිරීම පිණිස ආර්ථිකය නිර්කාබනීකරණය කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම හා අධ්‍යාපනික කටයුතු සඳහා ඉංග්‍රීසි බස භාවිත කිරීමේ හැකියාව සැමට ලබා දීම මඟින් දැනුම අත්පත් කර ගැනීමේ විෂමතා අවම කිරීම එසේ මෙහෙවරක් ලෙස සලකා ඉටු කළ හැකි ඇතැම් දේවල් ය. මෙවැනි බරපතළ ප්‍රශ්න හුදෙක් තාක්ෂණික විසඳුම්වලින් පමණක් විසඳිය හැකි ඒවා නො වේ. ඒ සඳහා නව තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදන පමණක් නො ව සමාජීය, සංවිධානාත්මක හා දේශපාලනික ක්ෂේත්‍ර වල ද ඵලදායක නව එළඹුම් ගොඩනගා ගත යුතු ය.

මරියානා මාස්සුකාටෝ *Mission Economy* හෙවත් 'මෙහෙවර ආර්ථිකය' යනුවෙන් හඳුන්වන්නේ එයයි. හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම 'මෙහෙවර' *(Mission)* ලෙස සැලකූ විට එය ඉටු කර ගැනීම පිණිස කළ යුතු ලොකු කුඩා සංකීර්ණ කටයුතු හඳුනා ගෙන ඒවා පොදු හා පුද්ගලික යන දෙ අංශයේ ම අනුපූරක දායකත්වයෙන් ඉටු කර ගැනීමේ වැඩපිළිවෙළක් සැකසීමේ විධික්‍රමය නිදර්ශනයකට ගෙන මෙහෙවර ආර්ථිකයක් සංවිධානය කිරීම යනු කුමක් ද යන්න වටහා ගත හැකි ය. මාස්සුකාටෝ යෝජනා කරන අන්දමට මේ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය තුළින් නිශ්චිත පොදු අරමුණ ඉටු කර ගන්නා අන්දම පැහැදිලි ව විස්තර කිරීම අතිශයින් වැදගත් ය. මෙහෙවර ආර්ථිකයක මූලික අරමුණු සඳහා යොදා ගත හැකි ඉලක්ක සඳහා මාස්සුකාටෝ සුවිශේෂයෙන් යෝජනා කරන්නේ අප 20 වැනි

පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක් කළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන ඉලක්කයි *(sustainable development goal)*.

මාස්සුකාටෝ පෙන්වා දෙන අන්දමට මිෂන් එකොනොමි *(mission economy)* හෙවත් මෙහෙවර ආර්ථිකයක් ගැන කතා කිරීමේ දී ද අතිශයින් වැදගත් වන්නේ අපේක්ෂිත ඵලය යි. ඒ අනුව රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී ආර්ථිකයේ වර්ධන වේගය සහ ලාභය ඉපයීමට වඩා වැදගත් විය යුත්තේ මහජනතාවට අත්විඳිය හැකි නිශ්චිත ඵල ප්‍රයෝජන සහ මහජනතාවට වැදගත් පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීමයි. ඒ එළඹුමට අනුව පුද්ගලික අංශයේ සමාගම් පාලනයේ දී පවා හුදෙක් කොටස් හිමියන්ගේ පමණක් නො ව, කාර්ය මණ්ඩලය, පාරිභෝගිකයන් සහ පොදු ප්‍රජා සංවිධාන ඇතුළු සියලු පරදු දරන්නන්ගේ *(stakeholders)* පොදු යහපත මුල් වන ආකාරයේ සමාගමික අරමුණක් හරය කර ගත යුතු ය.

මෙහෙවර මුල්කර ගත් ආර්ථික එළඹුමක දී වැදගත් වන්නේ උද්දාමශීලී අපේක්ෂාවලින් ආවේශ විය හැකි විවිධ අංශවල ක්‍රියාශීලී දායකත්වය හා කාර්ය ශූර නවෝත්පාදන ඉස්මතු කළ හැකි ඉලක්ක තෝරා ගැනීම යි. වෙනත් අන්දමකින් කිව හොත් කළ යුත්තේ සියල්ලන් සඳහා සාධාරණ වඩා හොඳ අනාගතයක් සමපේක්ෂණය *(speculation)* කිරීමත් එය සාක්ෂාත් කර ගැනීම පිණිස පුද්ගලික හා පොදු යන උභය අංශවල ම ආයෝජන එකට සංවිධානය කර ගැනීමත් ය. අවසානයේ දී මිනිසෙකු සඳ මතට යවා ආපසු ගෙන්වා ගැනීමට හැකි වූයේ එම අරමුණ ඉටු කිරීමට සමත් ඒකාබද්ධ එළඹුමක් පරිකල්පනය කර ගැනීමට සියලු පරදු දරන්නන්ට *(stakeholders)* හැකිවීම නිසා බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

එහෙත් මෙහි දී ප්‍රශ්නය වන්නේ සාමාන්‍යයෙන් අලුතින් සිතිය නො හැකි, වෙළඳපොළ අසමත්කම් සහ ඌනතා ආමන්ත්‍රණය නො කරන, මහජන යහපත තකා සාර්ථක නියාමනයක් කිරීමට අසමත්, අකාර්යක්ෂම, දූෂිත, කම්මැළි සහ තරබාරු නිලධාරි තන්ත්‍රයක් ලෙස ආණ්ඩු සාමාන්‍යයෙන් අත්පත් කර ගෙන ඇති අපකීර්තිය යි. එයට

අනුව සිවිල් නිලධාරීහු සිලිකන් මිටියාවතේ චිර ප්‍රකට ව්‍යවසායකයන් මෙන් නිර්මාණශීලී අවදානම් ගැනීමට සූදානම් අය නො වෙති. ඒ නිසා අවදානම් ගැනීමට සූදානම් නවෝත්පාදනලෝලී පෞද්ගලික ව්‍යවසායකයන්ට එක හා සමාන ව තරඟ කළ හැකි සමතල ක්‍රීඩා පිටියක් සාදා දී ආණ්ඩුව ආර්ථිකයට මැදිහත් වීමෙන් ඉවත් විය යුතු බව කියනු අපට නිතර ඇසේ.

එහෙත් මේ පටු දැක්මෙන් අත් මිදෙන තෙක් ආර්ථික ක්‍රමය පිළිබඳ ගැටලුවලට විසඳුම් සෙවීම අපහසු බව මාස්සුකාටෝගේ මතය යි. අද්‍යතන ධනවාදය 'මිෂන්' හෙවත් 'මෙහෙවර' මුල් කර ප්‍රතිව්‍යුහගත කිරීමට නම් ආර්ථික ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම පිණිස පොදු අරමුණ නමැති අදහස පාදක කරගත් නව දේශපාලන හා ආර්ථික ආඛ්‍යානයක් ගොඩ නගා ගත යුතු ය. ඒ අනුව සැකසෙන සමාජ සම්බන්ධකම්, පැවරුම් සහ සංනිවේදනවල ඒකායන ප්‍රතිඵලයක් ලෙස වඩාත් සාධාරණ සහ ධරණීය සමාජයක් බිහි කිරීම අරමුණ කරගත් උද්දාමශීලී අභිප්‍රායක් අප තුළ තිබිය යුතු ය. එකී සජ්ජන සමාජය බිහි කිරීමට ආර්ථිකයේ අගයන් නිපදවන සියල්ලන් *(value creators)* හැකි තාක් දුරට අන්තර්ග්‍රහණය වන ප්‍රායෝගික ක්‍රමවේදයක් ද තිබිය යුතු ය. අගය නිපදවීම *(value creation)* සහ අගය ප්‍රතිව්‍යාප්ත කිරීම *(value distribution)* අතර ශක්තිමත් සම්බන්ධතාවක් බිහි කිරීම පිණිස ධනය සාමූහික ව නිපදවීම ද එකී පොදු අරමුණ මුල් කර ගෙන සිදුවිය යුතු ය.[260] මෙහි දී අගය ප්‍රතිව්‍යාප්ත කිරීම යනු හුදෙක් ඒකරාශී වීමෙන් පසු ධනය නැවත බෙදාහැරීම *(wealth redistribution)* පමණක් නො ව ඒකරාශී වීමට ඉඩ නො තබා කල් තියා ම සාධාරණ ව ධනය බෙදා හැරෙන අන්දමද *(wealth pre-distribution)* නිර්ණය කිරීම යි. මෙයට උදාහරණයක් ලෙස අප 26 වැනි පරිච්ඡේදයේ සවිස්තර ව සාකච්ඡා කරන සියලු දෙනාට නිශ්චිත ආදායමක් සහතික කරන සාර්වත්‍රික මූලික ආදායම *(Universal basic Income)* පිළිබඳ අදහස ගෙන හැර දැක්විය හැකි ය.

260 Mariana Mazzucato (2020), Mission Economy – A moonshot guide to changing capitalism, Penguin, London, pp 29-30 K.E

මේ අනුව ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී පොදු අරමුණ සාක්ෂාත් කර ගැනීම අරභයා පොදු සහ පෞද්ගලික යන උභය පාර්ශව අතර අන්‍යෝන්‍ය ඵලදායකත්වය ඇති කර ගන්නේ කෙසේ ද යන්න වැදගත් ය. මෙහි තේරුම නම් අවදානම පොදු අංශයටත් ප්‍රතිලාභ පෞද්ගලික අංශයටත් පැවරෙන දැනට ඇති පොදු-පෞද්ගලික පංගුකාරිත්වය *(public-private partnership)* නම් හිස් යෙදුම බැහැර කොට ප්‍රතිලාභ මෙන් ම අවදානම ද සමාන ව බෙදී යන සහජීවනයක් පෞද්ගලික හා පොදු අංශ අතර ඇති කිරීම යි.

මෙහෙවර මුල් කර ගත් ආර්ථික වර්ධන එළඹුමක් යනු හඳුනා ගත් සමාජීය අරමුණු ඉටු කර ගැනීම පිණිස ආර්ථිකය යොමු කළ යුතු දිසාව තෝරා එය සාක්ෂාත් කර ගැනීම පිණිස විසඳිය යුතු ගැටලු මොනවාද ඒ සඳහා ආර්ථික පද්ධතිය සැලසුම් කර ගන්නේ කෙසේ ද යන්න විස්තර කිරීමයි. එහි දී රටවැසියන් සහ ව්‍යාපාර යන දෙකොට්ඨාසය ම සම්බන්ධ කර ගත හැකි සහ ආර්ථිකය හා සම්බන්ධ විවිධාකාර ක්‍රියාකාරීන් අතර නවෝත්පාදන, ආයෝජන සහ සහයෝගය උත්ප්‍රේරණය කළ හැකි ආකාරයේ ප්‍රතිපත්ති සැකසීම මෙහි දී අත්‍යවශ්‍යය වේ. එහි තේරුම වන්නේ වෙළඳපොළේ ඇති කිනම් ගැටලු අප විසින් විසඳිය යුතු ද යන්න වෙනුවට කිනම් ආකාරයක වෙළඳපොළක් අප විසින් පවත්වා ගෙන යා යුතු ද යන්න තීරණය කිරීම යි. නව ඩිජිටල් තාක්ෂණය සම්බන්ධ ඇති නැති පරතරය අවම කිරීම, වැඩි වැඩියෙන් පුනර්ජනනීය බල ශක්තිය ආදේශ කර ගැනීම, සාගරවල ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉවත් කිරීම ආදී සුවිශේෂී ප්‍රශ්නයකට විසඳුම් සෙවීමේ දී වුවද වඩා ඵලදායක තාක්ෂණික නවෝත්පාදන විසඳුම් ඒ සඳහා යොදා ගැනීම ද ඉන් අදහස් වේ. එහි දී වැරදි ප්‍රශ්නය නම් කොයි තරම් මුදලක් ඇත් ද? ඉන් අපට කළ හැක්කේ කුමක් ද? යන්නයි. නිවැරදි ප්‍රශ්නය වන්නේ අවශ්‍යතාව කුමක් ද? එම අවශ්‍යතාව ඉටු කර ගැනීමට අය වැය යළි සකසා ගත යුත්තේ කෙසේ ද යන්න බව මාස්සුකාටෝ පවසයි.

මෙහි දී ආණ්ඩුව සහ ධනවාදය යන දෙක ම ගැන බරපතළ ලෙස නැවත සිතා බැලීමක් කළ යුතු ය. ධනවාදය වෙනස් කිරීම යනු ආණ්ඩුව සැකසී ඇති ආකාරය සහ ව්‍යාපාර කටයුතු කරන ආකාරය යන දෙක ම වෙනස් කිරීමත් පොදු හා පුද්ගලික ආයතන අතර ගොඩ නැගෙන අන්තර් සම්බන්ධතාවේ ස්වරූපය තීරණාත්මක ව වෙනස් කිරීමත් බව මාස්සුකාටෝ පෙන්වා දෙයි. මෙහෙවර මුල් කර ගත් සංවර්ධනයේ දී ආයතනවල පාලන ව්‍යුහය සහ ආයතන අතර සම්බන්ධතාව මෙහෙයවිය යුත්තේ හඳුනා ගත් අරමුණ සාක්ෂාත් කර ගැනීම පොදු අභිමතාර්ථය වසයෙන් සලකමිනි.

මේ අනුව ආණ්ඩුව යනු හුදෙක් වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම පිණිස ගැටලු විසඳන ආයතනයක් යනුවෙන් පවතින ආකල්පය වෙනස් වී ආණ්ඩු පවතින්නේ නිශ්චිත පොදු අරමුණු ඉෂ්ට කර ගැනීමට ය යන ආකල්පය ඇති කර ගත යුත්තේ ය. වෙළඳපොළ ප්‍රශ්න විසඳීමේ කටයුත්ත ආණ්ඩුවක ප්‍රධාන කාර්යය නො වේ. ඒ වෙනුවට ආණ්ඩුව කළ යුත්තේ සමාජීය අවශ්‍යතා හා පොදු අරමුණු ඉටු කර ගැනීමට දායකත්වය ලැබෙන අන්දමට වෙළඳපොළ මෙහෙයවීම යි. ඒ සඳහා ආර්ථිකයේ දිශානතිය විය යුත්තේ කුමක් දැ'යි තීරණය කිරීම සහ සියලු නියාමන කටයුතු ඒ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා පවත්වා ගෙන යෑමත් ආණ්ඩුවේ කාර්යය බව මාස්සුකාටෝ කියයි.

මේ සම්බන්ධයෙන් අතිශයින් වැදගත් වන්නේ ආණ්ඩුවේ නිලධාරි තන්ත්‍රයේ ආකල්පය යි. නිර්බාධක වෙළඳපොළ ක්‍රමයක් පවත්වා ගෙන යෑම ආණ්ඩුවේ මූලික රාජකාරිය වසයෙන් සලකා කටයුතු කරනවා වෙනුවට පොදු අරමුණු ඉටු කිරීම සඳහා අවදානම් ගැනීමට නො පැකිළෙන ඒකාබද්ධ යන්ත්‍රණයක් ලෙස නිලධාරි තන්ත්‍රය කටයුතු කළ යුතු ය. හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම වැනි මෙහෙවරක් තීරණය කළ පසු එහි ඇති සියලු අවදානම් ආමන්ත්‍රණය කරමින් පොදු සහ පෞද්ගලික යන අංශ දෙක ම මෙහෙයවමින් අධිෂ්ඨානශීලී ව කටයුතු කිරීමට කෙනඩිගේ ආණ්ඩුවට හැකි විය.

ඒ අනුව 'ආණ්ඩුව පවතින්නේ හුදෙක් වෙළඳපොළ අසමත් වන අවස්ථාවල දී හිඩැස පිරවීමට ය' යන සාම්ප්‍රදායික සිතුවිල්ලෙන් අප මිදිය යුතු ය. ආණ්ඩුව කේන්ද්‍රීය ව්‍යවසායකයෙකු හා නවෝත්පාදකයෙකු වසයෙන් කටයුතු කළ යුතු ය. නවෝත්පාදනයේ ලා පුරෝගාමී වීම ආණ්ඩුවට ආගන්තුක කටයුත්තක් නො වේ. අද පුද්ගලික අංශය විසින් අත්පත් කර ගෙන ඇති ව්‍යාපාර සඳහා උපයෝගී වන බොහෝ තාක්ෂණික සොයා ගැනීම් ආණ්ඩු විසින් පොදු අරමුදල් භාවිතයෙන් හෝ පොදු ආයතන මඟින් නවොත්පාදනය කරනු ලැබූ ඒවා ය.

නවොත්පාදනය සම්බන්ධයෙන් ආකර්ෂණීය කීර්තියක් අත්පත් කරගත් අයිෆෝන්, අයිපෑඩ් වැනි ජනප්‍රිය නිෂ්පාදන හඳුන්වා දුන් ඇපල් සමාගම උදාහරණයකට ගෙන මාස්සුකාටෝ මේ සම්බන්ධයෙන් කදිම විවරණයක් සපයයි.  නිවසක ගරාජයකින් ඇරඹී වෙළඳපොළ බලයේ බලකණුවක් වී යැයි සැලකෙන ඇපල් සමාගම නිර්මාණාත්මක සංහාරයේ *(creative destruction)* ඉන්ද්‍රකීලයක් ලෙස නිරන්තරයෙන් හුවා දක්වනු ලැබේ. එහෙත් ඇත්ත වසයෙන් ම ඔය හුවා දක්වන තරම් ඇපල් සමාගම වෙළඳපොළ බල පරාක්‍රමය නිසාම ලෝකය ජය ගත් ආයතනයක් නො වන බව මාස්සුකාටෝ පෙන්වා දෙයි. ඇපල් සමාගම ආරම්භයේ දී එයට මූල්‍යාධාර සැපයුණේ ඇමෙරිකානු ආණ්ඩුවේ *SBIR* හෙවත් කුඩා ව්‍යාපාර නවොත්පාදන පර්යේෂණ ආයතන *(Small Business Innovation Ag-ency) :* වැඩසටහන යටතේ ය. එපමණක් නො ව එහි බොහෝ 'ස්මාට්' නිෂ්පාදනවලට යොදා ගත් තාක්ෂණය බිහිවුණේ පොදු අරමුදල් ආයෝජනය වූ *APRA, NASA, DARPA* වැනි රාජ්‍ය ආයතනවල ව්‍යාපෘති හා වැඩසටහන් නිසා ය.[261] මාස්සුකාටෝ පෙන්වා දෙන අන්දමට ඇත්ත වසයෙන් ම අයිෆෝනය වැනි මෙවලමක යොදා ගෙන ඇති හැම තාක්ෂණයක් ම ජනිත වුණේ රාජ්‍ය ආධාර මඟින් හෝ පොදු අරමුදලින් පවත්වා ගෙන

261 Mariana Mazzucato (2020), Mission Economy – A moonshot guide to changing capitalism, Penguin, London, pp 55 K.E

යන ආයතනවලින් ක්‍රියාත්මක වූ වැඩසටහන් මගිනි. අයිෆෝනය සඳහා යොදා ගෙන ඇති සංනිවේදන තාක්ෂණයට අතිරේක ව අන්තර්ජාලය, ජීපීඑස් හෙවත් ගෝලීය තැන් සෙවුම් පද්ධති, ටච් ස්ක්‍රීන් හෙවත් ස්පර්ශ තිරය, *SIRI* යනුවෙන් හැඳින්වෙන හඬ ආධාරක ක්‍රමය ආදි මේ සියලු උපාංගවලට පාදක තාක්ෂණය පොදු අරමුදල්වල අනුග්‍රහය ලැබූ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සොයා ගැනීම් ය. ඇපල් සමාගමේ නිර්මාතෘ ස්ටීව් ජොබ්ස් අවිවාදයෙන් ම කෘතහස්ත නිර්මාණශීලී පුද්ගලයෙකු බව ඇත්තකි. එහෙත් අයිෆෝන්-අයිපෑඩ් අධිරාජ්‍ය ගොඩනැගීම සම්බන්ධයෙන් ඔහු වෙත ආරූඪ කර ඇති ජනප්‍රිය විශ්වාසය නිසා ඇපල් සමාගම ඒ තත්වයට ගෙන ඒම සඳහා පොදු අරමුදලින් බිහිවුණු තාක්ෂණය විසින් ඉටු කරන ලද තීරණාත්මක කාර්යභාරය නො සලකා හැරීම අයුතු ය. ඇපල් සමාගම බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඇති වුණ විවාදයේ දී රාජ්‍ය ආධාර ක්‍රමවලින් ලද මෙවැනි ඵල ප්‍රයෝජන ලබාගැනීම් ගැන අවශ්‍ය තරම් අවධානයක් යොමු නො විණි. නවෝත්පාදනයේ දී අවදානම් ගැනීමට මැලි නො වූ පොදු වැඩසටහන්වල ඵල ප්‍රයෝජන නිසා පසු කලක ඉමහත් ධනස්කන්ධයක් උපයා ගත් ඇපල් වැනි සමාගම් එම ආදායමෙන් සැලකිය යුතු කොටසක් බදු ගෙවීම මඟින් පොදු අරමුණු ඉටු කිරීමට දායකවීම මඟ නො හැරිය හැකි යුතුකමක් බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

ආණ්ඩුවක් විසින් මෙහෙවර ආර්ථිකය මෙහෙයවනු ලැබීමට අනුරූප කාර්යභාරයක් ඇමෙරිකාවේ *DARPA* හෙවත් ආරක්ෂක කටයුතු සම්බන්ධ උසස් පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ ඒජන්සිය *(Defense Advance Research Project Agency)* වැනි ආයතන විසින් ඉටු කරනු ලැබී ය. එහි කටයුතු හුදෙක් උසස් තාක්ෂණික පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම පමණක් නො වී ය. තෝරා ගත් සුවිශේෂී නිශ්චිත ඉලක්ක හඳුනා ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය හා මානව සම්පත් ඒ කරා යොමු කරවීම, නවෝත්පාදන අවස්ථා සඳහා නව කවුළු විවර කිරීම, තාක්ෂණික සංවර්ධනයේ

නියැලෙන පුද්ගලික හා පොදු ආයතන අතර අන්තර් සම්බන්ධකම් ගොඩනැගීම, නවොත්පාදන සඳහා ආයෝජනය කිරීමට ව්‍යාපාර ප්‍රාග ්ධන හිමියන් පොලඹවා ගැනීම වැනි කටයුතු රැසක් එම ආයතනයෙන් ඉටු විය. *DARPA* ආයතනය බිහි කරනු ලැබුවේ තාක්ෂණික විශිෂ්ටත්වය නො කඩවා ඇමෙරිකා එක්සත් ජනපදය සතු ව පවත්වා ගෙන යෑම සඳහා ය. ඒ නිසා එකී මෙහෙවර *(Mission)* ඉටු කිරීම සඳහා අවශ්‍ය ආක්‍රමණශීලී වැඩ සටහනක් *DARPA* ආයතනය විසින් පවත්වා ගෙන යන ලදී. වසරකට ඩොලර් බිලියන 3ක වැය ශීර්ෂයක් සහ 240 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත වූ එම ආයතනය නම්‍යශීලී වැඩ සංස්කෘතියකින් යුක්ත වුවක් විය. ආයතනයේ නිශ්චිත ව්‍යාපෘති හා වැඩ සටහන් සඳහා අවශ්‍ය ගුණාත්මක බවින් උසස් කළමනාකරුවන් අදාළ ව්‍යාපෘතියට අනුකූල ව අවුරුදු 4-6 දක්වා කෙටි කාලීන කොන්ත්‍රාත්තු පදනම යටතේ බඳවා ගන්නා ලදී. එනිසා ඔවුහු පොදු අරමුණ කරා ළඟා වීම සම්බන්ධයෙන් තමන්ට හිමි නිශ්චිත කාර්ය නො වළහා ඉටු කිරීම පිණිස අවශ්‍ය අවදානම් ගැනීමට පසුබට නො වන අය වූහ.

*DAPRA* ආයතනික මොඩලයේ ප්‍රධාන ලක්ෂණ හතරක් මසුකටෝ සිය *Entrepreneurial State* නමැති ග්‍රන්ථයේ මෙසේ හුවා දක්වයි.[262]

- බලාපොරොත්තු සහගත නවෝත්පාදනීය අදහස් අත්හදා බැලීම සඳහා අයවැය සම්බන්ධයෙන් සැලකිය යුතු ස්වායත්ත භාවයක් ඇති විචක්ෂණ විද්‍යාඥයින්ගෙන් සහ ඉංජිනේරුවන්ගෙන් සමන්විත සාපේක්ෂ වසයෙන් කුඩා වූ කාර්යාල සමුච්චයකින් *DAPRA* ආයතනික ව්‍යුහය සමන්විත යි. මෙකී කාර්යාල ප්‍රතික්‍රියාවක් ලෙස නො ව ඉදිරි දැක්මක් සහිතව ප්‍රගාමී ලෙස කටයුතු කරමින් තමන් පරිචය දක්වන ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ න්‍යාය පත්‍රය තීරණය කරයි. එහි

262 Mariana Mazzucato (2015) The Entrepreneurial State: Debunking Public vs. Private Sector Myths, Public Affairs, pp 98-99, K.E

දී හඳුනා ගත් සුවිශේෂ තාක්ෂණික අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය විද්‍යාඥයන් සහ තාක්ෂණික ශිල්පීන් විශ්ව විද්‍යාල සහ අනෙකුත් පොදු හා පෞද්ගලික ආයතනවලින් තෝරා ගෙන සම්බන්ධීකරණය කොට කණ්ඩායම් ලෙස මෙහෙයවා ගැනී ම ද එම කාර්යාල විසින් ම ඉටු කරනු ලබයි.

- නවෝත්පාදනීය පර්යේෂණ සඳහා අවශ්‍ය වන මූලාධාර ලබා දෙන්නේ විශ්ව විද්‍යාල පාදක පර්යේෂකයන්, නව නිපැයුම් සඳහා ම අලුතින් බිහි කළ සමාගම් සහ පළපුරුදු සමාගම්වලින් සමන්විත සාමූහිකයකට යි. එහි දී ප්‍රාථමික පර්යේෂණ සහ ඉහළ මට්ටමේ පර්යේෂණ අතර වෙනස නො සැලකේ. මන්ද ඒ දෙවර්ගය ම ගැඹුරු ලෙස එකිනෙක හා වෙළී තිබෙන බැවිනි. ඒ හැර පර්යේෂණවල දී අවශ්‍ය ප්‍රගතිය නො පෙන්වන කණ්ඩායම්වලට වෙන් කළ මූලාධාර වැඩි ප්‍රගතියක් දක්වන කණ්ඩායම්වලට පැවරීමේ බලය ද *DAPRA* ව්‍යාපෘති කළමනාකරුවන් සතු ය.
- ආයතනයේ අරමුණ වන්නේ ප්‍රායෝගික ව උපයෝගී කර ගත හැකි විසඳුම් හඳුන්වා දෙන ආකාරයේ තාක්ෂණික දියුණුවක් ඇති කර ගැනීම යි. අදාළ සමාගම්වලට සිය නවෝත්පාදන වෙළඳපොළට හඳුන්වා දීමට ආධාර කිරීම දක්වා *DAPRA* ආයතනයේ කාර්යභාරය පුළුල් කර ගැනීමට කළමනාකරුවන්ට ඉඩ තිබේ.
- නවෝත්පාදනීය අදහස් සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් ජනිත කිරීම පිණිස එකිනෙකට වෙනස් පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර සහයෝගිතාව තහවුරු වන ලෙස සම්බන්ධීකරණ කටයුතු අධීක්ෂණය කිරීම *DAPRA* ආයතනයේ වගකීමක් වීම.

ඒ අනුව ආයතන මට්ටමින් පමණක් නො ව ආණ්ඩුවක් වසයෙන් වුවද *DAPRA* මොඩලයට අනුරූප ව සුදුසු සාකල්‍ය එළඹුමක් අනුගමනය කිරීම මෙහෙවර ආර්ථිකයක අරමුණු ඉටු කර

ගැනීමට දායකත්වය දෙන ආයතනවලට කළ හැකි ය. මේ අනුව කටයුතු කිරීමට නම් ආණ්ඩුවේ පරිපාලන තන්ත්‍රය ගුණාත්මක, ආකල්පීය හා සංවිධානාත්මක යන සියලු අංශවලින් ම ප්‍රතිසංවිධානය විය යුතු ය.

නව තාක්ෂණ ක්ෂේත්‍රයේ *DAPRA* ආයතනය වැනි පොදු ආයතන ඉටු කළ ඵලදායක පුරෝගාමී කාර්යභාරය අදාළ වන්නේ යහමින් අරමුදල් හා සම්පත් ඇති ඇමෙරිකා එක්සත් ජනපදය වැනි විශාල රටවල්වලට පමණක් නො වේ. ඩෙන්මාකය හා ඊශ්‍රායලය වැනි කුඩා රටවල් ද ආණ්ඩුවේ මූලපිරීමෙන් හා මෙහෙයවීමෙන් නවොත්පාදන හඳුන්වා දීම සාර්ථක කර ගෙන තිබේ. වර්තමානයේ චීනයේ පුනර්ජනනීය බල ශක්තිය හා පරිසර හිතකාමී කාර්මිකකරණය සඳහා අවශ්‍ය බොහෝ දියුණු තාක්ෂණික විසඳුම් ලබා ගන්නේ කුඩා රටක් වූ ඩෙන්මාකයෙන් බව මාස්සුකාටෝ පෙන්වා දෙයි. එමෙන් ම තායිවානයේ කාර්මික තාක්ෂණ පර්යේෂණ ආයතනය, ඊශ්‍රායලයේ ප්‍රධාන විද්‍යාඥයාගේ කාර්යාලය, ජපානයේ ජාත්‍යන්තර වෙළඳාම සහ කර්මාන්ත පිළිබඳ අමාත්‍යාංශය, සිංගප්පූරුවේ විද්‍යා තාක්ෂණ පර්යේෂණ කටයුතු ඒජන්සි ආයතනය එක්සත් ජනපදයේ *DAPRA* ආයතනයට අනුරූප ව සිය රටවල තාක්ෂණික නවොත්පාදන නිර්මාණය කිරීමේ ලා පුරෝගාමී විය. මෙහි ලා තවත් වැදගත් උදාහරණයක් වන්නේ නූතන ඉලෙක්ට්‍රොනික් කර්මාන්තයේ ඉන්ද්‍රකීලයක් ව ඇති දකුණු කොරියාව යි. කොරියාව සෙමිකොන්ඩක්ටර් කර්මාන්තයට අවතීර්ණ වුණේ 1970 ගණන්වල දී ඇමෙරිකානු තාක්ෂණික සමාගම් ආකර්ෂණය කරමින් අඩු මිලට හොඳ පුහුණු ශ්‍රමිකයන් සැපයීමට එරටට තිබූ හැකියාව උපයෝගී කර ගනිමිනි. ඊළඟ දශකයේ දී නිෂ්පාදන ශක්‍යතාව ඇති කොරියානු ව්‍යාපාරිකයන්ට නවෝත්පාදනය සඳහා අනුබල දෙන තීරණාත්මක කාර්මික ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් කොරියාව ඉලෙක්ට්‍රොනික භාණ්ඩ වෙළඳපොළෙන් සැලකිය යුතු කොටසක් සිය අණසකට නතු කර ගත්තේ ය.

රාජ්‍ය අංශය අනුක්‍රමයෙන් අකාර්යක්ෂම කිරීම නවලිබරල්වාදය අනුදත් රාජ්‍ය නායකයන්ගේ දැනුවත් මෙහෙයවීමෙන් සිදු වූවකි. ඉංග්‍රීසි භාෂාවේ ඇති භයානක ම වචන කිහිපය වන්නේ "මම රජයෙන්, මං ආවේ උදව් කිරීමටයි" යනුවෙන් කීම බව නවලිබරල්වාදී ආර්ථික චින්තනයේ කස කරුවෙකු වූ ඇමෙරිකානු ජනාධිපති *(*1981-1989*)* රොනල්ඩ් රේගන් වරක් පැවසී ය. රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව අවම වීමට ඇති හේතු ඉවත් කරනවා වෙනුවට එමඟින් ඔහු අදහස් කළේ රාජ්‍ය අංශයේ කාර්ය අවම කොට පෞද්ගලික අංශය ප්‍රමුඛ කොට ආර්ථිකය ගොඩ නැඟීම යි.

තදනන්තර ව රජයේ ආර්ථික භූමිකාව සම්බන්ධයෙන් වැරදි මතවාද කිහිපයක් වපුරන ලද බව මාස්සුකාටෝ පෙන්වා දෙයි. ඉන් පළමු වැන්න නම් ආර්ථික වටිනාකම් නිපදවීම පෞද්ගලික අංශයේ කටයුත්තක් බැවින් රාජ්‍ය අංශයේ කාර්ය හුදෙක් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමකට සීමා විය යුතු බව යි. ඒ අනුව ආර්ථික ක්‍රීඩාවේ නීති සැකසීම, නියාමනය සහ වෙළඳපොළ ඌනතා පූරණය කිරීම හැරෙන්නට වෙන කිසිවක් රජය විසින් නො කළ යුතුයැ'යි අදහස් කෙරිණි. 2008 මූල්‍ය අර්බුදයේ දී සමස්ත ආර්ථිකය කඩා වැටීමෙන් බේරා ගැනීමට මහ බැංකුවලට තීරණාත්මක ව මැදිහත් වීමට සිදු වුණත් සාමාන්‍යයෙන් මහ බැංකුවක කාර්යභාරය ලෙස සැලකුණේ ව්‍යාපාරවලට හිතකර ලෙස පොලී අනුපාත සහ ණය පහසුකම් පවත්වා ගෙන යැමයි. රජයේ භූමිකාව අවම කළ මේ වැරදි මතවාදයේ ප්‍රතිඵලය වූයේ නව නිෂ්පාදන ක්‍රමවේද හා නවෝත්පාදන හඳුන්වා දීම සම්බන්ධ තිබූ විශ්වාසය පොදු ආයතනවලින් ගිලිහී යැමයි. ඒ අනුව නිර්මාණාත්මක අවදානම් ගැනීමට රාජ්‍ය ආයතන මැලි වීම නිසා ඒවා හුදු අක්‍රිය හා අකාලික ආයතන බවට පත් විය. ඒ සමඟම විශ්ව විද්‍යාල අනුබද්ධිත පර්යේෂණ ආයතන හා විද්‍යාර්ථීන් සමඟ පමණක් නො ව පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ ව නවෝත්පාදන බිහි කිරීම සම්බන්ධයෙන් එතෙක් ඉටු කළ මෙහෙයවුම් භූමිකාව ද රාජ්‍ය ආයතනවලින් ගිලිහී ගියේ ය. මේ නිසා *DARPA* වැනි රාජ්‍ය

ආයතන විසින් ඉටු කළ පුරෝගාමී මෙහෙවර කටයුතු අමතක කරමින් ආර්ථික වටිනාකම් බිහි කරන්නේ පෞද්ගලික අංශයෙන් පමණකි යන්න පොදු විශ්වාසයක් බවට පත් විය.

දෙවැනි වැරදි මතවාදය වන්නේ ආණ්ඩුව පවතින්නේ වෙළඳපොළ අසමත්කම් නිසා ඇතිවෙන හිඩැස පිරවීමට පමණකි යන්න යි. වෙළඳපොළ අසමත්කම්වලට නොයෙකුත් හේතු තිබිය හැකි ය. ඒ අතර පාරිභෝගිකයන් හා වෙළෙන්දන් අතර එක සමාන තොරතුරු හුවමාරු නො වීම නිසා ඇතිවෙන අසමමිතික බව හෝ සමාජ යහපත සැලසෙන ආර්ථික විද්‍යාවේ දී ධන බාහිරතා *(positive externalities)* ලෙස හැඳින්වෙන පොදු සේවා හා භාණ්ඩ, මහජන සෞඛ්‍ය සහ මූලික පර්යේෂණ ආදිය සඳහා පොදු අරමුදල් සැපයීම හෝ එසේත් නැතිනම් පරිසර දූෂණය වැනි ඍණ බාහිරතා *(negative externalities)* ද තිබිය හැකි ය. ධන බාහිරතා යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ කිසියම් කටයුත්තකින් තුන්වැනි පාර්ශවයකට නිරායාසයෙන් ම ලැබෙන වාසිය යි. උදාහරණයක් ලෙස විකිණීම සඳහා මල් වවන කෙනෙකු ඒ මඟින් මී පැණි නිපදවීමට මී මැසි පාලනයේ නියැලෙන අසල්වැසියෙකුට අනායාසයෙන් ම වාසියක් සලසයි. වෙළඳපොළ අසමත්කම්වලට මැදිහත් වීම යන අදහසට අනුව පරිසර දූෂණය වැනි අවස්ථාවල දී මැදිහත් වී දූෂකයා විසින් හානිපූරණය කළ යුතු ය යන තර්කය මත විශේෂ කාබන් බද්දක් අය කිරීම රජයේ කාර්යයක් ලෙස සැලකේ. එමෙන් ම බදු ප්‍රතිපත්තිය මඟින් එක්රැස් වන ධනය ප්‍රතිව්‍යාප්ත කිරීම ද සැලකෙන්නේ වෙළඳපොළ අසමත්කම්වලට රජය යොදන පිළියමක් ලෙස ය.

එහෙත් අධ්‍යාපනයට අරමුදල් යෙදවීම වැනි ධන බාහිරතා *(positive externalities)* සම්බන්ධ ව ගත හොත් නවලිබරල්වාදීන් අදහස් කරන්නේ රජය අධ්‍යාපනයට මැදිහත් විය යුත්තේ පෞද්ගලික අංශය විසින් අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමට අසමත් වන අවස්ථාවල දී පමණකි කියා ය. එම අදහස තහවුරු කිරීමට නවලිබරල්වාදීන් යොදා

ගන්නා එක් තර්කයක් වන්නේ වෙළඳපොළ තරඟය සහ ලාභ ලැබීමේ චේතනාව නිසා පාරිභෝගිකයන්ට අධ්‍යාපනය සම්බන්ධයෙන් හොඳ තෝරා ගැනීමක් කළ හැකි නමුත් රාජ්‍ය පරිපාලන කටයුතු මඟින් ගන්නා තීරණවල දී එවැනි තේරීමක් කිරීමට අවස්ථාවක් නො ලැබෙන බව යි. මේ හැර දේශපාලන අනුග්‍රහය, ඥාති සංග්‍රහය සහ නොයෙකුත් දූෂිත ක්‍රියා නිසා අවදානමට ලක් වන බැවින් වෙළඳපොළ මඟින් ලබාදෙන තේරීම් තරම් හොඳ තේරීම් රාජ්‍ය අංශයට ලබා දිය නො හැකි බව ද නිතර හුවා දක්වනු ලැබේ. එහෙත් මෙය නිවැරදි නම් වෙළඳපොළ අසමත් වන අවස්ථාවල දී රජය මැදිහත් වීමෙන් හොඳ ප්‍රතිඵලයක් ලැබෙන්නේ කෙසේ ද යන්න එමඟින් විස්තර නො වේ. එයාර්බස් සමාගම ප්‍රංශ හා ජර්මන් ආණ්ඩුවල ඒකාබද්ධ මූලික ආයෝජනවලින් අරඹා මගී ගුවන් යානා නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ව්‍යාපාරයක් බවට පත් වූ විට නවලිබරල්වාදීන් එය හැඳින්වූයේ පෞද්ගලික අංශයට ඇති ව්‍යාපාරික අවස්ථාවක් පැහැර ගැනීමක් ලෙසිනි.

ඇත්ත වසයෙන් ම ක්‍රමෝපායික ලෙස යෙදවූ විට රාජ්‍ය අංශයේ ආයෝජන නිසා පුද්ගලික අංශයේ ආයෝජන ද දිරිගැන්වේ. එයා බස් සමාගමට පෞද්ගලික අංශයෙන් යෙදවුණ ආයෝජන ඊට නිදසුනකි. තාක්ෂණික දියුණුවේ ඉතිහාසය සලකා බලන විට තීරණාත්මක නව සොයා ගැනීම් බිහි කර ගැනීමට හැකි වූ බොහෝ අවස්ථාවල දී රාජ්‍ය ආයෝජන මූලික වූ බව පෙනේ. නැනෝ තාක්ෂණය හා ජීව තාක්ෂණය සම්බන්ධ නවෝත්පාදන වැනි ආරම්භයේ දී අවදානම ගත යුතු බොහෝ ක්ෂේත්‍රවල ආයෝජන කිරීමට රාජ්‍ය අංශය ඉදිරිපත් වී බිය සැක ඉවත් නො කරන්නට පෞද්ගලික අංශය ඒ සඳහා ආයෝජනය කිරීම පසුබෑමකට ලක් වන්නට ඉඩ තිබුණු බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

තෙවැනි වැරදි මතවාදය ලෙස මාස්සුකාටෝ හඳුන්වන්නේ ආණ්ඩුව කටයුතු කළ යුත්තේ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතනයක් ලෙස ය යන ප්‍රකට විශ්වාසය යි. මින් අදහස් වන්නේ

කිසිදු අවදානමක් ගැනීමෙන් තොර ව ආණ්ඩුව පුද්ගලික ව්‍යාපාරයක් ලෙස තමන්ට නියමිත සීමිත කටයුත්ත ඉටු කළ යුතු බව යි. එකී සීමිත කටයුතු නම් ව්‍යාපාරික ඒකාධිකාර ඇතිවීම වැළැක්වීම, නීතිය හා සාමය ආරක්ෂා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී පමණක් නියාමනය කිරීම වැනි ක්‍රියා මඟින් ආර්ථික ක්ෂේත්‍රයේ තරඟකාරී ලෙස නියැලෙන්නන් සඳහා සම බිමක් පවත්වා ගෙන යැම යි. ඒ හැරෙන්නට ආණ්ඩුව විසින් වෙන කිසි දෙයක් නො කළ යුතු බව නවලිබරල්වාදීන්ගේ අදහස විය. ආණ්ඩුවේ ආයතන පුද්ගලික අංශයේ මෙන් ව්‍යාපාරික විනයක් ඇති ව පවත්වා ගෙන යා යුතු බව හැරෙන්නට ඉන් කියවෙන්නේ පොදු ප්‍රවාහනය හා මහජන සෞඛ්‍ය වැනි සාම්ප්‍රදායික ව රජය මඟින් පවත්වා ගෙන ගිය පොදු සේවාවලින් සැලකිය යුතු කොටසක් පෞද්ගලික අංශයට පවරා දිය යුතු බව යි.

ආණ්ඩුවේ කටයුතු ව්‍යාපාරික ආයතනයක් ලෙස පවත්වා ගෙන යුතු ය යන අදහසට අනුකූල ව 1980 ගණන්වල ඇතැම් ව්‍යාපාරවේදී ගුරුකුල විසින් හඳුන්වා දෙනු ලැබූ *New Public Management* හෙවත් 'පොදු අංශයේ නව කළමනාකරණය' නමැති සංකල්පය යටතේ පොදු අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අටියෙන් ලාභ ලැබීම පොදු ආයතනවල මූලික අරමුණ කර ගත යුතුයැ'යි නිර්දේශ කෙරිණි. ඒ හැර ආණ්ඩුව මඟින් කළ යුතු සේවා සැපයීම් ආදිය කොන්ත්‍රාත්තු මත පෞද්ගලික අංශයට පැවරීම ද බෙහෙවින් උනන්දු කෙරුණි. මෙහි දී එක් ප්‍රබල තර්කයක් වුණේ සමාගමක කොටස්කරුවන්ට එම සමාගමේ කළමනාකරුවන් වග වෙන අන්දමට සමාන ව මහජනතාවට රජයේ සේවකයන් වග වෙන අන්දමේ ක්‍රමයක් නොමැති වීම විශාල අඩුපාඩුවක් බවයි. කොටස්කරුවන්ට මෙන් නො ව මහජනතාවට ආණ්ඩුවේ කළමනාකාරිත්වය ගැන එවැනි වග වීමක් ඉල්ලා සිටිය හැක්කේ වසර පහකට වරක් පැවැත්වෙන මැතිවරණයක් මඟින් පමණි.

එහෙත් 1990 වන විට නව පොදු කළමනාකරණ සංකල්ප උපයෝගී කරගත් රටවලට ඉන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල නො ලැබෙන බව පෙනී යන්නට විය. කොන්ත්‍රාත්කරුවන් බාර ගත් ඇතැම් සේවා නිසි ලෙස ඉටු නො විණි. නපක *(New Public Management)* හෙවත් පොදු අංශයේ නව කළමනාකරණ සංකල්පයට අනුව දිරි ගන්වන ලද නිර්නියාමනය නිසා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් හැසිරීම් නිරන්තරයෙන් දක්නට ලැබුණි. දිගු කාලීන ආයෝජන සඳහා වෙහෙසෙනු වෙනුවට කෙසේ හෝ කොටස් මිල ඉහළ දමා ගැනීමේ කෙටි කාලීන වැඩපිළිවෙළවලට සමාගම් ඇබ්බැහි වෙන්නට පටන් ගත්තේ ය. රජයේ සේවා කටයුතු බහිස්සේවාපර්ණය *(outsource)* කිරීම හෙවත් පිටස්තර ප්‍රභව වලට පැවරීම නිසා අදාළ නිෂ්පාදන හා සේවාවල ගුණාත්මක බව පවත්වා ගැනීමට ආණ්ඩුවලට අපහසු විය. එහෙත් පුද්ගලීකරණය වූ ප්‍රවාහන සේවාවලින් බලාපොරොත්තු වූ කාර්යක්ෂමතාව හා නවීකරණය ඉටු නොවිණි. ඒ නිසා බ්‍රිතාන්‍ය වැනි රටවල පෞද්ගලීකරණය කළ දුම්රිය සේවා යළි පවරා ගත යුතුයැ'යි උද්ඝෝෂණ ඇති විය. සෞඛ්‍ය හා අධ්‍යාපන අංශවල මහජන සේවා ලාභ ලබන ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට තැත් කිරීම නිසා සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට මහජනයා විසින් ගෙවිය යුතු මිල සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර රෝගීන් සහ ශිෂ්‍යයන් හුදු සේවාදායකයන් ලෙස සැලකුණි. එහෙත් මේ අතර ප්‍රංශය වැනි රටවල රජය මඟින් කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන ගිය දුම්රිය සේවය අන් රටවල පොදු ප්‍රවාහන සේවාවලට ආදර්ශයක් විය. ප්‍රංශ රජය සතු *EDF* නමින් හැඳින්වෙන විදුලි සහ ගෑස් සමාගම අසල්වැසි බ්‍රිතාන්‍යය බෙල්ජියම සහ ඉතාලිය යන රටවල සේවාදායකයන් සඳහා ද විදුලි හා ගෑස් සේවා කාර්යක්ෂම ව සපයයි.

තවත් වැරදි මතවාදයක් වන්නේ රජයේ කටයුතු බහිස්සේවාපර්ණය කිරීම හෙවත් පිටස්තර ප්‍රභව වලට පැවරීම මඟින් අවදානම අඩු කර බදු ගෙවන්නන්ගේ මුදල් ඉතිරි කර ගත හැකි බව යි. නවලිබරල්වාදීන් අනුදත් පොදු අංශයේ නව කළමනාකරණ

සංකල්පයට අනුව යෝජනා කළ ප්‍රතිසංවිධාන ක්‍රම අතර පොදු ආයතන පුද්ගලීකරණය කිරීම, පොදු අංශයට අයත් ප්‍රමාණයෙන් විශාල සංස්ථා හා සමාගම් විමධ්‍යගත කිරීම හා කොටස්වලට කැඩීම හා පොදු ආයතනවල වැටුප් ගෙවීම කාර්යසාධනය ඉලක්ක අනුව සිදු කිරීම ද විය. මේ යෝජනා බ්‍රිතාන්‍යයේ නවලිබරල්වාදී මාග්‍රට් තැචර් අගමැතිනියගේ කාලයේ පමණක් නො ව ටෝනි බ්ලෙයාර්ගේ ලේබර් ආණ්ඩුව විසින් ද පුද්ගලීකරණය, පොදු හා පුද්ගලික පංගුකාරිත්වය *(public and private partnership)* සහ බහිස්සේවාපර්ණය ආදි වසයෙන් මහත් උද්‍යෝගයෙන් හඳුන්වා දෙනු ලැබීය. එහෙත් ඒ අනුව විදේශික රාජ්‍ය සමාගම්වලට ද බ්‍රිතාන්‍යයේ සේවා සැපයීම් අත්පත් කර ගැනීමට ඉඩ දෙනු ලැබීය. ඒ නිසා වැඩි අයිතියක් හොං කොං රජය සතු *MTR* සමාගම ලන්ඩන් උමං දුම්රිය මාර්ග සංවර්ධනයට දායක වූ අතර ලන්දේසි රජය සතු ජාතික දුම්රිය ප්‍රවාහන සේවය සතු *Abellio* සමාගම බ්‍රිතාන්‍යයේ බස් සහ දුම්රිය සේවා ද පවත්වා ගෙන යයි. මේ අනුව හැම රාජ්‍ය සමාගමක් ම අකාර්යක්ෂම ය යන නිගමනය නිවැරදි නො වන බව පෙනී යයි. කෙසේ වෙතත් ලෝක බංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් දිරි ගන්වන ලදු ව ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල් බොහෝමයක් ද පොදු අංශයේ නව කළමනාකරණ සංකල්පය මඟින් හුවා දැක්වූ පෞද්ගලීකරණ වැඩපිළිවෙළ උද්‍යෝගයෙන් අනුගමනය කළේ ය. බ්‍රිතාන්‍යයේ මෙය කොතෙක් තදින් පැතිරිණි දැ'යි කිව හොත් *Private Finance Initiative (PFI)* හෙවත් පුද්ගලික මූල්‍ය ආයෝජන වැඩපිළිවෙළ යටතේ රෝහල්, බන්ධනාගාර, පාසල් සහ ආරක්ෂක සේවා ගොඩනැගිලි වැනි සාමාන්‍යයෙන් රාජ්‍ය අංශය මඟින් පවත්වා ගෙන යන පහසුකම් පෞද්ගලික සමාගම්වල පංගුකාරිත්වයෙන් නවීකරණය කිරීම හඳුන්වා දෙන ලදී.

පොදු අංශයේ නව කළමනාකරණ සංකල්පය අනුදත් පරිදි රජය කුඩා විය යුතු අතර රජයේ මූල්‍ය පාලනය සමබර අයවැයක් මත පදනම් කර ගත යුතු විය. වෙනත් අයුරකින් කිව හොත්

වාර්ෂිකව ලැබෙන ආදායම ඉක්මවා යන මුදලක් රජය විසින් වැය කිරීම කිසිසේත් ම නො කළ යුතු දෙයක් ලෙස සැලකුණි. ඒ අතර ණය ප්‍රතිශතය ඉහළ යෑම වළක්වා ණය ප්‍රමාණය අඩු කර ගත යුතු බවත් පැවසිණි. ඒ අනුව අවදානම් ආයෝජන වසයෙන් සැලකුණු සියලු දේවල් රජය විසින් පිටු දැකිය යුතු විය. එහෙත් පෞද්ගලික අංශයට බහිස්සේවාපර්ණය *(outsource)* කෙරුණු රෝහල් හා පාසල් නවීකරණය සඳහා වැය වන මුදල රජය විසින් ගෙවනු ලැබිය යුතු බව පිළිගැනිණි. කෙසේ වෙතත් බහිස්සේවාපර්ණයට අනුව පෞද්ගලික අංශයට පැවරෙන ව්‍යාපෘති සඳහා වැය වන මුදල ඒ හා සමාන ව්‍යාපෘතියක් රාජ්‍ය අංශය මඟින් ණය ක්‍රම යටතේ ක්‍රියාත්මක කිරීමට යන මුදලට වඩා 40% කින් වන බව බ්‍රිතාන්‍යය රජයේ විගණකාධිපති වාර්තා උපුටා දක්වමින් මාස්සුකාටෝ පෙන්වා දෙයි.

ආණ්ඩුවල කටයුතු බහිස්සේවාපර්ණය කෙරෙන එක් වැදගත් අංශයක් වන්නේ රජයේ ආයතනවලට අවශ්‍ය විවිධ මෘදුකාංග නිපදවා ගැනීමයි. එහෙත් බොහෝ පොදු ආයතන එසේ සැපයෙන මෘදුකාංගවලින් බොහෝමයක් තමන්ට අවශ්‍ය කටයුත්ත සඳහා උචිත ඒවා නො වන බව පෙන්වා දී ඇති අවස්ථා එමටය. 2011 දී බ්‍රිතාන්‍ය මහජන සෞඛ්‍ය සේවයට රෝගීන්ගේ වාර්තා තැබීමේ මෘදුකාංගයක් පිළියෙළ කිරීම සඳහා පවුම් බිලියන 10ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් සඳහා වියදම් කිරීමෙන් අනතුරු ව වසර දහයක් ගත වී ගිය පසු ද අවශ්‍ය පරිදි එම කටයුත්ත ඉටු කර ගැනීමට නො හැකි විය. මේ පිළිබඳ විමර්ශනයක් කළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මහජන වියදම් පිළිබඳ කමිටුව එය බ්‍රිතාන්‍ය රාජ්‍ය සේවයේ නරක ම කොන්ත්‍රාත්තු මගඩිවලින් එකක් බව සඳහන් කළේ ය. එසේ බහිස්සේවාපර්ණය *(outsource)* කිරීම මඟින් බලාපොරොත්තු වූ කාර්යක්ෂමතාව ලබා ගැනීම උගහට වූවා පමණක් නො ව එය මුදල් ගසා කෑමේ කටයුත්තක් වූ බවට ඇති උදාහරණ එමට ය.

පස්වැනි වැරදි මතවාදය වසයෙන් මාස්සුකාටෝ පෙන්වා දෙන්නේ නවෝත්පාදන ආදී පෙරටුගාමී ආර්ථික කටයුතු ප්‍රවර්ධනය

කිරීම සඳහා රජය මැදිහත් වී සුදුස්සන් තෝරා නො ගත යුතු ය යන්නයි. ඒ වෙනුවට රජයේ කාර්යය ලෙස සැලකෙන්නේ ජයග්‍රාහකයින් හෝ පරාජිතයන් වන්නේ කවුදැ'යි නො සලකා හැම කෙනෙකුට ම සමාන නීතිරීතිවලට යටත් ව තරග කළ හැකි වෙළඳපොළ හිතෛෂි ප්‍රතිපත්ති හඳුන්වා දීමයි. එහෙත් ඇත්ත වසයෙන් ම නිෂ්පාදනය උත්තේජනය කිරීම පිණිස කුමන ආකාරයේ රාජ්‍ය ආධාරයක් දිය යුතු ද යන්න තීරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට සිදු වන නිසා එම ආධාරය ලැබීමට සුදුසු වන්නේ කවුද යන්න තීරණය කිරීම ද නිරායාසයෙන් ම රජයකට සිදු වන්නේ ය. ආර්ථිකය මෙහෙයවීමේ දී ජයග්‍රාහකයින් විය යුත්තේ කවුරුන් ද යන්න තෝරා ගැනීමට රජයකට බොහෝ විට සිදු වන්නේ ආර්ථික උන්නතිය සඳහා අවශ්‍ය වන තීරණාත්මක නව තාක්ෂණය හෝ නවොත්පාදන ක්ෂේත්‍රය කුමක් ද යන කරුණ මත ය. එවැනි තේරීමක දී සුවිශේෂ අවධානයට යොමු වන කරුණු අතර අදාළ තාක්ෂණයේ හෝ නවෝත්පාදනයේ පුරෝගාමිත්වය තහවුරු කර දීමට ඇති අවශ්‍යතාව, නව දැනුම බෙදා හදා දීමේ අවශ්‍යතාව, රැකියා නිපදවීම, නිෂ්පාදනය හා ආදායම ඉහළ නැංවීම, කලාපීය සංවර්ධනය උත්තේජනය කිරීම සහ ආරක්ෂක කටයුතු පිළිබඳ ප්‍රමුඛතා ද තිබිය හැකි ය.

කර්මාන්ත ක්ෂේත්‍රයේ උපායමාර්ගික ස්ථානය *(strategic position)* තහවුරු කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවල දී රජයකට ඒ සඳහා අවශ්‍ය දියුණු තාක්ෂණය කුමක් ද සහ එම තාක්ෂණ හැකියාව ඇති කර ගැනීම පිණිස දායක කර ගත හැක්කේ කවරෙක් ද යන්න තීරණය කිරීමට සිදුවිය හැකි ය. මෙය යුක්ති යුක්ත කළ හැකි වුවත් බොහෝ විට තර්කය වන්නේ ඒ අන්දමේ ඥානාන්විත තෝරා ගැනීම් කිරීමට රජයට නො හැකි ය යන්න යි. මේ තර්කයට එක් උදාහරණයක් වසයෙන් හුවා දක්වන්නේ ඉංග්‍රිසි-ප්‍රංශ රාජ්‍ය ආධාර ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වූ කොන්කෝඩ් ගුවන් යානා ව්‍යාපෘතිය යි. මේ ව්‍යාපෘතිය මඟින් ශබ්දයේ වේගය අබිබවා යෑමට නිපදවූ සුපර්සොනික් වර්ගයේ ගුවන් යානා විස්සක් නිපදවා 1976 සිට 2003

දක්වා ප්‍රංශ සහ බ්‍රිතාන්‍ය ගුවන් සේවා මඟින් සේවයට යෙදවිණි. නමුත් සේවා වියදම් අධික වීම නිසා අනෙකුත් වාණිජ ගුවන් සේවාවලින් ඉල්ලුම් නො ලැබීම වැනි කරුණු නිසා කොන්කෝඩ් යානා නිෂ්පාදනය අත්හැර දැමීමට සිදු විය. එහෙත් කොන්කෝඩ් ගුවන් යානය නිපදවීමේ දී අත්පත් කර ගත් විශිෂ්ට තාක්ෂණික ජයග්‍රහණවල ආභාසය ගුවන් යානා ක්ෂේත්‍රයේ තාක්ෂණික දියුණුවට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේ ය.

ජයග්‍රහණය කළ හැක්කේ කිනම් තාක්ෂණයකට ද යන්න හඳුනා ගැනීමට රජයකට නො හැකි ය යන්න ඓතිහාසික ව බැලූ විට නිවැරදි නො වේ. තාක්ෂණයේ පෙරළිකාර දියුණුවක් ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවල දී කාර්මික හා විශේෂඥ ශක්‍යතා සම්බන්ධීකරණය කිරීම, ප්‍රමිති නියම කිරීම සහ නව නිපැයුම් සඳහා වෙළඳපොළක් ඇති කිරීම මඟින් තීරණාත්මක මැදිහත් වීමක් කිරීමට රජයට හැකි බවට කදිම උදාහරණ තිබේ. 1990 ගණන්වල දී රූපවාහිනී ක්ෂේත්‍රය සඳහා *HD (High Definition)* හෙවත් අධි විෂදතාව සහිත ඩිජිටල් රූපවාහිනී විකාශනය සඳහා ඇතිවිය හැකි අනාගත ඉල්ලුම ගැන සලකා බැලූ දකුණු කොරියානු රජය *HD TV* නිපදවීමේ තාක්ෂණය සොයා ගැනීම පිණිස අමාත්‍යාංශ තුනක, පෞද්ගලික සමාගම් කිහිපයක, රජයේ සහ විශ්ව විද්‍යාල පර්යේෂණ ආයතන කිහිපයක නියෝජිතයන්ගෙන් සමන්විත පර්යේෂණ හා මෙහෙවර කමිටුවක් පිහිටු වී ය. එහි ප්‍රතිඵලයක් වසයෙන් පර්යේෂණ සංසදයක් හෙවත් කොන්සෝටියමක් ඇති වූ අතර එයට කොරියානු ඉලෙක්ට්‍රොනික ආයතනය, කොරියානු කාර්මික තාක්ෂණ ආයතනය, වීඩියෝ කර්මාන්ත සම්පත් සහ සංවර්ධන සංගමය වැනි පොදු ආයතන මෙන් ම සැම්සුන්ග්, හයුන්ඩායි, *LG* සහ ඩාවූ ඉලෙක්ට්‍රොනික්ස් වැනි පුද්ගලික සමාගම් ද අයත් විය. ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයේ දායකත්වයෙන් ඩොලර් මිලියන 100ක අරමුදලක් ද පිහිටුවන ලදී. ඇමෙරිකානු හා ජපාන කාර්මික දැනුමෙන් ද ප්‍රයෝජන ගැනීම පිණිස එම රටවල ද පර්යේෂණ කණ්ඩායම්

පිහිට වූ ඒ කොන්සෝටියමය 1993 ඔක්තෝබරයේ දී ඩිජිටල් *HD* රූපවාහිනි විකාශනය සහ ග්‍රහණය පිළිබඳ මූලාකෘතිය එළි දැක්වීය. ඉන් දෙවසරකට පසු කොන්සෝටියමය විසින් වාණිජ මට්ටමින් *HD* රූපවාහිනී නිෂ්පාදනය හඳුන්වා දීමට අවශ්‍ය *ASCI* චිප් ප්‍රොසෙසරය නිපදවූ විට බොහෝ පෞද්ගලික සමාගම් එහි වාණිජ නිෂ්පාදන හිමිකම ලබා ගැනීම සඳහා තරග කළේ ය. අවසානයේ නිෂ්පාදන හිමිකම ලබා ගත් සැම්සුන් ආයතනය 1998 සිට සිය *HD TV* විකාශන මෙවලම් වාණිජ මට්ටමෙන් නිපදවී ය.

ඩිජිටල් විප්ලවය, හරිත පරිවර්තනය, සුසමාදර්ශීය තාක්ෂණික වෙනස්කම් ඇතිවීම වැනි තීරණාත්මක ක්ෂේත්‍ර ඵලදායි ලෙස මෙහෙයවීමට රජය මුල් අවස්ථාවේ දීම මැදිහත් විය යුතු වන්නේ එවැනි ක්ෂේත්‍රවල නවෝත්පාදනික ප්‍රතිඵල සමාජය ගමන් ගන්නා දිශානතිය තීරණය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි නිසා යි. එවැනි අවස්ථාවල දී රජය මඟින් ඇත්ත වසයෙන් ම කරනු ලබන්නේ හුදෙක් තරඟකරුවන් තෝරා ගැනීමක් නො ව මඟින් ඉහළ ම තාක්ෂණය ජනිත කිරීමට හැකි නව සම්බන්ධතා ගොඩ නැගීම පිණිස විවිධ ක්ෂේත්‍රවල කටයුතු සම්බන්ධීකරණය කිරීමට මුල් වීම යි. එම ක්‍රියාවලියෙන් ආභාසය ලත් තාක්ෂණික ජයග්‍රහණ අනෙකුත් නොයෙක් අංශවල දියුණුවට ද හේතුවෙයි.

නවෝත්පාදනය සඳහා පුරෝගාමී දායකයන් විය යුත්තේ කවුරුන් දැ'යි යන්න ගැන එක්සත් ජනපද රජය නිගමනය නො කළේ නම් අන්තර්ජාලය බිහි නො වන්නට ඉඩ තිබුණි. එහෙත් වැදගත් වන්නේ රජය එය ඉටු කරන ආකාරයයි. ඉන් අදහස් වන්නේ රජයක් සිය නවෝත්පාදනීය මැදිහත් වීම් සියල්ල එකම ක්ෂේත්‍රයක කළ යුතු ය යන්න නො වේ. ඇත්ත වසයෙන් ම රජය කටයුතු කළ යුත්තේ නවොත්පාදන සඳහා අරමුදල් සැපයීමට ඉදිරිපත් වන අවදානම් ලෝලී ආයෝජකයන් *(Venture Capitalists)* හා සම ව අදාළ ක්ෂේත්‍ර කිහිපයක ම ආයෝජන කරමින් අවදානම බෙදා හදා ගැනීමයි. එහෙත් එවැනි ආයෝජනවලට පොදු යහපත පිළිබඳ දිශානතියක් තිබිය

යුතු ය. උදාහරණයක් වසයෙන් ගත්තොත් ඇමෙරිකානු ආර්ථිකය හරිත ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සිය රජයේ දිශානතිය වසයෙන් සලකමින් බැරැක් ඔබාමා ජනාධිපතිවරයා ශක්‍යතා ජනක නවෝත්පාදනයක් ලෙස හඳුනා ගෙන තිබූ ටෙස්ලා විදුලි මෝටර් රථ නිෂ්පාදනයට අවශ්‍ය සොලින්ඩ්‍රා සූර්ය බල ශක්ති තාක්ෂණය සඳහා බලශක්ති දෙපාර්තමේන්තුව හරහා රජයේ ඇප සහිත පහසු ණය ලබා දුන්නේ ය. සාම්ප්‍රදායික තාක්ෂණයෙන් බෙහෙවින් වෙනස් වූ සොලින්ඩ්‍රා විසඳුම අසාර්ථක වූ අතර ටෙස්ලා මෝටර් රථ නිෂ්පාදනය අතිශයින් සාර්ථක විය. එහෙත් රජය මැදිහත් වී ජයග්‍රාහකයන් තේරීමේ පිළිවෙත විවේචනය කරන අය හැම විටම හුවා දක්වන්නේ සොලින්ඩ්‍රා ව්‍යාපෘතියේ අසාර්ථකත්වය මිස ටෙස්ලා ව්‍යාපෘතිය ලද ජයග්‍රහණය නො වේ.

නීතියේ ආධිපත්‍යය ප්‍රමුඛ වූ ප්‍රජාතන්ත්‍රවාදී රටවල මෙන් නො ව අනුග්‍රාහක දේශපාලනය රජයන ලංකාව වැනි රටවල රාජ්‍ය අංශය අකාර්යක්ෂම කිරීමට එක් හේතුවක් වූයේ දේශපාලනඥයින් තම අනුග්‍රාහකයන්ට සුදුසුකම් නො සලකා රැකියා හා තනතුරු ලබා දීමේ මාර්ගයක් ලෙස රාජ්‍ය ආයතන යොදා ගැනීම යි. එහෙත් පොදුවේ ගත් විට රජයේ සේවකයන්ගෙන් ඵලදායක ප්‍රත්‍යුත්ක්‍රම *(initiatives)* හෝ නවෝත්පාදන *(innovation)* හෝ බිහි නො වීමට හේතුව වෙළඳපොළ ක්‍රමය වැඩ නොකරන අවස්ථාවලදී සාම්ප්‍රදායික පැලැස්තර දැමීම සිය ඒකායන භූමිකාව වසයෙන් සැලකීම හැරෙන්නට කිසිදු අළුත් දෙයක් කිරීමට ඔවුන් දක්වන බියයි. ඒ නිසා කොයි වෙළේ අර්බුදයට යා දැයි නො දැන ගැහි ගැහී දුවන වෙළඳපොළ යන්ත්‍රණයක් පැලැස්තර ඇලවීමෙන් පවත්වා ගෙන යෑමට පිහිටුවා ඇති ආයතනයක් ලෙස පමණක් ආණ්ඩුව ගැන කල්පනා කිරීමට නිලධාරි තන්ත්‍රය පෙලඹේ. නවලිබරල්වාදයට අනුව නාගරික වායු දූෂණය අවම කිරීම සහ නව දැනුම නිපදවීම සඳහා ආයෝජනය කිරීම වැනි පොදු යහපත මුල්කරගත් කටයුතු පවා සලකන ලද්දේ සමාජ අභිමතාර්ථවලට වඩා වෙළඳපොළ ඌනතා

ආමන්ත්‍රණය කරන ඒවා වසයෙනි. එකී වෙළඳපොළ යන්ත්‍රණය අර්බුදයට ලක් වී කඩා වැටෙන ඇතැම් අවස්ථාවල දී බැංකු හා සමාගම් ගලවා ගැනීමට පොදු අරමුදල් පොම්ප කිරීමේ සිට පුද්ගලික අංශය විසින් ආයෝජනය කිරීම ප්‍රතික්ෂේප කරන ක්ෂේත්‍රවලට මුදල් යෙදවීම දක්වා ආණ්ඩුවට අලවන්නට සිදු වන පැලැස්තරවල සංඛ්‍යා අති විශාල විය හැකි ය. උදාහරණයක් වසයෙන් 2008 ආර්ථික අර්බුදය අවස්ථාවේ දී ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුවට කොටස් වෙළඳපොළ සමඟ කඩා වැටුණු බැංකු හා මූල්‍ය ආයතන ගලවා ගැනීම පිණිස ඩොලර් බිලියන 700ක් වැය කිරීමට කොන්ග්‍රස් මන්ත්‍රණ සභාවේ අනුමැතිය ඉල්ලා සිටීමට සිදුවීම නිදර්ශිත කොට දැක්විය හැකි ය..

එහෙත් අවශ්‍ය වන්නේ ප්‍රමාණයෙන් 'කුඩා ආණ්ඩුවකැයි' කියමින් රොනල්ඩ් රේගන් ප්‍රමුඛ බොහෝ නවලිබරල්වාදී දේශපාලනඥයන් පොදු සේවා ලෙස පවත්වා ගෙන ගිය රජයේ පොදු කාර්යයන් සැලකිය යුතු ප්‍රමාණයක් කලක සිට ම කොන්ත්‍රාත් ක්‍රම යටතේ පෞද්ගලික අංශයට පවරා දී තිබුණි. ඒ සමාන ව චිලිය වැනි රටවල එතෙක් පොදු දේපළක් වසයෙන් රජය මඟින් පවත්වා ගෙන ගිය ජල සම්පත් හා ජල මාර්ග පවා පුද්ගලීකරණය කරන ලදී. එහෙත් ඇත්ත වසයෙන් ම ප්‍රශ්නය වන්නේ 'විශාල ආණ්ඩුවක්' පැවතීම නො ව පවතින්නේ කුමන වර්ගයක ආණ්ඩුවක් ද ආණ්ඩුව විසින් කුමක් කෙසේ කරනු ලබන්නේ ද යන්න යි. අනෙක් අතට මෙහෙවර ආර්ථිකයක් යනු ජාතික ආණ්ඩු මට්ටමට පමණක් නො ව පළාත්, ප්‍රාදේශීය, නගර හා ගම් පමණක් නො ව කලාපීය හා ගෝලීය මට්ටම දක්වා විවිධ ඒකකවල පරිමාණයට අනුව අනුවර්තනය කර ගත හැකි සංකල්පයකි. එකම කොන්දේසිය මෙහෙවර ආර්ථිකයට පොදු යහපත මුල්කරගත් ඍජු අරමුණු තිබිය යුතු ය. එමෙන් ම ඒ අරමුණු ඉටු කර ගැනීමට සමත් නිශ්චිත ඉලක්ක සහිත වැඩපිළිවෙළක් තිබිය යුතු ය.

අද අප මුහුණ දෙන මූලික ප්‍රශ්න කිසිවක් අනිවාර්යයෙන් ම පැන නැගුණු වැළැක්විය නො හැකි ඒවා නො වේ. ඒවා බොහෝමයක් අපේ සමාජ ආර්ථිකය මෙහෙයවීමට අප තෝරා ගෙන තිබූ ක්‍රමවේද නිසා ඇති වූ ඒවායි. මූල්‍ය වෙළඳපොළේ හැර මූල්‍ය අංශය නියම ආර්ථිකය සඳහා ආයෝජන නොකළ යුතු යැ'යි හෝ කෙටි කාලීන ලාභය සඳහා පමණක් ආයෝජනය කළ යුතු යැ'යි නියමයක් නැත. එහෙත් ඒවා එසේ කිරීම දිරි ගන්වන බදු සහන, ණය සඳහා ගෙවන පොලිය සමාගම් බදුවලින් අඩු කිරීම, ආයෝජන බැංකු සහ සිල්ලර බැංකුවලට ඒකාබද්ධ ව කටයුතු කිරීමට ඉඩ හැරීම සහ නිර්නියාමනය දේව භාෂිතයක් ලෙස පිළිගැනීම අප තෝරා ගෙන තිබූ ක්‍රමවේදයේ ඇතැම් දූර්ලක්ෂණ විය. අතිශයින් මූල්‍යකරණයට ලක් වූ ව්‍යාපාර ක්ෂේත්‍රයක් හැම විට ම කෙටි කාලීන වාසි තකා වැඩ කළ යුතු යැ'යි නියමයක් නැතිවාක් මෙන් ම පොදු අංශය සැම විට ම කළ යුත්තේ වෙළඳපොළ අසමත්කම සම්බන්ධයෙන් හානිපූරකයෙකු ලෙස ක්‍රියා කිරීම යයි නියමයක් ද නැත. එසේම මිනිසුන් සත්වයන් සහ ගහ කොළවලට හානිදායක ලෙස ගෝලීය උණුසුම දිගින් දිගටම වැඩි විය යුතු යැ'යි ද නියමයක් නැත. මේ සියල්ල හුදෙක් අපේ කල්කිරියාවල සාමූහික ප්‍රතිඵලයෝ ය.

ඒ නිසා දේශපාලන ආර්ථික හා සමාජීය යන ක්ෂේත්‍රවල අප මෙතෙක් උපයෝගී කර ගෙන ඇති එළඹුම්වල කැපී පෙනෙන වෙනසක් ඇති කිරීමේ අති මහත් අවශ්‍යතාව අද අප හමුවේ ඇත. එහෙත් එම වෙනස කිරීමට නම් ආර්ථිකය සමස්තයක් ලෙස උත්තේජනය කළ හැකි අන්දමට රජයේ කාර්ය සංකල්පගත කරමින් ප්‍රශ්නය විනිවිද දැකිය යුතු ය. එයට හේතුව සරල ය. මන්ද අදාළ ආර්ථික ආයතන කළමනාකරණය කරන ආකාරය පිළිසැකසුම් කිරීම, ඒවා අතර සම්බන්ධතාව ඵලදායක ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම සහ. ආර්ථික ක්‍රියාකාරීන් හා සිවිල් සමාජය අතර අන්‍යෝන්‍ය ප්‍රතිපෝෂණයක් තහවුරු කිරීම වැනි කරුණු ද ආමන්ත්‍රණය කරමින් සාකල්‍ය පරිවර්තනයක් කිරීමේ හැකියාව ඇත්තේ කුමන ආකෘතියකින් පැවතුණ ද රජයකට ම පමණක් වන බැවිනි.

මෙහි දී සංස්ථාපිත සමාගම් පාලනය *(corporate governance)* නැවත සිතා බැලීම ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ ඉහළින් ම තිබිය යුතු ය. තම කොටස් මිල ඉහළ දමමින් කොටස්කරුවන් සතුටු කරනවාට වඩා අදාළ ව්‍යාපාරයේ පාරිභෝගිකයන් ද ඇතුළු ව සියලු පාර්ශවකරුවන් හෙවත් පරදු දරන්නන්ගේ පොදු යහපත ගැන සැලකිලිමත් වීමට පෞද්ගලික සමාගම් යොමු කළ යුතු ය. මේ පරිවර්තනය සාර්ථක කිරීමට සමාගම්වල සාම්ප්‍රදායික සමාජ වගකීම පමණක් අවධාරණය කිරීම නො සෑහේ. අවශ්‍ය ව ඇත්තේ සමාගම විසින් නිර්මිත වටිනාකම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබීමත් සමස්ත වටිනාකම් දාමය මඟින් එය පෝෂණය වන ආකාරය ප්‍රායෝගික ව ප්‍රදර්ශනය වීමත් ය. ව්‍යවසායක සමාගම් සහ ආණ්ඩුව යන දෙකොට්ඨාසය ම එකට එක් ව කටයුතු කරන අරමුණ පිළිබඳ අවංක කැපවීමක් තිබීම ද අත්‍යවශ්‍යය. එවැනි අවස්ථාවල දී අදාළ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කැප වී කටයුතු කරන සමාගම් දිරිගැන්වීමේ වැඩපිළිවෙළක් රජයට තිබිය යුතු ය. උදාහරණයක් ලෙස පෞද්ගලික ව්‍යවසායවලට පොදු අරමුදලින් සහනාධාර ලබා දීමේ දී එම සහනය සමාජ සහ පාරිසරික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඔවුන් දෙන දායකත්වය මත තීරණය කෙරෙන කොන්දේසි එවැනි සමාගම් සමඟ එළඹෙන කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට අඩංගු කළ හැකි ය.

රජය මඟින් යොදන ආයෝජන ආභ්‍යන්තරික වසයෙන් ගත් විට කොතෙක් දුරට නවෝත්පාදන උත්තේජනය කරන අන්දමින් යොදා ගන්නේ ද බාහිර වසයෙන් එම ආයෝජන දීර්ඝකාලීන ව කොතෙක් දුරට නිෂ්පාදන වර්ධනය සඳහා දායක වන්නේ ද යන කරුණු ඉතා වැදගත් ය. 2019 දී දළ ජාතික ආදායමට සාපේක්ෂ ව වැඩි ම ණය අනුපාතික තිබූ යුරෝපීය රටවල් වූ ග්‍රීසිය, ඉතාලිය හා පෘතුගාලය සම්පත් හා සංවර්ධනය, අධ්‍යාපනය, නවෝත්පාදන සහ පොදු ව්‍යවසාය අරමුදල් සඳහා අවශ්‍ය ආයෝජන කෙරීම අතින් බෙහෙවින් පසුගාමී රටවල් විය.

නවලිබරල්වාදය විසින් රජයේ ආර්ථික භූමිකාව හැකි තරම් අඩු වපසරියක පවත්වා ගෙන යෑමට තැත් කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස රජය විසින් සපයන සේවා පුද්ගලීකරණය හෝ බහිස්සේවාපර්ණය කිරීම බෙහෙවින් උත්කර්ෂණයට නංවයි. ඒ අනුව රජය ලවා හඳට මිනිසෙකු යැවීම වෙනුවට මෑත දශකවල දී ප්‍රයත්නය වූයේ පෞද්ගලික අංශය රජයේ කරමතින් හොඳ රවුමක් ගැසීම යි.

කෙසේ වෙතත් හඳට මිනිසෙකු යවා ආපසු ගෙන් වීම වැනි හුදෙක් විද්‍යාත්මක හා තාක්ෂණික දායකත්වය මත රඳා පවතින කටයුත්තකට වඩා ආදායම් විෂමතාව අවම කොට දුප්පත්කම පිටුදැකීම, සුභාවිත ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම, ගමනාග මනය නිර්කාබනීකරණය කිරීම වැනි ඉලක්ක හුදු විද්‍යාත්මක හා තාක්ෂණික විසඳුම් මත පමණක් ඉටු කර ගත හැකි ඒවා නො වේ. ඒවා පුළුල් ක්ෂේත්‍රයක සමාජීය, ආර්ථික හා දේශපාලනික සාධක ද සැලකිල්ලට ගන්නා ක්‍රමෝපායික මාර්ග යෙදා ගනිමින් ඉටු කර ගත යුතු ඒවා ය. එහෙත් ඒ හැම කටයුත්තක දී ම අරමුණ පැහැදිලි ව හඬ නගා කීමට හැකි විය යුතු ය.

# -24 -

## මෙහෙවරක් *(mission)* සැලසුම් කිරීම

ඇත්තටම ආර්ථික නියාමවලින් නිර්ණය කරන පරිදි ආණ්ඩු ක්‍රියා කළ යුත්තේ නවෝත්පාදනය සහ අගය එකතු කිරීම මුළුමනින් ම පෞද්ගලික අංශයට පවරමින් අත්‍යවශ්‍ය වූ විට පමණක් වෙළඳපොළ ඌනතා පිළිසකර කිරීම සඳහා මැදිහත් වීමට පමණ ද? නූතන ආණ්ඩු යනු බොහෝ විට නිදහස් වෙළඳපොළ ආර්ථිකය යටතේ අපට උරුම ඉරණමට අනුව බිහි වන ඒවා ය. නවලිබරල්වාදී ආර්ථික චින්තනයට අනුව රජයේ නිලධාරීන් පුහුණු කරන්නේ හුදෙක් වෙළඳපොළ ඌනතා පිරිමසා ගැනීමේ කටයුතු ඉටු කිරීමට සහ ආණ්ඩුවෙ අසමර්ථකම වෙළඳපොළ අසමර්ථකමට වඩා බෙහෙවින් උග්‍ර යැ'යි විශ්වාස කිරීමට යි. ඒ අනුව පෞද්ගලික ව්‍යාපාරිකයන් පමණක් පූජනීය කොට සලකන සහ අවදානම් ගැනීමට අකැමැති, ආර්ථික වටිනාකම් ජනිත කිරීමට තමන්ට ඇති හැකියාව අත්හැර දැමූ කුලෑටි මහජන ආයතනවලින් සමන්විත ආණ්ඩුවක් අපට හිමි වීම අරුමයක් නො වේ.

එහෙත් අනෙක් අතට ඊට හාත්පසින් ම වෙනස් අන්දමින් අභ්‍යන්තර ශක්‍යතාව ඉහළ නැංවීම පිණිස අවශ්‍ය ආයෝජන නිසි ලෙස යොදමින් ක්‍රියාශීලී හා ප්‍රගාමී ලෙස ආර්ථිකයේ හා සමාජයේ දිශානතිය තීරණාත්මක ව නිර්ණය කිරීමේ බර කරට ගෙන ආණ්ඩු හැසිරුණු අවස්ථා පිළිබඳ කදිම උදාහරණ ද අපට තිබේ. දැවැන්ත

ආර්ථික අවපාතයක් ජය ගැනීමට ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපති *(*1933-1945*)* ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් දියත් කළ නිව් ඩීල් *(New Deal)* හෙවත් නව සහන පිළිවෙතේ සිට දෙවැනි ලෝක මහා යුද්ධ සමයේ පෙරළිකාර කාර්මික පරිවර්තනය දක්වා ද, මෑතක දී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු අනුව යුරෝපයේ හරිත නගර 100ක් බිහි කිරීමේ පියවර හඳුන්වා දීමේ දී ද දැවැන්ත අභිලාෂ මුල් කොට ගෙන ආණ්ඩු ඉතා ප්‍රගාමී ලෙස නායකත්වය ලබා දුන් අවස්ථා එමට ය.

එවැනි දැවැන්ත අභිලාෂ මුල් කර ගන්නා ආණ්ඩු ඒ සම්බන්ධයෙන් මුළු මහත් සමාජයේ ම ක්‍රියාශීලී දායකත්වය උත්තේජනය කර ගැනීමට සමත් විය යුතු ය. එහි දී වැදගත් වන්නේ අධි අවදානම් සහිත පුරෝගාමී ආකාරයේ ආයෝජන කිරීමට සාමාන්‍යයෙන් මැලි වන පෞද්ගලික අංශය සමාජීය අභියෝගවලට මුහුණ දීමට සමත් තීරණාත්මක වෙනස්කම් ඇති කිරීමට තුඩු දෙන ආයෝජනය කිරීමට පොලඹවමින් අදාළ ව්‍යාපාරවල උද්‍යෝගිමත් කොටස්කරුවෙකු ලෙස  මැදිහත් වී ක්‍රියා කිරීමට ආණ්ඩුවලට ඇති හැකියාව බව ආර්ථික විද්‍යාඥ මරියානා මාස්සුකාටෝ සිය *Mission Economy* කෘතියේ පෙන්වා දෙයි.[263] එවැනි අවදානම්වලට පෞද්ගලික අංශය පෙලඹවීම පිණිස රජය ද ක්‍රියාශීලී ආයෝජකයෙකු ලෙස ඒවාට සහභාගි වීම ඉතා වැදගත් ය. එසේ නොමැති ව කළ යුත්තේ ආර්ථික අර්බුදවල දී කඩා වැටෙන බැංකු හා මූල්‍ය ආයතන ගලවා ගන්නා හුදු ගැලවුම් කරුවාගේ භූමිකාවට පමණක් ආණ්ඩුවේ කටයුතු සීමා කිරීම නො වේ.

ඇමෙරිකා එක්සත් ජනපදය 'දස වසරක් තුළ අපි හඳට මිනිසෙකු යවා ආපසු ගෙන් විය යුතු ය' යන්න මෙහෙවරක් *(a Mission)* ලෙස තීරණය කළ පසු එම මෙහෙවර ඉටු කිරීමට පොදු හා පෞද්ගලික අංශ දෙක ම එක් ව එක ම අරමුණක් මත

263 Mariana Mazzucato (2020), Mission Economy – A moonshot guide to changing capitalism, London: Penguin, pp 18, K.E

පිහිටා කටයුතු කළ අන්දම ගැන අපි මීට පෙර පරිච්ඡේදයෙන් කථා කළෙමු. එම ප්‍රයත්නය  නිසා උත්තේජනය වූ නවොත්පාදන රාශියකි. හඳට යවන අජටාකාශ යානය සහිත රොකට්ටුව සැදීමේ සිට අභ්‍යවකාශ ගමන නිමා කොට හඳ ට ගොඩ බැසීම සහ නැවත හඳෙන් පිටත් ව පෘථිවියට ළඟා වීම දක්වා කුඩු මහත් ගැටලු විසඳා ගැනීමට නොයෙකුත් ක්ෂේත්‍ර සඳහා විවිධ ව්‍යාපෘති සියයකට අධික සංඛ්‍යාවක් දියත් කිරීමට සිදු විය. ඒවායින් සැලකිය යුතු සංඛ්‍යාවක් සාර්ථක වීම ගැන සහතිකයක් නැති  අවදානම් සහගත ඒවා ය. තවත් සමහරක් බොහෝ විට අසාර්ථක ප්‍රතිඵල ගෙන දුන් ඒවා විය. එහෙත් අසාර්ථකවීම්වලින් ඉගෙන ගත් පාඩම් අවසානයේ දී මූලික මෙහෙවර වූ හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම සාර්ථක කර ගැනීමට උදව් විය. හඳට මිනිසෙකු යවා ගෙන්වා ගැනීම මෙහෙවර ලෙස සැලකූ අධිෂ්ඨානශීලී පොදු වැඩපිළිවෙළකට අතිරේක ව හඳට ගොස් ආපසු පැමිණීමට හැකිවීම ම මූලික ව විද්‍යාත්මක ඥානයේ සහ තාක්ෂණයේ නව ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකි ය.

*The Moon and the Ghetto Revisited* නමැති ලිපිය ලියමින් 2011 දී ආර්ථික විද්‍යාඥ රිචඩ් නෙල්සන් වැදගත් පැනයක් මතු කළේ ය. අපේ නවෝත්පාදනික හැකියාවලට හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම වැනි අසීරු දෙයක් සාර්ථකව ඉටු කර ගැනීමට හැකි වූ නමුත් මිහිතලය මත ඇති දුප්පත්කම, අසාක්ෂරතාවය සහ මුඩුක්කු පැතිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අපි දරුණු ලෙස අසංවිධානාත්මක සහ තාක්ෂණික වසයෙන් අක්‍රිය වී ඇත්තේ මන්ද යන්න ඔහු මතු කළ ඒ වැදගත් පැනය යි. වැරදි දේශපාලනය එයට එක හේතුවක් විය හැකි බව පිළිගත හැකි වුවත් ඇත්ත හේතුව හුදෙක් විද්‍යාත්මක සහ තාක්ෂණික විසඳුම් මඟින් පමණක් එවැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම නො හැකි වීම බව ද නෙල්සන් ප්‍රකාශ කළේ ය.[264] මේ සම්බන්ධයෙන් නෙල්සන් මුළුමනින් ම නිවැරදි බව මාස්සුකාටෝ පවසයි.

264 R.R. Nelson (2011) The Moon and the Ghetto Revisited in Science and Public Policy, 38(9), New York: Oxford University Press, pp. 681-690

එනිසා අද ලෝකය මුහුණ දෙන අතිශය තීරණාත්මක සමාජ ප්‍රශ්න විසඳීමේ ලා මෙහෙවර එළඹුමක් සාර්ථක ව තීරණය කරන්නේ සහ අනුගමනය කරන්නේ කෙසේ ද? සමාජ ප්‍රශ්න විසඳීම යනු හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම තරම් පැහැදිලි ඉලක්කයක් සහිත කටයුත්තක් නො වේ. බොහෝ සමාජ ප්‍රශ්න ඇතිවී තිබෙන්නේ සමාජ ආර්ථිකය, දේශපාලනය, තාක්ෂණය සහ සමාජ චර්යාව ඇතුළු නොයෙකුත් ක්ෂේත්‍රවල පැන නගින ප්‍රශ්න එකට ගැට ගැසීමෙනි. උදාහරණයක් ලෙස ගත්තොත් කිසියම් නගරයක් කාබන් විමෝචනය අවම කෙරෙන පරිසර හිතකාමී හරිත නගරයක් බවට පරිවර්තනය කිරීමේ දී බලශක්තිය, ප්‍රවාහනය සහ ගොඩනැගිලි නිර්කාබනීකරණය කිරීම පිණිස පරිසර හිතකාමී ක්‍රමවේද හා ද්‍රව්‍ය භාවිතය කිරීම දිරිගැන්වීම, නව පරිසර රෙගුලාසි හඳුන්වා දීම, හැසිරීම් චර්යා වෙනස් කිරීම වැනි විවිධාකාර කටයුතු ඉෂ්ට කර ගැනීමකින් තොර ව එකී මෙහෙවර සාක්ෂාත් කර ගත නො හැකි ය. ඒ අර්ථයෙන් බැලූ විට හඳට මිනිසෙකු යවා ආපසු ගෙන්වා ගැනීම සමාජ ගැටලු විසඳීම තරම් සංකීර්ණ කටයුත්තක් නො වේ.

කෙසේ වෙතත් සමාජ ප්‍රශ්න විසඳීමේ දී අදාළ මෙහෙවර කුමක් ද යන්න තීරණය කළ යුත්තේ කවුද යන ප්‍රශ්නයට අවධානය යොමු කිරීම වටී. මිනිසෙකු හඳට යවා නැවත ගෙන්වා ගැනීමේ මෙහෙවර බෙහෙවින් ආකර්ෂණීය කටයුත්තක් වූ නමුත් එය තීරණය කරන ලද්දේ ඉහළ සිට පහළට බලය පැතිරෙන ධනවත් සුදු ජාතිකයන්ගේ ආධිපත්‍යට නතු දේශපාලන අධිකාරියක තනි අභිමතය පරිදි ය. එහෙත් සමාජයක ආදායම් විෂමතාව අවම කිරීම හෝ දේශගුණ විපර්යාසයක හානි අවම කර ගැනීමට ආර්ථිකය නිර්කාබනීකරණය කිරීම වැනි මෙහෙවරක් සාක්ෂාත් කර ගැනීමට යෑමේ දී එබඳු ආකාරයෙන් අධිපතිවාදී තීරණ ගැනීම අසීරු ය. අනික් අතට හඳට යෑම වැනි හුදු තාක්ෂණික මෙහෙවරකට සහය ලබා ගැනීම තරම් පහසු ලෙස කාබන් විමෝචනය අවම කර ගැනීම වැනි සංකීර්ණ සමාජ මෙහෙවරක් සාක්ෂාත් කර ගැනීමට සමාජ සහාය ලබා ගැනීම දුෂ්කර ය.

ඇත්ත වසයෙන් ම ආණ්ඩු කිරීමට බලාපොරොත්තු වූ ඇතැම් ප්‍රගතිගාමී දේශපාලන පක්ෂ නිෂ්පාදන හා ප්‍රවාහන කටයුතුවල දී වායුගෝලයට නිකුත් වෙන කාබන් විමෝචනය අවම කර ගැනීම සිය මූලික මෙහෙවරක් වසයෙන් ප්‍රකාශ කර තිබුණි. එහෙත් එම කටයුත්ත මෙහෙවර වසයෙන් තෝරා ගැනීම ම දේශපාලන පක්ෂවල මැතිවරණ පරාජයට ද හේතු විය. 2019 වසරේ ඔස්ට්‍රේලියාවේ ලේබර් පක්ෂය දේශගුණ විපර්යාසයෙන් සිදුවිය හැකි හානි අවම කිරීම ඔවුන්ගේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධාන කරුණක් ලෙස සඳහන් කිරීම මෙයට එක් උදාහරණයකි. එහෙත් එහි ප්‍රතිඵලය වුණේ මැතිවරණයෙන් ලේබර් පක්ෂය පරාජයට පත් වීමයි. සමීක්ෂණ මඟින් පසුව සොයා ගත් පරිදි එම පරාජයට ප්‍රධාන හේතුවක් වූයේ ලේබර් පක්ෂයේ දේශගුණ විපර්යාස අවම කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ හොත් දැනට පවතින රැකියාවලින් සැලකිය යුතු ප්‍රමාණයක් නැතිව යතැ'යි මහජනයා අතර ඇති වූ අනියත බියයි. ඒ නිසා හුදෙක් අභිමත මෙහෙවර ප්‍රකාශ කිරීම පමණක් නො සෑහේ. ඒ සඳහා මහජන සහයෝගය ද අවශ්‍යයෙන්ම දිනා ගත යුතු ය.

දරිද්‍රතාව, සාගින්න, ව්‍යසනකාරී දේශගුණික විපර්යාස, ස්ත්‍රී පුරුෂ සමානත්වය ආදී සමාජ ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම පිණිස *Sustainable development Goals* යනුවෙන් හඳුන්වන තිරසාර සංවර්ධන අරමුණු 17ක් 2030 වන විට ඉටු කර ගැනීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 2015 දී එකඟ වූ අන්දම අපි 20 වැනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කළෙමු. මෙහෙවර ආර්ථිකයකින් කිනම් ආකාරයක මෙහෙවර ඉටු විය යුතු ද යන්න නිර්ණය කිරීමට එම අරමුණුවලින් දී ඇති අභියෝග කදිම ආරම්භයක් ලබා දෙන බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ පරදු දරන්නන් *(stakeholders)* ලෙස ලොව පුරා විවිධාකාර පංගුකරුවන් උද්‍යෝගිමත් කර ගැනීමට හැකිවීම වැදගත් කාරණයකි. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල නියෝජිතයන්, සිවිල් සමාජ සංවිධාන හා විෂය විශේෂඥයන් සමඟ යෙදුණු පුළුල් සාකච්ඡාවක ප්‍රතිඵලයක් වසයෙන් තීරණය වූ මෙකී

සංවර්ධන අරමුණු හැම රටක ම සහභාගිත්වයෙන් අන්තර්ජාතික ව පිළිගත්තකි. එම අරමුණු දාහත සාධාරණ, අන්තර්ග්‍රහනීය *(inclusive)* හා තිරසාර සමාජ ගොඩනැගීමේ දී මතු වන නොයෙකුත් සමාජීය හා තාක්ෂණික ගැටලු විසඳීම පිණිස යොදා ගත හැකි නවෝත්පාදනීය විසඳුම් බිහි කිරීමට ඉඩ සලසා දෙයි. මේ තිරසාර සංවර්ධන අරමුණුවල තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ ඒවා ඉටු කිරීමේ දී අන්තර්-සම්බන්ධතාව අතින් බහු ක්ෂේත්‍රීය වූ සංකීර්ණ ගැටලු ආමන්ත්‍රණය කිරීමට සිදුවීම යි. ඒ නිසා ඒ සඳහා ඇති විසඳුම් හුදු තාක්ෂණික කරුණුවලට එහා ගිය ඒවා ය. අදාළ ගැටලු බොහෝමයකට සෘජු පිළිතුරු නොමැති බැවින් ඒවා විසඳීමේ දී දේශපාලන හා තාක්ෂණික කරුණු සමාජීය ප්‍රශ්න හා සම්බන්ධ වී ඇති අන්දම මෙන් ම මහජන චර්යාවේ අවශ්‍යයෙන් ම ඇතිවිය යුතු වෙනස්කම් සහ ඒ පිළිබඳ ප්‍රතිචාර කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවබෝධයක් ඇති කර ගත යුතු ය. මේ සංකීර්ණත්වය නිසා තිරසාර සංවර්ධන අරමුණු නියත ලෙස ඉටු කර ගත හැකි ප්‍රායෝගික ඉලක්කවලට පරිවර්තනය කර ගත යුතු ය.

මේ අනුව තිරසාර සංවර්ධන අරමුණු 17 සම්පූර්ණ කර ගත යුතු ප්‍රායෝගික ඉලක්ක 169 කින් සමන්විත ය. මාස්සුකාටෝ විස්තර කරන අන්දමට එකී ඉලක්ක බහුවිධ ව්‍යාපෘති මඟින් කරන අත්හදා බැලීම්වලට අනුව පමණක් ජයගත හැකි අභියෝගවලින් සමන්විත මෙහෙවර මුල්කරගත් සංවර්ධන එළඹුම්වලට කදිමට ගැළපේ. එය හරියට හඳට මිනිසෙකු යැවීම නමැති අරමුණ ඉටු කර ගැනීමට නිරාකරණය කර ගත යුතු වූ සිය ගණන් ගැටලුවලට විසඳුම් සොයා ගැනීම වැනි ය. මෙය විස්තර කිරීම පිණිස මාස්සුකාටෝ තිරසාර සංවර්ධන අරමුණු කිහිපයක් උදාහරණ ලෙස ගනී. ඉන් එකක් නම් තිරසාර සංවර්ධනය පිළිබඳ 07 වැනි අරමුණ වන "දැරිය හැකි මිලකට පිරිසිදු බලශක්තිය" යන්නයි. මේ අරමුණ ඉටු කර ගැනීමට 2030 වන විට සම්පූර්ණ කර ගත යුතු ප්‍රායෝගික ඉලක්ක තුනක් වෙයි. එනම් දැරිය හැකි මිලකට විශ්වාස දායක නවීන බලශක්තිය ලබා ගැනීමේ හැකියාව ලෝක ව්‍යාප්ත ව ඇති කිරීම, ගෝලීය බලශක්ති ජනන

පද්ධතිය තුළ පුනර්ජනනීය බලශක්ති භාවිතය සැලකිය යුතු පමණින් ඉහළ නැංවීම සහ ගෝලීය බලශක්ති කාර්යක්ෂමතාව දෙගුණයකින් ඉහළ නැංවීම යන ඉලක්ක තුන යි.

05 වැනි තිරසාර සංවර්ධන අරමුණ වන "ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම" සාක්ෂාත් කර ගැනීම ඉලක්ක හයකින් යුක්ත යි. ඒවා නම් ස්ත්‍රීන්ට සහ ගැහැනු ළමයින්ට සිදු වන සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම; ස්ත්‍රීන්ට සහ ගැහැනු ළමයින්ට එරෙහි ව පොදු සහ පෞද්ගලික තැන්වල සිදු වන සියලු ආකාරයේ හිංසන මෙන් ම ළමා හා බලහත්කාර විවාහ, ලිංග ඡේදනය ආදි සියලු ආකාරයේ හානිදායක ක්‍රියා තුරන් කිරීම; පොදු සේවා, යටිතල පහසුකම්, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනයේ දී නිවස හා පවුල තුළ ගෙවීමක් නො ලබා ලබා දෙන සැලකිලි, සත්කාර සහ ඉටු කරන ගෙදර වැඩ කටයුතු අගය කිරීම; දේශපාලනික, ආර්ථික හා පොදු කටයුතු සම්බන්ධයෙන් ඕනෑම තරාතිරමක ම තීරණ ගැනීමේ දී නායකත්වය දැරීමටත් පරිපූර්ණ සහ ඵලදායී ලෙස සහභාගි වීමටත් ස්ත්‍රීන්ට සමාන අවස්ථා ලබා දීම; 1994 පැවති එක්සත් ජාතීන්ගේ ජනගහන හා සංවර්ධන සමුළුවේ ක්‍රියාමාර්ග සැලැස්ම සහ 1995 බීජිං හි පැවති හතරවැනි ලෝක ස්ත්‍රී සමුළුවේ දී සම්මත වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සහ ප්‍රජනන අයිතීන් ලෝක ව්‍යාප්ත ව සියලු ස්ත්‍රීන්ට ලබා දීම ද වේ.

මෙවැනි අරමුණු සම්බන්ධයෙන් මෙහෙවර එළඹුමක් සැලසුම් කර ගන්නේ කෙසේ ද යන්න 2017-2018 වසරවල මරියානා මාස්සුකාටෝ මෙහෙවර එළඹුමකට අනුව යුරෝපීය කොමිසමට[265] එහි නවෝත්පාදන ප්‍රතිපත්තිය *(Innovation Policy)* සකස් කිරීමට උදව් කළ ආකාරය විමසීමෙන් දැන ගත හැකි ය. ඇය 2020 දී පළ කළ සිය *Mission Economy* නමැති ග්‍රන්ථයේ සඳහන් කරන අන්දමට යුරෝපීය කොමිසම සුහුරු, අන්තර්ග්‍රහනීය සහ තිරසාර වර්ධනයක් *(smart*

265 යුරෝපීය රටවල් 27කින් සමන්විත යුරෝපා සංගමයේ සමස්ත උපාය මාර්ගය සකස් කරන්නේ, නීති හා ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම සහ අයවැය කළමනාකරණය හා අධීක්ෂණය කරන්නේ ද එම රටවල් නියෝජනය කරණ සාමාජිකයන් 27ක් දෙනෙකුගෙන් සමන්විත යුරෝපීය කොමිසම විසිනි.

*inclusive and sustainable growth)* අරමුණු කරගත් අභියෝගාත්මක ප්‍රතිපත්ති ගැන පොදුවේ කතා කළ නමුත් එකී අරමුණු ඉටු කර ගැනීමේ ලා පැහැදිලි ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කර නො තිබිණි. ඒ වන විට සුවිශේෂී තාක්ෂණික සොයා ගැනීම්වලට ආධාර කිරීම හෝ අලුතින් බිහි වෙන නවෝත්පාදනික ව්‍යවසායකයන් දිරිගැන්වීම වැනි කටයුතු ප්‍රධාන ප්‍රතිදාන *(outcomes)* හෙවත් ප්‍රතිඵල ලෙස සලකා යුරෝපීය කොමිසමේ නවොත්පාදන ප්‍රතිපත්තිය සකසා තිබුණි. එහෙත් සමස්තයක් වසයෙන් ගත් විට ඒ සඳහා අවශ්‍ය වූ උද්‍යෝගිමත් පරිවර්තනීය උච්ඨානයක් *(transformational shift)* ඇතිවීම එම ප්‍රතිපත්ති නිසා සිදු නො වී ය. ඒ අනුව යුරෝපීය කොමිසම කළ යුත්තේ ප්‍රතිපත්ති හඳුනා ගැනීමට ඔවුන් තර්ක කර ඇති ක්‍රමය අනික් පැත්ත හැරවීම බව මාස්සුකාටෝ පෙන්වා දුන්නා ය.

ඒ සඳහා ඇය උපදෙස් දුන් අන්දමට යුරෝපීය සංගමය පළමුවෙන් ම කළ යුත්තේ නවොත්පාදන හඳුනා ගැනීමට පෙර නවොත්පාදනවලින් විසඳිය හැකි ප්‍රශ්න මොනවා ද යන්න ප්‍රථමයෙන් ම හඳුනා ගැනීම යි. එවිට එම ප්‍රශ්න විසඳීමට හැකි නව තාක්ෂණය සහ ඒ අනුව නවොත්පාදන බිහි කිරීමට හැකි අලුත් ව්‍යවසායකයින් ඉදිරියට ඒම සිදු වනු ඇත. මෙය පැහැදිලි කිරීමට ඇය උදාහරණයකට ගත්තේ අන්තර්ජාලය බිහි වීම යි. අන්තර්ජාලය බිහි වූයේ පරිගණක යන්ත්‍රවලට මූලිකත්වය දී සකස් කළ ප්‍රතිපත්තියක් නිසා නො ව මූලික ගැටලුවක් ලෙස හඳුනා ගෙන තිබූ පරිවාරය සමඟ අන්තර් සංනිවේදනය පවත්වා ගැනීමේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස ය.

ඒ අනුව යුරෝපීය කොමිසමට ලබා දුන් උපදෙස් විස්තර කරමින් මාස්සුකාටෝ වාර්තා දෙකක් පිළියෙළ කළා ය. ඉන් එක වාර්තාවකින් මෙහෙවර මූලික කරගත් එළඹුමක් යනු කුමක් ද සහ එවැනි එළඹුමක් මෙහෙවර සිතියමක් ලෙස සකස් කළ හැක්කේ කෙසේ ද යන්නත් අනෙකෙන් ප්‍රතිපත්තිමය තලයේ දී සුවිශේෂ මෙහෙවරක් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්නත් විස්තර විය. ඒ සඳහා මාස්සුකාටෝ යොදා ගත් ආදර්ශ මෙහෙවර සිතියමේ අනුරුවක් පහත දැක්වේ.




ඒ අනුව යුරෝපා සංගමය මෙහෙවර පහකින් සමන්විත 2021-2027 දක්වා ක්‍රියාත්මක වන හොරයිසන් යුරෝප් *(Horizon Europe)* නම් පර්යේෂණ සහ නවෝත්පාදන වැඩසටහනක් දියත් කළේ ය.[266] මේ වැඩසටහන සඳහා යුරෝ බිලියන 95.5 වෙන් කිරීමට නියමිත ය. යුරෝපීය පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා පිහිටුවන ලද විශාලතම අරමුදල එය වෙයි. එම වැඩසටහනට අයත් මූලික මෙහෙවර *(Mission)* පහ මෙසේ යː

- දේශගුණ විපර්යාසයට මුහුණ දිය හැකි යුරෝපයක් ගොඩ නැගීම;
- යුරෝපය පුරා පිළිකා රෝගය ජය ගැනීම;
- යුරෝපීය සාගර සහ ජල මාර්ග පවිත්‍ර කර ප්‍රතිස්ථාපනය කිරීම;
- දේශගුණ ව්‍යසනයට දායකවීම වළක්වන සුහුරු නගර *(Smart Cities)* සියයක් යුරෝපය තුළ වර්ධනය කිරීම;
- යුරෝපයේ පස සුරැකීමෙන් ජීවිත සුරැකීම;

266 https://ec.europa.eu/info/research-and-innovation/funding/funding-opportunities/funding-programmes-and-open-calls/horizon-europe_en - Retrieved on 22 July 2021

උදාහරණයක් වසයෙන් පිළිකා රෝගය ජය ගැනීම යන මෙහෙවර මඟින් ඉටු කර ගන්නේ හුදෙක් පිළිකා රෝග වැලඳෙන යුරෝපීයන් ප්‍රමාණය සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් වසයෙන් අවම කිරීමෙන් පමණක් නො වේ. එයට පිළිකා රෝගය වැලඳී ප්‍රතිකාර ලැබ සුව වූ අයගේ ජීවිතවල ගුණාත්මක බව වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සහ ආයෝජන යොදා ගැනීම ද ඇතුළත් වී තිබේ. ඒ අනුව 2030 වසර වන විට දැනට සුව කළ හැකි ප්‍රමාණයට වඩා රෝගීන් මිලියන 30 ක් සුවපත් කොට ඔවුන්ට වඩා හොඳින් දිගු කලක් ජීවත් වීමට හැකියාව ඇති කිරීම ද, පිළිකා රෝගය ගැන ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීම ද, වැළැක්විය හැකි පිළිකා රෝග වැලඳීම වැළැක්වීම ද, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර ක්‍රම වැඩි දියුණු කිරීම ද, පිළිකා රෝගයට ගොදුරු වන සැමගේ ජීවිතයේ ගුණාත්මක බව ඉහළ දැමීමට ආධාර කිරීම සහ එම අභිමතාර්ථ යුරෝපා සංගමයට අයත් සියලු රටවල් විසින් 2030 වන විට සාක්ෂාත් කර ගනු ලැබීම ද මෙකී මෙහෙවරේ නිශ්චිත ඉලක්ක වසයෙන් එකග වී ප්‍රකාශයට පත් කර තිබේ.

එමෙන් ම සාගර සම්බන්ධ මෙහෙවර යුරෝපීය සාගර හා මුහුදු පිරිසිදු කිරීම පමණක් නො ව හානියට පත් ව ඇති සාගර හා මිරිදිය පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම ද, සාගරවලින් ලැබෙන සම්පත් සහ සේවා තිරසාර කර ගැනීම පිණිස නිල් ආර්ථිකය හෙවත් සාගර ආශ්‍රිත ආර්ථික කටයුතු නිර්කාබනීකරණය කිරීම ද ඉලක්ක ලෙස ඇතුළත් ය. මෙකී මෙහෙවර හා සම්බන්ධ ක්ෂේත්‍ර එකිනෙක හා ප්‍රත්‍යවර්ත්‍ය ලෙස සම්බන්ධ ඒවා ය. පස සුරැකීමෙන් ජීවිත සුරැකීම පිළිබඳ මෙහෙවරට ආහාර නිපදවීම තිරසාර කිරීම ද ඇතුළත් වන බැවින් එය හරිත පරිසරයක් ගොඩ නැගීම සහ දේශගුණ විපර්යාසයට මුහුණ දීම පිළිබඳ මෙහෙවර සමඟ ද අනුබද්ධ වෙයි.

මෙහි දී නියමිත මෙහෙවර සහ ඒ හා අදාළ ඉලක්ක විවිධ ආංශික ක්ෂේත්‍ර අතර අන්තර් ක්‍රියාකාරිත්වය මඟින් හැකි තරම් නවෝත්පාදන බිහි කර ගැනීමට සහ ආයෝජන ආකර්ෂණය

කර ගැනීමට සමත් විය යුතු ය. එනිසා උනන්දුවක් දක්වන නවෝත්පාදකයන් සහ ව්‍යවසායකයන් ආවේශ කළ හැකි වන ලෙස එම මෙහෙවර පුළුල් ලෙස රාමු ගත කළ යුතු ය. මේ සඳහා උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ 13 වැනි තිරසාර සංවර්ධන අරමුණ වසයෙන් සැලකෙන "දේශගුණ විපර්යාස සහ එහි බලපෑම අවම කිරීම" ගෙන හැර දැක්විය හැකි බව මාස්සුකාටෝ පවසයි. එම මෙහෙවරට අනුව දේශගුණ විපර්යාසයේ බලපෑම අවම කිරීම යන දැවැන්ත අභියෝගය ජය ගැනීමේ එක් ඉලක්කයක් ලෙස යුරෝපය පුරා කාබන් උදාසීන නොහොත් අවම කාබන් ප්‍රමාණයක් විමෝචනය වෙන සුහුරු නගර (*smart cities*) 100ක් බිහි කිරීමට එකඟ වී තිබේ. එම නගරවල කාබන් විමෝචනය සිදු වන ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා නව තාක්ෂණය යොදා ගැනීමට සැලසුම් කර තිබේ. පුරවැසියන්ගේ ගමනා ගමන පහසුකම්වල සිට ඉලෙක්ට්‍රොනික පාලන ක්‍රම දක්වා ප්‍රවාහන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම, බල ශක්ති භාවිතය, පෝෂණික අවශ්‍යතා සහ ඉදිකිරීම් කර්මාන්තය ආදී ක්ෂේත්‍රවල නව ප්‍රමිති හඳුන්වාදීම ඇතුළු අත්‍යවශ්‍ය වෙනස්කම් සිදු කිරීම ද එම වැඩපිළිවෙළට අයත් ය. ඒ සඳහා නව රෙගුලාසි මෙන් ම නව තාක්ෂණය, නව ක්‍රියාකාරකම් සහ නවොත්පාදන ද අවශ්‍ය වේ. ඒ අනුව මූලික මෙහෙවර හා සම්බන්ධ ව්‍යාපෘති ගොන්නට (*project portfolios*) විදුලි බලය උපයෝගී කරගත් පොදු ප්‍රවාහන පද්ධතියක්, ගොඩනැගිලි කර්මාන්තය සඳහා කාබන් අවශෝෂණය කළ හැකි ද්‍රව්‍ය යොදා ගැනීමේ වැඩ පිළිවෙළක්, පුනර්ජනනීය බල ශක්ති ප්‍රතිශතය ඉහළ නැංවීම, පුර වැසියන් විසින් නිපදවන කාබන් ප්‍රමාණය පාලනය කර ගත හැකි අන්දමේ කාබන් හැඳුනුම් පත් සහ නාගරික ආහාර සැපයුම් පද්ධතිය ගම්බද කාබනික කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කිරීම වැනි විවිධ ව්‍යාපෘති ද අඩංගු විය. දේශගුණ විපර්යාසය ආමන්ත්‍රණය කිරීමේ එම මෙහෙවර මාස්සුකාටෝ සිතියම් ගත කරන්නේ පහත රූපාදර්ශයේ දැක්වෙන ආකාරයට යඃ




## මරියානා මසුකටෝ අනුව

'හොරයිසන් යුරෝප්' *(Horizon Europe)* වැඩපිළිවෙළේ එන තවත් ප්‍රධාන මෙහෙවරක් වන්නේ යුරෝපීය සාගර හා මිරිදිය ජල සම්පත් පවිත්‍ර කර ප්‍රතිස්ථාපනය කිරීමයි. ආර්ථික නිෂ්පාදන කටයුතු හා ගෝලීය පරිවහන ජාලයට ලැබෙන දායකත්වයට අතිරේක ව පෘථිවියේ දේශගුණ රටාව නියාමනය වීමේ එක් තීරණාත්මක සාධකයක් වන්නේ ද සාගරය යි. ගෝලීය උණුසුම ඉහළ යෑම සාගර ජලයේ උෂ්ණත්වය සම්බන්ධ ඇතිවෙන වෙනස්කම්වලට තීරණාත්මක ලෙස බලපා තිබේ. සුළි සුළං සහ දරුණු කුණාටු සාගර ජල තලයේ මේ උෂ්ණත්ව වෙනස් වීම අනුව ඇති වන්නකි. ඒ හැර සාගරය කාබන් කිඳුමක් හෙවත් අතිරික්ත කාබන් ඩයොක්සයිඩ්

අවශෝෂණය කර ගැනීමේ ස්වාභාවික ව්‍යුහයක් ලෙස ද ක්‍රියා කරයි. කාර්මික විප්ලවය කාලයේ සිට සාගරවලට එක් වී ඇති අපද්‍රව්‍ය හා වායුගෝලයේ කාබන් වායු අවශෝෂණය ඉහළ යෑම නිසා මුහුදු ජලයේ ආම්ලිකතාව වැඩි වීම සාගර ජෛව පද්ධතියට හානිදායක ලෙස බලපා තිබේ.

'හොරයිසන් යුරෝප්' වැඩපිළිවෙළේ සාගර හා මිරිදිය ජල සම්පත් ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණට සමාන අරමුණක් එක්සත් ජාතීන්ගේ 14 වන තිරසාර සංවර්ධන අරමුණ වන "දිය යට ජීවිතය" *(Life Below Water)* යන්නෙන් ද ඉටු කිරීමට අදහස් කරයි. එම තිරසාර සංවර්ධන අරමුණ යටතේ එන එක් ඉලක්කයක් වන්නේ අපේ සාගරවලට සහ මුහුදුවලට හානිදායක ප්ලාස්ටික් ඇතුළු අප ද්‍රව්‍ය තවදුරටත් එකතු වීම වළක්වා දැනට එකතු ව ඇති ඒවා ඉවත් කිරීම යි. 1950 සිට මේ වන විට ලොව පුරා නිෂ්පාදනය වී ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් බිලියන 8.3 ක් වෙතැ'යි ගණන් බලා තිබේ. ඒ හැර වසරක් පාසා නිපදවෙන ප්ලාස්ටික් ටොන් මිලියන 300 න් අවම වසයෙන් වාර්ෂික ව ප්ලාස්ටික් ටොන් මිලියන 8ක් අපද්‍රව්‍ය වසයෙන් සාගරයට එක් වේ. ඒ නිසා සාගර ජීවීන්ට හා පරිසරයට සිදු වන ඉමහත් හානිය දැවැන්ත අභියෝගයකි. එය විසඳීමට හොරයිසන් යුරෝප් වැඩපිළිවෙළ යටතේ යෝජනා කරන කටයුතු හුදෙක් සාගරයේ නාවික කටයුතු නියාමනයට පමණක් සීමා වූ ඒවා නො වේ. ප්ලාස්ටික් වෙනුවට ආදේශ කළ හැකි පරිසර හිතකාමී ද්‍රව්‍ය නිපදවීම, දූෂණ කාරක කැළිකසළ පාලනය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම සහ චර්යා මනෝවිද්‍යාව ඇතුළු බොහෝ ක්ෂේත්‍ර හා අන්තර් සම්බන්ධ වන ඉලක්ක කිහිපයකින් එම මෙහෙවර සමන්විත ය. ඒ සඳහා මෙහෙවර සිතියමක් සකස් කරන විට ජෛව හායනීය *(Biodegradable)* ප්ලාස්ටික් ආදේශකවල සිට ප්‍රතිබිම්බ හැඳිනීම *(Image Recognition)* මඟින් මුහුදු අපද්‍රව්‍ය හඳුනා ගැනීම සහ ස්වායත්ත ව ප්ලාස්ටික් ඉවත් කිරීමේ යාන්ත්‍රණ ආදි බහුවිධ කටයුතු සම්බන්ධ නවෝත්පාදන විසඳුම් අවශ්‍ය වේ.

මේ සාගර හා මිරිදිය ජල සම්පත් පවිත්‍ර කර ප්‍රතිස්ථාපනය කිරීමේ මෙහෙවර සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යුරෝපය තුළ පුළුල් මහජන සාකච්ඡාවක් ඇති කිරීමට යුරෝපීය කොමිසම සැලසුම් කළේ ය. ඒ සඳහා යොදා ගත හැකි කෙටුම්පතක් පිළියෙළ කිරීම පණිසස අදාළ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥයන් 15 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කළ අතර එම කමිටුව එකී මෙහෙවර සම්බන්ධ මූලික අවබෝධයක් මහජනතාවට ලබා දිය හැකි ක්‍රියාකාරකම් යෝජනා කරමින් "2030 වන විට අපේ සාගර සහ ජල මාර්ග ප්‍රතිජනනය කිරීම" *(Regenerating our Ocean and Waters by 2030)* නමින් අන්තර් කාලීන වාර්තාවක් 2020 ජුනිවල දී නිකුත් කළේ ය. සාගර හා මිරිදිය ජල සම්පත් පවිත්‍ර කර ප්‍රතිස්ථාපනය කිරීමේ මෙහෙවර සම්බන්ධයෙන් මුහුණ දීමට සිදු වන අභියෝග පිළිබඳ අවධානය යොමු කරමින් වාර්තාව මෙසේ සඳහන් කළේ යඃ

> **"මින් පෙර කිසිදු කලක නො වූ විරූ අන්දමින් අපේ සාගර සහ ජල සම්පත් බලවත් පීඩනයකට ලක් ව තිබේ. දශක ගණනාවක් තිස්සේ සිදු වූ සාගර හා ජල දූෂණය හා හානිදායක භාවිත නිසා ජලාශ්‍රිත පරිසර පද්ධතිය බරපතළ ලෙස නිසරු වී ඇත. මේ අතර දේශගුණ විපර්යාසය සහ සාගර ආම්ලීකරණය වීම නිසා ඇතිවූ මැන බැලිය හැකි බලපෑම් නිසා එම පීඩනය තවත් තීව්‍ර වී තිබෙන බව ඉතා පැහැදිලිය. මේ නිසා පෘථිවියේ දේශගුණය නියාමනය කිරීමට සාගරයට ඇති හැකියාව අනතුරට ලක් වී ඇත. එහෙත් එක අතකින් මඳ දැනුම සහ සාගරය පිළිබඳ අඩු මහජන අවධානය සහ අනෙක් අතින් දුර්වල පාලන ක්‍රම නිසා ජල පද්ධති ප්‍රතිස්ථාපනය කිරීමට සහ නිසි ලෙස කළමනාකරණය කිරීමට දැනට අප සතු ව ඇති ආම්පන්න සහ ක්‍රමවේද ප්‍රමාණවත් නො වන බව ද පැහැදිලිය."**

ඒ අනුව සාගර හා ජල දූෂණය බින්දුවට බැස්සවීම *(zero pollution)* සාගර හා ජල සම්පත් පාලන ක්‍රමවේද විධිමත් කිරීම, සාගර හා ජලාශ්‍රිත පරිසර පද්ධති පුනර්ජනනීය කිරීම, සාගර සාක්ෂරතාව ඇතුළුව ජල සම්පත් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ ජලාශ සාගර සහ මුහුදු ආශ්‍රිත කටයුතු නිර්කාබනීකරණය යන අන්තර් සම්බන්ධිත තේමා හතරක් වටා අභියෝග ගණනාවක් පෙන්වා දී ඒ සම්බන්ධයෙන් වාර්තාව යෝජනා ගණනාවක් ඉදිරිපත් කළේ ය. එකී යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී මිරිදිය හා සාගර ජල සම්පත් සමග

කාර්මික හා නාගරික පද්ධති චක්‍රීය ව සම්බන්ධ කරන ක්‍රමානුකූල එළඹුමක් මඟින් නොයෙකුත් තේමා යටතේ සාකච්ඡා කොට කටයුතු කිරීමට පුරවැසියන් සහ සියලු පරදු දරන්නන් ඒකරාශී කළ යුතු බව ද වාර්තාවෙන් යෝජනා විය.

ඒ අනුව පරිසරය ද ඇතුළු ව මිරිදිය හා සාගර දූෂණය ජෛව විවිධත්වයට සහ මිනිස් සෞඛ්‍යාරක්ෂාවට බලපාන ආකාරය පිළිබඳ යාවත්කාලීන කළ ඇගයුමක් පිළියෙළ කෙරිණි. ඒ අනුව ආමන්ත්‍රණය කළ යුතු ප්‍රමුඛතා හඳුනා ගැනීම, නව නිෂ්පාදන ද්‍රව්‍ය නිපදවීම, ප්‍රතිචක්‍රීකරණය, නවෝත්පාදනික චක්‍රීය ව්‍යුහ සහ නව තාක්ෂණය උපයෝගී කර ගෙන පරිසර දූෂණය, විශේෂයෙන් ප්ලාස්ටික් ඇතුළු අපද්‍රව්‍ය, අපවිත්‍ර කාරක සහ දූෂණ පෝෂක යනාදිය පටන් ගන්නා ප්‍රභවයේ සිට ම නතර කිරීමට කටයුතු යෙදීමට විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. ඒ හැර කසල පද්ධති උතුරා යෑම, භූගත ජලය හා සුළි කුණාටු නිසා උද්ගත වන අප ජලය සුපිරිසිදු කිරීම සහ යුරෝපා සංගමයේ ජෛව විවිධත්වය පිළිබඳ ක්‍රමෝපායට අනුව ශබ්ද දූෂණය අවම කිරීම සහ ශබ්ද දූෂණය තක්සේරු කිරීම පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම යන තේමා ගැන අවධානය යොමු කළ යුතු බව වාර්තාව කියයි.

මෙකී කරුණුවලින් බොහෝමයක් අප නිල් ආර්ථිකය *(Blue Economy)* යනුවෙන් හඳුන්වන ධීවර හා නාවික පරිවහන කටයුතු ඇතුළු ව සාගර හා ජල සම්පත් ආශ්‍රිත ආර්ථිකය තිරසාර ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ ලා අතිශයින් වැදගත් ය. විශේෂඥ වාර්තාවේ සාගර හා ජල සම්පත් දූෂණය බින්දුවට බැස්සවීම සම්බන්ධ තේමාව යටතේ සාකච්ඡාවට ලක් කළ යුතු ඉලක්ක ලෙස පහත සඳහන් යෝජනා නිර්දේශ කර තිබුණි.

## වසර 2025 වන විට

- මධ්‍යධරණී මුහුද හා ප්‍රධාන ගංගා පෝෂක ප්‍රදේශවල ප්ලාස්ටික් දූෂණයට ලක් වී ඇති ප්‍රදේශ හඳුනා ප්ලාස්ටික් ඉවත් කිරීමේ නියාමක ව්‍යාපෘති *(pilot projects)*ආරම්භ කිරීම;

- එක්වරක් පමණක් භාවිතයට ගන්නා සියලු ප්ලාස්ටික් භාණ්ඩ භාවිතය තහනම් කිරීම;
- රතු මඩ *(bauxite)* යනුවෙන් හැඳින්වෙන කාර්මික අපද්‍රව්‍ය, ආකර කර්මාන්තයේ අවශේෂ සහ ඉවත් කරන මඩ ද්‍රව්‍ය ගංගාවලට හෝ මුහුදුවලට දැමීම නතර කිරීම;
- අපවිත්‍ර ජලය පවිත්‍රකරණය කිරීම සඳහා මුහුදුබඩ ප්‍රදේශවල අධි තාක්ෂණික නියාමක ව්‍යාපෘති ආරම්භ කිරීම
- යුරෝපීය සංගමයේ රටවල්වල ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත ශාලා 50ක් පිහිටුවීම

## වසර 2030 වන විට

- ගංගා පෝෂක ප්‍රදේශ ද ඇතුළත් ව අත්ලාන්තික් සාගරය, මධ්‍යධරණී, බෝල්ටික්, කළු සහ උතුරු මුහුදුවලට අපද්‍රව්‍ය දැමීම 95%කින් අඩු කර ගැනීම සහ වාර්ෂික ව *x*% ප්‍රමාණයක අපද්‍රව්‍ය ඉවත් කිරීම;
- යුරෝපා සංගමය තුළ ඇති සියලු වෙළඳපොළවල අලෙවි කරන ප්ලාස්ටික් භාණ්ඩ ප්‍රතිචක්‍රීය කළ හැකි හෝ නැවත නැවත භාවිත කළ හැකි ඒවා බවට වග බලා ගැනීම;
- නාගරික අප ජලය100%ක් ම තෘතීය මට්ටමේ *(ඉහළතම පවිත්‍රතාවක් ඇති)* පවිත්‍රකරණයකට ලක් කිරීම;
- පස සේදී යෑම නිසා යුරෝපීය ගංගා හා මුහුදුවල ඇතිවෙන හානිදායක පෝෂණය *(eutrophication)* අවම කිරීම;
- වාරි කර්මාන්තය සඳහා යොදා ගන්නා ජලයෙන් අවම වසයෙන් 20% ක් සඳහා ප්‍රතිචක්‍රීකරණය කළ ජලය යොදා ගැනීම;
- නව කෘෘස් නාවික යාත්‍රා සඳහා යොදා ගන්නා ජලය 100% ක් ම අප ජලය පවිත්‍ර කිරීමෙන් සපුරා ගැනීම;
- කාබනික දූෂණ කාරක අනවරතයෙන් සාගර හා ජල වහන පද්ධතියට එක්වීම වැළැක්වීම;
- ඖෂධ ද්‍රව්‍ය නිෂ්කාෂණය 50%කින් අඩු කිරීම;
- නව දියයට ශබ්ද නිරීක්ෂක පද්ධතියක් මත පදනම් ව

යුරෝපයේ හැම නාවික හා අනුජලජ කලාපයක ම මානව කටයුතු නිසා ඇතිවෙන ශබ්ද දූෂණය 50%කින් අඩු කිරීම.

සාගර හා ජල සම්පත් පවිත්‍ර කොට ප්‍රතිස්ථාපනය කිරීම යන මෙහෙවර ප්‍රායෝගික ව ඉටු කිරීම පිළිබඳ නිදර්ශනයක් වසයෙන් ගෙන හැර දැක්වූ ඉහත කී ඉලක්ක හා අන්තර් සම්බන්ධකම් ඇති තවත් ඉලක්ක ගණනාවක් විවිධ තේමා යටතේ සපුරා ගැනීමට ද මේ යටතේ යෝජනා කර තිබේ. ඒ අතර සාගර ආශ්‍රිත ව සුළං බලය සහ මුහුදු මාස්සුකාටෝ රළ බලය යොදා පුනර්ජනනීය බලශක්තිය නිපදවීම ඉහළ නැංවීම, පවිත්‍ර පරිවහනය සඳහා මුහුදු යාත්‍රා නවීකරණය කිරීම, ඇල්ගී නිෂ්පාදන කර්මාන්තයේ කාබන් විමෝචනය අවම කිරීම, වෙරළබඩ සංචාරක කර්මාන්තය ආශ්‍රිත සේවා නිර්කාබනීකරණය කිරීම සහ වෙරළ ප්‍රතිස්ථාපනය, නිල් අභය භූමි වපසරිය සහ සංඛ්‍යාව ඉහළ නැංවීම, මහජනතාව අතර හා අධ්‍යාපන ක්‍රමය තුළ සාගර සාක්ෂරතාව ඉහළ නැංවීම ද වේ.

මුහුදින් වට වූ දිවයිනක් වන ශ්‍රී ලංකාවට තිරසාරත්වය පිළිබඳ මූලධර්ම මත සැලසුම් කරනු ලබන නිල් මෙහෙවර ආර්ථිකයකින් *(Blue Mission Economy)* ගත හැකි ඵල ප්‍රයෝජන එමටය. හොරයිසන් යුරෝපා වැඩපිළිවෙළ මෙන් දකුණු ආසියාව පදනම් කර ගෙන වඩා ඵලදායක එවැනි වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට තරම් කලාපීය දේශපාලන ඒකකයක් ලෙස දකුණු ආසියාව තවමත් හැඩ ගැසී නැති නමුදු ඒ සඳහා අව්‍යාජ එක්සත් දකුණු ආසියානු සංගමයක් නුදුරු අනාගතයේ බිහි කර ගැනීමට ද අප උනන්දු විය යුතු ය.

මරියා මාස්සුකාටෝ පෙන්වා දුන් මෙහෙවර ආර්ථික එළඹුම පිළිබඳ ක්‍රමෝපායට අනුව හැඩ ගැසෙන හොරයිසන් යුරෝප් වැඩපිළිවෙළේ ඇතැම් අංග මඳක් විස්තර සහිතව නිදර්ශනයට ගැනීමෙන් මා අදහස් කළේ කාටත් ඵලදායක නිශ්චිත පොදු මෙහෙවරක් අරමුණු කොට ආර්ථික සංවර්ධනය යොමු කළ විට කෙතරම් පුළුල් පරාසයක නව ආර්ථික කටයුතු, නවෝත්පාදන හා රැකියා අවස්ථා ඇතිවීමට ඉඩ ඇත් ද යන්න පිළිබඳ පාඨකයාගේ අවධානයට ලක් කිරීමයි. මෙහි දී වඩාත් වැදගත් කාරණයක් වන්නේ

සාම්ප්‍රදායික ලෙස හුදෙක් වෙළඳපොළ සහ ලාභය මඟින් සියල්ල ස්වයං ක්‍රියාකාරී ව තීරණය වේ යන යල්පැන ගිය අදහස ඉක්මවා ගොස් පොදු මෙහෙවරක් ඉටු කර ගැනීම වටා ආර්ථික හා සමාජීය කටයුතු සංකල්ප ගත කිරීමෙන් තිරසාර සංවර්ධනය සඳහා පොදු හා පෞද්ගලික යන දෙ අංශයේ ම කැපකරු දායකත්වය උත්තේජනය කළ හැකි බවයි.

කෙසේ වෙතත් ආණ්ඩු තම කටයුතු කිරීමට ඇබ්බැහි වී ඇති ආකාරය සැලකූ විට පෙරළිකාර වෙනස්කම්වලින් තොර ව මෙහෙවර ආර්ථිකයක් පිළිබඳ අදහස ක්‍රියාවට නැංවීම හිතන තරම් පහසුවෙන් කළ හැකි දෙයක් නො වේ. උදාහරණයක් ලෙස පරිසර හිතකාමී පවිත්‍ර ආර්ථික වර්ධනයක් සඳහා කටයුතු කිරීමේ දී ගමනාගමන හා පරිවහන සේවා, බල ශක්ති සහ කාර්මික සංවර්ධන ක්‍රමෝපාය, නව තාක්ෂණය, නවෝත්පාදනය සහ විද්‍යාව මෙන් ම මුදල් ආදී විෂය පථ සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යාංශ දෙපාර්තමේන්තු අතර අතිශයින් අව්‍යාජ සහයෝගයක් හා සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. ඒ හැර අපේ ආහාර පරිභෝජනය හා ගමනාගමනය පිළිබඳ හුරු පුරුදු ක්‍රමවේද හා ඇබ්බැහිකම් වෙනස් කර ගැනීමට ද සිදුවේ. සිය රටවැසියන් සමඟ තිරසාර සංවර්ධනය හා මෙහෙවර ආර්ථිකය පිළිබඳ අව්‍යාජ සාකච්ඡාවක විශ්වාසදායක ලෙස නිරත විය නො හැකි ආණ්ඩුවකට එය කළ නො හැකි ය.

ඒ අනුව මෙහෙවර ආර්ථිකයක් පරිකල්පනය කිරීමේ දී අවශ්‍යයෙන් ම කළ යුතු කටයුතු කිහිපයකි. පළමුවෙන් ම තෝරා ගනු ලබන මෙහෙවර කිහිපය සමාජයට වැදගත් වන මහජන අපේක්ෂා කුප්පන, එඩිතර සහ ප්‍රබෝධ ජනක ඒවා විය යුතු ය. එම මෙහෙවර මිනිසුන්ගේ එදිනෙදා ජීවිතය වැඩි දියුණු කිරීමට ඍජු ව දායක වන පැහැදිලි අභිප්‍රායන් සහ උන්නතිකාමී *(ambitious)* විසඳීම්වලින් සමන්විත මහජන පරිකල්පනය අවදි කරවනසුලු එකක් විය යුතු ය. එමෙන් ම එසේ නිශ්චිත කර ගන්නා මෙහෙවර සඳහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණුවල දක්නට ලැබෙන පරිදි පැහැදිලි දිශානතියක්, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල පිළිබඳ කාල

වකවානු තිබිය යුතු ය. මෙහෙවර සම්බන්ධ නියමිත ඉලක්ක සහ එකී ඉලක්ක සපුරා ගැනීමේ කාලසටහන තීරණය කිරීමේ දී එය පැහැදිලි කළ හැකි ය. මෙම ඉලක්ක දෙයාකාරයකින් එනම් මිනිසෙකු හඳට යවා ආපසු ගෙන්වා ගැනීම වැනි ද්වයංගී *(binary)* ආකාරයෙන් හෝ කාබන් විමෝචනය 30%කින් අඩු කිරීම සඳහා කාර්මික නිෂ්පාදන කර්මාන්තය වෙනස් කිරීම වැනි ප්‍රමාණාත්මක ව කරන වෙනසක් මුල් කර ගෙන හෝ නිර්ණය කළ හැකි ය. අප ඒ ඉලක්කය සපුරා ගත්තා ද නැද්ද වැනි එක් සරල ප්‍රශ්නයකින් සාර්ථකත්වය තක්සේරු කළ හැකි අන්දමට ඉලක්ක නිර්ණය වී තිබිය යුතු ය. මුළු මෙහෙවර පුරා වරින් වර ප්‍රගතිය තක්සේරු කර ගැනීමේ දී එය ඉතා වැදගත් ය.

ඒ හැර අදාළ මෙහෙවර සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන නවෝත්පාදන සහ ආයෝජන පිළිබඳ. උන්නතිකාමී එහෙත් යථාර්ථවාදී පැහැදිලි ඉලක්ක තීරණය කර ගත යුතු ය. ඒ සඳහා අවදානමක් ගෙන අවශ්‍ය ප්‍රතිඵල ලබා ගැනීම පිණිස සිවිල් සේවකයන්, පර්යේෂකයන් සහ නවෝත්පාදකයන් නිරන්තරයෙන් දිරිමත් කොට හුරුපුරුදු කල්කිරියාව ඉක්මවා කටයුතු කිරීමට ඔවුන් පෙලඹවීම ද අවශ්‍ය වේ. එහෙත් ඒ සඳහා ඔවුන්ට දී ඇති ඉලක්ක සහ අදාළ කාල සටහන් ප්‍රායෝගික හා යථාර්ථවාදී ඒවා විය යුතු ය. යථාර්ථවාදී නො වන ඉලක්ක සඳහා පාර්ශවකරුවන් ඉදිරි පත්වීමට මැලි වනවා මෙන් ම නවෝත්පාදන සම්බන්ධව ප්‍රමාණවත් උන්නතිකාමයක් ඇවිස්සීමට අසමත් වන ඉලක්ක ද ආයෝජකයන්ට හෝ නවෝත්පාදකයන්ට ආකර්ෂණීය නො වේ.

තවත් වැදගත් කාරණයක් නම් එවැනි මෙහෙවරක් මෙහෙයවීමේ කාර්ය ඒ සඳහා උචිත විශේෂිත රාජ්‍ය ආයතනය මඟින් පමණක් ඉටු කළ යුතු ද යන්නයි. උදාහරණයක් ලෙස මිනිසෙකු හඳට යවා නැවත ගෙන ඒමේ මෙහෙවර ඉටු කරන ලද්දේ ඇමෙරිකානු එක්සත් ජනපදයේ අභ්‍යවකාශ තරණය හා අජටාකාශය පිළිබඳ රාජ්‍ය ආයතනය වන *NASA (National Aeronautics and Space Agency)* ආයතනය විසිනි. එවැනි ආයතනයක් නැති අවස්ථාවල දී එකී මෙහෙවර සම්බන්ධීකරණය කොට මෙහෙයවීම පිණිස වෙන ම

ආයතනයක් පිහිටුවීම වැදගත් වේ. යුරෝපීය කොමිසම විසින් නිර්ණය කරන ලද මෙහෙවර පහ සඳහා මෙහෙවර මණ්ඩල *(Mission Boards)* පහක් පත් කර ඇති අතර තම මෙහෙවර ක්ෂේත්‍රය තුළ සංයුක්ත කටයුතු සම්බන්ධයෙන් යුරෝපීය කොමිසමට උපදෙස් දීම එකී මණ්ඩලවල කාර්යය යි. ඒ අනුව එක් එක් මෙහෙවර යටතේ අවශ්‍ය කටයුතු සිය සාමාජික රටවල් හා සම්බන්ධීකරණය කිරීමට යුරෝපීය කොමිසම අපේක්ෂා කරයි.

සමස්තයක් ලෙස ගත් විට මෙහෙවර ආර්ථික එළඹුමක මෙහෙවර මොනවා දැ'යි තීරණය කළ හැකි වන්නේ හුදෙක් වෙළඳපොළ නවෝත්පාදන සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස සේවයට රජය යෙදවීම මඟින් නො ව නවෝත්පාදනවල එන්ජිම ලෙස කටයුතු කිරීම රජය විසින් අත්පත් කර ගනු ලැබූ විට ය. සාමාන්‍යයෙන් ඇමෙරිකානු රාජ්‍ය යන්ත්‍රණය තුළ නවෝත්පාදන දිරි ගැන්වීම සඳහා මෙවැනි නම්‍යශීලීතාවක් පැවතුණේ යුද සමය තුළ පැවති මිලිටරි සංවිධාන ව්‍යුහයට යි. සාමාන්‍යයෙන් මිලිටරි ව්‍යුහයට අයත් ආයතනවලට ආණ්ඩුවේ අනෙක් ආයතන තරම් නිලධාරිවාදී බාධකවලට මුහුණ දීමට සිදු නො වේ. මෙහෙවර හෙවත් *Mission* යන්න ම මිලිටරි වාං මාලාවේ හුරුපුරුදු වදනකි. ඇමෙරිකා එක්සත් ජනපදයේ *DARPA (Defense Advance Project Agency)* නොහොත් ආරක්ෂක කටයුතු පිළිබඳ උසස් පර්යේෂණ ව්‍යාපෘති ආයතනයට නවෝත්පාදන රැසක් බිහි කළ ව්‍යාපෘති ගණනාවක් සාර්ථකව දියත් කිරීමට හැකි වීමට එක් හේතුවක් වූයේ එය මිලිටරි සංස්කෘතියට අනුව හැඩ ගැසුණු ආයතනයක් නිසා විය හැකි බව මාස්සුකාටෝ පෙන්වා දෙයි.

මේ සඳහා දිය හැකි කදිම උදාහරණයක් ලෙස කෝවිඩ්-19 එන්නත් නිපදවීම සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ආරක්ෂක කටයුතු පිළිබඳ උසස් පර්යේෂණ ව්‍යාපෘති ආයතනය *(DARPA)* පුරෝගාමී වූ හැටි මාස්සුකාටෝ විස්තර කරයි. කෝවිඩ්-19 වසංගතය ආරම්භයේ දී ම *DARPA* ආයතනය කෝවිඩ් -19 රෝගය සඳහා එන්නත් නිපදවීමට මොඩර්නා සහ ඉනෝවියෝ නමැති ඖෂධ

නිෂ්පාදන සමාගම් දෙකට අරමුදල් සැපයී ය. මේ එන්නත් නිපදවීමට යෝජනා කර තිබූ ක්‍රමය මුළුමනින් ම නව ක්‍රමයක් වූ *RNA* සහ *DNA* තාක්ෂණය මත පදනම් විය. බොහෝ විද්‍යාඥයන් සහ ආයෝජකයන් ඒ ක්‍රමය අවදානම් සහිත ආයෝජනයක් විය හැකි යැ'යි සැලකූ නමුත් *DARPA* ආයතනය සාමාන්‍ය එන්නත් නිෂ්පාදන ක්‍රමයට වඩා එවැනි න්‍යුක්ලික් අම්ල පාදක තාක්ෂණය මඟින් කඩිනමින් එන්නතක් බිහි කර ගත හැකිවෙතැ 'යි යන විශ්වාසය මත උද්දාමශීලී ලෙස ඒ සඳහා ආයෝජනය කළේ ය. එහි ප්‍රතිඵල බෙහෙවින් සතුටුදායක විය. ඒ අනුව පළමු වටයේ ම කෝවිඩ්-19 සඳහා එන්නත් කිරීමට මොඩර්නා එන්නත සූදානම් කර ගත හැකි වූ අතර ඉන් අනතුරුව ඉනොවෝ එන්නත සායන පරීක්ෂණවලට යොමු කිරීමට හැකි විය. ඉහළ අවදානම් ආයෝජනවලින් ඉහළ ප්‍රතිඵල ලබා දුන් එවැනි නවෝත්පාදන කිහිපයක් ම බිහි කිරීමට පුරෝගාමී වීමේ ගෞරවය *DARPA* ආයතනයට හිමි ව තිබේ.

මෙහෙවර එළඹුමක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු තවත් වැදගත් කරුණක් නම් එකී මෙහෙවර තනි තාක්ෂණික විසඳුමක් කරා යොමු වෙනවා වෙනුවට බහුවිධ ක්ෂේත්‍රවල තාක්ෂණික විසඳුම් සහ විවිධාකාර නවෝත්පාදන උද්දීපනය කරවීමට දායක වන්නක් ද යන්නයි. සාමාන්‍යයෙන් මෙහෙවරක් සුනිශ්චිත අරමුණු කරා යොමු වෙන නමුත් එම අරමුණු බහුවිධ ව්‍යාපෘති ජනිත කරලීමට තරම් පුළුල් ඒවා විය යුතු ය. ඒ නිසා මෙහෙවර සපුරා ගැනීමේ දී වැඩි ම නවෝත්පාදන සංඛ්‍යාවක් බිහි කිරීමට හැකි අන්දමින් එකී මෙහෙවරේ අරමුණු තීරණය කිරීම වැදගත් ය.

මෙහෙවර එළඹුම පිළිබඳව මහජනතාවගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඇති කළ හැක්කේ කෙසේ ද යන්න අතිශයින් වැදගත් ප්‍රශ්නයකි. හඳට මිනිසෙකු යවා ආපසු ගෙන් වීම පිළිබඳව 1960 ගණන්වල කෙනඩි ජනාධිපතිවරයා දියත් කළ සමාජ සාකච්ඡාව ඇරඹෙන අවධියේ දී ඇමෙරිකානු ජනසමාජය තුළ දෙවැනි ලෝක මහා යුද්ධය කාලයේ සිට පැවති අවදානම් සහ ප්‍රතිලාභ බෙදා හදා ගැනීම පිළිබඳ පරහිතකාමී ප්‍රජා මානසිකත්වය ඒ වන විටත් පැවතුණු

බව මාස්සුකාටෝ පෙන්වා දෙයි. දෙවැනි ලෝක යුද්ධය අභියෝග යක් වසයෙන් සලකමින් පොදු සහ පෞද්ගලික යන දෙඅංශම පොදු සමාජීය අරමුණක් සඳහා සහයෝගයෙන් වැඩ කිරීමේ ජීව ගුණය ඒ වන විටත් ඇමෙරිකානු ජනතාවගේ මතකයේ රැඳී තිබුණි. එය අද කාලයේ කථා කරන 'කෝපරේට් රෙස්පොන්සිබිලිටි' *(corporate responsibility)* හෙවත් සමාගම්වල සමාජ වගකීම හා පුණ්‍ය කටයුතුවලට වඩා හාත්පසින් ම වෙනස් වූ සාමූහික ආකල්පයකි. මෙහි දී පොදු අරමුණු පිළිබඳ කටයුතුවලට සිය දායකත්වය ලබාදෙන ව්‍යාපාර සමාගම්වල ආකල්පය වන්නේ වටිනාකම් දාමය තුළ සමාජයේ පොදු අරමුණුවලට සහයෝගය දක්වන නවෝත්පාදනීය ආයෝජන මඟින් ආදායමක් ද උපයා ගැනීම යි.

එහෙත් එකල පැවති මේ සාමූහික ආකල්පය 1970 ගණන්වල සිට වෙනස් වීම ඇරඹුණේ විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ හා බ්‍රිතාන්‍යයේ වැඩි වශයෙනුත් යුරෝපයේ තරමක් අඩුවෙනුත් සාමූහික ප්‍රජා වගකීම් පිළිබඳ ජීව ගුණය අබිබවා යන ලෙස ස්වාමිත්වකාමී පුද්ගලික අයිතිවාසිකම් ස්ථාන ගත කළ පසු ය. ඒ වන විට දෙවැනි ලෝක මහා යුද්ධ සමයේ බෙදා හදා ගැනීම් සහ ප්‍රජා සත්කාර පිළිබඳ සාමූහික අත්දැකීම්වලට මුහුණ දුන් අය වෙනුවට අලුත් පරම්පරාවක් ඉදිරියට පැමිණ තිබුණි. ඒ අතර ආර්ථික නිර්නියාමනය හමුවේ ශීඝ්‍රයෙන් මූල්‍යකරණය වන පරිසරයක හුදු ආත්මාර්ථකාමය මුල්කරගත් ධන ලෝභය උත්කෘෂ්ට කරවන ආකල්පවලට ඔවුන්ගෙන් බොහෝ අය ගොදුරු විය. ඒ සමඟ ජන සමාජයේ ඇති හැකි ස්තරය තුළ උතුරා ගිය සෞභාග්‍ය සහ පරිභෝජනවාදය සාමූහික ඕනෑ එපාකම් වෙනුවට පුද්ගල අභිවෘද්ධිය ඔජ වඩවා තැබී ය.

දැවැන්ත සමාජ අභියෝග ජය ගැනීම සහ නවෝත්පාදනය පිළිබඳ සාමූහික හැඟීම උද්දීපනය කිරීම පිණිස මෙහෙවර ආර්ථික එළඹුම පිළිබඳ සංකල්පය උපයෝගී කර ගෙන මහජනතාව ක්‍රියාශීලී ලෙස මැදිහත් කර ගැනීම තුළින් ඉහත කී ප්‍රවණතාව ආපසු හැරවීමට හැකියැ'යි මාස්සුකාටෝ අදහස් කරයි. ඊට හේතුව

මෙහෙවර ආර්ථික එළඹුම මඟින් මහජනතාවට වැදගත් වන කරුණු පිළිබඳ ප්‍රතිපත්ති, මානව සම්පත් සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රතිපත්ති පිළිබඳ කතිකාව සඳහා මහජන සහභාගිත්වය අවියෝජනීය ලෙස කේන්ද්‍රස්ථානයට ගෙන එන බැවිනි. සහභාගිත්වය තහවුරු කිරීම පිළිබඳ නිල ක්‍රියාවලියක් නොමැතිව වුව ද බොහෝ රටවල ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් පහළ සිට කෙරෙන බලපෑම කොහොමටත් අනුක්‍රමයෙන් වැඩි වෙමින් පවතී.

හුදෙක් දියුණු තාක්ෂණික විසඳුම් මත සාර්ථකත්වය තීරණය වන මිනිසෙකු හඳට යවා ආපසු ගෙන්වා ගැනීම වැනි ඉහළ සිට පහළට මුළුමනින් ම පාහේ විද්‍යාඥයන්ගේ මතයට ප්‍රමුඛත්වය ලැබෙන මෙහෙවරක් මෙන් නො ව නව තාක්ෂණය මෙන් ම සමාජීය හා දේශපාලනික කරුණු කාරණා ද එක සමාන වැදගත් කමකින් සැලකිය යුතු මෙහෙවර එළඹුමක් සැලසුම් කිරීමේ දී විනිවිද භාවයකින් යුතු පුළුල් මහජන සහභාගිත්වයක් අවශ්‍ය වේ. මේ සඳහා නිදර්ශනයක් ලෙස හරිත ආර්ථිකයකට පරිවර්තනය වීමේ සංක්‍රාන්තිය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාර්ගෝපදේශවලට[267] අනුව යුරෝපීය වෘත්තීය සමිති සාමාජිකත්වය අරමුණු කරගත් "සාධාරණ සංක්‍රාන්තියක්" *(Just Transition)*[268] යන සමාජ ව්‍යාපාරය හැඳින්විය හැකි ය. එහි පරමාර්ථය වූයේ කාබන් විමෝචනය අවම කෙරෙන හරිත ආර්ථිකයකට පරිවර්තනය වීමේ දී සාම්ප්‍රදායික සේවා නියුක්තිකයන්ට ඒ සඳහා අනුවර්තනය වීමට සහ හරිත ආර්ථිකයේ ඵල නෙලා ගැනීමට ආධාර කිරීම යි. ඒ සඳහා විශේෂයෙන්ම ඛනිජ තෙල් ආදි කාබනික ඉන්ධන පාදක කර්මාන්ත නිර්කාබනීකරණයට පරිවර්තනය කිරීමේ දී එකී කර්මාන්ත ක්ෂේත්‍රවල නියුතු සේවකයන්ගේ හැකියා හා ශිල්පීය දැනුම නව හරිත ආර්ථිකයට උචිත ලෙස යාවත්කාලීන කිරීමට ආධාර කිරීම එම ව්‍යාපාරයේ මූලික අරමුණක් විය.

---

267 https://www.ilo.org/global/topics/green-jobs/publications/WCMS_432859/lang–en/index.htm - Retrieved on 25 July 2021

268 https://caneurope.org/just-transformation-vision-principles/ - Retrieved on 25 July 2021

ජන සමාජයක ජීවත් වන සාමාජිකයන් අතර සබැඳියාව තහවුරු කරන එක් වැදගත් සාධකයක් වන්නේ දියුණු සමාජීය ජීවිතයකට ඇති අභිලාෂය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සාමූහික පරිකල්පනය උද්දීපනය කළ හැකි නිර්මාණාත්මක සංස්කෘතිය යි. මෙය විස්තර කිරීමට මාස්සුකාටෝ උදාහරණයකට ගන්නේ ප්‍රකට ස්වාභාව ධාර්මිකයෙකු හා වාර්තා විචිත්‍රාංගකරුවෙකු වන ඩේවිඩ් ඇටෙන්බරෝ විස්තර කථනය කළ වූ *Blue Planet* හෙවත් 'නිල් ග්‍රහලෝකය' යන වාර්තා චිත්‍රපට මාලාවට අයත් ඇතැම් අනුවේදනීය දර්ශනවලින් ඇති කළ බලපෑම යි. 2017 වසරේ දී බීබීසී රූපවාහිනී සේවය ඔස්සේ මුල් වරට ප්‍රචාරය වූ මේ වාර්තා චිත්‍රපට මාලාව පෘථිවියේ දිය ගොඩ වෙසෙන සත්ව විශේෂ අලළා සකස් කළ මින් පෙර නො දුටු විරූ ආකාරයේ ආකර්ෂණීය වාර්තා චිත්‍රපට මාලාවකි. එහි අවසාන වැඩසටහනේ දිය යට ඇති ප්ලාස්ටික් අපද්‍රව්‍ය උගුරේ හිර වීම නිසා මිය යන ළදරු ඩොල්පින් මාළුවෙකු පිළිබඳ හද කකියවන දර්ශනයක් ඇතුළත් විය. ලොව පුරා බොහෝ රටවල දරුවෝ මේ අනුවේදනීය දර්ශනය දැක තදින් කම්පාවට පත් වූහ. ඉන් පසු ප්ලාස්ටික් රහිත සාගරයක් පිළිබඳ පාසලේ පංති කාමර තුළ සහ පවුලේ කෑම මේසය වටා සිදු වුණු කතිකාවලින් පෙන්වා දුන්නේ ප්ලාස්ටික් ඉවත් කිරීම පිළිබඳ මෙහෙවරේ ඇති වැදගත්කම තේරුම් ගැනීමටත් ඒ හා අදාළ නව ක්‍රියාකාරකම් පිළිබඳ පෘථුල සාකච්ඡාවක් ඇති කිරීමටත් නිර්මාණාත්මක මැදිහත් වීම විසින් කුප්පන ලද සහභාගිත්වය සහ සහානුකම්පිත සමාජ සංස්කෘතිය කෙතරම් වැදගත් ද යන්නයි. ඒ අනුව ප්‍රතිපත්ති සම්පාදන සාකච්ඡා හා සම්මන්ත්‍රණ ඉක්මවා ප්ලාස්ටික් අපද්‍රව්‍ය විරහිත සාගරයක් පිළිබඳ අදහස මහජන පරිමණ්ඩලය සසල කරමින් සමාජගත විය.

පොදු අංශයේ නව වැඩ සටහන් සහ නවෝත්පාදන අවශ්‍යතා සැලසුම් කිරීමේ දී මහජන සහභාගිත්වය සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දැක්වීම දැන් බොහෝ රටවල දක්නට ලැබේ. මේ සම්බන්ධයෙන් දිය හැකි හොඳ උදාහරණ අතර එක්සත් ජාතීන්ගේ

තිරසාර සංවර්ධන අරමුණු රාමු ගත කිරීමේ ලා වැදගත් අදහස් ජනනය කිරීම සහ උපදේශනය සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙත ගත හැකි ය. 2015දී තිරසාර සංවර්ධන පිළිබඳ න්‍යාය පත්‍රය සැකසීම පිණිස ලොව වටා විවිධාකාර සංවිධිත සිවිල් සමාජ කණ්ඩායම් *A Million Voice: The Worlds We Want* හෙවත් "මිලියනයක හඬක්: අපට අවශ්‍යය ලෝකය" යන තේමාව යටතේ අදහස් පළ කළේ ය.[269] එක්සත් ජාතීන්ගේ සංවර්ධන සාමූහිකය මඟින් දියත් කළ එම ගෝලීය සාකච්ඡාවේ මූලික අභිප්‍රාය වුණේ සංවර්ධන අරමුණු නිර්ණය කිරීමේ දී ඒවායේ සමාජීය අයිතිය සාමාජික රටවල ආණ්ඩු පක්ෂවල නිල කාලය ඉක්මවා ජනතාව අතර තහවුරු කර ගැනීම යි.

හඳට මිනිසෙකු යවා නැවත ගෙන්වා ගැනීමේ මෙහෙවර මහජන අභිලාෂ අතිශයින් උද්දීපනය කරන්නක් විය. එහෙත් මූලික වසයෙන් ම තාක්ෂණික මෙහෙයුමක් වූ එය සැලසුම් කිරීමට මහජන සහභාගිත්වයක් අවශ්‍ය නො වීම තේරුම් ගත හැක්කකි. කෙසේ වෙතත් ආර්ථිකයේ හරිත වර්ධනය, දිවිපෙවත සෞඛ්‍ය සම්පන්න කිරීම, ගමනාගමනයේ මතු අනාගතය සහ ඩිජිටල් බෙදුම නැති කිරීම වැනි සමාජීය මෙහෙවර සැලසුම් කිරීමේ දී වැඩි ම ජන සංඛ්‍යාවකට ඵල ප්‍රයෝජන ලැබෙන සේ සැලසුම් කිරීම සහ ඊට අවශ්‍ය සමාජ පිළිගැනීම තහවුරු කිරීම පිණිස මෙහෙවර නිර්ණය ආරම්භයේ සිට ම විවිධ ජන කොටස්වල හඬට කන්දීම අත්‍යවශ්‍යය ය.

මහජන කතිකාවේ දී ඇතිවෙන විවාද සම්බන්ධයෙන් විවෘත ව අදහස් සාකච්ඡා කිරීමට දේශපාලනඥයන් වග බලා ගත යුතු ය. දශකයකට අධික කාලයක් ජර්මනියේ සිවිල් සමාජ ව්‍යාපාරය හරිත බලශක්තිය නමින් පවත්වා ගෙන ගිය සමාජ කතිකාව අවසානයේ දී ජර්මන් ආණ්ඩුව විසින් කාබන් විමෝචනය අවම කරන හා න්‍යෂ්ටික බලය අනුක්‍රමයෙන් අතහරින බලශක්ති සංක්‍රාන්තියක් කරා මෙහෙයවීමට හැකි වූයේ ජර්මන් දේශපාලනඥයන් එම සාකච්ඡාවට විවෘත ව මැදිහත් වූ බැවිනි.

269 https://unsdg.un.org/resources/million-voices-world-we-want - Retrieved on 25 July 2021

මෙහෙවර නිර්ණය කිරීමේ මහජන කතිකාව අසල්වාසී මට්ටමේ සිට පලාත් මට්ටම හා ඉන් ඔබ්බට විවිධ මට්ටම් දක්වා ද පතළ කළ හැකි ය. ස්වීඩනයේ වීදි පදනම් කර ගෙන "හැම වීදියක් ම සෞඛ්‍ය සම්පන්න, තිරසාර හා ප්‍රබෝධ ජනක වීදියක් කරමු" යන තේමාව යටතේ අදාළ වීදියේ නේවාසික ජනතාවගේ සහභාගිත්වයෙන් දියත් වූ වැඩපිළිවෙළ එවැනි මෙහෙවර ස්ථානික වසයෙන් නිර්ණය කොට ක්‍රියාත්මක කිරීම පිළිබඳ හොඳ උදාහරණයකි.[270] ස්වීඩනයේ කිලෝමීටර 40,000 ක වීදිවල වැඩි වසයෙන් වාහන නතර කිරීමට යොදා ගෙන ඇති ඉඩ කඩ වෙනුවට වැඩි ඉඩක් අසල්වාසීන්ගේ සමාජ භජන කටයුතු සඳහා යොදා ගැනීම එම වැඩපිළිවෙළේ එක් ඉලක්කයක් විය. තවත් එවැනි ම මෙහෙවර එළඹුමකින් යුත් අසල්වාසී වැඩ පිළිවෙළක් වූයේ ළඟ ම පාසලේ ඉගෙන ගන්නා සිසු දරුවන්ට සෞඛ්‍ය සම්පන්න පෝෂ්‍යදායී තිරසාර ආහාර වේලක් ලබා දීම යි. ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය දායකත්වය සහිත ව, ආහාරද්‍රව්‍ය වගා කරන ගොවියන්, සහ ආහාර සපයන සමාගම්, පෝෂණවේදීන් හා දෙමව්පියන් ද දායක වන වැඩපිළිවෙළක් දියත් විය.

ඉහත කී අසල්වාසීන්ට ප්‍රබෝධ ජනක වීදියක් සහ පෝෂ්‍යජනක පාසල් ආහාරයක් යන වැඩපිළිවෙළවල් දෙක ම එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු බිම් මට්ටමෙන් ඉලක්ක ගත කිරීමට අනුකරණය කළ හැකි කදිම උදාහරණ වසයෙන් ද සැලකිය හැකි ය. මේ අනුව මෙහෙවර ආර්ථික එළඹුම පිළිබඳ සංකල්පය ඉතා නම්‍යශීලී ලෙස විවිධ මට්ටම්වලට පහසුවෙන් අනුවර්තනය කළ හැකි බව පෙනී යයි. ජාතික මට්ටමේ මෙහෙවර එළඹුම්වලට වඩා අසල්වැසි මට්ටමේ මෙහෙවර එළඹුම්වලට ක්‍රියාකාරී මහජන සහභාගිත්වය ලබා ගැනීම පහසු ය. එමෙන් ම ප්‍රතිඵල අගැයීම, බෙදා හදා ගැනීම හා අඩුපාඩුකම් සපුරා ගැනීම සඳහා මහජන සහභාගිත්වය ලබා ගැනීමේ දී ද එවැනි බිම් මට්ටමේ මෙහෙවර එළඹුම් වඩා සාර්ථක ය.

මේ අනුව අභ්‍යාසයක් වසයෙන් සලකමින් තිරසාර සංවර්ධන

270 https://www.vinnova.se/en/news/2021/03/the-street-as-a-meeting-place-instead-of-a-parking-lot/ - Retrieved on 25 July 2021

ඉලක්ක බිම් මට්ටමේ දී ගම, වීදිය කුඹුරු යාය ආදී ඒකක අනුව ආදේශ කර ගත හැකි ආකාරයේ මෙහෙවර එළඹුම් සහ අදාළ ඉලක්ක සාමූහික ව පරිකල්පනය කිරීම සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හොඳ අභ්‍යාසයකි.

මහජන සහභාගිත්වය සම්බන්ධයෙන් මතක තබා ගත යුතු වැදගත් කාරණයක් වන්නේ ඒ තුළ මහජනතාවගේ කෘත්‍රිම එකමුතුකමක් හෝ අවිරෝධයක් බලාපොරොත්තු නො විය යුතු බව ය. මිනිසුන්ගේ ජීවිත වෙනස් කළ බොහෝ දේවල් විරෝධයකින් තොර ව පැමිණි ඒවා නො වේ. එහෙත් විරෝධතාවලට හේතුවන සැබෑ කරුණු මොනවා දැයි දැන ගැනීමට හැකි වෙන පරිදි විවෘත සාකච්ඡාවලට ඉඩ සැලසීම අතිශයින් වැදගත් ය. දේශගුණ විපර්යාසයට තුඩු දෙන හේතු ගැන අනතුරු ඇඟවූ කණ්ඩායම්වලට එරෙහි ව කොතරම් විරෝධයක් පැවතී දැ'යි අපි දනිමු. අප ජීවත් වන පරිසරය පිළිබඳ හදිසි තත්වයක් ලෙස සලකා බලශක්ති හා පරිවහන ක්ෂේත්‍රවල තීරණාත්මක පරිවර්තනයක් කිරීමට බිහි වුණ බලපෑම් කණ්ඩායම් තම ප්‍රයත්නවලට එරෙහි මතවාද සාක්ෂි මත නිශ්ප්‍රභ කිරීමට ආණ්ඩුව සහ ව්‍යාපාර සාර්ථක ව පොලඹවා ඇති අන්දම අපි අත්දැක ඇත්තෙමු. ඒ නිසා සියලු පරදු දරන්නන්ගේ සාධාරණ අදහස් උදහස් සලකා බැලීම පමණක් නො ව එසේ සලකා බලන බව පෙනී යෑම ද මෙහෙවර ආර්ථික එළඹුමකට ඉතා වැදගත් ය.

# 5. විෂමතා අවම කිරීම

# - 25 -

## අසමානතාව ආමන්ත්‍රණය කිරීම

නොටින්ග්හැම් සහ යෝර්ක් යන විශ්වවිද්‍යාලවල වසංගතවේදය පිළිබඳ මහාචාර්යවරුන් ලෙස කටයුතු කරන රිචඩ් විල්කින්සන් සහ කේට් පිකට් විසින් රටවල් කිහිපයකින් එකතු කළ දත්ත වලින් තහවුරු වන අන්දමට අද ඇති සමාජ ප්‍රශ්න බොහෝමයකට ම මුල උග්‍ර වන සමාජ අසමානතාවයි. පුද්ගලයන්ගේ සෞඛ්‍යය තත්වයට, අන්‍යෝන්‍ය විශ්වාසයට, ප්‍රචණ්ඩත්වයට මෙන් ම ගෝලීය දේශගුණ විපර්යාසයට ද ආදායම් විෂමතා ප්‍රමුඛ සමාජ තුළ පවතින අසමානතාව හේතුවන බව විල්කින්සන් සහ පිකට් පෙන්වා දී තිබේ. සමාජ ප්‍රශ්න වලට මුල අසමානතාව බව නිසි ලෙස තේරුම් ගැනීමට තවමත් හැකි නො වී ඇති බැවින් අසමානතාව ආමන්ත්‍රණය කිරීමට ප්‍රමාණවත් තරම් අවධානයක් අප යොමු කර නැති බව ද ඔවුහු පෙන්වා දෙති. ඔවුන් අදහස් කරන පරිදි රෝග ලක්ෂණ ගැන පමණක් කල්පනා කරන වෛද්‍යවරයෙකු මෙන් අපි ද රෝග කාරකය ගැන අවධානය යොමු කර නැත. ඊට උදාහරණයක් වශයෙන් වැඩිවන සමාජ ප්‍රචණ්ඩත්වය ට පිළිතුරක් ලෙස වැඩි වැඩියෙන් සිරගෙවල් තැනීමට කටයුතු කිරීම තරම් තවත් මුලාවක් නො මැති බව ඔවුහු පෙන්වා දෙති. මන්ද ප්‍රචණ්ඩත්වයට හේතුවන සමාජ අසමානතා ආමන්ත්‍රණය කිරීමකින් තොරව හිර ගෙවල් ඉදි කිරීමෙන් ප්‍රචණ්ඩත්වය මර්දනය කළ නො හැකි ය. රෝග ලක්ෂණ වලට වඩා රෝග නිදානය ගැන වැඩි අවධානයක් යොමු කරන වෛද්‍යවරයෙකු මෙන් අප කටයුතු කළ

යුතු බව විල්කින්සන් සහ පිකට් පවසයි. අසමානතාව නිසා ඇති විය හැකි බලපෑම් සම්බන්ධ කරන ලද පර්යේෂණ හා සමීක්ෂණ රැසකින් හෙළිදරව් වන වැදගත් නිගමන කිහිපයක් අදාළ මූලාශ්‍ර සමඟ විල්කින්සන් සහ පිකට් 2020 දී පළ කළ ඔයැ *Inner Level* නම් කෘතියේ ඇති වගු කිහිපයක අඩංගු කර තිබේ.[271] එම පර්යේෂණවලින් හෙළි වන නිගමන කිහිපයක් පහත දක්වමු:

- සමාජ අසමානතාව වැඩි රටවල සෞඛ්‍ය ප්‍රශ්න සහ සමාජ ප්‍රශ්න ද වැඩි ය.
- සමාජ අසමානතාව වැඩි රටවල මරණ අනුපාතය ද ඉහළ ය.
- සමාජ අසමානතාව වැඩි රටවල හැම මට්ටමක ඇති කලකිරීම ද වැඩි ය.
- අසමානතාව වැඩි පොහොසත් රටවල මානසික ආබාධවල පැතිරීම වැඩි ය.
- ආදායම් විෂමතාව සහ භින්නෝන්මාදය අතර සහ-සම්බන්ධයක් තිබේ.
- අසමානතාව අඩු රටවල් හා සසඳන විට අසමානතා වැඩි යුරෝපීය රටවල සමාජ සහභාගිත්වය අඩු ය.
- අයහපත් සෞඛ්‍ය පහසුකම් ඇති ඇමෙරිකානු කෝරලවල ඩොනල්ඩ් ට්‍රම්ප්ට පක්ෂව ඡන්දය භාවිතා කළ සංඛ්‍යාව වැඩි ය.
- ඇමෙරිකානු විශ්ව විද්‍යාල සිසුන්ගේ ආත්මරාගී *(narcissistic)* හැසිරීම ඇමරිකා එක්සත් ජනපදයේ ආදායම් විෂමතාව වැඩි වීමත් සමඟ ඉහළ ගොස් තිබේ.
- දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට වෙළඳ ප්‍රචාර සඳහා වැය කරන මුදල ආදායම් විෂමතාව වැඩි වීමත් සමඟ වැඩි වෙයි.
- ආදායම් විෂමතාව වැඩි පොහොසත් රටවල ළමයින්ගේ සුභසාධනය දුර්වල ය.

271 Wilkinson. R and Pickett. K (2020) The Inner Level, New York: Penguine, p 3

- ආදායම් විෂමතාව වැඩි වීමට සාපේක්ෂව කුටුම්බ වල ණය ප්‍රමාණය ද වැඩි වෙයි.
- අසමානතාව වැඩි රටවල පාසල් දරුවන් අතර ඇති පරපීඩනකාමිත්වය වැඩි ය.
- ආදායම් විෂමතාව වැඩි වීම වැඩිහිටියන්ගේ අඩු අධ්‍යාපන සුදුසුකම් වලින් නිරූපණය වෙයි.
- වැඩි සමානාත්මතාවක් ඇති රටවල සිසුන් අතර ගණිත හා සාහිත්‍ය පිළිබඳ ඇති දැනුම වැඩි ය.
- ආදායම් විෂමතා වැඩි රටවල සමාජ සචලතාවට *(social mobility)* ඇති ඉඩ කඩ අඩු ය.
- වැඩි සමානාත්මතාවක් ඇති රටවල කෞතුකාගාර සහ කලාභවන පරිහරණයට පෙලඹෙන ප්‍රමාණය වැඩි ය.
- අසමානතා වැඩි රටවල අඩු වයසින් අපරාධ කිරීමට පෙලඹෙන ප්‍රමාණය වැඩි ය.
- සමානාත්මතාව වැඩි රටවල ව්‍යාපාරිකයෝ පරිසර සංරක්ෂණය පිළිබඳ අන්තර් ජාතික ගිවිසුම් ගැන වැඩි අවධානයක් යොමු කරති.
- අසමානතාව වැඩි රටවල වෘත්තීය සමිති ව්‍යාපාරය ද දුර්වල ය.

අන් අය අප දෙස බලන ආකාරය සහ අපේ ම සමාජ තත්වය පිළිබඳ අප තුළ ඇති අසහනකාරී කුහුල වඩා තීව්‍ර වීමට ආදායම් විෂමතා වැඩි වීම හේතු වෙතැ'යි යන උපකල්පනය පරීක්ෂා කිරීම සඳහා 2007 දී රිචර්ඩ් ලේට් සහ ක්‍රිස්ටෝපර් වෙලන් යන සමාජ විද්‍යාඥයන් දෙපොළ යුරෝපා සංගමයට අයත් රටවල් 27 ක වැඩිහිටියන් 35,634 දෙනෙකුගේ ප්‍රතිචාර විමර්ශනයට ලක් කර බැලීය.[272] මේ පර්යේෂණයේ දී "මගේ රැකියාවේ තත්වය හෝ ආදායමේ ප්‍රමාණය හෝ නිසා ඇතමුන් මට පහත් කොට සලක යි" යන ප්‍රකාශය සම්බන්ධයෙන් කොතෙක් දුරට ඔබ එකඟ වන්නේ ද නැද්ද යන්න පර්යේෂණයට ලක් වූ සියල්ලන්ගෙන් ම විමසන ලදි.

272 Layt, R. and Whelan, C., (2014) Who feels inferior? 'A test of the anxiety hypothesis of social inequalities in health', European Sociological Review 2014; 30: 525-35

හැම සමාජයක ම සාමාජිකයින් අඩු වැඩි වසයෙන් සිය සමාජ තත්වය සහ අන්‍යයන් තමන් දෙස බලන ආකාරය ගැන සැලකිලිමත් වන බැවින් එම ප්‍රශ්නයට ලැබෙන පිළිතුර ආදායම් විෂමතා සහ හීනමානය අතර ඇති සම්බන්ධතාව මැනීමේ හොඳ මිම්මක් ලෙස සැලකුණි. එම ප්‍රකාශය හා තදින් හෝ සාමාන්‍යයෙන් එකඟ වන අයගේ ප්‍රතිශතය රටකින් රටකට වෙනස් වූ නමුත් ආදායම අඩු වීමත් සමඟ හීනමානීය කුහුල වැඩි වීම ඒ හැම රටක ම පොදු ලක්ෂණයක් විය. පොදුවේ ගත් විට වැඩි සමාජ සමානාත්මතාවක් ඇති ඩෙන්මාර්ක්, නෝර්වේ, ස්වීඩන්, ස්ලෝවේනියා සහ චෙක් වැනි රටවල වැඩි දෙනෙක් සිය සමාජ තත්වය ගැන ඒ තරම් කරදර වූ බවක් නො පෙනුණි. එහෙත් ආදායම් විෂමතාවල කැපී පෙනෙන වැඩවීමක් තිබූ පෝලන්තය, රුමේනියාව, ලිතුවේනියාව, ලැට්වියාව, පෘතුගාලය සහ මැසිඩෝනියාව වැනි රටවල හැම ආදායම් මට්ටමකට ම අයත් අය අතර අසහනකාරී කුහුල බහුල ව පැවතුණි. සමාජ විෂමතා වැඩි වීම තමන්ගේ තත්වය සහ අන් අය විසින් තමන් දෙස බලන ආකාරය පිළිබඳව හැම දෙනෙකු ම අධික ව සංවේදී කරවන සාධකයක් බව ලේට් සහ වෙලන් පවසයි.

ආදායම් විෂමතාව අර්ථ දැක්වීම ගැටලුවක් නො වූව ද සමාජයක සියල්ලන් එක සමාන නොවන නිසා සමානාත්මතාව යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ඇති අර්ථකතනවල වෙනස්කම් තිබිය හැකි ය. 1979 මැයි 22 දා ස්ටැන්ෆර්ඩ් සරසවියේ පැවති ටැනර් දේශනයේ මාතෘකාව වූයේ 'සමානාත්මතාව යනු කුමකින් සමාන වීමක් ගැන ද?' හෙවත් *equality of what?* යන්නයි. දේශකයා එවකට ඔක්ස්ෆර්ඩ් සරසවියේ දේශපාලන ආර්ථිකය පිළිබඳ මහාචාර්යවරයා වූ අමාර්ත්‍ය සෙන් ය. සුභසාධන ආර්ථිකය තේරුම් කිරීමට කළ මෙහෙය නිසා 1998 දී ඔහුට නොබෙල් ත්‍යාගය ද හිමි විය. ටැනර් දේශනයේ මාතෘකාව මඟින් ම සමානාත්මතාවය සම්බන්ධයෙන් අමාත්‍ය සෙන් මතු කළ ඒ වැදගත් ප්‍රශ්නය, 'සමානාත්මතාව යනු කුමකින් සමාන වීමක්

ගැන ද ?' යන්න ඉන් පෙර ඒ අන්දමින් විමසීමකට භාජනය වී නොතිබිණි. උදාහරණයක් ලෙස ප්‍රකට *A Theory of Justice* කෘතියේ කර්තෘ ජෝන් රෝල්ස් සමානාත්මතාව දුටුවේ නිදහස අතින් ඇති සමානාත්මතාවය සහ ඔහු විසින් මූලික භාණ්ඩ *(primary goods)* යැයි දාර්ශනික ව හැඳින් වූ අයිතිවාසිකම්, ආදායම, ධනය සහ අවස්ථා වැනි දෑ අතින් ඇති සමානාත්මතාවයි. ඇමෙරිකානු නීති විශාරදයෙකු වන රොනල්ඩ් ඩ්වෝර්කින් සමානාත්මතාව විග්‍රහ කළේ හැම පුද්ගලයෙක් ම එක හා සමාන සැලැකුම්වලට ලක් වීමක් ලෙසයි. නිව්යෝක් සරසවියේ දර්ශන වාදය පිළිබඳ මහාචාර්ය තෝමස් නේජල් ඇතුළු බොහෝ අය සමානාත්මතාවය ලෙස දුටුවේ මූලික වශයෙන් ම ආර්ථික සමානාත්මතාව යි. එහෙත් සිය *Inequality Reexamined* කෘතියේ අමාර්ත්‍ය සෙන් පෙන්වා දෙන අන්දමට මේ සියලු විචාරකයෝ සමානාත්මතාවය විස්තර කළේ 'සමානාත්මතාවය යනු කෙබඳු ආකාරයකින් සමාන වීමක් ද?' යන වැදගත් පැනය විමසීමකින් තොර ව යි.

අසමානාත්මතාවය *(inequality)* නිශ්චය කිරීම නොයෙකුත් ආකාරවලින් කළ හැකි දෙයක් බව පළ කළ සෙන් එනිසා සුවිශේෂ වූ අසමානතා වෙන් වෙන් ව විමර්ශනය කිරීම වඩා වැදගත් බව පෙන්වා දුන්නේ ය. සෙන් පවසන අන්දමට අසමානකම් තක්සේරු කිරීමේ දී මනුෂ්‍ය වර්ගය තුළ පෘතුලව පැතිර ඇති විවිධාකාර වෙනස්කම් අනිවාර්යයෙන් ම සැලකිය යුතුය. එනිසා හුදෙක් එක සම්පතකින් අසමාන වීමක් ගැන පමණක් වැඩි අවධානය යොමු කිරීම වැරදි ය. සමානාත්මතාව නිර්ණය කිරීමේ දී මිනිසුන් අතර ඇති මේ විවිධත්වය සැලැකීම විශේෂයෙන් වැදගත් වන්නේ මන්දැ'යි සෙන් මෙසේ විස්තර කරයිඃ

> "මනුෂ්‍යවර්ගයා අතිශයින් විවිධ ය. බාහිර ලක්ෂණවලින් පමණක් නො ව පුද්ගලික චරිත ලක්ෂණවලින් ද අප එකිනෙකා ගෙන් බෙහෙවින් වෙනස් ය. මෙම විචිත්‍ර විවිධත්වය ගැන අප තුළ තිබිය යුතු අවධානය මිනිසාගේ සමානත්වය පිළිබඳ ප්‍රබල වාගාලාපය මඟින් පසකට දමා තිබේ. . 'සියලු මිනිස්සු සමානයන් ලෙස උපන්හ' වැනි

වාගාලාප සමානාත්මතාවාදයේ ම නිසර්ග ලක්ෂණයක් ලෙස සැලකුව ද පුද්ගලයන් අතර ඇති සැබෑ වෙනස්කම් නො සලකා හැරීම ඇත්ත වසයෙන් ම තදබල අසමානතාවලට හේතු විය හැකිය. මන්ද සියල්ලන්ට ම සමානයන් ලෙස සැලකීමේ ඉල්ලීම සැම විටම වරප්‍රසාද නො ලත් අයට අසමාන ලෙස සැලැකීමක් ද වන බැවිනි."[273]

සෙන් අදහස් කරන අන්දමට සමානාත්මතාව සම්බන්ධයෙන් කතා කිරීමේ දී සම්පත් ගැන ම අවධානය යොමු කිරීම අසමානතාවල බහුවිධත්වය නො තකා හැරීමකි. අප සියල්ලෝ ම ඉපදුණේ සමානයන් ලෙස ම නොවේ. ශරීරයේ ස්වරූපයෙන් සමාන වුවද අප අනෙක් නොයෙක් අතින් අසමාන ය. අනෙක් අතට එකම සම්පතක් ගැන අවධානය යොමු කරන විට එම සම්පතින් වැඩක් ගැනීමේ ශක්‍යතාව කෙනෙකුට නැත්නම් එවැනි අවධානයකින් එතරම් වැඩක් නොවේ. මිනිසුන් අතර පවතින මේ විවිධත්වය නිසා ඔවුන්ගේ යහපැවැත්මට හේතු විය හැකි විවිධාකාර දේවල් තිබිය හැකිය. නොහොත් හැම කෙනෙකුට ම හැම විටම එක සමාන සම්පතක් ලබා දීමෙන් එතරම් පලක් නැති විය හැකිය. ඒ නිසා සමානාත්මතාවය ගැන කතා කරන හැම විට දී ම අපි 'සමානාත්මතාව යනු කුමකින් සමාන වීමක් ගැන ද ? යන්න විමසිය යුතු ම ය. සෙන් පෙන්වාදෙන අන්දමට අප සියල්ලෝ ම එක හා සමාන නො වන බැවින් සමානාත්මතාවය ඇගයීමට ලක් කිරීම විවිධාකාරයෙන් කළ හැකිය.

ඒ නිසා සමානාත්මතාවය යන්න තක්සේරු කළ යුත්තේ කෙනෙකුට ඇති නිදහස සහ කෙනෙකුගේ 'ශක්‍යතා' *(Capabilities)* යනුවෙන් සෙන් හඳුන්වන හැකියා අනුව ය. නිදහස පිළිබඳ සෙන්ගේ අර්ථකතනය ශක්‍යතා එළඹුමට ඔහු කළ දායකත්වයේ පදනම වෙයි. ශක්‍යතා එළඹුමට අනුව නිදහස යනුවෙන් හැඳින්වෙන්නේ පුද්ගලයෙකු විසින් කළ යුතු හෝ පුද්ගලයෙකු සතු කිසියම් කටයුත්තක් කිරීමට ඉඩ ලැබීම පමණක් නො ව එම කටයුත්ත කිරීමට එම පුද්ගලයා සතු හැකියාව *(ability)* ද එම නිදහසේ ම අත්‍යවශ්‍ය කොටසක් ලෙස සැලකීම යි. ශක්‍යතාව නැත්නම් නිදහස ද නැත.

273 Amartya Sen(1992), Inequality Reexamined, New York: Oxford University Press, p.1

සමානාත්මතාවය අවබෝධ කර ගැනීමේ මාර්ගයක් ලෙස අමාත්‍ය සෙන් හඳුන්වා දුන් ශක්‍යතාව මුල් තැන් හි ලා සැලකීම හැඳින්වෙන්නේ ශක්‍යතා එළඹුම *(capability approach)* යනුවෙනි. සමාජ වැඩපිළිවෙළවල්වල සාර්ථකත්වය මැනීමේ දී හුදෙක් ආර්ථික වර්ධනය පමණක් නො ව හැකි සියලු දෘෂ්ටිකෝණවලින් සංවර්ධනය මැනීමට ශක්‍යතා එළඹුම යොදා ගත හැකිය. ශක්‍යතා ගණන් ගැනීම මඟින් කෙනෙකුගේ මූලික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමේ හැකියාව පමණක් නො ව ජීවිතය පිළිබඳ ඇති සතුට, සබලගැන්වීම හෙවත් බලායනය වීම *( empowerment)* සහ කාරකත්වය *(agency)* වැනි මූලික කුසලතා පිළිබඳ ව අත්පත් කර ගෙන ඇති සාධන මට්ටම් ද මැනිය හැකිය. කාරකත්වය යනුවෙන් මෙහි දී හැඳින්වෙන්නේ ස්වායත්ත ව කටයුතු කරමින් තමන්ගේ ම වූ තීරණ ගැනීමට හෝ තේරීම් කිරීමට හෝ පුද්ගලයෙකු සතු ධාරිතාවයි.

ඒ අතර අසමානතාව යන්න තාක්ෂණික හෝ ආර්ථික හෝ ප්‍රපංචයක් නො ව දෘෂ්ටිවාදී හා දේශපාලනික නිර්මිතයක් බව නව පරපුරේ ආර්ථික විද්‍යාඥයෙකු වන තෝමස් පිකෙටි පෙන්වා දෙයි.[274] එසේ නො වන්නට වෙළෙඳපොළ සහ තරගකාරිත්වය, ලාභය සහ වැටුප, ප්‍රාග්ධනය සහ ණය, පුහුණු හා නුපුහුණු සේවකයන්, ස්වදේශිකයන් සහ විදේශිකයන්, බදු රහිත ක්ෂේමස්ථාන *(tax havens)* හෙවත් අක් වෙරළ ගිණුම් සහ තරගකාරී සේවා යන මේ කිසිවක් නො තිබෙනු ඇත. ඒ හැම දෙයක් ම ඇත්ත වසයෙන් ම සමාජීය හා ඓතිහාසික නිර්මිතයන්ය.

පොදුවේ ගත් විට සමාජය පිළිබඳ ඕනෑ ම දෘෂ්ටිවාදයකට සමාජීය, ආර්ථික සහ දේශපාලනික මාන අයත් වේ. දෘෂ්ටිවාදයක් මඟින් තැත් කරන්නේ සමාජය වඩා යහපත් යැයි සිතන ආකාරයට පරිවර්තනය කිරීමේ දී පැන නගින ප්‍රශ්න සමුදායකට උත්තර බැඳීම යි. මේ ප්‍රශ්න කොතරම් සංකීර්ණ විය හැකිදැ'යි කිව හොත් කිසිදු

274 Piketty, T. (2020), Capital and Ideology, New York: The Belknap Press of Harvard University Press, pp. 20-21 KE

දෘෂ්ටිවාදයකට ඒවාට පරිපූර්ණ ලෙස පිළිතුරු සැපයීම අසීරු විය හැකි ය. දෘෂ්ටිවාදය යන යෙදුම තුළ ම දෘෂ්ටිවාදී ගැටුම් සහ එකඟ නො වීම් පිළිබඳ ගැටලු ද ගැබ් වේ. එහෙත් හැම සමාජයකට ම එම සමාජය සංවිධානය විය යුත්තේ කෙසේ ද යන්න ගැන පිළිතුරු සොයා ගැනීමට සිදුවේ. බොහෝ විට ඒ සඳහා එම සමාජයේ ම ඉතිහාසය මෙන් ම අන්‍ය සමාජවලින් උකහා ගත හැකි අත්දැකීම් ද ප්‍රයෝජනවත් විය හැකි ය. ඉදින් මෙහි දී සැලකිය යුතු මූලික ගැටලු මොනවාද ? මේ ප්‍රශ්නය තෝමස් පිකෙටි සිය *Capital and Ideology (*2020*)* කෘතියේ සවිස්තරාත්මක ව සාකච්ඡාවට ලක් කරයි.

පිකෙටි පෙන්වා දෙන අන්දමට මෙහි දී එක් වැදගත් ප්‍රශ්නයක් වන්නේ දේශපාලන තන්ත්‍රයේ ස්වභාවය කුමක් විය යුතු ද යන්නයි. දේශපාලන තන්ත්‍රය යනුවෙන් මෙහි දී අදහස් කළේ ප්‍රජාව සහ එම ප්‍රජාව වෙසෙන වාසභූමියේ සීමා නිර්ණය කරන, සාමූහික තීරණ ගැනීම් ක්‍රමවේදය පහදන, ප්‍රජා සාමාජිකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් විස්තර කරන නීතිරීති පද්ධතියට යි. මෙකී නීතිරීති දේශපාලනයේ දී සහභාගිත්වය තහවුරු කර ගන්නේ කෙසේ ද යන්න විස්තර කරමින් පුරවැසියන්ගේ, විදේශිකයන්ගේ මෙන් ම විධායකයේ, ව්‍යවස්ථාදායකයේ, මැති ඇමතිවරුන්ගේ, රජුන්ගේ, අධිරාජ්‍යවල සහ යටත් විජිතවල අදාළ භූමිකා විස්තර කරයි.[275]

පිකෙටි හුවා දක්වන අනිත් වැදගත් කාරණය දේපොළ තන්ත්‍රය සම්බන්ධ විධි විධානයි. එමඟින් අදහස් කරන්නේ සමාජයේ විවිධ කණ්ඩායම් අතර දේපොළ නියාමනය කරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික නීති, විධිවිධාන සහ තිබිය හැකි විවිධාකාර දේපොළ හිමිකාරකම් පිළිබඳ විස්තරයකි. එවැනි නීති පුද්ගලික හා පොදු දේපළවලට ද, මූල්‍ය සම්පත්, ඉඩම් සහ ඛනිජ සම්පත් සහ වහලුන් සහ බුද්ධිමය දේපළ වැනි අනෙකුත් ද්‍රව්‍ය නො වන දේපළ සම්බන්ධයෙන් සැලකිය යුත්තේ කෙසේ ද යන්න ද විස්තර කළ යුතු ය. පූර්ව නූතන යුගයේ

---

275 Piketty, T. (2020), Capital and Ideology, New York: The Belknap Press of Harvard University Press, pp. 16-17, KE

දී ඉඩම් හිමියන් සහ ප්‍රවේණිදාසයන් හෝ වහලුන් අතර ඇති සම්බන්ධතා ද එවැනි නීති මගින් තීරණය විය යුතු විය.

දේශපාලන තන්ත්‍රය පිළිබඳ ගැටලුව අනිවාර්යයෙන් ම එකී දේශපාලන තන්ත්‍රය බලපවත්වන දේශ සීමාව, ප්‍රදේශය කුමක් ද යන්න නිර්ණය කළ යුතු ය. එමෙන් ම සෑම ප්‍රජා සමූහයක් ම සම්බන්ධයෙන් එයට අයත් වන අය කවුද අයත් නො වන අය කවුරුන් ද යන්න විස්තර කළ යුතු ය. මෙහි දී අදාළ භූමිය තුළ කිනම් ආයතන විසින් කිනම් භූමි ප්‍රදේශයක් පාලනය කරයි ද? ඒවා සංවිධානය වන්නේ කෙසේ ද? සමස්ත ලෝක ප්‍රජාව තුළ අනෙකුත් ප්‍රජාවන් සමඟ සම්බන්ධතා පවත්වා ගත යුත්තේ කෙසේ ද වැනි ප්‍රශ්න එහි දී දේශපාලන තන්ත්‍රය සම්බන්ධයෙන් ඇති එකිනෙකට බැඳුණු ගැටලු වසයෙන් සැලකේ.

දේපොළ පිළිබඳ ප්‍රශ්නය ද එවැනි ය. කෙනෙකුට අයිතිකර ගත හැක්කේ මොනවාද කෙනෙකුට තවත් අය අයිති කර ගත හැකි ද යමෙකුට ස්වාභාවික සම්පත්, ඉඩම්, ගොඩනැගිලි, සමාගම්, දැනුම, මූල්‍ය සම්පත් ආදිය අයිති කර ගත හැකි ද දේපළ අයිති අය සහ අයිති නැති අය අතර ඇතිවෙන ගනුදෙනු නියාමනය කරන්නේ කවුරුන් ද පරම්පරාවෙන් පරම්පරාවට දේපළ අයිතිය පැවරෙන්නේ කෙසේ ද වැනි ප්‍රශ්න ඒ අතර වෙයි. අධ්‍යාපනික තන්ත්‍රය සහ මූල්‍යමය තන්ත්‍රය සමඟ දේපොළ තන්ත්‍රය ද එසේ සමාජ අසමානතාව පරිණාමය වන ආකාරය තීරණය කරයි.

බොහෝ පූර්ව නූතන සමාජවල දේශපාලන තන්ත්‍රය සහ දේපොළ තන්ත්‍රය අතර ඉතා ළඟ සම්බන්ධතාවක් තිබුණි. එකල වහලුන් ද දේපළ වසයෙන් සැලකුණි. වෙනත් අයුරකින් කිව හොත් එහි දී පුද්ගලයන් කෙරෙහි බල පවත්වන බලය දේවල් කෙරෙහි බලපවත්වන බලයෙන් නිදහස් වූවක් නො වීය.

පුළුල් ලෙස සලකා බැලූ විට අසමානතාව අඩු කිරීම සඳහා ක්‍රියාත්මක කළ සර්ව ජන ඡන්දය, නිදහස් අධ්‍යාපනය හා නිදහස්

සෞඛ්‍යය වැනි පියවර බෙහෙවින් සාර්ථක වී තිබේ. කොන්සර්වෙටිව් මතවාදීන් කුමක් පැවසුව ද අනාගතයේ දී ද එවැනි පියවර සමානතාව කරා යන ගමනට අතිශයින් වැදගත් ය.

වර්තමානයේ පවතින අසමානතාවට ප්‍රබල හේතුවක් වී ඇත්තේ දේශ සීමා සහිත ජාතික ස්වෛරීභාවය යි. සමාජීය හා දේශපාලන අයිතිවාසිකම් නිර්ණය කරනු ලබන්නේ එකී ජාතික රාජ්‍ය විසිනි. මේ නිසා ජාතික අනන්‍යතාවය, සංක්‍රමණිකයන් සහ ආගම් ආදි වසයෙන් අසමානතාව දිරි ගන්වන ජාතික රාජ්‍යයට ආවේණික ගැටලු නිරන්තර ව පවතී. ඒ නිසාම අසමානතාවට පිළිතුරු සැපයිය හැකි පුළුල් සහාගයක් ජාතික රාජ්‍ය මට්ටමින් ගොඩනගා ගැනීම අසීරු වී තිබේ. එහි ප්‍රතිඵලයක් වසයෙන් ධනවතුන්ට පැවති බලය වැඩි වී තිබෙන අතර අසමානතාව තවතවත් වැඩි වෙමින් යයි.

මේ තත්වයට එක් හේතුවක් වී ඇත්තේ යට කී භේදකාරී හේතු මත අවවරප්‍රසාදිත ජනතාව වෙන් කර තබා ගැනීමට හැකි වීම සහ ඒ වෙනුවට ඔවුන් එක්සත් කළ හැකි ප්‍රබල දෘෂ්ටිවාදයක් නැති වීමයි.

මෙහි දී අප අවධාරණය කළ යුත්තේ දේශපාලන තන්ත්‍රය සහ දේපළ තන්ත්‍රය යන දෙකම බොහෝ කලක සිට එකිනෙක හා ඉතා සමීප ළෙන්ගතුකමකින් ක්‍රියා කරන බවයි. පිකෙටි පෙන්වා දෙන අන්දමට මේ කල් පවතින ව්‍යුහාත්මක සම්බන්ධතාව දිගු කාලීන ඓතිහාසික පර්යාලෝකයකින් තොර ව හරියට ම විශ්ලේෂණය කළ නො හැකි ය.

අද රුසියාවේ, චීනයේ සහ කිසියම් දුරකට නැගෙනහිර යුරෝපයේ ද පශ්චාත් කොමියුනිස්ට්වාදී සමාජ අතිධනවාදයේ *(hyper capitalism)* උත්කර්ෂවත් සහායකයන් බවට පත් ව සිටී. පිකෙටි පවසන අන්දමට මෙය ස්ටැලින්වාදයේ සහ මාවෝවාදයේ පරාජයත් ඒ නිසා සමානාත්මතාවාදය පිළිබඳ එතෙක් පැවති ජාත්‍යන්තර බලාපොරොත්තු නැතිභංග වී යෑම නිසාත් ඇති වූ ඍජු ප්‍රතිඵලයකි. කොමියුනිස්ට්වාදයේ පරාජය කොතරම් දරුණු වී දැ'යි කිව හොත්

එය වහල් භාවය සහ යටත් විජිතවාදය ද අබිබවා අති-ධනවාදය සහ දේපළ අයිතිය අතර නො මැකෙන බන්ධනයක් ඇති කරලීමට සමත් විය. පිකෙටි පෙන්වා දෙන අන්දමට ඉතිහාසය තුළින් සය වැදෑරුම් දෘෂ්ටිවාදී දේශපාලන ප්‍රවණතා හඳුනා ගත හැකි ය. ඒවා නම් දේපළවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, යටත් විජිතවාදය, කොමියුනිස්ට්වාදය, ත්‍රෛක්‍රියාකාරිත්ව *(trifunctional)* සමාජය සහ වහල් සමාජය යන දෘෂ්ටිවාදයි. මේ හැම දෘෂ්ටිවාදයක් ම සමාජ සාධාරණත්වය ගැන ද කතා කරයි.[276]

ත්‍රෛක්‍රියාකාරීත්ව *(trifunctional)* සමාජය යනුවෙන් පිකෙටි මෙහි දී හඳුන්වන්නේ ආගමික පූජක පංතිය, වංශවතුන් සහ යුධාධිපතියන් අයත් පංතිය, පොදු මහජනතාව සහ වැඩ කරන අය අයත් පංතිය යනුවෙන් එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් ඉටු කරන ස්තර තුනකින් සමන්විත ව මධ්‍ය කාලීන යුගයේ පැවතුණ සමාජය යි.

පිකෙටි පෙන්වා දෙන අන්දමට හැම මානව සමාජයකට ම එම සමාජය තුළ ඇති අසමානතාව සාධාරණීකරණය කිරීමට අවශ්‍ය විය. ඒ සඳහා හේතු සොයා දිය නො හැකි නම් සමස්ත දේශපාලන හා සමාජමය මන්දිරය කඩා වැටීමේ අනතුරට මුහුණ දිය යුතු විය. එනිසා හැම යුගයක දී ම එම යුගය තුළ පැවති හෝ පැවතිය යුතුයැ'යි මිනිසුන් විසින් විශ්වාස කළ අසමානතා සුජාත කිරීමේ අරමුණ මුඛ්‍ය කරගත් පරස්පර කතිකා සහ දෘෂ්ටිවාද වර්ධනය විය. මෙම කතිකා තුළින් කිසියම් ආකාරයක ආර්ථික, සාමාජික හා දේශපාලනික නියාමයන් උද්ගත වූ අතර සමාජ ව්‍යුහයේ ධුරාවලි ස්වභාවය පවත්වා ගැනීමට ඒවා ඉවහල් විය. පරස්පර ආර්ථික, සාමාජික හා දේශපාලනික කතිකා අතර ඇතිවූ ගැටුම තුළින් අධිපති කතිකාව හෝ කතිකා ඉස්මතු වී ඒ අනුව අසමානතාවල පැවැත්ම වැඩිදුරටත් ශක්තිමත් කර ලීය.

276 Piketty, T. (2020), Capital and Ideology, New York: The Belknap Press of Harvard University Press, p. 23 KE

ඓතිහාසික ව ගත් කල්හි සියලු සමාජ සංවිධානය වී ඇත්තේ සමාජ සම්බන්ධතා, දේශ සීමා සහ දේපළ අයිතීන්, සංකීර්ණ ආයතනික විධි විධාන මඟින් සමාජය නියාමනය කිරීම සඳහා වර්ධනය කරගත් කිසියම් දෘෂ්ටිවාදයක් වටායි.

අසමානතාව යුක්ති සහගත කිරීම සඳහා නූතන සමාජවල යොදා ගන්නා බොහෝ ආඛ්‍යාන දේපළ අයිතිය, ව්‍යවසායකත්වය, කුසලතාවාදය *(meritocracy)* යන තේමාවලට අයත් ය. කුසලතාවාදය යනුවෙන් හඳුන්වන්නේ කෙනෙකු සතු ආර්ථික හා දේශපාලන බලය තීරණය විය යුත්තේ එම පුද්ගලයාට උපතින් උරුම වූ වත්කම් හෝ සමාජ පංතිය මත හෝ නොව හුදෙක් එම පුද්ගලයා සතු ප්‍රතිභාව, සමත්කම් සහ ජයග්‍රහණ මත ය යන අදහස යි. ඉහත කී ආඛ්‍යානවලට අනුව වෙළඳපොළ සහ දේපළ යන දෙකම අත්පත් කර ගැනීම මුළුමනින් ම කාර්යසූර මිනිසුන් විසින් කරනු ලබන නිදහස් තෝරා ගැනීම් මත සිදු වන දේවල් බවත් ව්‍යවසායක ප්‍රතිභාව නිසා පිදිය යුත්තන් බවට පත් ව ඇති පොහොසතුන් විසින් රැස් කර ගන්නා ධනය නිසා ස්වයංක්‍රීය ව සමාජයට යහපතක් සිදු වන බවත් පැවසේ. ඒ නිසා නූතන අසමානතාව පූර්ව නූතන යුගයේ පැවති අනම්‍ය, අත්තනෝමතික, සහ බොහෝ විට ආඥාදායක වූ අසමානතාවට වඩා හාත්පසින් ම වෙනස් බව ද කියනු ලැබේ.

එහෙත් සෝවියට් කොමියුනිස්ට්වාදයේ කඩා වැටීම සහ අතිධනවාදයේ *(hyper-capitalism)* නැඟී සිටීම සමඟ උද්ගත වූ මේ දේපළවාදී සහ කුසලතාවාදී ආඛ්‍යානයේ ඇති වැරැද්ද නම් එය එන්න එන්න ම අවලංගු වෙමින් තිබීම බව පිකෙටි පවසයි. එය තුළ ඇති නොයෙකුත් ප්‍රතිවිරෝධතා නිසා යුරෝපයේ, එක්සත් ජනපදයේ, ඉන්දියාවේ, බ්‍රසීලයේ, චීනයේ, දකුණු අප්‍රිකාවේ, වෙනිසියුලාවේ සහ මැදපෙරදිග එකිනෙකට වෙනස් විවිධාකාර ප්‍රතිවිරෝධ ඇති ව තිබේ. එහෙත් විසිඑක් වැනි සිය වස එළඹ දශක දෙකක් ගෙවී ගොස් ඇති මේ මොහොතේ දී එකී විවිධ ප්‍රක්ෂේපණ එම රටවල සුවිශේෂ ඉතිහාසයන් ද නො තකා එකිනෙක හා අන්තර් සම්බන්ධ වී ඇති බව

පැහැදිලිව පෙනෙයි. එනිසා අරකී අසමානතා ආඛ්‍යානවල දුර්වලකම් හඳුනා ගෙන සුදුසු විකල්ප ආඛ්‍යානයක් අපට ගොඩනගා ගැනීමට හැකි වන්නේ අසමානතාව පිළිබඳ පාරජාතික පර්යාලෝකයක් *(transnational perspective)* ගොඩනගා ගැනීමෙන් පමණක් බව ද පිකෙටි පවසයි.

එක් දහස් නවසිය අසූ ගණන්වල සිට සෝවියට් කොමියුනිස්ට් වාදයේ කඩා වැටීමෙන් උත්කර්ෂයට පත් කොන්සර්වෙටිව් විප්ලවය හා උද්ගත වූ නූතන දේපළවාදී දෘෂ්ටියේ වර්ධනය විසි එක්වැනි සියවසේ පළමු දශක දෙකේ දී ආදායම සහ ධනය සංකේන්ද්‍රණය කිරීම විශාල වසයෙන් වැඩි කළේ ය. ඒ අනුව ඇති වූ සමාජ ආතතිය ද ලොව පුරා වැඩි වී ගියේ ය. මේ සමාජ ආතතිය විසින් ම කාර්යසාධක සමානාත්මතාවක් බලාපොරොත්තුවෙන් ජාතික අනන්‍යතාව පිළිබඳ දේශපාලනය හෙවත් නව ජාතිකවාදය ප්‍රවර්ධනය කළේ ය. පවතින අසමානතා සමනය කිරීමට වෙනත් විකල්පයක් නොමැති බව පැවසූ විට ඒ වෙනුවට තම අනන්‍යතාවය හා දේශ සීමා තුළ රැකවරණය සොයා ගැනීමට මිනිසුන් උත්සුක වන බව අරුමයක් ද?

එහෙත් 1980 ගණන්වල සිට එන මේ අති අසමානතා ආඛ්‍යානය දෛවෝපගත සිදුවීමක් ම නො වේ. තරමක් දුරට එය ඉතිහාසයේ ප්‍රතිඵලයක් වසයෙන් සැලකිය හැකි වුව ද, තෝමස් පිකෙටි පෙන්වා දෙන පරිදි බොහෝ විට එයට හේතු වූයේ පුළුල් ලෙස දැනුම බෙදා දීමට අසමත් වීම, නොයෙකුත් ශික්ෂණ *(disciplines)* අතර දැඩි සීමා ඇති කර ගැනීම නිසා අන්තර් ශික්ෂණ පර්යාලෝකයක් *(interdisciplinary perspective)* බිහි කර ගැනීමට නො හැකි වීම සහ රට වැසියන් අතර ආර්ථික මූල්‍යමය කරුණු ගැන ප්‍රමාණවත් තරම් අවබෝධයක් නොමැති වීම යි. (බොහෝ විට එවැනි කරුණු අන්‍යයන්ගේ කාර්යය ලෙස සැලකෙයි.).

පිකෙටි පවසන අන්දමට ඉතිහාසය මැනවින් අධ්‍යයනය කරන විට තේරුම් යන එක දෙයක් නම් විසි එක් වෙනි සියවසට උචිත නව ආරක සහභාගිත්ව සමාජවාදයක් ඇති කර ගැනීම සඳහා

පවතින ධනේශ්වර ක්‍රමය අතික්‍රමණය කිරීම කළ හැකි දෙයක් බවයි. ඒ සඳහා අප සමාජීය අයිතිය, සැමට ගුණාත්මක අධ්‍යාපනය, දැනුම සහ බලය බෙදා ගැනීම මත පදනම් වූ නව ආරක ජාත්‍යන්තර සමානාත්මතාවක් කරා යා යුතු ය.

මේ අරමුණ ඉටු කර ගැනීමට නම් නව මාදිලියක සමාජීය අයිතියක් ප්‍රවර්ධනය කර ගත යුතු වන බව පිකෙටි පෙන්වා දෙයි. එම නව මාදිලියේ අයිතිය සදාකාලික පුද්ගලික අයිතිය වෙනුවට තාවකාලික පුද්ගලික අයිතිය ආරෝපණය කිරීම මත පදනම් වූවක් විය යුතුය. උදාහරණයක් ලෙස ඒ සඳහා සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලවල ඡන්දය දීම සහ තීරණ ගැනීමේ බලය නව ආරකට කළ හැකි ය. ඒ හැර විශාල වසයෙන් ධනය හා දේපොළ එක්රැස් වීම සිදු වන විට අනුක්‍රමයෙන් වැඩිවන බදු අය කිරීමක් මඟින් සියල්ලන්ට ම යහපත සැලසෙන ලෙස එම ධනය නැවත බෙදී යන වැඩ පිළිවෙළක් තිබිය යුතු ය. ඒ අනුව දේපළ සහ ධන සම්පත් අතලොස්සක් අත ඒකරාශී වීම වෙනුවට නිරන්තරයෙන් ම සංසරණය වීම සිදුවිය යුතු ය

ඒ හැර අනුක්‍රමයෙන් වැඩි වෙන ආදායම් බදු ක්‍රමයක්, සියල්ලන්ට ම සාර්වත්‍රික මූලික ආදායමක් *(Universal Basic Income)* සහතික කිරීමක් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ද එම වැඩපිළිවෙළට අයත් විය යුතු ය. අවසාන වසයෙන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුව සහ දේශ සීමා ද අන්තර්ජාතික ව ලෝක ආර්ථිකය යළි ප්‍රතිසංවිධානය කිරීම ද සිදුවිය යුතු වේ. එම ප්‍රතිසංවිධානය සමාජීය මූල්‍ය සහ පරිසර සාධාරණත්වය ඇති කර ගැනීම සඳහා යොදා ගන්නේ කෙසේ ද යන්න ද මෙහි දී අතිශයින් වැදගත් වෙයි.

මේ කරුණු සම්බන්ධයෙන් නිශ්චිත මොඩලයක් දැනට නැතත් එවැන්නක් ගොඩනගා ගැනීමේ සංකථනයක් දියත් කිරීම අත්‍යවශ්‍ය බව පිකටි පවසයි. වෙනත් කරුණු හැරෙන විට පිකෙටි පෙන්වා දෙන පරිදි එවැනි මොඩලයක් බිහිකරගැනීමේ දී සුවිශේෂයෙන් සලකා බැලිය යුතු කරුණු කිහිපයක් ගැන දැන් අපේ අවධානය යොමු කරමු.

## ධනවාදය අතික්‍රමණය කිරීම සහ පෞද්ගලික දේපළ

සාධාරණ අයිතිය යනු කුමක් ද? ධනවාදය ඉක්මවා යන ආකාරයේ සහභාගිත්ව සමාජවාදයක් ගොඩ නගා ගැනීමේ දී පිළිතුරු සොයා ගත යුතු වඩාත් ම සංකීර්ණ සහ කේන්ද්‍රීය ප්‍රශ්නය වන්නේ එයයි. දේපළවාදය *(properieteriasm)* යන්නෙන් අදහස් කරන්නේ ස්වාමිත්වකාමී පුද්ගලික දේපළ අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ දේශපාලන දෘෂ්ටිවාදය යි. ඇත්තටම ධනවාදය යනු විසල් කර්මාන්ත, ජාත්‍යන්තර මූල්‍ය කටයුතු, සහ වඩාත් මෑතක දී නම් ඩිජිටල් ආර්ථිකය දක්වා ව්‍යාප්ත වන එම දේපළවාදයේ ම දිගුවකි.

ධනවාදයේ ස්වභාවය ප්‍රාග්ධනය හිමිකරුවන් අතර ආර්ථික බලය සංකේන්ද්‍රණය වීම අරමුණ කර ගැනීම යි. පිළිගත් සම්ප්‍රදායට අනුව දේපොළ ප්‍රාග්ධනය හිමි කරුවන්ට තම දේපොළ කිනම් කුලියක් මත කවුරුන්ට කුලියට දෙන්නේ ද යන්න තීරණය කළ හැකි ය. ඒ හා සමාන ව මූල්‍ය සහ වෘත්තීය ප්‍රාග්ධනය හිමිකරුවන් බොහෝ විට සිය සමාගම් පාලනය කරන්නේ එක සමාගම් කොටසකට එක ඡන්දයක් යන කොටස් හිමි පදනම මත යි. ඒ අනුව අනෙකුත් අයිතීන්ට අතිරේක ව තමන් සේවයට යොදා ගන්නා අය සහ ඒ අයගේ වැටුප තීරණය කිරීමට ද සමාගමේ ප්‍රාග්ධන හිමිකරුවන්ට හැකියැ'යි පිළිගැනේ.

එහෙත් ප්‍රාග්ධන හිමියන්ගේ අයිතිය පිළිබඳ ඉහත කී නියත ස්වභාවය විවිධාකාර වෙනස් වීම්වලට බඳුන් වී තිබේ. පිකෙටි පෙන්වා දෙන පරිදි දහනමවැනි සියවසේ සිට නීතිමය හා සමාජමය වසයෙන් බදු ක්‍රමයේ ඇති වූ වෙනස් වීම් එයට බෙහෙවින් බලපා තිබේ. උදාහරණයක් වසයෙන් කුලියට දෙන දේපළ සම්බන්ධයෙන් ගත හොත් කුලියට ගත අය හදිසියේ ඉවත් කිරීම හෝ හිටි අඩියේ කුලිය වැඩි කිරීම හෝ වැළැක්වීමේ දිගුකාලීන සහතිකයක් කුලී පදිංචිකරුට දීමට අද දේපළ හිමිකරුට සිදුවී තිබේ. තමන් කිසියම් කලක් එම දේපළ කුලියට ගෙන තිබුණේ නම් පදිංචි ව සිටි කාලය අනුව වඩා පහසු මිලකට කුලීකරුවන්ට එකී දේපළ භුක්තියට හිමිකර

ගත හැකි වීම ද එවැනි ඇතැම් විධිවිධාන අතර තිබේ. මෙය එක්තරා ආකාරයකට සම්පත් නැවත බෙදා දීමේ ක්‍රමයක් හා සමානය.

ඒ හා සමාන ව සමාගම්වල කොටස් හිමියන් සතු බලය සම්බන්ධයෙන් ද කම්කරු නීති හා සමාජ නීති මඟින් සීමා පනවා තිබේ. ඇතැම් රටවල සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලවල කොටස් හිමියන්ගේ නියෝජිතයන් සමඟ එකට හිඳ ගෙන තීරණ ගැනීමේ බලය සේවක නියෝජිතයන්ට ද ලැබේ. හරියටම සිදු වන්නේ නම් එය දේපළ අයිතිය නියම වසයෙන් ම නැවත බෙදීමක් වැනිය.

1940ස් සහ 1950ස් ගණන්වල සිට ම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලවල ඡන්ද බලය සේව්‍යයන් හා සේවකයන් අතර බෙදා ගැනීමේ ක්‍රමවේදයක් ජර්මානු හා නෝර්ඩික් යුරෝපීය කලාපයේ රටවල පැවතුණු බව තෝමස් පිකෙටි පෙන්වා දෙයි. ජර්මන් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයේ ඡන්ද බලයෙන් හරි අඩක් හිමි වන්නේ සමාගමේ සේවකයින් විසින් පත් කරනු ලබන නියෝජිතයන්ට යි. ස්වීඩනයේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ සමාගම් ඇතුළුව සියලු සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තුනෙන් එකක් සේවක නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු ය. සේවකයන් සමාගම් ප්‍රාග්ධනයේ හිමිකරුවන් නොවූ ව ද මේ විධිවිධාන අදාළ වේ. සහ-කළමනාකාරිත්වය *(co-management)* යනුවෙන් හැඳින්වෙන මේ ක්‍රමය වෘත්තීය සමිති සහ ඒවායේ දේශපාලන අනුග්‍රාහකයන් විසින් සිදු කළ නිරන්තර අරගලයක ප්‍රතිඵලයක් වසයෙන් ඇති වූවකි. දහනවවැනි සියවසේ අග භාගයේ සිට ඇරඹුණ උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වසයෙන් ආරම්භ වී පළමු ලෝක මහා යුද්ධ කාලයේ සිට අනුක්‍රමයෙන් හඳුන්වා දෙන ලද මේ ක්‍රමය දෙවැනි ලෝක මහා යුද්ධ කාලය වන විට තදින් තහවුරු වී තිබුණි. එම අදහස නිරූපණය වන වෙනස්කම් අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වල ද අඩංගු විය.[277]

277 Piketty, T. (2020), Capital and Ideology, New York: The Belknap Press of Harvard University Press, pp 695, KE

විශේෂයෙන් 1919 සහ 1949 ජර්මානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවල දී දේපළ හිමිකාරිත්වය පිළිබඳ අයිතීන් නිර්ණය කරන විට පොදු අවශ්‍යතා සහ ප්‍රජාවගේ යහපත පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය යන්න එම අයිතියට අදාළ වන සුවිශේෂ වගකීමක් ලෙස අවධාරණය විය. ඒ අනුව දේපළ අයිතිය ශුද්ධ වූ දෙයක් ලෙස සැලකීම නතර විය. මුලදී මේ සංශෝධනවලට එරෙහි ව කොටස් හිමියෝ දැඩි ලෙස සටන් කළ නමුදු මහජන ආශීර්වාදය ඇතිව පසුගිය අඩ සියවසකට වැඩි කාලයක් තිස්සේ තවමත් එම නීති ස්ථාවර ව පවතී.

පිකෙටි පෙන්වා දෙන පරිදි දැනට ලබා ගත හැකි සියලු ම සාක්ෂිවලට අනුව සහ-කළමනාකාරිත්වය *(co-management)* බෙහෙවින් සාර්ථක පියවරක් බව තහවුරු වී තිබේ. බොහෝ විට කොටස්කරුවන් දිගුකාලීන ව හානිදායක වූ කෙටි කාලීන මූල්‍යමය ලාභ අපේක්ෂාවලින් ආවේශ ව තීරණ ගැනීමට පෙලඹෙන නමුත් ඊට ප්‍රතිපක්ෂ ව සේවක නියෝජිතයන්ගේ මැදිහත් වීම නිසා සමාග ම්වල දිගු කාලීන උපාය මාර්ග වැඩිදියුණු කිරීමට හැකිව තිබේ. ඒ නිසා අනෙකුත් සමාගම් පාලන මොඩලවලට වඩා වැඩි නිෂ්පාදන ධාරිතාවක් ඇති සහ අසමානතාව අඩු කළ හැකි සමාජ ආර්ථික මොඩලයක් ප්‍රවර්ධනය කිරීමට ජර්මනිය හා ස්වීඩනය වැනි රටවලට හැකිව තිබේ.

මේ ජර්මානු නෝර්ඩික් සහ-කළමනාකාර මොඩලය බෙහෙවින් බලාපොරොත්තු දනවන සුළු නමුත් එය තුළ පවා නොයෙක් සීමා පවතී. උදාහරණයක් වශයෙන් ගත හොත් පවතින විධිවිධානවලට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී සමෝසමේ බෙදීමක් ඇති වූ විට තීරණාත්මක ඡන්දය පාවිච්චි කළ හැක්කේ කොටස් හිමියන්ගේ නියෝජිතයන්ට පමණි. මේ ක්‍රමය වැඩි දියුණු කිරීමට තවත් ප්‍රතිසංස්කරණ කිහිපයක් වැදගත් විය හැකි බව පිකෙටි පෙන්වා දෙයි. ඒවා නම් ධනය සම්බන්ධ අසමානතාව අඩු කිරීම පිණිස අනුක්‍රමයෙන් ඉහළ යන බදු ක්‍රමයක් ද, ප්‍රාග්ධන පාරිතෝෂික

අරමුදලක් *(capital endowment fund)* සහ වැඩදායක ලෙස දේපළ සංසරණය වීමේ ක්‍රමයක් ද හඳුන්වා දීම යි. මේ යෝජනා ඉදිරියේ දී තවදුරටත් විස්තරාත්මක ව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

ඒ හැර සමාගම් සේවකයින්ට සමාගමේ කොටස් මිලට ගැනීමේ අවස්ථා ද තිබිය යුතු බව පිකටි පවසයි. කුඩා ප්‍රමාණයේ සමාගම්වල ආයෝජකයන්ට අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට සැලකිය යුතු බලපෑමක් කිරීමට ඉඩ දීම සාධාරණ නමුත් (ඔවුන් විසින් කරන ලද ආයෝජනයට ලැබිය යුතු ප්‍රතිලාභ තහවුරු කිරීමේ අවශ්‍යතාව ද සලකමින්) විශාල ප්‍රමාණයේ සමාගම් සම්බන්ධයෙන් එම අවශ්‍යතාව සමාගමේ දිගුකාලීන ස්ථාවර භාවය පිළිබඳ සේවකයන්ගේ අවශ්‍යතාව තරම් වැදගත් නො වේ.

ලාභ ඉපයීමේ අරමුණෙන් තොර ව පිහිටා ඇති ජනමාධ්‍ය සමාගම් සම්බන්ධයෙන් මෑතක දී ඉදිරිපත් කරන ලද එක් යෝජනාවක් වන්නේ සමාගමේ ප්‍රාග්ධනයෙන් 10% ක් ඉක්මවා යන ආයෝජනවල දී එසේ ආයෝජනය කළ මුදලින් තුනෙන් එකකට අනුරූප වන අන්දමට ඡන්ද බලයක් සහිත ව අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නියෝජනය වීමට සේවකයන්ට අවස්ථාව ලබා දීම යි. ඒ හා සමාන ව ම අධ්‍යක්ෂ මණ්ඩලය තුළ මාධ්‍යවේදීන්, පාඨකයන් සහ ජනමූලීය අර්ථපතියන් *(crowd funders)* වැනි කුඩා පරිමාණයේ ආයෝජකයන්ගේ නියෝජනය ද වැඩි කළ හැකි ය. මෙම ක්‍රමවේදය අනෙකුත් සමාගම්වලට ද හඳුන්වා දිය හැකි ය. උදාහරණයක් වසයෙන් කිසියම් ප්‍රමාණයකට වඩා විශාල සමාගම් සම්බන්ධයෙන් 10% වැඩි ආයෝජන හිමි ආයෝජකයන් සතු ඡන්ද බලය සීමා කළ හැකි ය. විශාල සමාගම්වල තීරණ ගැනීමේ බලය එක් පුද්ගලයෙකු මත සංකේන්ද්‍රණය වී තිබීමට කිසිදු සාධාරණ හේතුවක් නැති අතර වඩා සාමූහික ව තීරණය ගැනීම මඟින් සිය ප්‍රජාව කෙරෙහි වැඩි වගකීමක් දැරීමට එවැනි සමාගම්වලට හැකි වෙයි.

ඇත්තටම බැලුවොත් පොදු සහ පෞද්ගලික යන අංශ දෙකේ ම ඇතැම් ආයතන කොටස් හිමියන්ගේ සහභාගිත්වයකින්

තොර ව මනාව ක්‍රියා කරයි. ඊට හොඳ උදාහරණයක් නම් එක්සත් ජනපදය ඇතුළු ඇතැම් රටවල පදනම් *(Foundations)* වසයෙන් සංවිධානය වී ඇති පුද්ගලික විශ්වවිද්‍යාල යි. මේ වර්ගයේ පුද්ගලික විශ්වවිද්‍යාලවලට නිර්ලෝභී දායකයන් විසින් ආධාර මුදල් දෙන අතර ඒ වෙනුවට ඔවුන්ට බොහෝ විට ලැබෙන එකම වරප්‍රසාදය වන්නේ තම දරුවන් තත් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම් වැනි දේවල් පමණි. ආධාරයේ ප්‍රමාණය අනුව ඇතැම් විටක ඔවුන්ට විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ ආසනයක් ද හිමි විය හැකි ය. මේ ක්‍රමයේ පවතින අඩුපාඩුකම් නැති කිරීමට මෙවැනි ආයතනය තදින් නියාමනය විය යුතු බව සැබැවි. එහෙත් මෙහි දී වැදගත් වන්නේ යට කී දායකයන් විසින් පිරිනමන මූල්‍යාධාර විශ්වවිද්‍යාලයේ ඍජු ප්‍රාග්ධනයට එකතු වන බව යි. ඒ වෙනුවෙන් දායකයන්ට ලැබෙන පාලක මණ්ඩලයේ ආසනය ඔවුන්ගේ දායකත්වයේ ප්‍රමාණය නො තකා පහසුවෙන් ම ඉවත් කළ හැකි එකකි.

පොදුවේ ගත් විට ආයෝජකයන්ගේ බලය සීමා වෙන තරමට ආයතනවල කාර්යක්ෂමතාව වැඩි විය හැකි ය. මෙයට ඇති තරම් උදාහරණ සෞඛ්‍ය, සංස්කෘතිය සහ ප්‍රවාහනය වැනි අංශවලින් සොයා ගැනීමට හැකි බව පිකෙටි පෙන්වා දෙයි.

ජර්මන්-නෝර්ඩික් ක්‍රමය මඟින් හඳුන්වා දුන් සමාගම් සහ-කළමනාකරණයේ *(co-management)* හොඳ ම ප්‍රතිඵලය වූයේ විශාල කොටස් හිමියන්ගේ අනිසි බලපෑම අවම කිරීමට එමඟින් හැකිවීම යි. මේ ක්‍රමය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් දැනට ඇති වෙනත් යෝජනා ද සලකා බැලිය හැකි ය. උදාහරණයක් වසයෙන් පිකෙටි පෙන්වාදෙන පරිදි සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය තේරීම සේවකයන් සහ කොටස් හිමියන් යන දෙකොටසගේ ම සහභාගිත්වයෙන් සිදු කළ යුතු බව බ්‍රිතාන්‍යයෙන් ආ එබඳු හොඳ යෝජනාවකි.

ව්‍යාපාරික සමාගම්වල සමාජීය අයිතිය *(social ownership)* සහ අධ්‍යක්ෂ මණ්ඩලවල හවුල් ඡන්ද බලය තහවුරු කිරීම අති ධනවාදය අතික්‍රමණය කිරීමේ ලා අතිශයින් වැදගත් වන මෙවලම් ය. එහෙත්

ඒවා පමණක් ම ප්‍රමාණවත් නො වන බව පිකෙටි පවසයි. ඔහුට අනුව සාධාරණ සමාජයක දිගින් දිගටම පෞද්ගලික දේපළ පැවතිය හැකි බවට එකඟ වීමෙන් මූලික ව ම අදහස් වන්නේ පොදු අවශ්‍යතාවලට පටහැණි අන්දමින් ධනය සංකේන්ද්‍රණය වීම වැළැක්වීම යි. ධනය සංකේන්ද්‍රණය වීම වැළැක්වීමේ එක් ක්‍රමයක් වන්නේ ආදායම අනුව වැඩිවන බදු මඟින් ධනය විභජනය කිරීම යි. අධික ආදායම් ලබන අයගෙන් වැඩි බදු ප්‍රතිශතයක් අය කිරීම නිසා ආර්ථික වර්ධනයට හානිවෙතැ'යි යන්න සාක්ෂිවලින් තහවුරු වී නැති මනස්ගාතයකි. විසිවැනි සියවසේ එක්සත් ජනපදයේ ඉහළ ආදායම් ලබන්නන් සම්බන්ධයෙන් ආදායම් බදු ප්‍රතිශතය ආදායමින් සියයට 70% - 90% පමණ වූ විට දශක ගණනාවක් තිස්සේ ම පෙර නොවූ විරූ අන්දමේ ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගැනීමට හැකිවූ බව පිකෙටි පෙන්වා දෙයි. මේ අනුව ඇතැම් අය තර්ක කරන අන්දමට අන්ත අසමානතාව *(extreme inequality)* යනු සෞභාග්‍යය සහ කාර්මික සංවර්ධනය ජනනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් නො වන බව පෙනේ.

නෝබල් තයාගලාභී ආර්ථික විද්‍යාඥ පෝල් සැමුවෙල්සන් *Economics: An Introductory Analysis,* නමින් 1948 දී ආර්ථික විද්‍යාව ගැන පළ කළ කෘතියේ 1947 වසර සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවැති ආදායම් බදු අනුපාත වලට අනුරූපව අනුක්‍රමික බදු ක්‍රමය විස්තර කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපදයේ පැවැති පුද්ගල ආදායම් බදු ප්‍රතිශතය පැහැදිලි කරන වගුවක් අඩංගු කර තිබේ.[278] එහි පරිවර්තනයක් පහත දැක්වේ. 1947 දී ඉහළ ආදායම් සම්බන්ධයෙන් පැවති බදු ප්‍රතිශතය මෙම වගුවේ සඳහන් ප්‍රතිශතයට වඩා වැඩිය. උදාහරණයක් ලෙස ආදායම $200,000 ක් වන විට ගෙවිය යුතු ආදායම් බදු ප්‍රතිශතය 91% දක්වා ඉහළ ගිය බව සංරක්ෂණ වාර්තා පෙන්නුම් කරයි.[279]

---

278 Paul A. Samuelson (1948) Economics: An Introductory Analysis, McGraw-Hill Book Company: New York, p.173

279 https://taxfoundation.org/historical-income-tax-rates-brackets/ - retrieved on 14 Jan 2022

| 1947 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ දරුවන් නැති විවාහක පුරුෂයෙකු විසින් සිය ආදායම අනුව ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය - (සියලු සංඛ්‍යා ඇමෙරිකානු ඩොලර් වලිනි) | | | |
|---|---|---|---|
| ආදායම | පුද්ගල ආදායම් බද්ද | ආදායම් බද්ද පුද්ගල ආදායමේ ප්‍රතිශතයක් ලෙස | ආදායම් බදු අය කිරීමෙන් පසු වියදම සඳහා ඉතිරි වන මුදල |
| *$ 1000* හෝ ඊට අඩු | *$ 0* | *0%* | *$ 1000* |
| *$ 3000* | *$ 330* | *11%* | *$ 2,670* |
| *$ 5000* | *$ 700* | *14%* | *$ 4,300* |
| *$ 10,000* | *$ 2,600* | *26%* | *$ 7,400* |
| *$ 20,000* | *$ 6,100* | *30%* | *$ 13,900* |
| *$ 50,000* | *$ 24,000* | *48%* | *$ 26,000* |
| *$ 200,000* | *$ 148,000* | *74%* | *$ 52,000* |
| *$ 1,000,000* | *$ 839,000* | *84%* | *$ 161,000* |

නව ලිබරල්වාදයේ බලපෑමට ලක් වීමට පෙර ඒ හා සමාන ව බ්‍රිතාන්‍යයේ ඉහළ ආදායම් මට්ටම්වල ආදායම් සඳහා බදු අනුපාතිකය 83% ක් විය. එහෙත් මාග්‍රට් තැචර් බලයට පත් වූ වහා ම එය 60% දක්වා පහත දැමුණි. 1988 වන විට කොන්සර්වෙටිව් ආණ්ඩුව ඒ ප්‍රමාණය 40% දක්වා තවදුරටත් පහත දැමූ විට පොහොසත් කොන්සර්වෙටිව් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඒ අනුව තමන්ට ලැබෙන බදු සහනය ගණනය කිරීමට කැල්කියුලේටරයේ ඇති බින්දු ප්‍රමාණය මදි යැ'යි උදම් ඇනී ය.

පොහොසතුන් සඳහා බදු අඩු කිරීමේ මේ ප්‍රවණතාව වැඩි වසයෙන් ම උත්කර්ෂණයට නංවන ලද්දේ නවලිබරල්වාදී ආර්ථික

දෘෂ්ටියට අනුව ය. 1980 සිට ක්‍රියාත්මක වූ නවලිබරල්වාදී බදු ප්‍රතිපත්තිය වූයේ ප්‍රාග්ධනය මත පනවා තිබූ බදු බර සැහැල්ලු කොට එම හිඟ පාඩුව වැටුප් සහ පරිභෝජන භාණ්ඩ මත පටවන බදු වැඩි කිරීමෙන් පියවා ගැනීම යි. ප්‍රාග්ධනය මත පනවා තිබූ බදු බර ඉවත් කළ විට ආයෝජන දිරිමත් කොට ආර්ථික වර්ධනය ඇති කළ හැකි බව මෙය පිටුපස තිබූ මූලික තර්කය යි. වැඩි වැඩියෙන් ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමේ තරඟයෙන් ජය ගැනීමට බොහෝ රටවල් මේ නවලිබරල්වාදී ක්‍රමෝපාය අනුගමනය කළ බව පිකෙටි පෙන්වා දෙයි. ඒ අනුව වසර 1980 - 2006 අතර යුරෝපා සංගමයේ රටවල සමාගම් බදු 49% සිට 25% දක්වා අඩු කරන ලද අතර ඉහළ ආදායම් මට්ටම්වල පුද්ගල ආදායම් බදු 67% සිට 42% දක්වා අඩු කෙරිණි. ඒ අතර භාණ්ඩ මත අය කරන අගය එකතු කිරීමේ බදු *(VAT)* 13% සිට 20% දක්වා ඉහළ දැමිණි. එසේ 2007 වන විට යුරෝපයේ සමස්ත බදු ආදායමෙන් 33% ක් පමණ භාණ්ඩ මත පනවන ලද බදුවලින් ද 40% ක් වැටුප් ශ්‍රමයෙන් අය කරන බදුවලින් ද සමන්විත වූ අතර සමාගම්වලින් අය වූ බදු ආදායම 20% ක් දක්වා පහත වැටිණි.[280] එක්සත් ජනපදයේ සමාගම් හා ඉහළ ආදායම් ලබන පුද්ගලයන්ගෙන් අය කරන බදු ද ඊට අනුරූප ව අඩු විය. මෙහි ප්‍රතිඵලය වූයේ ප්‍රාග්ධනය මත බදු බර අඩු වීමත් වැටුප් මත පැනවූ බදු බර වැඩි වීමත් නිසා සමාජය තුළ ආදායම් විෂමතාව තව තවත් ඉහළ යෑමයි. මේ කාලය තුළ රැකියා විරහිත භාවය වැඩි වූ අතර කොන්සර්වෙටිව් ආණ්ඩු විසින් වැඩ වර්ජන අනුකම්පා විරහිතව මර්දනය කළ නිසා යුරෝපයේ වෘත්තීය සමිතිවලට පෙර තිබූ කේවල් කිරීමේ හැකියාව අඩු විය. එබැවින් පාරිභෝගික බදු හා වැටුප් බදු වැඩි කිරීමට එරෙහි ව ප්‍රබල සාමූහික හඬක් නැගීමට යුරෝපීය වැටුප් ශ්‍රමිකයන්ට නො හැකි විය.

කෙසේ වෙතත් බදු අය කිරීම මඟින් ධනය නැවත විභජනය කිරීමේ දී ඓතිහාසික අත්දැකීම් අපට පෙන්වා දෙන අන්දමට

280 Kaufmann. S & Stutze. I (2017) Thomas Piketty's Capital in the 21st Century, New York: Verso, pp. 13-14

උරුමය *(Inheritance)* සහ ආදායම *(Income)* මත පමුණුවන බදු පමණක් ප්‍රමාණවත් නො වන බව පිකෙටි පවසයි. ඔහු යෝජනා කරන අන්දමට එයට අනුපූරක ව වත්කම් මත ද ක්‍රමයෙන් වැඩි වන වාර්ෂික වත්කම් බද්දක් ද *(Wealth Tax)* අය කළ යුතු ය. එමගින් ධනය සංසරණය වීම සැලකිය යුතු ලෙස වැඩි කළ හැකි ය. වත්කම් බදු යනු කිසියම් ආයතනයක් හෝ පුද්ගලයෙකු විසින් අත්පත් කර ගෙන ඇති මුදල්, බැංකු තැන්පත්, ඉඩකඩම්, සමාගම් ගත නො කරන ලද ව්‍යාපාර, මූල්‍ය වත්කම් ආදී සියලු ම ආකාරයේ නිශ්චල හා චංචල වත්කම් සඳහා පනවනු ලබන බද්දකි.

පිකෙටි පෙන්වා දෙන පරිදි එසේ වත්කම් බදු සම්බන්ධ ව වැඩි අවධානයක් යොමු කිරීමට හේතු කීපයක් තිබේ. ඒ අතරින් වැදගත් ම හේතුව ආදායම් මෙන් වත්කම් වංක ලෙස සැඟවීමට අපහසු වීම යි. වත් පොහොසත්කමින් ආඪ්‍ය ධනවතෙකුගේ ආදායම් බදු ඔහුගේ මුලු ඉපයීම්වලින් සොච්චමක් පමණි. ඔහුගේ ඇත්ත ආදායම පවුලේ අය සන්තක වස්තුව තුළ සඟවන බැවින් හුදෙක් ආදායම් බදු ගෙවීමෙන් පමණක් ඔහුගේ සමාජ වගකීම ඉටු වෙතැ'යි අපේක්ෂා කළ නො හැකි ය. ඇත්ත වසයෙන් ම තමන් සතු වත්කම් හා ධන සම්පත් හා සැසඳූ විට ධන කුවේරයන් ගෙවන්නේ ඉතා අඩු ආදායම් බද්දකි. බොහෝ ධන කුවේරයන් තමන් සතු ආදායම් සහ වත්කම් විදෙස් ගිණුම්වල සඟවා තැබීම මඟින් විවිධ බදු සහන දිනා ගනිමින් සහ වංචනික බදු ප්‍රකාශ ඉදිරිපත් කරමින් බදු ගෙවීමේ සමාජ වගකීම පැහැර හැර තිබේ. මේ නිසා බදු සාධාරණත්වය තහවුරු කරන බදු ක්‍රමයක් හඳුන්වා දී වරප්‍රසාද ලත් පෙළැන්තියක් වෙත ධනය විශාල වසයෙන් සංකේන්ද්‍රණය වීම වළක්වා සමාජ අසමානතාව අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

කෙසේ වෙතත් අතිශයින් ධනවත් බව යනු පොදු යහපත සඳහා සම්මාදම් දීමේ හැකියාව පෙන්නුම් කරන දර්ශකයකි. යම්කිසි තැනැත්තෙකු සතු ව මන්දිර, මහල් නිවාස, ගබඩා සහ කර්මාන්තශාලා වැනි වැදගත් දේපළ ඇත්නම් කිසියම් හේතුවක් නිසා ඒවායින් ආදායම්

අපේක්ෂා නො කළත් ඒ සඳහා බදු අය කිරීම කළ යුතු ය. ඇත්ත වසයෙන් ම නිශ්චල දේපොළවලින් බදු අය කරන සෑම රටක් ම බදු අය කරන විට කිසිවකුට එම දේපළවලින් ආදායමක් ලැබෙන්නේ ද නැද්ද යන කාරණය වැදගත් කොට නො සලකයි. (උදාහරණ: එක්සත් ජනපදයේ දේපළ බද්ද සහ ප්‍රංශයේ නිශ්චල දේපළ බද්ද) මෙම නිශ්චල දේපළ බදු ක්‍රමය 18 වන සහ දහනව වන සියවස් තරම් ඈත ට දිව යන්නකි. එහෙත් එහි දී ආයෝජනයේ ප්‍රමාණය නො තකා ඕනෑම වත්කමක් සම්බන්ධයෙන් නියම කෙරුණේ එකම බදු අනුපාතිකයකි. එනිසා පිකෙටි යෝජනා කරන අන්දමේ වත්කම්වල වටිනාකමට අනුව අනුක්‍රමයෙන් වැඩි වන බදු අය කිරීමක දී මෙන් නො ව එහි දී ධනය නැවත බෙදීමක් සිදු වෙන්නේ ඉතා අඩුවෙනි.

අනුක්‍රමයෙන් ඉහළ යන දේපළ උරුම බද්දක් වෙනුවට (ඒවා ආදායම මත නො ව මුළුමනින් ම වත්කම්වල හිමිකම මත රඳා පවතින බදු ය.) වාර්ෂික වත්කම් බද්දක් අය කිරීමේ වාසිය එය වත්කම්වල වෙනස්වීම් අනුව සහ හිමිකරුගේ ගෙවීම් හැකියාවට අනුව වහාම උපයෝගී කර ගත හැකි වීමයි. මෙහි දී උරුම බදු අය කිරීමට මාක් සකර්බර්ග් හෝ ජෙෆ් බෙසෝස් වයස අනූවක් වී ඔවුන්ගේ දේපළ උරුමක්කාරයින්ට පවරන තෙක් බලා සිටීම අවශ්‍ය නො වේ. වත්කම්වල උරුමය පවරන තෙක් බලා සිටීමට සිදු වන දැනට පවතින උරුම බදු ක්‍රමය අලුතෙන් රැස්කරගත් ධනයෙන් බදු අය කර ගැනීම සම්බන්ධ හොඳ ක්‍රමයක් නො වේ. ඒ නිසා ඒ වෙනුවට යොදා ගත හැකි වාර්ෂික වත්කම් බද්ද වඩාත් කාර්යක්ෂම බදු ක්‍රමයකි. කොහොමටත් දැනට පවතින වත්කම් බද්ද උරුම බද්දට වඩා වැඩි ප්‍රමාණයක් අය වෙන බදු ක්‍රමයකි. කලක් එක්සත් ජනපදයේ දී කතා බහට ලක් වූ ප්‍රකෝටිපති බද්ද ද සැලකිය යුතු මහජන අවධානයක් දිනා ගත්තේ ය. කෙසේ වෙතත් සිය වත්පොහොසත්කම්වලින් 20% සිට 30% දක්වා උරුම බදු වසයෙන් තම උරුමකරුවන් ලවා ගෙවීමට වඩා වත්කම්වල මුලු වටිනාකමින් 1% සිට 2% දක්වා වාර්ෂික බද්දක් ගෙවීමට විශාල දේපළ හිමියන් වැඩි කැමැත්තක් දැක්විය හැකි ය.

මෙහි දී ස්ථිර ලෙස පුද්ගලික වූ දේපළක් පවතින්නේ ය සහ ඇතැම් අයට පමණක් ඒවාට උල්ලංඝනය කළ නො හැකි අයිතියක් ඇත්තේය යන්න පිළිගත හැකි විශ්ලේෂණ මඟින් තවදුරටත් වලංගු කළ නො හැකි ය යන්න පිකෙටි අවධාරණය කරයි. ධනය රැස් කිරීම යනු සැම විටම සමාජ ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. වෙනත් සාධකවලට අතිරේකව එය නීතිමය, මූල්‍යමය සහ අධ්‍යාපනික ක්ෂේත්‍රවල සේවා, විවිධාකාර යටිතල පහසුකම්, ශ්‍රමය සම්බන්ධ සමාජීය බෙදීම් මෙන් ම මිනිසා විසින් සිය වස් ගණනාවක් තිස්සේ රැස් කරගත් දැනුම මත රඳා පවතින්නකි. එනිසා අධික ලෙස ධනය රැස් කර ඇති උදවිය ඉන් කොටසක් අවුරුදු පතා තම ප්‍රජා සමූහය වෙත පිරිනැමීම ඉතා සාධාරණය. එනිසා සියලු පුද්ගලික ධන සම්පත්වල අයිතිය තාවකාලික බවට පත් කළ යුතු ය.

බදු ක්‍රමයෙන් ද දේපළ අයිතිය කිසියම් පමණකට සීමා වෙයි. දේපළ උරුම වීම මත පනවන වටිනාකම අනුව අනුක්‍රමණික ව ඉහළ යන දේපළ උරුම බද්ද ඇතැම් සංවර්ධනය වන රටවල 30% සිට 40% දක්වා වැඩි වී තිබේ. දශක ගණනාවක් තිස්සේ ම ඇමරිකා එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ දේපළ උරුම බද්ද 70% සිට 80% දක්වා ප්‍රමාණයක් විය. එය සදාතනික උරුමයක් තාවකාලික අයිතියක් බවට පත් කරන බද්දක් බඳු විය. වෙනත් අන්දමකින් කියන්නේ නම් එමඟින් පරම්පරාවෙන් පරම්පරාවකට ධනය උරුම කර ගැනීමට ඉඩ දී තිබූ නමුත් වූ නමුත් එසේ උරුමය ඊළඟ පරපුරට මාරු වන හැම විට ම එම ධනයෙන් කොටසක් ප්‍රජාවට පිරිනැමිය යුතු විය. ඒ හැර උරුමය පිළිබඳ බද්ද සහ සමගාමී ව අනුක්‍රමයෙන් වැඩි වන ආදායම් බදු ක්‍රමයක් මඟින් ද පරම්පරා ගණනාවක් තිස්සේ ධනය එක් රැස්වීම නොහොත් සංකේන්ද්‍රණය වීමට තිබූ ඉඩකඩ වළක්වන ලද්දේ ය.

පුද්ගලික දේපොළ සහ ධනවාදය අතික්‍රාන්ත කිරීමටත් සහභාගිත්ව සමාජවාදය ගොඩනැඟීමටත් මේ බදු ක්‍රම දෙක ම තවත් වැඩිදියුණු කළ යුතු යැ'යි පිකෙටි යෝජනා කරයි. කෙටියෙන් කිව්වොත් මෙතෙක් කර ඇති දේවල් ඉක්මවා යන බොහෝ වැදගත්

දේවල් නීති සහ මූල්‍ය පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම මඟින් ඉටු කර ගත හැකි ය. මෙහි දී පළමුවෙන් ම සමාගම් තුළ බලය බෙදීම තවදුරටත් විස්තීර්ණ කිරීම මඟින් ප්‍රාග්ධන හිමිකාර සමාජයක් ඇති කර ගත හැකි ය. දෙවනුව ප්‍රාග්ධන හිමිකාරිත්වය තාවකාලික දෙයක් බවට පත් කිරීම පිණිස විශාල වත්කම්වලින් අනුක්‍රමික ව වැඩි වන බදු නියම කොට ඒ මඟින් ලැබෙන ආදායම ලෝක ප්‍රාග්ධන පාරිතෝෂික අරමුදලකට *(global capital endowment fund)* බැර කළ හැකි ය. එම අරමුදල හරහා වස්තුව සහ ධනය ගෝලීය මට්ටමෙන් නිරන්තරයෙන් සංසරණය වන දෙයක් බවට පත් කළ හැකි ය. අසමානතාව ජාතික රාජ්‍ය ක්‍රමයේ ඵලයක් බැවින් උග්‍ර අසමානතා තුරන් කිරීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව අත්‍යවශ්‍ය බව පිකෙටි පවසන්නේ එබැවිනි.

පිකෙටි යෝජනා කරන අන්දමට අනුක්‍රම බදු ගණනය කිරීමේ දී අති විශාල දේපළ උරුමවල සහ උපරිම ආදායම් ශ්‍රේණිවල බදු ප්‍රමාණය වටිනාකමින් 60%-70% පමණ තරම් විය යුතු ය[281]. දේපළ උරුම සහ ආදායම් ප්‍රමාණ රටක ඒක පුද්ගල වත්කම මෙන් දස ගුණයකට වැඩි අවස්ථාවල දී 90% සිට 80 දක්වා බදු අය කළ යුතු ය. මේ බදු අනුපාත 1930 සිට 1980 ගණන් දක්වා ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය විසින් පවත්වා ගෙන ගිය බදු ප්‍රතිශතය හා බෙහෙවින් සමාන ය. එසේ වුව ද මේ කාල පරිච්ඡේදය තුළ ඒ රටවල වැඩි ආර්ථික වර්ධනයක් ඇති වූ බව ද පිකෙටි මතක් කරයි.

පිකෙටි යෝජනා කරන බදු ක්‍රම අතරින් වඩාත් නවතම බදු ක්‍රමය වන්නේ වත්කමේ ප්‍රමාණය අනුව අනුක්‍රමික ව වැඩිවන වත්කම් බද්ද යි *(wealth tax)*. එක්සත් ජනපදයේ දහනම වන සියවසේ දී ඇරඹුණු ධන බද්ධ හා ප්‍රංශයේ ඉඩම් හා නිවාස බද්ද

281 ආර්ථික විද්‍යාඥ පෝල් සැමුවෙල්සන් ගේ *Economics* කෘතියේ පළ වූ පරිදි 1947 ඇමෙරිකානු එක්සත් ජනපදයේ පැවැති පුද්ගල ආදායම් බදු ප්‍රතිශතය මේ යෝජනාවට අනුරූප ය.

අදාළ වත්කමේ වටිනාකමින් සියයට එකකට වඩා වැඩි නො වීය. සාමාන්‍යයෙන් එකී බදු ක්‍රමයට  මූල්‍යමය වත්කම් අයත් නොවීය. එහෙත් වර්තමානයේ ධන කුවේරයින්  තමන් සතු මූල්‍ය සම්පත්වලින් බොහොමයක් බදුවලින් ගැලවීම පිණිස අක් වෙරළ *(offshore)* බැංකු ගිණුම්වල තැන්පත් කර සඟවා තිබේ.  එනිසා වර්තමානයේ පවතින ධන බද්ධ ඇත්ත වසයෙන් ම අනුක්‍රමික බද්දකට වඩා ප්‍රතික්‍රමික *(regressive)* බද්දකි.

ඒ නිසා පිකෙටි යෝජනා කරන අන්දමට මේ සම්බන්ධ අනුක්‍රමික ආදායම් බදු අනුපාත ජාතික සාමාන්‍ය හා ඊට වඩා අඩුවෙන් ආදායම් ලබන්නන්ගෙන් 0.1% බැගින් ද ජාතික සාමාන්‍ය මෙන් දෙගුණයක් ආදායම් ලබන්නන්ගෙන් 1% බැගින් ද අනුක්‍රමයෙන් වැඩි ව ගොස් ජාතික සාමාන්‍ය මෙන් සිය ගුණයක් ආදායම ලබන්නන්ගෙන් 10% බැගින් ද  ජාතික සාමාන්‍ය මෙන් දහස් ගුණයක් ආදායම ලබන්නන්ගෙන් 60% ක් වසයෙන් ද අනුක්‍රමික ව වැඩි විය යුතු ය. මේ අනුව බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාත්මක පදනම වැඩි වීමක් ද ඉහළ ආදායම් ලබන්නන් විසින් ගෙවන ආදායම් බදු ප්‍රමාණය ධනය සාධාරණ ව නැවත බෙදී යෑම පිණිස උපයෝගී කර ගත හැකි මට්ටමට වැඩි වීමක් ද සිදුවේ.  දැනට පවතින දේපොළ බදු ක්‍රමයේ ඇති සමතල ප්‍රමාණයට *(flat rate)* වඩා මේ ක්‍රමය මඟින් ධනය බෙදී යෑම වැඩි කළ හැකි ය. ඒ හැර මේ ක්‍රමය මඟින් අඩු ආදායම් ලාභීන්ට ගෙවීමට සිදු වන බදු මුදල් ප්‍රමාණය බෙහෙවින් අඩු කළ හැකි ය. මෙකී බදු අනුපාත යෝජනා කර ඇත්තේ දැනුවත් සාකච්ඡාවකට පදනමක් වසයෙන් බව අවධාරණය කරන පිකෙටි නියම බදු අනුපාත තීරණය කිරීම ආදායම් විෂමතා පිළිබඳ නිවැරදි දත්ත මත සාකච්ඡා කොට තීරණය කළ යුතු බව පෙන්වා දෙයි.

පුළුල් ලෙස ගත්තොත් පිකෙටි යෝජනා කරන  ආකාරයට සාධාරණ සමාජයක බදු ක්‍රමය මූලික බදු වර්ග තුනක් මත රඳා පවතිනු ඇත. ඒවා නම් වටිනාකම අනුව අනුක්‍රමික ව වැඩි වෙන වත්කම් බද්ද, වටිනාකම අනුව අනුක්‍රමික ව වැඩි වෙන දේපළ උරුම බද්ද

සහ වැඩිවන ආදායම අනුව අනුක්‍රමික ව වැඩි වෙන ආදායම් බද්ද යන බදු තුන් වර්ගයයි. උදාහරණයක් වසයෙන් ඉහත කී බදු අතරෙන් අනුක්‍රමික ආදායම් බද්ද සහ උරුම බද්ද ජාතික ආදායමෙන් සියයට 5ක් පමණ ලබා දෙනු ඇතැ'යි උපකල්පනය කළ හැකි ය. ඒ ආදායම මුළුමනින් ම පාහේ සාර්වත්‍රික ප්‍රාග්ධන පාරිතෝෂික අරමුදලට බැර කළ හැකි ය. සමාජ ආරක්ෂණ බදු ද, කාබන් බදු ද ඇතුළත් ව සමස්ත අනුක්‍රමික ආදායම් බදු ප්‍රමාණය ජාතික ආදායමෙන් සියයට 45ක් පමණ වනු ඇතැ'යි බලාපොරොත්තු විය හැකි අතර එම මුදල සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය ඇතුළු අනෙකුත් පොදු වියදම් සඳහා යොදා ගත හැකි ය.

ජාතික ආදායමෙන් සියයට 5 ක් පමණ වන වත්කම් සහ උරුම බදු ආදායම වයස 25 ට වැඩි සෑම වැඩිහිටියෙකුට නිත්‍ය මූලික ආදායමක් ලෙස පාරිතෝෂිකයක් ලබා දීමට ප්‍රමාණවත් වනු ඇතැ'යි පිකෙටි කල්පනා කරයි. පිකෙටි ගණන් බලා ඇති අන්දමට මේ පාරිතෝෂිකය 25 හැවිරිදි රටවැසියෙකුට සාමාන්‍යය තත්වය යටතේ සතු කර ගත හැකි මූල ධනයෙන් සියයට හැටක් පමණ වනු ඇතැ'යි උපකල්පනය කළ හැකි ය.

උදාහරණයක් වසයෙන් ගත්තොත් 2010 අවසානයේ දී බටහිර යුරෝපයේ, ඇමරිකාවේ සහ ජපානයේ වැඩිහිටි තරුණයෙකුගේ සාමාන්‍ය පුද්ගලික වත්කම යුරෝ දෙලක්ෂයක් පමණ විය. ඒ අනුව පුද්ගලයෙකුට ලබා දිය යුතු මූලික ආදායම් පාරිතෝෂිකය යුරෝ 120,000 බැගින් වනු ඇත. මේ අන්දමින් බැලූ විට සෑම පුද්ගලයෙකුට ම සිය වැඩිහිටි ජීවිතය ආරම්භයේ දීම නිවසක් තනා ගැනීමට හෝ තමාගේ ම වූ ජීවන වෘත්තියක් ඇරඹීමට අවශ්‍ය මූල ධනය සහතික කර ගත හැකි වේ.

අද අතළොස්සක් අතර අතිශයින් සංකේන්ද්‍රණය වී ඇති ධන සම්පත් නිසා ජනගහනයෙන් 50% ක් පමණ වන අඩු ආදායම් ලබන ජන කොටස් අතර ගැවසෙන අල්ප ධනය රටේ සම්පූර්ණ සම්පත් ප්‍රමාණයෙන් 5% වඩා නො වැඩි වේ. දැන් පවතින ක්‍රමය

අනුව පොහොසත් තරුණයන් අතළොස්සකට සිය දෙමව්පියන්ගෙන් බිලියන ගණනක මුදල් ප්‍රමාණයක් උරුම වන්නේ ය. නිකරුණේ සිටින කොටසකට මේ සා විශාල උරුමයක් ලැබෙන අතර අන් අයට කිසිවක් ම නො ලැබීම බෙහෙවින් අසාධාරණ ය.

සියල්ලන්ට ම මූලික ආදායමක් සහතික කළ යුතු ය යන යෝජනාවට තරමක දිගු ඉතිහාසයක් ඇත්තේය. 1796 දී තෝමස් පෙන් සිය *Agrarian Justice* නැමති පොතෙන් මූලික ආදායම් ලබා දීම සඳහා උරුම බද්දක් පැනවිය යුතු යැයි කියා සිටියේ ය. මෑතක දී ඇන්තනී ඇට්කින්සන් ද අනුක්‍රමික උරුම බද්දක් මඟින් පාරිතෝෂික ගෙවීමේ ක්‍රමයක් යෝජනා කළේ ය. පිකෙටි යෝජනා කරන ක්‍රමය වන්නේ වාර්ෂික උරුම බද්ද සහ වත්කම් බද්ද යන ආදායම් මාර්ග දෙකම යොදා ගෙන සාර්වත්‍රික ප්‍රාග්ධන පාරිතෝෂික අරමුදලක් ඇති කිරීම යි. විෂමතාව සමනය කිරීමේ එක් වැදගත් පියවරක් *Universal Basic Income* හෙවත් සැමට මූලික ආදායමක් සහතික කිරීම පිළිබඳ යෝජනාව අපි මීළඟ පරිච්ඡේදයෙන් වැඩි දුර සාකච්ඡාවට ලක් කරමු.

# - 26 -

## සැමට මූලික ආදායමක් සහතික කිරීම

සාර්වත්‍රික මූලික ආදායම *(Universal Basic Income)* යනුවෙන් හඳුන්වන්නේ වෙන කෙනෙකුට අත නො පා තමන්ට අවශ්‍ය එදිනෙදා මූලික වියදම් දරා ගැනීමට හැකි, ඒ නිසා ම තමන් සුරක්ෂිත ය යන හැඟීම ඇතිවීමට තරම් ප්‍රමාණවත් වන මුදලක් හැම පුද්ගලයෙකුට ම පොදු අරමුදලක් මඟින් නො කඩවා ලැබෙන ආදායම් ක්‍රමයකි.

ඒ අනුව පුද්ගලයෙකුට ලැබෙන මාසික දීමනාව කොතරම් ද? එය ගෙවිය යුත්තේ වෙනත් සුභසාධන ප්‍රතිපත්තියක් අත්හිටවීමෙන් පසු ද? ඒ සඳහා අවශ්‍ය මුදල් උපයා ගැනීමට අයබදු වැඩි කළ යුතු ද? ආදී කිසිවකට පිළිතුරු එම සංකල්පය තුළ නැත. ඒ සඳහා නිසැක ව ම සැලකිය යුතු මුදලක් වැය කළ යුතු වේ. මෙවැනි දීමනාවක් ගෙවිය හැකි ද? හැකි වුණත් එවැන්නක් ගෙවිය යුතු ද වැනි ප්‍රශ්න ද පැන නැගීමට ද පුළුවන. සමාජය තුළ අධික ආදායම් විෂමතාවක් ඇත්නම් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයක් පවත්වා ගැනීමට අපහසු ය. ආදායම් අසමානතාව වැඩිවන තරමට ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තුළ ස්වාධීන ව කටයුතු කිරීමට අඩු ආදායම් ලබන්නන්ට ඇති හැකියාව ද අඩුවෙයි. එබැවින් සැමට තම මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට හැකි මූලික ආදායමක් ලබා දීම දේශපාලන සමානාත්මතාව තහවුරු කිරීමෙ ලා තීරණාත්මක පියවරකි.

සැමට මූලික ආදායමක් ලබා දීම යුක්ති සහගත කරන හේතු ගණනාවක් තිබේ. ඒවා අතරින් ඇතැම් හේතු සුවිශේෂයෙන් ම අද්‍යතන ඒවා ලෙස ද තවත් ඇතැම් හේතු සියවස් දෙකකට වැඩි කලක් තිස්සේ පැවත එන ඒවා ලෙස ද සැලකිය හැකි ය. 18 වන සිය වසේ ඇමෙරිකානු විප්ලව සමයේ ප්‍රකට දේශපාලන විචාරකයෙකු වූ තෝමස් පේන් සඳහන් කළ අන්දමට සාර්වත්‍රික මූලික ආදායම සමාජ යුක්තිය පිළිබඳ කාරණයකි. පේන්ට අනුව ඊට හේතු වන්නේ සමාජය තුළ ඇති සියලු මූලික වත්කම් ස්වාභාවික ව ම සාමූහික වීම යි. ඒ නිසා එම වත්කම්වල ප්‍රතිලාභ සැමට එක සමාන ව ලැබිය යුතු ය. ප්‍රංශ වැසියන් සියලු දෙනාට සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දෙන ලෙස 1795 දී තෝමස් පේන් සිය 'ගොවි ජන යුක්තිය' *'Agrarian Justice'* නම් කෘතියෙන් නව ප්‍රංශ සමූහාණ්ඩුවට යෝජනා කළේ ය. ඒ සඳහා අවශ්‍ය අරමුදල් ලබාගත හැක්කේ කෙසේ දැ'යි යන්න පේන් පෙන්වා දුන්නේ මෙසේ යඃ

> **"වගා නො කර තිබුණේ නම් මහ පොළොව තවමත් පවතින්නේ මනුෂ්‍ය සංහතියේ පොදු දේපළක් ලෙස ය. ඒ නිසා කෙනෙකු පුද්ගලික දේපළ වසයෙන් සැලකිය යුත්තේ ඔහු විසින් මහ පොළොව මතට පුද්ගලික ව එකතු කරන ලද අගය මිස මහ පොළොව නො වේ. ඒ අනුව හැම දේපළක ම හිමිකරු ඔහු විසින් අල්ලා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙනුවෙන් ප්‍රජාවට බිම් කුලියක් ගෙවිය යුතු ය. මේ සැලසුම සඳහා අවශ්‍ය අරමුදල් සොයා ගත යුත්තේ එම බිම් කුලිය එකතු කිරීමෙනි."[282]**

ඇමෙරිකාවේ හා ප්‍රංශයේ එවකට උද්ගත ව තිබූ දේශපාලන කලබැගෑනිය මැද යෝජනා කළ එම සැලැස්ම පේන් සාධාරණීකරණය කළේ ඉහත සඳහන් සුපැහැදිලි විශිෂ්ට හේතු දැක්වීම මතය. තෝමස් පේන් විසින් තර්කානුකූල කළ මෙය පේනියානු මූලධර්මය ලෙස හැඳින්විය හැකි ය. එසේ පිහිටුවීමට යෝජනා කළ අරමුදල යොදා ගත යුතු ආකාරය ද ඔහු මෙසේ පැහැදිලි කළේ යඃ

282 T. Paine ([1795] 2005), 'Agrarian justice', in Common Sense and Other Writings. New York: Barnes & Noble, p. 332.

**"ස්වභාවයෙන් ම කෙනෙකුට තිබිය යුතු භූමිය පිළිබඳ උරුමය ඉඩම් හිමි දේපළ ක්‍රමය හඳුන්වා දීම නිසා අහිමි විය. එයට වන්දියක් ලෙස වයස 21 ට වැඩි සැම කෙනෙකුට ම ස්ටර්ලින් පවුම් පහළොවක්[283] ගෙවිය හැකි ජාතික අරමුදලක් පිහිටුවිය යුතු ය. ඒ හැර පනස් වියට එළඹෙන හැම කෙනෙකුට ම වාර්ෂික ව පවුම් දහයක දීමනාවක් ගෙවිය යුතු ය."[284]**

පේන්ගේ අදහසට පටහැණි ව ඉඩම් හිමිකම පිළිබඳ දක්ෂිණාංශික ස්වතන්ත්‍රවාදීන් *(libertarians)* අතර එකල පැවති මතයට අනුව ස්වාභාවික සම්පත්, විශේෂයෙන් ම ඉඩම්, කිසිවකුට අයත් නො වන දේවල් වසයෙන් පවතින විට එහි අයිතිය අනිවාර්යයෙන් ම හිමි වන්නේ එම භූමිය මුලින් ම අත්පත් කරගත් තැනැත්තාට ය. ඒ සඳහා ඔහුට සමාජයේ අනෙකුත් සාමාජිකයන්ගේ අවසරයක් ලබාගැනීමට හෝ සමාජයට වන්දියක් ගෙවීමට හෝ අවශ්‍ය නො වේ. එහෙත් ඉන් වෙනස් ව වාම ස්වතන්ත්‍රවාදීන්ගේ මතය වූයේ හැම ස්වාභාවික භූමියක් ම පොදු දේපළක් වන බැවින් ඒවා පුද්ගලික අයිතියට නතු කර ගැනීම සාධාරණ වන්නේ ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදී මාර්ග ඔස්සේ මහජන කැමැත්ත ලබා ඇත්නම් සහ එයට හිලව්වට වන්දියක් පොදු අරමුදලකට ගෙවා ඇත්නම් පමණක් බව යි.[285]

සාර්වත්‍රික මූලික දීමනාව සාර්වත්‍රික හෙවත් විශ්වීය ආදායමක් ලෙස හඳුන්වනු ලබන්නේ වයස අවුරුදු 18 ට වැඩි රැකියා කරන නො කරන ස්ත්‍රී පුරුෂ සැම කෙනෙකුට ම එම දීමනාව ගෙවීමට යෝජනා කරන බැවිනි. මෙහි දී "මූලික" යන පදය වැරදි වැටහීම්වලට හේතු විය හැකි ය. එහෙත් ඉන් අදහස් වන්නේ යමෙකු ජීවත් වන සමාජය තුළ ආන්තික තත්වයන් යටතේ වුව එදිනෙදා දිවිය යන්තමින් හෝ

283 වර්තමාන අගය අනුව මෙය ආසන්න වශයෙන් පවුම් 1,800 ක් පමණ වේ

284 T. Paine ([1795] 2005), 'Agrarian justice', in Common Sense and Other Writings. New York: Barnes & Noble, p. 334.

285 Guy Standing (2017) Basic Income and How We Can Make it Happen, London: Pelican, UK KE' p36

ගත කිරීමට ප්‍රමාණවත් වන ආදායමක් යන්න යි. එහි අරමුණ හැම කෙනෙකුගේ ම මූලික ආර්ථික සුරක්ෂිතභාවය සහතික කිරීම මිස ඔහුට හෝ ඇයට පරිපූර්ණ ආදායමක් හෝ ධනවත්කමක් ළඟා කර දීම නො වේ.

මූලික ආර්ථික සුරක්ෂිතභාවය යනු කුමක් ද යන්න තීරණය කිරීම ද තරමක අභියෝගයකි, නමුත් විචාර බුද්ධියට අනුව එය තේරුම් ගැනීම අපහසු නො විය යුතු ය. අවම වසයෙන් දිනපතා ආහාරයක් ලබා ගැනීම, ජීවත් විය හැකි නිවහනක් පවත්වා ගැනීම, එදිනෙදා ගමනාගමනය සඳහා අවශ්‍ය වියහියදම් පියවා ගැනීමට තරම් ආදායමක් ලබා ගැනීමට හැකි වීම මූලික ආර්ථික සුරක්ෂිතභාවය යන්නෙන් අදහස් වේ. මූලික ආදායමක් වෙනුවෙන් පෙනී සිටින බොහෝ දෙනා විශ්වාස කරන්නේ එය 'අයිතියක්' ලෙස ඉටු විය යුතු බව යි. ඉන් අදහස් කරන්නේ එය ලබන්නාගේ අභිමතය පරිදි වුව ද අත්හිටුවිය හැකි දෙයක් නො වන බවයි. සාර්වත්‍රික මූලික ආදායමක් ලැබීම හැම කෙනෙකුගේ ම 'සමාජීය සහභාගිත්වය' සහතික කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතු ය. ඒ මඟින් සමාන තත්වයක් ඇති පුරවැසියන් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී ව සමාජීය කටයුතුවලට දායකවීමට හා මැදිහත් වීමට අවශ්‍ය මූලික සම්පත් ශක්‍යතාව හැම කෙනෙකුට ම ලැබෙනු ඇත.

සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම සාධාරණීකරණය කිරීමට අද යොදා ගන්නා ඇතැම් ආචාර ධර්මීය හා සදාචාරාත්මක හේතු ද ඉහත කී පේනියානු මූලධර්මය අනුව ම පැහැදිලි කළ හැකි ය. දරිද්‍රතාව සහ සමාජ විෂමතාව අවම කිරීමට දැනට යොදා ගන්නා ක්‍රමවලට වඩා සාර්වත්‍රික මූලික ආදායම බෙහෙවින් ඵලදායක විය හැකි ය. එසේ වුව ද ආචාර්ය ගයි ස්ටෑන්ඩින්ග් පෙන්වා දෙන අන්දමට සාර්වත්‍රික මූලික ආදායමක් හඳුන්වා දීම ප්‍රථම කොට ම සැලකිය යුත්තේ සමාජ යුක්තිය පිළිබඳ කාරණයක් ලෙස ය. අප සියලු දෙනා ම සතු ධනය හා ආදායම අපට උරුම වන්නේ අපේ ම ප්‍රයත්නවලට වඩා අපට පෙර සිටි බොහෝ පරම්පරාවල ප්‍රයත්න සහ

ජයග්‍රහණ නිසා ය. සරල ව කල්පනා කළ හොත් කිසියම් ම ගෙවීමක් නොකර සුළුතරයක් විසින් යමකට හිමිකම් කීම අප 'පුද්ගලික උරුමය' යනුවෙන් පිළිගන්නේ නම් 'සමාජ උරුමය' යනුවෙන් ද මූලධර්මයක් තිබිය යුතු බව ද අප පිළිගත යුතු ය.[286]

'පොදු දේපළ වසයෙන් හැඳින්වෙන පොදුවේ සමාජය සතු ස්වාභාවික හා සමාජීය සම්පත් සහ පොදු පහසුකම් ඇත්තේ ය' යන්න ගැන අප අතර මතභේදයක් නැත. එහෙත් ඉතිහාසයේ කිසියම් කලක අනෙක් අය ලද පමණින් සතුටු වෙන අතරතුර, වරප්‍රසාද ලත් අතළොස්සක් විසින් පොදු අයිතිය යටතේ පැවති දේපළ කොල්ල කා ඇති බව ද අප පිළිගත යුතු ය. නො එසේ වී නම් පමණට වඩා ඉඩකඩම් සහ වත්කම් ඇති කොටසක් බිහි වීමට ක්‍රමයක් නැත. ඒ අනුව බැලූ විට එමගින් වාසි සලසා ගත් කොල්ලකාරී අතළොස්ස සහ ඔවුන්ගේ උරුමක්කාර පොල්මඃක්කාර සියල්ලෝ ම පොදු ජනතාවට සිදු කළ එම පාඩුවට හිලව් වීම සඳහා නො කඩවා බිම් කුලිය ගෙවිය යුතු ය. අප පසුගිය පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක් කළ තෝමස් පිකෙටිගේ අනුක්‍රමයෙන් වැඩි වෙන වත්කම් බද්ද පිළිබඳ යෝජනාව එයට එක පිළිතුරකි. එක්තරා ආකාරයකට බැලුවොත් සැමට සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම යනු ඒ බිම් කුලිය එක සමාන ව සැමට බෙදා දීමකි.

ඇමෙරිකාවේ ඇලස්කා ජනපදයේ ඇති ඇලස්කා ස්ථිර අරමුදලෙන් *(Alaska Permanent Fund)* ජනපද වැසියන්ට ලබා දෙන වාර්ෂික දීමනාව කිසියම් දුරකට ඉහත සඳහන් බිම් කුලිය පිළිබඳ ප්‍රතිපත්තියට අනුරූප ව ගෙවනු ලබන්නකි. ඇලස්කා ජනපද ව්‍යවස්ථාවේ නව වැනි වගන්තියට අනුව ඇලස්කාවේ භූ සම්පත්වල අයිතිය පොදුවේ ජනපද වැසියන් සතු ය. ඛනිජ තෙල්වලින් අතිශයින් පොහොසත් ඇලස්කාවේ තෙල් ළිං කණින ඇමෙරිකානු සමාගම් තමන් නිස්සාරණය කර ගන්නා තෙල්වලින් එන ආදායමෙන්

286 Guy Standing (2020) Battling Eight Giants: Basic Income Now. London: I.B. Tauris, , p.3

ගිවිස ගත් කොටසක් ඛනිජ හිමිකම් ගාස්තු ලෙස ඇලස්කා ස්ථිර අරමුදලට ගෙවිය යුතු ය. 2019 වසරේ දී එම අරමුදලේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 64 ක් විය. වසරකට වරක් සිසිරයේ දී ඇලස්කා ජනපදයේ පදිංචි හැම පුරුෂයෙකුට ම, ස්ත්‍රියකට ම සහ ළමයෙකුට ම එම අරමුදලින් ඩොලර් 1000 සිට 2000 දක්වා වූ දීමනාවක් ගෙවනු ලැබේ.[287] එහෙත් අනෙකුත් ජනපදවල භූගත පොදු දේපළ වසයෙන් පවතින ගල් අඟුරු සහ ඛනිජ තෙල් සඳහා පෞද්ගලික සමාගම් එවැනි පොදු හිමිකම් ගාස්තු නො ගෙවයි. ඛනිජ ඉන්ධන වැනි පැරණි බල ශක්ති ක්ෂේත්‍ර සඳහා පමණක් නො ව ජල විදුලිය, සුළං සහ සූර්ය බල විදුලිය වැනි පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධයෙන් ද එම ප්‍රතිපත්තිය මත පිහිටා පොදු දේපළ භාවිත කොට ව්‍යාපාරිකයන් විසින් උපයා ගන්නා ලාභයෙන් මහජන හිමිකම් පංගුව අය කර ගත හැකි ය. සාර්වත්‍රික මූලික ආදායම් දීමනාවකට අනුරූප ව ඇමෙරිකා එක්සත් ජනපදයේ දැනට ක්‍රියාත්මක වන එකම වැඩපිළිවෙළ එකී ඇලස්කා ස්ථිර අරමුදලයි.

සැමට සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම සම්බන්ධයෙන් ආචාර්ය ස්ටැන්ඩින්ග් පෙන්වා දෙන දෙවැනි වැදගත් ආචාර ධර්මීය කාරණය වන්නේ ලොකු දීමනාවක් නො වුණත් සාර්වත්‍රික මූලික ආදායම පෙර නොවූ විරූ ලෙස පුද්ගල සහ ප්‍රජා ස්වාධීනත්වය තහවුරු කරලීමට ආධාරකයක් වීම යි. එය ලබන ස්ත්‍රී පුරුෂයන්ට තමන් පීඩනයට ලක් කරන සේව්‍යයන්ට සහ අනුන්ගෙන් යැපීමට සිදුවීම නිසාම ඉවසිය යුතු වද බන්ධනවලට ද 'බැහැ' යයි පවසන්නට හැකි ආත්ම ශක්තියක් ඇති වෙයි. දේශපාලන නිදහස අතින් බැලුව ද සිය අසරණකම නිසා ම බලගතු අයගේ කැමැත්තට අනුව කටයුතු කරන්නට සිදු වී ඇති අයට ස්වාධීන තීරණ ගැනීමට සාර්වත්‍රික මූලික ආදායම පිහිට වෙයි. ඒ අනුව දේශපාලන අවනත භාවය නො පෙන්වුව හොත් තමා සමෘද්ධි දීමනා ලැයිස්තුවෙන් ඉවත් කරනු ඇතැ'යි යන බියෙන් තීරණ ගැනීමට කිසිවෙකුට තවදුරටත් අවශ්‍ය නො වේ.

287 Annie Lowrey (2018) Give People Money, New York: Crown Publishers, p. 205 KE

සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව වයස 18ට වැඩි හැම කෙනෙකුට ම ලැබෙන දීමනාවකි. වයස සපිරුණු සැමට එක සමාන ව ලැබෙන බැවින් සමෘද්ධිය මෙන් එය දේශපාලනීකරණය කිරීමට ඉඩක් නැත. සමෘද්ධි වැඩ සටහන ඇරඹී වසර 18ක් ගත වූ පසු ද සමෘද්ධි ලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් දේශපාලන බලපෑම වෙනස් වී නැති බව කැලණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන නදීකා බණ්ඩාර පෙන්වා දෙයි. ඒ සම්බන්ධයෙන් 2016 දී පැවැත් වූ ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී ඇය සමෘද්ධි ඉලක්ක පවුල් තේරීමේ දී සිදු වන අයථා බලපෑම් ගැන විමසූ විට එක් සමෘද්ධි නිලධාරියෙක් මෙසේ පැවසී ය. "අපට කරන්න දෙයක් නැහැ. සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහනට සමෘද්ධිලාභීන් තෝරන්න කියලා ආණ්ඩුව අපට කිව්වහාම තෝරන්න ඕන අයගේ ලැයිස්තුව පළාතේ ආණ්ඩු පක්ෂ දේශපාලකයා අපට එවනවා. ලැයිස්තු හදන්නේ දේශපාලන පක්ෂයට ඇති හිතවත්කම් උඩ. ඒ ලැයිස්තුවල දෙන්න ඕන අයත් ඉන්නවා; නැති අයත් ඉන්නවා. හුඟක් වෙලාවට වැඩි ම සුදුසුකම් තියෙන අය ලැයිස්තුවල නැහැ. ඒත් අපට කරන්න දෙයක් නැහැ. සමහර වෙලාවලට අපි පුද්ගලික ව ඒව දේශපාලනඥයාට කියනවා. ඒත් ඒව හැම තිස්සෙ ම හරි යන්නෙ නෑ"[288] මෙකී සමෘද්ධි නිලධාරීන් පවත්වන්නේ ද දේශපාලන අනුග්‍රහය මතය. නදීකා බණ්ඩාර පෙන්වා දෙන අන්දමට මේ අනුග්‍රහ දේශපාලනයේ අනිටු බලපෑම අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිලිතිගොල්ලෑවේ සිය ආබාධිත පුත්‍රයා රැක බලා ගෙන ජීවත් වන 68 හැවිරිදි මහලු වැන්දඹු ස්ත්‍රියක් මෙසේ තහවුරු කළා ය. "අපිට ජීවත් වෙන්න තරම් ආදායමක් නැහැ. ඒත් මුල ඉඳල ම අපිව සමෘද්ධියට ගත්තෙ නැහැ. ඒකට හේතුව අපි විරුද්ධ පක්ෂෙයි කියල අවුරුදු ගණනක් තිස්සෙ හංවඩු ගැහිල තිබුණ නිසයි. කිහිප සැරයක් ම අපි අභියාචනා දැම්මා. ඒත් වැඩක් වුණේ නැහැ. මට

288 N.D.M. Bandara (2016) Causes and Consequences of Poverty Targeting Failures: The Case of the Samurdhi Program in Sri Lanka, Asian Politics & Policy—Volume 8, Issue 2, Hoboken, NJ: Wiley, p. 295

හිතෙන්නෙ සමෘද්ධියෙන් විතරක් නෙවෙයි ආණ්ඩුවෙ ආධාර ලැබෙන හැම එකකින් ම අපිව අයින් කරලා."[289] දිළිඳුකම යනු හුදෙක් එදිනෙදා මූලික වියදමට අවශ්‍ය මුදල් නැති වීම පමණක් නො ව ඒ නිසා දීනභාවයට පත්වීමට සිදුවීම ද වේ. එහෙත් සාර්වත්‍රික මූලික ආදායම ලබා ගැනීමට සමෘද්ධිය ලබා ගැනීමට මෙන් බලයේ සිටින දේශපාලනඥයන්ට කන්නලව් කිරීමට හා ගැතිකම් කිරීමට සිදු නො වේ. වෙනත් අයුරකින් කිව හොත් සමෘද්ධි වැඩපිළිවෙළ මෙන් ලබන්නාගේ නිදහස සීමා කරන බලපෑම් හා සසඳන විට සැමට මූලික ආදායමක් සහතික කිරීම මඟින් ඇති කරන විමුක්තිදායක වටිනාකම එම ආදායමේ මූල්‍ය වටිනාකමට වඩා බෙහෙවින් වැඩි ය.

තුන්වැනි ආචාර ධර්මීය කාරණය වන්නේ පවුල්වල සාමාජිකයන්ටත් තමන් හා ජීවත් වන ප්‍රජා කණ්ඩායමටත් ඇතුළු ව ලැබෙන හැම කෙනෙකුට ම සාර්වත්‍රික මූලික ආදායම නිසා ඇතිවෙන සුරක්ෂිත භාවය යි. සුරක්ෂිත භාවය යනු පොදු යහපත පිළිබඳ සාධකයකි. ඔබට සුරක්ෂිත භාවය තිබීම නිසා මගේ සුරක්ෂිත භාවය අඩු වන්නේ නැත. අනෙක් අයට ලැබෙන සුරක්ෂිත භාවය සියල්ලන්ගේ ම සුරක්ෂිත භාවය ද තහවුරු කිරීමට හේතු වෙයි. පමණට වඩා සුරක්ෂිත භාවය තිබීම අප්‍රවේසම්කාරී වීමට හේතුවක් විය හැකි වුව ද අත්‍යවශ්‍ය මූලික සුරක්ෂිත භාවය නොමැති වීම ස්වාධීන තීරණ ගැනීම හා දේශපාලන සහභාගිත්වය මොට කිරීමටත් හේතු විය හැකි ය.

සාර්වත්‍රික මූලික ආදායම ගෙවනු ලබන්නේ එක් එක් පුද්ගලයාට වන නමුත් එය තනි පුද්ගලවාදී දීමනාවක් නො වේ. සමාජය පුරා සාර්වත්‍රික හා එක සමාන වීම නිසා ම එය බදු ගෙවීමේ දී ලැබෙන විශේෂ සහන හෝ සමෘද්ධිය වැනි සමාජ සේවා දීමනා මෙන් එක් එක් අයගේ සමාජ තත්වය මත ලබා දෙන දීමනාවක් නො වේ. එනිසා "උන් සහ අපි" වැනි බෙදීමකින් තොර ව සියල්ලන් ම එක සමාන ව අගය කරන බව එමඟින් තහවුරු වේ. සමානයන් ලෙස

289 Ibid. p. 295

එක් එක් පුද්ගලයාට වෙන වෙන ම ගෙවනු ලැබුවත් සාර්වත්‍රික මූලික ආදායමක ප්‍රතිලාභ පවුලේ සාමාජිකයන් අතර අන්තර් සම්බන්ධතාව, ප්‍රජා සංසක්තිය *(community coherence)* හෙවත් එකමුතුකම ශක්තිමත් කිරීමට දායක වේ.

අනෙක් අතට සාර්වත්‍රික මූලික ආදායම සමාජ සහයෝගිතාව සහ මානව සම්බන්ධතා ශක්තිමත් කිරීමට ද දායක වෙයි. හැම දෙනා අතරම එක සමාන ව බෙදී යන එවැනි පොදු ආදායමකින් හැඟවෙන්නේ හැම දෙනෙක් ම සාමූහික ඉතිහාසයක ඵලයක් වසයෙන් ගොඩ නැගුණු පොදු ජාතික ධනයක ප්‍රතිඵල එක සමාන ව භුක්ති විඳින එකම ප්‍රජාවක කොටස්කරුවන් වන බව යි. දශක කිහිපයක් තිස්සේ නවලිබරල්වාදය විසින් උත්කර්ෂණයට නංවන ලද තරගකාරිත්වය සහ අසීමිත ස්වාර්ථකාමිත්වය විසින් සෝදා පාලු කරන ලද සද්භාවී සමාජ සහයෝගිතාව නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා එවැනි සාමූහික සමානාත්මතාවක් අත්‍යවශ්‍ය ය. මේ සාධකය සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ඉතා වැදගත් ය. ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණය පවත්වා ගෙන යෑමට නම් සමාජයක සාමාජිකයන් අතර සැලකිය යුතු සමානාත්මතාවක් තිබිය යුතු ය. වසර පහකට වරක් ඡන්ද බලයෙන් පමණක් එක සමානයන් බවට පත් වෙනවාට වඩා සියල්ලන්ට ම එක සමාන අගයකින් නිතිපතා සලකන සාර්වත්‍රික මූලික දීමනාව ඡන්ද බලයට වඩා රට වැසියන් අතර දේශපාලන සමානාත්මතාව මූර්තිමත් කරයි.

සෑම රටවැසියෙකුට ම සාර්වත්‍රික මූලික ආදායමක් *(universal Basic Income)* ලෙස ලැබෙන මාසික දීමනාවක් ඔබටත් ලැබෙතැ 'යි සිතන්න. හැම කෙනෙකුට මෙන් ම එම මුදල ඔබ ජීවත් වන තුරු ඔබේ බැංකු ගිණුමට රජයෙන් ගෙවිය යුතු වේ. එම මුදලින් කාමරයක් කුලියට ගැනීමට සහ මාසය තුළ ආහාර, බස් ගාස්තු ආදී ජීවන වියදම් ආවරණය කිරීම කළ හැකි ය. ඔබට රැකියාවක් සොයා ගැනීමට නො හැකි නම් හෝ සහකරුගේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් අත් මිදී නිදහස් වීමට අවශ්‍ය නම් හෝ එම දීමනාව නිසැක ව ම ඔබ ව

අසරණ භාවයෙන් ගලවා ගනු ඇත. ශ්‍රී ලංකාවේ පවුල්වලින් 25.8% ගෘහ මූලිකයා වන්නේ ස්ත්‍රිය වන බැවින් සාර්වත්‍රික මූලික ආදායම ඔවුන්ට සැලකිය යුතු සහනයක් වනු ඇත.

නමුත් ඒ සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව අත මිට දිග හැර වියදම් කරමින් සෙල්ලක්කාර ජීවිතයක් ගත කිරීමට ප්‍රමාණවත් දීමනාවක් නො වේ. එහෙත් එයට වියදම් කිරීමේ කොන්දේසි නැත. ඔබට අවශ්‍ය ඕනෑ ම දෙයක් ඒ මුදලින් කළ හැකි ය. ඔබේ බිල් ගෙවීමට ඔබට එය භාවිත කළ හැකි ය. ඔබට කැමති පාඨමාලාවකට වැඩිදුර අධ්‍යාපනයකට එය වියදම් කළ හැකි ය, නැත හොත් නිවසක් ඉදිකිරීම සඳහා ඉතිරි කර ගත හැකි ය. නොඑසේනම් එය සිගරට් සහ මත්පැන් සඳහා වුව ද වියදම් කළ හැකි ය. එහෙමත් නො වේ නම් ඔබේ රැකියාවෙන් ඉවත් වී කලා කටයුත්තක නිරත වීමට, පුණ්‍ය කටයුතු සඳහා කැපවීමට හෝ රෝගී දරුවෙකු රැක බලා ගැනීමට ඔබට එම දීමනාව භාවිත කළ හැකි ය. සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව ලබා ගැනීම සඳහා කිසිවක් ඉටු කිරීමට හෝ කිසිදු කොන්දේසියකට යට වීමට අවශ්‍ය නො වේ. ඔබ ජීවත් වන තාක් කල් එය සෑම මසක ම, ඔබට ලැබෙනු ඇත. මාසයෙන් මාසයට එය ලබා ගැනීම සඳහා ඔබට නිශ්චිත සුදුසුකමක් තිබීම, දරුවෙකු සිටීම, නිවසක් තිබීම හෝ කිසිවෙකුගෙන් චරිත සහතිකයක් ලබා ගැනීම අවශ්‍ය නො වේ. ඔබේ ප්‍රජාවේ අනෙක් සෑම පුද්ගලයෙකුට ම මෙන් ඔබටත් සෑම මසක ම සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව ලැබිය යුතු ය.

සාර්වත්‍රික මූලික ආදායම පිළිබඳ නියමු ව්‍යාපෘති ජර්මනිය, නෙදර්ලන්තය, ෆින්ලන්තය, කැනඩාව සහ කෙන්යාව යන රටවල ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉන්දියාව ද නියමු ව්‍යාපෘති කිහිපයක් අත්හදා බැලීය. ඇතැම් දේශපාලනඥයන් සාර්වත්‍රික මූලික ආදායම කැලිෆෝනියා ජනපදය සඳහා සම්මත කර ගැනීමට උත්සාහ දරන අතර, ස්විට්සර්ලන්ත ජනමත විචාරණයක මාතෘකාව බවට ද එය පත් විය. එම ජනමත විචාරණයෙන් යෝජනාව ප්‍රතික්ෂේප වූ

නමුත් යෝජනාවට අනුග්‍රහය දැක් වූ ප්‍රමාණය බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් වැඩි විය.

2017 ප්‍රංශ ජනාධිපතිවරණයට සමාජවාදී පක්ෂයෙන් ඉදිරිපත් වූ බෙනුවා හාමොන් තරුණ තරුණියන්ට මසකට යුරෝ 600 ක කොන්දේසි විරහිතව මූලික ආදායමක් ලබා දීමෙන් ආරම්භ කොට අනතුරුව එය හැම පුරවැසියෙකුට ම මසකට යුරෝ 750 ක් ලැබෙන සේ එම ආදායම වැඩි කිරීමට පොරොන්දු විය.

ඇනී ලෝව්රි ඇගේ "*Give People Money*" නමැති කෘතියේ පෙන්වා දෙන අන්දමට තාක්ෂණික දියුණුව නිසා අනාගතයේ වැඩි විය හැකි විරැකියාවට සාර්වත්‍රික මූලික ආදායම සහනයක් විය හැකි ය. තාක්ෂණික දියුණුව සමඟ වැඩි කලක් නො ගොස් රොබෝවරු අපගේ බොහෝ රැකියා කටයුතු භාර ගනු ඇත. ලෝව්රි පෙන්වා දෙන පරිදි ඔක්ස්ෆර්ඩ් සරසවියේ ආර්ථික විද්‍යාඥයින් විසින් ගණන් බලා ඇති අන්දමට මිලියන ගණනක් වූ සුදුකරපටි රැකියා ද ඇතුළු ව රැකියාවලින් අඩක් පමණ දියුණු තාක්ෂණික රොබෝවරුන් ආදේශ කිරීමේ හේතුවෙන් අතුරුදහන් වීමට ඉඩ ඇත. ට්‍රක් රථ රියදුරන්, ගබඩා ඇසුරුම්කරුවන්, ඖෂධවේදීන්, ගණකාධිකාරීවරුන්, නීති සහායකයින්, මුදල් අයකැමියන්, පරිවර්තකයන්, රෝග විනිශ්චයකරුවන්, කොටස් තැරැව්කරුවන් ආදී විවිධාකාර රැකියාවල නියුතු වූ අයට මේ තත්වයට මුහුණ දීමට සිදු වනු ඇති බවට විශ්ලේෂකයෝ අනතුරු අඟවති.[290] මෝටර් රථ කර්මාන්තයේ දැවැන්තයන් තිදෙනා ලෙස සැලකෙන ජී එම්, ෆෝඩ් සහ ක්‍රිස්ලර් යන ඇමෙරිකානු සමාගම් තුන 1950 ගණන්වල දී මිචිගන් නගරයේ පමණක් 400,000 කට අධික පිරිසක් සේවයේ යොදවා තිබුණි. එහෙත් මෝටර් රථ නිෂ්පාදනය ස්වයංක්‍රීයකරණයට *(automation)* ලක් වීම නිසා අද වැඩි ම ප්‍රමාණයක් මෝටර් රථ නිපදවන එම නිෂ්පාදන සමාගම් තුනේ ම නිරත වන සේවක සංඛ්‍යාව 160,000 ක් දක්වා අඩු වී තිබේ. එක්සත් ජනපදයේ කළ සමීක්ෂණයකින් අනාවරණය වූ පරිදි

290 Annie Lowrey (2018) Give People Money, New York: Crown Publishers, p. 25

ස්වයංක්‍රියාකාරි වාහන හඳුන්වා දීමෙන් පසු ඇමෙරිකානු රැකියා මිලියන 2.1 සිට මිලියන 3.1 දක්වා ප්‍රමාණයක් අහෝසි වනු ඇතැ'යි එකල ජනාධිපති ව සිටි බැරැක් ඔබාමා ප්‍රකාශ කළේ ය. මේ කාරණය ම සිය සමු ගැනීමේ කථාවේ දී හෙතෙම නැවත මෙසේ අවධාරණය කළේ ය. "ආර්ථිකය අස්ථාවර කිරීමේ මීළඟ රැල්ල පැමිණෙන්නේ මුහුදෙන් එතෙර සිට නො වේ. එය පැමිණෙන්නේ ස්වයංක්‍රියාකරණය සිදුවීමේ වේගය නිර්දය ලෙස වැඩි වීම හේතු කොට බොහෝ මධ්‍යම පාන්තික රැකියා යල්පැන යෑම නිසාය."[291]

සාර්වත්‍රික මූලික ආදායම් දීමනාවකට පක්ෂ තවත් ඇමෙරිකානු තර්කයක් පදනම් ව ඇත්තේ හෙට දවසේ ඇති විය හැකි ගැටලුවලට වඩා වර්තමානයේ ඇති ගැටලු මත යි. ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපදය සහ අනෙකුත් ඉහළ ආදායම් ලබන රටවල් දැනටමත් මුහුණ දී සිටින පුළුල් ආදායම් අසමානතා පරතරය සහ වැටුප් එක තැන පල් වීම තරමක් දුරට සමනය කිරීමට සාර්වත්‍රික මූලික ආදායමට හැකි වෙතැ'යි අපේක්ෂා කෙරේ. ඇමෙරිකානු වැඩ කරන මැද පන්තියේ ආර්ථිකය හැකිළෙමින් තිබෙන අතර ඇමෙරිකාවේ ආර්ථික වර්ධනය යනු ධනකුවේරයන්ගේ තැරැව්කාර ගිණුම්වලට ආධාර කිරීම මිස කම්කරුවන්ගේ පසුම්බි පිරවීම නො වේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉහළතම ආදායම් ලබන සියයට 20 හැරෙන විට අනෙක් සියලු පවුල් සඳහා සාර්වත්‍රික මූලික ආදායම සෘජු ආධාරකයක් ලෙස යොදා ගත යුතුයැ'යි ඇතැම් යෝජකයෝ තර්ක කරති. එමඟින් කම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව වැඩි වන අතර, සේවා යෝජකයන්ට වැටුප් වැඩි කිරීමට හා වැඩි ප්‍රතිලාභ ලබා දීමට බල කෙරෙනු ඇත. ඔබට මසකට ඩොලර් 1,000 ක් ලැබීම සහතික කළ විට ඔබ පැයකට ඩොලර් 7.25 ක් වැනි සුළු මුදලකට රැකියාවක් කළ යුත්තේ ඇයි?[292] "අතිමහත් ධනයකින් ආඪ්‍ය වූ කාලයක, කිසිවෙකුත් දරිද්‍රවතාවයේ ජීවත් නො විය යුතු ය.

291 ibid, p. 29

292 ibid, p. 14

මධ්‍යම පංතිය එක තැන පල් වීමකට හෝ බලාපොරොත්තු සුන් වූ අනාගතයකට යටත් නො විය යුතු ය" යනුවෙන් සාර්වත්‍රික මූලික ආදායම පිළිබඳ අදහස ප්‍රවර්ධනය කරන තවත් ඇමෙරිකානු චින්තන පර්ෂදයක් වන *Economic Security Project (*ආර්ථික ආරක්ෂක ව්‍යාපෘතිය*)* තර්ක කරයි.[293]

මූලික ආදායම් දීමනාවක් ලබාගැනීමේ අවශ්‍යතාව වඩාත් ම දැනෙන්නේ අඩු ආදායම් ලැබෙන රටවල වෙසෙන වැසියන්ට ය. එම රටවල බොහෝ රජයන් දරිද්‍රතා අනුපාතය අඩු කිරීම සඳහා දුප්පතුන්ට මුදල් ලබාදෙන නමුත් දේශපාලනීකරණය වීම නිසා එම වැඩ සටහන්වලින් අභිමත ප්‍රතිඵල ලබා ගත නො හැකි ය. සමෘද්ධි වැඩසටහන ඵලදායක වී නම් සමෘද්ධිලාභීන්ගේ සංඛ්‍යාව එය ආරම්භ කළ 1995 සිට අනුක්‍රමයෙන් අඩු විය යුතු වූ නමුත් එය එසේ නො වී ය. ලෝක බැංකුව විසින් නිර්ණය කරන අත්‍යන්ත දිළිඳුකම නැති කිරීම යනු ණයගැතිකම නැති කිරීම, රැකියා අවස්ථා නො ලැබීම, සෞඛ්‍ය පහසුකම් නැති වීම, ආත්ම විශ්වාසය සහ නිදහස නැති වීම සහ අන්තර්ග්‍රහනීය *(inclusive)* නො වීම වැනි සමාජ අවහිරතා නැති කිරීම නො වේ. අත්‍යන්ත දිළිඳුකම යනු ඉතා පහළ සමාජ තලයක පිහිටි දෙයකි. එම තලයේ ජීවත් වන කෙනෙකු හාල් කැඳ කෝප්පයක් බී අල්ලට දමා ගත් සීනි ටිකක් ලෙව කා කහට කෝප්පයක් බොන වර්ගයේ අයයි. බයිසිකලයක් මිලට ගැනීමට, උසස් අධ්‍යාපනයට වියදම් කිරීමට, නිවසක් තනා ගැනීමට හැකියාවක් ඔවුන්ට නො මැත. සාර්වත්‍රික මූලික ආදායමක් සහතික කිරීම යනු අත්‍යන්ත දරිද්‍රතාව තුරන් කිරීම එල්ල කරගත් වැඩ සටහනක් නො ව සමාජ සමානාත්මතාව, පොදු අයිතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය සඵල කර ගැනීමට හැම ස්ත්‍රියක් සහ පුරුෂයෙක් ම එක සමාන ව සබල ගැන්වීම අරමුණු කරගත් වැඩපිළිවෙළකි.

293 https://www.economicsecurityproject.org/guaranteedincome/ - Retrieved on 21 July 2021

සාර්වත්‍රික මූලික ආදායම පිළිබඳ යෝජනාවට විපක්ෂ අයගේ මූලික ප්‍රශ්නයක් වන්නේ කිසිදු වැඩක් නො කොට උත්පත්තියෙන් ම ලැබෙන හිමිකමක් ලෙස දුප්පත් පොහොසත් හැම කෙනෙකුට ම එවැනි දීමනාවක් දිය යුත්තේ මන්ද යන්න යි. ඇතැම් රටවල රජ පවුලේ සාමාජිකයන්ට උපතින් ම දීමනාවක් හිමි වන නමුත් අනෙකුත් රට වැසියන්ට එවැනි දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නැත. සාර්වත්‍රික මූලික ආදායම යනු දරිද්‍රතාව නැති කිරීමට පොහොසතුන්ගෙන් දුප්පතුන්ට ධනය අත්පත් කර දෙන ව්‍යායාමයක් නො වේ. දරිද්‍රතාව නැති කිරීමට එය ඇතිවෙන හේතු ඉවත් කළ යුතු ය. සාර්වත්‍රික මූලික ආදායම යනු අප සියල්ලන්ගේ ම පොදු අයිතිය වෙනුවෙන් අප සියලු දෙනාට වෙන වෙනම ලැබෙන ලාභාංශය යි. එහි ඇති විශේෂත්වය පොදු අයිතිය සම්බන්ධයෙන් සියල්ලන්ට ම ඇත්තේ එක සමාන කොටස් ප්‍රමාණයක් වීම යි. වත්කම් ඇති නැති හැම කෙනෙකුට ම එය එක සමාන ව අයිතිය. අනෙක් අතට බොහෝ දරිද්‍රතා වැඩ සටහන්වල මෙන් පුද්ගලයන් තෝරා බේරා දීමනා ගෙවීමක් සිදු නො වන බැවින් සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව දේශපාලනීකරණය කිරීමට සහ ඒ සඳහා දැවැන්ත ගනුදෙනු යන්ත්‍රණයක් නඩත්තු කිරීමට අවකාශයක් නො ලැබේ. සාර්වත්‍රික මූලික ආදායම් හිමි අය තදනන්තර ව පොහොසතුන් බවට පත් වුව ද ඔවුන්ගේ දීමනාව නො වෙනස් ව පවතින්නේ ය. එහෙත් එයට හිලව්වට වැඩිවන ආදායමෙන් සහ වත්කමෙන් එම දීමනාව පවත්වා ගෙන යෑමට දායක වීම පිණිස වැඩි වූ පොහොසත්කම අනුව වැඩියෙන් බදු ගෙවීමට ඔහුට සිදු වේ.

දුප්පතුන්ට නිකම් ම මුදල් ලබා දීම කම්මැළියන් බිහි කරන වැඩක් බවට සාම්ප්‍රදායික විවේචන එමටය. එහෙත් ප්‍රමුඛ පෙළේ අර්ථ ශාස්ත්‍රඥයන් කණ්ඩායමක් හොන්ඩියුරාස්, ඉන්දුනීසියාව, මොරොක්කෝව, මෙක්සිකෝව, නිකරගුවාව සහ පිලිපීනය යන රටවල දරිද්‍රතාවෙන් පෙළෙන්නන් වෙත මුදල් ලබා දෙන වැඩසටහන් අධ්‍යයනය කර බැලූ විට එසේ මුදල් ලැබීම නිසා ඔවුන්ගේ වැඩ කරන

පැය ගණනට හෝ වැඩ කිරීමට ඇති ප්‍රවණතාවට කිසිදු බලපෑමක් ඇති නො වන බව සොයා ගත් බව ඇනී ලෝව්රි උපුටා දක්වයි[294]. මුදල් ලබා දීමේ වැඩසටහන් සමහර අවස්ථාවල දී පිරිමින් වැඩ කළ ප්‍රමාණය ඉහළ නැංවීමට හේතු වූ බව ද එමගින් පෙන්වා දී තිබුණි. 2018 ලෝක සංවර්ධන වාර්තාව ඉදිරිපත් කරමින් සාර්වත්‍රික මූලික ආදායම ලබා දීම නිසා වැඩ කිරීම අඩු වූ බවක් තහවුරු ව නැති බව ලෝක බැංකුව පවා සඳහන් කළේ ය. ඇලස්කා ස්ථිර අරමුදල සම්බන්ධයෙන් කළ සමීක්ෂණයක දී තහවුරු වූ කරුණු අනුව අරමුදලේ ලාභාංශ ගෙවීම නිසා ජනපද වැසියන්ගේ අර්ධ කාලීන රැකියා අවස්ථා වැඩි වූ අතර සමස්තයක් ලෙස රැකියා නියුක්තිය ඉහළ ගොස් තිබුණි.[295] එහෙත් ඇතැම් මුදල් ලබන්නන් අඩුවෙන් වැඩ කළ බව සොයා ගත් තවත් සමීක්ෂණයකට අනුව ඊට හේතුව වූයේ ළමයින් සහ වයස්ගත වූවන් රැක බලා ගැනීමේ අවශ්‍යතාව තිබූ අය වැඩ අතහැර ගෙදර නතර වීම බවත් හෙළි විය.

නමුත් මිනිසුන් මුදල් නාස්ති කරන්නේ නැද්ද? ඔවුන්ට ලැබෙන මුදල මත්පැන්, මත් ද්‍රව්‍ය සහ සිගරැට් වැනි දේවලට වියදම් කර, අපේක්ෂිත පරිදි දරිද්‍රතාවෙන් ගැලවීමේ බලපෑම අඩු කරන්නේ නම් කුමක් කළ යුතු ද? නිකරගුවාවේ, රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ස්ත්‍රීන්ට මුදල් ලබා දෙන එවැනි එක් වැඩ සටහනක් සම්බන්ධයෙන් කනස්සල්ලට පත් වූයේ, මත්පැන් සඳහා වියදම් කිරීමට මුදල් රැගෙන භාර්යාවන් ආපසු එන තෙක් ස්වාමිපුරුෂයන් බලා සිටිනු ඇත යන විශ්වාසය නිසා ය. එහෙත්, ඊට පටහැණි සාක්ෂි ඕනෑ තරම් තිබෙන බව ලොව්රි පෙන්වා දෙයි. ලෝක බැංකුවේ පර්යේෂකයන් දෙදෙනෙක් මෑතක දී මෙවැනි මුදල් ආධාර වැඩසටහන් පිළිබඳ අධ්‍යයන 19 ක් විශ්ලේෂණය කර බැලූහ. මුදල් ලබාගත් අය ඒ මුදල මත්පැන් පරිභෝජනය සඳහා යොදා ගත් බවට කිසිදු සාක්ෂියක් සොයා ගැනීමට ඔවුන්ට නො හැකි විය. පේරු රටේ කළ එක්

294 Annie Lowrey (2018) Give People Money, New York: Crown Publishers, p. 95

295 I. Marinescu, 'No Strings Attached: The Behavioral Effects of U.S. Unconditional Cash Transfer Programs', New York: Roosevelt Institute, May 2018.

අධ්‍යයනයකින් හෙළි වූයේ ලැබුණු අතිරේක මුදල් නිසා ඉටි පන්දම්, චොකලට්, සිසිල් බීම සහ අවන්හල්වල ආහාර ගැනීම නිහතමානී ලෙස ඉහළ ගිය බවයි. එහෙත් එවැනි කුඩා ආස්වාදයක් විඳ ගැනීම සම්බන්ධයෙන් දුප්පතුන් සමග උරණ විය යුතු ද?

සාර්වත්‍රික මූලික ආදායම ගෙවීම සඳහා වියදම් වන මිල දරා ගත හැකි ද යන ප්‍රශ්නය කෙනෙකුට ගෙවන මුදල් ප්‍රමාණය සහ සමාජයේ මූල්‍ය ප්‍රමුඛතා මොනවා ද යන දෙ කරුණ මත තීරණය විය යුතු බව ගයි ස්ටැන්ඩින්ග් පවසයි. පවතින බෙහෙවින් සංකීර්ණ සහ ප්‍රතිගාමී බදු ක්‍රම කිසිවක් පූජනීය හෝ අනුල්ලංඝනීය ඒවා නො වේ. ජනාධිපති ධුරයට පත්වීමට බොහෝ කලකට පෙර 1999 නොවැම්බර් 9 වන දින, "ඩොට්කොම්" කොටස් වෙළඳපොළ උත්පාතය *(boom)* ඇති වූ අවස්ථාවේ දී සීඑන්එන් නාලිකාවේ වැඩ සටහනකට සහභාගී වෙමින් ඩොනල්ඩ් ට්‍රම්ප් එක් වරක් පමණක් අය කරන 14.25% ක ධන බද්දක් යෝජනා කළේ ය. එහි අදහස වූයේ එවකට ඩොලර් ට්‍රිලියන 5.7 ක් ව තිබූ එක්සත් ජනපදයේ ජාතික ණය අතුගා දැමීම යි. එමඟින් ණය සේවා සඳහා ගෙවීමට සිදුවන වියදම් ද අහෝසි කල හැකි බව ඔහු තර්ක කළේ ය.

බදු වැඩි කිරීම වර්ධනය අඩු කරයි යන සාමාන්‍ය මතයට පදනමක් නැත. දෙවන ලෝක යුධ සමයේ සහ ඉන් බොහෝ කලකට පසු ඇමරිකා එක්සත් ජනපදයේ සහ එක්සත් රාජධානියේ ආදායම් බදු අනුපාත ඉතා ඉහළින් තිබුණි. එය ඇමරිකා එක්සත් ජනපදයේ 82% ක් වූ අතර එක්සත් රාජධානියේ ආදායම් බදු අනුපාතය වර්තමාන අනුපාතවලට වඩා බෙහෙවින් වැඩි විය. රේගන් පරිපාලනය විසින් විශාල ලෙස අඩු කරන තෙක් එක්සත් ජනපදයේ ආදායම් බදු සඳහා 70% ක් තරම් ඉහළ අනුපාතයක් පැවතුණි. එහෙත් ආදායම් බදු අදට වඩා බෙහෙවින් වැඩි වූ අවධියේ එක්සත් ජනපදයේ ආර්ථික වර්ධනය ද නො කඩවා වැඩි විය. වැඩි ආදායම් බදු අනුපාතයක් අය වූ 1963-1976 අතර කාලය තුළ ඇමෙරිකා එක්සත් ජනපදයේ වාර්ෂික ආර්ථික වර්ධනය 1.7% කින් ඉහළ ගිය නමුත් අඩු ආදායම්

බදු අනුපාතයක් ක්‍රියාත්මක වූ 1980-2016 අතර වාර්ෂික ආර්ථික වර්ධනය 1.3% කට සීමා විය.[296] එම නිසා ආදායම් බදු වැඩිවන විට වර්ධන වේගය අඩු වෙතැ'යි යන්න නිවැරදි නො වේ.

හැම ඇමෙරිකානු පුරවැසියෙකුට ම සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම සෑහෙන වියදමක් වැය වන කටයුත්තකි. ඒ සඳහා මුදල් සපයා ගත යුතු ආකාරය සම්බන්ධයෙන් 2020 ඇමෙරිකානු ජනාධිපතිවරණය සඳහා ඩිමොක්‍රටික් පක්ෂයෙන් අපේක්ෂකත්වය ඉල්ලූ බර්නි සැන්ඩර්ස් සහ එළිසබෙත් වොරන් යන සෙනෙට් සභිකයන්ගේ මතය වූයේ සාර්වත්‍රික මූලික ආදායම ලබා දීම පිණිස අවශ්‍ය අරමුදල් ප්‍රාමාණික ව අනුක්‍රමයෙන් වැඩිවන ආදායම් බදු සහ / හෝ වත්කම් බදු මත ධනවතුන්ගෙන් අය කර ගත යුතු බවයි.

එම අදහස එක් වැදගත් කාරණයක් මතු කරයි. එනම් ආදායම් බදු අය කිරීම මඟින් ධනය නැවත බෙදා හැරීම නො වැළැක්විය හැකි ලෙස ම පවතින බදු ක්‍රමය ප්‍රතිශෝධනය කිරීමේ හැකියාව සමඟ බැඳී ඇති අතර එය ඉතා දුෂ්කර හා සංකීර්ණ විෂය කරුණක් වන බවයි. බරපතළ බදු ප්‍රතිසංස්කරණ සඳහා වන දේශපාලන බාධක ඉතා ඉහළ ය. නමුත් බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය නො කිරීමේ ප්‍රතිවිපාක බොහෝ විට ඊටත් වඩා වැඩි විය හැකි ය. බදු ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති අවස්ථාවාදී දේශපාලනඥයන්ට පහසු ඉලක්ක වේ. බදු ගෙවීම යුතුකමක් ලෙස සැලැකීමට රට වැසියන් බොහෝ විට මැලි වන්නේ එසේ ගෙවන මුදල් දූෂිත දේශපාලනඥයන් සහ ඔවුන්ගේ සහකරුවන් විසින් වංචනික ව මංකොල්ල කනු ඇතැ'යි යන සිතුවිල්ල නිසා ය. එබැවින් බදු ප්‍රතිසංස්කරණ සඳහා මහජනයාට මැනවින් පැහැදිලි කළ හැකි බදු මූලධර්මයක් අවශ්‍ය වේ.

රජයට මුදල් යෙදවීම සඳහා බදු අවශ්‍යය යන මූලධර්මයෙන් අපට එය ඇරඹිය හැකි ය. සරලව ඉන් අදහස් කරන්නේ මූලික රජයේ

296 Thomas Piketty, Emanuel Saez and Gabriel Zucman (2018) Distributional National Accounts : Methods and Estimates for the United States, Quarterly Economics 133 [2] – http://gabriel-zucman.edu/usdina

සේවාවන් සැපයීමේ වියදම් පියවා ගැනීමට ආදායම් අවශ්‍ය බව යි. කිනම් සේවාවන් සඳහා කොතරම් ප්‍රමාණයකින් රජයේ මුදල් යෙදවිය යුතු ද යන කරුණ ගැන පුද්ගලයින් දරන මත රජය පිළිබඳව දරන අදහස්වල විවිධත්වයට අනුව වෙනස් විය හැකි ය. සෑම රටක ම රාජ්‍ය අයවැයේ විවිධ මට්ටම්වල පවතින ණය සඳහා විශාල පොලී ගෙවීම් ද ඇතුළත් කිරීමට සිදුවේ. රූපවාහිනී පණ්ඩිතයින් සෑම රාත්‍රියක ම අපෙන් වසන් කරන හෝ අපට මතක් කරන පරිදි, රාජ්‍ය ණය දිගු කලක් තිස්සේ ඉහළ යමින් තිබේ. ඊට හේතුවක් වන්නේ අඛණ්ඩ අයවැය පරතරය සහ වෙළඳ හිඟයට අතිරේක ව, ධනවතුන් සඳහා දී ඇති නොයෙකුත් බදු සහන යි.

ඒ අතර ජාත්‍යන්තර වෙළඳාම ඉහළ ගොස් තිබේ. ෆෝබ්ස් සඟරාවට අනුව ඵකදඥ්ක 500 නමින් හැඳින්වෙන විශාලතම සමාගම් 500 යේ ආදායම 2020 දී ඩොලර් ට්‍රිලියන 33.3ක් දක්වා ඉහළ ගියේ ය. එහෙත් පසුගිය අවුරුදු 40 තුළ ඇමරිකානු එක්සත් ජනපදයේ මධ්‍යම පාන්තික වැටුප් හා ජීවන තත්වය ඉහළ ගොස් නැත. වසර 40 කට පෙර පැවති තත්වයට ද  වඩා අඩු ආදායම්ලාභී කණ්ඩායම අද දුප්පත් වී ඇත. නවලිබරල්වාදය සහ ගෝලීයකරණය පිළිබඳ බොහෝ  ඡන්ද දායකයින්ගේ අතෘප්තියට ප්‍රධානතම හේතුව එය විය හැකි ය.

ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුවේ අයවැයෙන් සැලකිය යුතු කොටසක් වියදම් කරන්නේ මිලිටරි වැය ශීර්ෂය සඳහා යි. 2020 දී එය මුළු අයවැයෙන්  7.9% දක්වා අඩු වූ නමුත් අනෙකුත් බොහෝ රටවලට වඩා තවමත් එය අතිශයින් වැඩිය. එපමණ වැයක් සාධාරණීකරණය කිරීමට හැකි බාහිර තර්ජනයක් නොතිබුණත් ඇමරිකානු දේශපාලනඥයන් එම අයවැයේ විසල් බව ප්‍රශ්න කිරීමට එඩිතර නො වේ. එහෙත් සාමාන්‍යයෙන් එක්සත් ජනපදය යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ නිවාස වැනි වෙනත් සේවාවන් සඳහා වැය කරන්නේ වෙනත් රටවලට වඩා බෙහෙවින් අඩු මුදලකි. මෙම වෙනස්කම් හා නොගැළපීම් ආමන්ත්‍රණය කළ

යුතු ස්ථානය මෙය නො වුණත් බදු අය කිරීම පිළිබඳ විවරණවල දී මෙවැනි කරුණු අපට මග හැරිය නො හැක. ලංකාවේ ද ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති වැය ශීර්ෂය 2020 දී රජයේ මුලු වියදමෙන් 10.2%. රජයේ වියදමට සාපේක්ෂව ගත් විට එය ඇමෙරිකා එක්සත් ජනපදයේ මිලිටරි වියදමටත් වැඩි ප්‍රතිශතයකි. ආරක්ෂක අංශයේ මිල දී ගැනීම් සහ කොන්ත්‍රාත්තු සඳහා දරන වියදම්වලින් කොමිස් සහ වාසි ලබා ගැනීම ලොකු කුඩා බොහෝ රටවල වංචනික පාලකයන්ට මුහුණ දීමට සිදුවී ඇති චෝදනාවලට අතර මුල් තැනක් ගනී.

බ්‍රිතාන්‍ය වැනි රටක් උදාහරණයකට ගත්තොත් ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාපාරවල ලාභය නිරූපණය කළ පංගුව සහ සේවක වැටුප් සහ දීමනා නිරූපණය කළ පංගුව විසි වෙනි සියවසේ වැඩි කාලයක දී බොහෝ දුරට නො වෙනස් ව පැවතුණි. ඒ අනුව 1945න් පසු ආසන්න යුගයේ දී සාමාන්‍යයෙන් වැටුප් නො නැවතී වැඩි වෙමින් තිබූ අතර වැටුප් අතර පැවති වෙනස ද එතරම් විශාල නො වී ය. එහෙත් 1970 ගණන්වල දී එම යුගය අවසන් විය. 1980 වන විට බ්‍රිතාන්‍යයේ ජාතික ආදායමේ ශ්‍රමයේ වටිනාකම සඳහා වෙන් වුණ පංගුව 65% සිට 55% දක්වා අඩු වූ අතර වැටුප් අතර තිබූ පරතරය සැලකිය යුතු ලෙස වැඩි විය. 2018 වන විට බ්‍රිතාන්‍යයේ දළ දේශීය නිෂ්පාදිතය 2008 ආර්ථික කඩා වැටීමට පෙර තිබූ ප්‍රමාණයටත් වඩා 10% කින් ඉහළ ගිය නමුත් වැටුප් ලබන්නන්ගේ ඉපයීම් මධ්‍යස්ථය *(median earnings)* 2008 තිබූ ප්‍රමාණයටත් වඩා අඩු විය. බ්‍රිතාන්‍ය සංඛ්‍යා ලේඛන කාර්යාලය වාර්තා කරන අන්දමට 2018 දී ප්‍රසාද දීමනා සහිතව සතියක සාමාන්‍ය වැටුප වූ පවුම් 491 ඊට දශකයකට පෙර ලැබුණු වැටුප් ප්‍රමාණයට වඩා පවුම් 31 කින් අඩු විය. දශක ගණනාවක් තිස්සේ බ්‍රිතාන්‍යයේ සාමාන්‍ය වැටුප හැම වසර 29 කට වරක් දෙගුණ වී තිබුණ නමුත් මේ සියවසර අවසානය දක්වා ම නැවත එසේ සිදු වන බවක් නො පෙනේ යැ'යි *The Resolution*

*Foundation* ආයතනය ඇස්තමේන්තු කරයි.[297] නිස්සාරක ධනවාදය නිසා බිහිවුණු මේ ප්‍රවණතාව බොහෝ රටවලට පොදු ය. එනිසා තෝමස් පිකෙටි පෙන්වා දුන් අන්දමට සාර්වත්‍රික මූලික ආදායම වැනි ධනය නැවත විභජනය කරන ක්‍රමයක් සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් බොහෝ විට ලබා ගත යුත්තේ මෙසේ නිස්සාරණය කර ඇති ධන සම්පත්වලිනි.

බොහෝ දැනුවත් ආර්ථික විද්‍යාඥයින් උපයන ආදායමට වඩා *rent seeking* හෙවත් නිස්සාරණීය ආදායම් සඳහා අය කරන බදුවලට කැමැත්තක් දක්වන්නේ ශ්‍රමයට මත කෙරෙන බදු අය කිරීමකට වඩා කාර්යක්ෂම ලෙස එමගින් අසමානතාව අඩු කරන බැවිනි. *Rent* හෙවත් නිස්සාරණීය ඉපයීම් මත අය කෙරෙන බදු සඳහා උදාහරණ වන්නේ ප්‍රාග්ධන ලාභ බදු, ඉඩම් වටිනාකම් මත දේපළ වෙළඳාම් බදු, කාබන් බදු, සම්පත් නිස්සාරණ බදු සහ විද්‍යුත් චුම්බක වර්ණාවලිය භාවිත කිරීම සඳහා අය කරන බදු වැනි බදු ය. (සූදුව, දුම් කොළ සහ මත්පැන් සඳහා අය කෙරෙන බදු රුබළු බදු වසයෙන් නො සැලකේ.)

බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් දැනට ඔවුන්ගේ බදු ආදායමෙන් වැඩි ප්‍රමාණයක් ලබා ගන්නේ ශ්‍රමය මත බදු, එනම් පුද්ගලික ආදායම් බදු සහ ආයතනික ආදායම් බදු අය කර ගැනීමෙන් මිස නිස්සාරණීය ඉපයීම්වලින් *(rent )* අය කෙරෙන බදු මත නො වේ. මෙයට හේතුව ශ්‍රමය සඳහා වන බදු නිස්සාරණ *(rent)* බදුවලට වඩා කාර්යක්ෂම හෝ සාධාරණ නිසා නො වේ. බොහෝ දුරට ශ්‍රමය මත බදු එකතු කිරීම සුලබ ඒවා එකතු කිරීමට පහසු බැවිනි.

ධන සම්පත් සඳහා වූ බදු *(wealth tax),* සහමුලින්ම වෙනස් කතන්දරයකි. ධන සම්පත් සඳහා බද්දක් අය කිරීම වත්කම් ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට පොලඹවන බලපෑමක් වන බව බොහෝ ආර්ථික විශේෂඥයින් පෙන්වා දී ඇත. ඵලදායී ලෙස

297 Standing, Guy (2020) Battling Eight Giants: Basic Income Now. London: I.B. Tauris, p.15

උපයෝගී කර ගෙන නැති ප්‍රාග්ධනයට ද වත්කම් බදු මගින් බදු ගෙවීමට සිදුවේ. ඒ නිසා උපයෝගී නො වන ප්‍රාග්ධනයෙන් පවා ආදායමක් ඉපයීමේ ක්‍රමයක් ලෙස ද වත්කම් බද්ද සැලකිය හැකි ය. සංවර්ධනය නොකළ ඉඩම්වලින් පමණක් නො ව, භෞතික හා මූල්‍ය යන දෙවර්ගයේ වත්කම් ද ඇතුළුව සියලු ආකාරයේ රුබළුසැර ආදායම්වලින් අය කෙරෙන අධිභාරවලින් මුදල් ලැබෙන ස්වෛරී සම්පත් අරමුදලක් *(Sovereign Wealth Fund)* රජය මගින් පවත්වා ගෙන යා යුතු බව ගයි ස්ටෑන්ඩින්ග් යෝජනා කරයි.[298] ස්වෛරී සම්පත් අරමුදල යනු ලොව පුරා කොටස්, බැඳුම්කර, දේපළ හා වටිනා ලෝහ ආදී ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමෙන් ආදායම උපදවා ගැනීමට පවත්වා ගත හැකි රාජ්‍ය අරමුදලකි.

ඒ හැර අක් වෙරළ ගිණුම්වල *(off shore accounts)* සඟවා තැබීම මගින් බොහෝ ධන හිමියෝ සිය සමාජ යුතුකම වූ බදු ගෙවීම පැහැර හරිති. එහෙත් ඒ අතරම කිසිදු හිරිකිතයකින් තොර ව සියලු පොදු පහසුකම් තම ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගනිති. මේ චෞර ධන හිමියන්ගේ අක් වෙරළ ගිණුම් පිළිබඳ ඇතැම් තොරතුරු, 2015 දී පැනමාවල පිහිටි මෙසෙක් ෆොන්සේකා නමැති සේවා සපයන සමාගමේ ලේඛන විශාල සංඛ්‍යාවක් ජර්මනියේ *Sueddeutsche Zeitung* පුවත්පත අතට පත්වීමෙන් ද හෙළිදරව් විය. එක් විචාරකයෙකු පෙන්වා දුන් පරිදි මේ පැනමා පත්‍රිකාවලින් *(Panama Papers)* හෙළිදරව් වන තොරතුරු අනුව පැනමා අක් වෙරළ ගිණුම්වල ආදායම් සඟවා තැබීම මගින් නිසැක ලෙසම සැමට සාර්වත්‍රික මූලික ආදායම ගෙවීමට තරම් ප්‍රමාණවත් බදු ආදායමක් ඇමෙරිකානු ධනපතියන් විසින් රජයට ගෙවීම පැහැර හැර තිබේ.[299] (ශ්‍රී ලාංකික ධන හිමියන් 46 දෙනෙකුගේ නම් ද මේ පැනමා පත්‍රිකාවල සඳහන් ව

298 ibid. p.154 (KE)

299 "C. Holtz (2016), 'The Panama Papers prove it: America can afford a universal basic income', Guardian, 8 April. http://www.theguardian.com/commentisfree/2016/apr/07/panama-papers-taxes-universal-basic-income-public-services." – Retrieved on 16 Aug 2021

තිබුණු බව කොළඹ ටෙලිග්‍රාෆ් වෙබ් අඩවිය වාර්තා කළේ ය.*)* එවැනි තවත් අක් වෙරළ ගිණුම් පිළිබඳ රහස්‍ය ලිපි ගොනු මිලියන 11.9 ක තොරතුරු ගවේෂණීය ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සාමූහිකය *(International Consortium of Investigative Journalist)* විසින් අනාවරණය කරමින් තිබේ. පැන්ඩෝරා පත්‍රිකා ව්‍යාපෘතිය යන නමින් හැඳින්වෙන මෙය ජනමාධ්‍ය ඉතිහාසයේ සිදු කළ විශාලතම විමර්ශනය ලෙස සැලකේ. පරීක්ෂණයේ මුල් අවධියේ දී පමණක් අනාවරණය කරගත් කරුණු අනුව ලොව පුරා රටවල් 90 කට අයත් හිටපු සහ දැනට සිටින රාජ්‍ය නායකයන් 35 දෙනෙකු හා දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන් 336 දෙනෙකුගේ අක් වෙරළ ගිණුම් පිළිබඳ තොරතුරු සොයා ගෙන තිබේ.[300] බොහෝ දේශපාලනඥයන් රටින් බැහැර අක් වෙරළ ගිණුම් පවත්වා ගෙන යන්නේ තමන්ගේ ඩීල්වලට ලැබෙන අල්ලස් සහ කොමිස් මුදල් තැන්පත් කර තැබීමට ය. දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන් එවැනි බොහෝ අයථා ගනු දෙනු සිදු කරන්නේ වැඩි අපහසුවක් නැති ව මුදල් විශුද්ධිකරණය කළ හැකි රටවල සිය නමට හෝ හිතවතෙකුගේ නමට ලියා පදිංචි කරන බොරු සමාගම් හරහා ය. *OECD* වාර්තාවකට අනුව වාර්ෂිකව ඩොලර් ට්‍රිලියනයක මුදල් ප්‍රමාණයක් අල්ලස් ලෙස හුවමාරු වේ.[301] මෙයින් බොහෝ අල්ලස් ප්‍රමාණයක් හුවමාරු වන්නේ සංවර්ධනය වන රටවල ඇති වත්කම් නිස්සාරණය කර ගැනීමට විදේශීය සමාගම් දේශපාලනඥයින්ට හා නිලධාරීන්ට ගෙවන තුටු පඩුරු ලෙස ය. අල්ලස් දූෂණ අවම කිරීම අයථා මූල්‍ය ගනුදෙනු හා බදු පැහැර හැරීම් අවම කර ගැනීමට හේතු වනු ඇතැ'යි එකී වාර්තාවෙන් පවසයි.

පැන්ඩෝරා පත්‍රිකා එළිදරව් වීමට පෙර *Tax Justice Network* නමැති ප්‍රකට උපදේශන *(advocacy)* සංවිධානය විසින් කරන ලද

300 https://www.icij.org/investigations/pandora-papers/ retrieved on 06 Oct 2021 - Retrieved on 16 Oct 2021

301 OECD (2014) Illicit Financial Flows from Developing Countries: Measuring OECD Responses OECD p. 11 - Retrieved on 16 Aug 2021

ඇස්තමේන්තුවලට අනුව ගෝලීය සුපිරි ධනවතුන් ඩොලර් ට්‍රිලියන 21 සිට 32 දක්වා වූ දැවැන්ත මුදල් ප්‍රමාණයක් සිය රටවල්වලින් පිට පිහිටි බදු රහිත හෝ ඉතා අඩු බදු සහිත අක් වෙරළ ගිණුම් තුළ සඟවා ඇත. ඒ මඟින් ඩොලර් බිලියන 190 සිට බිලියන 280 දක්වා වාර්ෂික අය බදු ප්‍රමාණයක් ගෙවීම පැහැර හැරීමට ඔවුන්ට හැකිව තිබේ.[302] ආචාර්ය ගයි ස්ටෑන්ඩින්ග් පෙන්වා දෙන අන්දමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ *(IMF)* ඇස්තමේන්තුව එයට බොහෝ වැඩි ය. ඒ අනුව ලාභ සඟවා තැබිය හැකි අක් වෙරළ ගිණුම්වල මුදල් තැන්පත් කර තැබීමෙන් ලොව පුරා ආණ්ඩුවලට නො ලැබී යන වාර්ෂික බදු ආදායම ඩොලර් බිලියන 600කි.[303] පැන්ඩෝරා පත්‍රිකාවලින් හෙළිදරව් වෙන තොරතුරු අනුව මේ ප්‍රමාණය තවත් බොහෝ වැඩි විය හැකි ය. ඇපල් වැනි ඇතැම් දැවැන්ත සමාගම් සිය කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට සිදු වූ විට අඩු බදු අය කරන අයර්ලන්තයේ පිහිටි සිය අක් වෙරළ ගිණුම්වල තැන්පත් කර ඇති මුදල් යොදා ගන්නවා වෙනුවට ඇමෙරිකානු බැංකුවලින් ණය ලබා ගෙන ලාභාංශ ගෙවීම තුළින් බදු ගෙවීම මග හරින ආකාරය නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥ ජෝෂප් ස්ටිග්ලිස් පෙන්වා දෙයි.[304] බදු ගෙවීම මෙසේ පැහැර හරින අතරතුර මේ සියලු සමාගම් කිසිදු ගෙවීමකින් තොර ව සිය ධනෝපායන මාර්ග පවත්වා ගෙන යෑමට පොදු අරමුදල්වලින් නඩත්තු කරන යටිතල පහසුකම් සේවාවන් යොදා ගනිති.

*Tax Justice Network* සංවිධානය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පිළියෙළ කරන ලද ඇස්තමේන්තුවලට අනුව පාරජාතික සමාගම් *(transnational corporations)* විසින් කරනු ලබන බදු වංචා නිසා වාර්ෂික ව ශ්‍රී ලංකාවට අහිමි වන බදු ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 97කි. ඊට අමතර ව පුද්ගලයින් විසින් කරන ආදායම් සැඟවීම්

---

302 J. S. Henry (2012), The Price of Offshore Revisited. Chesham, UK: Tax Justice Network. - https://taxjustice.net/ - Retrieved on 16 Aug 2021

303 Standing, Guy (2020) Battling Eight Giants: Basic Income Now. London: I.B. Tauris, p.150

304 Stiglitz, Joseph (2012) People, Power and Politics, New York: W.W.Norton and Company, p 103

නිසා අහිමි වන බදු ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 07කි.[305] මේ අනුව අක්වෙරළ ගිණුම්වල මුදල් සැඟවීම ඇතුළු අයථා මූල්‍ය ගනුදෙනු නිසා ශ්‍රී ලංකාවට අහිමි වන මුළු බදු ආදායම වයස 18 ට වැඩි හැම ශ්‍රී ලාංකිකයෙකුට ම මසකට රුපියල් 6000/- බැගින් සාර්වත්‍රික මූලික දීමනාවක් ගෙවීමට අවශ්‍ය වන මුදල මෙන් දෙගුණයක් තරම් විශාල ය. එහෙත් අනෙක් වත්කම් මෙන් නො ව මෙවැනි අයථා මූල්‍යමය වත්කම් හෙළිදරව් කර ගැනීම අසීරු ය. පැන්ඩෝරා පත්‍රිකා සිද්ධිය එළිදරව් වූ විට පකිස්ථානයේ අගමැති ඉම්රාන් ඛාන් තම රටවල ඇති අක් වෙරළ ගිණුම්වල මුදල් සඟවමින් බදු වංචා කිරීමට සහ මුදල් විශුද්ධ කිරීමට අවශේෂ රටවල දූෂිත රාජ්‍ය නායකයන්ට, දේශපාලනඥයන්ට සහ නිලධාරීන්ට ඉඩ ලබා දීමේ වගකීමෙන් ගැලැවීමට බටහිර රටවල රාජ්‍ය නායකයන්ට නො හැකි බව පෙන්වා දුන්නේ ය. අන්තර්ජාතික වසයෙන් සිදු වන මේ බදු වංචාව නතර කිරීමට බලාත්මක කළ හැකි ජාත්‍යන්තර ගිවිසුමක් ඇති කර ගැනීම ගැන විටින් විට සාකච්ඡා පවත්වා ඇති නමුත් ප්‍රබල ගෝලීය ජනමතයකින් තම බලයට අභියෝග එල්ල වන තුරු දේශපාලනඥයන් ඒ සඳහා යොමු වෙතැ'යි සිතිය නො හැකි ය.

සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව ගෙවීම සඳහා එක්සත් ජනපදය සම්බන්ධයෙන් බලාපොරොත්තු විය හැකි - යෝජනාව මෙසේ විය හැකියැ'යි ඇනී ලොව්රි පවසයි.[306] එක්සත් ජනපදයේ දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් ට්‍රිලියන 20 ක් යැයි උපකල්පනය කරන්න. එය වර්තමාන මට්ටමට වඩා තරමක් වැඩි ය. ඇමරිකා එක්සත් ජනපදයේ සෑම මට්ටමක ම රජයේ වියදම ඉන් 40% ක් හෝ ඩොලර් ට්‍රිලියන 8 ක් පමණ වේ. එයිනුත් ඩොලර් ට්‍රිලියන 4 ක් වෙන් වන්නේ ෆෙඩරල් පාලන කටයුතු සඳහා ය. ණය සේවා සඳහා වෙන් වන ඩොලර් මිලියන 500 ක් වැනි මුදලක් ද එයට ඇතුළත් ය. වර්තමානයේ දී එක්සත් ජනපද ෆෙඩරල් රජයේ ආදායමෙන් අඩක්

305 https://iff.taxjustice.net/#/profile/LKA

306 Annie Lowrey (2018) Give People Money, New York: Crown Publishers, p. 155-165 KE

*(51%)* පමණ තනි පුද්ගල ආදායම් බදුවලින් *(individual income tax)* සමන්විත ය. තවත් 35% ක් පමණ වැටුප් හා වේතන බදු වසයෙන් සේව්‍යයන් මගින් එකතු වන ඒවා ය. ඇත්ත වසයෙන් ම වසර 50 කට පෙර සමාගම්වල ලාභයෙන් ලැබෙන ආයතනික ආදායම් බදු ප්‍රමාණය රජයේ මුලු ආදායමෙන් 25% පමණ විය. නමුත් දැන් එය 9% දක්වා අඩු වී තිබේ. සුරා බදු *(excise tax)* ද දැන් මුළු බදු එකතුවෙන් ඉතා සුළු කොටසකි. පෙට්‍රල් බදු, දුම්කොළ හා මද්‍යසාර සඳහා වන බදු සියල්ල ම එක් කළ විට එය එක්සත් ජනපද ෆෙඩරල් රජයේ ආදායමෙන් 8% ක් පමණි.

සාර්වත්‍රික මූලික ආදායම වසයෙන් වයස අවුරුදු 18 ට වැඩි සැම ඇමෙරිකානුවෙකුට ම බැංකුවක තැන්පත් කරන ලද ඩොලර් 1000 ක මාසික "සමාජ ලාභාංශයක්" ලැබෙනු ඇතැ'යි සිතමු. ඒ අනුව සාර්වත්‍රික මූලික ආදායම ලබා දීම පිණිස වර්තමාන ෆෙඩරල් බදු ආදායමට වඩා වාර්ෂික ව ඩොලර් ට්‍රිලියන 3 ක් පමණ වැය වනු ඇතැ'යි සිතිය හැකි බව ඇනී ලොව්රි පෙන්වා දෙයි. එහෙත් වසරකට ඩොලර් ට්‍රිලියන 1.3 ක් වේතන බදුවලින් ආවරණය කරන දැනට පවත්වනා එස් එස් විශ්‍රාම වැටුප් වැඩසටහනේ කොටසක් වෙනුවට සාර්වත්‍රික මූලික ආදායම ආදේශ කිරීමට හැකි වේ. ඒ අනුව කරන ගැළපුම්වලින් පසු සාර්වත්‍රික මූලික ආදායම ගෙවීම සඳහා දළ වසයෙන් වැය වන මුදල ඩොලර් ට්‍රිලියන 2 ක් පමණ වනු ඇත. ඒ අනුව ඵලදායිතාවේ ඇති වන වෙනස්කම් නො තකා හැරිය ද එය ෆෙඩරල් රජයේ සමස්ත පිරිවැය ඩොලර් ට්‍රිලියන 6 දක්වා ඉහළ නංවනු ඇත. 2016 වන විට ඇමරිකානුවන් මිලියන 41 ක් පමණ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූහ. ඩොලර් 1,000 ක මාසික දීමනාවක් නිසැක ලෙස ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු දරිද්‍රතා රේඛාවෙන් ඉහළට තල්ලු කරනු ඇත. ඒ හැර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අසනීපයක්, ස්වාභාවික විපතක් හෝ හදිසි රැකියා අහිමි වීමක් යනු තවදුරටත් අනුන්ට අත පාන්නට සිදු වන අසරණ වීමක් නොවන බවට සාර්වත්‍රික මූලික ආදායම වග බලා ගනී.

*Undercover Economist (*2005*)* කෘතියේ කර්තෘ ටිම් හාෆෝඩ් එක්සත් රාජධානිය සඳහා පුද්ගලයෙකුගේ සාර්වත්‍රික මූලික ආදායම දිනකට පවුම් 10ක් හෙවත් මසකට පවුම් 300 ක් විය යුතුයැ'යි යෝජනා කළේ ය. ඔහුගේ ගණන් බැලීමට අනුව මිලියන 64ක් වූ එරට වැසියන්ට මාසික ව සාර්වත්‍රික මූලික ආදායම ගෙවීම සඳහා වසරකට වැය වන මුදල පවුම් බිලියන 234කි. එක්සත් රාජධානියේ රජයේ විශ්‍රාම වැටුප්, දරුවන් සඳහා දීමනාව, ආබාධිතයන් සඳහා දීමනාව, ගෙවල් කුලී ආධාර දීමනාව, විරැකියා දීමනාව ආදී දීමනා ඇතුළත් වන සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ සඳහා වාර්ෂික ව වැය වන පවුම් බිලියන 217 ඒ සඳහා හිලව් කර ගත හැකි බව ඔහුගේ අදහස විය.[307] ඒ අනුව සාර්වත්‍රික මූලික ආදායම ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස ඉලක්ක ගත සුභසාධන සේවා සඳහා වැය වන රජයේ වියදම් අඩු වනු ඇත. සැමට මූලික ආදායමක් ලැබීම චර්යාව සම්බන්ධයෙන් ධනාත්මක වෙනස් වීම්වලට තුඩු දිය හැකි බැවින් බොහෝ විට බන්ධනාගාර සහ පොලිසිය සඳහා යන වියදම පවා පිරිමසා ගත හැකි වේ. භාණ්ඩ හා සේවා සඳහා වැය කිරීමට ඇති පුද්ගලික ආදායම වැඩි වීම නිසා රජයට වැඩි බදු ආදායමක් ද උපයා ගැනීමට හැකි වනු ඇත.

සාර්වත්‍රික මූලික ආදායමක් ලබා දීම පිළිබඳව ඊට වඩා වෙනස් ආකාරයක යෝජනාවක් කොම්පස් නමැති චින්තන පර්ෂදය විසින් එක්සත් රාජධානිය සඳහා ඉදිරිපත් කරන ලදි. එය තරමක දෙමුහුන් ක්‍රමයක් වන අතර දැනට පවතින සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ ද අඩුවක් නැතුව පවත්වා ගෙන යා හැකි ක්‍රමයකි. ඊට අනුව වයස 25ට වැඩි හැම පුරවැසියෙකුට ම සතියකට පවුම් 61 බැගින් වූ දීමනාවක් *(*මාසිකව පවුම් 244ක්*)* ලැබෙනු ඇත. එයට වඩා අඩු දීමනාවක් වයස 25 ට අඩු යෞවනයන්ට සහ විශ්‍රාම වැටුප් ලැබෙන අයට ගෙවිය හැකි ය. ගණන් බලා ඇති අන්දමට ඒ සඳහා වාර්ෂික ව පවුම් මිලියන 7000ක් වැය වේ. එකී මුදල ආදායම් හා වත්කම් බදු

307 https://timharford.com/2016/05/could-an-income-for-all-provide-the-ultimate-safety-net/ Retrieved on 14 August 2021

සංශෝධන මඟින් උපයා ගත හැකි බව කොම්පස් චින්තන පර්ෂදය පෙන්වා දෙයි.[308]

ශ්‍රී ලංකාව සඳහා සාර්වත්‍රික මූලික ආදායමක් හඳුන්වා දීමට අවශ්‍ය වන දළ පිරිවැය අපට මෙසේ ගණනය කළ හැකි ය. 2016 පැවති කුටුම්බ සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුගේ මධ්‍යස්ථ ආදායම මසකට රු23,260 ක් විය යුතු ය. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම්වලට අනුව 2020 දී එක් පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතා පරිපූර්ණ කර ගැනීමට අවශ්‍ය වන මාසික ආදායම රු 5114/-කි.[309] ඒ ඇසුරෙන් ලංකාවේ දී සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව එක් පුද්ගලයෙකුට මාසිකව රු.6,000 පමණ වෙතැ'යි සැලකිය හැකි ය. 2019 වසරේ දී වයස 18 වැඩි ලියා පදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව 15,992,096 වූ බැවින් රටවැසියන් මිලියන 16 කට මෙම දීමනාව ගෙවිය යුතු යැ'යි උපකල්පනය කළ හැකි ය. එවිට ඒ සඳහා වසරකට රුපියල් බිලියන 1152 ක් පමණ අවශ්‍ය වේ. එය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 6.8% ක් පමණ වේ. එම වසරේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 12.6% වූ බැවින් සැමට සාර්වත්‍රික මූලික ආදායම ලබා දීමට නම් රජයේ ආදායම 50%කට මඳක් වැඩි ප්‍රමාණයකින් ඉහළ යැවිය යුතු ය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ බදු ආදායම් පංගුව 11.6% කි. ඩෙන්මාර්කයේ එය 34% ක් වන අතර දකුණු අප්‍රිකාවේ එය 26.7% කි. දකුණු ආසියාවේ වැඩිම ප්‍රතිශතය ඇති නේපාලයේ එය 19.8%කි. නව ලිබරල්වාදයේ පරමාදර්ශී රට ලෙස සැලකෙන චිලී රටේ පවා බදු ආදායම් ප්‍රතිශතය දළ දේශීය නිෂ්පාදිතයෙන් 17.8% වේ. මේ නිසා දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ බදු ආදායම් ප්‍රතිශතය පවතින්නේ බෙහෙවින් අඩු මට්ටමක ය. බදු ප්‍රතිපත්තිය වෙනස් කිරීම තුළින් සාර්වත්‍රික මූලික ආදායම සඳහා යන පිරිවැය

308 https://www.compassonline.org.uk/wp-content/uploads/2016/05/UniversalBasicIncomeByCompass- Retrieved on 14 August 2021Spreads.pdf

309 http://www.statistics.gov.lk/povertyLine/2020 Retrieved on 14 August 2021

ආවරණය කිරීමට තරම් හැකි මට්ටමට එම ප්‍රතිශතය ඉහළ නැංවිය හැකි හැකි ය. දැනට මත් පවත්වා ගෙන සමෘද්ධි දීමනාව වැනි අකාර්යක්ෂම සුභසාධන ක්‍රමවලට යොදා ඇති අරමුදල් සාර්වත්‍රික මූලික ආදායම සඳහා යොදා ගැනීමට අතිරේකව අවශ්‍ය කෙරෙන අරමුදල් සපයා ගැනීම සැලසුම් කිරීමේ දී පසුගිය පරිච්ඡේදයේ දී සාකච්ඡාවට ලක් කළ තෝමස් පිකෙටිගේ තුන්පත් බදු යෝජනා ක්‍රම සලකා බැලීම වැදගත් ය. එමෙන් ම සාර්වත්‍රික මූලික ආදායම් නොකඩවා ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස අනෙකුත් රටවල සාකච්ඡා වී ඇති ආදායම් යෝජනා ගැන විමසා බැලීම ද ප්‍රයෝජනවත් වේ.

රජයට දැරිය හැකි පමණට ගෙවීම් කරන තරමක් දුරට මූලික ආදායමක ස්වරූපය ඇති සුභසාධන ක්‍රමයක් 1985දී නෙදර්ලන්ත රජයේ විද්‍යාත්මක කවුන්සිලය යෝජනා කළේ ය. සැමට මූලික ආදායමක් ගෙවීම පිළිබඳ ඇස්තමේන්තු බෙල්ජියම, කැනඩාව, ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය හා දකුණු අප්‍රිකාව යන රටවල් ද පිළියෙළ කර තිබේ. නවසීලන්තය සම්බන්ධයෙන් කරන ලද එක් ඇස්තමේන්තුවකට අනුව වසරකට හැම වැඩිහිටියෙකුට ම නවසීලන්ත ඩොලර් 11,000 බැගින් ද වයස 18-20 අතර යොවුන් පුද්ගලයෙකුට ඩොලර් 8,500 බැගින් ද ගෙවීම පිණිස 30%ක සම බදු *(flat tax)* ක්‍රමයක් හඳුන්වා දීම ප්‍රමාණවත් වෙතැ'යි ගණන් බලා තිබුණි. ඇන්ඩි ස්ටර්න් ගණන් බලා ඇති අන්දමට හැම ඇමෙරිකානු පුරවැසියෙකුට ම *(*මිලියන 234 ක ජනගහනයක්*)* මසකට ඩොලර් 1000 ක මූලික ආදායමක් ලබා දීමට වසරකට ඩොලර් ට්‍රිලියන 2.7 ක් වැය වේ. එය ඇමෙරිකාවේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයේ මුලු වටිනාකමෙන් 15% කි. මසකට ඩොලර් 1000 යනු ඇමෙරිකාවේ දරිද්‍රතා සීමාව සලකුණු වෙන මාසික ආදායම් මට්ටමයි. එම මුදල සපයා ගැනීම සඳහා ඔහු යෝජනා කරන පියවර අතර ආහාර සලාක සැපයීම ඇතුළු දරිද්‍රතාව අවම කිරීම වෙනුවෙන් දැනට පවත්වා ගෙන යන වැඩසටහන අවලංගු කිරීමෙන් ඩොලර් බිලියන 76 ක් ද නිවාස සැපයීම සඳහා වෙන් කර

ඇති ඩොලර් බිලියන 49 ක් ද උපයන ලද ආදායම්වලින් කරන බදු හර *(tax credit)* කපා හැරීමෙන් ලබාගත හැකි ඩොලර් බිලියන 82 ක් ද අයත් ය.[310] ඒ හැර හමුදා වැය අඩු කිරීම, ඉහළ ආදායම් සඳහා බදු සහන ලබා දීම අහෝසි කිරීම මඟින් තවත් ට්‍රිලියන1.2ක් ලබා ගැනීම, ෆෙඩරල් වෙළඳ බද්දක්, මූල්‍ය ගනුදෙනු බද්දක් සහ වත්කම් බද්දක් අය කිරීමෙන් සපයා ගනු ලබන අරමුදල් යොදා ගැනීම ද සැමට මූලික ආදායමක් ගෙවීමට අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහා කරන ලද යෝජනාවලට අයත් ය.

මූලික ආදායම් දීමනාවක මිල දැරීම සඳහා යෝජනා කර ඇති වඩා ආකර්ෂණීය හා පෘථුල ලෙස ඇමෙරිකා එක්සත් ජනපදයේ සාකච්ඡාවට ලක් වූ තවත් එක් යෝජනාවක් වන්නේ දේශගුණ විපර්යාසය ඇති කිරීමට තුඩු දෙන කාබන් ඩයොක්සයිඩ් වැනි හරිතාගාර වායු විමෝචනය අධෛර්යමත් කිරීම සඳහා අය කරන කාබන් බද්දකින් ලැබෙන ආදායම යොදා ගැනීම යි. එක්සත් ජනපදයේ දේශගුණ විපර්යාසය පිළිබඳ පුරවැසි ලොබි කණ්ඩායම විසින් ගණනය කරනු ලැබ ඇති අන්දමට කාර්මික කටයුතු නිසා විමෝචනය වන සෑම කාබන් ඩයොක්සයිඩ් ටොන් එකකට ඩොලර් 15 ක බද්දක් අය කළ හොත් වසරකට ඩොලර් බිලියන 117 ක බදු ආදායමක් ලබා ගත හැකි ය. එහෙත් එවැනි කාබන් බද්දකින් ඉපයිය හැකි ආදායම පමණක් යොදා ගත්තොත් එක ඇමෙරිකානු කුටුම්බයකට ලබා දිය හැකි වන්නේ වසරකට ඩොලර් 811 මූලික ආදායමක් පමණි. ඒ අතර අන්තරීකෘත කාබන් ලෙස සැලකිය හැකි ප්ලාස්ටික් හා පෝට්ලන්ඩ් සිමෙන්ති අඩංගු හයිඩ්‍රොකාබන් නිෂ්පාදන ආනයනය කරන ප්‍රමුඛ නිෂ්පාදකයින් විසින් විශේෂ කාබන් බද්දක් ගෙවිය යුතුයැ'යි යෝජනා විය. එමඟින් උපයන මුලු ආදායම ට්‍රිලියන 1 කක් වන සේ කාබන් විමෝචන බද්ද සැලසුම් කළ හැකියැ'යි ද අදහස් කෙරිණි.

310 A. Stern (2016), Raising the Floor: How a Universal Basic Income Can Renew Our Economy and Rebuild the American Dream. New York: Public Affairs

ඇමෙරිකා එක්සත් ජනපදයේ සැමට මූලික ආදායම ලබා දීම සඳහා යන වියදම දැරීමට ඉඩම්වල අගය සඳහා බද්දක් අය කිරීම තවත් යෝජනාවකි. මෙය සියවස් දෙකකට පෙර තෝමස් පේන් ඉදිරිපත් කළ සාම්ප්‍රදායික යෝජනාවට සැහෙන දුරට සමාන විය. කෙනෙකුට හිමි ඉඩම් ප්‍රමාණය සාමාන්‍යයෙන් ආදායම සහ වත්කම් අනුව වැඩිවන බැවින් ඉඩම් බදු ද හිමිකම් කියන හෙක්ටෙයාර් ප්‍රමාණය අනුව අනුක්‍රමයෙන් වැඩි විය යුතු ය. ඒ අනුව ඉඩම් බදු මඟින් විශාල ආදායමක් ලබා ගත හැකියැ'යි අපේක්ෂා කෙරේ. එකොනොමිස්ට් සඟරාව විසින් කරන ලද ඇස්තමේන්තුවකට අනුව එක්සත් ජනපදයේ ඉඩම්වල වාර්ෂික වටිනාකමෙන් 5% ක බද්දක් අය කළොත් ඩොලර් ට්‍රිලියනයක් උපයා ගත හැකි ය. එය රටේ සෑම පුරවැසියෙකුට ම වසරකට ඩොලර් 3,500 ක දීමනාවක් ගෙවීමට සෑහේ.[311] ඉඩම් සඳහා ප්‍රමාණය අනුව වත්කම් බද්දක් අය කිරීම වඩා සුදුසු වන්නේ සාමාන්‍යයෙන් බොහෝ රටවල ඉඩම් ප්‍රතිපත්ති ප්‍රතිගාමී සහ ඒ නිසා ම ඉඩම් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන බැවින් යැයි ආචාර්ය ගයි ස්ටැන්ඩින්ග් පෙන්වා දෙයි.[312]

අනෙකුත් බදු යෝජනා අතර වත්කම් බදු, උරුම බදු, මූල්‍ය ගනුදෙනු බදු සහ ස්වයංක්‍රීය යන්ත්‍ර බදු ආදී විවිධාකාර බදු ප්‍රභව සාර්වත්‍රික මූලික ආදායම ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් සොයා ගැනීමේ ක්‍රම වසයෙන් යෝජනා කර තිබේ. තවත් යෝජනාවකින් කියවෙන්නේ ගූගල්, ෆෙස්බුක් වැනි අන්තර්ජාලය මත පදනම් වූ දැවැන්ත සමාගම් සිය ලාභ උපයා ගැනීම සඳහා දැනට නො මිලේ භාවිත කරන දත්ත සහ අන්තර්ගතය වෙනුවෙන් ඒවා සපයන්නන්ට ගෙවිය යුතු මුදල සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව ලබා දීම සඳහා රජයට ගෙවිය යුතු බව යි.[313]

311 The Economist (2016), 'Sighing for paradise to come', The Economist, 4 June, p. 24."

312 Standing, Guy (2020) Battling Eight Giants: Basic Income Now. London: I.B. Tauris, p.153

313 C. Rhodes (2017), 'Funding basic income through data mining', Basic Income News, 29 January

මේ සම්බන්ධව ඩෙන්මාර්ක් රටේ සම්ෆන්ඩ්ස් ටන්කන්*(SamfundsTanken)* යනුවෙන් හැඳින්වෙන සමාජ චින්තන පර්ෂදයේ කැඳවුම්කරු සහ ආයෝජන ව්‍යවසායකයෙකු වන සෝරන් ඉකලුන්ඩ් ඉදිරිපත් කළ ආදායම් යෝජනාව ද බොහෝ අයගේ අවධානයට යොමු විය. ඔහු එය නම් කළේ සමාජ ව්‍යාපාර අරමුදල *(Social Venture Fund)* යන නමිනි. එම යෝජනාවට අනුව සිය බල කොට්ඨාසයේ සේවයේ නියුතු සියලු පුද්ගලික හා පොදු ආයතනවල සේවකයන්ගේ වැටුපෙන් කොටසක් මූලික ආදායම් දීමනාවක් ලෙස නාගරික සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් ගෙවනු ලබයි. එයට අනුරූප වන දීමනාවක් රැකියා විරහිත අයට ද ගෙවනු ලැබේ. එහෙත් ඒ සඳහා එම බල කොට්ඨාසය තුළ පිහිටි හෝ ව්‍යාපාර කටයුතුවල භෞතික ව නියැලෙන සියලු සමාගම් සිය ලාභයෙන් පංගුවක් ප්‍රාදේශීය සභාව හෝ නාගරික සභාව සමඟ හෝ බෙදා ගැනීමට එකඟ වෙයි. සමාගම් විසින් ගෙවිය යුතු වැටුපෙන් පංගුවක් ප්‍රාදේශීය සභාව විසින් ගෙවනු ලබන බැවින් සමාගම්වල ලාභය ඉහළ යන අතර ආයෝජන පුළුල් කිරීමට හැකි වේ. එහි ප්‍රතිලාභ නගර සභාවට ද හිමි වේ. මෙය තරමක් සංකීර්ණ ක්‍රමයක් වුව ද ආදායම් උපයා ගැනීමේ නිර්මාණශීලී ක්‍රම පිළිබඳ අගය කළ යුතු යෝජනාවක් ලෙස සැලකිය හැකි ය.

සාර්වත්‍රික මූලික ආදායම් දීමනාව ලබා දීම සඳහා එක්සත් ජනපදය සම්බන්ධයෙන් ඇති තවත් අදහසක් වන්නේ තාක්ෂණික බදු මඟින් අවශ්‍ය අරමුදල් සපයා ගැනීම යි. ඉන් එක් ක්‍රමයක් වන්නේ විද්‍යුත් චුම්බක සංඛ්‍යාත වර්ණාවලි බද්දක් හෝ අන්තර්ජාල බද්දක් අය කිරීම යි. ඩොලර් ට්‍රිලියන 1 ක වාර්ෂික ආදායම ගෙන ඒමට අරමුණු කර ගෙන එය නියම කළ හැකිවෙතැ'යි අපේක්ෂා කෙරේ. විදුලි සංදේශ සමාගමක් ලාභ ඉපයීම සඳහා විද්‍යුත් චුම්බක වර්ණාවලියේ කිසියම් සංඛ්‍යාත කලාපයක් භාවිත කරන විට, වෙනත් කිසිවෙකුට එම සංඛ්‍යාත කලාපය භාවිත කළ නොහැක. ඒ අනුව විද්‍යුත් චුම්බක වර්ණාවලිය භාවිත කිරීමේ අයිතිය වෙන්දේසි

කිරීම බෙහෙවින් ඵලදායී ආර්ථික බදු කුලියක් අය කිරීමකි. ඒ මඟින් වර්ණාවලිය කාර්යක්ෂම ව භාවිතයට ගන්නා අතර පොදු සම්පතකින් කොටසක් අත්හැරීම වෙනුවෙන් මහජනයාට බදු හරහා වන්දි ගෙවනු ලැබේ. වර්ණාවලිය භාවිත කරන සමාගම් ලාභය ලබා ගන්නේ ඔවුන්ට ඒකාධිකාරයක් ඇති නිසා නො ව ඔවුන් කොතරම් හොඳින් එම සම්පත භාවිත කරනවා ද යන්න මත ය. අන්තර්ජාලය ද පොදු සම්පතක් වන අතර, තවත් යෝජනාවකට අනුව එහි ඇතැම් භාවිතයන් සඳහා යථාර්ථවාදී බද්දක් අය කළ හැකි ය. මෙකී බද්ද අර්ධ වසයෙන් යුරෝපයේ දැනට මත් කෙරෙන පරිදි රූපවාහිනී ප්‍රවේශ ගාස්තු ලෙසත්, ව්‍යාපාර දත්ත හුවමාරුව සඳහා ගාස්තු සහ වෙළඳ දැන්වීම් වැනි සමූහ විකාශන පණිවිඩ යැවීමට අන්තර්ජාල භාවිතය කිරීම සඳහා ගාස්තු (පළමු පන්තියේ තැපැල් ලිපි හා සමාන) අය කිරීමත් කළ හැකි ය. එවැනි බද්දක් මඟින් අනවශ්‍ය "ජන්ක් මේල්" සහ ව්‍යාජ අලෙවිකරණය සඳහා අන්තර්ජාල භාවිතය දැඩි ලෙස අධෛර්යමත් වනු ඇත.

සාර්වත්‍රික මූලික ආදායම් වැඩසටහන යනු ජනසමාජයක වෙසෙන සියල්ලන්ට ම තම අනාගතය ගොඩනගා ගැනීම සහතික කරන පදනමක් තිබේ යන විශ්වාසය ඇති කරන වැඩපිළිවෙළකි. එම මූලික ආදායම වැඩ කරන ජනතාවගේ කේවල් කිරීමේ බලය වැඩි කරවයි. තමන්ගේ ම මූලික ආදායමක් ලබා ගැනීමට හැකිවීම නිසා ස්ත්‍රීන් සබල ගන්වයි. සාර්වත්‍රික මූලික ආදායම බහුතරයට ලැබෙන දෙය ම සුළුතරයට ලබා දෙයි. එබැවින් එය සමාජ සාධාරණත්වය මෙන් ම දේශපාලන සහභාගිත්වයේ සමානාත්මතාවය තහවුරු කිරීමට ආධාර කරයි. තමන්ට ලැබෙන නිත්‍ය දීමනාව අනාගතය සුරක්ෂිත කර ගැනීම සඳහා වඩාත් සුදුසු ලෙස පරිහරණය කිරීමට පොලඹවන සාර්වත්‍රික මූලික ආදායම සාමාන්‍යයෙන් බොහෝ සමාජ සේවා වැඩපිළිවෙලවල ඇති වර්ගවාදී සහ දේශපාලනීකරණය වූ අනුග්‍රාහක ආකල්ප පිටු දකිමින් අන්‍යෝන්‍ය විශ්වාසය වඩා ලයි. පවුලේ වයස 18ට වැඩි ස්ත්‍රී පුරුෂ සැමට එක සමාන ව ලැබෙන

සාර්වත්‍රික මූලික ආදායමක් යනු නො සැලකිල්ලට ලක් ව සිටි පවුල්වලට සහ ග්‍රාමීය ජනතාවට සුවිශේෂ සහනයකි. දෙමව්පියන්ගේ හැකි නො හැකියාවන් නො තකා ළමා සංවර්ධනය සඳහා සම සම ව ආධාර කරන වැඩපිළිවෙළකි. සමාජ විෂමතාව සහ ධ්‍රැවීකරණය උත්සන්න වන යුගයක හැම දෙනෙකුට ම සමාන ව සලකන සාර්වත්‍රික මූලික ආදායම සමාජ ය සබල ගැන්වෙන, සමාජ අන්තර්ග්‍රහණය තහවුරු කරන සහ සමාජ සහභාගිත්වය වෙනුවෙන් එකාවන් ව කටයුතු කිරීමට රටවැසියන් පොලඹවන සහ ඒ නිසා සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කරන වැදගත් සාධකයකි.

# - 27 -

## සිව්දින වැඩ සතිය - ජීවිතය විඳ ගැනීම

අපේ ජීවිත කාලයෙන් වැඩි කොටසක් වැය කළ යුත්තේ ජීවනෝපායක් වසයෙන් "වැඩට යෑම" යනුවෙන් අප හඳුන්වන කාර්යය ඉටු කිරීම සඳහා ද? ඊට වඩා වැඩි කාලයක් ජීවිතය විඳ ගැනීම සඳහා ලබා නො ගත යුතු ද? වැඩට යෑමට වඩා වැඩට නොයා සිටීමට ඇති හැකියාව මානව ප්‍රගතියේ දර්ශකයක් ලෙස සැලකීමට අප දේශපාලකයන්ට බල කළ යුතු නො වේ ද?

කම්කරුවන්ගෙන් ගහන වූ බ්‍රිතාන්‍යයේ නාගරික පෙදෙස්වල දුම් දමන චිමිනිවලින් පෙන්නුම් කළ පළමු කාර්මික විප්ලවය ගල් අඟුරු දහනයෙන් නිපදවූ වාෂ්ප බලය පදනම් කරගත් එකක් විය. එකල වැඩ කරන කාලය දිනකට පැය 12 සිට 16 දක්වා තරම් දිගු විය. විදුලි බලය පදනම් කර ගෙන දෙවැනි කාර්මික විප්ලවය ඇතිවෙන විට දිනකට පැය අටක් පමණක් වැඩ කිරීම සම්මුතිය බවට පත් කර ගැනීමට අපට හැකි විය. එහෙත් ඉලෙක්ට්‍රෝනික මයික්‍රො-ප්‍රොසෙසරය මුල් කර ගැනීමෙන් උද්ගත වූ තුන්වැනි කාර්මික විප්ලවය නිසා අප වැඩ කළ යුතු කාලය අඩු කරනවාට වඩා සිදු වූයේ වැඩ කිරීම උත්කර්ෂණයට නැංවීම යි. තරඟකාරීවීමට නම් වැඩි වැඩියෙන් වැඩට කැපවීම අත්‍යවශ්‍ය බව දේශපාලන නායකයෝත් ආර්ථික විද්‍යාඥයෝත් අපට දේශනා කළහ. ඒ අනුව අතිකාල දීමනා මත ඇසම්බ්ලි ලයින් හෙවත් එකලස් පේළිවල වැඩි කාලයක් ගත

කිරීමට කම්කරුවන්ට සිදුවිය. තරඟකාරී ලෙස නිෂ්පාදනය වැඩි කිරීම පිණිස වෙලාවක් අවේලාවක් නො තකා වැඩට කැපවීම යුතුකමක් ලෙස සලකන ලෙස ඉගැන්විණි.

එහෙත් අප දැන් ගත කරන්නේ නව ඩිජිටල් තාක්ෂණය, ජීව තාක්ෂණය සහ භෞතික තාක්ෂණයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය පදනම් කරගත් තීරණාත්මක ලෙස කෘත්‍රිම ඥානය *(Artificial Intelligence)* හා ස්වයං ක්‍රියාකාරිත්වය *(Automation)* යොදා ගත හැකි අපූරු හතරවැනි කාර්මික විප්ලවයක එළිපත්තේ ය. නිෂ්පාදන ක්‍රියාවලිය තාක්ෂණය මත පදනම් වූ කෘත්‍රිම ඥානය මඟින් මෙහෙයවීම හැරෙන විට එය ඉන් පෙර පැවති සියලු කාර්මික විප්ලව අභිභවා ජීවනෝපායක් වසයෙන් වැඩ කිරීම සඳහා අප ගත කළ යුතු කාලය අවම කිරීමට දායක වනු ඇතැ'යි අපේක්ෂා කළ හැකි ය. තාක්ෂණික දියුණුවත් සමඟ ස්වයංක්‍රියව කටයුතු ඉටු කළ හැකි රොබෝවරුන්ට වැඩපොළේ සහ ගේ දොර කටයුතු පැවරීමේ හැකියාව හැරෙන විට හතරවැනි කාර්මික විප්ලවය ජීවනෝපායික විප්ලවයක් බවට පත්කර ගත හැකි වන්නේ වැඩ කිරීමට ගත කළ යුතු කාලය අඩු කර ගැනීමට දැනුවත් වැඩපිළිවෙළක් දියත් කර ගැනීමට අපට ඇති හැකියාව මතය. දින හතරක වැඩ සතියක් හඳුන්වා දීම දැන් සිට ම තීරණාත්මක දේශපාලන ඉල්ලීමක් බවට පත් විය යුත්තේ එබැවිනි.

ධනවාදී ආර්ථික ක්‍රමය මෙන් ම රාජ්‍ය ඒකාධිකාරී සෝවියට් ක්‍රමය යටතේ ද වැඩ හෙවත් ශ්‍රමය උත්කර්ෂණයට නැංවීම පොදු දෙයක් විය. මහන්සි වී වැඩ කිරීම නිසා ශ්‍රම වීරුවන් වසයෙන් අභිධාන ලත් අයගේ ඡායාරූප එකල සෝවියට් ප්‍රචාරක සඟරාවල බහුලව දක්නට ලැබුණ දෙයක් විය. ජීවත් වීම සඳහා අප වැඩ කළ යුතු බව මෙන් ම වැඩ කිරීම පිණිස අප ජීවත් වන්නේ ය යන අදහස අප තුළ පැල පදියම් කිරීමට ප්‍රයත්න දැරිණ. රැකියාවක් ලෙස කරන්නේ බිම ඇමදීම ද නැත හොත් ආදායම් බදුවලින් ගැලවීමේ විධික්‍රම සම්බන්ධ කෛරාටික බදු උපදේශකයෙකු වසයෙන් කටයුතු කිරීම ද යන්න නො තකා ජීවනෝපාය වසයෙන් අපට තෝරා ගැනීමට සිදු ව

ඇති වැඩ කිරීම තුළ අර්ථයක් සොයා ගැනීමටත් ඒ මඟින් වැඩ කිරීමේ තෘප්තිය, ආඩම්බරය ඇති කර ගැනීමත් ධනවාදය පමණක් නො ව ඊනියා සමාජවාදයත් අපෙන් බලාපොරොත්තු විය.

අනෙක් අතට අප කවුද යන්න නිර්ණය කිරීමේ දීත් මහළු විය විශ්‍රාමයෙන් ගත කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමේ දීත් අප වැඩි කාලයක් ගත කරන්නේ කිනම් ආකාරයක සගයන් සමඟ ද යන්න සම්බන්ධයෙනුත් අපේ රැකියාව වැදගත් සාධකයකි. එසේ ම අපේ වටිනාකම් හා නො වටිනාකම් හැඩ ගැස්වීමේලාත් අප ජීවනෝපාය වසයෙන් තෝරා ගන්නා රැකියාව වැදගත් වෙයි. එහෙත් බොහෝ දෙනෙකු වැඩට යන්නේ හැකි ඉක්මනින් ආපසු නිවස බලා යා යුතු ය යන අභිප්‍රාය මත බව රහසක් නො වේ. ඒ නිසා සතියෙන් වැඩි කොටසක් වැඩපොළෙහි ගත කිරීම කළ යුතු ම දැ'යි අපට ඇසිය හැකි ය ? ව්‍යවස්ථාපිත රජ පවුලක සාමාජිකයන් හැරෙන විට අනෙක් සියල්ලෝ ම රැකියාවක් මඟින් ජීවනෝපාය සලසා ගැනීම සම්මුතියක් බවට පත් ව ඇති බව ඔබට නො වැටහෙන්නේදැ'යි කිසිවෙකු විසින් එවිට අපෙන් ඇසීමට ඉඩ තිබේ. රජ පවුල් හැරෙන විට පරම්පරාවෙන් සැලකිය යුතු ධනයක් උරුම වූ අයට ද එසේ නො වන අයට වඩා බෙහෙවින් අඩු කාලයක් වැඩ පොළක ගත කොට දරු පවුල් නඩත්තු කළ හැකි බව අප දනිමු. අනෙක් අතට හතර වන කාර්මික විප්ලවයත් සමඟ වැඩ කාර්යක්ෂමතාව වැඩි වන්නේ වැඩ කිරීමට ගත කරන කාලය අඩු කිරීම මඟින් නො වේ නම් රැකියාවක නිරත වීම සම්බන්ධයෙන් ඒ කාර්මික විප්ලවය තුන්වැනි කාර්මික විප්ලවයට වඩා විශිෂ්ට වේයැ'යි සැලකිය නො හැකි ය.

තාක්ෂණික දියුණුවත් සමඟ අද පවා අප වැඩ කරන ආකාරය සහ අප සේවයේ යොදවා ඇති කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වීමකට ලක් වී තිබේ. එහෙත් දැනට පෙනෙන අන්දමට වැඩ කරන ජනතාවගේ පැත්තෙන් දැනුවත් සංවිධානාත්මක මැදිහත් වීමක් සිදු නො වුව හොත් නව ආරක වැඩවසම් ක්‍රමයක් ඇතිවීමේ අවදානමක් ද පවතී. බොහෝ කොට ඩිජිටල් තාක්ෂණය සහ

අන්තර්ජාලය යොදා ගෙන ක්‍රියාත්මක වන ආර්ථිකය තුළ දැනට මත් රැකියා නියුක්තිය යනු නිත්‍ය රැකියා වෙනුවට කෑලි ක්‍රමයට, තාවකාලිකව සහ කොන්ත්‍රාත්තු ක්‍රමයට, අවුට්සෝර්ස් හෙවත් බහිස්සේවාපර්ණ ක්‍රමයට වැඩ කරවා ගැනීමට සහ මැන්පවර් ක්‍රමයට වැඩ කිරීමට සිදුවීමයි. බලාපොරොත්තු වන සේවයේ ස්වභාවය විසින් වළක්වනු නො ලබන්නේ නම් කාර්යාලයට හෝ සේවා ස්ථානයට භෞතික ව පැමිණ වැඩ කිරීම මේ ක්‍රමය යටතේ අවශ්‍ය නැත. ඒ වෙනුවට නිවසේ සිට අන්තර්ජාලය යොදා ගෙන වැඩ කිරීමට සේවකයන් දිරි ගන්වනු ලැබේ. බැලූ බැල්මට ම මේ ක්‍රමයට අනුව රැකියාවල නම්‍යශීලී බවක් පෙනෙන නමුත් නිත්‍ය රැකියාවල ඇති වැටුප් සහිත නිවාඩු, විශ්‍රාම වැටුප් හෝ සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වය, වෛද්‍යාධාර හා රක්ෂණ ක්‍රම ආදියෙන් සිය සේවකයන්ට ප්‍රතිලාභ දීමෙන් අභිමතය පරිදි වැළකී සිටීමට සේව්‍යයන්ට නොහොත් හාම්පුතුන්ට හැකි වේ. අනෙක් අතට නිරන්තරයෙන් අන්තර්ජාලය ඔස්සේ තම සේවය සැපයීමට සිදුවීම නිසා කාලයක් වේලාවක් නො තකා සේවකයාගෙන් සේවය උකහා ගැනීමට සේව්‍යන්ට ඉඩ සැලසේ.

මෙම වෙනස් වීම් නිසා, බොහෝ විට රැකියා මාරු කිරීම, ඕනෑවට වඩා වැඩ කිරීමට සිදුවීම සහ රැකියා සුරක්ෂිතභාවය අවම වීම වැනි තත්වයන්ට මුහුණ දීමට සේවකයන්ට සිදු ව තිබේ. වැටුප් ඇතුළු ව රැකියාවෙන් ලැබෙන නිශ්චිත ආදායම අනිස්ථිර වීම නිසා මූල්‍ය අස්ථාවරත්වයට මුහුණ දීමට සේවකයන්ට සිදුවේ. හැරත් නිශ්චිත වේලාවකින් තොර ව වේලාව අවේලාව නො තකා වැඩ කිරීමට සිදුවීම නිසා කලක් යන විට දැරිය නො හැකි වැඩ පීඩනයක් ද සේවකයාට එල්ල විය හැකි ය. සරල ව කිව හොත් - මෙකී රැකියා අස්ථිරත්වය පාදක කරගත් ආර්ථිකය සේවකයන්ට තිරසාර රැකියාවක් ලබා ගැනීමට උදව් නො කරයි. එක්තරා ආකාරයකට එය වැඩවසම් යුගයේ පැවති සේවා සැපයීම හා අනුරූප වේ.

නිත්‍ය මාසික වැටුපක් වෙනුවට කෑලි ක්‍රමයට දීමනාවක් ගෙවනු ලබන මෙවැනි රැකියා අයත් වන ආර්ථිකය හඳුන්වනු ලබන්නේ ගිග් ආර්ථිකය *(gig-economy)* යන නමිනි. එවැනි ගිග් ආර්ථික ක්ෂේත්‍රයේ රැකියාවලට එක් උදාහරණයක් වසයෙන් ගනිමින් නිත්‍ය මාසික වැටපක් ලබන රියැදුරු රැකියාවක් වෙනුවට ඌබර් සමාගම යටතේ තමාගේ ම මෝටර් රථය යොදා චාරිකාවක් චාරිකාවක් පාසා එක්වෙන දීමනාවක් ලබා ගන්නා කුලී රියදුරෙකු වසයෙන් සේවයේ නිරත වන පුද්ගලයන් හැඳින්විය හැකි ය.

බර කර්මාන්තවල යෙදීමට සිදු වූ කාර්මික යුගයේ වැඩ දුෂ්කර වුවත් කම්කරුවෝ තමන්ගේ රැකියාවට ලැබෙන තැන ගැන දැන සිටියහ. කලක් ගත වූ පසු නිශ්චිත පැය ගණනක් සහිත වැඩ දිනයක් දිනා ගැනීමට ඔවුන්ට හැකි විය. හැරත් අතිරේක වැඩ කාලය වෙනුවෙන් අතිකාල දීමනා ලබා ගත හැකි විය. ඔවුන්ට රැකියා කොන්ත්‍රාත්තුවක් තිබුණු අතර නිවාඩු, අසනීප නිවාඩු සහ විශ්‍රාම වැටුප් හෝ සේවා අර්ථ සාධක අරමුදල් ද ලැබුණි. කල් තබා රැකියාව අවසන් කිරීමට සේව්‍යයාට සිදු වුව හොත් අවම වසයෙන් තුන් මාසයක වැටුප හෝ ඒ සමාන වන්දි ගෙවීමක් සේවකයාට ගෙවිය යුතු විය. ඒ හැර වෘත්තීය සමිතිවල සංවිධානය වීමේ හැකියාව අනුව ඇති කරගත් කේවල් කිරීමේ බලය මත වඩා හොඳ රැකියා කොන්දේසි සහිත සාමූහික ගිවිසුමකට එළඹීමට සේව්‍යයන් පොලඹවා ගැනීමේ හැකියාව ද සේවකයන්ට තිබුණි.

එහෙත් තාක්ෂණය උපයෝගී කර ගෙන දූරස්ථ ව  ශ්‍රමය යොදා ගැනීමේ දී  තවදුරටත් අර කී මූලික සේවා කොන්දේසි ලබා දීම මඟ හැරීමට බොහෝ විට සේව්‍යයන්ට හැකි වේ. මෙහි දී න්‍යායාත්මක ව, සේවකයාට නිදහස සහ නම්‍යශීලී බවක් ලබා දුන්න ද, බොහෝ විට යථාර්ථය වන්නේ ජීවනෝපාය වසයෙන් අස්ථිර රැකියාවක් ලැබීම යි. මේ ක්‍රමයට අනුව බොහෝ දෙනෙකු තම සේව්‍යයන් සඳහා පූර්ණ කාලීන ව වැඩ කරන බවක් පෙනෙන්නට තිබුණත් සේව්‍යන් විසින් ඔවුන් වර්ගීකරණය කරනු ලබන්නේ නිදහස් සේවකයින් *(freelance workers)* ලෙස යි.

ඒ අනුව ඔබ නිදහස් සේවකයෙකු වන විට, නිවාඩු ගෙවීම් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් වැනි දේවල් ඔබට ලබා දීමට සේවා යෝජකයා බැඳී නැත. එයින් අදහස් වන්නේ ඔබ පහසුවෙන් ඉවත් කළ හැකි බවත් අතිරික්ත වැටුප් ලබා දීමට අවශ්‍ය නො වන බවත් ය. ඔබ කුඩා ම වැරැද්දක් කළත් - උදාහරණයක් වසයෙන් කොන්ත්‍රාත් වැඩ ක්‍රමය යටතේ ඔබ විසින් මෙහෙයවිය යුතු කුරියර් පැ කේජයක් ප්‍රමාද වී පැමිණීම වැනි වැරදීමක දී - ඔබ එම අවස්ථාවේ දී ම දීම සේවයෙන් පහ කිරීමට ඔබේ සේව්‍යයාට හැකි වේ.

මේ සම්බන්ධයෙන් ඇතැම් උදාහරණ ප්‍රකට ඇමසන් සමාග මේ සේවා සංවිධාන ක්‍රමය විමසීමෙන් ලබා ගත හැකි ය. ඇමසන් සමාගමේ ජනප්‍රියත්වයට මූලික හේතුවක් වන්නේ වෙළඳ සැලකට නො යා ගෙදර සිට ම ඔබට කැමති ඕනෑ ම බඩුවක් පහසු මිලකට අද අයැදුම් කොට හෙට වන විට එය නිවසට ම ගෙනවිත් දීමට ඇමසන් සමාගමට ඇති හැකියාව යි. ඇණවුම් කළ භාණ්ඩ අදාළ නිවසට ගෙන ගොස් බාර දීම සඳහා බොහෝ විට යොදා ගැනෙන්නේ කොන්ත්‍රාත් ක්‍රමය අනුව වැඩ කරන තවත් සමාගමකි. මේ සමාගම් බොහෝ විට මෑන් පවර් හෙවත් මිනිස් බල සමාගම්වලින් රියදුරන් සපයා ගනිති. කිසියම් භාණ්ඩයක් ප්‍රමාද වී භාර දීම ඇමසන් සමාගමේ කීර්තියට හානි කර වරදක් ලෙස සැලකෙන බැවින් ප්‍රමාද වීමේ වැරැද්ද මෑන්පවර් සමාගම්වලින් ලබාගත් සේවකයන්ට පවරා ඔවුන් සේවයෙන් ඉවත් කර සිය ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීමට ඇමසන් වැනි සමාගම්වලට හැකි ය. ඇමසන් සමාගම පමණක් නො ව ගනුදෙනු කරුවන්ගේ පහසුව තකා පාරිභෝගික ද්‍රව්‍ය හා ආහාර ආදිය නිවසට ම සපයන බොහෝ සේවා සපයන්නන් කටයුතු කරන්නේ ඒ ආකාරයෙනි.

මේ ක්‍රමයේ දී රැකියා නියුක්තිකයින් වැඩිපුර ම ඔවුන්ගේ සේවා ස්ථාන සමඟ අන්තර්ජාලය හරහා සන්නිවේදනය කරන හෙයින්, ඔවුන්ට "සැම විට ම ක්‍රියාත්මක වී සිටීමේ" මානසිකත්වයක් ඇත. ඔවුහු සැම විට ම පාහේ සේවා ඇමතුමක යෙදී සිටිති. එබැවින් ඔවුන්ගේ

ශ්‍රම කාලය සහ නිදහස් කාලය අතර වෙනස අතුරුදහන් වී යයි. පොතක් පතක් කියවීමට, ව්‍යායාමයක් වසයෙන් හෝ ඇවිදීමට, ගීතයක් සංගීතයක් විඳ ගැනීමට, චිත්‍රපටයක් නැරඹීමට, හිත මිතුරු සම්භාෂණයක යෙදීමට, බිරිඳ හා දූ දරුවන් සමඟ ගත කිරීමට ඔවුන්ට ලැබෙන කාලය ඒ නිසා අවම කිරීමට හෝ එවැනි සමාජ සම්බන්ධතා මුළුමනින් ම නො තකා හැරීමට එකී මානසිකත්වය සේවකයාට බල කරයි.

ඒ අතර දිනෙන් දින ඉහළ යන ජීවන වියදම නිසා ගැටලුව උග්‍ර වේ. බොහෝ අයට එක් රැකියාවක් කිරීමෙන් පමණක් තම වියදම පිරිමසා ගැනීමට නො හැකි වේ. අස්ථිර පදනම් මත කෑලි ක්‍රමයට වැඩ කළ හැකි තැන්වල ඇති ඇබෑර්තු සොයමින් වෙහෙස වීමට සේවකයන්ට සිදු වේ.

කෑලි ක්‍රමයට වැඩ කිරීම, මෑන්පවර් ආයතන ඔස්සේ සේවයේ යොදා ගැනීම වැනි තත්වයන් නිසා අද එකල මෙන් සේවා කොන්දේසි වැඩිදියුණු කිරීමට කම්කරු ශ්‍රමය සංවිධානගත කර ගැනීම අසීරුය. එකල වෘත්තීය සමිති පිහිටුවීම හෝ සාමූහික වැඩ වර්ජන නිසා කම්කරුවන්ගේ සාධාරණ ඉල්ලීම්වලට ඇහුම්කන් දීමට හාම්පුතුන්ට සිදු විය. නිදසුනක් වසයෙන්, එසේ සංවිධානය වීමේ හැකියාව නිසා දහනව වන ශතවර්ෂයේ අග භාගයේ එක්සත් රාජධානියේ කම්කරුවන්ට කම්කරු පක්ෂය නමින් දේශපාලන පක්ෂයක් ද පිහිටු විය හැකි විය. බලය ලබාගත් පසු ව එයට වැඩදායක පුළුල් ප්‍රතිසංස්කරණ සඳහා නීති සම්පාදනය කිරීමට ද හැකි විය. මහා බ්‍රිතාන්‍යයේ ජාතික සෞඛ්‍ය සේවය, අවම වැටුප සහ අඩු වැටුප් සහිත කම්කරුවන් සඳහා බදු බැර කිරීම් හඳුන්වා දුන්නේ එකී කම්කරු පක්ෂය විසින් පිහිටු වූ ආණ්ඩු යටතේ ය.

ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් සේවා සැපයුම් මත පදනම් වූ සමාගම්වල ශ්‍රම දායකත්වය සාම්ප්‍රදායික සමාගම්වලට වඩා බෙහෙවින් වෙනස් ය. ගූගල්, ෆෙස්බුක්, ට්විටර්, ආදී දැවැන්ත සමාගම්වල ව්‍යාපාර කටයුතු රැඳී පවතින්නේ ඒවායේ පාරිභෝගිකයන්

විසින් ස්වකැමැත්තෙන් එකී ජාලගත වේදිකා උපයෝගී කර ගන්නා ප්‍රමාණයට අනුව ය. උදාහරණයක් ලෙස ඔබ ෆේස්බුක් සඳහා ඇබ්බැහි වන ප්‍රමාණයට අනුව සහ ඔබ එයට ස්වේච්ඡාවෙන් ලබාදෙන දායකත්වය මත ෆේස්බුක් ආයතනයේ වෙළඳ ප්‍රචාර සේවා ව්‍යාපාරික කටයුතු රඳා පවතී. ඔබ විසින් නොමිලේ ම එකී සමාගම්වලට ලබා දෙන මේ දායකත්වය එක් ආකාරයක ස්වයං සූරාකෑමක් *(self-exploitation)* වසයෙන් ද හැඳින්විය හැකි ය.

මෙම දැවැන්ත සමාගම් බොහෝමයකට ඉතා ඉහළ වැටුප් හා පාරිතෝෂික ලබන ජ්‍යෙෂ්ඨ විධායකයෝ සිටිති. එහෙත් ශ්‍රම කටයුතු සඳහා යොදා ගන්නා අවශේෂ සේවකයන් සලකන්නේ හුදු මෙවලම් පමණි. රැකියාවේ ඩිජිටල් ස්වභාවය නිසා ම සේවා සැපයීම සඳහා යොදා ගන්නා අවශේෂ සේවකයන් වෙන කවරදාකටත් වඩා සුපරීක්ෂණයට හා ඇගයීමට ලක් වේ. උදාහරණයකට ඌබර් සමාගමට තමන් සඳහා ඕනෑම වෙලාවක සේවය සැපයීමට සූදානම් ස්වේච්ඡා රියදුරන් දුරස්ථ ව සුපරීක්ෂණයට ලක් කළ හැකි ය. මෙවැනි සමාගම්වලට විරුද්ධත්වයක් ඉදිරිපත් කිරීමට පෙර සමස්ත ශ්‍රම බලකාය වුවද සැණකින් සේවයෙන් ඉවත් කළ හැකි ය. බ්‍රිතාන්‍ය තුළ අනෙකුත් සේවකයන්ට ලැබෙන විශ්‍රාම පාරිතෝෂික, නිවාඩු ආදී කම්කරු අයිතීන් ඌබර් සමාගම විසින් සේවයට යොදා ගන්නා ස්වේච්ඡා රියදුරන්ට ද ලැබිය යුතුයැ'යි බ්‍රිතාන්‍ය ශ්‍රේෂ්ඨාධිකරණය මෑත දී දුන් තීන්දුව[314] මේ තත්වය කිසියම් දුරකට වෙනස් කිරීමට හේතු වනු ඇතැ'යි සිතිය හැකි ය.

ඉහත කී අවිධිමත් සේවා නියුක්ති ක්‍රම යටතේ සේවකයන් වැඩට යොදා ගැනීම නව වැඩවසම් ක්‍රමයක ලක්ෂණ පෙන්නුම් කරයි. ඒ ක්‍රමය යටතේ විශේෂයෙන්, අතළොස්සක් පාලකයින් - එනම් ප්‍රධාන විධායක නිලධාරීන්, ව්‍යවසායකයින්, ආයෝජකයින් සහ කොටස් හිමියන් - ඒ නව වැඩවසම්වාදයේ නව ප්‍රභූ පැලැන්තිය

314 https://www.theguardian.com/technology/2021/feb/19/uber-drivers-workers-uk-supreme-court-rules-rights - Retrieved on 27 Aug 2021

ලෙස සැලකිය හැකි ය. අද බොහෝ කම්කරුවන් මුහුණ දෙන වැඩට නියමිත කාලයක් වේලාවක් නැති අස්ථිර රැකියා ක්‍රමය වෙනුවට හැමට සිව් දින වැඩ සතියකට යටත් ව ගිවිසුම් ගත ස්ථිර රැකියා අයිතිය තහවුරු කිරීම මගින් තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵල සේවක තෘප්තිය සහ රැකියා සුරක්ෂිතභාවය වැඩි කිරීමට යොදා ගත යුතු ය.

ඇත්ත වසයෙන් ම අප වඩා උනන්දු විය යුත්තේ තාක්ෂණය යොදා ගෙන දුරස්ථ ව වැඩ කරන සේවකයන්ට ද ඌබර් ක්‍රමයට වැඩ කරන සේවකයන්ට ද ආයතනික ව වැඩ කරන සේවකයන් හා සමාන සේවා කොන්දේසි මත වැඩ කිරීමට සැලැස්වීම යි. මෙහි දී දිනකට වැඩ කළ යුතු පැය ගණන හා සතියකට සේවය කළ යුතු උපරි ම දින ගණන සේවා කොන්දේසි යටතේ අනුල්ලංඝනීය ලෙස ස්ථාපිත කිරීම සමාජීය වසයෙන් වැදගත් ය. සතියකට වැඩ කළ යුතු උපරිම දින ගණන තීරණය කිරීමේ දී දැනට පවතින දින පහක සතිය වෙනුවට දින හතරක සතියක් හඳුන්වා දීම වඩා ඵලදායී වීමට එක් හේතුවක් වන්නේ එය යි. කොටින් ම නිශ්චිත වැඩ කරන කාලයක් ගැන එකඟත්වයක් නොමැති නිවාඩු හා විශ්‍රාමික වැටුප් පිළිබඳ සහතිකයක් නොමැති රැකියා ගිවිසුම් මත සේවකයින් වැඩට යොදාගැනීම අවලංගු කිරීමට අප කටයුතු කළ යුතු ය. වැඩ කිරීමේ ක්‍රමවේදය දුරස්ථ ව හෝ ආයතනයට පැමිණ යන දෙකෙන් කිනම් ආකාරයකින් ඉටු කිරීමට සිදු වුව ද එය දිනකට පැය අටේ උපරිමයට හා දින හතරක වැඩ සතියකට සීමා විය යුතු ය. කෘත්‍රිම ඥානය දියුණු කර ගැනීමත් සමඟ මේ ප්‍රමාණය තව තවතවත් අඩු කර ගැනීමට අපට හැකි විය යුතු ය.

දැනට පවතින පැය 40 ක වැඩ සහිත දින පහේ සතිය හඳුන්වා දීම ඇරඹුණේ 1938 ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් ජනාධිපතිවරයා ගේ පාලන සමයේ ඇමෙරිකාවේ නීති ගත වූ ශ්‍රම ප්‍රමිති පිළිබඳ පනත යටතේ ය. එකල පැවති ආර්ථික අවපාතය නිසා රැකියා වියුක්තිය ඉහළ යෑම වළක්වා ගැනීම ද එම තීරණයේ එක් අරමුණක් විය. ඊට පෙර 1926 දී දින හයේ වැඩ වැඩ සතිය වෙනුවට පැය 40ක් සහිත දින

පහේ වැඩ සතියක් හෙන්රි ෆෝඩ් සිය ෆෝඩ් මෝටර් රථ කර්මාන්ත ශාලාවට හඳුන්වා දුන්නේ ය. ඔහුගේ අරමුණ වූයේ ඇමෙරිකානු පාරිභෝගික සමාජය ඒ මඟින් පුළුල් කිරීම යි. ඒ සම්බන්ධයෙන් 'වර්ල්ඩ් වර්ක්' නමැති සඟරාවට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් "වර්ධනය වෙන පාරිභෝගික සමාජයකට විවේක සුවය කියන එක අත්‍යවශ්‍ය දෙයක්. මොකද මිනිසුන්ට මෝටර් රථ ඇතුළු පාරිභෝගික භාණ්ඩ සොයා බලා මිලට ගැනීමේ කටයුතු කරන්න ප්‍රමාණවත් කාලයක් තියෙන්න ඕනෑ" යනුවෙන් හෙන්රි ෆෝඩ් පැවසීය.

ඒ වන තෙක් ම ලොව පුරා සම්මුතිය වූයේ ඉරිදා හැර සතියේ අනෙකුත් දින සියල්ල වැඩ කරන දින වසයෙන් සැලකීම යි. එහෙත් 20 වන සිය වස මුල භාගයේ දී වැඩ සතිය අවම කර ගැනීම සහ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම ගැන ඇතැම් ආර්ථික විද්‍යාඥයන්ගේ අවධානය යොමු වී තිබුණි. උදාහරණයක් වසයෙන් "තව ශත වර්ෂයක් තුළ සතියකට වැඩ කළ යුතු කාලය අපට පැය 15කට සීමා කළ හැකිවෙතැ 'යි මම විශ්වාස කරමි" යනුවෙන් 1930 මැඩ්රිඩ් නගරයේ දී දි ආර්ථික විද්‍යාඥ ජෝන් මේනාඩ් කේන්ස් කළ ප්‍රකාශය උපුටා දැක්විය හැකි ය. ඇමෙරිකාවේ කොන්සර්වෙටිව් චින්තන පර්ෂදයක් ලෙස සැලකෙන රාන්ඩ් කෝපරේෂන් ආයතනය අනාගත ආර්ථිකය සම්බන්ධයෙන් 1960 දී සකස් කළ වාර්තාවකට අනුව ඇමෙරිකානු සමාජයේ අවශ්‍යතා පිරිමැසීමට ඇත්ත වසයෙන් ම අවශ්‍ය වන්නේ එවකට සිටි සේවා නියුක්තිකයන්ගෙන් 2%ක් පමණි.

එහෙත් 1980 වන විට වැඩ කිරීමේ පැය ගණන අඩු කිරීම නතර වී තිබුණි. නවලිබරල්වාදී ආර්ථික වර්ධන වේගය වැඩි කිරීමේ ක්‍රමෝපාය තුළ වැඩි වැඩියෙන් වැඩ කිරීම උත්කර්ෂණයට නැංවිණි. පරිභෝජනය හා වර්ධන වේගය වැඩි වීම වූ නමුත් සේවකයන්ගේ විවේක කාලය වැඩි නොවීය. බ්‍රිතාන්‍ය ඇතුළු යුරෝපීය රටවල වැඩ කරන කාලය නො වෙනස් ව පැවතුණ නමුත් ඇමෙරිකා එක්සත් ජනපදයේ වැඩ කරන කාලය ඇත්ත වසයෙන් ම වැඩි වූ බව රට්ගර් බ්‍රෙග්මන් සිය *Utopia for Realists* නමැති කෘතියේ සඳහන් කරයි. ඒ

අනුව ආර්ථික වර්ධනය වැඩි වීම නිසා වැඩ කරන කාලය අඩු වෙනු ඇතැ'යි කී කේන්ස්ගේ අනාවැකිය සනාථ නො වී ය.

2008 ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ ජර්මනිය සිය රටේ සේවකයන් සේවයෙන් පහ කිරීමට හාම්පුතුන්ට ඉඩ දෙනවා වෙනුවට '*Kuzarbeit*' නමින් හැඳින්වූ වැඩ ක්‍රමයක් හඳුන්වා දෙමින් සතියකට වැඩ කළ යුතු පැය ගණන අඩු කළේ ය. ඒ අනුව කලින් වැඩ කළ කාලයට වඩා අඩු කාලයක් වැටුප් සහිතව සේවය කිරීමට සේවකයන්ට අවස්ථාව ලැබුණු අතර එසේ වැඩ කාලය අඩු කිරීම නිසා ඔවුන්ට වැටුපෙන් 60% ක් පමණක් හිමි විය. ඒ අනුව නොයෙකුත් අරමුණු සඳහා වැඩ කරන කාලය අඩු කිරීමේ යෝජනා ක්‍රියාත්මක කර තිබේ. උදාහරණයක් වසයෙන් කොවිඩ්-19 වසංගත සමයේ වැඩ කිරීමේ ක්‍රමය හා කාලය අඩු කිරීමට කටයුතු යොදන ලද්දේ වසංගතය පාලනය කිරීමේ උපක්‍රමයක් ලෙසය.

එහෙත් ඇත්තටම දින හතරක වැඩ සතිය හඳුන්වා දිය යුත්තේ ඊට වඩා පුළුල් සමාජ අරමුණක් ඇතුව ය. තමන්ට සහ තම පවුලට ජීවත් වීමට සරිලන ආදායමක් ලබා ගැනීම පිණිස සිය ජීවිත කාලයෙන් වැඩි කොටසක් කැප කිරීමට සිදු වන සේවකයන්ට ජීවිතය විඳ ගැනීමට ලැබෙන කාලය බෙහෙවින් අඩු ය. වර්තමානයේ එය බොහෝ විට සතියකට දින දෙකක සති අන්තයකට සීමා වී තිබේ. එහෙත් විවේක ගැනීමට, ආදරණීයයන් සමඟ කාලය ගත කිරීමට, අධ්‍යාපනික හෝ නිර්මාණශීලී කටයුත්තක යෙදීමට හෝ වෙනත් අවශ්‍යතා සහ අභිලාෂ ඉටු කර ගැනීමට අමතර දිනයක් සමඟ දින හතරක වැඩ කරන සතියක් මඟින් ශ්‍රම බලකායේ සාමාන්‍ය යහපැවැත්ම සහ ඵකියාව පිළිබඳ ආකල්ප බෙහෙවින් වැඩි දියුණු කළ හැකි ය. දින තුනක සති අන්තයක් සමඟ ප්‍රමාණවත් විවේකයක් ලැබෙන, තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇති වීම වඩාත් ඵලදායී වේ.

වර්තමාන දින පහේ වැඩ සතියක කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් සලකා බැලුවොත් පැය 8 ක වැඩ දිනයෙන් ඵලදායක

වැඩ කොටසක් ඉටු වීම පැය 1.5 සිට 2.5 දක්වා අතර ප්‍රමාණයකට සීමා වන බව කැනඩාවේ සහ බ්‍රිතාන්‍යයේ සිදු කළ සමීක්ෂණ උපුටා දක්වමින් වරක් එකොනොමිස්ට් සඟරාව වාර්තා කළේ ය.[315] ඒ නිසා වැඩ කරන දින ගණන අඩු කොට සේවක තෘප්තිය වැඩි කිරීම මඟින් කාර්යක්ෂමතා ඵලය වැඩි කිරීමට හැකි විය යුතු ය.

ඇත්ත වසයෙන් ම වැඩ කරන කාලය අඩු කර ගැනීම බොහෝ සේවකයන්ගේ අභිප්‍රාය යි. ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති සමීක්ෂණයක දී වැඩ කරන අය වඩා කැමති අමතර ව දෙසතියක වැටුපක් ලබා ගැනීමට ද නැතහොත් අමතරව දෙසතියක නිවාඩුවක් ලබා ගැනීමට දැ'යි විමසූ විට දෙගුණයකට වැඩි ප්‍රමාණයක් කැමැත්ත දැක්වූයේ දෙසතියක අමතර නිවාඩුව ලබා ගැනීමට යි.

රැකියාවෙන් පිටත වැඩි කාලයක් ගත කිරීමට සේවකයන්ට ඉඩ ලැබීම ඔවුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට හිතකර බලපෑමක් ඇති කරයි. දින හතරක වැඩ සතියක් ඔවුන්ට ව්‍යායාම කිරීමට, කියවීමට, රස මසවුළක් පිස ගැනීමට, දූ දරුවන් හා හිතමිතුරන් සමඟ සාමීචියේ යෙදීමට හෝ ඕනෑම විනෝදාංශයකට හෝ පෞද්ගලික අභිලාෂ වෙත ආපසු යෑමට වැඩි අවස්ථාවන් සලසනු ඇත. වැඩ කරන කාල සීමා අඩු කිරීම වැඩපළවල් තුළ ඇතිවිය හැකි අනතුරු අඩු කිරීමේ සිට වැඩ කිරීමේ ආතතිය අඩු කිරීම සහ කාන්තාවන්ගේ විමුක්තියට දායකවීම දක්වා ප්‍රතිලාභ රැසකට හේතු වනු ඇත. ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව පිළිබඳ දර්ශක අනුව ඉහළින් සිටින්නේ වැඩ සතිය අඩු කිරීමට කටයුතු කර ඇති රටවල් බව බ්‍රෙග්මන් පෙන්වා දෙයි. පුරුෂයන් වැඩ පොළේ ගත කරන කාලය අඩු වීම යනු නිවසේ දී සිය සහකාරියට සහය වීමට ලැබෙන කාල වේලාව වැඩි වීමකි.

මෙසේ වැඩ කරන සතිය අඩු කිරීමේ විකල්පය සේවකයින්ගේ ජීවිත වැඩිදියුණු කරන අතර ම, සේවක තෘප්තිය වැඩි වීම ආයතනයේ සේවකයන් අතර සහයෝගය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යෑමට ද

315 https://www.economist.com/the-economist-explains/2021/07/08/could-a-four-day-working-week-become-the-norm

හේතු වනු ඇත. දින හතරක වැඩ සතිය වැඩ කිරීමේ දැඩි විධිවිධාන ඇති අයට සැනසිල්ලක් වනු ඇත.

දින හතරක වැඩ සතිය හඳුන්වා දීම නිසා නිෂ්පාදන ධාරිතාවය අඩු විය හැකියැ'යි මැසිවිලි නැඟෙන්නට බැරිකමක් නැත. වර්තමාන ධනවාදී ආර්ථික ආකෘතියේ කොතෙක් අඩුපාඩුකම් තිබුණත් ඒ නිසා බිහි වී ඇති ව්‍යාපාර හිමියන් සහ සමාගම් තවමත් අතිමහත් බහුතරයකගේ ජීවනෝපාය සඳහා වග කිව යුතු ය. අවම වැටුප් ලබා දීමේ සිට කොටස් හිමියන්ගේ ලාභාංශ සැපයීම දක්වා වූ ආදායම් සැපයීමත් සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ, යටිතල පහසුකම්, පාසල් සහ පොදු පහසුකම් පවත්වා ගැනීම ඇතුළු සමාජයේ බොහෝ අවශ්‍යතාවලට පොදු අරමුදල් සපයන බදු පදනම සැපයීමත් ඔවුන්ගේ එක් වගකීමකි. ඒ නිසා දින හතරක වැඩ සතිය ව්‍යාපාරයට වාසියක් මිස පාඩුවක් නො වන බව ව්‍යාපාර හිමියන්ට ඒත්තු යා යුතු ය. 2019 බ්‍රිතාන්‍ය මහ මැතිවරණයේ දී ලේබර් පක්ෂයේ එක මැතිවරණ පොරොන්දුවක් වූයේ ලේබර් ආණ්ඩුවක් බලයට පත් වුව හොත් දශකයක් තුළ සතියකට වැඩ කරන පැය ගණන 32 දක්වා අඩු කොට දින හතරක වැඩ සතියක් හඳුන්වා දී මට කටයුතු කරන බවයි. එම යෝජනාව ආර්ථික සමෘද්ධිය කඩාකප්පල් කරන්නක් වන බව කොන්සර්වෙටිව් පක්ෂය චෝදනා කළ ද දැනටමත් දින හතරක වැඩ සතිය හඳුන්වා දී ඇති බ්‍රිතාන්‍ය ආයතන සම්බන්ධයෙන් රීඩින් විශ්ව විද්‍යාලයේ ආචාර්ය මිරියාම් මාරා ප්‍රමුඛ කණ්ඩායමක් විසින් කරන ලද සමීක්ෂණයකට අනුව දින හතරක වැඩ සතියක් හඳුන්වාදීම නිසා එම ආයතන වලට වසරකට පවුම් බිලියන 92 ක මුදලක් ඉතිරි කර ගත හැකි වූ බව පෙන්වා දෙයි.[316]

කෙසේ වෙතත් 2020 කෝවිඩ්-19 වසංගතය නිසා උද්ගත වූ ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා දින හතරක වැඩ සතිය ප්‍රයෝජනවත් විය හැකි බව බ්‍රිතාන්‍යයේ ඇතැම් කොන්සර්වෙටිව්

316 https://research.reading.ac.uk/research-blog/economics-of-a-four-day-working-week-research-shows-it-can-save-businesses-money/ - Retrieved on 28 Aug 2022

පාක්ෂිකයන් ද මත පළ කරන්නට පටන් ගෙන තිබේ. ඒ අනුව ද්විපාර්ෂික පාර්ලිමේන්තු මන්ත්‍රීන් කණ්ඩායමක් ද ඇතුළත් විද්වතුන් පිරිසක් 2020 ජුනි මාසයේ දී ලිපියක් ලියමින් දින හතරක වැඩ සතිය හඳුන්වා දෙන ලෙස කොන්සර්වෙටිව් ආණ්ඩුවේ චාන්සලර්වරයාගෙන් ඉල්ලා සිටියේ ය. "ආර්ථිකය මූලික වසයෙන් ම ප්‍රතිව්‍යුහගත කිරීමෙන් වැඩ කිරීම වඩා සම ලෙස බෙදී යෑමට හැකි වන ලෙස දින හතරක වැඩ සතියක් හඳුන්වා දීම ඉතාමත් හොඳ යෝජනාවක් බව අපි සලකමු" යනුවෙන් ඔවුහු සිය ලිපියේ සඳහන් කළහ. ඇතැම් සමීක්ෂණවලට අනුව බ්‍රිතාන්‍යයේ වැඩ කරන ජනයා අතරින් 75%ක් දින හතරක වැඩ සතියකට කැමැත්ත පළ කරති.[317]

බ්‍රිතාන්‍යයේ ද වැඩ සතිය අනුක්‍රමයෙන් අඩු වූ එකකි. 1946 සිට 1979 දක්වා බ්‍රිතාන්‍ය සතියකට පැය 46ක් වැඩ කරන රටක් වූ අතර පැය 40ක වැඩ සතියක් හඳුන්වා දෙනු ලැබුවේ 1979 සිට ය. ඒ නිසා නිෂ්පාදන ධාරිතාවය අඩු වූ බවට කර්මාන්ත හිමියන්ගෙන් මැසිවිලි නැගුණු බවක් වාර්තා නො වී ය. වැඩ හා සැපයුම් දාම ප්‍රතිසංවිධානය, තාක්ෂණය යොදා ගැනීම නිසා ඇතිවෙන වාසිය නිසා වැඩ කරන පැය ගණන පමණක් නො ව දින ගණන ද අඩු කිරීම නොකළ හැක්කක්ද නො වේ.

දින හතරක වැඩ සතිය හඳුන්වා දීම මඟින් ඇත්ත වසයෙන් ම ඇතිවිය හැක්කේ ආර්ථිකය මර්දනය වීමකට වඩා වර්ධනය වීමකි. සති අන්තය දීර්ඝ වීම නිසා විනෝදය හා විවේකය සඳහා ලැබෙන අතිරේක කාලය උපයෝගී කර ගත හැකි අන්දමට දේශීය සංචාරක කර්මාන්තය හා විනෝදය, විවේකය ආශ්‍රිත ආර්ථික කර්මාන්තවල වැඩිදියුණු වීමක් බලාපොරොත්තුවිය හැකි ය. ඒ හැර නිර්මාණාත්මක කටයුත්තක යෙදීමට වැඩිදුර අධ්‍යාපනයක නිරත වීමට වැඩි වැඩියෙන් අවස්ථාවන් ලැබීම මානව සම්පත් වර්ධනයට ද උත්තේජනයක් විය හැකි ය. දින හතරක වැඩ සතිය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක

317 https://www.independent.co.uk/news/uk/politics/coronavirus-four-day-week-poll-rishi-sunak-corbyn-a9595201.html - Retrieved on 28 Aug 2021

කිරීමෙන් දැනට වඩා වැඩි කාලයක් පවුලේ සාමාජිකයන් සහ ප්‍රජා මිතුරන් සමග ගත කිරීමටත් ක්‍රීඩා කිරීමටත් ළමයින්ට සහ යෞවනයන්ට ලැබෙන කාලය වැඩි වේ.

ඒ හැර තවත් වැදගත් පැතිකඩක් වන්නේ නිර්කාබනික ආර්ථිකයක් කරා යොමු වීමේ දී අහිතකර දේශගුණ විපර්යාසවලට තුඩු දෙන හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සම්බන්ධයෙන් ද දින හතරක වැඩ සතියක් මඟින් ලැබෙන දායකත්වය ඉමහත් වීම යි. ආයතන සහ කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය වන බල ශක්තිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට ද, ගමනා ගමන අවශ්‍යතා සඳහා වැය වන ඉන්ධන ප්‍රමාණය අඩු වීම නිසා ද පාරිසරික වත්කම් ද අඩංගු සමස්ත ආර්ථිකයට ලැබෙන වාසිය ඉමහත් ය. නව ආර්ථික දැක්මක් තුළ ධරණීය සංවර්ධනයකට මානවයාට හිතකර පරිසරයක් පවත්වා ගෙන යෑමට යොදන වැදගත් ආයෝජනයක් වසයෙන් දින හතරක වැඩ සතිය සැලකිය යුතු ය.

සුවිශාල නගරයක, දින හතරක සතියක් හඳුන්වා දීමෙන් අදහස් වන්නේ මාර්ගයේ වාහන සංඛ්‍යාව ක්ෂණික ව අඩු කිරීම යි. සති අන්තය දිනකින් වැඩි කිරීම යනු රැකියා වියුක්තියකින් තොර ව සේවක සංඛ්‍යාව සියයට 20 කින් අඩු කිරීමකි. සමීක්ෂණවලින් ගණන් බලා ඇති පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයේ හරිතාගාර වායු විමෝචනයෙන් සියයට 29 ක් පමණ උද්ගත වන්නේ ප්‍රවාහනයෙනි. එබැවින් දින හතරක සතිය සම්මත කර ගැනීමෙන් අදහස් වන්නේ වායු විමෝචනය අඩු වීමක් වන අතර එය එක්සත් ජනපදයේ පමණක් මෝටර රථ මිලියන 10 ක් මාර්ගයෙන් ඉවත් කිරීමට සමාන වේ! යැයි කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ මානව සම්පත් පිළිබඳ අධ්‍යනය පිළිබඳ ආචාර්ය ඩේවිස් පෙන්වා දෙයි. "රැකියාවට නො පැමිණීම ඔබට තනි සේවකයෙකු ලෙස පරිසරය සුරැකීම සඳහා කළ හැකි දේවලින් හොඳම එකක් විය හැකියැ'යි ඩේවිස් පවසයි."

සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද දින හතරක වැඩ සතිය තීරණාත්මක දායකත්වයක් ලබා දේ. ඒ නිසා

ප්‍රජා හා දේශපාලන කටයුතු වල නියැලීමට, සංවිචාරණීය කතිකා වලට සහභාගි වීමට, සමාජ සංවිධාන කටයුතු ඉටු කිරීමට ස්වේච්ඡා සේවයේ නියැලීමට ලැබෙන ඉඩ කඩ වැඩිය. ඒ නිසා සංවිචාරණීය සමාජයක් ගොඩ නගා ගැනීමේ ලා දින හතරක වැඩ සතියක් යනු වැදගත් සාධකයකි.

ජීවත් වීම සඳහා ජීවනෝපායක් තිබීම හැම කල්හි ම පැවති අවශ්‍යතාවකි. එම ජීවනෝපායන් වක්‍ර හෝ සෘජු ලෙස භාණ්ඩ හා සේවා සැපයීමේ කටයුත්ත ඉටු කිරීමට අත්‍යවශ්‍ය බවට කෙරෙන තර්කයේ ඇත්තක් තිබිය හැකි නමුත් තාක්ෂණය වැඩි දියුණු වීමත් සමඟ වැඩ කිරීම සඳහා මිනිස් ශ්‍රමය යොදා ගැනීමට අවශ්‍ය කරන කාලය අවම නො කිරීමට එය හේතුවක් නො විය යුතු ය. රැකියාවක නිරත වීමට යෙදිය යුතු කාලය අවම කිරීම යනු වඩා පරිපූර්ණ ජීවිතයක් විඳ ගැනීමට සේව්‍ය සේවක දෙගොල්ලට ම වැඩි කාලයක් ලබා දීමකි.

# - 28 -

## සමාජීය හා ආර්ථික ප්‍රතිමාන

යුක්තිගරුක සංවිචාරණීය සමාජයක් බිහි කර ගැනීම අපේ අභිප්‍රාය නම් එවැනි සමාජයක තිබිය යුතු පොදු චර්යාව කෙබඳු විය යුතු ද යන්න කියැවෙන සදරපි හෙවත් ප්‍රතිමාන මොනවා ද යන්න ගැන අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය. *Norms* යන ඉංග්‍රීසි වචනයට දී ඇති සිංහල වදන් අතර ප්‍රතිමාන, හා ප්‍රමිති වැනි වචන ද වේ. ප්‍රතිමාන යනු කිසියම් සදාචාරීය චර්යාවක් හෝ අරමුණක් කිනම් ප්‍රමිතියක් ඇතිව ඉටු කර යුතු ද යන්න පිළිබඳ අප තුළ ඇති පිළිගැනීම යි. ඒ අනුව කොටින් ම *Norms* හෙවත් ප්‍රතිමාන යනු සමාජයේ පුද්ගල පැවතුම් හා කෙරුම් පිළිබඳ ව බහුතරය විසින් පිළිගත යුතු ප්‍රමිති ය. කිසියම් ප්‍රතිමානයක් සදාචාරය පිළිබඳ ප්‍රතිමානයක් නො වන්නේ ද එමඟින් චර්යාවක් නියාමනය නො කරයි ද එවිට එහි ප්‍රතිමානික සද්භාවයක් *(normative virtue)* නැති බවත් එවැනි දේවල් ප්‍රතිමාන වසයෙන් නො සැලකිය යුතු බවත් ව්‍යවස්ථා නීතිය පිළිබඳ විශාරදයෙකු වන සැන්ඩියාගෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ලැරි ඇලෙක්සැන්ඩර් පවස යි.[318]

බොහෝ විට යම් යම් චර්යා පිළිබඳ අපේ සිතුවිලි පැන නැගෙන්නේත් අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවෙන්නේත් ඒ ඒ චර්යා සම්බන්ධයෙන් ඇතැ'යි අප විශ්වාස කරන පරමාදර්ශී ප්‍රතිමාන පදනම් කර ගෙන ය. යමක් කිරීමේ දී ප්‍රතිඵලය ලෙස කුමක් බලාපොරොත්තු

318 Allexander Larry (2011) What are constitutions and what should they do ? in What Should Constitutions Do? Paul Ellen Frankel (eds), Cambridge University Press. p.12

වන්නේ ද සහ ඒ සඳහා කුමක් කළ යුතු ද යන කරුණු දෙක ම ප්‍රතිමාන මඟින් එක්තරා දුරකට නිශ්චය වේ. අභිමත සමාජීය පැවතුම් සහ කෙරුම්වල ප්‍රතිමාන පිළිබඳව කතිකාවකින් තොර ව යුක්තිය අත්පත් කර ගැනීමේ දේශපාලනය දියත් කිරීම අසීරු ය. ඒ ප්‍රතිමාන මඟින් කියවෙන්නේ අප ගොඩ නැඟීමට බලාපොරොත්තු වන යුක්තිගරුක සමාජය කෙබඳු පුද්ගල චර්යාවලින් සහ පුද්ගල ශක්‍යතාවලින් යුත් සමාජයක් විය යුතු ද යන්න යි. ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට පෙර අයිස්ලන්ත වැසියෝ එම ව්‍යවස්ථාව මඟින් ගොඩ නැඟීමට බලාපොරොත්තු වන ජන සමාජය කෙබඳු එකක් විය යුතු ද යන්න පිළිබඳ ව ගැඹුරු සංවිචාරණයක *(deliberation)* නියැලුණු අන්දම අපි පස්වැනි පරිච්ඡේදයේ දී සාකච්ඡා කළෙමු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වන්නේ කෙබඳු සමාජයක් ද යන්න සංයුක්ත ලෙස වර්තමාන ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නො වේ. ඒ වෙනුවට එහි පූර්විකාවේ ඇති වැල්වටාරම් භාෂිතයෙන් කියවෙන්නේ එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිදහස, සමානාත්මතාව, යුක්තිය, මූලික මිනිස් අයිතිවාසිකම් හා අධිකරණයේ ස්වාධීනත්වය සකල ජනතාවට සහතික කරන්නා වූ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් බවට පත් කිරීම සඳහා ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමටත් සම්මත කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් තෝරා පත් කර ගන්නා ලද නියෝජිතයන්ට භාර කොට බලය පවරා දෙනු ලැබූ නිසා පනවන ව්‍යවස්ථාවක් බවයි. එහෙත් අප කවුරුත් දන්නා පරිදි එකී නිදහස, සමානාත්මතාවය, යුක්තිය, මූලික මිනිස් අයිතිවාසිකම් හා අධිකරණයේ ස්වාධීනත්වය කෙබඳු විය යුතු ද යන්න පිළිබඳව පුළුල් සංවිචාරණීය සමාජ කතිකාවක් ව්‍යවස්ථා සම්පාදනයට සූදානම් වීමක් ලෙස ඇති කිරීමේ වෑයමක් එකල නොතිබිණි. ඒ නිසා එවැනි වටිනාකම් සහිත ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට මහජන වරමක් ලැබිණියැ'යි කීම සත්‍යයකට වඩා ළං වන්නේ ව්‍යවස්ථාව කෙටුම්පත් කළ විශේෂඥයන්ගේ හුදු අනුකරණීය භාවිතයක් ලෙස ය. එය වඩාත් තහවුරු වන්නේ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කරමි යැ'යි දිවුරුම් දෙන ජනාධිපති,

අගමැති, මැති ඇමති ආදීන් කිසිදු විලි ලැජ්ජාවක් නැතිව නිදහස, සමානාත්මතාවය, යුක්තිය, මූලික මිනිස් අයිතිවාසිකම් සහ අධිකරණයේ ස්වාධීනත්වය වැනි වටිනාකම් නිරන්තරයෙන් ගර්හාවට ලක් කරන බැවිනි. මූලික අයිතිවාසිකම් මහජන පරමාධිපත්‍යයේ අනුල්ලංඝනීය අංගයක් යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ව තිබියදී මානව අයිතිවාසිකම් යනු අප අමාරුවේ දැමීමට බටහිර රටවල් විසින් ඇටවූ කෙමණකැ'යි ඔවුන්ගෙන් ඇතමෙක් පුන පුනා සඳහන් කරන්නේ එබැවිනි. එනිසා ලංකාණ්ඩුක්‍රම ව්‍යවස්ථා පූර්විකාවේ සඳහන් එවැනි වටිනාකම් සැලකිය හැක්කේ හුදු ව්‍යාජ සැරසිල්ලක් ලෙස පමණි. සමානාත්මතාවය වැනි වටිනාකම් උල්ලංඝණය වන විධිවිධාන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ම දක්නට ලැබීම ම ඊට නිදසුනකි..

රට තුළ බුද්ධාගමට දිය යුතු ප්‍රමුඛත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් නිරූපණය වීමේ අවශ්‍යතාව පිළිබඳ ඇතැම් කොටස් දක්වන උනන්දුව සලකමින් ඒ සම්බන්ධයෙන් වඩා යුක්ති යුක්ත කළ හැකි යෝජනාවක් සාකච්ඡාවට ලක් කිරීමේ ප්‍රයත්නයකට 2017 නොවැම්බරයේ දී මම ද දායක වීමි. එයට දායක වූ සියල්ලන් ම පාහේ රාජ්‍යයේ ලෞකික බව *(secular nature)* වෙනුවෙන් පෙනී සිටින අය වූහ. එහෙත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින් බුද්ධාගම ආරක්ෂා කර ගැනීම පිළිබඳ අදහස වෙනත් අන්දමකට ප්‍රක්ෂේපණය කිරීමට අපි අදහස් කළෙමු. අප කිනම් ආකාරයක සමාජයක් ගොඩනැගිය යුතු ද සහ එම සමාජයේ ජීවත්වන්නන් එකිනෙකා කෙරෙහි හැසිරිය යුත්තේ කෙසේ ද යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කතිකාවේ කේන්ද්‍රීය කරුණක් බවට පත්කර ගැනීම එමඟින් අපේ අභිප්‍රාය වීයැ'යි සැලකිය හැකි ය.[319] යෝජනාවේ හරය වූයේ හුදෙක් බුද්ධාගමට ප්‍රමුඛත්වය දීම වෙනුවට බුදු දහමේ අපේක්ෂා කරන සදාචාරීය ශික්ෂණය පොදු

319 සෙල්වි තිරුචන්ද්‍රන්, කුසල් පෙරේරා, ඇන්ටන් මාකස්, එම්.සී.එම් ඉක්බාල්, සුනේත්‍රා රාජකරුණානායක, විජයානන්ද ජයවීර, ආචාර්ය නිශාන් ද මැල්, ජීවනී කාරියවසම්, විජය ජයතිලක, ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන, පරාක්‍රම නිරිඇල්ල, ආචාර්ය එච්. දොන් සුමනරත්න, ආචාර්ය පුෂ්පා රම්ලනී, ලලිත් අබේසිංහ සහ ක්‍රිෂාන් සිරිවර්ධන එම යෝජනාවට අත්සන් කර තිබූ අයයි

චර්යාව බවට පත් කළ හැකි සමාජයක් ගොඩ නැගීම වඩා සංයුක්ත ලෙස ආණ්ඩුක්‍රමයේ අරමුණ කිරීම යි. හොඳ සංවිචාරණයකින් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පූර්විකාවේ ම එවැනි අරමුණු නිශ්චය කොට දැක්විය හැකි ය. එවිට එය ජනසමාජය ගමන් කළ යුතු දිශානතිය කුමක් විය යුතු ද යන්න පිළිබඳ ව රට වැසියන් අතර ඇති කර ගත් සාමූහික එකඟත්වයක් ලෙස සැලකිය හැකි වේ. කෙසේ වෙතත් එවකට අපේ යෝජනාව වූයේ 1978 ජනරජ ව්‍යවස්ථාවේ දෙවෙනි පරිච්ඡේදයේ නව වෙනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ඇතුළත් කළ යුතු බවයි:

"ආණ්ඩුකරණයේ දී සියල්ලන් සමානයින් ලෙස සලකමින් කුල, පංති, ආගම්, ජනවර්ග සහ ස්ත්‍රී පුරුෂ භාවය නො තකා කරුණා, මෙත්තා, මුදිතා, උපේක්ඛා සහ අහිංසා යන ශික්ෂා උත්තරීතර ශික්ෂා ලෙස සියලු කල්හි පිළිගනිමින් රාජ්‍ය හා ආණ්ඩුව ඒවා ප්‍රගුණ කළ යුතුය;

කරුණා යනු අනුන් වෙත දක්වන ඉවසීම, දයාව වේ;

මෙත්තා යනු සියල්ලන් වෙත දක්වන සොඳුරු බව, මිත්‍රත්වය, යහපත් ගුණගරුක බව වේ; මුදිතා යනු අනුන් සම්බන්ධයෙන් දක්වන ස්වාර්ථකාමයෙන් තොර අවංක සංවේදී සතුට වේ; උපේක්ඛා යනු ක්ෂාන්තිය, වෙනසකින් තොර ව සම සිතින් සැලකීම වේ;

අහිංසා යනු හිංසනයෙන්, ප්‍රචණ්ඩත්වයෙන් තොර සිල්වත් ක්‍රියාකාරිත්වය වේ.

මෙම උතුම් පංච ශික්ෂා මත පිහිටි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ස්ථාපිත කොට පවත්වා ගැනීම පිණිස සියලු පුරවැසියන්ට ඔවුන් සතු සිවිල්, දේශපාලනික, සමාජීය, ආර්ථික, සංස්කෘතික, පාරිසරික සහ අධ්‍යාපනික අයිතීන් පූර්ණ ලෙස භුක්ති විඳීමේ සම අවස්ථාවන් සහතික කිරීම රාජ්‍යයේ හා එහි ව්‍යවස්ථාපිත ආයතනවල මූලික වගකීම වේ."

පරිපූර්ණ යෝජනාවක් නො වුනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කිනම් ආකාරයක සමාජයක් ගොඩ නැගීමට කටයුතු කළ යුතු ද යන්න සහ සියලු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන ඒ සඳහා කුමක් කළ යුතු ද යන්න පිළිබඳ ව සංවිචාරණීය කතිකාවක් ඇති කිරීමේ හොඳ මූලද්‍රව්‍ය ඉහත යෝජනාවේ තිබුණි. යෝජනාව එවකට පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභාපති ඇතුළු මෙහෙයුම් කමිටු

සාමාජිකයන්ට ඉදිරිපත් කරනු ලැබුවත් ඒ ගැන කිසිදු ප්‍රතිචාරයක් නො වී ය.

හොඳ ජීවිතයක් යනු කුමක් ද යන්න පිළිබඳ මිනිසුන් තුළ එකිනෙකට වෙනස් අදහස් තිබිය හැකි ය. එසේ වුව ද වාර්ගික හා ආගමික වෙනස්කම් ඉක්මවා කිසියම් අවම පොදු කොන්දේසි මත එක රටක රටවැසියන් ලෙස අනන්‍ය වූ දේශපාලන ප්‍රජාවකට අයත් වීමේ එකඟතාවක් ඇති කර ගැනීමට එය බාධාවක් නො වේ. එවැනි අවම පොදු කොන්දේසි එම සමාජයට අයත් ඕනෑ ම කෙනෙකුට සිය පුද්ගල අභිමානය සුරැකගෙන අන්‍යයන් සමඟ සහජීවනයෙන් ජීවිතය විඳ ගැනීමට තරම් ප්‍රමාණවත් විය යුතු ය. කරුණා, මෛත්‍රී, මුදිතා, උපේක්ඛා සහ අහිංසා වැනි ප්‍රතිමාන ඒ සඳහා අතිශයින් ම උචිත යැ'යි කිව හැකි ය. කෙසේ වුව ද එවැනි ප්‍රතිමාන ගැඹුරු සමාජ සංවිචාරණයකින් පසු නිශ්චය කළ යුතු දේවල් ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක සඳහන් කළ පමණින් ම එවැනි කොන්දේසි ප්‍රායෝගික ව තහවුරු කළ නො හැකි බව සැබැවි. එහෙත් බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල පටිපාටිමය විධිවිධාන මෙන් ම අභිලාෂාත්මක ප්‍රකාශ ද අඩංගු වේ. බොහෝ විට එවැනි අභිලාෂ දක්නට ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පූර්විකාවේ ය.

ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ආරම්භ වන්නේ එම ව්‍යවස්ථාව මඟින් සංවිධානය කරන සමාජයේ අභිමත ස්වභාවය කුමක් ද යන්න පැහැදිලි කෙරෙන පූර්විකාවකිනි *(preamble)*. නූතන යුගයේ මුල්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලෙස සැලකෙන ඇමරිකානු එක්සත් ජනපද ව්‍යවස්ථාව *(*1787*)* ඇරඹෙන්නේ "එක්සත් ජනපදවල ජනතාව වන අප, වඩා පරිපූර්ණ සාංගමික රාජ්‍යයක් පිහිටුවීම උදෙසාත්, යුක්තිය, අභ්‍යන්තර නිරුපද්‍රතාව, පොදු ආරක්ෂාව සැලසීම, පොදු සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ අපටත් අපෙන් පසුව එන අයටත් නිදහසේ ආශිර්වාදය සාක්ෂාත් කිරීම පිණිස ඇමරිකා එක්සත් ජනපදය සඳහා මෙම ව්‍යවස්ථාව පනවා පිහිටුවමු" යන පූර්විකාවෙනි.

ව්‍යවස්ථාවක පූර්විකාවෙන් අදහස් වන්නේ කුමක් ද යන්න සම්බන්ධයෙන් වඩා මෑත කාලීන උදාහරණයක් දකුණු අප්‍රිකාව 1996 දී සම්මත කරගත් නව ව්‍යවස්ථාවේ පූර්විකාවෙන් උපුටා දැක්විය හැකි ය. එම ව්‍යවස්ථාවේ මූලික අභිලාෂය වූයේ පැරණි වර්ණභේදවාදී අතීතයෙන් ගැලවී පරිණාමනය වන අනාගතයක දූතයෙකු බවට පත් වීමයි. ඒ බව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පහත දැක්වෙන පූර්විකාව කියවීමෙන් සැක හැර දැන ගත හැකි යඃ

*"දකුණු අප්‍රිකාවේ ජනතාව වන අපි,*
*අතීතයේ අපට ඇති වූ අසාධාරණකම් සලකමින්,*
*අපේ දේශයේ යුක්තිය සහ නිදහස සඳහා දුක්විඳි අයට බුහුමන් කරමින්,*
*අපේ රට ගොඩ නැගීමට හා සංවර්ධනය කිරීමට කටයුතු කළ අයට ගරු කරමින්,*
*අපේ බහුවිධත්වය එක්සත් කරමින් දකුණු අප්‍රිකාව තුළ ජීවත්වෙන සියල්ලන්ට ම දකුණු අප්‍රිකාව අයිති බව විශ්වාස කරයි.*

*ඒ අනුව අපි නිදහස් ලෙස තෝරා ගන්නා ලද නියෝජිතයන් මඟින් සමූහාණ්ඩුවේ උත්තරීතර නීතිය ලෙස මෙම ව්‍යවස්ථාව සම්මත කරමු.*
*ඒ මඟින්,*
*අතීතයේ තිබූ බෙදීම් සුවපත් කොට ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්, සමාජ සාධාරණය සහ මූලික මිනිස් අයිතිවාසිකම් පදනම් කරගත් සමාජයක් පිහිටුවීම;*
*මහජන කැමැත්ත පදනම් කර ගත් ආණ්ඩුවකින් යුක්ත වූ ද මහජනයා සහ හැම පුරවැසියෙකු ම එක හා සමානව නීතියෙන් ආරක්ෂා කරන්නා වූ ද ප්‍රජාතන්ත්‍රවාදී විවෘත සමාජයකට පදනම දැමීම;*
*සියලු රටවැසියන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ හැම පුද්ගලයෙකුගේ ම ශක්‍යතා මුදා හැරීම; සහ*
*ජාතීන් නමැති පවුලේ ස්වෛරී රාජ්‍යයක් ලෙස නියම ස්ථානය ගැනීමටත් හැකි වෙන එක්සත් සහ ප්‍රජාතන්ත්‍රවාදී දකුණු අප්‍රිකාවක් ගොඩ නගමු.*

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පෙළ තුළ පූර්විකාව යනු අලුතින් බිහි කරනු ලබන රාජ්‍යය පිළිබඳ ව ව්‍යවස්ථා සම්පාදකයින්ගේ කේන්ද්‍රීය අභිලාෂ ප්‍රකාශයට පත් කරන්නා වූ ද ඔවුන්ගේ ගැඹුරු ප්‍රාර්ථනා සංනිවේදනය කරන්නා වූ ද ස්ථානය යි" යනුවෙන් මහාචාර්ය බෝ බ්‍රෙස්ලින් ව්‍යවස්ථාවක කාර්ය ගැන කරන විවරණයක සඳහන් කරයි.[320]

එහෙත් මෙවැනි පූර්විකා ව්‍යවස්ථාවක පදනම ලෙස ගැණුන ද ඒවා අධිකරණමය වසයෙන් විනිශ්චයට ලක් කළ නො හැකි ඒවා ලෙස සැලකේ. අධිකරණයක් මඟින් බලාත්මක කල නො හැකි බැවින් බොහෝ නීතිඥයෝ සහ නීති විශාරදයෝ එවැනි ඡේදවල අමතර වටිනාකමක් නැතැයි නො සලකා හරිති. එසේ වුව ද දකුණු අප්‍රිකාවේ ඡන්ද අයිතිය පිළිබඳ නඩු විභාගයක දී "සමස්තයක් ලෙස ගත් විට එමඟින් ව්‍යවස්ථාවට අර්ථයක් සහ ඥානනයක් දෙන තාක් දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාවේ පූර්විකාවේ සඳහන් වන වටිනාකම් අතිශයින් ම වැදගත් බවත් එහෙත් ඒවා තුළින් බලාත්මක කළ හැකි අයිතීන් පැන නො නගින බවත්" දකුණු අප්‍රිකානු ව්‍යවස්ථා අධිකරණයේ සභාපති ආතර් චස්කල්සන් පැහැදිලි කර ඇති බව ආචාර්ය ලෙවින්සන් උපුටා දක්වයි.[321]

මහාචාර්ය ලැරි ඇලෙක්සැන්ඩර්ට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්ය වන්නේ 'අප විසින් සමාජය හා ආණ්ඩුව සංවිධානය කර ගත යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධ ඉතා මූලික ප්‍රශ්න නිරාකරණය කර දැක්වීම' යි.[322] එසේ වුවද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී සංවිචාරණයක් පැවැත්වීමේ දී අප මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරන්නේ කිනම් ආකාරයක සමාජයක් ගොඩනැගීම සඳහා ද යන ප්‍රශ්නය මුලින් ම විමසිල්ලට

---

320 Beau Breslin, From Words to Worlds: Exploring Constitutional Functionality (Baltimore: MD, The Johns Hopkins University Press, 2009), p. 50.

321 Levinson, Stanford (2011) Do Constitutions Have a Point? in in What Should Constitutions Do? Paul Ellen Frankel (eds), Cambridge University Press. p.164

322 Allexander, Larry (2011) What are constitutions and what should they do ? in What Should Constitutions Do? Paul Ellen Frankel (eds), Cambridge University Press. p.1

ලක් කිරීම වැදගත් ය. ව්‍යවස්ථාවට අඩංගු විය යුතු පොදු අභිලාෂ හා වටිනාකම් ගැන බහුතරයකට සහභාගි විය හැකි කතිකාවකින් පටන් ගැනීම ව්‍යවස්ථාවේ පොදු අයිතිය තහවුරු කිරීමේ හොඳ ක්‍රමයකි. ආණ්ඩුක්‍රමයේ ව්‍යුහය හා ඒ ඒ ආයතනවල අවශ්‍යතාව සාධාරණීකරණය කිරීම සහ ආයතනික කාර්ය, කළ නො කළ යුතු දේවල් සහ බලතල පිළිබඳ සාකච්ඡාවකට මහජනතාවගේ ක්‍රියාශීලී අවධානය හා සහභාගීත්වය යොමු කර ගත හැක්කේ එසේ එකඟ වන අභිලාෂ හා වටිනාකම්වලට ඇති පොදු පිළිගැනීම මත ය.

හැම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ම නිර්ණායක තුනකට අනුව ඇගයීමට ලක් කළ හැකියැ'යි මේරිලන්ඩ් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය විලියම් ගැල්ස්ටන් පවසයි. ඒවා නම් යථාර්ථවාදී බව *(realism)*, සංසක්ත බව *(coherence)*, සහ අංගසම බව *(congruence)* යි.[323] ඔහුට අනුව ව්‍යවස්ථාවක් යථාර්ථවාදී වන්නේ එමගින් රට වැසියන්ට අනවශ්‍ය බර පැටවීමක් සිදු නො වේ නම් ය; එය සංසක්ත වන්නේ ව්‍යවස්ථානුකූල ව සහජීවනයෙන් ජීවත් විය යුතු රටවැසියන් එකම ප්‍රජාවකට අයත් නො වීමට තරම් ව්‍යවස්ථාවෙන් ප්‍රගුණ කරවන වටිනාකම් පරස්පර නො වූ විටයි. උදාහරණයක් ලෙස ගත්තොත් ජනවර්ග කිහිපයක් ජීවත් වන රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් ප්‍රගුණ කරවන වටිනාකම් සියලු ජනවර්ග වලට පිළිගත හැකි විය යුතු ඒවා විය යුතුය. ව්‍යවස්ථාවක් අංගසම වන්නේ සමස්තයක් වසයෙන් ගත් විට එමගින් හඳුන්වා දෙන විධිවිධාන ව්‍යවස්ථාව යටතේ ජීවත්වෙන ජනතාවගේ සදාචාරීය හැඟීම් හා ගැළපෙන විට යි. ඒ අතින් කරුණා, මෙත්තා, මුදිතා, උපේක්ඛා සහ අහිංසා යන චර්යා ගුණාංග ලක්වැසි සියල්ලන්ට ම එකඟ විය හැකි ඒවා ය. මේ අනුව අපේක්ෂිත සදාචාරීය වටිනාකම් පිළිබඳ පොදු එකඟත්වය ව්‍යවස්ථාවේ සඳහන් ව තිබීම ව්‍යවස්ථාව සුජාතකරණය කිරීමට කොයි තරම් වැදගත් වේ දැයි සිතිය හැකිය.

---

323 Galston, William A (2011) Pluralist Constitutionalism, in What Should Constitutions Do? Paul Ellen Frankel (eds), Cambridge University Press. p.238

ඇමෙරිකානු ව්‍යවස්ථාවේ ප්‍රධාන කර්තෘ ලෙස සැලකෙන ජේම්ස් මැඩිසන් පැවසූ අන්දමට "මිනිසුන් විසින් මිනිසුන් පරිපාලනය කිරීම පිණිස ආණ්ඩුවක් සැලසුම් කරන විට ඉතා අසීරු ම කාරණය වන්නේ පාලිතයන් පාලනය කිරීමට ආණ්ඩුවට බලය ලබා දෙන අතර ම තමන් ව පාලනය කර ගැනීම ද ආණ්ඩුවේ ම අනිවාර්ය කාර්ය බවට පත් කිරීම යි."[324] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යය වන්නේ මේ අසීරු ගැටලුව විසඳීම සඳහා ආණ්ඩුවක ව්‍යුහය කෙබඳු විය යුතු දැයි විස්තර කොට ආණ්ඩුවකට හිමි බලය නිශ්චිත කිරීම සහ එම බලයේ සීමා නිර්ණය කිරීම බව මැඩිසන් අනුව ගිය ව්‍යවස්ථා විශේෂඥයෝ පැවසූහ. එහි දී ආණ්ඩුවේ එකී බලය කොතරම් ප්‍රබල විය යුතු ද එම බලය සීමා වන්නේ කෙසේ ද ආණ්ඩුවේ නීත්‍යානුකූල කටයුතු මොනවාද සහ ඒවා යුක්තියුක්ත ව සාධාරණීකරණය කරන්නේ කෙසේ ද පුරවැසියන්ගේ පොදු යහපත සාක්ෂාත් කිරීම රටක ව්‍යවස්ථාවේ අරමුණක් නම් පොදු යහපත යන්න නිර්වචනය කළ යුත්තේ කෙසේ ද රටවැසියන්ගේ අයිතීන් සම්බන්ධව ව්‍යවස්ථාවෙන් කිනම් ආකාරයක රැකවරණ සැපයිය යුතු ද සහ එම අයිතීන් කිනම් ආකාරයකින් කෙටුම්පත් වී තිබිය යුතු ද වැනි ප්‍රශ්න ගණනාවකට පිළිතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන මඟින් පැහැදිලි කළ යුතු බව ඔවුහු පෙන්වා දෙති. මේ සියල්ල වැදගත් ප්‍රශ්න බව නිසැක ය. ඒ අනුව ආණ්ඩුක්‍රමය ගැන මතු වන ගැටලු ඇතැම් විට අධිකරණය හරහා නිරාකරණය කර ගත හැකිය.

එහෙත් ආණ්ඩුක්‍රමයේ පදනම විය යුතු සමාජ අභිලාෂ ගැන සමස්ත සමාජයේ ම එකඟත්වයක් තිබීම සහ එය ආණ්ඩුක්‍රමයේ මෙහෙයුම් මූලධර්මය ලෙස ඉහළින් ම සඳහන් ව තිබීම සහ ඒ අනුව ආණ්ඩුක්‍රම විධිවිධාන තීරණය කිරීම ද අතිශයින් ම වැදගත් ය.

අප ගොඩ නගන සජ්ජන සමාජයක වටිනාකම් පිළිබඳ

324 James Madison, Federalist No. 51, in Alexander Hamilton, James Madison, and John Jay, The Federalist Papers, ed. Clinton Rossiter (New York: New American Library, 1961), 322.

ප්‍රතිමාන ගැන අවධානය යොමුවිය යුත්තේ ව්‍යවස්ථා සම්පාදනයේ දී පමණක් නො වේ. ආර්ථික හා සමාජීය සංවර්ධනය සම්බන්ධයෙන් ද ඒ අනුව සමාජයේ සාමාජිකයන් තුළ ඇති විය යුතු ශක්‍යතා සම්බන්ධයෙන් ද එවැනි මිනුම් තිබිය යුතුය. දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාවේ පූර්විකාවේ 'සියලු රටවැසියන්ගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ හැම පුද්ගලයෙකුගේ ම ශක්‍යතා මුදා හැරීම' අභිලාෂයක් වශයෙන් සඳහන් ව තිබූ බව අපි දුටුවෙමු. මෙසේ මුදා හැරිය යුතු ශක්‍යතා මොනවාද, ඒවායේ ස්වභාවය කුමක් විය යුතු ද යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම මඟින් එම ශක්‍යතා වර්ධනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයේ දායකත්වය කෙබඳු විය යුතු ද යන්න ගැන අවබෝධයක් ඇති කර ගත හැකි ය.

කලක් තිස්සේ බ්‍රිතාන්‍ය යටත් විජිත ලෙස පැවැති ඇමෙරිකානු ජනපද දහතුනක් එක් වී බ්‍රිතාන්‍යයට එරෙහි ව යුද්ධ කොට ඇමෙරිකානු එක්සත් ජනපදය නමින් නිදහස් රාජ්‍යයක් ලෙස 1776 දී සිය ස්වාධීනත්වය ප්‍රකාශ කළේ ය. නව ආරක ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දුන් ඔවුන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෝකයේ මෙතෙක් ප්‍රායෝගික ව ක්‍රියාත්මක වෙන ව්‍යවස්ථා අතරින් පැරණි ම ව්‍යවස්ථාව ද වෙයි. ඒ අවුරුද්දේ ම ස්කොට් ජාතික දාර්ශනිකයෙකු වූ ඇඩම් ස්මිත් දස වසරක් තිස්සේ ජාතීන්ගේ ධනෝපායන මාර්ග පිළිබඳ ව තමන් විසින් කරන ලද විමර්ශනවල ප්‍රතිඵල ගොනු කරමින් *Wealth of Nations (ජාතීන්ගේ ධනය)* යනුවෙන් ග්‍රන්ථයක් පළ කළේ ය. නූතන ආර්ථික විද්‍යාවේ මූල ග්‍රන්ථය ලෙස සැලකෙන ඒ කෘතියෙන් හඳුන්වා දුන් මූලික ආර්ථික සංකල්ප අද පවා ආර්ථික විද්‍යාවේ සනාතන මූලධර්ම ලෙස සැලකෙයි.

මේ ආණ්ඩු ක්‍රමය සහ ආර්ථික ක්‍රමය යන ක්‍රම දෙක ම 'මිනිසුන් වනාහි ආත්මාර්ථකාමී සත්ව විශේෂයකිඃ එහෙත් ඒ ආත්මාර්ථකාමය ම පොදු යහපත සඳහා උපයෝගි කර ගත හැකි ය' යන අපූරු විශ්වාසය මත පවත්වා ගෙන යනු ලැබේ. මෙය වඩාත් ම පැහැදිලි වන්නේ 'මිනිසුන්ගේ ඒ ආත්මාර්ථකාමය නිදහස් වෙළඳපොළ මඟින් සමාජයීය

වශයෙන් ඵලදායී ප්‍රතිඵල වලට පරිවර්තනය කරනු ඇත' යන ස්මිත්ගේ දැඩි විශ්වාසය තුළ යි. ඇමෙරිකානු ව්‍යවස්ථාවේ ආදි කර්තෘවරු ද ඒ හා සමාන අදහසක් පළ කරමින් රාජ්‍යයේ මූලික ආයතන අතර බලය බෙදීම නිසා ඇතිවෙන ආයතනික ආත්මාර්ථකාමය මඟින් ආණ්ඩුවේ බලය සංවරණය හා තුලනය කළ හැකියැ'යි ද එය පොදු ජනතාවට වාසිදායක යැ'යි ද කියා සිටියහ.

මේ දැක්මවල් දෙකට ම ආත්මාර්ථකාමයේ පල ප්‍රයෝජන පිළිබඳ ව පොදු වූ අන්ධ විශ්වාසයක් ද තිබුණි. සමාජය පිළිවෙළකට පවත්වා ගැනීමට නම් සියල්ලෝ ම එක් ව හවුලේ සදාචාරීය පැවැත්ම අනුගමනය කළ යුතු බව ස්මිත් සිය *Theory of Moral Sentiments (*සදාචාරීය මනෝභාවය පිළිබඳ න්‍යාය*)* කෘතියෙන් 1759 දී කියා තිබුණි. එහෙත් ආත්මාර්ථකාමී මිනිසුන් විසින් වෙළඳපොළ නිර්මාණය කරන බව සිය නවතම කෘතියෙන් කියූ ස්මිත්ට ඒ වෙළඳපොළ මඟින් ම අර කී සදාචාරය අනාථ කරන ආත්මාර්ථකාමී මිනිසුන් බිහි කරන බව දැකීමට නො හැකි විය. ඇමෙරිකානු ව්‍යවස්ථාවේ ආදි කර්තෘවරු ද ඊට දෙවැනි නොවූහ. දේපළ හිමි සුදු ජාතිකයන් වූ ඔවුහු නිදහස ගැන උජාරුවෙන් කථා කළ හ. එහෙත් වර්ණ භේදය හා පුරුෂෝත්තම වාදය හෙළා දැකීමට මැලි විය. සංවරණ හා තුලන ගැන කතා කරන අතර ම ඔවුන් අදහස් කළ ප්‍රජාතන්ත්‍රවාදයෙන් ස්ත්‍රීන්, කලු ජාතිකයින්, වහලුන් සහ දේපොළ අහිමි දිළින්දන් ඇතුළු බහුතරයක් බැහැර කළහ.

ගෝලීය වශයෙන් ප්‍රධාන ආදර්ශයක් වන ඒ දේශපාලන ක්‍රමය හා ආර්ථික ක්‍රමය වසර 250කට වැඩි කාලයක් තිස්සේ ගොඩ නගා ඇත්තේ ස්වාර්ථය ම සලකන ආත්මාර්ථකාමී හා ස්වාමිත්වකාමි *(possessive)* පෞද්ගලිකත්වය පූජනීයත්වයට පත් කිරීම සහ ආන්තීකරණයට ලක් කළ සමාජ කණ්ඩායම් දේශපාලනයෙන් කොන් කර දැමීම මතය. බොහෝ කොට ම එසේ කොන් කරනු ලැබූවන්ගේ නිරන්තර අරගල ද හේතු කොට මේ කාලය තුළ සමාජීය සහ ආර්ථික වසයෙන් සැලැකිය

යුතු දියුණුවක් ද ඇති වී තිබෙන බව සැබෑවකි.[325] නමුත් දැන් අපි ආත්මාර්ථකාමය පිළිබඳ ඒ කේන්ද්‍රීය ආර්ථික මූලධර්මයේ ඵලයක් ලෙස බිහි කළ සමාජ විෂමතා හා පාරිසරික හානිය නිසා සමාජීය බිඳ වැටීම්වලට, පුද්ගල පරත්වාරෝපණයට *(alienation)* හා දේශපාලනික ධ්‍රැවීකරණයට ගොදුරු ව අතර මං වී සිටින්නෙමු.

ඉතිං අපට මීට වඩා හොඳ දෙයක් කළ නො හැකි ද? මිනිසුන් වසයෙන් ගත් විට අපි ඇති හැකි පමණින් බෙදා හදා ගැනීමට සහ සියල්ලන්ට ම යහපත සැලසීමට කැමති සත්කාරශීලී ගුණ යහපත් අය වෙමු. එනිසා අපට ඒ අන්‍යෝන්‍ය සහයෝගිතාව හා පරාර්ථකාමය මත පදනම් ව මීට වඩා හොඳ සාධාරණ ආර්ථික ක්‍රමයක් ගොඩ නගා ගත නො හැකි ද? අප අතර නිරන්තර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක්, බැඳීමක් ඇතැ'යි හැඟෙන කණ්ඩායම් කටයුතුවල දී හෝ සාමූහික ප්‍රජා කටයුතුවල දී එම කටයුතු බොහෝ විට හොඳින් ඉටු කර ගත හැකි බව අපි අත්දැකීමෙන් දනිමු. ඉතිං ඒ අනුසාරයෙන් ම අපේ ආර්ථිකය හා දේශපාලනය පොදු යහපත තකා දැවැන්ත පරිවර්තනයකට ලක් කිරීමට අපට නො හැකි ද? ඒ සඳහා අප කුමක් කළ යුතු ද? සැලැකිය යුතු අරගලයකින් තොර ව එවැනි පරිවර්තනයක් ඇති කර ගත නො හැකි බව නම් අපි හොඳින් දනිමු.

අපේ අන්‍යෝන්‍ය සහයෝගිතාව සහ සමුපකාරී ආකල්පය ප්‍රවර්ධනය කරමින් ඒ මත ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම විශ්ලේෂීය, ප්‍රතිමානීය සහ නිර්දේශීය වසයෙන් පැතිකඩ තුනකින් විග්‍රහ කළ යුතු බව සහයෝගිතා ආර්ථිකයක් පිළිබඳ අදහස ඉදිරිපත් කරමින් සාන්ත ක්රූස් විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය ක්‍රිස් බෙනර් සහ දකුණු කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය මැනුවෙල් පැස්ටර් පවසයි.[326] විශ්ලේෂීය යනුවෙන් ඔවුන්

325 උදා: ඇමෙරිකානු කලු ජාතිකයන්ට සමානාත්මතා අයිතිය දිනා ගැනීමට නිදහස ලැබී වසර 170ක් පමණ අරගල කිරීමට සිදුවිය. ඇමෙරිකානු ස්ත්‍රීන්ට ඡන්ද බලය ලැබීමට 1920 දී 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය සිදුවන තෙක් බලා සිටීමට සිදුවිය.

326 Benner, Chris and Pastor, Manuel (2021), Solidarity Economics, Cambridge: Polity Press, p.3

අදහස් කරන්නේ සහයෝගිතාව, සමූපකාරි බව වර්ධනය කිරීම සහ විෂමතා අවම කිරීම මුල් කොට වැඩි සශ්‍රීකත්වයක්, නවෝත්පාදනික උත්තේජනයක් සහ ආර්ථික ගති ශක්තියක් ඇති කළ හැක්කේ කුමන ක්ෂේත්‍රවල ද යන්න විස්තර කිරීම යි. ප්‍රතිමානීය යනුවෙන් අදහස් කළේ මිනිසුන් අතර ඇති අන්‍යෝන්‍ය සහජීවනය සහ සහ-සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම පිණිස දේශපාලන හා ආර්ථික ආයතන ප්‍රතිසංවිධානය කළ හොත් වඩාත් ශක්තිමත් ආර්ථිකයක් සහ යහපත් සමාජයක් ඇති කර ගත හැකි බවට ඇති විශ්වාසය යි. නිර්දේශීය යන්නෙන් අදහස් කළේ මේ අන්‍යෝන්‍ය සහයෝගය මත පවත්වන වඩා හොඳ ආර්ථිකයක් සඳහා අවශ්‍ය කරන පරිවර්තනය සියල්ලන්ගේ ම අගයට ලක් වීමට හැකි අන්දමින් ඉටු කිරීම අභියෝගාත්මක දෙයක් බවත් එයට පවතින දේශපාලනයෙන් හා ආර්ථිකයෙන් ලාභ ප්‍රයෝජන ගන්නා අයගේ බලය බිඳ දැමීම ද අනිවාර්යයෙන් ම ඇතුළත් වන බවත් ය.

එම අභියෝගයට සාර්ථක ව අභිමුඛ වීමේ මුල් ම කොන්දේසියක් වන්නේ ආර්ථිකය ගැන අප හිතන ආකාරය තීරණාත්මක ව වෙනස් කර ගැනීම යි. සම්ප්‍රදායික ආර්ථිකය අපට උගන්වා ඇති අන්දමට ආත්මාර්ථකාමිත්වය සහ වෙළඳපොළ යන දෙක ම ස්වාභාවික ඒවා ය. හැරත් ඒවාට ඇති විකල්ප අසාර්ථක වූ ඒවා ය; නැතහොත් ස්ථාවර ඒවා නො වේ. වෙනත් සුදුසු ආර්ථික විකල්පයක් නැති බැවින් සම්ප්‍රදායික ආර්ථික විද්‍යාවට අනුව නම් දැනට පවතින මට්ටමින් සමාජ විෂමතා විඳ දරා ගැනීමට අප හුරු පුරුදු විය යුතු ය.

එහෙත් එම අදහස පිළිගැනීමට අප සූදානම් නැත. සත්තිගුම්බ ජාතකයේ එන සත්පුරුෂයන් සහ අසත්පුරුෂයන් යන දෙ කොටස ඇසුරේ වෙන් වෙන් ව හැදුණු ගිරා පෝතකයින් දෙදෙනා මෙන් ම අසත්පුරුෂ ආත්මාර්ථකාමියෙකු වීම හෝ සත්පුරුෂ පරාර්ථකාමියෙකු වීම හෝ සිදුවන්නේ මිනිසුන්ට ලැබෙන උපදෙස්වල ස්වභාවය අනුව ය. "ආර්ථිකය පවතින්නේ හුදෙක් ම ආත්මාර්ථකාමය නිසායැ'යි ආර්ථික

විද්‍යාව බිහි වූ දා සිට අපට උගන්වා තිබේ. එහෙත් ඒ වෙනුවට සත්පුරුෂ පරාර්ථකාමීන් බිහි කළ හැකි ආර්ථිකයක් ගොඩ නැගීමට ඉගෙන ගැනීම දැන් අත්‍යවශ්‍යය කරුණක් වී තිබේ" යැ'යි බෙනර් සහ පැස්ටර් පවසයි.

පවතින ආර්ථිකය මෙන් ම ආර්ථික න්‍යාය හා ආඛ්‍යානය යන දෙකම ගොඩ නැගී ඇත්තේ වැරදි සංකල්ප මතය. ඒ නිසා සහයෝගිතාව මත පදනම් වූ නිවැරදි නව ආර්ථික එළඹුමක් අපට අවශ්‍යය. බෙනර් සහ පැස්ටර්ට අනුව එවැනි සහයෝගිතා ආර්ථික එළඹුමක් ඇති කර ගැනීම මූලික පරිශ්‍ර තුනක් මත පදනම් කර ගත යුතු ය. පළමුවැන්න එය හුදෙක් කිසියම් දෙවියෙකු හෝ ස්වභාව ධර්මය විසින් නිශ්චය කරන ලද වියුක්ත නීතිරීති පද්ධතියකින් මෙහෙයවෙන ගම්භීර අන්දමින් 'ආර්ථිකය' යනුවෙන් හැඳින්වෙන දෙය නොව ඊට වෙනස් ව හැම දෙනාට ම 'අපේ ආර්ථිකය' යනුවෙන් මුලු හදින් ම හැඳින්විය හැකි කිසිවෙකු පිට මං නොකරන සහයෝගිතා ආර්ථිකයක් විය යුතුය. 'අපේ ආර්ථිකය' යනු විටෙක බලය සහ තවත් විටෙක අන්‍යෝන්‍යත්වය ***(mutuality)*** නිරූපණය කරමින් සියල්ලන්ගේ ම අන්‍යෝන්‍ය සබඳකම්වල ප්‍රතිඵලයක් ලෙස අන්‍යෝන්‍ය සහයෝගිතාව මත ගොඩනැගෙන දෙයකි. දෙවැනි කාරණය වන්නේ ඇත්ත වසයෙන් ම අප වඩා හොඳින් කටයුතු කරන්නේ එක් ව සහ එකට වැඩ කරන විට බව යි. එහෙත් සම්ප්‍රදායික ආර්ථික විද්‍යාවට අනුව ආර්ථිකය දියුණු වීමට මූලික හේතුව තරඟකාරී ආත්මාර්ථකාමිත්වය යි. ඒ වෙනුවට අප විශ්වාස කළ යුත්තේ අපේ යහපැවැත්ම රඳා පවතින්නේ අප අතර ඇති අන්‍යෝන්‍ය සහයෝගිතාව ශක්තිමත් වන ප්‍රමාණය මත බව ය. තෙවැනි කාරණය වන්නේ පවතින ක්‍රමය ඇතැම් අයට බෙහෙවින් වාසිදායක නිසා එය වෙනස් කිරීමට නම් සමාජ පරිවර්තනයක් පතන ප්‍රබල මහජන ව්‍යාපාරයක් අත්‍යවශ්‍ය බව යි. මීට වඩා යහපත් කිසිවෙකු පිට මං නො කරන ආර්ථික ක්‍රමයක් හඳුන්වා දීමට හැකි වන්නේ දේශපාලන සහ ආර්ථික සහයෝගිතාව සඳහා කටයුතු කිරීමට එකාවන් ව ඒකරාශි වීමෙන් පමණි.

කෙසේ වෙතත් මුළුමනින් ම පොදු අංශය පාදක කරගත් ආර්ථික විසඳුම් ඉදිරිපත් කිරීම වර්තමාන නවලිබරල්වාදී ආර්ථික අර්බුදයට හොඳ ප්‍රතිකාරයක් නො වේ. ප්‍රගතිශීලී යැයි හැඳින්වුණු එවැනි ඊනියා රාජ්‍යය කේන්ද්‍රීය ආර්ථික එළඹුම්වල අසාර්ථකත්වය අප අත් දැක තිබේ. රැකියා අවස්ථා සුලබ කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පහසු මිල නිවාස ක්‍රම ඇති කිරීම, වර්ගභේදය, ලිංගභේදය. කුලභේදය සහ ආගම්භේදය වැනි බෙදීම් අනුව අඩුසැලකිලිවලට ලක් වීම වැළැක්වීම වැනි දේවල් රාජ්‍යයේ මැදිහත් වීම මත කළ යුතු ය. එහෙත් රාජ්‍ය කේන්ද්‍රීය සමාජවාදයේ අසාර්ථක වීම, සුභසාධන ප්‍රයත්නවල විකෘති වීම් සහ සීමිත කම් නිසා රජය මැදිහත් වූ ආකාරය ගැන වැඩි දෙනෙකු තුළ ප්‍රසාදයක් නොවීය. අධ්‍යාපනය, සෞඛ්‍ය, පොදු ආයෝජන, පරිසර ආරක්ෂාව වැනි මාර්ග මඟින් ආර්ථික ප්‍රගතියට රජය වේදිකාවක් සපයන නමුත් අපේ එදිනෙදා ක්‍රියාකාරකම් හා ගනුදෙනු වැඩි වසයෙන් ම පවතින්නේ පුද්ගලික අංශය සමඟ ය. ඒ සම්බන්ධයෙන් නම් අපට මීට වඩා හොඳ පොදු යහපත මුල්කරගත් ස්වාධීන නියාමන ක්‍රම අත්‍යාවශ්‍ය බව පැහැදිලි ය. අපට අවශ්‍ය වෙන්නේ ජජජ හෙවත් 'පබ්ලික් ප්‍රයිවේට් පාට්නර්ෂිප්' යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙන රජය සහ පුද්ගලික අංශයේ සහයෝගිතාවකට වඩා රජය - මහජනතාව-පුද්ගලික අංශය යන ත්‍රෛපාර්ශ්වික සහයෝගිතාවකි. එහි දී රජය ඍජු ව ජනතාව සමඟ හවුල්කරුවන් විය යුතුය.

අපට මීට වඩා හොඳ ව්‍යාපාරික හා පාරිභෝගික චර්යාවක් අවශ්‍ය ය. ඒ සඳහා ද ප්‍රතිමාන තිබිය යුතු ය. හුදෙක් රජය දෙස බලා සිටිනවාට වඩා එකිනෙකා කෙරෙහි විශ්වාසය ඇති කර ගැනීමටත් එකම අරමුණකට අනුව කටයුතු කිරීමටත් අපට ද සමාජයේ ම කොටසක් වන ව්‍යාපාරිකයින්ට ද හැකි විය යුතුය. ප්‍රමිති නියාමනයට රජයේ මැදිහත් වීම අවශ්‍යය ය. එමෙන් ම ධනය නැවත බෙදී යාම සහතික කිරීම පිණිස හුදු අවම වැටුපකට වඩා ජීවත් වීමට සරිලන වැටුපක් නිර්දේශ කොට ක්‍රියාත්මක කිරීම, සැමට මූලික ආදායමක්

*(Universal Basic Income)* සහතික කිරීම, පොදු සේවා පවත්වාගෙන යාම රජයේ කාර්ය අතර ප්‍රමුඛ දේවල් ය. එහෙත් ඒවා නිසි ලෙස ඉටු කර ගත හැක්කේ ඒ සඳහා නිරන්තරයෙන් මැදිහත් විය හැකි සංවිචාරණීය සමාජ ව්‍යාපාර පවත්වාගෙන යා හැකි ප්‍රමාණයට අනුව ය. මේ හැර ජීවත් වීමට සරිලන වැටුප් හා සේවා කොන්දේසි සඳහා වෘත්තීය සමිති සන්ධාන සහ "සාධාරණ හා සදාචාරීය වෙළඳාම" සඳහා උද්ඝෝෂණ ව්‍යාපාර ජාතික මට්ටමෙන් පමණක් නො ව පාර ජාතික මට්ටමෙන් ද විමධ්‍යගත බිම් මට්ටමෙන් ද ඇති කළ යුතු ය.

ඒ හැර කළ හැක්කේ කුමක් දැයි පෙන්වීමට අධ්‍යක්ෂ මණ්ඩල වලට ඵලදායී ලෙස සේවක නියෝජිතයන් පත් කිරීම, ධීවර හා පශු සම්පත් ආදී විවිධ කර්මාන්ත සමුපකාර, ප්‍රජා ඉඩම් හා යාය සමුපකාර වැනි දේවල් පදනම කරගත් කාර්යක්ෂම ව්‍යවසාය හඳුන්වා දිය හැකිය. උදාහරණයක් වසයෙන් ගොවියන්ගේ කුඹුරු හිමිකම් මත කොටස් අයිතිය ලැබෙන යාය සමූපකාර ආයෝජන මඟින් කෘෂිකර්මය හා ආහාර සැපයුම නවීකරණය හා කාර්යක්ෂම කිරීම සහ පරිසරයේ රසායනික දූෂණය වැළැක්වීම සඳහා දියුණු තාක්ෂණය යොදා ගත හැකිය. ප්‍රජා සංවිධාන ඇති කළ යුත්තේ හුදෙක් පැරණි ක්‍රම වලට විරුද්ධ වීම සඳහා පමණක් නොවේ නව ක්‍රම ද හඳුන්වා දීම සඳහා ය.

විකල්ප ආර්ථික රාමුවක් බිහි කිරීමේ දී මිනිසුන් යනු හුදෙක් තනි තනි පුද්ගලයන් පමණක් නො ව පුළුල් සමාජ හා ප්‍රජා සමූහවල සාමාජිකයෝ ය යන අවබෝධය වැදගත් ය. එමෙන් ම මිනිසුන් අභිප්‍රේරණය වෙන්නේ හුදෙක් ආත්මාර්ථකාමිත්වය නිසා ම පමණක් නො ව අනෙකුත් අය කෙරෙහි දක්වන සහානුකම්පාව සහ සිය සමාජයට අයත් වීම පිළිබඳ අභිමානීය පිළිගැනීම ද නිසා බව අවබෝධ කර ගත යුතු ය. ඒ අනුව අපි අපේ ආර්ථික ප්‍රවර්ධනය සැලසුම් කළ යුත්තේ ස්වාමිත්වකාමී පුද්ගලභාවය හා තරඟකාරිත්වය මත නො ව පොදු අයිතිය සහ පොදු අනාගතයක හවුල්කාරයන් ලෙස ය.

නව පරපුරකට අයත් සැලැකිය යුතු ආර්ථික විද්‍යාඥයින් සංඛ්‍යාවක් පශ්චාත් ධනවාදී අනාගතයක් පිළිබඳ ව අවධානය යොමු කර තිබේ. එය තුළ ව්‍යාපාරවල ප්‍රජා හා සේවක අයිතිය පුළුල් වෙන බවත් ආර්ථික තීරණ ගැනීම සංවිචාරණීය ප්‍රජාතන්ත්‍රවාදය අනුව සිදු වන බවත්, ලාබය වෙනුවට සමාජ සුභසාධනය ප්‍රමුඛ වෙන බවත් අපේ බලාපොරොත්තුව යි. ධනවාදී රේඛීය ආර්ථිකයේ සීමා අතික්‍රමණය කරන පුනර්ජනනීය චක්‍රිය ආර්ථිකයක් සහ හුදු තරඟය වෙනුවට සහයෝගිතාව මුල්කරගත් ව්‍යවසායකත්වයක් ඇති කර ගත යුතුය.

මෙහි දී පවතින ආර්ථිකය තුළ ද යම් පමණකට සහයෝගිතාවක් ඇති බව අප අමතක නො කල යුතු ය. ඒ පිළිබඳ හොඳම උදාහරණය කිසිදු වැටුපක් නො ලබන ගෘහිණියන් විසින් සපයන ගෘහස්ථ සේවාවන් ය. ඊට ළමයින් හදා වඩා ගැනීම, මහල්ලන් සහ ආබාධිතයන් රැක බලා ගැනීම, ඉවුම් පිහුම් ඇතුළු අනෙක් බොහෝ කටයුතු ද ඇතුළත් ය. මෙය ඉතා ගැඹුරු මට්ටමේ අන්‍යෝන්‍යතාව *(mutuality)* කි. එහෙත් එම සහයෝගිතාව කිසිවෙකුගේ අවධානයට හා ඇගයුමට ලක් නො වී සිදු වෙමින් පවතී. මෙකී අන්‍යෝන්‍යතාව ජීවලෝකය පුරා ම දක්නට ලැබෙන මූලධර්මයකි. මීමැස්සෙකු පැණි උරමින් මලින් මලට යන විට තමන්ට අවශ්‍ය පැණි ලබා ගන්නා අතරම මල් පරාගනය කිරීමෙන් ගෙඩි හට ගැනීමට උදව් කරයි. සහරක්ෂණය හෙවත් අන්‍යෝන්‍යතාව යනුවෙන් හැඳින්වෙන්නේ එයයි. ඒ වැදගත් අන්‍යෝන්‍යතාව අප බොහෝ විට නො දකින්නේ නවලිබරල්වාදය විසින් ප්‍රවර්ධනය කරන ලද ආත්මාර්ථකාමි ආර්ථික පුද්ගලයා සහ නිදහස් වෙළඳපොළ පිළිබඳ මිරිඟුව නිසා ය. අන්‍යෝන්‍යතාව ඇත්තේ ගෘහස්ථ කටයුතුවල පමණක් නො වේ. සමාජ කටයුතු යනුවෙන් අප හඳුන්වන බොහෝ දේවල්වලට පදනම වන්නේ එකී අන්‍යෝන්‍යතාව යි.

සංවර්ධනයේ මූලික අරමුණ ආර්ථික වර්ධනය යැයි බොහෝ දේශපාලනඥයන් සැලකූ බැවින් දළ දේශීය නිෂ්පාදිතයෙන් නිරූපණය කරන ඒක පුද්ගල ආදායමේ වැඩි වීම එහි සංවර්ධන

දර්ශකය ලෙස නිර්ණය කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වී තිබේ. ආදායම් බෙදී යන ආකාරය ගැන කිසිදු සැලකිල්ලක් නො දක්වන දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ ඒ මිනුම රට තුළ ඇති දරිද්‍රතාව පිළිබඳ ඇත්ත තත්වය මෙන් ම අධික ආදායම් විෂමතාව නිසා උද්ගත ව ඇති ඌනතා ද සඟවන අන්දම අප මීට පෙර සවිස්තර ව සාකච්ඡා කර ඇත්තෙමු. එබැවින් රටක මානව සංවර්ධනය ඇගයීමේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමාණාත්මක වර්ධනය මත ගණනය කෙරෙන ඒක පුද්ගල ආදායමේ වැඩි වීම එතරම් වැඩකට ගත හැකි මිනුමක් නො වේ. වැඩකට නො මැති වා පමණක් නො ව එය අධික විෂමතා සහ දුප්පත්කම සහිත සමාජවලට ඉහළ ලකුණු ද ලබා දෙයි. උදාහරණයක් ලෙස වර්ණභේදවාදය නිසා එකල දකුණු අප්‍රිකාවේ පැවති උග්‍ර සමාජ විෂමතා නො තකා ආර්ථිකය ගැන ප්‍රශස්ති ගැයීමට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමාණාත්මක වර්ධනය සුළුතර සුදු ජාතික ආණ්ඩුවට උපයෝගි කර ගත්තේ ය. දළ දේශීය නිෂ්පාදිතය අනුව සංවර්ධනය මැනීම ජීවන තත්වය පිළිබඳ අනෙකුත් මාන එනම් සෞඛ්‍ය, අධ්‍යාපනය, ස්ත්‍රීන්ගේ තත්වය, දේශපාලන සහභාගිත්වය, ජනවාර්ගික සාමය වැනි දේවල් සැලකිල්ලට නො ගනී. ආදායම් බෙදී යන ආකාරය පිළිබිඹු කෙරෙන දත්ත ඒ සමඟ සැපයීමට කටයුතු කළ ද අර කී බහුමාන සංවර්ධන අවශ්‍යතා ඉන් පිළිබිඹු නො වේ.

ඒ නිසා ආර්ථික වර්ධනය හා දරිද්‍රතාව නිර්ණය කිරීමෙන් පටන් ගැනීම වෙනුවට ජන සමාජයේ ප්‍රතිමාන නිර්ණය කිරීමේ හැකියාව අප විමසිය යුත්තේ අපේ සමාජයෙ තුළ "පොහොසත් ජීවිතයක්" යනුවෙන් හැඳින්විය හැක්කේ කෙබඳු ප්‍රතිමානවලින් නිරූපණය වන ජීවිතයක් ද යන්න විමසීමෙනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අඩංගු කළ යුතුයැ'යි අප 2017 දී දායක වූ යෝජනාවට අනුව රාජ්‍යයේ හා ව්‍යවස්ථාපිත ආයතනවල කේන්ද්‍රීය කාර්යයක් විය යුත්තේ කරුණා, මෙත්තා, මුදිතා, උපේක්ඛා සහ අහිංසා යන ශික්ෂා පංච ශික්ෂා මත පිහිටි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ස්ථාපිත කොට පවත්වා ගැනීම පිණිස 'සියලු පුරවැසියන්ට ඔවුන්

සතු සිවිල්, දේශපාලනික, සමාජීය, ආර්ථික, සංස්කෘතික, පාරිසරික සහ අධ්‍යාපනික අයිතීන් පූර්ණ ලෙස භුක්ති විඳීමේ සම අවස්ථාවන් සහතික කිරීම' යි.

22 වන පරිච්ඡේදයෙන් අප සාකච්ඡාවට ලක් කළ ඩෝනට් ආර්ථික මොඩලය හඳුන්වා දුන් කේට් රේවර්ත් යෝජනා කරන අන්දමට අප පළමුවෙන් ම කළ යුත්තේ අපේ ගෝල් කණුව හෙවත් අරමුණ වෙනස් කිරීමයි. ඇය පෙන්වා දුන් පරිදි වසර 70ක් තිස්සේ ආර්ථික විද්‍යාඥයෝ ප්‍රගතියේ දර්ශකය ලෙස දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන අනුපාතයට ලොල් ව සිටියහ. ඒ ලොල් වීම ආදායම සහ වත්කම් සම්බන්ධ අත්‍යන්ත විෂමතා සාධාරණීකරණය කිරීමටත් පෙර නො වූ විරූ ලෙස ජීව ලෝකය විනාශ කිරීමටත් හේතු විය. කේට් අවධාරණය කරන පරිදි ඒ වෙනුවට විසි එක් වැනි සියවස සඳහා අපට අවශ්‍ය කරන්නේ ඊට වඩා විපුල අරමුණක් වූ අපට ජීවදානය දෙන පෘථිවි ග්‍රහයාගේ සාධනීය පාරිසරික සීමා මායිම් තුළ හැම පුද්ගලයෙකුගේ ම මානව අයිතිවාසිකම් සාක්ෂාත් කිරීමයි.

අමාර්ත්‍ය සෙන් පෙන්වා දුන් පරිදි ඇතැම් පුද්ගලයන්ට අනෙක් පුද්ගලයන්ට වඩා වරප්‍රසාද හිමි ව ඇති බැවින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ නිරත වීමට ඔවුන්ට වැඩි අවකාශයක් තිබෙන බව රහසක් නො වේ. එහෙත් "එවැනි අසමානකම් සමතුලිත කිරීමට හැකි පරිපූර්ණ ආයතන ගොඩනගන තෙක් අපට බලා සිටිය නො හැකිය. ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය යනු හුදෙක් අපට සිතිය හැකි පරිපූර්ණ ම ආයතන ව්‍යුහය ලබා ගැනීම නො වේ. ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය නිසැක ලෙස ම රඳා පවතින්නේ අපේ සැබෑ චර්යා පිළිවෙළ සහ අපේ සමාජ හා දේශපාලන අන්තර් ක්‍රියාකාරිත්වය මතය. නො එසේ ව එය මුළුමනින් ම ආයතනික ධර්මිෂ්ටකම මත පමණක් රඳා පවතින දෙයක් නො වේ. අනෙක් සියලු ආයතන මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ද රඳා පවතින්නේ යුක්තියුක්ත අවකාශය උපයෝගි කර ගන්නා මිනිස් කාරකත්වයේ *(Human Agency)* දැනුවත්

ක්‍රියා මතය."[327] යනුවෙන් අමාත්‍ය සෙන් සිය *Idea of Justice* කෘතියේ කළ සඳහන අප මේ කෘතියෙන් ඉදිරිපත් කළ සමස්ත කතිකාව හකුළුවා දක්වන ප්‍රකාශයක් බඳුය.

කිසියම් නියෝජිත කණ්ඩායමකට බලය අත්පත් කර දීමට වැඩ කරන අන්තේවාසිකයන් පිරිසක් වීමේ සම්ප්‍රදායික දේශපාලන සුසමාදර්ශය ඉවත ලා අප කළ යුත්තේ සියල්ලන්ට ම යුක්තිය අත්පත් කර ගැනීම අරමුණ කරගත් නිරන්තර ව ගොඩ නැගෙන හා නිරන්තර ව වැඩ කරන විවෘත බහුජන ව්‍යාපාරයක් ගොඩ නැගීමයි. එය බහුජන සංවිචාරණය මුල් කර ගොඩ නැගිය යුත්තක් මෙන් ම බහුජන සංවිචාරණය පදනම් කර ගෙන පවත්වා ගත යුත්තකි. ඒ සඳහා දායක විය හැකි අදහස් ගොන්නක් මම මගේ ශක්ති පමණින් ගොනු කර මේ කෘතියෙන් ඉදිරිපත් කළෙමි. ඒවා අවසාන ප්‍රතිකාර හෝ නිගමන හෝ නො ව අදාළ කරුණු කාරනා සම්බන්ධ ව ඔබේ අවධානය මුවහත් කිරීම සඳහා ඉදිරිපත් කළ අදහස් ය. එම අදහස් නව දේශපාලන හා ආර්ථික සුසමාදර්ශයක් බිහි කිරීමේ ලා දැනුවත් සමාජ සංවිචාරණයකට උත්තේජනයක් වේවා.

**සමාප්තයි.**

327 Sen. Amartya (2009) The Idea of Justice (London: Allen Lane), p' 354

දිගු කලක් ගුවන්විදුලි ජනමාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කළ විජයානන්ද ජයවීර 1994 සිට යුනෙස්කෝ ආයතනයේ සේවයට බැඳී පැරිසියේ පිහිටි යුනෙස්කෝ මූලස්ථානයේ ද අනතුරු ව ඉන්දුනීසියාව, මැලේසියාව සහ ඉන්දියාව යන රටවල නේවාසික ව වෙසෙමින් ද ආසියානු කලාපයේ ජනසන්නිවේදන සංවර්ධනය පිළිබඳ යුනෙස්කෝ උපදේශකවරයා ලෙස කටයුතු කළේ ය. 2011 දී යුනෙස්කෝ සේවයෙන් විශ්‍රාම යන විට ඔහු දියුණුවෙන රටවල ජනසංනිවේදන සංවර්ධනය පිළිබඳ යුනෙස්කෝ ජාත්‍යන්තර වැඩසටහනේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේ ය. විජයානන්ද ජයවීර බ්‍රිතාන්‍යයේ ලෙස්ටර් විශ්වවිද්‍යාලයේ ජනසංනිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකි.



# සංවිචාරණීය සමාජයක්

## A Deliberative Society

**විජයානන්ද ජයවීර**

හුදු බලය අත්පත් කර ගැනීම අරමුණ කරගත් පැරණි පන්නයේ දේශපාලනය වෙනුවට යුක්තිය අත්පත් කර ගැනීම අරමුණ කරගත් නව දේශපාලනයක් බිහි කිරීම සහ ආත්මාර්ථකාමය හා ස්වාමිත්වකාමය වෙනුවට සහයෝගිතාව හා තිරසාරත්වය පදනම් කරගත් සහරක්ෂණීය ආර්ථික එළඹුමක් හඳුන්වාදීමේ අවශ්‍යතාව මේ කෘතියෙන් අවධාරණය කරයි. පවතින දේශපාලනයේ හා ආර්ථික එළඹුමේ එවැනි සුසමාදර්ශීය වෙනසක් ඇති වීමට නම් දැනුවත් සංවිචාරණීය මහජන සහභාගීත්වයට නිරන්තර ව ඉඩ සලසන දේශපාලන තන්ත්‍රයක් සහ එමඟින් බිහි කිරීමට බලාපොරොත්තුවන ජන සමාජයේ ස්වභාවය පිළිබඳ පොදු එකඟතාවක් ඇති කර ගත යුතුය. බලය අත්පත් කර ගැනීමට විකල්ප වූ 'යුක්තිය ඉටු කර ගැනීමේ' සංවිචාරණීය දේශපාලන ක්‍රියාකාරිත්වයක් සහ නාස්තිකාරී රේඛීය ආර්ථිකය වෙනුවට පුනර්ජනනීය චක්‍රීය ආර්ථිකයක් ගොඩ නැගිය හැකි ආකාරය පිළිබඳ මුඛ්‍ය අදහස් පද්ධතියක් ඉස්මතු කර ගැනීමට දායක වීම මේ කෘතියේ අරමුණයි.

අගහස් ප්‍රකාශන
අංක. 717/2,
මාදින්නාගොඩ,
රාජගිරිය.

Rs. 1750.00

ISBN 978-955-51142-2-6

9 789555 114226

Mola